# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## (සතරවන කාණ්ඩය)

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

(සතරවන කාණ්ඩය)

අමරදාස රත්නපාල

තායිවානයේ තායිපේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසි, බණ්ඩාරගම විදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම චන්ද්‍රිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදි.

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම
විදාගම,
බණ්ඩාරගම


Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org



**This book is strictly for free distribution, it is not to be sold.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

## සතරවැනි කාණ්ඩයට විශෙෂ

# පෙරවදන

## වජිරාරාමවාසී පියදස්සි මාහිමිපාණන් විසිනි

අභිධර්මාර්ථ සඞ්ග්‍රහ නම් වූ ප්‍රකරණයෙහි පරමාර්ථ ධර්මයන් පරිච්ඡෙද නවයකට බෙදා සඞ්ග්‍රහකොට ඇත. එහි එන **කර්මස්ථාන සඞ්ග්‍රහ විභාග නම් වූ** නව වැනි පරිච්ඡෙදය ඇසුරුකොට ලියන ලද විස්තර විවරණයක් මේ සතරවැනි කාණ්ඩයෙහි දක්නා හැකි ය.

**අභිධම්මත්ථසඞ්ගහ** නම් වූ අගනා ග්‍රන්ථය පාළි භාෂායෙන් ලියූ අනුරුද්ධාචාර්ය්‍ය පාදයන් පොත අවසන් කරනුයේ මෙසේය:

**"භාවෙතබ්බං පනිච්චෙවං භාවනාද්වයමුත්තමං**
**පටිපත්ති රසස්සාදං පත්ථයන්තෙන සාසනෙ"**

බුද්ධශාසනයෙහි ප්‍රතිපත්තීන්ගේ රසාස්වාදය පතන්නහු විසින් කියන ලද ක්‍රමයෙන් සමථ-විපස්සනා නම් වූ උතුම් භාවනා දෙක වැඩිය යුත්තේ ය.

භාවනාවෙහි යෙදෙන්නවුන් විසින් දතයුතු කරුණු නවවැනි පරිච්ඡෙදයෙහි සැකෙවින් සඳහන් වෙයි. ඒ සැකෙවින් කී කරුණු මේ සතරවැනි කාණ්ඩයෙහි සවිස්තරව ලියැවී ඇත. භාවනා පිළිබඳව දතයුතු දෑ උගෙන භාවනා කරන්නට කැමැති භවතුනට මේ කාණ්ඩයෙන් ලබාගතහැකි උපදෙශයෝ බොහෝ ය. එහෙයින් මෙය භාවනා පිළිබඳවම ලියැවුණු පොතක් හැටියට සලකනු මනාය. ධර්මය හදාළයුත්තේ කුමක් සඳහා ද? ධර්මඥානය යොමුකළ යුත්තේ කුමට ද? යන්න යට සඳහන් ගාථායෙන් මනාව හෙළිවේ.

**ධර්මය-අභිධර්මය** හැදෑරිය යුත්තේ නයා වලිගයෙන් අත්ලා ගන්නකු සේ (**අලගද්දූපරියත්ති**) නොව නිස්සරණය,

නිර්වාණය, සඳහා ය. (**නිස්සරණ පරියත්ති**). නයා වරදවා ගත්තවුන් විපතට පත්වන්නා සේ ධර්මය වරදවා ගත්තහුට ඒ දහම දිගු කලක් අහිත පිණිස, දුක් පිණිස පවතිනුවා ඇත.

එහෙයින් බණ උගත යුත්තේ: 'සිල් ආතත්හි සිල් පුරමි, සමාධි ආතත්හි සමාධි ගබ්ගත්වමි, විදර්ශනා ආතත්හි විදර්ශනා වඩමි, මාර්ගඵල ආතත්හි මාර්ග භාවනා කෙරෙමි, ඵල සාක්ෂාත් කෙරෙමි.' (ධර්මප්‍රදීපිකා) යන මේ ආකාරයෙනි. එයම නිස්සරණ පරියත්ති නම්.

ධර්මය යනු කුමක් ද? ධර්ම ශබ්දය සඳහා ධර්මරාජන් වූ සම්මා සම්බුද්ධ තථාගතයන් වහන්සේ නොයෙක් තැනදී නොයෙක් වචන යෙදූහ. **ධම්ම, ධම්මචක්ක, ධම්මවිනය, සාසන, බ්‍රහ්මචරිය, පාවචන** යනු ඉන් කිහිපයෙකි. පර්යාය (සමාන) ශබ්ද සේ පෙනෙන මේ වචන පිළිබඳව විවරණයක් කිරීමට මේ නොතැනි.

ධර්මය (සාසනය) **පරියත්ති, පටිපත්ති, පටිවෙධ** හෙවත් පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ වශයෙන් ත්‍රිභේද ය. **සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ** ආදී නවාඞ්ගයෙකින් යුත් පර්‍යාප්තිධර්මය, ධර්මවිනය වශයෙන් දෙවැදෑරුම් ය. ඒ ධර්මයද **සම්මුති-පරමත්ථ** (සංවෘති-පරමාර්ථ) වශයෙන් සත්‍ය දෙකකට බෙදේ. එහෙයින් කීහ අටුවා ඇජරහු:

> “**ද්වෙ සච්චානි අක්ඛාසි සම්බුද්ධො වදතං වරො**
> **සම්මුතිං පරමත්ථං ච තතියං නූපලබ්භති**
>
> **සංකෙත වචනං සච්චං ලොක සම්මුති කාරණං**
> **පරමත්ථ වචනං සච්චං ධම්මානං භූතලක්ඛණං**”

'වාදීවර වූ සම්බුදු රජහු සම්මුති-පරමත්ථ වශයෙන් සත්‍යද්වයක් දෙසූ සේක. එයින් අන්‍ය වූ තුන්වන සත්‍යයක් නම් නො ලැබේ.

'සත්ත්ව පුද්ගල ව්‍යවහාරය නොයික්මවා කැරෙන ස්ත්‍රී පුරුෂ වෘක්ෂලතා ආදී සංකෙත වචන ලොකසම්මුති

හෙයින් ඇත්තෙකි. සකන්ධ, ධාතු, ආයතන, ආයර්‍යසත්‍ය, ප්‍රතීත්‍යසමුත්පාද වශයෙන් දෙසූ ධර්මයන් පරමාර්ථ සත්‍යයෙහි වැටෙන හෙයින් ඇත්තෙකි.'

මෙමැ කීහ නාගාර්ජුනපාදයෝ: (**මාධ්‍යමිකවෘත්ති,** 492 පිටුව)

**"ද්වෙසත්‍යෙ සමුපාශ්‍රිත්‍ය බුද්ධානං ධර්මදෙශනා
ලොක සංවෘති සත්‍යංච සත්‍යංච පරමාර්ථතඃ"**

'ලෝක සංවෘති සත්‍යයද, පරමාර්ථ සත්‍යයද යන මේ සත්‍යද්වය ඇසුරු කොට බුදුවරයන්ගේ ධර්ම දෙශනාව වේ.'

ව්‍යවහාර (වොහාර) වචනය ඇසුරු නොකොට පරමාර්ථ ධර්මය දෙශනා කළ නො හැකිය. පරමාර්ථ ධර්මයන්ගේ අවබොධයක් නො මැතිව නිර්වාණාධිගමයක් නො කළ හැකිය.

ධර්මවිනය කී තැන **විනය** යන්නෙන් මිනිසාගේ කාය වාග් සංවරණයට අවශ්‍යවන, නිවන් මඟට යොමු කොට දෙශනා කළ ශික්ෂා සමූහය ගැනෙත්. එය ශීල ශික්ෂාවයි. **ධම්ම** යන්නෙන් සමාධි සහ පඤ්ඤා යන දෙවැදෑරුම් ශික්ෂාවෝ ගැනෙත්. මෙසේ මේ ධර්මවිනය නමින් අදුන්වන පය්‍ර්‍යාප්ති ධර්මය පුරුදු කිරීම ප්‍රතිපත්තිය යි. ඒ ප්‍රතිපත්ති පූරණයෙහි යෙදෙන්නවුන් විසින් **අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපදා** වශයෙන් වදහළ පරිදි කෙමෙන් පිළිවෙළින් පිරිවෙත් පිරිය යුතුය. බුදුරජහු අනුක්‍රමයෙන් විනෙය ජනයන් හික්මවීම සඳහා **"දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං, ඔකාරං, සංකිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං..... සාමුක්කංසිකා ධම්මදෙසනා පකාසෙසි"** යන්නෙන් අදුන්වන දෙශනා නය යොදා ගත්හ. මේ නයින් විමුක්තිය කරා යන මඟ හෙළි කළහ. මෙසේ ප්‍රතිපත්ති ධර්ම පුරන්නහු එහි මුඛ්‍ය ප්‍රතිඵලය වශයෙන් ප්‍රතිවෙධය ලබත්. **සොතාපත්ති, සකදාගාමි,**

**අනාගාමි, අරහත්ත** යන සතර මඟ සතර ඵල සහ නිර්වාණ ය යන මේ නවලොවුතුරා දහම් ප්‍රතිවෙධ ධර්මයෙහිලා ගැනෙත්.

මේ **පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ,** යන ත්‍රිවිධ ශාසනයක් (ධර්මයක්) අවශ්‍යවන්නේ මන්ද? බුදුරජාණන් වහන්සේ ධර්ම විනයයක් ගැන දෙශනා කළේ මන්ද? දුකෙන් මිදීම සඳහාය. **“පුබ්බෙචාහං භික්ඛවෙ එතරහි ච දුක්ඛං චෙව පඤ්ඤපෙමි, දුක්ඛස්ස ච නිරොධං”** “මහණෙනි, පෙරත් දැනුත් (අදත් එදත්) මම දුකත්, දුක්ඛයාගේ නිරොධය හෙවත් නිවීමත් පණවමි.” මේ සිවුසස් සැකෙවින් කී පරිදිය. මෙයම ධර්මයේ පරම සාරයයි. අනෙක් හැම ධර්මයෝ මේ සත්‍ය සතරට ඇතුළුවෙති. **“සච්චවිනිම්මුත්තා හි භගවතො දෙසනා නත්ථි”** සත්‍ය සතරෙන් තොරවූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනාවෙක් නැත. යන නෙත්ති අටුවා වචනයෙනුත්, **“චතුසච්ච විනිම්මුත්තො ධම්මො නාම නත්ථි”** චතුරාර්‍ය සත්‍යයෙන් තොර දහමෙක් නම් නැත. යන පෙටකොපදෙස වචන යෙනුත් ඒ බව හෙළි වේ.

**අභිධර්ම** යන්නෙහි **“අභි”** ශබ්දයට අටුවා ටීකා ඇජරහු අර්ථාන්තරයෙක් දක්වති “අභි” ශබ්දයෙහි (ධර්ම) අතිරෙක, (ධර්ම) විශෙෂ යනආදි අර්ථයන් දක්ක හැකිය. නිවන් දැකීමට ඉවහල්වන බැවින් **ධර්මාතිරෙකය,** ලොක සම්මුති යෙන් පිටත් හෙයින් **ධර්මවිශෙෂය.**

කාමාවචරාදී වශයෙන් ක්‍රමයෙන් වැඩිවෙන නිසා අභි ශබ්දයෙහි **වෘද්ධි අර්ථයෙක් ද වේ.** ඵස්ස වෙදනා ආදි සලක්ෂණ (සලක්ඛණ) ධර්ම ඇති හෙයින් අභිධර්මය **සලක්ඛණ ධර්ම** ද වේ. කුසලාකුසල, ක්‍රියා විපාක වශයෙන් පිරිසිඳ පෙන්වන හෙයින් **පරිච්ඡින්න ධර්මත්** වේ. ලොකොත්තර ධර්මයන් ඇතුළත් හෙයින් **“පූජිත ධර්මද”** වේ. තවද අභිධර්මය ශාසන වශයෙන් **යථාධම්ම ශාසන** නම්. කථා වශයෙන් **නාමරූප පරිච්ඡෙද කථා** නම්. දෙශාන වශයෙන් **පරමාර්ථදෙශනා** නම්.

ශාබ්දිකයන් විසින් මෙසේ විවරණය කරන ලද මේ "අභිධර්ම"යෙහි එන්නේ පරමාර්ථ ධර්ම සතරෙකි. සත්ත්ව සන්තානයෙහි පහළවන තාක් සිත්, **චිත්ත පරමාර්ථ** වශයෙනුත්, හැම සිත්හි ලැබිය හැකිතාක් හොඳ නොහොඳ ගුණ විශේෂයන් **චෛතසික පරමාර්ථ** වශයෙනුත්, මේ චිත්ත චෛතසික නම් වූ නාම ධර්මයනට ආධාර වූ ශරීරයෙහි ලැබිය හැකිතාක් ද්‍රව්‍ය සමූහය **රූප පරමාර්ථ** වශයෙනුත්, මේ නාමරූප හෙවත් පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත සත්ත්වයා පිළිබඳ වුවත් චිත්ත චෛතසිකයන් හා සම්ප්‍රයෝග ලක්ෂණයෙන්-වත්, රූපයන් හා කලාප බන්ධන වශයෙන්වත්, කිසිකලෙක නො බැඳෙන බැවින් ඒකාන්ත කෙවල (තනි) ධර්මයක් වූ ද, සෝවාන් ආදී සතර මඟින් දක්නා තෙක් ප්‍රත්‍යක්ෂයෙන් නොපෙනෙතත් නිත්‍යව නොවෙනස්ව පවත්නාවූ ද, නිර්වාණ ධර්මය **නිර්වාණ පරමාර්ථ** වශයෙනුත් අභිධර්මයෙහි අඳුන්වා දී ඇත. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණයෙහිම දැක්ක හැක්කේ මේ සතර පරමාර්ථ පිළිබඳ විස්තර විවරණ ය.

මිනිසා කවරෙක්ද? ඔහුගේ බලාපොරොත්තුව කුමක්ද? යන්න මේ සතර පරමාර්ථ ධර්මයන්ගෙන් හෙළිවෙයි. **චිත්ත, චෛතසික, රූප** යන ධර්මත්‍රයයෙන් මිනිසා හැඳින්වෙයි. ඔහුගේ නාමකය හා රූපකය ගැනෙයි. වෙනත් වචන වලින් කියතොත් මිනිසාගේ සිතත්, කයත් ගැනෙයි. මෙයම තවදුරටත් විභජනය කරනවිට **රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ** යන පස්කඳ ගැනෙයි. මේ පංචස්කන්ධසංඛ්‍යාත මිනිසාගේ (බෞද්ධයාගේ), පරමාර්ථය, උසස්ම බලාපොරොත්තුව, නිර්වාණාවබෝධයයි. එහෙයින්, අභිධර්ම දෙශනාවෙන් ඉගැන්වෙන්නේ පංචස්කන්ධ විභාගය සහ නිර්වාණ පරමාර්ථය බව පැහැදිළි ය.

ඒ නිර්වාණ පරමාර්ථය කැමැත්තවුන් විසින් තමා සෙවිය යුතුය (**අත්තානං ගවෙසෙය්‍යාථ**). එසේ තමන් සොයන්නවුන් විසින් බැලියයුත්තේ රූපාදි පංච උපාදානස්කන්ධයන් දෙස ය. එසේ බැලීමට යට සඳහන් **සමථ-විපස්සනා** භාවනාද්වය අවශ්‍ය ය.

සමථයෙන් කැරෙන්නේ වික්ෂිප්තව, අන්‍යවිහිතව, පොලාපතින මිනිස් සිත ඉන් මුදා අරමුණෙහි රැඳවීම ය. **සමාධි, එකග්ගතා, එකොධිභාව** යන ආදි නාමයෙන් හැඳින්වෙන්නේ ඒ සමථය යි. අරමුණෙහි රාගවශයෙන් නොඇලී, පටිඝ වශයෙන් නොහැපී – **අනුරොධ, විරොධ** භාවයෙන් තොරව – බලනවිට සිතෙහි ඇතිවන එකඟකම, සන්හුන්කම **සමථ** භාවනාවයි. මෙය **ආලම්බණොප** – **නිධ්‍යානය යි.**

**සමාහිතො යථාභූතං පජානාති** – සමාහිතවූ, සන්සුන් සිත ඇති දේ ඇති හැටියට දකියි. මෙසේ ඇති සැටියෙන් දැකීම **විපස්සනාවයි** (විදර්ශනාවයි), විශෙෂාකාරයෙන් දැක්මයි. විශෙෂාකාරයෙන් දැක්ම නම් පස්කඳ ඝණ සංඥයෙන් ගොණුවක්, මිටියක් සේ නොගෙන වෙන් වෙන් කොට බැලීම යි, ඝණවිනිර්භොගය යි.

**සඤ්ඤ විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස** (විපිරියාස) වශයෙන් දක්වෙන පරිදි අරමුණ විපරීතා කාරයෙන් නොගෙන ඇතිතතු දැකීම යි. එනම්: රූපාදී පංචඋපාදානසක්ඛධයන් එකක්, එකක් පාසා ත්‍රිලක්ෂණයට ආරොපනය කැර බැලීම යි. **අනිච්ච, දුක්ඛ, අනත්ත** යනු ත්‍රිලක්ෂණ යි. අකුරු අටෙකින් හා පද තුනෙකින් **(අට්ඨක්ඛරා තිනිපද)** යුත් මේ තිලකුණු විදර්ශනා භාවනාවේ අඞ්ග යි.

බුද්ධ වචනය අනුව රූපාදි පස්කඳ හෙතුප්‍රත්‍යයෙන් හටගත් නිසා අනිත්‍ය ය, මොහොතක් එක සේ නොපැවැත වෙනස් වෙයි. යමක් අනිත්‍ය ද එය දුක් ය. යමක් දුක් ද එය අනාත්ම ය, ස්ථිරවූ නිත්‍යවූ ශාස්වතවූ ආත්ම-යෙන් තොර ය. යමක් අනාත්ම ද එය මාගේ නොවේය. **(නෙ තං මම).** එය මම නොවෙමි **(නෙ සො හමස්මි).** ඒ මාගේ ආත්මය නො වෙයි **(න මෙසො අත්තා).** පස්කඳ පිළිබඳව මෙසේ ඇතිතතු සම්‍යක් ප්‍රඥයෙන් **(සම්මප්පඤ්ඤය)** බැලීම **ලක්ඛණොපනිධ්‍යානය යි.** මෙසේ

බලත්නවුන්ගේ සිත නොඇලීමෙන්, උපාදාන නොකිරීමෙන් ආශ්‍රවයන්ගෙන්, කෙලෙසුන්ගෙන් මිදෙයි. (**සංයුත්ත නිකාය,** 351).

කාණ්ඩ සතරෙකින් යුත් **අභිධර්මාර්ථප්‍රදීපිකාවෙන්** මුල සිට අගතෙක් හෙළිකරන්නේ මේ විමුක්ති මාර්ගය යි, නිවන් මඟයි. එහෙයින්, මෙය කියවන භවතුන් විසින් නිර්වාණ පරමාර්ථය සඳහා උත්සාහ දැරීම මැනැවි.

ආභිධර්මිකයන්ගේ ගෞරවාදරයට බඳුන් වූ අභිධර්මාර්ථ සංග්‍රහය නම් වූ ග්‍රන්ථරත්නයට පොරණැදුරන් විසින් ලියන ලද ටීකා අතර දැනට ඇත්තේ **දිඹුලාගල** මහා කස්සප මාහිමිපාණන් විසින් රචිත පුරාණ ටීකාව ද, උන්වහන්සේගේ ශිෂ්‍ය **සාගරමති සාරිපුත්ත** මාහිමිපාණන් විසින් ඉතා ව්‍යක්ත ලෙස සැපැයුණු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය ද, උන්වහන්සේගේ ශිෂ්‍ය **සුමඞ්ගල මාහිමිපාණන්** ලියූ **අභිධම්මත්ථ** **විභාවිනී ටීකාව** ද යන මේ ග්‍රන්ථයන් ය. මෑතකාලයේදී ලියැවුණු පොත් ද කිහිපයෙකි.

උගතුන්ගේ සිතැදගත් මේ අභිධර්මාර්ථ සංග්‍රහයම අනුව යමින් **අමරදාස රත්නපාල දෙස්තර මහත්මා** විසින් මහත් වෑයමකින් සපයා ඇති මේ **අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම් වූ ග්‍රන්ථයෙහි අභිධර්මපාළියත් ඇතුළුකොට අභිධර්ම කාරණා ඉතා විසිතුරුවත් විසදවත් ලියා ඇති බව කිය යුතුය.

කාණ්ඩ සතරෙකින් සහ පිටු 2309 යුතුව මෙතරම් විස්තර විභාග සහිතව ලියැවුණු මේ සා විශාල අනෙක් අභිධර්මග්‍රන්ථයක් මේ රටෙහි ලියැවී නැති සේ ය.

පාළි භාෂාව නොදත් සාමාන්‍ය ජනයාට වුවද අභිධර්ම දේශනාවන් පිළිබඳව සෑහෙන දැනීමක් ලබා ගැනීමට මේ පොත බෙහෙවින් උපකාරවනුවා ඇත. අභිධර්මය පිළිබඳව විස්තර සහිතව හෙළබසින් ලියැවුණු පොතක් නැතැයි මැසිවිලි කියන්නට දැන් ඉඩෙක් ඇත. ඒ පාඩුව

මේ කාණ්ඩ සතරෙන් පිරිමැසේ. දහම් පාසල්හි ශිෂ්‍ය ශික්‍ෂක දෙපසට ද මේ අභිධර්මාර්ථ ප්‍රදීපිකාව හස්තසාර වස්තුවක් වනු නිසැක ය.

මෙසේ නවීනයනට පමණක් නොව ප්‍රවීනයනට ද බෙහෙවින් උපකාර වන මේ ග්‍රන්ථය ජනකාන්ත වනුවා ඇත. වෛද්‍ය වෘත්තියෙහි යෙදෙන ගමනේ මෙබඳු වටනා අභිධර්මග්‍රන්ථයක් ලියා බෞද්ධ ධර්ම සාහිත්‍යය පෝෂණය කිරීම ගැන සත්පුරුෂ කවුරුනුත් රත්නපාල මහත්මාට කෘතඥවිය යුතු බව කියනු කැමැත්තෙමි.

"බුදුගුණ මුත් තෙපුල් - මෙත් බහාවුන් මුත් සිත්
නොවෙවා කොනෙක්හිදු - පරවැඩ මුත් පියෝමා"

# හැඳින්වීම

**අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම් වූ මේ පොත අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් සම්පාදනය කරන ලද්දකි. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණයන්හි ඇතුළු වූ ධර්මාර්ථයන් පිඬුකොට ත්‍රිපිටකධර අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **අභිධර්මාර්ථ සංග්‍රහ** නම් ග්‍රන්ථය බොහෝ කලෙක සිට අභිධර්මය උගන්නවුනට මහෝපකාරී විය. බුදුරජාණන් වහන්සේ විසින් දෙසිත ත්‍රිපිටක ධර්මයෙහි සඳහන්වන ධර්මාර්ථයන් මනාව වටහාගැනීමට පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනීමක්වත් තිබිය යුතුය. මෝහයෙන් මඩනාලද පුහුදුන් සිත් සතන් මිථ්‍යාමතවලින් මුදවා පිරිසුදු සම්‍යග් දෘෂ්ටියෙහි යොදවා ගැනීම ධර්මඥානයෙන්ම කළ යුත්තෙකි. කුසලාකුසල ධර්මයන් හැඳින එහි ඉෂ්ටා'නිෂ්ට විපාකයන් දැනගැනීමටත් චතුරාර්යසත්‍ය ධර්මාවබෝධය පිණිස වැඩිය යුතු සමථ විදර්ශනා භාවනානු යෝගයටත් ඉවහල්වන ධර්ම සමූහය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඇතුළත් වේ. එබැවින් ධර්මය ඉගෙනීමෙහි කැමැත්ත ඇති, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු කර ගැනීමට උත්සාහ දරන සත්පුරුෂයන්හට අභිධර්මාර්ථ සංග්‍රහය වැනි අන් ග්‍රන්ථයක් නැතැයි කිව යුතුය.

පෙර ධර්ම විනයධර උතුමන් විසින් ඉතා ගෞරවයෙන් ආචාර්ය පරම්පරානුගත විධි නොසික්මවා තම සිසුන් පිරිසුදු ශීලයෙහි පිහිටුවා ධර්මඥානය ලබාදීමෙන් පර්යාප්ති ප්‍රතිපත්ති ශාසනය රැකගත් බව ශාසන ඉතිහාසයෙන් හෙළිවේ. පසු කලෙක විදෙශයෙන් පැමිණි අන්‍ය ලබ්ධිකයන්ගේ නපුරු බලපෑම් නිසාත් වෙනත් නොයෙක් අවහිරකම් නිසාත් පිරිහෙන්නට ගිය මේ සසුන, කලින් කල පහළවූ ගිහි පැවිදි උතුමන්ගේ උත්සාහයෙන්, අතුරුදහන් වන්නට ඉඩ නොදී රැකගත් හෙයින් අදත් සැදැහැතියන්හට දහම් ඉගෙනීමටත් පිළිවෙත් පිරීමටත් ඉඩ ඇත්තේමය. නුවණත්, ශ්‍රද්ධාවත්, උත්සාහයත් ඇතොත් භික්ෂූන් වහන්සේට දහම් ඉගෙන පිළිවෙත් පිරීමට එතරම් අවහිරයක් නම් නැත. එහෙත් එවැනි

භාග්‍යයක් නැතිව නොයෙක් දුෂ්කරතා මධ්‍යයෙහි රැකීරක්‍ෂා ගේ දොර වැඩ කටයුතු ආදියෙහි යෙදී සිටින සැදැහැවත් ගිහි පින්වතුන්හට වරින්වර නොයෙක් මාතෘකායෙන් කැරෙන ධර්‍ම දේශනා හැර පිළිවෙලින් ධර්‍මය ඉගෙනීමට ක්‍රමයක් නැති හෙයින් පින්පව් හැඳින ගැනීමට පවා නොහැකිව ඔවුන් ශ්‍රද්ධාදි ගුණයන්ගෙන් පිරිහෙමින් ලෝකයේ නන් දෙසින් ගලා එන මිථ්‍යා මතවලට ඇබ්බැහි වෙමින් ධර්‍මයට පිටුපායන්නා සේ පෙනෙන්නට ඇත.

භාග්‍යයකට මෙන් මෑතෙක සිට ධර්‍මධර ස්වාමීන් වහන්සේලා සහ උගත් ගිහි උතුමන් විසින්ද ධර්‍මය උගන්නවුන්ගේ ප්‍රයෝජනය පිණිස හෙළ බසින් දහම් පත් පොත් මුද්‍රණය කරවා පළකර හැරීමත් ධර්‍ම පන්ති පැවැත්වීමත් නිසා ගිහි පින්වතුන්හට ධර්‍මය උගෙනීමට මගක් සැලසී ඇතිබව සඳහන් කළයුතුය.

මෙයට දසවසකට පමණ පෙර කොළඹ තරුණ බෞද්ධ සමිතියේ එවකට ප්‍රධාන ලේකම් ධුරය දැරූ සී. ටී. පෙරේරා මහත්මාටද ධර්‍ම පන්තියක් ඇරඹීමේ අවශ්‍යතාවය වැටහී අපට ආරාධනා කෙළෙන් වර්‍ෂ 1954 ක් වූ මැයි මස 3 වන දින කොළඹ තරුණ බෞද්ධ සමිති ශාලාවේදී **"පරමාර්‍ථ ධර්‍ම පන්තිය"** නමින් ධර්‍ම පන්තියක් අරඹා එතැන් සිට අද වන තෙක් නොකඩවා සති පතා එම ධර්‍ම පන්ති පවත්වාගෙන යමි. අභිධර්‍මාර්‍ථ සංග්‍රහය අනුව යමින් එහි ඇතුළු ධර්‍මයන් හැකිතාක් ලිහිල් බසින් විස්තර කරදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඒ ධර්‍ම කොටස් එම ආකාරයෙන්ම මුද්‍රණය කොට පළකළහොත් ලක්දිව නොයෙක් පළාත්වල සිටින පින්වතුනටද ඉන් මහත්සේ ඵල ලැබිය හැකි බව බොහෝ දෙනාගේ අදහස වූයෙන් එම පාඩම් මුද්‍රණය කොට ධර්‍මදානයක් වශයෙන් නොමිළයේ බෙදා හැරීමට සී. ටී. පෙරේරා මහත්මාම ඉදිරිපත් විය. කටයුතු අධික දුෂ්කර කාලයක් වූයේ වී නමුත් බොහෝ දෙනාට වන ධර්‍ම ලාභය සලකා ධර්‍ම පත්‍රිකා ලියා දීමට භාර ගෙන අවකාශ ඇති පරිදී එය කර දුනිමි. සුළු

වශයෙන් කිරීමට අදහස් කළ කටයුත්ත විස්තර ඇතිව ධර්මය උගෙනීමට කැමති පින්වතුන් ඇතිබව දැනගන්නට ලැබුන හෙයින් අපට ඇති අනවකාශයත් ප්‍රකාශක හවතුන් හට දරන්නට සිදුවන වියදමත් නොසලකා ධර්ම ලාභයම සලකා පිටු දෙදහසකට අධිකවූ ප්‍රමාණයක් ලියා මුද්‍රණය කරවා නොමිලයේ බෙදා හරින්නට හැකි විය මේ පත්‍රිකා පිළිවෙළින් මුද්‍රණය කරවා බෙදා හරින්නට සී. ටී. පෙරේරා මහත්මා දැරූ උත්සාහයත් වියදම් කළ ප්‍රමාණයත් බොහෝය. මේ ධර්ම දානමය පුණ්‍යකර්මයෙහි ඇති වැදගත්කම වටහාගත් වෙනත් සැදැහැවතුන් විසින්ද නොයෙක් වර මුදල් පරිත්‍යාග කිරීම ආදියෙන් ඒ මහත්මාට අනුබල දුන් බවද සතුටින් සඳහන් කළ යුතුය. පිටු 500 කින් පමණ යුත් අවසාන පරිච්ඡේදය කොළඹ තරුණ බෞද්ධ සමිතියේ පාලක මණ්ඩලය භාර ගෙන ඒ සමිතියේ වියදමින් මුද්‍රණය කරවා දීම මේ සත්කෘත්‍යයට විශෙෂ රුකුලක් විය:

වර්ෂ 1959 දි ආරම්භ කළ **"පරමාර්ථ ධර්ම පත්‍රිකා"** සියල්ල මුද්‍රණය කිරීමත් බෙදා හැරීමත් පුරා අවුරුදු සතරක් මුළුල්ලේම සිදු විය. එක් වරකට මුද්‍රණය කළ හැකි වූයේ පත්‍රිකා සීමා සහිත ප්‍රමාණයක් බැවින් පසුව මේ ධර්මය උගන්නට අදහස් කළ පින්වතුන්හට මුල් පරිච්ඡේද ලබා ගැනීමට නොහැකිවූයෙන් නැවතත් එය මුද්‍රණය කරවා දෙන ලෙස නොයෙක් පළාත්වලින් ආරාධනා ලදිමි. එහෙයිනි මේ පොත මෙසේ මුද්‍රණය කරවන්නට සිදුවූයේ.

අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි එන ධර්මයන් පිළිබඳ විස්තර විවරණයක් මෙහි ඇතුළත් කළ හෙයින් මේ පොතට **"අභිධර්මාර්ථ ප්‍රදීපිකා"** යන නාම යෙදුවෙමු. අභිධර්මාර්ථ සංග්‍රහ පාලියත්, එහි භාවයත් ඒ ඒ පරිච්ඡේද වලට මුලින් යොදා ඇත. කාණ්ඩ සතරක් හැටියට පළ වන මේ ග්‍රන්ථයෙහි පළමු කාණ්ඩයෙහි **චිත්ත සංග්‍රහ විභාග** නම් වූ ප්‍රථම පරිච්ඡේදයද, **චෛතසික සංග්‍රහ විභාග** නම් වූ ද්විතිය පරිච්ඡේදයද, **ප්‍රකීර්ණක සංග්‍රහ විභාග** නම් වූ තෘතිය පරිච්ඡේදයද, **වීථි සංග්‍රහ විභාග** නම් වූ

චතුර්ථ පරිච්ඡේදයද, **විථිමුක්ත සංග්‍රහ විභාග** නම් වූ පඤ්චම පරිච්ඡේදයද ඇතුලත් වේ. දෙවන කාණ්ඩයෙහි **රූප සංග්‍රහ විභාග** නම් වූ ඡට්ඨම පරිච්ඡේදය සහ **සමුච්චය සංග්‍රහ විභාග** නම් වූ සප්තම පරිච්ඡේදයද, තුන්වන කාණ්ඩයෙහි **ප්‍රත්‍යය සංග්‍රහ විභාග** නම් වූ අෂ්ටම පරිච්ඡේදයද, සතරවන කාණ්ඩයෙහි **කර්මස්ථාන විභාග** නම් වූ නවවන පරිච්ඡේදයද ඇතුලත් වේ.

මේ පොත ලිවීමේදී **විශුද්ධි මාර්ගය, අත්ථසාලිනී** නම් වූ **දම් සඟුණු අටුවාව, විභඞ්ග අටුවාව** ආදි අභිධර්ම ග්‍රන්ථ උපයෝගී කරගත් බව සඳහන් කරනු කැමැත්තෙමි.

විශෙෂයෙන් පාලි භාෂාවෙහි වැඩි දැනීමක් නැති පින්වතුන්ගේ ප්‍රයොජනය සලකා මේ ධර්ම විවරණය හැකිතාක් ලිහිල් බසින් ලියා ඇති බවත් පෙළ අටුවාවන්හි එන පාලිපාඨ මෙහි නොයෙදූ බවත් සලකනු මැනවි.

මේ පොත හදාරන භවතුනට අභිධර්මය පිළිබඳ යම් කිසි දැනීමක් ඇති කර ගත හැකි වූයේ නම් එයම අපගේ වෑයමේ ප්‍රතිඵලයක් හැටියට සලකමි.

මෙබඳු ග්‍රන්ථයක් ලියන්නට තරම් අවශ්‍ය මූලික ශාස්ත්‍ර ඥානයත්, ධර්ම ඥානයත් ජීවිතයේ මුල් අවධියේම මට ලබා දුන් මා ගුරුදෙව් **දන්ගෙදර සිරි සරණපාල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** සහ ධර්ම සාකච්ඡාදියෙන් මට පිහිට වූ **පැලෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්** නමස්කාරපූර්ව කෘතඥතායෙන් සිහිකොට පින් දෙමි. එසේම නෑසිහිය මා දෙමාපිය ගුරුවරාදීන්ටද මෙහි පින් අනුමෝදන් කරවමි.

මේ කාණ්ඩයට විශෙෂ පෙර වදනක් ලියා දෙමින් මට අනුග්‍රහ කළ වජිරාරාම වාසි **පියදස්සි** හිමිපාණන්ට ද, සෝදුපත් බලා දුන් පින්වතුන්ට හා ප්‍රකාශක භවතුන්ට ද කෘතඥ වෙමි.

**සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !**

**අමරදාස රත්නපාල**

1964 මාර්තු 23 වැනිදා කොළඹදීය

# පටුන

## කර්මස්ථාන විභාග නම් වූ
## නවම පරිච්ඡේදය


| | පිටුව |
|---|---|
| පෙළ | 1 |
| භාවය | 11 |
| **සමථ විපස්සනා භාවනා** | 21 |
| සමථ භාවනාව | 22 |
| සමාධිය වැඩිය යුතු පිළිවෙළ | 31 |
| සතළිස් කර්මස්ථාන | 44 |
| නුසුදුසු විහාර | 51 |
| සුදුසු විහාර | 54 |
| කුඩා පිළිබොධ | 54 |
| පඨවි කසිණ භාවනාව | 55 |
| ප්‍රතිභාග නිමිත්ත රැක ගැනීම | 57 |
| දසවිධ අපිණා කෞශල්‍යයෝ | 59 |
| ප්‍රථම ධ්‍යානය | 65 |
| ප්‍රතිභාග නිමිත්ත වඩන පිළිවෙළ | 72 |
| පඤ්ච විධ වශීය | 73 |
| ද්විතීය ධ්‍යානය | 74 |
| තෘතීය ධ්‍යානය | 75 |
| දශවිධ උපෙක්ෂා | 77 |
| චතුර්ථ ධ්‍යානය | 79 |
| ආපො කසිණ භාවනාව | 80 |
| තෙජෝ කසිණ භාවනාව | 81 |
| වායො කසිණ භාවනාව | 82 |
| නීල කසිණ භාවනාව | 82 |

පීත කසිණ භාවනාව 83

ලොහිත කසිණ භාවනාව 83

ඕදාත කසිණ භාවනාව 83

ආලොක කසිණ භාවනාව 83

ආකාස කසිණය 84

කසිණ මල 84

දස අසුභ කර්මස්ථාන භාවනා 86

දස අනුස්සති කර්මස්ථාන භාවනා 92

**1. බුද්ධානුස්සතිය** 92

අරහ නම්වූ ගුණය 94

සම්මා සම්බුද්ධ නම්වූ ගුණය 95

විජ්ජාචරණසම්පන්න නම්වූ ගුණය 96

සුගත නම්වූ ගුණය 98

ලොකවිදූ නම්වූ ගුණය 99

අනුත්තර පුරිසදම්මසාරථි නම්වූ ගුණය 102

සත්ථාදෙවමනුස්සානං නම්වූ ගුණය 103

බුද්ධ නම්වූ ගුණය 104

භගවා නම්වූ ගුණය 105

බුද්ධානුස්සතියෙහි අනුසස් 110

**2. ධම්මානුස්සතිය** 111

ස්වාක්ඛාත නම්වූ ගුණය 111

සන්දිට්ඨික නම්වූ ගුණය 115

අකාලික නම්වූ ගුණය 116

එහිපස්සික නම්වූ ගුණය 116

ඔපනයික නම්වූ ගුණය 117

පච්චත්තංවෙදිතබ්බොවිඤ්ඤූහි නම්වූ ගුණය 117

ධම්මානුස්සතියෙහි අනුසස් 118

| | |
|---|---|
| **3. සංඝානුස්සතිය** | 118 |
| සුපටිපන්න නම්වූ ගුණය | 119 |
| උජුපටිපන්න නම්වූ ගුණය | 120 |
| ඤායපටිපන්න නම්වූ ගුණය | 121 |
| සාමීචිපටිපන්න නම්වූ ගුණය | 121 |
| ආහුනෙය්‍ය නම්වූ ගුණය | 122 |
| පාහුනෙය්‍ය නම්වූ ගුණය | 122 |
| දක්ඛිණෙය්‍ය නම්වූ ගුණය | 122 |
| අඤ්ජලිකරණීය නම්වූ ගුණය | 123 |
| අනුත්තර පින්කෙත නම්වූ ගුණය | 123 |
| සංඝානුස්සතියෙහි අනුසස් | 123 |
| **4. සීලානුස්සතිය** | 124 |
| සීලානුස්සතියෙහි අනුසස් | 126 |
| **5. චාගානුස්සතිය** | 126 |
| **6. දෙවතානුස්සතිය** | 128 |
| **7. මරණානුස්සතිය** | 130 |
| **8. කායගතාසතිය** | 145 |
| **9. ආනාපාන සතිය** | 180 |
| ආනාපාන සතිය වඩන පිළිවෙළ | 183 |
| ප්‍රථම චතුෂ්කය | 187 |
| ද්විතීය චතුෂ්කය | 206 |
| තෘතීය චතුෂ්කය | 211 |
| චතුර්ථ චතුෂ්කය | 215 |
| ආනාපාන සති භාවනායෙහි අනුසස් | 219 |
| **10. උපසමානුස්සතිය** | 221 |
| සතර බ්‍රහ්ම විහාර භාවනා | 226 |
| මෛත්‍රී භාවනාව | 230 |
| මෛත්‍රී භාවනාවෙහි අනුසස් | 258 |

කරුණා භාවනාව 262

මුදිතා භාවනාව 264

උපෙක්ෂා භාවනාව 265

දස ඥාන බල 270

චතුර්වෛශාරද්‍ය ඥානය 271

ෂට් අසාධාරණ ඥාන 271

**සතර අරූප ධ්‍යාන** 273

ආකාසානඤ්චායතන ධ්‍යානය 273

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය 280

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය 281

නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය 283

ආහාරෙ පටික්කූල සඤ්ඤා භාවනාව 290

චතුධාතුවවත්ථාන භාවනාව 301

චතුධාතු සමුට්ඨානය 317

රූපකලාප හා රූපවිභාගය 319

**පඤ්චාභිඥා** 336

ඍද්ධි විධඥානය 336

අධිට්ඨාන ඍද්ධිය 353

විකුර්වණ ඍද්ධිය 380

මනොමය ඍද්ධිය 381

දිව්‍යශ්‍රොත ඥානය 381

පරචිත්ත විජානන ඥානය 384

පුබ්බෙනිවාසානුස්සති ඥානය 389

චුතූපපාත ඥානය 395

සප්ත අභිඥා 403

**විපස්සනා භාවනා** 413

ප්‍රඥාවෙහි ප්‍රභෙද 414

ප්‍රඥා භාවනා වැඩීම 423

| | |
|---|---|
| **1. ශීල විශුද්ධිය** | 426 |
| සීලයෙහි ප්‍රභේද | 428 |
| ප්‍රාතිමොක්ෂ සංවර සීලය | 436 |
| ඉන්ද්‍රිය සංවර සීලය | 443 |
| ආජීව පාරිශුද්ධි සීලය | 447 |
| සවැදෑරුම් ශික්ෂාපද | 447 |
| කුහනා | 448 |
| ලපනා | 451 |
| නෙමිත්තිකතා | 453 |
| නිප්පෙසිකතා | 455 |
| ලාභෙන ලාභං නිජිගිංසනතා | 456 |
| ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය | 458 |
| චීවර පරිභෝගය | 458 |
| පිණ්ඩපාත පරිභෝගය | 459 |
| සෙනාසන පරිභෝගය | 461 |
| ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝගය | 462 |
| සතර සංවර සීලය සැපයිය යුතු පිළිවෙල | 463 |
| ප්‍රහාණය කළයුතු ධර්ම හා ප්‍රහාණ මාර්ග | 476 |
| සීලය කිළිටිවීම හා පිරිසුදුවීම | 479 |
| සීලයාගේ පිරිසුදු බව | 482 |
| සීලසම්පත්තියෙහි ආනිසංස | 486 |
| **2. චිත්ත විශුද්ධිය** | 487 |
| **3. දිට්ඨි විශුද්ධිය** | 488 |
| චතුධාතු වශයෙන් පරිග්‍රහ කිරීම | 489 |
| අටළොස් ධාතු වශයෙන් පරිග්‍රහ කිරීම | 392 |
| ද්වාදසායතනයන්ගේ වශයෙන් පරිග්‍රහ කිරීම | 494 |
| ස්කන්ධ වශයෙන් පරිග්‍රහ කිරීම | 494 |
| සංක්ෂෙප වශයෙන් නාමරූප පරිග්‍රහ කිරීම | 495 |

| | |
|---|---|
| **4. කඞ්ඛාවිතරණ විසුද්ධිය** | 503 |
| **5. මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය** | 513 |
| ත්‍රිවිධ පරිඥා | 514 |
| කලාප සම්මර්ශනය | 515 |
| සතළිස් ආකාරයෙන් සම්මර්ශනය කිරීම | 520 |
| අරූප සම්මර්ශනය | 531 |
| රූප සප්තකය | 533 |
| අරූප සප්තකය | 541 |
| දස විදර්ශනොපක්ලෙශ | 552 |
| **6. ප්‍රතිපදාඤාණ දස්සන විසුද්ධිය** | 558 |
| 1. උදයව්‍යයානු දර්ශන ඥානය | 559 |
| 2. භඞ්ගානු දර්ශන ඥානය | 560 |
| 3. භයතූපට්ඨාන ඥානය | 564 |
| 4. ආදීනවානුදර්ශනා ඥානය | 565 |
| 5. නිබ්බිදානු දර්ශනා ඥානය | 569 |
| 6. මුඤ්චිතුකම්‍යතා ඥානය | 569 |
| 7. පටිසඞ්ඛානු දර්ශනා ඥානය | 570 |
| 8. සඞ්ඛාරොපෙක්ෂා ඥානය | 572 |
| ත්‍රිවිධ විමොක්ෂමුඛ | 577 |
| සප්තාර්ය්‍ය පුද්ගලයෝ | 578 |
| 9. සත්‍යානුලොම ඥානය | 587 |
| **7. ඥාන දර්ශන විසුද්ධිය** | 588 |
| ඥාණදස්සන විසුද්ධියේ ආනුභාවය | 601 |
| පරිපූර්ණ බොධි පාක්ෂික භාවය | 601 |
| වුට්ඨාන බලසමායොගය | 606 |
| ක්ලෙශ ප්‍රහාණය | 607 |
| ප්‍රඥා භාවනායෙහි අනුසස් | 619 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## නවමො පරිච්ඡෙදො

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

## කම්මට්ඨාන සඞ්ගහ විභාගො

1. සමථ විපස්සනානං – භාවනාන මිතො පරං
කම්මට්ඨානං පවක්ඛාමි – දුවිධම්පි යථාක්කමං.

2. තත්ථ සමථ සඞ්ගහෙ තාව දසකසිණානි, දස අසුභා, දස අනුස්සතියො, චතස්සො අප්පමඤ්ඤායො, එකා සඤ්ඤා, එකං වවත්ථානං, චත්තාරො ආරුප්පා චෙති සත්තවිධෙන සමථ කම්මට්ඨාන සඞ්ගහො.

3. රාග චරිතා, දොස චරිතා, මොහ චරිතා, සද්ධා චරිතා, බුද්ධි චරිතා, විතක්ක චරිතා, චෙති ඡබ්බිධෙන චරිත සඞ්ගහො.

4. පරිකම්ම භාවනා, උපචාර භාවනා, අප්පනා භාවනා චෙති තිස්සො භාවනා.

5. පරිකම්ම නිමිත්තං, උග්ගහ නිමිත්තං, පටිභාග නිමිත්තං චෙති තීණි නිමිත්තානි වෙදිතබ්බානි, කථං.

6. පඨවි කසිණං, ආපො කසිණං, තෙජො කසිණං, වායො කසිණං, නීල කසිණං, පීත කසිණං, ලොහිත කසිණං ඕදාත කසිණං, ආකාශ කසිණං, ආලොක කසිණං චෙති ඉමානි දස කසිණානි නාම.

7. උද්ධුමාතකං, විනීලකං, විපුබ්බකං, විච්ඡිද්දකං, වික්ඛායිතකං, වික්ඛිත්තකං, හතවික්ඛිත්තකං, ලොහිතකං, පුළවකං, අට්ඨිකං චෙති ඉමෙ දස අසුභානාම.

8. බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතාසති, ආනාපානසති, චෙති ඉමා දස අනුස්සතියො නාම.

9. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා චෙති ඉමා චතස්සො අප්පමඤ්ඤායො නාම. බ්‍රහ්ම විහාරොති ච පවුච්චති.

10. ආහාරෙ පටික්කූල සඤ්ඤා එකා සඤ්ඤා.

11. චතුධාතු වවත්ථානං එකං වවත්ථානං.

12. ආකාසානඤ්චායතනාදයො චත්තාරො ආරුප්පනාමාති සබ්බථාපි සමථ නිද්දෙසෙ චත්තාලීස කම්මට්ඨානානි භවන්ති.

13. චරිතාසු පන දස අසුභා කායගතා සති සඞ්ඛාතා කොට්ඨාස භාවනාච රාගචරිතස්ස සප්පායා.

14. චතස්සො අප්පමඤ්ඤායො නීලාදිනිච චත්තාරි කසිණානි දොසචරිතස්ස.

15. ආනාපානං මොහචරිතස්ස විතක්ක චරිතස්සච.

16. බුද්ධානුස්සති ආදයො ඡ සද්ධාචරිතස්ස.

17. මරණ උපසමසඤ්ඤා වවත්ථානානි බුද්ධිචරිතස්ස.

18. සෙසානි පන සබ්බානිපි කම්මට්ඨානානි සබ්බෙසම්පි සප්පායානි, තත්ථාපි කසිණෙසු පුථුලං මොහචරිතස්ස, ඛුද්දකං විතක්කචරිතස්සෙවාති.

**අයමෙත්ථ සප්පාය භෙදො**

19. භාවනාසු පන සබ්බත්ථාපි පරිකම්ම භාවනා ලබ්භතෙව.

20. බුද්ධානුස්සති ආදිසු අට්ඨසු සඤ්ඤා වවත්ථානෙසු චාති දසසු කම්මට්ඨානෙසු උපචාර භාවනාව සම්පජ්ජති. නත්ථි අප්පනා.

21. සෙසෙසු පන සමතිංස කම්මට්ඨානෙසු අප්පනා භාවනාපි සම්පජ්ජති.

22. තත්ථාපි දසකසිණානි ආනාපානඤ්ච පඤ්චකජ්ඣානිකානි.

23. දස අසුභා කායගතා සති ච පඨමජ්ඣානිකා.

24. මෙත්තාදයො තයො චතුක්කජ්ඣානිකා.

25. උපෙක්ඛා පඤ්චමජ්ඣානිකාති ඡබ්බීසති රූපාවචරජ්ඣානිකානි කම්මට්ඨානානි.

26. චත්තාරො පන ආරුප්පා ආරුප්පජ්ඣානිකාති.

**අයමෙත්ථ භාවනා භෙදො**

27. නිමිත්තෙසු පන පරිකම්මනිමිත්තං උග්ගහනිමිත්තං ච සබ්බත්ථාපි යථාරහං පරියායෙන ලබ්භන්තෙව.

28. පටිභාග නිමිත්තං පන කසිණාසුභකොට්ඨාසානාපානෙස්වෙව ලබ්භති. තත්ථ හි පටිභාගනිමිත්තමාරබ්භ උපචාර සමාධි අප්පනා සමාධිච පවත්තන්ති.

29. කථං. ආදිකම්මිකස්ස හි පඨවි මණ්ඩලාදිසු නිමිත්තං උග්ගණ්හන්තස්ස තමාරම්මණං පරිකම්ම නිමිත්තන්ති පවුච්චති, සා ච භාවනා පරිකම්ම භාවනා නාම.

30. යදා පන තං නිමිත්තං චිත්තෙන සමුග්ගහිතං හොති, චක්ඛුනා පස්සන්තස්සෙව මනොද්වාරස්ස ආපාථමාගතං, තදා තමෙවාරම්මණං උග්ගහ නිමිත්තං නාම සා ච භාවනා සමාධියති.

31. තථා සමාහිතස්ස පනෙතස්ස තතොපරං තස්මිං උග්ගහනිමිත්තෙ පරිකම්ම සමාධිනා භාවනාමනුයුඤ්ජන්තස්ස යදා තප්පටිභාගං වත්ථුධම්ම විමුච්චිතං පඤ්ඤත්ති සඞ්ඛාතං භාවනාමයමාරම්මණං චිත්තෙ සන්නිසින්නං සමප්පිතං හොති තදා තං පටිභාග නිමිත්තං සමුප්පන්නන්ති පවුච්චති

32. තතොපට්ඨාය පරිපන්ථ විප්පහීනා කාමාවචර සමාධි සඞ්ඛාතා උපචාර භාවනා නිප්ඵන්නා නාම හොති.

33. තතොපරං තමෙව පටිභාග නිමිත්තං උපචාර සමාධිනා සම්මා සෙවන්තස්ස රූපාවචර පඨමජ්ඣානමප්පෙති.

34. තතොපරං තමෙව පඨමජ්ඣානං ආවජ්ජනං සමාපජ්ජනං අධිට්ඨානං වුට්ඨානං පච්චවෙක්ඛණාචෙති ඉමාහි පඤ්චහි වසිතාහි වසීභූතං කත්වා විතක්කාදිකමොළාරිකඞ්ගප්පහානාය විචාරාදි සුඛුමඞ්ගුප්පත්තියා පදහතො යථාක්කමං දුතියජ්ඣානාදයො යථාරහමප්පෙන්ති.

35. ඉච්චෙවං පඨවි කසිණාදිසු ද්වාවීසති කම්මට්ඨානෙසු පටිභාග නිමිත්ත මුපලබ්භති.

36. අවසෙසෙසු පන අප්පමඤ්ඤා සත්තපඤ්ඤත්තියං පවත්තන්ති.

37. ආකාසවජ්ජිත කසිණෙසු පන යංකිඤ්චි කසිණං උග්ඝාටෙත්වා ලද්ධමාකාසං අනන්තවසෙන පරිකම්මං කරොන්තස්ස පඨමාරුප්පමප්පෙති.

38. තමෙව පඨමාරුප්පවිඤ්ඤාණං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස දුතියාරුප්පමප්පෙති.

39. තමෙව පඨමාරුප්පවිඤ්ඤාණාභාවං පන නත්ථි කිඤ්චීති පරිකම්මං කරොන්තස්ස තතියාරුප්පමප්පෙති.

40. තතියාරුප්පං සන්තමෙතං පණීතමෙතන්ති පරිකම්මං කරොන්තස්ස චතුත්ථාරුප්පමප්පෙති.

41. අවසෙසෙසුච දසසු කම්මට්ඨානෙසු බුද්ධගුණාදිකමාරම්මණමාරබ්භ පරිකම්මං කත්වා තස්මිං නිමිත්තෙ සාධුකමුග්ගහිතෙ තත්ථෙව පරිකම්මඤ්ච සමාධියති උපචාරො ච සම්පජ්ජති.

42. අභිඤ්ඤාවසෙන පවත්තමානං පන රූපාවචර පඤ්චමජ්ඣානං අභිඤ්ඤා පාදක පඤ්චමජ්ඣානා වුට්ඨහිත්වා අධිට්ඨෙය්‍යාදිකමාවජ්ජෙත්වා පරිකම්මං කරොන්තස්ස රූපාදිසු ආරම්මණෙසු යථාරහමප්පෙති.

43. අභිඤ්ඤාච නාම:-

ඉද්ධිවිධං දිබ්බසොතං – පරචිත්ත විජානනා
පුබ්බෙනිවාසානුස්සති – දිබ්බචක්ඛූති පඤ්චධා.

**අයමෙත්ථ ගොචර භෙදො**

**නිට්ඨිතො ච සමථ කම්මට්ඨාන නයො**

---

44. විපස්සනා කම්මට්ඨානෙ පන සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි, පටිපදාඤාණ දස්සන විසුද්ධි, ඤාණදස්සන විසුද්ධි චෙති සත්තවිධෙන විසුද්ධි සඞ්ගහො.

45. අනිච්චලක්ඛණං, දුක්ඛලක්ඛණං, අනත්තලක්ඛණං චෙති තීණි ලක්ඛණානි.

46. අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා චෙති තිස්සො අනුපස්සනා.

47. සම්මසනඤාණං, උදයව්‍යයඤාණං, භඞ්ගඤාණං, භයඤාණං, ආදීනවඤාණං, නිබ්බිදාඤාණං, මුඤ්චිතුකම්‍යතා ඤාණං, පටිසඞ්ඛාඤාණං, සඞ්ඛාරුපෙක්ඛාඤාණං, අනුලොම ඤාණං චෙති දසවිපස්සනාඤාණානි.

48 සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො චෙති තයො විමොක්ඛා.

49 සුඤ්ඤතානුපස්සනා, අනිමිත්තානුපස්සනා අප්පණිහිතානුපස්සනා චෙති තීණි විමොක්ඛ මුඛානි ච වෙදිතබ්බානි.

50. කථං. පාතිමොක්ඛසංවරසීලං, ඉන්ද්‍රියසංවරසීලං, ආජීවපාරිසුද්ධිසීලං, පච්චයසන්නිස්සිත සීලං චෙති චතුපාරි සුද්ධි සීලං සීලවිසුද්ධි නාම.

51. උපචාරසමාධි අප්පණාසමාධි චෙති දුවිධොපි සමාධි චිත්තවිසුද්ධි නාම.

52. ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානවසෙන නාම-රූප පරිග්ගහො දිට්ඨි විසුද්ධි නාම.

53 තෙසමෙව ච නාම රූපානං පච්චය පරිග්ගහො කඞ්ඛාවිතරණ විසුද්ධි නාම.

54. තතොපරං පන තථා පරිග්ගහිතෙසු සප්පච්චයෙසු තෙභූමික සඞ්ඛාරෙසු අතීතාදි භෙදභින්නෙසු ඛන්ධාදිනය-මාරබ්භ කලාපවසෙන සඞ්ඛිපිත්වා "අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනං" ති අද්ධාන වසෙන, සන්තති වසෙන, ඛණවසෙනවා සම්මසන-ඤාණෙන ලක්ඛණත්තයං සම්මසන්තස්ස තෙසඤ්ච පච්චය වසෙන, ඛණවසෙනච උදයබ්බයඤාණෙන උදයබ්බයං සමනුපස්සන්තස්සච:

ඔභාසො පීති පස්සද්ධි – අධිමොක්ඛො ච පග්ගහො
සුඛං ඤාණමුපට්ඨාන – මුපෙක්ඛා ච නිකන්ති චෙති,

ඔභාසාදි විපස්සනුපක්කිලෙස පරිපන්ථ පරිග්ගහ වසෙන මග්ගාමග්ග ලක්ඛණ වවත්ථානං මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි නාම.

55. තථා පරිපන්ථ විමුත්තස්ස පන උදයබ්බයඤාණතො පට්ඨාය යාවානුලොමා තිලක්ඛණං විපස්සනා පරම්පරාය පටිපජ්ජන්තස්ස නව විපස්සනාඤාණානි පටිපදාඤාණදස්සන විසුද්ධි නාම.

56 තස්සෙවං පටිපජ්ජන්තස්ස පන විපස්සනා පරිපාකමාගම්ම ඉදානි අප්පනා උප්පජ්ජිස්සතීති භවඞ්ගං වොච්ඡින්දිත්වා උප්පන්න මනොද්වාරාවජ්ජනානන්තරං ද්වෙ තීණි විපස්සනා චිත්තානි යංකිඤ්චි අනිච්චාදි ලක්ඛණමාරබ්භ පරිකම්මොපචාරානුලොම නාමෙන පවත්තන්ති. යා සිඛාප්පත්තා සා සානුලොමා, සඞ්ඛාරුපෙක්ඛා වුට්ඨානගාමිනී විපස්සනාති පවුච්චති.

57. තතොපරං ගොත්‍රභුචිත්තං නිබ්බානමාලම්බිත්වා පුථුජ්ජනගොත්තමභිභවන්තං අරියගොත්තමභිසම්භොන්තංච පවත්තති.

58. තස්සානන්තරමෙව මග්ගො දුක්ඛසච්චං පරිජානන්තො සමුදය සච්චං පජහන්තො නිරොධ සච්චං සච්ඡිකරොන්තො මග්ග සච්චං භාවනාවසෙන අප්පනා වීථිමොතරති. තතොපරං ද්වෙ තීණි ඵලචිත්තානි පවත්තිත්වා භවඞ්ගපාතොව හොති.

59 පුන භවඞ්ගං වොච්ඡින්දිත්වා පච්චවෙක්ඛණ ඤාණානි පවත්තන්ති.

> මග්ගං ඵලං ච නිබ්බානං – පච්චවෙක්ඛති පණ්ඩිතො
> හීනෙ කිලෙසෙ සෙසෙ ච – පච්චවෙක්ඛති වා නවා.

60. ඡබ්බිසුද්ධික්කමෙනෙවං – භාවෙතබ්බො චතුබ්බිධො
ඤාණ දස්සන විසුද්ධි – නාම මග්ගො පවුච්චති.

අය මෙත්ථ විසුද්ධි භෙදො

---

61. තත්ථ අනත්තානුපස්සනා අත්තාභිනිවෙසං මුඤ්චන්ති. සුඤ්ඤතානුපස්සනානාම විමොක්ඛමුඛං හොති.

62. අනිච්චානුපස්සනා විපල්ලාසනිමිත්තං මුඤ්චන්ති. අනිමිත්තානුපස්සනානාම විමොක්ඛමුඛං හොති.

63. දුක්ඛානුපස්සනා තණ්හා පණිධිං මුඤ්චන්ති. අප්පණිහිතානුපස්සනානාම විමොක්ඛ මුඛං හොති.

64. තස්මා යදි වුට්ඨානගාමිනී විපස්සනා අනත්තතො විපස්සති. සුඤ්ඤතො විමොක්ඛො නාම හොති මග්ගො.

65. යදි අනිච්චතො විපස්සති අනිමිත්තො විමොක්ඛො නාම.

66. යදි දුක්ඛතො විපස්සති අප්පණිහිතො විමොක්ඛො නාමාති ච මග්ගො විපස්සනා ගමන වසෙන තීණි නාමානි ලභති. තථා ඵලංච මග්ගාගමන වසෙන මග්ගවීථියං.

67. ඵලසමාපත්ති වීථියං පන යථාවුත්තනයෙන විපස්සන්තානං යථාසකං ඵලමුප්පජ්ජමානම්පි විපස්සනා ගමන වසෙනෙව සුඤ්ඤතාදි විමොක්ඛාති ච පවුච්චති.

68. ආරම්මණ වසෙන පන සරසවසෙන ච නාමත්තයං සබ්බත්ථ සබ්බෙසම්පි සමමෙවාති

**අයමෙත්ථ විමොක්ඛ භෙදො**

---

69. එත්ථපන සොතාපත්ති මග්ගං භාවෙත්වා දිට්ඨිවිචිකිච්ඡාප්පහාණෙන පහීණාපායගමනො සත්තක්ඛත්තුපරමො සොතාපන්නොනාම හොති.

70. සකදාගාමි මග්ගං භාවෙත්වා රාගදොස මොහානං තනුකරත්තා සකදාගාමී නාම හොති. සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා.

71. අනාගාමි මග්ගං භාවෙත්වා කාමරාග ව්‍යාපාදානං අනවසෙසප්පහාණෙන අනාගාමි නාම හොති අනාගන්තා ඉත්ථත්තං.

72. අරහත්ත මග්ගං භාවෙත්වා අනවසෙස කිලෙසප්පහාණෙන අරහානාම හොති. ඛීණාසවො ලොකෙ අග්ගදක්ඛිණෙය්‍යොති.

## අයමෙත්ථ පුග්ගල භෙදො

73. සමාපත්ති වීථියො පනෙත්ථ සබ්බෙසම්පි යථා සක ඵලවසෙන සාධාරණාව.

74. නිරොධ සමාපත්ති සමාපජ්ජනං පන අනාගාමිනං චෙව අරහන්තානං ච ලබ්භති. තත්ථ යථාක්කමං පඨමජ්ඣානාදි මහග්ගත සමාපත්තිං සමාපජ්ජිත්වා වුට්ඨාය තත්ථ ගතෙ සඞ්ඛාරධම්මෙ තත්ථ තත්ථෙව විපස්සන්තො යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා තතො පරං අධිට්ඨෙය්‍යාදිකං පුබ්බ කිච්චං කත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජති. තස්ස විත්තං අප්පණාජවනානං පරතො වොච්ඡිජ්ජති චිත්ත සන්තති, තතො නිරොධ සමාපන්නො නාම හොති

75. වුට්ඨානකාලෙපන අනාගාමිනො අනාගාමිඵල චිත්තං අරහතො අරහත්තඵල චිත්තං එකවාරමෙව පවත්තිත්වා භවඞ්ග පාතො හොති. තතොපරං පච්චවෙක්ඛණ ඤාණං පවත්තති

## අයමෙත්ථ සමාපත්ති භෙදො

## නිට්ඨිතොච විපස්සනා කම්මට්ඨාන නයො

76. භාවෙතබ්බං පතිච්චෙවං – භාවනාද්වය මුත්තමං
පටිපත්ති රසස්සාදං – පත්ථයන්තෙන සාසනෙ

**ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ කම්මට්ඨාන සඞ්ගහ විභාගො නාම නවමො පරිච්ඡෙදො**

77. චාරිත්ත සොභිත විසාල කුලොදයෙන
සද්ධාභිවුඩ්ඪපරිසුද්ධ ගුණොදයෙන
නම්බව්හයෙන පණිධාය පරානුකම්පං
යං පත්ථිතං පකරණං පරිනිට්ඨිතං තං

78. පුඤ්ඤෙන තෙන විපුලෙන තු මූලසොමං
ධඤ්ඤාධිවාස මුදිතොදිතමායුගන්තං
පඤ්ඤාවදාතගුණ සොභිතලජ්ජිභික්ඛූ
මඤ්ඤන්තු පුඤ්ඤ විභවොදය මඞ්ගලාය.

**ඉති අනුරුද්ධාචරියෙන රචිතං අභිධම්මත්ථ සඞ්ගහංනාම පකරණං නිට්ඨිතං**

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහය

## නවම පරිච්ඡේදය

## කර්මස්ථාන සංග්‍රහ විභාගය

### (භාවනා)

1 මින් මත්තෙහි සමථ විදර්ශනා භාවනාවන්ගේ දෙවැදෑරුම් කමටහන් පිළිවෙලින් කියන්නෙමි.

2. එහි සමථ සංග්‍රහයෙහි පළමු කොට දසකසිණයෝය, දස අසුභයෝය, දස අනුස්සතියෝය, සතර අප්‍රමාණ්‍යයෝය, එක් සංඥාවක්ය, එක් ව්‍යවස්ථානයක්ය, සතර ආරූප්‍යයෝයයි සප්ත ප්‍රකාරයකින් සමථ කර්මස්ථාන සංග්‍රහය දතයුතු.

3 රාග චරිතය, ද්වේෂ චරිතය, මෝහ චරිතය, සද්ධා චරිතය, බුද්ධි චරිතය, විතර්ක චරිතය, යයි ෂඩාකාරයකින් චරිත සංග්‍රහය දතයුතු

4. පරිකර්ම භාවනාය, උපචාර භාවනාය, අර්පණා භාවනා යයි භාවනාවෝ තිදෙනෙක.

5. පරිකර්ම නිමිත්තය, උග්ගහ නිමිත්තය, ප්‍රතිභාග නිමිත්තයයි තුන් නිමිත්තයන් දතයුත්තාහුය. කෙසේද?

6. පඨවි කසිණය, ආපෝ කසිණය, තේජෝ කසිණය, වායෝ කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, ඕදාත කසිණය, ආකාස කසිණය, ආලෝක කසිණය යන මොවුහු දස කසිණයෝ නම් වෙත්.

7. උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලොහිතකය, පුලවකය, අට්ඨිකය යන මොවුහු දස අසුභයෝ නම් වෙත්.

8 බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සඞ්ඝානුස්සතිය, සීලානුස්සතිය, චාගානුස්සතිය, දෙවතානුස්සතිය, උප-සමානුස්සතිය, මරණානුස්සතිය, කායගතාසතිය, ආනාපාන සතිය යන මොවුහු දස අනුස්සතිහු නම් වෙත්.

9. මෛත්‍රිය, කරුණාය, මුදිතාය, උපෙක්ෂාය යන මොවුහු සතරදෙන අප්‍රමාණ්‍යයෝ නම් වෙත්. බ්‍රහ්ම විහාරයෝ යයි ද කියනු ලැබෙත්.

10. ආහාරයෙහි පිළිකුල් යයි පවත්නා සංඥව එකම සංඥා නම් වේ.

11. සතර ධාතු ව්‍යවස්ථානය එකම ව්‍යවස්ථාන නම් වේ.

12. ආකාසානඤ්චායතනාදී සතර ධ්‍යානයෝ ආරූප්‍යයෝ නම් වෙත්. මෙසේ සප්ත්‍රකාරයෙන් සමථ කර්මස්ථාන නිර්දෙශයෙහි සතළිස් කර්මස්ථානයෝ වෙත්.

13. චරිතයන් අතුරෙන් දස අසුභයෝ ද කායගතාසති නම් වූ කොට්ඨාස භාවනාවද රාගචරිතයාහට සුදුසු වෙත්.

14. සතර අප්‍රමාණ්‍යයන්ද, නීලාදී සතර කසිණයන්ද ද්වේෂ චරිතයාහටද,

15. ආනාපානසතිය මොහ චරිතයාහටද, විතර්ක චරිතයාහටද,

16. බුද්ධානුස්සති ආදී සය ශ්‍රද්ධා චරිතයාහටද,

17. මරණානුස්සතිය, උපසමානුස්සතිය, ආහාරෙ පටික්කූලසඤ්ඤය, චතුධාතු වවත්ථානය යන මොවුහු බුද්ධි චරිතයාහටද,

18. සෙසු සියළු කර්මස්ථානයෝ සියල්ලන්ටමද සුදුසු වෙත්. එහිදු කසිණයන් අතුරෙන් මහත් වූ කසිණ මෝහ චරිතයාහටද, කුඩා වූ කසිණ විතර්ක චරිතයාහටද සුදුසු වෙත්.

**මෙය මෙහි සප්පාය භෙදයයි**

---

19. භාවනාවන් අතුරෙන් සියළු කර්මස්ථානයන්හි පරිකර්ම භාවනාව ලැබේ.

20. බුද්ධානුස්සති ආදී අටෙහිද, එක සංඥෙ, එක ව්‍යවස්ථානයන්හිද යන දස කර්මස්ථානයන්හි උපචාර භාවනාම සිද්ධවන්නීය. අර්පිණ භාවනාවක් නැත.

21. සෙසු සමතිස් කර්මස්ථානයෙහි අර්පිණා භාවනාවද සිදුවන්නීය.

22. එහිද, දස කසිණයෝද, ආනාපානසතියද ධ්‍යාන පඤ්චකය උපදවත්.

23. දස අසුභයෝද කායගතාසතියද ප්‍රථම ධ්‍යානය උපදවත්.

24. මෛත්‍රි ආදි බ්‍රහමවිහාර තුන ධ්‍යාන චතුෂ්කය උපදවත්.

25. උපෙක්ෂා බ්‍රහමවිහරණය පඤ්චම ධ්‍යානය උපදවයි. මෙසේ රූපාවචර ධ්‍යාන උපදවන කර්මස්ථාන සවිස්සෙක් වෙත්.

26. සතර අරූප කමටහන් අරූපධ්‍යාන උපදවත්.

**මෙය මෙහි භාවනා භෙදයයි.**

---

27. නිමිත්තයන් අතුරෙන් පරිකර්ම නිමිත්තද උග්ගහ නිමිත්තද සියලු කමටහන්හිම සුදුසු පරිදි පරියාය වශයෙන් ලැබේ.

28. පටිභාග නිමිත්ත වනාහි දස කසිණය, දස අසුභය, කේසාදී කොට්ඨාසය, ආනාපාන සතිය යන මෙහිම ලැබේ. එහි ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට උපචාර සමාධිය හා අර්පණා සමාධියද පවතිත්.

29. කෙසේද පඨවි කසිණාදීන්හි අරමුණු ගන්නාවූ ආදිකම්මිකයාහට, ඒ අරමුණ පරිකර්ම නිමිත්ත යයි කියනු ලැබේ. එය අරමුණු කොට ඇති භාවනා චිත්තයද පරිකර්ම භාවනා නම් වේ.

30. යම් කලෙක එම අරමුණ සිතින් මනා කොට ගන්නා ලද්දේ වෙයිද, ඇසින් බලන්නෙකුට මෙන් මනො ද්වාරයට වැටහෙයිද, එකල්හි එම අරමුණ උග්ගහනිමිත්ත නම් වේ. ඒ භාවනාවද සිත එකඟ කරයි.

31. එසේ එකඟ වූ සිත් ඇති ඔහුට ඒ උග්ගහ නිමිත්තයෙහි පරිකර්ම සමාධියෙන් භාවනායෙහි යෙදෙන කල්හි යම් විටෙක ඒ හා සමාන වූ වස්තු ධර්මයෙන් තොරවූ ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත අරමුණක් සිතෙහි පිහිටියේ වෙයිද, එවිට ඒ ප්‍රතිභාග නිමිත්ත උපන්නේයයි කියනු ලැබේ.

32 එතැන් පටන් නීවරණයන්ගෙන් තොරවූ කාමාවචර සමාධි සඞ්ඛ්‍යාත උපචාර භාවනාව නිපන්නී නම් වෙයි.

33. ඉන්පසු ඒ ප්‍රතිභාග නිමිත්ත උපචාර සමාධියෙන් මනාව සේවනය කරන කල්හි රූපාවචර ප්‍රථම ධ්‍යානය උපදී.

34 ඉන්පසු එම ප්‍රථම ධ්‍යානය ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණ යන මේ පඤ්චවශිතායෙන් වශීභූතකොට විතර්කාදී ඖදාරික අඞ්ගයන්ගේ ප්‍රහාණය පිණිස, විචාරාදී සුඛුම අඞ්ගයන්ගේ උත්පාදය පිණිස ව්‍යායාම කරන කල්හි පිළිවෙලින් ද්විතිය ධ්‍යානාදීහු සුදුසු පරිදි උපදිත්

35. මෙසේ පඨවි කසිණාදී වූ දෙවිසි කම්සථානයන්හි ප්‍රතිභාග නිමිත්ත ලැබෙන්නේය

36. අවශෙෂ කම්සථානයන් අතුරෙන් අප්‍රමාණ්‍යයෝ සත්ත්ව ප්‍රඥප්තියෙහි පවතිත්.

37. ආකාස කසිණය හැර ඉතිරි කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක් උගුළුවා ලැබූ ආකාස ප්‍රඥප්තිය අරමුණු කොට අනන්ත වශයෙන් පරිකර්ම කරන්නාහට ප්‍රථම අරූපධ්‍යානය ලැබේ.

38. ඒ ප්‍රථම අරූප විඤ්ඤාණය අරමුණුකොට අනන්ත වශයෙන් පරිකර්ම කරන්නහුට දෙවෙනි අරූප ධ්‍යානය ලැබේ.

39. ඒ ප්‍රථමාරූපප විඤ්ඤාණයාගේ අභාවයම වූ නාසති භාව ප්‍රඥප්තිය කිසිවක් නැතැයි පරිකර්ම කරන්නහුට තුන්වැනි අරූප ධ්‍යානය ලැබේ.

40. තුන්වන අරූප විඤ්ඤාණය ශාන්තය ප්‍රණීතය යයි පරිකර්ම කරන්නහුට සතරවැනි අරූප ධ්‍යානය උපදී.

41. සෙසු දස කමටහන් අතුරෙන් බුදුගුණ ආදී අරමුණු ගෙන පරිකර්ම කොට, ඒ අරමුණු මනාසේ ගත් කල්හි එහිම පරිකර්ම භාවනාවද පිහිටයි. උපචාර භාවනාවද සම්පාදනය වෙයි.

42. අභිඥා වශයෙන් පවත්නා රූපාවචර පඤ්චම ධ්‍යානය වනාහි අභිඥාපාදක පඤ්චමධ්‍යානයෙන් නැගිට අධිෂ්ඨාන කළයුතු අරමුණු ආදිය මෙනෙහි කොට පරිකර්ම කරන්නහුට රූපාදී ආරම්මණයන්හි සුදුසු පරිදි පිහිටන්නේය.

43. අභිඥාවෝ නම්:- ඉද්ධිවිධය, දිබ්බසෝතය, පරචිත්ත විජානනය, පුබ්බෙනිවාසානුස්සතිය, දිබ්බචක්ඛු යයි පඤ්ච විධ වේ.

**මෙය මෙහි ගොචර භේදයයි.**

44. විදර්ශනා කර්මස්ථානයෙහි වනාහි සීලවිසුද්ධිය, චිත්ත විසුද්ධිය, දිට්ඨි විසුද්ධිය, කඞ්ඛාවිතරණ විසුද්ධිය, මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය, පටිපදාඤාණදස්සන විසුද්ධිය, ඤාණදස්සන විසුද්ධිය යයි සප්තප්‍රකාරයකින් විසුද්ධි සඞ්ග්‍රහය වේ.

45. අනිත්‍ය ලක්ෂණය, දුක්ඛ ලක්ෂණය, අනාත්ම ලක්ෂණය යයි ලක්ෂණයෝ තිදෙනෙකි.

46. අනිච්චානුපස්සනාය, දුක්ඛානුපස්සනාය, අනත්තානුපස්සනායයි අනුපස්සනාවෝ තිදෙනෙකි.

47. සම්මසන ඤාණය, උදයව්‍යය ඤාණය, භඞ්ග ඤාණය, භය ඤාණය, ආදීනව ඤාණය, නිබ්බිදා ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණය. පටිසඞ්ඛා ඤාණය, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය, අනුලොම ඤාණය යයි විපස්සනා ඤාණයෝ දස දෙනෙකි.

48. සුඤ්ඤත විමොක්ඛය, අනිමිත්ත විමොක්ඛය, අප්පණිහිත විමොක්ඛය යයි විමොක්ඛයෝ තිදෙනෙකි.

49. සුඤ්ඤතානුපස්සනාය, අනිමිත්තානුපස්සනාය, අප්පණිහිතානුපස්සනායයි විමොක්ඛ මුඛයෝ තිදෙනෙක්ද දතයුත්තාහ.

50. කෙසේ ද? පාතිමොක්ඛ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය ආජීවපාරිසුද්ධි සීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය යන චතුපාරිසුද්ධි සීලය සීලවිසුද්ධි නම් වේ.

51. උපචාර සමාධිය, අර්පණා සමාධිය යන ද්විවිධ සමාධිය චිත්තවිසුද්ධිය නම් වේ.

52. ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් නාමරූප පරිග්‍රහය දිට්ඨිවිසුද්ධි නම් වේ.

53. ඒ නාමරූපයන්ගේම ප්‍රත්‍යයන් පිරිසිඳ දැනගන්නා ඤාණය කඞ්ඛාවිතරණ විසුද්ධිය නම් වේ.

54. ඉන්පසු එසේ පිරිසිඳ දැනගත්, ප්‍රත්‍යය සහිත වූ අතීතාදී වශයෙන් හෙද හින්න වූ ත්‍රෛභූමික සංස්කාරයන්හි ස්කන්‍ධාදී නය අරභයා කලාප වශයෙන් පිඬු කොට ක්‍ෂය වන හෙයින් අනිත්‍යය. භයට කාරණ හෙයින් දුක්ඛය, අසාර හෙයින් අනාත්මය යයි කාල වශයෙන් හෝ සන්තති වශයෙන් හෝ ක්‍ෂණ වශයෙන් හෝ සම්මර්‍ශන ඥානයෙන් ලක්‍ෂණත්‍රය සම්මර්‍ශනය කරණ කල්හි එහිම ප්‍රත්‍යය වශයෙන්ද ක්‍ෂණ වශයෙන්ද උදයව්‍යය ඥානයෙන් ඇතිවීම නැතිවීම අනුව බලන්නාහට ඕභාසය, ප්‍රීතිය, පස්සද්ධිය, අධිමොක්ඛය, වීර්‍ය්‍යය, සුඛය, ඥානය, සිහිය, උපෙක්‍ෂාව, නිකන්තිය යන මේ විදර්‍ශනොපක්ලේශ නම් වූ සතුරන් පිරිසිඳ දැන ගැනීම් වශයෙන් මාර්‍ග අමාර්‍ග ලක්‍ෂණ බෙදා දත හැකි ඥානය මග්ගාමග්ග ඥානදස්සන විසුද්ධි නම් වේ.

55. එසේ සතුරු උවදුරින් මිදුනා වූ ඔහුට උදයව්‍යය ඥානයෙහි පටන් අනුලොම ඥානය දක්වා ත්‍රිලක්‍ෂණයෙහි විදර්‍ශනා ඥාන පරම්පරායෙන් පිළිපදින කල්හි උපදින නවවිදර්‍ශනා ඥානයෝ පටිපදාඥාණ දස්සන විසුද්ධි නම් වේ.

56. මෙසේ පිළිපදින්නහුගේ විදර්‍ශනා ඥානය මිහි කිරීමට පැමිණ, දැන්ම අර්‍පණාව උපදින්නේ යයි කිවයුතු අවස්ථාවට පැමිණි කල්හි භවඞ්ගය බිඳී උපන් මනොද්වාරාවජ්ජනයට අනතුරුව දෙතුන් විදර්‍ශනා චිත්තයෝ යම්කිසි අනිත්‍යාදි ලක්‍ෂණයක් අරමුණු කොට පරිකර්‍ම, උපචාර, අනුලොම, නාමයෙන් පවතිත්. මස්තකයට පැමිණියාවූ අනුලොම ඥානය සහිතවූ ඒ සඞ්ඛාරුපෙක්ඛා ඥානය වුට්ඨාන ගාමිනී විපස්සනා යයි කියනු ලැබේ.

57. ඉන්පසු ගොත්‍රභූ චිත්තය නිවන අරමුණු කොට පෘථග්ජන ගොත්‍රය මඩිමින් ආර්‍ය්‍යගොත්‍රයට පමුණුවමින් උපදී.

58. එයට අනතුරුව මාර්ගය, දුක්ඛසත්‍යය පිරිසිඳ දැන ගනිමින්, සමුදය සත්‍යය පහකරමින්, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්‍ෂ කරමින්, මාර්ග සත්‍යය වැඩීමෙන් අර්පණා වීථියට බැසගනී. ඉන්පසු ඵලසිත් දෙකක් තුනක් ඉපද භවඞ්ග පාතයවෙයි.

59. නැවත භවඞ්ගය සිඳීගොස් ප්‍රත්‍යවෙක්‍ෂා ඤාණයෝ උපදිත්. ආයම්ඵලයට පැමිණි පණ්ඩිත තෙම මාර්ගයද, ඵලයද, නිර්වාණයද ප්‍රත්‍යවෙක්‍ෂා කරයි ප්‍රහීණ කෙලශයන් හා අප්‍රහීණ කෙලශයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ හෝ නොකරන්නේ හෝ වෙයි

60. මෙසේ ෂඩ් විශුද්ධීන්ගේ අනුක්‍රමයෙන් වැඩිය යුතුවූ සොතාපත්ති ආදී සිව්වැදෑරුම් මාර්ග ඤාණ දස්සන විසුද්ධි නම් වන්නේයයි කියන ලදී.

මෙය මෙහි විසුද්ධි භෙදයයි

61. එහි අනත්තානුපස්සනාව ආත්මයක් ඇතැයි දැඩිව ගැනීම මුදාහරින බැවින් සුඤ්ඤතානුපස්සනා නම් විමොක්‍ෂ මුඛය වෙයි

62. අනිච්චානුපස්සනාව විපයර්‍යාස නිමිත්ත මුදාහරින බැවින් අනිමිත්තානුපස්සනා නම් විමොක්‍ෂ මුඛය වෙයි

63. දුක්ඛානුපස්සනාව තෘෂ්ණා ප්‍රණිධිය මුදාහරින බැවින් අප්පණිහිතානුපස්සනා නම් විමොක්‍ෂ මුඛය වෙයි.

64 එහෙයින් ඉදින් වුට්ඨාන ගාමිනී විපස්සනාව අනාත්ම වශයෙන් විදර්ශනා කරයිද එකල්හි මාර්ගය සුඤ්ඤත විමොක්‍ෂ නම් වෙයි

65. ඉදින් අනිත්‍යය වශයෙන් විදර්ශනා කරයිද, එකල්හි මාර්ගය අනිමිත්ත විමොක්‍ෂ නම් වෙයි

66. ඉදින් දුක් වශයෙන් විදර්ශනා කරයිද, එකල්හි මාර්ගය අප්පණිහිත විමොක්‍ෂ නම් වෙයි. මෙසේ මාර්ගය විපස්සනා ගමන වශයෙන් නම් තුනක් ලබයි. එසේම ඵලයද මාර්ගවීථියෙහිදී මාර්ගගමන වශයෙන් නම් ලබයි.

67. ඵල සමාපත්ති වීථියෙහි වනාහි යථොක්ත නයින් විදර්ශනා වඩන්නාහට තමන් අයත් ඵලය උපදින්නේ නමුදු විපස්සනා ගමන වශයෙන් සුඤ්ඤතාදි විමොක්ෂය යයිද කියනු ලැබේ.

68. අරමුණු කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නම් තුණ සියලු තන්හි සියලු පුද්ගලයන්ටම සමවන්නේ යයි දතුයුතු.

**මෙය මෙහි විමොක්ෂ භෙදයයි**

---

69. එහි වනාහි සොතාපත්ති මාර්ගය වඩා දිට්ඨිවිචිකිච්ඡාවන් පහකිරීමෙන් ප්‍රහීණවූ අපායගමන් ඇති ආර්‍ය්‍ය පුද්ගලතෙම සත්තක්ඛත්තුපරමවූ සොතාපන්න නම් වෙයි.

70. සකෘදාගාමි මාර්ගය වඩා රාග ද්වෙෂ මොහයන් තුනී කිරීමෙන් එක්වරක්ම මේ කාම ලොකයට එන හෙයින් සකෘදාගාමි නම් වෙයි.

71. අනාගාමි මාර්ගය වඩා කාමරාග ව්‍යාපාදයන් නිරවශෙෂව පහකිරීමෙන් මේ කාමභූමියට නැවත නො-එන හෙයින් අනාගාමි නම් වෙයි.

72. අර්හත් මාර්ගය වඩා ඉතිරි නොකොට කෙලෙස් පහකිරීමෙන් ක්ෂීණවූ ආශ්‍රවයන් ඇති ලොකයෙහි අග්‍රදක්ෂිණාර්හවූ අර්හත් නම් වෙයි.

**මෙය මෙහි පුද්ගල භෙදයයි**

---

73. මෙහි සමාපත්ති වීථිහු සියලුම ආර්‍ය්‍යයන්හට තම තමන්ට අයත් ඵල වශයෙන් සාධාරණම වෙත්.

74 නිරොධ සමාපත්තියට සමවැදීම වනාහි අනාගාමීන්ටද රහතන්ටද ලැබේ. එහිදී පිළිවෙලින් ප්‍රථම ධ්‍යානාදි මහද්ගත සමාපත්තීන්ට සමවැද එයින් නැගිට එහි ඇතුළත් සංස්කාරධර්මයන් ඒ ඒ සමාපත්තියෙන් නැගී සිටි කෙණෙහිම

විදර්ශනා වශයෙන් බලමින් ආකිඤ්චඤ්ඤායතනය දක්වා ගොස්, ඉන්පසු අධිෂ්ඨානාදී පූර්වකෘත්‍යය කොට නෛවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවදී එහි අර්පණාජවන දෙකකින් පසුව චිත්තසන්තතිය සිඳෙයි. එහෙයින් නිරොධයට සමවැදුනේ නම් වෙයි.

75. ඒ සමවතින් නැගිටින කල්හි අනාගාමිහට අනාගාමි ඵල සිතද, රහත්හට රහත් ඵල සිතද එක්වරක්ම ඉපිද භවඞ්ගපාතය වෙයි. ඉන්පසු ප්‍රත්‍යවෙක්ෂා ඥානය පවත්නේය.

**මෙය මෙහි සමාපත්ති භෙදයයි**

**විදර්ශනා කර්මස්ථාන නය නිමි.**

---

76. ශාසනයෙහි ප්‍රතිපත්ති රසාස්වාදය ප්‍රාර්ථනා කරන්නහු විසින් මෙසේ කියනලද නයින් උතුම්වූ භාවනාවයය වැඩිය යුතු.

**මෙසේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි කර්මස්ථාන සංග්‍රහ විභාග නම් වූ නවම පරිච්ඡේදය නිමි.**

---

77. චාරිත්‍රයෙන් හෙබියාවූ, උසස් කුලයක උපන් ශ්‍රද්ධාවෙන් වැඩුනු පිරිසුදු සීලාදි ගුණධර්මයන්ට උත්පත්ති ස්ථානයක්වූ නම්බ නමැති උපාසක තැන විසින් පරානුග්‍රහය සලකා යම් ප්‍රකරණයක් කළමැනවැයි ආරාධිතද එය නිමවන ලදි.

78. ඒ විපුල වූ පුණ්‍යස්කන්ධය කරණකොට ගෙන හිතැතියන්හට නිවාසස්ථාන වූ ප්‍රසිද්ධ වූ මූලසෝම විහාරය ප්‍රඥයෙන් පිරිසුදු වූ, ගුණධර්මයෙන් සොභන වූ, ලජ්ජී භික්ෂූහු පුණ්‍ය සම්පත්තියගේ අභිවෘද්ධිය පිණිස සතිසම්පජඤ්ඤයෙන් යුක්තව සිතත්වා.

**අනුරුද්ධාචාර්යයන් විසින් රචිත අභිධර්මාර්ථ සංග්‍රහ නම් වූ ප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

---

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

**නවම පරිච්ඡේදය**

## කර්මස්ථාන සංග්‍රහ විභාගය

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

## සමථ විපස්සනා භාවනා

ශීලයෙන් මනා කොට කාය වාග් සංවරය ලබාගත් තැනැත්තේ ධ්‍යාන, මාර්ග ඵල ආදිය ලබා නිර්වාණ අවබෝධ කරගැනීම පිණිස උත්සාහවත් වන්නේය. හෙතෙමේ පළමු කොට චිත්ත දමනය පිණිස භාවනායෙහි යෙදෙන්නේය. **භාවනාව** නම් සිත තැන්පත් කරගැනීම පිණිස සුදුසු අරමුණෙක සිත වැඩීම නොහොත් අරමුණ නැවත නැවත සිහි කිරීමය.

මේ **භාවනාව, චිත්ත භාවනා** හෙවත් **සමථ භාවනාය ප්‍රඥා භාවනා** හෙවත් **විදර්ශනා භාවනා** යයි දෙවැදෑරුවේ.

**සමථ භාවනා** නම් ධ්‍යාන අභිඥා ආදිය ලබනු පිණිස කාමච්ඡන්දාදී නීවරණ ධර්ම හෙවත් ප්‍රතිපක්ෂ ධර්මයන් හා විතර්කාදී ඖදාරික ධ්‍යානාංගයන් සංසිඳවාගෙන **සමාධි** නම් වූ චිත්තෛකාග්‍රතාව පිණිස චිත්තයාගේ වැඩීමයි.

**විදර්ශනා භාවනා** නම් සත්ත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂාදී වශයෙන් හෝ නිත්‍ය, සුභ, සුඛ, ආත්ම වශයෙන් හෝ නොබලා මේ පඤ්චස්කන්ධාදිය හෙවත් නාමරූප ධර්මයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මයයි නුවණින් මනා කොට බැලීම පිණිස චිත්තයාගේ වැඩීමයි. මෙයින් නිවණ අරමුණු කිරීමෙන් මාර්ග ඵලයන්ට පැමිණිය හැකි වේ.

## සමථ භාවනාව

චිත්ත චෛතසික ධර්මයන්ගේ සාමාන්‍ය ස්වභාවය නම් නොයෙක් ආරම්මණයන්හි වික්ෂිප්තව හැසිරීමය. එක් අරමුණෙක සිත පිහිටුවා ගැනීම ඉතා දුෂ්කරය. යම් ධර්මයකගේ උපකාරයෙන් මේ චිත්ත චෛතසික ධර්මයන් එක් අරමුණෙක සමව, මනාව, වික්ෂිප්ත නොවී පිහිටුවා ගැනීම වේ නම් ඒ ධර්මයට **සමාධිය** යයි කියනු ලැබේ. මෙහිදී සමාධිය වශයෙන් දක්වනු ලබන්නේ ඤාණසම්ප්‍රයුක්ත කුසල චිත්තයෙහි යෙදෙන බලවත් ඒකාග්‍රතාවයයි.

**සමාධියෙහි ලක්ෂණය** හෙවත් සාමාන්‍ය ස්වභාවය නම් නොයෙක් ආරම්මණයන්හි සිත නොවිසිරෙන බව හෙවත් අවික්ෂෙප භාවයයි. වික්ෂෙපය නැති කිරීම හෙවත් නොසන්සුන් බව නැති කිරීම සමාධියගේ **කෘත්‍යය** හෙවත් **සම්පත්තිය** වේ.

සමාධියෙහි **පච්චුපට්ඨාන** නම් වූ වැටහෙන ආකාරය හෝ ඵලය නම්, උද්ධච්ච හේතුවෙන් කම්පා නොවන බව හෙවත් **අකම්පන** භාවයයි. සමාධියෙහි ආසන්න කාරණය හෙවත් **පදට්ඨානය** නම් **සුඛ** යයි.

අවික්ෂෙප ලක්ෂණයෙන් සමාධිය එක් වැදෑරුම් වුවද එහි නොයෙක් ප්‍රභේද වේ.

### 1. උපචාර සමාධි සහ අර්පණා සමාධි

කර්මස්ථානයක් ගෙන භාවනායෙහි යෙදී සිටින යෝගාව–චරයා හට යම් කලෙක උද්ග්‍රහ නිමිත්ත ඉපිද එය නැවත

නැවත වැඩීමෙන් ආවර්ජනා කිරීමෙන් ක්‍රමයෙන් කාමච්ඡන්ද දී නිවරණ ධර්මයන් විෂ්කම්භනයෑවී කෙලෙස් සංසිඳී, **ප්‍රතිභාග** නිමිත්ත වැටහුනේවී නම්, එකල ඔහුගේ සිත **උපචාර සමාධියෙන්** සමාහිත වූයේ යයි කියනු ලැබේ. උපචාර සමාධි අවස්ථාවෙහි උපදනා ධ්‍යානාඞ්ගයෝ ශක්ති සම්පන්න නොවෙති. ඇතැම් විටෙක සිත නිමිත්ත අරමුණු කරන්නේය. ඇතැම් විටෙක භවාඞ්ගයට බස්නේය.

මේ උපචාර සමාධිය අර්පණා සමාධියට පූර්ව භාගයෙහි ලැබෙන්නේය. තවද සතලිස් කමටහන් අතුරෙන්, **බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, ආහාරෙපටික්කූලසඤ්ඤා, චතුධාතුවවත්ථාන** යන දශවිධ කර්මස්ථානයන් වඩා ලැබිය හැකි සමාධිය **උපචාර සමාධියයි.** එයින් අර්පණා සමාධිය ලැබිය නොහැකි වේ.

**අර්පණා සමාධිය** නම් ගොත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මයට අනතුරුව ලැබෙන ප්‍රථම ධ්‍යානාදීවූ මහග්ගත චිත්තයන්හි සම්ප්‍රයුක්ත බලවත් **එකග්ගතාව** යයි. මේ අවස්ථාවෙහි උපදනා **ධ්‍යානාඞ්ගයෝ** ශක්ති සම්පන්න වෙති. උපචාර අවස්ථාවෙහිදී මෙන් දුර්වල නොවෙත්.

**උපචාර සමාධි** අවස්ථාවෙහිදී සිත සමාහිත වන්නේ කාමච්ඡන්ද දී නීවරණ ධර්මයන්ගේ විෂ්කම්භන ප්‍රහාණයෙන් බවත් **අර්පණා සමාධි** අවස්ථාවෙහිදී සිත සමාහිත වන්නේ ධ්‍යානාඞ්ගයන්ගේ බලවත් වීමෙන් බවත් දතයුතු.

**2. ලෞකික සමාධිය සහ ලොකොත්තර සමාධිය.**

**කාම, රූප, අරූප** යන ත්‍රිවිධ භූමියෙහි ලෞකික කුසල චිත්ත සම්ප්‍රයුක්ත එකග්ගතාවය **ලෞකික සමාධිය** වේ.

සොවාන් ආදී ලොකොත්තර චිත්තයන්හි සම්ප්‍රයුක්ත එකග්ගතාවය **ලොකොත්තර සමාධිය** නමි.

**3. සප්පීතික සමාධිය සහ නිප්පීතික සමාධිය.**

උපචාර ධ්‍යාන අවස්ථාවෙහි ප්‍රීතිය ඇතිව හෝ නැතිව හෝ කාමාවචර කුසල චිත්තය උපදී. ප්‍රීතිය ඇති කල්හි සමාධිය සප්පීතික සමාධියද, ප්‍රීතිය නැති කල්හි නිප්පීතික සමාධියද වේ.

චතුෂ්ක නයින් ප්‍රථම, ද්විතීය ධ්‍යාන දෙක්හිද, පඤ්චක නයින් ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යානයන්හිද ප්‍රීති නම් වූ ධ්‍යානාඞ්ගය ඇති හෙයින් එහි උපදනා සමාධිය **සප්පීතික සමාධි** නම් වේ. චතුෂ්ක නයින් තෘතීය චතුර්ථ ධ්‍යාන දෙක්හිද, පඤ්චක නයින් චතුර්ථ පඤ්චම ධ්‍යාන දෙක්හිද ප්‍රීතිය බැහැර කළ හෙයින් එහි උපදනා සමාධිය **නිප්පීතික සමාධි** නම් වේ.

**4. සුඛසහගත සමාධිය සහ උපෙක්ඛාසහගත සමාධිය.**

චතුෂ්ක නය වශයෙන් ප්‍රථම, ද්විතීය, තෘතීය, ධ්‍යානයෝද, පඤ්චක නයින් ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයෝද සුඛ සහගතය, එහි උපදනා එකග්ගතාවය සුඛ සහගත සමාධි නම් වේ. චතුෂ්ක නයින් චතුර්ථ ධ්‍යානයද පඤ්චක නයින් පඤ්චම ධ්‍යානයද උපෙක්ඛා සහගතය. එහි උපදනා එකග්ගතාවය **උපෙක්ඛා සමාධි** නම් වේ. උපචාර සමාධි අවස්ථාවෙහිදී සුඛ සහගත හෝ උපෙක්ඛා සහගත හෝ වේ.

**5. හීන සමාධි, මධ්‍යම සමාධි, ප්‍රණීත සමාධි**

දුර්වලවූ, සවල්ප මාත්‍රවූ ආසෙවනය නොලත් සමාධිය **හීන සමාධි** නමි. වඩා ප්‍රගුණ නොවූ මධ්‍යම ප්‍රමාණයෙන් වඩනාලද සමාධිය **මධ්‍යම සමාධි** නමි. අතිශයින්ම ප්‍රගුණ කොට වඩනාලද සමාධිය **ප්‍රණීත සමාධි** නමි.

**6. සවිතක්ක සවිචාර සමාධිය, අවිතක්ක විචාර මත්ත සමාධිය, අවිතක්ක අවිචාර සමාධිය.**

**සවිතක්ක සවිචාර සමාධිය** නම්, උපචාර සමාධිය සහ ප්‍රථම ධ්‍යානයෙහි එකග්ගතාවයයි. ඒ ධ්‍යානයන්හි විතක්ක

විචාර යන ධ්‍යානාංගයෝ ඇත්තාහ. පඤ්චක නය වශයෙන් ගත් කල්හි ද්විතීය ධ්‍යානයෙහි ඇත්තේ විතක්කය හැර විචාරය පමණෙකි. එහෙයින් එය **අවිතක්ක විචාරමත්ත සමාධිය** නම්. චතුෂ්කනය වශයෙන් ද්විතීය ධ්‍යානාදීන්හි ඇති එකග්ගතාවයත්, පඤ්චක නය වශයෙන් තතිය ධ්‍යානාදීන්හි ඇති එකග්ගතාවයත්, **අවිතක්ක අවිචාර සමාධි** නම්. ඒ ධ්‍යානයන්හි විතක්ක විචාරයෝ නැත.

**7. පීති සහගත සමාධි, සුඛ සහගත සමාධි, උපෙක්ඛා සහගත සමාධි.**

චතුෂ්ක නය වශයෙන් ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හිද, පඤ්චක නය වශයෙන් ප්‍රථම, ද්විතීය, තතිය ධ්‍යානයන්හිද පීති ධ්‍යානාංගය ඇති හෙයින් එහි එකග්ගතාවය **පීති සහගත සමාධි** නම්. චතුෂ්ක නයින් තතිය ධ්‍යානයෙහිද, පඤ්චක නයින් චතුත්ථ ධ්‍යානයෙහිද ප්‍රීතිය හැර සුඛය යෙදෙන හෙයින් ඒ ධ්‍යානයන්හි ඇති එකග්ගතාවය **සුඛ සහගත සමාධි** නම්. චතුෂ්ක නයින් චතුත්ථ ධ්‍යානයෙහිද පඤ්චක නයින් පඤ්චම ධ්‍යානයෙහිද ප්‍රීතියත්, සුඛයත් හැර උපෙක්ෂාව ඇති හෙයින් එහි එකග්ගතාවය **උපෙක්ඛා සහගත සමාධි** නම් වේ. උපචාර සමාධියෙහි මේ ත්‍රිවිධ සමාධීන්ම ලැබෙත්.

**8. පරිත්ත සමාධි, මහග්ගත සමාධි, අප්පමාණ සමාධි.**

**පරිත්ත සමාධිය** නම් උපචාර අවස්ථාවෙහි කාමාවචර කුසල චිත්තයෙහි ඇති එකග්ගතාවයයි. රූපාවචර අරූපාවචර කුසල සම්ප්‍රයුක්ත එකග්ගතාවය **මහග්ගත සමාධි** නම්. ලොකොත්තර චිත්ත සම්ප්‍රයුක්ත එකග්ගතාවය **අප්පමාණ සමාධි** නම්.

**9. දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා–දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා –සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා–සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා.**

භාවනාව ආරම්භ කළ තැන් පටන් උපචාර සමාධිය උපදින තෙක් පවත්නා යම් භාවනාවෙක් වේද එයට

**ප්‍රතිපදා** යයි කියනු ලැබේ. උපචාරයෙහි පටන් අර්පණාව දක්වා පවත්නා කුසල චිත්ත සම්ප්‍රයුක්ත ප්‍රඥාව **අභිඥා** නම්.

නීවරණාදි ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ බලවත්වීම ඇති කල්හි ප්‍රතිපදාව ඉතා දුෂ්කර වේ. එබැවින් එය දුක් සහිත හෙයින් **දුක්ඛා පටිපදා** හෙවත් දුක්වූ ප්‍රතිපදාව නම් වේ. නීවරණාදී ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ බලවත් වීමක් නැති කල්හි ප්‍රතිපදාව සැපවත් වේ. එබැවින් එයට **සුඛාපටිපදා** හෙවත් සුඛවූ ප්‍රතිපදා යයි කියති. ඇතැම් කෙනෙකුට ප්‍රතිපදාවට පසුව ලැබෙන අභිඥාව **දන්ධව** හෙවත් මදව පවතී. ශීඝ්‍රව නොපවතී එයට **දන්ධාභිඤ්ඤා** යයි කියනු ලැබේ. අභිඥාව ශීඝ්‍රව පැවති කල්හි **ඛිප්පාභිඤ්ඤා** නම් වේ.

තවද, ප්‍රතිපදාව දුක් සහිත වීමට හෙවත් **දුක්ඛාපටිපදා** වට උපකාර වන කරුණු නම්–

1. සප්පාය සේවනය නොලැබීමය.
2. පළිබොධ සිඳලීම් ආදී පූර්ව කෘත්‍යය සපයා නොගෙන භාවනාවෙහි යෙදීමය.
3. තෘෂ්ණාව බලවත්වීමය.
4. පෙර ජාතිවල සමථය මනාකොට පුරුදු නොකළ බවය.
5. තියුණු වූ කාමච්ඡන්ද දී කෙලශයන් ඇති බවය.

**සුඛා පටිපදා** හෙවත් සැප වූ ප්‍රතිපදාවට උපකාරවන කරුණු නම්–

1. සප්පයා සේවනය ලැබීමය.
2. පළිබොධ සිඳලීම් ආදී පූර්ව කෘත්‍යය සපයා ගෙන භාවනාවෙහි යෙදීමය.
3. තෘෂ්ණාව බලවත් නොවීමය.

4. පූර්ව ජන්මයන්හි පුරුදු කළ සමථය ඇති බවය.

5. මදවූ කාමච්ඡන්දාදි කෙලෙස් ඇති බවය.

**දන්ධාභිඤ්ඤා** හෙවත් මදවූ ප්‍රඥාවට උපකාරවන කරුණු නම්–

1. අර්පණා කෞශල්‍යය සම්පාදනය කර නොගැනීමය.

2. අවිද්‍යාව බලවත්වීමය.

3. පූර්ව ජන්මයන්හි විදර්ශනාව පුරුදු නොකළ බවය.

4. මෘදුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති බවය.

**ඛිප්පාභිඤ්ඤාවට** හෙවත් ශීඝ්‍රවූ ප්‍රඥාවට උපකාර වන කරුණු නම්–

1. අර්පණා කෞශල්‍යය සම්පාදනය කර ගැනීමය.

2. අවිද්‍යාව බලවත් නොවීමය.

3. පූර්ව ජන්මයන්හි පුරුදු කළ විදර්ශනා ඇති බවය.

4. තියුණුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති බවය.

මෙසේ දුක්වූ ප්‍රතිපදාවෙන් හා දන්ධ අභිඥාවෙන් ලබන සමාධිය **දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා** නම් වේ.

දුක්වූ ප්‍රතිපදාවෙන් හා ශීඝ්‍ර අභිඥාවෙන් ලබන සමාධිය **දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** නම් වේ.

සැපවූ ප්‍රතිපදාවෙන් හා දන්ධ අභිඥාවෙන් ලබන සමාධිය **සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා** නම් වේ.

සැපවූ ප්‍රතිපදාවෙන් හා ශීඝ්‍ර අභිඥාවෙන් ලබන සමාධිය **සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** නම් වේ.

**10. පරිත්ත පරිත්තාරම්මණ සමාධිය, පරිත්ත අප්පමාණාරම්මණ සමාධිය, අප්පමාණපරිත්තාරම්මණ සමාධිය, අප්පමාණ අප්පමාණාරම්මණ සමාධිය.**

ප්‍රගුණ නොකළ, වසඟ කර නොගත්, මතු ධ්‍යාන ලැබීම පිණිස ප්‍රත්‍යය වීමට සමත් නොවූ සමාධිය **පරිත්ත සමාධි** නමි.

ප්‍රගුණ කළ, වසඟ කරගත්, මතු ධ්‍යාන ලැබීම පිණිස ප්‍රත්‍යය වීමට සමත්වූ සමාධිය **අප්පමාණ සමාධි** නමි.

නොවඩනලද කසිණාරම්මණයෙහි පැවති සමාධිය **පරිත්තාරම්මණ** සමාධියයි.

වඩනලද කසිණාරම්මණයෙහි පැවති සමාධිය **අප්පමාණාරම්මණ** සමාධියයි.

මෙසේ පරිත්ත වූද, පරිත්තාරම්මණ වූද සමාධිය **පරිත්ත පරිත්තාරම්මණ සමාධි** නාම් වේ.

පරිත්ත වූද, අප්‍රමාණාරම්මණ වූද, සමාධිය -- **පරිත්ත-අප්පමාණාරම්මණ සමාධි** නාම් වේ.

අප්‍රමාණ වූද, පරිත්තාරම්මණ වූද සමාධිය **අප්පමාණ-පරිත්තාරම්මණ සමාධි** නාම් වේ.

අප්‍රමාණ වූද, අප්‍රමාණාරම්මණ වූද සමාධිය **අප්පමාණ-අප්පමාණාරම්මණ සමාධි** නාම් වේ.

**11. ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය.**

ධ්‍යානාඞ්ගයන්ගේ වශයෙන් සමාධිය සතර වැදෑරුම් වේ.

කාමච්ඡන්දාදි පඤ්චනීවරණ ධර්මයන් විෂ්කම්භනය කරන **විතර්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා** යන ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් යුත් සමාධිය **ප්‍රථම ධ්‍යාන** නාම් වේ.

විතක්ක, විචාරයන් සංසිඳුවා **ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා** යන අඞ්ග තුනෙන් යුත් සමාධිය **ද්විතීය ධ්‍යාන** නම් වේ.

ප්‍රීතියද සංසිඳීමෙන් **සුඛ, ඒකාග්‍රතා** යන අඞ්ග දෙකෙන් යුත් සමාධිය **තෘතීය ධ්‍යාන** නම් වේ.

සුඛය සංසිඳුවීමෙන් **උපෙක්ෂා, ඒකාග්‍රතා** යන අඞ්ග දෙකෙන් යුත් සමාධිය **චතුර්ථ ධ්‍යාන** නම් වේ.

**12. හාන භාගිය, ඨිති භාගිය, විසෙස භාගිය, නිබ්බෙධ භාගිය සමාධි.**

ප්‍රථම ධ්‍යාන ලාභීහට කාමාස්වාදයෙන් කාමාරම්මණයන්ගේ සංඥා මනස්කාරයෝ පවතිත් නම්, එය පරිහානිය සේවනය කළ ප්‍රඥාව බැවින් එයට **හාන භාගිය සමාධිය** යයි කියනු ලැබේ. ධ්‍යානයට ප්‍රතිපක්ෂවූ නිවරණාදියගේ පැවැත්ම ඇති හෙයින් පිරිහීම සේවනය කරන්නේ වේ.

පිරිහීමක් හෝ වැඩීමක් නොමැතිව සමෘතියගේ පැවැත්මෙන් ස්ථිතිය සේවනය කළ සමාධිය **ඨිති භාගිය සමාධි** නම් වේ.

අවිතර්කාලම්බනවූ සංඥා මනස්කාරයන්ගේ පැවැත්මෙන් මතු විශෙෂාධිගමයට ප්‍රත්‍යය වන වැඩීම, සේවනය කළ සමාධිය **විසෙස භාගිය සමාධි** නම් වේ.

ආදීනව දර්ශනයෙන් නිබ්බිදාසහගත සංඥා මනස්කාරයන්ගේ වශයෙන් නිවන සේවනය කළ සමාධිය **නිබ්බෙධ භාගිය සමාධි** නමි.

**13. කාමාවචර සමාධි, රූපාවචර සමාධි, අරූපාවචර සමාධි, අපරියාපන්න සමාධි.**

උපචාර වශයෙන් පවත්නා කාමාවචර කුසල චිත්තයන්හි ඒකාග්‍රතාවය **කාමාවචර සමාධි** නමි.

රූපාවචර කුසල චිත්තයන්හි පවත්නා ඒකාග්‍රතාවය **රූපාවචර සමාධි** නමි.

අරූපාවචර කුසල චිත්තයන්හි පවත්නා ඒකග්ගතාවය **අරූපාවචර සමාධි** නම්.

ලෝකෝත්තර කුසල චිත්තයන්හි පවත්නා ඒකග්ගතාවය **අපරියාපන්න සමාධි** නම්.

**14. ඡන්ද සමාධි, විරිය සමාධි, චිත්ත සමාධි, වීමංසා සමාධි.**

ඡන්දය අධිපතිකොට වඩාගත් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය **ඡන්ද සමාධි** නම්.

වීර්‍ය්‍යය අධිපතිකොට වඩාගත් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය **විරිය සමාධි** නම්.

චිත්තය අධිපතිකොට වඩාගත් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය **චිත්ත සමාධි** නම්.

ප්‍රඥාව අධිපතිකොට වඩාගත් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය **වීමංසා සමාධි** නම්.

**15. ප්‍රථම ධ්‍යාන සමාධි, ද්විතීය ධ්‍යාන සමාධි, තෘතීය ධ්‍යාන සමාධි, චතුර්ථ ධ්‍යාන සමාධි, පඤ්චම ධ්‍යාන සමාධි.**

**විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා** යන අඞ්ග පසෙන් යුත් ප්‍රථම ධ්‍යානය – **ප්‍රථම ධ්‍යාන සමාධි** නම්.

විතර්කය හැර **විචාර, පීති, සුඛ, ඒකග්ගතා** යන අඞ්ග සතරෙන් යුත් ද්විතීය ධ්‍යානය – **ද්විතීය ධ්‍යාන සමාධි** නම්.

**පීති, සුඛ, ඒකග්ගතා** යන අඞ්ග තුනෙන් යුත් තෘතීය ධ්‍යානය – **තෘතීය ධ්‍යාන සමාධිය** නම්.

**සුඛ, ඒකග්ගතා** යන අඞ්ග දෙකෙන් යුත් චතුර්ථධ්‍යානය **චතුර්ථ ධ්‍යාන සමාධි** නම්.

**උපෙක්ඛා, ඒකග්ගතා** යන අඞ්ග දෙකෙන් යුත් පඤ්චම ධ්‍යානය – **පඤ්චම ධ්‍යාන සමාධි** නම්.

# සමාධිය වැඩිය යුතු පිළිවෙල

## ලෞකික සමාධිය

1. සිල් පිරිසුදු කරගත යුතුය.
2. දශවිධ පලිබෝධයන්ම දුරුකටයුතුය.
3. කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකගෙන් ස්වකීය චරිතානුකූලවූ කම්ස්ථාන-යක් ලබාගතයුතුය.
4. සමාධි භාවනාවට අයොග්‍ය ස්ථානයන් අත් හැරිය යුතුය.
5. සමාධි භාවනාවට යොග්‍ය ස්ථානයකට එළඹිය යුතුය.
6. සුළු පලිබෝධයන්ද දුරුකට යුතුය.
7. භාවනාවට නියම විධි එකකුදු නොපිරිහෙලමින් භාවනා කළයුතුය.

### 1. සිල් පිරිසුදු කරගැනීම.

පඤ්චශීලය, දසශීලය, උපොසථ ශීලය, සාමණේර ශීලය, උපසම්පදා ශීලය යනාදී වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇති ශීලයන් අතුරෙන් තමා රක්නා යම් සීලයක් වේනම්, එය මනාකොට සමාදන්ව, ආරක්‍ෂා කරගත යුතු. මෙයින් කාය සංවරයද, වාග් සංවරයද ඇතිවේ. ශීලය ආවර්ජනා කරන්නා-හට ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ තියුණු බවට පැමිණේ. එකල්හි ඔහුගේ සිත කෙලෙශයන්ගෙන් පිරිසුදු වන හෙයින් චිත්ත භාවනාවට සුදුසු වන්නේය.

## 2. දශවිධ පලිබෝධයන් දුරුකිරීම.

චිත්ත භාවනාව ආරම්භ කිරීමට පෙර ඔහු විසින් දුරු කටයුතු පලිබොධ දශය නම්:

1. ආවාස පලිබොධ.
2. කුල පලිබොධ.
3. ලාභ පලිබොධ.
4. ගණ පලිබොධ.
5. නව කර්ම පලිබොධ.
6. අද්ධාන පලිබොධ.
7. ඥාති පලිබොධ.
8. ආබාධ පලිබොධ.
9. ග්‍රන්ථ පලිබොධ.
10. ඍද්ධි පලිබොධ.

**1. ආවාස පලිබොධ**– භාවනා කර්මයෙහි යෙදෙන පුද්ගලයා, වාසස්ථානයන්හි නො ඇලිය යුතු. හෙතෙම එහි කරනු ලබන නව කර්මාදියෙහි යෙදී වාසය කරන්නේද, සිහිල් සෙවන මිහිරි පැන් ආදීවූ සැප විහරණයට උපකාර වන දෑය අපෙක්ෂා කෙරේද, එහි ඇලෙමින් එයට ප්‍රිය කරමින් වසන්නේද, එවැනි තැන් ඔහුගේ භාවනා කර්මයට බාධා කරන්නාවූ පලිබොධයක් වන්නේය.

**2. කුල පලිබොධය**– ඥාති කුලයෙහි හෝ උපස්ථාන කුලයෙහි හෝ ඇලීමත් පලිබෝධයකි. භාවනා කර්මයෙහි යෙදීමට පමණක් නොව තමාගේ ශීලය රැක ගැනීමටද, බාධාවක් විය හැකි. එබැවින් භාවනාවෙහි යෙදෙන පුද්ගලයා විසින් තම මව්පිය නෑ මිතුරු ආදීන් කෙරෙහිත්, උපස්ථාන කරන්නවුන් කෙරෙහිත් ඇලීමක් නැතිව විසිය යුතු.

**3. ලාභ පලිබොධය**– ලාභ සත්කාරාදියෙහි ඇලෙන පුද්ගලයන්ට, කර්මස්ථාන භාවනායෙහි යෙදිය නොහැකි වේ සිල්වත් ගුණවත් භික්ෂූන්හට සිව්පස ලාභයෙන් අඩුවක් නැත. ගිය ගිය තැන සැදැහැති උපාසක උපාසිකාවෝ භික්ෂූන් වහන්සේ සොයා ගෙනවිත් ආරාධනා කොට සිව්පස යෙන් පුදති. මෙසේ දායකයන් සතුටු කරවන්නට යෑමෙන් භාවනා කර්මයට බාධා පැමිණේ. යොගාවචර භික්ෂුව මිනිසුන් ගැවසෙන තැන් හැරපියා හුදකලාව විසීමට කැමති වන්නේ ලාභය පලිබොධයක් විය හැකි බැවිනි.

**4. ගණ පලිබොධය**– සූත්‍රාන්ත, අභිධර්ම, ආදී වශයෙන් ධර්මය ඉගෙනගන්නා පිරිසට පත පොත කියවීම්, අර්ථ කියා දීම් ආදියෙහි යෙදෙන භික්ෂූන් වහන්සේට මහණදම් පිරීමට හෝ භාවනා කර්මයෙහි යෙදීමට හෝ අවකාශයක් නොලැබේ. එබැවින් ධර්මය හදාරන්නාවූ **ගණයා** ඒ භික්ෂුවහට පලිබොධයකි. එවැනි ගණයා ඇති කල්හි ඔවුන් අන් ආචාර්යයන් වහන්සේ නමකට හෝ පවරා තෙමේ අරණ්‍යගතව ගණ පලිබෝධයෙන් මිදී භාවනායෙහි යෙදෙන්නේය.

**5. නව කර්ම පලිබොධය**– යොගාවචර භික්ෂූන් වහන්සේ වසන ස්ථානයෙහි යම් නව කර්මාන්තාදියෙක් කරණු ලබන්නේ නම්, ඒ කටයුතු සොයා බැලීම ඒ භික්ෂුවට භාරවීනම්, භාවනා කර්මයට එය බාධාවක්, පලිබෝධයක් වන්නේය. එබැවින් භාවනාවෙහි යෙදෙනු කැමැති ඒ භික්ෂූන් වහන්සේ ඒ වැඩ කටයුතු අනිකුත් සංඝයාට භාරකොට අරණ්‍යගතව කමටහන වඩන්නේය.

**6. අද්ධාන පලිබොධය**- අරණ්‍යගතව හෝ අන් තැනෙක හෝ භාවනාවෙහි යෙදී සිටින පුද්ගලයා හට යම් කලෙක ප්‍රත්‍යය සෙවීම් පිණිස හෝ අන් කටයුත්තක් සඳහා හෝ යම් තැනෙක යාමට කැමැත්තක් ඇතිවූව-හොත් ඒ ගමන් යාමට උපන් සිත සංසිඳුවාගෙන විසිය

යුතුය එය ඉතා දුෂ්කර කටයුත්තකි. එබැවින් අද්ධානය හෙවත් ගමන් යාමෙහි අපෙක්ෂාව යොගාවචරයා හට බාධාවකි. පලිබොධයකි.

**7. ඥාති පලිබොධය** – මෙහි **ඥාතිහු** නම් **ආචාර්‍ය්‍යය, උපාධ්‍යාය, සද්ධිවිහාරිකය, අන්තෙවාසිකය, සමානොපාධ්‍යායකය, සමානාචාර්‍ය්‍යකයෝ** සහ ගෘහයෙහි **මව්, පිය, සහෝදරාදීහුය.** මේ ඥාතීන් හට යම් ගිලන් බවෙක් හෝ අන් කටයුත්තෙක් හෝ ඇතිවී තමාගේ පැමිණීම අපෙක්ෂා කරන්නේ නම්, එයද භාවනා කර්මයට බාධාවකි පලිබොධයකි. එවැනි අවස්ථාවක් ඇතිවූවහොත් එහි ගොස් සුදුසු සේ උපස්ථාන කොට නිරොගී කොට නැවත භාවනාවෙහි යෙදිය යුතු. ගිලන් වූයේ උපාධ්‍යායන් වහන්සේ නම්, සුව වනතෙක් හෝ දිවිහිම් කොට වුවත් උපස්ථාන කළයුතු වේ. එසේම ප්‍රව්‍රජ්‍යාචාර්‍ය්‍ය, උපසම්පදාචාර්‍ය්‍ය සද්ධිවිහාරිකයෝද, තමන් විසින් කර්ම වාක්‍ය කියා උපසම්පදා කරගත්තාලද, තමා විසින් පැවිදි කරවන ලද අන්තෙවාසිකයෝද දිවිහිම්කොට උපස්ථාන කළයුතු වෙත්. මව් පියන්ටද උපාධ්‍යායයන් වහන්සේට මෙන්ම උපස්ථානකළ යුතුය. තමා සතු බෙහෙත් ආදියෙන් හෝ පිඩුසිඟා ලත් දෙයින් හෝ උවටැන් කළ යුතුය. සහෝදර සහෝදරියන්ට තමා සතු බෙහෙතින් සත්කාර කොට, හැකි නම් පසුව එය ලබාගත යුතුය. ස්වකීය ඥාති නොවූවන්ට එසේ නොපිළිපැදිය යුතු.

**8. ආබාධ පලිබොධය** – යෝගාවචර තෙමේ යම්කිසි රොගයකින් පෙළෙන්නේ නම් එයද භාවනාවට පලිබොධයකි. රෝගයට පිළියම් කොට එය සංසිඳුවා ගතයුතු. ඉවසාගත හැකි නම් සසර ස්වභාවය සිහිකොට මහණදම් පිරීමට උත්සාහවත් වියයුතු.

**9. ග්‍රන්ථ පලිබොධය** – යම් යොගාවචර භික්ෂුවක් පර්‍ය්‍යාප්ති ධර්මය සජ්ඣායනා කිරීමය, ධාරණය, පරිපුච්ඡාය යනාදීවූ කෘත්‍යයන්හි නිතර ව්‍යාවෘත වේ නම් එයද භාවනා

කර්මයට පලිබෝධයකි. දතයුතු ධර්මය පළමුකොට ඉගෙණ පසුව භාවනායෙහි යෙදෙන යෝගාවචරයාහට භාවනාව සමෘද්ධ වූ පසු බොහෝ කලක් ගත වූයේ වී නමුත්, පළමු ඉගෙන ගත් දහම සිහිවත්තේමය.

**10. ඍද්ධි පලිබෝධය** – පෘථග්ජන ඍද්ධිය පලි-බොධයක් වන්නේ විදර්ශනා භාවනාවටය. සමාධිය ලබා අනතුරුව, ඍද්ධි ලැබිය යුතු බැවින් සමාධි භාවනාවට ඍද්ධිය පලිබෝධයක් නොවේ. එබැවින් විදර්ශනා වඩා මාර්ගඵල ලබනු කැමති යෝගාවචරයා විසින් ඍද්ධි පලි බොධය සිඳලිය යුතුය.

## 3. කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක ගෙන් ස්වකීය චරිතානුකූල වූ කර්මස්ථානයක් ලබා ගතයුතු.

මෙහි **කමටහන සබ්බත්ථක කමටහනය, පාරිහාරිය කමටහනය** යයි දෙවැදෑරුම් වේ. එයින් බෞද්ධයින්හට **බුද්ධානුස්සතිය, මරණානුස්සතිය, අසුභ භාවනා** යනාදිය හැම තැන්හිදීම වැඩිය යුතු හෙයින් එයට **සබ්බත්ථක කමටහන** යයි කියනු ලැබේ. **පාරිහාරිය කමටහන** නම් නියම වශයෙන් ඒ ඒ පුද්ගලයන් විසින් පරිහරණය කළ යුතු කමටහනය.

කමටහන් ගත් යොගාවචරයා විසින් පළමුකොට බුදුගුණ සිහිකොට ඉක්බිතිව තමා කෙරෙහිද සීමාවෙහි වසන පිරිස කෙරෙහිද, එහි වසන දෙවියන් කෙරෙහි ද, ගොචරග්‍රාමවාසී ප්‍රභූන් කෙරෙහිද, එහි මහාජනයා කෙරෙ-හිද සකල සත්ත්වයන් කෙරෙහි ද මෙසේ පිළිවෙලින් "සුවපත් වෙත්වා නිදුක් වෙත්වා" යනාදීන් මෙත් වැඩිය යුතු. මෙසේ මෙත් වැඩීමෙන් දෙවියන් සහිතවූ මනුෂ්‍යයන්ගෙන් ආරක්‍ෂාව ලැබ, සුවසේ විසීමටද, උපද්‍රව රහිතව භාවනා කර්මය කිරීමටද හැකි වන්නේය. එමෙන්ම මරණානුස්මෘතිය වඩන්නේ නම් සසර කළකිරීම ඇතිවී අයෝග්‍ය ප්‍රත්‍ය සෙවීම

ආදිය අත්හැර, වඩ වඩාත් උත්සාහයෙන් ප්‍රතිපත්ති පිරීමට උපකාර ලැබ ගන්නේය. අසුභ සංඥා වැඩීමෙන් පඤ්චස්කන්ධයෙහි ආශාව දුරුවේ. මෙසේ **සබ්බත්ථක කමටහන්** වඩා ඉක්බිති තමා විසින් **පාරිහාරිය කමටහන** නම් වූ තම චරිතයට අනුකූල වූද නිතර පරිහරණය කළයුතු වූද කමටහන ගෙන වඩන්නට උත්සාහ කළයුතු.

කමටහන ලබාගත යුත්තේ යහපත් ගුණ ඇති **කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකගෙන්ය**. ඔහු කෙරෙහි පැවතිය යුතු ගුණ නම්–

**1. ප්‍රිය භාවය** – ස්වකීය සීලසම්පත්තියෙන් ආශ්‍රය කරන්නවුන්ට ප්‍රිය භාවය ඇතිවිය යුතු.

**2. ගරු භාවය** – ගරු කටයුතු පුද්ගලයෙක් ද විය යුතු.

**3. ගුණවත් බව** – ගුණවත් වීමෙන්ද ගෞරවයට භාජන වියයුතු.

**4. අවවාද දීම** – කරුණායෙන් අන්‍යයන්ට අවවාද දෙන පුද්ගලයෙක්ද වියයුතු.

**5. ඉවසන සුලු බව** – චෝදනා වශයෙන් වුවත් යමෙක් ප්‍රශ්න කරන්නේ නම් එය ඉවසනසුලු විය යුතු.

**6. ගැඹුරු ධර්ම කියාදීමෙහි දක්ෂ බව** – චතුරාර්‍ය සත්‍යය, පටිච්චසමුප්පාදාදී ගැඹුරු ධර්ම කියා දීමට සමත් කෙනෙක්ද වියයුතු.

**7. ඇසුරු කළවුන් නිසි මග යවන්නට සමත් බව** – තමා ආශ්‍රය කරන පිරිස නොමග නොයවා, නිසි මගම යොදවන්නට සමත් විය යුතු. මෙකී ගුණයන්ගෙන් යුත් තැනැත්තාට **කල්‍යාණ මිත්‍රයා** යයි කියනු ලැබේ.

කල්‍යාණ මිත්‍රයන් අතුරෙන් බුදුරජාණන් වහන්සේ ශ්‍රෙෂ්ඨය. බුදුන් පිරිනිවි කල්හි අසූ මහා ශ්‍රාවකයන් අතුරෙන්

එක් ශ්‍රාවකයන් වහන්සේ නමකගෙන්ද, එසේත් නැත්නම් තමා ගනු කැමති කමටහන ගෙන ධ්‍යාන උපදවා, එය පාදක කොටගෙන විදර්ශනා වඩා රහත් බව ලබාගත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නමකගෙන්ද, එසේත් නැත්නම් පිළිවෙලින් අනාගාමීය, සකෘදාගාමීය, ශ්‍රොතාපන්නය, ධ්‍යානලාභී පෘථග්ජනයාය, ත්‍රිපිටකධරයාය, ද්විපිටකධරයාය, එකපිටකධරයාය, අටුවා සහිත එක් සඟියක්වත් ධරන ලජ්ජී පුද්ගලයාය යන මේ පුද්ගලයන් කල්‍යාණ මිත්‍රයන් වශයෙන් සලකා කමටහන ලබාගතයුතු. මෙබඳු උතුමෝ ආචාර්‍ය්‍ය මතයම ගරු කරමින් ධර්මය කියා දෙන්නාහ. අතනනොමතික නොවන්නාහ. එබඳු උතුමන්ට වත් පිළිවෙත් කොට කමටහන ගතයුතු.

මෙසේ කමටහන් ගැනීම සඳහා ආචාර්‍ය්‍යයන් වහන්සේ වෙත යන කල්හි තනිවම යායුතු. හිස්වැසුම් පාවැසුම් නොගෙනිය යුතු. යන අතරමග ඇති විහාරස්ථානයන්හිද වත් පිළිවෙත් කොට යායුතු. තමා ගෙනයන පිරිකරද සැහැල්ලු වියයුතු. මෙසේ විහාරස්ථානයට ගිය කල්හි අනිකුත් පිරිස හමුවීමට නො යායුතු. ඇතැම්විටෙක ඔව්හු ආචාර්‍ය්‍යයන්ගේ නුගුණ කියා විපිළිසර ඉපිදවිය හැකි හෙයිනි. ආචාර්‍ය්‍යයන් වහන්සේ වෙත පැමිණි කල්හි නිසි පුදසත්කාර කොට, ඔහු අණ පිළිපැද ආ කරුණු ඇසූ කල්හිම කියයුතු. මෙසේ වත් පිළිවෙත් කරමින් මනාව හැසිරෙණ කල්හි ආචාර්‍ය්‍යයන් වහන්සේ ද තමා පරීක්ෂා කොට බලා චරිතා–නුකූල වූ සුදුසු කමටහනක් දෙන්නේය.

**චරිත සය**

චරිත වශයෙන් සලකන කල්හි පුද්ගලයෝ සදෙනෙක් වෙති. එනම්:—

| | |
|---|---|
| **1. රාග චරිතයාය** | **4. ශ්‍රද්ධා චරිතයාය** |
| **2. ද්වේෂ චරිතයාය** | **5. බුද්ධි චරිතයාය** |
| **3. මෝහ චරිතයාය** | **6. විතර්ක චරිතයාය** |

1. **රාග චරිතයා** – යම් පුද්ගල සන්තානයෙක්හි රාගය උත්සන්න භාවයෙහි පවත්තේ නම් හෙතෙමේ රාගචරිතයෙකි. කුසල් කරණ අවස්ථාවෙහි රාගචරිතයාහට ශ්‍රද්ධාව බලවත්ව පවතී. කුසලපක්ෂයෙහිවූ ශ්‍රද්ධාව සිනිඳු වන්නාක් මෙන් අකුසල පක්ෂයෙහි වූ රාගය ද සිනිඳුවේ. ශ්‍රද්ධාව ශීලාදී ගුණ සොයන්නාක් මෙන් රාගය ද වස්තු කාමයන් සොයන්නේය. ශ්‍රද්ධාව හිතවත් දෙය අත් නොහරින්නාක් මෙන් රාගය ද අහිත දෙය අත් නොහරී. එහෙයින් ශ්‍රද්ධාව, රාගයට ආසන්න ගුණ ඇති ධර්මයකැයි කියනු ලැබේ. තවද, පූර්ව ජන්මයෙහි ඉෂ්ට ක්‍රියා හා ශුභ ක්‍රියා බහුල කොට ඇති ව උපන්නේ නම් ඇතැම් කෙනෙක් රාගචරිතයෙක් වන්නේයයි කියනු ලැබේ. ඕහට පඨවි, ආපො, තෙජෝ, වායෝ යන සිව් ධාතුහුම සම ව පවතිත් යයි ද කියති.

ඉරියව් වශයෙන් සලකන කල්හි, රාග චරිතයා ප්‍රකෘති ගමන් යන කල්හි ලීලායෙන්ම යයි. හෙතෙමේ සෙමෙන් සම ව පා තබා සම ව පා නගන්නේය. ඔහුගේ සිටීම හා හිඳීම ද ප්‍රසාද ජනකය, මිහිරි ය. ඔහු නිදන කල්හි සෙමෙන් සම්කොට යහන සකස් කොට, සෙමෙන් වැදහෙව අඟ පසඟ ඔබ්මොබ නොවිසිරෙනසේ මැනවින් තබාගෙන, ප්‍රසාද එලවන ආකාරයෙන් නිදන්නේය. අවදි වන කල්හි ද වහා නැගී සිට සෙමෙන් කථා කරන්නේය.

රාග චරිතයා මිහිරි ආහාරයට කැමති වන්නේය. සිත්කලු රූපයන් දුටු කල්හි මවිතවූවකු මෙන් බොහෝ වේලා බලා සිටී. සවල්ප වූ ගුණයෙහි ඇලෙන්නේය. ඇති දෙස් ගණනට නොගනී.

රාග චරිතයා කෙරෙහි බලපවත්නා ක්ලේශ ධර්මයෝ නම්—

1. **මායා** හෙවත් තමා කෙරෙහි ඇති දෙස් මුවහ කිරීම,

2. **සාඨෙය්‍ය** හෙවත් නැති ගුණ පහළ කිරීම.

3. **මානා** හෙවත් උඩඟු බව ය.

4. **පාපිච්ඡතා** හෙවත් නැති ගුණ පහළ කිරීම් මුඛයෙන් ප්‍රත්‍යය පිළිගැන්මෙහි පමණ නොදන්නා බව ය.

5. **මහිච්ඡතා** හෙවත් ඇති ගුණ පහළ කිරීම් මුඛයෙන් ප්‍රත්‍යය පිළිගැන්මෙහි පමණ නොදන්නා බව ය.

6. **අසන්තුට්ඨිතා** හෙවත් ලද්දෙයින් සතුටු නොවන බව ය.

7. **සිඞ්ග** හෙවත් අඟක්මෙන් උත්සන්න වූ කෙලෙස් ඇති බව ය.

8. **චාපල්‍යය** හෙවත් ශරීර හා පරිෂ්කාර හෙබවීම් වශයෙන් පැවති ලොල් බව ය.

9. **අහිරිකය** හෙවත් පාපය පිළිකුල් නොකරන බව ය.

10. **අනොත්තප්පය** හෙවත් පාපයට බිය නොවන බව ය.

11. **මද** හෙවත් මත් බව ය.

12. **පමාද** හෙවත් සිහි නුවණ නැති බව ය.

යනාදී අකුසල ධර්මයෝ රාග චරිතයා කෙරෙහි බල පවත්වති.

රාග චරිතයාහට සප්පාය නම්, අපිරිසුදු වූ කොළ සෙවෙණි කළ කැඩී බිඳී ගිය බිත්ති ඇති වවුලන් ගෙන් ගැවසී ගත්, පිළිකුල් උපදවන, දුර්වර්ණ යහන් ඇති පන්සල් ය, දුර්වර්ණ වූ රළු වස්ත්‍ර ය, මැටි හෝ යකඩ පාත්‍රය, පිඬු පිණිස යාමේදී විසම මාර්ගය, ගරු නොකරණ මිනිසුන් ඇති ගම්ය, පිළිකුල් වූ සිරුරු ඇති ව චිත් අගෞරවයෙන් වළඳවන දැසයෝ ය, කුසගිනි නිවීමට පමණක් සෑහෙන රූක්ෂ වූ ආහාරය ද යන මොව්හු වෙත්.

**2. ද්වේෂ චරිතය** – ද්වේෂය බහුල කොට ඇති පුද්ගල තෙමේ ද්වේෂ චරිතයා ය. කුසල් කරණ කල්හි ද්වේෂ චරිතයාහට බුද්ධිය බලවත්ව පවතී. ස්නේහය රහිත බවත් අරමුණෙහි නොඇලීමත් බුද්ධියේ ලක්ෂණයෙකි. ද්වේෂ චරිතයා ද සෙනහ රහිතය එහෙයින් අරමුණෙහි නොඇලේ. බුද්ධිය, ඇති වරද සොයන්නාක් මෙන්, ද්වේෂය ද නැති වරද සොයන්නේය. බුද්ධිය සංස්කාරයන් දුරු කරණ ආකාරයෙන් පවතින්නාක් මෙන් ද්වේෂය ද සත්ත්වයන් දුරුකරණ ආකාරයෙන් පවතී. එහෙයින් බුද්ධිය ද්වේෂයට ආසන්න ගුණ ඇති ධර්මයකැයි කියනු ලැබේ.

ඉරියව් පැවැත්වීමේදී ද්වේෂ චරිතයා පතුල් අගින් බිම සාරන්නාක්හු මෙන් යන්නේය. පාදයන් ද වහා බිම තබා වහා ම නගන්නේ ය. ඔහුගේ සිටීම හා හිඳීම ද තද ය, දූඩි ය. ඔහු නිදන කල්හි යම්තම් දෙයකින් යහන පනවාගෙන මුළු ශරීරයම හෙළාලන ලදුව මුහුණත් හකුළුවාගෙන නිදන්නේය. පුබුදුවන කල්හි ද වහා නැගී සිට කිපී එකෙකු මෙන් කථා කරන්නේ ය.

පූර්වජන්මයෙහි අත්පා සිඳුම්, වධබන්ධන, වෛරක්‍රියා බහුලකොට ඇතිව හෝ නිරයෙන් හෝ නාගයෝනියෙන් චුත ව හෝ මෙහි උපන් කල්හි ඇතැම් කෙනෙක් ද්වේෂ චරිතය ඇත්තෙක් වන්නේයයි කියනු ලැබේ. ඔහුගේ තෙජෝ වායෝ ධාතූහු උත්සන්න වෙති.

තවද ද්වේෂ චරිතයා ඇඹුල් වූ ආහාරයට කැමතිවෙයි. ස්වල්ප වූ ද අමනාප රූපයක් දුටු කල්හි කලාන්තවූවකු මෙන් මඳ වේලාවක් බලා සිටින්නේය. ස්වල්ප දෝෂයෙහි ද නැවෙන්නේය. ඇති ගුණය පවා ගණනට නොගනී.

ද්වේෂ චරිතයා කෙරෙහි බලපවත්නා ක්ලේශ ධර්මයෝ නම්:–

1. **ක්‍රෝධය** හෙවත් කිපෙනසුළු බව ය.

2. **උපනාහ** හෙවත් බද්ධ ක්‍රෝධය, වෛරය.

3. **මක්ඛ** හෙවත් අනුන්ගේ ඇති ගුණ මැකීම ය.

4. **පලාස** හෙවත් යුගග්‍රාහය. ගුණ ඇත්තේ ඔහුට පමණ ද, මට ද ඒ ගුණ ඇතැයි ගැනීම.

5. **ඉස්සා** හෙවත් පරසම්පත් නොඉවසීම ය.

6. **මච්ඡරිය** හෙවත් ස්වසම්පත් සැඟවීම ය.

ද්වේෂ චරිතයාහට සප්පාය නම්, ඉතා පිරිසුදු වූ ද, නොයෙක් චිත්‍රකර්මාදියෙන් සරසන ලද, අලංකාර සැප පහසු යහන් ආදිත් ඇති, දුටු පමණින් ප්‍රිය උපදවන සේනාසන ද, පිරිසුදු වූ අලඞ්කාර මාර්ගී ද, ඉතා පිරිසුදු සියුම් සිවුරු පිරිකර ද, පිරිසුදු පැහැ ඇති යකඩ පාත්‍ර ද, ඉතා දුර ද නො වූ ආසන්න ද නො වූ ගම් ද, මනාව සකස් කොට සියතින්ම ප්‍රණීත ආහාරයන් වළඳවන දායකයන් ද යන මොව්හු වෙති.

**3. මෝහ චරිතයා** – මෝහය බහුල කොට ඇති තැනැත්තේ මෝහ චරිතයා නම් වේ. මොහු නුපන් කුසල් උපදවන්නට උත්සාහ කරන්ම බොහෝසෙයින් අන්තරායකර විතර්ක උපදී. විතර්කය මෙන් මෝහය ද අරමුණෙහි ව්‍යාකූලව පවත්නා බැවින් අනවස්ථිතය. විතර්කය ලඝු කල්පනා ඇති බැවින් චඤ්චල වන්නාක් මෙන් මෝහය ද අරමුණෙහි නොබැස පවත්නා හෙයින් චඤ්චලය. එහෙයින් මෝහ චරිතයාහට විතර්ක චරිතයා සභාගයයි කියනු ලැබේ.

තවද, පූර්වජන්මයෙහි බොහෝ කොට මත්පැන් පානය කෙළේද , ධර්මශාස්ත්‍ර ඉගෙනීම නොකෙළේ ද, තිරිසන් යෝනියෙන් චුත ව මෙහි උපන්නේ ද හෙතෙමේ බෙහෙවින් මෝහ චරිතයෙක් වේ. ඔහු පඨවි ආපො ධාතු උත්සන්න පුද්ගලයෙකැයි ද කියනු ලැබේ.

ඉරියව් වශයෙන් වනාහි ඔහු අවුල් ගමනින් යන්-නෙක් වේ. තැතිගත්තෙකු මෙන් පා බිම තබා තැතිගත්තෙකු මෙන් පා නගන්නේය. ඔහුගේ සිටීම හා හිඳීම ද අවුල්

සහිතය. නිදන කල්හි යහන අවුල්සේ පණවාගෙන අත්පා ගසාගෙන මූහුණින් හෙව නිදන්නේය. පුබුදුවන කල්හි ද මැලිකමින් නැගී සිටින්නේය. ආහාර ගැනීමේදී අසවල් රසයට ප්‍රිය යයි කිය නොහැකිය. වික්ෂිප්තව නොයෙක් දේ සිතමින් වළඳන්නේය. යම් රූපයක් දුටු කල එහි විවේචනය අනුන්ගේ අදහස් අනුවම කරන්නේය. අන්‍යයෝ නින්‍දාකරත් නම් තමා ද නින්‍දා කරන්නේය. ප්‍රශංසා කරත් නම් තමා ද ප්‍රශංසා කරන්නේය. ඔහුගේ අඥාන භාවය ප්‍රකටය.

මෝහ චරිතයා කෙරෙහි බලපවත්නා අකුසල ධර්මයෝ නම්:-

1. **ථීනය හා මිද්ධය** හෙවත් චිත්ත චෛතසිකයන්ගේ ගිලන් බව, අලස බව.
2. **උද්ධච්චය** හෙවත් නොසන්සුන් බව ය.
3. **කුක්කුච්චය** හෙවත් පසුතැවිල්ල ය.
4. **විචිකිච්ඡා** හෙවත් සැකය.
5. **ආදාන ගාහිතා** හෙවත් නුනුවණින් දැඩිකොට ගන්නා බව ය.
6. **දුප්පටිනිස්සග්ගතා** හෙවත් ගත් මිථ්‍යාදෘෂ්ටිය ඉවත් කොට අත් නොහැරිය හැකි බව ය.

මෝහ චරිතයාහට සප්පාය නම් – සම්බාධ රහිත වූ, මුවහ නැති එළිමහත් සෙනසුන් ද, සක්මන ද, ප්‍රිය වූ ද, පිරිසුදු වූ ද සිවුරු පිරිකර හා අහර ද වෙත්.

**4. ශ්‍රද්ධා චරිතයා** – මොහුගේ ක්‍රියා පිළිවෙළ බොහෝ සෙයින් රාග චරිතයාට සමාන ය.

මොහු කෙරෙහි බලපවත්නා ගුණයෝ නම්:-

1. **මුත්තචාගිතාවය** හෙවත් දෙන දෙයෙහි නො ඇලී දීම ය.
2. **බුද්ධාදී ආර්‍ය්‍යයන් දක්නා කැමති බව ය.**

3. **බණ ඇසීමට කැමති බව ය.**

4. **ප්‍රීති බහුල බව ය.**

5. **රජ ඇමති ආදීන් හා එක්ව නොවසන බව ය.**

6. **මායා රහිත බව ය.**

7. **පැහැදිය යුතු තැන පහදින බව ය.**

ශ්‍රද්ධා චරිතයා හට සප්පාය නම්. ද්වෙෂ චරිතයාට කී පරිදිය. විශේෂයෙන් වනාහි බුද්ධානුස්සති ආදී අනුස්සති සය සප්පාය වේ.

**5. බුද්ධි චරිතයා** – මොහු බොහෝසෙයින් ද්වෙෂ චරිතයා මෙනි.

මොහු කෙරෙහි බලපවත්නා ගුණයෝ නම්:–

1. **කීකරු බව ය.**

2. **කල්‍යාණ මිත්‍රයන් ඇති බව ය.**

3. **භෝජනයෙහි පමණ දන්නා බව ය.**

4. **සිහිනුවණ ඇති බව ය.**

5. **අප්‍රමාද බව ය.**

6. **සංවේග කටයුතු තන්හි සංවේග කරණ බව ය.**

7. **සංවේගයට පැමිණ නුවණින් වීය්‍ර්‍ය කරණ බව ය.**

බුද්ධි චරිතයා හට අසප්පයා වශයෙන් කිවයුතු යමක් නැත. කවරෙක් වුවද සප්පයා වන්නේය.

**6. විතර්ක චරිතයා** – බොහෝසෙයින් මෝහ චරිතයා හට සමානය.

ඔහු කෙරෙහි බලපවත්නා ධර්‍මයෝ නම්:–

1. **දොඩමළු බව ය.**

2. **ගණසඞ්ගණිකාරාමය.**

3. **කුසලානුයොගයෙහි අනභිරතිය.**

4. **සථිර සිත් නැති බව ය.**

5. **රාත්‍රියෙහි මෙසේ මෙසේ කරමියි විතර්ක කරණ බව ය.**

6. **දහවල් විතර්කිතයන්හි යෙදෙන බව ය.**

7. **අරමුණින් අරමුණට යන බව ය.**

විතර්ක චරිතයාහට සප්පාය නම් - විවෘත සේනාසන ද, ගැඹුරු පර්වත විවරය ද, වනයෙන් මුවහ වූ ගුහා බඳු සේනාසන ද වෙත්. සෙස්ස රාග චරිතයාහට කී පරිදි දතයුතු.

## සතළිස් කර්මස්ථාන

සමථ භාවනා පිණිස කර්මස්ථානයෝ සඞ්ඛ්‍යා වශයෙන් සතළිසකි. එනම්:-

**1. දස කසිණ** - පඨවි කසිණය, ආපො කසිණය, තේජෝ කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, ඕදාත කසිණය, ආලෝක කසිණය, ආකාශ කසිණය.

**2. දස අසුභ** - උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලෝහිතක, පුලවක, අට්ඨික.

**3. දස අනුස්සති** - බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, මරණානුස්සති, කායගතාසති, ආනාපානසති, උපසමා-නුස්සති.

**4. සතර බ්‍රහ්මවිහාර** - මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා.

**5. සතර ආරූප්‍යයෝ** – ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය,

**6. ඒකසංඥා** – ආහාර පටික්කූල සංඥාව.

**7. ඒක වවත්ථාන** – චතුධාතු වවත්ථානය.

මේ සතළිස් කමටහන් අතුරෙන් උපචාරධ්‍යානය පමණක් ගෙන දෙන කමටහන් දශයෙකි. එනම්:–

1. **බුද්ධානුස්සති,**
2. **ධම්මානුස්සති,**
3. **සඞ්ඝානුස්සති,**
4. **සීලානුස්සති,**
5. **චාගානුස්සති,**
6. **දේවතානුස්සති,**
7. **මරණානුස්සති,**
8. **උපසමානුස්සති,**
9. **ඒකසංඥා,**
10. **ඒක වවත්ථාන.**

සෙසු කර්මස්ථාන තිස (30) වැඩීමෙන් අර්පණාව ද ලබාගත හැකි වේ. මෙසේ මේ සතළිස් කර්මස්ථානයෝ **උපචාර වන කර්මස්ථානයෝය, අර්පණා වන කර්මස්ථාන-යෝයයි** දෙවැදෑරුම් වේ.

තිස්වැදෑරුම් අර්පණා වන කර්මස්ථානයන් අතුරෙන්–

**1. චතුෂ්කධ්‍යානික** හෙවත් සතර රූපාවචරධ්‍යාන ගෙන දෙන කර්මස්ථානයෝ එකොළොසකි. එනම්:–

**ආනාපානසතිය** හා **දසකසිණයෝ ය.**

**2. ප්‍රථමධ්‍යානික** හෙවත් ප්‍රථමධ්‍යානය පමණක් ම ගෙන දෙන කර්මස්ථානයෝ ද එකොළොසකි. එනම්:-

**කායගතාසතිය** හා **දස අසුභයෝ** ය.

**3. ත්‍රිකධ්‍යානික** හෙවත් ප්‍රථම, ද්‍විතිය, තෘතීය ධ්‍යාන පමණක් ගෙන දෙන කර්මස්ථානයෝ තිදෙනෙකි. එනම්:-

**මෛත්‍රී, කරුණා, මුදිතා** යන ප්‍රථම බ්‍රහ්මවිහාර තුනය.

**4. චතුර්ථධ්‍යානික** හෙවත් චතුර්ථධ්‍යානය පමණක් ගෙන දෙන කර්මස්ථානයෝ පසෙකි. එනම්:—

**උපෙක්ඛා බ්‍රහ්මවිහාරය** හා **සතර අරූප්‍යයෝය.**

මේ සතළිස් කර්මස්ථාන **ධ්‍යාන ප්‍රභෙද** වශයෙන් සතර කොටසකට බෙදා දත යුතු.

යට දක්වන ලද චතුර්විධ ප්‍රභෙදයන් අතුරෙන් චතුෂ්කධ්‍යානික හා ත්‍රිකධ්‍යානික කර්මස්ථානයන්හි ඇත්තේ **අඞ්ග සමතික්‍රමය යි.** එනම්— විතර්කාදී ධ්‍යානාඞ්ගයන් ඉක්මවා ඒ අරමුණු කොට ම ද්විතියධ්‍යානාදිය ඉපදවීම ය. චතුර්ථධ්‍යානිකයෙහි වූ උපෙක්ඛා බ්‍රහ්මවිහාරයෙහි ද ඇත්තේ **අඞ්ගසමතික්‍රමයයි.** එහිදී මෛත්‍රාදිය පිළිබඳ අරමුණෙහි සොමනස්සය ඉක්මවා ලැබිය යුතු හෙයිනි. සතර ආරූප්‍ය යන්හි ඇත්තේ **ආරම්මණ සමතික්‍රමයයි.** එහිදී ආකාශ කසිණය හැර සෙසු පඨවි ආදි නව කසිණයන් අතුරෙන් යම් කිසිවක් ඉක්මවා ආකාසානඤ්චායතනය ලැබිය යුතු. ආකාශාදිය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනාදිය ලැබිය යුතු. සෙසු කර්මස්ථානයන්හි එවැනි සමතික්‍රමයක් හෙවත් අඞ්ග හෝ ආරම්මණ ඉක්මවීමක් නැත. මෙසේ සමතික්‍රම වශයෙන් කර්මස්ථාන දත යුතු.

මේ සතළිස් කමටහන් අතුරෙන් පැතිරවීම් වශයෙන් වැඩිය යුතු වන්නේ දස කසිණ පමණකි. ඒ කසිණ

සම්තාක් තැන් පතුරුවා ද එතෙක් තැන් දිව්‍යශ්‍රොතාභිඥා-වෙන් ශබ්ද අසන්නට ද, දිව්‍ය චක්ෂුරභිඥායෙන් රූප දකින්නට ද, චෙතොපරියඥාණයෙන් පරසිත් දැනගන්නට ද උපකාරවේ. අන්‍ය වූ තිස් කම්සථාන වැඩීමෙන් හෙවත් පැතිරවීමෙන් ප්‍රයෝජනයක් නැත. මෙසේ **වර්ධනාවර්ධන වශයෙන්** කම්සථාන දත යුතු.

**ආරම්මණ** වශයෙන් වනාහි, **දස කසිණ, දස අසුභ, ආනාපානසති, කායගතාසති** යන දෙවිසි කම්සථානයෝ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට පවතී. **සතර බ්‍රහ්ම විහාරයෝ ද, ආකාසානඤ්චායතනය** සහ **ආකිඤ්චඤ්ඤා-යතනය** යන කම්සථාන සය ප්‍රඥප්ති අරමුණු කොට පවතී. **විපුබ්බකය, ලොහිතකය, පුලවකය, ආනාපාන සතිය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය** හා සූර්‍ය්‍යාලොකාදියෙන් ගන්නා **ආලොක කසිණය** යන මේ කම්සථාන අට **චලිතාරම්මණ** අරමුණු කොට ප්‍රතිභාග නිමිති ඉපදීමට පූර්වභාගයෙහි පවතී. ප්‍රතිභාග නිමිති උපන් කල්හි එය අචලිත ම වේ. සෙසු කම්සථානයෝ අචලිත අරමුණු ඇත්තාහු වෙති. ආනාපාන සතිය හා කායගතා සතිය හැර සෙසු අනුස්සති අට ද, ආහාරප්‍රතික්කූල සංඥාව, චතුධාතු වවත්ථානය, විඤ්ඤාණඤ්චායතනය, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය යන මේ කම්සථානයෝ සවභාව ධර්ම අරමුණු කොට පවත්නාහ.

මේ සතළිස් කම්සථානයන් අතුරෙන් **දස අසුභ, කායගතාසති, ආහාර ප්‍රතික්කූලසංඥා** යන කම්සථාන දෙළොස දෙව භූමියෙහි නොලැබේ. ඒ දෙළොස හා **ආනාපාන සතිය** ද රූපාවචර බ්‍රහ්ම භූමියෙහි නැත: අරූප තලයන්හි **සතර ආරූප්‍යයෝ** පමණක් ලැබේ. මනුෂ්‍ය භූමියෙහි මේ සතළිස් කමටහන ම ලැබෙත්.

**කමටහන් ගැනීම** ත්‍රිවිධාකාරයෙන් සිදුවේ. එනම්:— **දැකීමෙන් ද, ඇසීමෙන් ද, ස්පර්ශ කිරීමෙන් ද** යන තුන් **ආකාරයෙනි.**

වායෝ කසිණය හැර **සෙසුකසිණ නවය ද, දස අසුභ ද** යන එකුන් විසි (19) කර්මස්ථානයෝ පූර්වභාගයෙහි දී ඇසින් දුටු වස්තු කරණ කොට ගෙන ම උග්ගහ නිමිත්ත ඉපිද විය යුතු. කායගතාසතියෙහි තචපඤ්චකය දැකීමෙන් ම අරමුණ ගතයුතුවේ සෙස්ය ඇසීමෙන් ගතයුතු. එබැවින් එය දිට්ඨ, සුත වශයෙන් ගතයුතු. ආනාපාන සතිය වනාහි ස්පර්ශයෙන් ද, වායෝ කසිණය දැකීමෙන් හා ස්පර්ශ කිරීමෙන් ද ගත යුතු. සෙසු අටළොස් කර්මස්ථානයෝ ඇසීමෙන් ද ගත යුතු. සතර බ්‍රහ්මවිහාරයන් අතුරෙන් උපෙක්ෂා බ්‍රහ්මවිහාරය රූපාවචර චතුර්ථධ්‍යානයට පැමිණ ඉපද වියයුතු. අරූපාවචර කර්මස්ථානයෝ ද එසේමය.

අරූපාවචරධ්‍යාන ඉපදවීමට ආකාශ කසිණය හැර ඉතිරි කසිණ නවය ප්‍රත්‍යය වෙති. අභිඥාවන්ට නම් දස කසිණ ම ප්‍රත්‍යයවෙති. මෛත්‍රී, කරුණා, මුදිතා යන ප්‍රථම බ්‍රහ්මවිහාර තුන චතුර්ථ වූ උපෙක්ඛා බ්‍රහ්මවිහාරයට ප්‍රත්‍යය වෙති. යට යට ආරුප්පයයෝ මතු මතු ආරුප්පයන්ටද නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිරෝධ සමාපත්තියටද ප්‍රත්‍යය වෙති. සියලු දිට්ඨධම්ම සුඛවිහාරයෝ විදර්ශනාවට හා සමාපත්තියට ප්‍රත්‍ය වෙත්. මෙසේ කර්මස්ථානයන්ට **ප්‍රත්‍යය වීම** දත යුතු.

**චරිත** වශයෙන් වනාහි, **රාග චරිතයා හට—දස අසුභ, කායගතා සති** යන එකොළොස අනුකූල වෙති. **ද්වේෂ චරිතයා හට—සතර බ්‍රහ්මවිහාර** හා **නීලාදි වර්ණ කසිණ සතරය** යන අට අනුකූල වෙති. **මෝහ චරිතයා හට** හා **විතර්ක චරිතයා හට ද—ආනාපාන සතිය** අනුකූල වේ. **ශ්‍රද්ධා චරිතයා හට, බුද්ධානුස්සති** ආදී ප්‍රථම අනුස්සති සය අනුකූල වෙති. **බුද්ධි චරිතයා හට—මරණ සතිය, උපසමානුස්සති, චතුධාතුවවත්ථාන, ආහාරපටික්කූල සංඥා** යන සතර අනුකූල වෙති. වර්ණ කසිණ සතර හැර සෙසු කසිණ ද සතර ආරුප්පය ද සියල්ලන්ටම අනුකූල වෙති.

කසිණයන් අතුරෙන් **පරිත්ත කසිණය**, විතර්ක චරිතයාට ද, **අප්‍රමාණ කසිණය** මෝහ චරිතයාට ද අනුකූල වේ.

යට දක්වන ලද කමටහන් අතුරෙන් ස්වකීය චරිතානුකූල වූ කමටහනක් ගැණීම පිණිස කල්‍යාණ මිත්‍රයන් වහන්සේ කරා පැමිණි යෝගාවචරයා විසින් පළමු කොට බුදුරජාණන් වහන්සේ වෙත හෝ ආචාර්‍ය්‍යයන් වහන්සේ වෙත හෝ තම ආත්මභාවය පාවාදී ප්‍රණිධ්‍යාශයයෙන් හා ප්‍රණිධිමුක්තියෙන් යුක්තව කමටහන් ඉල්විය යුතු. බුදුරජාණන් වහන්සේට තම ආත්ම භාවය පාවාදීමෙන් ආරණ්‍ය සේනාසනාදීන්හි බිහිසුණු අරමුණු එළඹ සිටියත් බිය නොවී සොම්නස් වීමට එය ම උපකාර වන්නේය. ආචාර්‍ය්‍යයන්ට පාවාදීමෙන් ආචාර්‍ය්‍යයන් අයත් පැවතුම් ඇත්තෙක්ව ඔහුගෙන් ආමිසයෙන් හා ධර්මයෙන් ද සංග්‍රහ ලබාගෙන, ගැඹුරු ග්‍රන්ථ ඉගෙන, ආරක්ෂා සහිතව භාවනා කර්මයෙහි යෙදිය හැකිවේ. යෝගාවචර තෙමේ **ප්‍රණිධ්‍යාශයයෙන්** යුක්තවූයේ නම් තුන් බොධීන් අතුරෙන් එක්තරා බොධියකට පැමිණ සසරින් එතර වන්නේය.

බොධිඥානය මුහුකිරීම හෙවත් ප්‍රණිධ්‍යාශය සම්පන්න වීම සයාකාරයකින් සිදුවේ.

එනම්:—

1. ලොභයෙහි දොස් දක්නා බෝසත්වරු **අලෝභාධ්‍යාශය** ඇත්තෝ වෙති. සෑම අවස්ථාවන්හි දීමෙහි කෙසේ නිර්ලොභවමෝදැයි සිතා අලොභ අදහස් ඇත්තෝ වෙති.

2. ද්වෙෂයෙහි දොස් දක්නා බෝසත්වරු **අද්වේෂාධ්‍යාශය** ඇත්තෝ වෙති.

3. මෝහයෙහි දොස් දක්නා බෝසත්වරු **අමෝහාධ්‍යාශය** ඇත්තෝ වෙති.

4. **ගෘහ වාසයෙහි දෙස් දක්නා බෝසත්වරු නෙක්ඛම්මාධ්‍යාශය හෙවත් පැවිදි වීමෙහි අදහස් ඇත්තෝ වෙති.**

5. **ගණසඞ්ගණිකාවෙහි දෙස් දක්නා බෝසත්වරු ප්‍රවිවේකාධ්‍යාශය හෙවත් විවේක ගැනීමේ අදහස් ඇත්තෝ වෙති**

6. **සියලු භව ගති ආදීන්හි දෙස් දක්නා බෝසත්වරු නිස්සරණාධ්‍යාශය හෙවත් නිවන් සෙවීමෙහි අදහස් ඇත්තෝ වෙති.**

ඉදින් ආචාර්‍ය්‍යයන් වහන්සේ පරසිත් දන්නා නුවණ ඇති කෙනෙකු වී නම්, කමටහන් ඉල්වන්නාගේ සිත් සතන් බලා චරිතයට සුදුසු කමටහන දෙන්නේය. එසේ පරසිත් දන්නා නුවණ නැති ආචාර්‍ය්‍ය කෙනකු වී නම් ඔහු කෙරෙහි කවර ධර්‍ම බහුලව පවතී ද අසුභාදීන් අතුරෙන් කවරක් මෙනෙහි කරණ විට පහසු දැනේදැයි කෙබඳු කමටහනකට සිත නැමේ දැයි විචාරා දැන කමටහන දෙන්නේය.

මෙසේ කමටහන ලබාගත් පුද්ගල තෙමේ **සමාධි භාවනාවට නුසුදුසු විහාර අත්හැර, සුදුසු විහාරයක වසමින්, කුඩා පළිබෝධ ද දුරු කොට, සියලු භාවනා විධි නොපිරිහෙලමින්** භාවනාවෙහි යෙදිය යුතු වේ. ආචාර්‍ය්‍යයන් වහන්සේ හා සමග එක විහාරයෙහි විසීම පහසු වන්නේ නම් එසේ විසිය යුතු. එසේ නො හැකි නම් ගව්වක් හෝ අඩ යොදුනක් හෝ යොදුනක් හෝ දුරින් පිහිටි සප්පාය විහාරයෙක්හි විසිය යුතු. එසේ විසීමෙන් කැමති අවස්ථාවක ආචාර්‍ය්‍යයන් හමු වී කමටහන ශුද්ධ කොට ගෙන යා හැකිවේ. එබඳු වූ සප්පාය විහාර-යක්වත් නො ලබන්නේ නම් කර්මස්ථානය පිළිබඳ දතයුතු සියලුම දෙය මනා කොට ඉගෙන, දුරකට හෝ ගොස් සමාධි භාවනාවට සුදුසු විහාරයක වාසය කරමින් භාවනා ආරම්භ කළ යුතු.

# නුසුදුසු විහාර

සමාධි භාවනාවට නුසුදුසු වූ, දෝෂ සහිත වූ තැන් අටළොසකි (18). මෙයින් එක දෝෂයකින් හෝ යුක්ත විහාර නුසුදුසු විහාර ලෙස සලකනු ලැබේ. ඒ අටළොස් දෝෂ නම්:-

1. **මහා විහාරයෙහි දෝෂ** - මහා විහාරයක බොහෝ භික්ෂූහු වාසය කරති. නොයෙක් අදහස් ඇති ඒ භික්ෂූහු බෝමළු හැමදීම, පැන් පෙරා තැබීම යනාදී වූ කළමනා නොයෙක් වත් පිළිවෙත් ආදිය නො කොට කල් යවති. යෝගාවචර භික්ෂු තෙමේ පිඬු පිණිස යාමට පෙර ඒ භික්ෂූන් විසින් නො කරණ ලද යම් වත් පිළිවෙතක් වේ නම් එය සම්පූර්ණ කොට පිඬු සිඟා වැඩිය යුතු. එවිට දහවල් වී පිඬු සිඟා වැඩි ඒ භික්ෂුවට කිසි ආහාරයක් නො ලැබීමෙන් ක්ලාන්ත වීම ද ඇතිවිය හැකි. එපමණක් නොව එහි වසන අතිකුත් භික්ෂූන් ගෙන් නොයෙක් කරදර හිරිහැර ද පැමිණෙන්නට අවකාශ තිබේ. එසේ නොව නිසි වත් පිළිවෙත් කැරෙණ, අවහිරකම් රහිත වූ මහා විහාරයක්වේ නම් එය නුසුදුසු නොවන්නේ ය.

2. **අභිනව විහාරයෙහි දෝෂ** - අභිනවයෙන් ඇති කරණ ලද විහාරයක නොයෙක් නව කම් ඇතිවිය හැකි. යෝගාවචර භික්ෂුවට ද එහි කළමනා කටයුතු වේ නම් එවැනි තැන් ද භාවනාවට සුදුසු නැත. දෙස් සහිතවේ.

3. **දිරාපත් විහාරයෙහි දෝෂ** - දිරාපත් වූ තැනක නොයෙක් කැඩුම් බිඳුම් පිළියම් කරන්නට ද, කටුකොහොල් ඉවත් කොට පවිත්‍ර කරන්නට ද නිතර සිදු වේ. එය ද කමටහන පිරිහීමට හේතුවක් වේ.

4. **මහා මාර්ගාසන්න විහාරයෙහි දෙස්** - මහා මාර්ගාසන්න වූ විහාරයන්හි බොහෝ සෙයින් ආගන්තුක සම්බාධයෝ ඇත්තාහ. නිතර නිතර ආගන්තුක භික්ෂූන්

පැමිණෙන කල්හි තම අසුන් ඒ භික්ෂූන්ට දී තමන්ට සැප පහසු නැති සෙනසුන් සොයා යන්නට වීමෙන් භාවනාවට බාධා ඇති වේ. එවැනි අවහිරකම් නැති තැන් සුදුසු ය.

**5. පැන්කෙම් විහාරයෙහි දෝෂ** – ගල් පොකුණු ඇති විහාරයක් වනවිට පැන් පිණිස පැමිණෙන මහාජනයා ගෙන් ද භාජන, දර, පඬු ඔරු ආදිය සොයා එන පිරිස ගෙන් ද කරදර ඇතිවිය හැකි බැවින් එබඳු තැන් ද භාවනාවට නුසුදුසු ය.

**6. පලාපත් විහාරයෙහි දෝෂ** – පලාකොළ ආදිය ඇති තැනට දහවල් කාලයේදී පලා නෙලන වනිතාවන්ගේ පැමිණීම ද ඔවුන්ගේ විසභාග ශබ්ද ද ඇති විය හැකි බැවින් එබඳු තැන් ද භාවනාවට නුසුදුසු ය.

**7. මල් ඇති විහාරයෙහි දෝෂ** – පලාපත් විහාරයන්හි මෙන් මල් ඇති තැන්හි ද, මල් නෙලීමට එන පිරිස ගෙන් හිරිහැර ඇති විය හැකි බැවින් සම්බාධ සහිත ය.

**8. ඵල ඇති විහාරයෙහි දෝෂ** – නොයෙක් ඵල වර්ග ඇති තැනට ද බොහෝ දෙනා විත් ඵල ඉල්වාගෙන හෝ බලාත්කාරයෙන් හෝ පැහැර ගෙනයාම සිදුවන නිසා ඔවුන් වැළැක්වීමේදී අපහාස විඳීමට ද සිදුවන බැවින් එවැනි තැන් ද භාවනාවට නුසුදුසු ය.

**9. ලෝකයා විසින් සම්භාවනා කරණු ලබන විහාර** – එවැනි තැන්වල වසන භික්ෂූන් වහන්සේලා රහත් යයි සලකා බොහෝ දෙනා උන්වහන්සේලා දැක, වැඳ පුද සත්කාර කිරීමට පැමිණෙන බැවින් යෝගාවචර භික්ෂුවට එය ද නුසුදුසු තැනෙකි.

**10. නගරාශ්‍රිත විහාරයෙහි දෝෂ** – මෙහි බොහෝ දෙනා නිතර ගැවසෙන තැනක් හෙයින් භාවනාවට නුසුදුසු ය.

**11. දූව ඇති විහාරයෙහි දෝෂ** - දර හෝ දූව උපකරණයට යෝග්‍ය ගස් ඇති තැන්වලට ද දර කැඩීම පිණිස පැමිණෙන සත්‍රීන්ගෙන් ද, ගෙවල් ආදිය පිණිස ලී දඬු සොයන මිනිසුන් ගෙන් ද කරදර ඇතිවිය හැකි බැවින් භාවනාවට නුසුදුසු ය

**12. ක්ෂෙත්‍රාශ්‍රිත විහාරයෙහි දෝෂ** - කුඹුරු ලඟ ඇති විහාරයන් ද භාවනාවට නුසුදුසු ය. එහි වැඩ කරණ අය විහාරස්ථානයට පැමිණ ගොයම් පෑගීම, වී වේලීම ආදී නොකටයුතු දේ කරති. එයින් යෝගාවචර භික්ෂූන්ට මහත් හිරිහැරයකි. එවැනි උපද්‍රව නැති තැන් සුදුසු ය.

**13. විසභාගයන් ඇති විහාරයෙහි දොස්** - ඔවුනොවුන් කෙරෙහි නුරුස්නා ගති ඇති භික්ෂූන්ගේ කලහ ආදිය සිදුවන හෙයින් එවැනි තැන් ද නුසුදුසු ය.

**14. සමුද්‍රතීර ආශ්‍රය කළ විහාරයෙහි දෝෂ** - නැව් තොටවල් අසල විහාරයන්ට නිතර මිනිසුන් පැමිණ ලැගුම් ගැනීමට අවසර ඉල්වත්. ගැල්වලින් එහි පැමිණ බඩු ගෙන යන අයගෙන් ද, කරදර පැමිණෙති. එහෙයින් එවැනි ස්ථාන ද නුසුදුසු වෙත්.

**15. ප්‍රත්‍යන්තයෙහි පිහිටි ස්ථාන ද,** රත්නත්‍රයෙහි පැහැදුනු පුද්ගලයන් නැති හෙයින්, විසීමට නුසුදුසු ය.

**16. රාජ්‍ය සීමායෙහි ඇති විහාර ද** නුසුදුසු ය. එහි වසන භික්ෂුවට රාජ්‍ය දෙක්හිම මිනිසුන් සතුටු කර ගෙන විසීම දුෂ්කර කරුණකි.

**17. සප්පාය නැති** බව - රූපාදී විසභාග අරමුණු ලැබීම ද, අමනුෂ්‍යයන් ගේ ගැවසීම ද භාවනාවට බාධාවකි. එයින් ලැබෙන අපහසුකම් බොහෝ ය එහෙයින් සිත එකඟ කරගෙණ විසීම ඉතා දුෂ්කර වේ.

**18. කල්‍යාණ මිත්‍රයන් නැති බව** - තමාගේ ආචාර්ය්‍ය යන් වහන්සේ හෝ උපාධ්‍යායන් වහන්සේ හෝ නො ලැබීම ද දෝෂයකි.

## සුදුසු විහාර

අඞ්ග පසකින් සමන්විත සේනාසන සුදුසු විහාර ලෙස සලකනු ලැබේ. ඒ අඞ්ග පස නම්:-

1. ගමට ඉතා දුරත් නොවූ ඉතා ආසන්නත් නොවූ, ගමනාගමනයට ද පහසු වන්නේ ද,

2. දහවල් ජනාකීර්ණ නොව, රාත්‍රි කාලයෙහි නිශ්-ශබ්ද ව, මහාජන සන්නිපාතයෙන් වන ගිගුම් හඬ නැත්තේ වන්නේ ද,

3. මැසි මදුරු, අවු සුලං, නයි පොළොං ආදීන් ගේ ස්පර්ශ නැත්තේ වන්නේ ද.

4. සේනාසනයෙහි වසන්නවුන්ට චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර නිරායාශයෙන් ලැබෙන්නේ ද,

5. බහුශ්‍රැත වූ ධර්මවිනයධර ස්ථවිර භික්‍ෂූහු ඒ වෙහෙර වෙසෙත් ද, ඔව්හු කලින් කල එළඹ, අර්ථ විචාරත් ද, ගැඹුරු අර්ථ ලිහිල් කොට දක්වත් ද, සැක තැන් දුරු කරත් ද.

මෙසේ අඞ්ග පසකින් යුත් සෙනසුන් සුදුසු විහාර නම් වෙති.

## ක්‍ෂුද්‍ර පළිබොධය

මෙසේ සුදුසු විහාරයට පැමිණි යෝගාවචරයා විසින් යම් යම් ක්‍ෂුද්‍ර පළිබොධ ඇත් නම් එය ද සිඳලිය යුතු. හෙතෙම දික් වූ කෙස් නිය ඇත්නම් එය කැපිය යුතු. සිවුරු කිලිටි නම් එය සෝදා පිරිසුදු කරගත යුතු. ගෙත්තම් කළ යුතු නම් එය ද කළ යුතු. පාත්‍රය මල බැඳී ඇත්නම් පිසගත යුතු. ඇඳ පුටු ආදිය ද ශුද්ධපවිත්‍ර ව තබා ගත යුතු.

## පඨවි කසිණ භාවනාව

පඨවි කසිණ භාවනාවෙහි යෙදෙන භික්ෂු තෙම, යට දක්වන ලද පරිදි සියලු කටයුතු සම්පාදනය කොට දහවල් දත් වළඳා, බත්මත ද දුරු කොට ගෙන විවේක ස්ථානයකට ගොස්, අභිනවයෙන් පිළියෙල කරගන්නා ලද හෝ ප්‍රකෘතියෙන් පිහිටි පෘථිවියක හෝ නිමිත්ත ගැනීමට පිළියෙල විය යුතු.

පෙර ආත්මභාවයන්හි, බුදුසසුන්හි හෝ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් හෝ පැවිදි ව, පඨවි කසිණයෙහි චතුෂ්ක පඤ්චක ධ්‍යානයන් උපදවා ගන්නා ලද්දේ නම්, එබඳු උපනිශ්‍රය සම්පන්න පුද්ගලයන්ට කලින් පිළියෙල කරනොගත් පෘථිවියෙහි ම නිමිත්ත උපදනේ ය. **මල්ලක** නම් මහ තෙරනමක් එබඳු උපනිශ්‍රය සම්පත් ඇති වූ හෙයින් සී සෑ තැන බලත් ම ප්‍රතිභාග නිමිත්ත ඉපදී, එය වඩා, පඤ්චම ධ්‍යානය උපදවා ගෙන එය පාදක කොට ගෙන විදර්ශනා වඩා රහත් වූ සේක.

එසේ පෙර භවයන්හි පඨවිකසිණය වඩා නුපුරුදු පුද්ගල තෙම, ආචාර්‍ය්‍යයන් වෙතින් කර්මස්ථාන විධි ඉගෙන, සතර කසිණ දෙස් දුරු කොට කසිණ මණ්ඩලය සාදා ගත යුතු. ඒ සතර කසිණ දෝෂ නම්, නීල, පීත, ලෝහිත, ඕදාත යන වර්ණ මිශ්‍ර වීම ය. එවැනි දෙස් රහිත වූ අරුණුවන් මැටියෙන් කසිණ මණ්ඩලය සාදා ගත යුතු. ඒ කසිණ මණ්ඩලය කැමති තැනක ගෙනයා හැකිසේ **සංහාරිම කසිණ මණ්ඩලයක්** මෙන් සාදා ගන්නේ නම්, දඬු සතරෙක රෙදිකඩක් හෝ සමක් හෝ බැඳ, එහි තුනී කොට අඹරා ගත් මැටියෙන් එක් වියත් සතරඟුලක් වන සේ වට කොට මණ්ඩලය සාදා ගත යුතු. එහිම තිබෙන සේ හෙවත් **තත්‍රස්ථ කසිණ මණ්ඩලයක්** සාදාගනු කැමති නම්, පිරිස් නො හැවසෙන විහාරස්ථානයෙහි කෙළවර හෝ අන් තැනක හෝ කණු ගසා, වැලින් බැඳ යට කියන ලද ආකාරයට මැටිගසා සාදාගත යුතු වේ. එය ද බෙර ඇසක් සේ සම කොට තනා ගත යුතු.

**කසිණ** මණ්ඩලය මෙසේ තනා ගෙන, අවට භූමිය ද හැමද, පිරිසුදු කොට, තමා ද සනානය කොට පිරිසුදු වී කසිණ මණ්ඩලයට දෙරියන් වියත් අතර තැන, එක් වියක් සතරඟුලක් උස් කොට ආසනයක් තනා, එහි හිඳ, කාමයෙහි ආදීනවයන් හා නෙක්ඛම්මයෙහි ආනිශංස ද මෙනෙහි කොට, රත්නත්‍රයෙහි ගුණ සිහි කොට ගෙන ප්‍රීති ප්‍රමොද්‍ය උපදවා, එකාන්තයෙන් මම බුදු, පසේබුදු, මහරහතුන් පිළිපන් මේ ප්‍රතිපදාවෙන් විවේක සුවය ලබන්නෙමි යි ඡෙයර්‍ය උපදවා සමඅාකාරයෙන් බලා නිමිති ගෙන භාවනා කළ යුතු. කසිණ මණ්ඩලය දෙස බලන කල්හි එහි වර්‍ණය හෝ ලක්‍ෂණය හෝ නො සලකා, **"පඨවි", "පඨවි"** යයි ප්‍රඥප්ති ධර්මයෙහි ම සිත පිහිටුවා මෙනෙහි කළ යුතු. මෙසේ බොහෝ කලක් විටෙක ඇස් දල්වා ගෙන ද, විටෙක ඇස පියාගෙන ද ආවර්ජනා කරත් ම, ඇස පියාගෙන ආවර්ජනා කරණ කල්හි ඇස දල්වා ආවර්ජනා කරණ කලෙක මෙන් කසිණය මනා කොට වැටහෙන්නේ නම්, එකල්හි **උද්ග්‍රහ නිමිත්ත** උපන්නේ නම් වේ. මෙසේ උද්ග්‍රහ නිමිත්ත උපන් පසු එහි නොසිට අන් තැනකට ගොස් ඒ නිමිත්ත මෙනෙහි කොට භාවනා කළ යුතු. **තරුණ සමාධිය** නම් වූ මේ නිමිත්ත යම් හෙයකින් නැතිව ගියහොත්, නැවතත් කසිණ මණ්ඩලය තිබූ තැනට ගොස් පළමු පරිදි එය වඩා නිමිත්ත උපදවා ගත යුතු. මෙසේ නැවත නැවත උද්ග්‍රහ නිමිත්ත ආවර්ජනා කරණ කල්හි ක්‍රමයෙන් ඔහුගේ කාමච්ඡන්දාදී නීවරණයන් විෂ්කම්භනය වී, කෙලෙස් සංසිඳීමෙන් **උපචාර සමාධි** වශයෙන් සිත සමාහිත වන්නේ ය. එවිට **ප්‍රතිභාග නිමිත්ත** උපන්නේ වේ.

ප්‍රතිභාග නිමිත්ත උද්ග්‍රහ නිමිත්තට වඩා සියදහස් ගුණයෙන් පිරිසුදු ය. එය වර්‍ණ සණ්ඨාන ඇත්තක් නොවේ. එසේම ඇසින් දක්ක හැකි, ඖදාරික වූ, සම්මර්‍ශනයට යොග්‍ය, ලක්‍ෂණත්‍රයෙන් හෙබියා වූ අරමුණක් ද නොව, සමාධිලාභීන්ට ම වැටහෙන මාත්‍රයකි. මේ ප්‍රතිභාග නිමිත්ත

මනාව රැකගත් පුද්ගලයාහට උපචාර ධ්‍යානයාගේ උප කාරයෙන් අර්පණාව ද ලබාගත හැකි වේ. එසේ හෙයින් ඒ ප්‍රතිභාග නිමිත්ත චක්‍රවර්ති ගර්භයක් මෙන් රැකගත යුතු යයි කියන ලදී.

## ප්‍රතිභාග නිමිත්ත රැකගැනීම

ප්‍රතිභාග නිමිත්ත රැකගැනීමට අසප්පාය වූ **ආවාස, ගොදුරු ගම්, කථා, පුද්ගල, භෝජන, සෘතු, ඉරියව්** දුරු කොට සප්පාය වූ ආවාස ආදිය සේවනය කළ යුතු. එසේ සේවනය කිරීමෙන් නොබෝ කලකින් ම අර්පණාව ලබාගත හැකි වේ.

**1. ආවාස** - යම් ආවාසයක වාසය කරණ යෝගාවචරයාහට නූපන් නිමිත්ත නූපදින්නේ නම්, උපන් නිමිත්ත නැති වන්නේ නම්, නො එළඹි සිහිය නො එළඹෙන්නේ නම්, අසමාහිත සිත සමාහිත නොවන්නේ නම්, ඒ ආවාසය **අසප්පාය ආවාසයක්** වේ. යම් ආවාසයක වසන්නහුට නිමිත්ත උපදී නම්, උපන් නිමිත්ත ස්ථිර වේ නම්, සිහිය එළඹ සිටී නම්, සිත සමාහිත වේ නම් එය **සප්පාය ආවාසයක්** වන්නේ ය.

**2. ගොදුරු ගම්** - තමා වසන සේනාසනයෙන් උතුරු දිග හෝ දකුණු දිග හෝ ඉතා නුදුරු තන්හි පිහිටි භික්ෂාව සුලභ වූ ගම, **සප්පාය ගොදුරු ගම** වන්නේ ය. උතුරු දිග හෝ දකුණු දිග හෝ බලා යාමෙන් හිරු මුහුණට නො වදින හෙයින් ගමනාගමනයෙහි දී වෙහෙසට පත් නොවේ. එසේ නොවූ ගම **අසප්පාය ගොදුරු ගම** වේ.

**3. කථා** - තිරශ්චීන කථා නම් වූ දෙතිස් කථාවෝ **අසප්පාය කථා** නම් වේ. එයින් තමා ලබාගත් නිමිත්ත ද නැතිව යන්නේ ය. ප්‍රමාණවත් වූ දශ කථා වස්තු නිශ්‍රිත කථා **සප්පාය කථා** නම් වේ.

**දෙතිස් තිරශ්චීන කථා නම්** – රාජ කථා, චෞර කථා, මහාමත්ත කථා, සේනා කථා, භය කථා, යුද්ධ කථා, අන්න කථා, පාන කථා, වස්ත්‍ර කථා, යාන කථා, සයන කථා, මාලා කථා, ගන්ධ කථා, ඉත්ථි කථා, ඥාති කථා, සූර කථා, විසිඛා කථා, කුම්භට්ඨාන කථා, හාති කථා, ගාම කථා, නිගම කථා, නගර කථා, ජනපද කථා, පුබ්බපෙත කථා, නානත්ත කථා, ලෝකක්ඛායික කථා, සමුද්දක්ඛායික කථා, ශාස්වත දෘෂ්ටි කථා, උච්ඡේද දෘෂ්ටි කථා, වෘද්ධි කථා, කාමසුඛ කථා, අත්තකිලමථානුයෝග කථා, යන දෙතිස ය.

**දසකථා වස්තූහු නම්** – අල්පේච්ඡ කථා, සන්තුෂ්ටි කථා, විවේක කථා, අසංසග්ගි කථා, වීර්ය කථා, ශීල කථා, සමාධි කථා, ප්‍රඥා කථා, විමුක්ති කථා, විමුක්තිඥාන දර්ශන කථා යන දශකථාවෝ ය.

**4. පුද්ගල** – යම් පුද්ගලයෙක් ඇසුරු කිරීමෙන් සමාහිත නොවූ සිත සමාහිත වේ නම්, සමාහිත වූ සිත ස්ථිර වේ නම්, තිරිසන් කථා ආදිය නො කරණ ශීලාදී ගුණ යන්ගෙන් යුක්ත වූ පුද්ගලයා **සප්පාය පුද්ගල** නම් වේ. එසේ නොව තිරිසන් කථා කරණ ශරීර පෝෂණයෙහි ම යෙදුන පුද්ගලයන් ඇසුරු කිරීමෙන් තමා ලත් ධ්‍යානයත්, නිමිත්තත් නැති වන්නේ නම් ඔවුහු **අසප්පාය පුද්ගල** නම් වෙත්.

**5. භෝජන** – යම් භෝජනයක් ගැනීමෙන් අසමාහිත වූ සිත සමාහිත වීමට උපකාර වන්නේ නම්, සමාහිත වූ සිත ස්ථිර වේ නම් එය **සප්පාය භෝජන** නම් වේ. යම් භෝජනයක් නිසා ලත් ධ්‍යානයත්, නිමිත්තත් පිරිහෙන්නේ ද එය **අසප්පාය භෝජන** නම් වේ.

**6. ඍතු** – යම් ඍතුවක් සේවනය කිරීමෙන් අසමාහිත වූ සිත සමාහිත වීමට උපකාර වේ නම්, සමාහිත වූ සිත ස්ථිර වේ නම් එය **සප්පාය ඍතු** නම් වේ. යම් ඍතුවක් සේවනය කිරීමෙන් ලත් ධ්‍යානයත් නිමිත්තත් පිරිහෙන්නේ නම් එය **අසප්පාය ඍතු** නම් වන්නේ ය.

**7. ඉරියව්** – යම් පුද්ගලයෙකු හට සක්මන් කිරීම, සිටීම, හිඳීම සයනය කිරීම් ආදී වූ ඉරියව් අතුරෙන් යම් ඉරියව්වක් සිත සමාහිත වීමට, ස්ථිර වීමට උපකාරවේ නම් එය **සප්පාය ඉරියව්** නම් වේ. ලත් ධ්‍යාන නිමිත්තාදිය පිරිහීමට හේතුවේ නම් ඒ ඉරියව් **අසප්පාය ඉරියව්** නම් වේ.

මෙසේ සප්තවිධ අසප්පාය යත් දුරු කොට සප්තවිධ සප්පාය යත් සේවනය කොට අර්පණාව නො ලැබෙත්නේ නම් ඔහු විසින් දසවැදෑරුම් වූ කෞශල්‍යයයන් සම්පාදනය කටයුතු.

## දශවිධ අර්පණා කෞශල්‍යයෝ

**1. වස්තු විශද ක්‍රියාව** – අධ්‍යාත්මික, බාහිර වස්තු පිරිසුදු කර ගැනීම වස්තු විශද ක්‍රියා නම් වේ. අධ්‍යාත්මික වස්තුහු නම් කෙස්, ලොම්, නිය, දත්, ආදියයි. සිවුරු පිරිකර සෙනසුන් ආදිය බාහිර වස්තුහු වෙති. අධ්‍යාත්මික වස්තුහු අපිරිසුදු වූ කල්හි නුවණ ද අපිරිසුදු විය හැකි. අපිරිසුදු තෙල් ඇති පහනෙහි එළිය අපිරිසුදු වන්නාක් මෙනි. අපිරිසුදු නුවණ ඇති කල්හි කමටහන ද අභිවෘද්ධියට නො පැමිණේ. පිරිසුදු අධ්‍යාත්මික – බාහිර වස්තුහු ඇති කල්හි නුවණ ද පිරිසුදු වන හෙයින් කමටහනෙහි යෙදෙන විට එය අභිවෘද්ධියටම පැමිණේ.

**2. ඉන්ද්‍රිය සමත්ත්ව ප්‍රතිපාදනය** – ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සම බවට පැමිණ වීම ය. **ශ්‍රද්ධා, වීර්‍ය, සති, සමාධි, ප්‍රඥා** යන ඉන්ද්‍රිය ධර්ම පස සම ව නො පවත්නේ නම් අර්පණාව ලබා ගැනීම දුෂ්කර වේ. යම් කලෙක ඔහුගේ **සද්ධින්ද්‍රිය** බලවත් වී සෙසු ඉන්ද්‍රියයන් දුබල වී නම්, එකල්හි **විරියින්ද්‍රිය යෙන්** කරනු ලබන, සම්ප්‍රයුක්ත ධර්මයන්ට අනුබල දීම නම් වූ **ප්‍රග්‍රහ කෘත්‍යය** ය ද, **සතින්ද්‍රියයෙන්** කරනු ලබන අරමුණ කරා එළඹ සිටීම නම් වූ **උපට්ඨාන කෘත්‍යය** ද, **සමාධින්ද්‍රියයෙන්** කරනු ලබන සම්ප්‍රයුක්ත ධර්මයන් විසිර යා

නොදී තැන්පත් කිරීම නම් වූ **අවික්ෂෙප කෘත්‍යය** ද, **පඤ්ඤින්ද්‍රියයෙන්** කරනු ලබන, ඇතිසැටියෙන් දැනගැන්ම නම් වූ **දර්ශන කෘත්‍යය** ද කළ හැකි නොවේ. එසේ ඇති කල්හි ඉන්ද්‍රිය ධර්මස්වභාවය මෙනෙහි කිරීමෙන් හෝ **සද්ධින්ද්‍රිය ය** එතරම් බලවත් නො වන ආකාරයෙන් හෝ පිළිපැදිය යුතු.

යම් කලෙක **විරියින්ද්‍රිය** ය බලවත් වී සෙසු ඉන්ද්‍රියයන් දුබල වී නම්, එකල්හි **සද්ධින්ද්‍රියයෙන්** කරණු ලබන **අධි-මොක්ෂ කෘත්‍යය** ද, සෙසු ඉන්ද්‍රියයන්ට, තම තමා අයත් කෘත්‍යයන් ද කළ හැකි නොවේ. එවිට පස්සද්ධිය වැඩීම් ආදියෙන් වීර්ය්‍යය අඩු කර ගත යුතු.

මෙකී ඉන්ද්‍රිය ධර්මයන් අතුරෙන් **ශ්‍රද්ධා**-**ප්‍රඥා** දෙදෙනාගේ ද, **වීර්ය්‍යසමාධි** දෙදෙනාගේ ද සම බව විශේෂයෙන් සැළකිය යුතුවේ. **ශ්‍රද්ධාව** බලවත් ව **ප්‍රඥාව** දුබල වී නම් හෙතෙම අස්ථානයෙහි පහදින හෙයින් **මුධප්‍රසන්නයෙක්** වෙයි. **ප්‍රඥාව** බලවත් ව **ශ්‍රද්ධාව** දුබල වී නම්, කෛරාටික පක්ෂය භජනය කරණ පුද්ගලයෙක් වන්නේ ය. බෙහෙතින් හටගත් රෝගයක් පිළියම් කිරීමට දුෂ්කර වන්නාක් මෙන්, හෙතෙම පිළියම් කටහැක්කේ නොවේ. **ශ්‍රද්ධා** - **ප්‍රඥා** දෙක සමව ඇති කල්හි ස්ථානයෙහි ම පහදින්නේ ය.

යම් හෙයකින් **සමාධිය** බලවත් ව **වීර්ය්‍යය** දුබල වී නම් ඔහු කුසීත භාවයෙන් මැඩලනු ලබන්නේ ය. **වීර්ය්‍යය** බලවත් වී **සමාධිය** දුබල වී නම් ඔහු **උද්ධච්ච භාවයෙන්** මැඩලනු ලැබේ. **සමාධි, වීර්ය්‍ය** යන ඉන්ද්‍රියයන් දෙදෙනා සමව පවත්නා කල්හි කුසීත භාවයත්, උද්ධච්චයත් පහවී යාමෙන් අර්පණාව ලැබිය හැකි වේ.

**ශ්‍රද්ධා, ප්‍රඥා** දෙක අතුරෙන් සමාධි භාවනායෙහි යෙදුන පුද්ගලයාහට **ශ්‍රද්ධාව** බලවත්වීම ප්‍රයෝජනවත් වේ. වහාම අර්පණාව නො ලැබුවත් ශ්‍රද්ධාව ඇති හෙයින් බුදුන් වහන්සේ වදාළ පරිදි පිළිපැදීමෙන් ඒකාන්ත ප්‍රතිඵල ලැබෙන බව සළකා පරිකම් කොට අර්පණාවට ද පැමිණෙන්නේ ය.

එපරිද්දෙන් ම ඕහට සමාධි නම් වූ **ඒකග්ගතාවය** බලවත් ව පැවැත්ම අවශ්‍ය වන්නේ ය. විදර්ශනා භාවනායෙහි නියුක්ත පුද්ගලයාහට වනාහි **ප්‍රඥාව** ප්‍රධාන වන්නේ ය. **සතිය** සෑම අවස්ථාවන්හිම බලවත් විය යුතු. සතිය **කරණ** කොට ගෙන සිත ආරක්‍ෂා වන හෙයින් අනිකුදු ඉන්ද්‍රියයන්ට තම තමන් අයත් කෘත්‍යය කිරීමට අනුබලය ලැබෙන්නේ ය.

**3. නිමිත්ත කෞශල්‍යය** – සිත එකඟ කර ගැනීමට උපකාර වන පඨවි කසිණාදිය තනා ගැනීමෙහි ද, තනාගත් ඒ කසිණාදී භාවනා කිරීමෙහි ද, භාවනා කිරීමෙන් ලබා ගත් නිමිති රැක ගැනීමෙහි ද දක්‍ෂ බව **නිමිත්ත කෞශල්‍යය** නම් වේ.

**4. සිතට ප්‍රග්‍රහ දියයුතු කල ප්‍රග්‍රහ දීම** – යම් කලෙක යෝගාවචරයාගේ සිත ඉතා ලිහිල් ව ගිය වීර්‍ය්‍යය ඇතිවීම් ආදියෙන් හැකිළී ගිය සවභාවයක් ඇත්තේ වේ ද එකල්හි **ධම්මවිචය සම්බෝධ්‍යාඞ්ගය, විරිය සම්බෝධ්‍යාඞ්ගය, පීති සම්බෝධ්‍යාඞ්ගය** යන බෝධ්‍යාඞ්ග ධර්ම තුන වැඩිය යුතු වේ. **පස්සද්ධි, සමාධි, උපෙක්ඛා සම්බෝධ්‍යාඞ්ග** ධර්ම ඔහු විසින් නො වැඩිය යුතු. මේ ධර්මයන්ගෙන් හැකිළී ගිය සිත නගාලිය හැක්කේ ය. ගින්නක් දල්වා ගනු කැමති තැනැත්තේ අමු තණපත්, අමු ගොම, අමු දර දමා දියමුසු සුළං හමා ගිනි දල්වා ගත නො හැකි වන්නාක් මෙනි. ධම්මවිචය, විරිය, පීති සම්බෝධ්‍යාඞ්ගයන් වැඩීමෙන් හැකිළී ගිය සිත නගා සිටුවිය හැකි හෙයින් එකී ධර්ම තුන වැඩිය යුතු. ගින්නක් දල්වාගනු කැමති පුද්ගල තෙම වියළි තණ රොඩු, වියළි ගොම වැරටි, වියළි දර දමා මුඛයෙන් පිඹ ගිනි දල්වා ගන්නාක් මෙනි. බෝධ්‍යාඞ්ග ධර්මයන් වඩනා පිළිවෙල යට දක්වන ලද ධම්මානුපස්සනා පිළිබඳ විස්තරයෙන් දත යුතු.

**5. සිතට නිග්‍රහ කළ යුතු කල නිග්‍රහ කිරීම** - යම් කලෙක්හි ඔහුගේ සිත බලවත් වීර්‍ය්‍යය ආදිය හේතු කොට ගෙන නොසන්සුන් බවට පැමිණියේ නම් එකල්හි **පස්සද්ධි,**

**සමාධි, උපෙක්ඛා** යන බෝධ්‍යාඞ්ග ධර්ම තුන වැඩිය යුතු. **ධම්මවිචය, විරිය, පීති** යන බෝධ්‍යාඞ්ග ධර්ම නො වැඩිය යුතුයි. ධර්මවිචය ආදී බෝධ්‍යාඞ්ග ධර්ම තුනෙන් නො සන්සුන් සිත සන්සිඳුවා ගත නො හැකි වේ. ගින්නක් නිවාගනු කැමති පුද්ගල තෙමේ එහි වියලි තණ රොඩු, වියලි ගොමවැරටි, වියලි දර ආදිය දමා සුළං පිඹින්නේ නම් ඔහුට ඒ ගින්න නිවාගත නොහැකි වන්නාක් මෙනි. පස්සද්ධි ආදී ත්‍රිවිධ ධර්මයන් වැඩීමෙන් නොසන්සුන් සිත සංසිඳුවා ගත හැකි වේ. ගින්න නිවා ගනු කැමති ව අමු තණ, අමු ගොමු, අමු දර ආදිය දමා දියමුසු සුළඟින් ගින්න නිවන්නාක් මෙනි.

**6. සිත සතුටු කළ යුතු කල්හි සතුටු කිරීම** - යම් කලෙක ඔහුගේ සිත නුවණ මෙහෙයීමේ මදකමින් හෝ සමාධිය නො ලැබීමෙන් හෝ එහි ආස්වාද රහිත වේ ද, එකල්හි අෂ්ට සංවේග වස්තු මෙනෙහි කිරීමෙන් සංවේගයට පමුණුවා ගත යුතු වේ. අෂ්ට සංවේග වස්තුහු නම් - **ජාති, ජරා, ව්‍යාධි, මරණ, අපා දුක, අතීත සංසාර මූලක දුක, අනාගත සංසාර මූලක දුක,** සහ **වර්තමාන අහර සෙවුම් මූලක දුක** යන අෂ්ට ධර්මයෝ යි. **බුද්ධ, ධම්ම, සංඝ** යන තෙරුවන් ගුණ සිහි කිරීමෙන් ද ප්‍රසාදය ඇති වන්නේ ය.

**7. සිතට උපෙක්ෂා කළ යුතු විට උපෙක්ෂා කිරීම** - යම් කලෙක යෝගාවචරයාගේ සිත හැකිළීමක් නොසන්සුන් බවක් හෝ ආස්වාද රහිත බවක් හෝ නැතිව අරමුණෙහි මනාව පිහිටා සමාධිය පිණිස පිළිපන්නේ වේ ද එකල්හි සිතට අනුබල දීමෙක් හෝ නිග්‍රහ කිරීමෙක් හෝ සතුටු කිරීමෙක් හෝ නොකර උපෙක්ෂා කළ යුතු වේ. රථය බැඳි අසුන් මනාව සමව යන විට රියැදුරු අනුබලදීම් ආදිය නො කරන්නාක් මෙනි.

**8. අසමාහිත පුද්ගල පරිවර්ජනය** - භාවනාවෙහි යෙදෙන පුද්ගලයා විසින් නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදායෙහි නො ඇලුනු නොයෙක් කටයුතුවල යෙදුනු නොසන්සුන් ඉන්ද්‍රියයන් ඇති පුද්ගලයන් දුරු කටයුතු.

**9. සමාහිත පුද්ගල සේවනය** – නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනු සිත් ඇති, භාවනා කරණ, සමාධිලාභී පුද්ගලයන් සේවනය කළ යුතු.

**10. තදධිමුක්තතාය** – සමාධිය වඩනු කැමති පුද්ගලතෙම, සමාධිය ගරු කොට, සමාධියට ම නැමුණු බර වූ සිත් ඇතිව විසිය යුතු.

මෙසේ දශවිධ අර්පණා කෞශල්‍යය සම්පාදනය කොට අර්පණාව ලැබිය හැකි වේ. ඉදින් අර්පණාව නො ලැබුනේ නම් භාවනාව අත් නො හැර නුවණින් යුක්තව නැවත නැවත ව්‍යායාම කරමින් භාවනාවෙහි යෙදිය යුතු. ඇතැම් කෙනෙක් ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි වහා අර්පණාවට පැමිණෙන්නෙමියි වීර්‍ය්‍යය දැඩි කොට ගනී. එකල්හි අධික වීර්‍ය්‍යය හේතු කොට ගෙන උද්ධච්චය හෙවත් නො සන්සුන් බව ඇතිවී අර්පණාව ලැබගන්නට අසමර්ථවේ. ඇතැම් පුද්ගලයෙක් අධික වීර්‍ය්‍යයෙහි දොස් දැක කුසීත බැව්හි වැටෙයි. ඔහුට ද අර්පණාව නොලැබේ. යම් පුද්ගලයෙක් නොසන්සුන් බවෙහි හෝ කුසීත බැව්හි හෝ නොවැටී සම්ප්‍රයෝගයෙන් නිමිත්ත වඩා ද හෙතෙම අර්පණාවට පැමිණෙන්නේ ය. මෙසේ මනා කොට, වඩන ලද පඨවි කසිණය ඇති කල්හි අර්පණා චිත්තවීථිය උපදින්නේ ය. භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡේද යන භවඞ්ග සිත් දෙක ඉපිද නිරුද්ධ වූ කල්හි ඒ පඨවිකසිණය අරමුණු කොට මනොද්වා–රාවජ්ජන චිත්තය ඉපිද ඉක්බිති ජවන් සිත් සතරක් හෝ පසක් උපදී. එයින් මුල් ජවන් තුන හෝ සතර කාමාවචර ඤාණසම්ප්‍රයුක්ත කුසල චිත්තයෝ ය. අවසාන ජවනය රූපාවචරය. මෙකී කාමාවචර ජවනයන්හි **විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා** යන චෛතසික ධර්මයෝ ප්‍රකෘති කාමාවචර චිත්තයන්හි විතක්කාදීන්ට වඩා ඉතා බලවත් ය. ඒ කාමාවචර ජවනයන් අතුරෙන් පළමු වන ජවනය අර්පණාවට පරිකර්ම වන හෙයින් **පරිකර්ම සිත** යයි ද, දෙවන ජවනය අර්පණාවට ආසන්න ව හෙවත් සමීපයෙහි

හැසිරෙන බැවින් **උපචාර සිත** යයි ද, තුන් වන ජවනය අර්පණාවට අනුලොම වන බැවින් **අනුලොම සිත** යයි ද, සතර වන ජවනය කාම හෙවත් පරිත්ත ගොත්‍රය මැඩ මහග්ගත ගොත්‍රය වඩනා හෙයින් **ගොත්‍රභූ සිත** යයි ද ව්‍යවහාර වේ. පස් වන ජවනයට **අර්පණා සිත** යයි කියනු ලැබේ. මෙසේ ජවන් පසක් පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ, අර්පණා වශයෙන් උපදිනු ලබන්නේ දන්ධාභිඥ පුද්ගලයාගේ වශයෙනි. ඛිප්පාභිඥ පුද්ගලයන්ට වනාහි පරිකර්ම චිත්තයක් නැත. ඔහුට උපදනා චිත්තවීථියේ ජවන් සතරක් උපදී එයින් පළමු වන ජවනය **උපචාර** යයි ද දෙවන ජවනය **අනුලොම** යයි ද, තුන්වන ජවනය **ගොත්‍රභූ** යයි ද, සතරවන ජවනය **අර්පණා** යයි ද හඳුන්වනු ලැබේ. අර්පණා චිත්තය ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ග සිත් නැවතත් උපදී. මෙසේ භවාඞ්ග සිත් කීපයක් ඉපිද නිරුද්ධ වූ පසු ධ්‍යානය ප්‍රත්‍යවෙක්ෂා කරුණු පිණිස භවඞ්ගචලනය, භවඞ්ගු-පච්ඡේදයන්ට අනතුරුව මනොද්වාරාවජ්ජනය ඉපිද ඥාන සම්ප්‍රයුක්ත කුසල් ජවන් සතරක් හෝ පසක් පිළිවෙළින් ධ්‍යානය ප්‍රත්‍යවේක්ෂා කරමින් ඉපිද ඉක්බිති භවඞ්ගා පාතය වේ. මෙසේ පළමු වරට උපදනා අර්පණා චිත්ත වීථියේ අර්පණා සිතට **ප්‍රථමධ්‍යාන සිත** යයි කියනු ලැබේ. ඒ ප්‍රථමධ්‍යාන චිත්තය උපන් කල්හි ඒ යෝගාවචර තෙම **(විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති)** යයි වදාළ පරිදි කාමයන් ගෙන් වෙන්වම විතක්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛ ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාසය කරන්නේ ය. තවද හෙතෙම මේ ධ්‍යානය කරණකොට ගෙන **අඞ්ග පසක් ප්‍රහීණකොට, අඞ්ග පසකින් යුක්තව, ත්‍රිවිධ කල්‍යාණ-යෙන් හා දශලක්ෂණයෙන් යුක්තව** වාසය කරන්නේ යයි කියනු ලැබේ.

# ප්‍රථම ධ්‍යානය

අන්ධකාරය ඇති කල්හි පහන් ආලෝකය නොපවත්නාක් මෙන්, ධ්‍යානයට ප්‍රතිපක්ෂ වූ කාමයෝ ඇති කල්හි ප්‍රථමධ්‍යානය නොපවතී. එබැවින් ඒ කාම පරිත්‍යාගයෙන් ම ප්‍රථමධ්‍යානයට පැමිණිය යුතු වේ.

**කාමයෝ** වස්තුකාම, ක්ලේශකාම වශයෙන් දෙවැදෑරුම් වෙති. මනවඩන රූපාදිය **වස්තුකාමයෝ**යි. රාගාදීහු **ක්ලේශකාමයෝ**යි. ප්‍රාර්ථනාකාරයෙන් පැවති දුර්වල ලෝභය කැමතිවීම **ඡන්දකාම** නමි. එයට වඩා බලවත් ලෝභය කැමති වීම **රාගකාම** නම් වේ. එයටත් වඩා බලවත් බහලරාගයට කැමතිවීම **ඡන්දරාගකාම** නමි. නිමිත්තානුබ්‍යඤ්ජනයන්ගේ සඞ්කල්පයට හේතු වූ ලෝභය කැමතිවීම **සඞ්කල්පකාම** නම් වේ එයටත් වඩා බලවත් වූ ලෝභය කැමතිවීම **රාගකාම** නමි. එයටත් වඩා වෙසෙසින් ම බලවත් වූ ලෝභය කැමතිවීම **සඞ්කල්පරාග කාම** නම් වේ.

මෙහිදී වස්තුකාම, ක්ලේශකාමයන්ගෙන් වෙන්වීමෙන් ලබන විවේකය වනාහි, **තදඞ්ග විවේකය, විෂ්කම්භන විවේකය, සමුච්ඡේද විවේකය, පටිප්පස්සද්ධි විවේකය, නිස්සරණ විවේකය, චිත්ත විවේකය, කාය විවේකය, උපධි විවේකය** යන විවේකයන් අතුරෙන් **කාය විවේක, චිත්ත විවේක, විෂ්කම්භන විවේක** වශයෙන් ලබන විවේකය වේ. **විවිච්චෙව කාමෙහි** යන පදයෙන් දක්වන ලද වස්තු කාමයන්ගෙන් වෙන්වීමේදී **කාය විවේකය** ලැබේ. **විවිච්ච අකුසලෙහි ධම්මෙහි** යන පදයෙන් දක්වන ලද ක්ලේශ කාමයෙන් හා අකුසලයන් ගෙන් වෙන්වීමේදී **චිත්ත විවේකය** ලැබේ. එහෙයින් වස්තුකාම විවේකය ලැබීමෙන් කම් සැප අත්හැරීම ද ක්ලේශකාම විවේකයෙන් ධ්‍යාන සුඛය ලැබීම ද සිදුවන්නේ ය. වස්තු කාමයෙන් විවේකය ලැබීමේදී තණ්හා ආදී ක්ලේශයන්ගේ

උත්පත්තියට හේතු වූ වස්තු දුරු කිරීම ද, එහි ලොල් බව ඇති කරණ හේතු දුරු කිරීම ද, කාමගුණයන්ට හේතුවන ප්‍රාණඝාතාදියෙන් වෙන්වීම ද සිදු වේ. කෙලශකාමයන් ගෙන් විවේකය ලැබීමේදී තණ්හාදී කෙලෙස් දුරුකිරීම ද, එහි ලොල් බව දුරුකිරීම ද, ධ්‍යාන සංවර්ධනය පිණිස කටයුතු සම්පාදනය ද සිදු වේ.

තවද කාමච්ඡන්දාදී පඤ්චනීවරණයෝ ධ්‍යානයට ප්‍රතිපක්ෂ වූ ධර්මයෝයි. එහෙයින් කාමයන්ගෙන් වෙන්වීම කියන කල්හි **කාමච්ඡන්දයාගේ** විෂ්කම්භන විවේකය ද, අකුසලධර්මයන්ගෙන් වෙන්වීම කියන කල්හි **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා** යන පඤ්චනීවරණයන්ගේම විෂ්කම්භන විවේකය ද ප්‍රකාශ වන බව දත යුතු. මේ නීවරණයන්ගෙන් වන විවේකය ධ්‍යානාංගයන්ගේ වැඩීමෙන් ම ලබාගත යුතු වේ. සමාධි හෙවත් **ඒකාග්‍රතා** නම් වූ ධ්‍යානාංගය කාමච්ඡන්ද-නීවරණයට ප්‍රතිපක්ෂය. එසේම **ප්‍රීති** ධ්‍යානාංගය ව්‍යාපාද නීවරණයට ද, **විතර්ක** ධ්‍යානාංගය ථිනමිද්ධ නීවරණයට ද, **සුඛ** නම් වූ ධ්‍යානාංගය උද්ධච්චකුක්කුච්ච නීවරණයට ද, **විචාර** නම් වූ ධ්‍යානාංගය විචිකිච්ඡා නීවරණයට ද ප්‍රතිපක්ෂ වන්නාහ.

කාමච්ඡන්දයන්ගෙන් විවේකය ලැබීමේ දී, පඤ්චකාම ගුණික ලෝභයාගේ ද, කාමෞඝ, කාමයෝග, කාමාසව කාමූපාදාන අභිජ්ඣා කායග්‍රන්ථ, කාමරාග සංයොජන යන ආදීන්ගේ ද, තෘෂ්ණාව ගේ හා තත්සම්ප්‍රයුක්තයන්ගේ ද, ලෝභමූල අකුසල චිත්තයන්ගේ ද විෂ්කම්භන විවේකය ලැබෙන බව ද, සෙසු අකුසල ධර්මයන්ගෙන් විවේකය ලැබීමේදී, ද්වේෂ, මෝහ දෙදෙනාගේ ද, භවෞඝ, දිට්ඨෞඝ, අවිජ්ජෞඝ යන ත්‍රිවිධ ඕඝයන්ගේ ද, භවාදී ත්‍රිවිධ යෝගයන්ගේ ද, භවාදි ත්‍රිවිධ ආසවයන්ගේ ද, දිට්ඨාදී ත්‍රිවිධ උපාදානයන්ගේ ද, ව්‍යාපාදාදී ත්‍රිවිධ කායග්‍රන්ථයන් ගේ ද, කාමරාග සංයොජනය හැර සෙසු නවවිධ

සංයෝජනයන්ගේ ද, අවිද්‍යාවගේ හා තත්සම්ප්‍රයුක්තයන්ගේ ද, ද්වේෂ මෝහමූල අකුසල් චිත්තයන්ගේ ද විෂ්කම්භන විවේකය ලැබෙන බව ද සැලකිය යුතු. මෙසේ ප්‍රථම ධ්‍යානයෙන් ප්‍රහාණය කරනු ලබන්නා වූ ප්‍රහාණාඞ්ග පස දත යුතු.

ප්‍රථමධ්‍යානයෙහි **සමන්නාගත අඞ්ග පඤ්චකය** නම් **විතක්ක, විචාර, ප්‍රීති, සුඛ, එකග්ගතා** යන ධ්‍යානාඞ්ගයෝ යි.

**විතර්කය** – සිත අරමුණට නැංවීම ලක්ෂණ කොට ඇත්තේ ය. සිත අරමුණෙහි පැහැරීම, වෙසෙසින් පැහැරීම හෙවත් ආහනන පරියාහනනය රසය කොට ඇත්තේ ය. අරමුණට සිත පැමිණවීම පච්චුපට්ඨානය වේ.

**විචාරය** – විතර්කයට ඉක්බිතිව අරමුණ පිරිමදින බව ලක්ෂණ කොට ඇත්තේ ය. සහජාත ධර්මයන් අරමුණෙහි අනුවිචරණ වශයෙන් යොදවන බව රසය කොට ඇත්තේ ය. අරමුණෙහි සිත නොසිඳීමක් මෙන් පවත්නා බව පච්චුපට්ඨානය වේ.

විතර්කය ඖදාරිකය. ස්වකීය බලයෙන් සිත අරමුණට නංවන හෙයින් විචාරයට පූර්වාඞ්ගම වේ. විචාරය සියුම් ය. සෙලවීමෙක් නැත. මෙබඳු විතර්කයෙන් හා විචාරයෙන් යුත් ප්‍රථමධ්‍යානය **සවිතක්ක-සවිචාර ධ්‍යානය** නම් වේ.

නීවරණ ධර්මයන්ගේ පහවීමෙන් ලබන ලද විවේකයෙන් හටගත් **ප්‍රීතිය** හා **සැපය** ද ප්‍රථමධ්‍යානයාගේ සමන්නාගතාඞ්ගයෝ දෙදෙනෙකි.

**ප්‍රීතිය** – අරමුණ ප්‍රිය වශයෙන් දක්නා බව ලක්ෂණ කොට ඇත්තේය චිත්තකාය පිණවන බව නොහොත් පැතිරෙන බව එහි රසය වේ. ඔදවඩනා බව පච්චුපට්ඨානය වේ. මේ ප්‍රීතිය **ඛුද්දක ප්‍රීති, ඛණික ප්‍රීති, ඔක්කන්තික ප්‍රීති, උබ්බෙග ප්‍රීති, ඵරණ ප්‍රීති** යයි පස්වැදෑරුම් වේ. ශරීරයෙහි ලොමුදහගන්වන කුඩා ප්‍රීතිය **ඛුද්දක ප්‍රීති** නම් වේ. එයට වඩා බලවත් වූ ක්ෂණ ක්ෂණ වශයෙන්

විදුලි කෙටීමක් මෙන් උපදින ප්‍රීතිය **ඛණික ප්‍රීති** නම්. එයටත් වඩා බලවත් මුහුදු රළ සේ ශරීරය පිණවමින් බිඳෙන ප්‍රීතිය **ඔක්කන්තික ප්‍රීති** නම් වේ. එයටත් වඩා බලවත් වූ ද කය උඩගෙන ගොස් අහසෙහි නගා පියන පමණට පමුණු වන ප්‍රීතිය **උබ්බෙග ප්‍රීති** නම් වේ. එයටත් වඩා බලවත් වූ ද මුළු සිරුර ම හාත්පසින් ස්පර්ශ කරමින් පවත්නා ප්‍රීතිය **ඵරණ ප්‍රීති** නම්.

**සුඛය** - සාත බව හෙවත් ශීතල මධුර ස්වභාවය ලක්‍ෂණ කොට ඇත්තේ ය. සම්ප්‍රයුක්ත ධර්මයන් වඩනා බව එහි රසය වේ. සම්ප්‍රයුක්ත ධර්මයන්ට අනුග්‍රහ කරණ බව එහි පච්චුපට්ඨානය වේ.

ප්‍රථමධ්‍යාන අවස්ථාවේදී ප්‍රීතියත් සුඛයත් එකවර යෙදෙන්නේ ය. ප්‍රීතිය ඇති තැන සුඛය ඇතත් සුඛය ඇති තැන නියමයෙන් ම ප්‍රීතිය ඇතැයි කිව නොහැකි වේ. මේ ධර්ම දෙකෙන් ප්‍රීතිය සංස්කාර–ස්කන්ධයට ඇතුළත් ධර්මයෙකි. සුඛය වේදනා ස්කන්ධයට ඇතුළත් ධර්මයෙකි.

මෙහි කියන ලද පංචවිධ ප්‍රීතිය මිහිකිරීමෙන් කාය පස්සද්ධි චිත්තපස්සද්ධි යන පස්සද්ධි ධර්ම දෙක මිහිකිරීමට පැමිණේ. පස්සද්ධිය මිහිකිරීමෙන් කායික වූ ද චෛතසික වූ ද සුඛය වැඩේ. ඒ සුඛය මිහිකිරීමෙන් ක්‍ෂණික සමාධි උපචාර සමාධි, අර්පණා සමාධි යන ත්‍රිවිධ සමාධීහු වැඩෙන්නාහ. මෙහි ලැබෙන ප්‍රීතිය ඵරණ ප්‍රීතියයි. මෙසේ විවේකයෙන් හටගත් ප්‍රීතියත්, සුඛයත් ප්‍රථම ධ්‍යානයෙහි ඇති වන බව දත යුතු.

මේ විතක්ක, විචාර, ප්‍රීති, සුඛයන්ගෙන් අනුබලය ලත් ඒකාග්‍රතාවය, ඵස්සාදී වූ සෙසු චෛතසික ධර්මයන් සහිත වූ සිත ආරම්මණයෙහි සමව මනාකොට පිහිටුවන්නේ ය. උපචාර සමාධි අවස්ථාවෙහි ද මේ ධ්‍යානාඞ්ග පස ලැබෙති. නමුත් අර්පණා අවස්ථාවේදී ධ්‍යානාඞ්ගයෝ එයටත් වඩා අතිසයින් බලවත් වෙති. එසේ බලවත් ව කාමාවචර ලක්‍ෂණයෙන් බැහැර වූ රූපාවචර ලක්‍ෂණයට පැමිණෙති.

මෙසේ මේ යෝගාවචර තෙම කාමයන් ගෙන් වෙන් ව ම අකුසල ධර්මයන් ගෙන් වෙන්ව ම විතක්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛ ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාසය කරන්නේ ය.

මේ ප්‍රථමධ්‍යානය **ත්‍රිවිධ කල්‍යාණයෙන්** හා **දශ ලක්ෂණයෙන්** සමන්විත ය.

**ත්‍රිවිධ කල්‍යාණය** නම් **ආදි කල්‍යාණය, මධ්‍ය කල්‍යාණය, පර්යොසාන කල්‍යාණය** යන කල්‍යාණ තුනය.

**ආදිකල්‍යාණය** - ප්‍රතිපදා වශයෙන් විසුද්ධිය වීම ය. පරිකර්මය පටන් ගොත්‍රභූ චිත්තය අවසන් කොට ඇති භාවනාවට **ප්‍රතිපදා** යයි කියනු ලැබේ. ඒ ප්‍රතිපදා සමයෙහි උපද්‍රවයන් ගෙන් විසුඩවීම **ප්‍රතිපදා විශුද්ධිය** වේ. මේ ආදි කල්‍යාණයාගේ හෙවත් ප්‍රතිපදා විශුද්ධියෙහි ලක්ෂණ තුනෙකි. එනම්:-

1. **ධ්‍යානය පිළිබඳ උපද්‍රවයන්ගෙන් සිත පිරිසුදුවීම** — අර්පණා චිත්තවීථියෙහි අර්පණා චිත්තය උපන් කල්හි, ඒ ධ්‍යානයට උපද්‍රව වශයෙන් පවත්නා නීවරණ සංඛ්‍යාත වූ කෙලශ සමූහයාගෙන් සිත පිරිසුදු වන්නේ ය. ආදි කල්‍යාණයාගේ ප්‍රථම ලක්ෂණය මෙය වේ. ධ්‍යානයාගේ උත්පාදක්ෂණයෙහි දී ලැබෙන හෙයිනි.
2. **ඒ විසුඩවීමෙන් ම සිත මධ්‍යම - සමථ නිමිත්තට පැමිණීම**— දෙවන ලක්ෂණය වේ. **මධ්‍යම - සමථ** නිමිත්ත නම් එහි පවත්නා අර්පණා සමාධිය යි. සිත සංසිඳුවන හෙයින් සමථ නම් වේ. යෝගාවචරයාගේ සුඛයට කාරණා වන හෙයින් නිමිත්ත නමුදු වේ.
3. **ඒ පැමිණීමෙන් ම සිත එහි වැද සිටීම ය**— අර්පණා සමාධියෙන් සමාහිත බවට වැද සිටීම ආදිකල්‍යාණ-යාගේ තුන් වන ලක්ෂණය වේ.

**මධ්‍යකල්‍යාණය** – උපෙක්ෂානුබ්‍රෑහණාව හෙවත් උපෙක්ෂාව වැඩීම ය. මේ මධ්‍ය කල්‍යාණයාගේ ද ලක්ෂණ තුනෙකි. එනම්—

1. **ප්‍රතිපදා බලයෙන් පිරිසුදු වූ සිත නැවත පිරිසුදු නොකට හැකි බැවින් එහි ව්‍යාපාර නොකර උපෙක්ෂාවීම.**
2. **සමථ භාවයට පැමිණි හෙයින් නැවත සමාධාන-යෙහි ව්‍යාපාර නොකොට උපෙක්ෂාවීම.**
3. **සමථයට පැමිණි හෙයින් ම ක්ලේශ සංසර්ගය හැර එකත්වයෙන් වැටහුණු සමාධිහුගේ නැවත ව්‍යාපාර නොකර උපෙක්ෂාවීම.**

**පරියොසාන කල්‍යාණය** - සම්පහංසනාව හෙවත් සතුටුවීමය. පරියොසාන කල්‍යාණයාගේ ලක්ෂණ සතරෙකි. එනම්—

1. **එහි උපන් සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත යුගනද්ධ ධර්ම නොඉක්මෙන බැවින් සතුටුවීම ය.** මේ ධර්ම දෙක ඔවුනොවුන් නොඉක්මවා සමව පවත්නාහ.
2. **ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් නොයෙක් කෙලෙසුන් කෙරෙන් මිදී විමුක්ති රසයෙන් එකරස වන බැවින් සතුටු වීම ය.**
3. **ඒ එක රස භාවයට අනුරූප ව වීර්‍ය්‍ය පවත්නා බැවින් සතුටුවීම ය.**
4. **ආසෙවන වශයෙන් සතුටුවීම.**

මෙසේ ප්‍රතිපත්ති විශුද්ධි ලක්ෂණ තුන ය, උපෙක්ෂානු බ්‍රෑහණ ලක්ෂණ තුන ය, සම්පහංසනා ලක්ෂණ සතරය යන දශප්‍රකාර ලක්ෂණයන්ගෙන් සමන්විත වූ ප්‍රථමධ්‍යානය දතයුතු.

අතිදක්ෂ ධනුර්ධරයා වාලවේධය පිණිස සැරසී වාලය විදපු වාරයෙහි පා තුබුණු සැටි ද, දුන්න, දුනුදිය හා ශරය තුබුණු සැටි ද සලකා, මෙසේ සිටි මා විසින් මෙසේ දුන්න, දුනුදිය හා ශරය ගෙන මෙසේ වාලය විදුනා ලදැයි දැන මතු ද ඒ ඒ ආකාරයෙන් ම පිහිටා නො වරදවා වාලය විද ලන්නාක් මෙන්, ප්‍රථමධ්‍යානය ලත් යෝගාවචර තෙමේ ද මා විසින් මේ මේ බොජුන් වළඳා, මේ මේ පුද්ගලයන් ඇසුරු කරමින් මෙබඳු සෙනසුනෙක මේ මේ ඉරියව්වෙහි සිට මෙසේ ප්‍රථමධ්‍යානය උපදවා ගත්තෙමියි, භෝජන සප්පායාදී ආකාර සලකා යම් හෙයකින් ධ්‍යානයෙන් පිරිහුණේ වේ ද එකල්හි පළමු කී විධි සම්පාදනය කොට නැවත ධ්‍යානය උපදවා ගැනීම ද ප්‍රගුණ නොකළ ධ්‍යානය ප්‍රගුණ කර ගනිමින් නැවත නැවත අර්පණාවට පැමිණෙන්නට ද සමර්ථ වන්නේ ය.

අර්පණාවගේ චිරස්ථිතිය පිණිස ප්‍රතිපක්ෂ වූ නීවරණ ධර්මයන් මනා කොට ශුද්ධ කරගත යුතු වේ. යම් යෝගාවචරයෙක් කාමාදීනවාදිය සලකා කාමච්ඡන්දය විෂ්කම්භනය කොට නොගෙන, කාය පස්සද්ධි වශයෙන් කායදරථයට නිමිත්ත වූ ව්‍යාපාදය මනා කොට සන්සිඳුවා නොගෙන, ආරම්භ ධාතු, ආලෝකසංඥාදිය මෙනෙහි කිරීමෙන් මනා කොට ථිනමිද්ධය දුරු කොට නොගෙන, සමථ නිමිත්ත මෙනෙහි කිරීම් වශයෙන් මනා කොට උද්ධච්ච - කුක්කුච්චය නොනසා, විචිකිච්ඡාවට කාරණා වූ මද නිම්මදනාදී සමාධියට ප්‍රතිපක්ෂ ධර්මයන් මනා කොට ශුද්ධකර නොගෙන, ධ්‍යානයට සමවන්නේ නමුදු ඒ යෝගාවචර තෙම අශුද්ධ ස්ථානයකට පැමිණි බමරකු මෙන් වහා ඒ ධ්‍යානයෙන් නැගෙන්නේ ය. යම් යෝගාවචරයෙක් සමාධි ප්‍රතිපක්ෂ ධර්මයන් මනා කොට පිරිසුදු කොට ගෙන සමාධියට සමවදනේ ද ඔහු පිරිසුදු තැනකට වන් බමරා සේ මුළු දවසම වුවත් සමාපත්තියෙහි ම සිටීමට සමත් වේ. එසේ හෙයින්

සමාධියගේ චිරස්ථිතිය කැමති වන යෝගාවචර තෙම ප්‍රතිපක්ෂ ධර්ම මනා කොට ශුද්ධකරගෙන ම ධ්‍යානයට සමවදින්නේ ය.

සමාධි භාවනාවෙහි නියුක්ත යෝගාවචර තෙම මතු අභිඥා ආදිය පිණිස ධ්‍යානය වර්ධනය කරගනු කැමැත්තේ නම්, ඔහු විසින් උපචාර භූමි වශයෙන් හෝ අර්පණා භූමි වශයෙන් හෝ ලත් ප්‍රතිභාග නිමිත්ත මනා කොට වැඩිය යුතු වේ.

## ප්‍රතිභාග නිමිත්ත වඩන පිළිවෙල

ප්‍රතිභාග නිමිත්ත වඩනු කැමති යෝගාවචරයා විසින් සීමා බඳනා භික්ෂූන් වහන්සේ පළමු කොට නිමිති සලකා ඒ නිමිති ඇතුළ සීමා බඳනාක්මෙන්, ප්‍රතිභාග නිමිත්ත ද එක් අඟුල්, දෑඟුල්, තෙඅඟුල්, සිව්අඟුල් ආදී වශයෙන් පිරිසිඳ ඒතාක් වැඩිය යුතු. ඉක්බිති ව වියත්, රියන් ආදී වශයෙන් විහාර සීමාව දක්වා ද ඉන් ඔබ්බෙහි ගම්, නියම්ගම්, දනව්, රාජ්‍ය, සමුද්‍ර සීමා දක්වා ද වඩාගෙන සක්වළ ගල දක්වා හෝ ඉන් ඔබ්බෙහි හෝ පිරිසිඳ වැඩිය යුතු. මෙසේ නිමිත්තා වැඩූ තැන පොළොව, ගොඩ, වළ, ගංගා, පර්වත විසමතැන් ආදිය සමවන්නේ ය. ඒ යෝගාවචරයා විසින් මෙසේ ලත් ප්‍රථම ධ්‍යානයට සමවැදීම බහුල කරගත යුතු. ප්‍රත්‍යවේක්ෂණයෙහි උත්සාහ නොවිය යුතු. ප්‍රථම ධ්‍යානය ලබාගත් යෝගාවචර තෙම අදක්ෂවූයේ නම්, සමාධි නිමිත්ත සේවනය නොකර, නොවඩා, බහුල නොකොට, මනාව පිහිටුවා නොගෙන වාසය කරන්නේ නම් ඔහු ද්විතීය ධ්‍යානය ලබාගැනීම තබා ප්‍රථම ධ්‍යානය වත් රැකගැනීමට අසමර්ථ වෙයි. එසේ හෙයින් යෝගාවචරයා විසින් පළමු කොට ඒ ප්‍රථම ධ්‍යානයෙහි ම පස් ආකාරයෙකින් චිණ්වශී වියයුතු. වශී නම් කැමති පරිද්දෙන් යටත් කොට ගෙන පවත්වන්නට සමත් බවයි.

## පඤ්චවිධ වශීය

**ආවජ්ජන වසී, සමාපජ්ජන වසී, අධිට්ඨාන වසී, වුට්ඨාන වසී, පච්චවෙක්ඛණ වසී** යයි වසීහු පස් ආකාර වෙති.

1. **ආවජ්ජන වසී** - කැමති යම් තැනක, කැමති යම් ධ්‍යානාඞ්ගයක් කැමතිතාක් කල් ආවර්ජනා කිරීමෙහි සමත් බව **ආවජ්ජන වසී** නම් වේ. ප්‍රථම ධ්‍යානය ලබාගත් යෝගාවචර තෙම එම ධ්‍යානයෙන් නැඟී, ප්‍රථමධ්‍යානාඞ්ගය වූ **විතර්කය** අරමුණු කරණ කල්හි භවාඞ්ගචලනය භවාඞ්ගුපච්ඡේදය, ඉපිද නිරුඬ වූ පසු විතර්ක නම් වූ ධ්‍යානාඞ්ගය අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනය ද, එයට ඉක්බිති ව කාමාවචර කුසල ජවන් සතරක් හෝ පසක් ඉපිද නිරුඬ වෙති. ජවනයන්ට අනතුරුව භවාඞ්ග දෙකක් උපදියි. මේ ක්‍රමයෙන් **විචාරය** ද, **ප්‍රීතිය** ද, **සුඛය** ද, **එකාග්‍රතාවය** ද ආවජ්ජනා කරමින් පිළිවෙළින් චිත්තවීථි උපදී. යම් පුද්ගලයෙක්හට මෙසේ ධ්‍යානාඞ්ග පසෙහිනිරන්තරයෙන් සිත මෙහෙයවන්නට ආවර්ජනය කරන්නට සමත්කම ලැබේ නම් එවිට **ආවජ්ජන වසීය** සිඬවූයේ යයි කියනු ලැබේ.

2. **සමාපජ්ජන වසී** - කැමති යම් තැනෙක, කැමතිතාක් කල් ධ්‍යානයට සීඝ්‍රව සමවැදීමෙහි සමත් බව **සමාපජ්ජන වසී** නම් වේ. මුගලන් මහරහතන් වහන්සේ නන්දෝපනන්ද දමනයෙහිදී මේ සමාපජ්ජන වසී ශක්තියෙන් ධ්‍යානයන්ට සීඝ්‍රව සමවැදීමෙන් දමනය කරගත් බව දත යුතු.

3. **අධිට්ඨාන වසී** - කැමති යම් තැනක, කැමතිතාක් කල් ධ්‍යානය තබාගන්නට සමත් බව **අධිට්ඨාන වසී** නම් වේ.

4. **වුට්ඨාන වසී** – කැමති යම් තැනක, කැමති කාලයක ධ්‍යානයෙන් වහා නැගී සිටීමට සමත් බව **වුට්ඨාන වසී** නම් වේ.

5. **පච්චවෙක්ඛණ වසී** – කැමති යම් තැනක, කැමති යම් ධ්‍යානාඞ්ගයක්, කැමති යම් කලෙක ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙහි සමත් බව **පච්චවෙක්ඛණ වසී** නම් වේ.

මතු ද්‍විතියධ්‍යානාදිය ලබාගනු කැමති යෝගාවචරයා විසින් මේ ප්‍රථමධ්‍යානය යට කියන ලද පඤ්චවසිතාවන්ගේ වශයෙන් පුරුදු කළ යුතු.

## ද්විතීය ධ්‍යානය

ප්‍රථමධ්‍යානය මෙසේ පඤ්චවසිතා වශයෙන් පුරුදු කළ පුද්ගල තෙමේ, එයින් නැගී මේ සමාපත්තියෙහි ආසන්න වූ පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත සතුරෝ ඇත්තාහ. එහි අන්තර්ගත ධ්‍යානාඞ්ගයන් අතුරෙන් විතර්කය හා විචාරය ඖදාරික ය. එහෙයින් ම දුර්වල ය. එබැවින් දෙස් සහිත ය. විතක්ක විචාරයන් නැති ද්විතීයධ්‍යානය ශාන්තය. මේ ආදී වශයෙන් සලකා ප්‍රථමධ්‍යානයෙහි නිකාන්තිය දුරුකොට ද්විතියධ්‍යානය ලබාගන්නා පිණිස නැවත භාවනාව ආරම්භ කළ යුතු වේ. හෙතෙම නැවතත් යට කියන ලද පරිද්දෙන් ඒ නිමිත්ත ම **පඨවි පඨවී** යනාදී වශයෙන් නැවත නැවතත් මෙනෙහි කරන කල්හි ද්විතීයධ්‍යානය ලබන අර්පණා චිත්තවීථිය උපදී. එකල්හි භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව පඨවිකසිණය අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනය ද, ජවන් සිත් සතරක් හෝ පසක් ද ඉපිද භවඞ්ගපාතය වේ. මෙයින් අවසාන ජවනය **රූපාවචර ද්විතීයධ්‍යානය** වේ. ඉතිරි ජවන් ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර කුසල චිත්තයෝ ය.

ද්විතීයධ්‍යානය උපන් කල්හි ඒ යෝගාවචර තෙමේ **(විතක්ක විචාරානං වූපසමා, අජ්ඣත්තං සම්පසාදනං, චෙතසො එකොදිභාවං, අවිතක්කං අවිචාරං සමාධිජං**

**පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති)** යයි වදාළ පරිදි විතක්ක විචාර සංසිඳීමෙන් ස්වසන්තානයෙහි උපන් සම්ප්‍රසාදනයෙන් යුක්ත වූ චිත්තයාගේ ඒකොදිභාව යයි කියන ලද විතර්ක විචාරයන් රහිත වූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානය උපදවා වාසය කරන්නේයයි දත යුතු. ද්විතීයධ්‍යානයෙහි ප්‍රහීණාඞ්ගයෝ දෙදෙනෙකි. එනම් විතක්ක විචාරයෝ යි. සමන්නාගතාඞ්ගයෝ තිදෙනෙකි. එනම් පීති, සුඛ, ඒකග්ගතා යන තුනය. ප්‍රථමධ්‍යානය මෙන් ද්විතීය ධ්‍යානය ද ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් ද සමන්විත වේ. මේ ද්විතීයධ්‍යානය ස්වසන්තානයෙහි උපන් ශ්‍රද්ධායෙන් යුක්ත බැවින් ද විතක්ක විචාරයන්ගෙන් වන කැලඹීම් සංසිඳීමෙන් සිත පහදවන බැවින් **සම්පසාදනයයි** කියනු ලැබේ. විතක්ක විචාරයන් රහිත ව හුදකලාව අසහාය ව නැගෙන්නා වූ මේ සමාධිය සත්ත්ව, පුද්ගලයෙකුගේ නොව චිත්තයාගේ ම බව දැක්වීම පිණිස **චෙතසො ඒකොදිභාවං** යයි කියන ලදී. ප්‍රථමධ්‍යානයෙහි ද ශ්‍රද්ධාව ඇතත් එය අතිප්‍රසන්න නොවන බැවින් ද, අප්‍රකට බැවින් ද සම්පසාදනය යයි නොවදාරණ ලදී. ද්විතීය ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන හෙයින් ඒ ප්‍රථමධ්‍යාන සමාධියෙන් හටගත් සුඛයත් සමන්නාගතාඞ්ගයෝ වෙති. මෙහි විතක්කවිචාරයන්ගේ ප්‍රහාණය උපචාරක්ෂණයෙහිදී සිදු නොවේ. ද්විතියධ්‍යාන චිත්තයාගේ උත්පාදක්ෂණයේ දී හෙවත් දුතියධ්‍යානය උපදනා කල්හි විතක්ක විචාර යන ඖදාරිකධ්‍යානාඞ්ග දෙක නැතිවම උපදී.

## තෘතීය ධ්‍යානය

ද්විතියධ්‍යානය මෙසේ ලබාගත් යෝගාවචර තෙම, ඒ ධ්‍යානයට කියන ලද පරිද්දෙන් පඤ්චවසිතාවන්ගේ වශයෙන් පුරුදු කොට ප්‍රගුණ වූ කල්හි ඒ ධ්‍යානයෙන් නැගී, ද්විතියධ්‍යාන සමාපත්තිය, ආසන්න වූ විතක්ක විචාර සඞ්ඛ්‍යාත සතුරන් ද, එහි පවත්නා ප්‍රීතිය සිත් උද්දම්ප වන්නක් බැවින් ඖදාරික හෙයින් ද එහි අඞ්ගයෝ දුර්වල ය,

ද්විතීයධ්‍යානය දෝස් සහිත ය, තෘතීයධ්‍යානය නම් ශාන්තය යනාදී වශයෙන් සලකා ද්විතීයධ්‍යානයෙහි ආශාව අත්හැර තෘතීයධ්‍යානය ලබාගන්නා පිණිස නැවත භාවනා ආරම්භ කරන්නේ ය. හෙතෙම ද්විතීයධ්‍යානයෙන් නැගී එහි අන්තර්ගත ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරණ කල්හි, ප්‍රීතිය ඕදාරික වශයෙන් ද, සුඛය හා එකග්ගතාවය ශාන්ත වශයෙන් ද වැටහී, ප්‍රීතිය දුරු කරණු පිණිස ද, ශාන්ත වූ අඞ්ගද්වය ලබාගනු පිණිස ද, ඒ නිමිත්ත ම නැවතත් පඨවි පඨවි ආදී වශයෙන් මෙනෙහි කොට තෘතීයධ්‍යානය ලැබෙන අර්පණා චිත්ත වීථිය උපදවා ගන්නේ ය. පළමු පරිද්දෙන් භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව කසිණනිමිත්ත අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනය ද, එයට අනතුරුව එය ම අරමුණු කරමින් ජවන් සිත් සතරක් හෝ පසක් උපදී. එයින් අවසාන ජවනය රූපාවචර තෘතීයධ්‍යානය ය. ඉතිරි ජවන් කාමාවචරය. මෙසේ හෙතෙම (**පීතියාච විරාගා, උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති "උපෙක්ඛකො සතිමා සුඛවිහාරී" ති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති**) යනාදී වශයෙන් වදාළ පරිදි ප්‍රීතිය ද පිළිකුල් කිරීමෙන් සමතික්‍රමණය කොට, යුක්ති වශයෙන් අපක්‍ෂපාත ව බලමින් හෙවත් උපෙක්‍ෂකව වසන්නේ, සිහි නුවණින් යුක්තව, කයෙන් සුවය ද විඳිමින්, යම් ධ්‍යානයක් හේතුකොට ගෙන බුද්ධාදි ආර්‍යයෝ ඒ තෘතීයධ්‍යානයෙන් යුත් පුද්ගලයාහට "උපෙක්ඛකො සතිමා සුඛවිහාරී" යයි ප්‍රශංසා කරත් ද, ඒ තෘතීයධ්‍යානය උපදවා වාසය කරන්නේ ය.

තෘතීයධ්‍යානයාගේ උත්පත්තික්‍ෂණයේදී ම ප්‍රීතිය සමතික්‍රමණය කිරීමෙන් විතක්ක විචාරයන් ද ව්‍යුපසමනය වන බව දත යුතු. මෙහි උපෙක්‍ෂකව වසන්නේ යයි කී තන්හි දසවිධ වූ උපෙක්‍ෂාවන් අතුරෙන් **ධ්‍යානොපෙක්‍ෂාවෙන්** වසන බව දත යුතු. ධ්‍යානොපෙක්‍ෂාවේ **ලක්‍ෂණය** මධ්‍යස්ථ භාවය යි. රසය මෙනෙහි නොකරන බවයි. පච්චුපට්ඨානය අව්‍යාපාරය යි. පදට්ඨානය ප්‍රීති විරාගයයි.

## දශවිධ උපෙක්ෂා

1. ෂඩඞ්ගොපෙක්ෂා
2. බ්‍රහ්මවිහාරොපෙක්ෂා
3. බොධ්‍යාඞ්ගොපෙක්ෂා
4. වීර්‍ය්‍යොපෙක්ෂා
5. සංස්කාරොපෙක්ෂා
6. වෙදනොපෙක්ෂා
7. විදර්ශනොපෙක්ෂා
8. තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා
9. ධ්‍යානොපෙක්ෂා
10. පාරිශුද්ධ්‍යුපෙක්ෂා

1. **ෂඩඞ්ගොපෙක්ෂා** - රහතන්වහන්සේගේ චක්ෂුරාදි සදොර ඉෂ්ට අනිෂ්ටාදි අරමුණු වැටීමෙහි දී පිරිසුදු වූ, ප්‍රකෘතිය නො වෙනස් වීම් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් වේ ද එය **ෂඩඞ්ගොපෙක්ෂා** නම් වේ.

2. **බ්‍රහ්මවිහාරොපෙක්ෂා** - අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාර වූ යම් උපෙක්ෂාවක් වේද එය **බ්‍රහ්මවිහාරොපෙක්ෂා** නම් වේ.

3. **බොධ්‍යාඞ්ගොපෙක්ෂා** - විවේක නිශ්‍රිත වූ උපෙක්ඛා සම්බොධ්‍යාඞ්ගය වඩනා කල්හි සහජාත ධර්මයන් අතුරෙන් මධ්‍යස්ථාකාර වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **බොධ්‍යාඞ්ගොපෙක්ෂා** නම් වේ.

4. **වීර්‍ය්‍යොපෙක්ෂාව** - පමණ ඉක්ම පටන් නොගන්නා ලද පමණ ඉක්ම ලිහිල් නොකරණ ලද මධ්‍යස්ථාකාරයෙන් පැවති වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **වීර්‍ය්‍යොපෙක්ෂා** නම් වේ.

**5. සංස්කාරොපෙක්ෂා** – නීවරණාදීන් පරීක්ෂාකොට සනිටුහන් වශයෙන් සිටින්නාවූ ආදීනව දුටු හෙයින්, නීවරණාදීන් ගැන්මෙහි මධ්‍යස්ථාකාර වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **සංස්කාරොපෙක්ෂා** නම් වේ.

**6. වෙදනොපෙක්ෂා** – අදුක්ඛමසුඛ නම් වූ යම් උපෙක්ෂා වෙදනාවක් වේ ද එය **වෙදනොපෙක්ෂා** නම් වේ.

**7. විදර්ශනොපෙක්ෂා** – අනිත්‍ය දුක්ඛ අනාත්මාදී වශයෙන් සම්මර්ශනය කිරීමෙන් මධ්‍යස්ථාකාර වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **විදර්ශනොපෙක්ෂා** නම් වේ.

**8. තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා** – සහජාත ධර්මයන් සමව ඉසිලීමට කාරණා වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **තත්‍ර-මධ්‍යස්ථොපෙක්ෂා** නම් වේ.

**9. ධ්‍යානොපෙක්ෂා** – අග්‍ර වූ ධ්‍යාන සුඛයෙහි ද, පක්ෂපාත බව නූපදවන යම් උපෙක්ෂාවක් වේ ද එය **ධ්‍යානොපෙක්ෂා** නම් වේ.

**10. පාරිශුද්ධ්‍යුපෙක්ෂා** – නීවරණාදී ප්‍රතිපක්ෂ ධර්ම හා විතක්ක – විචාරාදී ඖදාරිකාඞ්ගයන් ගෙන් ද පිරිසුදු වූ, ප්‍රතිපක්ෂ ධර්ම සංසිඳවීමෙන් උත්සාහරහිත වූ යම් උපෙක්ෂාවක් වේ ද එය **පාරිශුද්ධි උපෙක්ෂා** නම් වේ චතුර්ථධ්‍යානයෙහි ඇති උපෙක්ෂාවයි.

තෘතියධ්‍යානය උපදනා කල්හි ඒ සිතෙහි සම්ප්‍රයුක්ත වූ යම් සුඛ වෙදනාවක් වේ ද එය ද විඳිමින්, එයින් හටගත් ප්‍රණීත වූ චිත්තජ රූපයන් ගේ ස්පර්ශය රූපකායයෙහි පැතිර පවත්නේ ය. ධ්‍යානයෙන් නැගී කල්හි ද එම කායික සුඛය අනුභව කරන්නේ ය. මේ සුඛය ඉතාමත් මිහිරිය. නමුත් එහි සුඛාභිලාෂයක් ඇති නොවන හෙයින් උපෙ-ක්ෂක ය. ප්‍රීතිය ද නූපදනා හෙයින් ස්මෘතිමත් ය. එහෙයින් ආර්යයන්ගේ ප්‍රශංසාවට ද හිමිවන්නේ ය. මෙහි දී ප්‍රහීණ වන්නේ ප්‍රීති ධ්‍යානාංගය පමණ ය. සමන්නාගතාංගයෝ දෙදෙනෙකි. එනම් සුඛ එකග්ගතා යන අඞ්ග දෙක ය. මේ ප්‍රීතිය අර්පණාක්ෂණයෙහි ම ප්‍රහීණ වේ.

## චතුර්ථ ධ්‍යානය

යෝගාවචර තෙම මෙසේ ලබාගත් තෘතියධ්‍යානය පඤ්චවසිතා වශයෙන් පුරුදු කොට, එහි ධ්‍යානාඞ්ග නැවතත් ප්‍රත්‍යවෙක්‍ෂා කරණ කල්හි, එහි සම්ප්‍රයුක්ත සොමනස්ස චෛතසික සඞ්ඛ්‍යාත සුඛය ඖදාරික වශයෙන් ද, උපෙක්‍ෂා වේදනාව හා චිත්තෛකාග්‍රතාවය ශාන්ත වශයෙන් ද වැටහෙන හෙයින් තෘතියධ්‍යානයෙහි නිකාන්තිය අත්හැර චතුර්ථධ්‍යානය පිණිස ඒ කසිණ නිමිත්ත ම ගෙන පඨවි, පඨවි යනාදී වශයෙන් නැවත නැවතත් භාවනා කරන්නේ ය. මෙසේ භාවනා කරත් ම අර්පණා වීථිය උපදින්නේ ය. යට කී පරිදි භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව, මනොද්වාරාවජ්ජනය ද ඉපිද නිරුධ වූ පසු එම කසිණ නිමිත්ත අරමුණු කරමින් ජවන් සතරක් හෝ පසක් උපදී. එයින් අවසාන ජවනය රූපාවචර චතුර්ථධ්‍යානය ය. ඉතිරි ජවන් කාමාවචර ය. මෙසේ හෙතෙම **"සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා, අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති"** යනාදී වශයෙන් වදාළ පරිදි, සුඛය ද ප්‍රහාණය කිරීමෙන්, දුක්ඛය ද ප්‍රහාණය කිරීමෙන්, පූර්වයෙහි සොම්නස හා දොම්නස අස්ථඞ්ගම කිරීමෙන්, දුක්නො වූ, සුඛ නොවූ, උපෙක්‍ෂා ස්මෘතියෙන් පිරිසුදු වූ චතුර්ථධ්‍යානය උපදවා වාසය කරන්නේ ය. මෙහි කායික සුඛය හා කායික දුක්ඛය ද ප්‍රහාණය කරණු ලබන්නේ චතුර්ථධ්‍යානක්‍ෂණයට පූර්වයෙහි ය. සොමනස්ස දොමනස්ස දෙදෙනාගේ ප්‍රහාණය හෙවත් අස්ථඞ්ගමය චතුර්ථධ්‍යානයාගේ උපචාර අවස්ථාවෙහි සිදුවේ.

මෙහි වදාළ අදුක්ඛම සුඛය නම් උපෙක්‍ෂා වෙදනාවයි. එය දුක්ඛයටත් සුඛයටත් ප්‍රතිපක්‍ෂ වූ ධර්මයකි. **උපෙක්‍ෂාව** වනාහි ඉෂ්ටානිෂ්ට දෙකට විපරීත වූ මධ්‍යස්ථානුලම්බනානු භවය ලක්‍ෂණ කොට ඇත්තේ ය. මධ්‍යස්ථභාවය එහි කෘත්‍යය වේ. පච්චුපට්ඨානය සුව දුක් දෙකින් අනුමාන

වශයෙන් දතයුතු බැවින් අවිභූත භාවයයි. පදට්ඨානය සුඛනිරොධයයි. චතුර්ථධ්‍යානයෙහි මේ උපෙක්‍ෂාවෙන් ම ජනිත වූ පිරිසුදු වූ ස්මෘතිය ඇති හෙයින් උපෙක්ඛාසතිපාරිශුද්ධියයි කියනු ලැබේ. මේ ධ්‍යානයෙහි ප්‍රහීණාඞ්ගය නම් සොම්නසයි. එම ප්‍රහාණය ධ්‍යානයට පූර්වයෙහි උපදනා ජවනයන්ගෙන් සිදුවේ. සමන්නාගතාඞ්ග දෙදෙනා නම් උපෙක්ඛා එකග්ගතා යන අඞ්ග දෙක ය.

මේ කියන ලද්දේ චතුෂ්කනය වශයෙන් රූපාවචර-ධ්‍යාන සතර ය.

**පඤ්චක නයයෙහි** වනාහි, **ප්‍රථමධ්‍යාන, ද්‍විතියධ්‍යාන, තෘතියධ්‍යාන, චතුර්ථධ්‍යාන, පඤ්චමධ්‍යාන** යයි ධ්‍යාන පසෙකි. **ප්‍රථමධ්‍යානයෙහි** චතුෂ්කනයෙහි දක්වන ලද පරිදි විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා යන ධ්‍යානාඞ්ග පසෙක් ඇත. **ද්‍විතියධ්‍යානයෙහි** දී ඖදාරික වූ විතර්කය පමණක් ප්‍රහීණ කොට, විචාර, පීති, සුඛ, එකග්ගතා යන අඞ්ග සතරකින් යුක්ත වේ. **තතියධ්‍යානයෙහි** විචාරය ද දුරු කොට ප්‍රීති, සුඛ, එකග්ගතා යන අඞ්ග තුනකින් යුක්ත වේ. චතුෂ්කනයෙහි දී මේ ද්‍විතිය, තතියධ්‍යාන දෙක ම එක් කොට ගෙන ද්‍විතියධ්‍යානය වශයෙන් දක්වන ලදී. **චතුර්ථධ්‍යානයෙහි** ප්‍රීතිය දුරු කොට සුඛ, එකග්ගතා යන අඞ්ග දෙකෙන් යුක්ත වේ. මෙය චතුෂ්කනයෙහි තෘතිය ධ්‍යානය වේ. පඤ්චමධ්‍යානයෙහි සුඛය දුරු කොට උපෙක්ඛා එකග්ගතා යන අඞ්ග දෙකින් යුක්ත වේ. මෙය චතුෂ්කන-යෙහි චතුර්ථධ්‍යානය වේ. මේ ධ්‍යාන වඩන පිළිවෙල යට චතුෂ්කනයෙහි දක්වන ලද පරිද්දෙන් දත යුතු.

## ආපො කසිණ භාවනාව

ආපො කසිණ නිමිත්ත වැඩීමට පෙර පඨවි කසිණයට කියන ලද ආකාරයෙන් සියලුම පූර්ව කෘත්‍යයන් සම්පූර්ණ කළ යුතු. මෙහිදී තමා විසින් සකස් කරගත් හෝ ප්‍රකෘතියෙහි පිහිටි හෝ ජලයෙහි නිමිත්ත ගත යුතුයි. පෙර ආත්ම

භාවයන්හි ආපො කසිණය වඩා මනා පුරුද්දක් ඇති පුද්ගලයන්හට පොකුණු, විල්, කලපු, මුහුදු ආදී තන්හි පිහිටි ජලයෙහිම නිමිත්ත උපදී. එසේ පෙර ආපො කසිණ නො වඩන ලද පුරුදු නොකළ, පුද්ගලයන්හට වනාහි කසිණ දෝෂයන් හැර නීල, පීත, ලෝහිත, ඕදාත යන සිව් පැහැ ඇති ජලය නොගෙන, ශුද්ධ වස්ත්‍රයෙකින් පෙරාගත් බිම නො වැටුනු වර්ෂා ජලය හෝ අන්‍ය පිරිසුදු ජලයක් හෝ භාජනය හෙවත් පාත්‍රය මුව දක්වා පුරවා ගෙන යට දක්වන ලද පරිදි සුදුසු තැනකට ගෙන ගොස් **ආපො, ආපො** යයි භාවනා කළ යුතු. ජලයෙහි ඇති වර්ණය හෝ ද්‍රව ලක්ෂණය හෝ මෙනෙහි නො කොට ප්‍රඥප්ති ධර්මයෙහි ම සිත පිහිටුවා ගත යුතු. ආපෝ ධාතුයෙහි උත්සන්න භාවය, අධික භාවය කරණ කොට ගෙන සසම්භාර ආපයට, ආපෝ යයි ලෝකව්‍යවහාරයක් ඇති හෙයින් ඒ ප්‍රඥප්තියෙහි සිත පිහිටුවා ගෙන භාවනා කරණ කල්හි යට පඨවි කසිණය ගැන කියන ලද ආකාරයෙන් උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත ද උපදී. එහි උද්ග්‍රහ නිමිත්ත සැලෙන්නාසේ වැටහේ. ප්‍රතිභාග නිමිත්ත නො සැලෙයි. එසේ වැටහෙන කල්හි ඒ නිමිත්ත වඩා උපචාරධ්‍යානය හා රූපාවචර ප්‍රථමධ්‍යානාදිය පිළිවෙලින් ලබා ගත හැකි වේ.

## තේජෝ කසිණ භාවනාව

**තේජෝ කසිණ** භාවනායෙහි දී තෙජෝ නිමිත්ත ගතයුතු. පෙර ආත්මභාවයන්හි තෙජෝ කසිණය වඩා මනා පුරුද්දක් ඇති පුද්ගලයාහට පහන් සිළු, උදුන, ලැව් ගින්න යනාදී තන්හි ගිනිසිළු බලත් ම නිමිත්ත උපදී. එසේ පූර්වකෘත්‍ය නැති තැනැත්තා විසින් එය පිළියෙල කරගත යුතු වේ. සිනිඳු වූ හර ඇති වියලි දර පලා කැබලි කොට සුදුසු තැනකට රැස් කොට ගිනි දල්වා ගත යුතුයි. ඉක්බිති සමක හෝ වස්ත්‍රයක හෝ එක්වියත් සතරඟුල් පමණ සිදුරක්කොට දල්වෙන ගින්න ඉදිරියේ තබාගෙන එහි දර, දුම් ආදිය මෙනෙහි නො කොට මැද සිදුරෙන්

පෙනෙන ගිනි දැල්ලෙහි ම නිමිත්ත ගත යුතු. ඒ නිමිත්තෙහි ද වර්ණය හෝ උෂ්ණත්වය හෝ මෙනෙහි නොකොට, තේජය උත්සන්න වීමෙන් පවත්නා සසම්භාර තේජසයෙහි තේජස යන ප්‍රඥප්තිය ම මෙනෙහි කොට තේජෝ – තේජෝ යයි භාවනා කළ යුතු. මෙසේ භාවනා කරත්ම යට කියන ලද පරිදි උද්ග්‍රහ ප්‍රතිභාග නිමිති උපදී. මෙයින් උද්ග්‍රහ නිමිත්ත ගිනිදැල් කැඩී කැඩී වැටෙන්නාසේ වැටහෙයි. ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි නිශ්චල ව වැටහෙයි. එසේ නිමිත්ත වැටහෙන කල්හි යෝගාවචර තෙම උපචාර අර්පණාධ්‍යාන උපදවා ගන්නේ ය.

## වායෝ කසිණ භාවනාව

වායෝ කසිණ භාවනාවෙහි දී වායුවෙහි නිමිත්ත ගත යුතු. සැලෙන උක්ගස් අගක් හෝ රුක් අගක් හෝ කෙස් අගක් හෝ බලා එය වාතය කරණ කොට ගෙන සැලෙන බව මෙනෙහි කොට නිමිති ගත යුතු. තවද කවුළු දොරින් හෝ බිත්ති සිදුරින් හෝ තම ඇඟ සපර්ශ කරණ වාතයෙක් වේ නම් එහි සිත පිහිටුවා ගත යුතු. මෙසේ වාතය මෙනෙහි කොට **වායො – වායො** යයි භාවනා කරණ කල්හි උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත ද වැටහෙයි. එය වඩා ධ්‍යාන උපදවා ගත යුතු.

## නීල කසිණ භාවනාව

පෙර නීල කසිණය වඩා පුරුදු ඇති පුද්ගලයෙකුට වනාහි පිපුණු නිල් මලින් ගැවසී ගත් මල් ගසක් හෝ, මල් අස්නක නිල් මල් හෝ නිල් පිළි ආදී සිකිවක් හෝ දැකීමෙන් නිමිත්ත උපදී. එසේ නැති පුද්ගල තෙම නිල් මල් ගෙන රේණු හෝ නැටි හෝ නොපෙනෙන පරිද්දෙන් නැටියෙක අසුරා ගෙන, අවට වෙනත් වර්ණයෙකින් පරිච්ඡෙද කොට සුදුසු තැනෙක තබා **නීලං – නීලං** යයි මෙනෙහි කළ යුතු. මෙසේ භාවනා වඩත් ම උද්ග්‍රහ ආදී නිමිති වැටහීමෙන් ධ්‍යානාදිය යට කී පරිදි උපදවා ගත හැකි වේ.

## පීත කසිණය

පීත කසිණ භාවනාව ද නීල කසිණය මෙනි. පෙර පුරුදු ඇති පුද්ගලයාහට කහ මලින් ගැවසිගත් මල්ගසක් හෝ මල් ඇතිරියක් හෝ කහ පිළියක් හෝ දැකීමෙන් නිමිත්ත උපදී. එසේ නැති කල්හි කිණිහිරි මල් ආදියෙන් හෝ කහ පිළියෙන් හෝ මණ්ඩලය සාදාගෙන **පීතකං - පීතකං** යයි භාවනා කොට නිමිති උපදවා ගත යුතු.

## ලෝහිත කසිණය

ලෝහිත කසිණය වඩා පුරුදු ඇති කෙනෙකුට රත් මලින් ගැවසිගත් මල් ගසක් හෝ මල් ඇතිරියක් හෝ රතු පිළි ආදී කිසිවක් හෝ දැකීමෙන් නිමිත්ත උපදී. එසේ නැති කල්හි රතු මලින් හෝ රතු පිළියෙන් හෝ මණ්ඩලය පිළියෙල කොට ගෙන **ලොහිතකං - ලොහිතකං** යයි මෙනෙහි කොට නිමිත්ත උපදවා ගත යුතු වේ.

## ඕදාත කසිණය

පෙර ඕදාත කසිණය වඩා පුරුදු ඇති තැනැත්තාට වනාහි සුදු මලින් ගැවසීගත් මල් ගසක් හෝ සුදු මල් ඇතිරියක් හෝ සුදු පිළි ආදියක් හෝ දැකීමෙන් නිමිත්ත උපදී. එසේ නැති තැනැත්තා විසින් සුදු මලින් හෝ සුදු පිළියෙන් හෝ කසිණ මණ්ඩලය පිළියෙල කොට හෝ **ඕදාත - ඕදාත** යයි මෙනෙහි කොට නිමිත්ත උපදවා ගත යුතු.

## ආලොක කසිණය

ආලොක කසිණය වඩා පුරුදු ඇති පුද්ගලයනට බිත්ති සිදුරු, කවුළු ආදී කිසිවකින් හිරු එළිය හෝ සඳ එළිය වැදී බිත්තියෙහි හෝ භූමියෙහි හෝ නැගෙන මණ්ඩලය දැකීමෙන් ම නිමිත්ත උපදී. එසේ නැති අය විසින් එවැනි වූ ම මණ්ඩලයක් බලා ගෙන **ඕභාසො - ඕභාසො** යි හෝ **ආලොකො - ආලොකො** යි හෝ භාවනා කළ යුතු.

එවැනි මණ්ඩලයක් නැති කල්හි බඳුනක පහනක් දල්වා එහි පසෙක සිදුරක් කොට බිත්තියකට අභිමුඛ කොට තබා සිදුරෙන් බිත්තියෙහි වැදි ආලෝකය බලා භාවනා කොට නිමිත්ත වඩා ධ්‍යාන උපදවා ගත යුතු.

## ආකාස කසිණය

පෙර පුරුදු කළ ආකාස කසිණ භාවනා ඇති පුද්ගලයා-හට වනාහි බිත්ති සිදුරු ආදී කිසිවක් දැකීමෙන් නිමිත්ත උපදී. එසේ කෘතාධිකාර නැති අය විසින් සමක හෝ පැදුරක හෝ එක්වියත් සතරඟුල් පමණ සිදුරක් කොට එය බලා **ආකාසො - ආකාසො** යි භාවනා කළ යුතු. එසේ භාවනා කොට යට කියන ලද පරිදි නිමිති උපදවා ධ්‍යාන ලබා ගත යුතු වේ.

## කසිණ ඵල

**1.** දස කසිණයන් අතුරෙන් **පඨවි කසිණය** වනාහි අභිඥලාභී පුද්ගලයාගේ ඍද්ධිය පෑමේ දී, එකෙක් ව බොහෝ දෙන වීමට ද, අහස හෝ ජලයෙහි හෝ පොළෝ මවා එහි පයින් ගමන් කිරීම, සිටීම, හිඳීම ආදී ක්‍රියාවන්ට ද උපකාර වේ.

**2. ආපො කසිණයෙන්** පොළොවෙහි දිය, වැසි, ගංගා, මුහුදු මැවීම එහි කිමිදීම යනාදියට උපකාරය ලැබේ.

**3. තෙජො කසිණයෙන්**- ගිනි, දුම්, අඟුරු, වැසි ඉපදවීම ද, තමාගේ තෙජසින් පරතෙජස ක්‍ෂය කිරීම ද, කපු පුළුන් දර ආදිය රැස් කොට එයින් කැමති දේ දවන්නට සමත්වීම, දිව්‍යචක්‍ෂුරභිඥනයෙන් රූපයන් දක්නා පිණිස ආලෝක කිරීම, පිරිනිවන් සමයෙහි තෙජො ධාතුවෙන් ශරීරය දවාලීම යනාදිය කළ හැකි වේ.

**4. වායො කසිණයෙන්** වායුව මෙන් ශීඝ්‍රව යාම, වාත, වැසි උපදවීම යනාදිය කළ හැකි වේ.

5. **නීලකසිණයෙන්** නිල් රූප මැවීම, අන්ධකාර කිරීම, යනාදිය කළ හැකි වේ.

6. **පීත කසිණයෙන්** රන්වන් රූප මැවීම, රන් වේවායි අධිෂ්ඨාන කිරීම යනාදිය කළ හැකි වේ.

7. **ලෝහිත කසිණයෙන්** රතු රූප මැවීම් ආදිය කළ හැකි වේ.

8. **ඕදාත කසිණයෙන්** සුදු රූප මැවීම්, ථිනමිද්ධය දුරු කිරීම්, අන්ධකාරය නැසීම, දිව්‍යසින් රූපයන් දකිනු පිණිස ආලෝක කිරීම ද කළ හැකි වේ.

9. **ආලෝක කසිණයෙන්** ප්‍රභාස්වර රූප මැවීම, ථිනමිද්ධය දුරු කිරීම, අන්ධකාරය නැසීම, දිව්‍යසින් රූප දක්නා පිණිස ආලෝක කිරීම යනාදිය කළ හැකි වේ.

10. **ආකාශ කසිණයෙන්** මුවහ වූ වස්තු ප්‍රකාශ කිරීම, පොළොවෙහි හෝ පර්වතාදියෙහි හෝ අහස් මවා ඉරියව් පැවැත් වීම, භිත්ති ආදියෙන් පිටත නොපැකිළ යාම යනාදිය කළ හැකි වේ.

ආනන්තරික කර්මාදිය කිරීම කරණ කොට ගෙන **කර්මාවරණයෙන්** යුක්ත වූ පුද්ගලයෝ ද, නියත මිථ්‍යා-දෘෂ්ටිය ගැනීමෙන් සහ උභතොබ්‍යඤ්ජනක පණ්ඩක වීමෙන් **ක්ලෙශාවරණයෙන්** යුක්ත වූවෝ ද, අහේතුක, ද්විහේතුක ප්‍රතිසන්ධි ලැබීමෙන් **විපාකාවරණයෙන්** යුක්ත වූවෝ ද, බුද්ධාදීන් කෙරෙහි **ශ්‍රද්ධා නැත්තෝ** ද, මාර්ගානුලෝම ප්‍රතිපදායෙහි **ඡන්දකර්මතාඡන්ද නැත්තෝ** ද, ලෞකික ලෝකෝත්තර සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත **ප්‍රඥා නැත්තෝ** ද, යන මොව්හු කසිණ භාවනායෙන් ප්‍රතිඵල ලබන්නෝ නො වෙති.

ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබාගත් තැනැත්තේ කර්මා-වරණයන් හා කෙලශාවරණයන් ද දුරු කොට, සර්මීය

ශ්‍රවණය හා සත්පුරුෂ සේවනය කිරීමෙන් ශ්‍රද්ධාව ද, කත්තුකම්‍යතා ඡන්දය ද, ප්‍රඥාව ද වඩා භාවනා විධි නො පිරිහෙළා කසිණ භාවනා කරන්නේ නම් ඕ හට භාවනාව සමෘද්ධවීමත් යට කියන ලද කසිණ භාවනා ඵල ලැබීමත් ඒකාන්තයෙන් සිදුවන්නේ ය.

## දස අසුභ කර්මස්ථාන භාවනා

**උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලොහිතක, පුළවක, අට්ඨික යයි අසුභයෝ** දසවිධ වෙත්.

මේ දසවිධ අසුභයන් අතුරෙන් **උද්ධුමාතකය** නම් ඉදිමීගිය මළසිරුරය. **විනීලකය** නම් උස්මස් ඇතිතැන්හි රතු වර්ණයෙන් ද, සැරව රැස්ව සිටි තන්හි සුදු පැහැයෙන් ද බොහෝ නිල් පැහැති තන්හි නීලවර්ණයෙන් ද යුක්ත වූ මළ සිරුර ය. **විපුබ්බකය** නම් සැරව වැගිරෙණ මළ සිරුර ය. **විච්ඡිද්දකය** නම් මැදින් දෙකඩ කොට කැපීමෙන් දෙපළු මළ සිරුර ය. **වික්ඛායිතකය** නම් බලු, කැණහිල් ආදීන් විසින් තැනින් තැන කඩා කන ලද මළ සිරුර ය. **වික්ඛිත්තකය** නම් අත් තැනකය, පා අන්තැනෙකය, හිස අන් තැනකයයි මෙසේ අවයවයන් ඒ ඒ තැන විසිරීගිය මළ සිරුරය **හතවික්ඛිත්තකය** නම් ආයුධයෙන් කොටා අඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඒ ඒ තැන විසුරු වන ලද මළ සිරුර ය. **ලොහිතකය** නම් වැගිරෙන ලේ වැකුණු මළ සිරුරය. **පුළවකය** නම් පණුවන් වැගිරෙන මළ සිරුරය. **අට්ඨිකය** නම් ඇටසැකිල්ලය.

උද්ධුමාතකාදී වූ මේ අසුභයන් අරමුණු කිරීමට අමු-සොහොන් ආදියෙහි දැමූ මෘත ශරීරයන් හමු විය යුතු. මෙකල එවැනි මළ සිරුරු දක්නට නො ලැබෙන හෙයින් අශුභ කර්මස්ථානය වැඩීම දුෂ්කර නමුත් එය වඩන ආකාරය දැන සිටීම ප්‍රයෝජන වන හෙයින් එහි විස්තරය සංක්‍ෂෙපයෙන් දක්වනු ලැබේ.

දස අසුභ කර්මස්ථානයන් අතුරෙන් යම් කිසි කර්මස්ථානයක් වඩනු කැමති යෝගාවචර තෙම, පඨවිකසිණයෙහි කී පරිදි සියලු පූර්වකෘත්‍යයන් සම්පූර්ණ කොට, ආචාර්‍ය්‍යයන් වහන්සේ වෙතින් කමටහන පිළිබඳ සියලු දතයුතු දෙය මනාකොට ඉගෙන භාවනාවට සුදුසු විසභාග නොවූ සිරුරක් සොයා ගන්නේ ය. පුරුෂයා හට ස්ත්‍රී සිරුර ද, ස්ත්‍රීහට පුරුෂ සිරුර ද විසභාග වේ. භාවනාව පිණිස පිටත්වීමට පෙර තම ආචාර්‍ය්‍යයන්ට හෝ එම ස්ථානයෙහි වසන අන්‍ය වූ කෙනෙකුට හෝ දන්වා යා යුතු. එසේ යන්නා වූ හෙතෙම නුමුලාව, එළඹ සිටි සිහියෙන් යුක්තව, සංවර වූ ඉන්ද්‍රියන් ඇතිව, ගිය ආමග සලකමින් හුදකලාව ගොස් ඒ නිමිත්ත තිබූ පෙදෙසෙහි පිහිටි ගල්, රැක්, තුඹස්, පඳුරු ආදිය ඇත් නම් එය නැවත නැවත ව්‍යවස්ථා කිරීම් වශයෙන් **සනිමිත්ත** කරමින් ද, අශුභ නිමිත්ත හා ඒ ගල් ආදිය, දෙක දෙක, එක්කොට ව්‍යවස්ථා කිරීම් වශයෙන් **සාරම්මණ** කරමින් ද **වර්ණ, ලිඞ්ග සණ්ඨාන, දිසා, ඕකාස, පරිච්ඡෙද, සන්ධි, විවර, නින්න, ථල, සමන්ත** යන එකොළොස් ආකාරයෙන් අරමුණ මනාව ගෙන, එළඹ සිටි සිහියෙන් යුක්තව ම ආගිය මඟ සලකමින් හුදකලාව යා යුතු. සක්මන් කරණ කල්හි ද හිඳින කල්හි ද අසුභ නිමිත්ත සිහි කරමින් ම සක්මන් කළ යුතු. හිඳිය යුතු. මේ ප්‍රතිපදායෙන් ජරාමරණයෙන් මිදෙන්නෙමියි අධිෂ්ඨාන කොට ගෙන, කර්මස්ථානය වඩන යෝගාවචරයා උපචාර සමාධි ලබා රූපාවචර ප්‍රථමධ්‍යානය ද ලබා ගෙන වාසය කරන්නේ ය.

**වර්ණ වශයෙන්** නිමිත්ත ගැනීම නම් මේ සිරුර සුදු, කලු යනාදී වශයෙන් මෙබඳු වූ පුද්ගලයෙකු ගේ යයි ව්‍යවස්ථා කිරීමයි. මේ සිරුර ස්ත්‍රියෙකු ගේ හෝ පුරුෂයෙකුගේ හෝ කියා ද, ප්‍රථම, මධ්‍යම, පශ්චිම වයස්හි පිහිටි අයකුගේ යයි ද ව්‍යවස්ථා කිරීම **ලිඞ්ග වශයෙන්** නිමිත්ත ගැනීම වේ. මේ හිස් සටහනය, මේ ග්‍රීවා සටහනය මේ අත් සටහනය යනාදී වශයෙන් ව්‍යවස්ථා කිරීම

**සණ්ඨාන වශයෙන්** නිමිත්ත ගැනීමයි. සිරුරෙහි, මෙය නැබින් යට වූ යට දිශාවය, මෙය නැබින් උඩවූ උඩ දිශාවය අසුභ නිමිත්ත මේ දිසාවෙහි ය යනාදී වශයෙන් ව්‍යවස්ථා කිරීම **දිශා වශයෙන්** නිමිත්ත ගැනීම නම් වේ මේ අවකාශයෙහි අත්ය, මේ අවකාශයෙහි පාදයෝය යනාදී වශයෙන් අශුභ නිමිත්ත ව්‍යවස්ථා කිරීම **අවකාශ වශයෙන්** නිමිත්ත ගැනීම නම් වේ. මේ සිරුර යට පතුලින් උඩ කෙසගින් ද, සරස සිවියෙන් ද සීමාවිය. එහි තුළ දෙතිස් කුණපයෝ ය යනාදී වශයෙන් අශුභ නිමිත්ත ව්‍යවස්ථා කිරීම **පරිච්ඡේද වශයෙන්** නිමිත්ත ගැනීමවේ. පෙර සම්බුඬශාසනයන්හි කමටහන් පුරුදු කළ, සංස්කාර පරිග්‍රහ කළ, නාම-රූප ව්‍යවස්ථා කල, මේරූ කුසල බීජයන් ඇති, මඳ කෙලෙස් ඇති පුද්ගලයෙකු මෙසේ සය ආකාරයකින් අරමුණු ගෙන භාවනා කළ හොත් ඔහට ප්‍රතිභාග නිමිත්ත වැටහෙන්නේ ය. එසේත් නො වැටහෙන්නේ නම් සන්ධි ආදී පස් ආකාරයෙන් නිමිත්ත වැඩිය යුතු.

සිරුරෙහි ඇති එක්සිය අසූවක් පමණ වූ සන්ධි අතුරෙන් ප්‍රකට වූ දකුණතෙහි වූ දසරු සන්ධි, වැලමිට සන්ධි, මනිබන්ධ සන්ධි යන සන්ධි තුනය, වමතෙහි වූ එම සන්ධි තුනය, දකුණු පයෙහි වූ කටි සන්ධි, දණ සන්ධි බොලට සන්ධි යන සන්ධි තුන හා වම් පයෙහි ඇති එම සන්ධි තුනය යනාදී වශයෙන් සන්ධි ව්‍යවස්ථා කිරීම **සන්ධි වශයෙන්** නිමිත්ත ගැනීම වේ. දකුණත හා දකුණැල අතර විවරය. වමත සහ වම්ඇල අතර විවරය, දෙපා අතර විවරය යනාදී වශයෙන් විවර ව්‍යවස්ථා කිරීම **විවර වශයෙන්** නිමිත්ත ගැනීම ය. මේ ඇස් වළ ය, මේ ඇතුළු මුව වළ ය, මේ ගළ වළ ය යනාදී වශයෙන් වළතැන් ව්‍යවස්ථා කිරීම **නින්න** වශයෙන් නිමිත්ත ගැනීම ය. දණ, නළල, ළය ආදී වශයෙන් උස් තැන් වළගොඩ තැන් ව්‍යවස්ථා කිරීම **ථල වශයෙන්** නිමිත්ත ගැනීම ය. මුළු සිරුරම හාත්පසින් ව්‍යවස්ථා කිරීම **සමන්ත වශයෙන්** නිමිත්ත ගැනීම ය.

මෙසේ සිරුර ව්‍යවස්ථා කොට, ශරීරයට ඉතා ළං නොවූ ඉතා දුර නොවූ තැන හිඳ, ඇස දල්වා බලා **"උද්ධුමාතක අසුභය, උද්ධුමාතක අසුභය"** යනාදී වශයෙන් භාවනා කොට ඇස පියාගෙන ද ආවර්ජනා කරණ කල්හි එම නිමිත්ත වැටහෙන්නේ නම් **උග්ගහ නිමිත්ත** මනාකොට ගන්නා ලද්දේ වේ. මෙසේ ලබාගත් උග්ගහ නිමිත්ත උපකාර කොට ගෙන නැවත නැවත භාවනා කරණ යෝගාවචරයාහට **ප්‍රතිභාග නිමිත්ත** ද, එයට ඉක්බිති ව **අර්පණාව** ද ලැබෙන්නේ ය. ඔහු උත්සාහ ගන්නේ නම් විදර්ශනා වඩා **අර්හත්වය** ද ලබා ගත හැකි වේ.

අසුභ භාවනායෙන් ප්‍රතිභාග නිමිත්ත ලත් කල්හි බාහිර වූ කාම සංඥාව දුරු වන හෙයින් විෂ්කම්භන වශයෙන් කාමච්ඡන්දය දුරුවන්නේ ය. **කාමච්ඡන්දය** දුරුවීම සමගම **ව්‍යාපාදය** ද ප්‍රහීණ වේ. ආරබ්ධ වීර්‍ය්‍ය ඇති බැවින් **ථීනමිද්ධය** ද, ශාන්ත ධර්මයන්ගේ ශක්තියෙන් **උද්ධච්ච-කුක්කුච්චය** ද, බුදුරජාණන් වහන්සේ කෙරෙහිත්, ප්‍රතිපත්තිය කෙරෙහිත් ඵලය කෙරෙහිත් විචිකිච්ඡාව ද ප්‍රහීණ වෙත්. ඒහා සමගම **විතර්ක, විචාර, පීති, සුඛ එකග්ගතා** යන ධ්‍යානාඞ්ගයෝ ද පහළ වෙත්. එහෙයින් හෙතෙම උපචාරධ්‍යානය ද, රූපාවචර ප්‍රථමධ්‍යානය ද උපදවා ගන්නේ ය.

**විනීලක** අසුභයක් දක්නේ නම් "**විනීලක පටික්කූලය විනීලක පටික්කූලය,**" යනාදී වශයෙන් ද, **විපුබ්බක** යෙහිදී **විපුබ්බක පටික්කූලය - විපුබ්බක පටික්කූල** යයි ද, **විච්ඡිද්දකයෙහි දී විච්ඡිද්දක පටික්කූලය - විච්ඡිද්දක පටික්කූලය** යයි ද, **වික්ඛායිතකයෙහි දී, වික්ඛායිතක පටික්කූලය, වික්ඛායිතක පටික්කූලය** යයි ද, **වික්ඛිත්තකයෙහි දී, වික්ඛිත්තක පටික්කූලය, වික්ඛිත්තක පටික්කූලය යයි ද, හතවික්ඛිත්තකයෙහි දී, හතවික්ඛිත්තක පටික්කූලය, හතවික්ඛිත්තක පටික්කූලය යයි ද, ලෝහිතකයෙහි දී, ලෝහිතක පටික්කූලය, ලෝහිතක පටික්කූලය යයි ද,**

**පුළුවකයෙහිදී පුළුවක පටික්කූලය, පුළුවක පටික්කූල යයි ද, අට්ඨිකයෙහි දී, අට්ඨික පටික්කූලය, අට්ඨික පටික්කූලය යයි ද,** අරමුණ වැඩිය යුතු වේ.

මේ දස අසුභයන් අතුරෙන් ඒ ඒ අසුභයෝ ඒ ඒ රාගචරිතයන්ට සප්පාය වන පිළිවෙල මෙසේ යි.

**උද්ධුමාතකය,** ශරීර සටහනෙහි විපත්තිය ප්‍රකාශ කරණ හෙයින් **සණ්ඨාන රාගීන්ට** සප්පාය වේ.

**විනීලකය,** ඡවිවර්ණයාගේ විපත්තිය ප්‍රකාශ කරණ හෙයින් **ශරීරවර්ණයෙහි රාගය ඇති පුද්ගලයන්ට** සප්පාය වේ.

**විපුබ්බකය,** දුර්ගන්ධය ප්‍රකාශ කරණ හෙයින් සුවඳ ගැනීමෙහි ඇලුණු **ශරීරගන්ධරාගීන්ට** සප්පාය වේ.

**විච්ඡිද්දකය,** ශරීරයෙහි සිදුරු ඇති බව ප්‍රකාශ කරණ හෙයින් **අඞ්ගප්‍රත්‍යඞ්ග පිළිබඳ ඝන භාවය නිසා උපදනා රාග ඇත්තවුන්ට** සප්පාය වේ.

**වික්ඛායිතකය,** මස්වැඩි තන්හි සැපත විනාශ වන සැටි ප්‍රකාශ කරණ හෙයින් **ශරීරයෙහි මස් වැඩිතැන් නිසා උපදනා රාගය ඇතියවුන්ට** සප්පාය වේ.

**වික්ඛිත්තකය,** අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ වික්ෂේපය ප්‍රකාශ කරණ හෙයින් **අඞ්ගප්‍රත්‍යඞ්ග පිළිබඳ ලීලා රාගීන්ට** සප්පාය වේ.

**හතවික්ඛිත්තකය,** අවයව එක්ව බැඳී ඇති ශරීරයෙහි භේදය ප්‍රකාශ කරණ හෙයින් **අවයව එක්වීමෙන් හටගත් ශරීරය එකක් කොට සලකා රාගය උපදවාගන්නවුන්ට** සප්පාය වේ.

**ලොහිතකය,** ලේවැකීමෙන් පිළිකුල් බව ප්‍රකාශ කරණ හෙයින් අලඞ්කාරයෙන් ඇති වූ **ශොභායෙහි රාගය ඇත්තවුන්ට** සප්පාය වේ.

**පුලවකය,** සිරුර පණුවන්ට සාධාරණ බව ප්‍රකාශ කරණ හෙයින් ශරීරයෙහි මමත්වයෙන් හටගත් රෝගීන්ට සප්පාය වේ.

**අට්ඨිකය,** ඇට පිළිබඳ පිළිකුල ප්‍රකාශ කරණ හෙයින් දත් හි රාගය ඇත්තවුන්ට සප්පාය වේ.

දසවිධවූ මේ අශුභාරම්මණය පිළිකුල් බැවින් එහි සිත රඳවා ගැනීම ඉතා දුෂ්කරය. බලවත් වූ විතර්කයෙන්ම සිත පිහිටුවා ගත යුතු බැවින් අශුභ භාවනාවෙන් විතර්කය සහිතවූ ප්‍රථම ධ්‍යානය පමණක් ලබා ගත හැකි වේ. විතර්කය ලැබෙන කල විතිය ධ්‍යානාදිය නොලැබේ. අරමුණ පිළිකුල් වූවත් අශුභ භාවනාවගේ ආනිශංසය වශයෙන් ජරා මරණයෙන් මිදීමට මේ ප්‍රතිපදාව උපකාරවන්නේයයි ගැනීමෙන් ද, නීවරණ ධර්මයන්ගේ විෂ්කම්භන ප්‍රහාණය වන බැවින් ද ප්‍රථම ධ්‍යාන අවස්ථාවෙහි දී ප්‍රීතිය ලැබෙන්නේ ය.

මළ සිරුරෙහි මෙන්ම ජීවමාන ශරීරයෙහි ද මේ අශුභ ලක්ෂණයෝ ඇත්තාහ. අපිරිසුදු බවය, දුර්ගන්ධ බවය, නින්දිත බවය යනාදිය අශුභයාගේ ලක්ෂණයෝය. ආගන්තුක අලංකාරයෙන් සැරසී සිටින හෙයින් ජීවමාන ශරීරයෙහි මේ ලක්ෂණයෝ ප්‍රකට නොවෙති. මේ ශරීරයෙහි සම්, මස්, ඇට, නහරාදි කුණපයෝ ඇත්තාහ. නව සිදුරු වලින් නිතර කුණු වැගිරෙන්නාහ. ඩහදිය, සෙම් සොටු, මළමූත්‍ර වැගිරෙන්නාහ නොයෙක් රෝගාබාධයන්ට සාධාරණයහ. දුකසේ බොහෝ වෙහෙස දරා රැකගත යුතුය. යම් කලෙක මේ කයෙහි ඇතුළු පැත්ත පිටතට හැරුණේ නම් කවුඩන් බල්ලන් එළවන්නට දඬු මුගුරු ගතයුතු වන්නේ ය. මේ ආදි වශයෙන් මෙනෙහි කරන්නාහට ජීවමාන ශරීරයෙහි ද පිළිකුල් බව වැටහෙන්නේ ම ය. එබැවින් නුවණ ඇති පුද්ගල තෙමේ, මළ සිරුරෙහි හෝ වේවා, ජීවමාන සිරුරෙහි හෝ වේවා, අන් තැනෙක හෝ වේවා, අශුභ ලක්ෂණය වැටහෙන්නේ නම් එහි අශුභ කර්මස්ථානය වඩා අර්පණා ප්‍රාප්ත වන්නේ ය.

## දස අනුස්සති කර්මස්ථාන භාවනා

නැවත නැවත සිහිකිරීම **අනුස්සති** නම් වේ. භාවනා කර්මස්ථානයන්ගේ වශයෙන් අනුස්සති දස වැදෑරුම් ය.

1. **බුද්ධානුස්සති** – බුදුන්වහන්සේගේ ගුණ අරමුණුකොට ඇති සිහි ය.
2. **ධම්මානුස්සති** – දහම් ගුණ අරමුණු කොට ඇති සිහි ය.
3. **සංඝානුස්සති** – සංඝගුණ අරමුණු කොට ඇති සිහි ය.
4. **සීලානුස්සති** – අඛණ්ඩ, අච්ඡිද්‍රාදී සීල ගුණ අරමුණු කොට ඇති සිහි ය.
5. **චාගානුස්සති** – ත්‍යාග ගුණ අරමුණු කොට ඇති සිහි ය.
6. **දෙවතානුස්සති** – දෙවියන් සාක්ෂි කොට තබා තමන්ගේ ශ්‍රද්ධා ගුණ අරමුණු කොට ඇති සිහි ය.
7. **මරණානුස්සති** – ජීවිතින්ද්‍රියොපච්ඡෙද සඞ්ඛ්‍යාත මරණය අරමුණු කොට ඇති සිහි ය.
8. **කායගතාසති** – රූපකායයෙහි හෙවත් කෙශාදි කාය කොට්ඨාස අරමුණු කොට ඇති සිහි ය.
9. **ආනාපානසති** – ආශ්වාස ප්‍රශ්වාස අරමුණු කොට ඇති සිහි ය.
10. **උපසමානුස්සති** – දුක්ඛනිරොධ නම් වූ නිර්වාණ සඞ්ඛ්‍යාත උපසමය අරමුණු කොට ඇති සිහි ය.

## 1. බුද්ධානුස්සතිය

**බුද්ධානුස්සතිය** වඩනු කැමති යෝගාවචරතෙම අචල ශ්‍රද්ධායෙන් යුක්තව යට දක්වන ලද පරිදි සුදුසු සේනාසනයක විවේකව හිඳ **"ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො**

**විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති"** යනාදී වශයෙන් බුදු **ගුණ** සිහි කළ යුතු යි. මෙයින් ප්‍රධාන වශයෙන් බුදුගුණ නවයක් ප්‍රකාශ වේ. ඒ නවය නම්:–

1. **සො භගවා ඉතිපි අරහං** – ඒ භාග්‍යවතුන්වහන්සේ මේ මේ කාරණයෙන් **අර්හත්** නම් වන සේක.

2. **ඉතිපි සම්මාසම්බුද්ධො** – මේ මේ කාරණයෙන් **සම්‍යක්-සම්බුද්ධ** නම් වන සේක.

3. **ඉතිපි විජ්ජාචරණ සම්පන්නො** – මේ මේ කාරණයෙන් **විද්‍යාචරණසම්පන්න** නම් වන සේක.

4. **ඉතිපි සුගතො** – මේ මේ කාරණයෙන් **සුගත** නම් වන සේක.

5. **ඉතිපි ලොකවිදූ** – මේ මේ කාරණයෙන් **ලොකවිදූ** නම් වන සේක.

6. **ඉතිපි අනුත්තරො පුරිසදම්මසාරථි** – මේ මේ කාරණයෙන් **අනුත්තර පුරිසදම්ම සාරථි** නම් වන සේක.

7. **ඉතිපි සත්ථා දෙවමනුස්සානං** – මේ මේ කාරණයෙන් දෙව් - මිනිසුන්ට **ශාස්තෘ** නම් වන සේක.

8. **ඉතිපි බුද්ධො** – මේ මේ කාරණයෙන් **බුද්ධ** නම් වන සේක.

9. **ඉතිපි භගවා** – මේ මේ කාරණයෙන් **භගවත්** නම් වන සේක.

මෙසේ මේ නවවිධ බුද්ධ ගුණයන් නම් වශයෙන් ඉගෙන නැවත විස්තර වශයෙන් ද දත යුතු.

# 1. අරහ නම් වූ ගුණය

**භාග්‍යවතුන් වහන්සේ**

1. **කෙලෙසුන් කෙරෙන් දුරුව, ආරකව සිටින හෙයින් ද.**
2. අරී නම් වූ කෙලෙස් සතුරන් නොහොත් පුණ්‍යාභි-සංස්කාරාදී දූවි නැසූ බැවින් ද.
3. ප්‍රත්‍යය ආදියට සුදුසු බැවින් ද.
4. පව් කිරීම පිළිබඳව රහස් නැති බැවින් ද, **අර්හත්** නම් වන සේක.

භාග්‍යවතුන්වහන්සේ, අර්හත් මග නුවණින් සවාසනා සියලු කෙලෙසුන් නැති කිරීමෙන් කෙලෙසුන් කෙරෙන් ඉතා දුරස්ථය, ආරකය. එහෙයින් **අරහ** නම් වන සේක. තවද ප්‍රඥා නමැති ශස්ත්‍රයෙන් රාගාදී වූ සියලු කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද **අර්හත්** නම් වන සේක. තවද, **සංසාරය** රථසකක් වැනි ය. **අවිද්‍යාව** සහ **භවතෘෂ්ණාව** එහි නාභියය. **පුණ්‍යාභිසංස්කාරාදීහු** එහි දූවිය. **ජරා මරණ** එහි නිම්වලල්ලය. **ආශ්‍රව සමුදය** නමැති අකුරින් විද, **ත්‍රිභව** නමැති රථයෙහි යොදන ලදුව අනාදිමත් කාලයක් මුළුල්ලේ පවත්නේය. තථාගතයන් වහන්සේ ඒ සංසාර නමැති චක්‍රයාගේ, **පුණ්‍යාභිසංස්කාරාදිය** නමැති අර මහබෝමැඩදී, **වීර්‍ය්‍ය** නමැති පාදයෙන් **ශීල** නමැති පෘථිවියෙහි පිහිටා, **ශ්‍රද්ධා** නමැති අතින්, **කර්මක්ෂයකරඥාන** නමැති පොරොව ගෙන කපා දමන ලද හෙයින් ද **අර්හත්** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ ගේ පටිච්චසමුප්පාද ධර්‍ම-යන් සර්වාකාරයෙන් දැනීම නම් වූ ධර්මස්ථිතිඥානයෙන්, ඒ ඒ ධර්ම තත්ත්වාකාරයෙන් දැන, ඒ ධර්මයන් කෙරෙන් කළකිරී, එහි නො ඇලී, ඒ සියල්ලෙන් මිදී, ඒ සංසාර චක්‍රයාගේ අර නැසූ හෙයින් ද **අර්හත්** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ අග්‍රදක්ෂිණාර්හ වන බැවින් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය ආදී සිව් පසයට ද, සෙසු පූජා විශේෂයන්ට ද අර්හ වන හෙයින් **අරහ** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ පව් කිරීමෙහි රහස් නැති හෙයින් ද **අරහ** නම් වන සේක.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ මේ ආදී කාරණයෙන් **අර්හත්** නම් වන සේකැයි යෝගාවචරයා විසින් මෙනෙහි කළ යුතු.

## 2. සම්මා සම්බුද්ධ නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ සියලුම ධර්මයන් අවිපරීත කොට, පරෝපදේශ රහිත ව, තමන්වහන්සේ ම අවබෝධ කළ සේක. **අභිඥෙය ධර්ම** නම් වූ, විශිෂ්ටඥානයෙන් දතයුතු වූ චතුස්සත්‍ය ධර්මයන්, ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් නොහොත් **අභිඥෙය්‍ය** වශයෙන් අවබෝධ කළ සේක. එසේම **පරිඥෙය ධර්ම** නම් වූ හාත්පසින් දත යුතු වූ දුක්ඛසත්‍යය ද, අනිත්‍යාදී ලක්ෂණ වශයෙන් පිරිසිඳ දත යුතු ධර්ම ද, **පරිඥෙය** වශයෙන් අවබෝධ කළ සේක. **ප්‍රහාතව්‍ය ධර්ම** නම් වූ බැහැර කටයුතු තෘෂ්ණා සඞ්ඛ්‍යාත සමුදයසත්‍යය **ප්‍රහාතව්‍ය** වශයෙන් අවබෝධ කළ සේක. **සාක්ෂාත් කරණීය ධර්ම** නම් වූ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක්ක යුතු නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධ සත්‍යය **සාක්ෂාත් කරණීය** වශයෙන් අවබෝධ කළ සේක. **භාවිතව්‍ය ධර්ම** නම් වූ වැඩිය යුතු වූ මාර්ග සත්‍යය **භාවිතව්‍ය** වශයෙන් අවබෝධ කළ සේක. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ **සම්මා සම්බුද්ධ** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ, චක්ෂුරායතනය, ශෝත්‍රායතනය, ඝ්‍රාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන අධ්‍යාත්මික ආයතනයෝ **දුක්ඛ සත්‍යය** යයි ද, ඒ ආයතනයන් උපදවීමට මූලකාරණය වූ තෘෂ්ණාව

**සමුදය සත්‍යය** යයි ද, ඒ ආයතන, තෘෂ්ණා යන දෙක්හිම නො පැවැත්ම **නිරොධ සත්‍යය** යයි ද, නිරොධය ප්‍රතිවෙධ කරණ ප්‍රතිපදාව **මාර්ග සත්‍යය** යයි ද තමන් වහන්සේම අවබෝධ කළ සේක.

මෙසේ ම රූපාදී වූ **බාහිර ආයතන සය** ද, චක්ඛු- විඤ්ඤාණාදී **විඤ්ඤාණ කාය සය** ද, චක්ඛුසම්ඵස්සාදී **ඵස්ස සය** ද, චක්ඛුසම්ඵස්සජ වේදනාදී **වේදනා සය** ද, **රූප සඤ්ඤාදී සඤ්ඤා සය** ද, රූපසඤ්චේතනාදී **චේතනා සය** ද, රූපතෘෂ්ණාදී **තෘෂ්ණා සය** ද, රූපවිතර්කාදී **විතර්ක සය** ද, රූපවිචාරාදී **විචාර සය** ද, රූපක්ඛන්ධාදී **පඤ්ච- ස්කන්ධ** ද, **දස කසිණ** ද, **දස අනුස්සති** ද, උද්ධුමාතකාදී **දස අසුභ** ද, කෙසාදී **දෙතිස්කුණප** ද, චක්ඛුධාතු ආදී **අටළොස්ධාතුහු** ද, කාම භවාදී **නව භව** ද, ප්‍රථමධ්‍යානාදී **ධ්‍යාන සතර** ද, මෙත්තාදී **සතර අප්පමඤ්ඤා** ද, ආකාසා- නඤ්චායතනාදී **අරූප සමාපත්ති සතර** ද, ප්‍රතිලොම වශයෙන් ජරා - මරණාදී වූ ද, අනුලොම වශයෙන් අවිද්‍යාදී වූ ද, **පටිච්චසමුප්පාදාඞ්ගයෝ** ද, **දුක්ඛසත්‍ය** යයි ද, ඒ ඒ ධර්මයන්ගේ ඉපැද්මට මූල හේතුව **සමුදය සත්‍යය** යයි ද, ඒ ඵලයාගේ හා හේතුවගේ ද නොපැවැත්ම **නිරොධ සත්‍යය** යයි ද, නිරොධ ප්‍රතිවෙධය කරණ ප්‍රතිපදාව **මාර්ග සත්‍යය** යයි ද තමන්වහන්සේම අවබෝධ කළ හෙයින් **සම්මා සම්බුද්ධ** නම් වන සේක.

## 3. විජ්ජාචරණ සම්පන්න නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ විද්‍යායෙන් ද, චරණයෙන් ද, යුක්ත වන බැවින් **විජ්ජාචරණසම්පන්න** නම් වන සේක.

මෙහි **විද්‍යා** නම් **ත්‍රිවිද්‍යා** හෝ **අෂ්ටවිද්‍යාවෝ** යි.

**ත්‍රිවිද්‍යා** නම්:—

1. **පුබ්බෙනිවාසානුස්සති ඥානය**
2. **දිබ්බචක්ඛු ඥානය**
3. **ආසවක්ඛයකර ඥානය.**

අෂ්ටවිද්‍යා නම්:—

1. ඉද්ධිවිධ ඥානය,
2. දිබ්බසොත ඥානය,
3. පරචිත්තවිජානන ඥානය,
4. පුබ්බේනිවාසානුස්සති ඥානය,
5. දිබ්බචක්ඛු ඥානය,
6. ආසවක්ඛයකර ඥානය,
7. විදර්ශනා ඥානය,
8. මනොමයඍද්ධි ඥානය.

චරණ නම් පසළොස්විධ වූ චරණ ධර්මයෝ ය. එනම්:—

1. සීල සංවරය,
2. ඉන්ද්‍රිය සංවරය,
3. භොජනයෙහි පමණ දන්නා බවය,
4. ජාගරියානුයොගය හෙවත් නිදිවර්ජිතයෙහි යෙදීමය.
5. ශ්‍රද්ධාව,
6. හිරිය,
7. ඔත්තප්පය,
8. බාහුසච්චය,
9. විරිය,
10. සතිය,
11. ප්‍රඥාය,
12. රූපාවචර ප්‍රථමධ්‍යානය,
13. ද්විතියධ්‍යානය,
14. තෘතීයධ්‍යානය,
15. චතුර්ථධ්‍යානය.

භාග්‍යවතුන්වහන්සේ සර්වඥතාඥාන නමැති විද්‍යා සම්පත්තියෙන් ලෝකයාගේ අර්ථානර්ථ දැන වදාරණ සේක. චරණසම්පත්තිය කරණ කොට ගෙණ මහා කාරුණිකත්වයෙන් අනර්ථය දුරුකොට අර්ථයෙහි ම යොදවන සේක. එහෙයින් විජ්ජාචරණ සම්පන්න නම් වන සේක. බුදුන්වහන්සේ විජ්ජාචරණ සම්පන්න වන හෙයින් ශ්‍රාවකයන් වහන්සේලා ද සුපටිපන්න වෙති.

## 4. සුගත නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ:—

1. **සෝභන ගමන් ඇති බැවින් ද,**
2. **සුන්දර තැනට ගිය බැවින් ද,**
3. **මනා කොට ගිය බැවින් ද,**
4. **මනා තෙපුල් ඇති බැවින්** ද **සුගත** නම් වන සේක.

භාග්‍යවතුන්වහන්සේ ආර්‍ය්‍යමාර්ග සඞ්ඛ්‍යාත වූ ගමනින් නිවනට පිවිසි සේක. ඒ ගමන ඉතා සෝභන බැවින් ද, පිරිසුදු බැවින් ද, නිරවද්‍ය බැවින් ද, **ශෝභන ගමන** යයි කියනු ලැබේ. එහෙයින් **සුගත** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ නිර්වාණ සඞ්ඛ්‍යාත සුන්දර තැනට ගිය බැවින් ද **සුගත** නම් වන සේක.

බුදුන්වහන්සේ නිර්වාණ සඞ්ඛ්‍යාත සුන්දර තැනට මනා කොට ගිය සේක. සෝවාන් ආදී සතර මාර්ගයෙන් ප්‍රහීණ කෙලශයන් කරා පෙරලා නොගිය සේක. දීපංකර පාද මූලයේ සිට බෝමැඩදී බුද්ධත්වය ලබන තෙක් සමත්‍රිංසත් පාරමී සඞ්ඛ්‍යාත සම්‍යක් ප්‍රතිපත්තියෙන් ලෝක සත්ත්වයා හට හිතසුව එළවමින්, ශාස්වත-උච්ඡෙද වශයෙන් හෝ කාමසුඛල්ලිකානුයොග, අත්තකිලමථානුයොග වශයෙන් හෝ අන්ත දෙකට නොපැමිණ ගිය හෙයින් **සුගත** නම් වන සේක.

භාග්‍යවතුන්වහන්සේ යුතුතන්හි යුතුවූ ම තෙපුල් තෙපලන හෙයින් **සුගත** නම් වන සේක.

යම් වචනයක් අසත්‍ය ද, අනර්ථයෙන් යුක්ත ද, අනුනට අප්‍රියය ද, එබඳු වචන නො වදුරණ සේක.

යම් වචනයක් සත්‍යය ද, අර්ථයෙන් යුක්ත ද, අනුනට අප්‍රිය ය ද එබඳු වචන කීමෙහි කාලය දන්නා සේක.

යම් වචනයක් අසත්‍යය ද, අනර්ථයෙන් යුක්ත ද, අනුනට ප්‍රිය වේද, එබඳු වචන නො වදුරණ සේක.

යම් වචනයක් සත්‍යය ද, අර්ථයෙන් යුක්ත ද, අනුනට ප්‍රිය වේද, එබඳු වචන කීමෙහි කාලය දන්නා සේක.

මෙසේ මනා තෙපුල් ඇති හෙයින් භාග්‍යවතුන්වහන්සේ **සුගත** නම් වන සේක.

## 5. ලොකවිදූ නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ සර්වප්‍රකාරයෙන් ම ලෝකය දන්නා හෙයින් **ලොකවිදූ** නම් වන සේක. බුදුරජාණන් වහන්සේ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත වූ මේ ලෝකය ස්වභාව වශයෙන් හෙවත් දුක් වශයෙන් දක්නා සේක. ඒ දුකට හේතුව හෙවත් දුක්ඛසමුදය තෘෂ්ණාව යයි ද දන්නා සේක. දුක් ස්වභාවයාගේ නිරුද්ධවීම හෙවත් දුක්ඛනිරොධය ද දන්නා සේක. ආර්‍ය්‍ය මාර්ගය දුක්ඛ නිරොධයාගේ උපාය වශයෙන් ද දන්නා සේක.

තවද, භාග්‍යවතුන් වහන්සේ **සංස්කාර ලොක, සත්ත්ව ලොක, අවකාශ ලොක** යන ත්‍රිවිධ ලොකය ම දන්නා හෙයින් ද **ලොකවිදූ** නම් වන සේක.

ප්‍රත්‍යයෙන් හටගන්නාවූ ද, ඉන්ද්‍රියබද්ධ, අනින්ද්‍රියබද්ධ වූ සියලු ස්කන්ධයෝ **සංස්කාර ලොක** නම් වේ.

ඉන්ද්‍රියබද්ධ ස්කන්ධයන්ගේ සමූහය ද, සන්තානය ද **සත්ත්ව ලොක** නම් වේ.

අනින්ද්‍රියබද්ධ රූපාදීන්ගේ සමූහය ද, සන්තානය ද **අවකාශ ලෝක** නම් වේ.

ප්‍රත්‍යයයෙන් පවත්නා සියලු සත්ත්වයෝ ය. නාම - රූප ය, ත්‍රිවේදනා ය, සතර ආහාරයෝ ය, පඤ්චඋපාදාන ස්කන්ධයෝ ය, අධ්‍යාත්මික ආයතන සය ය, විඥානස්ථිති සත ය, අෂ්ටලෝක ධර්මය, නවසත්ත්වාවාසය දසආයතනය, දොළොස් ආයතනය, අටළොස් ධාතූහු ය යන මේ සියල්ලම **සංස්කාර ලෝක** නම් වෙති, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුක්තවූ මේ සංස්කාරයන් දත් හෙයින් **ලෝකවිදූ** නම් වන සේක.

තවද, භාග්‍යවතුන්වහන්සේ සියලු සත්ත්වයන්ගේ **ආශය, අනුශය, චරිත, අධිමුක්ති** දන්නා හෙයින් ද **ලෝකවිදූ** නම් වන සේක.

පුරුදු කළ පරිදි සිත යම් තැනක හොවී නම් එය ඔහුහට **ආශය** නමි. ශාස්වත, උච්ඡේද දෘෂ්ටිහු, වට්ටය ආශ්‍රය කළ පෘථග්ජනයන් ගේ ආශය වේ. අනුලෝම ක්ෂාන්තිය හා යථාභූතඥානය ද විවට්ටය ඇසුරු කළ ශුද්ධ පුද්ගලයන්ගේ ආශය වේ.

මාර්ගඥානයෙන් ප්‍රහීණ නොකළ හෙයින් නිදසිටින්නාක් මෙන් පවත්නාවූ ද, සුදුසු කරුණක් එළඹි කල්හි නැගී එන්නාවූ රාගාදී සප්ත කෙලශයෝ **අනුශය** නම් වෙත්.

**චරිත** නම් රාගාදී ෂට්විධ චරිතයන් හා සුචරිත දුශ්චරිත ආදියය.

**අධිමුක්තිය** නම් හීනාධිමුක්තිය, ප්‍රණීතාධිමුක්තිය යන ද්විධ වූ අධ්‍යාශයයි.

තවද, භාග්‍යවතුන් වහන්සේ **අප්පරජක්ඛ, මහාරජක්ඛ තික්ඛින්ද්‍රිය, ස්වාකාර, ද්වාකාර, සුවිඤ්ඤාපය, දුවිඤ්ඤාපය භව්‍ය, අභව්‍ය** සත්ත්වයන් ද දන්නා හෙයින් **ලෝකවිදූ නම්** වන සේක.

උත්සන්න නොවූ රාගාදී කෙලෙස් ඇති පුද්ගලයෝ **අප්පරජක්ඛයෝයි.**

උත්සන්නවූ රාගාදී කෙලෙස් ඇත්තෝ **මහාරජක්ඛ-යෝය.**

තීක්ෂණ වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති පුද්ගලයෝ **තික්-ඛින්ද්‍රියයෝයි.**

මෘදුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති පුද්ගලයෝ **මුදින්ද්‍රියෝය.**

සුන්දර වූ ආකාර ඇති හෙවත් කල්‍යාණ ප්‍රකෘති ඇති සත්හු **ස්වාකාරයෝ ය.**

අයහපත් ආකාර ඇති, නරක ප්‍රතිපත්ති ඇති පුද්-ගලයෝ **ද්වාකාරයෝයි.**

පහසුවෙන් ධර්මය අවබෝධ කරවිය හැකි පුද්ගලයෝ **සුවිඤ්ඤාප** නම් වෙත්.

පහසුවෙන් ධර්මය හැඟවිය නොහැකි පුද්ගලයෝ **දුවිඤ්ඤාපයෝ යි.**

කර්මාවරණ, විපාකාවරණ, ක්ලේශාවරණ නැති පුද්-ගලයෝ භව්‍ය පුද්ගලයෝයි.

මෙහි **කර්මාවරණ** නම් ආනන්තරිය කර්මයෙන් ආවරණය වීමය. **විපාකාවරණ** නම් අහේතුක, ද්විහේතුක ප්‍රතිසන්ධි ඇතිවීමය. **ක්ලේශාවරණ** නම් නියත මිථ්‍යා-දෘෂ්ටියයි.

භාග්‍යවතුන් වහන්සේ **සත්ත්වලෝකය** මෙන් ම **අවකාශ ලෝකය** ද දන්නා හෙයින් **ලොකවිදූ** නම් වන සේක. එක්තිස් තලයකින් සමන්විත වූ සක්වලවල් අනන්තය. ඒ සියල්ලම භාග්‍යවතුන් වහන්සේ දන්නා සේක.

මේ ආදී කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ **ලොකවිදූ** නම් වන සේක.

## 6. අනුත්තරො පුරිසදම්මසාරථි නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ, ශීල ගුණයෙන් ද, සමාධි ගුණයෙන් ද, ප්‍රඥා ගුණයෙන් ද, විමුක්ති ගුණයෙන් ද, විමුක්ති ඥානදර්ශන ගුණයෙන් ද යනාදී සියලු ගුණයෙන් තමන් වහන්සේට වඩා විශිෂ්ටතරවූ කිසිවකු නැති හෙයින් **අනුත්තර** නම් වන සේක. එසේම එම ගුණයෙන් තමන් වහන්සේ හා සමයක්හු නැති හෙයින් **අසම** සේක. අසම වූ අතීත බුදුවරයන් වහන්සේ හා සම වූ බැවින් **අසමසම** නම් වන සේක. තමන්වහන්සේගේ රූපය බඳු ප්‍රතිමා නොකට හැකි බැවින් **අප්‍රතිම** **නම්** වන සේක. බුදුන්වහන්සේ වදාළ ධර්මය එසේ නොවේයයි පෙරළා ප්‍රතිපක්ෂ විය හැකි පුද්ගලයෙකු නැති හෙයින් **අප්‍රතිභාග** නම් වන සේක. නුඹවහන්සේ නොව මම බුදු යයි කියා සිටිය හැකි ප්‍රතිපක්ෂ පුද්ගලයෙකු නැති හෙයින් **අප්‍රතිපුද්ගල** නම් වන සේක. මෙසේ අපාද වූ හෝ, ද්විපාද වූ හෝ චතුෂ්පාද වූ හෝ බහුපපාද වූ හෝ, රූපී වූ හෝ, අරූපී වූ හෝ, සඤ්ඤී වූ හෝ, අසඤ්ඤී වූ හෝ, නේවසඤ්ඤානාසඤ්ඤී වූ හෝ යම් පමණ සත්ත්වකෙනෙක් වෙත් ද භාග්‍යවතුන්වහන්සේ ඒ සියලු සත්ත්වයනට අග්‍ර වන හෙයින්ද **අනුත්තර** නම් වන සේක.

පුරුෂදම්‍යයන් හෙවත් දමනය කටයුතු පුරුෂයන් දමනය කිරීමෙහි, හික්මවීමෙහි සමත් හෙයින් භාග්‍යවතුන් වහන්සේ **පුරිසදම්මසාරථී** නම් වන සේක. මෙසින් නො දැමුණාවූ ද, දමනය කටයුතු වූ ද තිරිසන් වූ හෝ මනුෂ්‍යවූ හෝ පුරුෂ පුද්ගලයන් දමනය කිරීම, ප්‍රකාශ වේ. හිමවත වසන **අපලාල** නම් නාරජුය, නාගදිවයින වසන **චූලෝදර මහෝදර නාරජුය.** හෙළදිව වසන **අග්ගිසිඛ ධූමසිඛ නාරජවරුය, ධනපාල හස්තිරාජයාය** යන තිරිසන් පුද්ගලයන් දමනය කොට සරණ ශීලයෙහි පිහිටුවා වදාළ සේක. එසේම **සච්චක නිගණ්ඨය, අම්බට්ඨ මානවකය,**

**පොක්ඛරසාති, සොණදණ්ඩ, කූටදන්ත බ්‍රාහමණයෝය** යනාදී මනුෂ්‍ය පුරුෂයන් ද, **ආලවක සූචිලෝම, ඛරලෝම** යක්‍ෂයෝය, **සක්දෙව්රජය, බකබ්‍රහ්මයා** යනාදී අමනුෂ්‍ය පුරුෂයෝ ද, උපායයෙන් දමනය කළ සේක. ඒ දමනය කිරීමත් සියුම් ක්‍රමයෙන් ද, පරුෂ ක්‍රමයෙන් ද, සියුම් වූ ද පරුෂ වූ ද ක්‍රමයෙන් ද කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර නම් වූ ගුණයෙන් හා පුරිසදම්මසාරථි ගුණයෙන් ද යුක්ත හෙයින් **අනුත්තරෝ පුරිසදම්මසාරථී** නම් වන සේක.

## 7. සත්ථා දෙවමනුස්සානං නම් වූ ගුණය

භාග්‍යවතුන් වහන්සේ දෙව්මිනිසුන්ට, **දිට්ඨධම්මික** හෙවත් මෙලොව අර්ථය පිණිස ද, **සම්පරායික** හෙවත් පරලොවින් වන අර්ථය පිණිස ද, **පරමත්ථ** හෙවත් නිර්වාණ ප්‍රතිලාභය පිණිස ද අනුශාසනා කරණ හෙයින් **සත්ථා දෙවමනුස්සානං** නම් වන සේක. බුදුන්වහන්සේ භව්‍ය පුද්ගලයන් වූ දෙව්මිනිසුන්ට පමණක් නොව තිරිසන් සත්ත්වයන්ට ද මතුඅත්බැවෙක්හි මාර්‍ග ප්‍රතිලාභය පිණිස දහම් දෙසූ සේක. බුදුරජාණන් වහන්සේ ගග්ගරා නම් පොකුණුතෙර චම්පා නගර වාසීන්ට දහම් දෙසන කල්හි උන්වහන්සේගේ ස්වරයෙහි නිමිත්ත ගෙන සිටි එක්තරා මැඩියෙකුගේ හිස නොදැනුවත්වම ගොපළුවෙකුගේ දඬු කෙළවර ඇනී කලුරිය කෙළෙන්, ඒ ධර්මස්වරයෙහි ගත් ප්‍රසාදයෙන් තව්තිසා දෙව්ලොව දොළොස් යොදුන් රන් විමනෙක මණ්ඩුක දෙවපුත්ත නමින් ඉපිද තම දෙව් සැපතට හේතුව බලා විමනත් සමග අවුත් බුදුන් වැඳ බණ අසා සෝවාන් වූයේය. මේ ආදී කරුණු හේතු කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ **සත්ථාදෙවමනුස්සානං** වන සේක.

## 8. බුද්ධ නාම වූ ගුණය

භාග්‍යවතුන් වහන්සේ—

1. චතුස්සත්‍යය තමන්වහන්සේම අවබෝධ කළ හෙයින් ද,
2. අන්‍යයන්හට අවබෝධ කරවූ හෙයින් ද,
3. සියල්ල දන්නා බැවින් ද,
4. සියල්ල දක්නා බැවින් ද,
5. අනිකකු විසින් අවබෝධ නොකරවන ලද බැවින් ද,
6. ක්ලේශ නිද්‍රායෙන් පිබිදී හෙයින් ද,
7. ආශ්‍රවක්ෂය කළ බැවින් ද,
8. ක්ලේශ ලේප නැති බැවින් ද,
9. ඒකාන්තයෙන් විතරාග, වීතද්වේෂ, වීතමෝහ බැවින්ද
10. ඒකාන්ත නික්ලේශී බැවින් ද,
11. ඒකාන්ත මාර්ගයට ගිය බැවින් ද,
12. හුදකලාව අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ බැවින් ද,
13. අබුද්ධිය නැසූ බැවින් ද,
14. බුද්ධිය ලැබූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

භාග්‍යවතුන් වහන්සේට බුද්ධ යන නාමය මව්පිය සහෝදර සහෝදරියන් විසින් හෝ මිත්‍රාමාත්‍යයන් විසින් හෝ සහලේ නෑයන් විසින් හෝ මහණ බමුණන් විසින් හෝ දෙවිබඹුන් විසින් හෝ තබන ලද්දක් නොව බෝධි-මූලයේදී සර්වඥතාඥානය ලැබීම සමගම විමෝක්ෂාන්තික වශයෙන් ලැබුනු ප්‍රඥප්ති නාමයකි. රහත් ඵලය ලැබීමත් සමගම ලැබූ ඥානය **විමොක්ෂාන්තික** ඥාන නමි.

# 9. භගවා නම් වූ ගුණය

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රෙෂ්ඨ බැවින් ද, උත්තම බැවින් ද, ගෞරවයෙන් යුක්ත බැවින් ද **භගවත්** නම් වන සේක. මේ භගවත් යන නාමය ගුණ නෛමිත්තක වශයෙන් හෙවත් ගුණය නිමිති කොට ලත් නාමයකි.

තව ද, ඒ තිලෝගුරු වූ බුදුරජාණන් වහන්සේ ඓශ්වය්‍ය්‍යාදී භෙද ඇති භග ධර්ම ඇති හෙයින් ද, පන්ත සේනාසනාදිය භජනය කළ හෙයින් ද, අර්ථ, ධර්ම, විමුක්ති රස භාග ඇති හෙයින් ද, ලෞකික ලොකොත්තර ධර්ම විභාග කළ හෙයින් ද, රාගාදිය භෙද කළ හෙයින් ද, භාග්‍ය ඇති හෙයින් ද, කාය භාවනාදී අනේක භාවනා ක්‍රමයෙන් වඩන ලද සිත් ඇති හෙයින් ද, භවයෙහි අන්තයට ගිය හෙයින් ද, **භගවත්** නම් වන සේක. තවද:—

1. ලෞකික ලොකොත්තර සැප නිපදවන දාන, සීලාදී පාරමී භාවයට පැමිණි කුසල් ඇති හෙයින් භාග්‍ය ඇත්තේනුයි **භගවත්** නම් වන සේක.
2. අනේකවිධ වූ කෙලශයන් බින්දේනුයි **භගවත්** නම් වන සේක. රාග, දෙෂ, මොහ, නිත්‍යමනසකාර, සුඛ මනසකාර, ආත්ම මනසකාර යනාදී **කෙලශයෝ ද,**

අභිරික – අනොත්තප්පය; කොධ – උපනාහ; මක්ඛ – පලාස; ඉස්සා – මච්ඡරිය; මායා – සාඨෙය්‍ය; ථම්භ – සාරම්භ; මාන – අතිමාන; මද – පමාද; තණ්හා – අවිජ්ජා යනාදී **කෙලශයෝ ද,**

ලොභ අකුසල මූල, ද්වෙෂ අකුසල මූල, මොහ අකුසල මූල, කාය දුශචරිත, වාග් දුශචරිත, මනො දුශචරිත, තණ්හා සංකෙලශ, දිට්ඨි සංකෙලශ, මාන සංකෙලශ, රාගමල, ද්වෙෂ මල, මොහමල, රාගවිෂම, ද්වෙෂවිෂම, මොහවිෂම, කාම සංඥා, භවසංඥා, විභවසංඥා, කාම විතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසාවිතර්ක, තෘෂ්ණා ප්‍රපඤ්ච, දිට්ඨි ප්‍රපඤ්ච, මාන ප්‍රපඤ්ච යනාදී **කෙලශයෝ ද,**

නිත්‍යසංඥා, සුඛසංඥා, ආත්මසංඥා, සුභසංඥා යන **චතුර්විධ විපරීත ධර්මයෝය,** කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන **චතුරාශ්‍රවයෝ ය,** අභිධ්‍යා, ව්‍යාපාද, සීලබ්බතපරාමාස ඉදංසච්චාභිනිවෙස යන **චතුර්විධ ග්‍රන්ථ,** කාමාදී **චතුරෝඝ ද,** කාමාදී **චතුර්යෝග ද,** ඡන්දාදී **සතර අගතිහු ද,** චීවරාදි සිව්පස පිළිබඳ **සතරවිධ තෘෂ්ණාවෝ ද;** කාම දිට්ඨි, සීලබ්බත, අත්තවාද යන **සතර උපාදානයෝය** යන කෙලශ ධර්මයෝ ද.

බුද්ධ, ධම්ම, සඞ්ඝ, ශික්ෂා පිළිබඳ සැකය හා සබ්රම්සරුන් කෙරෙහි කිපීම් සඞ්ඛ්‍යාත **පඤ්ච චෙතොඛිලයන් ද;** කාමයෙහි අවීතරාග, කායයෙහි අවීතරාග, රූපයෙහි අවීතරාග, බඩපුරා කා නිදි සුව විඳීමය. දෙව්සිරි පතා බඹසර විසීම් සඞ්ඛ්‍යාත වූ **පඤ්ච විනිබන්ධයෝ ද;** කාමච්ඡන්දාදි **පඤ්චනීවරණ ධර්මයෝ ද,** රූපාභිනන්දනාදී **පඤ්ච අභිනන්දන** යන **කෙලශධර්මයෝ ද,**

කොධ, මක්ඛ, ඉස්සා, සාඨෙය්‍ය, පාපිච්ඡතා, සන්දිට්ඨි පරාමාස යන **ෂට්විවාද මූලයෝ ය,** රූපතෘෂ්ණාදී **ෂට් තෘෂ්ණාවෝ ය** යන **කෙලශ ධර්මයෝ ද,**

කාමරාග, භවරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, අවිජ්ජා යන **සප්ත අනුශය ධර්මයෝ ද,**

මිච්ඡාදිට්ඨි ආදී **අට්ඨමිච්ඡත්තයෝ ද,**

තණ්හා, පරියෙසන, ලාභ, විනිච්ඡය, ඡන්දරාග, අජ්ඣොසාන, පරිග්ගහ, මච්ඡරිය, ආරක්ඛාධිකරණ යන **නව තෘෂ්ණා මූලකයෝ ද,**

**දස අකුසලයන්** හා **දස කර්මපථයෝ ද,**

**දෙසැට මිථ්‍යාදෘෂ්ටිහු** ය.

**අෂ්ටශත තෘෂ්ණා විචරිතයෝ** ය යනාදි ඉතා බලවත් නොවූ **දරථ කෙලශයෝ** ද, ඉතා බලවත් වූ **පරිදාහ කෙලශයෝ** ද, සියදහස් ගණන් බිත්දේහුයි **භගවත්** නම් වන **ඡේක**.

නවද, පස්මරුන් අතුරෙන්, සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් අනුත්පාද වශයෙන් **ක්ලේශමාරයා** ද, සමුදය ප්‍රහාණ පරිඥා වශයෙන් **ස්කන්ධ මාරයා** ද, අප්‍රවෘත්ත කරණ වශයෙන් **අභිසංස්කාර මාරයා** ද. බලනැසීම් වශයෙන් **දෙවපුත්‍ර මාරයා** ද, එසේම **මෘත්‍යු මාරයා** ද, බින්දේනුයි **භගවත්** නම් වන සේක.

නවද, භග්න කළ රාග, ද්වේෂ, මෝහ ඇති හෙයින් ද, ආශ්‍රව නැති හෙයින් ද, සියලු පව් බිඳලූ හෙයින් ද **භගවත්** නම් වන සේක.

මෙහි **"භාග්‍යය ඇත්තේ භගවා"** යයි කී කල්හි බුදුන්වහන්සේගේ රූපකාය සම්පත්තිය ද, සාමාන්‍ය මහා-ජනයා විසින් බුහුමන් කරණු ලබන බව ද, ක්ෂත්‍රියාදී ගෘහස්ථයන් විසින් එළඹිය යුතු බව ද, එළඹි ගෘහස්ථයන්ගේ කායපීඩා දුරු කිරීමෙහි පොහොසත් බව ද, තමන් කරා එළඹියනට ලෞකික සැප දීමෙහි සමත් බව ද ප්‍රකාශ වේ.

**"භග්න ක්ලේශ ඇත්තේ භගවා"** යයි කී කල්හි බුදුන්වහන්සේගේ ධර්මකාය සම්පත්තිය ද, පරීක්ෂක ලෝකයා විසින් බුහුමන් කරණු ලබන බව ද, තාපසාදී ප්‍රව්‍රජිතයන් විසින් එළඹිය යුතු බව ද, එළඹි පැවිද්දන්ගේ චිත්තපීඩා දුරු කිරීමෙහි පොහොසත් බව ද, තමන් කරා එළඹියනට ලෝකෝත්තර සැප දීමෙහි සමත් බව ද ප්‍රකාශ වේ.

3 භගධර්මයන්ගෙන් යුක්තවූ හෙයින් ද **භගවත්** නම් වන සේක. භගධර්ම නම් **ඓශ්වර්ය, ධර්ම, යශස්, ශ්‍රී, කාම, ප්‍රයත්න** යන ෂට් ධර්මයෝ ය.

ස්වකීය චිත්තයෙහි පරම ඊශ්වරත්වය ඇති හෙයින් ද, ලෞකික වූ **අණිම, ලඝිම, මහිමාදි** ඓශ්වර්ය හෝ සර්වාකාරයෙන් පරිපූර්ණව ඇති හෙයින් ද භගවත් නම් වන සේක. මෙහි **අණිම** නම් කායයාගේ අණු බව, කුඩා බව හෝ ලඝු බවයි. **ලඝිම** නම් සැහැල්ලු බවයි. **මහිම** නම් ආකාශයෙහි පදසා ගමනාදීන්හි මහත්වයයි.

**පත්ති** නම් ඒ මහිමයෙන් ඉෂ්ට දෙශයට පැමිණීමයි. **පාකම්ම** නම් අධිෂ්ඨානාදී වශයෙන් ඊප්සිත නිෂ්පාදනයයි. **ඊසතා** යනු තමා වසඟ බව හෝ ඊශ්වර බවයි. **යත්ථ-කාමාවසායිතා** යනු අහසින් යන්නහුගේ හෝ අන් කිසිවක් කරන්නහුගේ හෝ යම් කිසිතැනෙක නිමාවට පැමිණීමය. මේ අෂ්ටවිධ වූ ලෞකිකයයි සම්මත ඓශ්වර්‍ය්‍ය භාග්‍යවතුන් වහන්සේගේ සාඩ්විධඥානයෙහි ඇතුළත් වේ. මෙසේ ශාසනික වූ හෝ බාහිර වූ හෝ භග සඞ්ඛ්‍යාත ඓශ්වර්‍ය්‍ය ඇති හෙයින් **භගවත්** නම් වන සේක.

**ධර්ම** නම් ලොකොත්තර ධර්මයි.

**යශස්** නම් විද්‍යමාන ගුණය කරණ කොට ගෙන ලත් තුන්ලෝ පතළා වූ ඉතා පිරිසුදු වූ කීර්තියයි.

**ශ්‍රී** නම් රූපකාය **දකීමෙහි** ව්‍යාවෘත වූ සත්ත්වයන්ගේ මනනුවන් පිණවීමෙහි සමත් වූ **සර්වාකාරයෙන්** ම සම්පූර්ණ වූ සියළු අඞ්ගප්‍රත්‍යඞ්ග ගත ශොභාවය.

**කාම** නම් සිතූපැතූ ආත්මහිත හෝ පරහිත හෝ සියල්ල සිදුවන බැවින් ඉෂ්ටසිඞ් සඞ්ඛ්‍යාත කාමයයි.

**ප්‍රයත්න** නම් සියලු ලෝකයාගේ ගෞරවය ලැබීමට හේතු වූ සම්‍යක් ව්‍යායාම සඞ්ඛ්‍යාත උත්සාහයයි.

මෙකී ෂට් භග ධර්ම ඇති හෙයින් **භගවත්** නම් වන සේක.

4 සියලු ධර්මයන් කුසලත්‍රිකාදී භෙදයෙන් බෙද දක්වූ හෙයින් ද **භගවත්** නම් වන සේක.

භාග්‍යවතුන් වහන්සේ කුසලාදී ධර්මයන් **ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍යය, ඉන්ද්‍රියය, පටිච්චසමුප්පාදාදී** භෙදයෙන් බෙදූ සේක. **දුක්ඛසත්‍යය,** පීඩන, සඞ්ඛත, සන්තාප, විපරිණාම යන අර්ථ වශයෙන් ද, **සමුදයාර්‍ය්‍ය සත්‍යය,** ආයුහන, නිදාන, සංයොග, පළිබොධ යන අර්ථ

වශයෙන් ද, **නිරොධාර්‍ය සත්‍යය,** නිස්සරණ, විවේක, අසඞ්ඛත, අමත යන අර්ථ වශයෙන් ද; **මාර්ග සත්‍යය,** නියාර්ණික, හේතු, දස්සන, ආධිපතෙය්‍ය යන අර්ථ වශයෙන් ද බෙදා විවෘත කොට වදාළ හෙයින් ද **භගවා** නම් වන සේක.

5 **දිව්‍යවිහරණ, බ්‍රහ්මවිහරණ, ආර්‍යවිහරණ** යන ත්‍රිවිධ විහරණයන් භජනය කළ හෙයින් ද **භගවත්** නම් වන සේක, **දිව්‍යවිහරණය** නම් ධ්‍යානයයි. **බ්‍රහ්මවිහරණ** නම් මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතරය. **ආර්‍යවිහරණ** නම් ඵලසමාපත්තියයි.

එසේම **කායවිවෙක, චිත්තවිවෙක, උපධිවිවෙක** යන ත්‍රිවිධ විවේකයන් භජනය කළ හෙයින් ද **භගවත්** නම් වන සේක. **කායවිවේකය** නම් කාමයන් කෙරෙන් වෙන්වූ කාය ඇති බවය. **චිත්තවිවේකය** නම් ප්‍රථම ධ්‍යානාදී වශයෙන් නීවරණාදීන් කෙරෙන් මිදුනු සිත් ඇති බවය. **උපධිවිවේකය** නම් ස්කන්ධාදී උපධීන් කෙරෙන් වෙන්වීමය.

එසේම **සුඤ්ඤත, අප්පණිහිත, අනිමිත්ත** යන ත්‍රිවිධ විමොක්ෂයන් භජනය කළ සේක්නුයි **භගවත්** නම් වන සේක.

අන්‍යවූ ද ලෞකික--ලොකොත්තර උත්තරී මනුෂ්‍යධර්ම භජනය කළ හෙයින් ද **භගවත්** නම් වන සේක.

6 භවත්‍රයෙහි වමාළ තෘෂ්ණා ගමන් ඇති හෙයින් ද **භගවත්** නම් වන සේක.

භාග්‍යවතුන්වහන්සේ මෙසේ මේ මේ කාරණයෙන් **අර්හත්** නම් වන සේක. **සම්මාසම්බුද්ධ** නම් වන සේක. **විජ්ජාචරණසම්පන්න** නම් වන සේක, **සුගත** නම් වන සේක, **ලොකවිදූ** නම් වන සේක, **අනුත්තරපුරිසදම්ම-සාරථි** නම් වන සේක, **සත්ථාදෙවමනුස්සානං** නම් වන

සේක, බුද්ධ නම් වන සේක, භගවා නම් වන සේක යනාදී වශයෙන් බුදුගුණ සිහි කරණ කල්හි, යෝගාවචරයාගේ සිත රාග, ද්වෙෂ, මොහාදියෙන් නො පෙළෙයි. සිත ඍජුවෙයි. කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් විෂ්කම්භනය වෙත්. විතර්ක විචාරයෝ බුදුගුණයටම නැඹුරුව සිටිති. බුදුගුණ විතර්කනය කරත්ම, විචාරණය කරත්ම උපචාර ධ්‍යානය ගෙන දෙන බලවත් ප්‍රීතිය උපදී. සිත ප්‍රීතිමත් බැවින්, ප්‍රීතිය ආසන්න කොට ඇති පස්සද්ධියෙන් කාය චිත්ත දරථ සංසිඳෙයි. දරථ සංසිඳීමෙන් කායික වූ ද, චෛතසිකවූ ද සුවය උපදී. සුඛිතවීමෙන් සිත බුදුගුණ අරමුණු කොට ම සමාධිමත් වෙයි. මෙසේ පිළිවෙළින් පැවත එක් ඇසිල්ලෙහි ධ්‍යානාඞ්ග පහළ වෙත්. බුදුගුණ අරමුණු කොට ඇති මේ ධ්‍යානය උපචාර ප්‍රාප්ත ම වේ. අර්පණාවට නො පැමිණේ. බුදුගුණයන්ගේ ගැඹුරු බැවින් ද, නානාවිධ වූ බුදුගුණ සිහිකිරීමේ අදහස් පහළ වන බැවින් ද අර්පණා ප්‍රාප්ත නොවන බව දත යුතු.

## බුද්ධානුස්සතියෙහි අනුසස්

1. බුදුන්වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තෙක් වෙයි.
2. යටත් පැවතුම් ඇත්තෙක් වෙයි.
3. ශ්‍රද්ධායෙන් ද, සමෘතියෙන් ද, ප්‍රඥායෙන් ද, පුණ්‍ය-යෙන් ද මහත් බවට පැමිණියේ වේ.
4. නිතර ප්‍රීති ප්‍රමොද්‍යයෙන් වසන්නේ වේ.
5. ක්‍රොධා මහත් බිය ඉවසන්නේ වේ.
6. දුක් ඉවසීමට සමත් වේ.
7. "බුදුන් හා එක්ව වසමි" යි යන අදහස් ඇත්තේ වේ.
8. බුද්ධානුසමෘතිය රඳා සිටින මොහුගේ ශරීරය පවා චෛත්‍යයක් මෙන් පිදිය යුතු බවට පත් වේ.

9. ඔහුගේ සිත බුඛ භූමියට නැමුණේ වේ.

10. පාපයක් කරම්හි සිතෙන්නා හා සමගම බුදුන් අභි-මුඛයෙහි සිටිනාසේ පෙනී යන හෙයින් පව් කිරීමෙහි ලජ්ජා භය ඇත්තෙක් වේ.

11. මාර්ගඵල නොලද්දේ නම් මරණින් මතු ඒකාන්ත-යෙන් ම සුගති ගාමී වේ.

## 2. ධම්මානුස්සතිය

දහම් ගුණ මෙනෙහි කොට භාවනා වශයෙන් වැඩීම **ධම්මානුස්සති** භාවනා නම් වේ. ධම්මානුස්සතිය වඩනු කැමති යෝගාවචරයා විසින් **"ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො, එහිපස්සිකො, ඔපනයිකො, පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි"** කියා භාවනා කළ යුතු. මෙයින් ත්‍රිපිටක ධර්මය නම් වූ **පර්‍ය්‍යාප්ති ධර්මයෙහි** ද, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මාර්ග හා සතර ඵලය ද, නිර්වාණය ද යන **නවලෝකෝත්තර ධර්මයෙහිද** ගුණ මෙනෙහි කරණු ලැබේ.

## 1. ස්වාක්ඛාත නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේ විසින් පර්‍ය්‍යාප්ති ධර්මය හා නවලෝකෝත්තර ධර්මය ද මනාකොට දේශනා කරණ ලද හෙයින් ධර්මය **ස්වාක්ඛාත** නම් වන්නේ ය.

**පර්‍ය්‍යාප්ති ධර්මය,** වනාහි:—

1. **ආදි කල්‍යාණ, මධ්‍යෙ කල්‍යාණ, පර්‍ය්‍යවසාන කල්‍යාණ** බැවින් ද,

2. **සාර්ථ, සව්‍යඤ්ජන, සර්වසම්පූර්ණ පිරිසුදු** බ්‍රහ්ම-චර්‍ය්‍යාව ප්‍රකාශ වන බැවින් ද, **ස්වාක්ඛාතය.**

**සූත්‍ර පිටකය** වශයෙන් ගත් කල්හි බුදුන්වහන්සේ වදාළ:-

1. **එක් ගාථාවෙක්හි,** මුල පදයෙන් **ආදිකල්‍යාණය,** දෙවන, තුන් වන පදයෙන් **මජ්ඣකල්‍යාණය,** අවසන් පදෙන් **පරියොසාන කල්‍යාණය.**

2. **එකානුසන්ධික සූත්‍රයෙක්හි,** නිදානයෙන් **ආදි කල්‍යාණය,** නිගමනයෙන් **පරියොසාන කල්‍යාණය,** සෙස්සෙන් **මජ්ඣ කල්‍යාණය.**

3. **නානානුසන්ධික සූත්‍රයෙක්හි,** ප්‍රථම අනුසන්ධියෙන් **ආදිකල්‍යාණය,** අවසාන අනුසන්ධියෙන් **පරියොසාන කල්‍යාණය,** සෙස්සෙන් **මජ්ඣකල්‍යාණය.**

**සූත්‍ර විනය උභය පිටක** වශයෙන් වනාහි:—

සනිදාන, සඋත්පත්තික වශයෙන් **ආදි කල්‍යාණය.** විනෙය ජනයන්ට අනුරූප බැවින් හා දෙසනු ලබන ශීලාදී අර්ථ අවිපරිත බැවින් හා හේතු උදාහරණ සහිත බැවින් හා මධ්‍ය වශයෙන් **මජ්ඣ කල්‍යාණය.** අසන්න-වුන්ට ශ්‍රද්ධාව උපද වන හෙයින් නිගමන වශයෙන් **පරියොසාන කල්‍යාණය.**

**ත්‍රිපිටකය** වශයෙන් වනාහි, සියලු පර්යාප්ති ශාසනය එහි අර්ථය වූ **ශීල** වශයෙන් **ආදි කල්‍යාණය. සමථ, විදර්ශනා, මාර්ග, ඵල** වශයෙන් **මජ්ඣ කල්‍යාණය.** නිර්වාණය වශයෙන් **පරියොසාන කල්‍යාණය.**

තවද, ශීල, සමාධි වශයෙන් **ආදි කල්‍යාණය,** විදර්ශනා මාර්ග වශයෙන් **මජ්ඣ කල්‍යාණය,** ඵල වශයෙන් **පරියොසාන කල්‍යාණය.**

තවද, බුදුන්වහන්සේ මනා නුවණ ඇති බැවින් ධර්ම සුබොධිතායෙන් **ආදි කල්‍යාණය.** සංක්ලේශයන්ගේ ප්‍රහාණත්වය හා ව්‍යවහාරඥනයාගේ පරිපූර්ණත්වය ගෙන දෙන හෙයින් ධර්මසුධර්මතායෙන්, **මජ්ඣ කල්‍යාණය.** සඞ්ඝ සුප්‍රතිපත්තියෙන් **පරියොසාන කල්‍යාණය.**

ධර්මය අසා ඒ පිණිස පිළිපදිනවුන් විසින් අවබෝධ කටයුතු අභිසම්බෝධියෙන් **ආදි කල්‍යාණය**. ප්‍රත්‍යෙක බෝධියෙන් **මජ්ඣෙ කල්‍යාණය**. ශ්‍රාවක බෝධියෙන් **පරියොසාන කල්‍යාණය**.

ධර්මය ශ්‍රවණ මාත්‍රයෙන් **ආදි කල්‍යාණය**. ප්‍රතිපත්තියෙන් **මජ්ඣෙ කල්‍යාණය**. ඵලයෙන් **පරියොසාන කල්‍යාණය**.

**යම් ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවක්** හා **මාර්‍ග බ්‍රහ්මචර්‍ය්‍යාවක්** භාග්‍යවතුන්වහන්සේ ප්‍රකාශ කරත් ද, නානා නයෙන් දක්වත් ද ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව තම තමාට යෙදෙන යෙදෙන පරිදි අර්ථ සම්පත්තියෙන් යුක්ත බැවින් **සාර්ථ** නම් වන්නේ ය. ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බැවින් **සව්‍යඤ්ජන** නම් වන්නේය. ත්‍රිවිධ ශික්ෂාව හා සියලු පාළි ධර්මය ද **ශාසන බ්‍රහ්මචර්‍ය්‍යා** නම්. සියලු ශික්ෂාවන් ගේ සාරය වූ ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය මාර්‍ගය **මාර්‍ග බ්‍රහ්මචර්‍ය්‍යා** නම් වේ.

මේ බ්‍රහ්මචර්‍ය්‍යාව වනාහි **සංකාසන, පකාසන, විවරණ, විභජන, උත්තානීකරණ, පඤ්ඤත්ති** යන ෂට්විධ අර්ථයෙන් යුක්ත බැවින් **සාර්ථය**.

**සංකාසනය** නම් අර්ථය හැඟවීමය.

**පකාසනය** නම් පළමුවෙන් අර්ථය හැඟවීමය.

**විවරණය** නම් සංක්ෂෙපයෙන් කියන ලද්ද විස්තර කිරීමය.

**විභජනය** නම් පළමු කියන ලද්ද නැවත නැවත බෙදා දැක්වීමය.

**උත්තානීකරණය** නම් විවරණය තවද ප්‍රකට කොට කීමය.

**පඤ්ඤත්තිය** නම් විභජන දෘෂ්ටාන්ත දක්වීමෙන් ශ්‍රවණය කළවුන්ගේ සිත සතුටු වන සේ ප්‍රකාරයෙන් හැඟවීමය.

මේ ෂඩ්විධ අර්ථයන් අතුරෙන් සංකාසන, පකාසන දෙකින් **උද්දෙසය** ද, විවරණ, විභජන දෙකින් **නිද්දෙසය** ද, උත්තානීකරණ, පඤ්ඤත්ති දෙකින් **පටිනිද්දෙසය** ද දක්වන ලදී.

එසේම, බ්‍රහ්මචය්‍ර්‍යාව, **අක්ඛර, පද, බ්‍යඤ්ජන, ආකාර, නිරුත්ති,** **නිද්දෙස** යන ෂඩ්විධ ශබ්ද සම්පත්තියෙන් යුක්ත බැවින් **සබ්‍යඤ්ජනය.**

**අක්ඛර** නම් අකුරුයි.

**පද** නම් එක් අකුරකින් හෝ කීපයකින් හෝ අර්ථ ප්‍රකාශ වන වචනයයි.

**බ්‍යඤ්ජන** නම් පද කීපයක් එක්වීමෙන් සෑදෙන වාක්‍යයයි.

**ආකාර** නම් වාක්‍ය විභාග කිරීමයි.

**නිරුත්ති** නම් නිර්වචනයි.

**නිද්දෙසය** නම් නිර්වචනය තවද විස්තර කිරීමයි.

තවද, **අර්ථ ගම්භීරත්වයෙන්** හා **ප්‍රතිවෙධ ගම්භීරත්වයෙන්** ද යුක්ත බැවින් **සාර්ථය. ධර්ම ගම්භීරත්වයෙන්** හා **දෙශනා ගම්භීරත්වයෙන්** යුක්ත බැවින් **සබ්‍යඤ්ජනය.**

තවද, **අත්ථපටිසම්භිදා, පටිභාන පටිසම්භිදා** වශයෙන් **සාර්ථය. ධම්මපටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා** වශයෙන් **සබ්‍යඤ්ජනය.**

උගතුන් විසින් දතයුතු බැවින් පරීක්ෂක ජනයාගේ චිත්තප්‍රසාදය එළවන හෙයින් ද, ගැඹුරු අදහස් ඇති බැවින් ද

**සාර්ථය,** ඇදහිය යුතු බැවින් ලෞකික ජනයාගේ චිත්ත ප්‍රසාදය එළවන හෙයින් ද නොගැඹුරු පද ඇති හෙයින් ද **සබ්‍යඤ්ජනය.**

අඩුවක් නැති හෙයින් **සර්වසම්පූර්ණය.** අධිකයයි බැහැර කළ යුත්තක් නැතිව සියල්ල නිර්දෝෂ බැවින් **පිරිසුදුය.**

ශීලවිසුද්ධි ආදී සම්‍යක් ප්‍රතිපත්තියෙන් අධිගමය ප්‍රකාශ වන බැවින් **සාර්ථය,** පර්යාප්තියෙන් ආගමය ප්‍රකාශ වන බැවින් **සබ්‍යඤ්ජනය.** ශීලාදී පඤ්ච ධර්මස්කන්ධයෙන් යුක්ත බැවින් **සර්වසම්පූර්ණය.** දිට්ඨි, මානාදී උපක්ලේශ නැති හෙයින් ද **පිරිසුදුය.**

මෙසේ සාර්ථවූ ද, සබ්‍යඤ්ජනවූ ද, සර්වසම්පූර්ණවූ ද, පිරිසුදුවූ ද, බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරණ හෙයින් පර්යාප්ති ධර්මය **ස්වාක්ඛ්‍යාත** නම් වන්නේ ය.

**ලෝකෝත්තර ධර්මය** වනාහි නිර්වාණයට අනුරූප ප්‍රති-පත්තිය ද, ප්‍රතිපත්තියට අනුරූපවූ නිර්වාණය ද වදාළ බැවින් **ස්වාක්ඛ්‍යාත** නම් වන්නේය.

ආර්‍ය්‍ය මාර්ගය අන්තද්වයට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදා වූයේම මධ්‍යමප්‍රතිපදායයි කියන ලද හෙයින් **ස්වාක්ඛ්‍යාතය.** ආර්‍ය්‍ය ඵලය සංසුන් කෙලෙස් ඇත්තේම සංසුන් කෙලෙස් ඇතැයි කියන ලද හෙයින් **ස්වාක්ඛ්‍යාතය.** නිර්වාණය ශාස්වත, අමෘත, ත්‍රාණ, ලේණාදී ස්වභාව ඇති හෙයින්ම ශාස්වත, අමෘත, ත්‍රාණ, ලේණ යයි වදාළ බැවින් ද **ස්වාක්ඛ්‍යාතය.**

## 2. සන්දිට්ඨික නම් වූ ගුණය

ස්වකීය සන්තානයෙහි රාගාදීන් නැති කරණ බැවින් තමා විසින් ම දැක්ක යුතු ය යන අර්ථයෙන් **ආර්‍ය්‍ය මාර්ගය, සන්දිට්ඨික** නම් වන්නේ ය. **නවවිධ ලෝකෝත්තර ධර්මය,** යම් කෙනෙකු විසින් අධිගත නම්, ප්‍රත්‍යක්ෂඥානයෙන් තමා විසින් ම දැක්ක යුතු බැවින් ලෝකෝත්තර ධර්ම **සන්දිට්ඨික** නම් වන්නේය. එහෙයින් **ආර්‍ය්‍යමාර්ගය** ද **නවලෝකෝත්තර ධර්මය** ද **සන්දිට්ඨික** නම් වේ.

රාගයෙන් රත්වූ, රාගයෙන් අභිභූතවූ, රාගයෙන් වෙළඳනා ලද්දවූ, පුද්ගල තෙම, තමහට වධ පිණිස ද, අන්‍යයන්ට වධ පිණිස ද, තමන්ට හා අන්‍යයන්ටත් වධ පිණිස ද සිතන්නේ ය. චෛතසික වූත් දුක් දෙම්නස් විඳින්නේය. රාගය ප්‍රහීණවූ කල්හි තමන්ට හෝ අන්‍යයන්ට හෝ, ඒ දෙපක්‍ෂයටම හෝ වධ පිණිස නො සිතන්නේය. චෛතසිකවූත් දුක් - දෙම්නස් නොවිඳින්නේය. මෙසේ හෙයින් මේ ආර්‍ය්‍ය මාර්ගය සන්දිට්ඨික යයි බුදුන්වහන්සේ විසින් වදාළ සේක. දෘෂ්ට යනු දැකීමය. සංදර්ශනයට සුදුසු හෙයින් **සන්දිට්ඨික** නමි.

ලොකොත්තර ධර්මය, භාවනා ප්‍රතිවෙධ වශයෙන් ද, ප්‍රත්‍යක්‍ෂ ප්‍රතිවෙධ වශයෙන් ද දක්නා ලබන හෙයින් **සන්දිට්ඨික** නම් වන්නේය.

## 3. අකාලික නම් වූ ගුණය

ලොකොත්තර මාර්ග කුසලයාගේ විපාකය වන ඵල-චිත්තය, මාර්ගචිත්තයට අනතුරුව ම, එක් චිත්තක්‍ෂණයකුදු කාලය නො ඉක්මවා ලැබෙන හෙයින් **අකාලික** යයි කියනු ලැබේ. කල් නො යවා විපාක දෙන හෙයින් **අකාලික** නම් වේ. ලෞකික කුසලය අපරාපරිය වශයෙන් හෝ උපපද්‍ය වශයෙන් හෝ විපාකදෙයි. දිට්ඨධම්මවෙද්‍ය කර්මයාගේ විපාකය වූවත් එම ආත්මයෙහිම ස්වල්පකාලයක් වූවත් ගතවී විපාක දෙන්නේය. එහෙයින් ලෞකික කුසල විපාක දීමට කාලයක් ගතවන බැවින් **කාලිකය**. ලොකොත්තර කුසලය කාලයක් ගත නොවී විපාක දෙන හෙයින් **අකාලික** නම් වේ.

## 4. එහිපස්සික නම් වූ ගුණය

නවලොකොත්තර ධර්මය, ඒකාන්තයෙන් ම විද්‍යමාන බැවින් ද, පිරිසුදු බැවින් ද, එව, බලව යයි කීමට සුදුසු වන හෙයින් **එහිපස්සික** නම් වන්නේය. වලාකුල් රහිත වූ

අහසෙහි බබලන පූර්ණ චන්ද්‍රයා මෙන් ඒකාන්තයෙන් ම විද්‍යමානය. පඬුවන් පලසෙක ලූ ජෝතිරංග මාණික්‍යය මෙන් ඒකාන්තයෙන් ම පිරිසුදු ය. එබැවින් එව බලව යයි කීමට සුදුසු වෙයි.

## 5. ඕපනයික නම් වූ ගුණය

ලෝකෝත්තර මාර්ග ඵල ධර්මය සිත්හි උපනයනය කළයුතු හෙයින් ද, එළඹිය යුතු හෙයින් ද, උපදවා ගතයුතු හෙයින් ද **ඕපනයික** නම් වන්නේය. නිර්වාණයට පමුණු වන හෙයින් මාර්ගය ද, ප්‍රත්‍යක්ෂ කටයුතු බවට පමුණුවන හෙයින් ඵලය හා නිර්වාණය ද **උපනෙය්‍ය** නම් වේ. එහෙයින් නව ලෝකෝත්තර ධර්මය **ඕපනයික** නම් වන්නේය.

## 6. පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි නම් වූ ගුණය

නුවණ ඇත්තන් විසින් තම තමන් සිත්හිම ලා දතයුතු, දක්ක යුතු, විඳිනය කළ යුතු හෙයින් නවලෝකෝත්තර ධර්මය **"පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි"** යයි කියන ලදී. මා විසින් මාර්ගය වඩන ලද්දේය, ඵලය ලබන ලද්දේය, නිවණ සාක්ෂාත් කරන ලද්දේය යනාදී වශයෙන් තම තමන් විසින් ම දතයුතු වේ. අන්‍යයන් මගින් දත යුත්තක් නොවේ.

මේ ධර්මය සන්දිට්ඨික හෙයින් ස්වාක්ඛාතය. අකාලික හෙයින් සන්දිට්ඨිකය. එහිපස්සික හෙයින් අකාලිකය. එහිපස්සික හෙයින් ම ඕපනයිකය.

දහම් ගුණ මෙසේ සිහිකරන්නා වූ යෝගාවචරයාගේ සිත රාගයෙන්, ද්වේෂයෙන් මැඩලන්නේ නොවේ. ධර්මය අරමුණු කොටම ඍජු බවට පැමිණේ. කෙලෙසයන් සිඳීමෙන් නීවරණ විෂ්කම්භනය වේ. එහෙයින් ධ්‍යානාඞ්ග පහළ වීමෙන් උපචාරධ්‍යානය උපදී. දහම් ගුණ ගැඹුරු හෙයින් අර්පණා ප්‍රාප්ත නොවේ.

## ධම්මානුස්සතියෙහි අනුසස්

ස්වාක්ඛාතාදී වූ ගුණයෙන් යුත් මේ ධර්මය දේශනා කරන්නාවූ ද, මෙබඳු අඞ්ගයන්ගෙන් යුක්තවූ ද, ශාස්තෘවරයෙකු අතීතයෙහිදු නොදකිමි. දැනුදු නොදකිමි. ඔවුන් හා සමාන ශාස්තෘවරයෙක් නැතැයි දහම් ගුණ දැකීමෙන් ම, දහම් දෙසූ ශාස්තෘන්වහන්සේ කෙරෙහි ගෞරව සහිත වේ. යටහත් පැවතුම් ඇත්තේ වේ. ධර්මය කෙරෙහි ගරුබුහුමන් කරන්නේ, ශ්‍රද්ධාදී ගුණයෙන් විපුලත්වයට පැමිණේ. ප්‍රීතිය හා ප්‍රමෝද්‍ය බහුල කොට ඇත්තේ වේ. සියලු භය හා දුක් ඉවසීමෙහි සමත් වේ. ධර්මය හා එක්ව වසමියි යන සිත් පහළ වේ. දහම් ගුණ මෙනෙහි කරන්නා වූ ඔහුගේ ශරීරය පවා චෛත්‍ය ගෘහයක් මෙන් පූජනීය බවට පත්වේ. ධර්මාවබෝධය පිණිස සිත් නැමේ. ශික්‍ෂා කඩකිරීමට කාරණයක් පැමිණි කල්හි ධර්මසුධර්මතාවය මෙනෙහි කිරීමෙන් වහා හිරිඔතප් පහළ වේ. ලොව්තුරු දහම් ප්‍රත්‍යක්‍ෂ නොකෙළේ නම් මරණින් මතු ඒකාන්තයෙන් ම සුගතිගාමී වේ.

## 3. සංඝානුස්සති

සඟ ගුණ මෙනෙහි කොට භාවනා කිරීම **සඞ්ඝානුස්සති භාවනා** නම් වේ. **සඞ්ඝානුස්සතිය** වඩනු කැමති යෝගාවචර තෙමේ යටකී සේ රහසිගතව, විවේකව හිඳ, **"සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාවකසඞ්ඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස"** යනාදි වශයෙන් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ මනා පිළිවෙතට පිළිපන්නේය, සෘජු පිළිවෙතට පිළිපන්නේය,

උපාය පිළිවෙතට පිළිපන්නේය, සුදුසු පිළිවෙතට පිළිපන්නේය. යම් මේ සතර පුරුෂයුග කෙනෙක් ඇද්ද, පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් ඇද්ද, භාග්‍යවතුන්වහන්සේගේ මේ ශ්‍රාවක සමූහයා, ගෙණ අවුත් දියයුතු සිව් පසය පිළිගන්නට සුදුසු ය, අමුතු දන් පිළිගන්නට සුදුසු ය, දක්ෂිණාවට සුදුසු ය, වැන්ද යුතුය, සියලු ලෝකයාගේ අසදෘශ පින්කෙත යයි මෙසේ ආර්‍ය්‍යසඞ්ඝ ගුණ සිහිකට යුතු.

## 1. සුපටිපන්න නම් වූ ගුණය

භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ **සම්‍යක් ප්‍රතිපදාවට** ද, **අනිවර්ති ප්‍රතිපදාවට** ද, **අනුලෝම ප්‍රතිපදාවට** ද, **අපච්චනීක ප්‍රතිපදාවට** ද, **ධම්මානුධම්ම ප්‍රතිපදාවට** ද මනාකොට පිළිපන් සේක.

**සම්‍යක් ප්‍රතිපදාව** නම් යහපත් වූ ආර්‍ය්‍ය මාර්‍ග ප්‍රතිපදාවයි.

**අනිවත්ති ප්‍රතිපදා** - ප්‍රතිපක්ෂ වූ ධර්මයන් නැවත හැරී නොඑනසේ දුරු කරන හෙයින් සම්‍යක් ප්‍රතිපදාවම **අනිවර්ති ප්‍රතිපදා** නම් වේ.

**අනුලෝම ප්‍රතිපදා** - අවබෝධ කරගත යුතු වූ නිර්වාණයට ඒකාන්තයෙන් ම අනුලෝම වන බැවින් **අනුලෝම ප්‍රතිපදා** නම් වේ.

**අපච්චනීක ප්‍රතිපදා** - අනුලෝම වන බැවින් ද, විරුඬ නොවන බැවින් ද අවිරුඬ හෙවත් **අපච්චනීක ප්‍රතිපදා** නම් වේ.

**ධම්මානුධම්ම ප්‍රතිපදා** - නිර්වාණ ධර්මයට අනුරූප සවභාව ප්‍රතිපත්ති වන බැවින් **ධම්මානුධම්ම පටිපදා** නම් වේ.

**ශ්‍රාවකයෝ** නම් භාග්‍යවතුන්වහන්සේගේ අවවාද, අනුශාසනා සකසා අසන්නෝයි. කළ වරද දැක කරණ ධර්මදේශනා **අවවාදය** යි. පසුව පසුව කරණ ධර්මදේශනා හෝ කළ වරද නොදැක ආදියෙහිම කරණ ධර්මදේශනා හෝ **අනුශාසනා**යි. ඒ අවවාද අනුශාසනා පරිදි පිළි-පැදීමෙන් කාර්‍ය්‍ය සිදුවන බැවින් ආර්‍ය්‍ය භාවයට පමුණුවන ඇසීම **සකසා ඇසීම** නම් වේ. මෙයින් ආර්‍ය්‍යයෝම නිෂ්පර්‍ය්‍යායයෙන් **ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ** වෙති. ශ්‍රාවකයන්ගේ සමූහය **ශ්‍රාවක සඞ්ඝ** නම්. ආර්‍ය්‍ය ශීලසමානත්වයෙන් හා ආර්‍ය්‍ය දෘෂ්ටිසමානත්වයෙන් ද සමූහ භාවයට පැමිණි පිරිස **ආර්‍ය්‍යසඞ්ඝ** නම් වෙත්. මාර්ගස්ථ පුද්ගලයෝ සම්‍යක් ප්‍රතිපත්තියෙන් යුක්ත බැවින් **සුප්‍රතිපන්නයහ.** ඵලස්ථයෝද සම්‍යක් ප්‍රතිපත්තියෙන් පැමිණිය යුත්තට පැමිණි හෙයින් යථෝක්ත මාර්ග සම්‍යක් ප්‍රතිපත්තිය පිණිස **සුප්‍රතිපන්නයහ.** ස්වාක්ඛාත වූ ධර්මවිනය දෙක්හි අනුශාසනාවට අනුරූප කොට පිළිපන් හෙයින් ද, අනවද්‍ය ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ද **සුප්‍රතිපන්න** නම් වේ. මෙසේ හෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ආර්‍ය්‍ය වූ ශ්‍රාවක සඞ්ඝ තෙමේ **සුප්‍රතිපන්න** නම් වන සේක.

## 2. උජුපටිපන්න නම් වූ ගුණය

සම්‍යක් ප්‍රතිපදාව, මායා සාඨෙය්‍යාදී පාපධර්මයන් සමුච්ඡේද කළ හෙයින් **සෘජුය.** සෘජු වූ හෙයින් ම ගොමුත්‍රවඞ්කය මෙන් වඞ්ක නැති බැවින් **අවඞ්කය.** චන්ද්‍රරේඛාවඞ්කය මෙන් වඞ්ක නැති බැවින් **අකුටිලය.** නඞ්ගුලකොටිවඞ්කය මෙන් වඞ්ක නැති බැවින් **අජිම්හය.** එබඳු සෘජුවූ ද, අවඞ්කවූ ද, අකුටිලවූ ද, අජිම්හවූ ද, ප්‍රතිපදාවට පිළිපන් හෙයින් **උජුපටිපන්න** නම් වන සේක. තවද, අන්තද්වයට නො ගොස් මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ද, කය, වචන, මන යන තුන් දෙනාගේ සෘජු නොවන බව, කුටිල නොවන බවය, ජිම්හ බවය යන දෝෂයන්ගේ ප්‍රහාණය පිණිස පිළිපන් හෙයින් ද **උජු-පටිපන්න** නම් වන සේක.

## 3. ඤායපටිපන්නා නම් වූ ගුණය

සම්‍යක් ප්‍රතිපදා සඞ්ඛ්‍යාත ආර්‍යවූ, නිර්දෝෂවූ උපායට පිළිපන්නේ **ඤායපටිපන්න** නම් වේ. නිර්වාණ ධර්මය යමක් කරණකොට ගෙන ප්‍රතිවේධ කරණු ලැබේ ද, එයට **ඤාය** යයි කියනු ලැබේ. එනම් සම්‍යක් ප්‍රතිපදා සඞ්ඛ්‍යාත ආර්‍ය මාර්ගයයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේගේ ආර්‍ය ශ්‍රාවක සඞ්ඝ තෙමේ නිර්වාණ සඞ්ඛ්‍යාත ඤාය පිණිස පිළිපන් හෙයින් **ඤායපටිපන්න** නම් වන සේක.

## 4. සාමීචිපටිපන්නා නම් වූ ගුණය

සම්‍යක් ප්‍රතිපදාව, සසරදුකින් බැහැරලීමට සමර්ථ වන හෙයින් **සාමීචි** නම් වේ. සාමීචී සඞ්ඛ්‍යාත සසර දුකින් බැහැරලීමට සමත් සම්‍යක් ප්‍රතිපදාවට පිළිපන් හෙයින් **සාමීචිපටිපන්න** නම් වේ. තවද, යම් පරිදි පිළිපන් කෙනෙක් අනුන් කරනු ලබන උපස්ථානාදී සාමීචියට සුදුසු ලෙස පිළිපන් බැවින් ද **සාමීචිපටිපන්න** නම් වේ. මේ ආදී ගුණයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ආර්‍යශ්‍රාවක සඞ්ඝ තෙමේ **සාමීචිපටිපන්න** නම් වන සේක.

යටකී සුප්‍රතිපන්නාදී ගුණයෙන් යුත් ශ්‍රාවක සඞ්ඝ තෙමේ **පුරිසයුග** වශයෙන් සතරෙක. **පුරිස පුද්ගල** වශයෙන් අටදෙනෙක.

**පුරිස යුග** සතර නම්— සෝවාන් මාර්ගස්ථ – ඵලස්ථයෝ එක් පුරිස යුගයෙක. සකෘදාගාමී මාර්ගස්ථ – ඵලස්ථයෝ එක් පුරිස යුගයෙක. අනාගාමී මාර්ගස්ථ – ඵලස්ථයෝ එක් පුරිස යුගයෙක. අර්හත් මාර්ගස්ථ – ඵලස්ථයෝ එක් පුරිස යුගයෙකි.

**පුරිසපුද්ගලයෝ** අටදෙන නම්, සෝවාන් මාර්ගස්ථ, සෝවාන් ඵලස්ථ, සකෘදාගාමි මාර්ගස්ථ, සකෘදාගාමි ඵලස්ථ, අනාගාමි මාර්ගස්ථ, අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ යන පුද්ගලයෝ අට දෙනාය.

## 5. ආහුනෙය්‍ය නම් වූ ගුණය

මෙ කී පුරිස යුග වශයෙන් සතර දෙනෙක් වූ ද, පුරුෂ පුද්ගල වශයෙන් අටදෙනෙක් වූ ද ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ **ආහුනෙය්‍ය** නම් වන සේක.

දුරින් හෝ ගෙනවිත් සිල්වතුන් කෙරෙහි දිය යුතු සිව්පසය **ආහුනය** නම්වේ. ඒ ආහුනයයට සුදුසුවූයේ **ආහුනෙය්‍ය** නම්, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ පිරිසුදුවූ සිල් ඇති හෙයින් ද, උතුම්වූ ගුණයෙන් යුක්ත හෙයින් ද සිව්පසය පිළිගැන්වූවනට මහත් ඵල සිද්ධ කොට දෙන්නේය. එබැවින් ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ **ආහුනෙය්‍ය** නම් වන සේක.

## 6. පාහුනෙය්‍ය නම් වූ ගුණය

සතරදිගින් හා සතර අනුදිගින් ආ ප්‍රියමනාප වූ නෑයන් මිත්‍රයන් පිණිස සත්කාරයෙන් සපයන ලද ආගන්තුක දානයට **පාහුන** යයි කියනු ලැබේ. එසේ පිළියෙල කරන ලද දානය ඔවුනට නොදී ශ්‍රාවක සඞ්ඝයාට දිය යුතුම ය. සඞ්ඝයා ඒ පාහුනය පිළිගන්නට සුදුසු ය. සඞ්ඝයා වහන්සේ වනාහි එක් බුද්ධාන්තරයක් ඉක්මුණු කල්හි හෝ අසඞ්ඛ්‍යයක් කප් ඉක්මුණු කල්හි හෝ ලැබෙන්නේ ය. එබැවින් ප්‍රියමනාපවූ ද, සීලාදී ගුණයෙන් යුක්තවූ ද මේ සඞ්ඝයා අමුතු සත්කාරයට හෙවත් පාහුනයට සුදුසු වන්නේමය. ප්‍රිය නෑමිතුරු ආදීවූ සෙසු පාහුනකයෝ මුළුකාලයෙහිම ලැබිය හැකි වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ආර්‍යශ්‍රාවක සඞ්ඝයා **පාහුනෙය්‍ය** නම් වන සේක.

## 7. දක්ඛිණෙය්‍ය නම් වූ ගුණය

පරලොව අදහා දියයුතු දානයට **දක්ඛිණා** යයි කියනු ලැබේ. දක්ෂිණාව මහත්ඵල බව කිරීමෙන් විසුද්ධ කෙරෙනුයි **දක්ඛිණෙය්‍ය** නම් වේ. පිරිසුදු සීලාදී ගුණයෙන් යුත්

ආයසී සඞ්ඝයා කෙරෙහි පුදන ලද සිව්පසය මහත්ඵල මහානිසංස ගෙනදෙන හෙයින් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙම **දක්ඛිණෙය්‍ය** නම් වන සේක.

## 8. අඤ්ජලිකරණීය නම් වූ ගුණය

දෙ අත් හිස පිහිටුවා සියලු ලොකයා විසින් කරණු ලබන අඤ්ජලිකර්මයට සුදුසු වන හෙයින් **අඤ්ජලිකරණීය** නම් වේ. සීලාදී ගුණයෙන් පිරිසුදු වූ, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙම මේ අඤ්ජලී කර්මයට සුදුසු වන හෙයින් **අඤ්ජලිකරණීය** නම් වන සේක.

## 9. අනුත්තර පින්කෙත නම් වූ ගුණය

ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ, සියලු ලොකයාගේ නා නා ප්‍රකාර හිත සුව ගෙන දෙන්නාවූ ද, අසදෘෂ වූ ද, පුණ්‍යය හටගන්නා වූ ද තැනක් වන හෙයින්, හෙවත් සමානයෙක් නැති පුණ්‍යක්ෂෙත්‍රයක් වන බැවින්, **අනුත්තර වූ පින්කෙත** නම් වන සේක.

මෙසේ සුපටිපන්නාදී සංඝ ගුණ මෙනෙහි කරන්නාවූ යෝගාවචරයාගේ සිත, රාග, ද්වෙෂ, මොහාදියෙන් අභිභූත නොව, ඍජුභාවයට පැමිණ, නීවරණයන් විෂ්කම්භනය-වීමෙන් ධ්‍යානාඞ්ග පහළවීමෙන් උපචාර ප්‍රාප්ත වේ. සඟ ගුණ ඉතා ගැඹුරු හෙයින් ද නා නා විධ සඟගුණ සිහිවන හෙයින් ද, ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නො වේ.

## සඞ්ඝානුස්සතියෙහි අනුසස්

සඞ්ඝානුස්සති භාවනාවෙහි යෙදුන යෝගාවචර තෙමේ සඞ්ඝයා කෙරෙහි ගෞරව ඇත්තෙක් වේ. ශ්‍රද්ධාදී ගුණ-යෙන් විපුලත්වයට පැමිණේ. ප්‍රීති – ප්‍රමෝද්‍ය බහුල වීමෙන් සියලු භය, දුක් ඉවසිමෙහි සමතෙක් වේ. සඞ්ඝයා සමග වාසය කරන්නෙක් බව වැටහේ. ඔහුගේ ශරීරය පවා සඞ්ඝයාවහන්සේ රැස්වූ පොහෝ ගෙයක් මෙන් පූජාර්හ

වන්නේය. සඞ්ඝ ගුණය ලබනු සඳහා ඔහුගේ සිත නැමෙන්නේ ය. ශික්ෂා කඩ කිරීමට අවස්ථා පැමිණි කල්හි සඞ්ඝයා අභිමුඛයෙහි පෙනී ගියා සේ වැටහීමෙන් හිරිඔතප් එළඹ සිටීමෙන් එය වළකා ගත හැකි වේ. මතු ධ්‍යාන මාර්ගඵල නො ලබන්නේ නම් එකාන්තයෙන් සුගතිගාමි වන්නේ ය.

## 4. සීලානුස්සතිය

යම් ශීලයක් රක්නා පුද්ගලයෙකු විසින් තමාගේ ශීලය ආවර්ජනා කොට, මෙනෙහි කොට, භාවනා වශයෙන් වැඩීම **සීලානුස්සතිය** නම් වේ ඔහු විසින් රහසිගත ව, විවේකව සුදුසු අස්නක හිඳ **"අහො වත මෙ සීලානි, අඛණ්ඩානි, අච්ඡිද්දානි, අසබලානි, අකම්මාසානි, භුජිස්සානි, විඤ්ඤුප්පසත්ථානි, අපරාමට්ඨානි, සමාධිසංවත්තනිකානි"** යනාදී වශයෙන් මෙනෙහි කළ යුතු. එහි අර්ථය නම් සාධු, සාධු, මාගේ සීලය අඛණ්ඩය, අච්ඡිද්‍රය, අසබලය, අකල්මාෂය, භුජිස්සය, විඤ්ඤුප්පසත්ථය, අපරාමට්ඨය, සමාධිසංවත්තනිකය. යෝගාවචර තෙම ගිහියෙක් වී නම්, තමා විසින් රක්නා පඤ්චශීලය හෝ දශශීලය හෝ උපෝසථ සීලය හෝ මෙනෙහි කළ යුතු. පැවිද්දෙක් නම් තමාගේ පැවිදි සිල් සිහි කළ යුතු. මෙසේ තමාගේ සිල් මෙනෙහි කරන කල්හි අඛණ්ඩාදී වශයෙන් ම මෙනෙහි කළ යුතු.

**අඛණ්ඩය**— කෙළවර බිඳුනු වස්ත්‍රයක් මෙන්, තමාගේ ශීලයෙහි, ශික්ෂාපදයන් අතුරෙන් මුලින් හෝ අගින් එක් ශික්ෂාපදයකුදු නො කැඩුණේ ද, එය **අඛණ්ඩ** නමි.

**අච්ඡිද්‍රය**— මැද සිදුරු වූ වස්ත්‍රයක මෙන්, මැද එක් ශික්ෂාපදයකුදු නොබිඳුණේ නම් එය **අච්ඡිද්‍ර** නමි.

**අසබලය**— ශික්ෂා පදයන් අතුරෙන් පිළිවෙළින් ශික්ෂා පද දෙකක් හෝ තුනක් හෝ නොබිඳුණේ වී නම්, ඒ සීලය,

පිට හෝ කුස හෝ නැංගාවූ, දික් වට ආදී සටහන් ඇති සභාග නොවන වර්‍ණයෙන් යුක්තවූ කළු රත් ආදීවූ එක්තරා වර්‍ණයක් ඇති, ගවදෙනක මෙන් **සබල** නොවන බැවින් **අසබල** නම් වේ.

**අකල්මාෂය** - අතරතුරෙන් ශික්‍ෂාපද නො බිඳුණේ නම්, ඔහුගේ ශීලය, කලු, රතු ආදීවූ විසභාග බින්‍දුයෙන් විසිතුරු වූ ගවදෙනක මෙන් කල්මාෂ නොවන හෙයින් **අකල්මාෂ** නම් වේ.

තවද, සියලු ශික්‍ෂාපදයෝ ම, සප්තවිධ මෛථුන සංයෝගයෙන් ද, ක්‍රෝධ - උපනාහ යනාදී පාපධර්‍මයන්ගේ වශයෙන් ද, උපගත නො වන හෙයින් **අඛණ්ඩය, අච්ඡිද්‍රය, අසබලය, අකල්මාෂය** වන්නාහ.

**භුජිස්සය** - අඛණ්ඩාදී ගුණයෙන් යුත් ශීලය, තෘෂ්ණා දාස භාවයෙන් මිදී, සෙවරී භාවය කරණ හෙයින් **භුජිස්සය.**

**විඤ්ඤුප්පසත්ථය** - පිරිසුදු වූ ඒ ශීලය බුඬාදී නුවණැත්තන් හෙවත් විඥයන් විසින් ප්‍රශංසා කරන ලද හෙයින් **විඤ්ඤුප්පසත්ථ** නම් වේ.

**අපරාමට්ඨය** - මේ ශීලය කරණ කොට ගෙන මම දෙවියෙක් වන්නෙමි යයි තෘෂ්ණාවෙන් හෝ, ශීලයෙන් ශුඬිය වන්නේ යයි කියා දෘෂ්ටියෙන් හෝ පරාමර්ශනය නො කරන ලද ශීලය **අපරාමට්ඨ** නම් වේ.

**සමාධිසංවත්තනිකය** - යම් ශීලයක් උපචාරසමාධි, අර්‍පණා සමාධි පිණිස හෝ, මාර්‍ග සමාධි, ඵල සමාධි පිණිස හෝ පවත්තේ නම් එයට **සමාධි සංවත්තනිකය** යි කියනු ලැබේ.

මෙසේ තමාගේ ශීලය, අඛණ්ඩය, අච්ඡිද්‍රය, අසබලය, අකල්මාසය, භුජිස්සය, විඤ්ඤුප්පසත්ථය, අපරාමට්ඨය, සමාධි සංවත්තනිකය යනාදී වශයෙන් මෙනෙහි කරන කල්හි, තමාගේ සිත රාග, ද්වේෂ, මෝහාදියෙන් අභිභූත නොව,

ඍජුව පවත්නා හෙයින් කෙලෙසුන් සංසිඳී, නීවරණ ධර්මයන් විෂ්කම්භනය වීමෙන්, ධ්‍යානාඞ්ග ඉපිද උපචාර ප්‍රාප්ත වන්නේ ය. ශීල ගුණ ගැඹුරු බැවින් ද, ශීල ගුණය පිළිබඳව නා නා විධ අදහස් පහළ වන බැවින් ද ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නො වන්නේ ය. උපචාර ධ්‍යානයෙහි ම පිහිටයි.

## සීලානුස්සතියෙහි අනුසස්

සීලානුස්සතිය වඩන යෝගාවචරයා ශික්ෂාවෙහි ගෞරව කරන්නෙක් වන්නේ ය. සිල්වතුන් හා සභාග පැවතුම් ඇත්තෙක් වේ. ශික්ෂාවෙහි ගෞරව ඇති බැවින් ම ධර්මාමිෂ පටිසන්ථාරයෙහි නො පමා වන්නේ ය. ආත්මවාදදී බියෙන් මිදුණේ ද වේ. සවල්පමාත්‍ර වරදෙක් හි ද බිය ඇත්තෙක් වේ. ශ්‍රද්ධාදීන්ගේ විපුලත්වයට ද පැමිණේ. ප්‍රීතිප්‍රමෝද්‍යය බහුල වන්නේ ය. මතු මාර්ගඵල නොලබන්නේ නම් ඒකාන්ත යෙන් ම සුගතිපරායණ වන්නේ ය.

## 5. චාගානුස්සතිය

දානය ආවර්ජනා කරමින්, මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව **චාගානුස්සති** භාවනා නම් වේ. චාගානුස්සතිය වඩනු කැමති යෝගාවචර තෙම සවභාවයෙන් ම දන් දීමෙහි ම යෙදුනු එහි පැහැදුනු, එයටම නැමුනු සිත් ඇති කෙනෙකු වියයුතු. භාවනාව ආරම්භ කරන දිනයෙහිදී "දැන් ඉතින් මේ වේලාවේ සිට දනක් පිළිගන්නා කෙනෙක් හමුවී නම්, එක් පිඩක් පමණක්වත් නොදී නොවළඳමි"යි දාන සමාදාන කොට, එදිනම ගුණයෙන් විශිෂ්ටවූ ප්‍රතිග්‍රහකයන් කෙරෙහි, ශක්තිවූ පරිද්දෙන් බලය ඇති පරිද්දෙන් දන් දී, ඒ දාන පරිත්‍යාග නිමිත්ත ගෙන, රහසිගතව, විවේක ඇති තැනක හිඳ, මෙසේ ත්‍යාගය මෙනෙහි කළ යුතු. **ලාභා වත මෙ—සුලද්ධං වත මෙ—යොහං මච්ඡෙරමලපරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡෙරෙන චෙතසා විහරාමි—මුත්තචාගො, පයතපාණි,**

**වොස්සග්ගරතො, යාචයොගො, දාන සංවිභාගරතො** (මට ඒකාන්තයෙන් ලාභයෙක, මා විසින් ලබන ලද්ද මනාව ම ලබන ලද්දේ ය. ඒ මම මසුරුමලින් මඩනා ලද සත්ත්වයන් අතුරෙන්, මලරහිතව, මසුරු බව රහිත ව වාසය කරමි. මුදාහරන ලද ත්‍යාග ඇත්තේ පිරිසුදු කරගත් අත් ඇත්තේ. පරිත්‍යාගයෙහි ඇලුණේ, ඉල්ලූ දෙය දෙන, දානයෙහි ද, සංවිභාගයෙහි ද ඇළුණේ වෙමි')යි කියායි.

මට ඒකාන්තයෙන් ලාභයෙක. මම ආයුෂය දී දිව්‍යමයවූ ද, මනුෂ්‍යමයවූ ද, ආයුෂයට හිමිවන්නෙමි. දන් දෙන තැනැත්තේ ලොවට ප්‍රිය වෙයි. ඔහු බොහෝ දෙනා භජනය කරන්නාහ. සත්පුරුෂයන්ගේ ධර්මය නොයික්මවන්නේ, දන් දෙන්නේ ලොවට ප්‍රිය වන්නේය. මේ ආදී වශයෙන් භාග්‍යවතුන්වහන්සේ විසින් දන් දෙන්නහු පිළිබඳව යම් ආයු, වර්ණ, සුඛ, බල, පටිභානාදී වූ ද, ප්‍රියභාවාදී වූ ද ලාභකෙණෙක් වර්ණනා කරන ලද ද, ඒ සියලු ලාභයෝ මට ඒකාන්තයෙන් ම වන්නේ යයි සිතා දන් දීමෙන් තමාට වන ලාභය මෙනෙහි කළ යුතු.

එසේම, මා විසින් යම් සම්බුද්ධ ශාසනයක් හෝ මිනිසත් බවෙක් හෝ ලබන ලද නම්, එය මනාව ලබන ලද්දේ වෙමියි කියා ද මෙනෙහි කළ යුතු.

යම් බඳු වූ මම, අනුන් හා සාධාරණ බව නොඉවසීම ලක්ෂණකොට ඇති, චිත්තයාගේ ප්‍රභාස්වර බව දූෂ්‍ය කරන ඒකාන්ත පාපධර්මයක් වූ ලොභාදී මලයන් හා මසුරු මලයන් අතුරෙන් එක්තරා මලයකින්වත් මඩනා ලද සත්ත්වයන් අතුරෙහි, රාග, දෙෂාදී මලයන් ද, මාත්සර්‍ය්‍යය ද ප්‍රහීණ කොට වාසය කරන්නෙමි යයි ද මෙනෙහි කළ යුතු.

දෙන දෙය යමක් අපෙක්ෂා නොකොට, අල්වා නොගැනීම් වශයෙන් දෙන්නේ නම්, එය මුදාහරන ලද ත්‍යාගය හෙවත් **මුක්ත ත්‍යාගය** නම් වේ. දියයුතු දෙය

සකස් කොට සියතින් ම දෙන්නේ නම්, හෙතෙම හැම ද සෝදා පිරිසුදු කරගත් අත් ඇත්තේ වේ. හෙවත් **පයතපාණී** නම් වේ. දෙයධර්ම සඞ්ඛ්‍යාත වොස්සග්ගයෙහි නිතර යෙදුනේ වේද, එහි ඇළුණේ වේද එයට **වොස්සග්ග-රතො** යයි කියති. යම් දන වස්තුවක් යාචකයෝ ඉල්වත් නම් ඒ ඒ දන වස්තුව දෙන හෙයින් **යාචයොග** නම් වේ. යමෙක් අනුන්ට දෙනු පිණිස ම සපයා තබා දෙනු ලැබේ ද එය **දන** නමි. තමාගේ පරිභෝගයට සැපයූ වස්තුවෙන් බෙදා දෙනු ලබනුයේ **සංවිභාග** නම් වේ. දනයෙහි ද සංවිභාගයෙහි ද ඇළුණේ **සංවිභාගරතො** නම් වේ.

මෙසේ දනයාගේ "විගතමලමච්ඡේරතාදී ගුණයන්ගේ වශයෙන් තමාගේ දනය මෙනෙහි කරන්නා වූ යෝගාව-චරයාගේ සිත රාග, ද්වෙෂ, මෝහාදියෙන් නොමඩනා ලදුව, ඍජුව පැවැත්ම කරණ කොට ගෙන කෙලශයන් සංසිඳීමෙන් නීවරණ ධර්මයන් විෂ්කම්භනය වී ධ්‍යානාඞ්ගයෝ පහළ වෙත්. එවිට ඔහුගේ සිත උපචාර ප්‍රාප්තවේ. ත්‍යාග ගුණ ගැඹුරු හෙයින් ද, නා නා විධ ත්‍යාග ගුණ සිහිවන බැවින් ද ධ්‍යානය අර්පණාප්‍රාප්ත නොවේ.

**අනුසස්** වශයෙන් වනාහි ඔහු බෙහෙවින් ත්‍යාගාධි-මුක්තවේ. නිර්ලෝභවේ. මෛත්‍රියට අනුලෝම ව හැසිරේ. විශාරද වේ. ප්‍රීති ප්‍රමොද්‍ය බහුල වේ. මතු මාර්ගඵල නොලබන්නේ නම් ඒකාන්තයෙන් සුගති පරායණ වේ.

## 6. දෙවතානුස්සතිය

චාතුර්මහාරාජිකාදී දෙවියන් සාක්ෂි කොට තබා තමන්ගේ ශ්‍රද්ධාදී ගුණ සිහි කරමින් කරන්නා වූ භාවනාව **දෙවතානුස්සති** නම් වේ.

**දෙවතානුස්සතිය** වඩනු කැමති යෝගාවචරයා ආර්ය මාර්ග වශයෙන් අධිගත ශ්‍රද්ධාදී ගුණයෙන් යුක්තව රහසිගත ව, විවේකව හිඳ මෙසේ සිතන්නේ ය.

චාතුම්මහාරාජික නම් දෙවියෝ ඇත්තාහ. එසේම තාවතිංස නම් දෙවියෝ ද, යාම නම් දෙවියෝ ද, තුසිත නම් දෙවියෝ ද, නිම්මාණරති නම් දෙවියෝ ද, පරනිම්මිත වසවත්ති නම් දෙවියෝ ද ඇත්තාහ. තවද බ්‍රහ්මකායික දෙවියෝත් ඇත්තාහ. එයින් මතු පරිත්තාභාදි දෙවියෝ ඇත්තාහ. යම් බඳුවූ ශ්‍රද්ධාවෙකින්, ශීලයකින්, මෙලොවින් චුතව, උපන්නාහු ද, මට ද එබඳු වූ ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා ඇත්තේ යයි දෙවියන් සාක්ෂියට තබා තමන්ගේ ශ්‍රද්ධාදී ගුණයන් සිහි කළ යුතු.

මෙසේ දෙවියන්ගේ ශ්‍රද්ධාදී ගුණ සිහි කොට පසුව තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් සිහි කරමින් භාවනා කරන කල්හි ඔහුගේ සිත, රාගයෙන් ද, ද්වේෂයෙන් ද, මෝහ-යෙන් ද නොමඩනා ලද හෙයින්, සිත ඍජුවීම කරණ කොට ගෙන, කෙලෙශයන් සංසිඳීමෙන්, නීවරණ ධර්මයන් විෂ්කම්භනය වේ. එකල්හි ධ්‍යානාඞ්ගයන් ඉපිද සිත උපචාර ප්‍රාප්ත වේ. ශ්‍රද්ධාදී ගුණ ගැඹුරු බැවින් ද, නානාවිධ ගුණ සිහිවන බැවින් ද ධ්‍යානය අර්පණාප්‍රාප්ත නොවේ.

**අනුසස්** වශයෙන් වනාහි ඔහු දෙවියන්ට ප්‍රිය වේ. මනාප වේ. ශ්‍රද්ධාදී ගුණයෝ විපුලභාවයට පැමිණේ. ප්‍රීති ප්‍රමොද්‍ය බහුල වේ. මතු ධ්‍යාන මාර්ගඵල නො ලබන්නේ නම් ඒකාන්තයෙන් සුගතිගාමි වන්නේ ය.

යට දක්වන ලද **බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝා-නුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති** යන අනුස්සති සය සම්බාධ වන්නේ ආර්‍යශ්‍රාවකයන්ටම ය. ඒ ආර්‍යශ්‍රාවකයන් හට බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ ප්‍රකට වන හෙයින් ද, අඛණ්ඩ, අච්ඡිද්‍රාදී ගුණ ඇති පිරිසුදු සීලයෙන් යුක්ත වන හෙයින් ද, මසුරුමල ආදියෙන් පහවූ ත්‍යාග ගුණයෙන් යුක්ත වන හෙයින් ද, මහානුභාව ඇති දෙවියන්ගේ ගුණ බඳු ශ්‍රද්ධාදී ගුණයෙන් යුක්ත වන හෙයින්ද මේ අනුස්සති සය ආර්‍යශ්‍රාවකයන්ටම සම්බාධ වන බව වදාරණ ලදී.

## 7. මරණානුස්සතිය

මරණය සතර වැදෑරුම් වේ. එනම්:—

1. **ජීවිතින්ද්‍රියොපච්ඡෙද මරණය**
2. **සමුච්ඡෙද මරණය**
3. **ඛණික මරණය**
4. **සම්මුති මරණය.**

**ජීවිතින්ද්‍රියොපච්ඡෙද මරණය** නම් එක් භවයකට ඇතුලත් ජීවිතින්ද්‍රිය ප්‍රබන්ධයාගේ විච්ඡෙදය නොහොත් සිඳීයාමය.

**සමුච්ඡෙද මරණය** නම් රහතන් වහන්සේගේ වට්ට දුක්ඛ සමුච්ඡෙදය නොහොත් සියලු සසර දුකින් මිදීම් සඞ්ඛ්‍යාතවූ මරණ යයි.

**ඛණික මරණය** නම් සංස්කාරයන්ගේ ක්‍ෂණ භඞ්ගය නොහොත් උදය - ව්‍යය දෙකින් පිරිසිඳිනා ලද ප්‍රවෘත්තික්‍ෂණයාගේ භඞ්ගයයි.

**සම්මුති මරණය** නම් ගස මැරුණේය යනාදී වශයෙන් ලෝක සම්මත මරණයයි.

මේ මරණානුස්සතියෙහිදී ජීවිතින්ද්‍රිය ප්‍රබන්ධ විච්ඡෙද සඞ්ඛ්‍යාත මරණය හෙවත් **ජීවිතින්ද්‍රියොපච්ඡෙද මරණයම** අරමුණට නගා මෙනෙහි කළ යුතු.

**ජීවිතින්ද්‍රියොපච්ඡෙද මරණය** වනාහි:—

1. **කාල මරණය**
2. **අකාල මරණය**

යයි දෙවැදෑරුම් වේ.

කර්මක්‍ෂය වශයෙන් හෝ ආයුක්‍ෂය වශයෙන් හෝ වන මරණය **කාල මරණය** වේ. උපච්ඡෙදක කර්මයෙන් වන

මරණය **අකාල මරණ** නම් වේ. එහෙයින් **කාල මරණය** ද, **කර්මක්ෂය මරණය, ආයුක්ෂය මරණය** යයි ද්විධ වේ.

සුගතියෙහි **පුණ්‍යක්ෂය මරණය** නම් ප්‍රතිසන්ධිජනක කුසල කර්මය විපාකදී අවසන්වීමෙන් සිදුවන මරණයයි. උපන් භවයෙහි ආයුසන්තතිය පැවතීමට උපකාර වන ආහාරාදි ප්‍රත්‍යය සම්පත් ඇතත්, ජනක කර්මයාගේ විපාක ශක්තිය අවසන්වූයේ නම් දිවිපවත්වා ගත නො හැකිවේ. එසේ සිදුවන මරණයට **පුණ්‍යක්ෂය මරණය** යයි කියනු ලැබේ.

**ආයුක්ෂය මරණය** නම් කාල ආහාරාදි සම්පත් නැතිවීමෙන් ඒ ඒ කාලයට නිසි ආයුෂ ක්ෂයවීමෙන් වන මරණයයි.

**අකාල මරණය** ද දෙවැදෑරුම් වේ. එනම්:—

1. **තත්ක්ෂණික අකාල මරණය**
2. **පූර්වකෘත අකාල මරණය.**

**තත්ක්ෂණික අකාල මරණය — දූසිමාරය, කලාබු රජය, නන්ද යක්ෂය, නන්ද මානවකය** යනාදීන්ට මෙන් කර්මය කරණ ලද ක්ෂණයෙහි ම චුත කරවන්නට සමත් වූ බැවින් දිට්ඨධම්මවේදනීය වූ කර්මයෙන් රුකුල් ලැබ, උපච්ඡේදක කර්මයකින් සිදුවන මරණය **තත්ක්ෂණික අකාල මරණය** නම්.

**පූර්වකෘත අකාල මරණය—** පූර්වජාතික උපච්ඡේදක කර්මයෙන් හෝ අවියෙන් පහරන ලදුව හෝ සියදිවි නසා ගැනීම් ආදී වශයෙන් හෝ සිදුවන මරණය **පූර්වකෘත අකාල මරණය** වේ.

පුණ්‍යක්ෂය මරණය මෙන් ම දුගතියෙහි පාපකර්ම විපාක ශක්තිය ක්ෂය වීමෙන් වන මරණය ද **කර්මක්ෂය මරණ** නම්.

**කර්ම, ආයුෂ,** යන දෙක්හිම ශක්තිය තව ඉතිරිව තිබිය දී දිට්ඨධම්මවේදනීය වශයෙන් හෝ කළ බලවත් අන්‍ය කර්මයෙක ශක්තියෙන් හෝ සිදුවන මරණය **උපච්ඡෙදක මරණය** නම්. මෙය **අකාල** මරණයකි.

**කර්ම, ආයුෂ,** දෙක්හිම ශක්තිය එකවර ක්‍ෂය වීමෙන් වන මරණය **උභයක්ෂය මරණය** නම් වේ. මෙය **කාල මරණයකි.**

මෙසේ ජීවිතින්ද්‍රියොපච්ඡෙද සඞ්ඛ්‍යාත මරණයාගේ සිහිකිරීම **මරණානුස්සති** නම් වේ.

**මරණ සතිය** වඩනු කැමති යෝගාවචරයා විසින් රහසිගතව විවේකව හිඳ, **"මරණං භවිස්සති ජීවිතින්ද්‍රියං උපච්ඡිජ්ජිස්සති"** මරණය වෙයි. ජීවිතින්ද්‍රියය සිඳී යයි. කියා හෝ **"මරණං මරණං"** මරණය, මරණය කියා හෝ නුවණින් මරණාලම්බනය සිහි කළ යුතු. අයොනිසො-මනසිකාරයෙන්, හෙවත් නුනුවණින්, **සති, සංවෙග, ඥාන** යන මොවුන්ගේ වශයෙන් මරණය මෙනෙහි නො කරන්නාහට, ඉෂ්ට ජනයාගේ මරණ සිහිකිරීමේ දී ශෝකය උපදී. ප්‍රිය පුත්‍රයාගේ මරණය සිදුකිරීමේදී වැදූ මවට ශෝකය උපදී. අනිෂ්ට ජනයාගේ මරණය සිහිකිරීමේදී ප්‍රීතිය උපදී. වෛරීන්ගේ මරණ සිහිකිරීමේදී ද එමෙනි. මධ්‍යස්ථ ජනයාගේ මරණය සිහිකිරීමේදී සංවේගය නූපදී. මළමිනී දවන්නාහට මළ සිරුර දැක්මෙහි දී මෙනි. තමාගේ මරණය සිහිකිරීමෙහි දී භය උපදී. තමා මරණු පිණිස කඩුව ඔසවා ගෙන දිව එන වධකයා දැකුමෙහි දී මෙනි. **සති, සංවෙග, ඥාන** යන මොවුන්ගේ අභාවයෙන්, ශෝකය, හා ප්‍රීතිය ඉපදීම ද, සංවේගය නො ඉපදීම ද, භය ඉපදීම ද සිදුවන්නේ ය. යමෙක් "මේ මරණය උපන් සත්ත්වයන්ට නියත යයි" නුවණැත්තන්ගේ කීම අනුව සිහි කරන්නේ නම් ඔහුට සංවේගයත් නුවණත් ඇති වේ. යම් හෙයකින් යෝනිසොමනසිකාරය පවත්වන්නාහට මේ දෝෂය නො-වේද්ද, එහෙයින් අරණ්‍ය සොහොන් ආදී තැන්හි, සොරෑ

ආදීන් විසින් මරා දමන ලද සතුන් ද, මැරුණා වූ සතුන් ද බලා දැක පුරුදු සම්පත් විඳි සත්ත්වයන්ගේ මරණය සිහි කොට, **සති, සංවේග, ඤාන** උපදවා මරණය ඒකාන්තයෙන්ම වන්නේය යනාදී ක්‍රමයෙන් සිහි කළ යුතු. මෙසේ මෙනෙහි කරන තැනැත්තේ නුවණින් ද, උපායයෙන් ද මෙනෙහි කරන්නේ ය. මෙසේ මෙනෙහි කරන්නා වූ තීක්ෂණ ඉන්ද්‍රියන් ඇති, නුවණ ඇති යෝගාවචරයාහට නීවරණ ධර්මයන් විෂ්කම්භන වීමෙන්, ධ්‍යානාඞ්ගයන් ඉපිද, මරණය අරමුණු කොට සිහිය පිහිටීමෙන් උපචාරධ්‍යානය පහළ වේ.

මෙසේ භාවනා කරන්නාහට කර්මස්ථානය උපචාරප්‍රාප්ත නොවේ නම්, නැවත අට ආකාරයකින් මරණය සිහිකළ යුතු වේ. ඒ අට ආකාරය නම්:-

1. **වධක පච්චුපට්ඨානය**
2. **සම්පත්ති විපත්ති**
3. **උපසංහරණය**
4. **කාය බහුසාධාරණය**
5. **ආයු දුබ්බලය**
6. **අනිමිත්තය**
7. **අද්ධාන පරිච්ඡේදය**
8. **ඛණපරිත්තය**

**1. වධක පච්චුපට්ඨානය**- වධකයෙකු එළඹ සිටියාසේ මරණය එළඹ සිටියේ යයි සිහි කිරීම **වධක පච්චුපට්ඨානය** නම් වේ. යම්සේ මොහුගේ හිස කපමියි කඩුවක් ගෙන ග්‍රීවයෙහි පහරණාකාරයෙන් එළඹ සිටි වධකයා මෙන් ද, අවකාශයෙක් ලැබුනු විට ඒකාන්තයෙන් ම මරමි යි කඩුව නගා ගෙන සිටිනා සතුරෙකු දුරුනොවී එළඹ සිටියාසේ ද,

මරණය ද ඒකාන්තයෙන් ම එළඹ සිටියේ යයි සිහි කළ යුතු. මේ මරණය, ජාතිය හෙවත් උත්පත්තිය සමගම අවුත් දිවි පැහැර ගන්නේ ය. යම්සේ නයි හතු කැකුළු මුදුනෙන් පස්ගෙනම නැගේ ද, එසේම සත්ත්වයෝ ජරා-මරණ ගෙනම උපදිත්. සත්ත්වයාගේ ප්‍රතිසන්ධි චිත්තය, උත්පාදක්ෂණයට අනතුරුවම ජරාවට පැමිණ, පර්වත මස්තක යෙන් හුණු ගලක් මෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන් හා සමගම බිඳේ. මෙසේ පළමු කොට **ක්ෂණික මරණය** ජාතිය හා සමග ආයේ ය. උපන් සත්ත්වයෝ අවශ්‍යයෙන් ම මිය යන බැවින් **ජීවිතින්ද්‍රියොපච්ඡෙද මරණය** ද ජාතිය හා සමගම ආයේ ය. එහෙයින් මේ සත්ත්ව තෙම උපන් කල් පටන් ගෙන, යම්සේ නැගුණු සූර්‍ය්‍යා අස්තයට අභිමුඛව ම යන්නේ ද, ගිය ගිය තැනින් මදකුදු නොනවතී ද, යම්සේ පර්වතයෙන් ගලා බසින ගංගා තොමෝ ශීඝ්‍රයෙන් ගලා බසින්නේ, සැඩපහරෙහි හුණු තණපත් ආදියත් රැගෙන වහාම නො නැවතී ගලාබසී ද, එපරිද්දෙන් ම මොහොතකුදු නොනැවතී මරණයට අභිමුඛ ව ම යේ ම ය.

සත්ත්වයෝ බොහෝ සෙයින් මව්කුස පිළිසිඳ ගන්නේ රාත්‍රි කාලයෙහි ය. එසේ යම් එක රාත්‍රියක මව්කුස පිළිසිඳ ගත් සත්ත්වතෙම අහසට නැගි වලාකුලක් මෙන්, මොහො-තක්වත් නොනැවතී මරණය කරාම යන්නේ ය. මෙසේ යන්නා වූ ඔහට මරණය ඒකාන්තයෙන් ම එළඹ සිටින්-නේ වේ. ග්‍රීෂ්ම කාලයේදී, පර්වතයෙන් ගලාබසිනා කුඩා ගංගාවෝ වියලී යන්නාක් මෙන් ද, දහවල් සූර්‍ය්‍ය සන්තාප-යෙන් ඇතුළට වැද, නැවත රාත්‍රියෙහි ආපෝ රසයෙන් තෙත්ව, උදය කාලයෙහි දී වෘක්ෂ ඵලයන්ගේ නටුවෙන් ගිලිහි වැටීම මෙන් ද, මුගුරෙන් පහරණ ලද කල්හි මැටි බඳුන් බිඳී යන්නාක් මෙන් ද, හිරුරැස් වැටුනු කල්හි පිනිබිඳු විනාශයට යන්නාසේ ද, උපන් සත්ත්වයාහට ඒකාන්තයෙන් ම මරණය ආසන්න වේ ම ය. මෙපරිද්දෙන් ජාතිය හා සමගම ආ මේ මරණය, ග්‍රීවයට කඩුව සරහා එන ඒ වධකයා මෙන් ද දිවිනසා ම ය. දිවිනොහෙන

නොතවතී. එහෙයින් ජාතිය හා සමග ආ හෙයින් ද, දිව්ගත්නා හෙයින් ද කඩුව නගා ගෙන සිටි වධකයකු මෙන් මරණය ද එළඹ සිටියේ යයි සිහි කිරීම **වධකපච්චු පට්ඨාන** වශයෙන් මරණය සිහිකිරීම යයි දත යුතු.

**2. සම්පත්ති විපත්තිය** - විපත්තියෙන් නොමැඩෙන-තාක් කල් සම්පත්තිය හොබනේය. යම් සම්පතක් විපත්තිය නොමැඩසිටී ද එබඳු සම්පතක් නම් ලොවම නැත්තේය. මුළුපොළොවෙහි සම්පත් වළඳා, පමණ කළ නොහැකිසේ දන්දී සුවපත්ව සිටි ධර්මාශෝක මහරජතුමා පවා අවශාන යෙහිදී ඇඹුලුකැබැල්ලක් පමණට ඉසුරු බවට පත්ව, කුසලක්‍ෂය වීමෙන් මරණයට අභිමුඛවූයේ, සෝක කටයුතු බවට පැමිණියේය.

සියලු නීරෝගී බව ව්‍යාධිය කෙළවර කොට ඇත්තේ ය. සියලු යෞවන බව ජරාව කෙළවර කොට ඇත්තේ ය. සියලු ලෝකය ජාතිය අනුව යන ලද්දේ ය. ව්‍යාධියෙන් මඩනා ලද්දේ ය. මරණයෙන් පහරණ ලද්දේ ය.

යම්සේ ශෛලමය වූ ද, මහත් වූ ද, අහස පැහැර සිටි පර්වතයන් හාත්පසින් සතරදිගින් හමන චණ්ඩමාරුතයෝ සුන්කරමින් හැසිරෙන්නාහු ද, එපරිද්දෙන් ම, ජරාව ද, මරණය ද, රජවරුන් ද, බමුණන් ද, වෛශ්‍යයන් ද, ක්‍ෂුද්‍ර යන් ද, චණ්ඩාලයන් ද, පුක්කුසයින් ද යන සියලු සතුන් මඩිමින් පවතී. කුලෙන්වත්, රූපින්වත්, ශීලයෙන්වත්, ශ්‍රැතයෙන්වත්, සැදැහැ ආදී ගුණයෙන්වත් වැඩිසිටියහ යන සම්භාවනාවෙන් රජදරු ආදීන් කෙරෙන් කිසිවක්හු ද, එම කුල, රූපාදීන් හීනයහයි අවමානයෙන් චණ්ඩාලාදීන් කෙරෙන් කිසිවක්හුද දුරුකරන්නේ නොවෙයි. මරණය සියල්ලම මැඩලන්නේ ය. ඒ ජරා-මරණ යුධයෙන් ජය ගත නොහැකි වේ. එහි ඇතුන්ට ද විෂය නොවෙයි. රථයනට ද විෂය නොවෙයි. පදාතීන්ට ද විෂය නොවෙයි. මන්ත්‍රසඞ්ග්‍රාම ප්‍රයෝගයෙනුදු කැමති වස්තු දීමෙනුදු ජරා – මරණයෙන් දිනන්නට නොපිළිවන. මෙසේ ජීවිත

සම්පත්තියගේ, මරණ විපත්තිය කෙළවර කොට ඇති බව ව්‍යවස්ථා කොට මෙනෙහි කිරීම **සම්පත්ති විපත්ති වශයෙන්** මරණය සිහි කිරීම නම් වේ.

**3. උපසංහරණය** - යසොමහත්ත්වාදීයෙන් සමන්විත වූ අන්‍යයන් හා සමග සමාන භාවයෙන් මරණය තමා කෙරෙහි එළවා ඒ විශේෂ පුද්ගලයන්ට සේ තමාට ද මරණය වන්නේ ය යනාදී වශයෙන් මරණය සිහිකිරීම **උපසංහරණ** වශයෙන් සිහිකිරීම නම් වේ. එය මෙසේ සත් ආකාරයකින් සිහි කළ යුතු වේ:-

**1 යශස් මහත්ත්ව වශයෙන්**

**2 පුණ්‍ය මහත්ත්ව වශයෙන්**

**3 ථාම මහත්ත්ව වශයෙන්**

**4 ඍද්ධි මහත්ත්ව වශයෙන්**

**5 ප්‍රඥා මහත්ත්ව වශයෙන්**

**6 ප්‍රත්‍යෙකබුද්ධ වශයෙන්**

**7 සම්‍යක් සම්බුද්ධ වශයෙන්.**

**1. යශස් මහත්ත්ව වශයෙන්** - මේ මරණය නම් මහා යසස් ඇති, මහත් පිරිවර ඇති, පිරුණා වූ ධන වාහන ඇති මහා සම්මතය, මහාමන්ධාතුය, මහාසුදශීනය, දල්හනෙමිය, නිමිය යනාදීන්ගේ මතුයෙහි පවා සැක නැති ව ම පතිතවිය. මා මතුයෙහි කුමක් හෙයින් පතිත නොවේද යි මෙසේ යශස් මහත්ත්ව වශයෙන් සිහි කළ යුතුය.

**2. පුණ්‍ය මහත්ත්ව වශයෙන්** - ජොතිය නම් සිටුය, ජටිල නම් සිටුය, උග්ග නම් සිටුය, මෙණ්ඩක නම් සිටුය, පුණ්ණක නම් සිටුය, යන මොහු ද, ලෝකයෙහි මහා පින් ඇත්තෝ යයි ප්‍රසිද්ධ වූ යම් අනික් කෙනෙක් ඇද්ද, ඔව්හු

හැමදෙනම මරණයට පැමිණියාහ. මා වැන්නන් කෙරෙහි කුමක් හෙයින් මරණය නොපැමිණෙන්නේ දැයි මෙසේ පුණ්‍යමහත්ත්ව වශයෙන් ද සිහි කළ යුතු.

**3. ථාම මහත්ත්ව වශයෙන්** – වීයර්‍ය බල මහත්ත්වයෙන් යුක්ත වූ වාසුදෙවය, බලදෙවය, භීමසේනය, යුධිෂ්ඨිරය, ඛානුරමල්ලය යන මොව්හු මරහුගේ වසඟ බවට ගියහ. ලෝකයෙහි ප්‍රසිද්ධ වූ වීයර්‍ය බලයෙන් යුක්ත වූ මොව්හු මරණයට පැමිණියාහු නම්, මා වැන්නන්ට මරණය නො පැමිණෙන්නේ යයි කවර කථා ද, යනාදී වශයෙන් ද මරණය සිහි කළ යුතු.

**4. ඍද්ධි මහත්ත්ව වශයෙන්** – ඍද්ධිමතුන්ගෙන් අග්‍ර වූ දෙවන අග්‍රශ්‍රාවක මහමුගලන් මහ තෙරණුවෝ පය මහපට ඇඟිලි පමණෙකින් දේවේන්ද්‍රයාගේ විජයොත් මහාපාය කම්පා කෙළේ ද, උත්වහන්සේ පවා සිංහ මුඛයටවත් මෘගයෙකු මෙන් ඝෝරවූ මරුමුඛයට ඍද්ධීන් හා සමඟ පිවිසි සේක. මා වැන්නකු ගැන කවර කථා ද, යනාදී වශයෙන් ඍද්ධිමහත්ත්ව වශයෙන් ද මරණය සිහි කළ යුතු.

**5. ප්‍රඥා මහත්ත්ව වශයෙන්**–ලොව්තුරා බුදුන්වහන්සේ හැර සෙසු සියලු සතුන්ගේ නුවණ, සැරියුත් මහතෙරුන්ගේ ප්‍රඥාව සොළොස් කොටසක් කොට එයින් එක් කොටසක් නැවත සොළොස් භාගයක් කොට ලද ඒ සොළොස් වන කලාවට නො අගනේ ය. මෙසේ මහා ප්‍රාඥ වූ පළමු අගසව් සැරියුත් මහ තෙරුන් පවා මරහුගේ වසඟයට පැමිණියහ. මා වැන්නන් ගැන කවර කථා ද යනාදී වශයෙන් ප්‍රඥා මහත්ත්ව වශයෙන් ද මරණය සිහි කළ යුතු.

**6. ප්‍රත්‍යෙකබුද්ධ වශයෙන්** – යම් ඒ කෙනෙක් පරෝප දෙශයෙන් රහිතව තමන්ගේම ඥාන බලයෙන් හා වීයර්‍ය බලයෙන් ද, සියලු කෙලෙසුන් නසා, හුදකලාව ඇවිදීමෙන් හා විසීමෙන් කඟවෙහෙණුන් අඟ හා සමවූ උපමා ඇත්තා වූ

පසේ බුදු බව ලැබුයේ ද, ඒ පසේ බුදුන් වහන්සේ පවා මරහු කෙරෙන් නොමිදුනේ ය. මාවැන්නන් ගැන කියනුම කවරේ ද යි **ප්‍රත්‍යෙකබුඩ වශයෙන්** මරණය මෙනෙහි කළ යුතු.

**7. සම්‍යක් සම්බුඩ වශයෙන්** - යම් ඒ භාග්‍යවතුන් වහන්සේ අශීත්‍යානු ව්‍යඤ්ජනයෙන් හොබනා වූ ද්වාත්‍රිංසත් මහා පුරුෂලක්‍ෂණයෙන් විසිතුරු වූ රූප කාය ඇත්තේ ද, සවාසනා සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණයෙන් සර්වාකාරයෙන් පිරිසුදු වූ ශීලස්කන්ධාදී ගුණරත්නයෙන් සමෘඩ වූ ධර්මකාය ඇත්තේ ද, යශස් මහත්ත්වය, පින්මහත් බවය, ශක්ති මහත් බවය, ඍඩි මහත් බවය, ප්‍රඥා මහත් බවය, යන මොවුන්ගේ කෙළවරට ගියේ ද, තමා හා සමයක්හු නැත්තේද අසමවූ පූර්ව බුදුවරයන් හා සමද, අප්‍රතිපුද්ගල වූ, ප්‍රත්‍යාදීන්ට අර්හ හෙයින් රහත් ද, අවිපරිත කොට සියලු පදාර්ථ තෙමේම දත් හෙයින් සම්මා සම්බුඩ නම් වේ ද, ඒ භාග්‍ය වතුන් වහන්සේ පවා වැසිදිය හීමෙන් මහත් වූ ගිනි කඳක් මෙන් මරණ නමැති වැසි හීමෙන් ක්‍ෂණයෙකින් නිවී ගියසේක. යම් බඳු වූ මේ මරණය තෙම මෙබඳු වූ රූපකාය හා ධර්මකාය සම්පත්තියෙන් හෙබියා වූ මහර්ෂිහු කෙරෙහි හයින් වසඟ බවට නොපැමිණියේ ය. ලජ්ජාවෙනුදු වසඟ බවට නොපැමිණියේ ය. මෙසේ ලජ්ජා නැති, භය නැති සියලු සතුන් මැඩ පවත්නා වූ ඒ මරණය තෙම මාබඳු වූ පුද්ගලයෙක් කෙසේ නම් මැඩ නොපවතී ද, මෙසේ සම්‍යක් සම්බුඩයන්ගේ වශයෙන් මරණය මෙනෙහි කළ යුතු.

මෙසේ යශස් මහත් බව යනාදීන් සම්පූර්ණ වූ අන්‍යයන් හා සමග මරණ සාමාන්‍ය බැවින්, තමා කරා එළවා ඒ සත්ත්ව විශේෂයන්ට මෙන් මට ද මරණය වන්නේ යයි සිහි කරන ඒ යෝගාවචරයාහට කමටහන උපචාරප්‍රාප්ත වෙයි. මෙසේ **උපසංහරණ වශයෙන්** මරණය මෙනෙහි කටයුතු.

4. **කාය බහු සාධාරණය**-මේ ශරීරය අන්‍යවූ බොහෝ සත්ත්වයන්ට සාධාරණ යයි යනාදී වශයෙන් සිහි කිරීම **කාය බහු සාධාරණ වශයෙන්** මරණය සිහි කිරීම නම් වේ. පළමු කොට මේ කය අසූකුලයක පණුවන්ට සාධාරණය. ඔවුන් අතුරෙන් සිවිය ඇසුරු කළ පණුවෝ සිවිය කා දමති. එසේ ම සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු ආදිය ඇසුරු කළ පණුවෝ ඒ සම්, මස් ආදිය කා දමති. ඔව්හු එහිම උපදිති. එහිම ජරාවට පැමිණෙති. එහිම මියයෙත්. එහිම මලමූත්‍ර කෙරෙති. එය ම ඔවුන්ට තිඹිරි ගෙය ද, ගිලන් හල ද, සොහොන ද, වැසිකිළි ද, කෙසකිළිය ද වෙති. ඔවුන්ගේ ප්‍රකෝපයෙන් මරණයට ද පැමිණෙති. එපරිද්දෙන් ම අධ්‍යාත්මික වූ ද නොයෙක් සියගණන් රෝගයන්ට ද, බාහිර වූ, මරණයට ප්‍රත්‍යය වූ සර්ප, ගෝණුසු ආදීන්ට ද මේ ශරීරය සාධාරණය. යම් සේ සතර මං සන්ධියෙහි තබන ලද ඉලක්කයෙහි ශරය, තෙබය, අඩයටිය, පහණය යනාදිය වැදගන්තේ ද, එපරිද්දෙන් ම කයෙහි ද උපද්‍රවයෝ වැදහෙති. මේ කය ඒ උපද්‍රවයන්ගේ පැමිණීමෙන් මරණයට ද පැමිණෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, මේ සස්නෙහි මහණ තෙම දවස නික්මුණු කල්හි, රාත්‍රිය නැවත අා කල්හි, මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ය. මට මරණයට ප්‍රත්‍යයෝ බොහෝ ය. සර්පයෙක් හෝ මා ඩහන්නේ ය. ගෝණුස්සෙක් හෝ මා ඩහන්නේ ය. පත්තෑයෙක් හෝ මා ඩහන්නේ ය. එයින් මාගේ කාල ක්‍රියාව ද වන්නේ ය. මට ඒ අන්තරාය වන්නේ ය. පය පැකිළ හෝ වැටෙන්නෙමි. මා විසින් කන ලද ආහාරය හෝ නොදිරන්නේ ය. පිත හෝ කිපෙන්නේ ය. සෙම හෝ කිපෙන්නේ ය. මට ශසත්‍රක වාතයෝ හෝ කිපෙන්නාහ. ඒ පැකිළීම් ආදීන්ගේ වශයෙන් ද මාගේ කාලක්‍රියාව වන්නේ ය. මට එය ශාසනාශාසන මනසකාරයට අනතරාය වන්නේ ය." මෙසේ කායබහුසාධාරණ වශයෙන් ද මරණය සිහි කළ යුතු.

**5. ආයු දුබ්බලය**–ආයුෂයාගේ දුර්වල බව සිහිකිරීමෙන් ද, මරණය සිහි කළ යුතු. සත්ත්වයාගේ ආයුෂය දුර්වලය, බලනැත්තේ ය. ජීවිතය, ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳව පවතී. එසේම ඉරියව් පිළිබඳව ද වෙයි. මහාභූතයන් පිළිබඳ ද වෙයි. ශීතොෂ්ණ පිළිබඳ ද වෙයි. ආහාර පිළිබඳ ද වෙයි. ඒ මේ ආයුෂය ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ සමව පවත්නාතාක් කල් පවතී. පිටතට නික්මුණු නාසිකා වාතය ඇතුළට නොවදනා කල්හි ද, ඇතුළට වත් වාතය පිටතට නො නික්මුණු කල්හි ද, සත්ත්වයා මළේ නම් වේ. සතර ඉරියව්වන්ගේ ද සමව පවත්නාතාක් කල් ජීවිතය පවතී. එක්තරා ඉරියව්වක් වනාහි අධිකවූව හොත් ආයුසංස්–කාරයෝ සිඳෙන්නාහ. ශීතොෂ්ණයන්ගේ ද සමව පවත්නාතාක් කල් ජීවිතය පවතී. අධික ශීතයෙන් හෝ අධික උෂ්ණයෙන් හෝ මඩනා ලද්දේ ජීවිතය විනාශය වෙයි. මහා භූතයන්ගේ ද සමව පවත්නාතාක් කල් දිවි පවතී. පඨවි ධාතුවගේ හෝ ආපෝ, තේජෝ, වායෝ ධාතුවකගේ හෝ, යම් කිසි එකක්හුගේ කෝපයෙන් බලසම්පන්න පුද්ගලයෝ ද, පෘථිවි ධාතුවෙන් තදව ගිය කය ඇත්තෝ ද, ආපෝ ධාතු කෝපයෙන් වන අතිසාරාදීන්ගේ වශයෙන් හෝ තෙත්ව ගිය කුණුවූ කය ඇත්තෝ ද, කුසයෙහි කර්මජ තේජෝ ධාතුව කිපීමෙන් මහාදාහයෙන් ජීවිත වූවෝ ද, වාත කෝපයෙන් සිඳුන ලද සන්ධිබන්ධන ඇත්තෝ ද ජීවිතක්ෂයට පැමිණෙති. සුදුසු කල්හි කබලිකාරාහාරය ලබන්නේ නම් ජීවිතය පවතී. ආහාරය නොලබන්නාහට ජීවිතය පවත්වා ගත නොහැකිවේ. මෙසේ ආයු දුර්වලතා වශයෙන් ද මරණය සිහි කළ යුතු.

**6. අනිමිත්තය** – කාලාදී වශයෙන් ව්‍යවච්ඡේද රහිත බව සඞ්ඛ්‍යාත වූ නිමිත්ත වශයෙන් ද සලකා මරණය සිහි කළ යුතු. සත්ත්ව ලෝකයෙහි සනිටුහන් නැති, දැනගත නොහැකි කරුණු පසෙකි. එනම්:– (1) **ජීවිතය.** **(2) ව්‍යාධිය (3) මරණ කාලය (4) ශරීර නික්ෂෙපය (5) ගතිය** යන කරුණු පසය.

පළමු කොට **ජීවිතය** මෙපමණ කාලයක් ම ජීවත්විය යුතුය. මෙයින් ඔබ්බෙහි ජීවත් නොවිය යුතුය යි සනිටුහන් කළ නොහැකි බැවින් **අනිමිත්තය.** සත්ත්වයෝ කලල අවස්ථාවෙහිද මැරෙති අර්බුද අවස්ථාවෙහි ද මිය යති. පෙසී අවස්ථාවෙහි ද මිය යති. එසේම ඝන අවස්ථාවෙහි ද එක්මස් වයස් කල්හි ද, දෙමැසි කල්හි ද, තුන්මැසි කල්හි ද, සිව්මැසි කල්හි ද, පස්මැසි කල්හි ද, දසමැසි කල්හි ද, කුසින් නික්මුණු කල්හි ද, එයින් මතු ශතවර්ෂය ඇතුළත්හි ද, එයින් පිටත්හි ද මිය යන්නේම ය.

**ව්‍යාධිය** ද, මේ ව්‍යාධියෙන් ම සත්ත්වයෝ මැරෙති. අනික් ව්‍යාධියකින් නොමැරෙති යයි මෙසේ සනිටුහන් නැති හෙයින් **අනිමිත්තය.** සත්ත්වයෝ ඇස් රෝගයෙනුදු මිය යති. කණ් රෝගාදීන් කෙරෙන් එක්තරා එකකිනිදු මිය යති.

**කාලය** ද, සත්ත්වයා මෙකල්හිම මිය යා යුතුය. අන්‍ය කාලයෙක්හි මිය යා යුතු නොවෙයි. මෙසේ සනිටුහන් නැති හෙයින් **අනිමිත්තය.** සත්ත්වයෝ පෙරවරු කාලයෙහි ද මියයති. පස්වරු කාලයන්හි ද මිය යති.

**දෙහනික්ෂෙපය** ද, මිය යන්නවුන්ගේ දෙහය මෙතනම වැටිය යුතුය. අන් තැනෙක්හි නොවැටිය යුතු යයි ව්‍යවස්ථා රහිත බැවින් **අනිමිත්තය.** ඇතැම් සත්ත්වයෝ ඇතුළු ගම උපන්නේ, ගමින් පිටත්හි ද ආත්මභාවය හෙයි. ගමින් පිටත උපන්නවුන්ගේ ආත්මභාවය ඇතුළු ගමෙහි දී හෙයි. එසේම ගොඩ උපන්නවුන්ගේ ආත්මභාවය දියෙහි ද, දියෙහි උපන්නවුන්ගේ ආත්මභාවය ගොඩෙහි ද හෙයි. මෙසේ නොයෙක් ප්‍රකාරයෙන් ආත්මභාවය හෙළන්නේය.

**ගතිය** ද, මෙයින් චුතවූවහු විසින් මෙහි ම ඉපදිය යුතුය. අන් තැනක නොඉපිදිය යුතුයයි මෙසේ සනිටුහන් නොකළ හැකි බැවින් **අනිමිත්තය.** දෙව්ලොවින් චුතවූවාහු

මිනිස් ලොව උපදිති. මිනිස් ලොවින් චුතව දෙව්ලොව උපදිති. මෙසේ යන්ත්‍රයෙක්හි යෙදූ ගොනෙකු මෙන් සත්ත්වයෝ පඤ්ච ගතියෙහි ම පෙරළෙන්නාහ.

මෙසේ **අනිමිත්ත** වශයෙන් ද මරණය සිහි කළ යුතු වේ.

**7. අද්ධාන පරිච්ඡේදය**–එනම් ජීවිත කාල පරිච්ඡේදයයි. මෙකල මනුෂ්‍ය ජීවිතය මෙතෙක් කල් පැවතිය යුතු යයි කාල පරිච්ඡේදයක් නැත. බොහෝ කල් ජීවත් වේ නම් අවුරුදු සියයක් හෝ ජීවත් වෙයි. එයට වැඩි වුවහොත් ස්වල්පයක් වැඩි වෙයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. “මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂය අල්පය. පරලොව යායුතුය. කුසල් කටයුතුය. බ්‍රහ්ම–චර්‍ය්‍යායෙහි හැසිරිය යුතුය. උපන්නාහුට නොමැරීමක් නැත. මහණෙනි, යමෙක් බොහෝ කාලයක් ජීවත් වේ නම් හෙතෙම අවුරුදු සියයක් හෝ ජීවත් වෙයි. මඳක් වඩා හෝ ජීවත් වෙයි.

තවද, සූර්‍ය්‍යයා උදාවීම සමගම තණපත් අග පිණිබිඳු විනාශයට යන්නාසේ ද, දියෙහි නැගි බුබුළු එකෙණෙහි ම නැසෙන්නාසේ ද දිය ඇඳි ඉර එවේලේම නොපෙනී යන්නාසේ ද, පර්වතයෙන් ගලා බස්නා ගංගාව මොහොතක් නතර නොවන්නාසේ ද, දිව අග කෙළ පිඩ වියලී යන්නාක් මෙන් ද, රත් කළ යකඩලෙයෙහි ලූ මස් කැබැල්ල පිළිස්සී යන්නාසේ ද, මස් ලොඹුව කරා ගෙන යන ගවයා මෙන් ද, මනුෂ්‍ය ජීවිතය ඇසිල්ලක් පාසා ම මරණයට ම ළං වන්නේ ය.

තවද, භාග්‍යවතුන් වහන්සේ මෙසේ ද වදාළ සේක. මහණෙ , යම් මහණ කෙනෙක් මෙසේ මරණානුස්සතිය වඩා ද, මම එක් රෑ දවාලක් ජීවත් වෙම් නම් ඉතා යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය හෙවත් ආර්‍ය්‍ය මාර්ග ප්‍රතිවෙධයට උපකාරකවූ අවවාදය මෙනෙහි

කරන්නෙම් නම් ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්ම හිත මහණ කිස කරණ ලද්දේ වන්නේ ය. දවාලක් ජීවත් වෙම් නම් ඉතා යෙහෙක. එක් අහරක් වළඳන තාක් කල් සිටි නම් යෙහෙක, බත් පිඩු සතරක් හෝ පසක් වළඳනතාක් කල් ජීවත් වෙම් නම් ඉතා යෙහෙක. ඒ කාලය තුළ මම බුදුසසුන සිහිකරගන්නෙමි. එසින් මා විසින් බොහෝ වූ ආත්ම හිත මහණ කිස කරණ ලද්දේ වන්නේ ය. මහණෙනි, මේ මහණ තෙම ප්‍රමාදව වෙසෙති. දන්ධ ව මරණ සතිය වඩන්නේ යයි කියනු ලැබේ. මහණෙනි, යම්කෙනෙක් මම එක් ආලොපයක් මුඛයෙහි තබා ගිලිනතාක් කල් ජීවත් වෙම් නම් යහපති, ඇතුලට වන් වාතය පිටත් කෙරෙම් ද, පිටතවූ වාතය ඇතුලට එවම් ද එතෙක් කල් ජීවත් වන්නේ නම් යහපති! යනාදී වශයෙන් මෙනෙහි කරන්නේ නම් මහණෙනි, මේ මහණහු අප්‍රමාදව වෙසෙති. ආශ්‍රවයන්ගේ ක්‍ෂයය පිණිස තීක්‍ෂණ කොට මරණ සතිය වඩන්නේ යයි කියනු ලැබේ.'' මෙසේ සතර පස් ආලොපයක් කන පමණ කල් විශ්වාස නොකටයුතු ව ජීවිත කාලය සවල්ප යයි මෙනෙහි කිරීම **අද්ධාන පරිච්ඡේද** හෙවත් **කාලපරිච්ඡේද** වශයෙන් මරණය සිහි කිරීම නම් වේ.

8. **ඛණ පරිත්තය** – පරමාර්ථ වශයෙන් සත්ත්වයන්ගේ ජීවත් වන ක්‍ෂණය ඉතා සවල්පයයි සළකා මරණය සිහි කිරීම **ඛණ පරිත්තය** නම් වේ. ජීවිතක්‍ෂණය එක චිත්තක්‍ෂණයක් පමණ වූ ම කාලයක් වන්නේ ය යම්සේ පෙරළෙන්නා වූ රථ චක්‍රය එකම නෙම් ප්‍රදේශයකින් පෙරළේ ද, සිටිනා කල්හි එකම නෙම් ප්‍රදේශයකින් සිටී ද; එපරිද්දෙන් ම සත්ත්වයන්ගේ ජීවිතය එකම චිත්තක්‍ෂණයක් ඇත්තේ ය. සත්ත්ව තෙම යම් වර්තමාන චිත්තක්‍ෂණයෙකින් ජීවත්වේ යයි කියනු ලැබේ ද, ඒ චිත්තය නිරොධයට හෙවත් භඞ්ගයට ගිය මාත්‍රයෙහි ම ඒ නිරුද්ධ වූ චිත්ත සමන්විත සත්ත්වයා ද නිරුද්ධය – මෙළේ යයි කියනු ලැබේ.

නිරුද්ධවූ චිත්තක්ෂණයෙහි සත්ත්ව තෙම ජීවත් විය. ඒ නිරුද්ධ චිත්තක්ෂණයෙන් දැන් ජීවත් වෙමින් සිටියේ ද නොවෙයි. මතු ජීවත් වන්නේ ද නොවෙයි. අනාගත චිත්තක්ෂණයෙහි ජීවත්වූයේ ද නොවෙයි. ජීවත් වෙමින් සිටිනේ ද නොවෙයි. මතු ජීවත් වේ. වර්තමාන චිත්තක්ෂණයෙහි ජීවත් වූයේ ද නොවෙයි. ජීවත් වෙමින් සිටිනේය. මතු ජීවත් වන්නේ නොවේ.

ජීවිතය ද, ආත්මභාවය ද, සුඛ දුක්ඛ වේදනාව ද යන මෙය එක චිත්තක්ෂණයෙකින් යුක්තය. ජීවිතක්ෂණය ද වහා පෙරළෙයි. මියයන්නාහුගේ යම් නිරුද්ධ වූ ස්කන්ධයෝ වෙත් ද, දැන් ජීවත්වන පුද්ගලයාගේ නිරුද්ධ වූ ස්කන්ධයෝ වෙත් ද, චුතික්ෂණයෙහි නිරුද්ධ වූ ස්කන්ධයෝ ද සමානය. ගැළපීමක් නැතිවම නිරුද්ධ වූහ.

නූපන් සිතින් මේ ලෝකයෙහි සත්ත්වයා නූපන්නේය. වත්මන් සිතින් ජීවත් වෙයි. චිත්තයාගේ භඞ්ගයෙන් මැරුණේ වේ. ඒ ඒ ධරන සිත් නිසා යම් සන්තාන ප්‍රඥප්තියක් ඇද්ද එය නොනස්නේ ය. මෙසේ ජීවිතක්ෂණයාගේ පරිත්ත භාවය සැළකීමෙන් මරණය සිහි කළ යුතු වේ.

මෙසේ මේ අට ආකාරයන් අතුරෙන් එක්තරා ආකාරයකින් මරණය සිහි කරන්නහුට නැවත නැවත මනසිකාර වශයෙන් කමටහන් අරමුණු කොට ඇති සිත ආසේවනය ලැබීමෙන් එකඟ වන්නේ ය. මරණය අරමුණු කොට ඇති සිහිය පිහිටයි. නීවරණ හෝ විෂ්කම්භනය වෙති. ධ්‍යානාඞ්ගයෝ පහළ වෙති. මරණ අරමුණ ස්වභාව ධර්මයක් හෙයින් ද, සංවේග උපදවන හෙයින් ද ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නොව උපචාර ප්‍රාප්තවේ.

අනුසස් වශයෙන් වනාහි මේ මරණානුස්මෘති භාවනායෙහි යෙදුණු මහණ තෙම හැම වේලේම සංවේග බහුල බැවින් අප්‍රමත්ත වෙයි. සියලු භවයන්හි අනභිරති සංඥාව ලබන්නේ ය. ජීවිත නිකාන්තිය දුරු කෙරෙයි. අනිත්‍ය

සංඥ ලබන හෙයින් පාපයෙහි ගර්හා කෙරෙයි එහෙයින්ම සන්නිධි බහුල නොවෙයි. පිරිකරෙහි පහවූ මළ හා මසුරු ඇතිවෙයි. මේ යෝගිහට අනිත්‍ය සංඥව ද පුරුද්දට යෙයි. ඒ අනුසාරයෙන් දුක්ඛ සංඥ, අනාත්ම සංඥ ද වැටහෙයි. යම්සේ භාවිතා නොකළ මරණ සතිය ඇති තැනැත්තෝ සිංහාදි ව්‍යාල මෘගය, යක්ෂය, සර්පය, සොරුය, වධකය යන මොවුන් විසින් මඩනා ලද්දවුන් මෙන් මරණ කාලයෙහි භයට, ත්‍රාසයට සම්මොහයට පැමිණෙද්ද, එසේ නොපැමිණ නිර්භය ව ම, අමුළා වී කාලක්‍රියා කෙරෙයි. ඉදින් මෙම ජන්මයෙහි නිර්වාණය සාක්ෂාත් නොකෙළේ නම් කායයාගේ භෙදයෙන් සුගති පරායන වන්නේ ය.

## 8. කායගතාසතිය

මේ **කායගතාසති** කමටහන බුද්ධොත්පාදයෙහි දී මිස අන් කලෙක නොලැබෙන්නේ ය. එය තීර්ථකයන්ට විෂය නොවේ. ශරීරය අශුභයයි දනිතුදු කර්මස්ථාන වශයෙන් වඩන්නට ඔව්හු නොදනිති. භාග්‍යවතුන් වහන්සේ ද නොයෙක් සූත්‍රයන්හි මේ කායගතා සතිය නොයෙක් ආකාරයෙන් වදාළ සේක. "මහණෙනි, එක ධර්මයක් වඩන ලද්දේ, බහුල කරන ලද්දේ, මහත් සංවේග පිණිස පවතී. එසේම මහත් අර්ථය පිණිස ද චතුර්විධ යෝගයෙන් ක්ෂෙම බව පිණිස ද, හැම තැනම සමෘතියගේ අවිප්‍රවාසය පිණිස හා සත්‍යසථානික සම්ප්‍රජන්‍යය පිණිස ද, විදර්ශනා ඥනයාගේ අධිගමය පිණිස ද, මෙම ආත්මභාවයෙහි සුවසේ වසනු පිණිස ද, ත්‍රිවිද්‍යාය, නිර්වාණය, සතරශ්‍රාමාණ්‍ය ඵලය යන මොවුන්ගේ ප්‍රත්‍යක්ෂ කරණය පිණිස ද පවතී. ඒ එක ධර්මය නම් **කායගතා සතියයි.** මහණෙනි යම් කෙනෙක් කායගතා සතිය ධ්‍යානයට සමවැදීම වශයෙන් වළඳද් ද, ඔහු නිර්වාණයාගේ අධිගමයට හේතු බැවින් ද අමෘතයක් හා සමාන බැවින් ද අමෘතය වළඳත්. යම් කෙනෙක් කායගතා සති නොවළඳද් ද, ඔහු අමෘතය

නොවළඳත්. යම් කෙනෙකුන් විසින් කායගතා සතිය වැළඳිණි නම් ඔහු නිවන් වළඳයි. යමෙක් කායගතා සතිය නොවළඳූ නම් ඔහු නිවන් නොවළඳයි. පිරිහිණි නම් නිවන් පිරිහෙළන ලදී. නොපිරිහිණි නම් නිවන් නොපිරිහිණි. වැරදිණි නම් නිවන වැරදිණි. නොවැර දිණි නම් නිවන් නොවැරදිණි."

මේ කායගතා සතිය වඩා, බහුලීකෘත කොට මහත්ඵල මහානිසංස ලැබීම පිණිස තුදුස් ආකාරයකින් හෙවත් තුදුස් පර්වයන්ගේ වශයෙන් වැඩිය යුතු. ඒ තුදුස් පර්වයෝ නම්:—

1 ආනාපාන පබ්බය

2 ඉරියාපථ පබ්බය

3 චතුසම්පජඤ්ඤ පබ්බය

4 පටික්කූල මනසිකාර පබ්බය

5 ධාතු මනසිකාර පබ්බය

6-14 නවවිධ සීවථික පබ්බය

යන තුදුස් පර්වයෝ ය.

යට දක්වන ලද තුදුස් පබ්බයන් අතුරෙන් **ඉරියාපථ පබ්බය, චතුසම්පජඤ්ඤ පබ්බය, ධාතුමනසිකාර පබ්බය** යන ත්‍රිවිධ පර්වයෝ විදර්ශනා වශයෙන් වදාරන ලදී. **නවවිධ සීවථික පබ්බයෝ** විදර්ශනා ඥානයෙහි ම ආදීනවානු-පස්සනා වශයෙන් වදාරන ලදී. එහි උද්ධුමාතකාදියෙහි යම් සමාධි භාවනාවක් සිධ වේ නම් එය අසුභ කර්මස්ථාන භාවනායෙහිදී දක්වන ලදී. මෙහිදී දැක්විය යුත්තේ **ආනාපාන පබ්බය** හා **පටික්කූලමනසිකාර පබ්බයයි. එයිනුත් ආනාපානපබ්බය, ආනාපානසති** වශයෙන්

වෙනම කර්මස්ථානයෙකි. **පටික්කූලමනසිකාර** වශයෙන් යම් ඒ දෙතිස් ආකාර කර්මස්ථානයෙක් දේසනා කරන ලද ද මේ කමටහන ම මෙහි **කායගතාසති** යයි දත යුතු.

**කායගතා සති** භාවනායෙහි යෙදෙන යෝගාවචර තෙම, සතර මහා භූතයන් සන්නිශ්‍රය කොට ඇති, කුණු වූ, පරම දුර්ගන්ධ වූ මේ කය, පාදතලයෙන් මතුයෙහි, කේසාග්‍රයෙන් යට, සමින් පිරිසිඳිනා ලදුව, නානාප්‍රකාර කේශාදී අශුචියෙන් හරිතය. ඒ මේ කයෙහි **කෙශයෝ** ඇත. එසේම මේ කයෙහි **ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හෘදය, යකනමාංශ, බඩදිව, දලබුව, පපුකැන්, අතුණු, අතුණුබහන්, උදරිය, මල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේදතෙල්, කඳුළු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳමිදුළු, මූත්‍ර, හිස් මොළය** යන දෙතිස් කුණප කොට්ඨාසයෝ ඇත්තාහ.

**කාය** නම් ශරීරයයි. අසූචි රැසක් බැවින් ද කුත්සිත වූ, පිළිකුල් වූ කෙශාදීන්ගේ ද, චක්ෂුරොගාදී රෝග ශතයන්ගේ ද උත්පත්තිස්ථාන වන හෙයින් ද **කාය** යයි කියනු ලැබේ. බඹයක් පමණ වූ මේ කායයෙහි සර්වෝත්සාහයෙන් සොයන්නේ ද, කිසිවෙක් කිසි මුත්තක් හෝ මැණිකක් හෝ වෛදූර්‍ය්‍යයක් හෝ කලු වැලක් හෝ කොකුමක් හෝ කපුරක් හෝ වත්සුණු ආදී යමක් හෝ අණුප්‍රමාණද කිසි සුචි සවභාවයක්, සුචි වස්තුවක් නොදකී. අතිශයින් දුර්ගන්ධ වූ, පිළිකුල් වූ, අශ්‍රීක දර්ශන ඇති අනේකප්‍රකාර වූ කෙස් ලොම් ආදි භෙද ඇති අශුචි ම දකී.

**කායගතා සති** කමටහන වඩනු කැමති වූ ආදිකර්මික කුලපුත්‍රයා විසින් යට කියන ලද ප්‍රකාර ඇති කල්‍යාණ මිත්‍රයෙකු කරා එළඹ මේ කමටහන ගත යුතු. කමටහන් කියන්නහු විසිනුදු සත්පරිච්ඡේදකින් උද්ග්‍රහකෞශල්‍යය ද, දසපරිච්ඡේදෙකින් මනසිකාර කෞශල්‍යය ද කිය යුතු.

**සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යයෝ නම්:—**

1. **වචනයෙන්**
2. **සිතින්**
3. **වර්ණ වශයෙන්**
4. **සණ්ඨාන වශයෙන්**
5. **දිසා වශයෙන්**
6. **අවකාශ වශයෙන්**
7. **පරිච්ඡෙද වශයෙන්**

යන මේ සත් පරිද්දෙන් කමටහන ඉගෙණීමයි.

**1. වචනයෙන්**— මේ ප්‍රතික්කූල මනසිකාර කර්මස්ථාන යෙහි වනාහි යමෙක් ත්‍රිපිටකධර වූයේ නමුදු ඔහු විසින් පළමුව වචනයෙන් කීමෙන් ම සජ්ඣායනා කළ යුතු. ඇතමෙකුට වනාහි වචනයෙන් සජ්ඣායනා කරන්ම කමටහන පගල වේ. මලයවාසී මහාදෙව නම් තෙරුන් සමීපයෙන්, තෙරහු දෙනමක් කමටහන් ඉල්වන ලදුව සාර මසක් මෙයම "කෙසා, ලොමා, නඛා, දන්තා, තචො" යනාදී වශයෙන් පාළිය සජ්ඣායනා කරවයි අවසර ලැබ, ගෞරවයෙන් කමටහන ගෙන, සාරමස සජ්ඣායනා කරන්නාහුම සොවාන් වූහ. එබැවින් දෙතිස් ආකාර පටිකකූල මනසිකාරය වචනයෙන් සජ්ඣායනා කරන්නාහු විසින්, එය තච පඤ්චකාදී වශයෙන් බෙදා, අනුලොම ප්‍රතිලොම වශයෙන් සජ්ඣායනා කටයුතු. එහි පිළිවෙල මෙසේ යි:–

පළමුකොට **"කෙසා, ලොමා, නඛා, දන්තා, තචො"** යයි අනුලොම වශයෙන් ද, නැවත, **"තචො, දන්තා, නඛා, ලොමා, කෙසා"**, යයි ප්‍රතිලොම වශයෙන් ද කියයුතු. මෙය මෙසේ කියා ප්‍රගුණ වූ කල්හි **වක්කපඤ්චකය** ඉගෙණ එපරිද්දෙන් ම සජ්ඣායනා කට යුතු.

**වක්ක පඤ්චකය**- "**මංසං, නහාරූ, අට්ඨි, අට්ඨිමිඤ්ජං, වක්කං**", යයි අනුලෝම වශයෙන් ද, "**වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨි, නහාරූ, මංසං**", යයි ප්‍රතිලෝම වශයෙන් ද කිවයුතු. මේ වක්ක පඤ්චකය ප්‍රතිලෝම වශයෙන් කියන කල්හි තච පඤ්චකය ද එයට සම්බන්ධ කොට කීම වඩා යෝග්‍ය වේ. එනම්: **වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨි, නහාරූ, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා**" කියායි.

එයට අනතුරුව, **පප්ඵාස, පඤ්චකයද**, "**හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං**", යයි අනුලෝම වශයෙන් කියා නැවත ප්‍රතිලෝම වශයෙන් "**පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨි, නහාරූ, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා**", යයි වචනයෙන් කියා ප්‍රගුණ කටයුතු.

ඉක්බිතිව **මත්ථලුඞ්ග පඤ්චකය** ද, අනුලෝම වශයෙන් "**අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුඞ්ගං**" යයි කියා නැවත ප්‍රතිලෝම වශයෙන් "**මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨි, නහාරූ, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා**" යයි කියා ප්‍රගුණ කළ යුතු.

මෙසේ **තච පඤ්චකය, වක්ක පඤ්චකය, පප්ඵාස පඤ්චය, මත්ථලුඞ්ග පඤ්චකය** යන සතර පඤ්චක වශයෙන් විසි කොටස් සජ්ඣායනා කොට නැවත **මෙද ඡක්කය** හා **මුත්ත ඡක්කය** ද එපරිද්දෙන් ම පිළිවෙළින් සජ්ඣායනා කළ යුතු.

**මෙදඡක්කය** වනාහි, "**පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො**", යයි අනුලෝම වශයෙන් ද, නැවත පටිලෝම වශයෙන් "**මෙදො, සෙදො, ලොහිතං,**

**පුබ්බො, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං; කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා අට්ඨි, න්හාරු, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා"** යයි සජ්ඣායනා කොට ප්‍රගුණ කළ යුතු.

ඉක්බිතිව **මුත්තඡක්කය ද, අස්සු, වසා, ඛෙළො, සිඞ්ඝාණිකා ලසිකා මුත්තං"** යයි අනුලොම වශයෙන් කියා නැවත ප්‍රතිලොම වශයෙන් **"මුත්තං, ලසිකා, සිඞ්ඝාණිකා, ඛෙළො, වසා, අස්සු, මෙදො, සෙදො, ලොහිතං, පුබ්බො, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, න්හාරු, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා"**, යයි කියා ප්‍රගුණ කළ යුතු.

මෙසේ සජ්ඣායනා කරණ කල්හි කෙශාදී කොට්ඨාස-යන්ගේ **වණ්ණ නිමිත්තය, සණ්ඨාන නිමිත්තය, දිසා නිමිත්තය, ඕකාස නිමිත්තය, පරිච්ඡෙද නිමිත්තය** යනාදී වශයෙන් එකී එකී කොටස් මෙවැන්න යයි සලකා සජ්ඣායනා කටයුතු. මෙසේ කාල ශතසහශ්‍රයකුදු වචනයෙන් සජ්ඣායනා කරන්නම කමටහන් පෙළ පුහුණු වෙයි. අන් අරමුණක සිත නොදුවයි. දෙතිස් කොටස් ප්‍රකට වෙයි.

**2. සිතින්-** වචනයෙන් දෙතිස් කොටස්හු සජ්ඣායනා කළාක්මෙන් සිතින් ද සිතිය යුතු. වචසින් කරණ සජ්ඣායනාව මනසින් කරණ සජ්ඣායනාවට උපකාරවේ. බොහෝ කලක් සිතින් කමටහන මෙනෙහි කරන්නාහට දෙතිස් කොට්ඨාසයන් මුළු පටන් අග දක්වා කිසිතැනක නොපැකිළ නිතරම වැටහෙයි. මනසින් සජ්ඣායනා කිරීම අශුභ ලක්ෂණ ප්‍රතිවෙධයට හෙවත් පිළිකුල් ස්වභාවය වටහා ගැනීමට උපකාර වේ.

**3. වර්ණ වශයෙන්** — කෙස්, ලොම්, නිය, දත් ආදීන්ගේ නීල, රක්ත, සෙවතාදි වර්ණ වශයෙන් ද මේ දෙතිස් කොට්ඨාසයන් ව්‍යවස්ථා කොට මෙනෙහි කිරීම වර්ණ වශයෙන් උද්ග්‍රහ කෞශල්‍යය වඩාගැණීම නම් වේ.

**4. සණ්ඨාන වශයෙන්** — කෙසාදීන්ගේ සටහන් ව්‍යවස්ථා කොට හෙවත් නියම කොට දෙතිස් කොට්ඨාශයන් මෙනෙහි කිරීම සණ්ඨාන වශයෙන් උද්ග්‍රහ කෞශල්‍යය ඇතිකර ගැනීම වේ.

**5. දිසා වශයෙන්** — මේ සිරුරෙහි නාභියෙන් උඩ කොටස උපරිම දිසාය හෙවත් මතු දිසාවය. එයින් යට කොටස හෙට්ඨිම දිසාය හෙවත් යට දිසාවය. එහෙයින් දෙතිස් කොට්ඨාසයන් අතුරෙන් මේ මේ කොටස් මේ මේ දිශාවන්හිය යනාදි වශයෙන් නියම කොට, පිරිසිඳ මෙනෙහි කිරීම දිසා වශයෙන් ව්‍යවස්ථා කිරීම නම් වේ.

**6. අවකාස වශයෙන්** — දෙතිස් කොටසුන් අතුරෙන් මේ මේ කොටස් මේ මේ අවකාසයෙහිය යනාදී වශයෙන් සළකා ව්‍යවස්ථා කිරීම අවකාස වශයෙන් මෙනෙහි කිරීම නම් වේ.

**7. පරිච්ඡෙද වශයෙන්** — පරිච්ඡේදය දෙවැදෑරුම්වේ. එනම්, **සභාග පරිච්ඡේදය** සහ **විසභාග පරිච්ඡේදය** යි. **සභාග පරිච්ඡේදය** නම් තම තමාගේ කොටසින් ම වන පරිච්ඡේද යයි. අන් කොටසකින් වන පරිච්ඡේදය **විසභාග පරිච්ඡේද** නම් වේ. මේ කොටස, යටද, මත්තෙහි ද, සරසද, මෙනම් දෙයකින් පිරිසිඳිනා ලද්දේ යයි සැළකීම සභාග වශයෙන් පරිච්ඡේද කිරීම ය. කේශයෝ නම් ලොම් නොවෙති. ලෝමයෝ ද කෙස් නොවෙති, යනාදී වශයෙන් ඒ ඒ කොටස්හු අන් කොටසින් අමිශ්‍ර බැව් හෙවත් නොමුසු බැව් වශයෙන් මෙනෙහි කිරීම විසභාග වශයෙන් දෙතිස් කොට්ඨාශයන්ගේ උද්ග්‍රහ කෞශල්‍යය ලබා ගැනීම නම් වේ.

මෙසේ ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් වචනයෙන් ද, සිතින් ද, වර්ණ වශයෙන් ද, සණ්ඨාන වශයෙන් ද, දිසා වශයෙන් ද, අවකාස වශයෙන් ද, පරිච්ඡෙද වශයෙන් ද මේ දෙතිස් කොට්ඨාසයන් මනාකොට කියාදී, නැවත ද අසුවල් සූත්‍රයෙහි මේ දෙතිස් කොටස්හු ම පිළිකුල් වශයෙන් ද, අසුවල් සූත්‍රයෙහි ධාතු වශයෙන් ද යනාදී ක්‍රමයට භාග්‍යවතුන් වහන්සේ විසින් දක්වන ලද බව කියාදිය යුතු. එනම් **මහා සතිපට්ඨාන සූත්‍රයෙහි** මේ දෙතිස් ආකාර කමටහන පිළිකුල් වශයෙන් දේශනා කරණ ලදී. **මහා හත්ථිපදෝපම සූත්‍රයෙහි ද, රාහුලෝවාද සූත්‍රයෙහි ද, පුක්කුසාති සූත්‍රය** හා **විභඞ්ගප්‍රකරණය** සහ **ධාතු විභඞ්ග පාලියෙහි** ද ධාතු වශයෙන් වදාරණ ලදී. **කායගතාසති සූත්‍රයෙහි** වනාහි යමෙක්හට කෙශාදීහු වර්ණ වශයෙන් වැටහුණුහු නම් ඒ පුද්ගලයා සඳහා කෙසාදීන් කෙරෙහි වර්ණ කසිණාලම්බනික වූ සතර ධ්‍යානයන්ගේ වශයෙන් බෙදා දක්වන ලදී. එම සූත්‍රයෙහි ධාතු වශයෙන් කියන ලද්දේ විදර්ශනා කර්මස්ථානය වේ. පිළිකුල් වශයෙන් වදාරණ ලද්දේ ශමථ කර්මස්ථානය නම් වේ.

මෙසේ සත් පරිද්දෙකින් උද්ග්‍රහ කෞශල්‍යය කියාදී ඉක්බිතිව දශවිධ මනස්කාර කෞශල්‍යය ද කියා දියයුතු. **දශවිධ මනස්කාර කෞශල්‍යයෝ** නම්:—

**1. අනුපූර්ව වශයෙන්**

**2. නාතිශීඝ්‍ර වශයෙන්**

**3. නාතිශනික වශයෙන්**

**4. වික්ෂෙප දුරුකිරීම් වශයෙන්**

**5. ප්‍රඥප්ති ඉක්මීම් වශයෙන්**

**6. අනුපූර්වමුඤ්චන වශයෙන්**

7. **අප්පණා වශයෙන්**

8. **අධිචිත්තසූත්‍ර වශයෙන්**

9. **සීතිභාව සූත්‍ර වශයෙන්**

10. **බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍ර වශයෙන් ය.**

**1. අනුපුබ්බ වශයෙන්**- මේ කමටහන පුහුණු කිරීමට ආරම්භ කළ තැන් පටන් කෙසාදී කොට්ඨාසයන් පිළිවෙලින්, මැදින් එකකුදු නොහැර අනුපූර්ව වශයෙන් මෙනෙහි කළ යුතු. දෙතිස් පෙත්තක් ඇති හිණ මගින් නගින්නා වූ අදක්ෂ පුද්ගල තෙම මැදින් එකක් හැර හැර නගින්නේ නම්, වහා කලාන්තව වැටෙන්නේ ද, එපරිද්දෙන් ම එක් කොටසකුදු මැදින් හැර සජ්ඣායනා කරන්නාවූ යෝගාවචර තෙමේ ද භාවනා සම්පත්ති වශයෙන් පැමිණිය යුතුවූ භාවනාස්වාදයට නොපැමිණීමෙන්, කලාන්ත සිත් ඇත්තේ, භාවනාවෙන් පිරිහී ලක්ෂණ ප්‍රතිවෙධයට නොපැමිණෙන්නේය.

**2. නාතිශීඝ්‍ර වශයෙන්**- එසේ දෙතිස් ආකාර කමටහන පිළිවෙලින් සජ්ඣායනා කරන්නාවූ පුද්ගලයා විසින් ඉතා ඉක්මන්ව මෙනෙහි නොකට යුතු. යම් සේ තුන් යොදුන් මග පිළිපැද යා යුතු නො යා යුතු මග නොසළකා ශීඝ්‍ර ගමනින් සියක් වරක් හෝ ගමනාගමනය කරන පුරුෂයා හට ද, යා යුතු මග අවසන් වූවත් යායුතු නොයා යුතු මග විචාරාම යා යුතු වේ ද, එපරිද්දෙන් ම දෙතිස් ආකාරයෙන් සීඝ්‍රව මෙනෙහි කරන්නාහට කෙළවරට පැමිණියේ වී නමුත් කමටහන විභූත ව නොවැටහෙන්නේ ය. එහෙයින් දෙතිස් කොටසුන් සජ්ඣායනා කරන කල්හි නාතිශීඝ්‍ර වශයෙන් මෙනෙහි කළ යුතු.

**3. නාතිසණික වශයෙන්**- නාතිශීඝ්‍ර වශයෙන් දෙතිස් කොටසුන් යම්සේ මෙනෙහි නොකළ යුතු ද, එපරිද්දෙන් ම ඉතා සෙමෙනුදු මෙනෙහි කටයුතු නොවේ. තුන්යොදුන්

මග යනු කැමති පුරුෂයාහට, අතරමග පර්වත තටාකාදියෙහි විසිතුරු බලමින් යෙත් නම්, ඒමග ගෙවා යාමට දෙතුන් දිනක් හෝ ගතවන්නේය. එපරිද්දෙන් ම දෙතිස් කොටසුන් සෙමෙන් මෙනෙහි කරන්නාහට කර්මස්ථානයාගේ පයර්‍යාව ශානයට යාමක් නොවන්නේ ය. පිළිකුල් වශයෙන් වැටහීමක් නොවේ. කමටහන කෙළවරට නොයන බැවින්ම විශෙෂාධිගමයට ද ප්‍රත්‍යය නොවන්නේ ය.

**4. වික්‍ෂෙප දුරුකිරීම් වශයෙන්**- භාවනා කර්මස්ථානය හැර පිටත රූපාදී අරමුණෙහි සිත නොහෙළිය යුතු. එක් පියවරකට සීමාවූ හෙවත් ඒකපදික ප්‍රපාත මාර්ගයට පිළිපන් පුරුෂයා තබන පය නොසලකා ඔබිමොබ බලමින් යන්නේ, පියවර වැරදිව තැබීමෙන් ප්‍රපාතයෙන් හෙන්නේය, එපරිද්දෙන් ම පිටත වික්‍ෂෙපය ඇති කල්හි කමටහන පිරිහෙයි, නැසෙයි. එහෙයින් වික්‍ෂෙප දුරු කිරීම් වශයෙන් කමටහන මෙනෙහි කළ යුතු.

**5. ප්‍රඥප්ති ඉක්මවීම් වශයෙන්**- කෙශය ලොමය යනාදී වශයෙන් පණවන ලද යම් ප්‍රඥප්තියක් ඇද්ද, ඒ කෙසාදී ප්‍රඥප්තිය ප්‍රතික්කූල මනසිකාරයෙන් උගුළුවා පිළිකුල් යයි සිත තැබිය යුතු. ප්‍රඥප්තිය ඉක්මවූ බැවින් ම ඒ ඒ කොටස් පිළිකුල් වශයෙන් ම සිතට වැටහෙති. යම්සේ ජලය දුර්ලභ කාලයක මනුෂ්‍යයෝ අරණ්‍යයෙහි ළිඳක් දැක, එතැන තාල පත්‍රාදිය බැඳීමෙන් යම් සංඥවක් හෙවත් ලකුණක් කොට, ඒ සලකුණෙන් අවුත් නහද්ද, පැන් බොද්ද, යම් කලෙක මිනිසුන්ගේ නිතර නිතර ගමනාගමනයෙන් ආගිය පාද පහළවේ ද, එකල්හි පූර්වයෙහිදී කළ සලකුණෙන් වැඩක් නොවේ ද, කැමති කැමති කෙණෙහි ගොස් නහන්නාහු ද, පැන් බොන්නාහු ද වෙති. එපරිද්-දෙන් ම පූර්වභාගයෙහි කෙශය, ලොමය ආදී ප්‍රඥප්ති වශයෙන් මෙනෙහි කරන්නාහට පිළිකුල් බව පහළ වෙයි. පසුව භාවනාව වීපිප්‍රතිපන්න කළ කෙසය, ලොමය යන ප්‍රඥප්තිය ඉක්මවා ඒ ඒ කොටසුන්ගේ පිළිකුල් ආකාරයෙහි ම

භාවනා සිත පිහිටුවිය යුතු. මේ උපමාවෙහි යෝගාවචර තෙම මිනිසුන් වැනිය. කෙසාදි ප්‍රඥප්තිය තල්පත් ආදියෙන් කළ සළකුණ වැනි ය. දෙතිස් කොට්ඨාශයෝ ළිඳෙහි පැන් වැනිය. යෝගාවචරයාගේ පූර්වභාගයෙහි කේසා, ලෝමා යනාදී ප්‍රඥප්ති වශයෙන් මෙනෙහි කිරීම, ඒ සළකුණෙන් ගොස් ළිඳෙහි පැන් නැහැම, බීම මෙනි. යෝගාවචරයාගේ මනස්කාර බලයෙන් ප්‍රඥප්තිය ඉක්ම පිළිකුල් ආකාරයෙහි සිත පිහිටුවා භාවනාවෙහි යෙදීම, නිතර හැසිරීමෙන් ළිඳට මග පහළ වූ කල තල්පත් සළකුණ අත්හැර පා ගමනින් සැදුනු මගින් මිනිසුන් පැමිණ නහන, පානය කරණ කෘත්‍යය වැනිය.

**6. අනුපුබ්බ මුඤ්චන වශයෙන්** - මේ දෙතිස් කොටසුන් අතුරෙන් නොවැටහෙන නොවැටහෙන කොටස් අත්හැර වැටහෙන කොටස ගෙණ නැවත නැවත මෙනෙහි කරන්නහු විසින් අර්පණා ඉපදවිය යුතු.

**7. අප්පණා වශයෙන්**- කෙසාදි කොටස් අතුරෙන් එකි එකී කොටස්හි අර්පණා ප්‍රාප්තවීමය.

**8. අධිචිත්ත සූත්‍ර වශයෙන් ද,**

**9. සීතිභාව සූත්‍ර වශයෙන් ද,**

**10. බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍ර වශයෙන් ද** මනසකාර කෞශල්‍යය උපදවා ගත යුතු. මෙහි විස්තරය යට කියන ලද කායානුපස්සනා සතිපට්ඨාන විස්තරයෙන් බලා දත යුතු.

මෙසේ මේ සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍ය සංඛ්‍යාත විධි මනාකොට ඉගෙන, මේ දශවිධ වූ මනසකාර කෞශල්‍යය සංඛ්‍යාත විධි මනාකොට සැළකීම් වශයෙන් නිශ්චය කොට ඒ යෝගාවචරයා විසින් කමටහන මනාකොට උගත යුතු. ඉදින් ඒ යෝගීහට ආචාරීන් සමග එක වෙහෙරම විසීම පහසුවී නම් මෙසේ විස්තර වශයෙන් නො කියවා, මතු

මත්තෙහි කියවිය යුතු. අන් තැනක වසන්නේ නම් යට කියන ලද පරිදි විස්තර වශයෙන් කියවා කමටහන් පෙළ පුහුණු බවට පමුණුවන්නේ නැවත නැවත වචනයෙන් මනසින් පිරිවහා සියලු ගැටළු තැන් බිඳ, අර්ථ ඉගෙන පඨවි කසිණ භාවනාවෙහි කියන ලද පිළිවෙළින් භාවනාවට නුසුදුසු සෙනසුන් හැර සුදුසු විහාරයක වාසය කරමින් දික් නිය කෙස් කැපීම් ආදී වශයෙන් කුඩා පළිබොධ දුරු කොට පටික්කූල මනසිකාරයෙහි පරිකර්මය කටයුතු.

මේ යෝගාවචරයා විසින් පළමු කොට කේශයෙහි නිමිත්ත හෙවත් අශුභාකාරය ගත යුතු. කෙස් එකක් හෝ දෙකක් හෝ සිඳගෙන අත්ලෙහි තබා ගෙන පළමු කොට වර්ණය නියම කටයුතු. එසේම කෙස් කැපූ තැන්හි ද, ජලපාත්‍ර යෙහි ද, යාගු පාත්‍රයෙහි ද කෙශයන් ඇත් නම් එයද බැලීම වටී. ඒ කෙශය කාලවර්ණ නම් කලු යයි ද, සෙවත වර්ණ නම් සුදු යයි ද, ඒ දෙකින් මිශ්‍ර නම් අධික වූ වර්ණය වශයෙන් ද මෙනෙහි කටයුතු. එපරිද්දෙන් ම තව පඤ්චකයෙහි දක්වන ලද ලොම්, නිය, දත් සහ සම ද බලන්නහු විසින් පළමු කොට එහි වර්ණ නිමිත්ත ගත යුතු. මෙසේ නිමිත්ත ගෙණ ඒ සියළු කොට්ඨාශයන් **වර්ණ, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡෙදයන්ගේ** වශයෙන් නිශ්චය කොට, **වර්ණය, සටහනය, ගන්ධය, නිශ්‍රය, අවකාශය** යන මොවුන්ගේ වශයෙන් පස් ආකාරයකින් පිළිකුල් බව ව්‍යවස්ථා කටයුතු.

පළමු කොට **කේශයෝ** ප්‍රකෘති **වර්ණයෙන්** කලුය. අළුත් පෙණල ඇට පැහැ බඳු පැහැ ඇත්තාහ. **සටහන්** වශයෙන් දික්වූ වටවූ තුලා දන්ඩක් බඳු සටහන් ඇත්තාහ. **දිසා** වශයෙන් මතු දිසායෙහි හටගත්හ. **අවකාශ** වශයෙන් දෙපසින් දෙකන් සිළින්ද, ඉදිරිපසින් නලලෙන් ද පිටුපසින් ගලවළුයෙන් ද වට කරන ලදුව හිස් කබල වසා සිටි කෙශයන්ට අවකාශය. **පරිච්ඡෙද** වශයෙන් කෙසයෝ හිසවසා සිටි සමෙහි වී අග පමණ වැද පිහිටියාවූ යට

තමාගේ මූල තලයෙන් ද, මතුයෙහි අහසින් ද සරස ඔවුනොවුන් විසින් ද පිරිසිඳුන ලදහ. කෙස්හු දෙදෙනෙක් එක් කෙසක් නොවෙති යනාදී වශයෙන් සැලකීම **සභාග පරිච්ඡෙද** යයි. කෙස්හු ලොම් නොවෙති. ලොම්හු කෙශයෝද නොවෙති. මෙසේ අවශෙෂ එක්තිස් කොටසුත් හා මිශ්‍රනොවූයෙන් කෙස් නම් වෙන ම කොටසෙකැයි සැලකීම **විසභාග පරිච්ඡෙද** යයි.

තවද මේ **කෙශයෝ වර්ණ** වශයෙන් ද පිළිකුල්ය. **සටහන්** වශයෙන් ද පිළිකුල්ය. එසේම **ගන්ධ** වශයෙන් ද, **ආශ්‍රය** වශයෙන් ද **අවකාශ** වශයෙන් ද පිළිකුල් ය. යහපත් වූ කැඳ පාත්‍රයක හෝ බත් පාත්‍රයක හෝ කෙස් පැහැ වැනි කිසිවක් දැක මේ හිසකෙස් මිශ්‍රය, ඉවත් කරවයි පිළිකුල් කෙරෙති. මෙසේ කෙස්හු **වර්ණ** වශයෙන් පිළිකුල්හ. රාත්‍රි කාලයෙහි අනුභව කරණ කල්හි වරා කෙන්දක් හෝ නියඳ කෙන්දක් හෝ සැපුණ හොත් මෙය කෙස් මිශ්‍රයයි ඉවත් කරයි. පිළිකුල් කරයි. තෙල්ගැල්වීම් මල්පැළඳීම්, සුවඳ දුම් කැවීම් ආදියෙන් තොරවූ කෙශයන්ගේ **ගන්ධය** අතිශයින් ම පිළිකුල් වේ. එයටත් වඩා ගින්නෙහි කෙශයන්ගේ ගඳ පිළිකුල් වේ. කෙස්හු වර්ණ සණ්ඨාන වශයෙන් පිළිකුල් නොවූවත් ගන්ධ වශයෙන් නම් පිළිකුල් ම ය. ළදරු කුමරුවාගේ වර්චස කසාවත් පැහැය, කසාය පිණ්ඩයක සටහනය. කසළ ගොඩ දමන ලද ඉදුමුණු කලු බල්ලාගේ සිරුර තල්පතකට බඳු පැහැය. වට කොට හළ සඳ නිමවූ මිහිගු බෙරයකට බඳුවූ සටහන් ඇත්තේය. ඌගේ දළ ද දූසමන් කැකුළු වැනියයි වර්චස් පිඬද, බලු සිරුරද වර්ණ සණ්ඨාන වශයෙන් පිළිකුල් නොවේ. නමුත් ගන්ධ වශයෙන් වනාහි පිළිකුල් මැයි. යම්සේ අසූචිස්ථානයෙහි ගම්වැසියන්ගේ මළ මූත්‍ර ආදිය වැගිරීමෙන් හටගත්, පිසිය යුතු පළා, සුචිත් හෙවත් පිරිසුදු බව කැමති නගර වාසීන්ට පිළිකුල් වෙද්ද, අනුභවයට සුදුසු නොවෙද්ද, එපරිද්දෙන්ම කෙශයෝ ද, ලේ, සැරව, මළ, මූත්‍ර, පිත්, සෙම් ආදීන්ගේ වැගිරීමෙන් උපන් හෙයින් පිළිකුල්හ

මෙසේ **ආශ්‍රය** වශයෙන් ද පිළිකුල් ය. තවද මේ කෙසයෝ නම් අසූචි ගොඩෙක හටගත් පුස් මෙන් **එක්තිස් කුණප** කොටසෙහිම හටගත්හ. සොහොන කසළගොඩ ආදී තන්හි හටගත් පලා **මෙන්,** අගල් ආදියෙහි හටගත් පියුම්, මහනෙල් ආදී මල් මෙන් ද, අපිරිසුදු තන්හි හටගත් බැවින් අතිශයින්ම පිළිකුල්ය. මෙසේ කෙසයෝ **අවකාශ** වශයෙන් ද පිළිකුල් ය. මෙපරිද්දෙන් ම සියලු දෙතිස් කුණප කොටස්ංශයන්ගේ ද, **වර්ණ, සණ්ඨාන, ගන්ධ, නිශ්‍රය, අවකාශ** යන මොවුන්ගේ වශයෙන් පස්පරිද්දෙකින් පිළිකුල් බව නිශ්චය කටයුතු.

එසේම **ලොම්හු** ප්‍රකෘති වර්ණයෙන් කෙශයන් මෙන් සෙසු වර්ණයෙන් තුමූසු එක්වන් කලු පැහැ නොවෙති. **කළු** පිගුවන් **වර්ණ** ඇත්තාහු වෙති. **සටහන්** වශයෙන් නැමුණු අග ඇත්තාහු වෙති. තල්මුල් බඳු සටහන් ඇත්තාහ. **දිසා** වශයෙන් උඩ යට යන දෙදිසායෙහි ම පිහිටියාහු වෙති. **අවකාශ** වශයෙන් කෙසයන් පිහිටි තැන් ද, අත් පතුල් ද හැර බොහෝ අවශෙෂ සිරුර වසා සිටි සමෙහි හටගත්තාහු වෙති. **පරිච්ඡේද** වශයෙන් වනාහි සිරුර වසා සිටි සම්හි ලෙහෙබිලි පමණක් වැද සිටියාවූ, යට තමාගේ මූලතලයෙන් ද, උඩ අහසින් ද, සරස ඔවුනොවුන්ගෙන් ද පිරිසිඳිනා ලද්දාහු වෙති. ලොමයෝ දෙදෙනෙක් එක් ලොමයක් නොවෙතියි **සභාග පරිච්ඡේද** වශයෙන් ද, ලොමයෝ කෙස් නොවෙති. කෙශයෝ ලොම්හු නොවෙති. අවශෙෂ එක්තිස් කොටස් හා අමිශ්‍රය. ලෝමයෝ නම් වෙනම කොටසෙකැයි **විසභාග පරිච්ඡේද** වශයෙන් නිශ්චය කටයුතු.

**නඛා** හෙවත් **නිය** නම් විසිනියපොත්තට නමෙකි, සියළුම නියපොතු **වර්ණ** වශයෙන් සුදුය. **සටහන්** වශයෙන් මසුන්ගේ කොරපොතු බඳු සටහන් ඇත්තාහ. **දිශා** වශයෙන් පය නියපොත්තේ යට දිශාවෙහිය. අත නියපොතු මතු දිශායෙහිය. **අවකාශ** වශයෙන් ඇඟිලි අග පිහිටියාහුය.

**පරිච්ඡේද** වශයෙන් නියෙහි දෙපස හා මුල යන තුන් දිශායෙහි ඇඟිලි කෙළවර මසින් ද, ඇතුළත ඇඟිලි පිට මසින් ද, පිට හා අග, අහසින් ද, සරස ඔවුනොවුන් විසින් ද පිරිසිඳිනා ලද්දාහුය. නියපොතු දෙකක් එක් නියපොත්තක් නො වේය. එය අන්‍ය කොටස් හා අමිශ්‍රය. නියපොතු නම් වෙනම කොටසෙකැයි **සභාග විසභාග** වශයෙන් ද විසිනියපොතුම නිශ්චය කටයුතු.

**දන්තා** හෙවත් **දත්** යනු සම්පූර්ණ දත් ඇත්තහුගේ වශයෙන් දෙතිස් දත්හුය. **වර්ණ** වශයෙන් සුදුය. **සටහන්** වශයෙන් නොයෙක් සටහන් ඇත්තාහුය. යට දත්පෙළේ මැද දත් සතර, මැටි පිඩෙක පිළිවෙලින් තබන ලද ලබු ඇට බඳු සටහන් ඇත්තාහ. ඔවුන්ගේ දෙපස එකී එකී දත් එක් මූලක් ඇත්තේය. ඉද්දමල් කැකුළකට බඳු සටහන් ඇත්තාහ. එයට ඉක්බිති එක එක දතක් මුල් දෙකක් සහ අග් දෙකක් සහිත වේ. ගැල් ධුරයෙහි අවුළුවන වහල් දඬුවට බඳු සටහන් ඇත්තේය. එයට ඉක්බිති දෙදත් හි, මුල් තුන තුන ඇත්තාහ. එසේ ම අග්තුනක් ද ඇත්තාහ. එයට ඉක්බිති දෙදත්හු සතර සතර මුල් හා සතර සතර අග් ද ඇත්තාහු වෙති. යට දත් මෙන් ම උඩ දත් ද එසේ ම ය. **දිශා** වශයෙන් මතුදිසායෙහි හට ගත්තාහු වෙති. **අවකාශ** වශයෙන් හනු ඇට දෙක්හි පිහිටියාහු වෙති. **පරිච්ඡේද** වශයෙන් යට හනු ඇට පිහිටියාවූ තමාගේ මූලතලයෙන් ද මතුයෙහි අහසින් ද, සරස ඔවුනොවුන්ගෙන් ද පිරිසිඳුනා ලද්දාහු වෙති. දත් දෙකක් එක් දතක් නොවේය. දත්හු අන්‍යවූ එක්තිස් කොටස්හු නොවෙති. වෙනම කොටසෙකැයි මෙසේ පිරිසිඳ දත යුතු.

**තච** හෙවත් **සම** සියලු සිරුර වසා සිටි සමයි. ඒ සම මතුයෙහි කළු, ශ්‍යාම, රන් ආදී වර්ණවත් සිවියක් ඇත. ඒ සිවිය සියලු සිරුරින් ගලවා පිඩුකර ගතහොත් දෙබර ඇටක් පමණ වේ. **වර්ණ** වශයෙන් ඒ සම සුදුය.

ගිනිසිළුවකින් හෝ ආයුධයෙන් හෝ පිට සිවිය පහරණ කල්හිම ඒ ශ්වෙත වර්ණය ප්‍රකට වේ. **සටහන්** වශයෙන් සිරුරෙහි සටහන ම වේ. විස්තර වශයෙන් වනාහි පය ඇඟිලිවල සම පටපණු කොෂයකට සමානය. පිටිපත්ලෙහි සම පුටබඩළපාහන හෙවත් පිටිපතුල වසා සිටිනට සැදූ පාවහනක් බඳුය. ජඞ්ඝ හෙවත් සීත් කකුලෙහි සම බත වැසූ තල්පතකට බඳු සටහන් ඇත්තේ ය. කළවෙහි සම සහල්වලින් පුරවන ලද දික් පසුම්බියක් සමානය. ආනි සදයෙහි සම දියපිරූ පෙරහන්කඩකට බඳු සටහන් ඇත්තේය. පිට සම පුවරුවක එබූ සමකට බඳු සටහන් ඇත්තේය. බඩ සම වීණා දෙණ සැදූ සමකට බඳු සටහන් ඇත්තේය. ලෙහි සම බොහෝසේ සතරැස් සටහන් ඇත්තේය. දෙ අත සම හියවුරෙහි එබූ සමකට බඳු සටහන් ඇත්තේය. පිටි අත්ලෙහි සම කරකොපුවක් හෝ පණා වැස්මකට බඳු සටහන් ඇත්තේය. අත් ඇඟිලියෙහි සම යතුරු මිටියකට බඳු සටහන් ඇත්තේය. ග්‍රීවයෙහි සම ග්‍රීවා හැට්ටයක් බඳු සටහන් ඇත්තේය. මුහුණෙහි සම කුඩා මහත් සිදුරු ඇති ඩෙබර සැලකට බඳු සටහන් ඇත්තේය. හිස සම පාත්‍රථවියක් බඳු සටහන් ඇත්තේය.

සම අරමුණු කරමින් භාවනා කරන යෝගාවචරයා විසින් උඩුතොල පටන්ගෙන උඩුමුඛයෙහි නුවණ මෙහෙයවා පළමු කොට මුහුණ වැළඳ සිටි සම ව්‍යවසථා කටයුතු. ඉක්බිති නළල් ඇට සම ද, ව්‍යවසථා කටයුතු. අනතුරුව හිසඇටය ද හිස සමට ද අතුරෙන් නුවණ මෙහෙයවා, ඇට හා සමග සම ඒකාබද්ධ බව නොසළකා හිස සම ව නිශ්චය කටයුතු. ඉක්බිති පිටිකර සම ද අනුලොම ප්‍රතිලොම වශයෙන් දකුණත සම ද, එපරිද්දෙන් ම වමත සම ද, ඉක්බිති පිට සම ද, අනුලොම ප්‍රතිලොම වශයෙන් දකුණු පය සම ද, එසේම වම් පය සම ද, ඉක්බිතිව වස්තියෙහි සමය, බඩ සමය, ලෙහි සමය, උගුරෙහි සමය, යට හනුයෙහි සමය, යටිතොල සමය යන ඒ ඒ දෙස්හි

පිහිටි සම පිළිවෙලින් ව්‍යවස්ථා කටයුතු. මෙසේ ඕලාරික ඕලාරික වූ සම හෙවත් මහත් මහත් වූ සම පරිග්‍රහ කරන්නාහට ඇතුළුමූවෙහි සම ආදී සියුම් සම ද ප්‍රකට වේ. **දිශා** වශයෙන් යට උඩ යන දෙදිසාවෙහි ම වේ. **අවකාශ** වශයෙන් සියලු සිරුර වැළඳගෙන සිටියේය. **පරිච්ඡේද** වශයෙන් යට පිහිටි තෙලෙන් ද, මතුයෙහි අහසින්ද පිරිසිඳුනා ලද්දේ වේ. ඒ ඒ තන්හි සම එකක් ම නොවේ. සම, අන්‍යවූ එක්තිස් කොටසුන්ට අයත් නොවූ වෙනම කොටසකැයි නියම කටයුතු.

**මාංස** හෙවත් **මස** නම් නවසියයක් පමණවූ මාංශ පෙශීහුය. ඒ සියල්ලම **වර්ණ** වශයෙන් රක්ත වර්ණය. කැහැල මල් බඳුය. **සටහන්** වශයෙන් ජඞ්ඝාවෙහි පිංඩි මාංසය තල්පත වැසූ බත්මුලකට බඳු සටහන් ඇත්තේය. කලවා මාංසය ඇඹරුම්ගලේ දූගල බඳුය. ආනිසද මාංසය මැටිපිඬෙන් කළ ලිපෙක කෙලවරට බඳු සටහන් ඇත්තේය. පිට මස පැදුරෙහි වනා වියළා නගා ගත් තල් ගුළි පටලයක් බඳු ය. දෙපරාළ පතු ඇට පිහිටි මස පෙතැලි රුකුසෙක තුනී කොට ඇලවූ මැටියකට බඳු සටහන් ඇත්තේය. තනයෙහි මස සිටගෙන බිමහෙළූ මැටිපිඩකට බඳු සටහන් ඇත්තේය. බාහු දෙකෙහි මාංසය දෙගුණ කොට තුබූ සමගැසූ මහ මීයෙකු බඳු සටහන් ඇත්තේය. මෙසේ මහත් මහත් වූ, ඕලාරික මාංශ පෙශී පරිග්‍රහ කරන්නාහට විළුම් මස් ආදී සියුම් මාංසයෝ ද ප්‍රකට වෙති. දිශා වශයෙන් වනාහි උඩ යට දෙදිසාවෙහි ම වූයේය. **අවකාශ** වශයෙන් තුන් සියයකට වැඩි පමණ ඇට වසා සිටි. **පරිච්ඡේද** වශයෙන් වනාහි යට ඇට සැකිල්ලෙහි පිහිටි තලයෙන් ද, මතුයෙහි සමින් ද, සරස ඔවුනොවුන් විසින් ද පිරිසිඳුනා ලද්දාහු වෙති. මාංස දෙකක් එක් මාංසයක් නොවෙති. මාංසය වෙනම කොටසෙකැයි නියම කට යුතු.

**න්හාරු** හෙවත් **නහර** නම් නවසියයක් පමණ වූ නහරවැල් ය. **වර්ණ** වශයෙන් වනාහි සියලු නහරවැල්හු ම

සේවත වර්ණය. **සටහන්** වශයෙන් නොයෙක් සටහන් ඇත්තාහ. උගුරෙහි මතුභාගයෙහි පටන් පස්මහා නහරයෝ ශරීරය වැළඳගනිමින් පෙරපසින් බස්නාහ. පස්මහා නහර කෙනෙක් පිටිපසින් බස්නාහ. පස්මහා නහර කෙනෙක් දකුණැලයෙන් බටහ. පස්දෙනෙක් වමැලයෙන් බටහ. දකුණත වෙළමින් අතට පෙරපසින් පස්දෙනෙක් බටහ. පිටිපසින් පස්දෙනෙක් බටහ. වමත වෙළමින් එසේම පස්දෙන පස්දෙන බැගින් බටහ. දකුණු පය වෙළමින් පාදයාගේ පෙරපසින් පස්දෙනෙක් බටහ. පිටිපසින් පස්දෙනෙක් බටහ. වම් පය වෙළමින් ද එසේම පස්දෙන පස්දෙන බැගින් බටහ. මෙසේ ශරීරාධාරක නම් වූ මහ නහර සැටක් කය වළඳමින් බටහ. **කණ්ඩරයහයි** කියනු ලබන්නේ ද මේ සැට නහරයන්ට ය. ඒ සියලු නහරයෝ කැණිල්ල මල් කැකුළකට බඳු සටහන් ඇත්තාහ. ඒ ඒ පෙදෙස්හි පැතිර සිටි ඒ මහ නහරට වඩා සියුම් වූ සෙසු නහරහු වනාහි හූ රෙද්දකට බඳු සටහන් ඇත්තාහ. ඔවුන්ටත් වඩා සියුම් වූ සෙසු නහරහු කිඳි නූහුලකට බඳු සටහන් ඇත්තාහ. ඔවුන්ටත් වඩා සියුම් වූ සෙසු නහරහු මහ වීණාතත් බඳු සටහන් ඇත්තාහ. සෙසු ඔවුන්ටත් වඩා සියුම් වූ නහරහු මහානූලකට බඳු සටහන් ඇත්තාහ. අතුල්පිට, පතුල්පිට නහරහු කුරුළු පාදයට බඳු සටහන් ඇත්තාහ. හිසනහරහු බාල දරුවන්ගේ හිස් දලකට බඳු සටහන් ඇත්තාහ. පිටනහර අව්වෙහි වනන ලද තෙත් දැලකට බඳු සටහන් ඇත්තාහ. සෙසු ඒ ඒ අඞ්ග ප්‍රත්‍යඞ්ගානුගත වූ නහරහු ශරීරයෙහි බහාලූ දැල්සැට්ටයකට බඳු සටහන් ඇත්තාහ. **දිශා** වශයෙන් වනාහි උඩයට දෙ දිසාවෙහි ම හටගත්හ. **අවකාශ** වශයෙන් සියලු සිරුරෙහි ඇට වැළඳගෙණ සිටියහ. **පරිච්ඡෙද** වශයෙන් යට තුන්සියයක් අස්ථින්ගේ මතුයෙහි පිහිටි තෙලෙත් ද, මත්තෙහි මස හා සම පැහැර සිටි ප්‍රදේශයෙන් ද සරස ඔවුනොවුන් විසින් ද, පිරිසිඳුනා ලද්දාහු වෙත්. නහරයෝ දෙදෙනෙක් එක් නහරයක් නොවෙති. දෙතිස් කොටස් අතුරෙන් නහරයෝ වෙනම කොටසකැයි නියම කටයුතු.

අටසී හෙවත් ඈම නම් දෙතිස් දත් ඇට හැර අවශේෂ වූ අත ඇට සූසැටෙක. පය ඇට සූසැටෙක. මාංසනිශ්‍රිත මොළොක් ඇට සූසැටෙක. විළුම් ඇට දෙකෙක. එකී එකී පාදයෙහි ගොප් ඇට දෙකෙක. ජඞ්ඝා ඇට හෙවත් සිහින් කකුලෙහි ඇට දෙකෙක. එක් දණ ඇටෙක. එක් කලවා ඇටෙක. කටියෙහි ඇට දෙකෙක. පිටිකටුයෙහි ඇට අටලොසෙක. පරාළ ඇට (ඉළඇට) සූවිස්සෙක. ළෙහි ඇට තුදුසෙක. හදඇට එකෙක. අකු ඇට දෙකෙක. පතු ඇට දෙකෙක. බාහු ඇට දෙකෙක. අග්‍ර බාහුවෙහි ඇට දෙකෙක. උගුරෙහි ඇට සතෙක. හනු ඇට දෙකෙක. එක් නාසා ඇටෙක. ඇස් ඇට දෙකෙක. කන් ඇට දෙකෙක. එක් නළල් ඇටෙක. එක් මුදුන් ඇටෙක. හිස්කබල් ඇට නවයකැයි මෙසේ මේ ආදීවූ තුන්සියයක් පමණවූ ඇටය. ඒ සියලු අසව්හුම වණ්ණ වශයෙන් සුදුය. සටහන් වශයෙන් නොයෙක් සටහන් ඇත්තාහ. ඔවුන් අතුරෙන් පය ඇඟිල්ලෙහි අගපුරුකෙහි ඇට හිඟිනි ඇට බඳු සටහන් ඇත්තාහ. මැදපුරුකෙහි ඇට පනා ඇට බඳු සටහන් ඇත්තාහ. මුල්පුරුකෙහි ඇට පණා බෙරට බඳු සටහන් ඇත්තාහ. පිටිපත්ලෙහි ඇට තැළු කැනහිල්ල අල රැසකට බඳු සටහන් ඇත්තාහ. විළුම් ඇට එකැටි තල්ගෙඩියක ලොඳ බඳු සටහන් ඇත්තාහ. ගොප් ඇට එක්කොට බැඳි කෙළනා ගෝලයක බඳු සටහන් ඇත්තාහ. ජඞ්ඝා ඇට, ගොප් ඇට පිහිටි තැන පතුනොහළ හිඳිබඩකට බඳු සටහන් ඇත්තාහ. සීන් කකුලෙහි කුඩා ඇට දරුවන් කෙළන කුඩා දුනු දඬකට බඳු සටහන් ඇත්තාහ මහත් ඇට වැහැරගිය සර්ප පිටකට බඳු සටහන් ඇත්තාහ. දණ ඇට එක් අතෙකින් විරුණු පෙණපිඬක් බඳු සටහන් ඇත්තේය. ඒ දණ ඇට, සීන් කකුලෙහි ඇට වැද සිටි තැන ඉතා උල්වූ අග ඇති ගව අඟකට බඳු සටහන් ඇත්තේ ය. කලව ඇටය නපුරුකොට සැසි වූ පොරෝ දඬුවකට බඳු සටහන් ඇත්තේය. එය කටී ඇටෙහි පිහිටි තැන ක්‍රීඩා ගෝලයකට බඳු සටහන් ඇත්තේය. ඒ කලවා

ඇටින් කටී ඇට පිහිටන ලද තැන මුහුණින් කැපූ මනා දෙඹගෙඩියක් බඳු සටහන් ඇත්තේය. කටියෙහි ඇට දෙක ඒකාබද්ධ ව සිටියාහු කුඹල් උදුනක් බඳු සටහන් ඇත්තාහ. ඒ ඇට දෙක වෙන්වෙන් ව කඹුරන්ගේ යකුළෙහි බැඳි වළලු බඳු සටහන් ඇත්තාහ. කෙළවරෙහි පිහිටි අතිසඳයෙහි ඇට අධොමුඛකොට ගත් සර්පපෙණකට බඳු සටහන් ඇත්තාහ. සත්තැනක කුඩා මහත් සිදුරු ඇත්තාහ. පිටිකටුවෙහි ඇට ඇතුළතින් මතු මතුයෙහි හකුළුවා තුබූ තුඹපතකට බඳු සටහන් ඇත්තාහ. පිටතින් හිඳිපත් වැලකට බඳු සටහන් ඇත්තාහ. ඒ පිටිකටු අතරතුරෙහි කියත්දත් බඳුවූ දෙතුන් කටුකෙනෙක් වෙත්. සූවිසි පරාළ ඇටෙහි (ඉල ඇට) නොපිරිහුන් ඇට නොපිරිහුන් දහකැති බඳු සටහන් ඇත්තාහ. පිරිහුනු ඇට පිරිහුන් දහකැති බඳු සටහන් ඇත්තාහ. ඒ සියලු ඉලඇට හැළිකුකුළකුගේ විදහාගත් පියාවට බඳු සටහන් ඇත්තාහ. ළෙහි ඇට තුදුස දිරාගිය රථ පඤ්ජරයකට බඳු සටහන් ඇත්තාහ. හදය ඇට හැඳි පෙළොත්තක් බඳු සටහන් ඇත්තාහ. අකු ඇට අත් වෑ දඬුවකට බඳු සටහන් ඇත්තාහ. පතු ඇට එක් අතකින් ගෙවුණු හෙළදිව සිදුල්ලකට බඳු සටහන් ඇත්තාහ. බාහු ඇට කැඩපත් මිටකට බඳු සටහන් ඇත්තාහ. අග්‍රබාහුවෙහි ඇට තිමුල් තල් කඳ දෙකකට බඳු සටහන් ඇත්තාහ. අත්කර ඇට, එක්කොට අලවා තුබූ හැකුළුණු තුඹපතකට බඳු සටහන් ඇත්තාහ. පිටඅත්ලෙහි ඇට තැළු කැනහිල්ල අලරුසකට බඳු සටහන් ඇත්තාහ. අත ඇඟිල්ලෙහි මුලපුරුකෙහි ඇට පණා බෙරකට බඳු සටහන් ඇත්තාහ. මැද පුරුකෙහි ඇට නොපිරිහුන් පණා ඇට බඳු සටහන් ඇත්තාහ. අග පුරුකෙහි ඇට හිඟිනි ඇට බඳු සටහන් ඇත්තාහ. උගුරෙහි ඇට සත දඬුවක පිළිවෙළින් අමුණා තුබූ වටකොට කැපූ හුණකිළිල් මඳකට බඳු සටහන් ඇත්තාහ. යටි හනු ඇට කඹුරන්ගේ යකුළක බැඳි වලල්ලක් බඳු සටහන් ඇත්තාහ. මතු හනු ඇට උක්දඬුසස්නා සැතකට

බඳු සටහන් ඇත්තාහ. ඇස්වළ, නාසාවළ ඇට, ලොඳහල ලා තල්ඇටකට බඳු සටහන් ඇත්තාහ. නළල ඇට යට බලා තුබූ සක්තලු කබලකට බඳු සටහන් ඇත්තාහ. කන්සිළු ඇට කරනැවැමියන්ගේ කරකොපුවකට බඳු සටහන් ඇත්තාහ. නළලය, කන්සිළුය යන මොවුන්ගේ මතුයෙහි පට බඳනා තැන ඇටය තෙල තුබූ කඩපටකට බඳු සටහන් ඇත්තේය. මුදුන් ඇටය මුහුණින් කැපූ ඇද පොල්ගෙඩියක් බඳු සටහන් ඇත්තේය. හිස ඇට, වසා තිබූ දිරාගිය ලබුකබලකට බඳු සටහන් ඇත්තාහ. **දිසා** වශයෙන් වනාහි උඩයට දෙදිසාවෙහි ම වූහ. **අවකාශ** වශයෙන් සියලු සිරුරෙහි ම සිටියාහ. විශේෂයෙන් වනාහි හිසෙහි ඇට උගුරු ඇටෙහි පිහිටියාහ. උගුරෙහි ඇට පිටකටු ඇටෙහි පිහිටියහ. පිටකටු ඇට කටි ඇටයෙහි පිහිටියහ. කටියෙහි ඇට කලවා ඇටෙහි පිහිටියහ. කලවෙහි ඇට **දණ** ඇටෙහි පිහිටියහ. **දණ** ඇට ජඞ්ඝා ඇටෙහි පිහිටියහ. ජඞ්ඝා ඇට ගොප් ඇටෙහි පිහිටියහ. ගොප් ඇට පිටිපතුල් ඇටෙහි පිහිටියහ. **පරිච්ඡෙද** වශයෙන් වනාහි ඇතුළ ඇට මිදුලින් ද මත්තෙහි මසින් ද, අග ද මුල ද ඔවුනොවුන් විසින් පිරිසිඳුනා ලද්දාහු වෙති. ඇට දෙකක් එක් ඇටයක් නොවෙති. ඇට නම් වෙන්වූ ම කොටසෙකැයි නියම කටයුතු.

**අට්ඨිමිඤ්ජ** හෙවත් **ඇටමිදුලු** නම් ඒ ඒ අස්තීන්ගේ ඇතුළත්හි වූ මිදුළුය. **වර්ණ** වශයෙන් සුදුය. **සටහන්** වශයෙන් මහත් මහත් ඇට ඇතුළේ මිදුළු හුණනල බහාලූ හිවූ මහා වේවැල් බඩට බඳු සටහන් ඇත්තේය. කුඩා වූ ද ඉතා කුඩා වූ ද අස්ථින්ගේ ඇතුළෙහි මිදුළු සීත් හුණු පුරුකෙහි බහාලන ලද තිවූ සිහින් වේවැල් බඩකට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් උඩයට දෙදිසා වෙහිම වූයේය. **අවකාශ** වශයෙන් අස්ථින්ගේ ඇතුළත්හි පිහිටියේය. **පරිච්ඡෙද** වශයෙන් ඇට ඇතුළු තලයෙන් පිරිසිඳින ලදහ. ඇටමිදුළු වනාහි දෙතිස් කොටසුන් අතුරෙන් වෙනම කොටසෙකැයි පිරිසිඳිය යුතු.

**වක්ක** හෙවත් **වකුගඩු** නම් එක්ව බැඳී සිටි මස්පිඬු දෙකෙකි. **වර්ණ** වශයෙන් මඳ රත්පැහැ ඇත්තේය. එරබදු ඇට සමාන වර්ණය වේ. **සටහන්** වශයෙන් වනාහි බාල දරුවන්ගේ එකටබැඳි ක්‍රීඩාගොළු දෙකකට බඳු සටහන් ඇත්තේය. එක නටුවෙහි හටගත් අඹගෙඩි දෙකකට බඳු සටහන් ඇත්තේය. **දිශා** වශයෙන් උඩ දිසාවෙහි පිහිටියේය. අවකාශ වශයෙන් ගළවළයෙන් නික්ම එක් මුලක් ඇතිව මඳක් තැන් ගොස් දෙකක්ව බෙදුනාවූ දළ නහරින් බැඳි හදයමාංසය පිරිවරා සිටියේය. **පරිච්ඡේද** වශයෙන් සියලු අතින් ම වකුගඩු කොළවරින් පිරිසිඳින ලදය. මෙය වෙන් වූ ම කොටසෙකැයි පිරිසිඳිය යුතු.

**හදය** නම් **හෘදයමාංසයයි. වර්ණ** වශයෙන් රත්පියුම් පෙත්තක පිටත බඳු පැහැ ඇත්තේය. **සටහන්** වශයෙන් පිටත පෙතිහැර යට බලාගත් පියුම් කැකුළකට බඳු සටහන් ඇත්තේය. පිටතින් සිළුටුව ඇතුළත වැටකොළු ගෙඩියක ඇතුළත බඳු සටහන් ඇත්තේය. නුවණැත්තන්ට මඳක් විදගී සිටී, නුවණ මඳවුන්ට හැකිළම සිටී. ඇතුළත දෙඹ ඇටක් පිහිටන පමණ වළක් ඇති වේ. යම් වළෙක අඩපතක් පමණ ලෙහෙ සිටී ද, යම් ලෙහෙයක් නිසා මනොධාතු, මනොවිඤ්ඤාණ ධාතු යන දෙදෙන පවතිත් ද, එලෙහෙ සහිතවූ වළ, හදය මාංස පිණ්ඩය ඇතුළත පිහිටා ඇත. ඒ මේ ලෙහෙය රාග චරිතයාහට රත් වෙයි. ද්වෙෂ චරිතයාහට කළු වෙයි. මොහ චරිතයාහට මස් සේදූ ජලය බඳු වර්ණ වෙයි, විතර්ක චරිතයාහට කොල්ලු යුෂ බඳු වර්ණ වෙයි. ශ්‍රද්ධා චරිතයාහට කිණිහිරි මලකට බඳු පැහැ ඇති වෙයි. ප්‍රඥා චරිතයාහට ප්‍රසන්නය, විශේෂයෙන් ප්‍රසන්නය, නොකැළඹුණේය, පඬුවන් වූයේය, පිරිසුදු වූයේය, ඔපදැමූ ජාතිරංග මාණික්‍යයක් මෙන් ප්‍රභාමත් වූයේයයි වැටහේ. රාග චරිතාදීන්ගේ හදවත ඇසුරු කළ ලෙය රක්ත වර්ණ වන්නේ භවාඞ්ග සිත් පවත්නා කල්හිය. සෙසු සිත් පවත්නා කල්හි ඒ ඒ සිතට සුදුසු සුදුසු පරිද්දෙන් වර්ණය වෙනස්වේ. රාග චරිතයාහට සොම්නස්

වේදනා පවත්නා කල්හි රක්ත වර්ණය වේ. දෞර්මනස් වේදනා පවත්නා කල්හි කළු වෙයි. උපෙක්ෂා වේදනා පවත්නා කල්හි පහන් තලතෙල් පැහැය වෙයි. සෞම්නස් හා උපෙක්ෂා වේදනාවන්හි ද කුසලාකුසල වශයෙන් ද වෙනස් වේ. ද්වේෂ චරිතාදීන්ට ද එසේ ම ය. **දිසා** වශයෙන් වනාහි මතු දිසාවෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් සිරුර ඇතුළත දෙතන මැද පිහිටියේය. හදය නම් මෙන්වූ ම කොටසෙකැයි ද නිශ්චය කටයුතු.

**යකන** හෙවත් **අක්මං** නම් එක්ව බැඳීසිටි මංසපටල දෙකෙකි. **වර්ණ** වශයෙන් අක්මාව රක්ත වර්ණය. පඬුවන් ස්වභාව ඇත්තේය. ඉතා රතු නොවූ කුමුදු මලෙක පෙතිපිටට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් මුලදී එක්ව තිබෙයි අගදී දෙකක් ම වෙයි. කොබෝලීල පතකට බඳු සටහන් ඇත්තේය. නුවණ මඳ වූවන්ට මහත්වූ එකක්ම වෙයි. ප්‍රඥාවන්තයන්ට කුඩාවූ දෙකෙක් හෝ තුනෙක් වෙයි. **දිසා** වශයෙන් මතු දිසායෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් දෙතන මැද, ඇතුළත දකුණුභාගයෙහි පිහිටියේය. **පරිච්ඡෙද** වශයෙන් අක්මා කෙළවරින්ම පරිච්ඡින්නය. අක්මාව මෙන්වූ ම කොටසෙකැයි ද නියම කටයුතු.

**කිලෝමක** හෙවත් **දලබුව** නම් පටිච්ඡන්න දලබුව හෙවත් සැඟවී සිටි දලබුවය, අපටිච්ඡන්න දලබුව හෙවත් නොසැඟවී සිටි දලබුවය යයි ද්විප්‍රකාර වූ වසා වැළඳගෙණ සිටිනා මසයි. ඒ ද්විප්‍රකාර දලබුවම **වර්ණ** වශයෙන් සුදුය. දුහුල්කඩකට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් තමාගේ අවකාශයට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් පටිච්ඡන්න කිලෝමකය මතු දිසාවෙහිය. අපටිච්ඡන්න කිලෝමකය දෙදිසාවෙහි ම පිහිටියේය. **අවකාශ** වශයෙන් පටිච්ඡන්න කිලෝමකය හදවත ද වකුගඩුව ද වසාගෙන සිටියේය. අපටිච්ඡන්න කිලෝමකය සියලු සිරුර සමින් යට මාංසය වැළඳගෙන සිටියේය.

**පරිච්ඡෙද** වශයෙන් යට මසින් ද, මතුයෙහි සමින් ද, සරස ක්ලොමක භාගයෙන් ද පිරිසිඳුනා ලදී. ක්ලොමකය වෙන්වූ ම කොටසෙකැයි ද නියම කටයුතු.

**පිහක** නම් බඩදිව **මාංසයයි.** එය **වර්ණ** වශයෙන් නිල් නික මලකට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් සත් අඟුල් පමණ වෙයි. බන්ධනයක් නැත්තේය. කලු වස්සෙකුගේ දිවකට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් මතු දිසායෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් හදවතට වම් භාගයෙහි උදරපටලයාගේ මතුභාගය නිසා සිටියේය. මෙය ආවුධ පහරකින් පිටත නික්මුණු කල්හි ඒකාන්ත-යෙන් ම මරණය සිදුවේ. **පරිච්ඡෙද** වශයෙන් පිහක භාගයෙන් පිරිසිඳින ලදී. එය අසම්මිශ්‍රවූ වෙන්වූ ම කොටසෙකැයි නිශ්චය කටයුතු.

**පප්ඵාස** නම් දෙතුන් මස්කඩක්ව බෙදුණු පපු මාංසයයි. **වර්ණ** වශයෙන් රක්ත වර්ණය. ඉතා විලිකුත් නොවූ දිඹුල් ඵලයකට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් නොසම කොට කැඩූ මහා කැවුමකට බඳු සටහන් ඇත්තේය. ඇතුළෙහි කා බිව් දෙයක් නැති කල්හි නැංගාවූ කර්මජ තේජෝ උෂ්ණයෙන් පහරණ ලද හෙයින් සපා හෙළූ පිදුරු සපයක් මෙන් නිරස වෙයි. ඕජස් නැති වෙයි. **දිසා** වශයෙන් මතු දිසාවෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් ශරීරය ඇතුළත දෙතන අතර හදවත හා අක්මාව මත්තෙහි වසාගෙන එල්බෙමින් සිටියේය. **පරිච්ඡෙද** වශයෙන් පප්ඵාස භාගයෙන්ම පිරිසිඳුනා ලදී. එය අන්‍යවූ කොටසුත් හා අමිශ්‍රවූ වෙන්වූ ම කොටසෙකැයි නියම කට යුතු.

**අන්ත** නම් පුරුෂයාහට දෙතිස්රියනක් පමණ ඇති, ස්ත්‍රීහට අටවිසි රියනක් පමණ ඇති, එක්විසි තැනෙක නැමුණාවූ අතුණු වැටියයි. **වර්ණ** වශයෙන් සුදුය. වැලි මිශ්‍රකොටගත් සුදු හුණු බදාමයක් බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් ලෙහෙ දෙණෙක නමා තිබූ හිස සුත්

කළු සර්ප සිරුරකට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් උඩ යට දෙදිසා වෙහිම පිහිටියේය. **අවකාශ** වශයෙන් මත්තෙහි ගලවළයෙහි ද යට කරීසමාගීය හෙවත් ගුදපියස කෙළවර කොට ඇති ශරීරාභ්‍යන්තරයෙහි පිහිටියේය. **පරිච්ඡේද** වශයෙන් අන්ත භාගයෙ පිරිසිඳුනා ලදී. අන්ත නම් අසම්මිශ්‍රවූ වෙන්වූ ම කොටසෙකැයි නියම කටයුතු.

**අන්තගුණ** නම් අතුණු නැමුණුතන්හි බැඳගෙන සිටිනා අතුණුබහන් ය. **එය වර්ණ** වශයෙන් සුදුය. හෙල්මැලි මුලකට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් ද හෙල්මැලි මූලක් බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් උඩ යට දෙදිසාවෙහිම පිහිටියේය. උදැළු පොරෝ ආදියෙන් වැඩ කරන්නවුන්ගේ අතුණුවැටි, ගිලිය නොදී එක්කොට බැඳගෙන යන්ත්‍ර අදනා කල යන්ත්‍ර පෝරුව බැඳගෙන සිටින යන්ත්‍ර සූත්‍රය මෙන් පාපිස්නා බිස්සෙහි දරණ මඬුල්ල, අතර ගිලිය නොදී සිටින බාන් වෙළු රොද්දක් මෙන්, එක්විසි අතුණුවැටි අතුරෙහි සිටියේය. **පරිච්ඡේද** වශයෙන් අන්තගුණ භාගයෙන් ම පිරිසිඳුනා ලදී. අතුණු බහන් නම් අන් කොටසුන් හා අසම්මිශ්‍රවූ, වෙන්වූ ම කොටසෙකැයි නියම කටයුතු.

**උදරිය** නම් උදරයෙහි වූ **අසිත** නම් වූ වළඳනා ලද බත් ආදිය ය, **පීත** නම් වූ බොන ලද අඹ පැන් ආදිය ය, **ඛායිත** නම් වූ කන ලද පිටියෙන් කළ කැවුම් ආදිය ය, **සායිත** නම් වූ ආස්වාද කරණ ලද අඹ මීපැණි ආදිය ය යන දෙයයි, **වර්ණ** වශයෙන් වැළඳූ අහරට බඳු පැහැ ඇත්තේ ය. **සටහන්** වශයෙන් පෙරහන සිටිල කොට බැඳි සහලට බඳු සටහන් ඇත්තේ ය. **දිසා** වශයෙන් උඩ යට දෙදිසාවෙහිම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් උදරයෙහි පිහිටියේ ය. **උදරය** නම් දෙඅතින් පෙළන ලද තෙත් සළුවෙහි මැද නැගි බුබුලක් බඳු වූ අන්ත්‍ර පටලයයි. පිටතින් සිළුටුය. ඇතුළ කුණුමස් කසළ වැසූ කිලුටු පොරෝනා කඩෙක පුප් වැනි ය. කුණුවගිය කොස් කටුවෙක

ඇතුළත වැත්නයි ද කියන්නට වටී. ඒ උදරයෙහි **තක්-කොටක** නම් පණුවෝය, **ගණ්ඩුප්පාදක** නම් පණුවෝය, **තාලහීරක** නම් වූ තල්හිරට බඳු පණුවෝය, **සූචිමුඛකා** නම් වූ හිඳිකටු වැනි තුඩු ඇති පණුවෝය, **පටතන්තුකා** නම් වූ පටහු වැනි පණුවෝ ය. **සුත්තකා** නම් වූ හූ වැනි පණුවෝය යනාදී වූ දෙතිස්කුලයෙක පණුවෝ ආකුලව්‍යාකුලව මුළු මුළුව හැසිරෙති. ආහාර පාන නොලත් කල්හි පැනනැගී හඬන්නාහු, හදය මාංස පහරති. ආහාර පාන වළඳන කල්හි ද උඩුමුඛව පළමුකොට වැළඳූ දෙතුන් ආලොපයක් යුහුව යුහුව පැහැරගෙන කති. එය ඒ පණුවන්ට සූතිඝරයක් හෙවත් වදන තිඹිරි ගෙයද වෙයි. වැසි කිළිය ද වෙයි. ගිලන්හල ද වෙයි. සොහොන ද වෙයි. චණ්ඩාල ගම්දෙර වූ ගවර වළකට ග්‍රීෂ්ම කාලයෙහි දළ පොද ඇති වැසි වස්නා කල්හි දියෙන් ගෙනයන ලද සිරුරු මලය, සම් ඇට නහරකඩය, කෙළය, මුකුණුය, ලෙහෙය යනාදී වූ නොයෙක් කුණු එකතුවී මඩදියෙන් ගැළලී, දෙතුන් දවසක් ඇවෑමෙන් හටගත්තා වූ පණු කැලන් ඇතිවූයේ, සූර්‍ය්‍යරශ්මි සන්තාප වේගයෙන් කකියන ලද්දේ, මතු මතුයෙහි පෙණ බුබුලු නගිමින් ඉතා නිල් පැහැ ඇති, ඉතා දුගඳ, පිළිකුල්ව නො එළබෙන්නට නොදක්නට සුදුසු බවට පැමිණ සිටියේ ද හිඹිනට ද, ආස්වාද කරන්නට ද. නො සුදුසු වූයේ ද වෙයි. නානාවිධ වූ ආහාරපානාදිය දත් නමැති මොහොලින් සුණු කරන ලද්දේ, දිව් නමැති දතින් පෙරළන ලද්දේ, අඟදිව තුනී කෙළින් හා මුල්දිව බොල් කෙළින් වළඳනා ලද්දේ, එකෙණෙහි ම පහවූ වර්ණ, ගන්ධ, රස යනාදී සම්පත් ඇත්තේ, රෙදි වියන්නන්ගේ නාතු සේ ද, බල්ලන් නගාලූවක් සේ ද වැ, පිත්, සෙම්, වායුවෙන් වළඳනා ලදු ව ජඨරාග්නි සන්තාප වේගයෙන් කකියන ලද්දේ, පණුවන් විසින් ආකුලව මතුමත්තෙහි පෙණ බුබුලු නගමින් ඉතා කුණුගඳ පිළිකුල් බවට පැමිණ සිටීද, යමෙක් එය අසාද ආහාර පානාදියෙහි පිළිකුල් බව පිහිටා ද, උදරය

එවැන්නක් යයි නුවණැසින් බලන්නාහට වැටහෙන්නේ මැයි. උදරයෙහි පතිත වූ ආහාරපානාදිය පස් ආකාරයකට බෙදෙයි. එක් භාගයක් පණුවෝ කති. එක් භාගයක් ජඨරාග්නියෙන් දැවෙයි. එක් භාගයක් මූත්‍ර බවට පැමිණෙයි. එක් භාගයක් සිරුර මල බවට පැමිණෙයි. එක් භාගයක් රස බවට පැමිණ ලෙහෙ මස් ආදීන් වඩවයි. **පරිච්ඡෙද** වශයෙන් වනාහි උදර පටලයෙන් ද, උදරිය නම් වූ නොපැසුණු අහර භාගයෙන් ද පිරිසිඳුනා ලදී. උදරිය නම් අසම්මිශ්‍ර වූ, වෙන්වූ ම කොටසකැයි ද නියම කටයුතු.

**කරීස** නම් වර්චසයි. **වර්ණ** වශයෙන් බොහෝ සේ වැළඳූ අහරට බඳු වර්ණ ඇත්තේම වේ. **සටහන්** වශයෙන් අවකාශයට බඳු සටහන් ඇත්තේ වේ. **දිසා** වශයෙන් යට දිසාවෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් පක්වාසයෙහි පිහිටියේය. පක්වාසය නම් යට නාභියෙහි හා පිටකටුවෙහි මූලය යන මොවුන්ගේ අතුරෙහි අතුණු කෙළවර, උසින් අට අඟුලක් පමණ වූ හුණ නළක් වැනිවූයේය. යම්සේ උස්වූ භූමි ප්‍රදේශයෙහි හුණු වැසි දිය ගලාගෙන විත් වට භූමි ප්‍රදේශය පුරාසිටී ද, එපරිද්දෙන් ම යම්කිසි ආමාශයෙහි පතිත වූ බත් පැන් ආදියක් ඇද්ද එය උදරාග්-නියෙන් පෙණ නැගි නැගී පැසුණේ ඇඹරුම් ගලෙන් අඹරණ ලද්දක් මෙන් සිලිටු බවට පැමිණ අතුණු සිදුරෙන් ගලාබැස, හුණු නළෙක බහාලන ලද පඬුවන් මැටියක් මෙන් රැස්ව සිටී. **පරිච්ඡෙද** වශයෙන් පක්වාසය පටල යෙන් ද කරීසභාගයෙන් ද පිරිසිඳුනා ලදය. කරීසය නම් අසම්මිශ්‍ර වූ වෙන් වූ ම කොටසෙකැයි නියම කටයුතු.

**මත්ථලුඞ්ග** නම් හිස්කබල් අතුරෙහි සිටි මිදුළු රැසයි. එය **වර්ණ** වශයෙන් සුදුය. නයි හතු පිඩක් බඳු වර්ණ ඇත්තේ ය. දී බවට නොපැමිණි පැතුරුණු කිරකට බඳු පැහැ ඇත්තේ ය යි ද කියන්නට වටී. **සටහන්** වශයෙන් වනාහි අවකාශයට බඳු සටහන් ඇත්තේ ය. **දිසා** වශයෙන් උපරිම දිසාවෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් හිස්

කබල් ඇතුලෙහි සතර ගෙත්තම් මග තිසා එක්කොට තුබූ සතර පිටිපිඩක් මෙන් එක්ව සිටියේය. **පරිච්ඡේද** වශයෙන් හිස්කබල් අතුරෙහි ඇතුලත තලයෙන් ද, හිස්මොළ භාගයෙන් ද පිරිසිඳුනා ලදහ. මත්ථලුඞ්ගය අසම්මිශ්‍ර වූ වෙනම කොටසෙකැයි ද නිශ්චය කටයුතු.

**පිත්ත** නම් **බද්ධ පිත්තය, අබද්ධ පිත්ත** යයි දෙවැදෑරුම් වූ පිත්තය. එයින් **බද්ධ පිත, වර්ණ** වශයෙන් බොල්මී තෙලකට බඳු වර්ණ ඇත්තේ ය. **අබද්ධ පිත** මැලවුණු රණවරා මල් බඳු වර්ණ ඇත්තේ ය. **සටහන්** වශයෙන් ඒ දෙපිත ම ස්වකීය අවකාශ සංස්ථානය බඳු ය. **දිසා** වශයෙන් අබද්ධ පිත, කේශය, ලෝමය, නිය ය, දත් ය යන මස්රහිත තැන් හා දැලි වියලි සම ද හැර දියෙහි පැතිරෙන තෙල් බිඳක් මෙන් සෙසු සිරුර පැතිර සිටියේ ය. අබද්ධ පිත කිපුණු කල්හි ඇස් කසාවන් වෙති. හිසකරකැවිල්ල ඇතිවේ. ශරීරය කම්පාවෙයි. කැසීම ඇතිවේ. බද්ධ පිත හදවත හා පපු අතුරෙහි අක්මා මාංසය තිසා පිහිටියා වූ මහ වැටකොලු වසල්ලක් බඳු වූ පිත් කොශයෙහි පිහිටියේ ය. බද්ධ පිත කිපුණු කල සත්ත්වයෝ උමතුවෙති. සිහි විපර්‍යාස වෙති. හිරි–ඔතප් දෙක හැර නො කටයුතුදේ කෙරෙති. නො බිණිය යුතු දෙය බෙණෙති. නොසිතිය හැකි දෙය සිතති. **පරිච්ඡේද** වශයෙන් වනාහි පිත්ත භාගයෙන් පිරිසිඳුනා ලදහ. පිත නම් අසම්මිශ්‍ර වූ වෙනම කොටසෙකැයි ද නිශ්චය කටයුතු.

**සෙම්හ** නම් ශරීරය තුළ පාත්‍රයක් පුරාලන පමණ වූ සෙමය. **වර්ණ** වශයෙන් සෙවත වර්ණ ඇත්තේය. කැලිය කොළ මිරිකූ දියක් බඳු වර්ණ ඇත්තේ ය. **සටහන්** වශයෙන් තමා සිටින අවකාශය බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් උඩ දිසාවෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් උදර පටලයෙහි පිහිටියේ ය. ආහාර පාන වළඳනා කල කැට කැබිලිති වැටීමෙන් දිය සෙවෙල් දෙබේ කොට බෙදී නැවත පැතිර ගෙණ සිටීද, එපරිද්දෙන් ම බත් පැන් ආදිය වැටුණු

කල්හි සිදි දෙකක් ව නැවත පැතිරගෙන සිටී. සෙම මදවූ කල්හි පැසුණු ගඩක් මෙන් ද, කුණුවූ කුකුළු බිජුවටක් මෙන් ද, උදරය ඉතා පිළිකුල්වූ කුණුගඳ වෙයි. එයින් නැංගාවූ ගඳින් ද, තැලිද, මුඛය ද දුගීඣ වූයේ කුණුවූයේ, කුණපයක් බඳුවෙයි. ඒ මිනිස් තෙම පවා පහව, දුගඳ වහන්නේ යයි කිවයුතු බවට ද පැමිණේ. සෙම වැඩී බොල් බවට පැමිණියේ වැසිකිළියෙහි පියන් පෝරුවක් මෙන් උදරපටලයාගේ ඇතුළෙහිම කුණුගඳ ඔබාගෙන සිටී. **පරිච්ඡෙද** වශයෙන් වනාහි සෙම්භභාගයෙන් පිරිසිඳුනා ලද්දේ ය. සෙම නම් අසම්මිශ්‍රවූ වෙනම කොටසෙකැයි නියම කටයුතු.

**පුබ්බ** නම් සැරවයි. ජීවමාන ශරීරයෙහි සැරව **වණී** වශයෙන් පඬුවන් පතට බඳු පැහැ ඇත්තේ ය. මළ සිරුරෙහි වනාහි කුණුවූ බොල්නියඹු කැඳක් බඳු පැහැ ඇත්තේ ය. **සටහන්** වශයෙන් වනාහි පිහිටි අවකාශ ස්ථානය බඳු සටහන් ඇත්තේ ය. **දිසා** වශයෙන් උඩයට දෙදිසාවෙහි ම වේ. **අවකාශ** වශයෙන් වනාහි නිබඳ තැනෙක් නැත. යම් යම් තැනෙක වනාහි කුණු කටු ආයුධ අග්නි ජ්වාලාදීන් පහරණ ලද ශරීර ප්‍රදෙශයෙහි ලෙහෙ රුස්ව පැසේද, ගඩපොළු ආදීහු හෝ උපදීද, සැරව ඒ ඒ තැන සිටී. **පරිච්ඡෙද** වශයෙන් පූයා භාගයෙන් පිරිසිඳුනා ලදහ. සැරව නම් අසම්මිශ්‍රවූ, වෙන්වූ ම කොටසෙකැයි නියම කටයුතු.

**ලොහිතය** නම් **සන්නිචිත ලෝහිතය** හෙවත් රුස්ව සිටිනා ලෙහෙය, **සංසරණ ලෝහිතය** හෙවත් විසිර පවත්නා ලෙහෙය යයි දෙවැදෑරුම් වූ ලෙහෙය වේ. එයින් රුස්ව සිටිනා ලෙහෙය කකාළු බොල් ලහරෙසෙහි පැහැ බඳු **වණී** ඇත්තේ ය. විසිර පවත්නා ලෙහෙ ප්‍රසන්න ලහරෙසෙහි පැහැ බඳු **වණී** ඇත්තේ ය. **සටහන්** වශයෙන් ලෙහෙය තමන් සිටිනා ස්ථානය බඳු සටහන් ඇත්තේ ය. **දිසා** වශයෙන් සන්නිචිත ලෙහෙය උඩ දිශායෙහි ද, සංසරණ

ලෙහෙය උඩයට යන දෙදිසාවෙහි ම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් වනාහි සංසරණ ලෝහිතය **කෙස්** ලොම් නිය දත්හි මස් නැති තැන් හා වියලුණු සමද හැර ධමනි ජාලානුසාරයෙන් සියලු උපාදින්න ශරීරයෙහි පැතිර පවත්නේ ය. සන්නිචිත ලෝහිතය අක්මාව පිහිටි තැනට මතු භාගය පුරා **එක්** පාත්‍රයක් පිරෙන පමණ හදවත ය, යකුය, පපුවය යන මොවුන්ගේ මත්තෙහි මඳක් මඳක් වැහෙමින් වකු, හදය, යකුන, පපු යන මොවුන් තෙමමින් සිටියේය. ඒ රුධිරය වකු හදය ආදීන් **නොතෙමෙන** කල්හි සත්ත්වයෝ පිපාසා ඇති වන්නාහු ය. **පරිච්ඡේද** වශයෙන් වනාහි ලෝහිත භාගයෙන් පිරිසිඳිනා ලදහ. ලෙහෙය නම් අසම්මිශ්‍ර වූ වෙනම කොටසෙකැයි විනිශ්චය කටයුතු.

**ස්වේද** නම් ලෝමකූපාදියෙන් වැහෙන ආපෝ ධාතුවයි. **වර්ණ** වශයෙන් ප්‍රසන්න වූ තලතෙලට බඳු පැහැ ඇත්තේ ය. **සටහන්** වශයෙන් පිහිටි තැන් බඳු ය. **දිශා** වශයෙන් දෙදිශාවෙහි ම පිහිටියේය. **අවකාශ** **වශයෙන්** ලෙහෙයට මෙන් නිබඳ පිහිටි අවකාශ ස්ථානයක් නැත. ගින්නෙන් වන තැවුලිය හිරුරැසින් වන තැවුලිය, උෂ්ණ වලාහකාදිය හේතු කොට ඇති ඍතුවිකාරය යන මේ ආදීන්ගේ කූප විවරයෙන් හා ලොමකූප විවරයෙන් වැහෙන්නේ ය. එහෙයින් ඒ සෙවදයාගේ සටහන් ද කෙස ලොමකූප විවරයන්ගේ වශයෙන් ම මෙහෙහි කළ යුතු. **පරිච්ඡේද** වශයෙන් සෙවද භාගයෙන් පරිච්ඡින්නය සෙවදය නම් අසම්මිශ්‍ර වූ වෙනම කොටසෙකැයි නිසම කටයුතු.

**මේද** නම් පැසුණු නොහොත් මිදුණු තෙලයි. **වර්ණ** වශයෙන් වනාහි පැළු කහ ගැටෙක පැහැ බඳු වර්ණ ඇත්තේය, **සටහන්** වශයෙන් ස්ථූල සිරුර ඇත්තහුගේ සම හා මස් අතුරෙහි තබන ලද කසාවත් දුහුල් රෙදි කඩකට බඳු සටහන ඇත්තේ ය. කෘශවූ ශරීර ඇත්තහුගේ ජඞ්ඝා මාංසය, කලවා මාංසය, පිටකටුව ඇසුරු කළ

පිටමස, උදර මාංසය යන මාංසයන් නිසා දෙතුන් පට-කොට තිබූ කසාවන් පැහැ ඇති දුහුල් රෙදිකඩකට බඳු සටහන් ඇත්තේ ය. **දිශා** වශයෙන් උඩයට දෙදිසාවෙහිම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ස්ථූල ශරීර ඇත්තහුගේ මුළු සිරුර පැතිර සිටියේය. කෘශ ශරීර ඇත්තහුගේ ජඞ්ඝාමාංසාදීන් නිසා සිටියේ ය. මේ මේදය තෛල සංග්‍රහයට ගියේ වී නමුත් ඉතා පිළිකුල්ය. එහෙයින් හිස ගානා පිණිස හෝ නාසා තෛලයක් වශයෙන් හෝ නොගනිත්. **පරිච්ඡේද** වශයෙන් යට මසින් ද මතුයෙහි සමින් ද, සරස මේද භාගයෙන් ද පිරිසිඳුනා ලදී. මේදය අසම්මිශ්‍රවූ වෙනම කොටසෙකැයි නිශ්චය කටයුතු.

**අස්සු** හෙවත් කඳුලු නම් ඇසින් වැගිරෙන ආපෝ ධාතුවයි. **වර්ණ** වශයෙන් පහන් තලතෙලකට බඳු පැහැ ඇත්තේ ය. **සටහන්** වශයෙන් පිහිටි අවකාශ ස්ථානය බඳු සටහන් ඇත්තේ ය. **දිසා** වශයෙන් උඩ දිසායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ඇස වළ පිහිටියේ ය. මේ කඳුලු පිත්ත කොශයෙහි සිටින පිත්තය මෙන් දෙඇස්වළ හැමකල්හිම රැස්ව නොසිටී. යම් කලෙක සත්ත්වයෝ උපන් සොම්නස් ඇතිව මහාසිනාසෙද්ද, උපන් දොම්නස් ඇතිව වලපිද්ද, හඬද්ද, එබඳුවූ ම කාලයෙක්හි ශරීරයට නොසැපවූ ඉත් හුණුවූ හෝ ඉතා කුළු අහරක් වළඳද්ද, යම් කලෙක ඒ සතුන්ගේ ඇස් ධූමය, දූලිය, වැලිය යන මේ ආදියෙන් පහරණු ලබද්ද, එකල මේ සොම්නස, දොම්නස, විසමාහාර, විසම ඍතු යනාදිය ඇතිවීමෙන් ඇස්වළ පුරා කඳුළු සිටී, නැතහොත් වැගිරෙයි. මේ කඳුලු අරමුණු කොට භාවනා කරණ යෝගාවචරයා විසින් ඇස්වළ පුරා සිටි කඳුළු ම ගෙන භාවනා කටයුතු. **පරිච්ඡේද** වශයෙන් වනාගී කඳුළුවලින් ම පිරිසිඳුනා ලද්දේ ය. කඳුළු නම් අසම්මිශ්‍ර වූ වෙන ම කොටසෙකැයි නිශ්චය කටයුතු.

**වසා නම් වුරුණු තෙලයි.** එය **වර්ණ** වශයෙන් පොල්තෙලට බඳු වර්ණ ඇත්තීය. හුණු කැඳ වත්කළ

තෙලට බඳු පැහැ ඇත්තීයයි කියන්නට ද වටී. **සටහන්** වශයෙන් නගන කල පහන් දිය පිට විසිර භ්‍රමණය වන තෙල් බිඳට බඳු සටහන් ඇත්තීය. **දිසා** වශයෙන් උඩ යට දෙදිසායෙහිම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් බොහෝසේ අත්ලය, අත්පිටය, පත්ලය, පාපිටය, දෙනාසාපුටය, නලලය, අංශකූටය යන තන්හි සිටියාය. මේ වසා තොමෝ හසන තලාදී අවකාශයන්හි හැම කල්හිම විලීනව සිටින්නී නොවේ. යම්කලෙක වනාහි අග්නි සන්තාපය, සූර්‍ය්‍ය සන්තාපය, පිටත්හි වන විසභාග ඍතුය, ඇතුලෙහි වන විසභාග ධාතුය යන මෙයින් ඒ හසන තලාදී ප්‍රදේශයෝ උෂ්ණ වූ කල නාගන කල පහන් දිය මතුයෙහි පැතිරෙන තෙලක් මෙන් ඔබිමොබ හැසිරෙති. **පරිච්ඡේද** වශයෙන් වසායෙන්ම පරිච්ඡින්නය. වසා නම් අසම්මිශ්‍ර වූ වෙන ම කොටසෙකැයි නියම කටයුතු.

**ඛෙල** නම් ඇතුළු මුවෙහි පෙණමුසුවූ ආපෝ ධාතුවයි. එය **වර්ණ** වශයෙන් සුදු පෙණට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් අවකාශ ස්ථානයට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් මතු දිසායෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් දෙකපොල් පෙදෙසින් බැස දිවෙහි පිහිටියේය. එසේත් නිතර එහි සිටියේම නොවේ. ඇඹුල් ආදී අහරක් දුටුවිට හෝ සිහිකල විට හෝ උෂ්ණ, තික්ත, කටුක ලවන, ඇඹුල යනාදීන් අතුරෙන් යම් කිසිවක් මුවතුල තුබූ විට හෝ හදය කලාන්ත වූ විට හෝ යම් කිසිවක් නිසා පිළිකුල් බව උපන් විට හෝ මේ ඛෙළය ඉපිද දෙකපොලින් බැස දිවෙහි පිහිටයි. දිව අග පිහිටි කෙල තුනීය. දිව මුල්හි පිහිටි කෙල ඝනය. මුවෙහි තබන ලද හබලපෙති සහල් ආදීවූ හෝ උෂ්ණාදීවූ හෝ යම් කිසි රස ඇති අහරක් හෝ ගංවැල්ලෙහි කණින ලද ළිඳක දිය මෙන් අවසන් නොවම තෙමා ලන්නට සමර්ථය. **පරිච්ඡේද** වශයෙන් වනාහි ඛෙලයෙන්ම පරිච්ඡින්නය. කෙල නම් අසම්මිශ්‍රවූ අන්‍යවූ ම කොටසෙකැයි නිශ්චය කටයුතු.

**සිඞ්ඝාණිකා** නම් **සොටුය.** මේ මුකුණු නම් හිස්මුලින් වැගිරෙන අසූචියෙක. **වර්ණ** වශයෙන් ළා තල් ලොඳකට බඳු පැහැ ඇත්තේය. **සටහන්** වශයෙන් අවකාශ ස්ථානයට බඳු සටහන් ඇත්තීය. දිසා වශයෙන් මතු දිසායෙහි පිහිටියාය. **අවකාශ** වශයෙන් නාසාපුටයෙහි පුරා සිටී. මේ මුකුණු නාසාපුටයෙහි හැම කල්හි රැස්ව පිහිටියේ නොවෙයි. යම්සේ පුරුෂයෙක් නෙම නෙළුම් පතෙක දී බැඳ යට කටුවෙකින් විදී ද එවිට ඒ සිදුරෙන් දී බැසයත්තේ ද, එපරිද්දෙන් ම යම් කලෙක සත්ත්වයෝ වැලපෙද්ද, හඬද්ද, විසභාග ආහාර, ඍතු ආදියෙන් හෝ ධාතු කිපි කල හෝ හිස තුළින් කුණු සෙම් බවට පැමිණ හිස්මුලින් ගලා තලු මස්තක සිදුරින් බැස නාසාපුටයන් පුරාගෙණ සිටී. නැතහොත් වැගිරෙයි. මුකුණු අරමුණු කොට භාවනා කරණ යෝගීහු විසින් නාසාපුටයන් පුරා සිටි සොටු වශයෙන් ම සලකා පරිග්‍රහ කටයුතු. **පරිච්ඡේද** වශයෙන් වනාහි සිඞ්ඝාණිකා භාගයෙන් ම පිරිසිඳුනා ලද්දීය. සොටු නම් අසම්මිශ්‍රවූ අන්‍ය කොටසෙකැයි නියම කටයුතු.

**ලසිකා** හෙවත් **සඳමිදුලු** නම් ශරීර සන්ධීන්ගේ ඇතුළත පවත්නා බෙලසුල් කුණුය. **වර්ණ** වශයෙන් කිණිහිරි ලාටුවකට බඳු පැහැ ඇත්තීය. **සටහන්** වශයෙන් අවකාශ ස්ථානයට බඳු සටහන් ඇත්තීය. **දිසා** වශයෙන් දෙදිසායෙහි ම පිහිටියේය. **අවකාශ** වශයෙන් සන්ධීන්ගේ තෙල්ලීම් කෘත්‍යය සිඩකරමින් එක්සිය අසූවක් සන්ධීන්ගේ ඇතුළෙහි සිටී. යම් කෙනෙක්හට සඳමිදුලු මඳ වේද ඔහු නැගි සිටින විට ද, හිඳින කල ද, යන එන විට ද, අතපය හකුළුවන විට ද, දිග් කරන විට ද, අස්ථිහු කට කට යන ශබ්දය කෙරෙති. අසුරු ගසන්නෙකුසේ හැසිරෙති. යොදුනක් දෙකක් පමණ වූ මග ගිය විට වායෝ ධාතුව කිපෙයි. ශරීරයට දුක්ඛ වේදනා උපදිත්. යමෙක්හට සඳමිදුලු බොහෝ වී නම් ඕහට නැගීසිටීම, බැස හිඳීම් ආදිය ඇතිකල්හි අස්ථිහු කට කට යන ශබ්දය නොකෙරෙයි.

දුරමගද ගියහට වායෝ ධාතුව නො කිපෙයි. ශරීරයෙහි දුක්ඛ වේදනාවෝ ද නූපදිත් **පරිච්ඡෙද** වශයෙන් වනාභි සඳම්දුලු භාගයෙන් ම පිරිසිඳුනා ලදය. සඳම්දුලු නම් අසම්මිශ්‍රවූ වෙන ම කොටසෙකැයි නිශ්චය කටයුතු.

**මුත්තං** හෙවත් **මූත්‍ර** නම් **වර්ණ** වශයෙන් උඳුගැරූ දියට බඳු වර්ණ ඇත්තේය. **සටහන්** වශයෙන් මුහුණින් නමා තුබූ කළය ඇතුලෙහි සිටි දියට බඳු සටහන් ඇත්තේය. **දිසා** වශයෙන් යට දිසායෙහි පිහිටියේය. **අවකාශ** වශයෙන් වස්තියෙහි ඇතුළත්හිම පිහිටියේය. වස්තියට වස්තිපුටයයි ද කියනු ලැබේ. යම්සේ ඉදුල් දිය ගහීමලාදීන් දමන දියසුත් ගවරවල ඔබන ලද මුවනැති සිලිදිය වදනා කළයෙහි ගවරවළ දිය උනාවදී ද, ඒකළයෙහි දියවදනා මගෙක් නොපෙනේ ද එපරිද්දෙන් ම සිරුරින් උනා මූත්‍රා වදී ඔහුගේ වදනා මග නොපෙනේ. නික්මෙන මග ප්‍රකටය. යම් වස්තිපුටයක් මූත්‍රයෙන් පිරුණු කල්හි පස්සාව කෘත්‍යය හෙවත් මූත්‍ර කරම්යි අදහස පහළවෙයි. **පරිච්ඡෙද** වශයෙන් වනාභි වස්තියෙහි ඇතුළතින් ද, මූත්‍ර භාගයෙන් ද පිරිසිඳනා ලදහ. මූත්‍ර නම් අසම්මිශ්‍රවූ වෙනම කොටසෙකැයි නිශ්චය කටයුතු.

මෙසේ කෙස් ආදී දෙතිස් කොටසුත් **වර්ණ, සණ්ඨාන දිසා, අවකාශ, පරිච්ඡෙද** යන මොවුන්ගේ වශයෙන් නිශ්චය කොට පිළිවෙලින් ඉතා ශීඝ්‍ර නොවය යනාදී වශයෙන් **වර්ණ, සණ්ඨාන, ගන්ධ, ආශය, අවකාශය** යන මොවුන්ගේ වශයෙන් පස්පරිද්දෙකින් පිළිකුල්යයි මෙනෙහි කරන්නාවූ යෝගාවචරයාහට කෙශාදී ප්‍රඥප්ති ඉක්මවීම් වශයෙන් පවත්නා භාවනාව කෙලවර, ඇස් ඇති පුරුෂයාහට දෙතිස් වර්ණයක් ඇති කුසුමයන්ගේ එකහුයකින් බැඳී මල්දම බලන කල්හි සියලු පුෂ්පයෝ පසු පෙරට නොව එකවරට මෙන් පහළ වේද්ද, එපරිද්දෙන් මේ කයෙහි කෙශයෝ ඇත යනාදී වශයෙන් කය බලනුවහට වර්ණාදීන්ගේ වශයෙන් නියමිත වූ පිළිකුල් ආකාරයෙන් වැටහුණු ඒ සියලු කොටස් එකවට මෙන් ප්‍රකට වෙත්.

ඉදින් ඔහු පරසන්තානයෙහි ද මනසකාරය එළවා නම් මේ සිරුර යම්සේ පිළිකුල් ද එසේම ඒ සිරුර ද පිළිකුල් යයි වැටහෙන්නේ ම ය. යම්සේ තමාගේ කොටස් ද, අනුන්ගේ කයෙහි සියලු කෙසාදී කොටසුත් ද පිළිකුල් වශයෙන් ප්‍රකටව වැටහුණු කල්හි ඇවිදුනාවූ මිනිස් තිරිසන් ආදීහු සත්ත්වාකාරය හැර කුණප කොටස් රාශි වශයෙන් ම වැටහෙත්. ඔවුන් විසින් වළඳන ලබන ආහාරපාන ආදිය ද කුණප කොට්ඨාස රාශියෙහි බහාලන ලද දූයක් මෙන් වැටහේ. ඉක්බිති ඒ යෝගීහට අනුපුබ්බමුඤ්චනාදී වශයෙන් පිළිකුල්හ, පිළිකුල්හයි නැවත නැවත තමාගේ කයෙහි කෙශාදී කොටසුන් මෙනෙහි කරණුවහට පිළිවෙලින් අර්පණා උපදී. යම් කලෙක ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ සමව, සුවිශුද්ධව පවතිද් ද එසමයෙහි අශ්‍රද්ධාදීන්ගේ දුරුවීමෙන් අතිශයවත්ව බලප්‍රාප්තවූ ධර්මයෙන් උපත්ථම්භ ලදින් විතර්කාදී ධ්‍යානාඞ්ගයෝ පටුතරව පහළවෙති. ඔවුන්ට ඉදුරා ප්‍රතිපක්ෂ බැවින් නීවරණයන් කෙලෙසුන් හා සමග විෂ්කම්භිත වෙති. උපචාරසමාධියෙන් සිත සමාහිත වෙයි. යෝගීතෙම එම නිමිත්තම සේවනය කරනුයේ, වඩනුයේ, බහුල කරනුයේ අර්පණාවට ද පැමිණෙන්නේ ය.

එහි කෙශාදීන්ගේ **වර්ණ, සණ්ඨාන, දිසා, ඔකාශ, පිරිසිඳීම්** වශයෙන් වැටහීම **උග්ගහ නිමිත්ත** නමි. හැම ආකාරයෙන් ම පිළිකුල් වශයෙන් ම වැටහීම **ප්‍රතිභාග නිමිත්ත** නමි එය ආසේවනය කරනුහට, වඩනු හට අශුභ කමටහන්හි මෙන් ප්‍රථමධ්‍යාන වශයෙන් අර්පණාව උපදී. ඒ අර්පණාතොමෝ යමක්හට එකම කොටසෙක පහළවේ ද, එක කොටසෙක හෝ අර්පණාවට පැමිණ නැවත අනික් කොටසෙක පරිකර්මය නොකෙරේ ද, ඒ යෝගීහට එකම අර්පණාව උපදී යමක්හට වනාහි නොයෙක් කොටස්හු පහළ වෙද්ද, එක් කොටසෙක ධ්‍යානයට පැමිණ නැවත අනික් කොටසෙහිදු යෝගය කෙරේ ද, යෝගීහට **මල්ලක නම් තෙරුන්ට** මෙන් කොටස් ගණනින් ප්‍රථමධ්‍යානයෝ උපදිත්. ඒ තෙරණුවෝ **දීඝභාණක අභය** නම් තෙරුන්

අත් ගෙණ ඇවැත්වූ අභය මේ පැන උගණැයි කියා මේ කාරණය කීයේය. මල්ලක නම් ස්ථවිර තෙම දෙතිස් කොටසුත් කෙරෙහි දෙතිසක් වූ ප්‍රථමධ්‍යානයන් ලද්දේය. ඉදින් රාත්‍රියෙහි එක් ධ්‍යානයකට ද, දහවල් එක් ධ්‍යාන-යකට ද සමවදී නම් නැවත මුල් ධ්‍යානයට පැමිණෙන්නේ අඩමසක් ඉක්මීමෙන් ය. ඉදින් දවස දවස එක් ධ්‍යානයකට සමවදී නම් නැවත මුල් ධ්‍යානයට පැමිණෙන්නේ මසක් ගතවීමෙන්ය. මෙසේ ප්‍රථමධ්‍යානයන්ගේ වශයෙන් සිඬවන්නාවූ මේ කමටහන වර්ණ සණ්ඨානාදීන් කෙරෙහි සමෘති බලයෙන් ම සිඬ වන බැවින් **කායගතාසති** යයි කියනු ලැබේ.

මේ කායගතාසතියෙහි යෙදුණු මහණ තෙම අරණ්‍ය සේනාසනයන්හි ද, අධිකුසලයෙහි ද නො ඇල්ම නම්වූ අරතිය ද, පඤ්චකාම ගුණයෙහි රතිය ද මැඩලන්නේ ය. අරති රතීහු ඔහු මැඩලන්නට අසමර්ථවේ. ඔහු උපන් උපන් අරති රතිහු මැඩලමින් වසන්නේ ය. එසේම භය භෛරව මැඩලන්නේ ය. භය භෛරවයෝ ඔහු නොමඬිත්. ඔහු උපන් උපන් භය භෛරවයන් මැඩලමින් වසන්නේ ය. ශීතය ද, උෂ්ණය ද, සමව ඉවසන්නේ ය. කෙශාදීන්ගේ වර්ණ භෙදය ගෙන භාවනා කිරීමෙන් සතර ධ්‍යානයන් ලබන්නේ වේ. ෂඩ්අභිඥවන් ද ප්‍රතිවේධය කරන්නේ ය.

එබැවින් නුවණැත්තෝ මෙබඳු නොයෙක් අනුසස් ඇති මේ කායගතාසතියෙහි යෙදෙන්නාහ.

## 9. ආනාපානසතිය

භාග්‍යවතුන් වහන්සේ ආනාපාන සති කර්මස්ථානයට ප්‍රශංසා කරනසේක් "මහණෙනි, නිර්වාණ භූමියට අවතරණ තීර්ථවූ යම් යම් කසිණධ්‍යාන, අශුභධ්‍යාන කෙනෙක් වෙද්ද, හුදෙක් ඔහුම ශාන්තාදී ගුණයෙන් යුක්තයෝ නොවෙති. මේ **ආනාපානසති සමාධිය ද** ශාන්තාදී ගුණයුක්තය යි" බුදුන්වහන්සේ තමන්ට ප්‍රත්‍යක්ෂ වූ සමාධිය ද, දේශනානු-

භාවයෙන් ඒ ධර්මප්‍රතිග්‍රාහක භික්ෂූන්ට ආසන්න ප්‍රත්‍යක්ෂ කරණුවෝ **"අයම්පි ඛො භික්ඛවෙ ආනාපානසති සමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති"** යනාදී වශයෙන් මේ ආනාපානසති සමාධිය භාවිතා කරන ලද්දේ බහුලීකෘත කරන ලද්දේ, ශාන්තද, ප්‍රණීතද, අසේචනකද, සුඛවිහරණද වන්නේය. උපන් උපන් ලාමක අකුසල ධර්මයන් ඇසිල්ලකින් අතුරුදහන් කරන්නේ ය, සන්සිඳුවන්නේ ය'' යනාදි වශයෙන් මේ ධ්‍යානයෙහි යෙදිය යුතුය, පිළිපැද්ද යුතුයැයි ධ්‍යානයෙහි අභිරුචිය උපදවනු සඳහා, උත්සාහ කරනු සඳහා මෙසේ ප්‍රශංසා කොට වදාළසේක.

මෙහි **ආනාපාන සති සමාධිය** නම් ආශ්වාස-ප්‍රශ්වාස දීර්ඝ හ්‍රස්වාදි විශේෂ හා සමග පිරිසිඳගන්නාවූ ස්මෘතිය හා සම්ප්‍රයුක්තවූ සමාධියයි. ආනාපාන ස්මෘතියෙහි සමාධිය හෝ ආනාපානසති සමාධි නම් වේ. **භාවිතා කිරීම** නම් උපදවන ලද වඩන ලද හෙවත් ප්‍රගුණභාවයට පත්කරන ලදය යනු අර්ථයි. **බහුලීකෘත කිරීම** නම් බොහෝ කොට පැවැත්වීම හෙවත් ආවර්ජනාදින්ගේ වශයෙන් වසීභාවයට පැමිණ, කැමති කැමති කෙණෙහි සමවැදීමෙන් නැවත නැවත පවත්වනු ලැබීමය. මෙසේ උපදවන ලද, වඩනලද නැවත නැවත පවත්වන ලද ආනාපානසති සමාධිය **ශාන්ත ද** වෙයි. **ප්‍රණීත ද** වෙයි. අශුභ කර්මස්ථාන ශාන්ත ප්‍රණීත වන්නේ ප්‍රතිවේධ වශයෙන් පමණෙකි. ආරම්මණ වශයෙන් ඖදාරික බැවින් ද, පිළිකුල් බැවින් ද ශාන්ත ප්‍රණීත නොවේ. මේ ආනාපාන සතිය වනාහි සියලු ආකාරයෙන් ම ශාන්තප්‍රණීත වේ ම ය. ආරම්මණය පරම සුඛුම බවට පැමිණ ශාන්තවේ. ශාන්තවූ, සන්හුන්වූ, අරමුණෙහි පවත්නා ධර්මය ද ශාන්ත වේ. ව්‍යූප ශාන්ත ද වේ. නිර්වෘත ද වේ. ප්‍රතිවේධ සඞ්ඛ්‍යාත අඞ්ග ශාන්ත තත්ත්වයෙන් ද ශාන්ත වේ. එසේම ආලම්බන ප්‍රණීත භාවයෙන් ප්‍රණීත ද වේ.

ආතෘපනිකර වේ. ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාත අඞ්ග ප්‍රණීත තත්ව-යෙන් ද ප්‍රණීත වේ. අතෘපනිකර වේ. එහෙයින් ශාන්ත ද, ප්‍රණීත ද වේ යයි කියන ලදී. **අසේචනක** නම් ශාන්ත ප්‍රණීත භාවය පිණිස කිසි සෙවනයක්, වත්කිරීමක් නැති බවය. අසෙචනක බැවින් ම **අනාසිත්තකය. අනාසිත්තක** බැවින් ම **අව්‍යාකීර්ණය** හෙවත් පරිකර්මාදීන් හා අසම්මිශ්‍රය. අසම්මිශ්‍ර හෙයින් ම **පාටියෙක්කය** හෙවත් වෙන්ය. **ආවේණිකය** හෙවත් අසාධාරණය. සියල්ල සවභාවයෙන් ම ශාන්තය. ශාන්තභාවයට නිමිත්ත වූ පරිකර්මයක් හෝ නැත්තේ ය. උපචාරයෙන් හෝ ශාන්ත භාවයක් වූවමනා නොවේ. සෙසු ධ්‍යානයන්ගේ ශාන්ත භාවය උපචාරක්ෂණයේදී නිවරණ විෂ්කම්භනයෙන් හා මතුයෙහි අඞ්ගයන්ගේ පහළ වීමෙන් ද සිඞවන්නේ ය. මෙහිදී එවැන්නක් නැත. මෙය ආදියෙහි පටන්ම ශාන්තප්‍රණීත වේ. තවද මේ ආනාපානසති සමාධිය **සුඛවිහාරද** වෙයි. සමවත් කෙණෙහි කායික චෛතසික සුඛ ප්‍රතිලාභයට කාරණා වන බැවින් **සුඛවිහාර ද** වේ යයි දත යුතු. ත්‍රික චතුෂ්ක ධ්‍යාන වශයෙන් හෝ උපෙක්ෂාවගේ ශාන්ත බැවින් හෝ සුඛසවභාවය වන හෙයින් සියලු ධ්‍යානයන්ගේ වශයෙන් හෝ සුඛප්‍රතිලාභයට කාරණවෙයි. ධ්‍යාන චිත්ත සමුට්ඨාන ප්‍රණීත රූපයෙන් ස්පර්ශ කරන ලද ශරීර ඇති බැවින් කායික සුඛ ප්‍රතිලාභයට කාරණ වෙයි. උපනුපන් ලාමක අකුසල ධර්මයෝ නම් ධ්‍යානයෙන් විෂ්කම්භිත නුවූ, හීනවූ, අවිද්‍යායෙන් වූ පාපධර්මයෝ ය. එය තමාගේ ප්‍රවෘත්තික්ෂණ-යේදී ම අන්තර්ධාන කෙරේ. විශේෂයෙන් ම ව්‍යුපසමනය කෙරේ හෙවත් සන්සිඳුවයි. මේ සමාධිය පූර්වභාගයෙහි පටන් නා නා විතර්ක ව්‍යුපසමය කෙරෙයි.

තවද මේ කමටහන තීක්ෂණප්‍රඥ ඇති **ඥානොත්තර-යාභටය.** ඥනොත්තරයාගේ කෙලශ ප්‍රහාණිය සෙස්සන්ගේ කෙලශ ප්‍රහාණියට වඩා සාතිශය වේ. ශ්‍රද්ධා විමුක්තයහට වඩා දෘෂ්ටිප්‍රාප්තයා ගේ කෙලශ ප්‍රහාණිය මෙති. එහෙයින්

නිමිත්ත පහළ වූ ක්‍ෂණයෙහිම අඞ්ග ප්‍රාදුර්භාවය වන හෙයින් ඇසිල්ලෙකින්ම ප්‍රතිපක්‍ෂ ධර්මයන් අතුරුදහන් කරන්නේ යයි ද සන්සිඳුවන්නේ යයි ද කියන ලදී. ශාසනිකයන්ගේ ධ්‍යාන භාවනාව බොහෝසෙයින් ම නිබ්බධභාගී ය. බුදුරජාණන් වහන්සේට වනාහි ඒකාන්තයෙන් ම නිබ්බධභාගීය වේ. මේ ආනාපාන සති කමටහන වඩා සියලු සම්‍යක් සම්බුධයන් වහන්සේලා සම්‍යක් සම්බොධියට පැමිණෙති. තවද මේ කමටහන වඩන යෝගි තෙම අනුක්‍රමයෙන් ආර්‍ය්‍ය මාර්ගයාගේ වෘද්ධියට පැමිණියේ කෙලෙසුන් සමුච්ඡේදය කෙරෙයි, සන්සිඳුවයි.

## ආනා පාන සතිය වඩන පිළිවෙල

සතර අනුපස්සනාවන් කෙරෙහි සතර චතුස්කයන්ගේ වශයෙන් මෙසේ සොළොස් තැනක් හෙවත් සොළොස් අවකාශයක් ඇති මේ ආනාපාන සති කර්මස්ථාන භාවනාව සමෘද්ධවන්නේ අන්‍ය තීර්ථකයන්ගේ නා නා ප්‍රකාර වාද ලබ්ධීන් පිළිනොගත් මේ බුද්ධ ශාසනයට ඇතුළත් වූ සම්පූර්ණ ශ්‍රමණ කරණ ධර්මයන් ඇත්තාවූ භික්‍ෂුවට ය. ආනාපාන සති කර්මස්ථානය වඩනු කැමති ඒ භික්‍ෂුව විසින් පළමුකොට ආනාපාන සති සමාධි භාවනාවට අනුරූප වූ අරණ්‍ය සේනාසනයක් හෝ වෘක්‍ෂමූල සෙනසුනක් හෝ ශූන්‍යාගාර සෙනසුනක් හෝ සොයාගත යුතු. බොහෝ කලක් රූපාදී අරමුණෙහි විසුරුණු සිත ආනාපාන සති සමාධි අරමුණට නො කැමැතිවෙයි. කුළුගොන් යෙදූ රථයක් මෙන් නොමගටම දුවයි. යම්සේ ගොපලු තෙම, කුළුදෙනගේ කිරි සියල්ලම බී වැඩුණු දුර්දම වූ හෙවත් නොදැමුණු කුළුවසු පැටවා, දමනය කරණු කැමතිවූයේ, දෙන කෙරෙන් පහකොට එකත්පස්හි මහත් ස්ථම්භයක් හිඳුවා ඒ ස්ථම්භයෙහි යොතකින් බැඳ තබන්නේ ය. ඒ වස්සා ද ඔබින් ඔබ සැලී පලායනු නොහැකිවූයේ තමා බැඳීසිටි ඒ ටැඹ මුලම හිඳිනේ හෝ හෝනේ හෝ වේ.

එපරිද්දෙන් ම මේ මහණහු විසින් ද බොහෝ කලක් රූපාරම්මණාදීන් නිසා උපදනා වූ ආස්වාද සඞ්ඛ්‍යාත රසපානයෙන් වැඩුණු නොදැමුණු සිත්හු දමනය කරනු කැමැත්තහු විසින් රූපාදී අරමුණෙන් පහකොට අරණ්‍යයට හෝ ශූන්‍යාගාරයට හෝ ප්‍රවෙශ කොට එහි ආශ්වාස ප්‍රශ්වාස නැමැති ස්ථම්භයෙහි, ස්මෘති නමැති යොතින් බැන්ද යුතු. එසේ බැඳි කල්හි ඒ යෝගීහුගේ ඒ සිත ඔබින් ඔබ සැලී ද, ප්‍රවෘජ්‍යාවෙන් පූර්වයෙහි අනාදිමත් සසර පුරුදු අරමුණු නො ලබන්නේ සිහි නමැති යොත සිඳගෙන පලා යාමට පොහොසත් නොවූයේ එම ආශ්වාස ප්‍රශ්වාස ආලම්බනයට උපචාර, අර්පනා වශයෙන් එළඹ හිඳුනේ වෙයි, හෝනේ ද වෙයි.

පූර්ව වූ සියළු බුදුවරයන් වහන්සේලාගේ ද, සමහර ප්‍රත්‍යෙක බුද්ධ, බුද්ධශ්‍රාවකයන් වහන්සේලාගේ ද විශෙෂාධිගමයට හා අන්‍ය කර්මස්ථානයෙන් අධිගත විශෙෂ ඇත්තවුන්ගේ දිට්ඨධම්ම සුඛවිහාරයට ද කාරණ වූ මේ ආනාපාන සති කර්මස්ථානය ස්ත්‍රී, පුරුෂ, හස්ති, අශ්වාදීන්ගේ ශබ්දයෙන් ආකුල වූ ග්‍රාමාන්තය නොහැර වැඩීමට පහසු නොවෙයි. සෙසු කමටහන්, අරමුණු ප්‍රකට බැවින් ග්‍රාමාන්ත සේනාසනයන්හිද ආලම්බන බලයෙන් ම වැඩියහැකි වේ. මේ කර්මස්ථානාලම්බනය සියුම් බැවින් වැඩීමට නොහැකි වේ. එහෙයින් ග්‍රාමය ඇසුරු නොකළ ආරණ්‍යයෙහිම වැඩීමට පහසු වේ. යෝගාවචරයා විසින් මේ කමටහන පරිග්‍රහ කොට ආනාපාන චතුර්ථ, ධ්‍යානය නිපදවා එම ධ්‍යානය පාදක කොට අග්‍ර ඵලය වූ අර්හත්වයට පැමිණෙනු පිණිස අගාමක අරණ්‍ය සෙනසුන සුදුසු බව භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ යෝගීහට නිවාසස්ථානෝපදේශක බැවින් වස්තුවිද්‍යාචාර්යයකු වැනි ය. වස්තුවිද්‍යාචාර්ය තෙම නුවරට සුදුසු භූමිය දැක, මනාකොට ම පරීක්‍ෂාකොට මෙහි නුවරක් තනවයි උපදේශ කෙරේ ද, සුවසේ නුවර නිමි කල්හි, රජකුලයෙන් මහත් සත්කාර ලබා ද, එපරිද්දෙන් ම යෝගාවචරයාහට සුදුසු සෙනසුන්

පරීක්ෂා කොට මෙහි කමටහන් යෙදිය යුතුය යි උපදේශ කෙරෙයි. ඉක්බිති ඒ කමටහනෙහි යෙදුණු යෝගීහු විසින් ක්‍රමයෙන් අග්‍රඵලයට පැමිණි කල්හි මෙසේ භාවනා කරනුවහට විශේෂ ප්‍රතිලාභ වේ යයි දැන කී බැවින් ඒකාන්තයෙන් ම භාග්‍යවත් සම්බුද්ධ යයි මහත් සත්කාර ලැබෙයි. තවද මේ යෝගාවචර තෙම ආරණ්‍යයෙහි එකලාව වැස අභිමතාර්ථය සිදුකරගන්නා හෙයින් දිවියෙකු වැනිය. මහ දිවි රජතෙම වනයෙහි තෘණගහනයක් හෝ පර්වත ගහනයක් හෝ නිසා සැඟවී සිට වල් මී, ගොන්, සූකර ආදී වූ මෘගයන් අල්වාගනී ද, එ පරිද්දෙන් ම මේ මහණ ද අරණ්‍ය, වෘක්ෂමූලාදියෙහි කමටහන් හි යෙදෙන්නේ භාවනා ක්‍රමයෙන් සෝවාන්, සකෘදාගාමී, අනාගාමි අර්හත් යනසතර මග ද, ආර්‍යශ්‍රී ඵල ද ලබාගණියි දත යුතු. මේ කියන ලද්දේ විවේක සුඛයෙන් යුත් අරණ්‍ය සේනාසනයයි. මේ භාවනාවට සුදුසු අන්‍ය සෙනසුනක් නම් **වෘක්ෂමූලයයි.** ජනශූන්‍ය තැනෙක්හි පිහිටි විවේකය ඇති වෘක්ෂමූලය ද ආනාපානසති සමාධි වැඩීමට සුදුසු ය. අරණ්‍යය හා වෘක්ෂමූලය මෙන්ම **ශූන්‍යාගාරය ද** මේ භාවනාවට සුදුසු සෙනසුනකි. ශූන්‍යාගාරය නම් ජනශූන්‍ය විවේක ගෘහයයි. අරණ්‍ය, වෘක්ෂමූල හැර සෙසු **පර්වත කන්දර, ගිරිගුහා, සුසාන, වන පත්‍ථ, අබ්භොකාස, පලාලපුඤ්ජ** යන සප්තවිධ සේනාසන **ශූන්‍යාගාර** වශයෙන් සළකනු ලැබේ.

මෙසේ ඒ භික්ෂූහට ග්‍රීෂ්මාදි ඍතු ත්‍රයට අනුකූල වූ ද, ශ්ලේෂ්මාදි ධාතු ත්‍රයට හා මොහාදී චරිතත්‍රයට අනුකූල වූ ද සෙනසුන් දක්වන ලදී. ග්‍රීෂ්ම කාලයෙහි ශිතල බැවින් අරණ්‍ය සෙනසුන අනුකූල වේ. ශරත් කාලයෙහි විවරණ බැවින් වෘක්ෂමූල සෙනසුන අනුකූල වේ. වැසිකල්හි වැසිවරණ බැවින් ශූන්‍යාගාරය අනුකූල වේ. ප්‍රකෘතියෙන් ම සෙම අධිකයාහට අරණ්‍යය ද, පිත අධිකයාහට වෘක්ෂ මූලය ද, වාතය අධිකයාහට ශූන්‍යාගාරය ද අනුකූල වෙති. එසේම මොහ චරිතයාහට අරණ්‍යය ද, ද්වෙෂ චරිතයාහට

වෘක්ෂමූලය ද, රාග චරිතයාහට සූන්‍යාගාරය ද අනුකූල වෙති. ඉක්බිති යෝගාවචර තෙම මෙසේ ලබාගත් සෙනසුනක, හිඳීම්, සිටීම්, සයනයකිරීම්, සක්මන් කිරීම් යන ඉරියව් අතුරෙන් හිඳීම භාවනාවට සුදුසු බව සලකා, හිඳ භාවනා කිරීමට පිළියෙළ වියයුතු. සයනය කුසිත පක්‍ෂයෙහි ද, සිටීම හා සක්මන් කිරීම උද්ධච්ච පක්‍ෂයෙහි ද, වැටෙන බැවින් ඒ ඉරියව් තුන හැර අලීනවූ ද, අනෞද්ධත්‍යවූ ද හිඳීම සුදුසු බව දක්වන ලදී. මෙසේ හිඳින්නාවූ යෝගාවචර තෙම පළඟ බැඳ උඩුකය සෘජු කොට තබා හිඳ පරිමුඛ කොට සමෘතිය තැබීමෙන් අරමුණ මෙනෙහි කළයුතු. පළඟ බැඳ හිඳීමෙන් දුඩි බව ද, උපරිම කය සෘජුකොට තැබීමෙන් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැවැත්මට සුව බව ද, පරිමුඛ කොට සමෘතිය තිබීමෙන් ආලම්බනයාගේ පරිග්‍රහයට උපාය ද දක්වන ලදී. හාත්පසින් ඌරුබද්ධාසනය බැඳ හෙවත් එරමිණිය ගොතා උඩුකය සෘජුකොට හිඳින කල්හි අටළොස් පිටකටුයෙහි ඇට කෙළවර එකක්මතු එකක් තිබෙනාසේ පිළිවෙලින් පිහිටා සිටී. එවිට සම්මස් නහරාදීහු නොනැමෙති. ඒ සම් මස් නහාරාදීන්ගේ නැමීම හේතු කොට ගෙන කෙණෙහි කෙණෙහි යම් වේදනාවක් උපදිනු ලබන්නේ නම් මේ හිඳීමෙන් ඒ වේදනාවෝ හට නොගනිත්. ඒ වේදනාවන් නූපදනා කල්හි සිත එකඟ වේ. කමටහන පහ නො වේ. කර්මස්ථාන වීථිය වෘද්ධියට ද, මහත් බවට ද පැමිණෙයි.

ඒ යෝගාවචර තෙමේ යට කී ක්‍රමයෙන් හිඳ, සමෘතිය ද එළවා ඒ සමෘතිය නොහරිමින්, සිහියෙන් යුක්තව ම ආශ්වාස කෙරේ. මොහුගේ සමෘති රහිත වූ කිසි ආශ්වාස ප්‍රවෘත්තියක් නැත්තේ ය. ප්‍රශ්වාස කරන්නේ ද එසේම සමෘතිය නොහරිමින් ම, සිහියෙන් යුක්තව ම ප්‍රශ්වාස කරන්නේ ය. එහෙයින් ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙහි දී සතොකාරීවම ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ යයි කියනු ලැබේ.

විනය අටුවායෙහි ආශ්වාස නම් පිට වන වාතය යයි ද ප්‍රශ්වාසය නම් ඇතුල් වන වාතය යයි ද කියන ලදී. සියළුම ගර්භසෙය්‍යක සත්ත්වයෝ මව් කුසින් බිහිවන කල්හි, පළමුකොට ඇතුළත තුබුණු වාතය පිටතට නික්මේ. පසුව පිටත වාතය සියුම්වූ රජස් ගෙන ඇතුළට පිවිස තල්ලේ හැපී නවතී. සූත්‍ර අටුවායෙහි වනාහි ඇතුළට පිවිසෙන වාතය ආශ්වාසය යයි ද පිටත නික්මෙන වාතය ප්‍රශ්වාසය යයි ද දක්වන ලදී. මේ භාවනා ක්‍රමයේදී සූත්‍ර අටුවා අනුව සැලකීම වරී.

සොළසාකාර වූ හෙවත් චතුෂ්ක සතරකින් යුක්තවූ මේ ආනාපානසති භාවනා ක්‍රමයෙහි පළමුවන චතුෂ්කය විස්තර කරනු ලැබේ.

## ප්‍රථම චතුෂ්කය

**1 දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති**
**දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති**

**2 රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති**
**රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති**

**3 සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති**
**සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති**

**4 පස්සම්භයං කාය සංඛාරං අස්සසිස්සාමීති සික්ඛති**
**පස්සම්භයං කාය සංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.**

මෙහි සාමාන්‍ය අර්ථය නම්:—

1. දීර්ඝකොට ආශ්වාස කරමින් දීර්ඝකොට ආශ්වාස කරමියි දැනගන්නේය.

   දීර්ඝකොට ප්‍රශ්වාස කරමින් දීර්ඝකොට ප්‍රශ්වාස කරමියි දැනගන්නේය.

2. ලුහුඬුකොට ආශ්වාස කරමින් ලුහුඬුකොට ආශ්වාස කරමියි දැනගන්නේය.

ලුහුඬුකොට ප්‍රශ්වාස කරමින් ලුහුඬුකොට ප්‍රශ්වාස කරමියි දැනගන්නේය.

3. සියලු ආශ්වාස කාය ප්‍රකට කොට දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

සියලු ප්‍රශ්වාස කාය ප්‍රකට කොට දනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

4. ඖදාරික කාය සංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

ඖදාරික කාය සංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

ඒ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ යම් දිග් ලුහුඬු බවෙක් වේද්ද එය කාල වශයෙන් දතයුතු. මනුෂ්‍යයන් කෙරෙහි සමහර කෙනෙක් හස්ති, සර්පාදීන් මෙන් කාල වශයෙන් දීර්ඝකොට ආශ්වාස ප්‍රශ්වාස ප්‍රබන්ධයෝ පවත්වත්. සමහර කෙනෙක් බලු ශශ ආදීන් මෙන් හ්‍රස්වකොට ආශ්වාස ප්‍රශ්වාස ප්‍රබන්ධයෝ පවත්වත්. එහෙයින් ඒ සත්ත්වයන්ගේ කාල වශයෙන් දීර්ඝ වේලාවක් නික්මෙන්නාවූ ද, වදනාවූ ද ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ දීර්ඝයහ යයි ද, ස්වල්ප කාලයක් නික්මෙන්නාහු ද, වදනාහු ද ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ හ්‍රස්වයහ යි ද දතයුත්තාහුය.

මේ යෝගීතෙම නවආකාරයකින් දීර්ඝකොට ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ මම දීර්ඝකොට ආශ්වාස ප්‍රශ්වාස කරමියි දැන ආශ්වාස ප්‍රශ්වාස කළයුතු. එසේ දැනගත් ඕහට දීර්ඝ ආශ්වාස හ්‍රස්ව ආශ්වාස, දීර්ඝ ප්‍රශ්වාස හ්‍රස්ව ප්‍රශ්වාස යන සතරාකාරයෙන් හෝ මතු කියනු ලබන නවආකාරයෙන් එක් ආකාරයෙකින් හෝ කායානුපස්සනා සතිපට්ඨාන භාවනා සමෘද්ධ වන්නේය.

යෝගාවචර තෙම යට කියන ලද පරිදි සුදුසු සෙනසුනෙක්හි පළඟ බැඳ හිඳ උඩුකය සෘජු කොට තබාගෙන, පරිමුඛ කොට සිහිය එළවා ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙහිම සිත පිහිටුවා ගැනීමට උත්සාහ කටයුතු. බුදුරජාණන් වහන්සේ ආදිකර්මිකයාහට කම්ස්ථාන වශයෙන් වදාළේ යට දැක්වූ ප්‍රථම චතුෂ්කය පමණය. සොළසාකාරයෙන් ඉතිරි චතුෂ්ක තුන, මේ ප්‍රථම **චතුෂ්කය වැඩීමෙන් ධ්‍යානලත් පුද්ගලයාහට වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා වශයෙන් වදාළහ.** එබැවින් මේ කම්ස්ථානය වඩා ආනාපාන චතුර්ථධ්‍යානය පදස්ථාන කොට ඇති විදර්ශනායෙන් සිව්පිළිසිඹියා සමග අර්හත්වය ලබනු කැමති ආදිකර්මිකයා විසින් පෙර දක්වන ලද පරිද්දෙන් සිල් පිරිසුදු කර ගැනීම් ආදී වශයෙන් සියලු පූර්වකෘත්‍යයන් සම්පූර්ණ කොට ආචාර්‍ය්‍යවරයෙකු කරා එළඹ, **උග්ගහ, පරිපුච්ඡා, උපට්ඨාන, අප්පණා, ලක්ඛණ** යන සන්ධි පසින් යුත් කම්ස්ථානය ඉගෙන ගතයුතු. **උග්ග්‍රහය** නම් කම්ස්ථාන ග්‍රන්ථය ඉගැන්මයි. **පරිපුච්ඡා** නම් කමටහන් ග්‍රන්ථයාගේ අර්ථ විචාරය නොහොත් අර්ථ වශයෙන් සැක තැන් විචාරා උගැණීමයි. **උපට්ඨාන** නම් කමටහන වැටහීමය. මෙසේ භාවනායෙහි යෙදෙනුවහට මේ කමටහන්හි මෙසේ නිමිත්ත උපදියි යනාදි වශයෙන් උගැනීමය. **අර්පණා** නම් මේ කම්ස්ථානය වැඩීමෙන් මෙසේ ධ්‍යානය හෙවත් අර්පණාව වත්තේයයි උගෙනීමය. **ලක්ෂණ** නම් කම්ස්ථානයාගේ ස්වභාවයයි. **ගණනා, අනුබන්ධනා, ඵුසනා** යන මොවුන්ගේ වශයෙන් භාවනාව වඩා **ඨපනාවට** පැමිණීම ද, එයින් මතුයෙහි ද **සල්ලක්ඛණය, විවට්ටනය, පාරිසුද්ධිය, පතිපස්සනාය** යන ආදී වශයෙන් අට ආකාරයෙන් කමටහන්හුගේ ස්වභාවය සැලකීමය. මෙසේ පඤ්චසන්ධික වශයෙන් කම්ස්ථානය ඉගෙන ගත්තේ නම් තෙමේ ද ආචාරිහු ද වෙහෙසට පත් නොවෙති. එහෙයින් මදක් කියවාගෙන බොහෝ කාලයක් පුහුණු කොට, පසසන්ධියක් ඇති කමටහන

ඉගෙන ආචාරීන් සමීපයෙහි හෝ කියන ලද ප්‍රකාර ඇති අතික් සේනාසනයක හෝ වසමින්, සිඳින ලද කුඩා පළිබෝධයන් ඇතිව, කරණ ලද බත්කිස ඇතිව, අහර වැළඳීමෙන් වන බත්මත ද දුරුකොට, තුණුරුවන් ගුණ සිහි කිරීමෙන් සිත සතුටු කොට, ආචාරීන් කෙරෙන් ගත් සියලු භාවනාවිධි එකක්වත් නොහැර සිහිකොට මේ ආනාපානසති කර්මස්ථානය මෙනෙහි කටයුතු. මේ අට ආකාර ලක්‍ෂණයන් අතුරෙන් **ගණනා** නම් ගණන් කිරීමය, **අනුබන්‍ධනා** නම් සිහිය ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ අනුගමනය වශයෙන් ස්මෘතියගේ නිරන්තරයෙන් පැවත්ම ය. **ඵුසනා** නම් ආශ්වාස ප්‍රශ්වාසයන් ගණන්නහුගේ ද ගණනාව හැර, ආශ්වාස ප්‍රශ්වාසයන් ස්මෘතියෙන් බැඳ මෙනෙහි කරන්නා හට යම්සේ අර්පණාව වේ ද එසේ සිහි බඳනාහුගේ නාසිකාග්‍රයෙහි ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ස්පර්ශ කිරීමය. **ඨපනා** නම් අර්පණාව හෙවත් සිත මනාකොට අරමුණෙහි පිහිටුවීම ය. **සල්ලක්ඛණා** නම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් හෙවත් විදර්ශනා වශයෙන් මනාකොට සැළකීම ය. **විවට්ටනා** නම් ප්‍රවෘත්ති වශයෙන් ද, නිමිත්ත වශයෙන් ද, විනිවර්තනය කිරීම හෙවත් ආර්ය මාර්ගයයි. **පාරිසුද්ධි** නම් සියලු කෙලෙසුන් සර්‍වප්‍රකාරයෙන් සන්සිඳුවීම හෙවත් ආර්ය ඵලයයි. **පටිපස්සනා** නම් විවට්ටනා පාරිශුද්ධි ආදීන්ගේ වෙන් වෙන් ව බැලීම නම් වූ ප්‍රත්‍යවේක්‍ෂණයයි.

**ගණනා** - ආදිකර්මිකයා විසින් පළමුකොට මේ කමටහන ගණනින් මෙනෙහි කටයුතු. ගණන් කරන කල්හි ද පසෙකින් අඩුව ද නො ගිණිය යුතු. එක, තුන, පස යනාදී වශයෙන් ද අතර ගණන නො කැඩිය යුතු. පසෙකින් අඩුව ගණන් තබන්නාහට සම්බාධ වූ අවකාශයෙහි චිත්තෝත්පාදය චඤ්චලවේ. ඉඩ මද ගාලෙහි ගෙරිමුල මෙනි. දසයකින් මත්තට ගණන පමුණුවන්නහුට ගණනෙහි ම සිත බැඳෙයි. කමටහනෙහි නොරැඳෙයි. ගණන අතරෙහි කඩකරන්නාහට කමටහන මුදුන් පැමිණියේදෝ හෝ නොපැමිණියේදෝහෝයි සිත චංචල බවට පත් වේ. එහෙයින් මේ දෝෂයන්

දුරු කොට ගිණිය යුතු. ගණන් කරන්නහු විසින් ද පළමු කොට දන්ධගණනින් හෙවත් වී මනිනවුන්ගේ ගණනින් ගිණිය යුතු. වී මනින තැනැත්තේ වී වලින් නැළිය පුරා එකයි කියා මල්ලට දමයි. නැවත නැළිය පුරවන්නේ කුණුරොඩු ආදියක් දුටුයේ නම් එය ඉවත දමමින් එකයි එකයි කියන්නේය. දෙවෙනි වරට නැළිය සහලින් පුරවා මල්ලට දමන්නේ දෙකයි දෙකයි කියන්නේ ය. මේ ආදී ක්‍රමයෙන් මල්ලට දමන වී නැළියම ගණන් කරන්නේ ය. එපරිද්දෙන් ම යෝගාවචරයා විසින් ද ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ වැටහුණු ආශ්වාස ප්‍රශ්වාසයන් පමණක් ම ගණියි. නොවැටහුණු ආශ්වාස ප්‍රශ්වාසයන් නොගනියි. මෙසේ බොහෝ කාලයක් වැටහෙන වැටහෙන ආශ්වාස ප්‍රශ්වාසයන් එකයි, දෙකයි, තුනයි යනාදී වශයෙන් දසය දක්වා ගණන් කරන යෝගාවචරයාහට නික්මෙන්නාවූ ද ඇතුළට වදනාවූ ද ආශ්වාස ප්‍රශ්වාසයන් ප්‍රකටව වැටහෙත්. ඉක්බිති යෝගාවචරයා මෙකී දන්ධ ගණන හැර ශීඝ්‍ර ගණන වූ ගොපල්ලන්ගේ ගිණීමෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් ගණන් කරන්නේ ය. දක්‍ෂවූ ගොපල්ලා ගල්කැට ඉනතබාගෙන රැහැන් කෙවිටි ගෙන උදෑසනින් ගාලට ගොස් ගවයන් පිටට පහරදී නැගිටුවා, දොරටු කණුව මත නැග දොරටුවට පැමිණි ගවයන් එකයි, දෙකයි යනාදී වශයෙන් ගල්කැට දමා ගණින්නේය. මුළු රාත්‍රියෙහිම අවකාශ මද ගාලෙහි තද වෙමින් සිටි ගවයෝ දොරටුවෙන් නික්මෙන්නාහු ඔවුනොවුන් ඇග ගටමින් වෙළි වෙළි වහා පිටවෙත්. එපරිද්දෙන් ම යෝගාවචර තෙමේ ද වහා වහා ගණන් කරන්නේ ආශ්වාස ප්‍රශ්වාසයන් වෙන් වශයෙන් නොසලකා නාසිකාග්‍රයට පැමිණෙන ආශ්වාස ප්‍රශ්වාසයන් ම එක, දෙක, තුන, සතර යනාදී වශයෙන් දසය දක්වා වහ වහා ගණන් කරන්නේ ය. මෙසේ කමටහන ගණන පිළිබඳ වූ කල්හි ගණන බලයෙන් ම සිත එකඟවේ. සැඩවතුරේ රිටේ බලයෙන් නැව නවත්වන්නාක් මෙනි. මෙසේ ආශ්වාස ප්‍රශ්වාස අරමුණු කරන්නාවූ යෝගාවචර තෙම ඇතුළට වදනා වාතයක් සමග සිත ද

ඇතුළට නොගෙනිය යුතු. පිටතට නික්මෙන වාතය හා සමග ද සිත පිට නොකළ යුතු. එසේ කළහොත් බාහිර අරමුණෙහි සිත රැඳිය හැකි බැවින් ඔහු විසින් නාසිකාග්‍ර-යෙහිදී ම ආශ්වාස ප්‍රශ්වාසයන් පිහිටුවා ගෙන මෙනෙහි කළ යුතු.

මෙසේ ගණන් කරමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නා වූ පුද්ගලයා විසින් ගණන් කිරීමක් නැතිව ආශ්වාස ප්‍රශ්වාස යන්හි සිත පිහිටුවා ගත හැකි වන තාක් කල් ආශ්වාස ප්‍රශ්වාසයන් ගණන් කරමින් ම භාවනා කටයුතු.

**අනුබන්ධන**– නම් ගණන් කිරීම නවත්වා සිහියෙන් යුක්ත ව නිතර ආශ්වාස ප්‍රශ්වාසයන්ට අනුව යාම ය, හෙවත් උපන් උපන් ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කිරීම් වශයෙන් සතිය නැවත නැවත පැවැත්ම ය. ඒ අනුගමනය ද ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ආදිය, මධ්‍යය, අවශානය අනුව යාම් වශයෙන් නොකළ යුතුය. පිටතට නික්මෙන වාතය ශරීරයේ නාභි ප්‍රදේශයෙන් නික්මෙන හෙයින් නාභිය ආදිය වශයෙන් ද, හදය ප්‍රදේශය මධ්‍යය වශයෙන් ද, නාසිකාග්‍රය අවසානය වශයෙන් ද සලකනු ලැබේ. ඇතුළට වදනා වාතයාගේ ආදිය නාසිකාග්‍රය ද, මධ්‍යය හදය ප්‍රදේශය ද, අවශානය නාභිය වශයෙන් ද සැලකිය යුතු. ඒ අනුව සිත ගිය හොත් සිත වික්ෂේපව, කර්මස්ථාන මනසකාරය චලනය වෙයි. එහෙයින් ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කරන සිත ඒ ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව ඇතුළට හෝ පිටතට නොයා යුතු. එසේ නොකොට **ඵුසනා** වශයෙන් ද **ඨපනා** වශයෙන් ද මෙනෙහි කටයුතු.

අනුබන්ධන වශයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව සිත තබන්නහුගේ නාසා අග ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැහැරීම **ඵුසනා** නමි. එම අරමුණෙහි සිත මනාකොට පිහිටුවීම **ඨපනා** නමි. එහෙයින් ඵුසනා ඨපනා වශයෙන් වෙනම මෙනෙහි කිරීමක් නැත. ගණනා අනුබන්ධන වශයෙන් මෙනෙහි කරන කල්හි ඵුසනා ඨපනා වශයෙන් ද මෙනෙහි

කිරීම වේ. එය පැහැදිලි කිරීම් වශයෙන් **පඞ්ගුලොපමාව ය, දොවාරිකොපමාව ය, කකචොපමාව ය** යන උපමා දක්වන ලදී.

මව් පුතු දෙදෙන නැගි ඡෝලාව පදවන පිළුතෙම ඡෝලාව මුල හුන්නේ යන්නාවූ ද එන්නාවූ ද ඡෝලාවෙහි දෙකෙළවර හා මැද දක්නේ ද, ඒ දෙකෙළවර සහ මැද ද දක්නා පිණිස වෙහෙසීමක් නොකරන්නේ ද, එපරිද්දෙන් ම මහණ තෙම උපනිබන්ධන නමැති සර්වහමූලයෙහි හෙවත් නාසිකාග්‍රයෙහි සිහියෙන් සිට ආශ්වාස ප්‍රශ්වාස නමැති ඡෝලාව මෙනෙහි කොට පිටතට නික්මෙන්නා වූ ද ඇතුළට වදනාවූ ද වාතය අනුව නොගොස් ස්පර්ශ වන්නාවූ ස්ථානයෙහි දී ම අරමුණු කොට එහිම සිත මනාකොට පිහිටුවා ගනියි. ඒ සඳහා අමුතු උත්සාහයක් ද නොකරන්නේ ය. මෙය **පඞ්ගුලොපමාව ය.**

නගර දොරටුව රකා බලා ගන්නා දොරටුපල් තෙම නුවර ඇතුළත හෝ පිටත සිටින මිනිසුන් වෙත නොගොස් දොරටුවට පැමිණි පිරිසම විමසන්නාක් මෙන් මහණ තෙමේ ද ඇතුළට වන් වාතය ද පිටතට ගිය වාතය ද අනුව නොගොස් නාසිකාග්‍ර නමැති දොරටුව ස්පර්ශ කළ ආශ්වාස ප්‍රශ්වාසයෝම අරමුණු කොට එහි ම සිත පිහිටුවා ගන්නේ ය. මෙය **දොවාරිකොපමාව** නමි.

වඩුතෙම සමබිමක තිබූ රුක් කඳක් කියතකින් ඉරන කල්හි ඔබ්මොබ යන කියත් දත්හි නොව කියත් දැති වදනා තැනම ඔහුගේ සිහිය රඳා පවතී. හැම කියත් දත්ම එහි ස්පර්ශ කෙරෙන බැවින් ඔබ්මොබ යන කියත් දත් පිළිබඳ ඔහුගේ මෙනෙහි කිරීමක් නැත. නමුත් ඔහුගේ රුක් කඳ ඉරීමේ ප්‍රයෝගය ද, කඳ ඉරීම ද, කඳ දෙකඩව යාම ද පෙනේ. ආශ්වාස ප්‍රශ්වාස මෙනෙහි කරන්නා වූ යෝගාවචරයා ද එමෙනි. මෙහි සමබිම තුබූ රුක් කඳ මෙන් නැහැ අග ගත් උපනිබන්ධන නිමිත්ත ද, කියත්

දූති මෙන් ඇතුළත පිටත යන එන ආශ්වාස ප්‍රශ්වාසයන් ද, කඳ ඉරන වඩුවාගේ සිහිය කියත් දැති වදනා තැන පවත්නාක් මෙන් යෝගීහුගේ සිහිය නැහැ අග නිමිත්තයෙහි පැවැත් ම ද, ඔබ්මොබ යන කියත් දැති පිළිබඳ මෙනෙහි කිරීමක් නැත්තාක් මෙන්, ඇතුළත වදනා පිටත නික්මෙන ආශ්වාස ප්‍රශ්වාසයන් මෙනෙහි නොකිරීම ද යන එන හැම කියත් දත් පිළිබඳ දැනීම ඇති බව මෙන් යන එන හැම ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ දැනීම ඇති බව ද, රුක් කඳ ඉරීමේ වීර්‍ය්‍යය ඇති බව මෙන් කාය චිත්තයාගේ භාවනා කර්‍මයට යෝග්‍යවන බව ද, කඳ ඉරීම් ක්‍රියාව සිඬවන්නාක් මෙන් යොගීහුගේ කෙලෙස් ප්‍රහාණිය හා විතර්ක ව්‍යපසමය ද, කඳ දෙකඩව යාම මෙන් සංයෝජන ප්‍රහාණිය හා සපතානුශයන්ගේ පහවීම ද දත යුතු. මෙසේ වූ කල්හි උපනිබන්ධන, ආශ්වාස, ප්‍රශ්වාස යන ධර්‍ම තුන එක සිතකට අරමුණු නොවනු නමුත් ඒ ධර්‍ම තුන එක සිතින් නොදන්නේ ද නොවේ. සිත වික්ෂේපයට ද නොයෙයි. ප්‍රධාන සඞ්ඛ්‍යාත වීර්‍ය්‍යය ද පෙනෙයි. භාවනානුයෝගය ද සිඬ වේ. සමාධි නම් වූ ලෞකික විශේෂයට හා ආර්‍ය්‍ය මාර්‍ගඵල නාම් වූ ලෝකොත්තර විශේෂයට ද පැමිණේ මේ කකචෝපමාව නමි.

මෙසේ ආනාපානසති භාවනාව බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද ආකාරයෙන් ම යමෙක් ශොඩෂවිධ ක්‍රමයෙන් පුරුදු කොට මනා කොට වඩන්නේ නම් හෙතෙම, වලාකුළින් මිදුණු චන්ද්‍රයා යම්සේ අඳුරු දුරු කොට ආලෝකය පතුරුවා ද එමෙන් ම අවිද්‍යා වලායෙන් මිදී රහත් මග නුවණ නැමති චන්ද්‍රා ලෝකයෙන් කෙලශාන්ධ-කාරය දුරු කොට තමාගේ සකන්ධ ලෝකය ආලෝක කරන්නේ යයි වදාරන ලදී. මේ කකචෝපමාවෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් ආ ගිය වශයෙන් මෙනෙහි නො කළ යුතු බව දත යුතු.

මෙසේ මේ කර්‍මටහන මෙනෙහි කරන්නා වූ කිසි යෝගාවචරයෙකුහට නොබෝ කලකින් ම ප්‍රතිභාග නිමිත්ත

උපදී. විතර්කාදී අවශේෂ ධ්‍යානාඞ්ගයන් ගෙන් යුත් අර්පණා නම් වූ **ධ්‍යපනාව ද** සිඞ වේ. කිසිවෙකුහට ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නිරුඞ වීමෙන් කාය විඩා සංසිඳී යාමෙන් කයත් සිතත් සැහැල්ලුවී ශරීරය අහසට නැගෙන ආකාරයට ද පැමිණේ. ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට මෙසේ භාවනා කරන්නා වූ යෝගාවචරයාහට ක්‍රමයෙන් ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුඞව ගිය කල්හි සියුම් වූ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තයන් අරමුණු කොට ඇති සිත පවතී. ඒ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තයන් ද නිරුඞව ගිය කල්හි එයටත් වඩා සියුම් වූ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තයන් අරමුණු කොට සිත පවතී. අන්‍ය කමටහන් වඩන කල්හි නිමිත්ත ක්‍රමක්‍රමයෙන් විභූත බවට පත් වේ. මේ ආනාපාන සති කමටහන එසේ නොව නිමිත්ත ඉතා සියුම් බවට ම පැමිණේ නො වැටහෙන ආකාරයට ද පැමිණේ. එසේ නො වැටහෙන ආකාරයට පැමිණිය හොත් යෝගාවචර තෙම තමාගේ නිමිත්ත නැතිව ගියේ යයි සිතා නැගිට නොයායුතු. එතැනම හිඳ තමා කලින් ඵුසන වශයෙන් නාසිකාග්‍රයෙහිදී අරමුණු ගත් බව මෙනෙහි කොට එහිදී ම නැවතත් නිමිත්ත ගන්නට උත්සාහ කටයුතු. ආශ්වාස ප්‍රශ්වාසය ඇති නැති බව මෙනෙහි කරන්නා වූ පුද්ගල තෙමේ මෙසේ සැලකිය යුතු. මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ කොහි ඇද්ද, නැද්ද, කවරක් හට ඇත් ද, කවරක් හට නැද්ද, මව්කුස වසන්නවුන් හට ද, දියෙහි ගිලුනු වුන් හට ද, අසංඥිතලයෙහි වසන අසංඥීන් හට ද, මළවුන්ට ද, චතුර්ථධ්‍යානයට සමවන්න වුන්හට ද, රූපාරූප භවයෙහි උපන්නවුන් හට ද, නිරෝධසමාපත්තියට සමවන්න වුන් හට ද ආශ්වාස ප්‍රශ්වාසයෝ නැත්තාහ. මම හිඳින්නේ එවැනි අවස්ථාවක් ලබාගෙන නො වෙයි. එහෙයින් මට ආශ්වාස ප්‍රශ්වාසයන් තිබිය යුතු ය. ආශ්වාස ප්‍රශ්වාසයෝ නම් නාසාපුටයෙන් ම ඇතුළ්ව පිටවන්නෝ ය. එතැන්හි දීම ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත අල්වා ගත යුතු යයි මහා නුවණින් මෙනෙහි කළ යුතු ම ය. භාග්‍යවතුන් වහන්සේ ද

"මහණෙනි, සිහි නැත්තහුට නුවණ නැත්තහුට ආනාපාන සති භාවනාව නොකියමි", යයි වදාළේත් එහෙයිනි. මේ ආනාපාන සති භාවනාව ඉතා ගරු ය. බුදු පසේබුදු මහරහතන් ආදී මහා සත්ත්වයන්ට ම මෙනෙහි කිරීමට නිසි තැන්ය. එය ලාමක ද නොවේ. ලාමක සත්ත්වයන් විසින් සෙවිනා ලද්දේ ද නොවෙයි. මෙනෙහි කළ තරමින් ම ශාන්ත ද වෙයි, සියුම් ද වෙයි. සීසානා ගොවිතෙම සීසා වෙහෙසුනු කල්හි ගොනුන් මුදාහැර සෙවන ඇති රුකක් මුල මඳක් සැතපෙයි. ගොන්නු ද වේගයෙන් ගොස් කැලයෙහි වැද තණ අනුභව කොට සවස පැන් බොනා තොටට ගොස් පැන් බී එහි ලැග සිටී. නුවණැති ගොවියා ද නැවත සීසානා කැමැතිවන්නේ, ගොනුන්ගේ පියවර අනුව කැලයට නොගොස් ගොනුන් මේ වේලෙහි අසුවල් තැන පැන් බී ලැග ඇතැයි සිතා එතැනට ගොස් ගොනුන් අල්වා බැඳ ගෙනවිත් සීසානේ ය. එපරිද්දෙන් ම නුවණ ඇති යෝගාවචර තෙමේ ද කලින් නිමිත්ත ගත් තැන වූ නාසිකාග්‍රයෙහි ම නිමිත්ත සොයා ගන්නේ ය. මෙසේ සිහිය මෙහෙයවා භාවනා කරන්නාවූ යෝගාවචරයාහට නොබෝ කලකින් ම උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත ද වැටහෙන්නේ ය. නිමිත්ත වැටහෙන කල්හි ද, හැමදෙනා හට ම නිමිත්ත එකසේ නොව නා නා විධව වැටහෙන්නේ ය, එසේ නානාවිධව වැටහෙන්නේ සංඥා නානත්වය හා ප්‍රඥා නානත්වය හේතුකොටගෙනය. කිසිවෙකුහට සුවපහස් උපදවමින් කපු පුළුන් පෙදසේ ද, වාතධාරාසේ ද වැටහෙයි. කිසිවෙකුහට තරු රැසක් සේ ද, මැණික් ගුළි සේද, මුතු ඇට සේද යනාදී වශයෙන් වැටහෙති.

මෙහි ආශ්වාසය අරමුණු කොට ඇති සිත අනිකෙකි. ප්‍රශ්වාසලම්බන සිත අනිකෙකි. නිමිත්ත අරමුණු කොට ඇති සිත අනිකෙකි. මේ ධර්ම තුන නැත්තහුගේ කර්මස්ථානය අර්පණාවට හෝ උපචාරයට නො පැමිණේ. ඒ ධර්ම තුන ඇත්තහුගේ ම සිත උපචාරයට සහ අර්පණාවට ද පැමිණේ.

මෙසේ ප්‍රතිභාග නිමිත්ත වැටහුණු කල්හි යෝගාවචරයා විසින් ආචාරීන් සමීපයට ගොස් මට මෙබඳු දෙයක් වැටහෙන්නේ යයි කිව යුතු. ආචාරීන් විසින් එය නිමිත්ත යයි කියා හෝ නොවේය කියා හෝ නො කියා, ඇවත, භාවනායෙහි යෙදුනහුහට එසේ වන්නේ යයි කියා නැවත නැවත එය මෙනෙහි කරවයි කිව යුතු. එය නිමිත්ත යයි කී කල්හි දුෂ්කර වූ නිමිත්ත ලබන ලදැයි එයින් නිමාවට පැමිණේ. නිමිත්ත නොවේ යයි කී කල්හි මෙතෙක් කල් භාවනාවෙහි යෙදුණු නමුත් නිමිත්ත වත් පහළ නොවී යයි සිතා එහි ආසා කඩවී පසු බැසීමට පැමිණෙන්නේ ය.

ඒ යෝගීහට, ප්‍රතිභාග නිමිත්ත වැටහීමෙහි පටන් නීවරණ ධර්මයන් විෂ්කම්භිත වන්නේ ය. කෙලෙශයන් ද සංසිඳෙන්නේ ය. සිත උපචාර සමාධි වශයෙන් සමාහිත ද වේ. මෙතැන් සිට ඔහු විසින් ඒ නිමිත්ත වර්‍ණ වශයෙන් හෝ ලක්‍ෂණ වශයෙන් හෝ මෙනෙහි නොකළ යුතු. එය සක්විති ගැබක් මෙන් රැකගත යුතු. එසේ රැක ඒ නිමිත්ත නැවත නැවත මෙනෙහි කිරීමෙන් වැඩීමෙන් දශවිධ අර්පණා කෞශල්‍යය ද සැපයිය යුතු. වීර්‍ය්‍ය සමත්වය ද යෙදිය යුතු. මෙසේ ව්‍යායාම කරන්නා වූ ඒ යෝගාවචරයාහට පඨවි කසිණයෙහි කී ක්‍රමයෙන් ඒ නිමිත්තෙහි ම චතුෂ්ක පඤ්චක ධ්‍යානයන් උපදිත්. මෙසේ උපදවා ගන්නා ලද චතුෂ්ක පඤ්චක ධ්‍යානයන් ඇති ඔහු ඉදින් කායානුපස්සනාවෙහි සල්ලක්ඛණා විවට්ටනා ආදි වශයෙන් කමටහන් වඩා පාරිශුද්ධියට පැමිණෙනු කැමතිවී නම්, ඒ චතුෂ්ක පඤ්චකධ්‍යානයන් අතුරෙන් එක් ධ්‍යානයක් පඤ්චවශීතායෙන් ප්‍රගුණ කොට විදර්ශනාවට පටන් ගන්නේ ය. ධ්‍යානයට සමවත් හෙතෙම ධ්‍යානයෙන් නැගී මේ ආශ්වාස ප්‍රශ්වාස සමුදය නම් කරජකාය හා සිත යයි දැනගන්නේ ය. ආශ්වාස ප්‍රශ්වාසයන් චිත්ත සමුට්ඨාන වන නමුත් ශරීරය හැර නො පවත්නා බැවින් කරජකාය යයි ද, උපාදින්න කය හා ඒකාබද්ධව නො පවත්නා අශ්වාස ප්‍රශ්වාසයන් චිත්ත

ප්‍රත්‍යය උතුසමුට්ඨාන වන්නේ නමුත් චිත්ත ප්‍රත්‍යයයෙන් ම වන බැවින් **සිත** යයි ද කියනු ලැබේ. කඹුරු හම සුළං ගන්වන කල්හි සම ද, පුරුෂයාගේ ව්‍යායාමය ද නිසා වාතය හැසිරේ ද, එපරිද්දෙන් ම කරජකය ද, සිත ද නිසා ආශ්වාස ප්‍රශ්වාසයෝ හැසිරෙතියි බලා, මේ ආශ්වාස ප්‍රශ්වාස හා කය ද **රූපය** යයි ද, සිත හා තත්සම්ප්‍රයුක්ත ධර්ම **අරූප** හෙවත් **නාම** යයි ද නියමකර ගන්නේ ය. **එසේ** මේ ආශ්වාස ප්‍රශ්වාසාදීන් **නාමරූප** වශයෙන් ව්‍යවස්ථා කොට, ඒ නාම රූපයන්ගේ අවිද්‍යාදී ප්‍රත්‍යයයන් ඇති බව **දැක**, අතීතාදී තුන්කල්හිම ඒ නාම රූපයන්ගේ පැවැත්ම පිළිබඳ වූ සැකය දුරු කොට, කලාප සම්මර්ශනාදි වශයෙන් අනිත්‍යාදී තිලකුණට නගා, **උදයව්‍යයානුදර්ශනයට** පූර්වභාගයෙහි උපන්නා වූ ඕභාසාදී දශවිධ විදර්ශනොපක්ලේශයන් අමාර්ගය යයි හැර, උපක්ලේශයන් කෙරෙන් මිදී, **ප්‍රතිපදා ඥානය** මාර්ගය යයි නියම කොට දැන, සංස්කාරයන් ගේ උදය හැර භඞ්ගයම බලා **භඞ්ගානුදර්ශනා ඥානයට පැමිණ**, නිතර භඞ්ගය බැලීමෙන් භය වශයෙන් වැටහී ගිය සියලු **සංසකාරයන්** කෙරෙහි **ආදීනවානුපස්සනාව** පෙරටු කොට ඇති **නිබ්බිදානුපස්සනාවෙන්** කලකිරීමට පැමිණ, **මුඤ්චිතුකාම්‍යතාඥානය, පටිසඞ්ඛානුපස්සනා ඥානය, සඞ්ඛාරුපෙක්ඛා ඥානය, අනුලෝම ඥානය** යන මේ ඥනයන්ගේ කෙළවර උපන් **ගොත්‍රභූ ඥානයට** අනතුරුව උපන් **මාර්ග ඥානයෙන්** විරාගය කරණුයේ, මිදෙනුයේ යථා ක්‍රමයෙන් සතර ආර්‍ය්‍ය මාර්ගයට පැමිණ, **අර්හත් ඵලයෙහි** පිහිටා, **මග්ග, ඵල, නිර්වාණ, ප්‍රහීණ ක්ලේශ, අවශිෂ්ට ක්ලේශාදීන්ගේ** වශයෙන් එකුන් විසි ප්‍රභෙද වූ **ප්‍රත්‍යවේක්ෂා ඥානයාගේ** කෙළවරට පැමිණියේ දෙවියන් සහිත ලෝකයාගේ අග්‍රදක්ෂිණෙය්‍ය බවට සුදුසු වන්නේ ය.

මෙසේ භාවනා විධි සියල්ලත් එයින් ඵල ලබන සැටිත් මනාව ඉගෙන ශ්‍රද්ධාව උපදවාගෙන භාවනා ආරම්භ කළ යුතු.

**1. දීර්ඝ කොට ආශ්වාස කරන්නේ දීර්ඝ කොට ආශ්වාස කරමියි ද, දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ දීර්ඝ කොට ප්‍රශ්වාස කරමියි ද දැන ආශ්වාස ප්‍රශ්වාස කටයුතු.**

මෙසේ සිහියෙන් යුක්තව ආශ්වාස ප්‍රශ්වාස කරන්නා වූ පුද්ගල තෙම දීර්ඝ ආශ්වාසය දීර්ඝ වේලාවක් ආශ්වාස කරයි. දීර්ඝ ප්‍රශ්වාසය දීර්ඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස ප්‍රශ්වාස කරයි. මෙසේ ත්‍රිවිධාකාරයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරන කල්හි ඒ යෝගීහට **කත්තුකම්‍යතා කුසලච්ඡන්දය** උපදී. එනම් පෙරට වඩා අතිශයින් භාවනා කරනු කැමති බවයි. මෙසේ කත්තුකම්‍යතා කුසලච්ඡන්දය ඇති වූ කල්හි ඒ භාවනා බලයෙන් ම ආශ්වාස ප්‍රශ්වාසයෝ පෙරට වඩා සූක්ෂම බවට පැමිණේ. ඉදින් ඔහු **කත්තුකම්‍යතා ඡන්ද වශයෙන්** දීර්ඝ වූ ආශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස කරයි. දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. දීර්ඝ වූ ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස ප්‍රශ්වාස කරයි. මෙසේ කත්තුකම්‍යතා කුසලච්ඡන්ද වශයෙන් තුන් පරිච්ඡේ-දෙකින් ආශ්වාස ප්‍රශ්වාස කරන කල්හි ඒ ආශ්වාස ප්‍රශ්වාසයන් ඉතාමත් සූක්ෂමතර වන බැවින් ද, අරමුණ ඉතා සාන්ත වන බැවින් ද, කමටහන වීථි ප්‍රතිපන්න බැවින් ද ඒ යෝගීහට තරුණප්‍රීතිය නම් වූ **ප්‍රමෝදය** උපදින්නේ ය. මෙසේ ප්‍රමෝදය උපන් කල්හි **ප්‍රමෝද වශයෙන්** පෙරටත් වඩා අතිශයින් සියුම් වූ දීර්ඝ ආශ්වාසය දීර්ඝ වේලාවක් ආශ්වාස කරයි. දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. දීර්ඝ වූ ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස ප්‍රශ්වාස කරයි.

මෙසේ ආශ්වාස ප්‍රශ්වාස කිරීම, **ස්වභාව වශයෙන්** තුන් ආකාරයෙක, **කත්තුකම්‍යතා ඡන්ද වශයෙන්** තුන් ආකාරයෙක, **ප්‍රමෝදය වශයෙන්** තුන් ආකාරයෙකැයි **නවආකාරයකින්** පරිකම් කටයුතු.

මෙසේ නවආකාරයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරන කල්හි අනුක්‍රමයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් අතිශයින් ම සියුම් බවට පැමිණීමෙන් නො වැටහෙන කල්හි, සෙවිය යුතු ආකාරයට පැමිණි ඒ ආශ්වාස ප්‍රශ්වාසයන් කෙරෙන් සිත පෙරළෙයි. **තත්‍රමජ්ඣත්තතා** නම් වූ උපෙක්‍ෂාව පිහිටයි. මේ උපෙක්‍ෂාව, භාවනා බලයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් සූක්‍ෂමතර බවට පැමිණි කල්හි එහි ප්‍රතිභාග නිමිත්ත ඉපිද ප්‍රකෘති ආශ්වාස ප්‍රශ්වාසයන් කෙරෙන් සිත පෙරළී, ප්‍රතිභාග නිමිත්තෙහි උපචාර අර්පණා සමාධි ඉපිද, නැවත ධ්‍යානය පිණිස ව්‍යාපාරයක් නැති බැවින් **අධ්‍යුපෙක්‍ෂණය** වශයෙන් පිහිටන්නේ ය. මෙකී නවාකාරයෙන් පැවති දීර්ඝාකාර ආශ්වාස ප්‍රශ්වාසයෝ **කාය** නම් වෙත්. ආශ්වාස ප්‍රශ්වාසයන් නිසා උපන් නිමිත්ත ද ආශ්වාස ප්‍රශ්වාස යන නම ලබන්නේ ය. ඒ ආශ්වාස ප්‍රශ්වාස අරමුණට එළඹ සිටිනා සිහිය **උපට්ඨාන** නම් වේ. සමථ වශයෙන් නිමිත්තයාගේ අනුපස්සනාව ද, විපස්සනා වශයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් හා එයට නිශ්‍රය වූ කාය යද, **රූපය** යයි ද, සිත හා තත්සම්ප්‍රයුක්ත ධර්මයන් අරූප හෙවත් **නාම** යයි ද ව්‍යවස්ථා කොට නාමරූපයන්ගේ යම් අනුපස්සනාවක් වේ ද එය **අනුපස්සනා** හෙවත් **යථාභූතාවබොධඥාන** නම් වේ. මේ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තාලම්බණ කාය ය **උපට්ඨාන** නම් වේ. සතිය නොවේ. ඒ අරමුණ සිහි කරන හෙයින් ද, අරමුණෙහි එළඹ සිටිනා හෙයින් ද, සමෘතිය උපට්ඨාන ද වෙයි. සතිය ද වෙයි. එහෙයින් මෙයට **කායෙ කායානුපස්සනා සතිපට්ඨාන** භාවනා යයි කියනු ලැබේ. නොහොත්– කාය යෙහි මම ය, මාගේ ය, ස්ත්‍රිය, පුරුෂය යයි ගතයුතු කිසිවක් නැති බැවින් ද, එවැන්නක් නොබලා කාය මාත්‍රයාගේ ම අනුපස්සනාව **කායානුපස්සනා** නම් වේ. ඒ කායානුපස්සනා හා තත්සම්ප්‍රයුක්ත සමෘතිය උපට්ඨානවී **සතිපට්ඨාන** නම් වේ ඒ **කායානුපස්සනා** සතිපට්ඨානයාගේ වැඩීම **කායානුපස්සනා සතිපට්ඨාන භාවනා** නම් වේ.

**2. ලුහුඬු කොට ආශ්වාස කරන්නේ ලුහුඬු කොට ආශ්වාස කරමියි ද, ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නේ ලුහුඬු කොට ප්‍රශ්වාස කරමියි ද දැන ආශ්වාස ප්‍රශ්වාස කටයුතු.**

යට කියන ලද ආකාරයෙන් සිහියෙන් යුක්තව ආශ්වාස ප්‍රශ්වාස කරන්නා වූ පුද්ගල තෙම ලුහුඬු ආශ්වාසය ඇති වූ කල්හි, ලුහුඬු ආශ්වාසය සවල්ප වේලාවක් ආශ්වාස කරයි. ලුහුඬු ප්‍රශ්වාසය සවල්ප වේලාවක් ප්‍රශ්වාස කරයි. ලුහුඬු ආශ්වාස ප්‍රශ්වාසය සවල්ප වේලාවක් ආශ්වාස ප්‍රශ්වාස කරයි. මෙසේ ත්‍රිවිධාකාරයෙන් ලුහුඬු ආශ්වාස ප්‍රශ්වාසයන් දැන ආශ්වාස ප්‍රශ්වාස කරන කල්හි ඔහට **කත්තුකම්‍යතා කුශලච්ඡන්දය** ඉපිද, කත්තුකම්‍යතාච්ඡන්ද වශයෙන් ද යට කී ත්‍රිවිධාකාරයෙන් ලුහුඬු ආශ්වාස ප්‍රශ්වාස සවල්ප වේලාවක් කරන්නේය. මෙසේ ඉතා සියුම් බවට පැමිණි කල්හි **ප්‍රමෝදය** උපදී. ඉක්බිති හෙතෙම ප්‍රමෝදය වශයෙන් ද ත්‍රිවිධාකාරයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ ය. මෙසේ දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාසයන් මෙන් හ්‍රසව හෙවත් ලුහුඬු ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට භාවනා කරන කල්හි **තත්‍රමජ්ඣත්තතා** නම් වූ උපෙක්ෂාව ඉපිද, ඒ ප්‍රතිභාග නිමිත්තෙහි උපචාර අර්පණා සමාධිය ලබන්නේ ය. මෙසේ ද **කායානුපස්සනා සතිපට්ඨාන** භාවනාව වඩන්නේ ය.

මෙසේ මේ යෝගීතෙම දීර්ඝකාල වශයෙන් හා සවල්ප කාල වශයෙන් ද ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ, නවආකාර වශයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් දන්නේ ය. මෙසේ දන්නා වූ ඒ යෝගාවචර භික්ෂුහට–

**"දීඝො රස්සොච අස්සාසො – පස්සාසොපි ච තාදිසො
චත්තාරො වණ්ණා වත්තන්ති –
නාසිකග්ගෙව භික්ඛුනො"**

යයි කියන ලද පරිදි, දීර්ඝ වූ ආශ්වාසය, හ්‍රසව වූ ආශ්වාසය, දීර්ඝ වූ ප්‍රශ්වාසය, හ්‍රසව වූ ප්‍රශ්වාසය යන සතර ආකාරයෝ යෝගාවචර භික්ෂුහුගේ නාසිකාග්‍රයෙහි පවතිත්.

**3. සියලු ආශ්වාස කාය ප්‍රකට කොට දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය.**

**සියලු ප්‍රශ්වාස කාය ප්‍රකට කොට දනිමින් ප්‍රශ්වාස කරන්නෙම් යි හික්මෙන්නේ ය.**

යට දක්වන ලද පරිද්දෙන් සියලු දීඝිවූ ද හ්‍රස්වවූ ද ආශ්වාස ප්‍රශ්වාසයන් නැහැ අගදී නිමිත්ත ගෙන එහි සිත පිහිටුවා භාවනා කරන්නා වූ යෝගාවචර තෙම, සියලුම ආශ්වාස කායයාගේ ආදි, මධ්‍ය, පරියෝසාන වශයෙන් ප්‍රකට කොට දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය. එමෙන් ම සියලු ප්‍රශ්වාසකායයාගේ ද ආදි, මධ්‍ය, පරියෝසාන වශයෙන් ප්‍රකට කොට දනිමින් ප්‍රශ්වාස කරන්නෙම් යි හික්මෙන්නේ ය. මෙසේ ඒ යෝගී තෙම ඥානවිප්‍රයුක්ත සිතින් නොව ඥාන සම්ප්‍රයුක්ත සිතින් ම ආශ්වාස ප්‍රශ්වාස දැන හික්මිය යුතු බව දක්වන ලදී. ඇතැම් භික්‍ෂුවක්හට කලාප වශයෙන් සුණු විසුණු වූ ආශ්වාස ප්‍රශ්වාස කායයෙහි සමෘතිය ද ඥානය ද එළවා භාවනා කරන කල්හි ආදිය ප්‍රකට වන්නේ ය. මධ්‍යය සහ අවශානය ද ප්‍රකට නොවේ. හෙතෙම ආදිය ම ප්‍රකට කොට, පිරිසිඳ දැනගන්නට සමත් වේ. මධ්‍යය සහ අවශානය ද දැනගන්නට සමත් නොවන හෙයින් ඒ මධ්‍ය අවශාන දෙක්හි වෙහෙසට පත් වේ. එමෙන් ම ඇතැම් භික්‍ෂුවක්හට මධ්‍යය ප්‍රකට වේ. ආදිය සහ අවශානය ප්‍රකට නොවේ. හෙතෙම මධ්‍යය ප්‍රකට කොට දැනගන්නට සමත් වේ. ආදිය හා අවශානය ප්‍රකට නොවීමෙන් වෙහෙසට පත් වේ. ඇතැම් පුද්ගලයෙකුහට අවශානය ප්‍රකට වේ. ඔහට ආදිය සහ මධ්‍යය ප්‍රකට නොවීමෙන් ඒ දෙක්හි වෙහෙසට පත් වේ. ඇතැම් භික්‍ෂුවක් හට ආදිය, මධ්‍යය, අවශානය යන තුන් තැනම, සමෘතිය හා ඥානය ද එළවා භාවනා කිරීමෙන් ප්‍රකට වේ. හෙතෙම සියලුම ආශ්වාස ප්‍රශ්වාස කායයන් ප්‍රකට කොට දැනීමට සමත් හෙයින් කිසි තැනක වෙහෙසට පත්නොවී

නික්මෙන්නේ ය, ගැටෙන්නේ ය, වෑයම් කරන්නේ ය. මෙසේ ආනාපාන සතිය වඩන්නහුගේ සමෘති විශුද්ධි සඞ්ඛ්‍යාත වූ යම් සංවරයක් ඇද්ද, එය ඔහුගේ **අධිශීල ශික්‍ෂාය.** යම් සමාධියක් ඇද්ද, එය ඔහුගේ **අධිචිත්ත ශික්‍ෂාය.** යම් ප්‍රඥාවෙක් වේ ද එය ඔහුගේ **අධිප්‍රඥා ශික්‍ෂාය.** මේ තුන් ශික්‍ෂාවන්ගේ වශයෙන් ඒ ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙහි පවත්නා වූ සමෘතියෙන් හා භාවනා මනසකාරයෙන් නික්මෙන්නේ ය. එකී කුසල ධර්මයන් ආසේවනය කරන්නේ ය, වඩන්නේ ය, නැවත නැවත පැවැත්වීමෙන් බහුලීකෘත කරන්නේ ය.

පළමු ක්‍රම දෙකින් දීර්ඝ වූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ද හ්‍රස්ව වූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ද වර්තමාන කාල වශයෙන් අරමුණු කොට සිත පිහිටුවා ගැනීම වදාරන ලදී. මේ තුන් වන වස්තුවෙන් ඒ ආශ්වාස ප්‍රශ්වාස ආරම්මණයන් හි ඥානසම්ප්‍රයුක්ත සිත් උපදවා ගැනීම්-වශයෙන් යෝග කටයුතු බව වදාරන ලදී.

**4. ඖදාරික කාය සංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි නික්මෙන්නේ ය.**

**ඖදාරික කාය සංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි නික්මෙන්නේ ය.**

**කායසංස්කාර** නම් ආශ්වාස ප්‍රශ්වාසයි. මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ චිත්තසමුට්ඨාන වුව ද කරජකාය පිළිබඳව පවත්නා හෙයින් කායසංසකාර යයි කියනු ලැබේ. **පස්සම්භනාය** නම් ව්‍යුපසමනය හෙවත් සංසිඳුවීම ය. එවැනි සංසිඳුවීමක් නැති කල්හි උපදනා ස්ථූල ආශ්වාස ප්‍රශ්වාසයෝ ඖදාරික කායසංසකාර නම් වෙත්. මේ ඖදාරික කායසංසකාරයන් ප්‍රයෝග සම්පත්තියෙන්, නැවත නැවත නූපදනාසේ සංසිඳුවමින් නික්මීම, මෙයින් අදහස් කරන ලදී.

මේ කර්මස්ථාන භාවනාව ආරම්භ කිරීමට පෙර ඉරියව් නොසන්සුන් බැවින් ද, කිලිටි වූ සිතින් උපදනා වූ ප්‍රණීත නොවූ රූප ඇති බැවින් ද ශරීරය පරිදාහ සහිතය නොහොත් ඖදාරික ය. නිතර කෙලෙස් උපදනා හෙයින් සිත ද ඖදාරික ය. මේ කායචිත්තායන්ගේ ඖදාරික බව නොසංසිඳුන කල්හි, ඒ ඖදාරික කායචිත්තයන් නිසා පවත්නා ආශ්වාස ප්‍රශ්වාසයෝ ද ඖදාරික වෙත්. බොහෝවිට බලවත් වේ. ආශ්වාස ප්‍රශ්වාසයන්ට නාසිකාව නොපොහොනා කල්හි මුඛයෙන් ද ආශ්වාස ප්‍රශ්වාස පවත්වමින් සිටී. යම් කලෙක්හි මේ යෝගීතෙම, පළඟ බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා හිඳීමෙන් ශරීරය ද, භාවනා-රම්මණයෙහි පෙරටු කොට සිත පිහිටුවා ගැනීමෙන් සිත ද, යන කායචිත්ත දෙදෙනාගේ පරිග්‍රහය ඇති කරගත් කල්හි, ඒ කාය චිත්ත දෙදෙනා ශාන්ත ද වෙත්, අතිශයින් ශාන්ත ද වෙත්. අන් අරමුණු නොගන්නා හෙයින්, නොහොත් වික්ෂෙප නොවන හෙයින් කමටහන මෙනෙහි කරන්නා වූ සිත ද ශාන්ත වෙයි. ශාන්ත වූ සිතින් උපදනා චිත්තජ රූපයෝ ද ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා වශයෙන් මෑදු මොලොක් කර්මණ්‍ය බවට පත්ව ශාන්ත වෙති. කාය චිත්ත දෙදෙනා ශාන්ත බවට පත්වූ කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ ද ශාන්ත ව සියුම් ව පවතිත්. ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇද්දැයි නැද්දැයි සෙවීමට තරම් සියුම් බවට පැමිණෙති.

යම්සේ පුරුෂයෙක් වේගයෙන් හෝ දුවවිත්, පර්වතයෙන් හෝ බැස, මහා බරක් හෝ හිසින් බහා තබා සිටි කල්හි, ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ ඖදාරික වෙද්ද, නාසිකායෙන් පමණක් ආශ්වාස ප්‍රශ්වාස කිරීමට නො හැකිවූයේ මුඛයෙන් ද ආශ්වාස ප්‍රශ්වාසා කරන්නේ ද, ඒ පරිශ්‍රමය නොහොත් විඩාව දුරු කොට නහා, පැන් බී, තෙත් රෙදිකඩක් ළෙහි තබාගෙන සිහිල් සෙවනෙහි හුන්නේ, ඔහුගේ ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ව ඇද්දෑ නැද්දෑ යි සෙවිය යුතු බවට පැමිණෙන්නේ ද, යෝගීහට ද ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුන කල්හි එසේම ය.

අපරිගෘහිත කාලයට වඩා පරිගෘහිත කාලයෙහි ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

පරිගෘහිත කාලයට වඩා ප්‍රථමධ්‍යානොපචාරයෙහි දී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

ප්‍රථමධ්‍යානොපචාරයෙහිදීට වඩා ප්‍රථමධ්‍යානයෙහි දී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම්ය.

ප්‍රථමධ්‍යානයෙහිදීට වඩා ද්විතියධ්‍යානොපචාරයෙහි දී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

ද්විතියධ්‍යානොපචාරයෙහිදීට වඩා ද්විතියධ්‍යානයෙහිදී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

ද්විතියධ්‍යානයෙහිදීට වඩා තෘතියධ්‍යානොපචාරයේදී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

තෘතියධ්‍යානොපචාරයට වඩා තෘතියධ්‍යානයෙහිදී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

තෘතියධ්‍යානයෙහිදීට වඩා චතුර්ථධ්‍යානොපචාරයෙහිදී ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් ය.

චතුර්ථධ්‍යානොපචාරයෙහිදීට වඩා චතුර්ථධ්‍යානයෙහිදී ආශ්වාස ප්‍රශ්වාසයෝ අතිසියුම්ව නැතැයි කිවයුතු බවට පැමිණෙත්තේ ය.

මේ කියන ලද්දේ සමථ භාවනාවගේ වශයෙනි. විදර්ශනායෙහි දී අපරිගෘහිත කාලයෙහි හෙවත් කමටහන් නොගත් කල්හි පැවති කායසංස්කාර නම් වූ ආශ්වාස ප්‍රශ්වාසයෝ ඖදාරික ය. සතර මහා භූතයන් පරිගෘහිත කාලයෙහි කායසංස්කාරය සියුම් ය. සතර මහා භූතයන් පරිගෘහිත කාලයෙහිදීට වඩා උපාදාය රූප පරිගෘහිත කල්හි කායසංස්කාරයෝ සියුම් ය. එයටත් වඩා සකල රූප පරිගෘහිත කාලයෙහි කායසංස්කාරයෝ සියුම් ය.

එය ද ඖදාරික ය. අරූප පරිගෘහිත කල්හි එයටත් වඩා සියුම් ය. අරූප පරිගෘහිත කාලයට වඩා රූපාරූප පරිගෘහිත කාලයෙහි සියුම් ය. එයටත් වඩා ප්‍රත්‍යය පරිගෘහිත කාලයෙහි කායසංස්කාරයෝ සියුම් ය. එයටත් වඩා සප්‍රත්‍යය නාම-රූප පරිගෘහිත කාලයෙහි දී සියුම් ය. එය ද ඖදාරික ය. එයටත් වඩා උදයව්‍යයානුදර්ශනාදී වශයෙන් ලක්ෂණාරම්මණික විදර්ශනායෙහි සියුම් ය. එය ද දුර්වල විදර්ශනායෙහි දී ඖදාරිකය, බලවත් විදර්ශනාවෙහි දී සියුම් ය. මෙසේ පූර්ව පූර්ව කායසංස්කාර පශ්චිම පශ්චිම-යෙන් සන්සිඳෙන්නේ ය.

## ද්විතීය චතුෂ්කය

1. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
   පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති
2. සුඛ පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
   සුඛ පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති
3. චිත්ත සංඛාර පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
   චිත්ත සංඛාර පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති
4. පස්සම්භයං චිත්ත සංඛාරං අස්සසිස්සාමීති සික්ඛති
   පස්සම්භයං චිත්ත සංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.

මෙහි සාමාන්‍ය අර්ථය නම්:—

1. ප්‍රීතිය දනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   ප්‍රීතිය දනිමින්, ප්‍රකට කර ගනිමින් ප්‍රශ්වාස කරන්-නෙමි යි හික්මෙන්නේ ය.

2. සුඛය දනිමින්, ප්‍රකටකර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   සුඛය දනිමින්, ප්‍රකටකර ගනිමින් ප්‍රශ්වාස කරන්-නෙමි යි හික්මෙන්නේ ය.

3. චිත්ත සංස්කාරයන් දනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

චිත්ත සංස්කාරයන් දනිමින්, ප්‍රකට කර ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

4. ඖදාරික චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය.

ඖදාරික චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය.

මේ ආනාපානසති භාවනායෙහි ද්විතීය, තෘතීය, චතුර්ථ චතුෂ්කයෝ වනාහි, ප්‍රථම චතුෂ්කයාගේ වශයෙන් භාවනා කොට ලබාගත් ධ්‍යාන ඇති යෝගාවචරයාහට වේදනා, චිත්ත, ධම්මානුපස්සනා වශයෙන් දේශනා කරන ලද බව දත යුතු. ධ්‍යාන නැත්තාහට ඒ චතුෂ්ක තුන වැඩිය නො හැකිවේ.

**1. ප්‍රීතිය දනිමින් ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය.**

**ප්‍රීතිය දනිමින්, ප්‍රකටකර ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

මෙහි **ප්‍රීතිය** නම් ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන යන ධ්‍යාන දෙක්හි ධ්‍යානාඞ්ග වශයෙන් ඇතිවූ ප්‍රීති නම් වූ ධ්‍යානාඞ්ග යයි. මේ ප්‍රීතිය දැනීම හා ප්‍රකටකර ගැනීම දෙයාකාරයකින් සිදුවේ. එනම් **ආරම්මණ** වශයෙන් හා **අසම්මෝහ** වශයෙන් යන දෙයාකාරයෙනි.

යෝගාවචර තෙම, සප්‍රීතික වූ ප්‍රථමධ්‍යානයට හා ද්විතීයධ්‍යානයට ද පිළිවෙළින් සමවැදී, ඒ සමාපත්ති-ක්‍ෂණයේදී ම, ධ්‍යාන ලැබීමෙන් ආරම්මණ වශයෙන් ඒ ධ්‍යානයටම ඇතුළත් වූ ප්‍රීතිය ද දන්නේ වේ. යම්සේ සර්පයන් සොයන්නාවූ පුරුෂ තෙම ඒ සර්පයා වසන

තුඹස දුටු කල්හි සර්පයා ද දක්නාලදම වේද, මන්ත්‍ර බලයෙන් ඒ සර්පයා අල්වා ගන්නට පිළිවන් වන හෙයින් සර්පයා ගන්නාලද්දේ ම වේ ද, එපරිද්දෙන් ම ප්‍රීතියට ආසන්න වූ ආලම්බනය දත් කල්හි ප්‍රීතිය ද දක්නා ලදම වේ. සවලක්ෂණ හෙවත් සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ප්‍රීතිය දන්නා ලද්දේ ද වේ. මෙය **ආරම්මණය** වශයෙන් ප්‍රීතිය දැනීමය.

එසේම සප්‍රීතික වූ ප්‍රථම, ද්විතිය ධ්‍යානයන්ට පිළිවෙ-ළින් සමවැද, එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත වූ ප්‍රීතිය, **ක්ෂය** වශයෙන් ද, **ව්‍යය** වශයෙන් ද සම්මර්ශනය කරන්නා වූ යෝගාවචරයා විසින් තියුණු වූ ඒ විදර්ශනා ඥානයෙන් ප්‍රීතිය ද දක්නා කෙණෙහි ප්‍රීතියගේ සවලක්-ෂණයත්, ප්‍රතිවේධ කිරීමෙන් යම් බඳු වූ සාමාන්‍ය, විශේෂ ලක්ෂණයෙක් වේ ද, ඒ ලක්ෂණය දත් කල්හි ඒ ධර්මය ද ඇති සැටියෙන්, **අසම්මොහ** වශයෙන් දන්නාලද්දේ ම වේ. මෙසේ ආවර්ජනා කරන්නාහට, විදර්ශනා ඥානයෙන් තිලකුණු ආරෝපණය කොට ප්‍රීතිය දන්නාහට, දක්නාහට, ප්‍රත්‍යවේක්ෂා කරන්නාහට, ප්‍රීතියෙහි විදර්ශනා චිත්තය පිහිටුවන්නාහට, ශ්‍රද්ධායෙන් අදහන්නාහට, වීර්‍ය්‍යය ගන්නාහට, සිහිය එළවන්නාහට, සිත එකඟ කරන්නාහට, විදර්ශනාඥානයෙන් මනාව දක්නාහට, **ලක්ෂණ**, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් **අභිඥෙය්‍ය** හෙවත් **ඥාතපරිඥායෙන්** දතයුත්ත ද, **පරිඥෙය්‍ය** හෙවත් තිලකුණු වශයෙන් **තීරණ පරිඥායෙන්** දතයුත්ත ද, **පහාතව්‍ය** හෙවත් තදඞ්ග සමුච්ඡේද වශයෙන් පහ කළ යුත්ත ද, **භාවිතව්‍ය** හෙවත් වැඩිය යුතු වූ මාර්ගය ද, **සාක්ෂාත්කරණීය** හෙවත් සාක්ෂාත් කටයුතු වූ නිවන හා ඵලය ද **සාක්ෂාත්** කරන්නහු විසින් මාර්ගක්ෂණයෙහි දී යථා සවභාවය වසා සිටින මෝහය නසා පවත්නා වූ නුවණින් කැමති කැමති කල්හි දැනගන්නට සමත්වන හෙයින් **අසම්මොහ** වශයෙන් ප්‍රීතිය ද දන්නාලද්දේ ම වෙයි.

මෙසේ යෝගාවචර තෙම ධ්‍යානසම්ප්‍රයුක්ත ප්‍රීතිය දැනිමින්, ප්‍රකට කරගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ ය.

**2. සුඛය දැනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි සි හික්මෙන්නේ ය.**

**සුඛය දැනිමින්, ප්‍රකට කර ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමි සි හික්මෙන්නේ ය.**

මෙහි **සුඛය** නම් ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යාන සම්ප්‍රයුක්ත සුඛ නම් වූ ධ්‍යානාඞ්ග යයි. එය කායික සුඛය, චෛතසික සුඛය යන දෙවැදෑරුම් වූ සුඛය වේ. මේ සුඛය ද, පට කියන ලද ප්‍රීතිය මෙන් සුඛසහගත ත්‍රිවිධ ධ්‍යානයට සමවැදීමේදී ම **ආරම්මණ** වශයෙන් ද, ඒ ධ්‍යානයෙන් නැගී, ධ්‍යාන සම්ප්‍රයුක්ත සුඛය, ක්‍ෂය, ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන කල්හි විදර්ශනා **ක්‍ෂණයෙහි ලක්‍ෂණ** ප්‍රතිවේධ වශයෙන් **අසම්මෝහ** වශයෙන් ද දන්නේ ද වේ, ප්‍රකටකර ගැනීම ද වේ. මෙසේ යෝගාවචර තෙම සුඛය දැනිමින්, ප්‍රකටකර ගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ ය.

මේ වස්තු දෙක්හි වේදනානුපස්සනාව දක්වන ලද බව දත යුතු. පීති පටිසංවෙදී යන පදයෙන් ප්‍රීතිශීර්ෂයෙන් ද සුඛ පටිසංවෙදී යන පදයෙන් ස්වරූප වශයෙන් ද වේදනාව දක්වන ලදී.

**3. චිත්ත සංස්කාරයන් දැනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි සි හික්මෙන්නේ ය.**

**චිත්ත සංස්කාරයන් දැනිමින්, ප්‍රකට කර ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමි සි හික්මෙන්නේ ය.**

මෙහි **චිත්තසංස්කාරයෝ** නම් **වෙදනාස්කන්ධය** හා **සංඥාස්කන්ධය**යයි. එය සතර ධ්‍යානාඞ්ගයන්ගේ වශයෙන් ම චිත්තසංඛාර පටිසංවෙදී වන්නේ ය. සංඥා ද, වෙදනා ද යන මේ ධර්මයෝ චිත්තයෙහි ම වන හෙයින් චිත්තප්‍රතිබද්ධයහ. එ හෙයින් සංඥාසම්ප්‍රයුක්ත වූ වෙදනාව දක්වන ලද බව දත යුතු.

යෝගාවචර තෙම ඉදින් ආශ්වාස ප්‍රශ්වාසයන් දීඝ, හ්‍රස්ව වශයෙන් දැන ආශ්වාස ප්‍රශ්වාස කරමින්, ඖදාරික ඖදාරික ආශ්වාස ප්‍රශ්වාස නම් වූ කාය සංස්කාරයන් සංසිඳුවමින් නීවරණ ධර්මයන් විෂ්කම්භනය කොට සතර රූපාවචර ධ්‍යානයන් උපදවාගෙන, ඒ ධ්‍යානයන්හි අන්තර්ගත ප්‍රීති සහ සුඛ නම් වූ ධ්‍යානාඞ්ගයන් ආරම්මණ වශයෙන් හා අසම්මෝහ වශයෙන් ද දැන ආශ්වාස ප්‍රශ්වාස කොට, ඉක්බිති ඒ ධ්‍යාන චිත්තයෙහි ම වූ සංඥා සම්ප්‍රයුක්ත වූ වේදනාව ද දැන, මෙතෙහි කොට ආශ්වාස ප්‍රශ්වාස කරමින් හික්මෙන්නේ ය. එහෙයින් චිත්තසංස්කාර නම් වූ සංඥා සම්ප්‍රයුක්ත වේදනාව ද දනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේ යයි කියන ලදී.

**4. ඖදාරික චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**ඖදාරික චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

යෝගාවචර තෙම සංඥාස්කන්ධය සහිත වූ වේදනා ස්කන්ධය දනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ, යට කාය සංස්කාරයන්ගේ සංසිඳුවීම වන පරිද්දෙන්, යට යට ධ්‍යානයන්හිදීට වඩා මතු මතු ධ්‍යානයන්හිදී ක්‍රමයෙන් මේ චිත්ත සංස්කාරයන් ද සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ ය. ප්‍රථමධ්‍යානයෙහිදී චිත්ත සංස්කාරයෝ ඖදාරික ය. ද්විතීයධ්‍යානයෙහිදී සියුම් ය. ද්විතීයධ්‍යානයෙහිදී චිත්තසංස්කාරයෝ ඖදාරික ය. තෘතීයධ්‍යානයෙහිදී සියුම් ය. තෘතීයධ්‍යානයෙහිදී ඖදාරික ය. චතුර්ථධ්‍යානයෙහිදී සියුම් ය. විදර්ශනා ක්‍රමයෙහිදී ද කායසංස්කාරයන්ට කී පරිද්දෙන් ම දතයුතු.

මෙසේ මේ ද්විතීය චතුෂ්කය වේදනානුපස්සනා වශයෙන් වදාරණ ලදී.

## තෘතීය චතුෂ්කය

**1. චිත්ත පටිසංවෙදී අස්ස සිස්සාමීති සික්ඛති**
**චිත්ත පටිසංවෙදී පස්ස සිස්සාමීති සික්ඛති**

**2. අභිප්පමොදයං චිත්තං අස්ස සිස්සාමීති සික්ඛති**
**අභිප්පමොදයං චිත්තං පස්ස සිස්සාමීති සික්ඛති.**

**3. සමාදහං චිත්තං අස්ස සිස්සාමීති සික්ඛති**
**සමාදහං චිත්තං පස්ස සිස්සාමීති සික්ඛති.**

**4. විමොචයං චිත්තං අස්ස සිස්සාමීති සික්ඛති**
**විමොචයං චිත්තං පස්ස සිස්සාමීති සික්ඛති.**

මෙහි සාමාන්‍ය අර්ථය නම්:-

1. සිත මනාකොට දනිමින් ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   සිත මනාකොට දනිමින්, ප්‍රකට කර ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

2. සිත අභිප්‍රමොද කරමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   සිත අභිප්‍රමොද කරමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

3. සිත අරමුණෙහි සමකොට පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   සිත අරමුණෙහි සමකොට පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

4. සිත නීවරණ ධ්‍යානාඞ්ග ආදියෙන් මුදමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

සිත නීවරණ ධ්‍යානාඞ්ග ආදියෙන් මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

මේ තෘතීය චතුෂ්කය චිත්තානුපස්සනා වශයෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**1. සිත මනාකොට දනිමින්, ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**සිත මනාකොට දනිමින් ප්‍රකට කර ගනිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

මෙහි චිත්ත නම් සතර ධ්‍යාන චිත්තයෝ ය. යෝගාවචර තෙම ප්‍රථම, ද්විතීය, චතුෂ්කයන්ගේ වශයෙන් ආනාපාන සතිය වඩා කායසංස්කාරයන් හා චිත්තසංස්කාරයන් ද සංසිඳුවා ගෙන, ඉක්බිති එසේ කාය-චිත්තසංස්කාරයන් සංසිඳුවා ගැනීමට උපකාර වූ ධ්‍යාන චිත්තයන් ද මනාකොට දැන ආශ්වාස ප්‍රශ්වාස කරමින් හික්මෙන්නේ ය.

**2. සිත අභිප්‍රමෝද කරමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**සිත අභිප්‍රමෝද කරමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

යෝගාවචර තෙම ධ්‍යාන චිත්තය මනාකොට දැන ඒ ධ්‍යාන චිත්ත සම්ප්‍රයුක්ත ප්‍රීතිසම්බොධ්‍යාඞ්ග වූ ධ්‍යාන ප්‍රීතියෙන් සතුටු වන්නේ හාත්පසින් සතුටු වන්නේ නොහොත් ප්‍රීතිය අරමුණු කොට ඇති විදර්ශනා චිත්තය එම ආලම්බන වූ ප්‍රීතිය විසින් සතුටු කරමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය. මේ **අභිප්‍රමෝදය, සමාධි** වශයෙන් ද, **විදර්ශනා** වශයෙන් දැයි දෙයාකාරයෙන් ම

සිදුවේ. ප්‍රීතිසහගත වූ ප්‍රථම, ද්විතිය යන ධ්‍යාන ද්වයට සමවදනා කෙණෙහි ම තත්සම්ප්‍රයුක්ත ප්‍රීතියෙන් සිත සතුටු කිරීම **සමාධි** වශයෙන් **අභිප්‍රමෝද** කිරීම නම් වේ. ඒ ප්‍රීති සහගත ධ්‍යානද්වයට සමවැද එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත ප්‍රීතිය ක්‍ෂය, ව්‍යය වශයෙන් සම්මර්ශනය කිරීම **විදර්ශනා** වශයෙන් සිත **අභිප්‍රමෝද** කිරීම නම් වේ. මෙසේ දෙයාකාරයෙන් සිත අභිප්‍රමෝදය කරමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

**3. සිත අරමුණෙහි සමකොට පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**සිත අරමුණෙහි සමකොට පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

සිත සමාහිත කරගැනීම හෙවත් අරමුණෙහි සමකොට පිහිටුවා ගැනීම **සමාධි** වශයෙන් හා **විදර්ශනා** වශයෙන් දැයි යන දෙයාකාරයෙන් ම සිදු වේ. ප්‍රථම ධ්‍යානාදීන්ගේ වශයෙන් අරමුණෙහි සිත සමකොට තබන්නේ නොහොත් මදකුදු ලීන පක්‍ෂයට ද, උද්ධච්ච පක්‍ෂයට ද නොගොස්, අඩුවැඩි නොව, ඉන්ද්‍රිය සමත්වයට හෙවත් ඉන්ද්‍රියයන්ගේ සමබවට පැමිණීමෙන් විසම නොව, සමව සිත පවත්වා ගැනීම සමාධි වශයෙන් සමාහිත කරගැනීම නම් වේ. ඒ ධ්‍යානයන්ට සමවැද එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත වූ ප්‍රීතිය, ක්‍ෂය, ව්‍යය වශයෙන් සම්මර්ශනය කරණුවහට විදර්ශනාක්‍ෂණයෙහි දී අනිත්‍යාදී ලක්‍ෂණ ප්‍රතිවෙධ කිරීමෙන් **ක්‍ෂණික සමාධිය** උපදී. මෙසේ උපන්නාවූ ක්‍ෂණික සමාධි වශයෙන් ද අරමුණෙහි සිත සමකොට තබන්නේ **විදර්ශනා** වශයෙන් සිත අරමුණෙහි සමකොට පිහිටුවා ගැනීම නම් වේ. මෙසේ ද යෝගාවචර තෙම අරමුණෙහි මනාකොට සිත පිහිටුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

**4. සිත නීවරණ ධ්‍යානාඞ්ගාදියෙන් මුදමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**සිත නීවරණ ධ්‍යානාඞ්ගාදියෙන් මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

යෝගාවචර තෙම ප්‍රථම ධ්‍යානයට සමවැදීමේදී සිත **විෂ්කම්භන විමුක්ති** වශයෙන් **නීවරණයන්** කෙරෙන් මිදෙන්නේ, වෙන්කරන්නේ, වෙසෙසින් වෙන් කරන්නේ, නීවරණයන් දුරු කරන්නේ ය. ද්විතීය ධ්‍යානයෙන් සිත **විතක්ක - විචාරයන්** කෙරෙන් මුදන්නේ ය. තෘතීය-ධ්‍යානයෙන් සිත **ප්‍රීතිය** කෙරෙන් මුදන්නේ ය. චතුර්ථ ධ්‍යානයෙන් **සුඛ - දුක්ඛයන්** කෙරෙන් සිත මුදන්නේ ය, වෙසෙසින් මුදන්නේ ය. තවද ඒ ධ්‍යානයන්ට සමවැද, එයින් නැගී ධ්‍යානසම්ප්‍රයුක්ත චිත්තය ක්ෂය, ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන කල්හි ඒ යෝගී තෙම අනිත්‍යතාවයාගේ කෙළවර වූ භඞ්ගය දක්නා **භඞ්ගානුපස්සනා ක්ෂණයෙහි** චිත්තමුඛයෙන් සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් දකී. මෙසේ හෙතෙම ත්‍රෛභූමික ධර්මයන්ගේ අනිත්‍යතාවය දක්නා **අනිත්‍යානුපස්සනාවෙන්** ප්‍රත්‍යසමුප්පන්න ධර්මයන් කෙරෙහි නිත්‍යයහ, ශාස්වතයහ යි පැවති මිථ්‍යා සංඥාවෙන් හෙවත් මිථ්‍යා දෘෂ්ටියෙන් සිත මුදාගන්නේ ය. එසේ ම **දුක්ඛානුපස්සනායෙන්** සුඛසංඥායෙන් ද, **අනත්තානුපස්සනායෙන්** ආත්ම සංඥායෙන් ද, සංස්කාරයන් කෙරෙහි නිර්වේදාකාරයෙන් **නිබ්බිදානුපස්සනායෙන්** නන්දි නම් වූ සප්‍රීතික තෘෂ්ණායෙන් ද, සංස්කාරයන් කෙරෙහි විරජ්ජනාකාරයෙන් පැවති **විරාගානුපස්සනායෙන්** රාගයා කෙරෙන් ද, සංස්කාරයන්ගේ නිරෝධය බලන්නා වූ **නිරෝධානුපස්සනායෙන්** සමුදයෙන් ද, පටිනිස්සජ්ජනාකාරයෙන් පවත්නාවූ **පටිනිස්සග්ගානුපස්සනායෙන්** ආදානයෙන් හෙවත් අනිත්‍යාදී ග්‍රහණයෙන් හෝ ප්‍රතිසන්ධිග්‍රහණයෙන් හෝ සිත මුදමින් ආශ්වාස ප්‍රශ්වාස කරමින් හික්මෙන්නේ ය. මෙසේ හෙයින් මේ තෘතීය චතුෂ්කය චිත්තානුපස්සනා වශයෙන් දක් වන ලද බව දත යුතු.

## චතුර්ථ චතුෂ්කය

**1. අනිච්චානුපස්සී අස්ස සිස්සාමීති සික්ඛති**
**අනිච්චානුපස්සී පස්ස සිස්සාමීති සික්ඛති.**

**2. විරාගානුපස්සී අස්ස සිස්සාමීති සික්ඛති**
**විරාගානුපස්සී පස්ස සිස්සාමීති සික්ඛති.**

**3. නිරෝධානුපස්සී අස්ස සිස්සාමීති සික්ඛති**
**නිරෝධානුපස්සී පස්ස සිස්සාමීති සික්ඛති.**

**4. පටිනිස්සග්ගානුපස්සී අස්ස සිස්සාමීති සික්ඛති**
**පටිනිස්සග්ගානුපස්සී පස්ස සිස්සාමීති සික්ඛති.**

මෙහි අර්ථය නම්:-

1. අනිත්‍යය යි දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   අනිත්‍යය යි දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

2. විරාගය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   විරාගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

3. නිරෝධය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   නිරෝධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

4. පටිනිස්සග්ගය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

   පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

මේ සතර වන චතුෂ්කය ධම්මානු පස්සනා වශයෙන් වදාරණ ලදී.

**1. අනිත්‍යයයි දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**අනිත්‍යය යි දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

මෙහි **අනිත්‍යය** නම් **පඤ්චස්කන්ධය** යි. ස්කන්ධ පඤ්චකය **උත්පාද, ව්‍යය, අන්‍යථාත්ව** යන මෙයින් යුක්ත බැවින් අනිත්‍යය යි කියනු ලැබේ. **එහි උත්පාදය** නම් ප්‍රත්‍ය සමුප්පන්න ධර්මයන්ගේ හේතු ප්‍රත්‍යයෙන් වන උත්පත්ති යයි. උත්පන්න වූ ඒ ධර්මයන්ගේ නිරොධය හෙවත් විනාශය **ව්‍යය** නම්. ජරායෙන් වන අන්‍යථාභාවය **අන්‍යථාත්ව** නම්. මේ ත්‍රිවිධ ලක්ෂණයන්ගේ ඇති-වීමෙන් ස්කන්ධයන් කෙරෙහි යම් අනිත්‍ය සංඥාවක් වේ ද ඒ ලක්ෂණත්‍රය **අනිත්‍යය** නම් වේ. ඉපිද නැතිවීම හෝ උපන්නාවූ ධර්ම ඒ උපන් ආකාරයෙන් නො සිට **ක්ෂණ** භඞ්ග වශයෙන් බිඳීයාම **අනිත්‍යතාව** යයි. **අනිත්‍යානු පස්සනා** නම් ඒ ක්ෂණ භඞ්ග සඞ්ඛ්‍යාත වූ අනිත්‍යතාවගේ වශයෙන් රූපාදී ධර්මයන් කෙරෙහි අනිත්‍යයයි බැලීමයි. **අනිච්චානුපස්සී** නම් ඒ අනිත්‍යානු දර්ශනයෙන් සමන්විත වූ යොගාවචරයා යි. මෙසේ යෝගාවචර තෙම ප්‍රථම, ද්විතීය, තෘතීය චතුෂ්කයන්ගේ වශයෙන් මේ ආනාපාන සතිය වඩා ඉක්බිති ස්කන්ධ පඤ්චකය අනිත්‍ය යයි අනිච්චානු පස්සනායෙන් දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

**2. විරාගය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**විරාගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

මෙහි **විරාගය, ක්ෂය විරාගය ය, අත්‍යන්ත විරාගය යි** දෙයාකාර වේ. එයින් **ක්ෂය විරාගය** නම් සංස්කාරයන්ගේ

ක්‍ෂණ භඞ්ගය හෙවත් ක්‍ෂණික නිරොධ යයි. **අත්‍යන්ත විරාගය** නම් නිවණයි. **විරාගානු පස්සනා** නම් ඒ ක්‍ෂය විරාග, අත්‍යන්ත විරාග වශයෙන් පැවති විදර්ශනාව හා මාර්ග යයි. එහි ක්‍ෂය විරාග වශයෙන් පැවති විදර්ශනාව ද, අත්‍යන්ත විරාග වශයෙන් පැවති මාර්ගය ද කියන ලදී. මෙසේ යෝගාවචර තෙම ක්‍ෂය විරාග, අත්‍යන්ත විරාග වශයෙන් දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

**3. නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

මෙහි **නිරොධය ද, ක්‍ෂය නිරොධ ය, අත්‍යන්ත නිරොධ ය** යි ද්විධ වේ. **ක්‍ෂය නිරොධය** නම් සංස්කාරයන්ගේ ක්‍ෂණ භඞ්ගය හෙවත් ක්‍ෂණික නිරොධ යයි. **අත්‍යන්ත නිරොධය** නම් නිවණයි. ක්‍ෂය නිරොධයෙන් විදර්ශනාව ද, අත්‍යන්ත නිරොධයෙන් මාර්ගය ද කියන ලදී. මෙසේ යෝගාවචර තෙම ක්‍ෂය නිරොධ, අත්‍යන්ත නිරොධ වශයෙන් දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

**4. පටිනිස්සග්ගය දකිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.**

**පටිනිස්සග්ග** නම් හැරපීම යි, දුරුකිරීම් වශයෙන් හැරපීම යි, හෙවත් පැන අරමුණු වශයෙන් අල්ලාගැනීමෙන් හැරපීම යි. මෙය විදර්ශනාඥානයෙන් හා මාර්ග ඥානයෙන් ද සිදුකරනු ලැබේ. මේ **පටිනිස්සග්ග ය, පරිච්චාග පටිනිස්සග්ග, පක්ඛන්දන පටිනිස්සග්ග** යයි දෙවැදෑරුම් වේ. ඒ දෙවැදෑරුම් පටිනිස්සග්ගය අනුව බැලීම **පටිනිස්සග්ගානු පස්සනා** නම් වේ. විදර්ශනාවට හා මාර්ගයට ද නමෙකි.

පහ කළ යුතු ධර්මයන්ගේ තදඞ්ග ප්‍රහාණ වශයෙන් හෝ සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් හෝ පරිච්චජනය හෙවත් හැරපීම, දුරුකිරීම **පරිච්චාග පටිනිස්සග්ග** නම් වේ. විදර්ශනාව තදඞ්ග ප්‍රහාණ වශයෙන් ස්කන්ධාභිසංස්කාරයන් හා සමග කෙලශයන් පරිත්‍යාග කෙරේ, දුරුකෙරේ. අනිත්‍යානු පස්සනාව තදඞ්ග ප්‍රහාණ වශයෙන් නිත්‍ය සංඥාව දුරුකරන්නී, නිත්‍ය යයි ගැනීම් වශයෙන් පැවති කෙලශයන් හා තන්මූලක අභිසංස්කාරයන් ද, ඒ දෙකින් ම අනාගතයෙහි උපදනා විපාක ස්කන්ධයන් ද දුරුකෙරේ දුක්ඛානුපස්සනාව හා අනත්තානුපස්සනාව ද සුඛ සඤ්ඤා, ආත්ම සංඥා ආදීන් ද එසේම දුරුකෙරෙත්. සඞ්ඛත ධර්මයන්ගේ අනිත්‍යාදී දෙස් දැකීමෙන්, එබඳු දෙස් නැති නිර්වාණයෙහි නිම්න භාවයෙන් බැසගැනීම් වශයෙන් පක්ඛන්දන හෙවත් පැන වදනාකාරයෙන් පැවති විදර්ශනාව, **පක්ඛන්දන පටිනිස්සග්ගානු පස්සනා** නම් වේ. මෙය තදඞ්ග වශයෙන් කෙලෙස් දුරුකරන විදර්ශනාවගේ පටිනිස්සග්ග යයි. මාර්ගය ද, සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් ස්කන්ධාභිසංස්කාරයන් හා සමග කෙලෙස් දුරුකරන කල්හි අවිපාක ධර්මතා පාදනයෙන් අභිසංස්කාරයෝ ද, අනුත්පත්තියට සුදුසු වන බැවින් තන්මූලක වූ විපාක ස්කන්ධයෝ ද දුරුකෙළේ නම් වෙත්. නිවණ අරමුණු කිරීම් වශයෙන් නිවණෙහි පැන වදනාකාරයෙන් පවත්නා මාර්ගය **පක්ඛන්දන පටිනිස්සග්ගානු පස්සනා** නම් වේ. විදර්ශනා ඥානය, මාර්ග ඥානය යන දෙකම පූර්ව පූර්ව ඥානයට අනුව දක්නා හෙයින් අනුපස්සනා නම් වේ. මාර්ග ඥානය ද, ගොත්‍රභූ ඥානයට පසුව නිර්වාණය දක්නා හෙයින් අනුපස්සනා නම් වේ යයි කියනු ලැබේ.

මේ සතර වන චතුෂ්කය සුද්ධ විපස්සනා වශයෙන් ම කියන ලදී පූර්ව වූ චතුෂ්ක තුන සමථ විදර්ශනා වශයෙන් දේශනා කරන ලද බව දත යුතු. මෙසේ සතර චතුෂ්කයන්ගේ වශයෙන් ෂොඩශ වස්තුක වූ ආනාපාන සති භාවනාව දත යුතු.

## ආනාපානසති භාවනායෙහි අනුසස්

මේ ආනාපාන සතිය මහත්ඵල මහානිසංස වේ.

**1. විතර්ක සිඳලීම**- මේ ආනාපාන සති සමාධිය ශාන්ත, ප්‍රණීත, අසේචනක, සුඛවිහාර හෙයින් සමාධියට අන්තරායකර වූ කාමවිතර්කාදීන්ගේ වශයෙන් සිත ඔබින් ඔබ දිවීම වළකා, සිත ආනාපාන අරමුණට අභිමුඛ කෙරේ.

**2. මාර්ගඵල පිරීමට මුල්වීම**- ආනාපාන සතිය වැඩීමෙන් කායානුපස්සනාදී වූ සතර සතිපට්ඨානය සම්පූර්ණ කෙරේ. බෝධ්‍යංග භාවනාවන් නැතිව සතිපට්ඨාන භාවනාවගේ සම්පූර්ණවීමක් නොවන හෙයින් සප්ත බෝධ්‍යංගයන් ද වඩන ලද්දේ වේ. බෝධ්‍යංග භාවනා-යෙන් විද්‍යා විමුක්තින් මුදුන්පත් වන හෙයින් විද්‍යා විමුක්ති හෙවත් මාර්ගඵල ද පුරන්නේ ය.

**3. චරිමක ආශ්වාස ප්‍රශ්වාස දැනගැන්ම**- චරිමක ආශ්වාස ප්‍රශ්වාස නම් අවශාන වූ ආශ්වාස ප්‍රශ්වාසයෝ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් "රාහුලය ආනාපාන සතිය මෙසේ භාවිතා කරන ලද්දේ චරිමක ආශ්වාස ප්‍රශ්වාස පවා දැනගෙනම නිරුද්ධවෙත්. නොදැනී නිරුද්ධ නොවෙයි" යයි වදාළ හෙයින්, මේ ආනාපාන සතිය මනාකොට වඩන ලද පුද්ගල තෙමේ, මරණය පැමිණි අවස්ථාවෙහි දී අවශාන වශයෙන් ඇති වන ආශ්වාස ප්‍රශ්වාසයන් පවා දැනීමෙන් ම නිරුද්ධ වන්නේ යයි දක්වන ලදී. මේ චරිමකයෝ තුන් දෙනෙකි. එනම්:-

1. **භව චරිමක**
2. **ධ්‍යාන චරිමක**
3. **චුති චරිමක** යන තුන ය.

**1. භව චරිමක**- ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇත්තේ කාමභවයෙහි ය. රූපාරූප භවයන්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ නැත්තාහ. හීනවූ කාමභවයෙහි පවත්නා ආශ්වාස ප්‍රශ්වාසයෝ **භව චරිමක** නම් වෙති.

**2. ඣාන චරිමක**- ධ්‍යානයන් අතුරෙන් ප්‍රථම, ද්විතිය, තෘතිය ධ්‍යාන අවස්ථාවන්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇත්තාහ. චතුර්ථධ්‍යානයන්හි දී ආශ්වාස ප්‍රශ්වාස නැත. එහෙයින් ප්‍රථම, ද්විතිය, තෘතිය යන ධ්‍යානත්‍රයෙහි ආශ්වාස ප්‍රශ්වාසයෝ **ඣාන චරිමක** ය.

**3. චුති චරිමක**- යම් ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් චුති චිත්තයෙන් යට සොළොස් වන සිත හා සමග ඉපද, චුති චිත්තය හා සමග නිරුඬ වෙද්ද, මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ **චුති චරිමක** නම් වෙත්. මෙහි දී අදහස් කරනු ලබන්නේ චුති චරිමක යයි. මෙසේ වනුයේ පෘථජ්ජනයාහට ය. රහතන් වහන්සේට වනාහි සිත් ශාන්තව වැටෙන හෙයින්, ආශ්වාස ප්‍රශ්වාසයෝ චුති චිත්තයෙන් පෙරව ම නිරුඬ වෙති යි කියන ලදී. මේ ආනාපාන කර්මස්ථානයෙහි යෙදුනු යෝගීහට ආනාපාන සඞ්ඛ්‍යාත අරමුණ මනාකොට පරිග්‍රහ කළ බැවින් චුති චිත්තයට පෙරටුව සොළොස් වන චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි ඒ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ උත්පාදය ආවර්ජනා කරණුවහට උත්පාදය ද පහළවෙයි. ඒ ආශ්වාස ප්‍රශ්වාස-යන්ගේ ස්ථිතිය ආවර්ජනා කරණුවහට ස්ථිතිය ද පහළ වෙයි. ඔවුන්ගේ භඞ්ගය බලනුවහට භඞ්ගය ද ප්‍රකට වෙයි. මේ කමටහන හැර අන්‍ය කමටහනක් භාවනා කොට රහත් බවට පැමිණි භික්ෂුහට ජීවිතය පවත්නා කාලය පිරිසිඳ දැනීම හෝ නො දැනීම විය හැකි. මේ ෂොඩශ වස්තුක වූ ආනාපාන සතිය භාවනා කොට අර්හත්වයට පැමිණියහට ජීවිත කාලාවධිය පිරිසිඳුනා ලද්දේම වේ. හෙතෙම දැන් මෙතෙක් කල් මාගේ ආයුසංස්කාරයෝ පවත්නාහ. මෙයින් මතුයෙහි නො පවත්නාහයි දැන තමන්ගේ ස්වභාවයෙන් ම සිරුරු පිළිදැග්ම, හැදීම්, පෙරවීම් ආදී වූ සියලු කටයුතු නිමවා ඇස් පියන්නේ ය.

පෙර සිතුල්පහු වෙහෙර විසූ දෙබෑ තෙරුන් අතුරෙන් එක් තෙර නමක් පුරපසළොස්වක දින ප්‍රාතිමෝක්ෂය දෙසා භික්ෂු සඞ්ඝයා පිරිවරා, තමන් වැඩවසන තැනට

ගොස් සක්මන් මලුයෙහි සිට සඳපහන බලා, තමන්ගේ ආයුසංස්කාරය සලකා, පෙර අඩමස සවස් වේලෙහි හාත්පසින් නමන ලද ක්ෂීරධාරා බඳු වූ අහස් තලය ද, රිදීපටක් බඳු වැලිතලා ඇති භූමිභාගය ද දැක, මේ කාලය ද, ප්‍රදේශය ද රම්‍ය ය, මාගේ අදහස වැනිය, කෙතෙක් කල් මේ දුක්ඛ භාරය ඉසිලිය යුතුදේ හෝයි සිතනුයේ, භික්‍ෂු සඞ්ඝයා අමතා "තොප විසින් කෙසේ පිරිනිවන් පානා භික්‍ෂූහු දක්නා ලද විරූද"යි ඇසූ සේක. ඔවුන් අතුරෙන් සමහර කෙනෙක්, අප විසින් අසුන්හි හිඳම පිරිනිවන් පානාහු දක්නා ලද විරූහු යයි ද, සමහර කෙනෙක් අප විසින් අහස පලක් බැඳ හිඳම පිරිනිවන් පානාහු දක්නා ලද විරූහයි ද කීහු. එකල්හි මේ තෙරුන් වහන්සේ, දැන් මම තොපට සක්මන් කෙරෙමින් ම පිරිනිවන් පානාක්හු දක්වමි යි කියා, සක්මන හරහ ඉරක් ඇඳ, මම මේ සක්මන් කෙළවරින් අනික් කෙළවරට ගොස් එසින් හැරී විත් මේ රේඛාවට පැමිණ ම පිරිනිවන් පාමි යි කියා සක්මනට බැස අනික් කෙළවරට ගොස් හැරී එන්නේ එක් පයෙකින් රේඛාව ඇක්ම ගත් කෙණෙහි ම පිරිනිවියේ ය. ආනාපාන සති භාවනාව මෙසේ මහත්ඵල මහානිශංස බව දත යුතු.

## 10. උපසමානුස්සතිය

**උපසමය** නම් නිර්වාණය යි. නිර්වාණ සඞ්ඛ්‍යාත උපසමයෙහි ගුණ සිහි කරන හෙයින් **උපසමානුස්සති** නම් වේ.

උපසමානුස්සතිය වඩනු කැමති යෝගාවචර තෙම විවේකගත ව, නන් අරමුණු වලින් සිත වළකා මේ කමට හනෙහි ඇළුණු සිත් ඇතිව **"යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො, පිපාසවිනයො, ආලයසමුග්ඝාතො, වට්ටුපච්ඡෙදො, තණ්හක්ඛයො විරාගො, නිරොධො නිබ්බානං"** ති යනාදී වශයෙන්

භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි, සඞ්ඛත වූ හෝ අසඞ්ඛත වූ හෝ යම් ධර්මකෙනෙක් ඇද්ද, ඒ ධර්ම අතුරෙන් **විරාගය** අග්‍රයයි කියනු ලැබේ. ඒ වනාහි මදනිම්මදන ය, පිපාසවිනය ය, ආලයසමුග්ඝාත ය, වට්ටුපච්ඡේදය, තණ්හක්ඛය, විරාගය, නිරොධය, නිර්වාණය" යි වදාළ පරිදි සියලු දුක් නැති කරන නිර්වාණයෙහි ගුණ සිහි කළ යුතු වේ. මෙහි-

**සඞ්ඛත ධර්ම** නම් හේතු ප්‍රත්‍යයෙන් උපන්නාවූ ධර්මයෝ ය.

**අසඞ්ඛත ධර්මය** නම් හේතු ප්‍රත්‍යයෙන් නූපන් නිර්වාණ ධර්මය ය.

**ධර්ම** නම් ස්වභාව ධර්මය යි.

**විරාගය** නම් රාගයාගේ අභාවය. එනම් නිවණයි.

**මදනිම්මදනය**- නිවණට පැමිණ, මම උසස්මියි පැවති මානය නම් වූ මාන මදය ද, පුරුෂත්වය නිසා උපදනා වූ පුරුෂ මදය ද, ජාතිය නිසා ඇතිවන ජාති මදය ද, යනාදී වූ සියලුම මදයෝ නිම්මදනයට හෙවත් විනාශයට යන හෙයින් නිර්වාණයට නිම්මදන යයි කියනු ලැබේ.

**පිපාසවිනය**- නිවණට පැමිණ කාමතෘෂ්ණා සඞ්ඛ්‍යාත වූ කාමපිපාසා විනාශයට, අස්තයට යන හෙයින් නිර්වාණය පිපාසවිනය නම් වේ.

**ආලය සමුග්ඝාතය**- නිවණට පැමිණ පඤ්චකාම ගුණ නැමැති ආලයෝ සහමුලින් නැතිවන හෙයින් නිර්වාණය ආලය සමුග්ඝාත නමුදු වේ.

**වට්ටුපච්ඡේදය**- නිවණට පැමිණ තුන්භූමියෙහි වූ කර්ම ක්ලේශ, විපාක සඞ්ඛ්‍යාත වට්ටයන් සිඳෙන හෙයින් නිර්වාණය වට්ටුපච්ඡේද නමුදු වේ.

**තණ්හක්ඛය**- නිවණට පැමිණීමෙන් සම්ාකාරයෙන් තෘෂ්ණාව ක්ෂය වන හෙයින් නිවණට තණ්හක්ඛය යයි කියනු ලැබේ.

**විරාගය**- නිවණට පැමිණීමෙන් සම්ාකාරයෙන් තෘෂ්ණාවෙහි නො ඇලීම වන හෙයින් නිවණ විරාග නමුදු වේ:

**නිරොධ**- නිවණට පැමිණ සියලු දුක් නිරුධ වන හෙයින් නිවණ නිරොධ නමුදු වේ.

**නිර්වාණය**- යම් හෙයකින් වනාහි මේ අසඞ්ඛත ධර්මය, සතර යොනිය, පඤ්චගතිය, සප්ත විඤ්ඤාණස්ථිතිය, නව සත්ත්වාවාසය යන මොවුන්, අනික් අනික් භවයකට හෙවත් දෙවියන් මිනිස්වීම පිණිස මිනිසුන් නාරජුන්වීම පිණිස යනාදී වශයෙන් මතු මතු භව පිණිස බඳනා හෙයින් යොදවන හෙයින් වාණ යයි ලත් ව්‍යවහාරය ඇති තෘෂ්ණායෙන් නික්මුණේ ද, තෘෂ්ණාව හා විසංයුක්තවූයේ ද, එහෙයින් **නිබ්බාණ** යයි කියණු ලැබේ.

මෙසේ මදනිම්මදනතාදී ගුණයන්ගේ වශයෙන් ද නිර්වාණ සඞ්ඛ්‍යාත උපසමය සිහිකළ යුතු.

තවද, භාග්‍යවතුන් වහන්සේ **“අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, සච්චඤ්ච, පාරඤ්ච, සුදුද්දසඤ්ච, අජරඤ්ච, ධුවඤ්ච, නිප්පපඤ්ච, අමතඤ්ච, සිවඤ්ච, ඛෙමඤ්ච, අබ්භුතඤ්ච, අනීතකංච, අබ්‍යාපජ්ජංච, විසුද්ධිංච, තාණංච, ලෙනංච, වො භික්ඛවෙ දෙසිස්සාමි”** ති යනාදී වශයෙන් ද නිර්වාණයාගේ ගුණ වදාළ සේක

මෙහි **අසඞ්ඛත** නම් ප්‍රත්‍යයෙන් නොනිපන් බවය.

**සත්‍යය**- නිර්වාණය කිසි පර්යායෙකිනුදු අසත්‍යය නොවන බැවින් **ඒකාන්තයෙන්** ම සත්‍යය වන බැවින් අවිපරිතාර්ථයෙන් සත්‍යය නම් වේ.

**පාරං**– නිර්වාණය සංසාරයාගේ පරතෙර බැවින් පාර නමි.

**සුදුද්දස**– නිර්වාණය පරමගම්භීර බැවින් ද. අතිසූක්ෂම ශාන්ත ස්වභාවය ඇති බැවින් ද, නුමුහු කල නුවණ ඇත්තවුන් විසින් දක්නට නොපිළිවන් බැවින් මනාකොට දක්නට දුෂ්කර ය.

**අජරං**– තමා කෙරෙහි ජරා නැති බැවින් ද, නිවන් පැමිණි පුද්ගලයාහට ජරා නැති හෙයින් ද, නිවණ අජර නම් වේ.

**ධුවං**– ඒ ජරා ආදීන්ගේ වශයෙන් නොනස්නා හෙයින් ස්ථිර හෙයින් ධ්‍රැව නම් වේ.

**නිප්පපඤ්චං**– තෘෂ්ණා ආදී ප්‍රපඤ්චයෝ නැති හෙයින් නිප්පපඤ්ච නමි.

**අමතංච**– මරණ නැති බැවින් අමෘතය.

**සිවං**– අශිව භාවය කරන්නා වූ සංක්ලෙශ ධර්මයන් ගේ අභාවයෙන් සිව නම් වේ.

**ඛෙමං**– කාමාදී චතුර්යෝගයෙන් උපද්‍රව නැති හෙයින් ක්ෂේමය:

**අබ්භුතං**– විසංස්කාර බැවින් ද, ආශ්චර්ය්‍ය බැවින් ද, අභූතපූර්ව බැවින් ද අබ්භූතය.

**අනීතිකං**– ඊති නම් වූ සියලු අනර්ථයන්ගේ අභාව-යෙන් අනීතිකය.

**අව්‍යාපජ්ඣං**– දුක් නැති බැවින් අව්‍යාපජ්ඣය.

**විසුද්ධිං**– සියලු ක්ලෙශ මලයන්ගෙන් අත්‍යන්ත විසුද්ධ බැවින් විශේෂයෙන් ම ශුද්ධවේනුයි විසුද්ධි නමි.

**දීපං**– චතුර්විධ ඕඝයෙන් නොමඩනා ලද බැවින් දීපය.

**තාණං**- සියලු වට්ටදුක්ඛයෙන් ආරක්ෂා කරනු ලබන බැවින් තාණය.

**ලෙනං**- සංසාරයෙන් පිහිට වන හෙයින් ලෙන නම් වේ.

මෙසේ ද සියලු දුක්ඛයාගේ ව්‍යුපසම සඞ්ඛ්‍යාත උපසමයෙහි ගුණ මෙනෙහි කළ යුතු.

මෙපරිද්දෙන් නිර්වාණයෙහි ගුණ සිහිකරන්නා වූ යෝගාවචරයාගේ සිත ඒ වේලෙහි රාග, ද්වෙෂ, මොහාදියෙන් නොමඩනා ලද්දේම, නිවණ අරමුණු කරමින් සිත සෘජු වේ. නීවරණ ධර්මයන් විෂ්කම්භනය වේ. ධ්‍යානාඞ්ග පහළ වේ. උපසම ගුණ ගැඹුරු බැවින් ද, නා නා විධ ගුණ සිහිකිරීමෙහි අදහස් ඇති බැවින් ද, ඒ ධ්‍යානය උපචාරප්‍රාප්තවේ. අර්පණාවට නො පැමිණේ. උපසමානුස්සතිය සමෘද්ධ වන්නේ ආර්‍යශ්‍රාවකයන්ට ම ය. එසේ වුවත් උපසමය ගරු කොට ගත් පෘථග්ජනයන් විසින් ද මෙනෙහි කටයුතු ය. ශ්‍රැත වශයෙන් ද නිවන්හි සිත පහදී.

### උපසමානුස්සතියෙහි අනුසස්

උපසමානුස්සතිය වඩන යෝගාවචර තෙම:—

සුවසේ සැතපෙන්නේය

සුවසේ පිබිදෙන්නේ ය.

සන්සුන් ඉඳුරන් ඇති වන්නේ ය.

සන්සුන් සිත් ඇති වන්නේ ය.

හිරි - ඔතප් දෙකින් සමන්විත වේ.

ප්‍රසාද උපදවන්නේ ය.

ප්‍රණීත වූ අදහස් ඇති වන්නේ ය.

සබ්‍රම්සරුන්හට ගුරුද, සම්භාවනා කටයුතු ද වේ.

මතුයෙහි චතුරාර්‍ය සත්‍යාවබෝධය නොකෙළේ නම් සුගතිපරායණ වේ

# සතර බ්‍රහ්ම විහරණය

**බ්‍රහ්මවිහාරයෝ** සතර දෙනෙකි. එනම්:-

1. **මෙත්තා**
2. **කරුණා**
3. **මුදිතා**
4. **උපෙක්ඛා**

මේ සතර ධර්මයෝ ශ්‍රෙෂ්ඨ බැවින් ද, නිර්දොෂ බැවින් ද **බ්‍රහ්මවිහාර** යයි කියනු ලැබේ. සෙසු කමටහන් ආත්ම හිත ප්‍රතිපත්තිමාත්‍ර ය. මේ බ්‍රහ්මවිහාරයෝ **"සබ්බෙ සත්තා සුඛිතා හොන්තු"** යනාදී වශයෙන් දක්වනු ලබන හෙයින් පරහිත ප්‍රතිපත්තිහු ය. මෙසේ සියලු සතුන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති භාවයෙන් මේ විහාරයෝ ශ්‍රෙෂ්ඨයෝ යි. බ්‍රහ්මයෝ වනාහි මෙහිදී වැඩූ ධ්‍යාන භාවනා බලයෙන් නීවරණයන්ගෙන් මිදුණු ධ්‍යාන සිත් ඇතිව බඹලොව උපන්නාහු, එහි ආයු ඇතිතාක් විනීවරණ චිත්ත ඇතිවන බැවින් නිර්දොෂ චිත්ත ව වෙසෙද් ද, නොහොත් සියලු බුදුගුණයනට හේතු වූ දාන පාරමිතාදී වූ, බුද්ධකාරක ධර්මයන් පිරීමෙන් පිරිසුදු වූ ගුණ ඇති මහා බෝධි සත්ත්වයෝ සියලු සත්ත්වයන්හට හිතවත් බව පැතිරවීමෙන් ද, අහිත දුරු කිරීමෙන් ද, සම්ප්‍රාප්ත සම්පත්තියෙහි සතුටුවීමෙන් දැයි සියලු තන්හි දුරු කළ අගතිගමන ඇතිව, මධ්‍යස්ථභාව අධිෂ්ඨානයෙන් නිර්දෝෂ සිත් ඇතිව වෙසෙද් ද, ඒ බඹලොව උපන් බ්‍රහ්මයෝ හෝ මහාබෝධි-සත්ත්ව බ්‍රහ්මයෝ හෝ යම්සේ ද, එසේම මේ සතර බ්‍රහ්මවිහාරයෙන් සමන්විත වූ යෝගී තෙම යථොක්ත බ්‍රහ්මයන් හා සමව වසන හෙයින් ශ්‍රෙෂ්ඨ ව, නිර්දොෂව වසන්නේ යයි කියනු ලැබේ.

බ්‍රහ්මවිහාරයෝ සතර දෙනෙක් ම වූයේ **විසුද්ධිමාර්ගී මනස්කාරාදීන්ගේ** වශයෙනි. ව්‍යාපාද සංක්ලෙශාදීන් කෙරෙන් විශුද්ධියට උපාය මාර්ගීවූයේ **විශුද්ධිමාර්ගී** නම් වේ.

මොවුන් අතුරෙන් **මෙත්තා** හෙවත් **මෛත්‍රිය**, ව්‍යාපාදය බහුලයාහට ඉදුරාම ප්‍රතිපක්ෂ වන බැවින් ඔහුගේ **විශුද්ධිමාර්ගය** වේ. එසේම පරහිංසා බහුලයාහට **කරුණාව ද**, පරසම්පත්ති නො කැමැති අරති බහුලයාහට **මුදිතාව ද**, රාගය බහුලයාහට **උපෙක්ෂාව** ද, **විශුද්ධිමාර්ගයෝ** වෙති. හිතසුව එළවීම හෙවත් **හිතෝපසංහාරය** ද, අහිත දුරුකිරීම නම් වූ **අහිතාපනයනය ද**, සම්පත්තියෙහි සතුටුවීම නම් වූ **සම්පත්තිමෝදනය ද**, උපෙක්ෂාවීම නම් වූ **අනාභෝගය ද** යන මොවුන්ගේ වශයෙන් සත්ත්ව-යන් කෙරෙහි **මනස්කාරය** සතර ආකාර වේ. යම්සේ මව්තොමෝ ළදරු පුත්‍රයා ය, ගිලන් පුත්‍රයා ය, තරුණ පුත්‍රයා ය, සවකීය කටයුත්තෙහි යෙදුනු පුත්‍රයා ය යන සතර පුතුන් අතුරෙන් ළදරු පුත්‍රයාහට අභිවෘද්ධිය කැමති වෙද් ද, ගිලන් පුත්‍රයාහට ගිලන් බැවින් මුදනු කැමති වෙද් ද, තරුණ පුත්‍රයාහට, ඒ යෞවන සම්පත්තියගේ චිරස්ථිතිය කැමති වෙද් ද, සවකීය කටයුතුවල යෙදුණු පුත්‍රයාහට කිසි ක්‍රමයෙක නොයෙදී උත්සාහ නැත්තී වෙද් ද හෙවත් මධ්‍යස්ථවෙද් ද, එපරිද්දෙන් ම මේ සතර බ්‍රහ්ම-විහාරය වඩන්නා වූ යෝගාවචරයා විසින් ද සියලු සතුන් කෙරෙහි මෙත් වැඩිය යුතු වේ. එසේම කරුණා, මුදිතා, උපෙක්ඛා යන මේ උසස් ගුණයන් ද වැඩිය යුතු. ඔහු විසින් පළමු කොට සියලු සතුන් කෙරෙහි හිතාකාර පැවැත්මෙහි පිළිපැදිය යුතු. ඉක්බිති ව පවත්වන ලද හිත ඇති සත්ත්වයන්ගේ දුකින් මඩනා ලද බව දැක හෝ අසා හෝ, මේ පිළිවෙතින් මේ සත්ත්වයෝ නිරයාදියෙහි උපදනේ යයි කල්පනා කොට හෝ දුක් දුරුකිරීම් ආකාර-යෙන් පිළිපැදිය යුතු. ඉක්බිත්තෙන් මෙසේ පතන ලද හිත ඇති පතන ලද දුක් පහවීම් ඇති ඒ සත්ත්වයන් ගේ සම්පත්තිය දැක ඒ සම්පත්තියෙහි ප්‍රමෝදන වශයෙන් හෙවත් සතුටුවීම් වශයෙන් පිළිපැදිය යුතු. ඉක්බිති ඒ හිතාකාර පැවැතීම් ආදියෙන් මතුයෙහි කළයුත්තක් නැති හෙයින් අධ්‍යුපෙක්ෂ භාවය යයි කියන ලද මධ්‍යස්ථා-කාරයෙන් පිළිපැද්ද යුතු.

මේ සතර බ්‍රහ්මවිහරණය ම, අප්‍රමාණ අරමුණෙහි පවත්නා හෙයින් නොහොත් අප්‍රමාණ සත්ත්වයෝ මෙයට අරමුණු වන හෙයින් ද, එක් සත්ත්වයෙකු හෝ මෙතෙක් පෙදෙසෙක සත්ත්වයෝ හෝ ප්‍රමාණ කොට නොගෙන සියලු සත්ත්වයන් කෙරෙහි ම පැතිරවීම් වශයෙන් වැඩිය යුතු බැවින් මෙයට **අප්පමඤ්ඤා** හෙවත් අප්‍රමාණ්‍යයෝ යයි කියනු ලැබේ.

**මෙත්තා** – **අර්ථ වශයෙන්** වනාහි – සෙනහ කෙරේනු යි **මෙත්තා** නම්. මෙහි සෙනහය නම් සත්ත්වයන් කෙරෙහි පිළිපැදීම් වශයෙන්, රූක්ෂ බවට ප්‍රතිපක්ෂ වූ, නුවණින් යුක්තව හිතාකාර පැවැත්ම ය. තෘෂ්ණා වශයෙන් පැවතීම සෙනහය නො වෙයි. එය මොහ පූර්වාංගම වූ ලොභ ස්වරූපයකි. මෛත්‍රිය වනාහි අද්වෙෂ ස්වරූප වූ හෙයින් අලොභ සම්ප්‍රයුක්ත වෙයි. මෙත් කරණ මිත්‍රයා කෙරෙහි වූයේ හෝ මෙත් කරණු ලබන මිත්‍රයා කෙරෙහිවූයේ හෝ මිත්‍රයාගේ මේ පැවැත්ම වේනුයි **මෙත්තා** නම්. සත්ත්වයන් කෙරෙහි හිතවත් ආකාරයෙන් පැවැත්ම මෛත්‍රියයෙහි **ලක්ෂණය** වේ. සත්ත්වයන් කෙරෙහි හිත එළවීම එහි **රසය** හෙවත් කෘත්‍යය වේ. මට අනර්ථයක් කෙළේය යනාදී වශයෙන් පැවති වෛරය දුරු කිරීම **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය වෙයි. සත්ත්වයන්ගේ මනාප බව දැක්ම මෛත්‍රියගේ **පදට්ඨානය** හෙවත් ආසන්න කාරණය වෙයි. ව්‍යාපාදයාගේ විෂ්කම්භන වශයෙන් ව්‍යුපසමය හෙවත් සංසිඳවීම එහි **සම්පත්තිය** වේ. තෘෂ්ණා සහගත සෙනහයාගේ උත්පත්තිය මෛත්‍රියගේ **විපත්තිය** හෙවත් විනාශය වේ.

**කරුණා** – අනුන්ගේ දුක් දැක එය දුරුකරණු කැමැත්තෙන් ඒ දුක නොයිවසීම් වශයෙන්, සත්පුරුෂයන්ගේ සිත්හි හෘදය කම්පනය ඇති කරණ අර්ථයෙන් කරුණා නම් වේ. අනුන්ගේ දුක කිණනය කරණ හෙවත් විනාශ කරණ අර්ථයෙන් ද **කරුණා** නම්. දුක්ඛිතයන් කෙරෙහි පැතිරවීම් වශයෙන් අරමුණු කරණ අර්ථයෙන් ද

**කරුණා** නම් වේ. දුකට පැමිණි සත්ත්වයන්ගේ දුක් දුරු කරන ආකාරයෙන් පැවැත්ම කරුණායෙහි **ලක්ෂණය** වේ. අනුන්ගේ දුක් නොයිවසීම එහි කෘත්‍යය හෙවත් **රසය** වේ. විහිංසාවට ප්‍රතිපක්ෂ වශයෙන් වැටහීම හෙවත් නො වෙහෙසීම එහි **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය වේ. දුකින් මඩනා ලද සත්ත්වයන්ගේ අනාථ බව දැක්ම එහි **පදට්ඨානය** හෙවත් ආසන්න කාරණය වේ. විහිංසාවගේ ව්‍යුපසමය හෙවත් සත්ත්වයන්ගේ වෙහෙසන ආකාරයෙන් පැවති, කරුණාවට ප්‍රතිපක්ෂවූ, පටිඝ චිත්තයාගේ සංසිඳවීම එහි **සම්පත්තිය** වේ. කරුණා මුඛයෙන් ශෝකයාගේ ඉපදීම කරුණාවගේ **විපත්තිය** වේ.

**මුදිතා** - යම් ධර්මයක් කරණ කොට ගෙන ඒ ධර්මයෙන් යුක්තවූවෝ සතුටුවෙත් ද, මොදනය වෙත් ද, තෙමේ හෝ මොදනය වේ ද, මොදන මාත්‍රය හෝ වේ ද, එය **මුදිතා** නම් වේ. මුදිතාව පරසම්පත්තියෙහි සතුටුවීම හෙවත් ප්‍රමොදය **ලක්ෂණ** කොට ඇත්තී ය. ඊර්ෂ්‍යා නොකිරීම, ඊර්ෂ්‍යාවට ප්‍රතිපක්ෂ බව **රසය** හෙවත් කෘත්‍යය කොට ඇත්තී ය. පරසම්පත, අධිකුසල ධර්ම, ප්‍රාන්ත සයනාසන යන මෙහි අනභිරතිය හෙවත් නො ඇලීම නසන ආකාරයෙන් වැටහීම **පච්චුපට්ඨානය** වේ. සත්ත්වයන්ගේ සම්පත්තිය දැකීම එහි **පදට්ඨානය** වේ. අරතියගේ ව්‍යුපසමය හෙවත් අරතිය සංසිඳවාලීම එහි **සම්පත්තිය** වේ. ගෙහසිත ප්‍රීති වශයෙන් සිනහ ආදිය ඉපදවීම එහි **විපත්තිය** වේ.

**උපෙක්ඛා** - අවෛර වෙත්වා යනාදී වශයෙන් ව්‍යාපාද දුරු කිරීමෙන් ද, මධ්‍යස්ථ භාවයට පැමිණීමෙන් ද උපෙක්ෂා කෙරේනුයි **උපෙක්ඛා** නම්. සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථ භාවයෙන් පැවැත්ම උපෙක්ෂාවගේ **ලක්ෂණය** වේ. ප්‍රිය ආදී භෙද ඇති සියලු සත්ත්වයන් කෙරෙහි සම භාවයෙන් දැකීම එහි **රසය** වේ. සත්ත්වයන් කෙරෙහි ප්‍රතික්කූල අප්‍රතික්කූලාකාරයෙන් නොගන්නා හෙයින් සතුන් කෙරෙහි

ප්‍රතිඝ අනුනය දෙදෙනාගේ සංසිඳවීම් ආකාරයෙන් පැවැත්මෙන් ඔවුන්ගේ ව්‍යුපසමය **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය වේ. සත්ත්වයෝ කම්මස්සකතය හෙවත් කර්මය ස්වකීය කොට ඇත්තාහුය, ඔව්හු කවරක්හුගේ රුචියෙන් සුඛිත හෝ වෙද්ද, දුකින් හෝ මිදෙද් ද, පැමිණි සම්පතින් හෝ නො පිරිහෙද් ද, මෙසේ පැවති කම්මස්සකත දර්ශනය ඔහුගේ **පදට්ඨානය** හෙවත් ආසන්න කාරණය වේ. කරුණාවට ආසන්නව වැටහෙන චිත්තයාගේ ගැටීම හා මෙත්තා, මුදිතාවන්ට ආසන්නව වැටහෙන අනුනය ද පහ නොකළ සිත් ඇත්තාහට මැදහත් බැව් පිහිටිය නොහැකි හෙයින් ප්‍රතිඝ, අනුනය සංසිඳවීමම උපෙක්ෂාවගේ **සම්පත්තිය** වේ. පඤ්චකාම ගුණය ආශ්‍රය කළ ගෙහසිත වූ, මොහය හා යෙදුන හෙයින් අඥාන උපෙක්ෂාවගේ ඉපදීම එහි **විපත්තිය** වේ.

මෙසේ සැකෙවින් සතර බ්‍රහ්මවිහරණයන් හැඳින එය භාවනා වශයෙන් වඩන සැටි දතයුතු.

## මෛත්‍රී භාවනාව

මේ සතර බ්‍රහ්මවිහාරයන් අතුරෙන් මෛත්‍රී බ්‍රහ්මවිහාරය උපදවනු කැමැති ආදිකර්මික යෝගාවචරයා විසින් යට දක්වන ලද පරිදි සියලු කුඩා මහත් පළිබෝධයන් සිඳ දමා, ගන්නා ලද කමටහන් ඇතිව, බත්කිස නිමවා, බත්මත ද දුරු කොට, ජනශුන්‍ය ප්‍රදේශයෙක්හි මනාකොට පනවන ලද අස්නෙක්හි පළඟ බැඳ, සුවසේ හිඳ, තෙරුවන් ගුණ සිහිකොට, ශ්‍රද්ධාව මනාකොට උපදවාගෙන, භාවනාව ආරම්භ කළ යුතු. ඔහු විසින් පළමු කොට ද්වේෂයෙහි ආදීනව හා ක්ෂාන්තියෙහි අනුසස් ද ප්‍රත්‍යවේක්ෂා කටයුතු. මේ මෛත්‍රී භාවනායෙන් අදහස් කරනු ලබන්නේ ද්වේෂය පහ කිරීමත් ක්ෂාන්තිය ලබා ගැනීමත් ය නුදුටු ආදීනව ඇති කිසිවක් දුරුකරන්නට නුපුළුවන. එසේම නොදක්නා ලද අනුසස් ඇති කිසිවක් ලබාගන්නට ද නුපුළුවන. ද්වේෂයෙන් දුෂ්ටවූයේ, කැළඹුණේ, පර්‍ය්‍යුත්ථාන වශයෙන්

මඩනා ලද්දේ, කුසල් සිත් ඉපදීමට අවකාශ නො ලැබීම් වශයෙන් හාත්පසින් ද්වේෂයා විසින් ගන්නා ලද සිත් ඇත්තේ, ප්‍රාණවධ කරන්නේ ය යනාදී වශයෙන් දිට්ඨධම්මික සම්පරායික අනර්ථයට මුල්වන බව සලකා ද්වේෂයාගේ ආදීනව දතයුතු. ක්‍ෂාන්තියෙහි අනුසස් මෙනෙහි කරන්නා වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් "ක්‍ෂාන්ති සඞ්ඛ්‍යාත තිතික්‍ෂාව හෙවත් ඉවසීම, නොකටයුතු දෙය නො කිරීමය, කළයුතු දෙය කිරීමය යන මෙය ලක්‍ෂණ කොට ඇති සම්‍යක් ප්‍රතිපත්තියට මුල්වන බැවින් උතුම් තපස් නම් වේය" කියා ද, "පරම මඞ්ගල වූ ක්‍ෂාන්තියම බලකොට ඇති, ද්වේෂාදී ප්‍රතිපක්‍ෂයන් මැඩීමට සමත් ක්‍ෂාන්ති නමැති බල ඇති ඇති ඔහු බ්‍රාහමණ හෙවත් බාහිත පාප යයි මම කියමි", කියා ද. "තමාහට ද, අනුන්ට ද අනර්ථය වළක්වන්නා වූ මේ ක්‍ෂාන්තියට වඩා උසස් ගුණයෙක් නැතැයි"ද වදාරණ ලද හෙයින් ක්‍ෂාන්තියෙහි බොහෝ අනුසස් ඇති බව මෙනෙහි කටයුතු. මෙසේ දක්නා ලද ආදීනව ඇති ද්වේෂයෙන් සිත මුදාගනු පිණිස ද දන්නා ලද ආනිසංස ඇති ක්‍ෂාන්තියෙහි තමා යොදනු පිණිස ද මෛත්‍රී භාවනාව ආරම්භ කටයුතු.

මෛත්‍රී භාවනාව ආරම්භ කිරීමට පෙර **පුද්ගල දෝෂ** දැනගත යුතු. යම් බඳු පුද්ගලයෙක් අරමුණු කොට භාවනා කරන්නාහට, ඒ භාවනාව නැසේ ද, එබඳු පුද්ගලයෝ ම **පුද්ගල දෝෂ** නමුදු වෙත්. එබැවින් මේ මේ පුද්ගලයන් කෙරෙහි පළමුකොට මෛත්‍රිය නොවැඩිය යුතුය, මොවුන් කෙරෙහි කවර කලෙකවත් නො වැඩිය යුතුය යනාදී වශයෙන් පුද්ගලයන් හැඳින ගත යුතු වේ.

පළමු කොට මෛත්‍රිය නොවැඩිය යුතු පුද්ගලයෝ සතර දෙනෙකි. එනම්:-

1. **අප්‍රිය පුද්ගලයා** ය
2. **අති ප්‍රිය වූ සහායකයා** ය
3. **මධ්‍යස්ථ පුද්ගලයා** ය
4. **වෛරී පුද්ගලයා** ය යන සතර දෙන ය.

මේ පුද්ගලයන් සතර දෙනා අතුරෙන් **අප්‍රිය පුද්ගලයා** ප්‍රිය තැන තබාගැනීම ඉතා දුෂ්කර ය. අප්‍රිය බව ප්‍රිය බවට ඉඳුරාම ප්‍රතිපක්ෂ බැවින් අප්‍රියයා ප්‍රිය තැන තබා ගන්නට තැත් කිරීමෙන් වෙහෙසට පත් වේ. **අති ප්‍රියවූ සහායයා** ගෙහසිත ප්‍රෙමයට කරුණු වන බැවින් මැදහත් භාවයෙන් තබාගන්නට තැත් කිරීමේදී වෙහෙසට පත් වේ. ඒ අති ප්‍රිය සබඳයා හට මඳ වූ ද දුකක් උපන් කල්හි වැලපෙන ආකාරයට පැමිණෙන්නේ ය. ප්‍රිය ද නොවූ, අප්‍රිය ද නොවූ **මධ්‍යස්ථයන්** ගරු වශයෙන් ද ප්‍රිය වශයෙන් ද තබා ගන්නට තැත් කිරීමේ දී එසේම වෙහෙසට පත්වන්නේ ය. **වෛරී පුද්ගලයන්** සිහිකරන්නා හට ක්‍රොධය උපදී. එබැවින් මේ සතර දෙන කෙරෙහි පළමු කොට මෛත්‍රිය නො වැඩිය යුතු.

**ලිඞ්ග විසභාගයන්** කෙරෙහි ද කොටස් වශයෙන් නොහොත් සීමා වශයෙන් මෛත්‍රිය නො වැඩිය යුතු. ස්ත්‍රියට පුරුෂයා ද, පුරුෂයාහට ස්ත්‍රිය ද ලිඞ්ග විසභාගයෝ ය. කොටස් වශයෙන් හෙවත් අසුවල් ස්ත්‍රිය සුවපත් වේවා යි සිහිකරන්නාහට රාගය උපදී. පෙර එක්තරා ඇමති පුත්‍රයෙක් තමාගේ නිවසට නිතර වැඩමවන ස්ථවිරයන් වහන්සේ නමකගෙන්, කවුරුන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතු දැයි ඇසීය. තෙරුන් වහන්සේ ද, ලිඞ්ග වශයෙන් සමාන ප්‍රිය පුද්ගලයා කෙරෙහි මෙත් වැඩිය යුතු යයි විස්තර වශයෙන් නොකියා, ප්‍රිය පුද්ගලයකුහු කෙරෙහි මෙත් වැඩිය යුතු යයි කිය. ඇමති පුත්‍රයා ද, තමාට තම භාර්‍ය්‍යාව ප්‍රිය බැවින්, ඈ කෙරෙහි මෛත්‍රිය කරන්නට සැරසී, ශීලයෙහි පිහිටා, වසන ලද දොර ඇති ගර්‍භයෙහි යහනෙක්හි හිඳ මෙත් වැඩීමට ආරම්භ කෙළේ ය. මෙසේ මෙත් වඩන්නා වූ හෙතෙම මෛත්‍රී මුඛයෙන් උපන් රාගයෙන් අන්ධවූයේ, භාර්‍ය්‍යාව සමීපයට යනු කැමතිවූයේ, දොර නොදැක භිත්තිය බිඳගෙන යන්නට තැත් කරමින් මුළු රාත්‍රියම භිත්ති යුද්ධය කෙළේ ය. එහෙයින් ලිඞ්ග වශයෙන් සභාග නොවූවන් කෙරෙහි කොටස් වශයෙන් වෙන් කොට මෛත්‍රිය නො වැඩිය යුතු.

**කළුරිය කළ තැනැත්තන්** කෙරෙහි ද මෛත්‍රිය නො වැඩිය යුතු. මළවුන් කෙරෙහි මෛත්‍රිය වඩන්නාහට අර්පණාවක් හෝ උපචාරයක්වත් නො ලැබෙන්නේ ය. පෙර එක්තරා ළදරු භික්ෂුවක් තම ආචාර්‍ය්‍යයන් අරමුණු කරමින් මෙත් වඩනුයේ, ඕහට මෛත්‍රිය නො පිහිටි හෙයින්, මහා ස්ථවිරයන් වහන්සේ නමක් සමීපයට ගොස්, වහන්ස, මට මෛත්‍රීධ්‍යාන සමාපත්ති පුහුණු ය. නමුත් ඒ ධ්‍යාන සමවතට දුන් සමවදින්නට නොහැකි ය. එයට කාරණා කිම් දෝ හෝයි ඇසුයේ ය. ස්ථවිරයන් වහන්සේ ද, ඇවත, යමක්හු අරභයා මෛත්‍රිය ආරම්භ කෙරෙහි ද, ඒ පුද්ගලයා ජීවත් වේද්දෝ හෝ නො වේද්දෝ හෝයි දැන අරමුණ ගතයුතු යයි කීහ. එවිට තම ආචාර්‍ය්‍යයන් වහන්සේ සිහිකරන්නේ උන්වහන්සේ අපවත් වූ බව දැන, ඒ නිමිත්ත අත්හැර, අනිකක්හු කෙරෙහි මෛත්‍රිය පවත්-වන්නේ නොබෝ වේලාවකින් සමාපත්තියෙහි පිහිටියේ ය. එහෙයින් කළුරිය කළ වුන් කෙරෙහි මෙත් නොවැඩිය යුතු ය.

මෛත්‍රිය වඩන පුද්ගලයා විසින් පළමු කොට **"අහං සුඛිතො හොමි, නිද්දුක්ඛො හොමි"** මම සුවපත් වූයෙම් වෙමි, නිදුක් වූයෙම් වෙමි යි කියා හෝ **"අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ජො හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි"** මම වෛර පුද්ගලයන් ද, වෛර නම් පාපධර්මයන් ද නැති හෙයින් වෛරනැත්තේ වෙමි, විශේෂයෙන් ව්‍යාපාද නැති හෙයින් අව්‍යාපජ්ඣ හෙවත් ව්‍යාපාද නැත්තේ වෙමි, ඊඝ නම් වූ උපද්‍රව නැති බැවින් අනීඝ හෙවත් උපද්‍රව නැත්තෙමි, නිරවද්‍ය කායික සුඛ සමන්විත හෙයින් සුවසේ මාගේ ආත්ම භාවය පරිහරණය කරමි, පවත්වමි යි, මෙසේ නැවත නැවත **තමා කෙරෙහි** ම මෙත් වැඩිය යුතු. මෙසේ තමා කෙරෙහි මෙත් වඩන පුද්ගල තෙම "යම්සේ මම සුවපත්වනු කැමැත්තෙම් ද, දුක්ඛයෙහි පිළිකුල් ඇත්තෙම් ද, දුක් නොකැමැත්තෙම් ද, එපරිද්දෙන් ම සෙසු සත්ත්වයෝ ද

සුව කැමැත්තහ යි ද, දුක් නොකැමැත්තහයි ද'' තමා සාක්ෂි කොට සෙසු සතුන් කෙරෙහි හිතසුව කැමති බව උපදී. භාග්‍යවතුන් වහන්සේ ද මෙසේ වදාළ සේක. ''තම සිතින් සියලු දසදිසාවන්හිම සොයාගිය නමුත් කිසි දිනෙකවත් තමහට වඩා අතිශයින් ප්‍රිය වූ සත්ත්වයෙක් නොදක්නේම ය. සෙසු සත්ත්වයන්ට ද ඔවුනොවුන්ගේ ශරීර එසේම වෙන වෙන ම ප්‍රිය වෙති. එහෙයින් තමහට හිත සුව කැමැත්තෝ අන්සතෙකුහට හිංසා නො කරන්නේ ය.''

ඉදින් මෙසේ අවුරුදු සියයක් හෝ දහසක් හෝ මම සුවපත්වූයෙම් වෙම් යි යනාදී වශයෙන් තමා කෙරෙහි මෛත්‍රී වඩා ද, ඕහට අර්පණාවක් නම් නූපදී. ආත්මස්නේහ වශයෙන් එය උපද්‍රව සහිත බැවිනි. එහෙයින් පළමු කොට තමා කෙරෙහි මෛත්‍රී කටයුතු යයි කියන ලද්දේ තමා සාක්ෂි භාවයෙහි තබාගෙන සියලු සතුන් කෙරෙහි මෙත් වැඩීම පිණිස බව දත යුතු.

මෙසේ තමා කෙරෙහි මෙත් පැතිරවීමට ඉක්බිති, සුවසේ මෙත් පවත්වනු පිණිස, මේ යෝගීහට යම් පුද්ගලයෙක් ඉෂ්ට ද, ප්‍රිය වේ ද, මනාප වේ ද, සිත්වඩා ද, ගුණවත් හෙයින් ගරු කටයුතු ද, සම්භාවනා කටයුතු ද, එබඳු වූ ආචාර්යවරයෙක් හෝ ශීලාදි ගුණ වශයෙන් ආචාර්යයන් හා සමාන කෙනෙක් හෝ උපාධ්‍යායයෙක් හෝ උපාධ්‍යාය සමානයෙක් හෝ වේ නම්, ඒ පුද්ගලයාගේ දානය, ප්‍රියවචනය, අර්ථචර්යා ය, සමානාත්මතා ය යනාදීන්ගේ වශයෙන් ප්‍රියමනාප බවට කාරණයන් ද, ශීලය, ශ්‍රැතය, ශ්‍රද්ධාය, ජාගරියානුයෝගාදී වූ ගරු කටයුතු බවට හා සම්භාවනා කටයුතු බවට කාරණයන් ද සිහිකොට මේ පුරුෂතෙම සුවපත් වේවයි, නිදුක් වේවයි යනාදී ක්‍රමයෙන් මෛත්‍රිය වැඩිය යුතු. මෙබඳු පුද්ගලයන් කෙරෙහි මෙත් වැඩීමෙන් ඒකාන්තයෙන් අර්පණාව සිද්ධ වන්නේ ය.

මේ යෝගාවචරයා විසින් මෙපමණකින් සතුටට නොපැමිණ, **තමාය, ප්‍රිය ය, මධ්‍යස්ථ ය,** වෛරිය යන මොවුන්ගේ වශයෙන් විභාග නොකිරීම නම් වූ **සීමා-සම්භේදය** කරණු කැමැත්තෙන් එයට ඉක්බිතිව **අතිප්‍රිය සහායයා** කෙරෙහි මෙත් වැඩිය යුතු. ගරු කටයුත්තහු කෙරෙහි මෛත්‍රිය පැතිරවීමෙන් ප්‍රතිපක්ෂ ධර්මයන් විෂ්කම්භනය කළ හෙයින් අතිප්‍රිය සහයයා කෙරෙහි මෛත්‍රී මනසිකාරය සුවසේ එළවිය හැකි වේ. එයින් ද ඔහුට අර්පණාව ලබාගැනීමට පහසුවේ.

මෙසේ ප්‍රගුණ කළ මෛත්‍රී මනසිකාරය ඇති යෝගාවචරයා විසින් අතිප්‍රිය සහායයාට අනතුරුව **මධ්‍යස්ථ පුද්ගලයා** අරමුණු කොට මෙත් වැඩිය යුතු.

මධ්‍යස්ථ පුද්ගලයාහට අනතුරුව **වෛරී පුද්ගලයා** කෙරෙහි මෛත්‍රිය පැතිරවිය යුතු.

මෙසේ භාවනා කරන්නා වූ යෝගාවචරයා විසින්, ප්‍රිය **ගරු කටයුතු පුද්ගලයා ය, අති ප්‍රිය සහායයා ය, මධ්‍යස්ථයා ය, වෛරී පුද්ගලයා ය** යන සතර පුද්ගල කොට්ඨාසයන් කෙරෙහි එකී එකී කොටස්හි සිත් මොළොක් කොට, කර්මණ්‍ය කොට, ඉක්බිති අනතුරු අනතුරු කොටස්හි සිත් එළවිය යුතු. එනම් පළමුකොට ප්‍රිය ගරු ස්ථානයෙහි මෛත්‍රිය වඩා එහි වශී භාවයට පැමිණි සිත, කොට්ඨාසාන්තරයට පමුණුවනු පිණිස, මෘදු කර්මණ්‍ය කොට ඉක්බිතිව අතිප්‍රිය සහායයා කෙරෙහි උදාසීන භාවය දුරුකොට ප්‍රිය භාවය එළවා භාවනා වැඩිය යුතු. නැවත ඒ භාවනාව ද වශීප්‍රාප්ත කොට, මෘදු කර්මණ්‍ය කොට ඉක්බිති මධ්‍යස්ථයා කෙරෙහි ද උදාසීන භාවය දුරුකොට ප්‍රිය භාවය එළවා භාවනා වැඩිය යුතු. නැවත ඒ භාවනාව ද වශීප්‍රාප්ත කොට, මෘදු කර්මණ්‍ය කොට ඉක්බිති වෛරී පුද්ගලයන් කෙරෙහි වෛරී සංඥාව විෂ්කම්භනය කොට මධ්‍යස්ථයට පමුණුවනු පිණිස ද ප්‍රිය භාවය උපදවනු පිණිස ද භාවනාව වැඩිය යුතු ය.

යමෙක්හට වනාගී කම්බලයෙන් හෝ ප්‍රයෝග සම්පත්තියෙන් හෝ වෛරී පුද්ගලයෙක් නැත්තේ වේ ද, හෙතෙම මහා පුරුෂ ස්වභාව ඇති හෙයින්, බොහෝ කලක් පුරුදු කිරීමෙන් සමෘද්ධ වූ ක්‍ෂාන්ති, මෛත්‍රී, කරුණාදී ගුණයන්ගෙන් යුක්ත වන හෙයින්, උදාර අදහස් ඇති හෙයින්, සියල්ල ඉවසන සුළු හෙතෙම, අනුන්ගේ වරද තණපතක් පමණවත් නො සලකන්නේ ය. එසේ අනුන්ගේ වරද දැක වෛරී සංඥාව නූපදී ද හෙතෙම "මාගේ සිත මධ්‍යස්ථයා කෙරෙහි මෘදු කර්මණ්‍ය විය. එහෙයින් දැන් ඒ සිත වෛරී පුද්ගලයා කෙරෙහි එළවිය යුතු" යයි උත්සාහ නොකළ යුතු. යමෙකුහට වෛරී පුද්ගලයෙක් ඇත්නම්, ඔහු විසින් ම මධ්‍යස්ථයාට අනතුරුව ඒ වෛරී පුද්ගලයා කෙරෙහි මෙත් වැඩිය යුතු.

ඉදින් වෛරීහු කෙරෙහි මෙත් සිත එළවන්නා වූ යෝගාවචරයාහට, ඔහු විසින් කරණ ලද අපරාධය සිහිවීමෙන් ද්වෙෂය උපදී නම්, ඉක්බිත්තෙන් ඔහු විසින් පළමු කියන ලද ප්‍රිය පුද්ගලාදීන් අතුරෙන් කෙනෙකු කෙරෙහි නැවත නැවත මෙත් වැඩීමෙන් පටිඝය දුරු-කොට මෛත්‍රී ධ්‍යානය උපදවා ඒ මෛත්‍රී ධ්‍යාන සමවතට සමවැද, ඒ සමවතින් නැගී සිට නැවත වෛරී පුද්ගලයා කෙරෙහි සිත යොමුකොට මෙත් වඩන කල්හි ප්‍රතිඝය දුරුවී මෛත්‍රියෙහි සිත පිහිටන්නේ ය. ඉදින් එසිනුත් වෛරී පුද්ගලයා කෙරෙහි ද්වෙෂය නොසංසිඳෙන්නේ නම් ඔහු විසින් කකචෝපම අවවාදදීන්ගේ වශයෙන් හෝ ප්‍රතිඝය දුරු කර ගැනීමට උත්සාහ කටයුතු. භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි, දෙඅත්හි සවිකරණ ලද මිටි ඇති කියතකින් ලාමක පාප පුරුෂ වූ සොරහු තමාගේ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් කපත් නම්, ඒ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් කපන්නන් කෙරෙහි ද, යම් සිත් කැළඹීමක් වේ ද, දූෂ්‍ය වූ සිත් ඇති හෙතෙමේ මාගේ අනුශාසනය කළානම් නොවන්නේ ය" යනාදී වශයෙන් වදාරණ ලද්දේ

නොවේ ද, එහෙයින් කිපෙනසුළු පුද්ගලයා, තොප විසින් එසේ පිළිපැද්ද යුතු නොවේ දැයි තමාට ම අවවාද කරගත යුතු.

තවද, "යමෙක් කිපුණහුහට නැවත කිපේ ද, හෙතෙම ඒ පළමු කිපුණු පුරුෂයාහට වඩා ඒ ක්‍රෝධය හේතු කොටගෙන වෙසෙසින් පවිටු වෙයි. කිපුණහුහට නැවත නොකිපෙන්නේ නම් හෙතෙමේ නොදිනිය හැකි වූ යුධයෙන් ජයගත්තේ නම් වන්නේ ය."

"යමෙක් අන්‍යයා කිපුණු බව දැන සිහි ඇතිව ඉවසා සිටී ද, හෙතෙම තමහට ද, අන්‍යයාහට ද යන දෙදෙනාට ම වැඩ පිණිස හැසිරෙන්නේ වේ. නොහොත් තමහට ද මෙරමාහට ද උභය ලොකාර්ථය පිණිස හැසිරෙන්නේ වේ."

"මහණෙනි, සතුරන් විසින් කැමති වන ලද, සතුරන් විසින් කටයුතු වූ ධර්මයෝ සත්දෙනෙක් කිපෙන සුලු වූ ස්ත්‍රිය කරා හෝ පුරුෂයා කරා හෝ පැමිණෙත්. ඒ සත්දෙන නම්:–

1. සතුරු තෙම සතුරාගේ වර්ණවත් බවට නො සතුටු වන බැවින් සතුරා දුර්වර්ණ වී නම් ඉතා යෙහෙකැයි කැමති වේ.

2. සතුරා තම සතුරාගේ සුඛවාසය නුරුස්නා හෙයින් සතුරා දුකසේ වසන්නේ නම් මැනැවැයි සිතන්–නේ ය.

3. සතුරා තම සතුරාගේ ධනවත් කම නුරුස්නා හෙයින් සතුරා ධනවත් නොවන්නේ නම් මැනවැයි සිතන් නේ ය.

4. සතුරා තම සතුරාගේ උපභෝග පරිභෝග වස්තු ඇති බව නුරුස්නා හෙයින් සතුරා උපභෝග පරිභෝග වස්තු ඇත්තෙක් නොවන්නේ නම් මැනැවැයි සිතන් නේ ය.

5. සතුරා තම සතුරාට යස පිරිවර ඇති බව නුරුස්නා හෙයින් සතුරු යස පිරිවර ඇත්තෙක් නොවන්නේ නම් මැනැවැයි සිතන්නේ ය.

6. සතුරා තම සතුරාගේ මිත්‍රයන් ඇති බව නුරුස්නා හෙයින් සතුරා මිත්‍රයන් ඇත්තෙක් නොවන්නේ නම් මැනැවැයි සිතන්නේ ය.

7. සතුරා තම සතුරාගේ මරණින් මතු සවර්ගයට යාම නුරුස්නා හෙයින් සතුරා මරණින් මතු සවර්ගයෙහි නූපදනේ නම් මැනැවැයි සිතන්නේ ය.

මහණෙනි, ක්‍රෝධ කරන පුද්ගලයා තෙම කයින්, වචනයෙන්, සිතින් මෙසේ දුශචරිත කොට පහවූ සුව ඇති බැවින් අපාය නම් වූ, දුකට පිහිට හෙයින් දුගති නම් වූ, සුව සමූහයෙන් පිරිහුණු හෙයින් විනිපාත නම් වූ නරකයෙහි උපදී. ක්‍රෝධයෙහුදු මඩනා ලද්දේ වේ."

"මහණෙනි, සොහොන් පෙනෙල්ල දෙකොන ගිනි ඇවිළියේ, මැද බලු කැණහිල්, අශුචි ගෑවුනේ ගමේ දර වැඩක් හෝ ආරණ්‍යයේ දර වැඩක් හෝ නොකරන්නේ ය. මහණෙනි, මේ ක්‍රෝධ කරන පුද්ගලයා ද එබඳු උපමා ඇත්තේ යයි කියමි."

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි කකචොපම අවවාද ආදීන්ගේ වශයෙන් සිහි කිරීමෙන් පටිඝය දුරුකිරීමට උත්සාහ කරන්නාහට, ව්‍යායාම කරන්නා හට ඉදින් ඒ පටිඝය සංසිඳෙන්නේ නම් එය මැනව.

එසේ ද සිහි කොට ඉදින් පටිඝය සංසිඳවා ගැනීමට නොහැකිවූයේ නම්, ඉක්බිති ඒ වෛරී පුද්ගලයාගේ කායසමාචාරාදීන් කෙරෙහි යම් යම් ධර්මයන්, ක්ලෙශවිදාහ නැති බැවින් උපශාන්ත ද, ක්ලෙශමල නැති හෙයින් පිරිසුදු ද, සිහිකරන කල්හි ප්‍රසාද එලවා ද, ඒ ඒ ගුණ සිහි කොට ආඝාතය දුරු කර ගැනීමට උත්සාහ කටයුතු. ඇතැම් පුද්ගලයෙකුගේ කායසමාචාරයම උපශාන්ත වේ.

බොහෝ කොට වත් පිළිවෙත් කරන්නහුගේ ඒ කාය සමාචාරයාගේ උපශාන්ත භාවය ද සියලු දෙනා විසින් ම දැනගනු ලැබේ. වචී සමාචාර, මනො සමාචාරයෝ වනාහි නොසන්සිඳුනාහු වෙති. එසේ ඇති කල්හි ඔහුගේ ඒ නොසන්හුන් වචී සමාචාර මනො සමාචාරයන් නොසිතා කාය සමාචාරයාගේ සන්හුන් බවම සිහි කටයුතු, සමහරක්හුගේ වාක් සමාචාරය ම සන්සිඳුනේ වේ ඒ වාක් සමාචාරයාගේ සන්හුන් බව ද සියලු ජනයා විසින් දැනගනු ලැබේ, හෙතෙම ප්‍රකෘතියෙන් ම පිළිසඳර කථායෙහි දක්ෂ වේ. මොලොක්, ප්‍රිය වචන ඇත්තේ ය. සතුටු වන සුළු ය. සතුටු වූ මුහුණ ඇත්තේ ය. යම් කිසිවෙකු එළඹි කල තෙමේ ම පළමු කොට පිළිසඳර කථා කරන සුළුය. අව්‍යාකුලවූ පරිපූර්ණ වූ පදව්‍යඤ්ජනයෙන් හා මධුර ස්වරයෙන් ද දහම් දෙසන්නේ ය. නමුත් ඔහුගේ කායසමාචාර, මනො සමාචාරයෝ නොසන්සිඳුනාහු වෙති. එසේ ඇති කල්හි ඔහුගේ කාය සමාචාර මනො සමාචාරයන් නොසිතා, වචී සමාචාරයා ගේ සන්හුන් බව ම සිහි කටයුතු.

සමහරක්හුගේ මනො සමාචාරය ම සන්සිඳුනේ වේ. ඒ මනො සමාචාරයාගේ සන්හුන් බව ද, චෛත්‍ය වන්දනාදී කාලයේ දී සියලු ජනයාට ප්‍රකට වේ. යමෙක් නොසන්සුන් සිත් ඇත්තේ නම් හෙතෙම චෛත්‍යය හෝ බොධිය හෝ තෙරවරුන් හෝ වඳනා කල නො සකස් කොට වඳී. බණ අසන මංඩලෙහි දී එකඟ නොවූ වික්ෂිප්ත සිත් ඇතිව හෝ නිදිකිරමින් හෝහිඳියි. සන්හුන් සිත් ඇති තැනැත්තේ වඳින කල්හි සකස් කොට වඳී. දහම් අසන කල්හි නමන ලද කන් ඇතිව, අර්ථ සහිතව, කයින් හෝ වචසින් හෝ චිත්ත ප්‍රසාදය පහළ කරමින් අසන්නේ ය. මෙසේ එකෙක්හුගේ මනො සමාචාරය ම සන්සිඳුනේ වේ. කාය වාග් සමා-චාරයෝ නොසන්සිඳුනාහු වෙති. එසේ වූ කල්හි ඔහුගේ ඒ නොසන්හුන් කාය වාග් සමාචාරයන් නොසිතා, මනො සමාචාරයාගේ සන්හුන් බව ම සිහිකට යුත්තේ ය.

සමහරක්හුගේ වනාහි කාය, වාක්, මන යන ත්‍රිවිධ සමාචාරයන් අතුරෙන් එකක්වත් නොසන්සිඳුනේ වී නම් ඒ පුද්ගලයන් කෙරෙහි "දැන් මේ තෙමේ මිනිස්ලොව හැසිරෙයි. එතකුදු වුවත් කිප දවසක් ඇවෑමෙන් අටමහනිරය, සොළොස් ඔසුපත්නිරය යන තන්හි නැවත නැවත ඉපදීමෙන් නිරය පුරන්නේ යයි" කරුණාව එළවිය යුතු. කරුණාව නිසා ද ආඝාතය සංසිඳෙන්නේ ය.

සමහරක්හට මේ ධර්මයෝ තුන් දෙනම සංසිඳුනාහු වෙත්. ඔහුගේ යම් යම් සමාචාරයක් කැමැති ද, ඒ ඒ සමාචාරය සිහි කටයුතු. එබඳු පුද්ගලයා කෙරෙහි මෛත්‍රී භාවනා වැඩීම දුෂ්කර නොවේ.

මෙසේ ද ව්‍යායාම කරණ ඒ යෝගිහට ආඝාතය උපදියි නම්, ඉක්බිති ඒ යෝගීහු විසින් තමාට මෙසේ අවවාද කටයුතු.

තාගේ සතුරා විසින් තමහට විෂයවූ සිරුරෙහි ඉදින් දුක්ඛය කරන ලද නමුදු, ඒ සතුරාහට විෂය නොවූ ස්වකීය චිත්තයෙහි දුක්ඛය කරන්නට කුමක් හෙයින් කැමැත්තෙහි ද?

බොහෝ උපකාර ඇති, කඳුළු මුසු මුහුණු ඇති ඤාති වර්ගයා අත්හැර ඇවිත්, නොයෙක් අනර්ථ කරන්නාවූ ක්‍රෝධ නමැති සතුරා කුමක් හෙයින් නොහරී ද?

ඔබ යම් ශීලයක් රකියි ද, ඒ ශීලයාගේ හිරි–ඔතප් ආදී මුල් සිඳලන්නා වූ ක්‍රෝධය කුමක් හෙයින් නළවයි ද? එසේ වූ තා හා සමාන අඥබාලයෙක් තව කොහි ද?

සතුරා විසින් අනායර්‍ය කර්මය කරණ ලදැයි කුමක් හෙයින් තෝ කිපෙයි ද? එබඳු ම කර්මයක් නොප ද කරන්නට කුමක් හෙයින් කැමැත්තෙහි ද?

සතුරා තා රොස් කරණු කැමැත්තේ ඉදින් අමනාප කර්මයක් කෙළේ නමුදු, රොස් ඉපදවීමෙන් ඒ සතුරාගේ ම මනෝරථය කුමක් හෙයින් පුරයි ද?

නුඹ සතුරාහට කිපීමෙන් ඔහුට දුක් පැමිණිය හැකි ද වෙයි, නො හැකි ද වෙයි. තමා වනාහි දූත් ම ඒ ක්‍රෝධ නැමැති දුකින් පෙළෙන්නෙහි ය.

ක්‍රෝධයෙන් අන්ධවූ සතුරෝ ඉදින් තමන්ට නොසැප එළවන දුර්ගති මාර්ගයට නැංගාහු වූ නමුදු, තොප ද ඔහු කෙරෙහි කිපීමෙන් ඔවුන්ට අනුව කුමක් හෙයින් හික්මෙන්නෙහි ද?

සතුරා විසින් යම් රෝෂයක් නිසා තට අප්‍රිය කරණ- ලද ද, සතුරා ඒ රෝෂයට වසඟව පවත්නා හෙයින් ඔහුගේ දෘසයෙකු වැනිනුයි තාගේ ප්‍රත්‍යුප ක්‍රියාවට අස්ථානය. එහෙයින් ඒ රෝෂය සිඳ දමව.

අපරාධකයාගේ සන්තානයෙහි පවත්නා යම් ස්කන්ධ කෙනෙකුන් විසින් තට අපරාධ කරණ ලද ද, ඒ ස්කන්ධයෝ එකෙණෙහි ම සම්ස්කාරයෙන් ම නිරුධයහ, දූත් වනාහි අතික්ම ස්කන්ධ කෙනෙක් පවත්නාහ. එහෙයින් නුඹ කාහට කිපෙසි ද?

යමෙක් තෙම යමක්හට දුක්ඛය කෙරේ ද, හෙතෙම ඒ දුක් කිරීමට විෂය වූ පුරුෂයා හැර කවරක්හට කරන්නේ ද. ඒ තොප ද දුක්ඛයට හේතුනුයි ඕහට කුමක් හෙයින් කිපෙහි ද?

ඉදින් මෙසේ තමහට අවවාද කරන්නාවූ මේ යෝගීහට පටිඝය නොසන්සිඳේ නම්, ඉක්බිත්තෙන් මොහු විසින් තමන්ගේ ද, අනුන්ගේ ද **කම්මස්සකතා** බව ප්‍රත්‍යවේක්ෂා කටයුතු. තමාගේ කර්මස්වක බව පළමු කොට මෙනෙහි කරන්නා වූ හෙතෙම "භවත, නුඹ ඔහුට කිපී කුමක් කරන්නෙහි ද? ද්වේෂය මුල්කොට ඇති මේ කර්මය තට ම අනර්ථය පිණිස පවත්නේ නොවේ ද? නුඹ කර්මය ස්වකීය කොට ඇත්තෙහි. **කම්මදායාදය** හෙවත් කර්මයා විසින් දෙන ලද විපාක කොටස් ගන්නෙහි ය. **කම්මයොනි** හෙවත් කර්මය ම පිහිට කොට ඇත්තෙහි ය. **කම්මබන්ධු**

හෙවත් කර්මය ම නෑකොට ඇත්තෙහි ය. **කම්මපටිසරණො** හෙවත් කර්මය ම පිළිසරණ කොට ඇත්තෙහි ය. **යම් කර්මයක් කරන්නේ නම් ඒ කර්මයාගේ විපාක කොටස ගන්නෙහි ය.** තාගේ මේ කර්මය ද, සම්‍යක්සම්බොධිය හෝ ප්‍රත්‍යෙක බොධිය හෝ සාධන්නට සමත් නොවේ. එසේම බ්‍රහ්මභාවය, ශක්‍රභාවය යන මොවුන් ද සක්විති සම්පත, ප්‍රදේශරාජ්‍ය සම්පත යනාදී සම්පත්තීන් කෙරෙන් එක්තරා සම්පත්තියක් ද සාධන්නට අසමර්ථ වේ. ශාසන-යෙන් ද පිරිහෙයි. මිනිස් ලොව උපන් කල්හි විසාසාදදී භාවයට හෙවත් අනුන් කා ඉවත් කල දෙයින් යැපෙන දුගීත බවට ද, නරකාදියෙහි වූ දුක්ඛ විශේෂයන්ට ද, තාගේ මේ කර්මය පවත්තේ ය. එහෙයින් මේ කර්මය කරනහුහට, තුඹගේ ම දෙඅතින් ගිනිඅඟුරු හෝ අශුචි හෝ ගෙණ අනුන් පහරණු කැමති පුරුෂයාමෙන් තමා ම පළමුකොට දවන්නෙහි ය. දුර්ගන්ධ ද කරන්නේ ය. මේ ආදී වශයෙන් තමාගේ කම්මස්සක බව ප්‍රත්‍යවේක්ෂා කොට, මොහු ද තුඹට කිපී කුමක් කරන්නෙහි ද. ඔහුගේ කිපීම ඔහුට ම ය. ඔහුට ම අනර්ථය පිණිස පවත්තේ නොවේ. ඔහු ද තුඹසේම **කර්මස්වකය, කර්මදායාදය, කර්මයෝනිය, කර්මබන්ධුය,** ඔහුගේ ඒ කර්මය ඔහුට බුදු, පසේබුදු, බුදුසව් ආදිය හෝ බ්‍රහ්ම ශක්‍රාදී සම්පතක් හෝ සිඛකර දෙන්නට අසමර්ථ වන්නේ නොවේ ද? ශාසනයෙන් ද බැහැර කොට විසාසාදි භාවය හෝ නරකාදී දුක් හෝ සිඛ කර දෙන්නට සමර්ථ ය. මේ කර්මය කරන්නා වූ හෙතෙම, උඩු සුළඟ බලා සිට අනුන්ට දූලි ඉසීමට කැමති පුරුෂයාමෙන් ද්වේෂ නමැති රජස් තමන්ගේ ඇහෙහිම ඉසගන්නේ ය. "යමෙක් තමහටවත් සියලු සතුන්ටවත් නොකිපියා වූ නිරපරාධ වූ, අනඞ්ගණ වූ හෙවත් නිකෙලෂී වූ, පුරුෂ සඞ්ඛ්‍යාත වූ සත්ත්වයාහට අපරාධ කෙරේ ද එම බාලයා කරාම ඒ පාපය නැවත එන්නේ ය. උඩුසුළඟට දැමූ සියුම් රජස් මෙනි"සි භාග්‍යවතුන් වහන්සේ ද වදාළ සේක.

ඉදින් මේ ආදී වශයෙන් **ඛමමසංඛත** භාවය මෙනෙහි කරන්නා වූ ඒ යෝගාවචරයාහට, පටිඝය නොසන්සිඳේ නම්, ඔහු විසින් ශාස්තෘන් වහන්සේගේ පූර්ව චරිත ගුණ මෙනෙහි කොට පටිඝය සංසිඳවා ගන්නට උත්සාහ කළ යුතු.

භවත, නුඹගේ ශාස්තෲන් වහන්සේ සම්‍යක් සම්බෝධියට පැමිණීමට පෙර, සම්බෝධියට නොපැමිණියේම, බෝධිසත්ත්ව වූයේ ම, සාරාසඞ්ඛ්‍යයක් හා කල්ප ලක්‍ෂයක් ද, පාරමිතා පුරණුයේ ඒ ඒ ජාතියෙහි වධකයන් කෙරෙහිත් සිත දූෂ්‍ය කිරීමක් හෝ කැළඹීමක් හෝ නොකෙළේ නොවේ ද?

**ශීලව ජාතකයෙහි,** තමාගේ දේවිය කෙරෙහි අපරාධ කළ, පාපී වූ අමාත්‍යයා විසින් ගෙණෙන ලද සතුරු රජහු, තුන් සියයක් යොදුන් රාජ්‍යය ගන්නහු වළකනු පිණිස නැඟී සිටි අමාත්‍යයන්ට ආයුධ අල්වන්නට පවා ඉඩ නුදුන් සේක. නැවත අමාත්‍යයන් දහස හා සමග අමු-සොහොණෙහි කර පමණ කොට භූමිය කැණ වළ සිටුවා පස් ගසන ලද්දේ ද, සිත කළඹන පමණකුදු නොකොට, කුණප කන පිණිස ආවාවූ සිවලුන්ගේ පස් ගැටීම් නිසා වළින් නික්මෙන පිණිස බාහු බලයෙන් පුරුෂ ක්‍රියා කොට ලබන ලද දිවි ඇත්තේ, යුක්තිය විසඳිය හැකි යක්‍ෂයන්ගේ ආනුභාවයෙන් තමන්ගේ ශ්‍රීයහන් ගර්භයෙහි බැස සිට, ශ්‍රී යහනෙහි හොත් සතුරු රජහු දැක, කෝප නොකොට ම ඔවුනොවුන්ට ද්‍රෝහි නොකරණු පිණිස දිවුරවා ඒ සතුරු රජහු මිත්‍රස්ථානයෙහි තබා මෙසේ ප්‍රකාශ කෙළේය. "පුරුෂ තෙම අභිමතාර්ථ සිඩිය කැමැති වන්නේ ම ය. නුවණ ඇති තැනැත්තේ මෙසේ දුකට පැමිණි මට සුවයක් කොයිත් දැයි නො කළකිරෙන්නේ ය. යම් ප්‍රකාරයකින් කිසිවක්හට පීඩා නොකොට රාජ්‍යයෙහි පිහිටීම කැමැති-වීම් ද, ඒ ආකාරයෙන් ම මම දකිමි."

**ක්‍ෂාන්තිවාදී ජාතකයෙහි,** නුවණ නැති කලාබු කසීරජහු විසින්, ශ්‍රමණය, නුඹ කවර වාදීහි දැයි අසන

ලද්දේ, මම ක්ෂාන්තිවාදී නමැයි කී කල්හි කටුසැමිටියෙන් තලා අත්පා කපනු ලබන කල්හි කෝප පමණකුදු නො කෙළේ ය. මෙය ද ආශ්චර්යයක් නොවේ. වැඩිමහළු වූයේ ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේ මෙසේ කෙළේ ය.

**චුල්ල ධම්මපාල ජාතකයෙහි** වනාහි උඩුබලා හෝනා ලදරුවා වද, මුළුපොළොවට හිමිවූ ධම්මපාලයාගේ සඳුන් පිලවුන් ගැල්වූ අත් සිඳුනා ලැබෙති, දෙවයෙනි, මාගේ ප්‍රාණය නිරුඩවෙයි යනාදිය කියමින් මෑණියන් හඬමින් සිටියදී මහප්‍රතාප නම් පිය රජහු විසින් හුණ කිල්ලි මෙන් අත් පා සතර කපවනු ලබන කල්හි ද, එපමණකිනුත් සතුටට පත්නොවී මොහුගේ හිස කපවයි නියෝග කල කල්හි, දූත් තාගේ හිස නිගන්නා කලය, හවත් ධම්මපාලය, දූත් හිස කැපීමට නියෝග කල පිය රජහු කෙරෙහි ද, හිස කපන පුරුෂයා කෙරෙහි ද, හඬන මව කෙරෙහි ද, තමා කෙරෙහි ද යන මේ සතර දෙනා කෙරෙහි සමසිත් ඇත්තේ වේවයි, දැඩි වූ සමාදානයෙහි පිහිටා කිපි ආකාරයක් පමණකුදු නොකෙළේ ය. මෙය ද ආශ්චර්යයක් ම නොවේ. මිනිස්වූයේ ම මෙසේ කෙළේ ය.

තිරිසන්ව ද, **ඡද්දන්ත නම් ඇත්රජ ව,** විෂපෙවූ ශල්‍යයෙන් නාභියෙහි විදුනා ලද්දේ ද, ඒසා අනර්ථ කල සෝනුත්තර නම් වැද්දා කෙරෙහි ද සිත දූෂ්‍ය නොවීය. එසේ මහත් වූ ශල්‍යයෙන් විදුනා ලද හස්තිනාග තෙමේ, දූෂ්‍ය නොවූ සිත් ඇත්තේ, වැද්දාහට මෙසේ කීය: "සබඳ කුමක් පිණිස, කවර හේතුවකින් තෝ මට වධ කෙළෙහි ද, මේ ප්‍රයෝග කවරහුගේ ද." මෙසේ කී කල්හි කසී රජහුගේ මෙහෙසිය විසින් තොපගේ දළ පිණිස එවන ලදිම් වහන්සැයි කී කල්හි, ඒ වැද්දාගේ මනදෙළ පුරමින් ෂට්වර්ණ රශ්මි විහිදුවමින්, බබලන්නාවූ මනොඥවූ ශොභා ඇති තමාගේ දළ සඟල කපා දිනි.

**මහාකපි ජාතකයෙහි** වඳුරු රජව තමන් විසින් ම පර්වත ප්‍රපාතයෙන් නගන ලද පුරුෂයා විසින් "මෙතෙමේ

මනුෂ්‍යයන්ට අරණ්‍යයෙහි සෙසු මෘගයන් මෙන් අහරය. සෘගිති ඇති හෙයින් මේ වඳුරා මරා කෑයේ නම් යෙහෙක. එසේ සෘගිති තිවා ඉතිරි මාංසය මාර්ගාහාර වශයෙන් ගෙන කතරින් එතර වෙමි. එයම මට සියලු මගට උපකරණද වන්නේ ය.'' මෙසේ සිතා ගලක් ඔසවා ගෙන හිසට ඇන හිස පැළූ කල්හි කඳුලු පිරුණු ඇසින් ඒ පුරුෂයා දෙස බලා ''පින්වත, නුඹවහන්සේ අමුතු බැවින් මට ස්වාමින් වන්නාහ. එසේවූ තොප මෙබඳුවක් කරන්නවුද, දීර්ඝායුෂ්කය, තෙපි නම් අනිකක්හු වැළකුමට සුදුසු බව''යි කියා ඒ පුරුෂයා කෙරෙහි සිත දූෂ්‍ය නොකොට, තමන්ගේ දුක ද නොසිතා එම පුරුෂයා ක්ෂෙම භූමියට පැමිණවීය.

**භූරිදත්ත ජාතකයෙහි,** භූරිදත්ත නම් නා රජව ඉපිද අෂ්ටාඞ්ග උපෝසථය ඉටාගෙණ තුඹස මත්තෙහි හෝනා කල, කල්ප නාශක ගින්න සමාන වූ ඖෂධයෙන් සියලු ශරීරයෙහි ඉස්නා කල්හි ද, පෙට්ටියෙහි බහාලා මුළු දඹදිව ක්‍රීඩා කරවනු ලබන කල්හි ද, ඒ බමුණු කෙරෙහි සිත දූෂ්‍ය කිරීමක් පමණකුදු නො කෙළේ ය. මෙසේ කුඩා පෙට්ටියෙහි පයින් ඇන ඇන බහාලන කල්හි ද, දුර්වල බව කරණු පිණිස අතින් මඩනා කල්හි ද, මාගේ ශීලය කඩවේද්‍ය හෝ යන භයින් ඒ අහිතුණ්ඩිකයා–හට නො කිපියෙමි.''

**චම්පෙය්‍ය ජාතකයෙහි,** චම්පෙය්‍ය නම් නා රජව ද, අහිතුණ්ඩිකයා විසින් වෙහෙසනු ලබන්නේ, සිත් දූෂ්‍ය මාත්‍රයෙකුදු නො ඉපදවිය. එහෙයින් මෙසේ වදාරන ලදී: ''චම්පෙය්‍යව උපන් කල්හිදු, ධර්මයෙහි හැසිරෙන්නාවූ, පෙහෙවස් විසූ මා අහිතුණ්ඩිකයා ගෙණ රජගෙයි දොර කෙළවන්නේ ය. ඒ අහිතුණ්ඩිකයා, නිල්වූ ද, රන්වන්වූ ද, රත්වූ ද, අවදාතවූ ද, මඤ්ජෙෂ්ඨවූ ද යම් වර්ණයක් කැමැති වේද, ඔහුගේ ඒ සිත අනුව පැවතුනෙමි. මාගේ ආනු–භාවයෙන් පොළොව දිය කරන්නෙමි, දිය ද පොළොව

කෙරෙමි. ඉදින් මම ඔහුට කිපුණේවී නම් ක්‍ෂණයකින් ඔහු අළු කෙරෙමි. ඉතින් සිතට වසඟ වීම් නම් ශීලයෙන් පිරිහෙමි, ශීලයෙන් පිරිහුණුවූවහට සම්මා සම්බෝධි නැමැති උත්තමාර්ථය සිඬ නොවේ."

**සඞ්ඛපාල ජාතකයෙහි,** සඞ්ඛපාල නා රජවද තීක්‍ෂණ වූ තෙබින් අටතැනෙකින් විද, විදපු තැතින් කටුවේවැල් ඇතුල් කොට, නාසාවෙහි ද රැහැනක් බහා, සොළොස් වැදිපුතුන් විසින් කදින් ගෙන උසුලා ගෙන යනු ලබන්නේ පොළෝ පිට ගැහෙන සිරුරු ඇත්තේ, මහත් දුක් අනුභව කරන්නේ, කිපි බැලූ පමණින් ම සියලු වැදිපුතුන් හලු කරන්නට සමත්වූයේ ද, ඇස දල්වා කිපුණු ආකාර පමණකුදු නො කෙළේ ය. එහෙයින් වදාළ සේක "සඞ්ඛපාල නා රජව, සෑම තුදුස්වක ද පසළොස්වක ද පෙහෙවස් විසීමි. එකල්හි වැදිපුත් සොළෙස්දෙන රැහන ද, තරමලද ගෙන මා කරා ආහ. ඔව්හු මාගේ නාසය විද රැහැනින් බැඳ මා නගාගෙන ගියහ. ඒසා දුකක් ඉවසූයෙමි. ඉටාගත් සිල් නොනැසුවෙමි." මෙයද ආශ්චය්‍ය්‍යයක් නොවේ.

**මාතුපොසක ජාතකාදියෙහිදී** ද සෙසුත් නොයෙක් ආශ්චය්‍ය්‍යයන් කෙළේය. දූත් සම්ඥ බවට පැමිණි, දෙවියන් සහිත ලෝකයෙහි කිසිවක්හු හා අසදෘශවූ ක්‍ෂාන්ති ගුණ ඇති, ඒ භාග්‍යවත් ශාස්තෘන් වහන්සේ අදහන්නාවූ ඒ තට ප්‍රතිඝ චිත්තය ඉපදවීම අතිශයින් ම අයුතුය, නුසුදුසුය.

ඉදින් වනාහි, මෙසේ ශාස්තෘන් වහන්සේගේ පූර්ව චරිත ගුණයන් මෙනෙහි කොටත් බොහෝ දීර්ඝකාලයක් කෙලශයන්ට දාස බවට එළඹියාවූ මේ යෝගීහට, ඒ ප්‍රතිඝය නොසංසිඳේ නම්, ඉක්බිති ඔහු විසින් **අනමතග්ග පද ප්‍රතිසංයුක්ත වූ සූත්‍රයෝ** ප්‍රත්‍යවෙක්‍ෂා කටයුත්තාහු ය. **ඒ අනමතග්ග සූත්‍රයෙහි** මෙසේ වදාළ සේක.

"මහණෙනි, යම් සත්ත්වයෙක් මව් නොවූ විරැද, ඒ සත්ත්ව තෙම සුලභ රූප නොවේ. යමෙත් පිය නොවී ද, බෑ නොවී ද, බුහුන් නොවී ද, පුත් නොවී ද, දූ නොවී ද,

එබඳු පුද්ගලයෙක් ද ලබාගත හැකි නොවේ. එ හෙයින් ඒ පුද්ගලයා කෙරෙහි මෙසේ සිතිය යුතු. මේ පුද්ගල තෙමේ අතීතයෙහි මව් ව, දසමසක් කුසින් පරිහරණය කොට, මූත්‍රය, මලය, කෙළය, මුකුණුය යනාදීන් රත්හඳුන් කල්කය මෙන් පිළිකුල් නොකරන්නී සහ කොට, ලෙහි නටවන්නී, ඇකයෙන් වඩන්නී පෝෂණය කෙළේය. පියව, එළුවන් විසින් යාහැකි මගවූ අජපථයෙහි ද, සඞ්කුපථයෙහි ද, ප්‍රත්‍යන්තමාර්ගාදීන්හි ද ගොස් වෙළෙඳාම් කරන්නේ මා පිණිස දිවිද පුදා, දෙඅතින් නැගී සංග්‍රාමයෙහි වැද, නැවින් මහ මුහුදු එතරව, සෙසු නොයෙක් සිය ගණන් දුෂ්කර ක්‍රියා ද කොට මා පුත්‍ර රක්‍ෂා කරමියි ඒ ඒ උපායෙන් ධන රැස් කොට මා පෝෂණය කෙළේය. භ්‍රාතෘ, භගිනී, පුත්‍ර, දුහිතෘ ව මේ මේ උපකාරය ද කෙළේය. ඔහු කෙරෙහි සිත දූෂ්‍ය කරන්ට මට නුසුදුසු යයි මෙසේ ද සිහි කළ යුතු.

එසේ සිහිකොටත් ඉදින් සිත නිවාගන්නට නො සමත්වී නම්, ඉක්බිති මොහු විසින් **මෛත්‍රියෙහි අනුසස්** මෙසේ සිහි කළ යුතු. "භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාළේ ම නොවේ ද, මහණෙනි, මෛත්‍රියෙන් යුක්ත වූ මෛත්‍රී ධ්‍යානයෙහි ආදරයෙන් සෙවනා ලද, වඩනා ලද, නැවත නැවත කරණ ලද, යෙදූ යානාවක් මෙන් කරණ ලද, පිහිට ලද, අනුව සිටිනා ලද, පුරුදු කරණා ලද, මනා කොට සපයන ලද, මෛත්‍රී යෙහි එකොළොස් අනුසස් කෙනෙක් දක්නා ලැබේ. ඒ කවර එකොළොස ද?

1. සමවත් සමවන්නක්හු මෙන් සුවසේ නිදාගන්නේ ය.
2. සුවසේ නිර්විකාරව පුබුදියි.
3. පවිටු සිහින නො දකියි.
4. උරෙහි පැළඳි මුත්හරක් මෙන් මිනිසුන්ට ප්‍රිය වෙයි.
5. විශාඛ තෙරුන් මෙන් දෙවියන්ට ප්‍රිය වෙයි.

6. දරුවන් රක්නා මවුන් පියන් මෙන් දෙවියන් රකිත්.
7. මෛත්‍රී විහරණයෙන් යුක්තවූවහුගේ කය ගිනිවත්, විසවත්, ආයුධවත් නො වදී.
8. වහාම සිත සමාහිත වේ,
9. මුහුණෙහි පැහැ ප්‍රසන්න වෙයි.
10. නොමුළාව කාලක්‍රියා කෙරේ.
11. සමාපත්තින් මතුයෙහි අර්හත්වය ප්‍රතිවෙධ නො කරන්නේ බ්‍රහ්ම ලෝකයට පැමිණේ.”

ඉදින් තුඹ ප්‍රතිඝය සන්සිඳුවා නො ගත්තේ නම් මේ අනුසසින් පිටත්වූවෙක් වන්නෙහිය යනාදි වශයෙන් සිහි කළ යුතු.

මෙසේ ද පටිඝය නිවාගන්නට නො සමත්වී නම් ඔහු විසින් **ධාතු විනිර්භොගය** කටයුතු. පින්වත, තුඹ මොහුට කිපෙන්නේ ය කියා කවරක්හට කිපෙයි ද? කෙශයන්ට කිපෙහි ද නැත්නම් ලොම් නියදත් ආදි වූ කොට්ඨාශයන්ට කිපෙහි ද, නොහොත් කෙශාදීන් කෙරෙහි ඇති පඨවි ධාතුවට කිපෙහි ද, ආපො ධාතුවට තෙජෝ ධාතුවට, වායෝ ධාතුවට කිපෙහි ද? නොහොත් යම් පඤ්චස්කන්ධයක්, දොළොස් ආයතනයක්, අටළොස් ධාතුවක් නිසා පවත්නාහට මෙනම් ඇත්තෙකැයි කියති. කිම, තුඹ එයින් රූපස්කන්ධයට කිපෙහි ද, නොහොත් වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ ස්කන්ධයට හෝ කිපෙන්නෙහි ද, නොහොත් චක්ෂුරායතනයට කිපෙහි ද, රූපායතනයට කිපෙහි ද, මනායතනයට කිපෙහි ද, ධර්මායතනයට කිපෙහි ද, නොහොත් චක්ෂුර්ධාතුවට කිපෙහි ද, රූපධාතුවට කිපෙහි ද, චක්ෂුර්විඥාන ධාතුවට කිපෙහි ද– ශ්‍රොතාදීන් පිළිබඳව ද මෙසේ යි. මනොධාතුවට ධර්මධාතුවට මනොවිඥාන ධාතුවට කිපෙහි දැයි, මෙසේ ධාතු විනිර්භොගය කරන්නාහට වනාහි හිඳි අග අබසේ, අහස සිතියම්සේ ක්‍රොධය පිහිටන තැනක් නොවේ.

ධාතුවිනිර්භොගය කරන්නට නො පොහොසත්හු විසින් **දාන සංවිභාගය** කටයුතු. තමා අයත් දෙය සතුරාට දියයුතු. සතුරා සතු දෙය තමහට ගතයුතු. ඉදින් ඔහුගේ ආජීවය අපිරිසුදුවී නම්, ඔහු අයත් පිරිකර තමාගේ පරිභොගයට සුදුසු නොවේ යයි සිතන්නේ නම්, තමා සතු දෙයම ඔහුට දියයුතු. මෙසේ කරන්නාවූ ඕහට ඒකාන්තයෙන්ම ඒ පුද්ගලයන් කෙරෙහි පැවති ද්වෙෂය සන්සිඳේ. ප්‍රතිපක්‍ෂවූවහුගේ අතීත ජාතියෙහි පටන් අනුබන්‍ධනා ලද ක්‍රොධය ද එකෙණෙහි ම සන්සිඳේ. පෙර සිතුල්පහුවෙහෙර විසූ පිණ්‍ඩපාතික නම් තෙර කෙනෙක්, අන් කෙනෙකුන් විසින් තුන්වරක් සෙනසුනෙන් නෙරපන ලද්දේ, කහවණු අටක් වටිනා පාත්‍රයක් රැගෙන විත් මේ පාත්‍රය මාගේ මෑණියන් විසින් දෙන ලද්දේ ය. ධාර්මිකය. මවට පින් පිණිස පිළිගත මැනැවැයි කියා ඒ සථවිරයන්ට දුන්හ. ඔවුන්ගේ ක්‍රොධය එයින් ම සන්සිඳිති. එහෙයින් කියන ලදී දානය තෙම නොදමුණන් දමන්නේ ය. දානය තෙම ආත්මාර්‍ථ පරාර්‍ථාදි සියලු අර්‍ථසාදන්නේ ය. දානයෙන් ද, ප්‍රිය වචනයෙන් ද, දායකයෝ උසස් වෙති. ප්‍රතිග්‍රාහකයෝ යටත් වෙති.

මෙසේ වෛරී පුද්ගලයන් කෙරෙහි සන්සිඳුනාවූ පටිඝය ඇති ඒ යෝගීහට ප්‍රියයා ය, අතිප්‍රිය සහායයා ය, මධ්‍යසථයා ය, යන මොවුන් කෙරෙහි යම්සේ ද, එපරිද්දෙන් ම ඒ වෛරීහු කෙරෙහි ද මෛත්‍රි වශයෙන් සිත් පවතී. මෙසේ නැවත නැවත මෙත් වඩන්නාවූ යෝගාවචරයා විසින් තමා කෙරෙහි ද, ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද, මධ්‍යසථයා කෙරෙහි ද, වෛරී පුද්ගලයන් කෙරෙහි ද යන සතර දෙනා කෙරෙහි සමසිත් බව සම්පාදනය කරන්නාහු විසින් **සීමාසම්භෙදය** හෙවත් සීමා බිඳීම් වශයෙන් සමසිත් බව කටයුතු.

ප්‍රිය පුද්ගලයාය, මධ්‍යසථයා ය, වෛරීය යන මොවුන් හා සමග තමා සතරවනු කොට ඇති මේ පුද්ගලයෝ එක්තරා ප්‍රදේශයක හුන් කල්හි, සොරහු ඇවිත් වහන්ස,

මෙයින් එකකු අපට දෙවයි කියන්නාහ කවර කරුණක් නිසා දැයි ඇසූ කල්හි මරා ගෙල රුධිරය ගෙණ බිලියම් කරණු පිණිස යයි කීහ. එකල්හි මෙත් වඩන මේ යෝගී තෙම අසුවල්හු අසුවල්හු ගණිත්වයි සිතුයේ වී නම් සීමාසම්භේදය නො කරණ ලද්දේ ම වේ. ඉදින් මා ගණිත්වයි, මේ තුන් දෙන නො ගණිත්වයි සිතුයේවී නම් එවිට ද සීමාසම්භේදය නො කරණ ලද්දේ ම වේ. යමෙක් යමෙක් හුගේ ග්‍රහණය කැමැති වී නම් ඔහු ඒ පුද්ගලයාහට අහිත වෙයි. සෙස්සන්ට හිතෛෂී වෙයි. යම් කලෙක වනාහි සතර දෙනා කෙරෙහි එකකුදු සොරුන්ට දියයුතු කොට නො දකී ද එවිට තමා ආදී සතර දෙනා කෙරෙහි ම සමසිත් ඇතිවන හෙයින් සීමාසම්භෙදය කෙළේ නම් වේ.

තමා කෙරෙහි ද, ප්‍රියයා කෙරෙහි ද, මධ්‍යස්ථයා කෙරෙහි ද, වෛරීහු කෙරෙහි ද යන සතර දෙනා කෙරෙහි යම් කලෙක ප්‍රිය ය මැදහත් ය යනාදී වශයෙන් නානාත්වය දකී ද, එකල්හි සත්ත්වයන් කෙරෙහි හිතසිත් ඇත්තේ යයි කියනු ලැබේ. මෛත්‍රිය කැමැති පරිද්දෙන් ලද්දේ යයි ද, කුසල් ඇත්තේ යයි ද නො කියනු ලැබේ. යම් කලෙක තෙමේය, හිතය, මැදහත්ය, වෛරිය යන සතර සීමා බිඳ එකක්හු වශයෙන් කරණු ලැබේ ද, එකල්හි දෙවියන් සහිත වූ සියළු ලොව මෛත්‍රියයෙන් සමකොට පතුරුවන්නේ වේ. යමක්හට සීමා නො පෙනේ ද, ඔහු සීමා දක්නහුට වඩා මහත් භාවනා විශේෂය ඇත්තෙක් වන්නේ ය.

මෙසේ සීමාසම්භෙදය හා සමකාලයෙහි ම, යෝගාවචරයා විසින් **නිමිත්ත** ද, **උපචාරය** ද ලබන ලද්දේ වේ. මේ භාවනාවෙහි දී කසිණ කර්මස්ථාන ආදීන්හි මෙන් උද්ග්‍රහ නිමිත්තවත් වැටහෙන්නේ නොවෙයි. ඒ සීමාසම්භෙදය ම නිමිත්ත වැනි හෙයින් නිමිත්ත නම්. ඒ සීමාසම්භේද නිමිත්ත ලද කල්හි භාවනාව සාතිශය වන බැවින් නීවරණයෝ ද විෂ්කම්භිත වෙති. කෙලශයෝ ද සන්සිඳෙන ලද්දාහු වෙති. උපචාර සමාධි වශයෙන් සිත සමාහිත වෙයි.

සීමාසම්භෙද කළ කල්හි, සීමාසම්භෙද වශයෙන් පැවති එම සමථ නිමිත්ත සේවනය කරණුයේ, වඩන්නේ, නැවත නැවත වඩන්නේ නිදුකින් ම පඨවි කසිණයෙහි කී ආකාරයෙන් ම අර්පණාවට පැමිණේ. මෙතෙකින් ඒ යෝගාවචර තෙම, ප්‍රහීණ කළ පඤ්චාඞ්ගයක් ඇති, පඤ්චාඞ්ගයකින් සමන්විත වූ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්‍ෂණයෙන් යුක්ත වූ මෛත්‍රී සහගත ප්‍රථමධ්‍යානය ලැබූයේ වේ.

මෛත්‍රී සහගත වූ ඒ ප්‍රථමධ්‍යානය ලද කල්හි, සීමාසම්භෙදය වශයෙන් පැවති ඒ සමථ නිමිත්ත සේවනය කරමින්, වඩමින්, නැවත නැවත වඩමින් පිළිවෙලින් චතුෂ්කනය වශයෙන් ද්විතීය, තෘතීය ධ්‍යානයන් ද, පඤ්චකනය වශයෙන් ද්‍රුතිය, තෘතීය, චතුර්ථධ්‍යානයන්ට ද පැමිණෙන්නේ ය.

යෝගාවචර තෙම මෙසේ ධ්‍යාන උපදවා ගෙන, ඒ ධ්‍යානයන් අතුරෙන් එක්තරා ධ්‍යානයක්හුගේ වශයෙන් මෛත්‍රීසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වසන්නේ ය. එසේම දෙවන දිග ද, තුන් වන දිග ද, සතර වන දිග ද පතුරුවා වෙසෙයි. එසේම උඩ, යට හා අනුදිග් ද යන හැම තැනම, සත්ත්වයන් වාසය කරන මුළු ලොවම විපුල වූ, මහද්ගත වූ, අප්‍රමාණ වූ, වෛර නැත්තා වූ, දොම්නස් නැත්තා වූ, මෛත්‍රී සහගත සිතින් පතුරුවා වෙසෙයි. ප්‍රථමධ්‍යානාදීන්ගේ වශයෙන් අර්පණාවට පැමිණි සිත් ඇතියෙකු හටම මේ විකුර්වණාව සිඩවේ. මෙහි ඒ ඒ දිග් පරිග්‍රහ කොට, සීමා වෙන් කොට මෛත්‍රිය පැතිරවීම **ඔධිසොඵරණ** මෛත්‍රිය නම් වේ. සියලු දිග්හි හීනය, මධ්‍යමය, උත්කෘෂ්ටය, මිත්‍රය, සතුරුය, මධ්‍යස්ථය, ස්ත්‍රිය, පුරුෂයා, ආර්‍ය්‍යය, අනාර්‍ය්‍යය, දෙවය, මනුෂ්‍යය, යනාදී ප්‍රභෙද ඇති සියලු සතුන් කෙරෙහි ආත්මසම බැවින් ආත්මතා වශයෙන් මේ පරසත්ත්ව යයි විභාග නො කොට, නොහොත් සියලු සිත් කොටසින් සවල්පයකුදු කමටහනින්

පිටත්හි වික්ෂෙපයට නො පැමිණෙනුයේ සියලු දිග්හි සියලු සත්ත්වයන්, දිශා, පුද්ගල සීමා නො කොට මෛත්‍රිය පැතිරවීම **අනොධිසොඵරණ** මෛත්‍රිය නම් වේ.

**මෙත්තා** චෙතො විමුත්ති නම් වූ මේ මෛත්‍රීධ්‍යානය, පස් ආකාරයෙකින් අනොධිසොඵරණ වශයෙන් ද, සත් ආකාරයෙකින් ඔධිසොඵරණ වශයෙන් ද, දිසා වශයෙන් දශ ආකාරයෙකින් ද සිඛ කටයුතු.

**පඤ්චවිධ** අනොධිසොඵරණ මෙත්තා චෙතොවි-**මුක්තිය හෙවත් මෛත්‍රිය ධ්‍යානය** මෙසේ වැඩිය යුතු.

**1. සබ්බසත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු සත්ත්වයෝ අවෛර වෙත්වා හෙවත් වෛර නැත්තාහු වෙත්වා. අව්‍යාපජ්ඣ හෙවත් නීරෝගවූවාහු වෙත්වා. අනිඝ හෙවත් නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා) මෙහි සියලු සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා යි වැඩීමෙන් එක් අර්පණාවෙක. නීරෝගවූවාහු වෙත්වා යි වැඩීමෙන් එක් අර්පණාවෙක. නිදුක්වූවාහු වෙත්වා යි වැඩීමෙන් එක් අර්පණාවෙක. සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වායි වැඩීමෙන් එක් අර්පණාවෙක. මෙහි රූපාදී සකන්ධයන්හි ඡන්දරාග වශයෙන් ශක්ත හෙයින් හෙවත් ඇලුණු හෙයින් සත්ත්ව නම්.

මෙසේ සියලු සත්ත්වයන්ගේ වශයෙන් මෛත්‍රිය වැඩීමෙන් අර්පණා සතරෙක් සිඛවේ.

**2. සබ්බපාණා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු ප්‍රාණීහු වෛර නැත්තාහු වෙත්වා, නීරෝග වූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන්

පරිහරණය කෙරෙත්වා). ප්‍රාණීහු නම් ආශ්වාස ප්‍රශ්වාස-යෙන් යුක්තවූවෝය නොහොත් ජීවත්වන්නෝ ය. මෙහි ද අර්පණා සතරෙක.

**3. සබ්බෙ භූතා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු භූතයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝග-වූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා). කර්ම ක්ලේශ දෙකින් උපන්නෝ භූතයෝ ය. මෙහි ද අර්පණා සතරෙක.

**4. සබ්බෙ පුග්ගලා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා, හොන්තු අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු පුද්ගලයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණ කෙරෙත්වා). නිරයෙහි ගලන්නෝ නිරයෙහියන්නෝ පුද්ගලයෝ ය යනු එක් අර්ථයෙක. මෙහි ද අර්පණා සතරෙක.

**5. සබ්බෙ අත්තභාව පරියාපන්නා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු ආත්මභාව පරියාපන්නයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරොගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා). ආත්මභාව නම් පඤ්චස්කන්ධ සංඛ්‍යාතවූ ශරීරයයි. ඒ ස්කන්ධ පඤ්චකය ගෙණ පරමාර්ථ වශයෙන් අවිද්‍යමානවූව ද, ප්‍රඥප්තිමාත්‍රයෙන් විද්‍යමාන බැවින් ඒ ආත්මභාවයෙහි ඇතුළත්වූවෝ ආත්මභාව පරියාපන්නයෝ ය. මෙහි ද අර්පණා සතරෙක.

මෙසේ සත්ත්ව, ප්‍රාණ, භූත, පුද්ගල, ආත්මභාව පරියාපන්න වශයෙන් පස්ආකාරයෙකින් දක්වන්නේ නමුත් ඒ සියල්ලෝම සියළු සත්ත්වයන්ටම පරියාය

වචනයෝ ය. එහෙයින් මේ සත්ත්වාදී පස් දෙනාම ගෙන පස් ආකාරයෙන් අනොධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තිය දක්වන ලද බව දත යුතු. යමෙක් සත්ත්ව, ප්‍රාණ යනාදීන්ගේ වචනමාත්‍ර වශයෙන් නොව අර්ථ වශයෙන් වෙන් කොට අරමුණු කරන්නේ නම් ඔහුට අනොධිසොඵරණ මෛත්‍රිධ්‍යානය සිඩ නොවේ. එහෙයින් එහි අර්ථ නොගෙණ මේ පස් ආකාරයන් කෙරෙහි එක්තරා ආකාරයක්හුගේ වශයෙන් අනොධිසොඵරණ මෛත්‍රි චෙතොවිමුක්තිය වැඩිය යුතු.

මේ පස්ආකාර කොටසුන් කෙරෙහි පූර්වභාගයෙහිදී ඒ ඒ කොටස ගෙණ භාවනා කරණ කාලයෙහි නොයෙක් කොටස් වශයෙන් මනසිකාරය පැවතුණේ වී නමුත් ඒ ඒ භාවනා සිඩවන කෙණෙහි කොටසුන් අතුරෙන් යම් කොටසෙක් ප්‍රගුණවූ බැවින් අතිශයින් ප්‍රකට වේ ද, ඒ ඒ කොටස්හුගේ වශයෙන් මෛත්‍රිය පැතිරවීම කටයුතු. මෙසේ පස් ආකාරයන් කෙරෙහි, සතර අර්පණා වන්ගේ වශයෙන් අනොධිසොඵරණයෙහි අර්පණාවෝ විසිදෙනෙක් වන බව දතයුතු.

**සප්තවිධ ඔධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තිය හෙවත් මෛත්‍රි ධ්‍යානය.** මෙසේ වැඩිය යුතු.

**1. සබ්බා ඉත්ථියො අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු ස්ත්‍රීහු වෛරි නැත්තාහු වෙත්වා, නිරොගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා).

**2. සබ්බෙ පුරිසා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛීඅත්තානං පරිහරන්තු.**

(සියලු පුරුෂයෝ වෛර නැත්තාහු වෙත්වා, නිරොගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා).

**3. සබ්බෙ අරියා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු ආර්‍යයෝ වෛර නැත්තාහුවෙත්වා නීරෝග-වූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා)

**4. සබ්බෙ අනරියා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු අනාර්‍යවූ පෘථග්ජනයෝ වෛර නැත්තාහු වෙත්වා, නිරොගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා).

**5. සබ්බෙ දෙවා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු දෙවියෝ වෛරනැත්තාහු වෙත්වා, නීරොග-වූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා).

**6. සබ්බෙ මනුස්සා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු මනුෂ්‍යයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරොගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**7. සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු, අව්‍යා-පජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු විනිපාතිකයෝ වෛරනැත්තාහු වෙත්වා, නීරොගවූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

මේ සප්තවිධ ඕධිසොඵරණයෙහි සතර සතර බැගින් අර්පණාවෝ අටවිස්සෙකි.

**දශවිධ දිසා ඵරණ මෙත්තා චෙතො විමුත්තිය හෙවත් මෛත්‍රී ධ්‍යානය** මෙසේ වැඩිය යුතු.

**1. සබ්බෙ පුරත්ථිමායදිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු.**

(සියළු පෙරදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නිරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**2. සබ්බෙ පච්ඡිමාය දිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු පැළදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**3. සබ්බෙ උත්තරාය දිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු උතුරුදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**4. සබ්බෙ දක්ඛිණාය දිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු දකුණුදිග සත්ත්වයෝ වෛරනැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**5. සබ්බෙ පුරත්ථිමාය අනුදිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු පෙරඅනුදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**6. සබ්බෙ පච්ඡිමාය අනුදිසාය සත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු පැළ අනුදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**7. සබ්බෙ උත්තරාය අනුදිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු උතුරු අනුදිග සත්ත්වයෝ වෛරනැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**8. සබ්බෙ දක්ඛිණාය අනුදිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු දකුණු අනුදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**9. සබ්බෙ හෙට්ඨිමාය දිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු යට දිග සත්ත්වයෝ වෛරනැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

**10. සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු.**

(සියලු උඩදිග සත්ත්වයෝ වෛර නැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, නිදුක්වූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා.)

මෙපරිද්දෙන්ම දසදිග්හි සියලු සත්ත්වයෝද, ප්‍රාණීහු ද, සියලු භූතයෝ ද, සියලු පුද්ගලයෝ ද, සියලු ආත්මභාව පරියාපන්නයෝ ද, සියලු ස්ත්‍රීහු ද, සියළු පුරුෂයෝ ද, සියලු ආර්‍ය්‍යයෝ ද, සියලු අනාර්‍ය්‍යයෝ ද, සියලු දෙවියෝ ද, සියලු මනුෂ්‍යයෝ ද සියලු විනිපාතිකයෝ ද, වෛරනැත්තාහු වෙත්වා, නීරෝගවූවාහු වෙත්වා, සුවපත්වූවාහු තමන් පරිහරණය කෙරෙත්වා යි දිසා වශයෙන් මෛත්‍රිය වැඩිය යුතු.

මෙසේ අනොධිසොඵරණ වශයෙන් අර්පණා පස්සෙක, ඔධිසොඵරණ වශයෙන් අර්පණා අටවිස්සෙක, දිසා වශයෙන් අර්පණා දෙසිය අසූවෙකැයි අර්පණාවෝ සාරසිය අසූවක් වෙති.

## මෛත්‍රී භාවනාවෙහි අනුසස්

යට කියන ලද ආකාරයන් අතුරෙන් යම් කිසි ආකාරයකින් මෛත්‍රී ධ්‍යානය වඩා නම් ඒ යෝගාවචරයාහට අනුසස් එකොළොසක් ලැබෙත්තේ ය. ඒ අනුසස් එකොළොස නම්:-

1. **සුඛංසුපති** - යම්සේ සෙසු ජනයෝ දකුණැලයෙන්ම සයනය නොකොට හාත්පසින් පෙරළෙමින් සුරු සුරු ගාමින් ප්‍රශ්වාස වශයෙන් ශබ්ද පවත්වමින් දුකසේ හොවී ද, මේ යෝගීතෙම එසේ නො ව සුවසේ හෙව සමවතට සමවන්නක්හු මෙන් නිදන්නේ ය.

2. **සුඛං පටිබුජ්ඣති** - සුවසේ පුබුදී. - යම්සේ සෙසු ජනයෝ තතනමින්, හැඬෙමින්, පෙරළෙමින් දුකසේ

පුබුදී ද, මෛත්‍රී ධ්‍යානයෙන් යුත් යෝගාවචර තෙම එසේ නොව පිපෙන පියුමක් මෙන් සුවසේ විකාර නැතිව පුබුදී.

3. **න පාපකං සුපිනං පස්සති** – නපුරු සිහින නො දකී. හෙතෙම සවප්න දක්නේ ද, යහපත්වූ ම සවප්නයක් දකී. දාගැබක් වඳින්නාක්හු මෙන් ද, පූජා පවත්වන්නාක්හු මෙන් ද, බණ අසන්නාක්හු මෙන් ද, සවප්න දකී. සෙසු ජනයෝ තමන් සොරුන් විසින් පිරිවරණ ලද්දාසේ ද, නපුරු සතුන් විසින් උපද්‍රව කරණ ලද්දාසේ ද, ප්‍රපාතයෙහි හෙන්නා සේ ද, සවප්නයෙන් දකී. යෝගී තෙම එසේ පවිටු වූ සවප්න නො දකී.

4. **මනුස්සානං පියො හොති** – මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. උරෙහි බහාලූ මුත්හරක් මෙන් ද, හිස පළඳනා මල්මාලාවක්සේ ද මිනිසුන්ට ප්‍රිය වෙයි. මනාප වෙයි.

5. **අමනුස්සානං පියො හොති** – යම්සේ මිනිසුන්ට ප්‍රිය වේද, එසේම දෙවියන්ට ද ප්‍රිය වේ. **විශාඛ තෙරණුවෝ** පෙර පැළලුප් නුවර කෙලෙඹියෙක් වී එහි ම වසනුයේ මෙසේ ඇසීය. තම්බපණ්ණි ද්වීපය (ලක්දිව) වනාහි චෛත්‍යමාලාවෙන් අලඞ්කෘත ය. කාෂාය වස්ත්‍රයෙන් බැබලෙන්නී ය. කැමති කැමති තන්හි හිඳින්නට හෝ හෝනට හෝ පිළිවන. ඍතු සැප ද, සෙනසුන් සැප ද, පුද්ගල සැප ද, බණ අසන සැප ද, යන සියල්ල එහි සුවසේ ලැබෙයි. මෙසේ ඇසූ හෙතෙම තමාගේ භොග-රාසිය අඹුදරුවන්ට පාවාදී, රෙදිකඩ අග එක්කහවණුවක් පමණක් ගැටගසා ගෙන, ගෙදරින් නික්ම මුහුදු තෙර නැවක් එනු බලාසිටිනුයේ එක්මසක් ගත වීය. හෙතෙම ව්‍යවහාරයෙහි දක්‍ෂවූයේ මෙදෙරින් බඩු ගෙන අතික් තැනෙක විකුණන්නේ, දැහැමින් කරණ වෙළඳාමෙන් එම මස ඇතුළත දී දහසක් පමණ රැස් කොට අනුක්‍රමයෙන් ලක්දිව මහ විහාරයට අවුත් පැවිදි බව ඉල්වී ය. හෙතෙම මහණ කරණු පිණිස සීමාවට පමුණුවනු ලද්දේ ඒ දහසින්

බැඳිපියල්ල බිම හෙළී ය. මේ කිමෙක් දැයි ඇසූ කල්හි, කහවණු දහසෙක වහන්සැයි කීය. උපාසකය, පැවිදිවූ තැන් පටන්ගෙණ මිලමුදල් විධානය කරන්නට නො පිළිවන, දූත් ම එයට කටයුතු දනුවයි භික්ෂූහු කීහ. විශාඛයා මහණ වන තැනට ආවාහු සිස් අතින් නොයෙත් - වායි සිතා පියල්ල මුදා සීමා මලුයෙහි විසුරුවා, මහණව, උපසම්පදා ලැබ, පස්වසක් වැස, උභයමාතෘකා ප්‍රගුණ කොට, තමහට සැප කමටහන් ගෙණ, එකී එකී විහාරයෙහි සාරමස සාරමස බැගින් සමකොට වත් පුරමින් හෙවත් සියලු සතුන් කෙරෙහි සමව පැවති මෛත්‍රිවිහාර නමැති වාස ඇත්තේව හැසුරුණේ ය.

විශාඛ නම් මහතෙරහු, වනාන්තරයෙහි සිටියේ සිංහ ගර්ජනා කරන්නේ තමාගේ ගුණ සමුදාය ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නොහොත් ඒ තෙරහු සියලු සතුන් කෙරෙහි සම මෛත්‍රි විහරණයෙන් වෙසෙමින් ඇවිදිනාහු, එක්තරා රමණීය වන ලැහැබක් දක එහි එක්තරා රුක්මුලෙක සමවතට සමවැද, එයින් නැගී තමන්ගේ ගුණ ආවර්ජණාව හේතුකොට ඇති ප්‍රීති සොම්නසින් උදන් අනන්නාහු මෙසේ කීහ: "යම් තැනෙක පටන් උපසම්පන්න වීම් ද, යම් තාක් මෙතැනට ආම් ද, මේ අතුරෙහි කිලුටක් නම් නැත. තිදුක–තට වූයේ මහත් ලාභයකි." හෙතෙම සිතුල්පහු වෙහෙරට යන්නේ දෙමං සන්ධියකට පැමිණ මේ මගද්‍රෙ නොහොත් මේ මගද්‍රෙ හෝයි සිතමින් සිටියේය. එකල්හි ඒ පර්වතයෙහි වසන දේවතාවෙක් අත දික් කොට මේ මග යයි දක්වූයේ ය. එ මගින් ගොස් හෙතෙම සිතුල්පව්වෙහි සාරමසක් වැස අලුයම යෙමියි සිතා හොත්තේ සක්මන් හිස මණීල රුක වසන දේවතා තොමෝ හිනිපෙත්ත මත්තෙහි හිඳ හඬන්නට විය. සථවිර තෙමේ ද මේ කවරෙක් දැයි ඇසූ කල, වහන්ස මම මණීල දේවතා යයි කීහ. කුමක් හෙයින් හඬන්නේ දැයි විචාරණ ලද්දේ නුඹගේ ගමන් පිණිස යයි කීය. මා මෙහි වසන කල තට කවර ගුණයෙක් දැයි ඇසීය.

වහන්ස, නුඹ මෙහි වසන කල දෙවියෝ ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රිය කරති. දැන් නුඹ ගිය කල්හි කලහ කෙරෙති, නපුරු කථා කෙරෙති යි කිහ. ස්ථවිරයන් වහන්සේ ද, ඉදින් මා මෙහි වසන කල්හි තොපට සැප විහරණය වන්නේ නම් යහපතැයි කියා අතින් සාරමසක් එහි ම වැස නැවත එසේම ගමන යන්නට සිතීය. දේවතා තොමෝ එකල්හි ද නැවත හඬන්නට වන. මෙම උපායෙන් තෙරහු එම විහාරයෙහි ම පිරිනිවන් පෑසේක මෙසේ මෛත්‍රිය ධ්‍යානය ඇති මහණහු අමනුෂ්‍යයන්ට ප්‍රිය වේ.

**6. දෙවතා රක්ඛනති** - පුතක්හු රක්නා මව්පියන් මෙන් දෙවියෝ රකිත්.

**7. නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති** - මෛත්‍රිය වඩන යෝගීහුගේ සිරුර උත්තරා නම් උපාසිකාවන්ගේ කය මෙන් ගිනි නොවදී, සංයුත්තභාණක චූලසිව නම් තෙරුන්ගේ කය මෙන් විෂ නො වදී, සංකිච්ච නම් සාමණේරයන්ගේ කය මෙන් ආයුධ නොවදී. පෙර එක් ගවදෙනක් වස්සාට කිරිළුවමින් සිටි කල්හි වැද්දෙක් ඒ දෙන විදිමියි සිතා අතින් සකස් කොට දිග් අඬු ඇති හෙණින් ඇන්නේය. ඒ තෙබ ඒ දෙනගේ ශරීරයෙහි පැහැර තල්පතක් මෙන් හැකිළ ගියාය. එසේ වූයේ උපචාර ධ්‍යාන බලයෙන් හෝ අර්පණා බලයෙන් හෝ නොව හුදෙක් වස්සා කෙරෙහි බලවත් වූ ප්‍රිය සිත් ඇති බැවිනි. මෙසේ මෛත්‍රිය මහත් ආනුභාව ඇත්තී ය.

**8. තුවටං චිත්තං සමාධියති** - මෛත්‍රී විහාරීහුගේ සිත වහාම සමාහිත වේ. ඒ චිත්තයාගේ සමාහිත භාවයෙහි ලැසිගත් බවෙක් නම් නැත.

**8. මුඛවණ්ණො විප්පසීදති** - නටුයෙන් ගැලවුණු තල්ගෙඩියක් මෙන් ඔහුගේ මුහුණ ප්‍රසන්න වර්ණ වේ.

**10. අසම්මූළ්හො කාලං කරොති** – මෛත්‍රී විහාරයා හට මුළාව වන මරණයෙක් නම් නැත. මුළා නොවූයේම නිදන්නට වන්නක්හු මෙන් කාලක්‍රියා කෙරේ.

**11. උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති** – මෙත් සමවතින් මත්තෙහි රහත් බවට පැමිණෙනුවට අසමර්ථවූයේ නම් මෙයින් චුතව නිඳ පිබිදියාක්හු මෙන් බඹලොවට ම එළඹෙයි.

## කරුණා භාවනාව

කරුණා බ්‍රහ්ම විහාරය වඩනු කැමැත්තහු විසින් නිෂ්කරුණා බැව්හි හෙවත් විහිංසාවෙහි ආදීනවයත් සහ කරුණායෙහි අනුසස් ද ප්‍රත්‍යවෙක්‍ෂා කොට කරුණා භාවනාව ආරම්භ කටයුතු. ඔහු විසින් පළමු කොට ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි කරුණා භාවනාව ආරම්භ කටයුතු නො වේ. ප්‍රිය පුද්ගලයා කෙරෙහි කරුණාව ආරම්භ කරනුවහට ප්‍රිය භාවය පළමු කොට පහ නොවේ. ප්‍රිය භාවය පහ නොවූ කල කරුණාව නො පිහිටන්නේ ය. ප්‍රියයා ප්‍රියතන්හිම සිටින්නේ ය. ලිඞ්ග විසභාගයන් හා කාලක්‍රියා කළවුන් ද යට දක්වන ලද පරිදි කරුණා භාවනා වැඩීමට තැන් නොවෙත්. ඔහු විසින් පළමු කොට, කරුණා කටයුතු ස්වරූපය ඇති, අතිශයින් ම දුකට පැමිණියා වූ, දිළිඳු වූ, දුශ්චරිතයෙන් යුක්ත වූ බැගෑ පුරුෂයා, කපන ලද අත් පා ඇති, කබල පෙරටු තබා ගෙණ අනාථ ශාලායෙහි හොත්තහු, අතින් පයින් වැහෙන්නා වූ පණුකැලත් ඇති බැගෑ හඬින් හඬන්නහු දැක, මේ සත්ත්ව තෙම දුකට පැමිණියේ ය. මේ දුකින් මිදුණේ වී නම් යෙහෙකැයි කරුණාව පැවැත්විය යුත්තී ය. එවැනි පුද්ගලයෙක් නො ලබන්නහු විසින්, සුවපත්වූ ද, පව් කරණ පුද්ගලයෙක් වධ්‍යයා හා සම කොට මෙසේ කරුණා වැඩිය යුතු.

යම් සේ බඩු හා සමග අල්වාගත් සොරුට මෙසේ වධ කරවයි රජහු විසින් නියෝග කළ කල්හි, රාජපුරුෂයෝ

ඔහු බැඳ සන්ධියෙහි සන්ධියෙහි දී පහර සිය ගණනින් දෙමින් මරණතැනට ගෙණයන කල්හි මිනිසුන් කෑ යුතු වැළඳිය යුතු දෑ ද, මල්, ගඳ, විලවුන්, බුලත් ආදී දෙන්නාහ. හෙතෙම එය කන්නේ ද, වළඳන්නේ ද, සුවපත් වී, භොගයෙන් යුක්තවූවක්හු මෙන් යේ ද, එතකුදු වූවත් කිසිවෙක් මේ මහත් භොග ඇත්තෙකැයි නො සිතන්නේ ය. ඒකාන්තයෙන් මෙතෙම පින් නැත්තේ දූන් මිය යෙයි. මෙතෙම යම් යම් පියවරක් තබා ද, ඒ ඒ පියවරින් මරහු සමීපයට ම යෙයි සිතා ඕ හට ජනයෝ කරුණා කෙරේ ද, එ පරිද්දෙන් ම කරුණා කම්සථානයෙහි යෙදුණු යෝගාවචරයා විසින් සුවපත් වූ පුද්ගලයා කෙරෙහි කරුණාව වැඩිය යුතු. මෙතෙම පින් නැත්තේ, යම් හෙයකින් දූන් සුවපත්වූයේ සුව අනුභව කිරීමෙහි සැරහුණේ භොගයන් වළඳන්නේ ය. එසේ වූවත් තුන්දොරින් එක දොරකිනුදු කරණ ලද යහපත් කම්යක් නැති හෙයින් දුක් දොම්නස් අනුභව කරන්නේ යයි මෙසේ ඒ පුද්ගලයාහට කරුණා කොට, ඉක්බිති මෙම උපායෙන් ම ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද, එයට ඉක්බිති ව මධ්‍යසථ පුද්ගලයා කෙරෙහි ද, අනතුරුව වෛරීහු කෙරෙහි ද පිළිවෙළින් කරුණාව පැවැත් විය යුතු. ඉදින් ඔහට පෙර කී නයින් වෛරීහු කෙරෙහි පටිඝය උපදී නම් ඒ පටිඝය ද මෛත්‍රී භාවනාවෙහි කී නියායෙන් ම සංසිඳවා ගත යුතු.

යමෙක් වනාහි කරණ ලද කුසල් ඇත්තේ වී නම් ඔහු ද ඥාතිව්‍යසනය, රොග ව්‍යසනය, භොග ව්‍යසනය යනාදීන් කෙරෙන් එක්තරා ව්‍යසනයකින් සමන්විත පුද්ගලයෙකු බව දූක හෝ අසා හෝ එසේත් නැත්නම් සසර දුක් නොඉක්ම වූ බැවින් මොහු දුකඛිතම යයි සම්කාරයෙන් ම කරුණා පවත්වා පළමු කී පරිදි තමා කෙරෙහි ද, ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද, මධ්‍යසථයා කෙරෙහි ද, වෛරීහු කෙරෙහි ද, මෙසේ සතර දෙනා කෙරෙහි ද සීමාසම්භෙද කොට, සීමාසම්භෙද වශයෙන්

පැවති ඒ සමථ නිමිත්ත සේවනය කරන්නේ, වඩන්නේ, නැවත නැවත වඩන්නේ මෛත්‍රී කමටහනයෙහි කී පරිද්දෙන් ත්‍රික චතුෂ්ක ධ්‍යාන වශයෙන් අර්පණා වැඩිය යුතු.

ඉක්බිතිව යට කියන ලද ප්‍රකාරයෙන් පඤ්චවිධ අනොධිසොඵරණ කරුණා වශයෙන් ද, සප්තවිධ ඔධිසො ඵරණ කරුණා ධ්‍යාන වශයෙන් ද, දසාකාර දිශාඵරණ වශයෙන් ද යන අභිඥාවෝ ලැබිය යුතු.

මෙහි අනුසස් වශයෙන් මෛත්‍රී ධ්‍යානයෙහි කී පරිදි එකොළොස් අනුසස් ම ලැබෙන්නාහ.

## මුදිතා භාවනාව

මුදිතා භාවනාව ආරම්භ කරණු කැමති යෝගාවචරයා විසින් ද පළමු කොට ප්‍රිය පුද්ගල, මධ්‍යස්ථ පුද්ගල, වෛරී පුද්ගල යන මොවුන් කෙරෙහි ආරම්භ නොකටයුතු. ප්‍රිය පුද්ගල තෙමේ ප්‍රියභාව මාත්‍රයෙන් ම මුදිතාවට ආසන්න කාරණා නොවේ. සොම්නස් ආදීන්ගේ වශයෙන් සිඩවූ, නිත්‍යයෙන් සතුටු මුහුණු ඇති බව යනාදී විශේෂ යන් නැතිව හුදෙක් ප්‍රිය මාත්‍රභාවය ආසන්න කාරණා නොවේ. මධ්‍යස්ථ පුද්ගලයා සිහිකරණුවහට උදාසීනබව පිහිටයි. වෛරීහු සිහිකරන්නා හට ක්‍රෝධය උපදී. එහෙයින් මධ්‍යස්ථයා හා වෛරීහු කෙරෙහි ද පළමු කොට මුදිතාව නො වැඩිය යුතු. ලිඞ්ග විසභාගයන් හා කාලක්‍රියා කළාහු ද මුදිතාවට තැන් නොවේ.

අතිප්‍රිය සහායකයා මුදිතාවට ආසන්න කාරණ වන බැවින් පළමු කොට ඔහු කෙරෙහි මුදිතාව පැතිරවිය යුතු. සොණ්ඩසහාය හෙවත් ප්‍රමෝදයට පැමිණීමෙන් රහ සොඬෙකු බඳු වූ සහායයා මුදිත මුදිත හෙවත් අතිශයින් ම සතුටු වේ. පළමු කොට සිනහසී පසුව කථා කරයි. එහෙයින් ඒ සොණ්ඩසහායයා කෙරෙහි පළමු කොට මුදිතාව පැතිර විය යුතු. සුවපත් වූ ද සපයන ලද සුඛසාධන

ඇති, සතුටුවන්නාවූ ප්‍රිය පුද්ගලයා දැක හෝ අසා හෝ ඒකාන්තයෙන් මේ සත්ත්ව තෙම සනතුෂ්ටයහ. ඉතා යෙහෙකැයි, ඔහු කෙරෙහි මුදිතා වැඩිය යුතු වේ. ඉක්බිති ප්‍රිය වූ, මනාප වූ, එක් පුද්ගලයෙකු දැක සතුටුවේ ද එපරිද්දෙන් ම සියලු සතුන් කෙරෙහි මුදිතාව පැතිර විය යුතු. ඉදින් ඔහුගේ ඒ සොණ්ඩසහායයා හෝ ප්‍රිය පුද්ගලයා හෝ ඒ ජන්මයෙහි පූර්‍ව භාගයෙහි සුවපත් වී දැන් දුක්පත්වී නම්, ඔහුගේ ඉක්මුණා වූ සුවපත් බව සිහි කොට මෙතෙම පළමු මෙසේ වූ මහත් භොග ඇත්තේ විය. මහත් පිරිවර ඇත්තේ විය. හැම වේලෙහිම සතුටු වී යයි ඔහුගේ එම සතුටු වූ ආකාරය ගෙණ මුදිතාව ඉපද විය යුතු. අනාගතයෙහි හෝ නැවත ඒ සම්පත්තිය ලැබ ඇත්කඳය, අස්පිටය, රත්සිවිකාය යනාදියෙන් ඇවිදින්නේ යයි මොහුගේ අනාගතයෙහි එන මුදිතාකාරය ද ගෙණ මුදිතාව ඉපදවිය යුතු.

මෙසේ සොණ්ඩසහායයා ය, ප්‍රිය පුද්ගලයා ය යන ප්‍රිය පුද්ගලයන් දෙදෙනා කෙරෙහි මුදිතාව උපදවා ඉක්බිත්තෙන් මධ්‍යස්ථයා කෙරෙහි ද, සතුරා කෙරෙහි ද පිළිවෙලින් මුදිතා උපදවා අභිණාව ඉපද විය යුතු ය. මෙසේ මේ තුන්දෙනා කෙරෙහි ද තමා කෙරෙහි ද යන සතර දෙනා කෙරෙහි සමසිත් පවත්වා සීමාසම්භෙදය කොට මුදිතා භාවනාව සමෘධ කට යුතු.

අනුසස් ද මෛත්‍රි භාවනාවට කියන ලද ආකාරයෙන් දත යුතු.

## උපෙක්ෂා භාවනාව

උපෙක්ෂා භාවනාව ආරම්භ කරණු කැමති, මෛත්‍රි බ්‍රහ්මවිහාරාදිය වැඩීමෙන් තික චතුෂ්ක ධ්‍යාන ලබාගත් යෝගාවචරයා විසින්, තෘතිය ධ්‍යානයට හෝ චතුර්‍ත්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී “සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වායි” යනාදී වශයෙන් මෛත්‍රියෙන් පවත්වන ලද

මනසකාරයෙන් යුක්ත බැවින් ද, කරුණාවට දෞර්මනස ආසන්න බැවින් ද, මෛත්‍රිය හා මුදිතාවට සෞමනස ආසන්න බැවින් ද, එය ඖදාරික බැවින් ද, මෛත්‍රී, කරුණා, මුදිතාවන්හි ආදීනව ද, උපෙක්‍ෂාවෙහි ශාන්ත බවය, සූක්‍ෂම බවය, ප්‍රණීත බවය, විදුර කෙලෙස් ඇති බවය. විපුලඵල ඇති බවය යනාදී ආනිශංස දැක, ප්‍රකෘතියෙන් ම මැදහත් පුරුෂයෙක් වේද ඔහු කෙරෙහි උපෙක්‍ෂා කිරීම් වශයෙන් උපෙක්‍ෂාව වැඩිය යුතු ය. මේ සත්ත්ව තෙම තමා කළ කර්මයෙන් පරලොවින් ආයෙ. දැනුදු පරලොවට යෙයි. නුඹ ද නුඹ කළ කර්මයාගේ වශයෙන් ම පරලොවින් ආයෙහි ය. පරලොවට යන්නෙහි ය. ඕහට තාගේ ප්‍රයෝගයෙන් සුවයක් එළවන්නට වත් දුකක් පහ කරන්නට වත් නො පිළිවන. මෛත්‍රී කරුණාදී වශයෙන් සත්ත්වයන් කෙරෙහි මමත්ත්වය කිරීම චිත්තයාගේ ඍජුනොවූ ක්‍රියා ය. සියලු සත්ත්වයන් කෙරෙහි මැදහත් බව සියලු ආර්‍ය්‍යයන් විසින් ගන්නා ලද මාර්ගය ය. අවිරුද්ධ ප්‍රතිපත්තියෙකැයි, මෙසේ මැදහත් බවෙහි ගෞරව, බහුමාන, ආදර ඇත්තහු විසින් උපෙක්‍ෂා කොට, උපෙක්‍ෂාව ඉපද විය යුතු. මෙසේ සවිශෙෂ කොට උපෙක්‍ෂා උපදවා පිළිපදනා ඕහට ප්‍රකෘතියෙන් ම උදාසීන බැවින් ඔහු කෙරෙහි මැදහත් බව වේ. එකල්හි භාවනා බලයෙන් නීවරණයෝ විෂ්කම්භිත වෙති. කෙලෙස්හු සන්සිඳෙති. අර්පණාවට පැමිණේ. ඉක්බිති ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි පිළිවෙළින් උපෙක්‍ෂා වැඩිය යුතු. එසේ ප්‍රිය පුද්ගලය, සොණ්ඩසහායය, වෛරිය, තමාය යන සියල්ලන් කෙරෙහි මධ්‍යස්ථ වශයෙන් සීමාසම්භෙද කොට ඒ නිමිත්ත ම සේවනය කරණුයේ, වඩනුයේ, නැවත නැවත වඩනුයේ පෘථිවි කසිණයෙහි කී පරිදි චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය.

මේ උපෙක්‍ෂා ධ්‍යානය පෘථිවිකසිණාදී සෙසු කර්මස්ථානයන් වඩා උපදවාගත් තෘතිය ධ්‍යාන ඇත්තහුට නූපදී. ඒ කර්මස්ථාන භාවනාවන්හි අරමුණ සභාග නොවන බැවින් උපෙක්‍ෂා ධ්‍යානය ඒ මගින් ලබාගත නොහැකි වේ.

මෛත්‍රී ආදියෙහි තෘතීය ධ්‍යානය උපදවා ගන්නහුට ම අරමුණු සභාග බැවින් උපෙක්‍ෂා චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය.

එයින් මතුයෙහි ලැබිය යුතු අභිඥාවෝ ද, අනුසස් ද මෛත්‍රී භාවනාවට කී පරිදි දත යුතු.

**ධ්‍යාන වශයෙන්** වනාහි, අප්‍රමාණ ගොචර ඇති බැවින් හෙවත් අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොට ඇති බැවින්, එක ලක්‍ෂණ ද වූ මේ මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බ්‍රහමවිහරණයන් අතුරෙන් පළමු මෙත්තා, කරුණා, මුදිතා යන තුන්දෙන, සොමනස්ස වියොග බැවින් හෙවත් සොම්නස හා වෙන් නොවන හෙයින් චතුෂ්කනය වශයෙන් ත්‍රික ධ්‍යානිකය, පඤ්චකනය වශයෙන් චතුෂ්ක ධ්‍යානිකය. ව්‍යාපාද, විහිංසා, අරතීන්ට විරුධ වන හෙයින් මෙත් ආදියෙහි දොම්නස නූපදී. එහෙයින් මෛත්‍රී ආදී තුන්දෙන සොම්නස් හා පවති යයි කියනු ලැබේ. උපෙක්‍ෂාව වනාහි උපෙක්‍ෂා වෙදනාව ලැබිය යුතු හෙයින්, චතුෂ්ක, පඤ්චක නය වශයෙන් චතුර්ථ ධ්‍යානික හෝ පඤ්චම ධ්‍යානික හෝ වේ ම ය. සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පැවති බ්‍රහමවිහාරොපෙක්‍ෂාව, උපෙක්‍ෂා වෙදනාව හැර නො පවති.

**ශුභපරමාදි වශයෙන්** වනාහි, **මෛත්‍රී චෙතො විමුක්තිය,** හෙවත් මෛත්‍රී ධ්‍යානය **ශුභවිමොක්‍ෂය** පරම කොට ඇත්තේ ය. මෛත්‍රී විහරණය ඇති පුද්ගලයාහට සත්ත්වයන් පිළිකුල් නොවෙති. මෙසේ මෛත්‍රිය පුරුදු කරන්නාහට සවභාවයෙන් ම පිළිකුල් නොවූ නීලාදී පිරිසුදු වර්‍ණයෙහි ද සිත නිදුකින් ම වැද සිටී. එබැවින් මෛත්‍රිය සුභවිමොක්‍ෂයට උපනිශ්‍රය වේ යයි කියනු ලැබේ.

**කරුණා චෙතො විමුක්තිය** හෙවත් කරුණා ධ්‍යානය **ආකාශානඤ්චායතනය** පරම කොට ඇත්තේ ය. කරුණා විහරණය ඇති පුද්ගලයාහට සත්ත්වයන් කෙරෙහි වැටෙන

දඬුපහර ආදී ඇති රූප නිමිති කොට ඇතිවන දුක් සිහි කරණ කල්හි කරුණාව උපදින බැවින් රූපයෙහි ආදීනව ප්‍රකටවෙයි. මෙසේ දන්නා ලද රූපයෙහි ආදීනව ඇති බැවින් පඨවි කසිණ ආදියෙහි එක්තරා කිසුණක් උගුළුවා රූපයන්ගෙන් වෙන් වූ අහස අරමුණු කොට සිත් එළ- වන්නා වූ යෝගාවචරයාහට නිදුකින් ම සර්වාකාරයෙන් රූපයන්ගේ අභාවය විවරය යයි ඒ අහස්හි සිත පිනවයි. මෙසේ කරුණා තොමෝ ආකාශානඤ්චායතනයට උප- නිශ්‍රය වේ. එය හැර අන් කිසිවකට උපනිශ්‍රය නොවේ

**මුදිතා** **චෙතො විමුත්තිය** හෙවත් මුදිතා ධ්‍යානය **විඤ්ඤාණඤ්චායතනය** පරම කොට ඇත්තේ ය. මුදිතා විහරණය ඇති පුද්ගලයාහට වනාහි භොග සම්පත්ති ආදී ඒ ඒ ප්‍රමොද්‍ය කාරණයෙන් ප්‍රමුදිත වූ සත්ත්වයන්ගේ, උපන්නා වූ ප්‍රමොද්‍යය ඇති විඥනය සිහිකරණ කල්හි ආකාශ කසිණය හැර, ආකාශ නිමිත්ත ගොචර කොට ඇති ආකාශානඤ්චායතන ධ්‍යාන චිත්තයෙහි, අරූපාවචර ද්විතීය ධ්‍යානය හෙවත් විඤ්ඤාණඤ්චායතනයාගේ අධිගමය පිණිස භාවනා චිත්තය එළවන ඒ යෝගීහට නිදුකින් ම ඒ විඤ්ඤාණයෙහි සිත එළඹ සිටී. මෙසේ මුදිතාව විඤ්ඤා- ණඤ්චායතනයට උපනිශ්‍රය වේ. එයින් මතු කිසිවකට උපනිශ්‍රය නොවේ. එහෙයින් මුදිතාව විඤ්ඤාණඤ්චායතනය පරම කොට ඇත්තේ යයි වදාරණ ලදී.

**උපෙක්ඛා චෙතො විමුත්තිය** හෙවත් උපෙක්ඛා ධ්‍යානය **ආකිඤ්චඤ්ඤායතනය** පරම කොට ඇත්තේය. උපෙක්‍ෂා විහරණය ඇති පුද්ගලයාහට වනාහි සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වායි කියා හෝ දුකින් මිදෙත්වායි කියා හෝ පැමිණි සැපතින් නොපිරිහෙත්වායි කියා හෝ ආභොගයක් නැති හෙයින්, සුඛ දුක්ඛාදී පරමාර්ථග්‍රහණයට විමුඛ බැවින්, සුව දුක් ආදී නොගෙණ අවිද්‍යමාන ප්‍රඥප්ති ගැන්මෙහි දක්‍ෂ වූ සිත ඇති වේ. මෙසේ පරමාර්ථග්‍රහණයෙන් විමුඛ භාවයෙහි පුරුදු කරණ ලද සිත් ඇත්තහුට ද පරමාර්ථයෙන්

අවිද්‍යමාන ග්‍රහණයෙහි දක්‍ෂ වූ සිත් ඇත්තාහට ද, භාවනානු ක්‍රමයෙන් පැමිණෙන ලද විඤ්ඤාණඤ්චායතනය ඉක්ම ස්වභාවයෙන් අවිද්‍යමාන වූ පරමාර්‍ථ වූ විඤ්ඤාණයාගේ අභාවයෙහි චිත්තය එළවන්නහුගේ නිදුකින් ම ඒ අභාවයෙහි ආකිඤ්චඤ්ඤායතනය චිත්තය වැදගෙන සිටි යි. මෙසේ උපෙක්‍ෂාව ආකිඤ්චඤ්ඤායතනයට උපනිශ්‍රය වේ. එයින් මතු කිසිවකට උපනිශ්‍රය නොවේ. එහෙයින් උපෙක්‍ෂාව ආකිඤ්චඤ්ඤායතන පරම කොට ඇතැයි වදාරණ ලදී.

**දානාදී සියලු කල්‍යාණ ධර්‍ම පිරීම්** වශයෙන් වනාහි මේ සියලු අප්‍රමාණ ධර්‍මයෝ ම, පාරමීභාවයට පැමිණි දානාදී බුද්ධකාරක ධර්‍ම වූ සියලු අනවද්‍ය ධර්‍මයන්ගේ හෙවත් සමත්‍රිංසත් පාරමිතාවන් හා තන්නිමිත්ත වූ බුද්ධයානිකයන්ගේ පරිපූර්‍ණ භාවය සිද්ධකරවන්නාහ. සත්ත්වයන් කෙරෙහි හිතාධ්‍යාශය ඇති බැවින් ද, සත්ත්වයන්ගේ දුක් නොඉවසන හෙයින් ද, සත්ත්වයන්ගේ සම්පත්ති විශේෂයන් චිරකාලයක් පවත්නා කැමති බැවින් ද, සියලු සතුන් කෙරෙහි පක්‍ෂපාතයක් නැති බැවින් ද සමව පවත්නා සිත් ඇති මහා සත්ත්වයෝ, මෝහට දිය යුතුය, මෝහට නොදිය යුතුය යි විභාගයක් නොකොට සියලු සත්ත්වයන්ට සුඛ කාරණ වූ **දානය දෙත්**. මෙය මොහුගේ **දාන පාරමිතා** නමි. ඒ සත්ත්වයන්ගේ හිංසාව දුරුකරන්නහු **සිල් සමාදන්** වෙති. මෙය මොහුගේ **සීල පාරමිතා** නමි. සිල් පුරණු පිණිස **නෛෂ්ක්‍රම්‍යයට** හෙවත් ප්‍රව්‍රජ්‍යාවට එළඹෙත්. මෙය මොහුගේ **නෛක්ඛම්ම පාරමිතා** නමි. සත්ත්වයන්ගේ අර්‍ථ අනර්‍ථ දෙක්හි නුමුළාවීම පිණිස, නො ඇසූ තැන් අසන්නාහු, ඇසූ තැන් පිරිසුදු කරන්නාහු අහංකාර මමංකාරයන් දුරුකරන්නාහු ඥානය පිරිසුදු කෙරෙත්. මෙය මොහුගේ **ප්‍රඥා පාරමිතා** නමි. සත්ත්වයන්ට හිත සුව පිණිස නිත්‍යයෙන් ම, යම් සේ සත්ත්වයන්ට නූපන් හිත සුව උපදී ද, උපන් හිත සුව අභිවෘද්ධියට යේ ද, එසේ වීර්‍ය්‍ය කෙරෙත්. මෙය මොහුගේ **වීර්‍ය්‍ය පාරමිතා** නමි. වීරත්වයට පැමිණියාහුද, අපරාධ

කළවුන්ට නිග්‍රහයට සමත් බව ඇතත්, සත්ත්වයන්ගේ නොයෙක් අපරාධ, හිතාධ්‍යාශයෙන් ම **ක්‍ෂමා කෙරෙත්**. **ද්වේෂ ක්‍ෂමා කරණ** මේ ක්‍ෂාන්තිය මොහුගේ **ක්‍ෂාන්ති පාරමිතා** නම්. මෙ නම් දෙයක් තොපට දෙම්හ, කරම්හයි කරණ ලද ප්‍රතිඥාව විසංවාද නොකෙරෙත්. බොරු නොකියත්. මෙය මොහුගේ **සත්‍ය පාරමිතා** නම්. ඒ සියලු සත්ත්වයනට හිත සුව පිණිස සමාදන් වන ලද දානාදී ධර්මයන් කෙරෙහි නිශ්චලව පිහිටීම හෙවත් බුද්ධකාරක ධර්මයන්හි අචල සමාදානාධිෂ්ඨානය මොහුගේ **අධිෂ්ඨාන පාරමිතා** නම්. ඒ සත්ත්වයන් කෙරෙහි ප්‍රතිපක්‍ෂ විසින් අකම්පනීය වූ **මෛත්‍රියත්** පූර්වකාරීහු වෙත්. **උපෙක්ෂා**-වෙත් ප්‍රත්‍යුපකාරයක් ප්‍රාර්ථනා නො කෙරෙත්. මෙසේ **පාරමිතාවන්** පුරා **දශ බලය, චතුර්වෛශාරද්‍ය, ෂඩ් අසාධාරණ ඥානය, අෂ්ටාදශ බුද්ධධර්මය** යන ප්‍රභෙද ඇති සියලු කල්‍යාණ ධර්මයන් පුරන්නාහ.

## දස ඥාන බලය නම්

**"ඨානාඨානං විපාකංච-මග්ගං සබ්බත්‍ථ ගාමිනං**
**අනෙක ධාතුයො ලොකෙ-අධිමුත්තිඤ්ච පාණිනං**
**ජානාති ඉන්ද්‍රියානං ච-පරොපරියත්තං මුනි**
**ඣානාදි සංකිලෙසාදි-ඤාණං විජ්ජාත්තයං තථා."**

1. **ස්ථානාස්ථාන දන්නා නුවණ** හෙවත් වෙත් වෙත් ව හැකි නො හැකි දේ දන්නා නුවණ.

2. **විපාක ඥානය** හෙවත් කාලත්‍රයවර්ති කර්ම විපාක දන්නා නුවණ.

3. **සර්වත්‍රගාමිනිප්‍රතිපත්ති දන්නා නුවණ** හෙවත් මේ පිළිපැදීම අපායගාමිනිය. මේ මාර්ගය සුගතිගාමිනීය යනාදීන් දන්නා නුවණ.

4. **සත්ත්ව ගති දන්නා නුවණ.**

5. **ධාතු ඥානය** හෙවත් අනෙක ධාතු නා නා ධාතු ලොක දන්නා නුවණ.

6. **අධිමුක්ති ඥානය** හෙවත් සත්ත්වයන්ගේ නානාධි-මුක්තිකත්වාදී වශයෙන් ඇලීම් දන්නා නුවණ.

7. **ඉන්ද්‍රියපරොපරියත්ත ඥානය** හෙවත් ඉන්ද්‍රිය යන්ගේ පිළිවෙල දන්නා නුවණ.

8. **ඣානාදී සංකිලෙස ඥානය** හෙවත් කෙලශයන්ගේ ව්‍යවදාන, ව්‍යුත්ථාන හෙවත් ධ්‍යාන කෙලෙසීම් පිරිසුදුවීම් දන්නා නුවණ.

9. **පූර්වේනිවාස දන්නා නුවණ.**

10. **ආශ්‍රවක්ෂයකර ඥානය.**

## චතුර්වෛශාරද්‍ය ඥානය නම්

**වෙසාරජ්ජානි චත්තාරි-බුද්ධතො ආසවක්ඛයො**
**අන්තරායෙව නිය්‍යානෙ-යෙහි බුද්ධො විසාරදො.**

මම සම්බුද්ධයෙමි, ක්ෂීණාශ්‍රවයෙමි, මේ ධර්මය මොක්ෂයට අන්තරාය ය, මේ ධර්මය නෛර්‍යාණික යයි කී කල ඊට විරුද්ධව යමක් කියන්නට සමතෙකු නැති බව මෙනෙහි කරන කල උපදනා සොම්නස් සහගත ඥානය.

## ෂට් අසාධාරණ ඥානය නම්

1. **ඉන්ද්‍රිය පරො පරියත්ත ඥානය**
2. **ආසයානුසය ඥානය**
3. **යමකප්‍රාතිහාර්‍ය ඥානය**
4. **මහා කරුණාසමාපත්ති ඥානය**
5. **සර්වඥතා ඥානය**
6. **අනාවරණ ඥානය.**

අෂ්ටාදශ බුද්ධ ධර්මය හෙවත් බුදුරජාණන් වහන්සේට නිතර පුරුදු වූ ධර්ම දහඅට.

**තීසුඤාණ මද්ධාසු අනාගතාදිසු-තීසු මඤ්ඤාණං**
**විගතං විසුද්ධං**
**අද්ධාගානි ඡන්දස්සච දෙසනාය-සමාධි පඤ්ඤාන**
**විමුත්තිහීනං**
**මාරවා අජ්ජුත මෙව නත්ථි-වෙගායිතත්‍යවාවාවට**
**විතානාතාංච**
**නෙවත්ථි තස්සප්පච්සංචුපෙක්ඛා-තෙ හොන්ති**
**අට්ඨාරස බුද්ධ ධම්මා**

1. බුදුන්වහන්සේගේ අතීතකොටසෙහි නොපැකිලි කුළුණු නුවණ.

2. අනාගත කොටසෙහි නො පැකිලි කුළුණු නුවණ.

3. වර්තමාන කොටසෙහි නො පැකිලි කුළුණු නුවණ.

4. මේ කරුණු තුනෙන් යුත් බුදුන්වහන්සේගේ සියලු කාය කර්ම ද.

5. එසේම වූ වාක් කර්ම ද.

6. එසේම වූ මනඃ කර්ම ද, නුවණ පෙරටු කොට පැවැත්ම.

7. මේ ධර්ම සයෙන් යුත් බුදුන්වහන්සේට ධර්මය පිළිබඳ ඡන්දයාගේ හානියක් නැත්තේ ය,

8. ධර්ම දේශනාවගේ ද,

9. වීර්යයාගේ ද,

10. සමාධියගේ ද,

11. ප්‍රඥාවගේ ද,

12. විමුක්තියගේ ද,

13. මේ ධර්‍ම දෙලොසින් යුත් බුදුන්වහන්සේගේ ක්‍රීඩාභිප්‍රායෙක් නැත්තේ ය,

14. බලහත්කාරයෙන් කරන ක්‍රියාවක් නැත්තේ ය.

15. නුවණින් නුදුටු දෙයක් නැත්තේ ය,

16. ඉක්මන් ක්‍රියාවක් නැත්තේ ය,

17. නිෂ්ප්‍රයෝජන වූ සිත් පැවැත්මක් නැත්තේ ය,

18. අඥාන මැදහත් කමක් නැත්තේ ය.

මෙසේ බොහෝ අනුසස් ඇති, සියලු බුද්ධකාරක ධර්‍ම හෙවත් පාරමී ධර්‍ම පිරීමට උපනිශ්‍රය වන මේ සතර බ්‍රහ්මවිහරණයන් උත්සාහයෙන් වැඩිය යුතු.

## සතර අරූප ධ්‍යානය

අරූප ධ්‍යානසතර නම්:

1. **ආකාසානඤ්චායතන ධ්‍යානය**
2. **විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය**
3. **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය**
3. **නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය**

**ආකාසානඤ්චායතන ධ්‍යානය** වඩනු කැමැති යෝගාවචරයා විසින් චතුෂ්කනයින් රූපාවචර චතුර්‍ථ ධ්‍යානය උපදවා එම ධ්‍යානයට සමවැද, එයින් නැගී, "රූපය හේතුකොට ගෙන අනුන් පෙළනු පිණිස, මුගුරු ආදී දඬු ගැනීම, කඩු-දුනු ආදී ශස්ත්‍ර ගැන්ම, කලහය, විග්‍රහය, විවාදය යන මොහු පෙනෙන්නාහ. මේ සියල්ල සර්‍වාකාරයෙන් අරූප භවයෙහි නැතැයි හෙතෙම මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කොට දක්නා ලද ආදීනව ඇති රූපයන්ගේ ම කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, නිරුද්ධ කිරීම පිණිස පිළිපන්නේ වේ" යයි වදාළ බැවින්, ඒ දඬුගැනීම් ආදීන්ගේ ද, චක්‍ෂු, ශ්‍රොත, රෝගාදී වූ දහසක් ආබාධයන්ගේ ද වශයෙන්,

සමොකන ආදීනවයට හේතු බවට යෝග්‍ය ඖදාරික රූපයෙහි දොස් දැක, ඒ රූපයාගේ අතික්‍රමණය හෙවත් ඉක්මවීම පිණිස, පරිච්ඡින්න ආකාස කසිණය හැර පඨවි කසිණාදී නව කසිණයන් අතුරෙන් එක්තරා කසිණයක රූපාවචර චතුර්ථ ධ්‍යානය උපදවා ගත යුතු

ඒ යෝගාවචරයා විසින් චතුර්ථ ධ්‍යානයාගේ වශයෙන් ඒ ධ්‍යානයට අරමුණු වූ කරජ රූපය ඉක්මවන ලද්දේ වේ. ප්‍රථම ධ්‍යානාදීන්ට ද කරජ රූපය අරමුණු නො වතුදු ඖදාරික අඞ්ග ප්‍රහාණය වශයෙන් ශාන්ත බැවින් ද, ආනෙඤ්ජප්‍රාප්ත චතුර්ථ ධ්‍යානයෙන් ඉක්මුණේ මනාව ඉක්මෙන ලද්දේ නම් වේ. එතකුදු වුවත් කසිණ රූපය ද ඒ කරජ රූපයා හා ම සමාන හෙයින් ප්‍රතිභාග නිමිත්ත ද ඉක්මෙනු කැමති වේ.

යම් සේ සර්පයන්ට භය වන පුරුෂයෙක්, ආරණ්‍යයෙහි දී සර්පයක්හු විසින් අනුබඳනා ලද්දේ, වහා පලාගොස් ඒ පලාගිය තැන කලු පාටින් කරණ ලද පරිකර්මයෙහි රේඛා චිත්‍රයක් හෝ තල්පතක් හෝ, වැලක් හෝ රැහැනක් හෝ පැලීගිය පෘථිවියෙහි පැලුණු අතරක් හෝ දුරින්ම දැක භයවන්නේ ම වෙයි. තැතිගැන්මක් ද වෙයි. එය නොදක්නා කැමති වෙයි.

තවද, යම්සේ අනර්ථකාරී වෛරී පුද්ගලයා හා සමග එක ගම්හි වසන පුරුෂ තෙම, ඒ වෛරීහු විසින් වධය, බන්ධනය, ගෙය ගිනි තැබීම ය යනාදීන්ගේ වශයෙන් උපද්‍රව කරණ ලද්දේ, අනික් ගමක වසනු පිණිස ගොස්, ඒ ගිය ගම ද වෛරීහු හා සමානවූ රූප ශබ්දාදී පැවැත්ම ඇති පුරුෂයෙකු දැක භය වේ ද, තැතිගැන්මක් වේ ද, ඔහු නොදක්නා කැමති වේ ද, එසේම ප්‍රතිභාග නිමිත්ත ද ඉක්මවනු කැමති වෙයි.

ඒ උපමාවන්හි, ඒ පුරුෂයන් දෙදෙනාගේ, සර්පයා විසින් ද, වෛරීහු විසින් ද උපද්‍රව කරන ලද කාලය මෙන් යෝගාවචරයාගේ අරමුණු කිරීම් වශයෙන් කරජ

රූපය හා සමන්විත කාලය වශයෙන් ද, ඒ දෙදෙනාගේ වහාම පලායාම හා අන් ගමකට යාම මෙන් රූපාවචර චතුර්ථ ධ්‍යානයන්ගේ වශයෙන් කරජ රූපය ඉක්ම වන කාලය වශයෙන් ද, ඒ දෙදෙනාගේ පලාගිය තැන ද, අන් ගම ද, රේඛා චිත්‍ර තල්පත් යනාදීන් ද, වෛරීහු හා සමාන පුරුෂයා ද දැක, භය ය, තැතිගැන්ම ය, නොදක්නා කැමති බව ය යනාදීන් මෙන් යෝගාවචරයාගේ ප්‍රතිභාග කසිණ රූපය ද, එය හා සමාන බව සලකා ඒ කසිණ රූපය ඉක්මවනු කැමැති බව වශයෙන් ද දත යුතු.

ඒ යෝගී තෙම මෙසේ චතුර්ථ ධ්‍යානයට අරමුණු වූ කසිණ රූපයෙන් ද කලකිරී, එයින් පහවනු කැමති ව පස් ආකාරයෙන් පුරුදු කරණ ලද හෙවත් පඤ්චවසිතා වන්ගේ වශයෙන් පුරුදු කරණ ලද වශී භාව ඇත්තේ පුහුණු වූ රූපාවචර ධ්‍යානයෙන් නැගී මේ ධ්‍යානය ද, මා කලකිරුණු රූපයම අරමුණු කෙරේයයි කියා ද, ආසන්න වූ සොම්නස් නමැති සතුරා ඇත්තේ යයි ද, අරූප ධ්‍යානය වඩා ඖදාරික යයි ද දොස් දකී. මේ චතුර්ථධ්‍යානය අඞ්ග වශයෙන් ඖදාරික බවෙක් නැත. යම් සේ මේ රූපාවචර චතුර්ථ ධ්‍යානය උපෙක්ඛා, එකග්ගතා වශයෙන් අඞ්ග දෙකකින් යුක්ත වේ ද, අරූප ධ්‍යානයෝ සතර දෙන ද එසේ ම අඞ්ග දෙකකින් යුක්ත වෙති.

යෝගී තෙම, ඒ චතුර්ථ ධ්‍යානයෙහි දොස් දැක, එහි නිකාන්තිය දුරුකොට, ආකාසානඤ්චායතන ධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහි කොට, සක්වළ කෙළවර හෝ යම්පමණක් හෝ කැමැති වේ ද, එපමණක් කසිණය හෙවත් කසිණාලොකය පතුරුවා, එයින් පැතිරී අවකාශය "ආකාසො, ආකාසො" යි කියා හෝ "අනන්තො ආකාසො" කියා හෝ මෙනෙහි කරන්නේ, කසිණාලොකය උගුළුවයි. කසිණාලොක උගුළුවන්නේ ද පැදුරක් මෙන් නොහකුළුවයි. කබලකින් කබලෙහි ලූ කැවුමක් මෙන් නොම උදුරයි. හුදෙක් ඒ කසිණාලොකය ආවර්ජනා නො කරයි, මෙනෙහි කිරීමක් ද නොකෙරෙයි. ප්‍රත්‍යවේක්ෂා ද නොකෙරෙයි.

ආවර්ජනා නොකරන්නේ, මෙනෙහි නොකරන්නේ, ප්‍රත්‍ය-වේක්ෂා නොකරන්නේ, ඒකාන්තයෙන් ඒ කසිණාලෝකය පැතිරි ආකාශය "ආකාසො, ආකාසො" යි මෙනෙහි කරමින් කසිණා ලෝකය උගුළුවන්නේ නම් වේ. කසිණය ද උගුළුවනු ලබන්නේ හුදෙක් කසිණ රූපයාගේ අමන-සිකාරය ද "ආකාසො ආකාසො" යන මනසිකාරය ද පිණිස උගුළුවන ලද්දේ නම් වේ. කිසුණු ඉගුළු වූ අහස පමණක් පෙනේ. මෙයම කිසුණු ඉගුළුවූ අහස යයි හෝ, කිසුණු පහළ අහස යයි හෝ කිසුණු පහවූ අවකාශ යයි හෝ, මේ සියල්ල එකක් ම වේ.

හෙතෙම ඒ කසිණුග්ඝාටිමාකාස නිමිත්ත හෙවත් ඒ කිසුණු ඉගුළු වූ අහස් නිමිත්ත ම, ආකාසො ආකාසො යි නැවත නැවත ආවර්ජනා කෙරෙයි, තර්කාහත කෙරෙයි, විතර්කාහත කෙරෙයි. මෙසේ කරන්නා වූ ඔහුගේ කාමච්ඡන්දාදී නීවරණයෝ විෂ්කම්භනය වෙත්. ආකාශ නිමිත්තෙහි සිහිය මනාව පිහිටයි, උපචාර වශයෙන් සිත සමාහිත වෙයි. ඉදින් ඒ යෝගී තෙම ඒ ආකාශ නිමිත්ත ම නැවත නැවත ආසේවනය කරන්නේ වැඩීම කරන්නේ, බහුලීකෘත කරන්නේ, පඨවි කසිණාදියෙහි රූපාවචර ධ්‍යාන චිත්තය මෙන් කිසුණු ඉගුළු අහස්හි ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තය පිහිටයි. මේ ධ්‍යානයෙහි ද, පූර්වභාගයෙහි මන්ද ප්‍රාඥයාගේ වශයෙන් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ යයි කාමාවචර ජවන් සිත් සතරක් හෝ තීක්ෂ්ණ ප්‍රාඥයාගේ වශයෙන් උපචාර, අනුලෝම, ගොත්‍රභූ යයි තුනක් හෝ උපෙක්ෂා වෙදනා සම්ප්‍රයුක්තව ඉපිද පස්වනුව හෝ සිව්වනුව අරූපාවචර ධ්‍යාන චිත්තය වේ. සෙසස පඨවි කසිණයෙහි කියන ලද පරිදි දතයුතු. මෙහි විශේෂය නම්— මෙසේ අරූපාවචර සිත උපන් කල්හි ඒ යෝගී තෙම යම්සේ මුදුනෙහි පටන් වැසූ සිවිකාදී යානාමුඛය, සුළු දොරටු මුඛය, කළයෙක මුඛය යනාදීන් කෙරෙන් එක්තරා මුඛයක් නිල්රෙදි කඩෙකින් හෝ, රන්වන් කඩය, රත්කඩය, සුදුකඩය, යනාදීන් කෙරෙන් එක්තරා කඩෙකින් හෝ

බැඳ බලන පුරුෂ තෙම, වාත වේගයෙන් වත් අන් කිසිවෙකින් වත් ඒ රෙදිකඩ පහව ගිය කල අහස ම බලමින් සිටී ද, එපරිද්දෙන් ම පළමු කොට කසිණ මණ්ඩලය චතුර්ථ ධ්‍යාන චක්‍ෂුසින් බලමින් වාසය කොට ආකාශය, යන මේ පරිකර්ම මනසිකාරයෙන් ඒ නිමිත්ත වහා පහ කරණ ලද කල්හි ආකාශය බලමින් වාසය කෙරේ.

මෙසේ මේ ධ්‍යානලාභී තෙමේ **"සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා, අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති"** ති යයි වදාළ පරිදි, සියලු ආකාරයෙන් රූප සංඥා ඉක්මවීමෙන්, ප්‍රතිඝ සංඥා අස්තඞ්ගමයෙන්, නානත්ව සංඥා මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තය යයි, මෙසේ ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ යයි කියනු ලැබේ. රූපාවචර ධ්‍යාන ලැබූ පුද්ගලයාගේ ධ්‍යානයට සමවැදීමෙන් **කුසල සංඥා** වශයෙන් ද, මෙයින් සැව බඹලොව උපන්න හුගේ **විපාක සංඥා** වශයෙන් ද, රහතන්ගේ දිට්ඨධම්ම සුඛවිහරණයෙන් **ක්‍රියා සංඥා** වශයෙන් ද හැඳිනීම **රූප සඤ්ඤා** නම් වේ. ඒ ත්‍රිවිධ සංඥාවන්ම ඉක්මවූයේ රූප සංඥා මනාකොට ඉක්මවූයේ වේ. **ප්‍රතිඝ සංඥා** අස්තඞ්ගම යෙන් යයි කී තැන චක්‍ෂුරාදී ප්‍රසාද රූප හා රූපාදී පඤ්ච-ප්‍රකාර ආලම්බනයන් ගැටීමෙන් උපන් සංඥා **ප්‍රතිඝ සංඥා** නමි. එනම් **රූප සංඥාය, ශබ්ද සංඥාය, ගන්ධ සංඥාය, රස සංඥාය, ඵොට්ඨබ්බ සංඥාය** යන මේ **ප්‍රතිඝ සංඥාවෝය.** චක්‍ෂු, සොත, ඝාන, ජිව්හා, කාය යන පඤ්ච ප්‍රසාද වස්තූන් හා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්චාලම්බනයන් පිළිවෙලින් ගැටීමෙන් උපදනා පඤ්චවිධ කුසල විපාක, අකුසල විපාක චක්‍ෂුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝාණ-විඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ යන දසවැදෑරුම් විපාක චිත්තයන්ට හා ඒ හා සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට **ප්‍රතිඝ සංඥා** යයි කියනු ලැබේ. අරූපාවචර ධ්‍යානයෙහි හා එයින් උපදනා අරූපභවයෙහි ඒ ප්‍රතිඝ සංඥාවෝ

දසදෙනා නොපවති ප්‍රහාණය වෙති, අසම්භගම වෙති යි කියනු ලැබේ. රූපාවචර ධ්‍යානයෙහි ද ප්‍රතිඝ සංඥවෝ නොපවතී. එසේ නමුත් රූපාවචර ධ්‍යානය රූප විරාගය පිණිස නොවන හෙයින් ප්‍රතිඝ සංඥවන්ගේ ප්‍රහීණ බව නොකියන ලදී. අරූප ධ්‍යානය රූප විරාගය පිණිස ම පවතින හෙයින් එහිදී ප්‍රතිඝ සංඥවෝ ප්‍රහීණ වූ බව කිය යුතු. මේ අරූප ධ්‍යානයෙන් පෙර ප්‍රතිඝ සංඥවන් ප්‍රහීණ නො කළ බව දක්වීම සඳහා ප්‍රථමධ්‍යානයට සමවැදුනහුට, **ශබ්ද කණ්ටකය** යි බුදුන්වහන්සේ විසින් වදාරණ ලදී. පරතොඝොෂප්‍රත්‍යයෙන් ලැබිය යුතු සෝවාන් මාර්ගයට අනන්තර ප්‍රත්‍යය වූ, ගොත්‍රභූ ඥනයට හේතු වූ ශබ්දය, ප්‍රථම ධ්‍යානයට **කණ්ටකයෙකි** හෙවත් කන හුණු කටුවක් මෙනි. එහෙයින් බලවත් ශබ්දයාගේ ගැටීමෙන් ප්‍රථම ධ්‍යානයෙන් නැගිටීම වේ. අරූප ධ්‍යානයෙහි ප්‍රතිඝ සංඥව ප්‍රහීණ කළ හෙයින් අරූප සමාපත්තිහු **ආනෙඤ්ජාභි සංඛාරය** යයි ද, **ශාන්ත විමොක්ෂය** යි ද, කියනු ලැබේ.

**නානත්ව සංඥා** මෙනෙහි නො කිරීමෙන් යයි කී තැන්හි **නානත්ව සංඥා නම්,** ධ්‍යානයට සමනොවැදුනු පුද්ගලයාගේ **මනො ධාතු** නම් වූ පඤ්චද්වාරාවර්ජන සිතින් හෝ මනොවිඤ්ඤණධාතු නම් වූ මනොද්වාරවජ්ජන සිතින් හෝ යුක්තවූවහුගේ යම් සංඥවක්, හැඳිනීමක්, හඳුනන බවෙක් වේනම් එය වේ. එනම් සූසාළිස් සංඥවෝ යි.

| | | |
|---|---|---|
| කාමාවචර කුසල සංඥවෝ අටදෙන ය | ... | 8 |
| අකුසල සංඥවෝ දෙළොස ය | ... | 12 |
| කාමාවචර කුසල විපාක සංඥවෝ එකොළොස ය | | 11 |
| අකුසල විපාක සංඥවෝ දෙක ය | ... | 2 |
| කාමාවචර ක්‍රියා සංඥවෝ එකොළොස ය | ... | 11 |
| | | 44 |

මේ සූක්ෂ්ම සංඥාවන්ට **නානත්ව සංඥා** යයි කියනු ලැබේ. ද්විපඤ්ච විඥානයෝ ප්‍රතිඝ සංඥා වශයෙන් ගත් බැවින් මෙහිදී නො ගන්නා ලද බව දත යුතු. මේ සංඥාවෝ නානා ස්වභාව ඇති හෙයින් ද ඔවුනොවුන් හා අසදෘශ බැවින් ද **නානත්ව සංඥා** නම් වේ. ඒ නානත්ව සංඥාවන්ගේ සම්කාරයෙන් මෙනෙහි නො කිරීමෙන් ආවර්ජනා නො කිරීමෙන්, ආභෝග නො කිරීමෙන්, ප්‍රත්‍යවේක්‍ෂා නො කිරීමෙන් වාසය කෙරේ යයි කියන ලදී.

රූප සංඥා හා පටිඝ සඥා ද අරූප සමාපත්තියට සමවන් කල්හි ද අරූප භවයෙහි ද නොපවත්නාක් මෙන් අරූප පමාපත්තියට සමවැද වසන කාලයෙහි මෙකී නානත්ව සංඥාවන්ගේ මෙනෙහි කිරීමක්, ආවර්ජනා කිරීමක් නැත්තේ ම ය.

ආකාශය අනන්තය යි කී කල්හි ආකාශය නම් අජටා-කාශය හා පරිච්ඡින්නාකාශය යන ද්විප්‍රකාර වූ අවකාශයෙන් අන්‍ය වූ කසිණුගඝාටිම අවකාශය වේ. එහි ඉපදීමේ හෝ නැතිවීමේ හෝ අන්තයක් නොපැනෙන හෙයින් අනන්තය යයි කියනු ලැබේ. ස්වාභාවික දෙය පෙර නොවී හෙවත් නොපැවති උපදනා හෙයින් ද, ඉපිද නැති වන හෙයින් ද, උදයව්‍යය දෙකින් පිරිසිඳුනා ලද්දේ වේ. අවකාශය අස්වා-භාවික හෙයින් ඒ දෙකින් නො පිරිසිඳිනා ලද හෙයින් අනන්තය. කසිණා ලොකය මෙනෙහි නොකොට, එය උගුළුවා ඒ ආලෝකය පැවති ආකාශ මාත්‍රය හැර පරිච්ඡේදය නොගැනීමෙන් ද, පරිකර්ම භාවනා වශයෙන් අනන්තව ද පවත්නා හෙයින් අනන්තාකාශ නම් වේ. ඒ කසිණුගඝාටිම අවකාශයෙහි උපචාර ධ්‍යාන චිත්තය මෙනෙහි කිරීම් වශයෙන් පිහිටුවයි. අනන්ත වශයෙන් පතුරුවයි. එහෙයින් ද අනන්ත ආකාශ යයි කියන ලදී.

මෙසේ යෝගාවචර තෙම **ආකාසානඤ්චායතන ධ්‍යානය** උපදවා එයට සමවැද එයට සුදුසු ඉරියව්වෙන් වාසය කරන්නේ ය.

## 2. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය

**විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය** වඩනු කැමැති යෝගාවචර තෙම ආවජ්ජන සමාපජ්ජනාදී පස් ආකාරයෙන්, ආකාසානඤ්චායතන සමාපත්තියෙහි පුරුදු කරණ ලද වශිතා ඇති බැවින්, මේ ආකාසානඤ්චායතන සමාපත්තිය ආසන්න වූ රූපාවචර නමැති සතුරන් ඇත්තීය, විඤ්ඤාණඤ්චායතනය මෙන් ශාන්ත නොවෙති යනාදී වශයෙන් ආදීනව සලකා එහි නිකන්තිය හෙවත් කැමැත්ත අත්හැර විඤ්ඤාණඤ්චායතනය ශාන්ත වශයෙන් මෙනෙහි කොට, ඒ කිසිණු ඉගුළු අහස අරමුණු කොට පැවති ආකාසානඤ්චායතන ධ්‍යාන සිත **"අනන්තං විඤ්ඤාණං, අනන්තං විඤ්ඤාණං,"** විඤ්ඤාණය අනන්තය, විඤ්ඤාණය අනන්තය කියා හෝ **"විඤ්ඤාණං විඤ්ඤාණං,"** විඤ්ඤාණය, විඤ්ඤාණය කියා හෝ මෙනෙහි කටයුතු, නැවත නැවත ආවර්ජනා කටයුතු, ප්‍රත්‍යවෙක්ෂා කටයුතු, තක්කාහත හෙවත් තර්ක කළ යුතු, විතර්කාහත හෙවත් විතර්ක කළ යුතු. අනන්තය යි පමණක් මෙනෙහි නොකළ යුතු.

මෙසේ ප්‍රථම ආරූප්‍ය විඥාන සඞ්ඛ්‍යාත වූ විඥාන නිමිත්තෙහි භාවනා සිත නැවත නැවත පවත්නා වූ ඒ යෝගාවචරයාගේ කාමච්ඡන්දාදී නීවරණයෝ විෂ්කම්භනය වෙත්, විඥාන නිමිත්තෙහි සිහිය මනාව පිහිටයි. උපචාර වශයෙන් සිත සමාහිත වෙයි. ඉදින් හෙතෙම ඒ විඥාන නිමිත්ත නැවත නැවත ආසේවනය කරන්නේ වඩන්නේ, නැවත නැවත වඩන්නේ, පෙර කියන ලද පරිදි ආකාශයෙහි ආකාසානඤ්චායතනය මෙන් ඒ අහස ස්පර්ශ කොට ගන්නා ලද ආකාසානඤ්චායතන සිත අරමුණු කොට **විඤ්ඤානඤ්චායතන ධ්‍යාන සිත** උපදී. මේ චිත්ත වීථියෙහි මනොද්වාරාවජ්ජනයට අනතුරුව කාමාවචර උපෙක්ෂා වේදනා සම්ප්‍රයුක්ත ජවන් සිත් තුනක් හෝ සතරක් ඉපිද සතරවැනිව විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන චිත්තය

අර්පණා වශයෙන් උපදී. මෙසේ හෙයින් භාග්‍යවතුන් වහන්සේ **"සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති"** සඞ්ඛාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා අනන්ත වශයෙන් ඒ විඤ්ඤාණය අරමුණු කරමින් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ යි වදාළ සේක.

ඒ යෝගී තෙම මෙසේ ප්‍රථම අරූප ධ්‍යානයෙහි ආසන්න වූ රූප ධ්‍යාන නමැති සතුරන් ඇති බව යනාදී වශයෙන් සියලු ආදීනව දැක එහි නිකන්තිය අත්හැර ඒ ආකාසානඤ්චායතන ධ්‍යානය ද එහි අරමුණ ද අපවත් කිරීමෙන් ද, මෙනෙහි නොකිරීමෙන් ද ඉක්මවා, පෙර ඒ අනන්ත අවකාශය පැතිර පැවති ආකාසානඤ්චායතන සිත අනන්තං විඤ්ඤාණං කියා මෙනෙහි කොට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා එයට සමවැද, එයට සුදුසු ඉරියව්වෙන් වාසය කරන්නේ ය.

## 3. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය

**ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය** වඩනු කැමැති යෝගාවචරයා විසින් ආවජ්ජන සමාපජ්ජනාදී වශයෙන් පස් ආකාරයකින් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙහි පුරුදු කරණ ලද වශිතා ඇති බැවින්, මේ විඤ්ඤාණඤ්චායතනය සමීපයෙහි පවත්නා ආකාසානඤ්චායතන නම් සතුරෙක් ඇත්තේ ය, යනාදී වශයෙන් විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැක, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය මෙන් ශාන්ත නො වේ යයි ද සලකා එහි නිකන්තිය හැර ආකිඤ්චඤ්ඤායතනය ශාන්ත වශයෙන් මෙනෙහි කොට ඒ විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ ආකාසානඤ්චායතනයාගේ අභාවය, සූන්‍ය බව, අපගත වූ ආකාරය මෙනෙහි කටයුතු.

ඔහු විසින් ඒ ආකාසානඤ්චායතන විඤ්ඤාණය මෙනෙහි නොකොට **"නත්ථි නත්ථි"** – "නැත, නැතැ"යි

කියා හෝ "**සුඤ්ඤං සුඤ්ඤං** - සූන්‍යය, සූන්‍යයෙ", කියා හෝ "**විවිත්තං විවිත්තං** - විවික්තය, විවික්තය", කියා හෝ මෙනෙහි කළ යුතු. නැවත නැවත ආවර්ජනය කටයුතු, සිහිකටයුතු, ප්‍රත්‍යවේක්‍ෂා කටයුතු, තර්ක කළයුතු, විතර්ක කළ යුතු. එසේ මෙනෙහි කරන ඒ යෝගාවචරයාගේ සිතෙහි - කාමච්ඡන්දාදී නීවරණයෝ පහවෙති. එම අරමුණෙහි සිහිය මනාව පිහිටයි. උපචාර වශයෙන් සිත සමාහිත වෙයි ඉදින් හෙතෙම ඒ නිමිත්ත නැවත නැවත සේවනය කරන්නේ, වඩන්නේ, නැවත නැවත වඩන්නේ පෙර ආකාශයෙහි පහළ වූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය මෙන් ඒ ආකාසානඤ්චායතනයාගේ ශූන්‍ය භාව සඞ්ඛ්‍යාත අරමුණෙහි **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත** පිහිටන්නේ ය.

ඒ ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තයාගේ අභාවමාත්‍ර වූ ආලම්බනයෙහි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත අර්පණා වශයෙන් උපන් කල්හි ඒ යෝගාවචර තෙම, යම්සේ පුරුෂයෙක් මණ්ඩල මාලාදියෙහි යම් කිසි කටයුත්තක් සඳහා රැස්වූ භික්‍ෂු සංඝයා දැක, කිසි තැනකට ගොස්, රැස්වූ කටයුත්ත අවසන් කොට නැගීසිට භික්‍ෂූන් ගිය කල්හි අවුත් දොරකඩ සිට ඒ තැන බලන්නේ ශූන්‍යවූවාම දකු ද, ඔහට මෙතෙක් භික්‍ෂුහු කාලක්‍රියා කළහයි කියා ද, මෙතෙක් දෙන ඒ ඒ දිගට ගියහයි කියා ද, මෙනෙහි කිරීමක් නොවන්නේ ය. හුදෙක් මේ තැන ශූන්‍යය, විවික්තය යයි නැති බව ම දකී. එපරිද්දෙන් ම පළමු අහස විෂය කොට පවත්වන ලද විඤ්ඤාණය, විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන චක්‍ෂුසින් බලමින් වැස **නත්ථි නත්ථි** - නැත, නැත යනාදී පරිකර්ම වශයෙන් ඒ ආකාසානඤ්චායතන ධ්‍යානය අනතර්ධාන වූ කල ඔහුගේ අප ගම යයි කියන ලද අභාවය ම බලමින් වාසය කරන්නේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් "**සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති**".

සම්ස්කාරයෙන් ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසය කෙරේ'' යයි වදාරණ ලදී.

මෙසේ විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ ආකාසානඤ්චායතන ධ්‍යානය මෙනෙහි නො කිරීමෙන් අපවත් කොට හුදෙක් ඒ අභාවයම ''කිසිවක් නැතැයි'' මෙනෙහි කිරීමෙන් උපදවන ලද ධ්‍යානය **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය** යයි කියනු ලැබේ.

## 4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය** වඩනු කැමැති යෝගාවචර තෙම ආවජ්ජන සමාපජ්ජනාදී වූ පස් ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි වශීප්‍රාප්තව, මේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට විඤ්ඤාණඤ්චායතන නමැති ළංවූ සතුරෙක් ඇත්තේ ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මෙන් සන්සුන් බවට පැමිණියේ ද නොවෙයි, ප්‍රත්‍යයෙන් යැපිය යුතු බැවින් ද, රෝගයට මූල බැවින් ද සඤ්ඤාරොග හෙවත් සංඥාව රෝගයකට බඳුය, දුක් බැවින් හා රිදීම ඇති කරන හෙයින් **සඤ්ඤා ගණ්ඩ** හෙවත් සංඥාව පොළක් බඳුය. පීඩා උපදවන හෙයින් **සඤ්ඤාසල්ල** හෙවත් සංඥාව හුලක් බඳුය. වේදනා චෙතනාදිය ද මෙසේ ම ය. මේ සියල්ල සංඥාව (විඥානය) ඇති කල්හිම් වන්නේ ය. යම් නෙවසඤ්ඤානාසඤ්ඤාවක් වේ ද, එය ම ශාන්ත ය, ප්‍රණීත ය. මේ ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනව හා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි අනුසස් ද දැක, ආකිඤ්චඤ්ඤායතනයෙහි නිකන්තිය හෙවත් ආසාව හැර නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ශාන්ත බව මෙනෙහි කොට, ප්‍රථම ආරූප්‍ය විඥානයාගේ හෙවත් ආකාසානඤ්චායතනයාගේ අභාවය අරමුණු කොට පවත්වන ලද ඒ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියම ශාන්තය, ශාන්තය යයි නැවත නැවත මෙනෙහි කරන, ආවර්ජනා කරන, ප්‍රත්‍යවෙක්ෂා කරන, තර්ක කරන, විතර්ක කරන

ඒ යෝගාවචරයාගේ සිත්හි නීවරණයෝ පහ වෙති. සිහිය මනාව පිහිටයි. උපචාර වශයෙන් සිත සමාහිත වෙයි. හෙතෙම ඒ නිමිත්ත හෙවත් ඒ ධ්‍යාන සිත ආසේවනය කරන්නේ, නැවත නැවත වඩන්නේ අකාසානඤ්චායතනයාගේ අභාවයෙහි ආකිඤ්චඤ්ඤායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති යයි කියන ලද සතර නාමස්කන්ධයන්හි නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සිත අර්පණා වශයෙන් මනාව පිහිටන්නේ ය. එහෙයින් මේ යෝගාවචර තෙම **"සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති"** සර්වාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ඉක්මවා **නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට** පැමිණ වාසය කෙරේ යයි වදාරණ ලදී.

මෙහි ආකිඤ්චඤ්ඤායතන නම් වූ ආරම්මණයත්, ධ්‍යානයත් යන දෙකම අපවත් කිරීමෙන් හා මෙනෙහි නො කිරීමෙන් ද, ඉක්මවා, පඤ්චවොකාර භවයෙහි ද, යට තුන් අරූප භවයෙහි ද සංඥා මෙන් ඕළාරික සංඥා නැති බැවින් සංඥා නැත්තී යයි ද, සංස්කාරාවශෙෂ සූක්ෂම භාවයට පැමිණීමෙන් සූක්ෂම සංඥාව විද්‍යමාන බැවින් සංඥා නැත්තී නොවේ යයි කියා ද නෙවසඤ්ඤානාසඤ්ඤා නම් වූ ධ්‍යානයට සමවැද වාසය කරන්නේ යයි කියන ලද බව දත යුතු.

ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහි කොට සංස්කාරාවශෙෂ සමාපත්තිය වඩන ඒ පුද්ගල තෙම **නෙවසඤ්ඤානාසඤ්ඤී** නම් වෙයි. ආකිඤ්චඤ්ඤායතනය, ආරම්මණ ශාන්ත භාවයෙන් ම මෙනෙහි කරණ බවත් අඞ්ග ශාන්ත භාවයෙන් මෙනෙහි නො කරණ බවත් දත යුතු. අඞ්ග ශාන්ත භාවයෙන් මෙනෙහි කරන්නේ නම් ඒ ධ්‍යානය ආවජ්ජන සමාපජ්ජනාදී ප්‍රතිපත්තියෙන් පුරුදු කළ යුතු වේ. මෙහිදී එසේ නොව අරමුණු කිරීම් මාත්‍රයකින් මෙනෙහි කිරීම වෙයි. එය ද

ආකිඤ්චඤ්ඤායතනයට වඩා නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්තය, ප්‍රණීතය යනාදී වශයෙන් මෙනෙහි කරන්-නේය.

යම්සේ රජතෙම, මහත් රාජානුභාවයෙන් ඇතකු පිට හිඳ නුවර වීථියෙහි හැසිරෙන්නේ, ඇත්දත් වැඩ කරණ ශිල්පීන්, එක් වස්ත්‍රයක් තරකොට හැඳගෙණ, එක් වස්ත්‍රයකින් හිස වසා බැඳගෙණ, දත් සුණු ආදීන් ගැවසීගත් ශරීර ඇතිව, නොයෙක් අත් කැටයම් කරණුවන් දැක "මොහු ඉතා දක්‍ෂයෙක, මෙබඳු මෙබඳු ශිල්ප කරන්නේ" යයි ඔහුගේ දක්‍ෂ බවට සතුටු වෙයි. මම ද රාජ්‍යය හැර මෙබඳු ශිල්පියෙක් වී නම් යෙහෙකැයි නො සිතයි. එයට හේතුව රාජ්‍යශ්‍රිය මහත් අනුසස් ඇති බැවිනි. රජ තෙම මෙසේ ශිල්පියාට සතුටුව ඔහු ඉක්මවා යන්නේ ය. එපරිද්දෙන් ම යෝගාවචර තෙම ආකිඤ්-චඤ්ඤායතනය ශාන්ත වශයෙන් මෙනෙහි කොට එය ඉක්මවා, යම් සියුම් සංඥාවක් කරණ කොට ගෙන නෙවසඤ්ඤීනාසඤ්ඤී නම් වේද ඉතා සියුම් බැවින් සංස්කාර-යන්ගේ ශෙෂතා මාත්‍ර සමාපත්තිය වඩන්නේ යයි කියනු ලැබේ ද, අතිශයින් සියුම් වූ ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියට සමවැද වාසය කරන්නේ ය.

මෙසේ සංඥා ශීර්ෂයෙන් **නෙවසඤ්ඤානාසඤ්ඤා** යයි වදාළ නමුත් එපමණක් නොව වේදනාව ද ගෙන **නෙව-වේදනා නාවේදනා** යයි ද, චිත්තය ගෙන **නෙවචිත්තං නාචිත්තං** යයි ද, ස්පර්ශය ගෙන **නෙවඵස්සො නා ඵස්සො** යයි ද මේ ක්‍රමයෙන් සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් ද ගෙන ව්‍යවහාර කළ හැකි වේ.

එක්තරා සාමණේර නමක් පාත්‍රයෙහි තෙල් ගල්වා තැබුයේ ය. පසුව කැඳ වළඳන කාලය පැමිණි කල්හි තෙරුන්වහන්සේ පාත්‍රය ගෙනෙවයි කීය. හෙරණ තෙම පාත්‍රයෙහි තෙල් ඇතැයි කීය. එසේ නම් තෙල් ගුලාවෙහි වක්කරන්නෙමි කී කල්හි, වහන්ස, තෙල් නැතැයි කීය.

මේ උපමාවෙහි පාත්‍රයෙහි තෙල් ගල්වා තැබූ හෙයින් තෙල් ඇතැයි කී නමුත් ගුලාවෙහි වැක්කිරීමට තරම් තෙල් නැති හෙයින් තෙල් නැතැයි කීහ. එපරිද්දෙන් ම ඒ සංඥාව ද ඖදාරික සංඥාවගේ කෘත්‍යය කිරීමට අසමර්ථ හෙයින් නෙවසඤ්ඤා නම් වුවද, සංසකාරාවශෙෂ සූක්‍ෂම භාවයෙන් ඇති බැවින් (න - අසඤ්ඤා) නාසඤ්ඤා නම් වේ. මෙහි සංඥා කෘත්‍යය නම් අරමුණු හැඳිනීම හා විදර්ශනා- වට ද විෂයභාවයට පැමිණ නාම රූපයන්ගේ කලකිරීම නම් වූ **නිබ්බිදාඥානය** ඉපදවීමයි. මඳ උණුසුම් ඇති ජලය සුවය ගෙනදෙන්නාසේ මේ සංඥාවද, සංසකාරාවශෙෂ සූක්‍ෂම භාවයෙන් ප්‍රකටව සඤ්ජානනකෘත්‍යය කරන්නට ද අසමත් හෙයින් සෙසු යට තුන් සමාපත්තින්හි සංඥාවන් මෙන් විදර්ශනාවට විෂය භාවයට පැමිණ නිබ්බිදා ඥානය ඉපදවීමට අසමර්ථ වේ. මේ සංඥාව අතිශාන්ත අරමුණෙහි පැවති බැවින් අරමුණු හඳුනන කෘත්‍යය නො කළ හැකිවේ. අති සූක්‍ෂම අවස්ථාවට පැමිණ අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කොට ගත නොහැකි බැවින් විදර්ශනාවට අරමුණුව නිබ්බිදා ඥානය වැඩීමට ද නොහැකි වෙයි. අන්‍ය වූ කාමාවචර රූපාවචරාදී වූ චිත්ත චෛතසික සඞ්ඛ්‍යාත සෙසු සකන්ධයන්හි අනිත්‍යාදී වශයෙන් නොදත් යෝගාවචර තෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සකන්ධයන් සම්මර්ශනය කොට නිබ්බිදා ඥානයට පැමිණෙන්නට සමත් නොවේ. බුදුන් වහන්සේ හැර මහා නුවණ ඇති සැරියුත් මහ තෙරුන් වහන්සේ පවා පොහොසත් නොවේ ම ය. ප්‍රකෘති විදර්ශකයා හෙවත් විදර්ශනා වඩන පුද්ගලයා විසින් සකන්ධාදීන්ගේ පටන් විදර්ශනාභිනිවෙශය කොට ද්වාරා-- ලම්බනයන් නිසා පවත්නා ධර්මයන්ගේ වශයෙන් දොළොස් ආයතන, අටළොස් ධාතූන් විදර්ශනා කොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය අරමුණු කොට ඇති උදයව්‍යය ඥානය උපදවන්නට සමත් වේ. ඔහු "මෙසේ මේ ධර්මයන් නොතිබී උපදිති, තිබී වැනසෙති යි" මෙසේ නෙවසඤ්ඤා- නාසඤ්ඤායතන ධ්‍යාන චිත්තොත්පාදයට ඇතුළත් වූ

ස්පර්ශාදී ධර්මයන් වෙන්නොකොට එක්කොට ගෙන හෙවත් කලාප වශයෙන් සම්මර්ශනය කෙරේ. අනුපද ධර්ම විදර්ශනා වශයෙන් හෙවත් ස්පර්ශාදී ධර්මයන් විනිර්භොග කොට, වෙන් වෙන් වශයෙන් ගෙණ, අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කරන්නාහට, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය විදර්ශනා කොට නිබ්බිදා ඥානය උපදවන්නට නො හැකි වේ. මෙසේ මේ සතර වන ආරූප්‍ය ධ්‍යානය දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් විසිනුදු අනුපද වශයෙන් විදර්ශනා නොකට හැකි බවට සියුම් ව ගිය බව දත යුතු.

තවද මාර්ග - උදක උපමායෙන් ද මේ කරුණු පැහැදිලි වේ. මග යන එක් තෙර කෙනෙකුන්ගේ ඉදිරියෙන් යන්නා වූ එක් සාමණේර නමක්, ස්වල්ප වූ, වහන් තෙමෙන පමණ, මද දියත්තක් දැක, "වහන්ස, දිය ය, වහන් ගැලවුව මැනවැයි" කීය. ඉක්බිති තෙරනුවන් විසින් "ඉදින් දිය ඇත්නම් නහනකඩ ගෙණ එව, නහන්නෙමි"යි කී කල්හි, "වහන්ස, දිය නැතැ"යි කීය. එහිදී වහන් තෙමෙන පමණ දිය ඇති හෙයින් දිය ඇතැයි කීය. නහන පමණ දිය නැති හෙයින් දිය නැතැයි කීය.

තවද උපමාවෙකි. එක්තරා බමුණෙක් එක් පුරුෂයෙක් මනොඥ මැටි පාත්‍රයක් ගෙණ සිටිනු දැක "මට පාත්‍රය දෙවයි" ඉල්වීය. එය සුරා ගෙනෙන ලද පාත්‍රයක් හෙයින් එහි ඇතුළත සුරා ගෑවී ඇති බැවින් "මෙය තොපට දිය නො හැක්ක, මිහි රා ඇතැයි කීය. බමුණු තෙම "එසේ නම් මෝහට බොන්නට දෙවයි" තමා ළඟ සිටි පුරුෂයෙකු පෙන්වා කීය. හෙතෙම මිහි රා නැතැයි කීය. පාත්‍රයෙහි මිහිරා තැරවී තිබූ හෙයින් මිහිරා ඇතැයි කියාද බොන්නට පමණ නො තිබූ හෙයින් නැතැයි කියා ද කී බව සැළකිය යුතු.

මෙසේ ප්‍රකට සංඥා නැති හෙයින් **නෙවසඤ්ඤා** යයි ද, සංඥාව සංසකාරාවශෙෂ සූක්‍ෂම භාවයෙන් විද්‍යමාන හෙයින් **නාසඤ්ඤා** යයි ද කියන ලදී.

මේ අරූප සමාපත්තීහු රූපාදී අරමුණු ඉක්මවීමෙන් සතර දෙනෙක් ම වෙති. කසිණ රූප සඞ්ඛ්‍යාත ප්‍රතිභාග නිමිත්තයාගේ ඉක්මීමෙන් **ආකාසානඤ්චායතන** නම් වූ ප්‍රථම සමාපත්තිය ද, කසිණුග්ඝාටිම ආකාශයාගේ ඉක්මීමෙන් **විඤ්ඤාණඤ්චායතන** නම් වූ දෙවන අරූප සමාපත්තිය ද, ආකාශයෙහි පවත්වන ලද විඥනයාගේ ඉක්මීමෙන් **ආකිඤ්චඤ්ඤායතන** නම් වූ තුන්වන අරූප සමාපත්තිය ද, ආකාශයෙහි පවත්වන ලද විඥනයාගේ අපගමය ඉක්මීමෙන් **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** නම් වූ සතරවන අරූප සමාපත්තිය ද ලබාගත යුතු. මෙසේ අරමුණු ඉක්මීමෙන් මේ අරූපාවචර සමාපත්තීහු සතර දෙනෙක් ම වෙති යි දත යුතු. රූපාවචර සමාපත්තීන් හී මෙන් මේ අරූප සමාපත්තීන්හි අඞ්ග ඉක්මීමෙක් නැත. මේ සතර අරූප සමාපත්තීන් කෙරෙහි **උපෙක්ඛාය, චිත්තෙකග්ගතාය** යන මේ ධ්‍යානාඞ්ගයෝ දෙදෙනෙක් ම වෙත්. පශ්චිම පශ්චිම සමාපත්තීහු මනාකොට ප්‍රණීත තර වෙත්.

සිව්මහල් ප්‍රාසාදයක යට තෙලෙහි දිව්‍යමය වූ නෘත්‍යය, ගීතය, වාදිතය, සුවඳ මල්ය, භෝජනය ය, වස්ත්‍රය, සුවඳ දුම්ය, විලවුන් ය, වත්සුණුය යනාදී වශයෙන් උතුම් වූ පඤ්චකාම ගුණයෝ ඇත්තාහ. දෙවන තලයෙහි එයට වඩා උතුම් වූ පස්කම් ගුණයෝ ය. තුන්වන තෙලෙහි එයටත් වඩා උතුම් වූ පස්කම් ගුණයෝ ය, සතර වන තෙලෙහි සියල්ලනට වඩා උතුම් වූ පස්කම් ගුණයෝ ය. ඒ සතරම ප්‍රාසාදතල භාවයෙන් වෙනසක් නැත. පස්කම් ගුණයන්ගේ සමෘඩ විශේෂයෙන් වනාහි යට යට තලයට වඩා මතු මතු තලය අති ප්‍රණීත වේ. එමෙන් ම යට යට අරූප ධ්‍යානයන්ට වඩා මතු මතු අරූප ධ්‍යානයෝ ප්‍රණීත තරය. මෙය ප්‍රාසාදතල උපමාව ය.

තවද එකම ගැහැණියක් විසින් කටිනා ලද දළහු ය, සිහින්හු ය, අතිශයින් සිහින්හු ය, භාත්පසින් ම සියුම්හු ය

යන සතරාකාර වූ හූ, සතරපල්, තුන්පල්, දෙපල්, එක්පල් යයි ඒ ඒ ගණනින් වියන ලද දිගිනුත් පළලිනුත් සම වූ ප්‍රමාණ ඇති වස්ත්‍ර සතරෙක් වෙයි. ඒ ශාටිකාවෝ සතර දෙනම දිගින් පළලින් සම ප්‍රමාණ ඇති හෙයින් ප්‍රමාණ වශයෙන් වෙනසක් නැත. නමුත් සුඛ ස්පර්ශය, සිහින් බවය, මහගු බවය යන මෙයින් වනාහි පළමු පළමු ශාටිකාවන්ට වඩා පසු පසු ශාටිකාවෝ වෙසෙසින් ප්‍රණීත තර වෙත්. එපරිද්දෙන් ම මේ සතර අරූප ධ්‍යානයන්හි උපෙක්‍ෂා චිත්තෙකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙක ඇතත් භාවනා විශේෂයෙන් ඒ අඞ්ගයන්ගේ ප්‍රණීත, ප්‍රණීත තර භාවයෙන් පශ්චිම පශ්චිම සමාපත්තීහු වෙසෙසින් ප්‍රණීත තර වන්නාහ. මේ සාටිකා උපමා නමි.

තවද, අපවිත්‍ර තැනෙක එක් මණ්ඩපයක් ඇත. එක් පුරුෂයෙක් ඇවිත් ඒ අශුචිය පිළිකුල් කරන්නේ ඒ මණ්ඩපයෙහි එල්බ සිටී. පසුව අනිකෙක් අවුත් ඒ මණ්ඩපයෙහි එල්බ සිටි පුරුෂයා නිසා එල්බ සිටී. ඉක්බිති ව තුන්වන පුරුෂයෙක් අවුත්, පළමුව විත් එල්බ සිටි. දෙදෙනා දැක, "යම් මේ පුරුෂයෙක් මණ්ඩපයෙහි එල්බ සිටී ද, යමෙක් ඔහු නිසා එල්බ සිටී ද, ඔව්හු දෙදෙනම දුකසේ එල්බ සිටියාහු වෙති. මඩුව හුණු කල්හි ඔවුන්ගේ වැටීම නියම ය. එබැවින් මම පිටත සිටින්නෙමි"යි සිතා මණ්ඩපයෙහි අන් තැනෙක එල්බ සිටියේ ය. සතරවන පුරුෂයෙක් අවුත් තුන් වන පුරුෂයා නිසා එල්බ සිටියේ ය. මේ උපමායෙන් අශුචි තැන්හි මණ්ඩපය මෙන් **කසිණුග්ඝාටිමාකාශය** හෙවත් කිසුණු ඉගිළවූ අහස දත යුතු. අශුචියට පිළිකුල් කොට මඩුවෙහි එල්බ සිටි පළමු පුරුෂයා මෙන් රූප නිමිත්තෙහි පිළිකුල් කොට කිසුණු ඉගිළූ අහස අරමුණු කොට ඇති **ආකාශානඤ්චායතනය** දත යුතු. මණ්ඩපයෙහි එල්බ සිටි පුරුෂයා නිසා එල්බ සිටි දෙවන පුරුෂයා මෙන් අහස් අරමුණු කොට ඇති ආකාසානඤ්චායතනය අරමුණු කොට පැවති **විඤ්ඤානඤ්චා**

**යතනය** දත යුතු. ඒ දෙදෙනා හැර පිටත එල්බ සිටියා වූ තුන්වන පුරුෂයා මෙන් ආකාසානඤ්චායතනය අරමුණු නො කොට ඒ ආකාසානඤ්චායතනයාගේ අභාවය අරමුණු කොට ඇති **ආකිඤ්චඤ්ඤායතනය** දත යුතු. ඒ පිටත එල්බ සිටියාවූ තුන්වන පුරුෂයා නිසා එල්බ සිටි සතරවන පුරුෂයා මෙන් විඤ්ඤානයාගේ අභාව සඞ්ඛ්‍යාත වූ ආකිඤ්-චඤ්ඤායතනය අරභයා පැවැති **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** දත යුතු. මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය, අනික් අරමුණක් නැති හෙයින් ඒ ආකිඤ්චඤ්ඤායතනය ම අරමුණු කෙරෙයි. දක්නා ලද දොස් ඇති රජකු වුවද, වෙන ඇසුරු කළ යුතු මහාරජකු නැති බැවින් තමා වෘත්තිය සඳහා ඇසුරු කරන මහාජනයා මෙනි. තවද, යම්සේ දිග් හිණිමුදුනට නැංගාවූ පුරුෂ තෙම මතු පෙත්තෙහි සිටියේ යම්සේ අනිකක්හු නො ලබන හෙයින් එයම අල්ලා සිටී ද, පර්වතමුදුනට නැංගේ ඒ පර්වත මස්තකයෙහිම එල්බේ ද, එපරිද්දෙන් ම මේ සතරවන අරූපාවචර ධ්‍යානය ඒ තුන්වන අරූප ධ්‍යානය අරමුණු කොටම පවතී.

## ආහාරයෙහි ප්‍රතිකූල සංඥා භාවනාව

මේ භාවනාවෙහි ආහාරයෙහි පිළිකුල් ආකාරය හා ඉන් උපදවන උපචාර ධ්‍යානය ද අදහස් කරන ලදී.

ආහාර ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත වූ ප්‍රත්‍යය භාවයෙන් උත්පත්තියෙහි හෝ ස්ථිතියෙහි හෝ තමාගේ ඵලය ඵලවානුයි, නිපදවානුයි, පවත්වානුයි **ආහාර** නම්. මේ ආහාරයා:-

1. **කබලීකාරාහාරය**
2. **ඵස්සාහාරය**
3. **මනොසඤ්චෙතනාහාරය**
4. **විඤ්ඤාණාහාරය** යයි චතුර්විධ වේ.

මේ සිව්වැදෑරුම් ආහාරයන් අතුරෙන්;-

1. **කබලීකාරාහාරය**:- අජ්ඣ වශයෙන්-බත්ආදී ද්‍රව්‍යය කබල කොට ගිලිනා අජ්ඣයෙන් **කබලීකාරාහාර** නම්. මේ ඕජා සඞ්ඛ්‍යාත කබලීකාරාහාරය ශරීරය පවත්වයි. කර්මජාදී වශයෙන් හෙද භින්න වූ ඕජාරූපය, ප්‍රත්‍යය ලාභය ඇති කල්හි රූපකලාප සන්තති දෙකක් හෝ තුනක් ගලපමින්, ඕජාට්ඨමක රූපය උපදවමින්, රූපකායයට රැකුල් දෙයි. අධ්‍යාත්මික ධර්ම පරම්පරාවට විශේෂ උපකාර ද වෙයි. මේ කබලීකාරාහාරය රසතෘෂ්ණා මූලයෙන් සෙවීම වන හෙයින්, නොයෙක් දුක් විඳිනා බැවින් නිකන්තිය හෙවත් තෘෂ්ණාවම භය වෙයි. තෘෂ්ණා නොකොට වළඳත් හොත් දුකට හේතු නොවෙයි. මේ අර්ථය, හෙවත් **නිච්ඡන්දරාග පරිභොගය** පිණිස පුත්‍රමාංසොපමාව දක්වන ලදී. එනම් දුර්භික්ෂ කාන්තාරයෙන් එතර කරන පුරුෂයෙක් මළ පුතාගේ මාංසය තෘෂ්ණාවෙන් තොරව හුදෙක් කාන්තාරයෙන් එතර කිරීම පිණිසම අනුභව කරන්නා සේ, සසර නමැති කතරින් එතර කරනු පිණිසම අනුභව කරන කල රස තෘෂ්ණාව නොපවත්නා බව දත යුතු.

2. **ඵස්සාහාරය**:- අරමුණ වැදගන්නා හෙයින් ඵස්ස නම්. අරූප ධර්ම වූ මේ ඵස්සය, අරමුණෙහි වුසනාකාරයෙන් වැදගන්නා හෙයින් වුසන ලක්ෂණ වෙයි. වෙදනාදී වශයෙන් හෙදභින්න වූ හෙවත් සුඛ වෙදනාදීන්ට ප්‍රත්‍යය වූ ඵස්සාහාරය සුදුසු පරිදි ත්‍රිවිධ වෙදනාවන් උපදවමින් තම තමා එක්ව යෙදුනු ධර්මයන්ට හා තත් සමුට්ඨාන රූපයන්ට ද රැකුල් දෙයි. වෙදනාවට විශේෂ උපකාරද වෙයි. ස්පර්ශාහාරය අරමුණු හා එක්වීම ම භය වෙයි. සුඛ වෙදනීයාදී ස්පර්ශයට හේතුව කාය සංසර්ගාදී වශයෙන් අරමුණු හා එක්වීම ය. එයින් වෙදනාවන් ඉපදීම වෙයි. ඵස්සමූලයෙන් වන දුක්ඛය අරමුණු හා එක්වීමෙන් වන බැවින් උපගමනයම (එක්වීමම) භය වේ යයි දත යුතු.

සමඟැසු ගවදෙන සිටි සිටි තැනම පණුවන් කන්නාසේ ස්පර්ශය උපන් උපන් තන්හිම වේදනාව ද උපන්නේ වෙයි. ස්පර්ශය ඇති තන්හි වන වේදනාව දුක් වශයෙන් හුල් වශයෙන් ආදීනව දක්නාහට උපගමනය භය නොවන්නේ ය.

**3. මනෝසඤ්චේතනාහාරය:-** සිතනුයේ චේතනා නම්. මේ චේතනාව තමා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් අරමුණෙහි ගළපන්නේ ය. මනස නම් වූ සිත ඇසුරු කොට ඇති චේතනාව මනෝසඤ්චේතනා නම් වේ. පුණ්‍යාභිසංස්කාර ආදී වශයෙන් හෙද - භින්න වූ මේ චේතනාව, කාමභවාදී තුන් භවයෙහි සුදුසු පරිද්දෙන් සවිඥානක - අවිඥානක ප්‍රතිසන්ධිය එළවන හෙයින් මනෝසඤ්චේතනාහාර යයි කියනු ලැබේ. මේ මනෝ-සඤ්චේතනාහාරය, ඒ ඒ භවයෙහි විඥානය පිහිටීමෙන්, මේ හැම දුකටම පිහිටවන බව, සිඹවන බැවින් පිහිටවීමම භය යයි කියනු ලැබේ. දුර්වල මිනිසෙකුගේ අත් දෙක ගෙණ අඟුරු වලක හෙළන බල ඇති මිනිසුන් මෙන් කුසලාකුසල කර්ම ද භව නමැති අඟුරු වළෙහි හෙළන්නේ ය. **රාග, දෝෂ, මෝහ, ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෞර්මනස්ස, උපායාස** යන එකොළොස් වැදෑරුම් ගින්නෙන් සර්වාකාරයෙන් ඇවිළගත්තාක්මෙන් භවය දක්නාහට උත්පත්තිය හෙවත් භවයෙහි පිහිටවීම භයක් නො වන්නේ ය.

**4. විඤ්ඤාණාහාරය:-** යුක්ති සැළකීම් වශයෙන් විශේෂයෙන් දැනගන්නා අර්ථයෙන් විඥාන නම් වේ. මේ විඥානය ප්‍රතිසන්ධික්ෂණයෙහි සුදුසු පරිද්දෙන් නාමය ද, රූපය ද උපදවන හෙයින් විඥානාහාරය නම් වේ. අරූප තලයෙහි නාමය ද, අසංඥ තලයෙහි රූපය ද, සෙසු භවයෙහි නාම - රූපයන් ද උපදවන හෙයිනි. මේ විඥානාහාරයෙහි භවාන්තරාදීන් හා ගැළපීමම භය වෙයි. ආයුධ වලින් පහරණ ලද සොරෙකු මෙන්, මෙය දත යුතු. සොරහු බඳුය පුද්ගලයා. ආයුධය බඳුය විඥානය. ආයුධ

පහර මුල් කොට ඇති වේදනාව බඳුය විඥානමූල වේදනාව. මෙසේ ආදීනව වශයෙන් ගන්නා තැනැත්තාහට, ප්‍රති-සන්ධිය භයක් නො වන්නේ ය.

මේ සතර වැදෑරුම් ආහාරයන් අතුරෙන් **අසිත** හෙවත් වැළඳිය යුතු භෝජනය, **පීත** හෙවත් පියයුතු පානය, **ඛායිත** හෙවත් කෑයුතු කැවිලි ආදිය, **සායිත** හෙවත් ලෙවිය යුතු දිය යනාදී වශයෙන් ප්‍රභේද ඇති කබලී-කාරාහාරයම හෙවත් සවස්තුක වූ ආහාරයම මේ ආහාරයෙහි පටිකකූල සඤ්ඤාව ඉපදවීමට සුදුසු වූ කමටහනක් වන්නේ ය. ඒ ආහාරයෙහි හෙවත් ඕජා ආහාරය නොගෙණ සවස්තුක වූ ගිලිනා ආහාරයෙහි පිළිකුල් වශයෙන් ගැනීමෙන් උපන් සංඥාව **ආහාරෙපටික්කූල සඤ්ඤා** නම්.

**ආහාරයෙහි පිළිකුල් සංඥාව** වඩනු කැමති යෝගාව-චරයා විසින් මේ කමටහන ආචාර්‍යයන් ඇසුරු කොට පෙළ ධම් වශයෙන් ද, අර්ථ වශයෙන් ද මනා කොට ඉගෙණ එක පදයකුදු නොවරදවා රහසිගතව හිඳ මනා සිහිය උපදවා භෝජනාදී වශයෙන් සිව්වැදෑරුම් වූ ආහාරයෙහි පිළිකුල් බව දස ආකාරයකින් ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු. ඒ මෙසේයි:-

1. **ගමනාගමන** වශයෙන්
2. **පරියෙසණ** වශයෙන් හෙවත් ගෙයක් පාසා සෙවීම් වශයෙන්
3. **පරිභොග** වශයෙන්
4. **ආසය** වශයෙන් හෙවත් පිත්තාදීන්ට ආශ්‍රය වශයෙන්
5. **නිධාන** වශයෙන් හෙවත් තිබෙන තැන් වශයෙන්
6. **අපරිපක්ක** වශයෙන් හෙවත් නොපැසීම් වශයෙන්
7. **පරිපක්ක** වශයෙන් හෙවත් පැසීම් වශයෙන්

8. **ඵල** වශයෙන් හෙවත් ප්‍රධාන ඵල වශයෙන්

9. **නිස්සන්ද** වශයෙන් හෙවත් අප්‍රධාන ඵල වශයෙන්

10. **සම්මක්ඛන** වශයෙන් හෙවත් මැකීම් වශයෙන් ය.

**1. ගමනාගමන වශයෙන්**:- මහානුභාව ඇති බුදු-සස්නෙහි පැවිදිවූවහු විසින් මුළු රෑ බුදු බණ සජ්ඣායනා කොට හෝ මහණදම් පුරමින් හෝ සිට උදෑසන්හී ම නැගිට දුගැබ් මහ බෝමළුයෙහි වත් කොට බොන පැන් ද, පරිභොග කටයුතු පැන් ද එළවා තබා, ලැගුම්ගෙය හැම ද, සිරුරු පිළිදගුම් කොට, අසුනට නැගී විසිවරක් හෝ තිස්වරක් හෝ කමටහන මෙනෙහි කොට අස්නෙන් නැගී පාසිවුරු ගෙණ, ජන සම්බාධ රහිත වූ උපධි විවේක සුවය, සෙවණ හා ජල පහසුව ද, ශුඩ වූ සිහිල් වූ රම්‍ය වූ භූමිභාග ඇති තපෝවනයන් හැර, නිර්දෝෂ වූ ධ්‍යානරති අපෙක්‍ෂා නොකොට, අමූසොහොනට අභිමුඛ වූ සිවලක්හු මෙන්, අහර පිණිස ගමට අභිමුඛවූවහු වශයෙන් යා යුතු. මෙසේ යන්නහු විසින් ඇඳෙන් හෝ පුටුවෙන් හෝ නැගිටි තැන් සිට පාදූවිලිය ද, සුහුණු සිකනැලි මල ආදියෙන් ගැවසුණු පාපිස්න ද, ඉක්මවා යා යුතුය. ඇතැම් දවසෙක මී වසුරු වවුල් වසුරු ආදීන් දූෂිත බැවින්, ඇතුළු ගැබට වඩා වෙසෙසින් පිළිකුල් වූ ඉදිරි පෙදෙස ද දක්ක යුතු වේ. ඇතැම් දිනෙක බකමූහුණු පරෙවි ආදීන්ගේ වසුරෙන් වැකුණු හෙයින් මතුමාල් තලයට වඩා වෙසෙසින් පිළිකුල් වූ යට මාල්තලය වන්නේ ය. කිසිදිනෙක වාතයෙන් සැලෙන වියලි පත්‍ර ද, ගිලන් හෙරණුන්ගේ මූත්‍රය, මලය, කෙළය, සොටුය යනාදීන් ද, වර්ෂා කාලයෙහි දිය, මඩ, කසල ආදියෙන් ද වැඩියක් කිලිටු වූ හෙයින් යටමහල් තලයට වඩා වෙසෙසින් පිළිකුල් වූ ලැගුම් ගෙය වෙයි. එයට වඩා වෙසෙසින් පිළිකුල් වූ වෙහෙරට වදින මාර්ගය ද දක්ක යුතු වේ. මෙසේ අනුක්‍රමයෙන් වනාහි චෛත්‍යය ද, බෝධිය ද, වැඳ විතර්කමාලයෙහි සිටියහු විසින් මුතුරැසක් බඳු වූ චෛත්‍යය ද, මොනරපිල් කලඹක් මෙන් මනහර වූ

බෝධිය ද, දිව්‍ය විමාන සම්පත්තියක්සේ ශ්‍රීයාසහිත වූ සෙනසුන ද බලා, මෙබඳු වූ රම්‍ය වූ ප්‍රදේශයට පිටිපා ආහාරය නිසා යා යුතු වන්නේ යයි නික්ම යා යුතු. මෙසේ ගමට යන මගට පිළිපන්නහු විසින් කුණු කටු ඇති මග ද, ජලවේගයෙන් බිඳිනා ලද සමනො වූ මග ද, දක්ක යුතු වේ. ඉක්බිත්තෙන් වාතාතපාදී උපද්‍රව දුරු කරණ පිණිස ගඩක් වසන රෝගියක්හු මෙන් හඳනය හැඳ, වනවැසූ කඩක් බඳනක්හු මෙන් කාය බන්ධනය බැඳ, ඇටසැකිල්ලක් වසන්නක්හු මෙන් සඟල සිවුර පෙරව, බෙහෙත් කබලක් මෑතට ගන්නක්හු මෙන් පාත්‍රය එවිකායෙන් මෑතට ගෙණ, ගම් දොර සමීපයට පැමිණෙන්නහු විසින් ඇත් කුණුය, අස්කුණුය, ගෝකුණුය, මිනිස්කුණුය, බලුකුණුය යන මොහු දක්ක යුතු වෙත්. හුදෙක් දක්ක යුතුම නොවෙති. නාසය කඩා බිඳයන්නාසේ ඔවුන්ගේ දුර්ගන්ධය ද ඉවසිය යුතු වේ. ගම් දොර සමීපයෙහි එළියෙන් ඇතුළත චණ්ඩහස්ති අශ්වාදීන්ගෙන් උපද්‍රව දුරු කරණ පිණිස ගම්හි මහා මාර්ග බැලිය යුතු වෙත්. මෙසේ පාපිස්නාදී අනේක කුණපයන් කෙළවර කොට ඇති මේ පිළිකුල ආහාරය කරණකොටගෙණ මැඩිය යුතු ය. දක්ක යුතු ය. ආඝ්‍රාණය කටයුතු ද වේ. මෙසේ "පින්වත, ඔබ විසින් ඒකාන්තයෙන් ආහාරය පිළිකුලැයි" ගමන වශයෙන් පිළිකුල් බව ප්‍රත්‍යවේක්ෂා කටයුතු ය.

**2. පර්යෙෂණ වශයෙන්:-** මෙසේ ගමනෙහි පිළිකුල් බව ඉවසා ගමට පැමිණ සඟල සිවුර පොරවා කබලක් අතින් ගත් යාචකයෙකුසේ ගෙපිළිවෙලින් ග්‍රාමවීථියෙහි හැසිරිය යුතු වේ. වැසිකලෙක නම් පා තැබූ තැබූ තැන කෙණ්ඩ දක්වා ජලසහිත වූ මඩෙහි පාදයෝ එරෙන්නාහ. එසේ වූ කල්හි එක් අතෙකින් පාත්‍රය ගෙන අනික් අතින් සිවුර ඔසවා යා යුතු වේ. ග්‍රීෂ්ම කලෙක නම් පවන් වේගයෙන් නගාලූ පස්, තණ, දුහුලියෙන් ගැවසීගත් සිරුරු ඇතිව හැසිරිය යුතු වේ. ඒ ඒ ගේදොරට පැමිණ මස්ධෝනා, මාංසධෝනා, සහල්ධෝනාදිය හා කෙළ, සොටු,

බලු හූරු වසුරු ආදීන් මිශ්‍ර වූ පණුකැලන් ඇති, නිලමැස්සන් විසින් ගැවසීගත් කුණු වල සහ ගවර වළද දක්ක යුතු වන්නාහ. එකල්හි ඒ නිලමැස්සෝ නැගී සඟල සිවුර ද, පය ද, හිස ද යනාදී තන්හි වසති. ගෙයකට වැඩි කල්හි සමහර කෙනෙක් දෙති. සමහර කෙනෙක් නොදෙති. දෙන්නාහු ද සමහර කෙනෙක් ඊයේ පිසූ බත් ද, පරණව ගිය කැවුම් ද, පිළිණි වූ කොමු ආදිය ද දෙති. නොදෙන්නාහු ද, සමහර කෙනෙක් "වහන්ස, වැඩිය මැනවැයි" කියති. සමහර කෙනෙක් නොදුටුවන් මෙන් මුවෙන් නොබෙණෙති. සමහර කෙනෙක් මුහුණු ඇලකෙරෙති. සමහර කෙනෙක් "කොල මුණ්ඩකය යවයි." මේ ආදී පරුෂ වචනයෙන් බෙණෙති. මෙසේ බැගෑ පත් මිනිසෙකු මෙන් ගමෙහි පිඬු සිඟා නික්මිය යුතු. මෙසේ ගම්වැදීමෙහි පටන්ගෙන ගමින් නික්මීම දක්වා දියමඩ ආදී පිළිකුල්, අහර හේතුකොට ඉවසිය යුතු වේ. දක්ක යුතු වේ. – අහෝ – ආහාරය පිළිකුලැයි මෙසේ **පර්යේෂණ වශයෙන්** පිළිකුල් බව ප්‍රත්‍යවේක්ෂා කටයුතු.

**3. පරිභෝග වශයෙන්**:– මෙසේ සොයන ලද අහර ඇත්තහු විසින් ගමින් පිටත පහසු තැනෙක සුවසේ හිඳ, යම්තාක් ඒ අහරයෙහි අත නොතබා ද, ඒතාක් ඒ බඳුවූ ගරු කටයුතු භික්ෂුවක් හෝ ලජ්ජි මිනිසෙකු හෝ දැක ආරාධනා කිරීමට ද පිළිවන් වෙයි. මේ පාත්‍රගත වූ ආහාරයෙහි, වළඳනු කැමැතිව අත එබූ කෙණෙහි, පිඬු ගන්වයි කියන්නේ නම් මොහු මට දෙන්නේ ඉඳුල් දෙහෝයි සැකය හා ලජ්ජා කටයුතු වේ. අහරයෙහි අත තබා අණන්නාහට වනාහි ඇඟිලි පස දිගේ ඩහදිය වැහෙන්නේ වියළුණු දැඩි බත ද තෙමෙන්නේ එය මොළොක් කෙරේ. පසුව ඒ අහර අතින් ඇණූ පමණින් ම එහි සවභාවය වෙනස් වී යයි. පිඬුකොට මුඛයෙහි තිබූ කල්හි යට දත් වංගෙඩියක් මෙන් ද, උඩුදත් මොහොලක් මෙන් ද, දිව අතක් මෙන් ද කටයුතු කරන්නේ ය. මෙසේ ඒ අහර බලු බඳුනක ලූ බලුබත් පිඩක් මෙන්

මුඛයෙහි දී දත් මොහොලින් කොටා දිවින් පෙරළනු ලබන්නේ, දිව අග තිබූ පහන් කෙළින් ද, දිව මැද පටන් ගෙන බොල් කෙළින් ද, දූවටුදඬු නො පෙවෙන තැන දත්මලින් ද හණාගත් මේ අහරය සුණුවී එකෙණෙහි ම නැති වූ වර්ණ, ගන්ධ, සංස්කාර විශේෂය ඇතිවූයේ බලු බඳුනක තිබූ බලු වමනයක් මෙන් අතිශයින් පිළිකුල් බවට පැමිණේ. මෙබඳු වූ ඒ අහරය ඇසට හමු නොවන හෙයින් ගිලින්නට හැකි වේ. මෙසේ **පරිභෝග වශයෙන්** ද පිළිකුල් බව මෙනෙහි කටයුතු.

4. **ආශය වශයෙන්**:- මද පිත් ඇත්තන්ට වනාහි මෙසේ වැළඳූ ආහාරය ආමාශයටවත් කල්හි **පිතය, සෙමය, සැරවය, ලෙහෙය** යන මේ සතර ආශයෝ ම වෙති. යමෙක්හට **පිත්තාශය** අධික වේ නම් ඔහට උකු මීතෙලින් මිශ්‍රකලාක් මෙන් අතිශයින් ම පිළිකුල් වේ. යමෙක් හට **ශ්ලෙෂ්මාශය** අධිකවී නම්, ඔහට ඇත්බැබිල කොළ යුෂයෙන් මිශ්‍ර කලාක් මෙන් අතිශයින් පිළිකුල් වේ. යමෙක්හට **සැරව** හෙවත් **පුබ්බාශය** අධික වී නම් ඔහට කුණුවූ මොහොරුයෙන් මිශ්‍ර කළ දෙයක් මෙන් අතිශයින් පිළිකුල් වේ. යමෙක්හට **ලෙහෙ** හෙවත් **ලොහිතාශය** අධික වී නම් ඔහට පඬුයෙන් හැනු දියක් මෙන් අතිශයින් පිළිකුල් වේ. බුදු-පසේබුදු, සක්විතිරජුන්හට වනාහි මහා පිත් ඇති හෙයින් මේ සතර ආශයන් අතුරෙන් එක්තරා ආශයෙක් ම වෙයි. මන්දපුණ්‍යයන්ට සතර ආශයෝ ම වෙත්. එහෙත් එකක් අධික වේ. මෙසේ **ආශය වශයෙන්** පිළිකුල් බව ප්‍රත්‍යවෙක්ෂා කට යුතු.

5. **නිධාන වශයෙන්**:- මෙසේ මේ ආහාරය මේ සතර ආශයයන් අතුරෙන් එක්තරා ආශයයකින් වැකුණේ, ඇතුලු උදරයට වැද ඒ අහර රන් බඳුනෙක හෝ මාණික්‍ය රත්නාදී බඳුනෙක හෝ තැන්පත් වන්නේ නොවේ. ඉදින් ඒ ආහාරය දසහැවිරිදි වූවෙක් විසින් කනු ලැබේ නම් දස හවුරුද්දකින් සුඬ නොකළ වැසිකිළි වලක් බඳු

අවකාශයෙහි පිහිටත්තේ ය. ඉදින් විසිහවුරුද්දක්, තිස්හවුරුද්දක්, සතලිස්හවුරුද්දක්, පනස්හවුරුද්දක්, සැටහවුරුද්දක්, සැත්තෑහවුරුද්දක්, අසූහවුරුද්දක්, අනූහවුරුද්දක්, සියහවුරුද්දක් වයසැති, කෙනෙකු අනුභව කෙළේ නම්, එතෙක් එතෙක් කල් නොසේදූ වැසිකිළි වළක් බඳු වූ අවකාශයෙහි පිහිටත්තේ ය. මෙසේ පිහිටන තැන් හෙවත් **නිධාන වශයෙන්** පිළිකුල් බව මෙනෙහි කළ යුතු.

**6. අපරිපක්ක වශයෙන්:-** මෙසේ ඇතුළු උදරයට පැමිණ ආහාරය නොපැසී සිටිනතාක් කල් අතිශය අන්ධකාරයෙන් අඳුරු වූ නොයෙක් කුණප ගඳින් වාසිත වූ සුළඟින් හැසිරෙන ලද, අතිශයින් දුර්ගන්ධ වූ පිළිකුල් වූ ඒ ප්‍රදේශයෙහි යම්සේ ග්‍රීෂ්ම කාලයෙහි අකල් වැසි වස්නා කල්හි සැඬොල් ගම් දොර වූ වළෙහි පතිත වූ තෘණය, පත්‍රය, පැදුරු කඩය, සර්පකුණුය, මිනිස්කුණුය යනාදීහු හිරුරැසින් කකියන ලද්දාහු, පෙණ හා බුබුලින් ගැවසී ගත්තාහු සිටිද්ද, එපරිද්දෙන් ම, එදවස් ද, පෙරදින ද, එයට පළමු දින ද කනලද සියලු අහරම එක්ව ගෙණ, සෙම්පටලයෙන් වළඳනාලද්දේ, කයෙහි හටගත් ජඨරාග්නියෙන් තවන ලද්දේ, කැකෑරීමෙන් හටගත් පෙණ හා බුබුලෙන් ගැවසීගත්තේ, අතිශයින් පිළිකුල් බවට පැමිණ සිටින්නේ යයි මෙසේ **අපරිපක්ක** හෙවත් නොපැසුණු ආහාරය පිළිකුල් බව ප්‍රත්‍යවේක්ෂා කට යුතු.

**7. පරිපක්ක වශයෙන්:-** ඒ අහරය කායාග්නියෙන් පැසුණු කල්හි නිසිලෙස තවන ලද රන්-රිදී ආදී ධාතුන්සේ රන්-රිදී ආදී බවට නොපැමිණ, පෙණ හා බුබුලු නංවමින් ඇඹරුම් ගලෙහි ලා අඹරා ගෙන නළයෙක පුරාලූ පඬුවන් මැටි පිඩක් මෙන් මළ බවට පැමිණ පක්වාසය ද, මූත්‍රභාවයට පැමිණ මූත්‍රවස්තිය ද හෙවත් මූත්‍රාශය ද පුරත්තේය යයි මෙසේ **පැසුණු අහර වශයෙන්** පිළිකුල් බව මෙනෙහි කට යුතු.

**8. ඵල වශයෙන්:-** මෙසේ මනාව පැසෙන්නා වූ මේ අහරය, කෙස්, ලොම්, නිය, දත් ආදී වූ නොයෙක් කුණපයන් උපදවයි. මනාව නොපැසුණු අහරය දද ය, කණ්ඩු ය, කැසිලිය, කුෂ්ඨය, පාණ්ඩුය, ක්‍ෂය ය, කාශය, අතීසාරය යනාදී වූ සිය ගණන් රෝග උපදවයි. මෙසේ අහරයෙහි **ඵල වශයෙන්** පිළිකුල් බව ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු.

**9. නිස්සන්ද වශයෙන්:-** මේ අහරය වළඳනා කල්හි එක් දොරකින් ශරීරය තුළට වැද පිටතට නික්මෙන කල්හි, ඇසින් **අක්ඛිගූථ** නම් වූ කබය, කණින් **කණ්ණගූථ** නම් වූ මලය, නැහැයෙන් මූකුණු හෙවත් **සොටුය,** මුඛයෙන් **කෙළය,** සමහර කලෙක එම ද්වාරයන්ගෙන් **පිත්, සෙම්, ලෙහෙ** ආදිය ද, වර්චස් මාර්ගයෙන් **වසූරු ද,** මූත්‍ර මාර්ගයෙන් **මූත්‍ර ද,** සකල ශරීරයෙහි රෝමකූපයෙන් **ඩහදිය** දැයි නොයෙක් ප්‍රකාර වූ අශුචි බවට පමුණුවා නික්ම වති. එසේම මේ ආහාරය වළඳනා කල්හි මහත් පිරිවර ඇතිව වළඳනු ලැබේ. නිස්සන්දන සමයෙහි හෙවත් පිට කරන කල්හි මලමූත්‍ර ආදී බවට පැමිණියේ තනිවම සැඟවී නික්ම වනු ලැබේ. පෙරදවස්හි ඒ අහරය වළඳනා කල්හි සතුටු වූයේ වේ. එසේම ඔදවැඩි සිත් ඇත්තේ ද වේ. හටගත් ප්‍රීති සොම්නස් ඇත්තේ ද වේ. පසුදවස්හි එය වගුරුවන කල්හි වසන ලද නාසිකා ඇත්තේ වේ. පිළිකුල් හෙයින් හකුළුවන ලද මුහුණු ඇත්තේ වේ. ඉතා පිළිකුල් ඇත්තේ වේ. මකුනකු මෙන් සැඟවෙන සවභාවය ඇත්තේ වේ. පළමු දවස්හි ඒ අහරය, මේ කය පෝෂ්‍යය කරම්හයි ඇළුණේ, චිත්තයාගේ විපරිණාමාකාර ඡන්දරාගයෙන් රත්වූයේ, විශේෂයෙන් කැමතිවීම් සවභාව වූ අතිශය ගිජු බැවින් ඇලීමට පැමිණියේ, ගැටගැසුනාක් මෙන් ප්‍රතිබද්ධ ඇත්තේ, රසතෘෂ්ණායෙන් මුළාවට පැමිණියේ වේ ද, දෙවන දවස්හි එක් රැයක් විසීමෙන් නො ඇළුණේ, දුක්වනු ලබන්නේ, ලජ්ජාවනු ලබන්නේ, නින්දුකරන්නේ, පහකරයි. මෙසේ **නිස්සන්ද ඵල** හෙවත් අප්‍රධාන ඵල වශයෙන් අහරය පිළිකුල් බව මෙනෙහි කට යුතු.

**10. සමමක්ඛන වශයෙන්:-** වළඳන කල්හි ද මේ අහරය දතය, තොලය, දිවය, තල්ලය යන මේ තන්හි තැවරීම නිසා පිළිකුල් වෙයි. මේ දත් ආදිය සෝදන ලද්දාහු ද, එහි ගඳ දුරු කරණු පිණිස නැවත, නැවත සේදිය යුතු වෙත්. අහරය වළඳනා ලද්දේ ද, යම්සේ බත් පැසෙන කල්හි බොල්, ඇඟි, කුඩු ආදිය ඉතිරී, සැළියෙහි මුවවිට හා පියන්හි තැවරී සිටී ද, එපරිද්දෙන් ම සියලු සිරුර අනුව පවත්නා වූ කායාග්නියෙන් පෙණ නඟ නඟා පැසී ඉතිරෙන්නේ දත්හි දත්මල වශයෙන් ද, දිවය, තල්ලය යනාදී තන්හි කෙළ සෙම් ආදී වශයෙන් ද, ඇස, කණ, නාස, අධෝමාර්ගාදීන්හි ඇස් මලය, කන් මලය, සොටුය, මල මූත්‍රය යනාදීන්ගේ වශයෙන් තැවරී පවතිත්. මේ දෙරටු දිනෙන් දිනම සෝදනු ලබන්නාහුද, පිරිසුදු නොවෙති. මනහරද නොවෙති. යම් මගක් අතින් සෝදන ලද්දේ වේ ද, එම අත දියෙන් නැවත නැවත සේදිය යුතු වේ දෙතුන් විටෙක සුවඳ සුණු ආදියෙන් ද සේදිය යුතු වේ. මෙසේ ද සෝදා පිළිකුල් බව ඉවත් කිරීම දුෂ්කර වේ. මෙසේ ගැල්වීමෙන් හෙවත් **සමමක්ඛන වශයෙන්** පිළිකුල් බව මෙනෙහි කට යුතු.

මෙසේ දශආකාරයකින් අහරයෙහි පිළිකුල් බව මෙනෙහි කරන්නාහට තර්ක කරන්නාහට, චින්තා කරන්නා හට පිළිකුල් සංඥා වශයෙන් කබලීකාරාහාරය ප්‍රකට වෙයි. එහෙයින් මේ කමටහන **ආහාරෙ පටික්කූල සඤ්ඤා** නම් වේ. ඒ සංඥාව භාවනා වශයෙන් වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් ප්‍රකටව වැටහෙන කල්හි ඒ යෝගාවචරයාගේ සිත නීවරණයන්ගෙන් පහවෙති. කෙලෙස් සංසිඳේ. කබලීකාරාහාරය පිළිකුල් හෙයින් සිත අර්පණාවට නො පැමිණ උපචාර සමාධියෙන් සමාහිත වෙයි.

**අනුසස්:-** මේ ආහාරයෙහි පටික්කූල සංඥායෙන් යුක්ත වූ මහණහුගේ සිත රස තෘෂ්ණාවෙන් හැකිළෙයි, පෙරළි වැටෙයි. වළකී. ඒ යෝගී තෙම කතරින් එතර වනු කැමැත්තහු විසින් පුත්‍ර මාංශය කන්නාක් මෙන්,

පහවූ මද ඇතිවූයේ, හුදෙක් දුක්ඛයාගේ නිස්තරණය පිණිස අහර අනුභව කරන්නේ ය. ඒ යෝගීහට නිදුකින් ම කබලීකාරාහාරය පිරිසිඳ දැනීම් වශයෙන් පඤ්චකාම ගුණ විෂය රාගය පිරිසිඳ දැනීමට පැමිණේ. අපරිපක්ක ආදී පටික්කූල භාව වශයෙන් ද ඒ යෝගීහට කායගතාසති භාවනාව ද සම්පූර්ණ බවට පැමිණේ. අසුභ සංඥාවට හා අනුලෝම ප්‍රතිපදාවට ද පිළිපන්නේ වේ. මේ පිළිවෙත නිසා මෙම ජන්මයෙහි නිර්වාණාවබෝධය නො කෙළේ නම් ඒකාන්තයෙන් ම සුගතිපරායන වේ ම ය.

මේ භාවනාවට **ඒක සංඥා** යයි ද කියනු ලැබේ.

## චතුධාතු ව්‍යවස්ථාන භාවනාව

මෙහි සතර ධාතූහු නම් **පඨවි, ආපො, තෙජො, වායො** යන මහා භූතරූප හෙවත් ධාතු සතර ය. ඒ සතර ධාතූහු සවභාව **ලක්ෂණ** වශයෙන් සනිටුහන් කිරීම හෙවත් සතර මහා භූතයන්ගේ කක්ඛශාදී වූ සවකීය ලක්ෂණය සැලකීම් වශයෙන් සනිටුහන් කිරීම **චතුධාතු වවත්ථාන** නම් වේ. මේ ධාතු මනසිකාරයෙහිදී පරිකර්ම අවස්ථාවෙහි හෙවත් පූර්වභාගයෙහි මේ සතර ධාතූහු වෙන් වෙන්ව ගෙන මෙනෙහි කරන්නේ වී නමුත් අර්ථසිද්ධිය වන කල්හි නොහොත් උපචාර අවස්ථාවෙහිදී එකම ධාතුවෙක මනසිකාරය පවත්නා හෙයින් මේ කර්මස්ථානයට **ඒක වවත්ථාන** යයි ද කියනු ලැබේ **ධාතුමනසිකාරය, ධාතුකර්මස්ථානය, චතු ධාතුව්‍යවස්ථානය** යන මොහු අර්ථ වශයෙන් එකක්ම යයි දත යුතු. භාග්‍යවතුන් වහන්සේ මේ ධාතුමනසිකාරය සංක්ෂේප වශයෙන් **මහාසතිපට්ඨාන සූත්‍රයෙහි** ද විස්තර වශයෙන් **මහා හත්ථිපදෝපම, මහාරාහුලෝවාද, ධාතුවිභඞ්ග සූත්‍රයන්හි** හා අභිධර්මයෙහි **ධාතුවිභඞ්ගයෙහි** ද දේශනා කර වදාරණ ලදී මේ සතර ධාතුන් පිළිබඳ විස්තරයක් යට ධාතුකථායෙහි දක්වන ලද හෙයින් චතුධාතු ව්‍යවස්ථානයට උවමනා කරුණු පමණක් මෙහි දක්වනු ලැබේ.

තීක්‍ෂණවූ ප්‍රඥ ඇති ධාතු කර්මස්ථානය වඩන යෝගාවචරයා හට භාග්‍යවතුන් වහන්සේ මහාසතිපට්ඨාන සූත්‍ර දේශනායෙහිදී චතුධාතුව්‍යවස්ථානය මෙසේ වදාළ සේක.

**"සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහා පථෙ බිලසො පටිවිභජිත්වා නිසින්නො අස්ස, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු'ති."** මහණෙනි, යම්සේ දක්ෂවූ ගොඝාතකයෙක් හෝ ගොඝාතකයාගේ අතවැසියෙක් හෝ ගවදෙන මරා විකිණීම පිණිස සතර මංසන්ධියෙහි කොටස් කොටස් කොට බෙදා හුන්නේ වේ ද, එපරිද්දෙන් ම මහණෙනි, මහණ තෙම සිටිසේ සිටියාවූ ද, පිහිටිසේ පිහිටියාවූ ද මේ කය ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂා කෙරේ. මේ කයෙහි **පඨවිධාතු** ඇත, **ආපො ධාතු** ඇත, **තෙජො ධාතු** ඇත, **වායො ධාතු** ඇත කියායි. දක්ෂවූ ගොඝාතකයාට හෝ ඔහුගේ බත්වැටුපිත් ජීවත් වන අතවැස්සාට හෝ ආහාරාදිය දී ගවදෙන පෝෂණය කරන කල්හි ද, මරණ තැනට ගෙන යන කල්හි ද, එහි ගෙන ගොස් බැඳ තබන කල්හි ද, ගවදෙන මරණ කල්හි ද, මැරූ ගවදෙන බලන කල්හි ද, ගවදෙන කපා කොටස් කොටස් කොට නො බෙදූ කල්හි ද ගවදෙන යන සංඥව අතුරුදහන් නොවේ. යම්සේ ගවදෙන කපා කොටස් කොට බෙදා හුන්නහුට වනාහි ගවදෙන යන සංඥව අතුරුදහන්වී මාංස යන සංඥව පවති. ගවදෙන විකුණම් කියා හෝ මොහු ගවදෙන ගෙන යන්නේ යයි කියා හෝ අදහසක් පහළ නොවේ. මම මස් විකුණම්, මොහු මස් ගෙන යන්නේ යයි කියාම ඔහුට අදහස්වේ.

එපරිද්දෙන් ම මේ භික්‍ෂුහටද, පූර්වයෙහි, බාල පෘථග්ජන කාලයෙහි, ගිහිව සිට පැවිදිවූවහුට සත්ත්වයා ය, පුද්ගලයා ය, පුරුෂයා ය යන සංඥව දුරු නොවන්නේ ය. යම් තාක් කල් සිටි පරිද්දෙන් සිටියාවූ ද, පිහිටි පරිද්දෙන් පිහිටියාවූ ද

මේ කය ඝන විනිර්භොගය කොට හෙවත් රූප සන්තති සමූහ කෘත්‍යය ඝනයන්ගේ වෙන් කිරීම කොට ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂා නො කෙරේ ද ඒතාක්කල් සත්ත්ව සංඥව දුරු නොවේ. යම් කලෙක්හි වනාහි ධතු වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ නම් සත්ත්වයෙක, පුද්ගලයෙක, පුරුෂයෙක යන සංඥව දුරු වන්නේ ය.

**මහාහත්ථිපදොපම සූත්‍රයෙහි** වනාහි මෙසේ වදරන ලදී.

**අධ්‍යාත්මික පඨවි ධාතුව** නම් යමක් තමා සතන්හි වූයේ ද, තමා නිසාවූයේ ද, දැඩි ද, පුරුෂ ද, මම ය මාගේ යයි ගන්නා ලද්දේ ද එනම් **කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හෘදයමාංස, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, බඩවැල, අතුණුබහන, නො පැසුණු අහර, පැසුණු අහර** හිස්මොල ආදී ශරීරයට අයත්වූ ද, යම් ඒ අන්‍යවූ තමා අයත්වූ, කර්කශවූ, රළුවූ, කර්කශ බවට පත්වූ, කර්කශ සවභාවය ඇති අධ්‍යාත්මික පඨවි ධාතුවක් වේද එය වේ.

**අධ්‍යාත්මික ආපො ධාතුව** නම් යමක් තමා සතන්හි වූයේ ද, තමා නිසා වූයේ ද, ආබන්‍ධන සවභාවයක් වේ ද, ආබන්‍ධන සවභාවයට ගියේ වේ ද, ආලිඞ්ගන වශයෙන් සෙනහ නම් වේ ද, ආලිඞ්ගන බවට ගියේ වේ ද, අවිනිබෙභාග රූපයාගේ බන්‍ධන බවක් වේ ද අධ්‍යාත්මික ශරීරයට අයත් වූවා ද, **පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදිය ය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සඳමිදුලුය, මූත්‍රය** යන ප්‍රභෙද ගත වූ ආබන්‍ධන සවභාවයක් වේ ද, යම් ඒ අන්‍ය වූ, අධ්‍යාත්මික වූ, තමා අයත් වූ ආබන්‍ධන සවභාවය ඇති තෙත් ගතිය ඇති, තෙත් ගතියට ගියාවූ යමක් වේ ද, එය වේ.

**අධ්‍යාත්මික තෙජො ධාතුව** නම්:- යමක් තමා සතන්හි වූයේ ද, තමා නිසා වූයේ ද, තිුණු වූයේ ද,

තියුණු බවට ගියේ වේ ද, උණුසුම් වූයේද, උණුසුම් බවට ගියේ වේ ද, දැඩි උණුසුම් බවක් වේ ද, දැඩි උණුසුම් බවට ගියේ වේ ද, අධ්‍යාත්මික වූ ශරීරයට අයත් වූ යම් තෙජෝ ධාතුවෙක් වේ ද, කිපීම් හේතුවෙන් මේ රූපකාය වැඩියක් තැවේ ද, ජ්වර ආදියෙන් හටගත් දැඩි තැවුල් ඇත්තේ වේ ද, යම් සන්තාපන තේජසක් වේ ද, යම් තෙජෝ ධාතුවක් කිපීමෙන් මේ රූපකාය පැරණි වේ ද, දිරීමට යේ ද, චක්ෂුරාදී ඉන්ද්‍රිය යන්ගේ අපරිපූර්ණ භාවයට හෙවත් විකල බවට යේද, බෙලහීන බවට ද, ඇඟ රැලි වැටීම්, කෙස් ලොම් පැසීම් ආදී භාවයට ද පැමිණේ ද, යම් දිරවන තේජසක් වේ ද යම් තෙජෝ ධාතුවක් කිපීමෙන් මේ රූපකාය වැඩියක් දැවේද, කිපියාවූ තෙජෝ ධාතුවක් විසින් මේ රූපකාය වැඩියක් දවනු ලැබේ ද, ඒ දැවෙන්නාවූ හෝ දවනු ලබන්නාවූ පුද්ගල තෙමේත් දැවෙමි, දැවෙමි, දනු ලබමි, දනු ලබමියි හඬමින් හෝ වැලපෙමින් සිය වරක් හුණු කොට දියෙහි බහා උපුටාගත් ඝෘතයක්, ජලය මෙන් අත්‍යන්ත ශීතලවූ රත්සඳුනක් යනාදී වූ ආලෙපන ද්‍රව්‍යයක්, තල්වැට පවනක් පතාද, යම් දවන තේජසක් වේ ද යම් තෙජෝ ධාතුවක් හේතු කොට අනුභව කළාවූ බත් ආදී අහර හෝ පානය කළාවූ අඹපැණි ආදීවූ අහර හෝ කන ලද්දාවූ කැවුම් ආදී අහර හෝ ඉදුනු අඹ, මීපැණි, උක්පැණි ආදී රස බලන හෙවත් ආස්වාදිත අහර හෝ මනාව පැසීම් බවට පැමිණේ ද, **රස, ශ්‍රොණිත, මෙදස්, මාංස, ස්නායු, අස්ථි, අස්ථිමිඤ්ජාදී** වශයෙන් සප්ත ධාතු භාවයෙන් වෙන්වීමට හේතු වේ ද **යම් අහර පැසවන තේජසක්** වේ ද එය වේ.

**අධ්‍යාත්මික වායො ධාතුව** නම්:- යමක් තමා සතන්හි වූයේ ද, තමා නිසා වූයේ ද, වේගවත් ගති භාවයට නොහොත් වියලෙන, සැලෙන බවට පැමිණියේ වේ ද, අවිනිර්භොග රූපයාගේ තද බවට පත් වූ අධ්‍යාත්මික රූපය පිළිබඳ කර්මයෙන් හටගත් වායො ධාතුව එනම් වමන, ඉක්කා ආදියගේ පැවැත්ම කරන්නාවූ උඩට නැංගාවූ

**උද්ධඞ්ගම වාතයෝ** ය, මලමූත්‍රාදීන් පහ කරන්නා වූ යට බලා බස්නාවූ **අධොංගම වාතයෝ** ය, අන්ත්‍රපටල-යන්ගේ මැද පෙදෙස ඇසුරු කළ **කොට්ඨාසය වාතය** ය, නහරවැල් අනුසාරයෙන් මුළු සිරුරෙහි කුඩු මහත් අවයවයන්හි පැතිර පවත්නාවූ, වක්කිරීම්, දික්කිරීම් ආදිය උපදවන්නාවූ **අඞ්ගමඞ්ගානුසාරි වාතයෝ** ය, සඬින්ගේ සටනයන් කතුරකින් කපන්නවුන් මෙන් පැවති **සත්ථක වාතයෝ** ය, කර කැත්තෙන් පලන්නාක් මෙන් ළය පලන්නාවූ **ඛුරක වාතයෝ** ය, හදයමාංසය ම උපුටන්නාවූ **උප්පලක වාතයෝ** ය, ඇතුළට වදන නාසා වාතය නම් වූ **අස්සාස වාතයෝ** ය, පිටට නික්මෙන නාසා වාත නම් වූ **පස්සාස වාතයෝ** ය යන මේ වාතයෝ ද, මෙසේ, අන්‍යවූ, අධ්‍යාත්මිකවූ, වායු ස්වභාවයට ගියාවූ, අධ්‍යාත්මික රූපය පිළිබඳ කර්මයෙන් හටගත් වායුවෙක් වේ ද එය වේ.

**රාහුලෝවාද සූත්‍රයෙහි** ද මෙසේ ම වදාරා තිබේ.

මෙසේ විසි ආකාරයෙකින් පඨවි ධාතුය, දොළොස් ආකාරයෙකින් ආපොධාතුය, සතර ආකාරයෙකින් තෙජො ධාතුය, සය ආකාරයෙකින් වායො ධාතුය යි දෙසාළිස් ආකාරයෙකින් සතර ධාතුහු විස්තර කරණ ලද්දාහු වෙති.

මේ භාවනාවෙහිදී, තියුණු නුවණ ඇත්තාහට වනාහි, කෙශයෝ පඨවි ධාතුය, ලොමයෝ පඨවි ධාතුය යනාදී වශයෙන් දෙසාළිස් ආකාරයෙන් විස්තර කිරීමේදී ධාතු පරිග්‍රහය ප්‍රපඤ්චව හෙවත් ප්‍රමාදව වැටහෙයි. යම් හෙයකින් හෙතෙම මේ කොටස්හි යම් සතබ්ධ හෙවත් තද ලක්ෂණයක් වේද එය පඨවි ධාතුය, මහා භූත රූපයන් විසිර යා නොදී බැඳ තබන හෙවත් ආබන්ධන ලක්ෂණය ආපො ධාතුය, ඒ ධාතුන්ගේ පැසවන ලක්ෂණය හෙවත් පරිපාචක ලක්ෂණය තෙජො ධාතුය, ඔවුන්ගේ පිරෙන ලක්ෂණය හෙවත් විත්ථම්භන ලක්ෂණය වායො ධාතුය යනාදී වශයෙන් මෙනෙහි කරන්නේ නම් කමටහන මනාව පහළ වෙයි. මන්ද ප්‍රාඥ හෙවත් මද නුවණ ඇති

පුද්ගල තෙම මෙසේ මෙනෙහි කරන්නේ නම් කමටහන එළඹ නොසිට මුවහ කරන හෙයින් අඳුරු වෙයි. ඕහට වනාහි පෙර කීසේ කෙශයෝ පඨවි ධාතුය, ලොමයෝ පඨවි ධාතුය යනාදී ක්‍රමයෙන් විස්තර වශයෙන් මෙනෙහි කරන්නේ නම් කමටහන ප්‍රකටව පහළ වෙයි.

එ හෙයින් මේ කමටහන වඩනු කැමති තියුණු නුවණ ඇති යෝගාවචර තෙමේ පූර්වකෘත්‍යය වශයෙන් සිල් පිරිසුදු කොට ගෙන විවේකීව සුදුසු සෙනසුනකට ගොස් සිත කර්මස්ථානයට යොමු කොට මේ තමාගේ රූපකය අරමුණු කොට, මේ කයෙහි යම් දෘඪ බවෙක් හෝ රළු බවෙක් හෝ ඇද්ද එය **පඨවි ධාතුය.** යම් ආබන්ධන බවෙක් හෙවත් ධාතුන් බැඳ තබන බවෙක් හෝ ද්‍රව බවෙක් හෝ වේද එය **ආපො ධාතුය.** යම් පැසවන බවෙක් හෝ උණුසුම් බවෙක් හෝ වේද, එය **තෙජො ධාතුය.** යම් සෙලවෙන ආකාරයෙක් හෝ පිපෙන ආකාරයෙක් වේද එය **වායො ධාතුය** යනාදී වශයෙන් සංක්ෂෙපයෙන් සතර ධාතූන් ලක්ෂණ රසාදී වශයෙන් නිස්සත්ව නිර්ජීව වශයෙන් මෙනෙහි කටයුතු. මෙසේ හෙතෙම ලක්ෂණාදීන් සමග ධාතූන් සිය දහස් වරක් නොහොත් බොහෝ කලක් නැවත නැවත ආවර්ජනා කටයුතු, මෙනෙහි කටයුතු, තර්ක කටයුතු, විතර්ක කටයුතු, මෙසේ මෙනෙහි කරන්නාවූ ඕහට ලක්ෂණාදීන් අතුරෙන් යමෙක් මනාව ප්‍රකටව වැටහේ ද, එය ම ගෙන, ඉතිරිය හැර, ඒ හා සමග "පඨවි ධාතු, ආපො ධාතු" යනාදී වශයෙන් මෙනෙහි කටයුතු. මෙසේ මෙනෙහි කරන්නහු විසින් **අනුපුබ්බ, නාතිසීඝ්‍ර, නාතිසනික, වික්ඛෙප පටිබාහන, පණ්ණත්ති සමතික්කමන, අනුපට්ඨාන මුඤ්චන** යනාදී වශයෙන් පෙර කියන ලද පරිච්ඡෙදන් දශ ආකාරයෙන් මනසකාර කෞශල්‍යය සැපයිය යුතු. මෙසේ මනසකාරය පවත්වන්නහුට යම් කලෙක ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ලැබ, සමථ බව ඇති කල්හි අශ්‍රද්ධාදීන් දුරුවීමෙන් විතර්කාදී ධ්‍යානාඞ්ගයෝ ප්‍රකටව පහළ වෙති.

නිවරණයෝ ද ඒ හා පැවති පාප ධර්මයන් හා සමග විෂ්කම්භනය වෙති. මෙපමණකින් මොහු විසින් ධාතූන්ගේ ලක්‍ෂණ අරමුණු කොට උපචාර ධ්‍යානයට පැමිණියේ වේ. අර්පණාවට නො පැමිණේ.

තවද, මේ සතර මහා භූතයන්ගේ සත්ත්ව ශූන්‍යය බව දක්වනු පිණිස ධම්මසේනාපති සැරියුත් මහතෙරුන් විසින්, "විළුම් ආදිවූ පිළිවෙළින් මතු මතුයෙහි සිටි තුන්සියයකට අධික වූ ඇටද නිසා, එම ඇටසැකිල්ල බැඳ සිටි නවසියයක් නහර ද නිසා, එම ඇටසැකිල්ල පිරිවරා සිටි නවසියයක් මාංස පෙසී ද නිසා, මැසි පියාපතක් පමණ බොල ඇති සිවියෙන් වසන ලද සියල් සිරුරු වසා සිටි ඝන සමද නිසා, මොහු විසින් ආකාශය පිරිවරණ ලද්දේ රූපයයි සඞ්ඛ්‍යාවටයේ. නොහොත්, යම්සේ භිත්තිපාදදී වශයෙන් සිටවන ලද කණුද, ඒ කණු වැළඳ සිටි වැල් ද, එහි ලෙප කළ මැටි ද, මතුයෙහි සෙවූ තෘණ ද යන මෙ කණු ආදීන් ඇතුළතිනිදු පිටතිනුදු පිරිවරා සිටි ආකාශය අගාර යයි සඞ්ඛ්‍යාවට යේ ද, ගෘහය යන ප්‍රඥප්තිය ලැබේ ද, එ පරිද්දෙන් ම යට කියන ලද ඇට ආදීන් ඇතුළෙනුදු පිටතිනුදු පිරිවරා සිටි අහස එම ඇට ආදීන් නිසා රූප යයි සඞ්ඛ්‍යාවට යෙයි, ශරීරය යන ව්‍යවහාරය ලැබේ. යම් සේ කණු ආදීන් නිසා ගෘහ සඞ්ඛ්‍යාවට ගිය අගාරය, ක්‍ෂත්‍රිය ගෘහය, බ්‍රාහමණ ගෘහය යයි කියනු ලැබේ ද, එ පරිද්දෙන් ම මේ සිරුරුද ක්‍ෂත්‍රිය ශරීරය, බ්‍රාහමණ ශරීරය යයි ව්‍යවහාර කරණු ලැබෙයි. මෙහි කිසි ජීවයෙක් හෝ සත්ත්වයෙක් හෝ නැතැ" යි වදාරන ලදි. මෙසේ ඇට, නහර, මස්, සම් යන සතර කොටසුත් කෙරෙන් ඒ ඒ කොටසුන්ගේ විවරයෙන් පවත්නා වූ, නුවණ නමැති අතින් වෙන් වෙන් කොට ඇටය, නහරය, මස්ය, සම්ය යයි සතර පරිද්දෙකින් බෙදන ලද මේ කොටසුත් කෙරෙහි යම් තද බවෙක් රළු බවෙක් වේ ද, මෙය පඨවි ධාතුය යනාදී වශයෙන් පෙර කියන ලද ක්‍රමයෙන් ම ධාතූන් පරිග්‍රහ කොට නැවත

නැවත පඨවි ධාතු, ආපො ධාතු යනාදී වශයෙන් ධාතු මාත්‍ර වශයෙන්, නිස්සත්ව, නිර්ජීව වශයෙන් ආවර්ජනා කටයුතු, මෙනෙහි කටයුතු, ප්‍රත්‍යවෙක්ෂා කටයුතු. එසේ භාවනා කරන්නාහට නොබෝ කලෙකින් ධාතූන්ගේ වශයෙන් ප්‍රභෙද ගත ඥානයෙන් පරිග්‍රහ කරන කල්හි ස්වභාව ධම්මාරම්මණ වශයෙන් සිත අර්පණාවට නො පැමිණි උපචාර මාත්‍ර වූ සමාධිය උපදී. මෙය සංක්ෂෙප වශයෙන් දක්වන ලද චතුධාතු ව්‍යවස්ථානයෙහි භාවනා ක්‍රමය යි.

**විස්තර වශයෙන්** වනාහි:- මේ කමටහන වඩනු කැමැති නුවණ ඇති යෝගාවචර තෙම, ආචාර්‍ය්‍යයන් සමීපයෙහි දෙසාළිස් ආකාරවූ මේ කමටහන විස්තර වශයෙන්, ධාතු වශයෙන් ඉගෙණ යට කියන ලද පරිදි සුදුසු සෙනසුනෙක වසන්නේ, සියළු පූර්ව කෘත්‍යයන් පුරා රහසිගත ව සිහිය එළවා සතර ආකාරයකින්, එනම්:-

1. **සසම්භාර සංක්ෂෙප වශයෙන් ද**
2. **සසම්භාර විභත්ති වශයෙන් ද**
3. **සලක්ඛණ සංක්ෂෙප වශයෙන් ද**
4. **සලක්ඛණ විභත්ති වශයෙන් ද** කමටහන වැඩිය යුතු.

මෙහි දෙසාළිස් ආකාරයෙකැයි කියන ලද්දේ වස්තු වශයෙන් ධාතූන් සැළකීම සඳහාය.

**1. සසම්භාර සංක්ෂෙප වශයෙන්**:- පඨවි ආදීන් කරණ කොටගෙණ බුද්ධිය හෙවත් දැනීම හා ව්‍යවහාර කිරීම කරණු ලබන හෙයින් පඨවි ආදීහු සසම්භාර නම් වෙත්. කෙසාදී විසි කොටසුන් කෙරෙහි වනාහි පඨවිය යන බුද්ධිය ද, ව්‍යවහාරය ද යන දෙදෙන සම්බද්ධ බව නිසා පවත්නා බැවින් කෙසාදීන් කෙරෙන් පෘථිවි සම්භාර නම් වේ ප්‍රකටවූ ඒ සම්භාර ඇති බැවින් කෙසාදීහු සසම්භාර නම් වෙති. ආපො, තෙජෝ, වායො යන

කොටස්හි ද මෙම ක්‍රමය වේ. සසම්භාරයන්ගේ සංක්ෂේපය **සසම්භාර සංක්ෂේප** නමි. මෙසේ සංක්ෂේප වශයෙන් කෙසාදී විසිකොටස්හි ද පිත්තාදී දොළොස් කොටස්හි ද, සන්තාපනාග්නි ආදී සතර කොටස්හි ද, උද්ධඞ්ගමවාතාදී සය කොටස්හි ද පිළිවෙළින් පෘථිවි ධාතු ආදී සතර ධාතූන් පරිග්‍රහ කොට ව්‍යවස්ථා කිරීම සසම්භාර සංක්ෂේප වශයෙන් භාවනා කිරීම නම් වේ. මෙසේ සතර මහා භූතයන් ව්‍යවස්ථානය කරන්නාවූ ඒ යෝගාවචරයාහට සතර ධාතූහු ප්‍රකටව වැටහෙත්. එය නැවත නැවත ආවර්ජනා කරණ කල්හි මෙනෙහි කරණ කල්හි මෙකී ක්‍රමයෙන් උපචාර ධ්‍යානය උපදී.

**1. සසම්භාර විභත්ති වශයෙන්**:- එසේ භාවනා කොට කමටහන සිඩ නොවේ නම් ඔහු විසින් සසම්භාර විභත්ති වශයෙන් කමටහන වැඩිය යුතු. ඒ යෝගාවචරයා විසින් කායගතාසති කර්මස්ථාන භාවනායෙහි කී පරිදි සත් පරිද්දෙකින් උද්ග්‍රහ කෞශල්‍යය ද, දස පරිද්දෙකින් මනසකාර කෞශල්‍යය ද සැපයිය යුතු. පළමු කොට ධාතු මනසිකාර වශයෙන් පරිගෘහිතවූ කෙසාදි දෙතිස් කොටස්හි ඒ සියල්ල නො පිරිහෙළා තචපඤ්චකාදීන්ගේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් වචසින් කරණ සජ්ඣායනාදිය කොට එහි කියන ලද සියළුම විධි සම්පූර්ණ කළ යුතු. ඒ කායගතාසති භාවනායෙහි වර්ණ, සණ්ඨාන, දිසා, ඕකාශ, පරිච්ඡේද වශයෙන් කෙසාදීන් මෙනෙහි කොට ද, පිළිකුල් බව වශයෙන් සිත පිහිටුවා ගත යුතු එ හෙයින් වර්ණාදී වශයෙන් පස් පස් පරිද්දෙන් කෙස් ආදීන් මෙනෙහි කොට කෙසාදී විසිකොටස් පඨවි ධාතුය, පිත්තාදී කොටස් දොළොස ආපො ධාතුය යනාදී වශයෙන් ධාතු විස්තරයෙහි දක්වන ලද පරිදි කෙසාදී-යෙහි මනසකාරය පවත්වා යම් තෙජො ධාතුවකින් තැවේ ද, මුහුකුරුවන කෘත්‍යය ඇත්තේ ද ඒ තෙජො ධාතු යයි තෙජො කොටස්හි ද මනසිකාරය පැවැත් විය යුතු. අනතුරුව උද්ධඞ්ගමා වාතාදී වශයෙන් වායො

කොටස්හි ද මනසකාරය පැවැත් විය යුතු. මෙසේ භාවනා කරන යෝගාවචරයාහට ධාතු වශයෙන් කමටහන ප්‍රකට වන්නේ ය. ඒ ධාතූන් ම නැවත නැවත ආවර්ජනා කරණ කල්හි යට කියන ලද ආකාරයෙන් උපචාර සමාධිය උපදී.

**3. සලක්ඛණ සංක්‍ෂෙප වශයෙන්:-** යමෙක්හට මෙසේ භාවනා කොට කමටහන සමෘඬ නොවූයේ නම්, ඔහු විසින් සලක්ඛණ සංක්‍ෂෙප වශයෙන් භාවනාව වැඩිය යුතු. පළමු කොට ඔහු විසින් කෙසාදී විසි කොටස්හි ඝත්‍ථබ්ධ ලක්‍ෂණය හෙවත් තද ගතිය පඨවි ධාතුය යි වෙන් කොට ව්‍යවස්ථා කටයුතු. එසේ ම එහි ආබන්‍ධන ලක්‍ෂණය හෙවත් බැඳෙන ගතිය ආපො ධාතුය, පරිපාචන ලක්‍ෂණය හෙවත් පැසවන ගතිය තෙජෝ ධාතුය විත්‍ථම්භන ලක්‍ෂණය හෙවත් පිපෙන ගතිය වායො ධාතුය යි වෙන් වෙන් කොට ව්‍යවස්ථා කටයුතු.

එසේම පිත්තාදි දොළොස් කොටසෙහි ආබන්‍ධන ලක්‍ෂණය හෙවත් බැඳෙන ගතිය ආපො ධාතුය, පාරිපාචන ලක්‍ෂණය හෙවත් පැසවන ගතිය තෙජෝ ධාතුය, විත්‍ථම්භන ලක්‍ෂණය හෙවත් පිපෙන ගතිය වායො ධාතුය ඝත්‍ථබ්ධ ලක්‍ෂණය හෙවත් තද ගතිය පඨවි ධාතුය යනාදී වශයෙන් වෙන් වෙන් කොට ව්‍යවස්ථා කළ යුතු.

එසේම සන්තාපනාදී සතර කොටසෙහි පරිපාචන ලක්‍ෂණය හෙවත් මුහුකුරු වන ගතිය තෙජෝ ධාතුය, එහිම පවත්නා විත්‍ථම්භන ලක්‍ෂණය හෙවත් පිපෙන ගතිය වායො ධාතුය, ඝත්‍ථබ්ධ ලක්‍ෂණය හෙවත් තද ගතිය පඨවි ධාතුය, ආබන්‍ධන ලක්‍ෂණය හෙවත් බැඳෙන ගතිය ආපො ධාතුය යනාදී වශයෙන් වෙන් වෙන් කොට ව්‍යවස්ථා කළ යුතු.

එ පරිද්දෙන් ම උද්ධගමාවාතාදී සය කොටසෙහි විත්‍ථම්භන ලක්‍ෂණය හෙවත් පිපෙන ගතිය වායො ධාතුය,

සම්බන්ධ ලක්ෂණය හෙවත් තද ගතිය පඨවි ධාතුය, ආබන්ධන ලක්ෂණය හෙවත් බැඳෙන ගතිය ආපො ධාතුය, පරිපාචන ලක්ෂණය හෙවත් පැසවන ලක්ෂණය තෙජෝ ධාතුය යනාදී වශයෙන් වෙන් වෙන් කොට ව්‍යවස්ථා කළ යුතු.

මෙසේ සවලක්ෂණ සංක්ෂෙප වශයෙන් ධාතූන් ව්‍යවස්ථා කොට භාවනා කරණ යෝගාවචරයාහට ඒ සතර ධාතුහු ප්‍රකට වෙති. එය ම නැවත නැවත ආවර්ජනා කරණ කල්හි, මෙනෙහි කරන කල්හි පෙර කියන ලද පරිදි උපචාර සමාධිය උපදී.

**4. සවලක්ෂණ විභත්ති වශයෙන්:-** මෙසේ භාවනා කොට ඉදින් කමටහන සමෘද්ධ නොවේ නම්, ඔහු විසින් සවලක්ෂණ විභත්ති වශයෙන් හෙවත් බෙදීම් වශයෙන් කමටහන වැඩිය යුතු. ඔහු විසින් කෙසාදී වූ දෙසාලිස් කොටස් වෙන් වෙන් වශයෙන් ගෙන, කේසයෙහි පවත්නා තද ගතිය පඨවි ධාතුය, බැඳෙන ගතිය ආපො ධාතුය, පැසවන ගතිය තෙජෝ ධාතුය, පිපෙන ගතිය වායො ධාතුය යනාදී වශයෙන් සියලුම දෙසාලිස් කොටස්හි වෙන් වෙන් වශයෙන් එක එක කොටසෙහි සතර ධාතූන් මෙසේ වෙන් වෙන් කොට ව්‍යවස්ථා කළ යුතු. එකල්හි ඔහු විසින් ($42 \times 4 = 168$) එක්සිය හැට අටක් ධාතු ව්‍යවස්ථා කරන ලද්දේ වේ. මෙ පරිද්දෙන් ධාතු වෙන් කොට ව්‍යවස්ථා කරන ඒ යෝගීහට සතර ධාතුහු ප්‍රකට වෙති. එය ම නැවත නැවත ආවර්ජනා කරණ කල්හි, මෙනෙහි කරන කල්හි පෙර කියන ලද පරිදි උපචාර සමාධිය උපදී.

**චතුධාතු ව්‍යවස්ථාන කමටහන** වඩන්නා වූ යෝගාවචරයා විසින් තෙළෙස් (13) ආකාර වශයෙන් ද කමටහන වැඩිය යුතු. ඒ මෙසේයි:-

**1. වචනාර්ථ වශයෙන්**

**2. කලාප වශයෙන්**

**3. චූර්ණ හෙවත් සුණු වශයෙන්**

**4. ලක්ෂණාදි වශයෙන්**

**5. සමුට්ඨාන හෙවත් හටගැනීම් වශයෙන්**

**6. නානත්ත ඒකත්ත වශයෙන්**

**7. විනිර්භෝග අවිනිර්භෝග වශයෙන්**

**8. සභාග විසභාග වශයෙන්**

**9. අජ්ඣත්තික බාහිර වශයෙන්**

**10. සංග්‍රහ වශයෙන්**

**11. ප්‍රත්‍යය වශයෙන්**

**12. අසමන්නාහාර වශයෙන්**

**13. ප්‍රත්‍යය විභාග වශයෙන්**

යන තෙළෙස් ආකාර වශයෙන්, සතර ධාතුහු වැඩිය යුතු.

මේ භාවනා ක්‍රමයෙහි වනාහි ධාතූන් පිළිබඳ වූ වචනාර්ථය ගත යුතු බැවින් පළමු කොට කමටහන ඉගැන්ම වචන වශයෙන් විය යුතු හෙයින් **වචනාර්ථ වශයෙන්** ධාතූන් මෙනෙහි කටයුතු යයි කියන ලදී. එසේ වචනාර්ථ වශයෙන් විශේෂයෙන් ද සාමාන්‍යයෙන් ද ධාතූන් පරිග්‍රහ කොට සිටි පුද්ගලයාහට යම් හෙයකින් ඒ ධාතුහු පිඩු වශයෙන් වැටහෙද් ද, වෙන් වෙන් වශයෙන් නො වැටහෙද් ද එ හෙයින් **කලාප වශයෙන්** මෙනෙහි කටයුතු බව කියන ලදී. ඒ කලාපයෝ ප්‍රමාණ වශයෙන් පරමාණු ප්‍රමාණ වන හෙයින් එහි අනන්තගීත පෘථිවී ධාතු ආදීන්ගේ එක් ශරීරයක ඇති ප්‍රමාණය දක්වීම් පිණිස **චූර්ණ වශයෙන්** හෙවත් **සුණු** වශයෙන් මෙනෙහි කටයුතු බව කියන ලදී. මෙසේ ඒ ධාතූන් චූර්ණ වශයෙන් මෙනෙහි කොට එහි සවරූපය ම දක්ක යුතු හෙයින් **ලක්ෂණාදි වශයෙන්** මෙනෙහි කළ යුතු බව කියන **ලදී.**

එසේ ලක්ෂණාදී වශයෙන් ධාතූන් පරිග්‍රහ කරන්නහු විසින් සවලක්ෂණ විභක්ති වශයෙන් කම්ස්ථානාභිනිවේශයෙහි දෙසාළිස් කොට්ඨාසයන්ගේ වශයෙන් ධාතූන් පරිග්‍රහ කරණ ලබන කල්හි මෙතෙක් ධාතූහු ඍතුසමුට්ඨානය, මෙතෙක් දෙන චිත්ත සමුට්ඨානය, මෙතෙක් දෙන කම්ම සමුට්ඨානය, මෙතෙක් දෙන ආහාර සමුට්ඨාන යයි මෙසේ දත යුතු හෙයින් **සමුට්ඨාන වශයෙන්** මෙතෙහි කළ යුතු බව දක්වන ලදී. මෙසේ දැනගත් සමුට්ඨාන ඇති ඒ ධාතූන්ගේ ශබ්දානුසාරයෙන් විනා විශෙෂ සාමාන්‍ය පරිග්‍රහ කටයුතු යයි දක්වනු පිණිස **නානත්ත්ව ඒකත්ත්ව වශයෙන්** මෙතෙහි කළ යුතු බව කියන ලදී. **ලක්ෂණ** ආදීන්ගේ වශයෙන් විනිර්භොග ස්වරූප ඇති හෙවත් වෙන් වෙන් වූ ස්වරූප ඇති ධාතූහු අවිනිර්භොග වශයෙන් ද පරිග්‍රහ කළ යුතු හෙයින් **විනිර්භොග අවිනිර්භොග වශයෙන්** සිහි කළ යුතු බව දක්වන ලදී. අවිනිර්භොගව පැවැත්ම ඇති කල්හි ද ඇතැම් ධාතුවක් හට ඇතැම් ධාතූහු සභාගයහ, ඇතැම් ධාතූහු විසභාගයහ යි දැන ගැනීම පිණිස විශේෂ පරිග්‍රහ කටයුතු හෙයින් **සභාග විසභාග වශයෙන්** මනසකාරය පැවැත් විය යුතු යයි දක්වන ලදී. සභාගද විසභාගද වූ ධාතූහු අතුරෙන් අධ්‍යාත්මිකයෝ මෙබඳු කෘත්‍යය විශේෂයෙන් යුක්තයහ. බාහිරයෝ එයට වෙනස් කෘත්‍යය විශේෂයෙන් යුක්තයහයි පරිග්‍රහ කරණු පිණිස **අජ්ඣත්තික බාහිර වශයෙන්** මෙතෙහි කළ යුතු බව දක්වන ලදී. ඉක්බිති සංජාති සංග්‍රහාදී වූ ධාතූහු සමුට්ඨාන වශයෙන් සංග්‍රහ විශේෂය පරිග්‍රහ කටයුතු බැවින් **සංග්‍රහ වශයෙන්** මනසකාරය පැවැත් විය යුතු බව දක්වන **ලදී**. සන්ධාරණාදී වූ තම තමන්ගේ කෘත්‍යයෙන් ඔවුනොවුන්ට උපස්ථම්භ වන බව දැන ධාතූහු පරිග්‍රහ කටයුතු බව දක්වනු පිණිස **ප්‍රත්‍යය වශයෙන්** මනසකාරය දක්වන ලදී. අව්‍යාපාර නය වශයෙන් ධාතූහු පරිග්‍රහ කටයුත්තාහයි දක්වනු පිණිස **අසමන්නාහාර වශයෙන්** මනස්කාරය කියන ලදී. තමන්ගේ ප්‍රත්‍යය ධර්ම විශේෂයෙන් ද, ප්‍රත්‍යය

භාව විශේෂයෙන් ද ධාතුහු පරිග්‍රහ කටයුත්තාහ යි දක්වනු පිණිස **ප්‍රත්‍යය විභාග වශයෙන්** මනස්කාරය දක්වන ලදී. මෙසේ මේ තෙළෙස් ආකාරයෙන් ධාතුහු පරිග්‍රහ කිරීමට කාරණා දක්වන ලද බව දතයුතු.

**1. වචනාර්ථ වශයෙන්:-** පඨවි ධාතු ආදී වචනයන්හි අර්ථ පළමු කොට දත යුතු. පතළාවූ අර්ථයෙන් **පඨවි** නම් වේ. නොහොත් ප්‍රතිෂ්ඨා භාවයෙන් වැටහෙන හෙයින් **පඨවි** නම් වේ. පැතිරෙන්නේ ය, පැමිණෙන්නේ ය යන අර්ථයෙන් **ආප** නම් වේ. මේ අර්ථ දෙක සසම්භාර ආපය වශයෙන් කියන ලදී. සසම්භාර ආප නම් වූ ජලය වැගිරෙන හෙයින් සසම්භාර පෘථිවි නම් වූ පොළොවෙහි ගලා බැසීම් වශයෙන් ඒ ඒ තැනට පැමිණෙන්නේ ය. තවද, පඨවි, තෙජෝ, වායෝ යන ඉතිරි භූත ත්‍රය, ඔවුනොවුන් ආබන්ධනය කෙරෙමින් හුණුවී යා නො දෙමින්, විසිර යා නො දෙමින් පැතිරේනුයි, පැමිණේනුයි **ආප** නම් වේ. එරුෂාකාරය, පැසවන ආකාරය, විහිදුවන ආකාරය යන ආකාර ඇති සෙසු භූතත්‍රය විසින් බොහු ලබන්නක්හු මෙන් පවතී යන අර්ථයෙන් ද **ආප** නම් වේ. තීක්ෂණභාවයෙන් සෙසු භූත තුන හුණු ගන්වන අර්ථයෙන් **තෙජෝ** නම් වේ. කම්පා කරවන, සොළවන අර්ථයෙන් **වායු** නම් වේ. සෙසු භූතත්‍රය තමන් පිහිටි තැනින් අන් තැනෙක ඉපදීමට හේතු භාවයෙන් යවන හෙයින් ද **වායු** නම් වේ. පඨවි, ආපෝ, තෙජෝ, වායෝ යන මේ සතර මහා භූතයෝ කර්කශ බවය, වැගිරෙන බවය, උණුසුම් බවය, සැළෙන බවය යන තම තමා අයත් ලක්‍ෂණ හෙවත් ස්වලක්‍ෂණ ධරණ හෙයින් ද අනෙක ප්‍රකාර වූ සංසාර දුක්ඛය ගෙන දෙන හෙයින් ද, ධරණ හෙයින් ද **ධාතු** නම් වෙත්. තවද අනල්ප වූ දුක්ඛයාගේ විධාන මාත්‍රයක් හෙයින් ද වසඟයෙහි නො පවත්නා හෙයින් ද **ධාතු** නම් වෙත්. එසේම නිස්සත්ත්ව නිර්ජීවාර්ථයෙන් ද **ධාතු** නම් වෙත්. මෙසේ වචනාර්ථ වශයෙන් ධාතූන් මෙනෙහි කටයුතු.

2. **කලාප වශයෙන්:**- යම් මේ කෙසා, ලොමා යනාදී වශයෙන් විසිප්‍රකාරයකින් **පඨවි ධාතුව** ද, පිත්තං සෙම්හං යනාදී වශයෙන් දොළොස් ප්‍රකාරයකින් **ආපො ධාතුව** ද දක්වන ලද ද, ඒ ධාතූන් කෙරෙහි, යම් හෙයකින් **පඨවිය, ආපය, තෙජසය, වායුවය, වණ්ණය, ගන්ධය, රසය, ඕජාය** යන මේ අෂ්ට ධර්මයන්ගේ සමවධානයෙක් නො-හොත් එක්වීමෙක් වේද එකල්හි **කෙශයහ** යන සංඥ මාත්‍රය වෙයි. එම ධර්මයන්ගේ විනිර්භොගය හෙවත් වෙන්වීමෙක් වේද එකල්හි කෙශය යන සම්මුතිය නොවෙයි. එහෙයින් කෙශයෝ ද අෂ්ටධර්ම කලාප මාත්‍රයෙක හෙවත් අෂ්ට ධර්මයන්ගේ සමූහ මාත්‍ර ම වෙත්. ලොමාදීහු ද එසේම ය. ඒ කෙශාදීන් කෙරෙහි යම් කර්මජ කොටසෙක් ඇද්ද එහි ජීවිතින්ද්‍රිය රූපය හා භාවරූපය සමග එක් කොට ගත් කල්හි දසධර්ම කලාපයෙක් වෙයි. ලොමාදීහු ද මෙසේ යි. තවද අසිතාදී පරිපාචක තෙජෝ කොට්ඨාසය ජීවිතින්ද්‍රිය ය හා සමග නව ධර්ම කලාපයෙක් වෙයි, මෙසේ ඒ කෙසාදී කොටස්හු සුදුසු පරිද්දෙන් අට, නව, දස ධර්මයෝ සමූහ වූවාහු ද, එය පඨවි ධාතු ආපො ධාතු මාත්‍රයෙන් මෙනෙහි කරනු ලබන්නේ එහි පඨවි ධාතු ආදීන්ගේ අධික බැවිනැයි දත යුතු. මේ ධාතු මනස්කාර කර්මස්ථානය සත්ත්ව සංඥව දුරු කිරීම පිණිස වදාරණ ලදී. මෙසේ කලාප වශයෙන් ධාතූහු මෙනෙහි කටයුතු.

සතර ධාතූන් පිළිබඳ දෙසාළිස් කොටසුන් අතුරෙන් **උදරියං, කරීසං, පුබ්බො, මුත්තං**, යන සතර කොටස්හු **උතුසමුට්ඨානයහ**, අසිතාදීන් **පරිපාචනය කරණ තෙජො ධාතුව, කම්ම සමුට්ඨානය, ආශ්වාස වාතය, චිත්ත සමුට්ඨානය.** මේ සදෙන **එක සමුට්ඨානයහ.**

**සෙදො, අස්සු, ඛෙළො, සිඞ්ඝාණිකා** යන සතර දෙන **උතුසමුට්ඨාන, චිත්තසමුට්ඨාන** වශයෙන් **ද්විසමුට්ඨානයහ**.

සෙසු දෙතිස් කොටස්හු **චතුසමුට්ඨානයහ.**

මොවුන් කෙරෙහි අසිතාදී පරිපාචක තෙජො කොටස්හි හෙවත් ආහාරාදිය පැසවන තෙජො කොටසෙහි එකම **ජීවිත නවක කලාපයෙක්** වේ. (ජීවිතින්ද්‍රිය + ශුද්ධාෂ්ටකය). සෙසු එක සමුට්ඨාන කලාපයන්හි **ඍතුසමුට්ඨාන** හෝ **චිත්ත සමුට්ඨාන** හෝ එක එක අෂ්ටකය වේ. ද්විසමුට්ඨාන-යන්හි **ඍතු සමුට්ඨාන, චිත්ත සමුට්ඨාන** වශයෙන් **අෂ්ටක** දෙක දෙක වෙති. චතු සමුට්ඨානයන්හි **ඍතු, චිත්ත, ආහාර** සමුට්ඨාන වූ අෂ්ටක තුන වෙති. **ඍතු** සමුට්ඨාන, චිත්ත සමුට්ඨාන වශයෙන් **ශබ්ද නවකය** ද වේ. පරිපාචක තෙජො ධාතුව හා ආශ්වාස ප්‍රශ්වාස වායො ධාතුව හැර සෙසු තෙජො, වායො කොටස් අටෙහි ජීවිතින්ද්‍රිය සහිතවූ **ජීවිත නවකය ද** වේ. සෙසු සූවිසි කොටස්හි **කාය දසක. භාව දසක** සහිත වෙති. චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, වත්ථු යන කොටස් පසෙහි **චක්ඛු දසක, සොත දසක, ඝාණ දසක, ජිව්හා දසක, වත්ථු දසක** සහිත වෙති. මෙසේ පරිපූර්ණායතන රූප කායයෙහි හෘදය පරාමර්ශ නො කොට, එකත්තව වශයෙන් ගන්නා ලද කලාපයෝ එක්සිය තෙසැත්තෑවෙක් වෙති. රූප විභාග වශයෙන් වනාහි එක් දහස් පන්සිය එක් රූපයෙක් වෙයි. කොට්ඨාසයන්ගේ අවයව විභාග වශයෙන් වනාහි රූපයෝ අසඞ්ඛ්‍ය බව දත යුතු. මෙසේ ධර්ම විභාග වශයෙන් අනෙක භෙද භින්න වූ මේ දෙසාළිස් කොටස්හු උස්සද-ග්‍රහණයෙන් හෙවත් වැඩි ධාතුන්ගේ වශයෙන් චතුර්ධාතු වශයෙන් ම ව්‍යවස්ථා කටයුත්තාහුය.

# දෙසාළිස් කොට්ඨාසයන්ගේ වශයෙන් චතුධාතු සමුට්ඨානය

| කොට්ඨාස | | | | කම්ම | චිත්ත | උතු | ආහාර | සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|---|
| | පඨවි | | | | | | | |
| 1 | කෙසා | — | කෙස් | + | + | + | + | 4 |
| 2 | ලොමා | — | ලොම් | + | + | + | + | 4 |
| 3 | නඛා | — | නිය | + | + | + | + | 4 |
| 4 | දන්තා | — | දත් | + | + | + | + | 4 |
| 5 | තචො | — | සම | + | + | + | + | 4 |
| 6 | මංසං | — | මස | + | + | + | + | 4 |
| 7 | න්හාරු | — | නහර | + | + | + | + | 4 |
| 8 | අට්ඨි | — | ඇට | + | + | + | + | 4 |
| 9 | අට්ඨිමිඤ්ජා | — | ඇටමිදුළු | + | + | + | + | 4 |
| 10 | වක්කං | — | වකුගඩුව | + | + | + | + | 4 |
| 11 | හදයං | — | හෘදය | + | + | + | + | 4 |
| 12 | යකනං | — | අක්මාව | + | + | + | + | 4 |
| 13 | කිලොමකං | — | දලබුව | + | + | + | + | 4 |
| 14 | පිහකං | — | බඩදිව | + | + | + | + | 4 |
| 15 | පප්ඵාසං | — | පපුකැනැත්ත | + | + | + | + | 4 |
| 16 | අන්තං | — | බඩවැල | + | + | + | + | 4 |
| 17 | අන්තගුණං | — | අතුණුබහන | + | + | + | + | 4 |
| 18 | උදරියං | — | නොපැසුණු අහර | 0 | 0 | + | 0 | 1 |
| 19 | කරීසං | — | මළ | 0 | 0 | + | 0 | 1 |
| 20 | මත්ථලුඞ්ගං | — | හිස්මොළ | + | + | + | + | 4 |

| කොට්ඨාස | | | කම්ම | චිත්ත | ඍතු | ආහාර | සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|
| ආපො | | | | | | | |
| 21 | පිත්තං — | පිත | + | + | + | + | 4 |
| 22 | සෙම්හං — | සෙම | + | + | + | + | 4 |
| 23 | පුබ්බො — | සැරව | 0 | 0 | + | 0 | 1 |
| 24 | ලොහිතං — | ලේ | + | + | + | + | 4 |
| 25 | සෙදො — | වහදිය | 0 | + | + | 0 | 2 |
| 26 | මෙදො — | මේද තෙල | + | + | + | + | 4 |
| 27 | අස්සු — | කඳුළු | 0 | + | + | 0 | 2 |
| 28 | වසා — | වුරුණු තෙල | + | + | + | + | 4 |
| 29 | ඛෙළො — | කෙළ | 0 | + | + | 0 | 2 |
| 30 | සිඞ්ඝාණිකා — | සොටු | 0 | + | + | 0 | 2 |
| 31 | ලසිකා — | සඳමිදුළු | + | + | + | + | 4 |
| 32 | මුත්තං — | මුත්‍ර | 0 | 0 | + | 0 | 1 |
| තෙජො | | | | | | | |
| 33 | සන්තාපන තේජස | | + | + | + | + | 4 |
| 34 | ජිරවන තේජස | | + | + | + | + | 4 |
| 35 | දවන තේජස | | + | + | + | + | 4 |
| 36 | අහර පැසවන තේජස | | + | 0 | 0 | 0 | 1 |
| වායො | | | | | | | |
| 37 | උද්ධඞ්ගමා වාතය | | + | + | + | + | 4 |
| 38 | අධොගමා වාතය | | + | + | + | + | 4 |
| 39 | කුච්ඡිසයා වාතය | | + | + | + | + | 4 |
| 40 | කොට්ඨාසයා වාතය | | + | + | + | + | 4 |
| 41 | අඞ්ගමඞ්ගානුසාරී වාතය | | + | + | + | + | 4 |
| 42 | අස්සාස පස්සාස වාතය | | 0 | + | 0 | 0 | 1 |

# දෙසාළිස් කොට්ඨාසයන්ගේ රූප කලාප හා රූප විභාගය

| කොට්ඨාස නාම | | අෂ්ටක කලාප ගණන | | නවක කලාප ගණන | | දසක කලාප ගණන | | කලාප ගණන | රූප ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| පරිපාචක තෙජො කොටස | | — | — | 1 | ජීවිත නවක | — | — | 1 | 9 |
| සෙසු එකසමුට්ඨාන කොටස් | 5 | 1 | උතු හෝ චිත්ත | — | — | -- | — | 5 | 40 |
| ද්විසමුට්ඨාන කොටස් | 4 | 2 | උතු හා චිත්ත | — | — | — | — | 8 | 64 |
| චතුසමුට්ඨාන කොටස් | 32 | 32 | උතු චිත්ත ආහාර | — | — | — | — | 96 | 768 |
| උතුජ හා චිත්තජ කොටස් | 2 | — | — | 1 | ශබ්ද නවක | — | — | 2 | 18 |
| පරිපාචක තෙජො ධාතුව හා ආශ්වාස ප්‍රශ්වාස වායෝ ධාතුව හැර ඉතිරි තෙජෝ වායෝ කොටස් | 8 | — | — | 1 | ජීවිත නවක | — | — | 8 | 72 |
| උදරියං, කරීසං, පුබ්බො, මුත්තං, සෙදො, අස්සු, ඛෙළො, සිඞ්ඝාණිකා යන අට හැර ඉතිරි කොටස් | 24 | — | — | — | — | 2 | කාය දසක හා භාවදසක | 48 | 480 |
| චක්ඛු, සොත, ඝාණ, ජිව්හා වත්ථු යන කොටස් | 5 | — | — | — | — | 1 | චක්ඛු ආදී දසක කලාප | 5 | 50 |
| | | | | | | | | 173 | 1501 |

3. **චූර්ණ හෙවත් සුණු වශයෙන්**:- මධ්‍යම ප්‍රමාණ වූ ශරීරයක ලැබෙන, **සුණුවිසුණු** වී **පරමාණු** බවට පැමිණි පෘථිවි ධාතුහු **ද්‍රෝණයක්** පමණ වේ. **පරමාණුව** මෙසේ දත යුතු. අඟලෙන් අටෙන් කොටස හෙවත් අටවන භාගය **යවයෙක**. යවයාගේ අටවන භාගය **ඌකාවෙක.** ඌකාවගේ අටවන භාගය **ලික්ඛාය.** ලික්ඛාවගේ අටවන භාගය **රථරේණුය**. රථරේණුවගේ අටවන භාගය **තජ්ජාරිය**. තජ්ජාරිහුගේ අටවන භාගය **අණුය**. අණුහුගේ අටවන භාගය **පරමාණුවෙක.** ඇතැම් ආචාරීහු අටවන භාගය නොව සතිස්වන භාගයක් කොට ක්‍රමයෙන් ගැණ අණුහුගේ සතිස්වන භාගය **පරමාණුවෙකැයි** දක්වති. මේ පරමාණුව ආකාශ කොට්ඨාසිකය, මසැසට අවිෂය ය, දිවැසට ම විෂය යයි දත යුතු. මෙසේ පරමාණු භෙදයෙන් සුණු වූ සූක්ෂම රජස් වූ පෘථිවි ධාතුහු **ද්‍රෝණයක්** පමණ වත්නී ය. **ද්‍රෝණය** නම් සොළොස් නැළියක් පමණ ය. සතර මිටක් එක් **පතෙක**. පත සතරක් එක් **නැළියෙක**. නැළි සොළොසක් එක් **ද්‍රෝණයෙක**. එය **මගධ නැළියෙන්** දෙළොස් නැළියෙක. මෙසේ මධ්‍යම ප්‍රමාණ ශරීරයක ද්‍රෝණයක් පමණ පෘථිවි ධාතු සුණු ඇත්තේය. එයින් අඩක් පමණ වූ ආපො ධාතුවෙන් එය විසිර යා නොදී හාත්පසින් බැඳී පිඩුකොට ගන්නා ලද්දේ වෙයි. ඒ ආපො ධාතුවෙන් තෙත් වීමට හෝ වැගිරීමට නොයනසේ තෙජො ධාතුවෙන් රක්නා ලද්දේ වෙයි. එය ද සංඝාත වාතයෙන් පූරවන ලද්දේ වෙයි. මෙසේ සූක්ෂම වූ රජස් බවට පැමිණ ඒ පෘථිවි ධාතුව නො විහිදෙන සේ ආපො ධාතුවෙන් හාත්පසින් බැඳීමය, තෙජො ධාතුවෙන් පැසීමය, වායො ධාතුවෙන් සැලීමය යන කෘත්‍යයන්ගේ වශයෙන් උපකාර ලැබ, ස්නෙහයෙන් තෙමන ලද, තේජසින් මුහුකුරුවන ලද, වාතයෙන් හම්මන ලද පිටි පිඩක් සේ පිඩුවී, ඝන වී ස්ත්‍රී පුරුෂ ලිඞ්ගාදී භාව විකල්පයට පැමිණේ. එසේම කුඩාය, මහත්ය, දිගය, කොටය, ස්ථිරය, තදය යනාදී සවභාවය ද පහළ කරන්නේ ය.

මේ ශරීරයෙහි ද්‍රව බවට ගියා වූ එහෙයින් ම ආබන්ධනාකාර වූ **ආපෝ ධාතුව**, පෘථිවියෙහි පිහිටන ලද්දේ, තේජසින් රක්‍ෂා කරණ ලද්දී, වාතයෙන් හම්මන ලද්දී, නො වැගිරී, වහනය නොවී පිණ පිණා සිටින බව දක්වයි.

ආහාර පානාදීන් පැසවන්නා වූ උෂ්මාකාරවූ, හුණු බව ලකුණු කොට ඇති **කර්මජ තෙජෝ ධාතු** තොමෝ, පෘථිවි ධාතුව විසින් පිහිටන ලද්දී සහජ ධර්මයන් විසිර යා නොදී ආපෝ ධාතුව විසින් සංග්‍රහ කරන ලද්දී, වායුවෙන් විෂ්ටම්භිත වී මේ සිරුර හුණු කෙරේ. වැළඳූ අහර මනාකොට පරිපාචනය කිරීමෙන්, පැසවමින් රස බවට පමුණුවමින්, ශරීරය ද පැසවමින්, තියුණු කරමින් වර්ණ සම්පත්තිය ද උපදවයි. කර්මොපනිශ්‍රයට හා චිත්ත ප්‍රසාදය හේතු කොට ඇති ශරීරයෙහි වර්ණ සම්පත්තියට ද තෙජෝ ධාතුව විශෙෂ ප්‍රත්‍යය වේ. ඍතු ආහාර සමුට්ඨාන රූපයට වනාහි යථොක්ත තෙජෝ ධාතුව ශරීරයාගේ වර්ණ සම්පත්තිය එළවමින්, හුණු කරණ ලද මේ ශරීරය කුණුවීමට නො පමුණු වයි.

මේ ශරීරයෙහි, අඞ්ගමඞ්ගානුසාරී වූ හෙවත් ධමනි ජාලානුසාරයෙන් අඞ්ගප්‍රත්‍යඞ්ගයන්හි පැතිර පවත්නාවූ, සමුදීරණ විෂ්ටම්භන ලක්‍ෂණ වූ හෙවත් සොළවන හම්මවන ලක්‍ෂණ ඇති **වායො ධාතුව** පෘථිවියෙහි පිහිටන ලද්දී, සහජ ධර්මයන් වෙන්වී යා නොදී ආපො ධාතුයෙන් සංග්‍රහ කරණ ලද්දී, සහජ ධර්මයන් බිඳී යානොදී තෙජසින් රක්නා ලද්දී මේ සිරුර හම්මවයි. ඒ විෂ්ටම්භන ලක්‍ෂණ වූ වායො ධාතුව විසින් හම්මන ලද මේ කය බිම නොහෙයි. ඍජුව සිටියි. අනික් සමුදීරණ ලක්‍ෂණ වූ වායො ධාතුව විසින් ඒ ඒ දිසාවන්හි උත්පත්තියට හේතුවන ආකාරයෙන් පහරණ ලද මේ ශරීරය, ගමනය, සිටීමය, හිඳීමය, හෙවීමය යන ඉරියව් කෙරෙන් විඥප්තිය දක්වයි. අත්පා හකුළුවයි, දික්කරයි, ලෙලවයි, පරිවර්තනය කෙරෙයි.

මෙසේ මේ ස්ත්‍රී පුරුෂාදි භාවයෙන් බාල ජනයා වඤ්චා කරණ මායා රූපයක් බදු ධාතුමය වූ මේ සිරුර සූත්‍ර බලයෙන් පවත්නා යන්ත්‍ර රූපයක් මෙන්, ක්‍රියා කරවන්නා වූ ආත්මයක් නැතිව, චිත්ත බලයෙන් ධාතුමය යන්ත්‍රය පවත්නේ යයි සලකා **සුඤ්ඤ** වශයෙන් මෙනෙහි කටයුතු.

4. **ලක්ෂණාදි වශයෙන්:- පඨවි ධාතුව,** කක්ඛළ බව හෙවත් තද බව **ලක්ෂණ** කොට ඇත්තීය. සහජාත ධර්මයන්ට පිහිට බව කෘත්‍යය කොට ඇත්තිය. සහජාත ධර්මයන් පිළිගන්නා ආකාරයෙන් බුද්ධියට වැටහෙන හෙයින් පිළිගැන්ම වැටහීම් කොට ඇත්තීය.

**ආපො ධාතුව,** පග්ඝරණ **ලක්ෂණය** හෙවත් වෑහෙන බව **ලක්ෂණ** කොට ඇත්තීය. සහජාත ධර්මයන් වඩනා බව කෘත්‍යය කොට ඇත්තීය. සහජාත ධර්මයන් පිඩු කිරීම වැටහීම් කොට ඇත්තීය.

**තෙජො ධාතුව,** හුණු බව **ලක්ෂණ** කොට ඇත්තීය. සහජාත ධර්මයන් මිහි කිරීම කෘත්‍යය කොට ඇත්තීය. සහජාත ධර්මයන්ට මෘදු බව දීම වැටහීම් කොට ඇත්තීය.

**වායො ධාතුව,** විත්ථම්භන **ලක්ෂණ** හෙවත් හැම්මීම **ලක්ෂණ** කොට ඇත්තීය. සමුදීරණය හෙවත් චලනය කෘත්‍යය කොට ඇත්තීය. භූත සමූහය පිහිටි තැනින් අන් තැනෙක ඉපදීමට හේතු වන ආකාරයෙන් සැලීම වැටහෙන ආකාරය වේ. මෙසේ **ලක්ෂණාදි** වශයෙන් මෙනෙහි කටයුතු.

5. **සමුට්ඨාන වශයෙන්:-** යට දක්වන ලද පරිදි සතර ධාතූහු, දෙසාළිස් කොටස් වශයෙන් ගෙන, ඒ දෙසාළිස් කොටස් අතුරෙන්, **නො පැසුණු ආහාරය, පැසුණු ආහාරය, සැරවය, මූත්‍රය** යන කොටස් සතර **සෘතුවෙන් ම** උපදනාහු ය. **කන්ගූථය, ඛහදිය ය, කෙළය, සොටුය** යන මේ සතර කොටස් කලෙක **සෘතුවෙන් ද,** කලෙක **චිත්තයෙන් ද** උපදිති. **ආහාරාදීන් පැසවන**

**තේජස, කර්මයෙන්ම** වන්නේ ය. **ආශ්වාස ප්‍රශ්වාසයෝ චිත්තයෙන්** ම වන්නාහ. සෙසු දෙතිස් කොටස්හුම **චතුසමුට්ඨානයහ** හෙවත් **කර්ම, චිත්ත, ඍතු, ඕජා** යන සතරින් ම වන්නාහයි මෙසේ සමුට්ඨාන වශයෙන් මෙනෙහි කළ යුතු.

6. **නානත්ත ඒකත්ත වශයෙන්**:- සියලු ධාතූන්ගේ තම තමන්ට ම නියත කක්ඛලාදී ලක්ෂණය, රසය යනාදීන්ගේ වශයෙන් වෙනස් බව හෙවත් **නානත්වය** වෙයි. පඨවි ධාතුහුගේ ලක්ෂණය, රසය, පච්චුපට්ඨානය යන මොහු අනිකෙක. ආපො ධාතු ආදීන්ගේ ද ලක්ෂණාදිය අන්‍යයෝ ය. මෙසේ ලක්ෂණාදී වශයෙන් ද, කම්ම-සමුට්ඨානාදී වශයෙන් ද, නානා ස්වභාව වූ මේ සතර මහා ධාතූන්ගේ, **රූපය, මහා භූතය, ධාතුය, ධර්මය, අනිත්‍යය, දුඃඛය, අනාත්මය ය,** යන මොවුන්ගේ වශයෙන් සමානත්වය හෙවත් **ඒකත්වය** වෙයි.

සියලු ධාතුහු ම රුප්පන ස්වභාවය නොඉක්මෙන හෙයින් **රූපම** වෙත්. රුප්පන ස්වභාවය නම් ශීතාදී විරුඬ ප්‍රත්‍යය ඇති කල්හි වෙනස්ව ඉපදීමට හේතු වන ස්වභාවය ඇතිවීමයි.

මහත්ව පහළවීම් ආදී කරුණෙන් **මහාභූත** නම් වෙත්. මේ මහත්ව පහළවීම ද සසම්භාර ධාතූන්ගේ වශයෙන් දත යුතු. මේ ධාතුහු:-

**1. මහත්ව පහලවූ හෙයින් ද,**

**2. මහා භූතයන් හා සමාන බැවින් ද,**

**3. මහත් පෙරහැර ඇති හෙයින් ද,**

**4. මහත් විකාර ඇති හෙයින් ද,**

**5. මහත් බැවින් ද,**

**6. විද්‍යමාන බැවින් ද යි**

මෙතෙක් කරුණෙන් මහා භූතයයි කියනු ලැබෙත්.

1. මේ භූතයෝ පෘථිවි, පර්වතාදී අනුපාදින්න සන්තාන යෙහි ද දෙව්මිනිස් ආදී වූ උපාදින්න සන්තානයෙහි ද නොයෙක් සියදහස්රූප කලාප සමූහ වශයෙන් ද, සන්තති වශයෙන් ද, සීමා රහිත ප්‍රමාණ ඇතිව මහත්ව පහළ වෙත්. අනුපාදින්න සන්තානයන්හි මේ මහා පොළොව බොළින් දෙලක්ෂ සතළිස් දහසක් යොදුනැයි කියන ලදී. මේ ආදී වශයෙන් මහත්ව පහළ වූ බව දත යුතු. උපාදින්න සන්තානයෙහි ද මස්, කැසුබු, දෙව්, රකුස් ආදීන්ගේ තුන්ගව් ආදී පමණ ශරීර වශයෙන් මහත් බව පහළවූහයි වදාරණ ලද ම ය. “මහණෙනි, මහා සාගරයෙහි යොදුන් සියයක් පමණ ද වූ ආත්මභාව ඇත්තාහු ඇත” යනාදී වශයෙන් බුදුන්වහන්සේ විසින් වදාරණ ලදී.

2. යම්සේ මායාකාර තෙමේ මැණික් නොවූම වූ ජලය මැණික් කොට දක්වා ද, සවර්ණ නොවූම වූ කැට සවර්ණ කොට දක්වා ද, යක්ෂ නොවූයේම යක්ෂණී නොවූවාම, යක්ෂයෙකු කොට යක්ෂණියක කොට දක්වා ද, එපරිද්දෙන් ම භූතයෝ තුමූ නිල් නොවූම නිල්වූ උපාද රූප දක්වති, රන්වන් නොවූම, රක්ත නොවූම, සුදු නොවූම රන්වන්ව, රක්තවර්ණව, සුදුව උපාද රූපයන් දක්වත්. මායාකාර මහා භූතයා සමාන බව ඇති හෙයින් මේ සතරට **මහා භූතයයි** කියනු ලැබේ. යම්සේ යක්ෂාදී මහා භූතයන් විසින් අල්වාගන්නා ලද්දවුන්ගේ ශරීරයෙහි ඇතුළත හෝ පිටත හෝ ඔවුන්ගේ සිටීම නොදත හැකි වේ ද, ඔවුන් නිසා නො සිටිතැයි ද නො දතහැකි වේ ද, එපරිද්දෙන්ම මේ මහා භූතයෝ ද ඔවුනොවුන්ගේ ඇතුළත හෝ පිටත හෝ සිටිතැයි නොදත හැකිවේ. ඔවුනොවුන් නිසා නොසිටිනාහු යයි ද නොවෙතියි නොදත හැකිවේ. එහෙයින් යක්ෂාදී මහා භූතයන් සමාන වන බැවින් ද මේ සතර දෙන මහා භූත නම් වෙත්. එසේම යම්සේ යක්ෂණී සඞ්ඛ්‍යාත මහා භූතයෝ මනාපවූ කාල ශ්‍යාමාදී වර්ණයෙන් ද, සංස්ථානයෙන් ද, වික්ෂෙපයෙන් ද තමාගේ භයානක බව මුවහ කොට සතුන් වඤ්චා කෙරෙත් ද,

එපරිද්දෙන් ම මේ භූතයෝ ද ස්ත්‍රී පුරුෂ ශරීරාදියෙහි මනාපවූ අඞ්ගප්‍රත්‍යඞ්ග සටහනින් ද, මනාපවූ අත්පා ආදී ශරීරාවයවයෙන් ද, අත්පා, ඇඟිලි බැම නැටවීම් ආදියෙන් ද තමාගේ කර්කශත්වාදී භෙද ඇති ස්වභාව ලක්ෂණය මුවහ කොට බාල ජනයා වඤ්චා කෙරෙත්. තමාගේ ස්වභාවය දැකීමට අවකාශ නොදෙත්. එසේ වඤ්චක බැවින් යක්ෂිණී මහා භූතයන් හා සමාන වන හෙයින් මහා භූත නම් වෙත්.

3. මහත් වූ ප්‍රත්‍යයෙන් පරිහරණය කටයුතු හෙයින් ද, දිනපතා බොහෝ වූ බත්පිළී ආදියෙන් පැවැත්විය යුතු හෙයින් ද, මහත් පරිවර ඇති හෙයින් ද පඨවි ආදී සතර දෙන මහා භූත නම් වෙත්.

4. මේ භූතයෝ වනාහි තෘෂ්ණා දෘෂ්ටීන් යුත් කර්මයෙන් නිපන් හෙයින් උපාදින්න නම්වූවාහු ද, එසේ නොනිපන් හෙයින් අනුපාදින්න නම් වූවාහු ද, මහත් විකාර ඇති හෙයින් ද භූතයෝ නම් වෙත්. එයින් අනුපාදින්න-යන්ගේ කල්ප විනාශයෙහි දී විකාර මහත්වය පහළවේ. උපාදින්නයන්ගේ ධාතුක්‍ෂොභ කාලයෙහි විකාරයම ප්‍රකටවේ. එහෙයින් වදාරණ ලදී.

මෙලොව ගින්නෙන් විනාශ වන කල්හි ගිනිදැල් භූමියෙන් නැග බ්‍රහම ලෝකය දක්වා දුවත්.

යම් කලෙක ලෝකය කිපියාවූ දියෙන් විනාශ වේද් ද, එකල්හි කෙළලක්‍ෂයක් සක්වළ නසී.

යම් කලෙක වායො ධාතුහුගේ කෝපයෙන් ලොව විනාශයට යේද්ද, එකල්හි කෙළ ලක්‍ෂයක් සක්වළ විනාශයට යෙත්.

යම්සේ කාෂ්ටමුඛ නම් සර්පයා විසින් දෂ්ටවූ මේ කය දැඩිවේ ද, එමෙන් මේ කය පඨවි ධාතුහුගේ කෝපයෙන් කාෂ්ටමුඛ සර්පයාගේ මුඛයෙහි වූවක්හු මෙන් දැඩි වේ.

පූතිමුඛ නම් සර්පයා විසින් දෂ්ටවූවක්හු මෙන් මේ කය ආපෝ ධාතුහුගේ කෝපයෙන් කුණුවෙයි. පූතිමුඛ නම් සර්පයාගේ මුවෙහි වූවක්හු මෙන් වේ.

අග්නිමුඛ නම් වූ සර්පයා විසින් දෂ්ටවූවක්හු මෙන් තෙජෝ ධාතුහුගේ කෝපයෙන් මේ කය තැවෙයි. අග්නිමුඛ නම් සර්පයාගේ මුවෙහි වූවක්හු මෙන් වේ.

ශස්ත්‍රමුඛ නම් වූ සර්පයා විසින් දෂ්ට වූවක්හු මෙන් මේ කය වායෝ ධාතුහුගේ කිපීමෙන් සුණු වේ. ශස්ත්‍රමුඛ සර්පයාගේ මුවෙහි වූවක්හු මෙන් වේ.

මෙසේ මහත් විකාර ඇති හෙයින් ද **මහා භූත** නම් වෙත්.

5. මේ භූතයෝ යථා ස්වභාවයෙන් ම මහත් ව්‍යායාම-යෙන් පරිග්‍රහ කටයුතු බැවින් මහත් ය. එහෙයින් ද **මහා භූත** නම් වෙත්.

6. මේ භූතයෝ ස්වභාව වශයෙන් විද්‍යමාන බැවින් ද, මහත් බැවිනුත් විද්‍යමාන වන හෙයින් ද **මහා භූත** නම් වෙත්.

මේ සියලු ධාතුහුම මහන්තපාතුභාවාදි කාරණයෙන් **මහා භූත** නම්හු වෙත්.

ස්වලක්ෂණ ධරණ හෙයින් ද, දුක් පමුණුවන හෙයින් ද, දුක් විධාන කරණ හෙයින් ද, හැම දෙනම ධාතු ලක්ෂණය නො ඉක්මුණු හෙයින් ද **ධාතු** නම් වෙත්.

ස්වලක්ෂණය දැරීමෙන් ද, රූපධර්මයන්ගේ ක්ෂණය ඉතා ස්වල්ප නොවන බැවින් තමන්ගේ ක්ෂණයට අනුරූප කොට දැරීමෙන් ද **ධර්ම** නම් වෙත්.

ක්ෂණ භඞ්ගුර හෙයින් හෙවත් තමා අයත් ක්ෂණයට සුදුසු සේ සතළොස් චිත්තක්ෂණායුෂ්ක කාලයක් පැවත බිඳෙන අර්ථයෙන් **අනිත්‍යයහ.**

උදය, ව්‍යය දෙකින් පෙළීම් ආදියෙන් භය ඇති වන හෙවත් භයට කාරණ වන අර්ථයෙන් **දුක්ඛයහ.**

ආත්ම සාරයෙනුත් ශූන්‍ය හෙයින් **අනාත්මයහ.**

මෙසේ සියලු ධාතුන්ගේ ම **රූපය, මහාභූතය, ධාතුය, ධර්මය, අනිත්‍යය, දුක්ඛය, අනාත්මය** යනාදී වශයෙන් එකත්ත බව දත යුතු. මෙසේ නානාත්ව එකත්ව වශයෙන් ද සියලු ධාතූන් මෙනෙහි කටයුත්තාහ.

**7. විනිර්භෝග අවිනිර්භෝග වශයෙන්:- පඨවි, ආපෝ, තේජෝ, වායෝ** යන මේ ධාතුහු සතර දෙන එක්ව ඉපිද, එක්ව පැවත, සමාන කාලයෙහි ලැබ, යටත් පිරිසෙයින් ශුද්ධාෂ්ටකාදී එකී එකී කලාපයෙහි වෙන් වෙන් කොට බෙදිය නො හැකිවේ. යම් තැනෙක ධාතූන් තුන්දෙනහට පිහිට වශයෙන් **පඨවි ධාතුව** පවතී ද, එතැන්හිම හාත්පසින් බැඳීමය, පැසවීමය, සමුදීරණය හෙවත් සැලීමය යන කෘත්‍ය සිඩ කරමින් **ආපෝ ධාතුවය, තේජෝ ධාතුවය, වායෝ ධාතුවය** යන ධාතූන් ද ඇත්තාහ. මෙසේ සතර ධාතූන් වෙන් වෙන් කොට ගත නොහැකි හෙයින් **අවිනිර්භෝගයහ. ලක්ෂණ** වශයෙන් වනාහි වෙන් වෙන් වූ **ලක්ෂණ** ධරණ හෙයින් **විනිර්භෝගයහ.** මෙසේ **විනිර්භෝග අවිනිර්භෝග** වශයෙන් ද ධාතූන් මෙනෙහි කටයුතු.

**8. සභාග - විසභාග වශයෙන්:-** මෙසේ වෙන් ව නො පවත්නාද වූ මේ සතර ධාතූන් අතුරෙන් පළමු ධාතු දෙක හෙවත් **පඨවි - ආපෝ** යන ධාතු දෙක ගරුක බැවින් නොහොත් බර බැවින් ඔවුනොවුන්ට **සභාගයහ.** පශ්චිමවූ ධාතු දෙක හෙවත් **තේජෝ - වායෝ** යන ධාතු දෙක ලහුක බැවින් නොහොත් සැහැල්ලු බැවින් ඔවුනොවුන් හා **සභාගයෝ ය.** එසේ ම පළමු වූ **පඨවි - ආපෝ** යන ධාතු දෙක, පශ්චිම වූ **තේජෝ - වායෝ** යන ධාතු දෙක හා ද, පශ්චිම වූ **තේජෝ - වායෝ** යන

ධාතු දෙක, පලමු වූ **පඨවි – ආපො** යන ධාතු දෙක හා ද **විසභාගයෝ ය.** මෙසේ **සභාග – විසභාග වශයෙන්** ධාතූන් මෙනෙහි කටයුත්තාහ.

**9. අධ්‍යාත්මික – බාහිර වශයෙන්:–** අධ්‍යාත්මික වූ හෙවත් සත්ත්වසන්තානයට ඇතුලත් වූ **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර ධාතුහු චක්‍ෂුරාදී විඥාන වස්තූන් සදෙනාට ද, විඥප්තීන් දෙදෙනාට ද, ඉත්ථින්‍ද්‍රිය ය, පුරිසින්‍ද්‍රිය ය, ජීවිතින්‍ද්‍රිය යන්ට ද නිශ්‍රය වෙත්. **බාහිර** වූ හෙවත් අනින්‍ද්‍රියබද්ධ සන්තානයෙහි වූ සතර ධාතුහු විපරිත වූ ප්‍රකාර ඇත්තාහු වෙත්. විඥාන වස්තු, විඥප්ති, ඉන්‍ද්‍රියයන්ට නිශ්‍රය නොවෙත්. ඉරියාපථ ආදිය නූපදවත්, චතුසමුට්ඨා-නික නොවෙත්. මෙසේ සතර ධාතුහු අධ්‍යාත්මික – බාහිර වශයෙන් මෙනෙහි කටයුතු.

**10. සංග්‍රහ වශයෙන්:–** කර්මයෙන් හටගත් පෘථිවි ධාතු තොමෝ කම්මසමුට්ඨාන ආපො, තෙජො, වායො යන අන්‍ය ධාතූන් හා සමාන ජාති ඇත්තවුන්ගේ සඞ්ග්‍රහය හෙවත් සජාතිය සංග්‍රහ වශයෙන් එක සංග්‍රහ වේ. එසේ ම චිත්ත, ඍතු, ආහාර සමුට්ඨාන වූ පෘථිවි ධාතුව ද චිත්ත, ඍතු, ආහාර සමුට්ඨාන වූ ආපො, තෙජො, වායෝ යන ධාතූන් හා එක සංග්‍රහ වෙත්. මෙසේ සංග්‍රහ වශයෙන් ධාතුහු මෙනෙහි කටයුත්තාහ.

**11. ප්‍රත්‍යය වශයෙන්:– පඨවි ධාතුව,** ආපො ධාතුව විසින් සංග්‍රහ කරණ ලදුව, තෙජො ධාතුව විසින් රක්‍ෂා කරණ ලදුව, වායො ධාතුව විසින් හමමන ලදුව මෙසේ සහජාත තුන් මහා භූතයන්ට සන්ධාරණ වශයෙන් පිහිටව සහජාතාදි වශයෙන් ප්‍රත්‍යය වේ.

**ආපො ධාතුව,** පඨවි ධාතුවෙන් ප්‍රතිෂ්ඨා ලදුව, තෙජො ධාතුවෙන් රක්‍ෂා කරණ ලදුව, වායො ධාතුව විසින් හමමන ලදුව, මෙසේ සහජාත තුන්මහා භූතයන්ට ආබන්ධන වශයෙන් **උපකාර වේ.**

**තෙජෝ ධාතුව,** පඨවි ධාතුවෙහි පිහිටා, ආපෝ ධාතුවෙන් සංග්‍රහ කරණ ලදුව, වායෝ ධාතුවෙන් හමමන ලදුව, මෙසේ සහජාත තුන් මහා භූතයන්ට පැසවීම් වශයෙන් උපකාර වේ.

**වායෝ ධාතුව,** පඨවි ධාතුවෙහි පිහිටා, ආපෝ ධාතුවෙන් සංග්‍රහ කරණ ලදුව, තෙජෝ ධාතුවෙන් රක්‍ෂා කරණ ලදුව, මෙසේ සහජාත තුන්මහා භූතයන්ට විත්ථම්භන වශයෙන් උපකාර වේ.

මෙසේ මේ සතර ධාතුහු ඔවුනොවුනට ප්‍රත්‍යය වශයෙන් මෙනෙහි කළ යුතු.

**12. අසමන්නාහාර වශයෙන්**:- මේ සතර ධාතූන් අතුරෙන් පඨවි ධාතුව "මම පඨවි ධාතු වෙමි යි ද, සෙසු තුන් මහා ධාතූන්ට පිහිටව ප්‍රත්‍යය වෙමි යි ද" නොදනී. සෙසු ධාතූන් තුන්දෙන ද අපට පෘථිවි ධාතුව පිහිටව ප්‍රත්‍යය වේ යයි නො දන්නාහ. මෙසේ සතර ධාතුහු ඔවුනොවුන් මෙනෙහි නො කරණ බව සැළකීම් වශයෙන් නොහොත් අසමන්නාහාර වශයෙන් මෙනෙහි කළ යුතු.

**13. ප්‍රත්‍යය විභාග වශයෙන්**:- ධාතූන්ට වනාහි **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන ප්‍රත්‍යයයෝ සතර දෙනෙකි. ඒ සතර දෙනා අතුරෙන් කර්‍ම සමුට්ඨාන ධාතූන්ට කර්‍මය ම ජනක ප්‍රත්‍යය වේ. චිත්ත, ඍතු, ආහාරාදීහු ජනක වශයෙන් ප්‍රත්‍යය නොවෙත්. චිත්තාදී-යෙන් හටගත් ධාතූන්ට චිත්තාදීහු ම ජනක වශයෙන් උපකාර වෙත්. කර්‍මාදී ප්‍රත්‍යයෝ ජනක වශයෙන් උපකාර නොවෙත්.

තවද කම්ම සමුට්ඨාන ධාතූන්ට කර්‍මය ජනක ප්‍රත්‍යය වෙයි. සෙසු ධාතූන්ට අප්‍රධාන වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වෙයි.

චිත්ත සමුට්ඨාන ධාතූන්ට චිත්තය ජනක ප්‍රත්‍යය වෙයි. කර්‍මාදී සෙසු ත්‍රිසමුට්ඨාන භූතයනට ඒ චිත්තය

පච්ඡාජාත, අත්ථි, අවිගත යන තුන් ආකාරයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම ආහාර සමුට්ඨාන ධාතූන්ට ඒ ආහාරය ජනක ප්‍රත්‍යය වේ. සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා ධාතූන්ට ඒ ආහාරය, ආහාර, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ. සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා ධාතූන්ට ඒ සෘතුව අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ.

කම්ම සමුට්ඨාන මහා භූතය කම්ම සමුට්ඨාන මහා භූතයන්ට ද ප්‍රත්‍යය වෙයි. චිත්ත සමුට්ඨානාදි මහා භූතයනට ද ප්‍රත්‍යය වේ. චිත්ත සමුට්ඨාන ආහාර සමුට්ඨා-නයෝ ද එසේ ම ය. සෘතු සමුට්ඨාන මහා භූතය සෘතු සමුට්ඨාන මහා භූතයන්ට ද ප්‍රත්‍යය වෙයි. කම්ම සමුට්ඨානාදී මහා භූතයන්ට ද ප්‍රත්‍යය වේ.

කම්ම සමුට්ඨාන **පඨවි ධාතුව,** කම්ම සමුට්ඨාන ආපො, තෙජො, වායො ධාතූන්ට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිශ්‍රය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්තියෙන් ද ප්‍රතිෂ්ඨා වශයෙන් හෙවත් ආධාර වශයෙන් ද උපකාර වේ. ජනක වශයෙන් ප්‍රත්‍යය නොවේ. සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා වූ ද, සන්තති වශයෙන් පවත්නා වූ ද සතර මහා භූතයන්ට නිශ්‍රය, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිෂ්ඨා වශයෙන් හා ජනක වශයෙන් ද ප්‍රත්‍යය නොවේ. පෘථිවි ධාතුහුගේ ප්‍රතිෂ්ඨා භාවය, සහජාත ධර්මයන්ට ම වේ.

කම්ම සමුට්ඨාන **ආපො ධාතුව,** සෙසු මහා භූතයන්ට සහජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් හා ආබන්ධන ශක්තියෙන් හෙවත් හාත්පසින් බැඳීම් වශයෙන් ද උපකාර වේ. ජනක වශයෙන් උපකාර නොවේ. අවශේෂ තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා මහා භූතයන්ට නිශ්‍රය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ. ආබන්ධන වශයෙන් හෝ ජනක වශයෙන් හෝ උපකාර නොවේ.

**කම්ම සමුට්ඨාන තෙජො ධාතුව,** සෙසු මහා භූත තුනට සහජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති

තුනෙන් ද පැසවීම් වශයෙන් ද උපකාර වේ. ජනක වශයෙන් උපකාර නොවේ අවශේෂ තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා මහා භූතයනට නිශ්‍රය, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ. ජනක වශයෙන් හෝ පැසවීම් වශයෙන් හෝ උපකාර නොවේ.

**කම්ම සමුට්ඨාන වායො ධාතුව,** සෙසු තුන් මහා භූතයන්ට සහජාත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් හා හැම්මීම් වශයෙන් ද උපකාර වේ. ජනක වශයෙන් උපකාර නොවේ. අවශේෂ තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා මහා භූතයන්ට නිස්සය, අත්‍ථි, අවිගත වශයෙන් ම උපකාර වේ. ජනක වශයෙන් හෝ හැම්මීම් වශයෙන් හෝ උපකාර නොවේ.

**චිත්ත සමුට්ඨාන, ඍතු සමුට්ඨාන, ආහාර සමුට්ඨාන-යන්ගෙන්** හටගන්නා මහා භූතයන්ගේ ප්‍රත්‍යය වීම ද මේ ක්‍රමයෙන් ම දත යුතු.

**පඨවි** ආදි ධාතූන් අතුරෙන් එකී එකී ධාතූන් නිසා අනික් තුන් තුන් දෙනෙක් වෙති. මෙසේ එක් ධාතුවක් නිසා ධාතූන් තුන් දෙනෙක් සතර පරිද්දෙකින් පවතිත්.

එසේම පඨවි ආදි සතර ධාතූන් අතුරෙන් ධාතූන් තුන් තුන් දෙනා නිසා එක් ධාතුවක් පවති. එබැවින් ධාතු තුනක් නිසා එක් ධාතුවක් සතර පරිද්දෙකින් පවති.

පූර්ව වූ **පඨවි, ආපො** දෙදෙන නිසා පශ්චිම වූ **තෙජො, වායො** දෙදෙන ද.

පශ්චිම වූ **තෙජො, වායො** දෙදෙන නිසා පූර්ව වූ **පඨවි, ආපො** දෙදෙන ද,

**පඨවි, තෙජො** දෙදෙන නිසා **ආපො, වායො** දෙදෙන ද,

**ආපො, වායො** දෙදෙන නිසා **පඨවි, තෙජො** දෙදෙන ද,

**පඨවි, වායො** දෙදෙන නිසා **ආපො, තෙජො** දෙදෙන ද,

**ආපො, තෙජො** දෙදෙන නිසා **පඨවි, වායො** දෙදෙන ද යි.

මෙසේ ධාතූන් දෙදෙනෙක් නිසා ධාතූන් දෙදෙනෙක් සය ආකාරයෙකින් පවත්නාහ. මේ ප්‍රත්‍යය භාවය ද සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත ප්‍රත්‍යය වශයෙන් වේ.

තවද, මේ සතර ධාතූන් අතුරෙන් **පඨවි ධාතුව,** අභික්කම, පටික්කමාදි කාලයෙහි හෙවත් ඉදිරියට යාම, ආපසු ඒම යනාදී කායික ක්‍රියා පවත්නා කාලයෙහි, ගැටීම පෘථිවි ධාතුවෙන් ම වන හෙයින්, ගැටීම ම උපකාරවේ. ඒ පඨවි ධාතුව ම, ආපො ධාතුව විසින් අනුව යන ලද්දී, පාදය භූමියෙහි තැබීමට උපකාර වේ. පඨවි ධාතුවට අනුගත ආපො ධාතුව පාදය යට හෙළීමට උපකාරවේ. වායො ධාතුව අනුව යන ලද තෙජො ධාතුව පාදය උඩට එසවීමට උපකාරවේ. තෙජො ධාතුවට අනුගත වූ වායො ධාතුව අතිහරණ විතිහරණයට හෙවත් පය අභිමුඛයට යැවීමට හා සරසට යැවීමටද උපකාරවේ.

මෙසේ ප්‍රත්‍යය විභාග වශයෙන් ද සතර ධාතූහු මෙනෙහි කළ යුතු.

වචනාර්ථාදි වශයෙන් මෙසේ සතර ධාතූහු මෙනෙහි කරන්නා වූ යෝගාවචරයාහට, ඒ තෙළෙස් ආකාරයන් අතුරෙන් එකි එකී ආකාරයෙන් ධාතූහු ප්‍රකට ව පහළ වෙත්. එසේ නැවත නැවත ආවර්ජනා කරන, මෙනෙහි කරණ යෝගාවචරයාහට පෙර කී පරිද්දෙන් උපචාර

සමාධිය උපදී. මෙසේ සතර ධාතූන් ව්‍යවස්ථාකරන ඥානයාගේ වශයෙන් උපදනා **උපචාර සමාධිය, චතුධාතු වවත්ථාන** යයි සඞ්ඛ්‍යාවට යන්නේ ය.

මේ චතුධාතු වවත්ථාන කර්මස්ථාන භාවනායෙහි යෙදුණු යෝගාවචර තෙම, සත්ත්වසුන්‍යතා බව දැක සත්ත්වය යන සංඥව නසා අරණ්‍ය සෙනසුන් ආදියෙහිදී ව්‍යාල මෘග, යක්ෂ, රාක්ෂස යයි විභාගයට නො පැමිණ, ධාතු මාත්‍රය වැටහීමෙන් භය භෙරවයන් ඉවසන්නේ ය. ප්‍රාන්ත සේනාසනයන්හි හා අධිකුසල ධර්මයන්හි අරතිය හෙවත් නො ඇලීම ද, පස්කම් ගුණයෙහි රතිය හෙවත් ඇල්ම ද මැඩපවත්නේ ය. ඉෂ්ටාරම්මණයෙහි ඉපිලීමට ද, අනිෂ්ටාරම්මණයෙහි බැගෑ බවට ද නො පැමිණේත්. මහත් නුවණැති ද වෙයි. නිර්වාණය කෙළවර කොට ඇත්තේ හෝ සුගතිය පිහිට කොට ඇත්තේ හෝ වෙයි.

**සමාධි භාවනාවෙහි ආනිශංස පසෙක් වේ එනම්:-**

**1. දිට්ඨධම්ම සුඛවිහාරානිසංසය:-** ගෙවන ලද ආශ්‍රව ඇත්තා වූ රහතන් වහන්සේ, අර්පණා සමාධියට සමවැද, එකඟ කරණ ලද සිත් ඇතිව, දවස මුළුල්ලෙහි වාසය කරම්හයි සිතා සමාධිය වඩත් ද, රහතන්වහන්සේගේ ඒ අර්පණා සමාධි භාවනා තොමෝ දිට්ඨධම්මසුඛවිහාරානිසංස පිණිස හෙවත් ප්‍රත්‍යක්ෂ ආත්මභාවයෙහි සැපවිහරණය අනුසස් කොට ඇත්තීය. එ හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "චුන්දය, ආයර්‍ය විනයෙහි නොහොත් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි චිත්තෛකග්‍රතා මාත්‍රා කාර වූ මේ බාහිරක ධ්‍යාන ධර්මයෝ වනාහි සල්ලෙඛ ප්‍රතිපදා හෙවත් කෙලෙසුන් ලියන ප්‍රතිපදාවෝ යයි කියනු නො ලැබේ. මේ ධ්‍යාන ධර්මයෝ බුදුසස්නෙහි දිට්ඨධම්ම සුඛවිහාර යයි හෙවත් ඉහාත්මයෙහි සැපවිහරණයෝ යි කියනු ලැබේ."

**2. විපස්සනානිසංසය:-** සමවතින් නැගිට, එකඟ කරණ ලද සිතින් විදර්ශනා කරම්හයි ධ්‍යාන වඩන්නා වූ

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යන ආර්‍ය්‍යයන්ගේ හා පෘථග්ජනයන්ගේ ද අර්පණා සමාධි භාවනා තොමෝ ද, තෘෂ්ණා සංක්ලේශාදියෙන් කිලිටි බැවින් පරම සම්බාධ වූ, අර්ථ ප්‍රතිලාභයට යෝග්‍ය වූ නවවන ක්ෂණයයි කියන ලද අවකාශය අති දුර්ලභ බැවින් අර්පණාධිගමය ද ආගමනය නො කරන්නා වූ සංවේග බහුල පුද්ගල තෙමේ උපචාර සමාධියෙහි ම සිට විදර්ශනා කොට වහාම සසර දුකින් එතර වම්හයි අදහස් කරන බැවින් එබඳු උදාර අදහස් ඇත්තවුන්ගේ උපචාර සමාධිය ද, විදර්ශනාවට ආධාර වන බැවින් ද ඕකාසාධිගම ක්‍රමයෙන් විදර්ශනාවට ආසන්න කාරණා වන බැවින් ද උපචාර සමාධි භාවනා තොමෝ ද විදර්ශනාව අනුසස් කොට ඇත්තීය. එ හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:- "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟ කරණ ලද සිත් ඇති මහණ තෙමේ ධර්මයන්ගේ යථා සවභාවය ප්‍රකාරයෙන් දන්නේ ය."

**3. අභිඥානිසංසය**:- යම් යෝගාවචර කෙනෙක් අෂ්ටසමාපත්තීන් උපදවා, ඍද්ධිවිධාදී අභිඥා ඥානයන්ට පාදක වූ ධ්‍යානයට සමවැද, එම සමවතින් නැගිට "එකෝපි හුත්වා බහුධා හොති" තෙමේ එකෙක්ව ද බොහෝ වෙයි යනාදීන් කියන ලද ක්‍රම ඇත්තා වූ අභිඥාවන් ප්‍රාර්ථනා කරන්නේ නම් උපදවන්නේ නම්, ඔහුට පූර්වහේතු යයි කියන ලද අභිඥාධිගමයට අධිකාරය ඇති කල්හි, අභිඥාව ආසන්න කාරණා කොට ඇති බැවින්, අර්පණා සමාධි භාවනා තොමෝ අභිඥාව අනුසස් කොට ඇත්තී වේ. භාග්‍යවතුන් වහන්සේ ද "ඒ මහණ තෙම අභිවිශිෂ්ට ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුවූ ද, භාවනා කටයුතුවූ ද විභාවනා කටයුතුවූ ද, යම් යම් ධර්මයක්හුගේ අභිඥාවෙන් සාක්ෂාත්කරණය පිණිස විශේෂයෙන් සිත නමන්නේ ද, ඒ ඒ සාක්ෂාත් කටයුතු ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂකාරිත්වයට සුදුසු බවට, පූර්වභව සිද්ධවූ අභිඥාධිගමයට කාරණා වූ අධිකාරය ඇති කල්හි අභිඥාවට පැමිණෙන්නේ ය" යි වදාළ සේක.

**4. භවවිසේසානිසංසය**:- නො පිරිහුණු ධ්‍යාන ඇත්තාහු, බඹලොව උපදුම්හයි බඹලොව ඉපදීම ප්‍රාර්ථනා කරන්නාහු හෝ, ඒ ඒ භවගාමී කර්මය අරභයා භව ප්‍රාර්ථනාවක් නූපන්නාහු ද, තත් කර්මය කළ හෙයින් ම භව ප්‍රාර්ථනය සිදුවන බැවින් බඹලොව උත්පත්තිය නො පතා හෝ යම් පෘථග්ජන කෙනෙක් සමාධියෙන් නො පිරිහෙත් ද, ඒ පෘථග්ජනයන්ගේ අර්පණා සමාධි භාවනා තොමෝ විශිෂ්ට භවය එළවන බැවින් භවවිශෙෂානිශංස හෙවත් විශිෂ්ට භවය එළවීම අනුසස් කොට ඇත්තී වේ. භාග්‍යවතුන් වහන්සේ ද මෙසේ වදාළ සේක. "සවල්ප වශයෙන් ප්‍රථම ධ්‍යානය වඩා කොතැන්හි උපදනේ ද යත්? බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ගේ එකී භාවයට පැමිණෙති යි." උපචාර සමාධි භාවනා තොමෝ ද කාමාවචර සුගති සඞ්ඛ්‍යාත විශිෂ්ට භවය එළවන්නීම ය.

**5. නිරොධානිසංසය**:- යම් ආර්‍ය්‍ය කෙනෙක් වනාහි අෂ්ටසමාපත්තීන් උපදවා නිරොධ සමාපත්තියට සමවැද, සත්දවසක් මුළුල්ලෙහි අචිත්තකව හෙවත් චිත්තමූලයෙන් ගන්නා ලද සතර නාමස්කන්ධයෙන්ම වෙන්ව, ප්‍රත්‍යක්‍ෂ ආත්ම භාවයෙහි ම නාමස්කන්ධයන්ගේ නිරොධය යයි කියන ලද්දා වූ, උත්පාද, ස්ථිති, භඞ්ග සඞ්ඛ්‍යාත ත්‍රිවිධ දුක්ඛයන්ගේ නිවීමෙන් ලැබිය යුතු නිර්වාණ සැපයට පැමිණ සැපසේ වසම්හයි සමාධිය වඩත් ද, ඒ අනාගාමි හා රහතන්වහන්සේගේ අර්පණා සමාධි භාවනා තොමෝ නිරොධ සමාපත්තිය අනුසස් කොට ඇත්තීවේ. එහෙයින් කියන ලදී. "**අනිච්චානුපස්සනාය, දුක්ඛානුපස්සනාය, අනත්තානුපස්සනාය, නිබ්බිදානුපස්සනාය, විරාගානුපස්සනාය, නිරොධානුපස්සනාය, පටිනිස්සග්ගානුපස්සනාය, විවට්ටානුපස්සනාය** යන **අනුපස්සනාවන් අටදෙනාය, ආර්‍ය්‍යමාර්ග, ආර්‍ය්‍යඵල අටදෙනාය** යන **සොළොස්ඥාණ චර්‍ය්‍යාවෙන්** හා **රූපාවචර ධ්‍යාන පසය, අරූප ධ්‍යාන සතරය** යන **නව සමාධි චර්‍ය්‍යාවන්ගේ වශයෙන් ද** වශී භාවයෙන් හටගන්නා වූ ප්‍රඥා තොමෝ **නිරොධසමාපත්තියෙහි නුවණ** යයි කියනු ලැබේ.

මෙසේ සමාධි භාවනාවෙහි දිට්ඨධම්ම සුඛවිහාරාදී පඤ්චානිසංස ඇති බව දත යුතු. එබඳු පඤ්ච ප්‍රකාර අනුසස් ඇති හෙයින්, නොයෙක් අනුසස් ඇත්තා වූ කෙලෙස් නමැති අපවිත්‍රයන් දෙවීමෙහි පොහොසත් වූ භාවනාවෙහි යෙදීමෙහි නුවණ ඇති යෝගාවචර තෙම ප්‍රමාද නොවන්නේ ය.

## පඤ්චාභිඥා

සමාධි භාවනාවෙහි යට දක්වන ලද අනුසස් අතුරෙන් අභිඥා සම්පාදනය ද එක් ආනිසංසයකි. භාග්‍යවතුන් වහන්සේ විසින් "සමාධි භාවනාව ලෞකික අභිඥා ආනිසංස කොට ඇත්තීය"යි වදාරණ ලද්දේ ඒ අභිඥා සම්පාදනයට චතුර්ථධ්‍යාන ලාභියා උත්සාහවත් කරවනු පිණිස ය ඒ පඤ්චාභිඥාවන් සම්පාදනය කරගත් යෝගා-වචර තෙම, ඒ සමාධි භාවනාවෙන් ලබන ලද අනුසස් ඇත්ති, මනාසේ තහවුරු වූවා ද වෙයි. එසේ වූ හෙතෙම සුවසේ ප්‍රඥා භාවනාව සිඞ කරගන්නේ ය. එහෙයින් දැන් අභිඥාවන් විස්තර කරණු ලැබේ.

**පඤ්චවිධ ලෞකික අභිඥාවෝ නම්:-**

1. **ඍද්ධිවිධ ඥානය**
2. **දිව්‍යශ්‍රොත ඥානය**
3. **පරචිත්ත විජානන ඥානය**
4. **පූර්වේනිවාසානුස්සති ඥානය**
5. **සත්වයන්ගේ චුතූපපාත ඥානය** යන ඥාන පස වේ.

## 1. ඍද්ධිවිධ ඥානය

**ඍද්ධිවිධ ඥානය** හෙවත් **ඍද්ධිවිකුර්වණය** සම්පාදනය කරනු කැමති ආදිකර්මික යෝගාවචරයා විසින්, **පඨවි කසිණය** තෙක් ඇති අට කසිණයන්හි ලෞකික සමාපත්ති

අට බැගින් උපදවා, මතු දක්වන ලබන තුදුස් ආකාරයෙන් සිත දමනය කළ යුතු. ඒ තුදුස් ආකාරයෝ නම්:-

1. **කසිණානු ලෝමය**
2. **කසිණ පටිලෝමය**
3. **කසිණානු ලෝම පටිලෝමය**
4. **ඣානානු ලෝමය**
5. **ඣාන පටිලෝමය**
6. **ඣානානු ලෝම පටිලෝමය**
7. **ඣානුක්කන්තිකය**
8. **කසිණුක්කන්තිකය**
9. **ඣාන කසිණුක්කන්තිකය**
10. **අඞ්ග සඞ්කන්තිකය**
11. **ආරම්මණ සඞ්කන්තිකය**
12. **අඞ්ගාරම්මණ සඞ්කන්තිකය**
13. **අඞ්ග ව‍වත්ථාපනය**
14. **ආරම්මණ ව‍වත්ථාපනය.**

**පඨවි කසිණය, ආපෝ කසිණය, තේජෝ කසිණය, වායෝ කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, ඕදාත කසිණය, ආලෝක කසිණය, ආකාශ කසිණය** යන දස කසිණයන් අතුරෙන් ආලෝක කසිණය, ඕදාත කසිණයෙහි ඇතුළත් වේ. ආකාශ කසිණයෙන් අරූපාවචර සමාපත්ති නො ලැබේ. එහෙයින් ආලෝක කසිණය හා ආකාශ කසිණය ද හැර පඨවි කසිණය පටන් ඕදාත කසිණය දක්වා ඇති අට කසිණයන්හි සමාපත්ති අට බැගින් උපදවා ගත යුතු බව කියන ලදී.

**1. කසිණානු ලෝම**:- යෝගාවචර තෙම පළමු කොට පඨවි කසිණයෙන් ධ්‍යානයට සමවැද, එයින් නැගී අපො කසිණයෙන් ධ්‍යානයට සමවදී. මෙසේ පඨවි කසිණය පටන් ඕදාත කසිණය දක්වා පිළිවෙළින් අනුලෝම වශයෙන් අට කසිණයෙහි ම සියදහස්වර හෝ ඉන් වැඩියක් හෝ ධ්‍යානයට සමවදනේ ය. මෙය **කසිණානු ලෝමය** නම් වේ.

**2. කසිණ පටිලෝමය**:- ඕදාත කසිණය පටන් ආපසු පිළිවෙළින් පඨවි කසිණය තෙක් ප්‍රතිලෝම වශයෙන් අට කසිණයන්හි සියදහස්වර ධ්‍යානයට සමවැදීම **කසිණ පටිලෝමය** නම් වේ.

**3. කසිණානු ලෝම පටිලෝමය**:- පඨවි කසිණය සිට ඕදාත කසිණය දක්වා අනුලෝම වශයෙන් ද, නැවත ඕදාත කසිණය පටන් පඨවි කසිණය දක්වා පටිලෝම වශයෙන් ද නැවත නැවත සියදහස් වර ධ්‍යානයට සමවැදීම **කසිණානු ලෝම පටිලෝම** නමි.

**4. ධ්‍යානානු ලෝමය**:- ප්‍රථම ධ්‍යානය පටන් පිළි-වෙළින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් අනුලෝම වශයෙන් නැවත නැවත සියදහස් වර සමවැදීම **ධ්‍යානානු ලෝමය** නමි.

**5. ධ්‍යාන පටිලෝමය**:- නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පටන් ආපසු පිළිවෙළින් ප්‍රථම ධ්‍යානය තෙක් ප්‍රතිලෝම වශයෙන් නැවත නැවත සියදහස් වර සමවැදීම **ධ්‍යාන පටිලෝමය** නමි.

**6. ධ්‍යානානු ලෝම පටිලෝමය**:- ප්‍රථම ධ්‍යානය පටන් පිළිවෙළින් අනුලෝම වශයෙන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය දක්වා ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පටන් ආපසු පිළිවෙළින් පටිලෝම වශයෙන් ප්‍රථම ධ්‍යානය දක්වා ද සමවැදීම **ධ්‍යානානු ලෝම පටිලෝමය** නම් වේ.

7. **ධ්‍යානුක්කන්තිකය**:- පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවැද එයින් නැගී තෘතීය ධ්‍යානයට ද, එයට අනතුරුව, එය උගුළුවා පඨවි කසිණයෙන් ම උපදවන ලද ආකාශය අනන්ත වශයෙන් පතුරුවා, එහි පරිකර්ම කොට ආකාසානඤ්චායතන ධ්‍යානයට ද සමවැද ඉක්බිතිව, එයින් ම ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ අභාවයෙහි පැවති ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට සමවදී. මෙසේ කසිණය නොඉක්මවා, ධ්‍යානය එකින් එක ඉක්මවීමෙන් සමවැදීම ධ්‍යාන උල්ලඞ්ඝනය හෙවත් **ධ්‍යානුක්කන්තිකය** නම් වේ. ආපෝ කසිණ ආදියෙන් ද මේ ක්‍රමය වේ.

8. **කසිණුක්කන්තිකය**:- පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවැද නැවත ආපෝ කසිණය හැර, තෙජෝ කසිණයෙන් ද ප්‍රථම ධ්‍යානයට සමවදී. එයට අනතුරුව වායෝ කසිණය හැර නීල කසිණයෙන් ද, අවසානයෙහි පීත කසිණය හැර ලෝහිත කසිණයෙන් ද ප්‍රථම ධ්‍යානයට සමවදී. මෙසේ ධ්‍යානය උල්ලඞ්ඝනය නොකොට කසිණ එකක් හැර එකකින් එකම ධ්‍යානයට සමවැදීම කසිණ උල්ලඞ්ඝනය හෙවත් **කසිණුක්කන්තිකය** නම් වේ.

9. **ධ්‍යාන කසිණුක්කන්තිකය**:- **පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට** සමවැද, ආපෝ කසිණය හැර **තෙජෝ කසිණයෙන්** ද්විතීය ධ්‍යානය හැර **තෘතීය ධ්‍යානයට** සමවැද, වායෝ කසිණය හැර **නීල කසිණයෙන්** චතුර්ථ ධ්‍යානය හැර නීල කසිණය උගුළුවා **ආකාසානඤ්චායතන ධ්‍යානයට** සමවැද, පීත කසිණය හැර **ලෝහිත කසිණය** ආවර්ජනා කිරීමෙන් එය උගුළුවා ලබාගත් ආකාශය මෙනෙහි නොකොට එහි පැවති විඥානයාගේ අභාවය අරමුණු කිරීමෙන් **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට** සමවදී. මෙසේ කසිණයෙන් හා ධ්‍යානයන් අතරතුර ඉක්මවීමෙන් සමවැදීම ධ්‍යාන කසිණ උල්ලඞ්ඝනය හෙවත් **ධ්‍යාන කසිණුක්කන්තිකය** නමි.

**10. අඞ්ගසඞ්කන්තිකය:**- පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවැද පඨවි කසිණයෙන් ම ද්විතිය ධ්‍යාන, තෘතිය ධ්‍යාන, චතුර්ථ ධ්‍යානය යන රූපාවචර ධ්‍යානයන්ට අඞ්ග පිළිවෙළින් සමවැදීම **අඞ්ගසඞ්කන්තිකය** නමි.

**11. ආරම්මණ සඞ්කන්තිකය:**- පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවදනාසේ ආපො කසිණාදී වූ සියළු අට කසිණයෙන් ම එකම ධ්‍යානයකට ම සමවැදීම **ආරම්මණ සඞ්කන්තිකය** නමි.

**12. අඞ්ගාරම්මණ සඞ්කන්තිකය:**- පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට ද ආපො කසිණයෙන් ද්විතිය ධ්‍යානයට ද, තෙජෝ කසිණයෙන් තෘතිය ධ්‍යානයට ද, වායෝ කසිණ යෙන් චතුර්ථ ධ්‍යානයට ද, නීල කසිණය උගුළුවා ලබාගත් ආකාශය අරමුණු කොට ආකාසානඤ්චායතනයට ද, පීත කසිණයෙන් විඤ්ඤාණඤ්චායතනයට ද, ලොහිත කසිණයෙන් ආකිඤ්චඤ්ඤායතනයට ද, ඕදාත කසිණයෙන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයට දැයි මෙසේ අඞ්ගයන්ගේ ද, ආලම්බන යන්ගේ ද එකිනෙක පෑන සමවැදීම **අඞ්ගාරම්මණ සඞ්කන්තිකය** නමි.

**13. අඞ්ග වවත්ථාපනය:**- ප්‍රථම ධ්‍යානය පඤ්චඞ්ගිකය හෙවත් විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා යන අඞ්ග පසෙන් යුක්ත ය. ද්විතිය ධ්‍යානය තිවඞ්ගිකය හෙවත් පීති, සුඛ, එකග්ගතා යන අඞ්ග තුනෙන් යුක්ත ය. තතිය ධ්‍යානය දුවඞ්ගිකය හෙවත් සුඛ, එකග්ගතා යන අඞ්ග දෙකින් යුක්ත ය. චතුර්ථ ධ්‍යානය ද දුවඞ්ගිකය හෙවත් උපෙක්ඛා, එකග්ගතා යන අඞ්ග දෙකින් යුක්ත ය, ආකාසා-නඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤාය-තනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ද දුවඞ්ගිකය හෙවත් උපෙක්ඛා, එකග්ගතා යන අඞ්ග දෙකින් යුක්ත ය. මෙසේ ඒ ඒ ධ්‍යානයන් ගේ අඞ්ග මාත්‍රය ව්‍යවස්ථාපනය කිරීම **අඞ්ග වවත්ථාපනය** නම් වේ.

**14. ආරම්මණ වවත්ථාපනය:-** මේ පඨවි කසිණය, මේ ආපො කසිණය, මේ තෙජෝ කසිණය, මේ වායො කසිණය, මේ නීල කසිණය, මේ පීත කසිණය, මේ ලොහිත කසිණය, මේ ඕදාත කසිණය යයි මෙසේ ආලම්බන මාත්‍රය ම ව්‍යවස්ථාපනය කිරීම **ආරම්මණ වවත්ථාපනය** නම් වේ.

මේ තුදුස් ආකාරයෙන් සිත දමනය නොකොට, පෙර ආත්ම භාවයන්හි ධ්‍යාන වඩා පුරුද්දක් නැති, ආදිකර්මික යෝගාවචර තෙම, සෘද්ධිවිකුර්වණය සම්පාදනය කරන්නේ ය යන මේ කාරණය සිදු නොවේ ම ය. ආදිකර්මිකයාහට කසිණ පරිකර්මය හෙවත් **උග්ගහ නිමිත්ත** උපදනාතෙක් කසිණ මණ්ඩලයෙහි පිළිපෑදීම ඉතා දුෂ්කර ය. භාවනා කරන සියදහස් ගණනින් එකෙකු ම උග්ගහ නිමිත්ත වඩා ගැනීමට සමර්ථ වෙයි. කරණ ලද පරිකර්ම භාවනා ඇති යෝගාවචරයාහට **පටිභාග නිමිත්ත** උපදවා ගැනීම ද අති දුෂ්කර ය. සියදහස් ගණනින් එකෙකුම එයට සමත් වෙයි. උපදවා ගත් ඒ ප්‍රතිභාග නිමිත්ත වඩා **අර්පණාව** ලබා ගැනීම ඉතා දුෂ්කර ය. සියදහස් ගණනින් එකෙකු ම එයට ද සමත් වෙයි එසේ අර්පණාව ලබාගත් යෝගා-වචරයාහට යට කී **තුදුස් ආකාරයෙන් සිත භාවනාවෙන් දමනය කර ගැනීම** අති දුෂ්කර ය. සියදහස් ගණනින් එකෙකු ම එයට ද සමත් වෙයි. තුදුස් ආකාරයෙන් සිත දමනය කරගත් පුද්ගලයාහට සෘද්ධිවිකුර්වණය අතිශයින් දුෂ්කර ය. සියදහස් ගණනින් එකෙකු ම එයට සමත් වෙයි. **සෘද්ධි විකුර්වණය** ඇති පුද්ගලයාහට ද **ඛිප්පනිසන්ති භාවය** හෙවත් වහා වහා ධ්‍යානයට සමවැදීමේ සමර්ථ භාවය ලබා ගැනීම ඉතා දුෂ්කර ය. සියදහස් ගණනින් එකෙකු ම එයට සමත් වෙයි.

පෙර මිහින්තලා පව්වේ අම්බසථලයෙහි වැඩසිටි **මහා රොහණගුත්ත** ස්ථවිරයන් වහන්සේට ගිලන් උපස්ථානයට පැමිණියා වූ තිස්දහසක් පමණ සෘද්ධිමතුන් වහන්සේ අතුරෙන් උපසම්පදාවෙන් අටවස් වූ **බුද්ධරක්ඛිත** ස්වාමීන් වහන්සේ,

ඒ මහාරෝහණගුත්ත තෙරුණුවන්ට කැඳ පිළිගන්වමින් සිටි නාගරාජයා අල්වා ගැනීම පිණිස අහසින් බස්නා ගුරුළු රජු දැක එකෙණෙහි ම පර්වතයක් මවා නාරජු අතින් ගෙන ඒ පර්වතයට වැදුණේ ය. ගුරුළු රජ තෙමේ පර්වතයට පහරදී පලාගියේ ය. ඒ බුද්ධරක්ඛිත ස්ථවිරයන් වහන්සේගේ සෘද්ධ්‍යානුභාවය දැක රෝහණගුත්ත ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි අද අපගේ සඞ්ඝ සභාවෙහි රක්ඛිත ස්ථවිරනම නොසිටියේ නම් නාරජු රැකගත නොහැක්කම්හ. අප හැම දෙන ම ගර්හාවට පත් වන්නමෝ යයි" කීසේක. තවද "සතුරන් දිනීමට යුද්ධ කරන යෝධ භටයන් මලනැති කඩු තෝමරාදිය ගෙන හැසිරෙන්නාසේ භික්ෂූන් විසින් ද කෙලෙස් සිඳීම පිණිස නිර්මල වූ ධ්‍යානාභිඥාදිය උපදවාගෙන විසිය යුතු යයි" අවවාද කළ සේක. ඒ අවවාදයෙහි පිහිටා තිස්දහසක් භික්ෂූහු ඛිප්පනිසන්ති වූහ. ඛිප්පනිසන්ති භාවය හෙවත් වහා ධ්‍යානයට සමවැදීමට සමත්වුව ද, අනුන්ට පැමිණි උපද්‍රවයේදී පිහිට වන බව අති දුෂ්කර ය. සිය දහස් ගණනින් එකෙක්ම එයට සමත් වේ.

පෙර ලක්දිව ගිරිභණ්ඩවාහන නම් මහා පූජාවෙක් විය. එහිදී සියලු චෛත්‍ය ගිරි ආදිය ද, ලක්දිව අවට යොදනක් පමණ තන්හි මහා සමුද්‍රයෙහි ද මහත් වූ ප්‍රදීප පූජාවෙකි. වසවර්ති මාරයා මහත් වූ අඟුරු වැස්සක් මවා ඒ පූජාව හා මනුෂ්‍යයන් ද දවා අළුකරවන්නට තැත් කළ කල්හි, එක්තරා අභිඥාලාභී මහා තෙරනමක්, අඟුරු වැස්ස වස්වන බව කලින් නොදැන ම, එය අහසින් පහළට බස්නා බව දුටු කෙණෙහිම, ඇසිපිය හෙළීමටත් පෙර, මඳ ඇසිල්ලකින් පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, විකුර්වණ සෘද්ධිය උපදවා, පෘථිවියක් මවා, එකම ගිනිපුපුරක්වත් මිනිසුන් කරා පැමිණෙන්නට නොදී අහස්හිම අඟුරු වැස්ස නවතා ලූහ. මෙසේ අනුන්ට පැමිණි උපද්‍රවයේදී පිහිටවීම ඉතා දුෂ්කර වේ.

සෘද්ධිවිධ ඥානාදී ගුණ ධර්මයන්ට කාරණ වූ බලවත් පූර්වයෝග ඇති බුදු, පසේබුදු, අග්‍රශ්‍රාවකයනට මෙකී

ක්‍රමයෙන් තොරව විදර්ශනා භාවනා පිළිවෙලින් ම අභිඥ ඵල ප්‍රතිලාභයෙන් ම, මේ ඍද්ධිවිකුර්වණය ද, අන්‍ය වූ ප්‍රතිසම්භිදා ඥාන, ස්ථානාස්ථාන ඥානාදී ප්‍රභේද ඇති ගුණයෝ ද සමෘද්ධ වන්නාහ.

යම්සේ පළඳනා ආභරණයන් කරණු කැමති රන්කරුවෙක් ගිනි පිඹීම් ආදියෙන් රන් මෘදුකොට වැඩට සුදුසු පරිදි සකස් කොට කැමැති ආභරණ සාදාගන්නේ ද, භාජන විශේෂයන් කරණු කැමති කුම්භකාරයෙක් මැටි තලා, අනා, මෘදු කොට භාජන කරත් ද, එ පරිද්දෙන් ම ආදිකාර්මික යෝගාවචර තෙම මේ තුදුස් ආකාරයෙන් සිත හාත්පසින් දමනය කොට ගෙන, **ඡන්ද, චිත්ත, විරිය, වීමංස** යන සතර ඍද්ධිපාදයන් එකිනෙක මූල්කොට ගෙන සමවැදීම් වශයෙන් ද, **ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණ** යන පස් ආකාරයෙන් වසඟ බවට පැමිණවීමෙන් ද, සිත මොළොක් කොට කර්මණ්‍ය කොට, ඍද්ධිවිධ ඥානය ලබන පිණිස භාවනා කටයුතු. පූර්ව හේතු සම්පන්න පුද්ගලයා විසින් යම් කසිණයකින් චතුර්ථ ධ්‍යානයක් පාදක කොට අභිඥා ඉපදවිය යුතු නම්, ඒ ධ්‍යානයෙහි ද පුරුදු කරණ ලද වශී භාවනා කැමති විය යුතු.

යම් ආකාරයකින් ඒ ඉද්ධිවිධ ඥානය සම්පාදනය කළ යුතු ද, ඒ ආකාරය දක්වීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක, **“සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ, මුදුභූතෙ, කම්මනියෙ ඨිතෙ, ආනෙඤ්ජප්පත්තෙ, ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති”** ඒ අධිගමය කළ චතුර්ථ ධ්‍යාන ඇති යෝගී තෙම ප්‍රථම ධ්‍යානාදී ක්‍රමයෙන් මෙසේ රූපාවචර චතුර්ථ ධ්‍යානය ලැබ, චතුර්ථ ධ්‍යාන සමාධියෙන් සිත සමාධිමත් වූ කල්හි, උපෙක්ඛා සතිපාරිශුද්ධියෙන් පිරිසිදු වූ කල්හි, පිරිසුදු වූ හෙයින් ම ප්‍රභාස්වර කල්හි, පහවූ රාගාදී අඞ්ගණ ඇති කල්හි, අනඞ්ගණ හෙයින් ම පහවූ උපක්ලේශ ඇති කල්හි,

මනා කොට වඩන ලදුව වශී භාවයට පැමිණි කල්හි, මෘදු හෙයින් ම සෘද්ධිවිධ ඥාන කර්මයට යෝග්‍ය කල්හි මෙසේ පිරිසුදු ආදී බැව්හි සිටි කල්හි, ශ්‍රද්ධාදීන් පරිගෘහීත වන බැවින් නිශ්චල බවට පැමිණි කල්හි, **ඍද්ධිවිධ ඥාණය** පිණිස සිත මෙහෙයයි. **ශ්‍රද්ධාවෙන්** පරිගෘහිත වූ සිත හෙවත් ශ්‍රද්ධාවෙන් රුකුල් දෙන ලද සිත අශ්‍රද්ධාවෙන් නොසැලේ. **වීර්‍ය්‍යයෙන්** රුකුල් ලැබූ කල්හි කුසීත බැවින් නොසැලේ. **ස්මෘතියෙන්** රුකුල් ලැබූ කල්හි ප්‍රමාදයෙන් නොසැලේ. **සමාධියෙන්** රුකුල් ලැබූ කල්හි උද්ධච්චයෙන් නොසැලේ. **ප්‍රඥායෙන්** රුකුල් ලැබූ කල්හි අවිද්‍යායෙන් නොසැලේ. **ප්‍රඥාලෝකයෙන්** රුකුල් ලැබූ කල්හි ක්ලේශාන්ධකාරයෙන් සිත නොසැලේ. මෙසේ මේ ශ්‍රද්ධාදී ධර්ම සයෙන් යුක්තව, රුකුල් දෙන ලද සිත නිශ්චල බවට පැමිණියේ වෙයි.

මෙසේ **චතුර්ථ ධ්‍යානයෙහි සිත පිහිටුවීම ය, පිරිසුදු බව ය, ප්‍රභාස්වර බව ය, අනඞ්ගණ බව ය, ක්ලෙශ මලයෙන් පිරිසුදු බව ය, මෘදු බව ය, සෘද්ධි කර්මයට යෝග්‍ය බව ය, අචඤ්චල බව ය** යන මේ අඞ්ග අටින් යුක්ත වූ චතුර්ථ ධ්‍යාන චිත්තය **සෘද්ධිවිධාදි** අභිඥාවනට නැමීමට හා එයට අභිමුඛ කිරීමට ද යෝග්‍ය වේ.

තවද, චතුර්ථ ධ්‍යාන සමාධීන් සමාහිත වූ කල්හි, ප්‍රථම ධ්‍යාන සමාධිගමයෙන් නීවරණ විෂ්කම්භන වන හෙයින් පිරිසුදු බව ද, ද්විතීය ධ්‍යානාදියෙන් විතර්කාදී ඖදාරිකාඞ්ග ප්‍රහාණය වන හෙයින් ප්‍රභාස්වර බව ද, ධ්‍යාන ලැබීමෙන් ඉච්ඡාවචරානාදීන්ගේ අභාවයෙන් අනඞ්ගණ බව ද, අභිධ්‍යා මායාදීන්ගේ අභාවයෙන් පහවූ උපක්ලේශ ඇති බව ද, පඤ්ච ප්‍රකාර වශී භාවයට පැමිණීමෙන් මෘදු බව ද, සෘද්ධිපාදයට ආසන්න බවට පැමිණීමෙන් කර්මණ්‍ය බව ද, භාවනා පරිපූර්ණ බවට පැමිණීමෙන් ස්ථිර බව ද යන මේ ක්‍රම අටකින් ද යුක්ත වූ කල්හි චතුර්ථ ධ්‍යාන චිත්තය, අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මය අභිඥා ප්‍රත්‍යක්ෂ කරණය පිණිස ද ආසන්න කාරණා වේ.

**ඍද්ධිය**:- අභිමතාර්ථය නිපදවන අර්ථයෙන් ද, අභිමතාර්ථය ලැබීම් අර්ථයෙන් ද, උපාය සම්පත්ති අර්ථයෙන් ද, උපාය සම්පත්තියෙන් අදහස් කරන ලද ඵලය ලබාදෙන හෙයින් ද, අභීත් මාර්ග ඵල ලැබීම් අර්ථයෙන් ද ඉද්ධි නම් වේ.

මේ **ඍද්ධිය** දසවැදෑරුම් වේ. එනම්:-

1. **අධිට්ඨාන ඉද්ධිය**
2. **විකුර්වන ඉද්ධිය**
3. **මනෝමය ඉද්ධිය**
4. **ඤාණ විප්ඵාර ඉද්ධිය**
5. **සමාධි විප්ඵාර ඉද්ධිය**
6. **ආර්ය ඉද්ධිය**
7. **කර්මවිපාකජ ඉද්ධිය**
8. **පුඤ්ඤවතො ඉද්ධිය**
9. **විජ්ජාමය ඉද්ධිය**
10. **සම්මාපයොගපච්චය ඉද්ධිය.**

**1. අධිට්ඨාන ඍද්ධිය**:- ප්‍රකෘතියෙන් එකලාවූයේ බොහෝ වෙමියි අධිෂ්ඨාන කරයි. සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ බොහෝ වෙමියි ආවර්ජනා කොට අභිඥා නුවණින් අධිෂ්ඨාන කරයි. මෙසේ බෙදා දක්වූ ඍද්ධිය අධිෂ්ඨාන වශයෙන් උපදවා ගන්නා ලද හෙයින් **අධිෂ්ඨාන ඍද්ධි** නම් වේ.

**2. විකුර්වණ ඍද්ධිය**:- විවිධ රූප නිර්මාණ සඞ්ඛ්‍යාත විකාර ස්වභාවය උපදවන හෙයින් **විකුර්වණ** නම්. යෝගාවචර තෙම තමාගේ ප්‍රකෘති වේශය අත්හැර කුමාර

වේශයක් හෝ නාග, **සුපර්ණ**, යක්ෂ, රාක්ෂසාදී වූ කැමති වේශයක් නිර්මිත කොට දක්වයි. මේ ඍද්ධිය ප්‍රකෘතිවර්ණය හෙවත් ස්වභාවය දුරු කොට විකාර වශයෙන් පවත්නා හෙයින් **විකුර්වණ ඍද්ධිය** නම් වේ.

**3. මනෝමය ඍද්ධිය**:- අභිඥාලාභී ඒ යෝගාවචර තෙම තමාගේ ප්‍රකෘති ශරීරාභ්‍යන්තරයෙන් ඔහු හා ඒකාන්තයෙන් සමවූ අඞ්ගප්‍රත්‍යඞ්ග සම්පූර්ණ වූ අන්‍ය රූපයක් අභිඥා සිතින් ම නිපදවීම **මනෝමය ඍද්ධි** නම් වේ.

**4. ඥාන විස්ඵාර ඍද්ධිය**:- අර්හත් මාර්ග ඥානය ලැබීමට පෙර විදර්ශනා අවස්ථාවෙහි හෝ එයට පෙර අන්තිම භවික පුද්ගලයාගේ ප්‍රතිසන්ධිය ගැනීමෙහි පටන් හෝ පසුව ස්කන්ධ පරිනිර්වාණය තෙක් හෝ අර්හත් මාර්ග ඥානය ලබන අවස්ථාවෙහි හෝ ඒ ඥානයාගේ ආනුභාවයෙන් හිරු උදාවන කල එය සිටි තැන හා ඒ අවට ආලෝක කිරීමට සමත් වන්නාසේ ප්‍රහීන කළ යුතු ධර්ම ප්‍රහාණය කිරීම හා වැඩිය යුතු ධර්ම භාවනායෙන් සම්පූර්ණ කිරීම යනාදී වශයෙන් උපදනා විශේෂය **ඥාන විස්ඵාර ඍද්ධිය** නම් වේ.

ආයුෂ්මත් **බක්කුල තෙරණුවෝ** ළදරු අවස්ථාවෙහිදී නම් තබන මඞ්ගල දිනයෙහි, ගංගාවෙහි නාවන කල්හි, කිරිමවගේ ප්‍රමාදයෙකින් ගංගාවෙහි වැටුණේ, මත්ස්‍යයෙකු විසින් ගිලින ලද්දේ, බරණැස් තොටට පැමිණියේ ය. එහිදී මසුන් අල්වන්නෙක් ඒ මත්ස්‍යයා දැලින් අල්වා ගෙන ගොස් බරණැස සිටුභාර්‍යාවට විකිණියේ ය. ඈ මත්ස්‍යයා දැක සතුටුව ඈ විසින් ම ඒ මත්ස්‍යයා කැපිය යුතු යයි සිතා කපද්දී කුසහොත් රන්රුවක් බඳු ළදරු කුමරා දැක "මම පුතකු ලදිමි" යි සොම්නස් වූ වාය. මෙසේ බක්කුල තෙරණුවෝ මත්ස්‍යයාගේ කුසයෙහි නිරෝගීව විසීම පශ්චිමභවික වූ ඒ පුද්ගලයාගේ ආත්මභාවයෙහි ලැබිය යුතු අර්හත් මාර්ග ඥානානු භාවයෙන් නිපන් හෙයින්, **ඥාන විස්ඵාර ඍද්ධිය** යයි කියනු ලැබේ.

**සංකිච්ච තෙරණුවන්** වනාහි මව්කුස වසන කල්හි මව්තොමෝ කළුරිය කළාය. ඇගේ මළ සිරුර දරසෑයෙහි තංවා හුලෙන් ඇන දවන කල්හි ළදරුවාගේ ඇසෙහි හුල් කොණ ඇනී ළදරුවා ශබ්ද කෙළේය. එය අසා කුසහොත් ළදරුවා ජීවත් වන්නේ යයි දැන කුස පළා ළදරුවා රැගෙන මිත්තණියට දුන්නේ ය. ඇය ළදරුවා පෝෂණය කොට, වැඩිවිය පැමිණි කල්හි පැවිදි කරන ලදුව සිව්පිළිසිඹියා පත් රහත් බවට පැමිණි සේක. මෙසේ චිතකෙහිලා දවන කල්හි නිරෝගීව විසීම ආයුෂ්මත් සංකිච්ච තෙරණුවන්ගේ **ඤාණවිප්ඵාර සෘද්ධිය** නම් වේ.

රජගහ නුවර එක්තරා දර වෙළෙන්දෙක් වනයෙන් දර කඩා ගැල පුරවාගෙන සවස් වේලෙහි නගරය සමීපයට පැමිණ, ගොනුන් ලිහා **භූතපාල නම් කුඩා ළදරුවා** රථය සමීපයෙහි නිදිකරවා සිටියේ ය. පසුව ගොනුන් සොයනුයේ නගරය තුළට පිවිසි බව දැන ඔවුන්ගේ පා සටහනින් නගරය තුළට වන් කල්හි නුවර දොරටුව වැසිය. සැඩ ඵරුෂ ව්‍යාලමෘග යක්ෂාදීන් ගෙන් ගහන වූ පිට නුවරෙහි මුළු රැයක් ම නිරුපද්‍රත ව හුදකලාව භූතපාල ළදරුවාගේ විසීම, එම අත් බැව්හි ම ලැබිය යුතු අගීත් මාගී ඥතයාගේ ආනුභාවය කරණ කොට ගෙනවූ හෙයින් එය ඔහුගේ **ඤාණවිප්ඵාර සෘද්ධිය** නම් වේ.

**5. සමාධි විප්ඵාර සෘද්ධිය**:– ප්‍රථම ධ්‍යානාදි සමාධි ලැබීමට පෙර උපචාර අවස්ථාවෙහි හෝ ලැබූ සමාපත්තිය පඤ්චවසිතාවන්ගේ වශයෙන් පුරුදු කළ පසු හෝ සමාධිය ලැබූ ක්ෂණයෙහි හෝ ඒ ඒ ධ්‍යාන සමාධි තේජසින් නීවරණ විෂ්කම්භනය, විතර්කාදී ධ්‍යානාඞ්ග ඉක්මවීම, සඤ්ඤා–වෙදයිත නිරොධය හෙවත් නිරොධ සමාපත්තියට සමවත් කාලයෙහි උපද්‍රව නොපැමිණීමය යනාදී ආනුභාව විශේෂය **සමාධි විප්ඵාර සෘද්ධිය** නම්.

දිනක් **සැරියුත් මහ තෙරණුවෝ**, මුගලන් මහ තෙරුන් සමග කපොතකන්දරා නම් අරණ්‍ය විහාරයෙහි

සඳ එළියෙන් බැබලි රාත්‍රියක අළුත කෙස් බහන ලද හිසින් යුක්ත ව අභ්‍යවකාශයෙහි වැඩහුන් කල්හි එක්තරා යක්ෂයෙක් අන්‍ය යහළු යක්ෂයෙකු සමග හැසිරෙන්නේ සැරියුත් මහ තෙරුන්ගේ හිසට පහරක් ඇන්නේ ය. ඒ පහර මේඝ ගර්ජනාවක් මෙන් ශබ්ද නැගී ය. සැරියුත් තෙරණුවෝ ද බිපපතිසනාති භාවයෙහි හෙවත් වහා ධ්‍යාන සමවතට සමවැදීමෙහි දක්ෂ බව ඇති හෙයින් ඒ ක්ෂණයෙහි ම ධ්‍යානයට සමවැදුනෙන් ඒ පහරින් කිසිදු පීඩාවෙක් නොවී ය. මෙය වනාහි සැරියුත් මහ තෙරණුවන්ගේ **සමාධි විප්ඵාර ඍද්ධිය** නම් වේ.

එක්තරා රුකක් මුල නිරෝධසමාපත්තියට සමවැද නිශ්චලව වැඩහුන් **සඤ්ජීව ස්ථවිරයන් වහන්සේ** දුටු ගොපළු පිරිසක්, ඒ තෙරුන් වහන්සේ කළුරිය කළහයි සිතා, තණ, දර, ගොමරිටි ආදිය රැස් කොට ගිනි තැබූහ. එතකුදු වුවත් ඒ ගින්න උන්වහන්සේගේ සිවුරු කොනක් වත් දවන්නට සමත් නොවී ය. සිරුර ගැන කියනුම කවරේ ද. මෙසේ ගින්නෙන් නොදැවීම සඤ්ජීව තෙරණුවන්ගේ අනුපූර්ව සමාපත්ති වශයෙන් පැවති ශමථානු භාවයෙන් නිපන් හෙයින් **සමාධි විප්ඵාර ඍද්ධිය** නම් වේ. නිරොධ සමාපත්තියෙහි ආනුභාවය ගැන කවර කථා ද.

**ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ** ප්‍රකෘතියෙන් ම සමාපත්ති බහුල කෙනෙකි. උන්වහන්සේ දිනක් රාත්‍රි කාලයෙහි එක්තරා අරණ්‍යයක සමාපත්තියට සමවැද වැඩ හුන් සේක. එකල්හි පන්සියයක් පමණ වූ සොරු පිරිසක්, සොර බඩු පැහැර ගෙනයන්නේ එතැනට පැමිණ, දැන් අපලුහුබඳුනාහු නැතැයි සළකා, ගිමන් හරිනු කැමතිව ඒ ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන් කණුවෙකැයි සිතා, තෙරණුවන් මත බඩු පොදි සියල්ල තැබූහ. පසුව ගිමන් හැර යනු කැමතිවූ ඒ සොරු පිරිස බඩු පොදි නැවත ගන්නා කල්හි, පළමු තැබූ බඩු ගන්නා කෙණෙහි ම

තෙරුන් වහන්සේ සමවතට සමවැදීමේදී නියම කරගත් කාල පරිච්ඡේදයත් අවසන් වූ හෙයින් සමවතින් නැගී සිටි සේක. තෙරුන් වහන්සේ සෙලවෙනු දුටු ඒ සොරු පිරිස භයවී යකෙකැයි සිතා පලායන්නට විය. තෙරණුවෝ ද, භය නොවව්, උපාසකවරුනි, මම භික්‍ෂුවෙමි යි කීසේක. එකල්හි ඔව්හු තෙරුන් වෙත පැමිණ වැඳ, උන්වහන්සේ කෙරෙහි පැහැද, මහණව, සිව්පිළිසිඹියා පත් රහත් බවට පැමිණියාහ. මෙසේ පන්සියයක් පමණ වූ බඩු පොදි වලට යටවී කිසිදු පීඩාවක් නොවීම ඒ තෙරුන්ගේ **සමාධි විප්ඵාර ඍද්ධි** නම් වේ.

පුණ්ණක සිටුහුගේ දුහිතෘ වූ **උත්තරා උපාසිකාතොමෝ** නිතර මෛත්‍රී වඩන කෙනෙකි. දිනක් **සිරිමා** නම් වූ ගණිකාවක් ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් කබලෙහි කකාල තෙල් ඇගේ හිසෙහි වත් කළාය. උත්තරා උපාසිකාතොමෝ ද එකෙණෙහි ම මෛත්‍රී සමාධියට සමවත් හෙයින් පොකුරු පත දියත්තක් මෙන් තෙල් විසිර ගියේ ය. මෙසේ හුණු තෙලින් නොදැවීම උත්තරා උපාසිකාවගේ **සමාධි විප්ඵාර ඍද්ධිය** නම් වේ.

උදේනි රජහුගේ **සාමාවතී** නම් අගමෙහෙසියක් විය. මාගන්දිය නම් වූ බමුණු තෙම තම දියණියන් අගමෙහෙසි බවට පත් කරනු කැමති ව රජහුගේ වීණායෙහි නාගයෙකු බහා "මහරජ, සාමාවතිය ඔබ මරණු සඳහා වීණායෙහි නාගයෙකු බහාලන ලදැයි" රජුහට කීය. රජ තෙමේ ද, එය දැක කිපී සාමාවතිය මරමියි දුන්න ගෙන විෂපෙවූ හීයෙකින් විදින්නට තැත් කෙළේය. පන්සියයක් පමණ පිරිවර සහිත වූ සාමාවතිය රජු කෙරෙහි ඕදිස්සක මෛත්‍රී සමාපත්තියට සමවැද මෛත්‍රිය පතුරුවමින් සිටියා ය. එකල්හි රජ තෙමේ ද හීය විදින්නට හෝ බහා තබන්නට හෝ නොහැකිව වෙව්ලමින් සිටියේ ය. එවිට දේවිය "මහරජ කිම, පෙළෙන්නෙහිදැ" යි ඇසුවාය. "එසේය පෙළෙන්නෙමි" යි රජු කී කල්හි "එසේ නම් දුන්න බහා තබව" යි

සාමාවතිය කීවාය. එකල්හි ගිය පාමුලයෙහි ම පතිත විය. එවිට දේවිය නොකිපියාහට නොකිපෙවයි අවවාද කළාය. මෙසේ රජුට ගිය විදිනා නොහැකිවීම සාමාවතියගේ **සමාධි විප්ඵාර සෘධි** නම් වේ.

**6. ආර්‍ය්‍ය සෘධිය**:- පටික්කූලතාදී අනිෂ්ටාරම්මණ-යෙහි අප්පටික්කූල සඤ්ඤීව විසීම **ආර්‍ය්‍ය සෘධි** නම් වේ. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ පටික්කූලයෙහි අප්පටික්කූලව විසීම මැනවැයි සිතා ඒ පටික්කූල අරමුණෙහි අප්පටික්කූල සඤ්ඤීව වාසය කෙරේ. එසේම පටික්කූල අප්පටික්කූල අරමුණෙහි ෂඩඞ්ගාපෙක්ෂාවෙන් යුක්තව වාසය කෙරේ. මෙය රහතන් වහන්සේටම විෂය වන හෙයින් **ආර්‍ය්‍ය සෘධි** නම් වේ. මේ ආර්‍ය්‍ය සෘධියෙන් යුක්තවූ ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ පිළිකුල් වූ අනිෂ්ට වූ වස්තුවෙහි මෛත්‍රිය පතුරුවමින් හෝ ධාතුමනසිකාර වශයෙන් හෝ වාසය කරන සේක. පිළිකුල් නොවූ ඉෂ්ට වස්තුවෙහි අශුභ වශයෙන් හෝ අනිත්‍ය වශයෙන් හෝ මෙනෙහි කරමින් පටික්කූල සඤ්ඤීව වාසය කෙරේ. එසේම පටික්කූල අප්පටික්කූල දෙක්හි මෛත්‍රිය පතුරුවමින් හෝ ධාතු මනසිකාර වශයෙන් හෝ අප්පටික්කූල සඤ්ඤීව වාසය කෙරේ. අප්පටික්කූල පටික්කූල දෙක්හි අශුභ වශයෙන් හෝ අනිත්‍යය මෙනෙහි කරමින් හෝ පටික්කූල සඤ්ඤීව වාසය කෙරේ. ඇසින් රූපයක් දැක ගේහසිත ප්‍රේම වශයෙන් සොම්නස් නොව, ප්‍රතිඝ වශයෙන් දොම්නස් නොව ඉෂ්ටානිෂ්ට සියලු අරමුණෙහි පිරිසුදු ප්‍රකෘතිය නොහැරීම ලක්ෂණ කොට ඇති ෂඩ්ද්වාරයෙහි පැවති ෂඩඞ්ගාපෙක්ෂාව යයි කියන ලද තත්‍රමධ්‍යස්ථතායෙන් යුක්තව හෝ වාසය කෙරේ. මේ චිත්ත වශී භාවය රහතන් වහන්සේට ම ලැබෙන හෙයින් එයට **ආර්‍ය්‍ය සෘධිය** යි කියනු ලැබේ.

**7. කර්මවිපාකජ සෘධිය**:- සියලු පක්ෂීන්ගේ ද, දෙවි-යන්ගේ ද, ආදිකල්පික ඇතැම් මනුෂ්‍යයන්ගේ ද, ඇතැම් විනිපාතිකයන්ගේ ද, අහසින් යාම, පිරිසුදු ඇස් ඇති බව

යනාදිය **කර්මවිපාකජ සෘද්ධි** නම් වේ. මෙකී සත්ත්වයන්ගේ අහසින් යාම ආදිය අභිඥා පාදක ධ්‍යානයකින් හෝ උද්වේග ප්‍රීතිය සහිත වූ විදර්ශනාවකින් හෝ සිද්ධ වන්නෙක් නොවේ. එය කර්මවිපාකයාගේ වශයෙන් ලබන ලද සෘද්ධියකි.

**8. පුණ්‍යවන්තයන්ගේ සෘද්ධිය**:– චක්‍රවර්ති රජතෙම චතුරඞ්ගනී සේනාව ද, යටත්පිරිසෙයින් අස්ගොව්වන්, ගොපොල්ලන් ඇතුළු සියලු රජපිරිස් සමග අහසින් යාම යනාදිය පුණ්‍යවන්තයන්ගේ සෘද්ධිය වන බැවින් එයට **පුඤ්ඤවතො සෘද්ධිය** යයි කියනු ලැබේ. මෙය මේරූ පින් ඇති කල්හි සමෘද්ධ වන්නා වූ ආනුභාව විශේෂයකි.

**ජොතිය** නම් ගහපතිහට මාණික්‍යමය ප්‍රාසාදය හා සූසැටක් කප්රුක් මහපොළොව පළාගෙන නැගීම ඔහුගේ පුණ්‍යවත් සෘද්ධි නමි.

**ජටිල** නම් ගහපතිහට කොපමණ ගත්තේවී නමුත් නොගෙවෙන අසූරියන් සහ රන් පර්වතයක් පැන නැඟීම ඔහුගේ පුණ්‍යවත් සෘද්ධි නම් වේ.

**ඝොෂිත** නම් තැනැත්තා මරණු පිණිස සත් තැනෙක උපක්‍රම යෙදූ නමුත් කිසිදු දුකකට නොපැමිණ නිරෝගීව විසීම ඔහුගේ පුණ්‍යවත් සෘද්ධිය නම් වේ.

**මෙණ්ඩක** නම් තැනැත්තාට එක් සීරියක් පමණ තැන සත්රුවන්මුවා එළුවන් පැන නැගීම ඔහුගේ පුණ්‍යවත් සෘද්ධිය නම් වේ

තවද මහා **පිනැති පස්දෙනාගේ** සෘද්ධිය ද පුණ්‍යවත් සෘද්ධිය **නම්** වේ. ඔවුන් අතුරෙන්.

**මෙණ්ඩක සිටු** තෙම ඉස්සෝදා නහා අහස බැලූ කල දෙළොස්දහස් පන්සියයක් කොටුගුල් පුරවාලන පමණ රත්හැල් අහසින් බසියි.

ඔහුගේ භාර්‍යාව වූ **චන්ද්‍රා පද්ම ශ්‍රී දේවිය** සහල් නැළියකින් පිසූ බත්ගෙන මුළු දඹදිව වැසියන් අනුභව කරවුවත් බත් නිමාවට නොයේ.

ඔහුගේ පුත්‍රවූ **ධනඤ්ජය සිටාණෝ** දහසින් බැඳි පියල්ලක් ගෙන මුළු දඹදිව වැසියන්හට බෙදා දුන් නමුත් එය නිමාවට නො පැමිණෙයි.

ඔහුගේ ලේලිය වූ **සුමනා දේවිය** එක් වී තිඹක් ගෙන මුළු දඹදිව් වැසියනට දුන ද නිමාවට නො පැමිණෙයි.

ඔහුගේ **පුණ්ණ** නම් වූ දාසයා එක් නගුලක් ගෙන සෑ කල්හි ඔබින් මොබින් සීවැල් සත බැගින් සීවැල් තුදුසක් පෙනෙන්නේ ය. මේ මහා පිනැති පස්දෙනාගේ ඍද්ධිය නම් වේ.

9. **විජ්ජාමය ඍද්ධිය**:- විද්‍යාධරාදීන්ගේ මන්ත්‍ර බලයෙන් අහසින් යාම් ආදිය විජ්ජාමය ඍද්ධි නම් වේ. විද්‍යාධරයෝ ගන්ධාර විද්‍යාදී විද්‍යා ජපකොට මන්ත්‍ර කියා ඒ ආනුභාවයෙන් අහසින් යෙති. අහස්හි ඇතුන් අසුන් ආදී සිව්රඟ සෙනඟ දක්වති. මෙය ඔවුන්ගේ විද්‍යාමය ඍද්ධිය නමි.

10. **සම්මාපයොග පච්චය ඍද්ධිය**:- ඒ ඒ තන්හි සම්‍යක් ප්‍රයෝගයෙන් කැමති දෙය සමෘද්ධිවීම ඒ ඒ කට-යුත්තෙහි මනාව යෙදීමට හේතු වන හෙයින් සම්මාපයොග පච්චය ඉද්ධි නම් වේ. නෛෂ්ක්‍රම්‍යයෙන් නොහොත් ප්‍රථම ධ්‍යානයෙන් කාමච්ඡන්ද ප්‍රහාණය කිරීම් නම් වූ අර්ථය සිඩවන හෙයින් ඍද්ධි නම් වේ. රහත් මගින් සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය කිරිම නම් වූ අර්ථය සිඩ වන හෙයින් ද ඍද්ධි නම් වේ.

මේ ආදී වශයෙන් සම්‍යක් උපාය යෙදීම යයි කියන ලද ප්‍රතිපත්තියෙන් අභිමතාර්ථය සිඩ කර ගැනීමට හැකි වන පරිදි පැවති ක්‍රමානුකූල ප්‍රතිපත්තියෙන් සමෘඩ වන හෙයින් **සම්මාපයොග පච්චය ඍද්ධිය** යයි කියනු ලැබේ.

යම්කිසි ගණිත ගන්ධබ්බාදී ශිල්පයක් හෝ වෛද්‍ය කර්මයක් හෝ ඍග්වේදාදී ත්‍රිවේදය හෝ ත්‍රිපිටක ධර්මය හෝ ඉගෙනීමක් හෝ යටත්පිරිසෙයින් සීසෑම්, වැපිරීම් ආදිය පටන් ඒ ඒ කර්මාන්ත කොට හටගත් විශේෂය ඒ ඒ කටයුත්තෙහි **සම්‍යක්** ප්‍රයෝග ප්‍රත්‍යය යෙන් සමෘද්ධ වන හෙයින් ද **ඍද්ධිය** යයි කියනු ලැබේ.

මේ දශවිධ ඍද්ධීන් අතුරෙන් මෙහිදී **ඍද්ධිවිධ ඥානය** යන්නෙන් අදහස් කරණු ලබන්නේ **අධිෂ්ඨාන ඍද්ධිය** ය. **විකුර්වණ ඍද්ධිය මනෝමය ඍද්ධිය** ද කැමති විය යුතු යයි ද කියන ලදී.

## අධිෂ්ඨාන ඍද්ධිය

මෙසේ **ඍද්ධිවිධ ඥානය** ලබනු කැමති යෝගාවචර තෙම අනේකවිධ වූ ඍද්ධි කොට්ඨාසය නුවණින් මෙනෙහි කරයි. හෙතෙමේ ප්‍රකෘතියෙන් හුදකලාව සිට පසුව සිය දහස් ගණනින් බොහෝ වෙයි. බොහෝ ව එකෙක් වෙයි. එසේ වීමට පෙර ඔහු විසින්—

1. ඍද්ධියට සුදුසු **භූමි සතර** ය,
2. පිහිටීමට සුදුසු **පාද සතර** ය,
3. හේතු වූ **කාරණා** හෙවත් **පද අට** ය,
4. **මුල් සොළොස** ය යන මේය සම්පාදනය කොට නුවණින් අධිෂ්ඨාන කොට ඍද්ධිය උපදවා ගත යුතු.

ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන සතර**භූමි සතර** ය. ඒ මෙසේ යි:-

**1. ප්‍රථම ධ්‍යානය:-** පඤ්චනීවරණයන්ගේ විෂ්කම්භණයෙන් හටගත් හෙයින් විවේකජ භූමි නම් වේ.

**2. ද්විතීය ධ්‍යානය**:- ප්‍රීති, සුඛ, සහජාත හෙයින් **පීති සුඛ භූමි** නම්.

**3. තෘතීය ධ්‍යානය**:- උපෙක්ඛා සුඛ සහජාත හෙයින් **උපෙක්ඛාසුඛ භූමි** නම්.

**4. චතුර්ථ ධ්‍යානය**:- උපෙක්ඛා සහජාත හෙයින් **අදුක්ඛමසුඛ භූමි** නම් වේ.

මේ සතර ධ්‍යානයෝ ඍද්ධිය ලැබීම පිණිස ද, ඍද්ධියගේ නැවත නැවත ලැබීම පිණිස ද, විවිධ රූප මැවීම නම් වූ ඍද්ධි විකුර්වණය පිණිස ද, නොයෙක් ආනිශංස ලැබීම නම් වූ ඍද්ධි-විසවිතාය පිණිස ද, බිපපනිසනානි භාවය හෙවත් වහා ධ්‍යානයට පැමිණීම් සඞ්ඛ්‍යාත වශීභාවය පිණිස ද, ප්‍රතිපක්‍ෂ ධර්මයන් දුරු කිරීමෙන් විසාරද බව පිණිස ද පිහිට වන බැවින් **භූමි** නම් වේ. ප්‍රථම, ද්‍විතීය, තතිය ධ්‍යානයන්ට සමවැදීමෙන් ක්‍රමයෙන් ප්‍රීතිය පැතිර වීමෙන් ද, සැප බවට පැමිණීමෙන් ද, සුඛ සංඥව ලැබීමෙන් ද, සිත සැහැල්ලු බවට පැමිණීමෙන් ද සිත හාත්පසින් දමනය වේ. "එහෙයින් එයට **සමභාර භූමි** යයි කියනු ලැබේ. චතුර්ථ ධ්‍යානය සුවසේ ඍද්ධි ප්‍රතිලාභය පිණිස පවත්නා හෙයින් **ප්‍රකෘති භූමි** නම් වේ.

**සතර පාදයෝ** නම් ඍද්ධිපාදයෝ සතර දෙනා ය. ඒ සතර දෙනා නම්:-

**1. ඡන්‍දසමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය,**

**2. විරිය සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය,**

**3. චිත්ත සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය,**

**4. වීමංසා සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය.**

මෙහි **ඡන්‍ද සමාධිය** නම් පූර්වභාගයෙහි පැවති කත්තු-කම්‍යතා කුසලච්ඡන්‍දය හේතුකොට ඇත්තා වූ චිත්තයාගේ එකග්‍රතාවය යි.

ප්‍රධාන වූ හෝ ශ්‍රෙෂ්ඨ වූ හෝ චතුර්විධ වීර්‍ය්‍යය හෙවත් නූපන් අකුසල් නූපදීම පිණිස වෑයම් කිරීම ය, උපන් අකුසල් ප්‍රහාණය පිණිස වෑයම් කිරීම ය, නූපන් කුසල් ඉපදීම පිණිස වෑයම් කිරීම ය, උපන් කුසල් වැඩීම පිණිස වෑයම් කිරීම ය යන මේ ධර්මයෝ **ප්‍රධාන සංස්කාරයෝ** නම් වෙත්. අභිමතාර්ථය සිද්ධකරන අර්ථයෙන් ඍද්ධි නම් වූ අභිඥා සිතෙහි යෙදුණු ඡන්දසමාධි ප්‍රධාන සංස්කාරයන්ට ආධාරාර්ථයෙන් සෙසු චිත්ත චෛතසික සමූහය පාදයක් වූයේනුයි **ඉද්ධිපාද** නම් වේ. එ බැවින් ඡන්දාදී ධර්මයන් ලබමින් සිටියහුගේ **වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ** යන සතර නාමස්කන්ධයෝ **ඍද්ධිපාද** නම් වෙත්. මෙසේ ඡන්ද සමාධියෙන් හා ප්‍රධානසංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය, **ඡන්ද සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය** නම් වේ. මෙ පරිද්දෙන් ම විරිය සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය, **විරිය සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය** යයි ද, චිත්ත සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය, **චිත්ත සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය** යයි ද, වීමංසා හෙවත් ප්‍රඥා සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය, **වීමංසා සමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය** යයි ද දත යුතු. මේ සතර ඍද්ධිපාදයෝ ඍද්ධියගේ විසාරද බව පිණිස පවතිත්.

ඉද්ධි ප්‍රතිලාභය පිණිස පවත්නා ඡන්දාදී සතර ද, ඒ සතර හා යෙදුණු එකග්ගතා සතර ද යන අට දෙන **ඉද්ධිපාද** නම් වෙත්. **ඡන්ද සමාධිය** යයි කී කල්හි **ඡන්දය** සමාධි නම් නොවේ. එසේම **සමාධිය** ඡන්දය නොවේ. **ඡන්දය** එක් ධර්මයෙක. **සමාධිය** එක් ධර්මයෙක. මෙසේ ම **විරිය සමාධිය** යයි කී කල්හි **විරිය** එක් ධර්මයෙක, **සමාධිය** එක් ධර්මයෙක. **චිත්ත සමාධිය** යයි කී කල්හි චිත්තය එක් ධර්මයෙක, **සමාධිය** එක් ධර්මයෙක, **වීමංසා සමාධිය** යයි කී කල්හි **වීමංසාව** හෙවත් ප්‍රඥාව එක් ධර්මයෙක, **සමාධිය එක්** ධර්මයෙක. මෙසේ **ඉද්ධිපාදයෝ** අට දෙනෙක් වෙති.

ඡන්දය සමාධියෙන් වෙන් ව ද, සමාධිය ඡන්දයෙන් වෙන් ව ද ඍද්ධිය නිපදවීමට අසමර්ථ වන හෙයින් ඉද්ධිපාද නොවේ. නමුත් එක් ව උපදනා ඡන්දාදී සතර හා එකග්ගතා සඞ්ඛ්‍යාත සමාධිය ද ඍද්ධි ප්‍රතිලාභයට සමත් වන හෙයින් **ඉද්ධිපාද** නම් වෙත්.

ධ්‍යාන සිත ආනෙඤ්ජතායෙන් හෙවත් නොසැලෙනසේ පවත්නා ධර්ම සොළොස, **සොළොස් මූල** නම් වෙත්.

ඒ සොළොස් ධර්මයෝ නම්:-

1. **වීර්‍යයෙන් වඩනා සිත** කොසජ්ජයෙන් හෙවත් කුසීත බැවින් නොනැමුණු හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

2. **සන්සුන් වූ සිත** උද්ධච්චයෙන් උඩට නොනගන ලද හෙයින් ආනෙඤ්ජ නම් වේ.

3. **අරමුණෙහි නොඇලුණු සිත** රාගයෙන් නො-සැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

4. **ක්‍රෝධයෙන් දූෂණය නොවූ සිත** ව්‍යාපාදයෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

5. **දිට්ඨියෙන් අල්වා නොගන්නා ලද සිත** මිථ්‍යා-දෘෂ්ටියෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

6. **ඡන්දරාගයෙන් නොබැඳුණු සිත** ඡන්දරාගයෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

7. **කාමරාගයෙන් මිදුණු සිත** කාමරාග නිමිත්තෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

8. **සතර යෝගයන් ගෙන් වෙන් වූ සිත** කෙලෙස් නිමිත්තෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ,

9. **බලපෑ වූ කෙලෙස් කොටසින් නොසැලෙන සිත** කෙලෙස් සීමාවෙන් කම්පා නොවන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

10. **එකඟ බවට පැමිණි සිත** නොයෙක් කෙලෙසුන් ගෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

11. **ශ්‍රද්ධාවෙන් රුකුල් දෙන ලද සිත** අශ්‍රද්ධාවෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

12. **වීර්‍ය්‍යයෙන් රුකුල් දෙන ලද සිත** කුසීත බැවින් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

13. **ස්මෘතියෙන් රුකුල් දෙන ලද සිත** ප්‍රමාදයෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

14. **සමාධියෙන් රුකුල් දෙන ලද සිත** උද්ධච්චයෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

15. **ප්‍රඥාවෙන් රුකුල් දෙන ලද සිත** දුර්වල අවිද්‍යා වෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

16. **ඕභාසගත සිත** අවිද්‍යාන්ධකාරයෙන් නොසැලෙන හෙයින් **ආනෙඤ්ජ** නම් වේ.

මෙකී සොළොස් ධර්මයෝ සෘද්ධිහුගේ නොසැලීම පිණිස පවත්නා හෙයින් **සෘද්ධි මූලයෝ** නම් වෙත්.

යෝගාවචර තෙමේ සෘද්ධිය ලැබීමට උපකාර වන මූල ධර්මයන් මෙසේ සකස් කොට, අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී සියයක් වනු කැමති නම් සියයක් වෙමියි කාමාවචර සිතින් මෙනෙහි කිරීමෙන් පරිකර්ම කොට නැවත ආවර්ජනා කොට අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, එයින් නැගී, සියයක් වෙමියි අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨාන චිත්තය හා සමගම සියයක් වේ. මෙසේ දහසක් වනු කැමති නම් මේ ක්‍රමය ම පිළිපැදිය යුතු. මෙයින් අභිමතාර්ථ සිද්ධිය නොවූයේ නම්, නැවත නැවත පරිකර්ම කොට අභිමතාර්ථය සිද්ධ වන තෙක් අධිෂ්ඨාන කළ යුතු.

**මහාපන්ථක, චූලපන්ථක** යයි දෙබෑ කෙනෙක් වූහ. පන්ථයෙහි හෙවත් මාර්ගයෙහි උපන් හෙයින් පන්ථක නම් වීය. වැඩිමහලු **මහාපන්ථක** තෙම මහණව සිව්පිළිසිඹියාපත් රහත් බවට පැමිණි සේක. උන්වහන්සේ පසුව **චූලපන්ථක** යන් ද මහණ කරවා—

> **"පදුමං යථා කොකනදං සුගන්ධං**
> **පාතො සියා ඵුල්ල මවීත ගන්ධං**
> **අඞ්ගීරසං පස්ස විරොචමානං**
> **තපන්ත මාදිච්ච මිවන්තලික්ඛෙ."**

යන මේ ගාථාව ඉගෙණීමට භාර කළ සේක. එහි අදහස නම්, කොකනද නම් වූ බොහෝ පෙති ඇති, මනා සුවඳ ඇති හෙළපියුම හිරු උදාවන කල්හි යම්සේ සුගන්ධයෙන් වෙන් නොවී බබලා ද, එපරිද්දෙන් ම ශරීර ගන්ධයෙන් හා ගුණ ගන්ධයෙන් ද සුගන්ධ ඇතිව සරත් කාලයෙහි අහසෙහි බබලන සූර්‍ය්‍යා මෙන් තමන්වහන්සේගේ තේජසින් යුක්තව බබලන්නා වූ අඞ්ගීරස නම් සම්මා සම්බුදුන් වහන්සේ බලව" යනු යි. චූලපන්ථක තෙමේ සාරමසක් උත්සාහ කළ නමුත් මේ ගාථාව ඉගෙණීමට අසමර්ථ විය. මහාපන්ථක තෙරණුවෝ ඔහු කැඳවා, "ඇවැත්නි, මේ ශාසනය ප්‍රතිපත්ති සාරය. ප්‍රතිපත්ති පර්‍ය්‍යාප්තිය මුල් කොට ඇත්තේ ය. ඔබ ඒ පර්‍ය්‍යාප්තිය ඉගෙණීමට අසමර්ථය. එහෙත් මේ ශාසනයෙහි නුඹ අභව්‍යයෙකැ"යි විහාරයෙන් බැහැර කර වූ සේක. එකල **මහාපන්ථක** ස්ථවිරයන් වහන්සේ භත්තුද්දෙසක තනතුර ලැබ සිටි සේක. ජීවක තෙම විහාරයට පැමිණ, "ස්වාමීනි, සෙට දින භාග්‍යවතුන් වහන්සේත් සමග පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේ ගෙන අප නිවසට භික්ෂාව පිණිස වඩින සේක්වා" යි ආරාධනා කෙළේය. ස්ථවිර තෙමේ ද චූලපන්ථක තෙරුන් හැර අනික් බුදුපාමොක් සංඝයා වෙනුවෙන් ආරාධනය පිළිගත් සේක. චූලපන්ථක තෙමේ ද වැඩිමහළු තෙරුන් කළකිරුණු බව දැන විහාර

දෙරටුවට විත් හඬමින් සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ බව දිවැසින් දැක එතැනට වැඩ, "කුමක් හෙයින් හඬන්නේද" යි ඇසූ සේක. චූලපන්ථක තෙමේ ද සියලු පවත් දැන්වූයේ ය. "සජ්ඣායනා කිරීමට නොහැකි වූ පමණින් මාගේ ශාසනයෙහි අභව්‍යයෙක් නම් නොවේ. භික්ෂුව නොහඬවයි," වදාරා, එතැනින් බැහැර කොට ගෙන විහාරයට ගොස් සෘද්ධියෙන් මැවූ පිරිසුදු රෙදි කඩක් අතට දී මෙය පිරිමදිමින් "රජෝ හරණං, රජෝ හරණං" යයි නැවත නැවත සජ්ඣායනා කරව යි වදාළ සේක උන්වහන්සේ ද ඒ රෙදිකඩ පිරිමැදීමේ දී අත තිබූ ඩහදිය ගෑවීමෙන් කිලුටු වූ බව දැක "මේ රෙදිකඩ පිරිසුදු ය, එහි දොසක් නැත. දෝෂය ඇත්තේ මාගේ අතෙහි ය" යනාදී වශයෙන් සංඥව ලැබ පඤ්චස්කන්ධයෙහි දොස් දැකීමේ නුවණ උපදවා විදර්ශනා වඩා පිළිවෙළින් අනුලොම ගොත්‍රභූ ඥානය සමීපයට සිත පැමිණි කල්හි භාග්‍යවතුන් වහන්සේ ආලෝකය පතුරුවා මේ ගාථා වදාළ සේක:-

"රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති
එතං රජං විප්පජහිත්‍වා පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ."

"දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති
එතං රජං විප්පජහිත්‍වා පණ්ඩිතා
විහරන්ති තෙ විගත රජස්ස සාසනෙ."

"මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති
එතං රජං විප්පජහිත්‍වා පණ්ඩිතා
විහරන්ති තෙ විගත රජස්ස සාසනෙ."

මෙහි අර්ථය නම්:–

රාගය රජසය. මේ ආයතී විනයෙහි දූලි රජසැයි නොකියයි. රාගයට රජසයයි විශිෂ්ට නමෙකි. සිත කිලුටු කරන හෙයින් මේ රාග රජස ආයතී මාර්ගඥනයෙන් පහ කොට ආයතීයන් වහන්සේලා වීතරජස්ක සර්වඥ ශාසනයෙහි සිත් අලවා වෙසෙති.

එසේම ද්වෙෂය ද රජස් වෙයි, මොහය ද රජස් වෙයි.

මේ ගාථා දේශනාවශානයෙහි චූලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිව්පිළිසිඹියා හා ෂඩ්භිඥලාභීව අර්හත්වයට පැමිණි සේක. දෙවන දවස්හි භාග්‍යවතුන් වහන්සේ, භික්ෂුසංඝයා වහන්සේ සමග ජීවකයාගේ නිවසට වැඩිසේක්, ජීවකයා වඩාහිඳුවා දක්ෂිණෝදකය පිරිනැමූ කල අතින් පාත්‍රය වැසූ සේක. ජීවක තෙම ඒ කිම් දැයි විචාළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ, “උපාසකය, විහාරයෙහි එක් භික්ෂුවක් ඇතැයි” වදාළහ. ජීවක තෙමේ “විහාර-යෙහි වූ භික්ෂුව වහා කැඳවා ගෙන එව” යි පුරුෂයෙකු යැවී ය. බුදුරජාණන් වහන්සේ විහාරයෙන් වැඩි පසු චූලපන්ථක ස්ථවිරයන් වහන්සේ තමා වැනි රූප දහසක් අභිඥපාදක සිතින් මවාගෙන, රම්‍යවූ ඒ අඹ වනයෙහි කල් දන්වන තෙක් වැඩ සිටි සේක. විහාරයට පැමිණි ඒ පුරුෂයා කාෂාය වස්ත්‍රයෙන් බබලන විහාරය දැක ආපසු ඇවිත් ඒ බව දන්වා ඒ භික්ෂුව කවරෙක් දැයි නොදනී යි කීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට කථා කොට, “නුඹ නැවත විහාරයට ගොස් පළමු දුටු භික්ෂුවගේ සිවුරු කොණ අල්වා, “බුදුන්වහන්සේ ඔබවහන්සේ ඇමතූහයි කියවයි” වදාළහ. හෙතෙමේ ද වෙහෙරට ගොස් පළමු දුටු තෙරුන්වහන්සේගේ සිවුරු කොණ අල්ලා ගත් කල නිර්මිත කළ සියලු දෙනාම අතුරුදන් වූහ. තෙරුන්-වහන්සේ ද ඔහු යවා මුව ධෝවනාදී ශරීරකෘත්‍යයන් නිම කොට ඔහුට පෙරටුව වැඩ පණවන ලද අසුන්හි වැඩහුන් සේක.

ඒ නිර්මිත භික්ෂූහු වර්‍ණ, ශරීරාවයව, පරිෂ්කාර, ක්‍රියා විශේෂාදීන් නියම නොකොට මැවූ හෙයින් සෘඬිමතුන් හා සමාන වෙති. සිටීම් හිඳීම් ආදීවූ ද, කථා කිරීම්, තුෂ්ණීම් භූතවීම් ආදී වූ ද සෘඬිමතුන් කරන ක්‍රියාවන් නිර්මිත භික්ෂූහු ද කෙරෙත් මැයි.

ඉදින් නා නා වර්‍ණාදි වශයෙන් නිර්මිත කරණු කැමති වේ නම් එනම්:- ඇතැම් කෙනෙකුන් ප්‍රථම වයස්හිවූවන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් මධ්‍යම වයස්හිවූවන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් පශ්චිම වයස්හිවූවන් මෙන් ද, ඇතමෙක් දික් වූ කෙස් ඇතියවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් හිස මුඬු කළවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් කළු කෙස් ඇතියවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් මනාව රැඳු සිවුරු ඇත්තවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් මඳක් රැඳු සිවුරු ඇත්තවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් පද කියන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් අර්‍ථ කියන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙ-කුන් උස් ස්වරයෙන් කියන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් ප්‍රශ්න කරන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් ප්‍රශ්න විසඳන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් පඬු පිසනවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් පඬුපොවන්නවුන් මෙන් ද, ඇතැම් කෙනෙකුන් සිවුරු මසන්නවුන් මෙන් ද යනාදී වශයෙන් මවනු කැමති නම් – ඔහු විසින් පළමු කොට පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී මෙතෙක් භික්ෂූහු ප්‍රථම වයස්හි වූවාහු වෙත්වා යනාදී වශයෙන් පරිකර්‍මකොට නැවත සමාපත්තියට සමවැද එයින් නැගී අධිෂ්ඨාන කළ යුතු. ඒ අධිෂ්ඨාන සිත හා සමගම කැමති කැමති ආකාරම වේ.

බොහෝවැ එකකුවීමෙහි ද මේ ක්‍රමය ම වේ. එහි විශේෂය නම්:- මේ භික්ෂුව මෙසේ බොහෝ කොට මවා නැවත එකකුව සක්මන් කරමැයි කියා හෝ සජ්ඣායනා කරමැයි කියා හෝ ප්‍රශ්න අසමියි කියා හෝ මේ භික්ෂූන්

ස්වල්ප දෙනෙකුන් ඇති විහාරයෙක, කෙසේ බොහෝ වී ද, ඒකාන්තයෙන් මෙය ආයුෂ්මත් වහන්සේගේ ආනුභාවයකැ යි සිතා මා හැඳින ගනිතැ යි, අල්පෙච්ඡ බැවින් හෝ එකෙක් වන්නෙමැයි කැමති වන්නාහු විසින් පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී "එකෙක් වෙමි" යි පරිකර්ම කොට නැවත ධ්‍යානයට සමවැද, එයින් නැගී එකෙක් වෙමි යි අධිෂ්ඨාන කළ යුතු. ඒ අධිෂ්ඨාන සිත හා සමගම එකෙක් වේ. මෙසේ නොකෙළේවී නමුත් කාල නියමයක් ඇතිව අධිෂ්ඨාන කරන හෙයින් ඒ කාලය ගතවීම සමගම බොහෝ කොට නිර්මිත කළ රූප අතුරුදන් වෙයි.

තවද මේ ඍද්ධිවිධ ඥානය උපදවාගත් පුද්ගලයාහට කැමති කල්හි **ආවිර්භාවය** හෝ **තිරෝභාවය** උපදවාගත හැකිවේ. **ආවිර්භාවය** නම් භිත්ති පවුරු ආදී කිසිවෙකින් මුවහ නොවී, පිළිසන් නොවී, විවෘතව ප්‍රකටවීමයි. **තිරෝභාවය** නම් භිත්ති පවුරු ආදී කිසිවකින් මුවහවී පිළිසන්වී, වසන ලද ආකාරයෙන් හෝ මුතින් වසන ලද ආකාරයෙන් හෝ අප්‍රකට වීමයි. එසේ ප්‍රකට කරනු කැමති යෝගාවචර තෙම පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී "මේ අන්ධකාර තැන ආලෝක වේවා"යි කියා හෝ "මේ මුවහවූ දෑය ප්‍රකට වේවා"යි කියා හෝ "මේ දුර වූ දෑය ලංවේවා"යි කියා හෝ යනාදී වශයෙන් කැමති පරිද්දෙන් ආවර්ජනා කොට, පරිකර්ම භාවනා කොට අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨානයට අනතුරුව ම එසේ ම වන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ, චූලසුභද්‍රාවගේ ආරාධනය පිළිගෙන, සැවැත් නුවර සිට සාකෙත නුවරට වඩනට වන් කල්හි සක්දෙව් රජහුගේ නියමයෙන් විස්කම් දෙව්පුත් තෙමේ සත්යොදුනක් පමණ වූ මාර්ගයෙහි පන්සියයක් පමණ වූ කුළු ගෙවල් මැවී ය. බුදුන්වහන්සේ ද එහි වැඩ සිට සාකෙත නුවර වැස්සන් විසින් සැවත් නුවර වැස්සන් ද, සැවැත් නුවර වැසියන් විසින් සාකෙත නුවර

වැසියන් ද ඔවුනොවුන් දක්නාසේ අධිෂ්ඨාන කළ සේක. සාකෙත නුවර මැදට වැඩ පොළොව දෙබෑකොට අවීචි මහනිරය තෙක් දක්වූ සේක. ආකාශය දෙබෑකොට එහි වූ විමානයන් ද, බඹලොව තෙක් දක් වූ සේක.

**දේවෝරෝහණයෙකි ද** මේ කාරණය ප්‍රකට වේ. අපගේ භාග්‍යවතුන් වහන්සේ යමක මහා ප්‍රාතිහාර්‍ය්‍ය පවත්වා අසූසාරදහසක් ප්‍රාණීන් සංසාර බන්ධනයෙන් මුදවා, අතීත බුදුවරු යමාමහ පෙළහර දවස්හි පෙළහර කොට කොහි වැඩි සේක් දැයි ආවර්ජනා කරණුයේ, තව්තිසා භවනයට වැඩි බව දුටු සේක. අප බුදුරජාණන් වහන්සේ ද එක් පියවරක් පොළොවෙහි තබා දෙවන පියවර යුගන්ධර පර්වත මුදුනෙහි තබා නැවත පළමු පියවර ගෙන මහමේරු පර්වත මස්තකයෙහි තබා එහි වූ පණ්ඩුකම්බල ශෛලාශනයෙහි වස් සමාදන් ව එහි රැස්වූ දසදහසක් සක්වළ දෙව් බඹුන්හට අභිධර්ම දේශනාව මුල පටන් දේශනා කරන්නට ආරම්භ කළ සේක. භික්ෂාචාර වේලාවෙහි නිර්මිත බුදු කෙනෙකුන් මවා ඒ බුදුහු මෙතෙක් ධර්ම දෙසත්වායි අධිෂ්ඨාන කොට නාගලතා දැහැටි දඬු වළඳා අනවතප්ත විලින් මුව දෙවා, උතුරුකුරු දිවයිනට පිඬු සිඟා වැඩ අනවතප්ත විල් ඉවුරෙහි වැඩහිඳ දන් වළඳති. සැරියුත් මහා තෙරණුවෝ එතැනට වැඩ බුදුන් වැඳි කල්හි "අද මෙතෙක් දම් දෙසීමි"යි නය ක්‍රමය උන්වහන්සේට වදාරති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නොකඩ කොට තුන්මසක් මුළුල්ලෙහි අභිධර්ම දේශනා කළ සේක. ඒ ධර්මය, ඇසූ අසූකෙළක් පමණ දෙවියන්ට ධර්මාභිසමය වූහ. යමාමහ පෙළහර දවස්හි දොළොස් යොදුනක් පමණ තැන් රැස්ව සිටි පිරිස බුදුන් වහන්සේ දැකම යන්නෙමු යි කඳවුරු බැඳ එහි ම සිටියාහ. අනේපිඬු සිටාණන්ගේ බාල සොහොයුරු වූ චුල්ල අනේපිඬු සිටාණෝ ඒ පිරිසට සියලු ප්‍රත්‍යයයෙන් උපසථාන කළෝ ය. මහාජනයා ද භාග්‍යවතුන් වහන්සේ කොහි වැඩිසේක් දැයි දැනගනු කැමතිව අනුරුද්ධ මහතෙරුන් අයැද සිටියාහ.

අනුරුද්ධ තෙරණුවෝ ද ඕදාත කසිණයට සමවැද ආලෝකය පතුරුවා දිවැසින් බලා වස්විසීම සඳහා දෙව්ලොව වැඩි බව දැක මහාජනයාට ඒ බව ප්‍රකාශ කළ සේක. මහජන තෙමේ බුදුන් දැක වඳිනු කැමතිව ඒ බව මහමුගලන් මහ තෙරුන්ට කීහ. මුගලන් මහතෙරණුවෝ ද ඒ පිරිස මැද මහා පොළොව කිමිද මහාජනයාට පෙනෙන සේ මහාමේරු පර්වතය විනිවිදගෙන තථාගත පාදමූලයෙහි බුදුන් පා වඳිමින් ම පාමුලින් නැගී බුදුන්වහන්සේට මෙසේ සැල කළ සේක, "භාග්‍යවතුන් වහන්ස, ජම්බුද්වීපවාසීහු බුදුන් දැක වැඳම යන්නමෝ යයි කියා සිටිනාහ." කීහ. එකල්හි බුදුහු "මොග්ගල්ලානය, ඔබගේ දෙටු බෑ ධම්සෙනෙවි මහසැරියුත් තෙරණුවෝ කොහිදැ"යි විචාරා, "ස්වාමීනි, සංකස්ස නගරයෙහි යයි" කී කල "මොග්ගල්ලානය, මා දකිනු කැමැත්තෝ සෙට දින සංකස්ස නගරයට පැමිණෙත්වා. සෙට මහාපවාරණ පුණු පොහෝ දින බැවින් මම සංකස්ස නුවරට බසින්නෙමි"යි වදාළ සේක. යහපත ස්වාමීනි යි මුගලන් මහතෙරණුවෝ දසබලධාරීන් වහන්සේ වැඳ ආ මගින් ම නැවත බැස මිනිසුන් සමීපයට පැමිණි සේක. තෙරුන් වහන්සේ ද ඒ ගමනාගමනය කාලයෙහි යම්සේ මිනිසුන් දකි ද එසේ අධිෂ්ඨාන කළ සේක. මෙය මුගලන් මහතෙරුන්ගේ **ආවිභාව ප්‍රාතිහාර්‍ය්‍ය** විය. එසේ වැඩ එපවත් මහජනයාට දන්වා ගමන දුරයයි නොහඟවා පෙරබත් කිස නිමවාම යවයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සක්දෙව් රජුට කථාකොට "සෙට දවස මිනිස්ලොව යන්නෙමි"යි දැන් වූ සේක. සක්දෙව් රජහු විස්කම් දෙව් පුතුන් අමතා, "දරුව, සෙට භාග්‍යවතුන් වහන්සේ මිනිස් ලොව වඩනා සේක. එහෙයින් හිණිපෙති තුනක් නිර්මිත කරව. එකක් රනින් ද, එකක් රිදීයෙන් ද, එකක් මාණික්‍යයෙන් ද සකස් කරව"යි අණ කෙළේ ය. විස්කම් දෙව්පුත් තෙමේ ද එසේම මැවීය. භාග්‍යවතුන් වහන්සේ, දෙවන දවසෙහි

මහමෙර මුදුනේ සිට පෙරදිග ලෝකධාතුව බලා වදාරණ සේක් නොයෙක් සියදහස් චක්‍රවාටයන් විවෘතව ඒකාඞ්ගණයක් මෙන් ප්‍රකටවී ය. එසේම පශ්චිම දිග්භාගය ද, දකුණු දිග්භාගය ද යන සියලු දිගුත් ම ප්‍රකටවී ය. එසේ ම යට අවීචිය දක්වා ද, උඩ අකනිටා බඹලොව දක්වා ද පෙනී ගියහ. මෙසේ එ දින ලෝක විවරණ නම් මහා ප්‍රාතිහාර්‍ය්‍යයක් වී ය. මනුෂ්‍යයෝ දෙවියන් දකිති, දෙවියෝ මිනිසුන් දකිති. මනුෂ්‍යයෝ උඩ නොබලා ම දෙවියන් බලති. දෙවියෝ බිම නොබලාම මිනිසුන් දකිති. ඔවුනොවුන් සම්මුඛව බලන්නාක් මෙන් දකිති. භාග්‍යවතුන් වහන්සේ මැද වූ මාණික්‍යමය හිණිමගින් බස්නා සේක. වම්පස රන්හිණිමගින් කාමාවචර දෙවියෝ සදෙනක් බස්නාහ. දකුණුපස රිදී හිණිමගින් සුඬාවාස බ්‍රහමයෝ හා මහා බ්‍රහමයෝ ද බස්නාහ, සක්දෙව් රජු බුදුන්වහන්සේගේ පාසිවුරු ගෙන ආහ. මහාබ්‍රහමයා තුන් යොදුන් පමණ සේසතක් ද, සුයාම දෙවියෝ වල්විදුනා ද, පඤ්චසිඛ ගාන්ධර්ව පුත්‍රයෝ තුන්යොදුන් වේලුව පාණ්ඩු වීණාව ද ගෙන තථාගතයන් වහන්සේට පූජා පවත්වමින් බස්නාහ. එ දින භාග්‍යවතුන් වහන්සේගේ ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක බුදු බව නොපැතූ කෙනෙක් නම් නැත. මෙය බුදුන්වහන්සේගේ **ආවිභාව ප්‍රාතිහාර්‍ය්‍ය** නම් වන්නේ ය.

ලක්දිව තලගුරු විහාරවාසී **ධම්මදින්න** නම් තෙරණුවෝ තිස්සමහාවිහාරයෙහි චෛත්‍ය මලුයෙහි වැඩහිඳ **අපණ්ණක පටිපදා** සූත්‍රයෙන් දම්දෙසනුවෝ විජිනිපත සටිකුරු කළ කල්හි අවීචිය තෙක් ඒකාඞ්ගණයක් මෙන් ප්‍රකට විය. එය උඩුකුරු කළ කල්හි බඹලොව තෙක් ඒකාඞ්ගණයක් මෙන් ප්‍රකට විය මෙසේ නිරය දුකින් තැතිගන්වා, දිව්‍ය සැපයෙහි සිත් අලවා දහම් දෙසන කල්හි ඇතැම් කෙනෙක් සෝවාන් වූහ, ඇතැම් කෙනෙක් සකෘදාගාමී, අනාගාමී සහ අර්හත්ඵලයට ද පැමිණියහ. මෙය ද **ආවිභාව ප්‍රාතිහාර්‍ය්‍ය** නම් වේ.

**තිරොභාවය** හෙවත් මුවහ කරණු කැමති සෘද්ධිමත් පුද්ගල තෙම ආලෝකය නැතිකොට අන්ධකාරය ඇති කරයි. නොවැසුනු දූය හෝ වසයි. ලංවූ දූය හෝ ඈත් කරයි.

තමා හෝ අන්‍යයෙක් හෝ ළඟ සිටියේ ද නොදක්වනු කැමැත්තහු විසින් පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී "මේ ආලෝකය අන්ධකාර වේවා"යි හෝ පිළිසත් නොවූව පිළිසත් වේවා"යි කියා හෝ ලංවූ දූය ඈත් වේවා යි කියා හෝ ආවර්ජනා කොට පරිකර්ම භාවනා කොට පළමු කී පරිදි අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨාන චිත්තය හා සමග එසේ ම සිදු වේ. එකල්හි අන්‍යයෙක් ළඟ සිටියේ ද නොදකී. තමා ද නොදක්වනු කැමති නම් එසේ ම වෙයි.

**භාග්‍යවතුන් වහන්සේ** තමන්වහන්සේ සමීපයෙහි සිටි යසකුල පුත්‍රයා යම්සේ ඔහුගේ පියා විසින් නොදක්නේ ද එසේ අධිෂ්ඨාන කළ සේක.

එසේම එක්සිය විසියොදුනක් පෙරගමන් කොට මහාකප්පින රජු අනාගාමී ඵලයෙහි ද, දහසක් ඇමතියන් සෝවාන් ඵලයෙහි ද, ඔවුන් හා එකමග ගමන් කළ දහසක් පමණ සත්‍රීන් විසින් පිරිවරණ ලද අනොජා දෙවිය, සමීපයෙහි සිටියා වූ පිරිවර සහිත වූ රජු නො දක්නාසේ අධිෂ්ඨාන කොට සිටි කල්හි "ස්වාමීනි, රජු දුටු දූයි" ඈ විචාළා ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "කිම, තොපට රජු සෙවීම උතුම් ද, නැත හොත් තමා සෙවීම උතුම් දූයි විචාරා "තමා සෙවීම උතුමැ"යි කියා සිටි කල්හි ඔවුන්ට දහම් දෙසා සත්‍රීන් දහසක් සමග ඇය සෝවාන් පෙළෙහි ද, අමාත්‍යයන් අනාගාමි ඵලයෙහි ද, රජු අර්හත් ඵලයෙහිද පිහිට වූ සේක.

**මිහිඳු** මහ තෙරුන්වහන්සේ ලක්දිවට පැමිණි දිනයෙහි තමා සමග පැමිණි පිරිස දෙවන පෑතිස් රජුට නො පෙනෙනසේ අධිෂ්ඨාන කිරීම ද මේ ප්‍රාතිහාර්ය්‍ය මැයි.

**ආවිභාව** ප්‍රාතිහාර්‍ය්‍යයෙහි දී සෘඬි ප්‍රාතිහාර්‍ය්‍ය ද, ප්‍රාතිහාර්‍ය්‍ය **දක්වන්නා** ද පෙනෙයි. ශ්‍රාවකයන් හා අසාධාරණ වූ **යමක** ප්‍රාතිහාර්‍ය්‍යයෙහි උඩුකයින් ගිනි කඳක් හා යටි කයින් දිය කඳක් වෙන වෙන ම පෙනේ. **තිරෝභාව** ප්‍රාතිහාර්‍ය්‍යයෙහි සෘඬි ප්‍රාතිහාර්‍ය්‍ය පැනෙයි. ප්‍රාතිහාර්‍ය්‍ය **දක්වන්නා** නොපැනෙයි.

**චිත්‍ත ගෘහපති තෙම,** මහක තෙරුන් සමීපයෙහි "ස්වාමීනි, සෘඬි ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වුවහොත් මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ද, එසේ නම් ආලින්දයෙහි උතුරුසළුව එලවා ඒමත තෘණ කැරැල්ලක් විසුරුවයි කීසේක. හෙතෙම එසේ කළේ ය. එවිට මහක තෙරුන්වහන්සේ වෙහෙරට පිවිස කෙසී සිදුරෙන් ගිනිසිළු නික්මවා උතුරුසළුව නොදවා තණ කැරැල්ල පමණක් දවෙන ලෙස අධිෂ්ඨාන කළ සේක. එපරිද්දෙන් ම සෘඬි ප්‍රාතිහාර්‍ය්‍යවිය.

බ්‍රහ්ම පිරිස කෙරෙන් අතුරුදන්වනු කැමති බක බ්‍රහ්මයාහට අතුරුදන් විය නොහැකිසේ කොට, බුදුන්-වහන්සේ ඔවුනට අතුරුදහන්ව සිට "ශ්‍රමණභවත් ගෞතමයන් මෙහි ඇති බව හෝ නැති බව හෝ දනගත නොහැකැයි කියන බ්‍රහ්මයනට එයට අවකාශ නොවේවා"යි අධිෂ්ඨාන කොට, ශබ්දය පමණක් ඇසේවායි ඉටා මේ ගාථාව වදාළ සේක:-

**"භවෙචාහං භයං දිස්වා – භවංච විභවෙසිනං**
**භවංනාභි වදිං කිඤ්චි – නන්දිංච න උපාගමිං."**

එහි අදහස නම්:- මම මේ සංසාරයෙහි ජාති, ජරා, මරණ භය දකම, විභව නම් වූ නිර්වාණය සොයන්නෙම්, තෘෂ්ණා–දිට්ඨි වශයෙන් කිසි භවයක් ග්‍රහණය නොකෙළෙමි. භව තෘෂ්ණාවට ද නොපැමිණියෙමි" කියා යි. මෙසද භාග්‍යවතුන් වහන්සේගේ **තිරෝභාව ප්‍රාතිහාර්‍ය්‍ය** නමි.

**"තිරොකුඩ්ඩං, තිරොපාකාරං, තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ"** යනු ද

අභිඥවගේ තවත් ප්‍රාතිහාර්‍ය්‍යයකි. ගෙවල බිත්තියෙන් පිටතට ද, ගෙවල්, නගර, ගම් ආදිය වට කළ ප්‍රාකාර වලින් පිටතට ද, වෘක්ෂ, පර්වතාදීන්ගෙන් පිටතට ද, අහසෙහි යන්නාසේ නොපැකිළ යන්නේ ය යනු එහි අර්ථය වේ.

මේ ප්‍රාතිහාර්‍ය්‍යය දක්වනු කැමති යෝගාවචරයා විසින් ආකාස කසිණයට සමවැද එයින් නැගී, බිත්තියක් හෝ ප්‍රාකාරයක් හෝ මහාමේරු, චක්‍රවාට ආදිවූ එක්තරා පර්වතයක් හෝ ආවර්ජනා කොට, කරණ ලද පරිකර්ම ඇත්තේ "අහස වේවා" කියා අධිෂ්ඨාන කළ යුතු. එකල්හි එතැන ආකාශයක් සෑදේ. යටට බසින කැමැත්තහුට හෝ උඩ නගිනු කැමැත්තහුට හෝ විවරයක් වේ. විනිවිද යනු කැමැත්තාහට සිදුරෙක් වේ. ඍද්ධිමත් තෙමේ එයින් නොපැකිළ යයි

ප්‍රතිච්ඡන්නය විවෘත කිරීම ආකාශ කසිණය වැඩීමෙන් ද, එකකුව බොහෝ වීම් ආදිය පඨවි කසිණය වැඩීමෙන් ද, අහසෙහි හෝ ජලයෙහි හෝ පොළොව මවා පයින් යාම පඨවි කසිණය වැඩීමෙන් ද, සමෘද්ධ වන බව දත යුතු.

තවද, අන්‍ය ඍද්ධිමතකුගේ නිර්මිතයට වඩා පළමු නිර්මිතය බලපවත්වන හෙයින් දෙවනුව ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නහු විසින් පළමු ඍද්ධිමත්හට උඩින් හෝ යටින් හෝ යා යුතු.

**"පඨවියං පි උම්මුජ්ජ නිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ."**– ජලයෙහි මෙන් පොළොවෙහිද ඉල්පීම් ගැලීම් කෙරේ යනු ද තවත් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයකි. එසේ කරණු කැමැත්තහු විසින් ආපො කසිණයට සමවැද එයින් නැගී මෙතෙක් තන්හි පොළොව දිය වේවා යි පිරිසිඳ, පරිකර්ම කොට, පළමු කියන ලද ආකාරයෙන් අධිෂ්ඨාන කළ යුතු. අධිෂ්ඨානය කළ පරිද්දෙන් ම පිරිසිඳි ස්ථානයෙහි

පොළොව ජලය මෙන් වෙයි. හෙතෙම එහි ඉල්පීම්, ගැලීම් කෙරේ. පිටත බලාසිටියවුන්හට එහි පොළොව පෙනෙතත් ඍද්ධිමත් තැනැත්තාට එය ජලය වෙයි. හෙතෙමේ ඉල්පීම්, ගැලීම් පමණක් නොව නෑම, බීම, මුවදෙවීම, බඩු දෙවීම් ආදි යමක් කැමති නම් එය කරයි. එසේම, ජලය පමණක් නොව, ආපො අධික ගිතෙල්, තෙල්, මීපැණි යනාදීන් අතුරෙන් යමක් කැමැත්තේ නම්, ඒ කැමති දෙය මෙතෙක් වේවායි පිරිසිඳින ලද ද එය අධිෂ්ඨාන කළ පරිදිම වේ. එයින් බඳුනකට ගන්නා ලද ගිතෙල්, ගිතෙල් ම වෙයි. තෙල් ආදිය, තෙල් ආදිය ම වෙයි. එහි තෙමෙනු කැමැත්තේ තෙමෙයි. නොතෙමෙනු කැමැත්තේ නොතෙමෙයි. ඍද්ධිමත්හුහට ම එය ජලය වෙයි. සෙසු ජනයාට පොළොව වෙයි. එහි මිනිස්සු පයින් හෝ යානාදීන් හෝ යෙති. කෘෂිකර්මාදිය හෝ කෙරෙත්. ඉදින් ඒ ඍද්ධිමත් තෙම අන්‍යයන්ට ද එය ජලය වේවායි කැමති වේ නම් ඔවුන්ට ද එය ජලය වෙයි. පිරිසිඳි කාලය ඉක්මගිය කල්හි ඝට තළාකාදීන්හි තිබූ ජලය හැර සෙස්ස පොළොව වේ.

**"උදකෙපි අභිජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං."** – ජලයෙහි ද පොළොවෙහි මෙන් නොගැලෙමින් යයි යනු ද තවත් ප්‍රාතිහාර්‍යයකි. මෙසේ කරණු කැමති යෝගාවචරයා විසින් පඨවි කසිණයට සමවැද, එයින් නැගී, "මෙතෙක් තන්හි ජලය පොළොව වේවා යි" පිරිසිඳ, අධිෂ්ඨාන කළ කල්හි අධිෂ්ඨානය හා සමගම පිරිසිඳි ප්‍රදේශයේ ජලය පොළොව වේ. හෙතෙම එහි නොගිලී යෙයි. හුදෙක් යාම පමණක් නොව යම් ඉරියව්වක් කැමති වේ ද ඒ ඒ ඉරියව් පවත්වයි. එසේම පාංශු පමණක් නොව මැණික්, රන්, පර්වත, වෘක්ෂාදීන් අතුරෙන් යමක් කැමති වේ ද ඒ ඒ දෙය, යට කියන ලද පරිද්දෙන් ආවර්ජනා කොට අධිෂ්ඨාන කළ කල්හි එසේම සිඩ වෙයි. ඍද්ධිමත්හුට ම ඒ ජලය පොළොව වෙයි. සෙසු ජනයාට ජලය ම වෙයි. මත්ස්‍ය ය, කැසුබු, දියකා ආදී ජලචර

සත්ත්වයෝ ද කැමතියේ හැසිරෙති. ඉදින් සෙසු ජනයාට ද එය පොළොවක් මෙන් කරණු කැමැත්තේ නම් පොළොවක් ම වෙයි. පිරිසිඳි කාලය අවසන් වූ කල්හි පෙරසේම ජලය වේ.

**"ආකාසෙපි පල්ලංකෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො".**– අහසෙහි ද පය්‍යඞ්කයෙන් යන්නේ වෙයි. පියාපත් ඇති පක්ෂියෙකු මෙනි–යනු ද තවත් ප්‍රාතිහාර්‍ය්‍යයෙකි. මෙසේ කරණු කැමති යෝගාවචර තෙම පෘථිවි කසිණයට සමවැද එයින් නැගී, ඉදින් හිඳගෙන ම යනු කැමති නම්, පය්‍යඞ්කයක් පමණ තැන පිරිසිඳ පරිකර්ම කොට පෙරසේ අධිෂ්ඨාන කළ යුතු. වැදහෙව යනු කැමති නම් ඇඳක් පමණ තැන පිරිසිඳ පරිකර්ම කොට, අධිෂ්ඨාන කළ යුතු. ඉදින් පයින් යනු කැමති නම් මාර්ගය ප්‍රමාණ ප්‍රදේශයක් පිරිසිඳ පරිකර්ම කොට අධිෂ්ඨාන කළ යුතු. මෙසේ අධිෂ්ඨානය හා සමගම පොළොවම වෙයි. ස්වභාවයෙන් හෙතෙම ආකාශය ආවර්ජනා කොට අභිඥා ඥානයෙන් පෘථිවිය වේවා යි අධිෂ්ඨාන කළ කල්හි අහස පොළොව වේ. ප්‍රකෘති පොළොවෙහි සාමාන්‍ය මිනිසුන්සේ හෙතෙමේ අහසෙහි සක්මන් කිරීම් ආදි ඉරියව් පවත්වයි.

අහසින් යනු කැමති භික්ෂු තෙම දිවැස්ලාභියකු විය යුතු. අහසින් යන අතරමග ප්‍රකෘතියෙන් හටගත් නොහොත් ඍතුසමුට්ඨාන, වෘක්ෂ, පර්වතාදිය හෝ ඇති වෙයි. දිව්‍ය, නාග, සුපර්ණාදීහු ඊර්ෂ්‍යාවෙන් මවන්නාහු හෝ වෙත්. එවැනි උපද්‍රවාදිය දකිනු පිණිස දිවැස් ඇති විය යුතු. එසේ යමක් දුටුවහොත් පාදක චතුර්ථ ධ්‍යානයට වහා සමවැද එයින් නැගී, ආකාශය වේවායි පරිකර්ම කොට අධිෂ්ඨාන කළ යුතු. තවද, අවකාශ ඇති තැනෙක බැසීම සඳහා ද දිව්‍යචක්ෂුරභිඥානය උපකාර වේ. මොහු නහන තොට, ගම්දොර ආදී මහජනයා ගැවසෙන තැනෙක බැස්සේ නම් මහජනයා අතර ප්‍රකට වන හෙයින් එවැනි තැන් දිවැසින් බලා එයින් පිටත බැසීමට හැකි වේ.

**"ඉමෙපි චන්දිම සූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති."**- මේ මහත් සෘඩි ඇති, මහත් ආනුභාව ඇති සඳ-හිරු දෙදෙනා ද අත්ලෙන් අල්වයි. පිරිමදියි-යනු ද සෘද්ධිවිධඥානයාගේ ප්‍රාතිහාර්‍ය්‍යයකි. දෙසාළිස් දහසක් යොදුන් මතෙහි හැසිරීමෙන් මහත් සෘඩි ඇති, එක විට තුන් දිවයිනකට ආලෝකය දීමෙන් මහානුභාව ඇති සඳ-හිරු දෙදෙනා එක් ප්‍රදේශයක් හෝ හාත්පසින් හෝ අල්වයි, කැටපත් තලයක්සේ පිරිමදියි. අභිඥලාභී තෙම සඳ-හිරු දෙදෙන ආවර්ජනා කොට අභිඥ ඥානයෙන් චන්ද්‍ර-සූර්‍ය්‍යයන් අත්-පසෙහි වෙත්වා යි අධිෂ්ඨාන කළ කල්හි ඒ හා සමගම අත්පසෙහි වෙති. ඉදින් හෙතෙම හිඳ හෝ හෙවැ හෝ සඳ-හිරු අතින් අල්වයි. ඔබමොබ අත යවා පිරිමදියි. සඳ-හිරු වෙතට ගොස් අල්වනු කැමැති නම් එසේ ද කරන්නේ ය. එතැන්හිම සිට අල්වනු කැමැති නම් අත්පස වේවා යි අධිෂ්ඨාන කොට නටුයෙන් ගිළිහුනු තල්ගෙඩියක් මෙන් තමා වෙතට පැමිණි සඳ-හිරු දෙදෙන පිරිමදීයි. තමා සිටි තැනම සිට, සඳ-හිරු එහි ම තිබිය දී අත දික් කොට හෝ පිරිමදියි. එසේ වන කල්හි උපා-දින්නකය හෙවත් තණ්හා-දිට්ඨි දෙකින් මමායනය කරණ ලද ප්‍රකෘති අත නිසා අනුපාදින්න හෙවත් ධ්‍යාන බලයෙන් පහළ වූ අතින් පිරිමදියි. ශරීරය කුඩා කිරීමේ දී උපාදින්නකය කුඩා වේ. මහත් කිරීමේ දී උපාදින්නකය මහත් වේ.

එක් සමයෙක්හි **අනාථපිණ්ඩික ගෘහපති** තෙම, **භාග්‍යවතුන්වහන්සේ** ගෙන් බණ අසා, "ස්වාමීනි, හෙට දින පන්සියයක් පමණ භික්ෂු සඞ්ඝයා වහන්සේ සමග අප නිවසට භික්ෂාව පිණිස වඩිනසේක්වා" යි ආරාධනා කොට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ ආරාධනය ඉවසා, එදින රාත්‍රිභාගය ඉක්මවා පසු දින උදෑසන දසසහස්‍රී ලෝකධාතුව බලා වදාරණසේක්, **නන්දෝපනන්ද නම් නාරජු** දුටු සේක. එකල්හි ඒ නාරජුට උපනිශ්‍රය

සම්පත් ඇද්දේහෝ යි බලා වදාරණසේක්, "මේ තෙමේ මිථ්‍යාදෘෂ්ටියෙක, ත්‍රිවිධරත්නයෙහි අප්‍රසන්න වූවෙකැ" යි දැක, මොහු මිථ්‍යාදෘෂ්ටියෙන් කෙසේ මුදවා ගත හැකි දැයි බලන කල්හි මහමුගලන් තෙරණුවන් දුටු සේක. බුදුන් වහන්සේ ශරීරය පිළිදැගුම් කොට, ආයුෂ්මත් අනඳ තෙරණුවන් අමතා "ආනන්දය, පන්සියයක් පමණ භික්ෂූන් රැස් කරව, තථාගතයෝ දේවචාරිකාවෙයි යනු කැමති, යහ"යි වදාළ සේක. එදවස මහමෙරු හිනම්බයෙහි නන්දෝපනන්ද නම් නාරජුගේ ආපාන භූමිය සකස් කරණ කාලය විය. නාරජු තෙම දිව්‍ය රත්න පර්‍ය්‍යඞ්ක-යෙහි දිව්‍ය සේසත යට ත්‍රිවිධ නාටිකාවන් හා නාග පිරිස පිරිවරා, දිව්‍ය භාජනයන්හි එළවන ලද දිව්‍ය ආහාර පානාදිය බලමින් හුන්නේ විය. භාග්‍යවතුන් වහන්සේ ද යම්සේ නාරජුන් දකි ද, එපරිද්දෙන් අධිෂ්ඨාන කොට, නාරජුගේ විමානය මතුයෙන් පන්සියයක් භික්ෂූන් හා සමග තව්තිසා දෙවලොව බලා වැඩම කළසේක. එසමයෙහි නන්දෝපනන්ද නාරජුහට මෙබඳු දෘෂ්ටියක් උපන. "මේ මුඩු මහණහු අපගේ භවන මතුයෙන් තව්තිසා දිව්‍ය භවනයට යම්හ යි නික්මියාහුය. මොවුනට අප මස්තකයෙහි පාධූලි විසුරුවමින් යන්නට නොදෙම්හ"යි කියා යි. මෙසේ සිතා මහමෙර පතුලට ගොස් තමාගේ මහානාග වේශය මවා ගෙන මහමෙර සත්වරක් දරණ වැලින් වෙළා, මුදුනෙහි පෙණය තබා, තව්තිසා භවනය යටිකුරු කොට පෙණයෙන් වසා නොපෙනෙන සේ කෙළේ ය. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරහු, "ස්වාමීනි, පෙර මේ පෙදෙසෙහි දී මහමෙර පැනෙයි. මහමෙර හාත්පස තව්තිසා භවනයට ආරක්ෂා පිණිස පන්සියයක් පමණ යොදුන් විශාල වූද, නාග, ගරුඬ, කුම්භාණ්ඩ, යක්ෂාදීන්ගේ වාසස්ථාන වශයෙන් පැවැති පරිභාණ්ඩයෝ ද පැනෙත්. එසේම තව්තිසා භවනය ද, වෛජයන්ත ප්‍රාසාදය ද පැනෙයි. වෛජයන්ත ප්‍රාසාදය මත නංවන ලද ධජය ද පැනෙයි. අද ඒ කිසිවක් නොපෙනෙයි. එයට හේතු කවරේ දැයි, ඇසී ය. එකල්හි

බුදුරජාණන් වහන්සේ, "රට්ඨපාලය, අද නන්දෝපනන්ද නම් නාරජ තෙම තොපට කිපී මහමෙර සත්වරක් වෙලා එය මතුයෙහි පෙණයෙන් වසා අන්ධකාර කොට සිටින්නේ ය" යි වදාළහ. එවිට ඔහු දමනය කරමියි රට්ඨපාල තෙරහු කීහ. බුදුන්වහන්සේ එය අනුදන්න වදාළේ නැත. ඉක්බිති ආයුෂ්මත් භද්දිය, රාහුලාදී සියලු තෙරුන් ද අවසර ඉල්ලූ සේක. බුදුහු අවසර නුදුන්හ. අවසානයෙහි මුගලන් මහතෙරණුවෝ, "ස්වාමීනි, මම ඒ නාරජු දමනය කරන්නෙමැයි කී කල්හි, "මොග්ගල්ලානය, දමනය කරවු"යි අනුදන්න වදාළ සේක. මහමුගලන් තෙරණුවෝ ද, තමන් වහන්සේගේ මනුෂ්‍ය ආත්මභාවය හැර මහා නාගරාජ වේශයක් මවාගෙන, මහමෙර පත්ලට වැද, නන්දෝපනන්දයා මතුයෙහි තුදුස්වරක් දරණ වැලින් වෙළා, ඔහුගේ පෙණය මතුයෙහි තම පෙණය තබා මහමෙරට තදකොට සිටියහ. එවිට නාරජු දුමන්නට විය. තෙරණුවෝ ද, දුම ඇත්තේ තොපගේ ශරීරයෙහි පමණක් නොවේ. මාගේ සිරුරෙහි ද දුමක් ඇතැයි කියා දුම් නැගූහ. නාරජුගේ දුම් තෙරුන් නො පෙළීය. එහෙත් තෙරුන්ගේ දුම නාරජු පෙළීය. නැවත නාරජු ගිනි නිකුත් කළහ, තෙරණුවෝ ද එසේම ගිනි නිකුත් කළහ. නාරජුගේ ගින්නෙන් තෙරුන්ට බාධා නොවීය. තෙරුන් නිකුත් කළ ගිනි නාරජුට බාධා කළහ. නාරජතෙම, මෙතෙමේ මා මහමෙරට තද කොට පෙළයි. දුම් ද නංවයි, ගිනි ද නිකුත් කරයි. මේ කවරෙක් දැයි සිතා "පින්වත, නුඹ කවරහු දැයි, පිළිවිසීය. "නන්දය, මම මුගලන් වෙමි" යි කී කල්හි, "ස්වාමීනි, තමා භික්ෂු භාවයෙන් සිටිය මැනවැයි කීහ. තෙරහු ද, මවාගත් නාගරූපය හැර භික්ෂු වේශය ගෙන ඔහුගේ දකුණු කණින් ඇතුල්ව වම් කණින් නික්මෙති, වම් කණින් ඇතුල්ව දකුණු කණින් නික්මෙති. එසේම දකුණු නාසා සිදුරෙන් ඇතුල්ව වම් නාස් සිදුරෙන් නික්මෙති. වම් නාස් සිදුරෙන් ඇතුල්ව දකුණු නාස් සිදුරෙන් නික්මෙති. එකල්හි නාරජ මුඛය හැරියේ ය. එකල්හි තෙරහු මුවින් කුසට ඇතුල්ව,

කුස තුළ නැගෙනහිරින් බටහිර දිගට සක්මන් කරති. බටහිරින් නැගෙනහිර දෙසට සක්මන් කරති. භාග්‍යවතුන් වහන්සේ "මොග්ගල්ලානය, සිහි ඇතිකර ගනුව මේ නාගයා මහා ආනුභාව ඇත්තෙකැ" යි වදාළහ. එකල්හි තෙරහු, "ස්වාමීනි, මා විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලදහ. නැවත නැවත වඩන ලදහ. ගමනට යානාවක් මෙන් වඩන ලදහ. සිටීමට වස්තුවක් මෙන් කරන ලදහ. නැවත නැවත මනාකොට පිහිටුවන ලදහ. මනාකොට පුරුදු කරන ලදහ. මොනවට ආරම්භ කරන ලදහ. ස්වාමීනි, මේ එක නන්දෝපනන්දයෙක් සිටීවා. මම නන්දෝපනන්දයන් සමාන නාරජුන් සියයක් හෝ, දහසක් හෝ, සියදහසක් හෝ දමනය කරමි" යි කීහ.

නාරජ තෙමේ ද, "පළමුව ඇතුළත වදනා මොහු නොදක්නා ලදහ. දැන් පිටතට නික්මෙන කල්හි දළ ඇතුළට ගෙන සඟවා කාදමමි" යි සිතා "ස්වාමීනි, පිටතට නික්මෙව, මා කුස තුළ සක්මන් කරමින් මා නො පෙළව" යි කීහ. තෙරුන්වහන්සේ ද පිටතට නික්ම සිටියහ. එකල නාගරාජයා නාසාවාතය නිකුත් කෙළේය. මුගලන් මහ තෙරණුවෝ එකෙණෙහි ම චතුර්ථ ධ්‍යානයට සමවැදුණු සේක. එහෙයින් තෙරුන්වහන්සේගේ රෝම කූපයකුදු සෙලවීමට නොහැකි විය.

අවශේෂ භික්ෂූහු ද මුල පටන් මේ සියලු ප්‍රාතිහාර්‍ය්‍ය දක්වන්නට සමර්ථයහ. නමුත් මේ ස්ථානයට පැමිණ, මේ නාසාවාතයෙන් නොපෙළීම සඳහා **ඛිප්පනිසන්තිභාවය** යයි කියන ලද වහා ධ්‍යානයට සමවැදීමෙන් අභිමතාර්ථය සිඩ කරගන්නට අසමර්ථයහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට අවසර නුදුන්හ. නාරජු ද, මම නාසාවාතයෙන් මේ ශ්‍රමණයාගේ ලෝමකූපයකුදු සොලවන්නට අසමර්ථ වීමි. ශ්‍රමණ තෙම මහත් ඍද්ධි ඇත්තෙකැ'යි සිතීය. මහතෙරහු ද, තමන්වහන්සේගේ මනුෂ්‍යාත්ම භාවය හැර, මහත් ගුරුළු වෙසක් මවා, ගුරුළු වාතයක් දනවමින් නාරජු ලුහුබැන්දහ. නාරජ තෙමේ ද, තමාගේ

නාගාත්ම භාවය අත්හැර, මාණවක වේශයක් මවා ගෙන, "ස්වාමීනි, ඔබවහන්සේ සරණ යෙමි," යි කියමින් තෙරුන් වහන්සේගේ දෙපා වැන්දහ. තෙරුන්වහන්සේ ද, "නන්‍දය, ශාස්තෘන්වහන්සේ ද වැඩිය සේක. උන්වහන්සේ වෙත යම්හ" යි නාරජුන් දමනය කොට විෂරහිත කොට ගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණවූහ. නාරජු ද, භාග්‍යවතුන් වහන්සේ වැඳ "ස්වාමීනි, ඔබ වහන්සේ සරණ යෙමි" යි කීහ. බුදුන්වහන්සේ ද, **"සුඛී හොතු නාගරාජ"** සුවපත් වේවා නාරජ යයි වදාරා භික්‍ෂුසංඝයා විසින් පිරිවරණ ලදුව අනේපිඩු සිටාණන්ගේ නිවසට වැඩි සේක.

අනේපිඩු සිටාණෝ ද, "ඉතා දවල්ව වැඩියේ ඇයි" දැයි ඇසූ කල්හි, "මුගලන් තෙරුන් හා නන්‍දෝපනන්‍දයා අතර යුද්ධයක් වී" යයි බුදුහු වදාළහ. "ස්වාමීනි, කවරෙකුහට ජයවී ද, කවරෙකු පරාජයවී" දැයි ඇසූ සිටාණන්ට "මුගලන් තෙරුන්ට ජය ය, නන්‍දයාට පරාජයවී" යයි වදාළහ. එසේ නම් ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, මුගලන් තෙරුන්වහන්සේගේ ජය පූජා පවත්වමි යි සතියක් මාගේ ආරාධනය පිළිගත මැනැවැයි කියා සතියක් මුළුල්ලෙහි බුදුන්වහන්සේ ප්‍රමුඛ පන්සියයක් පමණ මහා සඟනට මහත් පූජා සත්කාර කෙළේය.

සෘද්ධිමත් තෙමේ සඳහිරු පිරිමැදීම පමණක් නොව, ඉදින් කැමති නම් සඳ-හිරු පා පුටුවක් කොට හෝ පා තබති. පුටුවක් කොට හෝ හිඳිති, ඇඳක් කොට හෝ හොවී. එල්ලෙන පුටුවක් කොට හෝ එල්බ ගනී. එක් සෘද්ධිමතෙකු පමණක් නොව වෙනත් සෘද්ධිමතුන් සියදහසක් හෝ එසේම කරතත් ඒ ඒ සෘද්ධිමතුන්හට එකී සියල්ලම සමෘද්ධ වේ. සඳ-හිරු දෙදෙනාගේ ගමන ද, ආලෝක කිරීම ද එසේම වෙයි. යම්සේ භාජන දහසෙක ජලය පුරවා තිබූ කල, ඒ හැම බඳුනකම සඳමඬල වෙන වෙනම පෙනේ ද, චන්‍ද්‍රයාගේ ප්‍රකෘති ගමන හා ආලෝක කිරීම ද එසේම සිදුවෙයි. මේ ප්‍රාතිහාර්‍ය්‍යය ද එසේමැයි.

"යාව බ්‍රහ්මලොකාපි කායෙන වසංවත්තෙති." සෘද්ධිමත් තෙම බඹලොව තෙක් කයින් වසයෙහි පවත්වයි— යනු ද එක් ප්‍රාතිහාර්‍ය්‍යයකි. මෙහි බ්‍රහ්මලෝක යයි කියන ලද්දේ ඉතා දුර දැක්වීම පිණිස ය. එය හැර අනික් සථානද මෙයට ඇතුළත් වේ. බඹලොව හෝ දෙව්ලොව ආවර්ජනා කොට, දුර පවත්නා වස්තූහු ළංවේවා යි ආවර්ජනය කොට, පරිකර්ම කොට නැවත සමාපත්තියට සමවැද අභිඥා ඥානයෙන් ළංවේවායි අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨානය හා සමගම දුර තිබූ වස්තුව ළංවෙයි. සමීපයෙහි වස්තුව දුර වේවායි එපරිද්දෙන් ම ඉටා නම් දුරවෙයි. බොහෝ වූ වස්තු ස්වල්ප වේවායි ඉටා නම් ස්වල්ප වෙයි. ස්වල්ප වූ වස්තුව බොහෝ වේවායි ඉටා නම් බොහෝ වෙයි. දිවැසින් ඒ බ්‍රහ්මයන්ගේ රූප දක්නා කැමැති නම් රූප දකී. දිවකනින් බ්‍රහ්මයන්ගේ ශබ්දය අසනු කැමති නම් ශබ්දය අසයි. චෙතොපරිය ඥාණයෙන් හෙවත් පරසිත් දන්නා නුවණින් බ්‍රහ්මයන්ගේ සිත් බලනු කැමති නම් සිත් දකී. ඉදින් ඔහු දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යනු කැමති නම්, ශරීරයාගේ වශයෙන් සිත පිරිනමා ශරීරයාගේ වශයෙන් සිත අධිෂ්ඨාන කොට, සුඛ සංඥාවට ද, ලඝු සංඥාවට ද වැද, දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යයි. ඉදින් ඔහු චිත්ත වශයෙහි කය පිහිටුවා චිත්ත වශයෙහි කය අධිෂ්ඨාන කොට සුඛ සංඥාවට ද වැද, නොපෙනන කයින් බඹලොව යයි. හෙතෙම එහි ගොස් බ්‍රහ්මයන් ඉදිරියෙහි මනොමය වූ සියලු අඟපසඟින් සම්පූර්ණ වූ, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපයක් මවාගන්නේ ය. ඒ සෘද්ධිමත් තෙම සක්මන් කෙරේ නම් නිර්මිත රූපය ද සක්මන් කරන්නේ ය. හෙතෙම සිටීම හෝ හොවීම හෝ කෙරේ නම් නිර්මිත රූපය ද එසේම කරන්නේය. හෙතෙමේ දුම නගා නම් දිලිහෙන්නේ නම්, දහම් දෙසා නම්, පැන විචාරා නම්, පැන විසඳා නම් නිර්මිත රූපය ද එසේ කරයි. හෙතෙමේ ඒ බ්‍රහ්මයා හා සමග සිටි නම්, කථා කෙරේ නම්, සාකච්ඡා කෙරේ නම් වෙන යමක් කෙරේ නම්, නිර්මිත රූපය ද එසේම කරයි.

**තථාගතයන් වහන්සේ** යමකප්‍රාතිහාර්‍ය්‍යාවශානයෙහි දෙව්ලොව වඩනාසේක් යුගන්ධර පර්‍වතය හා මහාමේරු පර්‍වතය ද සමීපයෙහි කොට පෘථිවිතලයෙන් එක් පාදයක් ගෙන යුගන්ධර පර්‍වතයෙහි පිහිටුවා, දෙවන පාදය මහමෙර මතුයෙහි තැබූ සේක. මෙය බුදුන්වහන්සේ දුර වූ දෙය සමීපයෙහි වන සේ කළ පරිදිය.

**මහමුගලන් මහතෙරහු,** දෙවෝරෝහණ සමයේදී සැවත් නුවරින් දවල් අහර අනුභව කොට නික්මුණු, දෙලොස් යොදුනක් තැන පිරීසිටි පිරිස තිස්යොදුනක් දුර වූ සංකස්ස නුවර සමීපයට ක්‍ෂණයකින් පැමිණවිය. මෙය මුගලන් මහ තෙරහු දුර වූ දෙය සමීපයෙහි වනසේ කළ පරිදි ය.

ලක්දිව චූලසමුද්ද නම් තෙර කෙනෙක් විය. දුර්භික්‍ෂ කාලයෙහි සත්සියයක් පමණ භික්‍ෂූහු උන්වහන්සේ වෙත පැමිණියහ. මහතෙරහු ද, මේ මහාභික්‍ෂු පිරිසට භික්‍ෂාව කොතැන්හි ලැබෙන්නේදැයි සිතන්නේ ලක්දිවින් පිණ්ඩපාතය නොලැබෙන බව දැක, මුහුදින් එතර දඹදිව පැලලුප් නුවරින් ලැබෙන බව දැන ඒ භික්‍ෂූන් පාත්‍ර සිවුරු ගන්වා "ඇවැත්නි, පිඬුසිඟා වඩිමු" යයි කියා, පොළොව හකුළුවා පැලලුප් නුවර වැඩි සේක. භික්‍ෂූහු මේ කිනම් නගරයක්දැයි ඇසූහ. ඇවැත්නි, පැලලුප් යයි තෙරහු කීහ. ස්වාමීනි, පැලලුප් නුවර දුර නොවේ දැයි ඇසූ භික්‍ෂූහට ඇවැත්නී, මහලු තෙරහු දුර වූ දෙය ද ළං කෙරෙතියි කීහ. එවිට මහමුහුද කොහිදැයි භික්‍ෂූහු ඇසූහ. අතරමග ඉක්ම වූ නිල්වන් කුඩා ඇලයයි තෙරහු කීහ. මුහුද මහත් නොවේදැයි ඇසූ භික්‍ෂූන්ට මහලු තෙරහු මහත් දැය කුඩා කෙරෙතියි කීහ මෙයද දුර වූ දැය ළං කිරීම හා මහත් වූ දැය කුඩා කිරීම් වශයෙන් දක්වන ලද ප්‍රාතිහාර්‍ය්‍යය වේ.

**තිස්සදත්ත** නම් තෙරනමක් සවස් කාලයෙහි දිය නා උතුරු සළුව පොරවා ශ්‍රී මහාබෝධීන්වහන්සේ වඳිනු කැමැතිවූයෙන් දුරවූව ළං කළහ.

**බුදුරජාණන් වහන්සේ** තමාගේ හා අඞ්ගුලිමාලයාගේ අතර ඉතා ළං වුවද එය දුර කළ සේක,

රජගහනුවර නැකත් කෙළනා දිනයක පන්සියයක් පමණ කුමාරිකාවෝ චන්ද්‍රමණ්ඩලාකාර කැවුම් පිසගෙන නැකත් ක්‍රීඩා පිණිස නික්ම ගියාහුය. අතරමගදී බුදුන් වහන්සේ වඩිනු දැක එක් කුමරියක්වත් එය පූජා නොකළාය. පසුව වඩින මහාකස්සප ස්ථවිරයන් වහන්සේ දුටු ඒ කුමරියෝ "අපගේ තෙරුන්වහන්සේ වඩිති, අපි කැවුම් පිළිගන්වමු" යයි කියා සියලු දෙනාම කැවුම් ගෙන තෙරුන්වහන්සේ වෙත එළඹියාහුය. තෙරණුවෝ පාත්‍රය මැත්කොට සියල්ලම එක පාත්‍රයක් පිරෙන පමණ කළසේක. බුදුරජාණන් වහන්සේ ද තෙරුන් වඩනා පෙරමග බලමින් වැඩහුන් සේක. තෙරුන්වහන්සේ ඒ කැවුම් පාත්‍රය ගෙනවිත් බුදුන්ට පිරිනැමූහ. මෙය **බොහෝ දැය ටිකක් කිරීමේ ප්‍රාතිහාර්යයකි.**

**මහාකාශ්‍යප තෙරණුවෝ** සත්දිනක් නිරෝධ සමවතට සමවැද එයින් නැගී දිළින්දන්ට සංග්‍රහ කරණු පිණිස **කාකවලිය** නම් දුගියාගේ ගේදොර වැඩ සිටියහ. ඔහුගේ භාර්යාව තෙරුන් දැක තම සැමියාට පිළියෙළ කළ ලුණු නැති ඇඹුල් කැඳ පාත්‍රයෙහි බහාලූහ. තෙරුන් වහන්සේ ද එය ගෙන බුදුන්වහන්සේගේ අත තුබූ සේක. බුදුන්වහන්සේ ද එය මහාභික්ෂු සඞ්ඝයාට පොහෝනා සේ අධිෂ්ඨාන කළ සේක. ඒ සියල්ලම පොහෝනා පමණ විය. කාකවලිය තෙමේ ද සත්වන දින සිටුතනතුරු ලැබීය. මෙය **ටික දැය බොහෝ කිරීමේ ප්‍රාතිහාර්ය වේ.**

ස්වල්ප වූ දැය බොහෝ කිරීම පමණක් නොව මිහිරිදැය අම්හිරි කිරීම ද, අම්හිරි දැය මිහිරි කිරීමද යනාදී යම් යම් දැයක් කරණු කැමැති නම් එය ද කළ හැකිවේ. එක් කලෙක **මහා අනුල ස්ථවිරයන් වහන්සේ,** බොහෝ භික්ෂූන් පිඩු සිඟා වැඩ, වියළි බත් පමණක් ලැබ ගංතෙර හිඳ වළඳන්නවුන් දැක, ගඟ දිය ගිතෙල් බඳුනක් වේවායි

අධිෂ්ඨාන කොට සාමණේරයන්ට හැඟවූහ. ඔහු බඳුනකින් එය ගෙනවුත් භික්ෂූන්ට පිළිගැන්වූහ. සියලු දෙනා වහන්සේ ම මිහිරි ගිතෙල් හා බත් වැළඳූහ. මෙය අම්හිරි දූය මිහිරි කිරීමේ ඍද්ධිප්‍රාතිහාර්‍යයකි.

තවද මෙහිම සිට කසිණාලෝකය වඩා ඒ බ්‍රහ්මයාගේ රූපය දකී. මෙහිම සිට ඒ බ්‍රහ්මයන් කථා කරන ශබ්දය අසයි. ඔවුන්ගේ සිතද පිරිසිඳ දනී.

දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යනු කැමති වේ නම් අභිඥලාභිතෙම පාදකධ්‍යාන චිත්තය ගෙන ශරීරයෙහි ආරෝපණය කොට "මේ සිත කය අනුව දන්ධව හෙවත් ලැසිව යන්නක් වේවයි" චිත්ත සවභාවය වූ ශීඝ්‍රගමන චලිතා කායයාගේ සවභාවය වූ දන්ධ හෙවත් ලැසිගමන පිහිටුවයි. එහි ඇති උපෙක්ෂාව ශාන්ත බැවින් සුඛසංඥව ලබයි. උපෙක්ඛා සහගත චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්තවූ සංඥව බරවූ නීවරණයන්ගේ ද, ඖදාරික වූ විතර්කාදියෙන් ද විශේෂයෙන් මිදුණු හෙයින් ලඝු සංඥවද ලබයි. ඒ සුඛ සංඥවට හා ලඝු සංඥවටද පැමිණියාවූ අභිඥලාභීහුගේ කරජකය පුළුන් පිඩක් මෙන් සැහැල්ලුවේ. එබැවින් සුළඟෙහි ලූ පුළුන් පිඩක් මෙන් සැහැල්ලුව දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යන්නාවූ හෙතෙම කැමතිවේ නම්, පඨවිකසිණයාගේ වශයෙන් ආකාශයෙහි මාර්ගයක් මවා පයින් යෙයි. ඉදින් පුළුන් පිඩක්සේ වාතයෙන් යනු කැමැති නම් වායෝ කසිණයට සමවැද වාතයක් මවාගෙන යයි. යනු කැමැති කල කරණ ලද චිත්ත අධිෂ්ඨාන වේගයෙන් ම උඩට නගන ලද්දේ දුන්නෙන් නගන ලද ඊතලයක්සේ දෘශ්‍යමානව යන්නේය.

නොපෙනී බඹලොව යනු කැමැති වේ නම්, කය ගෙන සිතෙහි නංවා, සිත අනුව කය සීඝ්‍රව ගෙන ගමන් කරවයි. රූප කායාරම්මණිකව උපන් ඍද්ධි චිත්තය හා සම්ප්‍රයුක්තවූ සුඛ සංඥවටද, ලඝු සංඥවටද බසී. කය චිත්ත යාගේ සවභාවය ගනී.

ඉදින් හෙතෙම කැමති වේ නම් තමා හෝ නිර්මිත රූපය හෝ බඹලොව යවයි.

නිර්මිත රූපයෙහි චක්‍ෂුරාදි ප්‍රසාද රූප, භාවරූපාදියක් නැත්තේය. ඍද්ධිමත් තෙම සක්මන් කරන්නේ නම්, නිර්මිත රූපය ද එසේම සක්මන් කරයි. මේ කියන ලද්දේ ශ්‍රාවකයන්ගේ වශයෙනි. භාග්‍යවතුන් වහන්සේ විසින් නිර්මිත කරණ ලද රූපය, භාග්‍යවතුන් වහන්සේ යමක් යමක් කෙරෙත් නම් ඒ ඒ දෑය ද, අන් යමක් කරවනු කැමැති නම් ඒ ඒ දෑය ද කෙරේ.

මේ කියන ලද්දේ අධිෂ්ඨාන ඍද්ධිය යි.

## විකුර්වණ ඍද්ධිය

**විකුර්වණ ඍද්ධිය** දක්වීමේදී ඍද්ධිමත් තෙම තමාගේ ප්‍රකෘති වේශය හැර කුමාර වේශයක් හෝ නාග, ගුරුළු, අසුර, ශක්‍ර, දිව්‍ය, බ්‍රහ්ම, සමුද්‍ර, පර්වත, සිංහ, ව්‍යාඝ්‍ර, දීපි ආදී යම් යම් වේශයක් හෝ මවා දක්වයි. තමා ඇතකු කොට හෝ අන් ඇතෙකු හෝ මවා දක්වයි. තමා අශ්වයෙකු කොට හෝ අන්‍ය අශ්වයෙකු හෝ මවා දක්වයි. රථ සෙනඟක් හෝ, පාබල සෙනඟක් හෝ නානාවිධ සේනා සන්නිවෙස හෝ මවා දක්වයි. මෙයින් යමක් මවනු කැමැත්තේ නම්, පඨවි කසිණාදීන් අතුරෙන් යම්කිසි ආරම්මණයකින් අභිඥපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී කුමාර වේශයක් කැමැති වේ නම්, ඒ කුමාර වේශය ආවර්ජනා කළ යුතු. එසේ ආවර්ජනා කොට පරිකර්මාවසානයෙහි නැවත සමවතට සමවැද එයින් නැගී මෙබඳු කුමාරයෙක් වෙම්යි අධිෂ්ඨාන කළ යුතු. ඒ අධිෂ්ඨාන චිත්තය හා සමගම කුමාරයෙක් වේ. දෙව්දත් තෙම අජාසත් කුමරුවන් පහදවා ගැනීමට කුමාර වේශයක් මවාගත්තේ ය. අන්‍ය රූප මැවීම ද මෙසේ ම ය. මෙය **විකුර්වණ ඍද්ධිය** නම්.

## මනෝමය ඍද්ධිය

මනෝමය ශරීරයක් මවනු කැමැති ඍද්ධිමත්හු විසින් පෙරකීසේ පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, එයින් නැගී පළමුව තමා කය ආවර්ජනාකොට, පරිකර්මකොට, සිදුරක් වේවායි අධිෂ්ඨාන කළ යුතු. එවිට සිදුරක් වේ. නැවත සිදුර ඇතුළත අනෙක් කයක් ආවර්ජනා කොට පෙරකීසේ ම ඒ සිදුර ඇතුළෙහි එබඳු කයක් වේවායි අධිෂ්ඨාන කරයි. එවිට ඒ යෝගීතෙම මුදු තණ ගසින් ඇදගන්නා ගොබයක් මෙන් ද, කොපුවකින් ඇදගන්නා කඩුවක් මෙන් ද, සැව හැර යන්නා නයකු මෙන් ද, ඒ අනෙක් කය ඇදගනී. මේ **මනෝමය රූපය** ඍද්ධිමත්හු හා සමානය.

## 2. දිව්‍යශ්‍රොත ඥානය

යම් ආකාරයකින් ඒ **දිබ්බසොත ඤාණය** සම්පාදනය කළ යුතු ද, ඒ ආකාරය දක්වීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. **සො එවං සමාහිතෙ චිත්තෙ, පරිසුද්ධෙ, පරියොදාතෙ, අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ, මුදුභූතෙ, කම්මනියෙ ඨිතෙ, ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා, විසුද්ධාය, අතික්කන්තමානුසකාය උභො සද්දෙ සුණාති, යෙ දූරෙ සන්තිකෙ චා ති".** ඒ අධිගමය කළ චතුර්ථ ධ්‍යාන ඇති යෝගීතෙම ප්‍රථම ධ්‍යානාදී ක්‍රමයෙන් මෙසේ රූපාවචර චතුර්ථ ධ්‍යානය ලැබ, චතුර්ථ ධ්‍යානයෙන් සිත සමාධිමත්වූ කල්හි, උපෙක්ඛා සති පාරිශුද්ධියෙන් පිරිසුදුවූ කල්හි, පිරිසුදු හෙයින්ම ප්‍රභාශ්වරවූ කල්හි, පහවූ රාගාදී අඞ්ගණ ඇති කල්හි, අනඞ්ගණ හෙයින් ම පහවූ උපක්ලේශ ඇති කල්හි, මනාකොට වඩන ලදුව වශීභාවයට පැමිණි කල්හි, මෘදු හෙයින්ම ඍද්ධිවිධඥාන කර්මයට යොග්‍යව සිටිකල්හි නොහොත් ඍද්ධිවිධ ඥාන කර්මයට යොග්‍ය කල්හි, මෙසේ පිරිසුදු ආදී බැව්හි පිහිටි කල්හි ශ්‍රද්ධාදීන් පරිගෘහිත වන බැවින් නිශ්චල බවට පැමිණි කල්හි මිනිස්කන්හි ශබ්ද ඇසීමේ ශක්තිය ඉක්ම සිටි දෙවියන්ගේ ශ්‍රොත්‍රය වැනි

හෙයින් දිබ්බසොත යයි කියන ලද නුවණින්, දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද දුරවූ හෝ සමීපයෙහි වූ හෝ උභයශබ්දයන් අසන්නේ ය.

දෙව්ලොවෙහිවූ දෙවියන්හට ශ්‍රද්ධා බහුලබවය, පිරිසුදුවූ දෘෂ්ටිය ය, ආනිසංස දක්නා බවය යනාදීවූ, දෙවියන් කෙරෙහි ඉපදීමට උපනිශ්‍රයවූ සුචරිත ධර්මයන් කාරණකොට ගෙන උපන් හෙයින් ද, වාත, පිත්ත, සෙම් රොගාදීන්ගෙන් මිදුණු හෙයින් ද උපක්ලෙශයන්ගෙන් විනිර්මුක්ත හෙයින් ද, ඉතා දුරෙහිවූ ද, ඉතා සියුම්වූ ද ශබ්ද අරමුණු ඇසීමට පවා සමර්ථ දිව්‍යමය වූ ප්‍රසාද ශ්‍රොත ධාතුව වෙයි. එසේම දිව්‍යශ්‍රොත ඥානය ලැබූ යොගී තෙම, වීර්‍ය්‍යාරම්භ වශයෙන් අභිමතාර්ථ සිද්ධිය කරන හෙයින් වීර්‍ය්‍ය භාවනා නම් වූ කුසල භාවනාවෙන් නොහොත් ප්‍රධාන සඞ්ඛාර සඞ්ඛ්‍යාත ඉද්ධිය ද භාවනායෙන් නිපන් ප්‍රඥමයවූ, උපක්ලෙශ විනිර්මුක්ත හෙයින් දුරයෙහිවූ ද, සියුම්වූ ද, ආලම්බන පිළිගැනීමෙහි සමර්ථ හෙයින් දිව්‍යශ්‍රොතය වැනිවූයේ හෝ, දිව්‍යවිහාර සඞ්ඛ්‍යාත රූපාවචර සතර ධ්‍යානයට ඇතුළත් වූ චතුර්ථ ධ්‍යානය නිසා ලබන ලද හෙයින් ද, දිව්‍ය නම් වූ තත්‍ව සේ ශබ්ද ස්වභාවය අවබෝධ කරන හෙයින් ශ්‍රොත නම් වූ, ආත්මාදීන් ශූන්‍ය හෙයින් හා ස්වලක්ෂණය දරණ හෙයින් ධාතු නම් වූ හෝ, හුදෙක් ඇසීම් මාත්‍රය කරන හෙයින්, ශ්‍රොතය වැනි හෙයින් ශ්‍රොත ධාතු නම් වූ දිව්‍ය ඥානයෙන්, උපක්ලෙශ විනිර්මුක්ත හෙයින් පිරිසුදු වූ, මිනිසුන් විසින් ස්වභාවයෙන් ලබන ශබ්ද ඇසීමෙහි විෂය ප්‍රමාණය ඉක්ම, දෙවියන්ගේ, කථා ශබ්දය ඇසීමෙහිදී දෙවියන්ගේ ශ්‍රොතයට විෂය වූ ප්‍රමාණයෙහි පවත්නා හෙයින් මනුෂ්‍ය විෂය ඉක්මවා සිටියාවූ යම් ඥානශ්‍රොතයකින් දිව්‍ය මනුෂ්‍ය දෙපක්ෂයෙහි වූ ශබ්දයන් අසයි. අන්‍ය චක්‍රවාටාදී ඉතා දුර තන්හි හෝ යටත් පිරිසෙයින් තම සිරුර පිළිබඳ වූ ද උකුණු ආදීන්ගේ ද, සියලු සවිඥනක අවිඥනක ශබ්දයන් ද අසයි.

**දිව්‍යශ්‍රොත ඥානය** උපදවනු කැමති යෝගාවචර තෙම අභිඥපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, එයින් නැගී

දිව්‍යශ්‍රොත ඥානයට පරිකර්ම වශයෙන් පැවති ක්‍ෂණික සමාධියෙන් සමාහිත වූ චිත්තයෙන් පළමු කොට ප්‍රකෘති ශ්‍රොත ප්‍රසාදයට විෂය වූ, අරණ්‍යාදී දූර තන්හි වූ සිංහ, ව්‍යාඝ්‍රාදීන්ගේ ද මේඝ ගර්ජනාදී වූ ද ඖදාරික ශබ්දය ආවර්ජනා කළ යුතු. මෙසේ ක්‍රමයෙන් ළං ළංව අවුත් විහාරයෙහි ගෙඩිය ගසන ශබ්දය, බෙර ශබ්දය, සංඛ ශබ්දය, සාමණේර දහර භික්‍ෂූන්ගේ සජ්ඣායනා ශබ්දය, "කිම, ස්වාමීනි, කිම ඇවැත්නි" යනාදීවූ ප්‍රකෘතියෙන් කථා කරන ශබ්දය, පක්‍ෂි ශබ්දය, වාත ශබ්දය, පාද ශබ්දය, අව්වෙහි වියලෙන තල්පත්වල ශබ්දය, කුරුකුහුඹු ආදීන්ගේ ශබ්දය යනාදී වශයෙන් සියලු ඖදාරික ශබ්දයන්ගේ පටන් ඉතා සියුම් ශබ්දයන් දක්වා ආවර්ජනා කටයුතු.

එසේම දිව්‍යශ්‍රොත ඥානය ඉපදවීමට හේතුවූ පූර්ව-දිසාවෙහි වූ ශබ්දය ද, පශ්චිම දිසාවෙහි වූ ශබ්දය ද, උත්තර දිසාවෙහි වූ ශබ්දය ද, දක්‍ෂිණ දිසාවෙහි වූ ශබ්දය ද, හෙට්ඨිම දිසාවෙහි වූ ශබ්දය ද, උපරිම දිසාවෙහි වූ ශබ්දය ද, නිරිත දිසාවෙහි වූ ශබ්දය ද, ඊසාන දිසාවෙහි වූ ශබ්දය ද, වයඹ දිසාවෙහි වූ ශබ්දය ද, ගිනිකොණ දිසාවෙහි වූ ශබ්දය ද යනාදී වශයෙන් සියලු දිසා අනු දිසාවන්හි ඖදාරික වූ ද, සියුම් වූ ද සියළුම ශබ්ද මෙනෙහි කටයුතු. මෙසේ මෙනෙහි කරන කල්හි ඒ ශබ්දය ඔහුගේ ප්‍රකෘති සිතට ප්‍රකට වෙයි. පරිකර්ම සමාධි චිත්තයට වූකලී අතිශයින් ම ප්‍රකට වෙයි.

මෙසේ ශබ්ද නිමිත්ත මෙනෙහි කරන්නාවූ යෝගා-වචරයාහට දිව්‍යශ්‍රොතධාතුව දැන් දැන් උපදනේ යයි කියයුතු තැනට පැමිණි කල්හි, අරමුණුවූ ශබ්ද අතුරෙන් යම් කිසි ශබ්දාරම්මණයක් අරමුණු කොට මනොද්වාරා-වර්ජන චිත්තය නිරුද්ධවූ කල්හි තීක්‍ෂ්ණප්‍රාඥ, මන්දප්‍රාඥයන්ගේ වශයෙන් ජවනයන් සතරක් හෝ පසක් උපදී. තීක්‍ෂ්ණ ප්‍රාඥයාහට උපදනා උපචාර, අනුලොම ගොත්‍රභූ යන කාමාවචර ජවන් තුනට අනතුරුව ද, මන්දප්‍රාඥයාහට උපදනා පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ යන

කාමාවචර ජවන් සතරට අනතුරව ද, සතරවනුව හෝ පස්වනුව හෝ රූපාවචර චතුර්ථධ්‍යාන අභිඥා සිත උපදී. ඒ චතුර්ථ ධ්‍යාන සිතෙහි උපදනා ඥානය **දිව්‍යශ්‍රොත ධාතු** නම් වේ.

මේ දිව්‍යශ්‍රොතධාතුව ස්ථිර කොට පවත්වාගනු කැමති යෝගාවචර තෙම, පාදක චතුර්ථ ධ්‍යානයට අරමුණු වූ කසිණ නිමිත්ත මෙතෙක් තැන පැතිරේවායි මෙනෙහි කරන්නේ ය. එවිට කසිණ නිමිත්ත එතෙක් තැන පැතිරේ. අනතුරුව ඒ යෝගී තෙම පාදක ධ්‍යානයෙන් නැඟී එහි වූ ශබ්දය ආවර්ජනා කෙරේ. පළමු කොට මෙතෙක් තැන ශබ්දය අසම්යි එක් අඟලක් පමණ තැන පිරිසිඳ වැඩිය යුතු. අනතුරු දඟුල්, සතරඟුල්, අටඟුල්, වියත්, රියන්, ඇතුළු ගැබ, පමුඛය, ප්‍රාසාදය, පිරිවෙණ, සංඝාරාමය ගොදුරු ගම ජනපදාදී වශයෙන් ක්‍රමයෙන් සක්වළ තෙක් ද, එයින් පිටතද පිරිසිඳ වැඩිය යුතු. මෙසේ ලබන ලද අභිඥ ඇති යෝගී තෙම පාදක ධ්‍යානාලම්බනයෙන් සම්මර්ශනය කරණ ලදුව ශරීරය ඇතුළත වූ ශබ්දය නැවත පාදක ධ්‍යානයට සමනොවැද දිව්‍යශ්‍රොත ඥානයෙන් ම අසන්නේ ය. මෙසේ අසන්නේ ද බඹලොවතෙක් සක්, බෙර, පණවාදී ශබ්දයෙන් එකකොලාහලවූයේ ද වෙයි. ශබ්ද බෙද අසනු කැමැතිවූයේ නම් ඒ එක එක ශබ්දයක් පාසා නැවත නැවත පාදක ධ්‍යානයට සමවැදිය යුතු. එවිට මේ බෙර හඬය මේ සක් හඬය යනාදී වශයෙන් නියම කොට පිරිසිඳ දත හැකි වේ.

## 3. පරචිත්ත විජානන ඥානය

(චෙතොපරිය ඤාණය)

තමාගෙන් අන්‍යවූ සත්ත්වයන්ගේ සිතෙහි ස්වභාවය පිරිසිඳ දන්නා නුවණ **පරචිත්තවිජානන ඥානය** හෙවත් **චෙතො පරිය ඤාණ** නමි. **පරිය** ශබ්දයෙන් පිරිසිඳ දැනීම අදහස් කරන හෙයින් චිත්තයේ සරාගාදී ස්වභාවය පිරිසිඳ දැනීම චෙතො පරිය නම් වේ.

මේ චෙතො පරිය ඤාණය ඉපදවීමට දිව්‍යචක්‍ෂුරභි ඥානය පරිකර්ම වශයෙන් පවතී. එ හෙයින් චෙතො පරිය ඤාණය උපදවනු කැමැති යෝගාවචර තෙම පළමුකොට දිව්‍යචක්‍ෂුරභිඥානය උපදවාගත යුතු. හෙතෙම පළමුකොට රූපාවචර චතුර්ථ ධ්‍යානය උපදවා, එය ස්ථිර බවට පමුණුවා, දිව්‍යචක්‍ෂුරභිඥානය ද උපදවාගෙන අන්‍ය පුද්ගල යෙකුගේ හෙවත් පරසන්තානගත හෘදයවස්තුව බැලිය යුතු. මේ හෘදයමාංස පිණ්ඩය පිටතින් පියුම් කැකුළක බඳු සටහන් ඇත්තේ ය. ඇතුළත වැටකොලු කොස්සක් වැනි ය. එය ඇසුරුකොට චතුසමුට්ඨානික රුධිරය පවතී. ඒ චතුසමුට්ඨානික රුධිරය නිසා හෘදයවස්තු රූපය සහිතවූ වස්තුදසක රූපකලාප පවතී. මනොද්වාරයෙන් අරමුණු ගෙන උපදනා සිත් මේ හෘදයවස්තුරූපය වස්තුකොට උපදී.

දිව්‍යචක්‍ෂුරභිඥානලාභී යෝගාවචර තෙම ඒ හෘදය ඇසුරු කොට පවත්නා රුධිර සඞ්ඛ්‍යාත චතුසමුට්ඨානික රූපයන්ගේ වර්ණය බැලීමෙන් සරාගාදී ප්‍රභෙදවූ සිත බැලිය යුතු.

සොම්නස් සිතක් පවත්නා කල්හි ඒ ලෙය විලිකුන් නුගඵලයක් මෙන් රතු පැහැ ඇත්තේ වේ.

දොම්නස් සිතක් පවත්නා කල්හි විලිකුන් දඹ ඵලයක් මෙන් කලු පාට වේ.

උපෙක්‍ෂා සිතක් පවත්නා කල්හි පහන් තලතෙලක් බඳු පැහැ ඇති වේ.

ඒ අනුව බැලීමෙන් මේ සිත **සොමනස්සින්ද්‍රිය** සහගත යයි ද, මේ සිත **දොමනස්සින්ද්‍රිය** සහගත යයි ද, මේ සිත **උපෙක්ඛින්ද්‍රිය** සහගත යයි ද දැනගනී. මෙසේ දිව්‍යචක්‍ෂුරභි ඥානයෙන් අනුමාන වශයෙන් සිත දැනගත් පසු නැවත නැවත නුවණ මෙහෙයවා සෙවීමෙන් චෙතොපරියඤාණය

ශක්තිමත් බවට පැමිණ වියයුතු. හෙතෙම මෙසේ සොම නස්සින්ද්‍රිය, දෞමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය වශයෙන් ව්‍යවස්ථා කොට පාදක ධ්‍යානයට සමවැද, එයින් නැගී "මොහු සිත දනිමි. මොහු සිත දනිමි" යි පරිකර්ම කොට චෙතොපරිය ඥානය දූත් උපදනේ යයි කිවයුතු තැනට පැමිණි කල්හි එසේ උපදනා සිත අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිතක් උපදී. එයට අනතුරුව පෙරකීසේ කාමාවචර ජවන් පසක් හෝ සතරක් හෝ උපදී. එයින් පසු පස්වැනිව හෝ සතර වැනිව හෝ රූපාවචර චතුර්ථ ධ්‍යාන සිත උපදී. ඒ සිත හා යෙදුණු ප්‍රඥ චෛතසිකය **චෙතොපරිය ඥාණය** නම් වේ.

අභිඥලාභි යෝගාවචර තෙම මෙසේ පරසන්තානගත සිත් දූනගැනීම පිණිස පරිකර්මකොට, ප්‍රත්‍යක්ෂ වශයෙන් දූනීමෙන් එය ප්‍රකට කෙරේ. නැවත නැවත සමවැදීමෙන් ශක්තිමත්වූ කල්හි ක්‍රමයෙන් සියලුම කාමාවචර, රූපාවචර, අරූපාවචර සිත් සරාගාදී ප්‍රභෙද වශයෙන් දූනගන්නේ ය. අරූපතලයෙහි හදය වස්තුරූප නැති හෙයින්, කාමාවචර, රූපාවචර සිත් බලා මනා පුරුද්දක් ඇති යෝගාවචර තෙම සිතින් සිතට සංක්‍රමණයවීම් වශයෙන් හෝ ආවර්ජනා බලයෙන් හෝ දොලොස් අරූපාවචර සිත් දූන ගන්නේ ය.

**චෙතොපරිය ඥාණයෙන්** පරසිත් බලන්නාවූ යෝගා- වචරයා ඒ සිත් සියල්ල සරාගාදිවූ සොලොස් ප්‍රභෙදයන්ගේ වශයෙන් බලන්නේ ය. ඒ මෙසේයි.

**1. සරාගං වා චිත්තං සරාගං චිත්තංති පජානාති**- රාගය සහිත වූ සිත සරාග සිත වශයෙන් බලන්නේ ය. මෙහි සරාග සිත නම් අටවැදූරුම් ලොභසහගත සිතය. දොලොස් අකුසල් සිත් අතුරෙන් ලොභමූල සිත් අටෙහි ලොභ සඞ්ඛ්‍යාතවූ රාගය යෙදුණු හෙයින් **සරාග** නම් වේ.

**2. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තංති පජානාති**- වීතරාග හෙවත් රාගය හා නො යෙදුණු සිත අවශේෂවූ චාතුර්භූමික කුසල් සිත් හා අව්‍යාකෘත සිත් සත්සැත්තෑව

මෙහි වීතරාග සිත් නම්. ද්වේෂමූල සිත් දෙක හා මෝහමූල සිත් දෙක යන අකුසල් සිත් සතර මෙහි ඇතුලත් නො වේ. ඇතැම් ආචාර්ය්‍ය කෙනෙක් ඒ සතර ද ඇතුලත් කොට වීතරාග සිත් අසූඑකකැයි කියති.

**3. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති**- ද්වේෂමූල අකුසල් සිත් දෙක **සදොස සිත්** නම් වේ.

**4. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති**- සෙසු කුසල් සිත් හා අව්‍යාකෘත සිත් සත්සැත්තෑව **වීතදොස සිත්** නම්. මෙහි දී අකුසල් සිත් අතුරෙන් ලොභමූල සිත් අට හා මොහමූල දෙසිතය යන දස අකුසල චිත්තයන් ඇතුලත්වී නැත. ඇතැම් ආචාර්ය්‍ය කෙනෙක් ඒ දසය ද ඇතුලත් කොට වීතදොස සිත් සත් අසූවෙකැයි කියති.

**5. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති**- මොහමූල දෙසිත **සමොහ** සිත් නම්. සියලුම දොළොස් අකුසල චිත්තයන්හි මොහය යෙදෙන බැවින් දොළොස් අකුසල් සිත් ම **සමොහ සිත්** යයි ද කියනු ලැබේ.

**6. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති**- සෙසු කුසල් සිත් හා අව්‍යාකෘත සිත් සත්සැත්තෑව **වීත මොහ** සිත් නම්.

**7. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති**- අරමුණෙහි හැකිලෙන හෙයින් ථීන - මිද්ධ සහගත වූ සසඞ්ඛාරික අකුසල් සිත් පස **සංඛිත්තවූ** සිත් නම්.

**8. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති**- නොසන්සුන් බව ඇති උද්ධච්චසම්ප්‍රයුක්ත සිත **වික්ඛිත්ත** සිත නම්. දොළොස් අකුසල් සිත්හිම උද්ධච්චය යෙදෙන හෙයින් දොළොස් සිත් ම **වික්ඛිත්ත** සිත් යයි ද කියනු ලැබේ.

**9. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති**– කෙලශයන්ගේ විෂ්කම්භනයට සමත්වූ හෙයින් ද, විපුලඵල ලබාදෙන හෙයින් ද, මහත් බවට පැමිණි හෙයින් ද, උලාරවූ ඡන්‍ද, විරිය, චිත්ත විමංසාදීන්ගේ වශයෙන් පිළිපන් හෙයින් ද රූපාවචර සිත් පසළොසත් අරූපාවචර සිත් දෙළොසත් යන සිත් සත්විස්ස මහග්ගත සිත් නම්.

**10. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති**– රූපාවචර අරූපාවචර සිත් සත්විසස හැර ඉතිරි දෙසැටක් සිත් අමහග්ගත සිත් නම්.

**11. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති**– සියලුම ත්‍රෛභූමික, එනම් කාමාවචර, රූපා-වචර, අරූපාවචර යන ලෞකික සිත් සඋත්තර සිත් නම්.

**12. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති**– ලෝකොත්තර සිත් අට අනුත්තර සිත් නම්.

**13. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති**– උපචාර සමාධියට හෝ අර්පණා සමාධියට හෝ පැමිණි සිත් සමාහිත සිත් නම් වේ.

**14. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති**– එසේ උපචාර සමාධියට හෝ අර්පණා සමාධියට නො පැමිණි සිත් අසමාහිත සිත් නම්.

**15. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජා-නාති**– **තදඞ්ගවිමුක්ති** වශයෙන් කෙලෙසුන්ගෙන් විනිර්මුක්ත වූ හෙවත් මිදුණු කාමාවචර කුසල් සිත ද.

**විෂ්කම්භන විමුක්ති** වශයෙන් කෙලෙසුන් ගෙන් මිදුණු රූපාවචර, අරූපාවචර සිත් ද,

**සමුච්ඡෙද විමුක්ති** වශයෙන් කෙලෙසුන්ගෙන් මිදුණු මාර්ග සිත් ද,

**පටිප්පස්සද්ධි විමුක්ති** වශයෙන් කෙලෙසුන්ගෙන් මිදුණු ලෝකෝත්තර ඵල සිත් සතර ද,

**නිස්සරණ විමුක්ති** වශයෙන් කෙලෙසුන්ගෙන් මිදුණු මාර්ගඵල සිත් දෙකොටස ද විමුක්ත සිත් නම්.

**16. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති**- මෙසේ පසළොස් විමුක්තීන්ගේ වශයෙන් කෙලෙසුන් කෙරෙන් නොමිදුණු සිත් අවිමුක්ත සිත් යයි දත්තේය.

## 4. පුබ්බෙනිවාසානුස්සති ඥානය

පෙර ජාතීන්හි කාම, රූප, අරූප භවයන්හි පැවති ස්කන්ධ පරම්පරාව සිහි කිරීමට සමත් වූ සමාධිය හා එක්ව පැවති ඥානය **පූර්වේනිවාසානුස්මෘති ඥානය** නම්. මේ ඥානය උපදවාගත් යෝගාවචර තෙම නොයෙක් භව, යෝනි, ගති, විඤ්ඤාණස්ථිති සත්ත්වාවාසාදී වශයෙන් අනෙක ප්‍රකාර වූ නාම, ගෝත්‍රාදී ආකාරයෙන් අනතුරු අතීත භවය ආදිකොට ඒ ඒ භවයෙහි පැවති ස්කන්ධ, පටිපාටි වශයෙන් හෝ, චුති-පටිසන්ධි වශයෙන් හෝ පිළිවෙළින් නුවණින් අනුගමනය කොට සිහි කරයි. එසේ සිහි කරන පුද්ගලයෝ සදෙනෙකි. එනම්:-

**1. තීර්ථකයා**- මේ ශාසනයෙන් පිටත්හි වූ කර්මවාදී ක්‍රියාවාදී තාපසාදීහු ඉකුත් සතළිස් කල්පයක් කල් සිහි කෙරෙති. එය ද ස්කන්ධ පටිපාටිය වශයෙන් සිහි කරති. නාම-රූප ධර්මයන් පිරිසිඳ දත්නා විදර්ශනා ඥානය නැති හෙයින් ඔහු දුර්වල ප්‍රඥාවෙන් යුක්තවූ වෙති.

**2. ප්‍රකෘති ශ්‍රාවකයෝ**- අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවකයන් හැර අනිකුත් බුධශ්‍රාවකයෝ ප්‍රකෘති ශ්‍රාවකයෝ ය. ඒ ප්‍රකෘති ශ්‍රාවකයෝ බලවත් ප්‍රඥා ඇති හෙයින් ස්කන්ධ පිළිවෙළින් හෝ චුතිප්‍රතිසන්ධි පිළිවෙළින් හෝ කල්ප සියක්, දහසක් හෝ සිහි කෙරෙති.

**3. අසූමහා ශ්‍රාවකයෝ**- කල්ප ලක්ෂයක් චුති ප්‍රතිසන්ධි ක්‍රමය අනුව සිහි කෙරෙති.

**4. අග්‍රශ්‍රාවක දෙනම**- එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් චුතිප්‍රතිසන්ධි පිළිවෙළින් සිහි කෙරෙති.

**5. පසේබුදුවරයන් වහන්සේලා**- දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් චුති-ප්‍රතිසන්ධි පිළිවෙලින් සිහි කෙරෙති.

මහාශ්‍රාවක, අග්‍රශ්‍රාවක හා පසේබුදුවරයන්ගේ මේ කාල පරිච්ඡේදය උන්වහන්සේලාගේ අභිනීහාරය හා බෝධි-සම්භාරය පූරණ කාලය වශයෙන් දක්වන ලදී.

**6. සම්‍යක් සම්බුදුන් වහන්සේට** සන්ධ පටිපාටියක් හෝ, චුති-පටිසන්ධි පටිපාටියක් හෝ කාල නියමයක් හෝ නැත්තේ ය. කෝටිගණන් කල්ප අත්හැර යම් තැනක් බලනු කැමැති නම් ඒ තැන ප්‍රකට වේ. එසේ බලන්නාහු ද සිංහ ගතිකව, වාලවේධයෙහි සමත්, සරභඞ්ගාදී ධනුර්-ධරයන් විසින් විදිනා ලද හීය, අතර ගස් වැල් ආදියක නො ගැටී, ඉලක්කය ම විදපියන්නාක් මෙන්, අතරතුර ජාතීන්හි නො ගැටී අභිමත ජාතියෙහි නුවණ පැමිණ සිටී.

මේ පුබ්බේනිවාස අනුසමරණය ද ඒ ඒ පුද්ගලයන්ගේ වශයෙන් වෙනස් වේ.

**තීර්ථකයෝ**- කණමැදිරි එළියෙන් බලන්නාක් මෙන් ද

**ප්‍රකෘති ශ්‍රාවකයෝ**- පහන් එළියෙන් බලන්නාක් මෙන් ද,

**මහා ශ්‍රාවකයෝ**- ගිනිහුලකින් බලන්නාක් මෙන් ද,

**අග්‍ර ශ්‍රාවකයෝ**- ඕසධිතාරකා එළියෙන් බලන්නාක් මෙන් ද,

**පසේබුදුවරයෝ**- සඳ එළියෙන් බලන්නාක් මෙන් ද,

**සම්‍යක් සම්බුදුවරයෝ**- මධ්‍යාහ්න සූර්‍ය්‍යාලෝකයෙන් බලන්නාක් මෙන් ද ප්‍රකට වේ.

තව ද **තීර්ථකයන්ගේ** පූර්වේනිවාසානුස්මරණය අන්ධයාගේ සැරයටි කොණ ගෙන යාම මෙන් ද,

**ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ ඥානය**- තනි ඒදණ්ඩෙහි යාමක් මෙන් ද,

**මහා ශ්‍රාවකයන්ගේ ඥානය**- පුවරුහෙයකින් යන්නාක් මෙන් ද,

**අග්‍ර ශ්‍රාවකයන්ගේ ඥානය**- ගැළක් යා හැකි හෙයක යන්නාක් මෙන් ද,

**පසේබුදුවරයන්ගේ ඥානය**- පා මගෙක යන්නාක් මෙන් ද,

**සම්‍යක් සම්බුදුවරයන්ගේ ඥානය**- මහා සකට මාර්ගයෙක යන්නාක් මෙන් ද ප්‍රකට වේ.

පුබ්බෙ**නිවාසානුස්සති** ඥානය ලබනු කැමති ආදිකාර්මික යෝගාවචර භික්ෂුව පසුබත නොහොත් පිණ්ඩපාතයෙන් වැළකී රහසිගතව, හුදකලාව හිඳ, කසිණාරම්මණය වඩා පිළිවෙළින් රූපාවචර චතුර්ථධ්‍යානයට සමවැද, අනතුරුව අභිඥපාදක චතුර්ථ ධ්‍යානයෙන් නැගී, සියලු කටයුතු වලට පසුව වූ ඒ හිඳීම සිහි කළයුතු. එතැන් සිට පිළිවෙළින් ආසන පැනවීම ය, සෙනසුනට ඇතුල්වීම ය, පාසිවුරු තැන්පත් කිරීම ය, අහර අනුභව කරන කාලය, ගමින් ආපසු ආ කාලය, ගමෙහි පිඩුසිඟා වඩින කාලය, පිඩුපිණිස ගමට වදනා කාලය, විහාරයෙන් නික්මෙන කාලය, දාගැබ්, මහබෝ වඳින කාලය, පාත්‍රය සෝදනා කාලය, පාත්‍රය, පිළිගන්නා කාලය, පාත්‍රය ගන්නට පෙර මුව දෙවීම තෙක් කළ දෙය ද, උදෑසන කාලයෙහි කළ දෑය ද, මධ්‍යම යාමයෙහි කළ දෙය ද, ප්‍රථම යාමයෙහි කළ දෙය ද, මෙසේ ප්‍රතිලෝම වශයෙන් සියලු රෑ දවල්

කල දූය ද, ආවර්ජනා කල යුතු. මෙකී කරුණු ප්‍රකෘති සිතට ද ප්‍රකට වේ. පරිකර්ම සමාධි චිත්තයට අතිශයින් ම ප්‍රකට වේ ඉදින් යම්කිසිවක් ප්‍රකට නොවේ ද, නැවත පාදක ධ්‍යානයට සමවැද, එයින් නැගී මෙනෙහි කල යුතු. මෙතෙකින් පහනක් දැල්වූ කල්හි මෙන් ප්‍රකට වෙයි.

මෙසේ ප්‍රතිලෝම වශයෙන් දෙවෙනි දවසය, තුන්වන දවසය, සතරවන දවසය, පස්වන දවසය, දසවන දවසය, අර්ධමාසය, මාසය, අවුරුද්දය, දස වසය, විසි වසය යනාදී ක්‍රමයෙන් මේ ආත්මභාවයෙහි ප්‍රතිසන්ධිය තෙක් ආවර්ජනා කටයුතු. මෙසේ මෙනෙහි කොට නැවත මෙයට අනතුරු අත්බැව්හි චුතික්ෂණයෙහි පැවැති නාම රූප ආවර්ජනා කටයුතු. අභිඥා සඳහා පුරුදු කරණ ලද නුවණ ඇති භික්ෂුව ප්‍රථම වාරයෙහි ම ප්‍රතිසන්ධිය උගුළුවා චුතික්ෂණයෙහි පැවැති නාම-රූපයන් බැලීමට සමත් වේ. පූර්වභවයෙහි පැවැති නාම-රූපයෝ ඉතිරියක් නැතිව ම නිරුද්ධවිය. අනෙක් කර්මයෙකින් හටගත් නාම-රූප පහළ විය. එහෙයින් ඒ නාම-රූපයන් සැඟවී සිටින ස්ථානය හාත්පසින් වැසුණු ඝනාන්ධකාරය මෙන් අප්‍රකට වේ ම ය. නුවණ මඳ පුද්ගලයාහට ඒ නාම-රූපයන් දැකීම ඉතා දුෂ්කරය. එහෙයින් ඔහු "ප්‍රතිසන්ධිය උගුළුවා චුතික්ෂණයෙහි පැවැති නාම-රූප දැකීමට නො හැකි වෙමියි" වියර්ථය නොහළ යුතු. ඔහු විසින් පාදක ධ්‍යානයට නැවත නැවත සමවැද එයින් නැග නැග ඒ ස්ථානය ආවර්ජනා කටයුතු.

යම්සේ ශක්තිමත් පුරුෂයෙක් කූටාගාර කර්ණිකාවක් කරණු සඳහා මහාරුකක් සිඳින්නේ, එහි සාඛාවන් සිඳීමෙන් ම පොරොවෙහි මුවහත නැති වී ගියේ නම්, ඔහු එපමණකින් මහාරුක සිඳිය නො හැකි යයි පසුබට නොවී එය කම්හලට ගෙනගොස් මුවහත් තබා ගෙනවුත් නැවත රුක සිඳින්නේ ය. මෙසේ රුක සිඳින්නාවූ ඔහුගේ පොරොවෙහි මුවහත නැවත නැවත නැතිවී ගියේ නම් හෙතෙම නැවත නැවතත් එය කම්හලට ගෙන ගොස්

මුවහත් තබා ගෙනවුත් රුක සිඳින්නේ ය. මෙසේ ඔහු පළමු සිඳි තැන් නැවත නොසිඳිය යුතු හෙයින් ද, නොසිඳු තැන් ම සිඳිය යුතු වන හෙයින් ද නොබෝකලෙකින් ඒ මහාරුක බිම හෙළන්නේ ය. එපරිද්දෙන් ම යෝගාවචර තෙම පාදක ධ්‍යානයෙන් නැගී, පළමු ආවර්ජනා කළ තැන් නැවත ආවර්ජනා නොකොට ප්‍රතිසන්ධියම ආවර්ජනාකරන්නේ නොබෝ කලෙකින් ම ප්‍රතිසන්ධිය උගුළුවා චුතික්ෂණයෙහි පැවැති නාම-රූපයන් අරමුණු කරන්නේ ය.

මේ උපමායෙහි කූටාගාර කර්ණිකාව මෙන් පූර්වේ-නිවාසානුස්සති ඥානය ද, මහා රුක මෙන් පූර්වභවයෙහි චුතික්ෂණයෙහි පැවැති නාම-රූප ධර්ම ද, ශාඛාවන් මෙන් මේ භවයෙහි ඒ හා සම්බන්ධ චිත්තය ද, මුවහත් පොරෝ-වෙන් සිඳින්නාක් මෙන් පරිකර්ම භාවනාද, කම්හල මෙන් පාදක ධ්‍යානය ද දතයුතු.

මෙසේ පසුවමම වූ සිඳීමෙහි පටන් ප්‍රතිසන්ධිය තෙක් අරමුණු කොට පැවැති ඥානය පූර්වේනිවාසානුස්මෘති ඥානය නොවේ. එය **පරිකර්ම සමාධි ඥානය** වේ. යම් කලෙක ඒ යෝගාවචරයාහට ප්‍රතිසන්ධිය ඉක්මවා පූර්වභවයෙහි වූ චුතික්ෂණයෙහි පැවැති නාම-රූප අරමුණු කොට මනොද්වා-රාවර්ජන සිත උපදී ද, ඒ සිත නිරුද්ධවූ පසු එයම අරමුණු කොට ජවන් සිත් සතරක් හෝ පසක් උපදී. එයින් පූර්වවූ පරිකර්මාදී සිත් කාමාවචර ය, පශ්චිම වූ සිත රූපාවචර චතුර්ථ ධ්‍යාන අර්පණා සිත වේ. ඒ රූපාවචර චතුර්ථ ධ්‍යාන චිත්තය හා සමග උපදනා ඥාණය **පුබ්බේනිවාසානුස්සති ඤාණ** නම්. ඒ ඤාණය හා සමග යෙදුණු සතිය කරණ කොට අනෙකවිධ වූ පූර්වේනිවාස අනුස්මරණය කෙරේ.

පූර්වේනිවාසයන් මෙසේ සිහිකරන්නාවූ අභිඥලාභී පුද්ගල තෙම, එක් ජාතියක් හෝ දෙකක් හෝ තුනක් හෝ ඒ ඒ ජාතීන් පිළිබඳ සකන්ධ සන්තතිය හෝ, ජාතිදහයක් හෝ නොයෙක් සංවට්ට විවට්ට කල්ප හෝ ආකාර සහිතවූ, උද්දේස සහිතවූ අනෙක ප්‍රකාර වූ පූර්වේනිවාසය සිහි කරයි.

එක් භවයක් පිළිබඳ වූ, එක් කර්මයෙන් නිපන් ප්‍රතිසන්ධිය මුල් කොට ඇති, චුතිය අවසන් කොට ඇති ස්කන්ධ සන්තතියට එක් ජාතියක් යයි කියනු ලැබේ.

සංවට්ට කල්පය නම් පිරිහෙන්නාවූ නොහොත් විනාශ-වන්නාවූ කල්පයයි, විවට්ට කල්පය නම් වැඩෙන්නාවූ කල්පයයි, කල්පයන් පිළිබඳ විස්තරය යට දක්වන ලද හෙයින් එය බලා දත යුතු.

මෙසේ නොයෙක් ජාති, කල්පාදිය සිහිකරන්නාවූ යෝගී තෙම, අසුවල් ජාතියෙහි හෝ සංවට්ට කල්පයෙහි හෝ අසුවල් භවයෙහි හෝ අසුවල් යෝනියෙහි හෝ අසුවල් ගතියෙහි හෝ අසුවල් විඥානස්ථිතියෙහි හෝ අසුවල් සත්ත්වාවාසයෙහි හෝ අසුවල් සත්ත්වනිකායෙහි හෝ උපන්නෙමි. එකල්හි මම මෙනම් ඇත්තෙක් වීමි. මෙනම් ගෝත්‍ර ඇත්තෙක් වීමි. නාම, ගෝත්‍රාදිය මෙන් ම වර්ණ, සම්පත්, රූක්ෂ බව, ප්‍රණීත බව, ජීවිකාව, සුව-දුක් බහුල බව හෝ අල්පායුෂ්ක බව හෝ දීර්ඝායුෂ්ක බව හෝ ඇත්තෙක් වීමි යනාදී වශයෙන් සිහිකරන්නේ ය. ඒ භවයෙහි හවුරුදු සියයක් හෝ නෛවසංඥානාසංඥා භවයෙහි නම් මහාකල්ප අසූසාර දහසක් හෝ වැස, ඒ භව, යෝනි, ගති, විඥානස්ථිති සත්ත්වාවාස, සත්ත්ව-නිකායයෙන් චුතව අසුවල් භවයෙක හෝ යෝනියෙක හෝ ගතියෙක හෝ විඥානස්ථිතියෙක හෝ සත්ත්වාවාස-යෙක හෝ, සත්ත්වනිකායක හෝ උපන්නෙමි. එයින් ද චුතව අසුවල් අසුවල් තැන උපන්නෙමි. එහිදී නාම ගොත්‍රාදිය මෙසේ විය යනාදී වශයෙන් සිහි කරන්නේ ය.

මෙපරිද්දෙන් මේ පූර්වේනිවාසානුස්සති ඥානයෙන්, අසුවල් තැන ඉපිද, එයින් චුතව අසුවල් තැන ඉපිද, මෙනම් ක්ෂත්‍රිය කුලයෙහි හෝ මෙනම් බ්‍රාහ්මණ කුලයෙහි හෝ මෙනම් වර්ණාදියෙන් යුක්තවීමි යි ආකාර වශයෙන් ද, නාමගෝත්‍රාදී උද්දෙස වශයෙන් ද, නානාවිධ වූ පූර්වේනිවාස සිහි කරන්නේ ය.

# 5. චුතූපපාත ඥානය

සත්ත්වයන්ගේ චුති උත්පත්ති දක්නා ඥාණය **චුතූපපාත ඥාන** නම් වේ. දිව්‍යචක්ෂුරභිඥානයෙන් ද චුති උත්පත්ති දක්නා හෙයින් මෙයට **දිබ්බචක්ඛු ඥානය** යයි ද කියනු ලැබේ.

මිනිසුන්ගේ මසැස පිළිබඳ දර්‍ශනොපචාරය ඉක්ම සිටි නොහොත් මිනිස් ඇසින් නොදැක්කහැකි සූක්ෂම රූපාදිය දැකීමට සමත්වූ, දිව්‍යමය ප්‍රසාද චක්ෂුෂයෙන් බලන්නාක් මෙන් සියුම් රූපාදිය දක්නා මේ දිව්‍යචක්ෂුරභිඥානයෙන් යුක්තවූ යෝගාවචර තෙම චුතවන්නාවූ ද, උපදින්නාවූ ද සත්ත්වයන් දකී. යමෙක් චුතිය පමණක් දැක, උත්පත්තිය නො දක්නේ නම් හෙතෙමේ උච්ඡේද දෘෂ්ටිය ගන්නේ ය. යමෙක් චුතිය නොදැක උත්පත්තිය පමණක් දකීද හෙතෙමේ අභිනව සත්ත්වයන් පහළ වන්නේ යයි දෘෂ්ටි ගනී. යමෙක් චුතියත් උත්පත්තියත් යන දෙකම දකී නම්, හෙතෙමේ මේ උභය දෘෂ්ටින් ගෙන් මිදුණු පිරිසුදු දෘෂ්ටියක් ඇති කෙනෙක් වේ. අභිඥාලාභී බුද්ධපුත්‍රයෝ චනාහි චුති උත්පත්ති දෙකම දක්නා හෙයින් දිට්ඨි විසුද්ධත්වයට පැමිණියාහු වෙති. චුති උත්පත්ති දක්නා කල්හි දිව්‍යචක්ෂුරභිඥානයට අරමුණු වන්නේ චුතියට ආසන්නවූ ද, එකෙණෙහි ම උපන්නාවූ ද සත්ත්වයෝ යි. රූපය පිළිබඳ චුති, උත්පාද ක්ෂණයන් ඉතා සියුම් බැවින් එය අභිඥා සිතට හමු නොවේ.

මේ දිව්‍යස් නුවණින් සත්ත්වයන් බලන්නාවූ යෝගාවචරයාහට මොහ සම්ප්‍රයුක්ත අකුසල කර්‍මයෙන් උපන්නාවූ ජාති, කුල, භොගාදීන්ගේ වශයෙන් හීන වූ, ගර්හා කටයුතු බවට පැමිණි, ලාමක කොට දක්නා ලද, හීන සත්ත්වයෝ ද හමුවෙත්.

එසේම, අමොහ සම්ප්‍රයුක්ත කුසල කර්‍මයෙන් නිපන්, සහේතුක ප්‍රතිසන්ධි ලැබූ ප්‍රණීත වූ සත්ත්වයෝ ද හමුවෙත්.

තවද අද්වේෂ සම්ප්‍රයුක්ත කුසල කර්මයෙන් නිපන්, ඉෂ්ට වර්ණාදියෙන් යුක්ත හෙයින් **සුවර්ණ** සත්ත්වයන් ද.

ද්වේෂ සම්ප්‍රයුක්ත අකුසල කර්මයෙන් නිපන් හෙයින් අනිෂ්ටවූ ද, අකාන්තවූ ද, අමනාපවූ ද, විරූපවූ ද, රූප ඇති **දුර්වර්ණ** සත්ත්වයන් ද,

අලෝභ සම්ප්‍රයුක්ත කුසල කර්මයෙන් නිපන් හෙයින් ආඪ්‍ය වූ, මහඩන ඇති, **සුගති** පුද්ගලයන් ද,

ලෝභ සම්ප්‍රයුක්ත අකුසල කර්මයෙන් නිපන් හෙයින් දිළිඳු වූ, සවල්ප වූ ආහාර-පාන ඇති **දුගති** පුද්ගලයන් ද දක්නු ලැබේ.

**එපමණක්** නොව යම් සත්ත්වයෙක් යම් කර්මයක් කොට යම් භවයෙක උත්පත්තිය ලැබුයේ නම් ඒ කර්මය ද දකී. එයට **යථාකම්මූපග ඥාණය** යයි කියනු ලැබේ. එසේම අනාගත භවයට හේතු වන කර්මය ද **අනාගතාංශ ඥාණයෙන්** බලයි.

**යථාකම්මූපග ඥාණය** උපදවනු කැමැති දිව්‍යචක්ෂු-රභිඥාලාභී යෝගාවචර තෙම, නිරයෙහි වූ සත්ත්වයෙකු දක්නු කැමැති නම්, නිරය අභිමුඛ කොට ධ්‍යානාලෝකය පතුරුවා නිරයෙහි වූ සත්ත්වයන් දිව්‍යඥානයෙන් ප්‍රත්‍යක්ෂසේ දැක, ඒ සත්ත්වයන්ගේ නිරයෙහි උපන් කර්මය බැලීමට කැමැතිවන්නේ, පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, එයින් නැගී "මේ සත්ත්වයා කවර නම් කර්මයක් කොට නිරයෙහි ඉපිද මෙපමණ දුක් අනුභව කෙරේද" යි මෙනෙහි කරයි. එවිට මෙනම් කර්මයකැයි කර්මාලම්බනික ඥානය උපදී. එසේම දෙව්ලොව දෙවියන් බලනු කැමැතිවේ නම්, දිව්‍ය ලෝකයට අභිමුඛකොට ආලෝකය පතුරුවා නන්දන වන, මිශ්‍රක වන, ඵාරුසක වනාදීන්හි මහා සම්පත් අනුභව කරන සුගති සත්ත්වයන් දිබ්බචක්ඛු ඥාණයෙන් දකී. අනතුරුව මේ සත්ත්වයන් කිනම් කුසල කර්මයක් කොට

මෙහි උපන්නාවූත් මහත් සම්පත් අනුභව කෙරෙත් දැයි බලන්නාහට මෙනම් කර්මයෙකැයි කර්මාලම්බනිකව ඥානය උපදී. මෙයද **යථාකම්මූපග ඥාණය** නම්. මේ යථාකම්මූපග ඥාණය උපදවා ගැනීමට වෙනම පරිකර්මයක් නැත. **අනාගතාංශ ඥාණයට ද** එසේ ම ය. මේ අනාගතාංශ ඥාණයත්, යථාකම්මූපග ඥාණයත්, දිබ්බචක්ඛු ඥාණය පාදක කොට ඇත්තහුට ම දිබ්බචක්ඛු ඥාණයෙන් ම සමෘඩ වන හෙයිනි. මතු උපදනා ආත්මභාවය බලනු කැමැති දිව නැණ ලැබූ යෝගාවචර තෙම යථාකම්මූපග ඥාණයම පාදක කොට අනාගතාංශ ඥාණය උපදවයි. මේ ඥාණ දෙකම දිබ්බචක්ඛු ඥාණය ඇති කල්හිම ලැබෙයි. නැති කල්හි නොලැබෙයි.

එසේම කාය දුශ්චරිත, වාග් දුශ්චරිත වශයෙන් ද, ආර්යෝපවාදක වශයෙන් ද, මිථ්‍යාදෘෂ්ටික වශයෙන් ද අකුසල කර්ම සමන්නාගත වූ අපාගත සත්ත්වයෝ දක්නා ලැබෙති.

කායද්වාරය මෙහෙයවා කාය විඥප්ති වශයෙන් පැවැත්තා වූ අකුසල කර්මය-**අකුසල කාය කර්ම** නම් වේ. වචිද්වාරය මෙහෙයවා වාග්විඥප්ති වශයෙන් පැවැත්තා වූ අකුසල කර්මය-**අකුසල වචීකර්ම** නම්.

බුදු, පසේබුදු, බුද්ධශ්‍රාවකයනට යටත්පිරිසෙයින් සෝවාන් ගිහියෙකුට පවා, අනර්ථකාමීව අන්තිම වස්තුවෙන් හෝ ගුණ නැසීමෙන් හෝ උපවාද කරන්නාහු, ආක්‍රොශ කරන්නාහු, ගර්හා කරන්නාහු, **ආර්යෝපවාදක** අකුසල කර්මයෙන් සමන්නාගත පුද්ගලයෝ වෙති. ආර්යයන් වහන්සේට සීලයෙන් උපවාද කරන්නේ නම් අන්තිම වස්තුවෙන් උපවාද බිණූයේ වේ. මොහුට ශ්‍රමණ ධර්මයක් නැත. මොහු අශ්‍රමණයක යනාදී වශයෙනි. මෝහට ධ්‍යානයෙක් වත්, විමොක්ෂයෙක් වත්, මාර්ගයෙක් වත්, ඵලයෙක් වත් නැතැයි උපවාද කරන්නේ, ගුණ නැසී-මෙන් උපවාද කරන්නේ වේ.

ඔහු දැන හෝ නොදැන හෝ උපවාද කළ කල්හි ඒ කර්මය **ආර්‍යෝපවාද කර්මය** වේ. මෙය ආනන්තරීය කර්මය හා සමානවූ ස්වර්ගාවරණවූ ද මාර්ගාවරණවූ ද, අකුසල කර්මයකි. නමුත් එය ආනන්තරීය කර්මය මෙන් ක්‍ෂමා කර නොගත හැකි **අතෙකිච්ඡ කර්මයක්** නොව ක්‍ෂමා කරගත හැකි **සතෙකිච්ඡ කර්මයකි.**

පෙර එක්තරා ගමෙක එක් ස්ථවිරයන් වහන්සේ නමක් නවක භික්‍ෂුවක් සමග පිඬුසිගා වඩින සේක. උන්වහන්සේලාට පළමු ගෙහිම උණු කැඳිත්තක් ලැබිණ. ස්ථවිරයන් වහන්සේට කුච්ඡි වාතයක් නොහොත් බඩ-රුජාවක් හටගත් හෙයින් "මේ උණු කැඳිත්ත උණුවෙන් ම සිහිල්වන්නට නොදී වැළඳුව හොත් සප්පාය වේ" යයි සිතා උළුඅස්සක් පිණිස මිනිසුන් ගෙනවුත් දමා තුබූ ලී කොටයක් මතහිඳ තෙරුන්වහන්සේ එය වැළඳූහ. නවක භික්‍ෂුව මෙය දැක, "ඉතා බඩසයින් පෙළෙන මේ මහල්ලා අපට ලජ්ජාවිය යුත්තක් කෙළේ" යයි කීය. තෙරුන් වහන්සේ ද ගම පිඬුසිගා විහාරයට ගොස් නවක භික්‍ෂුවට කථාකොට "ඇවැත්නි, තොපට මේ ශාසනයෙහි පිහිටක් ඇද්ද" යි විචාළාහ. "එසේ ය, ස්වාමීන්වහන්ස, මම සෝවාන්මි" යි කීය. "එසේ නම් මතුමාර්ගයක් පිණිස උත්සාහ නොකරව, තුඹ රහත්නමකට උපවාද කළහ" යි වදාළහ. නවක භික්‍ෂු තෙම තෙරුන්වහන්සේ ක්‍ෂමා කරවීය. එහෙයින් ඒ කර්මය ද බැහැර වී ය.

මෙසේ අන්‍යයෙක් ආර්‍යයන් වහන්සේ නමකට උපවාද කෙළේ නම්, උන්වහන්සේ වෙත ගොස් තමා වැඩිමහලු නම් උක්කුටිකයෙන් හිඳ, "මම ආයුෂ්මතුන්ට මේ මේ දෙය කීවෙමි, ඒ මට ක්‍ෂමා කෙරේවා" යි කියා ක්‍ෂමා කරවා ගතයුතු. ඉදින් තමා නවක කෙනෙක් වී නම් ආර්‍යයන් වහන්සේ වැඳ, උක්කුටිකයෙන් හිඳ, ඇඳිලි බැඳ, "ස්වාමිනි, මම ඔබවහන්සේට මේ මේ දෙය කීවෙමි. ඒ මට ක්‍ෂමා කරනු මැනවැ" යි ක්‍ෂමා කර විය යුතු. ඉදින් ආර්‍යයන් වහන්සේ යම් දිසාවෙකට ගියේ වී නම්,

තෙමේ ම එහි ගොස් හෝ සද්ධිවිහාරිකයකු හෝ යවා ක්‍ෂමා කර විය යුතු. ඉදින් එහි යන්නට හෝ කෙනෙකු යැවීමට හෝ නොහැකිවී නම් ඒ විහාරයෙහි භික්‍ෂූන් වැඩ සිටිද් ද, ඒ භික්‍ෂූහු නවක භික්‍ෂූන් නම් උක්කුටුකයෙන් හිඳ, වැඩිමහලු භික්‍ෂූන් නම් යට කියන පරිද්දෙන් පිළිපැද, "ස්වාමීනි, මම අසවල් ආයුෂ්මතුන්ට හෝ ස්ථවිරයන් වහන්සේට මේ මේ දෑය කීවෙමි, ඒ ආයුෂ්මතුන් හෝ ස්ථවිරයන් වහන්සේ මට ක්‍ෂමා කෙරෙත්වා" යි කියා ක්‍ෂමා කරගත යුතු. සම්මුඛයෙහි ක්‍ෂමා කළ නොහැකි නම් මෙසේ කළ යුතු. ඉදින් ආයතීයන් වහන්සේ ඒක-චාරික භික්‍ෂුවක් නොහොත් උන්වහන්සේ වසන තැනක් හෝ ආගිය තැනක් හෝ නොදනී නම්, එක් උගත් භික්‍ෂුන්වහන්සේ නමක් වෙත ගොස්, 'ස්වාමීන්වහන්ස, මම අසුවල් ආයුෂ්මතුන්ට මෙනම් මෙනම් දෑයක් කීවෙමි. එය සිහි කරන්නාවූ මට විපිළිසර උපදී. එයට කුමක් කරන්නෙම්ද" යි කිවයුතු. එවිට, "ඔබ එසේ නොසිතව, තෙරුන්වහන්සේ ඔබට ක්‍ෂමා කරනු ඇත. සිතසනසා ගනුව" යි කියා නම් ඔහු විසින් ද ඒ තෙරුන්වහන්සේ ගිය දිසාවට වැඳ ක්‍ෂමා කෙරෙත්වා යි කිව යුතු. ඉදින් ආයතීයන්වහන්සේ පිරිනිවන් පෑසේක් නම්, ඒ පිරිනිවන්පෑ ඇඳ සම්පයට ගොස් හෝ සොහොන වෙත ගොස් හෝ ක්‍ෂමා කරවිය යුතු. මෙසේ ක්‍ෂමා කරගත් කල්හි ඒ කර්මය ස්වර්ගාවරණ හෝ මාර්ගාවරණ හෝ නොවේ. කර්මය ද සංසිඳේ.

**මිථ්‍යාදෘෂ්ටිකයෝ** නම් විපරිතදෘෂ්ටි ඇත්තෝ යි.

**මිච්ඡාදිට්ඨි කම්ම සමාදානවූවෝ** නම් විපරිත දෘෂ්ටි වශයෙන් සමාදන් වූ නා නා විධ අකුසල කර්ම ඇත්තෝ ය. ඔව්හු මිථ්‍යාදෘෂ්ටිකවූ කාය කර්මාදීන්හි අන්‍යයන් ද සමාදන් කරවන්නාහු ය.

මේ මිථ්‍යාදෘෂ්ටිය මනොකර්මයෙකි. ආර්‍යෝපවාදය වචී-කර්මයෙකි. මිථ්‍යාදෘෂ්ටියට වඩා මහාසාවද්‍ය වූ අනික් කර්මයක් නැත්තේ ය.

මෙසේ කාය දුශ්චරිත, වාග් දුශ්චරිත, ආර්‍යෝපවාද, මිථ්‍යාදෘෂ්ටි ආදී වූ අකුසල කර්මයන් කළාහු අපායෙහි ද, දුර්ගතියෙහි ද, විනිපාතයෙහි ද, නරකයෙහි ද උපදින්නාහු වෙත්. මේ දිව්‍යචක්ෂුරභිඥානයෙන් ඔවුන් ද දකිනු ලැබේ.

අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහවූ හෙයින් **අපාය** නම් වේ. මේ **අපාය** යයි ගැනීමෙන් තිරිසන් යෝනිය ද ගැනේ.

දුකට ගතිවූ හෙයින් **දුර්ගති** නම් වේ. මෙයින් ප්‍රේත ලෝකය ද ගැනේ.

විවශව පතිත වන්නෝ **විනිපාතයෝ** ය. මෙයින් අසුර කාය ද ගැනේ.

ආස්වාද නම් වූ **අය** නැති හෙයින් නොහොත් ස්වර්ග-මෝක්ෂයට හේතු වූ ප්‍රත්‍යය සම්මත **අය** ගෙන් පහවූ හෙයින් සැපයන්ගේ හටගැනීමක් නැති හෙයින් **නිරය** නම් වේ. මෙයින් අවීචිය තෙක් සියලු අපාය ගැනේ.

මෙපරිද්දෙන් ම කුසල කර්මවිපාකයන්ගේ වශයෙන් සැපයට ගති වූ හෙයින් **සුගති** නම් වූ ද, සුවයෙන් අග්‍රවූ හෙයින් ස්වර්ගලෝකයෙහි උපන්නවුන් ද දකිති. මෙහි සුගතිය ගැනීමෙන් මනුෂ්‍යයෝ ද, ස්වර්ගය ගැනීමෙන් දෙවියෝ ද ගැනෙති.

දිව්‍යචක්ෂුරභිඥානයෙන් රූපයන් දකිනු කැමති ආදි කර්මික යෝගාවචර තෙම අටකසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක් අරමුණු කොට අභිඥාපාදක චතුර්ථ ධ්‍යානය උපදවා, යට දක්වන ලද පරිදි තුදුස් ආකාරයෙන් සිත දමනය කොට අඞ්ග අටකින් සම්පූර්ණ කිරීමෙන් භූමි, පාද, පද, මූල සම්පාදනය කිරීම් වශයෙන් සර්වප්‍රකාර-යෙන් ම දිව්‍යඥානයට සිත මෙහෙයීමට සුදුසු කොට **තෙජෝ කසිණ, ඕදාත කසිණ, ආලෝක කසිණ** යන තුනෙන් එකක් **දිව්‍යචක්ෂුරභිඥානයට** ආසන්න කළ යුතු.

එක් කසිණයත්හි උපචාර ධ්‍යානය පුහුණු කොට අරමුණ ද වැඩිය යුතු. ධ්‍යාන වශයෙන් කසිණාරම්මණයෙහි අභිඥා නොඉපදවිය යුතු.

මේ තුන් කසිණයන් අතුරෙන් ආලොක කසිණය ශ්‍රෙෂ්ඨ ය. එහෙයින් ආලොක කසිණය හෝ අනික් එකක් හෝ වඩා උපචාර ධ්‍යානය උපදවා ඒ උපචාර භූමියෙහි සිට ම ප්‍රතිභාග නිමිත්ත වැඩිය යුතු. එසේ කසිණ ප්‍රතිභාග නිමිත්ත වඩන ලද ප්‍රදේශයෙහි වූ රූපාලම්බනය ම දක්ක යුතු. එයින් පිටත අරමුණු කරන්නාහට පරිකර්ම වාරය ඉක්ම යන හෙයින් කසිණා ලොකය අතුරුදහන් වේ. අනතුරුව ධ්‍යානලාභීහු විසින් නැවත නැවත පාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී ආලෝකය පැතිර විය යුතු. මෙසේ වඩා කසිණාලෝකය ශක්තිමත්වූ කල්හි යම් පමණ ප්‍රදෙශයක කසිණාලෝකය පැතිරේවා යි පිරිසිඳින ලද්දේ නම් ඒ ප්‍රදෙශයෙහි කසිණාලෝකය පවතී. දවසක් මුළුල්ලෙහි වුවද එහිම හිඳ බලන්නාහට රූපාලම්බනය දක්ක හැකි වේ. මෙයට උපමාවක් දක්වනු ලැබේ.

එක්තරා මිනිසෙක් ගිනිහුලක් තනා රාත්‍රි කාලයෙහි මගට පිළිපන්නේ ය. ඒ ගිනිහුල නිවුණු කල්හි මාර්ගයෙහි සමවිසම තැන් නොපෙනී යයි. හෙතෙමේ ඒ ගිනිහුල බිමගසා නැවත ද දල්වා පෙරට වඩා එළිය වූයෙන් නැවත ද යන්නේ එය නැවත නැවත නිවීගිය කල්හි නැවත නැවත දල්වා මග යන්නේ ය. මෙසේ යන්නාවූ ඔහු සූර්ය්‍යයා උදාවූයෙන් ගිනිහුලෙන් වැඩක් නැති හෙයින් එය හැර දමා දවසම ගියේ ය. මේ උපමායෙහි ගිනිහුල එළිය මෙන් පරිකර්ම කළ කසිණාලොකය ද, ගිනිහුල නිවීමෙන් සමවිසම තැන් නොදැකීම මෙන් පරිකර්ම ධ්‍යාන වාරය ඉක්මවීමෙන් කසිණාලොකය අතුරුදහන් වී රූප නොදැකීම ද, ගිනිහුල බිම ගැසීම මෙන් නැවත නැවත පාදක ධ්‍යානයට සමවැදීම ද නැවත දල්වාගත් ගිනිහුල පෙරට වඩා ආලොකවීම මෙන් නැවත පරිකර්ම කරන

කල පෙරට වඩා කසිණාලෝකය පැතිරවීම ද, සූර්ය්‍යයාගේ උදාවීම මෙන් පිරිසිඳි පමණ තන්හි කසිණාලෝකය දැඩිව පැතිරී සිටීම ද, සූර්ය්‍යාලෝකයෙන් දවල් කාලයෙහි යාම මෙන්, දැඩිවූ කසිණාලෝකයෙන් දවසක් වුව ද රූප දැකීම දත යුතු.

මෙසේ භාවනා කරන යෝගාවචරයාගේ මසැසට හමුනොවූ කුසතුල වූ රූපය ද, හෘදවස්තුව ඇසුරු කොට පවත්නා රූපය ද, පොළොව යට භාගයෙහි වූ ද, භිත්ති පවුරු ආදියෙන් මුවහවූ ද, සක්වලින් බැහැරවූ ද රූපයන් යම් කලෙක නුවණැසට හමුවේ ද මසැසින් දක්නාක්මෙන් නුවණැසින් ප්‍රකටව දක්නේවේ ද එකල්හි දිව්‍යචක්ෂුරභිඥානය උපන්නේ යයි දත යුතු. චක්ෂුර් විඥානයෙන් ප්‍රකෘති රූපය මනාකොට දක්නාක් මෙන්, රූපයක් අරමුණුකොට පවත්නා සිත් අතුරෙන් දිව්‍යචක්ෂුරභිඥානය ද රූපාලම්බනය දැකීමට සමත් වේ. එයට පූර්වභාගයෙහි පැවැති පරිකර්ම සිත් රූපාලම්බනය දක්නේ නමුත් ප්‍රකට කොට බැලීමට සමත් නොවේ. දිව්‍යචක්ෂුරභිඥානය උපදනා චිත්ත වීථිය ඇති වන කල්හි එම රූපාලම්බනය අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිත ඉපිද නිරුද්ධවූ කල්හි එයම අරමුණු කොට පෙර කී සේ ජවන් සතරක් හෝ පසක් උපදී. එයින් අවසානයෙහි වූ රූපාලම්බන දැකීම සිද්ධ කරන චිත්තය රූපාවචර චතුර්ථ ධ්‍යානිකය. ඒ හා එක්ව යෙදුණා වූ ඥානයට **චුතූප පාත ඤාණය** යයි ද, **දිව්‍ය-චක්ෂුරභිඥානය** යයි ද කියනු ලැබේ.

මේ දිව්‍ය චක්ෂුරභිඥානය පෘථග්ජනයාහට අන්තරායකර විය හැකි. හෙතෙමේ යම් තැනෙක ආලෝක වේවායි අධිෂ්ඨාන කෙළේ නම් ඒ ඒ තන්හි වූ පෘථිවි, පර්වත, සමුද්‍රාදිය විනිවිද ආලෝකය වේ. එකල්හි දකිනු ලබන යක්ෂ රාක්ෂසාදී රූපයෙන් භය ඉපිද චිත්තවික්ෂෙපයට ද පැමිණ ධ්‍යානයෙන් පිරිහී උමතු බවට ද පැමිණිය හැකි වේ. එහෙයින් දිවැසින් පමණක් සතුටට පත්නොවී විදර්ශනා වඩා චතුස්සත්‍යාවබෝධයෙහි උත්සාහවත් විය යුතු.

## සප්ත අභිඥා ඥාන

**ඍද්ධිවිධ ඥානය, දිව්‍යශ්‍රොත ඥානය, පරචිත්තවිජානන ඥානය, පුබ්බෙනිවාසානුස්සති ඥානය, චුතූපපාත ඥානය** යයි අභිඥාවෝ පස්දෙනෙක් වුවද, චුතූපපාත ඥාණය යයි කියන ලද දිව්‍යචක්ෂුරභිඥානයට **යථාකම්මූපග ඥාණයක්, අනාගතංස ඥාණයක්** පිරිවර වන හෙයින් ඒ ඥාන දෙකත් පඤ්චාභිඥාවනට එකතු කල කල්හි අභිඥාවෝ සත්දෙනෙක් වෙති. ඒ ඒ අභිඥාවන් පිළිබඳ ආලම්බන විභාගය දැක්වීමේ පහසුව සඳහා මෙසේ අභිඥාවෝ සත් දෙනෙක් කොට මෙහිදී විස්තර කරනු ලැබේ.

ඒ සප්ත අභිඥාවෝ නම්:-

1. **ඍද්ධිවිධ ඥානය**
2. **දිව්‍යශ්‍රොත ඥානය**
3. **පරචිත්තවිජානන ඥානය හෙවත් චෙතොපරිය ඥානය**
4. **පුබ්බෙනිවාසානුස්සති ඥානය**
5. **චුතූපපාත ඥානය** හෙවත් **දිව්‍යචක්ෂුරභි ඥානය**
6. **අනාගතංස ඥානය**
7. **යථාකම්මූපග ඥානය** යන සත් දෙනය.

### සප්ත අභිඥාවන්ගේ ආලම්බන විභාගය

ආරම්මණ ත්‍රිකයෝ සතර දෙනෙක් වෙති. එනම්:-

1. **පරිත්තාරම්මණ ත්‍රිකය**– (පරිත්තාරම්මණ, මහග්ගතාරම්මණ, අප්පමාණාරම්මණ)
2. **මග්ගාරම්මණ ත්‍රිකය**– (මග්ගාරම්මණා ධම්මා, මග්ගහෙතුකා ධම්මා, මග්ගාධිපතිනො ධම්මා)

**3. අතීතාරම්මණ ත්‍රිකය**– (අතීතාරම්මණා, අනාගතාරම්මණා, පච්චුප්පන්නාරම්මණා)

**4. අජ්ඣත්තාරම්මණ ත්‍රිකය**– (අජ්ඣත්තාරම්මණ, බහිද්ධාරම්මණ, අජ්ඣත්තබහිද්ධාරම්මණ)

1. ඒ අභිඥාවෝ සත්දෙනා අතුරෙන් **සෘද්ධිවිධ ඥානය** ආලම්බන සතක පවතී. එනම්:–

1. **පරිත්තාලම්බනය**
2. **මහග්ගතාලම්බනය**
3. **අතීතාලම්බනය**
4. **අනාගතාලම්බනය**
5. **පච්චුප්පන්නාලම්බනය**
6. **අජ්ඣත්තාලම්බනය**
7. **බහිද්ධාලම්බනය**

1. යම් කලෙක කරජකායය, අභිඥා චිත්තය සන්නිශ්‍රය කොට ගෙන අදෘශ්‍යමාන ශරීරයෙන් යනු කැමැතිව, මහග්ගත චිත්තයෙහි කය පිරිනමා ද, එකල්හි ඒ සෘද්ධිවිධ ඥානයට පැවති චතුර්ථ ධ්‍යාන චිත්තය, රූපකායයාගේ වර්ණායතනය ආලම්බනය කොට පවත්නා හෙයින් ඒ සිත **පරිත්තාලම්බනික** වේ.

2. යම් කලෙක පාදක චාතුර්ථ ධ්‍යාන සිත දෘෂ්‍යමාන ශරීරයෙන් යනු කැමැතිව, රූපකායයෙහි පාදක චිත්තය පිරිනමාද නොහොත් මොනවට පිහිටුවාද, එකල්හි ධ්‍යාන චිත්තයම අරමුණු කොට සිත පවත්නා හෙයින් ඒ සිත **මහග්ගතාලම්බනික** වේ.

3. යම් කලෙක අතීත වූ, නිරුද්ධවූ ඒ පාදක ධ්‍යාන චිත්තය ම අරමුණු කෙරේ නම් එකල්හි ඒ ධ්‍යාන චිත්තය අතීතාලම්බනය හෙයින් **අතීතාලම්බනික** වේ.

4. සම්බුදුන් වහන්සේ පිරිනිවි කල මහාධාතු නිධානයෙහි දී මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ "අනාගතයෙහි දෙසිය අටළොස් වැනි වර්ෂය දක්වා මේ සුගන්ධයෝ නොවියළෙත්වා, මේ මල් නොමැලවේවා, මේ පහන් නොනිමේවා" යි අධිෂ්ඨාන කළ සේක. ඒ සියල්ල එසේම සිදුවිය. මේ ධ්‍යාන චිත්තය අනාගත රූපයන් අරමුණු කොට පැවැති හෙයින් ඒ සිත **අනාගතාලම්බනික** වේ.

අස්සගුත්ත මහාතෙරුන් වහන්සේ වත්තනිය සෙනස්නෙහි වැසි භික්ෂු සඞ්ඝයා වහන්සේ වියළි බත් වළඳනු දැක එහි වූ ජලය දවසක් පාසා පෙර බත් වළඳන වේලාවෙහි දී රස වේ වායි අධිෂ්ඨාන කළ සේක. ඒ අධිෂ්ඨානය පරිදි පෙර බත් කල ගත් ජලය දීරසවිය. පසු බත කාලයෙහි ගත් ජලය ප්‍රකෘති ජලය විය. මේ සෘද්ධියෙහි දී ද, ඒ ධ්‍යාන සිත **අනාගතාලම්බනික** වි ය.

5. රූප කාය ය පාදක ධ්‍යාන චිත්තය නිශ්‍රය කොට අදෘශ්‍යමාන කායයෙන් යන කල්හි ඒ ධ්‍යාන සිත **පච්චුප්පන්නාලම්බනික** වේ.

6. කාය වශයෙන් පාදක ධ්‍යාන චිත්තය හෝ, පාදක ධ්‍යාන චිත්තය වශයෙන් කය හෝ පිරිනමන කල්හි ද, තමාගේ කුමාර රූපාදිය මවාපාන කල්හි ද, තමාගේ රූප කාය හෝ පාදක ධ්‍යාන චිත්තය හෝ අරමුණු කරන හෙයින් ඒ ධ්‍යාන සිත **අධ්‍යාත්මිකාලම්බනික** වේ.

7. බාහිර වූ ඇත්, අස් ආදී රූපයන් මවාපාන කල්හි **බහිද්ධාලම්බනික** වේ.

මෙසේ සෘද්ධිවිධ ඥාන චිත්තය ආලම්බන සප්තක පවත්නා බව දත යුතු.

**2. දිව්‍යශ්‍රොත අභිඥා හෙවත් දිව්‍යශ්‍රොත ධාතු අභිඥා තොමෝ සිව්වැදෑරුම් අරමුණෙක පවතී. එනම්:-**

**1. පරිත්තා ලම්බනය**

**2. පච්චුප්පන්නා ලම්බනය**

**3. අජ්ඣත්තා ලම්බනය**

**4. බහිද්ධා ලම්බනය** යන සතරය.

1. යම් කලෙක දිබ්බසොත ධාතු අභිඥා තොමෝ ශබ්දය අරමුණු කරන්නේ නම්, සියළු ශබ්දයෝ කාමාවචර හෙයින් පරිත්තාලම්බනයෝ ය එහෙයින් ඒ දිබ්බසොත ධාතු අභිඥා සිත **පරිත්තාලම්බනික** වේ.

2. ඒ දිබ්බසොත ධාතු අභිඥා සිත ප්‍රත්‍යුත්පන්න ශබ්දයම අරමුණු කරන හෙයින් **පච්චුප්පන්නාලම්බනික** වේ.

3. ඒ දිබ්බසොත ධාතු අභිඥා සිත තමාගේ කුසතුලින් නික්මෙන ශබ්දය අරමුණු කරන කල්හි **අධ්‍යාත්මාලම්බනික** වේ.

4. අනුන්ගේ ශබ්ද ශ්‍රවණය කරන කාලයෙහි ඒ ධ්‍යාන චිත්තය **බහිද්ධාලම්බනික** වේ.

මෙසේ දිව්‍යශ්‍රොත ධාතු අභිඥාව ආලම්බන සතරෙක පවත්නා බව දත යුතු.

**3. පරචිත්ත විජානනඥාණය හෙවත් චෙතොපරිය ඥාණය.**

**චෙතොපරියඥාණය** අරමුණු අටෙක පවතී. එනම්:-

**1. පරිත්තාලම්බනය**

**2. මහග්ගතාලම්බනය**

**3. අප්පමාණාලම්බනය**

**4. මාර්ගාලම්බනය**

**5. අතීතාලම්බනය**

**6. අනාගතාලම්බනය**

**7. පච්චුප්පන්නාලම්බනය**

**8. බහිද්ධාලම්බනය** යන ආලම්බන අට ය.

1. අනුන්ගේ කාමාවචර සිත් දැනගන්නා කල්හි ඒ ධ්‍යාන සිත **පරිත්තාලම්බනිකය.**

2. අනුන්ගේ රූපාවචර, අරූපාවචර සිත් දැනගන්නා කල්හි ඒ ධ්‍යාන සිත **මහග්ගතාලම්බනිකය.**

3. මාර්ග - ඵලයන් දැනගන්නා කල්හි ඒ ධ්‍යාන සිත **අප්‍රමාණාලම්බනික ය.**

මේ චේතොපරිය ඥානයෙන් පෘථග්ජන පුද්ගලයාහට සෝවාන් ආදී ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ මාර්ග - ඵල සිත් දැනගත නො හැකි වේ. අභිඥලාභි සෝවාන් ආය්‍ර්‍ය පුද්ගලයාහට සකෘදාගාමි, අනාගාමි අර්හත් යන ආය්‍ර්‍යයන් වහන්සේලාගේ මාර්ග - ඵල සිත් දැනගත නො හැකි වේ. එසේ ම අභිඥලාභි සකෘදාගාමී ආය්‍ර්‍ය පුද්ගලයාහට අනාගාමි, රහත් ආය්‍ර්‍යයන් වහන්සේලාගේ මාර්ග - ඵල සිත් දැන ගත නො හැකි වේ. අභිඥලාභි අනාගාමි ආය්‍ර්‍ය පුද්ගලයා-හට රහතන් වහන්සේගේ අර්හත් මාර්ග සිත හෝ ඵල සිත හෝ දැනගත නොහැකි වේ. අභිඥලාභි රහතන් වහන්සේ සියළුම ආය්‍ර්‍යයන් වහන්සේලාගේ සිත් දැනගන්නා සේක. එසේ ම අභිඥලාභි අනාගාමි ආය්‍ර්‍ය පුද්ගලයෝ සෝවාන්, සකෘදාගාමි යන ආය්‍ර්‍යයන්ගේ සිත් දැන ගන්නා සේක. අභිඥලාභි සකෘදාගාමි පුද්ගලයෝ සෝවාන් පුද්ගලයන්ගේ සිත් දැන ගන්නා සේක. සමසම වූ අභිඥලාභි ආය්‍ර්‍යයෝ සමසම වූ ආය්‍ර්‍යයන්ගේ මාර්ග - ඵල සිත් දන්නා සේක.

4. මාර්ග සිත් අරමුණු කරන කල්හි ඒ ධ්‍යාන සිත **මාර්ගාලම්බනික** වේ.

5. අතීතයෙහි සත් දිනක් ඇතුළත අනුන්ගේ සිත් දැන ගන්නා කල්හි සිත **අතීතාලම්බනික** වේ.

6. අනාගතයෙහි සත් දවසක් ඇතුළත සිත් දැන ගන්නා කල්හි ඒ ධ්‍යාන සිත **අනාගතාලම්බනික** වේ.

7. ප්‍රත්‍යුත්පන්නාලම්බනයක් අරමුණු කරන ධ්‍යාන චිත්තය **පච්චුප්පන්නාලම්බනික** වේ.

**පච්චුප්පන්නය** වනාහි ත්‍රිවිධ වේ. එනම්:-

**1. ඛණ පච්චුප්පන්නය**

**2. සන්තති පච්චුප්පන්නය**

**3. අද්ධා පච්චුප්පන්නය** කියායි.

1. මේ ත්‍රිවිධ පච්චුප්පන්නයන් අතුරෙන් උත්පාද, ස්ථිති, භඞ්ග යන ක්‍ෂණත්‍රයට පැමිණි ධර්මය **ඛණ පච්චුප්පන්න** නම්.

2. රූපාරූප ධර්මයන්ගේ වශයෙන් එක් සන්තති වාරයෙක හෝ ද්විසන්තති වාරයෙක හෝ ඇතුළත් වූ ධර්මය **සන්තති පච්චුප්පන්න** නම්.

අන්ධකාරයෙහි සිට ආලෝක ඇති තැනට ගිය කෙණෙහි ම රූපය ප්‍රකට වේ. යම්තාක් එය ප්‍රකට වේ ද ඒ අතර සන්තති වාර එකක් දෙකක් වෙති. ආලෝකයෙහි සිට අන්ධකාර තැනට ගියහුහට ද රූපාලම්බනය ප්‍රකට නොවේ. එය ද ප්‍රකට වන අතර සන්තති වාර එකක් දෙකක් වේ.

3. ප්‍රතිසන්ධි, චුති දෙකින් පිරිසිඳිනා ලද එක භවයක් ඇතුළත වූ නාම - රූප සමූහය **අද්ධා පච්චුප්පන්නය**.

මේ **චේතොපරිය ඤාණයට සන්තති පච්චුප්පන්නය** හා **අද්ධා පච්චුප්පන්නය ද** අරමුණු වන්නේ ය. ඒ දෙවැදෑරුම් ආලම්බනයන් අතුරෙන් වර්තමාන ජවන වීථියෙන් අතීත අනාගත වශයෙන් දෙතුන් ජවන වීථි ප්‍රමාණ කාලයෙහි මෙරමාහට යම් සිතෙක් පහළ වේ ද ඒ සියලු සිත් **සන්තති පච්චුප්පන්න** නම්. මෙරමා සිත දැනගනු කැමැතිව එය ආවර්ජනා කොට අභිඥා සිතින් දැන ගනී ද ඒ කාලය **අද්ධා පච්චුප්පන්න** ය නම්. සන්තති පච්චුප්පන්නය ද අද්ධා පච්චුප්පන්නයෙහි ඇතුළත් වන හෙයින් චේතොපරිය **ඤාණය** අද්ධාපච්චුප්පන්න වශයෙන් ම **පච්චුප්පන්නා-ලම්බනික වේ** යයි කියනු ලැබේ.

8. අන්‍යයෙකුගේ සිත අරමුණු කොට අභිඥා සිත පවත්නා කල්හි එය **බහිද්ධා ලම්බනික** වේ.

4. **පුබ්බෙනිවාසානුස්සති ඤාණය** අරමුණු අටෙක පවතී, ඒ අටවැදෑරුම් ආරම්මණයෝ නම්:-

1. **පරිත්තා ලම්බනය**
2. **මහග්ගතා ලම්බනය**
3. **අප්පමාණා ලම්බනය**
4. **මග්ගා ලම්බනය**
5. **අතීතා ලම්බනය**
6. **අජ්ඣත්තා ලම්බනය**
7. **බහිද්ධා ලම්බනය**
8. **නවත්තබ්බා ලම්බනය** යන ආලම්බන අටය.

1. **පුබ්බෙනිවාසානුස්සති ඤාණයෙන්** කාමාවචර ස්කන්-ධයන් සිහි කරන කාලයෙහි අභිඥා චිත්තය **පරිත්තා-ලම්බනික** ය.

2. රූපාවචර, අරූපාවචර ධ්‍යානයන් අරමුණු කරන කල්හි ඒ අභිඥ සිත **මහග්ගතාලම්බනික** ය.

3. අතීත භවයෙහි තමා විසින් හෝ මෙරමා විසින් හෝ වඩන ලද මාර්ගී හා ප්‍රත්‍යක්ෂ කරන ලද ඵල සිහි කරන කල්හි ඒ අභිඥ චිත්තය **අප්පමාණාලම්බනික** ය.

4. වඩන ලද මාර්ගය ම සිහි කරන කල්හි අභිඥ සිත **මග්ගාලම්බනික** ය.

5. ස්වභාවයෙන් ම පූර්වේනිවාසානුස්සති ඥාණය **අතීතාලම්බනික** ය. මේ ඥාණයට අතීත ස්කන්ධයන් ද, ස්කන්ධ ප්‍රතිබද්ධ වූ නාම ගෝත්‍රාදිය ද යන මේ ධර්මයෝ අරමුණු වෙත්.

6. තමා පිළිබඳ අතීත වූ ස්කන්ධයන් සිහි කරන කල්හි මේ පූර්වේනිවාසානුස්සති ඥානය **අජ්ඣත්තාලම්බනික** වේ.

7. පර සන්තාන ගත ස්කන්ධයන් අරමුණු කරන කල්හි ඒ අභිඥ සිත **බහිද්ධාලම්බනික** ය.

8. අතීතයෙහි අසුවල් භාග්‍යවතුන් වහන්සේ වූසේක. උන්වහන්සේගේ මෑණියෝ අසුවල් නම් වූහ. පියාණෝ අසුවල් නම් වූහ යනාදීන් නාම, ගොත්‍ර, පෘථිවි, නිමිත්තාදිය සිහි කරන කල ඒ අභිඥ චිත්තය **නවත්තබ්බාලම්බනික** ය.

5. **දිව්‍යචක්ඛුරභිඥානය** අරමුණු සතරෙක පවතී. එනම්:-

1. **පරිත්තාලම්බනය**

2. **පච්චුප්පන්නාලම්බනය**

3. **අජ්ඣත්තාලම්බනය**

4. **බහිද්ධාලම්බනය** යන සතරය.

1. **දිබ්බචක්ඛුඤාණය**- කාමාවචර වූ රූපයන් අරමුණු කරන කල්හි **පරිත්තා ලම්බනිකය.**

2. විද්‍යමාන වූ රූපා ලම්බනයෙහි පවත්නා හෙයින් **පච්චුප්පන්නා ලම්බනිකය.**

3. තමාගේ කුක්ෂිගත රූපා ලම්බනාදියක් අරමුණු කරණ කල්හි **අජ්ඣත්තා ලම්බනිකය.**

4. මෙරමාගේ රූපායතනාදියක් අරමුණු කරන කල්හි **බහිද්ධා ලම්බනිකය.**

මෙසේ දිව්‍යචක්ෂුරභිඥානය සතර අරමුණෙක පවතී.

6. **අනාගතංස ඤාණය** අට අරමුණෙක පවතී. එනම්:-

1. **පරිත්තා ලම්බනය**
2. **මහග්ගතා ලම්බනය**
3. **අප්පමාණා ලම්බනය**
4. **මග්ගා ලම්බනය**
5. **අනාගතා ලම්බනය**
6. **අජ්ඣත්තා ලම්බනය**
7. **බහිද්ධා ලම්බනය**
8. **නවත්තබ්බා ලම්බනය** යන අටය.

1. අනාගත ආත්මයෙහි මෙතෙමේ කාමාවචර භූමියෙහි උපදනේ යයි දැනගන්නා කල්හි ඒ අභිඥාව **පරිත්තා ලම්බනිකය.**

2. මතු රූපා රූප භූමින්හි උපදනේ යයි දැනගන්නා කල්හි **මහග්ගතා ලම්බනිකය.**

3. මාර්ගය වඩන්නේ ය, ඵලය ප්‍රත්‍යවේක්ෂා කරන්නේ යැයි දැනගන්නා කල්හි **අප්පමාණං ලම්බනිකය.**

4. මාර්ගය වඩන්නේ යයි දැනගන්නා කල්හි **මාර්ගී ලම්බනිකය.**

5. අනාගතාංස ඤාණය ඒකාන්තයෙන්ම **අනාගතා ලම්බනිකය.**

6. මම අනාගතයෙහි අසුවල් තැන උපදින්නෙමි යි දැනගන්නා කල් ඒ අභිඥා සිත **අජ්ඣත්තා ලම්බනිකය.**

7. අසුවල් තැනැත්තා, අනාගතයෙහි දී අසුවල් තැන උපදින්නේ යයි දැනගන්නා කල්හි **බහිද්ධා ලම්බනිකය.**

8. අනාගතයෙහි දී මෛත්‍රිය නම් බුදුන් උපදනාහ. උන්වහන්සේ ගේ පිය තෙම සුබ්‍රහ්මා නම් බ්‍රාහ්මණය. මව්තොමෝ බ්‍රහ්මවතී නම් බැමිණිය යනාදී වශයෙන් නාමගෝත්‍රාදීන් දැන ගන්නා කල්හි **නවත්තබ්බං ලම්බනිකය.**

මෙසේ අනාගතාංස ඤාණය අට අරමුණෙක පවතී.

**7. යථා කම්මූපග ඤාණය** අරමුණු පසෙක පවතී.

**1. පරිත්තං ලම්බනය**

**2. මහග්ගතං ලම්බනය**

**3. අතීතා ලම්බනය**

**4. අජ්ඣත්තං ලම්බනය**

**5. බහිද්ධං ලම්බනය** යන අරමුණු පසය.

1. යථාකම්මූපග ඤාණයෙන් කාමාවචර කර්ම දැන-ගන්නා කල්හි ඒ අභිඥා චිත්තය **පරිත්තං ලම්බනික ය.**

2. රූපාවචර, අරූපාවචර කර්ම දැනගන්නා කල්හි **මහග්ගතා ලම්බනිකය.**

3. අතීත වූ කුසලාකුසල කර්ම දැනගන්නා කල්හි **අතීතාංශඥානය.**

4. තමාගේ කර්ම දැනගන්නා කල්හි **අජ්ඣත්තාලම්බනඥානය.**

5. මෙරමාගේ කර්ම දැනගන්නා කල්හි **බහිද්ධාලම්බනඥානය.**

මෙසේ යථාකම්මූපග ඥානය අරමුණු පසෙක පවතී.

## විපස්සනා භාවනා

සීලයෙන් කායවාග්ද්වාරයන් මනා කොට සංවර කරගත් **කල්‍යාණ පෘථග්ජන** තෙම, **චිත්ත භාවනා** වශයෙන් කසිණ, අශුභ, අනුස්සති, බ්‍රහ්මවිහාර, ආරූප්‍ය, සංඥා, වවත්ථාන යනාදී වූ සතළිස් කමටහන් අතුරෙන් යම් කිසි කමටහනක් වඩා, උපචාර, අර්පණාදී වශයෙන් ප්‍රභේද ගත සමාධියෙන් සිත සමාහිත වූ කල්හි චතුස්සත්‍ය ධර්මාවබෝධය පිණිස **ප්‍රඥා භාවනාව** වැඩිය යුතු ය.

මෙහි කුසල චිත්ත සම්ප්‍රයුක්ත විපස්සනා ඥානයට **ප්‍රඥාව** යයි කියනු ලැබේ. එනම් කුසල් සිත්හි යෙදුණු **විදර්ශනා ඥානය** යි.

අරමුණු, නීල – පීතාදී වශයෙන් හැඳින ගැනීම **සංඥා** නම් වේ. ඒ අරමුණු නීල – පීතාදී වශයෙන් හැඳිනීමත්, අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදී වශයෙන් **ලක්ෂණ** ප්‍රතිවේධ යන මොවුන්ගේ වශයෙන් විශේෂ දැන ගැනීමක් ඇති කල්හි එයට **විඥානය** යයි කියනු ලැබේ. අරමුණු නීල – පීතාදී වශයෙන් හැඳින ගැනීමත්, අනිත්‍යාදී වශයෙන් **ලක්ෂණ** දැනීමත්, උදයව්‍යය ඥානාදී පිළිවෙළින් ව්‍යායාම කොට මාර්ග පහළ කිරීමෙහි ද සමත් බවක් ඇති කල්හි නා නා ප්‍රකාරයෙන් ප්‍රභේද වශයෙන් දැන ගැනීම වන හෙයින් ප්‍රජානනාර්ථයෙන් **ප්‍රඥාව** යයි කියනු ලැබේ.

පඨවි ආදි රූප ධර්මයන්ගේ තද බවය, බැඳෙන බවය, පැසවන බවය, හම්මන බවය යනාදිය හා ස්පර්ශාදි අරූප ධර්මයන්ගේ අරමුණෙහි බැඳගැනීම් සවභාවාදි ඒ ඒ නාම - රූප ධර්මයන්හි පවත්නා විශේෂ සවභාවය හෝ අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදි සියලු නාම - රූප ධර්මයන්ට සාධාරණ සවභාවය හෝ අවිපරීතාකාරයෙන් අවබෝධ කිරීම ප්‍රඥාවේ ලක්ෂණය වේ. එ හෙයින් **ධම්මසභාව පටිවෙධ ලක්ඛණා පඤ්ඤා** යයි කියන ලදී.

නාම - රූප ධර්මයන්ගේ සවාභාවික ලක්ෂණය මුවහ කරන්නා වූ මෝහාන්ධාකාරය දුරලීම ප්‍රඥාවෙහි **කෘත්‍ය** හෙවත් රසය වේ. එහෙයින් **ධම්මානං සභාව පටිච්ඡාදක මොහන්ධකාර විධංසන රසා** යන කියන ලදී.

**අසම්මොහ පච්චුපට්ඨානා** යයි කී හෙයින් ඒ ඒ නාම - රූප ධර්මයන්හි නො මුලාවීම් සඞ්ඛ්‍යාත ඵලය **ප්‍රඥාවගේ පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාර වේ.

**සමාධි තස්ස පදට්ඨානා** යනුයෙන් සමාධිය ප්‍රඥාවගේ ආසන්න කාරණය වේ.

## ප්‍රඥාවෙහි ප්‍රභෙද

1. නාම - රූප ධර්මයන්ගේ විශේෂ සවභාවය හා සාමාන්‍ය සවභාවය ද ප්‍රතිවෙධ කිරීම් වශයෙන් **ප්‍රඥාව, එකවිධ වේ.**

2. **ලෞකික ප්‍රඥා, ලෝකෝත්තර** ප්‍රඥා යයි ප්‍රඥාව **ද්විවිධ වේ. එයින් කාමාවචර,** අරූපාවචර කුසල චිත්තයෙහි, විශේෂයෙන් **දිට්ඨි විශුද්ධි, කඞ්ඛාවිතරණ** විශුද්ධි, **මග්ගාමග්ගඤාණ දස්සන විශුද්ධි, පටිපදා ඤාණ දස්සන විශුද්ධි** යන සතර විශුද්ධීන්හි යෙදෙන ප්‍රඥාව **ලෞකික ප්‍රඥා** නම්. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ග සිත්හි යෙදෙන ප්‍රඥාව **ලෝකෝත්තර ප්‍රඥා** නම් වේ.

3. **සාංශ්‍රව ප්‍රඥා, අනාංශ්‍රව ප්‍රඥා** යයි ද ප්‍රඥා ද්විධ වේ. කාමාදි ආශ්‍රවයනට හෝ ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට අරමුණු වූ ප්‍රඥාව **සාංශ්‍රව ප්‍රඥා නම්.** කාමාදී ආශ්‍රවයන්ට අරමුණු නොවූ හෝ ආශ්‍රව සම්ප්‍රයුක්ත නොවූ ප්‍රඥාව **අනාංශ්‍රව ප්‍රඥා** නම් වේ.

4. **නාමව්‍යවස්ථාපන ප්‍රඥා, රූපව්‍යවස්ථාපන ප්‍රඥා** යයි ද ප්‍රඥාව ද්විධ වේ. විදර්ශනා වඩන්නාහුගේ සතර නාම ධර්ම විභාග කිරීම් වශයෙන් පැවැති ප්‍රඥාව **නාම ව්‍යවස්ථාපන ප්‍රඥා** නම්. රූපධර්මයන් විභාග කිරීම් වශයෙන් පැවැති ප්‍රඥාව **රූප ව්‍යවස්ථාපන ප්‍රඥා** නම්.

5. **සෞමනස්ස සහගත ප්‍රඥා, උපෙක්ඛා සහගත ප්‍රඥා** යයි ද ප්‍රඥාව ද්විධ වේ. සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සිත් දෙකෙහි යෙදෙන ප්‍රඥාව ද, රූපාවචර ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයන් පිළිබඳ වූ ද සොළොස් මාර්ග සිත්හි ද යෙදුණු ප්‍රඥාව ද **සෞමනස්ස සහගත ප්‍රඥා** නම්. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් දෙසිතෙහි ද පඤ්චමධ්‍යානික සතර මාර්ග චිත්තයෙහි ද යෙදුණු ප්‍රඥාව **උපෙක්ඛා සහගත ප්‍රඥාය.**

6. **දස්සන භූමික ප්‍රඥා, භාවනා භූමික ප්‍රඥා** යයි ද ප්‍රඥාව ද්විධ වේ. ප්‍රථම වරට නිර්වාණය දක්නා හෙයින් දස්සන නම් වූ සෝවාන් මාර්ග චිත්තය හා යෙදුණු ප්‍රඥාව **දස්සන භූමික ප්‍රඥා** නම්. සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන අවශේෂ ත්‍රිවිධ මාර්ගය, ප්‍රථම මාර්ගයෙන් දුටු ධර්මයම භාවනා වශයෙන් වැඩීමෙන් ලැබෙන හෙයින් විදර්ශනා **භාවනා භූමික ප්‍රඥා** නම් වේ.

7 **තවද, චින්තාමය ප්‍රඥා, ශ්‍රැතමය ප්‍රඥා, භාවනා-මය ප්‍රඥා** යයි ප්‍රඥාව ත්‍රිවිධ වේ. ප්‍රඥායෙන් යොදන ලද ජීවනෝපාය වූ කර්මාන්තයෙහි ද ප්‍රඥායෙන් යොදන ලද ශිල්පයන්හි ද, ප්‍රඥායෙන් නිපද වන ලද විද්‍යාවන්හි ද, **කම්මස්සකතා** හෙවත් කර්මය ස්වකීය කොට ඇති බව

දැනීමෙන් ද, **සච්චානුලෝමික** හෙවත් චතුසසත්‍යය ප්‍රතිවේධයට යොමුවූ විදර්ශනා ඥානයෙහි හෝ රූපය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය කියා ද; වේදනා, සංඥා, සඞ්ඛාර, විඥාන, අනිත්‍ය, දුක්ඛය, අනාත්මය කියා හෝ මෙසේ හිත පිණිස නැමුණු මේ සියල්ල දැකිය හැකි හෙයින් ද, දක්නා හෙයින් ද, රුචි කරන හෙයින් ද, නුවණින් සලකන හෙයින් ද, තෙමේ ම සවභාවයෙන් ම වැටහේ ද, අනුන්ගෙන් නො අසා ප්‍රතිවේධය වේ නුයි **චින්තාමය** **ප්‍රඥා** නම්. **මේ චින්තාමය ප්‍රඥාව බෝධිසත්ත්වයන්ට උපදනා ප්‍රඥා විශේෂයෙකි.** අනුන් ගෙන් අසා හෝ උපදෙසකින් හෝ ලබන ප්‍රඥාව **ශ්‍රැතමය ප්‍රඥා** නම්. අසා හෝ නො අසා හෝ භාවනාවෙන් උපදවන ලද විදර්ශනා මාර්ග සම්ප්‍රයුක්තප්‍රඥාව **භාවනාමය ප්‍රඥා** නම්.

8. **පරිත්තාරම්මණ ප්‍රඥා, මහග්ගතාරම්මණ ප්‍රඥා, අප්පමාණාලම්බන ප්‍රඥා** යයි ද ප්‍රඥාව ත්‍රිවිධ වේ. කාමාවචර ධර්මයන් අරමුණු කොට පැවති ප්‍රඥාව **පරිත්තාරම්මණ ප්‍රඥා** නම්. රූපාවචර අරූපාවචර ධර්මයන් අරමුණු කොට පැවැති ප්‍රඥාව **මහග්ගතාරම්මණ ප්‍රඥා** නම්. නිර්වාණය අරමුණු කොට පැවති ප්‍රඥාව **අප්පමාණාලම්බණ ප්‍රඥා** නම්.

9. **ආය කොසල්ල, අපාය කොසල්ල, උපාය කොසල්ල** වශයෙන් ද ත්‍රිවිධ වේ, **ආය** නම් වැඩීම ය. එය දෙවැදෑරුම් වේ. අනර්ථ නැසීම ය සහ අර්ථය ඉපදවීම ය. එහි දක්ෂ බව **ආය කොසල්ල** නම්. මේ ධර්මයන් මෙනෙහි කරන්නා හට නූපන් අකුසල් නූපදී නම්, උපන් අකුසල් ප්‍රහීන වේ නම්, නූපන් කුසල් උපදී නම්, උපන් කුසල් වැඩීමට, මහත් බවට, භාවනායෙන් සම්පූර්ණ බවට යේ නම්, ඒ පිළිබඳ යම් දැනීමක්, ප්‍රකට කොට දැනීමක්, නුමුළා බවෙක්, ඒ ධර්ම විනිශ්චය කිරීමක් දක්ෂ බවෙක්, සම්‍යක්දෘෂ්ටියෙක් වේ නම් එය **ආය කොසල්ල** නම් වේ.

**අපාය** නම් පිරිහීමය—එය ද අර්ථය පිරිහීමය, අනර්ථය ඉපදීම ය යයි ද්විධ වේ. මේ ධර්මයන් මෙනෙහි කරන්නා හට නූපන් කුසල් නූපදී යනාදිය සිදුවේ. එය **අපාය කෞශල්‍ය** යයි කියනු ලැබේ.

හිත-සුව ඉපදවීමට හේතු වූ ඒ ඒ ධර්මයන්ගේ ඉපදීමට හේතු කාරණයෙහි එකෙණෙහි පැවැති ස්ථානොචිත නුවණ හෙවත් දක්ෂ නිපුණ බව **උපාය කෞශල්‍ය** නමි. එහි ප්‍රඥාව **උපාය කෞශල්‍ය ප්‍රඥා** නමි.

**10.** **අජ්ඣත්තාභිනිවෙසය, බහිද්ධාභිනිවෙසය, අජ්ඣත්තබහිද්ධාභිනිවෙසය** යයි ද ප්‍රඥාව ත්‍රිවිධ වේ. තමාගේ රූපාදී ස්කන්ධයන් නුවණින් අරමුණු කොට පටන් ගන්නා ලද විදර්ශනා ප්‍රඥාව **අජ්ඣත්තාභිනිවෙසය** නම් වේ. අන්‍යයෙකුගේ රූපාදී පඤ්චස්කන්ධයෙහි හෝ බාහිර අනින්ද්‍රියබද්ධ රූප හෝ නුවණින් මෙනෙහි කොට පටන්ගත් විදර්ශනා ප්‍රඥාව **බහිද්ධාභිනිවෙසය** නම් වේ. අධ්‍යාත්ම බාහිර දෙපක්ෂයෙහි ම නුවණින් ගෙන පිහිටුවන ලද්දේ **අජ්ඣත්තබහිද්ධාභිනිවෙසය** යි.

**11.** තවද, **දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං** යයි ප්‍රඥාව චතුර්විධ වේ. **දුක්ඛ සත්‍යය** අරභයා පැවැති ප්‍රඥාව **දුක්ඛෙ ඤාණං** හෙවත් දුක්ඛ සත්‍යය දැනගන්නා ප්‍රඥාව ය, **දුක්ඛ සමුදය** අරභයා පවත්නා ප්‍රඥාව දුක්ඛ සමුදය සත්‍යය දැනගන්නා ප්‍රඥාව යි. **දුක්ඛ නිරොධය** අරභයා පැවැති ප්‍රඥාව දුක්ඛනිරොධ සත්‍යය දැනගන්නා ප්‍රඥාවයි. **දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදාව** අරමුණු කොට පැවැති ප්‍රඥාව දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදා සත්‍යය දැනගන්නා ප්‍රඥාවයි.

**12.** **අර්ථපටිසම්භිදා ඤාණං, ධම්මපටිසම්භිදා ඤාණං, නිරුත්තිපටිසම්භිදා ඤාණං, පටිභාන පටිසම්භිදා ඤාණං,** යයි ද ප්‍රඥාව චතුර්විධ වේ. සංක්ෂෙපයෙන් වනාහි **අර්ථ**

**යෙහි ඥානය අර්ථ ප්‍රතිසම්භිදාය. ධර්මයෙහි ඥානය, ධර්ම ප්‍රතිසම්භිදාය.** අර්ථ, ධර්ම දෙක්හි වූ නිරුක්තියෙහි ඥානය **නිරුක්ති ප්‍රතිසම්භිදාය.** ඒ ත්‍රිවිධ ඥානයෙහි ඥානය **ප්‍රතිභාන ප්‍රතිසම්භිදාය.**

**අර්ථය** නම් ප්‍රත්‍යයෙන් නිපන් **ඵල ධර්මය** යි. හේතු අනුසාරයෙන් පමුණු වනු ලැබෙනුයි හෝ අධිගමනය කරනු ලැබෙනුයි හෝ **අර්ථ** නමි. **ඵලය, නිර්වාණය, භාෂිත සඞ්ඛ්‍යාත වචනයාගේ අර්ථය, විපාකය, ක්‍රියාය** යන මේ ධර්ම පස අර්ථයෝ ය. ඒ අර්ථ ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුගේ එහි ප්‍රභේදගත ඥානය **අර්ථපටිසම්භිදා** නමි.

**ධර්මය** යනු ප්‍රත්‍යයට නාමෙකි. ප්‍රත්‍යයෙන් ඒ ඒ දාය විධානය කෙරේ ද, පවත්වා ද, පමුණුවා ද, එහෙයින් එයට **ධර්මය** යයි කියනු ලැබේ. ඵලය නිපදවන්නාවූ **හේතුය, ආර්‍ය්‍ය මාර්‍ගය, භාෂිතය, කුසලය, අකුසලය** යන මේ ධර්ම පස **හේතුහු** නම් වෙත්. ඒ හේතු සඞ්ඛ්‍යාත ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුගේ එහි ප්‍රභේදගත ඥානය **ධර්ම ප්‍රතිසම්භිදා** නමි.

තවද **දුක්ඛ** සඞ්ඛ්‍යාත ඵලයෙහි ඥානය **අර්ථ පටිසම්භිදාය.**

**දුක්ඛ සමුදය** සඞ්ඛ්‍යාත දුක්ඛ හේතුවෙහි ඥානය **ධර්ම පටිසම්භිදාය.**

**දුක්ඛ නිරොධයට** කාරණා වූ නිර්වාණ සඞ්ඛ්‍යාත ඵල යෙහි ඥානය **අර්ථපටිසම්භිදාය.**

දුක්ඛනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට හේතු වූ මාර්ගයෙහි **ඥානය ධර්මපටිසම්භිදාය.**

මෙසේ හේතුවෙහි ඥානය **ධර්මපටිසම්භිදා** යයි ද, ඵල යෙහි **ඥානය අර්ථපටිසම්භිදා** යයි ද දත යුතු.

යම් ධර්ම කෙනෙක් හටගත්තාහු ද, වූවාහු ද, හේතු සමවායයෙන් හටගත්තාහු ද, උපන්නාහු ද, විශේෂයෙන් උපන්නාහු ද, පහළ වූවාහු ද, මේ **ඵල ධර්මයෙහි ඥානය අර්ථපටිසම්භිදා** නමි.

යම් හේතු ධර්මයකින් ඒ ඵල ධර්මයෝ හටගත්තාහු ද, නිපන්නාහු ද, විශේෂයෙන් නිපන්නාහු ද, පහළවූවාහු ද, ඒ හේතු **ධර්මයෙහි ඥාණය ධර්ම පටිසම්භිදා** නම්.

ජරා මරණ දෙක්හි ඥාණය **අර්ථ පටිසම්භිදා** නම් වේ. එයට ප්‍රත්‍යවූ ජාතියෙහි ඥාණය **ධර්ම පටිසම්භිදා** නම්.

කර්ම භවයෙන් නිපන් ජාතියෙහි ඥාණය **අර්ථ පටිසම්භිදාය.** ඒ ජාතියට හේතු වූ කර්මභවයෙහි **ඥාණය ධර්ම පටිසම්භිදාය.**

උපාදාන, තණ්හා, වේදනා, ඵස්ස, ෂඩායතන, නාමරූප, විඥාන; සංඛාර යන මේ ඵලයෙහි ඥාණය **අර්ථ පටිසම්භිදාය.** එයට ප්‍රත්‍ය වූ ධර්මයෙහි ඥාණය **ධර්ම පටිසම්භිදාය.**

එසේම ජරා මරණ නිරොධයෙහි ඥාණය **අර්ථ පටිසම්භිදාය.** ජරා මරණ නිරොධගාමිණී ප්‍රතිපදායෙහි ඥාණය **ධර්ම පටිසම්භිදාය.**

මෙසේ සංස්කාර නිරොධයෙහි ඥාණය **අර්ථපටිසම්භිදාය.** සංස්කාර නිරොධගාමිණී ප්‍රතිපදායෙහි ඥාණය **ධර්ම ප්‍රතිසම්භිදාය.**

එසේම සූත්‍ර, ගෙය්‍ය, වෙදල්ලාදී වූ ධර්මය දනී ද ඒ දැනීම **ධර්මප්‍රතිසම්භිදාය.** ඒ ඒ භාෂිතයාගේ අර්ථය දැනීම **අර්ථපටිසම්භිදාය.**

ඒ ඒ කුසලාදී ධර්මයන්ගේ ප්‍රභෙද ගත ඥාණය **ධර්ම ප්‍රතිසම්භිදාය.** ඒ කුසලාකුසලයන්ගේ විපාක පිළිබඳ ඥාණය **අර්ථ ප්‍රතිසම්භිදාය.**

ඒ **අර්ථ, ධර්ම** දෙක්හි අවිපරිත ස්වභාවය වූ මාගධි භාෂා සංඛ්‍යාත ස්වභාවය, **නිරුක්ති** නම්. ඒ අනුව මේ ස්වභාව නිරුක්තිය, මේ ස්වභාව නිරුක්තිය නොවේ යයි, ඒ ස්වභාව නිරුක්තියවූ මාගධි භාෂායෙහි ප්‍රභෙද ගත ඥාණය **නිරුක්ති ප්‍රතිසම්භිදා** නම්.

**අර්ථ, ධර්ම, නිරුක්ති** යන මේ ඥානයන්හි ඥානය **ප්‍රතිභාන ප්‍රතිසම්භිදා** නම්. එනම්, ඒ තුන් ආකාර ඥානයන්හි, මේ ඥානයට මෙ නම් ගෝචර කෘත්‍යාදියක් ඇතැයි විස්තර වශයෙන් දැනීම ය. මේ සතරවිධ ඥානයට **සිව්පිළිසිඹියාවෝ** යයි කියනු ලැබේ.

මේ **සිව්පිළිසිඹියාවෝ** දෙතැනෙක ප්‍රභේද ගතවෙති. එනම්, **ශෛක්‍ෂ භූමිය, අශෛක්‍ෂ භූමි** යන දෙතැන ය. **ශෛක්‍ෂ භූමි** නම් සෝවාන් මාර්ග, සෝවාන් ඵල, සකෘදාගාමි මාර්ග, සකෘදාගාමි ඵල, අනාගාමි මාර්ග, අනාගාමි ඵල, අර්හත් මාර්ග යන සප්ත ස්ථානයෝ යි. **අශෛක්‍ෂ භූමි** නම් අර්හත් ඵලයයි. **අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවකයන්ගේ** සිව්පිළිසිඹියාවෝ **අශෛක්‍ෂ භූමි** නම් වූ **අර්හත්** ඵලයෙහිදී ම ප්‍රභේදගත වේ. **ආනන්ද ස්ථවිර, චිත්‍ත ගෘහපති, ධම්මික උපාසක, උපාලි ගෘහපති, ඛුජ්ජුත්තරා උපාසිකා** ආදීන් ගේ සිව්පිළිසිඹියාවෝ **ශෛක්‍ෂ** භූමියෙහි ප්‍රභේද ගත විය.

මෙසේ මේ ද්විභූමියෙහි සිව්පිළිසිඹියාවෝ ප්‍රභේද ගත වන්නාහු ද එය පස් ආකාරයකින් විසද වන්නාහ. ඒ පස් ආකාරයෝ නම්:-

1. **අධිගමයෙන්**
2. **පර්‍ය්‍යාප්තියෙන්**
3. **ශ්‍රවණයෙන්**
4. **පරිපෘච්ඡායෙන්**
5. **පූර්වයෝගයෙන්** යන ආකාර පස වේ.

**1.** මෙයින් අධිගමයෙන් විසද වන්නේ යයි කියනුයේ අර්හත් ඵලයට පැමිණීමේ දී සිව්පිළිසිඹියාවෝ ඉතා ප්‍රකට බවට විසද බවට පැමිණෙන හෙයිනි. ශෛක්‍ෂයන්ගේ සිව්පිළිසිඹියාවෝ මේ අර්හත් ඵලයට පැමිණීවිට සාතිසය බවට පත්වේ.

2. **පයඞාප්තිය** නම් ත්‍රිපිටක බුඞ වචන යයි. ත්‍රිපිටක බුඞ වචනය ප්‍රගුණ කිරීමෙන් සිව්පිළිසිඹියාවෝ විසද භාවයට පැමිණෙති.

3. **ශ්‍රවණය** නම් මනාකොට, අර්‍ථවත් කොට සඬමීය ශ්‍රවණය කිරීම ය. මෙසේ අර්‍ථවත් කොට ධර්‍මය ශ්‍රවණය කිරීමෙන් ලැබූ සිව්පිළිසිඹියාවෝ විසද බවට පැමිණෙති.

4. **පරිපුච්ඡා** නම් පෙළ අටුවා ආදීන්හි ගැටපද, අර්‍ථපද, ආදිය පිළිබඳ විනිශ්චය කථාව විචාරීම ය. පෙළෙහි ආ ධර්‍මයන් පිළිබඳ නො වැටහෙන තැන් වටහා ගැනීමට උපකාර වන ගැටපද ආදිය විචාරීමෙන් ද සිව්-පිළිසිඹියාවෝ විසද බවට පැමිණෙත්.

5. **පූර්‍වයෝගය** නම් පෙර බුදුවරයන්ගේ ශාසනයන්හි ගතපච්චාගතාදි වශයෙන් භාවනා වඩා, **අනුලෝම - ගොත්‍රභූ ඥාණයන්** ලැබීමට පෙර ඒ සමීපයෙහි වූ සඞ්ඛාරුපෙක්ඛා ඥාණය තෙක් විදර්‍ශනාවෙහි උත්සාහවත් වීම ය. මෙසේ සකස් කරණ ලද විපස්සනායෝග සඞ්ඛ්‍යාත පූර්‍වයොගය ඇති කල්හි ද සිව්පිළිසිඹියාවෝ විසද බවට පැමිණෙත්.

ඇතැම් ආචාරීහු, කරුණු අටක් සිව්පිළිසිඹියාවන් විසද බවට පැමිණීමට උපකාරක වෙත් යයි කියති. එනම්:—

1. **පූර්‍වයෝගය**
2. **බහුශ්‍රැත** භාවය— (බාහුසච්චය)
3. **දෙශභාෂා දැනීමය**
4. **ත්‍රිපිටක ධර්‍මය දැනීමය**— (ආගම)
5. **ත්‍රිපිටකාර්‍ථ විචාරීමය**— (පරිපුච්ඡා)

**6.** **සතර ඵලය**— (අධිගමය)

**7.** **බහුශ්‍රැත ගුරුන් සෙවීම ය**— (ගුරුසන්නිශ්‍රය)

**8.** **මිත්‍ර සම්පත්තිය— ප්‍රතිභාන ඇති කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමය.**

මේ කාරණා අට සිව්පිළිසිඹියාවන්ගේ විසද බවට උපකාරක ධර්මයෝ වෙති.

**1.** **පූර්වයෝගය**— යට විස්තර කරන ලදී.

**2.** **බාහුසච්චය** හෙවත් **බහුශ්‍රැත** බව නම් - ඒ ඒ නිරවද්‍ය ශාස්ත්‍රයන්හි හා ශිල්පයන්හි දක්ෂ භාවයයි.

**3.** **දෙශභාෂා** නම් එකල ව්‍යවහාර වන භාෂා දැනීම ය. විශේෂ වශයෙන් මාගධි භාෂාවෙහි දක්ෂ බව ය.

**4.** **ආගම** නම් ත්‍රිපිටක ධර්මයයි. යටත් පිරිසෙයින් මැදුම්සඟිය මූලපණ්ණාසකයෙහි ඕපම්ම වග්ගයවත් ධර්මය පිරවීම ය. නැතහොත් ධම්මපදයෙහි යමකවග්ගයෙහි ඔපම්මකවග්ගය දක්වා පිරිය යුතු.

**5.** **පරිපුච්ඡා** නම් එක ගාථාවෙක්හිවත් අර්ථවිනිශ්චය පිළිවිසීම ය.

**6.** **අධිගමය** නම් සොවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත් ඵලයයි.

**7.** **ගුරුසන්නිශ්‍රය** නම් බහුශ්‍රැත, ප්‍රතිභාන සම්පන්න ආචාර්යයන් වෙතින් දුෂ්කර තැන් විචාරමින් ඇසුරු කිරීම ය.

**8.** **මිත්‍ර සම්පත්තිය** නම් එබඳුවූ ම කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම ය.

මේ පස් ආකාරයන් හෝ අට ආකාරයන් හෝ අතුරෙන් **බුදුවරයෝ ද, පසේබුදුවරයෝ ද, පුබ්බයොග අධිගමයන්** නිසා සිව්පිළිසිඹියාවන්ට පැමිණෙති. බුඩ ශ්‍රාවකයෝ මේ සියලු කාරණයන් නිසාම සිව්පිළිසිඹියාවන්ට පැමිණෙති.

මේ සිව්පිළිසිඹියාවන්ට පැමිණීම සඳහා වෙනම කමටහන් වැඩීමක් නැත. ශෛක්‍ෂයන්ගේ ශෛක්‍ෂ ඵල අවසානයෙහි ද අශෛක්‍ෂයන්ගේ අර්හත්ඵල අවසානයෙහි ද සිව්පිළිසිඹියාවට පැමිණීම ද වේ.

මෙසේ ප්‍රඥාවගේ ප්‍රභේදය දත යුතු.

## ප්‍රඥා භාවනා වැඩීම

මෙසේ නොයෙක් ප්‍රභේදගත වූ මේ ප්‍රඥාව දැන හැඳින ගෙන එය භාවනා වශයෙන් වඩා ඵලාදිගමය කරණු කැමැති යෝගාවචරයා විසින් විදර්ශනා ප්‍රඥාවට භූමි වූ ස්කන්ධාදී ධර්මයන්ගේ අර්ථ හා පාළිය ඉගෙන, නුවණින් පුරුදු කොට, මූල වූ ධර්ම සම්පූර්ණ කිරීමෙන්, ශරීර වූ පඤ්ච විශුඬීන් වැඩීමෙන් **ප්‍රඥා භාවනාව** සිඬ කළ යුතු වේ.

**විදර්ශනා ප්‍රඥාව** වැඩීමට උපකාරක ධර්ම වූ **භූමි** නම් **ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සත්‍යය, පටිච්චසමුප්පාද** ආදී ප්‍රභේද ඇති ධර්මයෝ ය. සත්ත්වයෝ නා නා ප්‍රකාරය, ඔවුන් අතුරෙන්—

1. **අරූප සම්මූල්හයෝය**
2. **රූප සම්මූල්හයෝය**
3. **උභය සම්මූල්හයෝය** යයි සත්ත්වයෝ ත්‍රිවිධ වෙති.

**අරූප සම්මූල්හයෝ** නම් නාම ධර්මයන්හි මූළා වූවෝ ය.

ඔවුන් සඳහා **නාමස්කන්ධය,** වේදනා, සංඥා, සංඛාර, විඥානණ වශයෙන් සතරක් කොට ඇති **ස්කන්ධ දේශනාව** වදාළ සේක.

**රූප සම්මූල්හයෝ** නම් රූපයෙහි මුළාවූවෝ ය. ඔවුන් සඳහා එකොළොසක් වූ කොටස් ඇති **ආයතන** දේශනාව වදාළ සේක.

**උභය සම්මූල්හයෝ** නම් නාම-රූප දෙක්හි මුළාවූවෝ ය. ඔවුන් සඳහා නාමය සප්ත විඥාන ධාතුවශයෙන් ද රූපය එකොළොස් ආකාරයෙන් ද දක්වා **ධාතු** දේශනාව වදාළ සේක.

තවද සත්ත්වයෝ—

1. **තික්ඛින්ද්‍රිය**
2. **මජ්ඣිමින්ද්‍රිය**
3. **මුදින්ද්‍රිය** යයි ත්‍රිවිධ වෙත්.

තියුණු කළ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති පුද්ගලයන් සඳහා **ස්කන්ධ** දේශනාව ද, මධ්‍යම ප්‍රමාණයට දියුණු කළ ඉන්ද්‍රියයන් ඇති පුද්ගලයන් සඳහා **ආයතන** දේශනාව ද, මුදින්ද්‍රිය ඇති පුද්ගලයන් සඳහා **ධාතු** දේශනාව ද වදාළ සේක.

තවද සත්ත්වයෝ—

1. **සංක්ෂේප රුචික**
2. **මධ්‍යම රුචික**
3. **විස්තාර රුචික** යයි ත්‍රිවිධ වෙත්.

ඔවුන් අතුරෙන් සංක්ෂේප රුචික පුද්ගලයන් සඳහා **ස්කන්ධ** දේශනාව ද, මධ්‍යම රුචිකයන් සඳහා **ආයතන** දේශනාව ද, විස්තාරරුචිකයන් සඳහා **ධාතු** දේශනාව ද වදාළ සේක.

තවද, ඊශ්වර නිර්මාණවාදාදී වශයෙන් **ආත්ම දෘෂ්ටියෙහි** මුළාවූවන් සඳහා ඊශ්වරත්වයෙන් ශූන්‍යයහයි අනාත්ම **ලක්ෂණය** සුවසේ අවබෝධ කරවීම සඳහා **ඉන්ද්‍රිය** දෙශනාව වදාළ සේක.

අවසානයෙහි මේ ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය යන සතර ධර්මයන්ගේ පැවැත්ම ය, පැවැත්වීමේ හේතු ය, වැළැක්ම ය, වැළැක්මේ මාර්ගය යන සතර ධර්මයන්ගේ වශයෙන් සත්‍යය ධර්ම හා පටිච්ච සමුප්පාද ධර්ම ද වදාළ සේක.

මූල ධර්මයෝ දෙදෙනෙකි. එනම් ශීල විසුද්ධිය හා චිත්ත විශුද්ධිය යි. සෙසු පඤ්ච විශුද්ධීන්ගේ පිහිටීමට උපකාර හෙවත් හේතුවන හෙයින් මූල යයි කියනු ලැබේ.

ශරීර වශයෙන් සලකනු ලබන ධර්මයෝ පස් දෙනෙකි. එනම් දිට්ඨි විශුද්ධි, කඞ්ඛාවිතරණ විශුද්ධි, මග්ගාමග්ගඤාණ දස්සන විශුද්ධි, පටිපදා ඤාණදස්සන විශුද්ධි, ඤාණදස්සන විශුද්ධි යන විශුද්ධි පසය. භාවනා වශයෙන් වඩන ලද මේ ධර්ම පස පරම්පරා වශයෙන් පවත්නා කල, අත්, පා, හිස ආදී වශයෙන් උපමා කොට අවයවයෙන් යුත් ශරීරය යයි හඳුන්වනු ලබන හෙයිනි.

මෙහි භූමි වශයෙන් දක්වන ලද ධර්මයන් අතුරෙන් ස්කන්ධයෝ පස් දෙනෙකි. එනම් රූප ස්කන්ධ, වේදනා ස්කන්ධ, සංඥා ස්කන්ධ, සංස්කාර ස්කන්ධ, විඤ්ඤාණ ස්කන්ධ යන පඤ්චස්කන්ධයෝ ය.

ආයතනයෝ දොළොසෙකි. චක්ඛායතන, රූපායතනාදී අධ්‍යාත්මික ආයතන සය සහ බාහිර ආයතනයෝ සදෙන ය.

ධාතු අටළොසෙකි. චක්ඛු ධාතු, රූප ධාතු, චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදී වශයෙනි.

ඉන්ද්‍රිය ධර්මයෝ දෙවිස්සකි. චක්ඛු ඉන්ද්‍රිය, සෝත ඉන්ද්‍රිය, ඝාණ ඉන්ද්‍රිය ආදී වශයෙනි.

සත්‍ය ධර්මයෝ සතර දෙනෙකි. දුක්ඛාදී චතුරාර්‍ය්‍ය සත්‍යයෝ ය.

මේ ධර්මයන් පිළිබඳ විස්තරය අන් තැනෙක පළවී ඇති හෙයින් මෙහිදී නැවත දැක්වීම අනවශ්‍යය. (**ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍යය, පටිච්චසමුප්පාද** ධර්ම විස්තරයද; **ඉන්ද්‍රියයන්** පිළිබඳ විස්තරය ද බලනු.)

මූල ධර්මවූ ශීල විසුද්ධි, **චිත්ත** විසුද්ධි යන දෙදෙනා අතුරෙන් උපචාර සමාධි සහිත වූ අෂ්ට සමාපත්තීහු **චිත්ත විසුද්ධි** නම් වේ. **සමථ** භාවනා ශීර්ෂයෙන් යට දක්වන ලද්දේ ඒ **චිත්ත විසුද්ධි** යයි. එහෙයින් දැන් **සීල විසුද්ධිය** විස්තර කරණු ලැබේ.

## 1. ශීල විශුද්ධිය

**ප්‍රාතිමෝක්ෂ සංවරාදි චතුර්විධ පාරිශුද්ධි ශීලයන්ගේ වශයෙන් පිරිසුදුවීම ශීලවිසුද්ධි නමි.**

**සීලය** යනු ප්‍රාණඝාත, අදත්තාදානාදී වූ දුශ්ශීල්‍ය කර්මයන්ගෙන්, සමාදාන විරති වශයෙන් හෝ සම්පත්ති විරති වශයෙන් හෝ වැළකෙන්නහුගේ හෝ, උපාධ්‍යායවත් පිළිවෙත් ආදිය පුරන්නහුගේ හෝ **චේතනා, චෛතසික, සංවර, අව්‍යතික්‍රම** යන ශීලයෝ ය.

**චේතනා සීලය** නම් ප්‍රාණඝාතාදියෙන් වැළකෙන්නහුගේ හෝ වත්පිළිවෙත් පුරන්නහුගේ හෝ එවේලෙහි සිත්හි යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන් අතුරෙන් **චේතනා චෛතසිකය** යි. දස අකුසල කර්ම පථයන් අතුරෙන් **ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප** යන සප්ත අකුසල කර්මපථයන්ගෙන් වළකින්නහුගේ එවේලෙහි සිත්හි යෙදෙන චේතනා චෛතසිකය ද **චේතනා සීල** නම් වේ.

**චෛතසික සීලය** නම් ප්‍රාණඝාතාදියෙන් වැළකෙන්නහුගේ එවේලෙහි සිත්හි යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන් අතුරෙන් **සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා**

ආජීව යන විරති චෛතසිකත්‍රය යි. අකුසල කර්මපථයන් අතුරෙන් අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන අකුසල ධර්ම තුනට ප්‍රතිපක්ෂ වූ අනභිධ්‍යා, අව්‍යාපාද, සම්මාදිට්ඨි යන කුසල ධර්මයෝ ද චෛතසික සීල නම් වෙත්.

**සංවර සීලය** නම් **පාතිමොක්ඛසංවරය, සතිසංවරය, ඤාණසංවරය, ඛන්තිසංවරය, විරිය සංවරය** යන **පඤ්චවිධ සංවරයෝ** ය.

**පාතිමොක්ඛ සංවරය** නම් චාරිත්‍ර, වාරිත්‍රාදී ප්‍රභෙදගත විනය පරියාපන්න ශික්ෂාපද සීලයයි.

**සති සංවරය** නම් ඉන්ද්‍රිය සංරක්ෂණාදියෙහි පැවති සතියයි.

**ඤාණ සංවරය** නම් තණ්හා දිට්ඨි ආදිය නසන ඤාණයයි.

**ඛන්ති සංවරය** නම් ඉවසීම නොහොත් අද්වෙෂයෙන් සංවර වීමය.

**විරිය සංවරය** නම් කාමවිතර්කාදීන් පහකිරීම් වශයෙන් පවත්නා වීර්‍ය්‍යයයි.

**අව්‍යතික්‍රම සීලය** නම් සමාදන්ව ගත් සීලය කයින් හෝ වචනයෙන් හෝ නො බිඳ රැකගැනීමයි.

මේ චෙතනා, චෛතසික සීලාදීහු කුසල කාය කර්මාදීන්ට විසිර යන්නට ඉඩ නොදෙන අර්ථයෙන් ද කුසල ධර්මයන් ප්‍රතිෂ්ඨා වශයෙන් ධරණ අර්ථයෙන් ද සීල නම් වේ. එහෙයින් සීලයාගේ **ලක්ෂණය** හෙවත් සාමාන්‍ය සවභාවය නම් සීලනය නොහොත් කුසල කාය කර්මාදීන්ට විසිර යන්නට ඉඩනොදීම හා කුසල ධර්මයන් ප්‍රතිෂ්ඨා වශයෙන් දැරීමත් ය. සීලයාගේ **කෘත්‍යය** නම් දුශ්ශීලත්වය විනාශ කිරීමයි. එහි **සම්පත්තිය** නම් ධ්‍යානාදී ගුණ ඉපදීම ය.

සීලයාගේ **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය නම් හිත, කය, වචන යන ත්‍රිවිධ ද්වාරයාගේ පිරිසුදු බවය. එහි **පදට්ඨානය** හෙවත් ආසන්න කාරණය නම් හිරි-ඔතප් දෙක ය.

**සීලයෙහි ආනිසංස** බොහෝ ය. එනම්:-

1. විපිළිසර නොවීම ය.

2. මහත් වූ භොගස්කන්ධ ලැබීම ය.

3. කල්‍යාණ කීර්ති ශබ්ද නැගීම ය.

4. ක්‍ෂත්‍රියාදි පිරිස් කරා විසාරදව එළඹීම ය.

5. නොමුළා සිහි ඇතිව කාලක්‍රියා කිරීම ය.

6. මරණින් මතු දෙව්ලොව ඉපදීම ය යනාදි යයි.

## සීලයෙහි ප්‍රභෙද

1. සීලනාර්ථයෙන් සියලුම සිල් එකවිධ වේ.

2. තවද **චාරිත්‍ර සීලය. වාරිත්‍ර සීලය** යයි සීලය ද්විධ වේ.

එයින් භාග්‍යවතුන් වහන්සේ විසින් "මේ මේ දෙය කළ යුතුය" යයි පණවා වදාළ සේක් ද, ඒ ශික්‍ෂා පදයන්හි නියමිත සේ පිළිපැදීම **චාරිත්‍ර සීලය** නම් වේ. එසේම "මේ මේ දෙය නොකළයුතු" යයි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්‍ෂෙප කරණ ලද්දේ ද එය නොකිරීම් වශයෙන් පිළිපැදීම **වාරිත්‍ර සීලය** නම්. **චාරිත්‍ර සීලය** ශ්‍රද්ධායෙන් හා වීර්‍ය්‍යයෙන් ද සිඩ කළ යුතු ය. වාරිත්‍ර සීලය ශ්‍රද්ධායෙන් ම සිඩ කළ යුතු ය.

**3. අභිසමාචාරික සීලය, ආදිබ්‍රහ්මචරියක සීලය** යයි ද සීලය ද්විධ වේ. **අභිසමාචාරික සීලය** නම් උතුම් හැසිරීම ය, එනම්, සොවාන් ආදී මාර්ග-ඵල සඳහා පණවන

ලද සීලය යයි ආජීවට්ඨමක සීලය හැර සෙසු සිල් මෙහි ඇතුළත් වේ. තවද, බුද්ධකාණුබුද්ධක නොහොත් පචිති, දුකකට, දුර්භාෂිත, ශිකෂාපද ව්‍යතික්‍රමණය නොකොට රැකීම **අභිසමාචාරික සීල** නමි. එසේම සුළුවග, මහවග දෙක්හි ආ කඳුවත් පිරීම ද අභිසමාචාරික සීලය නම් වේ.

**ආදිබ්‍රහමචරියක සීලය** නම් මාර්ග බ්‍රහමචර්‍යාව ආදියෙහි වූ ආජීවාෂ්ටමක සීලය යි එනම් ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සමඵපපලාප, මිච්ඡාජීව යනාදියෙන් වැලකීම සඳහා සමාදන් ව ගන්නා සීලයයි. එසේම සංඝාදිසේස, පාරාජිකා යන මහා ශිකෂාපද ව්‍යතික්‍රමණය නොකොට රැකීම ද, භිකෂු-භිකෂුණී උභය විභඞගයන්හි ආ ශිකෂාපද ව්‍යතික්‍රමණය නොකොට රැකීම ද **ආදිබ්‍රහමචරියක සීලය** නම් වේ. අභිසමාචාරික සීලය නොපුරා ආදිබ්‍රහමචරියක සීලය පිරිය නොහැකි බව දත යුතු.

4. **විරති සීලය, අවිරති සීලය** යයි ද සීලය ද්විධ වේ.

ප්‍රාණඝාතාදියෙන් වැලකීම් මාත්‍රය හෝ එම කුසල චිත්ත වීථියෙහි උපදනා සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා-ආජීව යන විරති චෛතසික තුන **විරති සීලය** නමි. එම කුසල චිත්ත වීථියෙහි ම පහළ වන සෙසු චේතනාදී චෛතසිකයෝ **අවිරති සීල** නමි.

5. **නිඃසිත සීලය, අනිඃසිත සීලය** යයි ද සීලය ද්විධ වේ.

**තෘෂ්ණා දෘෂ්ටි** දෙකින් නිශ්‍රිත සීලය **නිඃසිත සීල** නමි. මේ සීලයෙන් මම දෙවියෙක් හෝ වෙමියි භවසම්පත් පැතීම් වශයෙන් පුරතු ලබන සීලය **තෘෂ්ණානිඃසිත සීලයයි.** සීලයෙන් ම සුඩිය වන්නේ යයි මිථ්‍යාදෘෂ්ටි වශයෙන් පුරන සීලය **දිට්ඨිනිඃසිත සීලය** යි.

මේ දෙවැදෑරුම් නිඃසිත සීලයෙන් වෙන් ව පුරතු ලබන ලෞකික ලොකොත්තර සීලය **අනිඃසිත සීල** නමි.

**6. කාලපරියන්ත සීලය, ආපාණකොටික සීලය** යයි ද සීලය ද්විධ වේ. කාල නියමයක් ඇතිව සමාදන්ව රක්නා සීලය **කාලපරියන්ත සීල** නම්. අෂ්ටාඞ්ග සීලය මෙනි. පඤ්චසීලය මෙන් දිවිහිම්කොට සමාදන්ව රක්නා සීලය **ආපාණකොටික සීලය**යි.

**7. සපරියන්ත සීලය, අපරියන්ත සීලය** යයි ද සීලය ද්විධ වේ. **ලාභය, යසසය, ඥාතිය, අඞ්ගය, ජීවිතය** යන මෙයින් කිසිවක් සීමා කොට රක්නා සීලය **සපරියන්ත සීල** නම්. ලාභ, යසස් ආදිය අපෙක්ෂා කොට සිල්රක්නා පුද්ගල තෙම එම ලාභ යසස් ආදිය ලත් කල්හි සීලය අත්හරියි. ඒ සීලය කැඩුණු බිඳුණු සිල් බැවින් සමාධිය පිණිස හෝ නිවන් පිණිස හෝ නොපවතී. එසේ ලාභ, කීර්ති ආදිය සීමා නොකොට රක්නා සීලය **අපරියන්ත සීල** නම්. ඒ සීලය නොකැඩුණු නොබිඳුණු සීලයක් වන හෙයින් සමාධිය පිණිස හෝ නිවන් පිණිස හෝ පවතී.

**8. ලෞකික සීලය, ලෝකෝත්තර සීලය** යයි ද සීලය ද්විධ වේ. භවසම්පත් ගෙනදෙන ආශ්‍රව සහිත වූ පෘථග්ජනයන්ගේ සියලු සීල **ලෞකික සීල** නම්. ආශ්‍රව රහිත වූ සෝවාන් ආදී ආර්‍යයන්ගේ භව නිස්සරණය ගෙන දෙන සීලය **ලෝකෝත්තර සීල** නම්.

**9. හීන සීල, මජ්ඣිම සීල, ප්‍රණීත සීල** යයි සීල ය ත්‍රිවිධ වේ.

**හීන සීලය**- හීන වූ ඡන්ද, චිත්ත, විරිය, විමංසායෙන් පවත් වන ලද සීලය ද, කීර්ති, ප්‍රශංසා අපෙක්ෂා කොට සමාදන් ව රක්නා සීලය ද, තමා උසස් කරගන්නා අදහසින් හෝ අනුන් හෙළා දක්නා අදහසින් හෝ අත්තුක්කංසන පරවම්භන වශයෙන් කිළිටි වූ සීලය හෝ තෘෂ්ණා වශයෙන් භව-භොග සම්පත් පතා රකිනු ලබන සීලය ද **හීන සීල** නම්.

**මජ්ඣිම සීලය**- මධ්‍යම වූ ඡන්‍ද, චිත්ත, විරිය, විමංසායෙන් පවත් වන ලද සීලය ද, සිල් රැකීමෙන් මතු උසස් කුල, සවර්ග සම්පත් පිණිස රක්නා සීලය ද, අත්තුක්කංසන, පරවම්භනාදියෙන් නොකිලිටි වූ පෘථග්-ජනයන්ගේ සීලය ද තමා පමණක් සසරින් මිදෙනු පිණිස රකිනු ලබන සීලය ද **මධ්‍යම සීලය** නමි.

**ප්‍රණීත ශීලය** - ප්‍රණීත වූ ඡන්‍ද, චිත්ත, විරිය, වීමංසා යෙන් පවත්වන ලද සීලය ද, සෝවාන් ආදී ආර්‍ය්‍ය භාවය පිණිස රක්නා සීලය ද, ලොකොත්තර සීලය ද, සියලු සතුන් සසරින් එතර කරනු සඳහා රකිනු ලබන බෝසතුන්ගේ පාරමිතා සීලය ද **ප්‍රණීත සීලය** නමි.

**10. අත්තාධිපතෙය්‍ය සීල, ලොකාධිපතෙය්‍ය සීල, ධම්මාධිපතෙය්‍ය සීල** යයි ද සීලය ත්‍රිවිධ වේ.

ආත්මගෞරවය උපදවා රක්නා සීලය **අත්තාධිපතෙය්‍ය සීල** නමි. ලොකාපවාදයට බියෙන් ලෝකයා ගරු කොට රක්නා සීලය **ලොකාධිපතෙය්‍ය සීල** නමි. ධර්ම ගෞරව-යෙන් රක්නා සීලය **ධම්මාධිපතෙය්‍ය සීලය** යි.

**11. පරාමට්ඨ සීල, අපරාමට්ඨ සීල, පටිප්පස්සද්ධි සීල** යයි ද සීලය ත්‍රිවිධ වේ. තෘෂ්ණා දිට්ඨි වශයෙන් අල්වා ගන්නා ලද හෙවත් පරාමර්ශනය කරන ලද නිස්සිත සීලය ම **පරාමට්ඨ සීල** නමි. සෝවාන් ආදී ආර්‍ය්‍යමාර්ග ප්‍රතිලාභය පිණිස පුරනු ලබන සීලය ද, සප්ත ශෛක්ෂ-යන්ගේ මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත විරති චේතනාදිය ද, තෘෂ්ණා, දිට්ඨි වශයෙන් නො කරන ලද හෙයින් **අපරාමට්ඨ සීල** නමි.

ශෛක්ෂයන්ගේ හා අශෛක්ෂයාගේ ඵල චිත්තයන්හි සම්ප්‍රයුක්ත විරති චේතනා ආදීහු කෙලෙස් විඩා සංසිඳුවන හෙයින් **පටිප්පස්සද්ධි සීල** නම් වේ.

**12. විසුද්ධ සීල, අවිසුද්ධ සීල, වෙමතික සීල** යයි ද සීලය ත්‍රිවිධ වේ.

ඇවැත්වලට නොපැමිණ ම රක්නා ලද සීලය ද, ඇවැත් වලට පැමිණ ඇවැත් දෙසා ගැනීම් ආදී වශයෙන් පිළියම් කරගන්නා ලද සීලය ද **විසුද්ධ සීල** නම්. ඇවැත්වලට පැමිණ ඇවැත් දෙසා ගැණීම් ආදී වශයෙන් පිළියම්කර නො ගන්නා ලද සීලය **අවිසුද්ධ සීල** නම්. ආහාරපානාදී වස්තුවෙහි සැක සහිතවීම නම් වූ **වස්තුවෙහි විමතිය** ද, පැමිණි ඇවැත් පචිති දුක්කටාදීන් අතුරෙන් කවරෙක්දෝ හෝයි සැක සහිත වීම නම් වූ **ආපත්තියෙහි විමතිය** ද, ඇවතට පැමිණියේදෝ හෝ නො පැමිණියේ දෝ හෝයි අජ්ඣාචාරයෙහි සැක සහිතවීම නම් වූ **අජ්ඣාචාරයෙහි විමතිය ද** යන විමති ඇත්තහුගේ සීලය **වෙමතික සීල** නම්.

**13. සෙඛ සීල, අසෙඛ සීල, නෙවසෙඛනාසෙඛ සීලය** යි ද සීලය ත්‍රිවිධ වේ.

ශෛක්‍ෂයන්ගේ මාර්ග-ඵල චිත්තයන්හි යෙදුණු විරති චේතනාදීහු **සෙඛ සීල** නම්. අශෛක්‍ෂයාගේ ඵල චිත්ත-යන්හි යෙදුණු විරති චේතනාදීහු **අසෙඛ සීල** නම්. පෘථග්ජනයන්ගේ සීලය **නෙවසෙඛනාසෙඛ සීල** නම්.

**14. හානභාගිය, ඨිතිභාගිය, විසෙසභාගිය, නිබ්බෙ-ධභාගිය සීල** යයි සීලය චතුර්විධ වේ. පිරිහීම් පක්‍ෂය භජනය කරන සීලය **හානභාගිය** සීල නම්. මෙය දුස්සීලයන් සෙවනය කරමින්, සීලවන්තයන් සේවනය නො කිරීමෙන්, වරදෙහි දොස් නො දැකීමෙන්, මිථ්‍යා අදහස් උපදවමින්, ඉන්ද්‍රිය සංවරාදියක් නොමැතිව රක්නා සීලය යි.

පිරිහීමටත් නො පැමිණ, අභිවෘද්ධියටත් නො පැමිණ, තුබූ පරිද්දෙන් ම පවත්නා සීලය, **ඨිතිභාගිය සීලය** වේ.

නමාලත් සීලසම්පත්තියෙන් ම සතුටුව මතු ධ්‍යාන මාර්ග - ඵලාදිය පිණිස උත්සාහවත් නොකරන්නේ සිටි තැන්හි ම සිටී.

සමාධි සඬ්ඛ්‍යාත විශේෂය පිණිස නැමීගත් සීලය **විසෙසභාගීය සීලය** වේ. හෙතෙමේ සීලයෙහි පිහිටා මතු සමාධිය පිණිස උත්සාහවත් වේ.

නිබ්බිද සඬ්ඛ්‍යාත විදර්ශනා පිණිස නැමීගත් සීලය **නිබ්බේධභාගීය සීලය** වේ. හෙතෙමේ විදර්ශනා වඩා මාර්ග-ඵලාධිගමය පිණිස උත්සාහවත් වේ.

**15. භික්ඛු සීල, භික්ඛුණී සීල, අනුපසම්පන්න සීල, ගහට්ඨ සීල** යයි ද සීලය චතුර්විධ වේ.

භික්ෂූන් උදෙසා පණවන ලද ශික්ෂාපද හා භික්ෂුණීන් උදෙසා පණවන ලද ශික්ෂා පදයන් අතුරෙන් භික්ෂූන්ටත් සාධාරණ ශික්ෂා පද **භික්ෂු සීල** නම් වේ.

භික්ෂුණීන් උදෙසා පණවන ලද ශික්ෂා පද හා භික්ෂූන් උදෙසා පණවන ලද ශික්ෂා පදයන් අතුරෙන් භික්ෂුණීන්ටත් සාධාරණ ශික්ෂා පද **භික්ෂුණී සීල** නමි.

සාමණේර සාමණේරින්ගේ දස සීලය **අනුපසම්පන්න සීල** නමි.

උපාසක උපාසිකාවන්ට නිත්‍යය වශයෙන් පණවා වදාල පඤ්ච ශික්ෂා පදයෝ ද, උත්සාහ ඇතොත් රැකිය යුතු දස සීලය ද උපොසථ සීල වශයෙන් පණවණ ලද අෂ්ටාඞ්ග සීලය ද **ගහට්ඨ සීල** නමි.

**16. ප්‍රකෘති සීල, ආචාර සීල, ධම්මතා සීල, පුබ්බහේතුක සීල** යයි ද සීලය චතුර්විධ වේ.

ස්වභාවයෙන් රැකෙන සීලය **ප්‍රකෘති සීලය** නමි උතුරුකුරු දිවයින් වැසි මනුෂ්‍යයන්ට මෙනි.

කුල, දෙශ, නිකාය යන මොවුන් කෙරෙහි පැවැති යහපත් චාරිත්‍ර **ආචාර සීලය** නම් ඒ ඒ කුල, දෙශාදීන්හි පෙර පටන් පැවත ආ ප්‍රාණඝාතාදියෙන් වැළකීම යනාදී යහපත් චාරිත්‍ර විධි පැවැත්වීම **ආචාර සීල** නම්.

බෝසතුන් මව්කුස පිළිසිඳගත් තැන් පටන් බෝසත් මාතාවන්ට පුරුෂයන් කෙරෙහි කාම අදහස් පහළ නොවීම යනාදිය **ධම්මතා සීලය** නම්.

පූර්ව හේතුවෙන් ම ජනිත **පුබ්බහේතුක සීල** නම්. මහාකාශ්‍යපාදී ශුද්ධසත්ත්වයන්ගේ ද, බෝසතුන්ගේ ද ඒ ඒ ජාතීන්හි පූර්වහේතු බලයෙන් පැවැති සීලය යි.

**17. පාතිමොක්ඛසංවර සීලය, ඉන්ද්‍රියසංවර සීලය, ආජීවපාරිශුද්ධි සීලය, පච්චයසන්නිශ්‍රිත සීලය** යයි ද සීලය චතුර්විධ වේ.

ප්‍රාතිමොක්ෂයෙහි වදාළ ශික්ෂාපද ව්‍යතික්‍රම නොකොට රැක ගැනීම් ආදිය **ප්‍රාතිමොක්ෂසංවර සීලය** වේ.

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන ෂට් ඉන්ද්‍රියයන් සංවර කරගැන්ම **ඉන්ද්‍රිය සංවර සීලය** යි.

ආජීවය හේතුකොට ගෙන පණවා වදාළ සවැදෑරුම් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම් වශයෙන් ද, කුහන ලපනාදී පාපධර්මයන්ගේ වශයෙන් ද, පවත්නා වූ මිථ්‍යාජීවයෙන් වැළකීම **ආජීවපාරිශුද්ධි සීලය** වේ.

ප්‍රත්‍යවෙක්ෂා කොට සිව්පසය පරිභොග කිරීම **ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය** යි.

**18. පරියන්තපාරිසුද්ධි සීලය, අපරියන්තපාරිසුද්ධි සීලය, පරිපුණ්ණපාරිසුද්ධි සීලය, අපරාමට්ඨපාරිසුද්ධි සීලය, පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීල** යයි සීලය පස්වැදෑරුම් වේ.

අනුපසම්පන්නයන්ගේ, සීමා සහිත ශික්ෂාපද ඇතිය වුන්ගේ, යම් සීලයක් වේ ද, එය **පරියන්තපාරිසුද්ධි සීල** නමි.

විශේෂාධිගමයෙහි වන කාය ජීවිත දෙක්හි අපෙක්ෂා රහිත වූද, ඒ පිණිස ම හළ ජීවිත ඇතියවුන්ගේ ද යම් සීලයක් වේද එය **පරිපූර්ණපාරිසුද්ධි සීලය** නම් වේ.

ශෛක්ෂයන්ගේ සීලය දෘෂ්ටි වශයෙන් පරාමර්ශනය නො කරන ලද හෙයින් **අපරාමට්ඨ පාරිසුද්ධි සීලය** නමි.

රහතන්වහන්සේ ද, පසේබුදුන් වහන්සේ ද, සම්මා සම්බුදුන් වහන්සේ ද සීලය සියලු කෙලෙස් විධා සංසිඳු වීමෙන් පිරිසුදු වන බැවින් **පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලය** නම් වේ.

**19.** **පහාණ සීල, වේරමණී සීල, චේතනා සීල, සංවර සීල, අවීතික්කම සීල** යයි ද සීලය පස්වැදෑරුම් වේ.

හිරි–ඔතප් යනාදීන් ප්‍රධාන කුසල් සිතකින් ප්‍රාණ–ඝාතාදිය නොකර හැරීම **පහාණ සීල** නමි.

එසේම ඒ ප්‍රාණඝාතාදී අකුසලයන්ගෙන් වැළකීම **වේරමණී සීල** නමි.

ප්‍රාණඝාතාදියට ප්‍රතිපක්ෂ වූ චේතනාව **චේතනා සීල** නම් වේ.

ප්‍රාණඝාතාදිය සිඳවිය හැකි මාර්ග වසාලීම් වශයෙන් සංවරවීම **සංවර සීල** නමි.

ප්‍රාණඝාතාදියෙන් වැළකීම පිණිස සමාදන් ව ගත් ශික්ෂාපද බිඳ නොලීම **අවීතික්කම සීල** නමි.

**පාතිමොක්ඛ සංවරාදී** චතුර්විධ පාරිසුද්ධි සීලයන්ගේ වශයෙන් පිරිසුදු වීම **ශීලවිසුද්ධි** යයි දක්වන ලද හෙයින් නොයෙක් ප්‍රභේද ඇති මේ සීලයන් අතුරෙන් **සතර සංවර සීලය** දැන් විස්තර කරණු ලැබේ.

## ප්‍රාතිමෝක්ෂ සංවර සීලය

**"ඉධ භික්ඛු පාතිමොක්ඛසංවර සංවුතො විහරති ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු."** යනාදී වශයෙන් මේ ශාසනයෙහි භික්ෂු තෙම ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්තව, ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්තව, ස්වල්ප වරදෙහි පවා භයදක්නා සුලුව වාසය කරන්නේ ය. ශික්ෂාපදයන් සමාදන්ව රකින්නේ යයි පුද්ගලාධිෂ්ඨාන දෙශනා වශයෙන් නොහොත් ශීලය දක්වුවමනා තන්හි ඒ ශීලය ඇති පුද්ගලයා වර්ණනා කොට ප්‍රාතිමෝක්ෂ සංවර සීලය වදාරණ ලදී. යම් සීලයක් තමා රක්නහු අපායිකාදී දුකඛයන්ගෙන් මුදා ගන්නේ වේද ඒ සීලය කයින් හෝ වචනයෙන් හෝ ශික්ෂාපද නො බිඳීම් වශයෙන් රකින්නේ නම් එය **ප්‍රාතිමෝක්ෂ සංවර සීලය** නමි. ඒ භික්ෂුව අනාචාරයෙන් වෙන්ව ආචාරයෙන් යුක්තව වාසය කරන්නේ ය.

**අනාචාරය** – කයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම, වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම, කයින් හා වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම **අනාචාරය** යයි කියනු ලැබේ. මේ ශාසනයෙහි යම් භික්ෂුවක් හුණ, කොළ, මල්, ඵල, නහනු, දැවටු ආදිය ගිහියන් සිත්ගන්නා පිණිස දෙන්නේ වේද, **චාටුකම්‍යතා, මුග්ගසූපතා, පාරිභට්ටතා, ජඞ්ඝපෙසනිකතා** යන මෙයින් හා බුදුන් විසින් පිළිකුල් කොට වදාළ අන්‍යවූ ද මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකා පවත්නේ වේද, එය ද **අනාචාර** නම් වේ.

**චාටුකම්‍යතා** නම් භික්ෂූන් විසින් ගිහියන්ගේ සිත් ගන්නා පිණිස ගිහියන් උසස්තන්හි තබා, තමන් පහත් තන්හි තබා කථා කිරීම ය.

**මුග්ගසූපතා** නම් මුංඇට තැම්බූ කල වැඩි කොටස නොපැසී, මද කොටසක් පැසී තිබෙන්නාසේ, කථාකරන කල්හි වැඩි කොටස අසත්‍ය වීම හා මද කොටසක් ම සත්‍යය වීම ය.

**පාරිභට්ටතා** නම් කිරිමවුන් මෙන් කුඩා දරුවන් වඩා ගෙන ආදර දැක්වීම ය.

**ජඞ්ඝපෙසනිකතා** නම් ගිහියන්ගේ පණිවිඩ පණත් ගෙන යාමයි.

බුදුන්වහන්සේ විසින් පිළිකුල් කර වදාළ අන්‍යවූ මිථ්‍යාජීවිකා නම් වෙදකම් කිරීම් නැකැත් කීම් ආදියයි.

තවද, මේ අනාචාරය, **කායික අනාචාරය, වාචසික අනාචාරය** යයි විධ වේ.

යම් මහණකෙණෙක් සඞ්ඝයා මැදට පැමිණියේ ස්ථවිර භික්ෂූන් කෙරෙහි සැලකීම හෝ ගෞරවය හෝ නොකොට, සිවුරෙන් සිවුර හෝ සිරුරෙන් සිරුර හෝ ගටමින් සිටී ද, ගටමින් හිඳීද, එසේම පෙරටුව හෝ සිටී ද, පෙරටුව හෝ හිඳී ද, උස් අසුන්හි හිඳගනී ද, හිසවසා පොරවාගෙන හිඳී ද, ළඟම සිට කථා කෙරේ ද, අත් වනවනා කථා කෙරේ ද, මහ තෙරුන් පාවහන් නැතිව සක්මන් කරන කල්හි තමා පාවහන් ඇතිව සක්මන් කෙරේ ද, මහතෙරුන් පහත් වූ සක්මනෙහි සක්මන් කරන කල්හි තමා උස්වූ සක්මනට නගීද, ස්ථවිර භික්ෂූන් බිම සක්මන් කරන කල්හි තමා සක්මනට නැගී සක්මන් කෙරේ ද, මහ තෙරුන් හිඳිනා තන්හි වැද හිඳ ගනී ද, නවක භික්ෂූන් අසුන්වලින් නෙරපාද, මහතෙරුන් නොවිමසා ගිගිහල් ගෙයි ලිප දර බහාලන්නේවේ ද, දොර වසා ද, නහන තොටෙහි ස්ථවිර භික්ෂූන් ඝට්ටනය කරමින් හෝ බසී ද, ඉදිරියෙන් හෝ බසී ද, ගටමින් නහාද, ඉදිරියෙහි සිට නහාද, ගටමින් නගීද, ඉදිරියෙන් නගීද, ඇතුල් ගමට වදනා කල්හි ස්ථවිර භික්ෂූන් ගට්ඨනය කරමින් හෝ යේද, ස්ථවිර භික්ෂූන් ඉක්මවා පළමු කොට හෝ යේද, ස්ථවිර භික්ෂූන්ට පෙරටුව හෝ යේද, කුලස්ත්‍රීන්, කුලකුමාරිකාවන් වසන, ආවරණය කරන ලද ගබඩාවලට වහා ඇතුල් වේද, ප්‍රත්‍යදායකයන්ගේ කුලදරුවන්ගේ හිස පිරිමදී ද, මේ ආදීහු **කායික අනාචාරයෝ** ය.

යම් මහණ කෙනෙක් මහතෙරුන්ට අගෞරව වශයෙන් මහතෙරුන් නොවිමසා දහම් දෙසාද, ප්‍රශ්න විසඳත්තේ ද, පාමොක් දෙසා ද, මහ තෙරුන් ඉදිරියෙහි නො නැගී සිට කථා කෙරේ ද, අත වනවනා කථා කෙරේ ද, ගෙය තුලට ගොස් කුලස්ත්‍රීන්, කුලකුමාරිකාවන්ගේ නම් ගොත් කියා අමතමින් "කුමක් ඇත්තෙහි ද, කැඳ ඇත්තෙහි ද, බත් ඇත්තෙහි ද, කැවුම් ඇත්තෙහි ද, කුමක් කමුද, කුමක් බොමුද, කුමක් වළඳමුද, කුමක් මට දෙත්තෙහි ද" යනාදී වශයෙන් ශ්‍රමණ සරුප් නොවන විකාර කථා කෙරෙද් ද, මේ ආදීහු **වාචසික අනාචාර** නමි.

**ආචාරය**– කයෙන් ශික්‍ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම ය, වචනයෙන් ශික්‍ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම ය, කයෙන් හා වචනයෙන් ශික්‍ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම ය යන මෙය **ආචාරය** යයි කියනු ලැබේ. සියලු සීල සංවරය ද **ආචාර** නමි. යම් මහණ කෙනෙක් **වෙළුදාන** නම් වූ ප්‍රත්‍යය උපදවනු කැමැතිව ගිහියන් සිත් ගන්නා පිණිස හුණ දඬුදීම ය, **පත්තදාන** නම් වූ තල්පත්, ආදි පත්‍ර දීම ය, **පුප්ඵදාන** නම් වූ සපු සමන් ආදී වූ මල් දීම ය, **ඵලදාන** නම් වූ කොස්, දෙල්, පුවක් ආදි ඵල දීම ය, **සිනානදාන** නම් වූ ඇඟ උලා නහන සුණු වගී දීම ය, **දන්තකට්ඨ දාන** නම් වූ දැවටිදඬු දීම ය, යන මේ ආදිය නො පවත්තේ ද, **චාටුකම්‍යතා, මුග්ගසූප්‍යතා, පාරිභට්ටතා, ජඞ්ඝපෙසනිකතා** යන මෙයින් ද වෙදකම්, නැකැත් කීම්, ගණිත, මිණිත, භාණ්ඩාගාරකම්ම, පිණ්ඩ-ප්‍රතිපිණ්ඩාදී බුදුන් වහන්සේ විසින් නිඳා කරන ලද මිථ්‍යාජීවයෙන් ද ජීවිකා නො පවත්තේවේ ද මෙය ද **ආචාර** නම් වේ.

තවද, යම් මහණ කෙනෙක් ශ්‍රද්ධා, ශ්‍රැත, ත්‍යාගාදී ගුණ හේතු කොට ඇති වූ, මහතෙරුන් කෙරෙහි ගෞරවය හා යටත් පැවතුම් ඇත්තේ වේද, හිරි-ඔතප් හෙවත් ලජ්ජායෙන් හා බියෙන් යුක්ත වේද, සෙඛිය ධර්මයෙහි

ආ නියායෙන් මනා කොට හැඳ, මනා කොට පෙරවියේ වේද, දුටුවන් පහදනා ගමනාගමන ඇත්තේ වේද, එසේම ප්‍රසාදවහවූ ඉදිරි බැලුම් හා අනුදිග් බැලුම් ඇත්තේ වේද, ප්‍රසාදවහවූ අත් පා ආදීන්ගේ හැකිළීම් දිගුකිරීම් ඇත්තේ වේද, වියදඬු පමණ දක්නා බැවින් යට හෙළූ ඇස් ඇත්තේ වේද, දුටුවන් පහදනා සත්හුන් ඊයඹ්‍යාපථයෙන් යුක්තවූයේ වේද, චක්‍ෂුරාදී ෂඩින්‍ද්‍රියයන් කෙරෙහි මොනවට කරණ ලද රක්‍ෂාවරණ ඇත්තේ වේද, චීවරාදී සිව්පසෙහි සෙවීම්, පිළිගැනීම්, පරිභොග කිරීම් ආදී වශයෙන් සම්‍යකාරයෙන් පමණ දත්තේ වේද, නිදිවර්ජිත කිරීමෙන් භාවනාවෙහි යෙදුනේ වේද, සිහිනුවණ දෙකින් යුක්තවූයේ වේද, ප්‍රත්‍යය තෘෂ්ණාව නැත්තේ වේද, යථාලාභ සන්තෝෂාදී ද්වාදසාකාරයෙන් සතුටුවූයේ වේද, පටන් ගන්නා ලද කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ වේද, උතුම් හැසිරීම නම් වූ අභිසමාචාරික සීලයෙහි ආදර කරන්නේ වේද, ගුරුස්ථානයෙහි ආදර බහුල කොට වෙසේ ද මේ ආදිය ආචාර යයි කියනු ලැබේ.

මෙසේ ශීලවිසුඩියට පැමිණෙනු කැමැති යෝගාවචරයා විසින් යට කී අනාචාරයන්ගෙන් වෙන් ව ආචාර සමපන්න ව වාසය කළයුතු.

එපරිද්දෙන් ම **අගෝචරයන්** ගෙන් වෙන්ව **ගොචර** සමපන්න ද විය යුතු.

**අගෝචර** නම්- පිණ්ඩපාතාදිය සඳහා නොයායුතු තැන් වශයෙන් ගත යුතු වූ, පඤ්චකාම ගුණයම ඇසුරු කරන බැවින් ද, ශ්‍රමණ ධර්‍මයට කාරණා නොවන බැවින් ද, වෙශ්‍යාදීහු ද, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා නමැති අසනිපතයට හේතු වන බැවින් **රාජරාජ** මහාමාත්‍යාදීහු ද, සම්‍යග්දෘෂ්ටි විපරිතයට කාරණ වූ බැවින් **තීර්ථකාදීහු** ද, ශ්‍රඩාහානිය ද, චිත්තබෙදය ද ඇතිවීමට කාරණා බැවින් **අශ්‍රඩාදී කුලයෝ** ද, **අගොචර** නම් වෙත්.

**වෙශ්‍යාදීහු නම්:-**

**1. වෙසිය**-වෙසඟනන් රාගාධිකයන් බැවින් ශ්‍රමණ ධර්මයට අන්තරායකරය.

**2. විධවා**-වැන්දඹුවන්, මළසැමියන්, බැහැරගිය සැමියන් ඇත්තවුන් ය.

**3. ථුල්ලකුමාරිකා** - ස්වාමිකුලයට නොගොස් ගෙහිදී වැඩිවිය පැමිණි මැහැලි කුමරියන්.

**4. පණ්ඩක**-නපුංසකයන්-නොසන්සුන් කෙලෙස් ඇත්තෝ ය.

**5. භික්ඛුණීන්**-උත්සන්න වූ බඹසරවස් ඇති හෙයින් බඹසරවසට අන්තරාය විය හැකි බැවිනි.

**6. පානාගාර**-රාසොඬුන් වසන සුරා සැල් ආදිය.

**රාජරාජමහාමාත්‍යාදීහු නම්:-**

**රජවරු** හා **මහ ඇමැතිවරු** ය. නුසුදුසු ලාභ සත්කාර උපදවන බැවින් සම්‍යග් ආජීවයට අන්තරාය කරය.

**තිර්ථකාදීහු නම්:-**

**තීර්ථකයෝ** සහ **තීර්ථක ශ්‍රාවකයෝ** ය-දෘෂ්ටි විපත්තියට හේතු වන හෙයින් සම්‍යග් දෘෂ්ටියට අන්තරාය කරය.

**අශ්‍රද්ධාදී කුලයෝ නම්:-**

**1. අශ්‍රද්ධා වන්තයෝ**-ශ්‍රද්ධා ගුණය නැති හෙයින් අන්තරාය කරය.

**2. අප්‍රසන්නයෝ**-සංඝයා කෙරෙහි පැහැදීමක් නැති අය.

3. **අක්කොස පරිභාසකානි**-දස ආක්‍රොස වස්තු ආදියෙන් ආක්‍රොස කරන හෙයින් හා භය දක්වීමෙන් තර්ජනය කරන හෙයිනි.

4. **අනත්ථකාමානි**-අනර්ථයම කැමැති වන අය.

5. **අහිත කාමානි**-අහිතවත් වූ අය.

6. **අඵාසු කාමානි**-සුවය කැමැති නොවන අය.

7. **අයොගක්ඛෙමකාමානි**-භයට කැමැති වන අය.

මෙකී කුලයන් **අගොචර** නම්. ඔවුන් නිසා දිවි පැවැත්ම වේද, ඔවුන් කරා එලඹේ ද, නැවත නැවත එලඹේ ද, එය **අගොචර** නමි.

**ගෝචර** නම් යම් මහණ කෙනෙක් යට කියන ලද වෙසඟනන්, වැන්දඹු ස්ත්‍රීන්, වැඩිවිය පැමිණ ස්වාමිකුලයට නොගොස් ගෙයි වසන තරුණියන්, පණ්ඩකයන්, භික්ෂුනීන් මත්පැන්සැල් ගෝචර කොට වාසය නො කරන්නේ වේද, රජුන් හා රජඇමැතියන් හා තීර්ථකයන් හා තීර්ථක ශ්‍රාවකයන් හා ද නුසුදුසු සංසර්ගයට නො පැමිණ වෙසේ ද, ශ්‍රද්ධාසම්පන්න, පැහැදීම ඇති, භික්ෂු-භික්ෂුණීන් උදෙසා සතරමංසන්ධියෙහි තැනූ බොන පැන් පොකුණක් බඳුවූ, භික්ෂු-භික්ෂුණීන්ගේ පැමිණීම කරණ කොට ගෙන උන්වහන්සේලා හන් පෙරෙවි චීවරාලොකයෙන් බැබලෙන්නාවූ, භික්ෂු භික්ෂුණීන් සඞ්ඛ්‍යාත සෘෂින්ගේ චීවර වාතයෙන් හා අත්පා දිගු කිරීම් ආදියෙන් හටගන්නාවූ පවනින් ද හමන ලද නොහොත් සෝද හරන ලද පව් ඇති හෙයින් උන්වහන්සේලාගේ ඇසුරින් පිරිසුදු වූ, අර්ථයක් ම කැමැති වන්නාවූ කුලයන් **ගොචර** නම් වේ.

තවද, **උපනිස්සය ගොචරය, ආරක්ඛ ගොචරය, උපනිබන්ධ ගොචර** යයි **ගොචරය** ත්‍රිවිධ වේ.

**උපනිස්සය ගෝචර**-සීලාදී ගුණයන්ට කාරණා වන හෙයින් උපනිස්සය ගෝචර නම්.

යම් කල්‍යාණ මිත්‍රයෙකු නිසා පෙර නො ඇසූවිරූ සූත්‍ර, ගෙය්‍ය ආදිය අසා ද,

පෙර අසන ලද්ද නැවත නැවත පිළිවිසීමෙන් පිරිසුදු කෙරේ ද,

ඇසූ විරූ තන්හි සැක දුරු කෙරේ ද,

කර්මය හා කර්මඵලය ද, රත්නත්‍රය ද ඇදහීම් වශයෙන් සම්‍යග්දෘෂ්ටිය ඇදහරිද, එහිම ශ්‍රද්ධායෙන් සිත පහදවා ද,

ධර්මය, පිරිසිදු කොට, එහි ප්‍රකාශිත වූ නාම-රූප ධර්මයන් තත්ත්වාකාරයෙන් දැන, සත්ත්වය, ජීවය, යනාදී මිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත වක් දිගහැරීමෙන් සම්‍යග්දෘෂ්ටිය දිගහරින්නේ වේද,

නාම-රූප ධර්මයන්ගේ කාරණය ද, ඒ කාරණයෙන් හටගත් ධර්ම මාත්‍රය ද, තත්ත්වාකාරයෙන් දැකීමෙන් අතීතානාගත වර්තමාන යන කාලත්‍රය විෂයෙහි සැක දුරු කෙරේ ද,

ඉන් ඔබ්බෙහි උදයව්‍යය ඥානාදී වශයෙන් විදර්ශනා වඩා ආර්‍ය්‍ය භූමියට පැමිණ අචල ශ්‍රද්ධායෙන් තුනුරුවන් කෙරෙහි සිත පහදවා ද,

මෙබඳු වූ **ලක්ෂණ** ඇති ඒ කල්‍යාණ මිත්‍රයාට අනුව හික්මෙන්නා වූ පුද්ගල තෙමේ ඒකාන්තයෙන් ශ්‍රද්ධාවෙන් ද, **ශීලයෙන් ද, ශ්‍රැතයෙන් ද, ත්‍යාගයෙන් ද, ප්‍රඥායෙන් ද** නො පිරිහෙන හෙයින් එය **උපනිශ්‍රය ගොචර** නම් වන්නේ ය.

**ආරක්ඛ ගොචරය** යම් භික්ෂුවක් ඇතුල් ගමට වැද පිඬුසිඟීම් පිණිස වීථි මාර්ගයට පිළිපන්නේ යට හෙළූ ඇස් ඇතිව, වියදඬු පමණ දුර බලන සුළුව, චක්ෂුරාදී

ෂඩින්ද්‍රියයන් මොනවට ආරක්‍ෂා කොට ගෙනයේ ද, ඇත්, අස්, රථ, පාබල සේනා ද, ස්ත්‍රී පුරුෂයන් ද නො බලමින් උඩ යට දිසා අනුදිසාවන් නො බලමින් යන්නේ වේද මෙය **ආරක්‍ඛ ගොචර** නම් වේ.

**උපනිබන්‍ධ ගොචරය** – යෝගාවචරයාගේ භාවනා චිත්තය ඔබමොබ යා නොදී සතර සතිපට්ඨාන නමැති ටැඹ කරා පමුණුවා, එහි බඳිද, ඒ සතර සතිපට්ඨාන ධර්මයෝ **උපනිබන්‍ධ ගෝචර** නම් වේ. මෙය සමෘති චෛතසිකය යි.

මෙසේ ආචාර ගොචර සම්පන්න වූ යෝගාවචර භික්‍ෂු තෙම අණු ප්‍රමාණවූ ඉතා සුළු වරදෙහි පවා භය දක්නා සුළුවේ. එනම්, නොදැන, අමතකවීමෙන් සිවුරු හැදීම් ආදියෙන් පැමිණි සෙඛිය ශික්‍ෂාපදයන්ගේ ඉක්මවීම ය, අකුසල චිත්තයන්ගේ ඉපදීම ය යනාදී ප්‍රභෙද ඇති ස්වල්ප මාත්‍ර වරදෙහි පවා පාරාජිකාපත්තියක් තරම් මහත් කොට සිතා භය දක්නා සුළුවේ. හෙතෙමේ ශික්‍ෂාපදයන්ගෙන් යමක් සමාදන්ව රැක්ක යුතු ද ඒ සියල්ල රක්නේය. ශික්‍ෂා පදයෙහි ප්‍රථම ප්‍රඥප්තිය, අනුප්‍රඥප්තිය, සර්‍වත්‍රප්‍රඥප්තිය, ප්‍රදෙශප්‍රඥප්තිය යනාදී ප්‍රභෙදවත් වූ යම් කිසිවක් හික්මිය යුතු ද, පිළිපැද්ද යුතු ද, පිරිය යුතු ද, ඒ සියල්ල ම මනා කොට ගෙන හික්මෙන්නේ ය යනු එහි අදහස වේ.

මෙසේ විදර්ශනා ප්‍රඥ භාවනාව වඩනු කැමැති යෝගාවචර තෙම පළමු කොට ප්‍රාතිමොක්‍ෂ සංවර සීලයෙහි මනාකොට පිහිටා හික්මෙන්නේය.

## ඉන්‍ද්‍රිය සංවර සීලය

**චක්‍ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන** යන ෂඩින්ද්‍රියයන් සංවර කර ගැන්ම පිණිස ද එයට හමුවන **රූප, ශබ්ද, ගන්‍ධ, රස, ඵොට්ඨබ්බ, ධම්මාරම්මණාදිය** නිමිතිකොට සිත්හි කෙලෙස් ඉපදීම වැළැක්වීම පිණිස පිළිපදනේ වේ ද එය **ඉන්‍ද්‍රිය සංවර සීලය** නම් වේ.

**"සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී"**— යනාදී වශයෙන් වදාළ හෙයින් ඒ ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් සංවර වූ භික්ෂු තෙම චක්ෂුර් විඥානයෙන් රූප දැක පියොවුරු ආදිවූ ස්ත්‍රී නිමිති හෝ දැලිරැවුල් ආදිවූ පුරුෂ නිමිති හෝ කෙලෙස් ඉපදීමට හේතු වන අන්‍ය නිමිති හෝ නොගෙන දුටු දෙය දුටු සැටියෙන් ම සලකා ගන්නේ ද නොහොත් ඇසට රූපයක් හමුවූ කල්හි උපදනා චක්ඛුවාරික චිත්තවීථියෙහි චක්ෂුර් විඥානයා විසින් ද, ජවන් සිත් විසින් ද ගන්නා ලද පමණෙහි ම සිටී ද, මතුමත්තෙහි ඒ අරමුණ සුභය, ඉෂ්ටය යනාදී වශයෙන් හෝ වෛෂ වශයෙන් හෝ සිත් නුපද වන්නේ ද, අනුබ්‍යඤ්ජන නම් වූ මතු මත්තෙහි කෙලෙස් ප්‍රකට බවට පමුණුවන අත් පා ආදිය ද, සිනහ ද, කථා කිරීම හා බැල්ම ද යනාදී ආකාර ශුභ වශයෙන් යහපත් වශයෙන් නොගෙන ඇති සැටියෙන් ම අශුභ වශයෙන් ම ගන්නේ වේද නොහොත් ඒ කෙසාදීහු රූපාදී වශයෙන් යථා සවභාවයෙන්, භූතයන් ගෙන් හටගත් බව, පිළිකුල් කටයුතු බව, චක්ෂුරාදීහු මහා භූතයන් නිසා පවත්නා බවය යනාදී වශයෙන් මෙනෙහි කරන්නේ ද යම් චක්ෂුරින්ද්‍රියක් සංවර කොට නොගෙන වාසය කරන පුද්ගලයා කරා රාග වෛෂාදී ලාමක අකුසල ධර්මයෝ ලුහුබැඳ එත් නම් ඒ චක්ෂුරින්ද්‍රිය සංවර කරගැනීම පිණිස පිළිපදනේ ය. එසේ පිළිපදනේම ඒ චක්ෂුරින්ද්‍රිය රැකගන්නේ ය. ඒ චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නේ ය. මෙසේ ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්ද අසා, ඝ්‍රාණ විඥානයෙන් ගන්ධාග්‍රහණය කොට, ජිව්හා විඥානයෙන් රස අනුභව කොට, කාය විඥානයෙන් ඵොට්ඨබ්බය ස්පර්ශය කොට මනො විඥානයෙන් ධම්මාරම්මණ දැන නිමිති වශයෙන් හෝ අනුබ්‍යඤ්ජන වශයෙන් හෝ නොගෙන, එය ඇති සැටියෙන් ම ගෙන, ඒ ඒ ඉන්ද්‍රියයන් සංවර කර ගැනීම පිණිස පිළිපදනේ ය, ඒ ඒ ඉන්ද්‍රියයන් රැක ගන්නේ ය, ඒ ඒ ඉන්ද්‍රියයෙහි සංවරයට ද පැමිණෙන්නේ ය.

පෙර මිහින්තලේ සෑගිරියෙහි විසූ **මහාතිස්ස** නම් තෙරුන් වහන්සේ සෑගිරියෙහි සිට අනුරාධපුරයට පිඬු පිණිස වඩනා කල්හි අනුරාධපුරයෙහි විසූ එක් කුලඟනක් සිය සැමියා සමග කලහ කොට ඔහු අත්හැර ගොස් හුදකලාව ගෙයි විසුම යෙහෙකැයි සිතා සොඳින් හැඳ පැළඳ ගෙන උදෑසනම මිහින්තලේ දෙසට යනු පිණිස මගට බැස්සාය. මෙසේ යන්නාවූ ඒ ස්ත්‍රිය සත්හුන් ඉඳුරන් ඇතිව මග වඩනා තෙරුන් දැක සිත් ගන්නා අදහසින් ශබ්ද නගා සිනාසීය. මූලකම්මට්ඨානය මෙනෙහි කරමින් වඩින තෙරුන් වහන්සේ ඒ ශබ්දය කුමක් දැයි බලන සේක් ඇගේ දත් පෙළ දැක අට්ඨික සංඥව උපදවා යොනිසොමනසිකාරයෙන් කමටහන වඩා ප්‍රථම ධ්‍යානය උපදවා එය පාදක කොට ගෙන විදර්ශනා වඩා සෝවාන් ආදි මාර්ග පිළිවෙලින් අර්හත් බවට පැමිණි සේක. ඇ ලුහුබැඳ ආ සැමියා තෙරුන් වහන්සේ දැක "ස්වාමීනි, මෙහි ගැහැණියක් ගියා දුටු දැයි විචාළේය. තෙරුන් වහන්සේ ද "ගැහැණි ද පිරිමි දැයි නොදනිමි, මග යන ඇටසැකිල්ලක් නම් දුටිමි" යි කී සේක.

මේ අසංවරය හෝ සංවරය ඇතිවන්නේ ඒ චිත්ත වීථියෙහි උපදනා ජවන් සිත් වලය.

රූපාරම්මණයක් හමුවූ කල්හි භවාඞ්ග සිත, **භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේද** වශයෙන් දෙවරක් ඉපිද නිරුඬ වූ කල්හි ඒ රූපාරම්මණය අරමුණු කොට ගෙන **ක්‍රියා මනොධාතුව** නම් වූ **පඤ්චද්වාරාවජ්ජන සිත** ආවර්ජනා කෘත්‍යය සිඞ කරමින් උපදී. එයට අනතුරුව ඒ රූපා- රම්මණය ම අරමුණු කොට දර්ශන කෘත්‍ය සිඞ කරමින් **චක්ඛු විඤ්ඤාණ සිත** චක්ෂුර්ප්‍රසාදය වස්තු කොට ගෙන ඉපිද නිරුඬ වෙයි. අනතුරුව **විපාක මනොධාතුව** නම් වූ සම්පටිච්ඡන සිත චක්ඛු විඤ්ඤාණයෙන් ගත් රූපාරම්මණය ම ගෙන, සම්පටිච්ඡන කෘත්‍යය සිඞ කරමින් ඉපිද නිරුඬ වූ කල්හි **විපාක අහේතුක මනොවිඤ්ඤාණ**

**ධාතුව** නම් වූ සන්තීරණ සිතද එම අරමුණම ගෙණ සන්තීරණ කෘත්‍ය සිද්ධකරමින් උපදී. එයට අනතුරුව **කිරිය අහේතුක මනොවිඤ්ඤාණ ධාතුව** නම් වූ මනො-ද්වාරාවජ්ජන සිත එම අරමුණම ගෙන වොට්ඨපන කෘත්‍ය සිඩ කරමින් ඉපිද නිරුඩවෙයි. එය නිරුඩ වූ කල්හි **ජවන් සිත් සතක්** පිළිවෙළින් උපදනේ ය. මේ සිත් අතුරෙන් භවාඞ්ග, පඤ්චද්වාරාවජ්ජන, චක්ඛු විඤ්ඤාන, සම්පටිච්ඡන, සන්තීරණ, වොට්ඨපන යන සිත්හි සංවරය හෝ අසංවරය හෝ නොවෙයි. ජවන් සිත් උපදනා කල්හි අමනසිකාරයෙන් ලොභ, ද්වේෂ, මොහාදී පාප වූ අකුසල චෛතසිකයෝ ඒ ජවනයන් හා එක්ව යෙදීම නිසා දුශ්ශීල බවෙක් හෝ සිහිමුළා බවෙක් හෝ නො දැන්මෙක් හෝ උපදී ද එය **අසංවරය** නම් වන්නේ ය. ජවනක්ෂණයෙහි යෝනිසෝමනසිකාරයෙන් යෙදී සංවරය නො කෙළේ නම් චක්ෂුරාදී ද්වාරයෝ ද, භවාඞ්ගයෝ ද, ආවර්ජනාදී වීථි චිත්තයෝ ද නොරක්නා ලද්දේම වේ. නුවරෙක සතර වාසල් දොර නොවැසුනේ නම්, ඇතුළු නුවර ගේදොර ආදිය කොතෙක් වසා තිබුනත් සියල්ලම ආරක්ෂා නොවන්නේය. එමෙන්ම කුසල පක්ෂයෙහි වූ සති, ප්‍රඥා ආදි ධර්මයෝ ඉපදුනාහු නම්, භවාඞ්ග ආවර්ජනාදිය ද රක්නා ලද්දේම වේ. නුවර වාසල් දොර වැසුවාක් මෙනි. මේ ජවනයන්ට අනතුරුව සිත තදාරම්මණ ඉපිද හෝ නොඉපිද හෝ භවාඞ්ගයට බසී.

මේ චිත්තවීථියට ඉක්බිතිව නැවතත් එම අරමුණම ගෙන මනොද්වාරික චිත්තවීථියක් උපදී.

එයට අනතුරුව ද, නැවතත් එම අරමුණම ගෙන තුන් වන වරට මනොද්වාරික චිත්ත වීථියක් උපදී. මේ තුන් වන මනොද්වාරික චිත්ත වීථියේ උපදනා ජවනයෝ ම, මෑ ස්ත්‍රිය, මේ පුරුෂයා ය යනාදී වශයෙන් තත්ත්වාකාරයෙන් හැඳිනීම හෝ ඒ අරමුණ සුභ වශයෙන් ගෙන පැහැදීම හෝ ඇලීම හෝ අශුභ වශයෙන් ගෙන දූෂ්‍යවීම හෝ කරන්නාහු වෙති. මේ සංවරය හෝ අසංවරය හෝ තුන් වන චිත්ත වීථියේ ජවන් සිත් නිසාම වන බව දත යුතු.

ශබ්දාරම්මණයක් හෝ ගන්ධාරම්මණයක් හෝ රසාරම්මණයක් හෝ ඵොට්ඨබ්බාරම්මණයක් හෝ ධම්මාරම්මණයක් හෝ හමුවීමේ දී මේ ක්‍රමයෙන්ම සංවර භාවය හෝ අසංවර භාවය තුන්වන චිත්ත වීථියේ ජවනක්ෂණයෙහිම වන බව සැලකිය යුතු.

මෙසේ ෂඩින්ද්‍රියයන් සංවර කරගැනීම **ඉන්ද්‍රිය සංවර සීලය** නම් වේ.

## ආජීවපාරිශුද්ධි ශීලය

ආජීවය කරණකොට ගෙන පනවා වදාළ **ශික්ෂාපද සදෙනාගේ** ඉක්මවීම් වශයෙන් ද **කුහනා, ලපනා, නෛමිත්තිකතා, නිෂ්පෙෂිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතාදී** පාපධර්මයන්ගේ වශයෙන් පවත්නාවූ **මිථ්‍යාජීවයෙන්** වැළකීම **ආජීවපාරිශුද්ධි සීල** නම්.

**සවැදෑරුම් ශික්ෂාපදයෝ** නම්:-

**1. පාරාජිකා නම් ආපත්තිය**- යම් භික්ෂුවක් සිව්පසයෙන් කලාන්ත නොවී ජීවත්විය හැකි වෙමියි සිතා ජීවත්වීම හේතුකොටගෙන, තමා තුළ නැති ගුණ පහළ කරනු කැමැතිව, තෘෂ්ණායෙන් මඩනා ලදුව, තමා සතන්හි නැත්තාවූ, නූපන්නාවූ ධ්‍යානයක් හෝ මාර්ග ඵලයක් හෝ ලද්දෙමි යි කියාද, ඒ භික්ෂුව හට එකෙණෙහිම දෙලොව පරදනා හෙයින් **පාරාජිකා** නම් වූ ආපත්තියක් වන්නේ ය.

**2. සංඝාදිසෙස ආපත්තිය**- ජීවිකාව හේතුකොට ගෙන ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකුන් පිළිබඳ එකෙණෙහි වන සංගමය පිණිස හෝ ආවාහ විවාහ වනු කැමැති ස්ත්‍රී පුරුෂයන්ගේ කැමැත්ත හෝ ඔබ මොබ ගෙන ගොස් කියා ද, ඒ භික්ෂුහට ආදි-අන්තයෙහි සංඝයා විසින් කටයුතු විනය කර්මයෙන් පිරිසුදු විය යුතු හෙයින් ද **සංඝාදිසෙස** නම් වූ ආපත්තිය සිදුවන්නේ ය.

3. **ථුල්ලච්චය ආපත්තිය**- යම් භික්ෂුවක් ජීවිකාව හේතුකොට ගෙන, වචනයාගේ අර්ථය දන්නා කෙනෙකුහට "තොපගේ විහාරයෙහි යම් භික්ෂු කෙනෙක් වෙසේද් ද, හෙතෙම රහත් කෙනෙකැ" යි තමා උදෙසා අනියමයෙන් කියාද ඒ භික්ෂුවහට **ථුල්ලච්චය** නම් ඇවත සිදුවන්නේ ය.

4. **පාචිත්තිය ආපත්තිය** - යම් භික්ෂුවක් ජීවිකාව හේතුකොට ගෙන, නොගිලන්වූයේ ම කිරි, ගිතෙල්, මාංසාදී භොජනය තමා උදෙසා කයින් හෝ වචනයෙන් හෝ ඉල්වාගෙන වළඳා නම් ඒ භික්ෂුවහට **පාචිත්තිය** නම් ඇවත සිදුවන්නේ ය

5. **පාටිදෙසනීය ආපත්තිය**- යම් භික්ෂුණී කෙනෙක් එසේම නොගිලන්ව, ජීවිකාව හේතුකොට ගෙන තමා උදෙසා ප්‍රණීත වූ භොජන ඉල්වා වළඳා නම් ඒ භික්ෂුණීහට **පාටිදෙසනීය** නම් ඇවත සිදු වන්නේ ය.

6. **දුක්කටාපත්තිය**- යම් භික්ෂුවක් ජීවිකාව හේතු කොට ගෙන, නොගිලන්වූයේම සූපයක් හෝ බතක් හෝ තමා උදෙසා ඉල්වා වළඳා නම් ඒ භික්ෂුවහට **දුක්කට** නම් ඇවත සිදු වන්නේ ය.

මේ ෂඩ්විධ **ශික්ෂාපද** ඉක්මවන භික්ෂුවගේ ආජීවය අපිරිසුදු වේ.

**කුහනා** - චීවරාදී සිව්පස සඞ්ඛ්‍යාත ලාභය ද, සත්කාර සඞ්ඛ්‍යාත වූ ගෞරවයෙන් දෙනු ලබන ප්‍රත්‍යය ද, පතළාවූ කීර්ති ඝොෂාවය ද, යන මොවුන්ගේ වශයෙන් ලාභ, සත්කාර, කීර්ති නිශ්‍රිත වූ ද තමා කෙරෙහි නැති ශ්‍රද්ධා ශීලාදී ගුණ ප්‍රකාශ කරනු කැමති වූ ලාමක අදහස් ඇත්තා වූ ද, ලාමක තෘෂ්ණාව නිසා යහපත් වූ ජීවිකාව කෙරෙන් පහ කරන ලද්දා වූ නොහොත් තෘෂ්ණායෙන් මඩනා ලද්දා වූ ශ්‍රමණයෙකුගේ **පච්චය පටිසෙදන** හෙවත් ප්‍රත්‍යය නො ඉවසා වැළකීම් සඞ්ඛ්‍යාත කුහක වස්තුවෙන් හෝ, **සාමන්තජප්පන** හෙවත් ප්‍රත්‍යය දායකයාගේ කණට

කෙඳිරීම නම් වූ කුහක වස්තුවෙන් හෝ **ඉරියාපථනිස්සිත** කුහක වස්තුවෙන් හෝ **අටඨපනා** නම් වූ පලඹූ කොට තැබීම හෝ ආදරයෙන් තැබීමක් හෝ වේ ද, **ඨපනා** නම් වූ යම් තබනාකාරයක් වේ ද, **සණ්ඨපනා** නම් වූ පිළියෙල කිරීම හෝ ප්‍රසාද එළවන බව කිරීම හෝ වේ ද, **භාකුටිතා** නම් වූ මහණදම් පිරීමෙන් මිරිකුණු බව හැඟවීමෙන් මුහුණ හකුළුවන බවක් හෝ වේද, **කුහනා** නම් වූ මහජනයා විශ්මයපත් කරවීමක් හෝ වේද, **කුහායනා** නම් වූ විශ්මයපත් කරවන්නවුන්ගේ පැවැත්මක් හෝ වේද, **කුහිතතා** නම් වූ කුහිතයාගේ පැවැත්මක් හෝ වේද, මෙය **කුහන** යයි කියනු ලැබේ. එහෙයින් මේ **කුහන වස්තු** තුනෙකි. එනම්:—

1. **පච්චය පටිසෙධන** හෙවත් ප්‍රත්‍යය වැළැකීම ය,

2. **සාමන්තජප්පන** හෙවත් රහස් බිණීම ය,

3. **ඉරියාපථ** හෙවත් ඊර්‍ය්‍යාපථ නිශ්‍රිත බව ය.

**1. පච්චය පටිසෙධන කුහන වස්තුව** - මේ ශාසන යෙහි ගෘහපතියෝ භික්‍ෂුවකට චීවර, පිණ්ඩපාත, සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන සිව්පසයෙන් නිමන්ත්‍රණය කෙරෙති, ලාමක වූ අදහස් ඇති, ප්‍රත්‍යය කැමති සුළු වූ භික්‍ෂුව ඒ සිව්පසයෙන් ප්‍රයෝජන ඇත්තේවී නමුදු වැඩියක් ලබන අදහසින් එය ප්‍රතික්‍ෂෙප කරමින් මෙසේ කියයි, ශ්‍රමණයන්ට මහාර්‍ඝ වූ සිවුරු කුමට ද, ඔවුනට හොබනේ සොහොනින් හෝ කසලගොඩෙන් හෝ රෙදි කැබැලි අවුලා මසා ගෙන පොරවන්නට ය. මහණුන්ට ප්‍රණීත පිණ්ඩපාත කුමට ද, ඔවුනට හොබනේ සිඟා ගෙන වළඳන්නට ය. මහණුන්ට මාහැඟි සෙනසුන් කුමට ද, ඔවුනට හොබනේ රුක්ඛමූලික ව අබ්‍යාවකාශයෙහි හෝ වසන්නට ය. මහණුන්ට අනගි ගිලන්පස බෙහෙත් පිරිකර කුමට ද, ඔවුනට හොබනේ පූතිමූත්‍රයෙන් හෝ

අරළුයෙන් හෝ බෙහෙත් කරන්නට ය, මෙසේ කියමින් එයම පෙන්වනු කැමැතිව රූක්‍ෂ වූ චීවර පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරයි. එය දක්නා දායකයෝ "මූන්වහන්සේ ඉතා අල්පෙච්ඡය, සන්තුට්ඨ ය, පවිවිත්ත ය, අසංසට්ඨ ය, ආරබ්ධවිරිය ය, ධූතවාදී ය, යි වඩවඩා සතුටුව සිව්පසයෙන් පුදත්. එවිට ඒ භික්‍ෂුව "ශ්‍රද්ධා, දෙයධර්ම, ප්‍රතිග්‍රාහක යන තුන් වස්තූන් ගේ එක්වීමෙන් සැදූහැවත් කුලපුත්‍රයෝ පින් රැස්කර ගනිති. තොපට ශ්‍රද්ධාව හා දෙය ධර්ම ද ඇත්තේ ය. මම ප්‍රතිග්‍රාහකයෙක්මි. ඉදින් මම නො පිළිගත්තේ නම් තොපි පිනින් බැහැර වන්නාහු ය. මට මේ පසයෙන් ප්‍රයෝජන නැතත් තොපට අනුකම්පා පිණිස පිළිගනිමි"යි දහම් දෙසා බොහෝ වූ සිවුරු පිරිකර ආදිය පිළිගනියි. එතැන්පටන් ගැල්පුරා වුවත් සිව්පසය එළවීමට කාරණා වූ විස්මයපත් කරවීම ප්‍රත්‍යය වැළකීම යයි කියන ලද **පච්චය පටිසෙධන කුහන වස්තුව** නම් වේ.

**2. සාමන්තජප්පන කුහන වස්තුව** – මේ ශාසනයෙහි ලාමක අදහස් ඇති, ඉච්ඡායෙන් මඩනා ලද, බුහුමන් ලබනු කැමැති භික්‍ෂුව, මෙසේ කථා කළ කල්හි මට මහජනයා බුහුමන් කරති යි සිතා ආර්‍ය්‍ය ධර්ම සන්නිශ්‍රිත බස් කියයි. "යමෙක් මේ සිවුරු ධරා නම්, ඒ මහණ තෙම මහෙශාක්‍ය ය. මෙබඳු පාත්‍රා, ලොහොතලූ ධබරා පෙරහන්කඩ යතුරුමුදු, කාබහන්, වහන් ධරා නම් ඒ මහණ තෙම මහෙශාක්‍ය ය. යමෙකුට මෙබඳු වූ උපාධ්‍යා ය, ආචාර්‍ය්‍යය, සමානොපාධ්‍යා ය, සමානාචාර්‍ය්‍යවරයෝ ඇත්තාහු නම් යමෙකුට මෙබඳු සන්දෘෂ්ට සම්භක්ත මිත්‍රයෝ ඇත්නම්, ඒ මහණ තෙම මහෙශාක්‍ය ය, යමෙක් මෙබඳු විහාරයක, අඩ්ඩයෝග ප්‍රාසාද, හම්මිය, ගුහාලෙණ, කුටි, කූටාගාර, අට්ටමාල, උඩණ්ඩ, උපට්ඨාන ශාලා, මණ්ඩප, රුක්ඛ-මූලයෙක වෙසේ නම් ඒ මහණ මහෙශාක්‍යය"යි මේ ආදී වශයෙන් කියයි. තව ද, හැකිළ හැකිළ, මුහුණ හකුළ හකුළා කුහකව, ප්‍රලාප දෙඩ දෙඩා වචනයෙන් ද

උත්තරිමනුස්ස ධර්මාධිගමය හඟවමින්, මේ ධ්‍යානලාභියා ය, මේ මාර්ග - ඵලලාභියා ය යනාදී වශයෙන් ඒ ඒ ආකාරයෙන් යම් විස්මයපත් කිරීමක් ඇත්තේ වේද එය **සාමන්තජප්පන කුහන වස්තුව** නමි. මේ තැනැත්තේ සිව්පසය දුරීමෙන්, මේ මේ පිළිවෙලට ක්‍රියා කරන තැනැත්තේ උත්තරී මනුස්ස ධර්ම ඇති කෙනෙකැයි හඟවා ලාභ සත්කාර ලබා ගනිති.

**3. ඉරියාපථ සන්නිසිත කුහන වස්තුව** - මේ ශාසන-යෙහි ලාමක අදහස් ඇති, ඉච්ඡායෙන් මඩනා ලද, බුහුමන් ලබනු කැමැති භික්ෂුව "මෙසේ කල කල්හි මහාජනයා මට බුහුමන් කරත්"යි සිතා ගමන් කරයි, තමා රහත් කෙනෙකැයි හෝ ධ්‍යානලාභියෙක කියා හෝ මහජනයාට දැනෙනසේ, දුටුවන්ට වැටහෙනසේ යයි සිටියි, හිඳියි, හොවියි, පැනෙන තැන සමවතට සමවත්හුමෙන් හිඳියි. මෙසේ ඉරියව් පැවැත්වීම් වශයෙන් දක්වන කුහක බවෙක් වෙයි ද එය **ඉරියාපථ සඞ්ඛ්‍යාත කුහන** බව යයි කියනු ලැබේ.

## ලපනා

ලාභ සත්කාර කීර්ති ප්‍රාර්ථනා කරන්නා වූ, පාපිෂ්ට වූ, ලෝභයෙන් මඩනා ලද භික්ෂුවකගේ අනුන් පිළිබඳ වූ යම් **ආලපනාවක්, ලපනාවක්, සල්ලපනාවක්, උල්ලපනාවක්, සමුල්ලපනාවක්, උන්නහනාවක්, සමුන්නහනාවක්, උක්කාචනාවක්, සමුක්කාචනාවක්, අනුප්පියභාණිතාවක්, චාටුකම්‍යතාවක්, මුග්ගසූප්‍යතාවක්, පාරිභට්ටතාවක්,** වේද එය **ලපනා** යයි කියනු ලැබේ.

**ආලපනාව** නම් විහාරස්ථානයට පැමිණි මිනිසුන්ට "පින්වත කුමක් පිණිස අවුද" යනාදී වශයෙන් පළමු කොටම කථාවට පටන්ගැනීම නොහොත් "මාගැන අසුවල් රජවරු ආදීහු මෙසේ පැහැදී සිටිති" යනාදී වශයෙන් තමා උසස් තැන තබා කථා කිරීමයි. **ලපනාව** නම් යම් කෙනෙක් තමා ගැන ඇසුයේ නම් යටකී පිළිවෙලට කීම ය.

**සල්ලපනාව** නම් ප්‍රත්‍යය දායකයන්ගේ කලකිරීමක් වුවහොත් අලාභයකැයි සිතා ඔවුන්ට ද අවකාශ තබ තබා කථා කිරීම ය.

**උල්ලපනාව** නම් ප්‍රත්‍යය දායකයාහට මේ මහා-ධනවන්තයා ය, මහාදානපතියා ය යනාදී වශයෙන් ඉසුරු සම්පත් ආදියෙන් උසස් කොට ගරුනම්බු දී බිණීම

**සමුල්ලපනාව** – දායකයා පිළිබඳව සත්මුතු පරම්පරාව දක්වා උසස්ය යනාදී වශයෙන් හැම අතින්ම උසස් කොට කථා කිරීම.

**උන්නහනාව** – "උපාසකවරුනි, පෙර තෙපි මෙබඳු කාලයෙහි අග්‍රශස්‍යය, අග්‍ර ඵලාදී අළුත් අළුත් දානයන් දුන්නාහ. දැන් කුමක් හෙයින් එබඳු දානයක් නොවේදැ"යි කියයි. ඔව්හු "සවාමීනි, එබඳු දෑ දුනුදු දෙම්හ, අවකාශ නොලබම්හ"යි යනාදිය කියනතෙක් මතු මත්තෙහි බැඳීම හෙවත් වචනයෙන් වෙලීම **උන්නහනා** නමි.

**සමුන්නහනාව** – හාත්පසින් ම නැවත නැවතත් ප්‍රත්‍යය දායකයා අවුලේලා බැඳීම තෙක් කථා කිරීම **සමුන්නහනා** නමි.

**උක්කාචනාව** – මේ කුලය මා මෙසේ හඳුනයි. ඉදින් මේ ගෙයි යම් දිය යුතු දාන වස්තුවක් උපන්නේ වී නම් මටම දෙන්නේ යයි මෙසේ උසස්කොට හැඟවීම, උසස් කොට ප්‍රකාශ කිරීම **උක්කාචනා** නමි.

**සමුක්කාචනාව** – හාත්පසින් නැවත නැවතත් උසස් කොට ප්‍රකාශ කිරීම **සමුක්කාචනා** නමි.

**අනුප්පියභාණිතාව** – සත්‍යයට සුදුස්සක් හෝ අන්‍යවූ සුභාෂිත ධර්ම වචනයට සුදුස්සක් හෝ නොබලා නැවත නැවත ප්‍රිය තෙපුල් බිණීම **අනුප්පියභාණිතා** නමි.

**චාටුකම්‍යතාව** – තමා යටහත් පැවතුම් ඇති බව හෝ ප්‍රත්‍ය දායකයා උසස් කොට තමා යට යට කොට තබා පැවැත්ම **චාටුකම්‍යතා** නමි.

**මුග්ගසූප්‍යතාව** නම් මුංඇට සූපයක් වැනි බවයි. මුං සූපයෙහි ඇතැම් ඇට පැසී ඇතැම් ඇට නොපැසී තිබෙන්නාක්මෙන් මොහුගේ කිසි වචනයක් සැබෑවෙයි සෙස්ස බොරුවෙයි.

**පාරිභට්‍යතා** – දරුවන් වඩන්නහුගේ සවභාවයයි. කිරිදරුවන් වඩන්නාවූ කිරිමවක් මෙන් ඇකයෙන් හෝ කරින් හෝ ප්‍රත්‍ය දායකයන්ගේ දරුවන් වඩාගැනීම **පාරිභට්‍යතා** නමි.

## නෛමිත්තිකතා

ලාභ සත්කාර කීර්ති කැමැතිවන්නාවූ, ලාමකවූ, ලෝභයෙන් මඩනා ලද භික්‍ෂුවගේ අනුත් පිළිබඳවූ යම් **නිමිත්තයෙක්, නිමිත්ත කර්මයෙක්, ඔභාසයෙක්, ඔභාස කර්මයෙක්, සාමන්තජප්පාවෙක්, පරිකථාවෙක්** වෙයි ද එය **නෛමිත්තිකතා** යයි කියනු ලැබේ.

**නිමිත්ත** – ප්‍රත්‍යය දීමට සංඥ උපදවනු පිණිස අනුන්ට කයින් හෝ වචනයෙන් හෝ කරන යම්කිසි ක්‍රියාවෙක් වේ නම් එය **නිමිත්ත** නමි.

**නිමිත්තකම්ම** – කෑමක් ගෙන යන්නවුන් දැක "කුමක්ද කෑමක් ලැබුවහුද" යි යනාදී වශයෙන් නිමිති කිරීම **නිමිත්තකම්ම** නමි.

**ඔභාස** – අද භික්ෂූන්ට සිව්පසය දුර්ලභය යනාදීන් ප්‍රත්‍යය පිළිබඳ කථාවෙන් තමාගේ අදහස හැඟවීම **ඔභාස** නමි.

**ඔභාසකම්ම** – වස්සන් රක්නවුන් දැක කිමෙක් ද උපාසකවරුනි මේ වස්සෝ කිරිදෙනුන්ගේ වස්සෝ ද, මොහොර දෙනුන්ගේ වස්සෝදැයි යනාදී ක්‍රමයෙන් විචාරා,

වහන්ස කිරිදෙනුන්ගේ වස්සෝයයි කී කල්හි, කිරිදෙනුන්ගේ වස්සෝ නොවන්නාහුය. ඉදින් කිරිදෙනුන්ගේ වස්සෝ වූවාහු නම් භික්ෂූහුද කිරිලබන්නාහු නොවෙත්දැයි මේ ආදී වශයෙන් ඒ වස්සන් බලන දරුවන්ගේ මව්පියනට දන්වා කිරිදෙවීම කරවන කථා ආදිය **ඕභාස කම්ම** නම් වේ.

**සාමන්තජප්පං** නම් තමා කැමති වස්තුව ආසන්න කොට දෙසීමයි.

එක්තරා කුලූපග භික්ෂුවක් වළඳනු කැමැතිව ප්‍රත්‍ය දායිකාවගේ ගෙට වැද අසුනක වැඩහුන්නේ ය. දායිකාව නොදෙනු කැමැතිව සහල් නැතැයි කියා සහල් සොයන පිණිස යයි අඟවා අසල ගෙයකට ගියා ය. එවිට භික්ෂුව ගෙයතුලට වැද එහි දොරමුල්ලේ තුබූ උක්දඬු ද, භාජනයක තිබූ සකුරු කැට ද, පැසයෙහි ලුණුමස් කැදූල්ල ද, සැලියෙහි සහල් ද, කලයෙහි ගිතෙල් ද බලා ගෙනවිත් එහාම හුන් තැනම සිටියේ ය. දායිකාවද සහල් නොලදිමියි කියාගෙන ආවාය. මෙය ඇසූ මහණ තෙම කියන්නේ අද භික්ෂාව නොලබන බවට නිමිත්තක් දුටිමි. මම විහාරයෙන් පිටත්ව එද්දී දොරමුල්ලේ තිබූ උක්දඬු වැනි සර්පයකු දුටිමි. ඔහුට ගසනු පිණිස ගල්කැට බලන්නේ බඳුනෙහි තුබූ සකුරු කැට මෙන් ගල් කැට ගෙන ගැසීමි. එවිට ඒ සර්පයා අර පසෙහි තිබූ ලුණුමාළු පෙත්ත මෙන් පෙණය ඔසවා ගිල ගනු කැමැතිව කට අරිනුයේ සැලියෙහි තුබූ සහල් වැනි දත් දුටිමි. කිපුණා වූ ඒ සර්පයාගේ කටින් වැකුණු කෙල, බඳුනෙහි තිබූ ගිතෙල් මෙනැයි කීය. දායිකාව ද මේ මුඩු මහණ රවටන්නට බැරියයි සිතා බත් පිස මස් සමග පිළිගැන්වූවාය.

මෙසේ ආසන්න කොට කිණීම **සාමන්තජප්පං** නම් වේ.

**පරිකථා** – යම්සේ ඒ ලාභය ලැබේද ඒ ආකාරයෙන් පෙරළ පෙරළා කී තෙපුල්ම නැවත නැවත කීම ය.

**නිෂ්පේසිකතා** – ලාභසත්කාර කීර්ති කැමැතිවන්නාවූ ලාමක අදහස් ඇති ලෝභයෙන් මඩනා ලද භික්ෂුවගේ පරහට යම් **අක්කෝසනාවක්, වම්භනාවක්, ගරහණා-වෙක්, උක්ඛෙපණාවෙක්, සමුක්ඛෙපනාවෙක්, ඛිපනාවක් සංඛිපනාවක්, පාපනාවෙක්, සම්පාපනාවෙක්, අවණ්ණ-හාරිකාවෙක්, පරපිට්ඨිමංසිකාවෙක්** වන්නේ ද එය **නිෂ්පේසිකතා**යයි කියනු ලැබේ.

**අක්කෝසනා** – ආක්‍රොසයට භයින් සිව්පසය දේයයි සිතා දශවිධ ආක්‍රොශ වස්තුවෙන් බිණීම **අක්කෝසනා** නම්.

**වම්භනා** – ලාමක කොට බිණීම **වම්භනා** නම්.

**ගරහනා** – තෝ අශ්‍රද්ධායෙහිය, නොපහන් තැනැත්-තෙහිය, යනාදීන් දෙස් පවරා බිණීම ය.

**උක්ඛෙපනා** – මොහු කෙරෙහි කිසිවක් නොකියවයි කියා උපාසකයන් දායකාදිභාවයෙන් පිටත දැමීම.

**සමුක්ඛෙපනා** – දායකයා දෙවන කම්යක් කෙළේය. මොහුට අතිකක් නොකිය යුත්තේයයි වස්තුව සහිත කොට හෝ මේ මේ කාරණයෙනුදු මොහුට අතිකක් නොකිය යුත්තේ යයි කාරණ සහිත කොට හෝ හාත්පසින් දායක භාවයෙන් දුරු කිරීමයි. දන් නොදෙන්නක්හට මොහු ඉතා දානපතියෙක යනාදී වශයෙන් මනාකොට දුරු කිරීමයි.

**ඛිපනා** – මොහුගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජන ද, මෙතෙම බිජුවට කන්නේයයි යනාදීන් අපහාස කිරීම.

**සංඛිපනා** – කුමක් හෙයින් මොහු නොදෙන සුල්ලහයි කියව් ද, මෙතෙමේ හැමකල්හිම සියලු දෙනාටම නැතැයි කියන වචනය දෙන්නේ ය. මෙසේ මනාකොට අපහාස කිරීම.

**පාපනා** – ප්‍රත්‍යය දායකයා දන් නොදෙන්නෙක් බවට හෝ නුගුණයට හෝ පැමිණවීමයි.

**සම්පාපනා** – හාත්පසින්ම අදායක බවට හෝ නුගුණයට හෝ පැමිණවීමය.

**අවණ්ණභාසිතා** – මොහුගේ නුගුණ කීකල ඊට හයින්වත් මොහු ප්‍රත්‍යය දේයයි සිතා ගෙයින් ගෙට, ගමින් ගමට, ජනපදයෙන් ජනපදයට නුගුණ ගෙන ගොස් කීම ය.

**පරපිට්ඨිමංසිකතා** – අභිමුඛයෙහි මිහිරිකථා කියා, අනභිමුඛයෙහි නුගුණ කීමය. අභිමුඛය නොබැලිය හැක්කහුගේ පිටමස් කෑමක් වැනි හෙයිනි.

ශරීරයේ ගැල්වූ දෙයක් පිස්නා හුණුදඬු පොත්තක් මෙන් අනුන්ගේ ගුණ පිස්තේ වේද, සුවඳ ද්‍රව්‍යයක් අඹරා සුවඳ සොයා ගන්නාක් මෙන් අනුන්ගේ ගුණ සුණු කොට මේ ලාභය සොයන්නේ වේද, මේද එබඳු වූ හෙයින් **නිප්පෙසිකතා** යයි කියනු ලැබේ.

**ලාභෙන ලාභං නිජිගිංසනතා** ලාභයෙන් ලාභය සෙවීම නම් ලාභසත්කාර කීර්තිකාමී ලාමක වූ අදහස් ඇති ලොභයෙන් මඩනා ලද භික්ෂු තෙම මේ ගෙයින් ලද ආමිෂය අනෙක් ගෙයකට ගෙන යයි. ඒ ගෙයින් ලත් ආමිෂය මේ ගෙට ගෙන එයි. මෙබඳු වූ ආමිෂය පිළිබඳ යම් කැමැත්තක්, සෙවීමක්, නැවත නැවත සෙවීමක් වේද එය **ලාභයෙන් ලාභය සෙවීම** නම් වේ යයි කියනු ලැබේ.

සවල්ප ලාභයකින් වංචාකොට බොහෝ වූ ලාභයක් ලබන්නට සෙවීම **නිජිගිංසනතා** නම්. මේ ගෙයින් ලද සිව්පස ලාභය අනෙක් ගෙට ගෙන ගොස් දී වැඩි ලාභයක් ලබා ගැනීමයි. මද ලාභයකින් මහත් ලාභයක් ලබා ගැනීමට **එට්ඨි** යයි කියනු ලැබේ. සවල්ප ලාභයකින් මහත් ලාභයක් සෙවීම **පරියෙට්ඨි** නමි.

තවද, **"පාපධර්මයන්ගේ වශයෙන් පවත්නා** වූ **මිථ්‍යාජීවයෙන් වැළකීම"** යයි කී තන්හි පාපධර්මයන්ගේ

යනු - දායකයන් විසින් කම්පල අදහා දෙන ලද සිව්පසය පරිභොග කොට ඒ මහණ බමුණෝ තිරශ්චීන විද්‍යා සඞ්ඛ්‍යාත වූ මිථ්‍යාජීවයෙන් දිවිපවත්නාහු වෙත් ද එය වේ.

**මිථ්‍යාජීවයෝ** නම්:-

1. **අඞ්ග විද්‍යාව** - අත්පා ආදි අවයවයන්ගේ ලක්ෂණ බලා ගුණාගුණ කීම.

2. **නිමිති ශාස්ත්‍ර** - පක්ෂි හඬ ආදිය අසා ගුණාගුණ කීම.

3. **උත්පාත ශාස්ත්‍රය** - උල්කාපාත, භූමිකම්පා ආදිය බලා මෙබඳු ඵලාපල වේයයි කීම.

4. **ස්වප්න ශාස්ත්‍ර** - මෙබඳු සවප්නයක් දුටුයේ නම් මෙබඳු විපාකයෙක් වේ යයි කීම.

5. **ලක්ෂණ ශාස්ත්‍ර** - මෙබඳු ලක්ෂණයෙන් යුත් ස්ත්‍රී හෝ පුරුෂයා හෝ මෙබඳු වේ යයි කීම.

6. **මූෂිකච්ඡින්නක ශාස්ත්‍රය** - වස්ත්‍රාදියෙහි අසුවල් භාගයෙහි මීයන් කෑකල මෙබඳු විපාක වේයයි කීම.

7. **අග්නිහෝම ශාස්ත්‍රය** - මෙනම් ගින්නෙන් හෝම පූජා කිරීමෙන් මෙබඳු විපාක වේයයි කීම.

8. **දබ්බිහෝම ශාස්ත්‍රය** - මෙනම් සැන්දකින් හෝම පූජා කිරීමෙන් මෙබඳු විපාක වේයයි කීම. යනාදී වශයෙන් ලාමක අකුසල කර්ම දත යුතු

මෙසේ අනෙක ප්‍රකාර මිථ්‍යාජීවයෙන් වෙන්ව විසීම **ආජීව පාරිශුද්ධි ශීලය** නම් වේ. එනම්, එසේ වෙන් වීමේදී පහළ වන කාමාවචර කුසල චිත්ත වීථින්ගේ ජවන් සිත් හා සමග යෙදුණු ත්‍රිවිධ විරති චෛතසික ධර්මයෝ ය.

**ආජීව** නම් මීට පැමිණ දිවිපැවැත්වීම යන අර්ථයයි.

දැහැමින් සෙමෙන් ප්‍රත්‍යය සොයන උත්සාහය වීර්‍ය්‍ය-යෙන් ම සිඛ කටයුතු බැවින් එයට **ප්‍රත්‍යය පයෝඊෂණ ව්‍යායාමය** යයි කියනු ලැබේ.

ඒ ආජීවයාගේ පිරිසුදුතාවය, නිරවද්‍ය බව, පිඹුසිඟිම් ආදියෙහි කම්මැලි නොවන බව උත්සාහයෙන් ම සිඛ කටයුතු.

**පාරිශුඛි** නම් ආජීවයාගේ පිරිසුදු බව, නිරවද්‍ය බවයි

## ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය

**චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර** යන සිව්පසය උපායයෙන්, නුවණින් දැන ප්‍රත්‍යවෙක්ෂා කොට පරිභොග කිරීම **පච්චය සන්නිස්සිත සීලය** නම් වේ.

**1. චීවර පරිභොගය:-**

**පටිසංඛායොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපින පටිච්ඡාදනත්ථං** යනාදී වශයෙන් මහණ තෙම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට චීවර පරිභොගය කටයුතු. එහි අර්ථය නම්:- "මම නුවණින්, උපායයෙන් මාර්ගයෙන් දැන පරීක්ෂා කොට තුන් සිවුරු අතුරෙන් යම් සිවුරක් වැළඳ ගනිමි, හඳිමි, පෙරවමි. එය මතු දක්වන ප්‍රයෝජනය පිණිසම ය. ඉන් වැඩියක් පිණිස නොවෙයි. ඒ ප්‍රයෝජන නම් - ශීතයාගේ ද, ශීතජ්වරාදිය ඉපදීමට කාරණාවූ ඇතුළත ධාතු කැළඹීම්, පිටත්හි ධාතු පෙරළීම් වශයෙන් උපන් යම් කිසි ශීතයක්හුගේ ද නසනු පිණිස ය, ශීත පීඩා නූපදනු පිණිස ය. ලැව්ගිනි ආදියෙන් හටගත් ගිනි, උෂ්ණය නසනු පිණිසය, වැළකීම පිණිසය. ඩැහැ ලේ බොන මැස්සෝය, මදුරුවෝය, දූලි ඇති, දූලි නැති

වාතයෝ ය, සූර්‍ය්‍ය තාපය නොහොත් සූර්‍ය්‍ය රශ්මිය ය, සර්පාදී දීර්ඝජාතිහුගේ දෂ්ට කිරීම්, ඇඟවැදගැනීම් යනාදි ස්පර්ශ වළක්වනු පිණිසය. තවද අඞ්ගජාතාදී සම්බාධස්ථාන විවෘත කළ කල්හි ලජ්ජාව නැතිවේ ද, කිපේ ද, විනාශවේ ද, ඒ ස්ථාන මුවහ කිරීම පිණිස මේ සිවුරු දරමි.” යනුයි.

## 2. පිණ්ඩපාත පරිභෝගය

**පටිසංඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි නෙවදවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසණාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිං-සූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි. නවං ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරොචාති.** යනාදි වශයෙන් මහණ තෙම නුවණින් ප්‍රත්‍යවෙක්‍ෂා කොට පිණ්ඩපාත පරිභොගය කටයුතු. එහි අර්ථය නම්:-

“මම නුවණින්, උපායෙන්, මාර්ගයෙන් දැන පරීක්‍ෂා කොට කන බොන දෑ ආදී වශයෙන් වැළඳිය යුතු යම්කිසි ආහාරයක් පිඬුසිඟීමෙන්, පාත්‍රයෙහි පිඬු වශයෙන් පතිත කරණ ලද හෙවත් බහාලන ලද හෙයින් පිණ්ඩපාත නම් වූ ඒ ආහාරය හෙවත් පිඬු සමූහය වළඳමි. ඒ අහර වැළඳීම හෙවත් ඒ පිණ්ඩපාතය ගම්දරු ආදීන් මෙන් කෙළිසෙල්ලම් පිණිස නොවේ ය. බලමද, පුරුෂමද කාරණා කොට ගෙන ද නොවලඳමි. සැරසීම පිණිස හෝ අඞ්ග ප්‍රත්‍යයන්-ගයන්ගේ ස්ථූලභාවය පිණිස ද නොවෙයි. නෘත්‍යකාරාදීන් මෙන් ප්‍රසන්න වූ ඡවි වර්ණය පිණිස, අලඞ්කාරය පිණිස ද නොවළඳමි. යම්තාක් පඨවි, ආපො, තෙජො, වායෝ යන සතර මහා භූතයන් නිසා පවත්නා වූ මේ රූපසමූහය නම් වූ කායයාගේ නොහොත් රූපස්කන්ධ පරම්පරාවගේ සිටීම පිණිස ද, යැපීම පිණිස ද, නොහොත් ජීවිතින්ද්‍රියයාගේ පැවැත්ම, නොසිඳීම බොහෝ කල් සිටීම පිණිස ද, බඩගිනි ආදියෙන් වන වෙහෙස සංසිඳුවන පිණිස ද, බඹසරවසට අනුග්‍රහ පිණිස නොහොත් සියලු ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවට ද

මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාසඞ්ඛ්‍යාත මාර්ග ඵලයන්ට අනුග්‍රහ පිණිස නොහොත් බ්‍රහ්මචර්‍ය්‍යාව සම්පාදනය කරණු පිණිස ද තෘෂ්ණාවෙන් ආහාරයෙහි ගිජු නො ව, මූළා නො ව පිණ්ඩපාතය වළඳමි. මෙසේ ආහාර ගැනීමට පෙර පැවැති යම් ක්ෂුධා වේදනාවක් වේද ඒ පුරාණ වේදනාවන් ද නසමි. පමණ නොදන්නා බොහෝ කොට වැළඳීමෙන් ඇතිවන නොයෙක් අළුත් දුකඛ වේදනාවන් ද නො උපදවමි. බෙහෙතක් වළඳනා ගිලනකුමෙන් පිණ්ඩපාතය වළඳමි. මාගේ මේ පිණ්ඩපාත අනුභවය කරණකොටගෙන ජීවිතින්ද්‍රියය සිඳලන්නා වූ ද, ඉරියව් බිඳලන්නා වූ ද උවදුරු දුරුවන හෙයින් මේ කායයාගේ බොහෝ කල් පැවතීම් සඞ්ඛ්‍යාත යාත්‍රාව ද වන්නේ ය. මිථ්‍යාආජීවයෙන් ප්‍රත්‍යය සෙවීම ය පමණ නොදන්නා බොහෝ කොට පිළිගැනීම ය, ප්‍රත්‍යවෙක්ෂා නොකොට ප්‍රත්‍යය පරිභොග කිරීමය යන මෙයින් වැළකී දැහැමින් ලබාගත් පිණ්ඩපාතය පමණ දැන පිළිගෙන, ප්‍රත්‍යවෙක්ෂා කොට වැළඳීම නම් වූ නිරවද්‍ය භාවය හා පමණ දැන වැළඳීමෙන් වන්නාවූ සැප විහරණය ද වන්නේ ය'' යනුයි.

නොසැපවූ ආහාර පමණ නොදන්නා වැළඳීම හේතුකොට ගෙන **අරති** නම් වූ අරණ්‍ය සේනාසනයෙහි හා, ධ්‍යාන භාවනායෙහි ද නො ඇලීම ය. **තන්දි** නම් වූ නිදිමත බව ය, **විජම්භිකා** නම් වූ ඇඟමැලි හැරීම ය, **විඤ්ඤූ ගරහ** නම් වූ නුවණැත්තන් විසින් ගර්හා කටයුතු බවට පැමිණීම ය යන මේ දෝෂ නැති කල්හි නිවරද බව වෙයි.

තවද සතර පස් පිඩක් නොවළඳා ජලය පානය කිරීම යෝගාවචර භික්ෂුවගේ සැපවිහරණයට ප්‍රමාණ වේ.

මෙසේ නිවැරැදි බවෙහි පිහිටීම ද වන්නේ ය යි සිතා සිව්පසය අනුභව කළ යුතු.

තවද මෙහි **නෙවදවාය** කී තන්හි මෝහයට උපනිශ්‍රය කාරණා වළක්වනු, නසනු පිණිස ද, **නමදය** යන්නෙන්

ද්වෙෂයට උපනිශ්‍රය කාරණා වළක්වනු පිණිස ද, **කාමච්ඡන්දය, කාමරාගය** යත්නෙන් රාගයට උපනිශ්‍රය කාරණා වළක්වනු පිණිස ද, **නදවාය නමදය** යන දෙකින් තම සතන්හි උපදනා කෙලෙස් සංයෝජනයන්ගේ ඉපදීම වැළැක්වීම පිණිස ද, **නමණ්ඩණාය, නවිභූසණාය** යන දෙකින් අන් සතන්හි උපදනා කෙලෙස් සංයෝජනයන්ගේ ඉපදීම වැළැක්වීම පිණිස ද, මේ සතරම නුවණින් පූරණ ප්‍රතිපත්තීන්ගේ ද, කම් සැපෙහි ඇලීමෙහි ද ප්‍රහාණය පිණිස ද වදාරණ ලද බව දත යුතු.

### 3. සෙනාසන පරිභොගය

**පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං** යනාදි වශයෙන් මහණ තෙම නුවණින් පරීක්‍ෂා කොට සේනාසන පරිභොග කටයුතු. එහි අර්ථය නම්:-

“මම නුවණින්, උපායෙන්, මාර්ගයෙන් දැන පරීක්‍ෂා කොට **යහන්** හෙවත් විහාරයෙක හෝ ප්‍රාසාදයෙක හෝ මැසි ආදියෙක හෝ හෝනා තැන් ද, **අසුන්** හෙවත් පුටු ආදි හිඳින තැන් ද පරිභොග කරමි. මේ සේනාසන පරිභොගය හුදෙක් සීතයාගේ වැළකීම පිණිස ද උෂ්ණයාගේ වැළකීම පිණිස ද, ඩැහැ ලේබොන මැසිය, මදුරුවෝ ය, වාතයෝ ය, සූර්‍ය්‍ය සන්තාපය ය, දීර්ඝජාතීන්ගේ ස්පර්ශය යන මේ ආදීන්ගේ වැළකීම පිණිස ය. එසේම හුණු බව සිහිල් බව යනාදී විඩාවෝ සෙනසුන්වලින් වැළකෙන හෙයින් ද, උපන් පීඩා සංසිඳවීමත් නූපන් පීඩා නූපදවීමත් සිදුවන හෙයින් ද ඍතු පීඩා නසනු පිණිසය කම්සථානා-රම්මණයෙහි සිත ඇලීම පිණිසය” යනුයි.

ශීතෝෂ්ණාදි ඍතු පීඩාවත්, සිංහ ව්‍යාඝ්‍රාදීන්ගෙන් වන උපද්‍රවත්, රාගද්වේෂාදි අප්‍රකට උපද්‍රවත්, නොසැප වූ

රූප දැකීම් ආදියත් වළක්වනු පිණිස සෙනසුන් සේවනය කරන්නෙමියි ප්‍රත්‍යවෙක්ෂා කොට සෙනසුන් සෙවීම උතුම්.

## 4. ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝගය

**පටිසඞ්ඛායොනිසො ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ජ පරමතාය** යනාදී වශයෙන් මහණ තෙම නුවණින් පරීක්ෂා කොට ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳිය යුතු. එහි අර්ථය නම්:-

"මම නුවණින් උපායයෙන්, මාර්ගයෙන් දැන පරීක්ෂා කොට ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමි. මේ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝගය හුදෙක් හටගත්තාවූ ද, පහළ වූවාවූ ද, රෝගයන්ගේ ද, ව්‍යාබාධයන්ගේ ද, ධාතූන්ගේ කැළඹීම් හා එයින් හටගත්තාවූ කුෂ්ට, ගණ්ඩ, පිළිකා-දීන්ගේ ද හේතුවෙන් වන අකුසල විපාක දුක්ඛ වේදනාව නසනු පිණිස ය. නිදුක පරම බව පිණිස ය. රෝගය සංසිඳවන තෙක් පමණ ය" යනුයි.

මෙහි **ගිලන්පස** යනු **ධාතු** කැළඹීම් **ලක්ෂණ** කොට ඇති, එම හේතුවෙන් උපදනා දුක් වේදනා ලක්ෂණ කොට ඇති, රෝගයට විපක්ෂ වූ, රෝගය සංසිඳ වන ගිතෙල් ආදී වූ යම්කිසි පථ්‍යයකි.

**භෙසජ්ජ** නම් භිෂජ් සඞ්ඛ්‍යාත වෙදහු විසින් අනුදන්නා ලද බැවින් වෙදෙකුගේ කර්මය භෙසජ්ජ හෙවත් බෙහෙද නම්. ගිලනුන්ගේ පසට බෙහෙත් වූ හෙයින් ගිලානපච්චය භෙසජ්ජ යයි කියනු ලැබේ.

**පරික්ඛාර** නම් පිරිවර යි. දිවිනසන්නා වූ රෝගා-බාධයන්ගේ ඉපදීමට අවකාශ නොදී රක්ෂා කරණ හෙයින් දිවිපැවැත්මට පිරිවරද වේ. ජීවිතය බොහෝකල් පැවැත්මට කාරණා ද ප්‍රත්‍යය ද වෙයි. මේ ජීවිත සම්භාරයෝ නම් ගිලන් බව දුරු කිරීමට සප්පාය වන, වෙදුන් විසින් නියම කළ තෙල්, මීපැණි ආදි ජීවිත පරිවාරයෝ ය.

මෙසේ නුවණින් සළකා චීවරාදි සිව්පස පරිභොගය ඇසුරු කල සීලය **පච්චයසන්නිසිත සීල** නම්.

**මේ සතර සංවර සීලය අතුරෙන්-**

**ප්‍රාතිමොක්‍ෂ සංවර සීලය, ශ්‍රද්ධාවෙන් ද,**

**ඉන්ද්‍රිය සංවර සීලය, සමාධියෙන් ද,**

**ආජීවපාරිසුද්ධි සීලය, වීර්‍ය්‍යයෙන් ද,**

**පච්චයසන්නිසිත සීලය, ප්‍රඥාවෙන් ද** සැපයිය යුතු වේ.

**1. ප්‍රාතිමොක්‍ෂ සංවර සීලය.**

ශික්‍ෂාපද පැණවීම ශ්‍රාවක විෂය ඉක්මවා සිටි බැවින් ප්‍රාතිමොක්‍ෂසංවර සීලය බුදුරජාණන් වහන්සේ කෙරෙහි ද, ධර්මය කෙරෙහි ද, ශ්‍රද්ධාව කරණ කොට ගෙන ම සැපයිය යුතු.

එසේම ජීවිතයත්, එයට උපකරණත් ගැන ආශාව අත්හැර ප්‍රාතිමොක්‍ෂසංවර සීලය සැදැහැයෙන් ම රැකිය යුතු, එහෙයින් කියන ලදී. "කිරළ බිජුවට රකින මෙන් ද, සෙමර වාලධිය රකින්නාක් මෙන් ද, මව්පියෝ එකම ප්‍රිය පුතකු රකින්නාක් මෙන් ද, එක් ඇස් ඇතියෙක් ඒ ඇස රකින්නාක් මෙන් ද ශීලය රක්නාහු හැම කල්හිම බුද්ධාදීන් කෙරෙහි ගෞරව ඇතිව මනාව ප්‍රියශීලී වව්."

තවද මහමුහුද කිසිසේත් වෙරළ නොඉක්මවා ද, එසේම බුද්ධ ශ්‍රාවකයෝ ද, ජීවිත විනාශ වුව ද, එය නොසලකා, ශික්‍ෂාපද සවල්පයකුදු නොඉක්ම වන්නාහු ය.

පෙර දඹදිව වින්ධ්‍යා මහා අරණ්‍යයේදී එක්තරා ශ්‍රමණ කෙනෙක් සොරුන් විසින් තලා අමුවැලින් බැඳ තබා පියන ලදී. ඒ මහණතෙම ඇවතට පැමිණේ යයි බියෙන්, ප්‍රාණවත් වූ ඒ වැල නොකඩාම වැදහොත් සැටියෙන් ම හිඳ සත් දවසක් මුළුල්ලෙහි ම විදර්‍ශනා වඩා අනාගාමී ව, එයින් සැව බඹලොව උපන.

තවද, ලක්දිව එක් තෙරනමක් සොරුන් විසින් අමු රසකිඳ වැලින් බඳින ලදුව සිටි කල්හි ඇති වූ ලැව් ගින්නක් නැගී එන කල ද, ප්‍රාණවත් වූ ඒ රසකිඳ වැල සිඳ දැමී නම් භූතගාම පාතව්‍යතාපත්තියට පැමිණෙති යි බියෙන් වැල නොසිඳම භාවනා කොට, විදසුන් වඩා, ජීවිත සමසිසීව කෙලෙසුන්ට හිසක් වැනිවූ අවිද්‍යාව, මාර්ග පටිපාටියෙන් ගොස් රහත්මගින් ක්‍ෂය කළ ඉක්බිති, එකුන්විසි (19 වැනි) ප්‍රත්‍යවෙක්‍ෂ ඥාණයෙහි පිහිටා භවාඞ්ගපාත වූ කල්හි, ආත්මයාගේ පැවැත්මට හිසක් වැනි වූ ජීවිතෙන්ද්‍රිය ය චුතිචිත්තයා විසින් ක්‍ෂය කරනු ලැබ පිරිනිවන් පා වදාළ සේක. කෙලශ ශීර්ෂයක් වූ අවිද්‍යාවත්, ආත්මශීර්ෂයක් වූ ජීවිතින්ද්‍රිය යන් එකවරම නිරුද්ධ වූවාහු ය. ඉක්බිති එම මග වඩනා පන්සියයක් පමණ පිරිවරකොට ඇති දීඝභාණක අභය මහ තෙරුන් එම දැගිය සිරුර දැක, ආදාහන කෘත්‍යය කරවා, අෂ්ටි ධාතු ගෙන ද ගැබක් කරවා වැඩියාහ.

මෙසේ ජීවිත හානිය වුවත් නුවණ ඇති තැනැත්තෝ ශික්‍ෂාපද නොබිඳින්නේ ය.

## 2. ඉන්ද්‍රිය සංවර සීලය

සිහියෙන් ආරක්‍ෂ කරණ ලද චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ පසුපස්සෙහි විෂම ලොභාදි පාප ධර්මයෝ ලුහුබැඳ නොයන හෙයින් ඉන්ද්‍රිය සංවර සීලය සතියෙන් හෙවත් සිහියෙන් ම සැපයිය යුතු වේ. **ආදිත්තපරියාය සූත්‍රයෙහි,** භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, රත් වූ, හාත්පසින් දිලිහෙන, එකම ගිනිදැලින් යුක්ත වූ අයොමය නාරාසනයකින් හෙවත් හුලකින් ඇස පිරිමදින ලද්දේ වී නම් එය උතුම් වන්නේ ය. ඇසින් දක්ක යුතු වූ රූපාලම්බණයන් කෙරෙහි, කෙලෙසුන්ගේ ඉපදීමට සුදුසු ආකාරයෙන් අත් පා ආදි වූ අනුව්‍යඤ්ජනයන් හෙවත් අනුබ්‍යඤ්ජනයන්ගේ වශයෙන් ස්ත්‍රී පුරුෂාදීන් කෙරෙහි සුභාදී නිමිත්තග්‍රහණය උතුම් නො වන්නේය"යි වදාළ සේක.

මනාකොට නොසපයන ලද ඉන්ද්‍රියසංවර සීලය ඇති කල්හි ප්‍රාතිමොක්ෂසංවර සීලය ද කල්නොපැවැත් විය යුතු වෙයි.

වැට නොබැඳි, නොරැකි ගොයම ගවාදීන් විසින් නසනු ලබන්නේ වේ ද, හරණ ලද දොර ඇති ගම සොරුන් විසින් පැහැරගනු ලබන්නේ වේ ද, එමෙන් ම ඉන්ද්‍රියසංවරය නමැති දොර නොවසන ලද කල්හි මේ ප්‍රාතිමොක්ෂසංවර සීල නමැති ධනය, රාග, ද්වෙෂ, මොහාදී කෙලෙස් නමැති සොරුන් විසින් පැහැර ගනු ලබන්නේ ය. නපුරු කොට සෙවිලි කරණ ලද ගෙයක් හාත්පසින් තෙමන්නා වූ වර්‍ෂාවක් මෙන්, රාග නමැති වර්‍ෂාව මොහුගේ සිත තෙමන්නේ ය. මැඩ ලන්නේ ය.

අළුත මහණ වූ **වඞ්ගීස** නම් මහණ කෙනෙක්, අනඳ මහ තෙරුන් සමග පිඬුසිඟා වඩනා කල්හි, එක් ස්ත්‍රියක් දැක පිළිබඳ සිත් ඇතිවිය. එවිට ඒ භික්ෂුව අනඳ මහ තෙරුන්ට මෙසේ කීය.

**"කාමරාගෙන ඩය්හාමි – චිත්තං මේ පරිඩය්හති**
**සාධු නිබ්බාපනං බ්‍රෑහි – අනුකම්පාය ගොතම."**

කාමරාග නම් ගින්නෙන් මා දවනු ලැබේ. මාගේ සිත හාත්පසින් දැවේ. ගෞතම පුත්‍රයාණෙනි, ඒ රාගගින්න නිවීමට උපායක් වදාරණු මැනව" කියායි. එවිට අනඳ තෙරණුවෝ වදාරණ සේක්–

"අයහපත් අරමුණෙහි යහපතැයි පැවති තොපගේ විපරීත සංඥාව හේතුකොට ගෙන, තොපගේ සිත රාග නමැති ගින්නෙන් දැවෙයි. එහෙයින් රාගය ඉපදීමට කාරණා වූ, යහපතැයි සිතා ගන්නා ලද ඒ අරමුණ මෙනෙහි නොකිරීමෙන් දුරුකරව. ඒ ස්ත්‍රී රූපය අශුභ වශයෙන් සලකා, අශුභාරම්මණයෙහි එකඟ වූ සිත මනා කොට පිහිටුවා තොපගේ සිත භාවනාවෙන් වඩව, සියලු සංස්කාර ධර්‍මයන් අනිත්‍යය වශයෙන් ද, ඉපදීමෙන් හා

බිඳීමෙන් ද පෙළෙන හෙයින් දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද බලව. තුන්ලොවම මැඩපවත්වා සිටියා වූ මහත් වූ තෘෂ්ණා නමැති ගින්න සතර මග සතර ඵල නමැති ජලයෙන් පිළිවෙළින් ගොස් නිවව. දුන් තෝ රාග ගින්නෙන් දැවාක් මෙන් නැවත නැවතත් නොදව''යි වදාළාහ. වඞ්ගීරස තෙරුන් අනඳ මහ තෙරුන්ගෙන් මේ දහම අසා රාගය දුරුකොට ගෙන පිඬු පිණිස හැසුරුණු සේක.

**චිත්තගුත්ත** නම් මහතෙර නමක් ලක්දිව කරඬු මහලෙන්හි වාසය කළසේක. ඒ ලෙන තුළ, **විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම** යන සත් බුදුවරයන් වහන්සේලා මහබිනික්මන් අයුරු විසිතුරු කොට අඳින ලද්දේ විය. එක් කාලයෙක්හි බොහෝ භික්ෂුහු විහාර බලමින් යන්නාහු, මේ ලෙනට ද පැමිණ එහි විසිතුරු බලන්නේ මෙය දුටහ. උන්වහන්සේලා දුටු ඒ සිතියම් ගැන චිත්තගුත්ත තෙරණුවන්ට දැන්වූ කල්හි, ඒ තෙරණුවෝ ''මෙහි සැට වසකට අධික කලක් වසන්නේ මෙය නුදුටිමි. දැන් තොප ඇස් ඇත්තා වූ හෙයින් ඒ බව දැනගතිමි'' කීහ. ඒ තෙරණුවෝ වියදඬු පමණ දුරමුත් උඩ නො බලන්නේ ය. ලෙන දොරකඩ ඇති මහා නාරැකෙහි මල්හට ගත් බව දන්නේ බිම මල් රේණු දුටු විට ය. එකල්හි මාගම වසන රජ තෙමේ චිත්තගුත්ත තෙරුන් ගුණ අසා, උන්වහන්සේ දැක වඳිනු කැමැතිව තුන් වරක් දූතයන් යවා ගෙන්වා ගත නොහැකිව, දරුවන්ට කිරි දෙන මවුන් තන-පටින් බැඳ මුද්‍ර තබා ඒ තෙරුන් නුවරට වඩනා තෙක් දරුවන්ට කිරි නොලැබේවායි කියා අණ කෙළේය. තෙරුන් වහන්සේ එ බව අසා දරුවන්ට අනුකම්පාවෙන් නුවරට වැඩි සේක. ඒ බව අසා, සිල් ගැනීමට ය කියා රජතෙම ගෙන්වාගෙන දන් වළඳවා, වැඳ, සිල්ගැනීම ද තෙරුන් දකිනු රිසියෙන් සත්දවසක් ම කල් දැමූහ. රජහු ද, දේවීන් ආදීහු ද වඳින කල්හි ''මහරජ සුවපත් වේවා''යි කියන්නේ ය. පසුව

යන අතික් තෙරහු මෙය අසා කුමක් නිසා හැමටම "මහරජ සුවපත් වේවා" යි කියා දූයි ඇසීය. "ඔවුන්ගේ විශෙෂයක් නොපෙනෙන බැවින් කීමි" යි කීහ. මෙසේ සත්දවසක් ම ඇතුළු නුවර වුසූ තෙරුන්ට දුක් වන්නේ යයි දැන රජතෙමේ තෙරුන් කරඹු මහලෙනට යැවූහ. එහි ගොස් පළමු ද, ම භාවනාව පිණිස සක්මනට නැගි වේලේ නාරුක වැසි දෙව්දූ, තෙරුන් සිල් පිරිසුදු බව දැක, දඹුවැට පහනක් ගෙන ආලෝක කරමින් සිටියාය. ඒ දින තෙරුන්ට කම්සථාන අරමුණ වෙනදට වඩා පැහැදිලිව පහල වූයේ ය. මෙසේ සතුටු වූ තෙරණුවෝ භාවනා කොට මැදුම් යම් දස පැය කෙළවර සියලු පර්තය පෘථිවි කම්පාවෙන් නාද කරවමින්, එහි වැසි දෙවියන්ගේ සාදුකාර පූජා ලබමින් සතර මග සතර ඵලයට පැමිණ වදාළහ.

එහෙයින් කියන ලදී:- "නොයෙක් දෙස බලන වල් වඳුරකු මෙන් ද, සිංහාදීන්ට භය වූ මුවකු මෙන් ද, මව්පියන් ලඟ නැති කල හයින් ඔබමොබ බලන ළදරුවකු මෙන් ද, වටපිට බලන චංචල වූ ඇස් ඇත්තෙක් නොවව්. ඇස්යට හෙළමින් වියදඬු පමණ බැලුම් ඇති ව වල් වඳුරකු මෙන් චංචල වූ සිතේ වසඟයට නොගොස් විසිය යුතු"

මහා මිත්‍ත සථවිරයන්ගේ මවට ගෙඩියක් සෑදී ගිලන් වූවාය. එවිට ඈ තම දියණියන් වූ මෙහෙණින්හට කථාකොට සොහොයුරු තෙරුන් වෙත ගොස්, මෙපවත් දන්වා බෙහෙතක් අසාගෙන එවයි කීය. ඈ තෙරුන්ට මෙපවත් කීය. එවිට තෙරුන් මෙසේ කීය. "අපි බෙහෙත් සාදන්නට නොදනිමු. එහෙත් අප පැවිදි තැන් පටන් මෙතෙක් ලොභ සහගත සිතින්, ඉන්‍ද්‍රිය සංවර සීලය බිඳගෙන, විසභාග රූපයක් නො බලන ලද්දේ ම ය. මේ සත්‍යයෙන් මවට සුවවේවායි සත්‍යක්‍රියා කොට, මේ වචනයෙන් මව් ඇඟ පිරිමදිව් කියා මෙහෙණින් යැවීය. ඈ ද ගොස් එසේ කළාය. මව් ඇඟ හටගෙන තුබූ ගඬද

එකෙණෙහි ම සුවවිය. මව් නැගිට, ප්‍රීතියෙන් කියනුයේ "අද අප බුදුන්වහන්සේ වැඩ සිටිසේක් නම් ශ්‍රීහස්තයෙන් මපුතණුවන් හිස නො පිරිමැද සිටිද්ද" යි කීය.

මෙසේ ඉන්ද්‍රියසංවර සීලය සමාධියෙන් ම සැපයිය යුතු බව දතයුතු.

## 3. ආජීවපාරිසුද්ධි සීලය.

මනාකොට පටන්ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තාහට ම මිථ්‍යා ආජීවය දුරුවේ. නුසුදුසු, අයුතු ප්‍රත්‍යය සෙවීම දුරු කොට, වීර්‍ය්‍ය කරණ කොට ගෙන, පිඬු සිඟීම් ආදී වූ, මනා වූ ප්‍රත්‍යය සෙවීමෙන් ආජීවපාරිසුද්ධිය සැපයිය යුතු වේ. හෙතෙමේ අපිරිසුදු ව උපන් සිව්පසය විසඝොර සර්පයන් මෙන් දුරු කරන්නේ ය. දහම් දෙසීම් ආදියෙන් ප්‍රසන්න වූ දායකයන්ගෙන් ලබන ලද පසය පිරිසුදු ය. පිණ්ඩපාතාදියෙන් ලබන ලද සිවුපසය පිරිසුදු ය.

ධූතාඞ්ග සමාදන් වූ භික්ෂුවහට පිණ්ඩපාතයෙන් හෝ ගුණයන්ට පැහැදී දායකයන්ගෙන් ලබන ලද පසය ද පිරිසුදු ය.

ලෙඩක් සංසිඳවනු පිණිස ලැබුණු අරළු හා සීනි, මී, තලතෙල්, ගිතෙල් යන චතුමධුරයක් වේ ද, ඒ චතුමධුරය සෙසු භික්ෂූන්ට තබා අරළු වළඳන්නේ වී නම් එය ඉතා සුදුසු ය. ඔහුට **ආර්‍ය්‍යවංශ ඇති මහණ** යයි ද කියනු ලැබේ.

ධූතාඞ්ගධර වූ හෝ ධූතාඞ්ගධර නොවූ හෝ ආජීවය පිරිසුදු කරගනු කැමැති භික්ෂුවට, චීවර හා **පිණ්ඩපාතය** පිළිබඳ, **නිමිත්ත, ඕභාස, පරිකථා, විඤ්ඤත්ති** යන සතරම නොවටනේ ය.

**සෙනාසන** පිළිබඳව ධූතාඞ්ගධර නොවූ භික්ෂුවහට **නිමිත්ත, ඕභාස, පරිකථා** පමණක් වටනේය. **විඤ්ඤත්ති** නොවටනේ ය.

මෙහි **නිමිත්ත** නම්- සෙනසුන් පිණිස බිම් සමතලා කිරීම් ආදී පිරියම් කරන මහණ හට ගිහියන් විසින් කුමක් කරන්නේ ද කවරෙක් මෙය කරවන්නේ දැයි කී කල්හි දායකයෙක් නැතැයි පිළිවදන් දීම හෝ අනිකුදු එබඳු නිමිති කර්‍මයක් වේ නම් එයට **නිමිත්ත** යයි කියනු ලැබේ. එය අසා ගිහියෝ අපි එය කරදෙන්නෙමු යයි කියා කරදෙත්.

**ඔභාස** නම්- භික්‍ෂු තෙම ගිහියන් දැක, "උපාසක-වරුනි, තෙපි කොහි වසව් ද"යි ඇසූ කල්හි, "අපි ප්‍රාසාදවලය"යි කී කල්හි "භික්‍ෂූන්ටත් ප්‍රාසාද නොකැප දැ"යි අසයි. මෙය හෝ මෙබඳු අනෙක් විධි හෝ **ඔභාස** යයි කියනු ලැබේ.

**පරිකථා** නම්- දායකයන් හමුවී "උපාසකවරුනි, භික්‍ෂු සඞ්ඝයාට සෙනසුන ගැහටය. නොපොහොනේය" යනාදී වශයෙන් අභිමතය හඟවන වචන කීම ය.

**විඤ්ඤත්තියෙන්** නිපන් **චීවර, පිණ්ඩපාත, සේනාසන** යන ප්‍රත්‍යය තුනම අකැපය. **විඤ්ඤත්තිය** නම් නොනෑ, නොපැවැරූවන් ගෙන් ඉල්ලීම ය.

බෙහෙත් සෙවීමේදී රෝගාතුර වූ භික්‍ෂුවහට **නිමිත්ත, ඔභාස, පරිකථා, විඤ්ඤත්ති** යන සතරම කැපය. එහෙත් රෝගය සංසිඳුන කල්හි එය නොකැප වන්නේ ය. මෙසේ බුදුන්වහන්සේ විසින් අනුකම්පාවෙන් අනුදැන වදාළ නමුදු එය නොකර, අල්පෙච්ඡතාදි ගුණයෙන් ම වසන්නේ නම් ඒ භික්‍ෂුව **සැරියුත් මහතෙරුන්** මෙන් වසන්නේ යයි කියනු ලැබේ.

අග්‍රශ්‍රාවක සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ එක් අරණ්‍යයක විවේක සුවය විඳිමින් වැඩ සිටිනා කල්හි, දිනක් සැරියුත් මහතෙරණුවන්ට බඩරුජාවක් උපන. එයින් දුක් වේදනා ද ඇතිවිය. මුගලන් තෙරණුවෝ එය දැක, පෙර මෙවැනි ආබාධයක් ඇති වූ කල්හි කුමණ බෙහෙතකින්

සුවවී දැයි අසා, ගිහි ව සිටිකල්හි මැණියන් පිළියෙල කර දුන් ගිතෙල්, මී, සකුරු යොදා සකස් කළ කිරි බතකිනැයි කී හෙයින් අපගේ පිනෙක් වේ නම් සෙට දින එය ලැබේ යයි මුගලන් තෙරණුවෝ කීහ. සක්මන කෙළවර වෘක්ෂාධි ගෘහිත දෙව්දුව මෙය අසා සෙට මේ බෙහෙත මා විසින් ලබා දිය යුතු යයි සිතා මුගලන් තෙරුන්ගේ කුලූපග දායකයන් ගෙදර වැඩිමහල් පුත්‍රයාහට ආවේශ වී බඩරුජාවක් ඇති කොට, ඔහු ගේ පිරිස පැමිණි කල්හි මෙසේ කීය. සෙට දින මුගලන් තෙරුන් වැඩිකල මේ පිළිවෙළින් සකස් කළ කිරිබතක් පුදන්නහු නම් මොහු හැර යන්නෙමි යි කීය. ඔව්හු ද එසේ පිළියෙල කොට පසුදින උදෑසන මුගලන් මහ තෙරණුවන් වැඩි කල්හි පාත්‍රය ගෙන පාත්‍රය පුරවා කිරිබත් වළඳවා නැවත ද කිරිබතින් පාත්‍රය පුරවා පිළිගැන් වූයේ ය. උන්වහන්සේ ද කිරිබත් පාත්‍රය ගෙන ගොස් සැරියුත් මහ තෙරුන්වහන්සේට පිළිගැන් විය. සැරියුත් තෙරුන්වහන්සේ එය බලා ඉතා සුදුසු කිරි බතෙකැයි දැන, එය කෙසේ ලැබුණේ දැයි දිවැසින් බලනුයේ තමන් වහන්සේගේ බස් අසා සිටි දෙව් දුව නිසා ලැබූ බව දැන මුගලන් මහතෙරුන් අමතා මේ ආහාරය ඉවත දමන්න. අතුණු නික්ම බිම වැතිර ගිය ද වාග්විඥප්තියෙන් නිපන් ආහාරය වළඳන්නට නුසුදුසුය''යි වදාළ සේක. මුගලන් තෙරණුවෝ ද එසේ කළ සේක. සැරියුත් මහ තෙරුන්ගේ බඩරුජාව ද එකෙණෙහි ම සුවවිය. පරිනිර්වාණය තෙක් ඒ ආබාධය නැවත හට නොගත්තේ ය.

මෙසේ **ආජීව පාරිසුද්ධි සීලය** වීර්‍ය්‍යයෙන් ම සැපයිය යුතු වේ.

### 4. ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය

සිව්පසය ප්‍රත්‍යවෙක්ෂා නොකොට පරිභොග කිරීමෙහි ආදීනව හා ප්‍රත්‍යවෙක්ෂා කොට පරිභොග කිරීමෙහි අනුසස් ද දැකීම නුවණින් හෙවත් ප්‍රඥයයෙන් ම සිද්ධ කට යුතුවේ.

**ප්‍රත්‍යවේක්‍ෂා කිරීම දෙවැදෑරුම් වේ. එනම්-**

1. **චීවරාදි ප්‍රත්‍යයන් ලත් කල්හි ප්‍රත්‍යවේක්‍ෂා කිරීම.**

2. **චීවරාදි ප්‍රත්‍යයන් පරිභෝග කරණ කල්හි ප්‍රත්‍යවේක්‍ෂා කිරීමය.**

1. ප්‍රත්‍යය ලත් අවස්ථායෙහිදීම ඒ ප්‍රත්‍යයෝ සතරමහා භූතයන් නිසා හටගත්තාහුය. එහෙසින් ධාතු මාත්‍රයෙකැයි ධාතු වශයෙන් හෝ මේ ප්‍රණීත වූ චීවරාදි සිව් ප්‍රත්‍යයෝ දෙතිස් කුණපයෙන් පිරී තිබෙන්නා වූ ශරීරයට පැමිණ පිළිකුල් වන්නාහු යයි **පිළිකුල් වශයෙන්** හෝ ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු.

පරිභෝගය සිව්වැදෑරුම් වේ. එනම්:-

1. **ථෙය්‍ය පරිභෝගය,**
2. **ඉණ පරිභෝගය,**
3. **දායජ්ජ පරිභෝගය,**
4. **සාමි පරිභෝගය.**

1. **ථෙය්‍ය පරිභෝගය**- බුදුන්වහන්සේ විසින් සිල්වත් භික්‍ෂූන්ට අනුදන වදාළ බැවින් ද, දායකයන් විසින් "අපි සිල්වත් සඞ්ඝයාවහන්සේට දෙම්හ"යි දෙන ලද බැවිනුදු, සිල්වතුන් අයත් පසය. යමෙක් දුශ්ශීල ව සඟමැද හිඳ වළඳන්නාහු නම් එය සඟසතු දෑය සොරා කෑමක් වන හෙයින් **ථෙය්‍ය පරිභෝග** නම් වේ.

2. **ඉණ පරිභෝගය**- සිල්වත් භික්‍ෂුව වුව ද, ප්‍රත්‍යවේක්‍ෂා නොකොට වළඳන්නේ නම් ඒ පරිභෝගය ණය කෑමක් වන හෙයින් **ඉණ පරිභෝග** නම් වේ. සිවුරු කයෙන් පහකොට හඳනා පොරෝනා ක්‍ෂණයක් පාසාම ප්‍රත්‍යවේක්‍ෂා කොට ම හැඳිය යුතු. පෙරවිය යුතු.

දනය වළඳනා විට පිඩක් පිඩක් පාසාම ප්‍රත්‍යවෙක්ෂා කොට වැළඳිය යුතු. එසේ නොහැකිවූයේ නම් පෙරවරු කාලයෙහි හෝ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු. එසේත් නොහැකි වී නම් පස්වරු කාලයෙහි හෝ පෙරයම් දසපැයෙහි හෝ පසුයම් දස පැයෙහි හෝ ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය. මෙසේත් ප්‍රත්‍යවෙක්ෂා නොකොට සිටියදීම අරුණු නැංගේ නම් ඒ භික්ෂුව **ඉණ පරිභොගයට** අසුවූයෙක් වෙයි. නොහොත් ඒ පරිභොගයට ණය ගැතියෙක් වෙයි. සෙනසුන් පරිභොග කරන හැම විටෙකම ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු. බෙහෙත් පිරිකර පිළිගන්නා කල්හි ද පරිභොග කරන කල්හි ද ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු. පිළිගන්නා කල්හි ප්‍රත්‍යවෙක්ෂා කළ ද ඉදින් පරිභොග කරන කල්හි ප්‍රත්‍යවෙක්ෂා නො කෙළේ නම් ඇවැත් වේ. පිළිගන්නා කල ප්‍රත්‍යවෙක්ෂා නොකළ ද පරිභොග කරන කල ප්‍රත්‍යවෙක්ෂා කෙළේ නම් ඇවැත් නොවේ. පිළිගන්නා කල්හි ද වළඳනා කල්හි ද ප්‍රත්‍යවෙක්ෂා නොකෙළේ නම් ඇවැත් වෙයි.

මෙහි **සුද්ධිය** හෙවත් පිරිසුදු බව සතරවැදෑරුම් වේ. එනම්, **දෙශනා සුද්ධිය, සංවර සුද්ධිය, පරියෙට්ඨි** හෙවත් **පයෙෂ්ෂණ සුද්ධිය** සහ **පච්චවෙක්ඛණ සුද්ධිය** යි.

1. **දෙශනා සුද්ධිය**- ඇවැත් දෙසා ගැනීමෙන් පිරිසුදු වන හෙයින් ප්‍රාතිමොක්ෂ සංවර සීලය, **දෙසනා සුද්ධිය** නම් වේ.

2. **සංවර සුද්ධිය**- නැවත මෙබන්දක් නොකරන්නෙමැයි සිතින් ම ඉටාගැනීම් වශයෙන් චිත්තාධිෂ්ඨාන සංවරයෙන් පිරිසුදු වන බැවින් ඉන්ද්‍රිය සංවර සීලය **සංවර සුද්ධිය** නම් වේ.

3. **පරියෙට්ඨි** හෙවත් **පයෙෂ්ෂණ සුද්ධිය**- එක්විසි වැදෑරුම් අයුතු ප්‍රත්‍යය සෙවීම් දුරුකොට දැහැමෙන් සෙමෙන් සිව්පසය උපදවන්නාහට යහපත් සෙවීම් ඇති හෙයින් ආජීවපාරිසුද්ධි සීලය **පරියෙට්ඨි සුද්ධිය** නම් වි.

4. **පච්චවෙක්ඛණ සුද්ධිය** – ප්‍රත්‍යවේක්ෂා කොට ප්‍රත්‍යය පරිභොග කිරීමෙන් පිරිසුදු වන හෙයින් ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය **පච්චවෙක්ඛණ සුද්ධිය** නම් වේ.

3. **දායාද පරිභොගය** – සප්ත ශෛක්ෂ පුද්ගලයන්ගේ පරිභොගය **දායාද පරිභොගය** නම් වේ. සප්ත ශෛක්ෂයෝ වනාහි බුදුන්වහන්සේගේ ඖරස පුත්‍රයෝ ය. පියසතු පසයට උරුමවූ පුද්ගලයෝව සිව්පස පරිභොග කරන්නාහ. සිව්පසය වනාහි දායකයන් විසින් දෙනු ලබන්නක් වුවද බුදුන්වහන්සේ විසින් අනුදැන වදාරණ ලද හෙයින් බුඩ සන්තක වෙති. එබැවින් ඒ ශෛක්ෂයෝ බුදුන්වහන්සේගේ පසය අනුභව කරන්නෝ වෙත්.

4. **සාමි පරිභොගය** – රහතන්වහන්සේගේ සිව්පස පරිභොගය **සාමි පරිභොගය** නම් වේ. තෘෂ්ණාවට දාස වන සවභාවය ඉක්මවූවන් හෙයින් රහතන්වහන්සේලා සිව්පසයට සවාමියෝ ය.

මේ සතර පරිභොගයන් අතුරෙන් **දායාද පරිභොගයත් සාමි පරිභොගයත්** උතුම් වේ.

සැහැල්ලු පැවතුම් ඇති පෘථග්ජන භික්ෂුවගේ ප්‍රත්‍යය පිළිබඳ ආශාව දුරුකොට ප්‍රත්‍යයෙහි නො ඇලුණු සිතින් පරිභොග කිරීම **සාමි පරිභොගය** වැනි හෙයින් ද, සිල්වත් පුහුදුන් මහණ තෙම සිහියෙන් යුක්ත ව ප්‍රත්‍යවේක්ෂා කොට සිව්පසය පරිභොග කිරීම **දායාද පරිභොගය** වැනි හෙයින් ද, සිල්වත් ගුණවත් භික්ෂුවගේ මේ දෙයාකාර පරිභොගයට ඒ **සාමි පරිභොග දායාද පරිභොග** යන දෙකම ඇතුළත් වෙත්. **ථෙය්‍ය පරිභොගය** සහ **ඉණ පරිභොගය ද** භික්ෂුවට කිසිසේත් නොවටනේ ය. එහෙයින් අග්‍රවූ සාමි පරිභොගයම පතා ප්‍රත්‍යවේක්ෂා කොට පරිභොග කිරීමෙන් ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය ප්‍රඥයෙන් ම සැපයිය යුතු යයි කියන ලදී මෙසේ පරිභොග කරන්නාවූ මහණ තෙම **සුදුසු සැව් ද, පැමිණි කල් ද දත් මහණ** යයි කියනු ලැබේ.

**මේ චතුපාරි ශුද්ධිය හැර පරියන්ත පාරිසුද්ධි සීලය, අපරියන්ත පාරිසුද්ධි සීලය, පරිපුණ්ණ පාරිසුද්ධි සීලය, අපරාමට්ඨ පාරිසුද්ධි සීලය, පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලය** යයි **පඤ්චවිධ පාරිසුද්ධි සීලයෙක්** ද යට දක්වන ලදී.

මොවුන් අතුරෙන් සීමාරහිත ශික්ෂාපද රක්නා උප සම්පන්න භික්ෂුවගේ **අපරියන්ත පාරිසුද්ධි සීලය අම්බඛාදක මහාතිස්ස** ස්ථවිරයන්ගේ කථා වස්තුවෙන් දත හැකිවේ. මුන්වහන්සේ දුර්භික්ෂ කාලයෙක දුර ගමනක් යන්නේ පිඬු පිණිස ගමකට වැඩ, එහි භික්ෂාව නො ලැබුනේ, ක්ලාන්තව, අඹගසක් යට සිහිල් සෙවණේ වැතිර හොත් සේක. තමන්වහන්සේ සමීපයෙහි වැටී තිබූ ඉදුණු අඹ ගෙඩි දක එය පිළිගන්වන්නට කෙනෙකු නැති හෙයින් ඇවැතට පැමිණිය හැකි බැවින් නොගෙන සිටිසේක. මග යන එක් උපාසකයෙක් ක්ලාන්ත වූ මේ ස්වාමීන් වහන්සේ දක අඹ කපා මිරිකා එහි පැනි තෙරුන්වහන්සේට පෙවී ය. එයිනුදු සුවපත් නොවූ හෙයින් උපාසක තෙම මුන්වහන්සේ කරපිට නංවා ගෙන සිය ගමට ගෙනයන අතර මගදී උන්වහන්සේ සිහිසත් ලැබ තමහටම අවවාද දෙනසේක්—

**"න පිතා න පි තෙ මාතා – න ඤාති න පි බන්ධවො**
**කරොන්ත තාදිසං කිච්චං – සීලවන්තස්ස කාරණා."**

යනුවෙන් මේ තාගේ පියා ද නොවේ. මව් ද නොවේ. නෑ ද නො වේ. බන්ධු ද නොවේ. සිල්වත් බව හේතු ගෙන ම මෙසා කෘත්‍යයක් කෙරේ." යයි සිතා එහිම යමින් විදසුන් වඩා රහත් වූහ. එහෙයින් කියන ලදී—

**"සංවෙගං ජනයිත්වාන – සම්මසිත්වාන යොනිසො,**
**තස්ස පිට්ඨි ගතො සන්තො – අරහත්තං අපාපුණිං."**

සංවෙග උපදවා නුවණින් සම්මර්ශනය කොට ඔහුගේ පිට උඩ යන්නේම රහත් බවට පැමිණියේ ය.

තවද, සැටවයස් ඉක්මගිය **මහාසඞ්ඝරක්ඛිත ස්ථවිර යන් වහන්සේ මරණ** මඤ්චකයෙහි වැඩහුන් සේක් එහි වැඩම කළ භික්ෂු සංඝයා වහන්සේ "අධිගත ලොකොත්තර ධර්ම ඇති සේක්ද" යි ඇසූහ. උන්වහන්සේ නැතැයි පිළිවදන් දුන් සේක. ඒ ඇසූ උපස්ථායක ළදරු භික්ෂුවක් උන්වහන්සේට මෙසේ සැල කළහ. "ස්වාමීනි, නුඹවහන්සේ පිරිනිවි සේකැයි හාත්පස දෙලොස් යොදුනෙක මහජනයා රැස් වූහ. ඔබවහන්සේගේ පෘථග්ජන කාලක්‍රියායෙන් මහත් විපිළිසරයෙක් වන්නේ ය." කියායි. එවිට උන්වහන්සේ, "ඇවැත්නි, මම මෙතේ බුදුන් දක තිවන් දක්නා අදහසින් විදසුන් නොවැඩූයෙමි. එසේ නම් මා වඩා හිඳුවා අවකාශ යක් දෙවයි" කීහ. භික්ෂුව ද එසේ කොට පිටතට නික්මුණේය. එසේ නික්මෙන්නා හා සමගම උන්වහන්සේ විදසුන් වඩා රහත් බවට පැමිණ අසුරු ගැසීමෙන් සංඥ කළ සේක. එහි රැස් වූ මහාසඞ්ඝයා වහන්සේ "මරණ මොහොතේදී ලොකොත්තර ගුණ ඉපදවීමෙන් දුෂ්කරයක් කරණ ලද්දේ" යයි කීහ. ඒ තෙරහු "දුෂ්කරය නම් මා මේ ඇසිල්ලෙහි රහත්වීම නොවේ. දුෂ්කර දෙයක් මම කියමි. මම පැවිදිවූ කාලයෙහි පටන් මතක නැතිව, නොදැන කළ දෙයක් සිහිනොවෙති, දුෂ්කරය නම් එයයි" කීහ.

විශෙෂාධිගමයෙහි විනා කාය ජීවිත දෙක්හි අපෙක්‍ෂා රහිතව ඒ පිණිසම හළ ජීවිත ඇතිවූ වන්ගේ **පරිපූර්ණ පාරිශුද්ධි සීලය** මෙයින් ප්‍රකට වේ.

තවද, සැවැත් නුවර **තිස්ස** නම් කෙළෙඹි පුත්‍රයෙක් සතළිස් කෙළක් ධනය අත්හැර පැවිදිව අරණ්‍යයෙහි විසීය, උන්වහන්සේගේ සොහොයුරාගේ භාර්‍ය්‍යාව උන් වහන්සේ මරණු සඳහා සොරුන් මෙහෙයූවාය. ඒ සොරු ගොස් උන්වහන්සේ පිරිවරාගත්හ. "තොපි කුමට අවුදූ"යි විචාරා "නුඹවහන්සේ මරණු සඳහා" යයි කී කල්හි කුමක් පිණිස දැයි ඇසූහ. ධනය සඳහා යයි කී කල ඇපයක් ගෙන අද එක රැයට මා නොමරණු හැකි දැයි

ඇසීය. එයට නොකැමැති වූ හෙයින් තෙරුන්වහන්සේ මහත් ගලක් ගෙන තමන්වහන්සේගේ කළවා ඇටය බිඳගෙන මේ ඇපය මද දැයි විචාළේය. එවිට සොරු තිසැකව, සක්මන් කෙළවර ගිනිවැල් ගසාගෙන හොත්හ. තෙරුන්වහන්සේ ද, ඉවසීමෙන්, වේදනා මැඩපවත්වා ස්වකීය පාරිසුද්ධි සීලය ප්‍රත්‍යවේක්ෂා කරන සේක් ප්‍රීති ප්‍රමෝද්‍යය උපදවා විදර්ශනා වඩා අරුණෝද්ගමනයෙහිදී අර්හත් බවට පැමිණි සේක. මෙය මුන්වහන්සේගේ **අපරාමට්ඨ පාරිසුද්ධි සීලය** නමි.

තවද, එක්තරා මහාතෙරනමක් ඉතා ගිලන්ව, සියතින් අහර වළඳන්නට පවා අසමර්ථව සියමල මූත්‍රයෙහි ම ඔබ මොබ පෙරලෙමින් සිටියේ ය. ඒ දුටු ළදරු භික්ෂු නමක් "ඛෙදයෙකි, ජීවිත සංසකාර දුක්ය" යි පැවසීය. එවිට ඒ තෙරුන්වහන්සේ, "ඇවැත්නි, මම දැන් මැරෙන්නෙම් ස්වර්ගසැප ලබමි. මට එහි සැපයක් නැත. එහෙත් මේ සීලය බිඳගෙන ලබන සැපය නම් ශික්ෂා බැහැර කොට ලබන ගිහි බව වැනි ය මම සීලය සමගම මැරෙන්නෙමි"යි කියා එහිම හිඳ ඒ රෝගයම සම්මර්ශනය කොට විදසුන් වඩා රහත් බවට පැමිණ වදාළ සේක. මෙය ද මුන්වහන්සේගේ **අපරාමට්ඨ පාරිසුද්ධි සීලය** නමි.

**පහාණ සීල, වෙරමණී සීල, චෙතනා සීල, සංවර සීල අවීතික්කම සීල** යයි දක්වන ලද පඤ්චවිධ සීලයන් පිළිබඳව ප්‍රාණඝාතාදී අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය වන පිළිවෙල මෙසේ දත යුතු:-

| **ප්‍රහාණය කළ යුතු ධර්ම** | **ප්‍රහාණ මාර්ගය** |
|---|---|
| **1. කාමච්ඡන්දය** | – **නෛෂ්ක්‍රම්‍යයෙන්** |
| **2. ව්‍යාපාදය** | – **අව්‍යාපාදයෙන්** |
| **3. ථිනමිද්ධය** | – **ආලෝක සංඥායෙන්** |
| **4. උද්ධච්චය** | – **අවික්ෂෙපයෙන්** |

| | ප්‍රහාණය කළ යුතු ධර්ම | | ප්‍රහාණ මාර්ගය |
|---|---|---|---|
| 5. | විචිකිච්ඡාව | – | ධම්මවවත්ථානයෙන් |
| 6. | අවිද්‍යාව | – | ඥානයෙන් |
| 7. | අරතිය | – | ප්‍රමොද්‍යයෙන් |
| 8. | නීවරණයන් | – | ප්‍රථම ධ්‍යානයෙන් |
| 9. | විතර්කවිචාරයන් | – | ද්විතීය ධ්‍යානයෙන් |
| 10. | ප්‍රීතිය | – | තෘතීය ධ්‍යානයෙන් |
| 11. | සුඛ දුඃඛ | – | චතුර්ථ ධ්‍යානයෙන් |
| 12. | රූප සංඥා | } | |
| 13. | පටිඝ සංඥා | – | ආකාසානඤ්චායතන සමාපත්තියෙන් |
| 14. | නානත්ත සංඥා | } | |
| 15. | ආකාසානඤ්චායතන සංඥාව | – | විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් |
| 16. | විඤ්ඤානඤ්චායතන සංඥාව | – | ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් |
| 17. | ආකිඤ්චඤ්ඤායතන සංඥාව | – | නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් |
| 18. | නිච්චසඤ්ඤාව | – | අනිච්චානුපස්සනායෙන් |
| 19. | සුඛ සඤ්ඤාව | – | දුක්ඛානුපස්සනායෙන් |
| 20. | අත්ත සඤ්ඤාව | – | අනත්තානුපස්සනායෙන් |
| 21. | නන්දිය | – | නිබ්බිදානුපස්සනායෙන් |
| 22. | රාගය | – | විරාගානුපස්සනායෙන් |
| 23. | තෘෂ්ණාව | – | නිරොධානුපස්සනායෙන් |
| 24. | ආදානය | – | පටිනිස්සග්ගානුපස්සනායෙන් |
| 25. | ඝන සංඥාව | – | ඛයානුපස්සනායෙන් |

| | ප්‍රහාණය කළ යුතු ධර්ම | ප්‍රහාණ මාර්ගය |
|---|---|---|
| 26. | ආයූහනය | – වයානුපස්සනායෙන් |
| 27. | ධ්‍රැව සංඥාව | – විපරිණාමානුපස්සනායෙන් |
| 28. | නිමිත්තය | – අනිමිත්තානුපස්සනායෙන් |
| 29. | පණිධිය | – අප්පණිහිතානුපස්සනායෙන් |
| 30. | අභිනිවේශය | – සුඤ්ඤතානුපස්සනායෙන් |
| 31. | සාරාදානාභිනිවේශය | – අධිපඤ්ඤා ධම්මානුපස්සනායෙන් |
| 32. | සම්මෝහාභිනිවේශය | – යථාභූතඤාණදස්සනයෙන් |
| 33. | ආලයාභිනිවේශය | – ආදීනවානුපස්සනායෙන් |
| 34. | අප්පටිසඞ්ඛාව | – පටිසඞ්ඛාධම්මානුපස්සනායෙන් |
| 35. | සංයෝගාභිනිවේශය | – විවට්ටානුපස්සනායෙන් |
| 36. | දෘෂ්ටිය හා සහජ වශයෙන් එක්ව සිටි ක්ලේශයෝ | – සෝතාපත්තිමාර්ග ඥානයෙන් |
| 37. | ඔළාරික ක්ලේශයෝ | සකෘදාගාමිමාර්ග ඥානයෙන් |
| 38. | අණුසහගත ක්ලේශයෝ | – අනාගාමිමාර්ග ඥානයෙන් |
| 39. | සකල ක්ලේශයෝ ප්‍රහාණ මාර්ගය | – අර්හත්මාර්ග ඥානයෙන් |

මේ සීලය නිර්වාණාවබෝධයට උපකාරවන්නේ මෙසේයි:-

**සීලය – චිත්තයාගේ විපිළිසර නොවීම පිණිස** වන්නේය.

**අවිප්පටිසාරය – ප්‍රමෝදය** පිණිස ද,

**ප්‍රමෝදය – ප්‍රීතිය** පිණිස ද,

ප්‍රීතිය – පස්සද්ධිය පිණිස ද,

පස්සද්ධිය – සෞමනස්සය පිණිස ද,

සෞමනස්සය – සමාධි ආසේවනය පිණිස ද,

සමාධි ආසේවනය – සමාධිවෘද්ධිය පිණිස ද,

සමාධි වෘද්ධිය – නැවත නැවත වැඩීම පිණිස ද,

නැවත වැඩීම – සද්ධින්ද්‍රියාදීන්ගේ නිෂ්පත්තිය පිණිස ද,

සද්ධින්ද්‍රියාදීන්ගේ නිෂ්පත්තිය – සමාධි පරිෂ්කාර පිණිස ද,

සමාධි පරිෂ්කාර – සමාධි පරිවාර පිණිස ද,

සමාධි පරිවාර – සමාධි පරිපූර්ණිය පිණිස ද,

සමාධි පරිපූර්ණිය – ඒකාන්ත නිර්වේදය පිණිස ද,

ඒකාන්ත නිර්වේදය – විරාගය පිණිස ද,

විරාගය – නිරෝධය පිණිස ද,

නිරෝධය – ව්‍යුපසමය පිණිස ද,

ව්‍යුපසමය – අභිඥාව පිණිස ද,

අභිඥාව – සම්බොධිය පිණිස ද,

සම්බොධිය – නිර්වාණය පිණිස ද පවතී.

## සීලය කිළිටිවීම හෝ පිරිසුදුවීම

සීලය – ඛණ්ඩවීමෙන්, ඡිද්‍රවීමෙන්, සබලවීමෙන්, කල්මාෂ වීමෙන් කිළිටි වේ.

සීලයාගේ පිරිසුදු බව, අඛණ්ඩ, අච්ඡිද්‍ර, අසබල, අකල්මාෂ වීමෙන් සිදු වේ.

**ලාභ, යස, ඥාති, අඞ්ග, ජීවිත,** අපෙක්‍ෂා කොට වන සීලසමාදානයෙන් හා **සප්තවිධ මෛථුන සංයෝග-යෙන් ද** සීලය කිලිටි වේ.

**ඛණ්ඩ සීලය - පාරාජිකා, සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනිය, දුක්කට, දුබ්භාසිත** යන සප්ත ආපත්ති ස්කන්ධයන් අතුරෙන් යම් ආපත්ති ස්කන්ධයක ආදියෙහි හෝ අන්තයෙහි හෝ ශික්‍ෂාපදයෙක් යමකු විසින් බිඳපියනලද්දේ ද, ඔහුගේ සීලය කෙළවර කැඞීගිය වස්ත්‍රයක් වැනි හෙයින් **ඛණ්ඩ සීල** නම් වේ.

**ඡිද්‍ර සීලය** - යම් ආපත්ති ස්කන්ධයක මධ්‍යයෙහි ශික්‍ෂා පදයෙක් බිඳපියන ලද්දේ ද, එය මැද සිදුරු වස්ත්‍රයක් වැනි හෙයින් **ඡිද්‍ර සීල** නම් වේ.

**සබල සීලය** - යම් ආපත්ති ස්කන්ධයක පිළිවෙලින් ශික්‍ෂාපද දෙකක් තුනක් බිඳපියන ලද්දේ ද, පිට හෝ කුස හෝ නැගි කලු, රතු ආදී වර්ණ ඇති කබර දෙනක් වැනි හෙයින් **සබල සීල** නම් වේ.

**කල්මාෂ සීලය** - යම් ආපත්ති ස්කන්ධයෙක අතරින් අතර ශික්‍ෂාපද බිඳපියන ලද්දේ ද, අතරින් අතර විසභාග පැහැ ඇති තිත් දෙනක් වැනි හෙයින් **කල්මාෂ සීල** නම් වේ.

**සප්තවිධ මෛථුන සංයෝගයෝ නම්**

1 ඇතැම් මහණ බමුණු කෙනෙක්, තුමූ සම්‍යක් බ්‍රහමචාරි යයි ප්‍රතිඥ කරන්නේ, ස්ත්‍රීන් හා සමග මෙවුන්දම් සේවනය නො කරති. එහෙත් ඔවුන් විසින් කරනු ලබන ඇග ඉලීම්, නැහැවීම්, අත් පා මැඞීම් ආදිය ඉවසති. ආස්වාදනය කරති. කැමති වෙති. සතුටු වෙති. මෙයින් බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂද වෙයි. ඔව්හු මෛථුන සංයෝගයෙන් යුක්ත වූ, අපිරිසුදු බ්‍රහමචර්‍ය්‍යායෙහි හැසිරෙන්නේ ය. ඔව්හු ජාති, ජරා, මරණාදී වූ දුකින් නො මිදෙන්නාහ.

2. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති, නොඉවසති. නුමුත් ඔවුන් සමග කෙලෙස් වශයෙන් සිනාසෙති. සෙල්ලම් කරති. මමත්වය කරති. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂද වෙයි.

3. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති. නමුත් ස්ත්‍රීන් ඇසින් ඇස පැහැර බලති. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂද වෙයි.

4. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති, නමුත් බිත්තියෙන්, ප්‍රාකාරයෙන් පිටත සිට සිනාසෙන, කථාකරන, ගායනාකරන, හඬනා ස්ත්‍රියගේ ශබ්දය අසත්. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂ ද වෙයි.

5. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති. නමුත් පෙර ස්ත්‍රීන් සමග කළ සිනා, කථා, ක්‍රීඩා සිහි කරති. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂ ද වෙයි.

6. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති. නමුත් පඤ්චකාමයෙන් සමර්පිත, සමඞ්ගීභූත ගෘහපතීන් හෝ ගෘහපති පුත්‍රයන් හෝ දැක පඤ්චකාමය කැමති වෙති. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂ ද වෙයි.

7. ඇතැම් මහණ කෙනෙක් එසේ ද නොකරති. නමුත් එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කොට ගෙන "මම ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහමචර්‍ය්‍යායෙන් හෝ ප්‍රසිඬ දෙවියෙක් හෝ අප්‍රසිඬ දෙවියෙක් හෝ වෙම්වා"යි බ්‍රහමචර්‍ය්‍යාවෙහි හැසිරෙති. මෙයින් ද බ්‍රහමචර්‍ය්‍යාව ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂ ද වෙයි.

මේ සප්තවිධ මෛථුනය කරණ කොට ගෙන ද භික්‍ෂු-වගේ සීලය ඛණ්ඩද, ඡිද්‍රද, සබලද, කල්මාෂද වන බැවින් එයින් යුක්ත වූ, අපිරිසුදු බ්‍රහමචර්‍ය්‍යායෙහි හැසිරෙන භික්‍ෂුව, ජාති, ජරා, මරණාදී දුකින් නො මිදෙන්නේ ය.

## සීලයාගේ පිරිසුදු බව

සීලය **අඛණ්ඩ, අච්ඡිද්‍ර, අසබල, අකල්මාෂ** වීමෙන් පිරිසුදු වන්නේ -

1. සර්වාකාරයෙන් ශික්ෂාපද බිඳ නො ගැන්ම ය.

2. බිඳුණු යම් ශික්ෂාපදයකට ප්‍රතිකාර කරගත හැකි නම් එසේ ප්‍රතිකර්ම කර ගැනීම ය,

3. **සප්තවිධ මෛථුනයෙන්** වෙන් ව විසීම ය.

4. අන්‍යවූත් **ක්‍රොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, මාන, අතිමාන, මද, පමාද** යනාදී පාපධර්මයන් නොඉපදවීම ය.

5. **අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සල්ලෙඛතාදී** ගුණ ඉපදවීමය යන මේ කාරණාවන් හේතුකොට ගෙන ය.

තවද, යම් සීලයක්, **ලාභ, යස, ඥාති, අඞ්ග, ජීවිත** පිණිස හෝ නොබිඳ රැකගන්නා ලද්දේ ද, මෛථුන සංයොගයන්ගෙන් හෝ ක්‍රෝධ, උපනාහාදී පාපධර්මයන්-ගෙන් උපගත නොවූයේ වේද, ඒ සීලය සර්වප්‍රකාරයෙන් ම **අඛණ්ඩ, අච්ඡිද්‍ර, අසබල, අකල්මාෂ** වන්නේ ය.

ඒ සීලයම, තෘෂ්ණාදාස භාවයෙන් මුදන හෙයින් **භුජිස්ස** නම් වේ. බුද්ධාදීන් විසින් පසස්නා ලද බැවින් **විඤ්ඤුප්පසත්ථ** නම් වේ. තෘෂ්ණා දිට්ඨීන් විසින් ස්පර්ශ නොකල බැවින් **අපරාමට්ඨ** නම් වේ. උපචාර, අර්පණා, සමාධි උපදවන හෙයින් **සමාධිසංවත්තනික** නම් වේ

**සීලවොදානය** හෙවත් සීලයාගේ පිරිසුදු බව දෙයාකාර-යෙකින් සිදු වේ. එනම්:—

**1. සීලවිපත්තියෙහි ආදීනව දැකීමය.**

**2. සීලසම්පත්තියෙහි ආනිශංස දැකීමය.**

**සීලවිපත්තියෙහි ආදීනව** මෙසේ දත යුතු.

1. සීලවිපත්තියට පැමිණි දුශ්ශීලයා ප්‍රමාද හේතුවෙන් මහත් වූ භෝග හානියට පැමිණෙන්නේ ය.

2. ඔහුගේ ලාමක කීර්ති ශබ්දයක් පැන නගින්නේ ය.

3. ඔහු ක්‍ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහමණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ එළඹෙන කල්හි, අවිසාරදව, මකුව එළඹෙන්නේ ය.

4. ඔහු කළුරිය කරණ කල්හි සිහිමුළාව කළුරිය කරන්නේ ය.

5. ඔහු මරණින් මතු අපායෙහි උපදින්නේ ය.

තවද, මේ දුශ්ශීලයා, තම දුශ්ශීල භාවය නිසා දෙව්මිනිසුන්ට අප්‍රිය වෙයි.

පිළිකුල් කටයුතු පුද්ගලයෙකු වන හෙයින් සබ්‍රම්සරුන් විසින් අනුශාසනා නො කළ යුතු වන්නේ ය.

දුශ්ශීලයන්ට ගර්‍හා කරන කල්හි තෙමේ ද දුක්-වන්නේ ය.

සිල්වතුන්හට පසසන කල්හි විපිළිසර වන්නේ ය.

හණ වස්ත්‍රයක් මෙන් ගුණයෙන් හා ශරීරයෙන් ද දුර්වණීවේ.

දෘෂ්ටානුගතියට පැමිණෙන්නවුන්ට අපාය දුක් එළවන බැවින් දුස්සර්ශ ද වේ.

දන් දෙන්නවුන්ට මහත්ඵල නො කරන හෙයින් අල්පාර්ඝ ද වේ.

අවුරුදු ගණන් ඉක්මුණු අශුචි වළක් මෙන් දුශ්-ශොධ්‍ය වේ.

දරට ද, වැඩට ද නො ගතහැකි සොහොන් පෙනෙ-හෙල්ලක්මෙන් ගිහිකමින් ද, මහණකමින් ද බැහැර වන්නේ ය.

මමත් ගවයෙක්මි යි ගව සමූහයා අනුව යන කොටළුවකු මෙන් තෙමේ භික්‍ෂු යයි ප්‍රතිඥා කරතත්, භික්‍ෂුවක් නො වන්නේ ය.

සියල්ලනට වෛරී පුරුෂයකු මෙන් නිතර උද්වෙග වන්නේ ය.

මළමිණියක් මෙන් සහවාසයට සුදුසු නො වන්නේ ය.

බහුශ්‍රැතාදියෙන් යුක්ත නමුදු, බමුණන් විසින් නො සළකුණු ලබන සොහොන් ගින්න මෙන් සබ්‍රම්සරුන් විසින් නො පිදිය යුතු වන්නේ ය.

රූප නො දක්නා අන්ධයා මෙන් විශෙෂාධිගමයෙහි අභව්‍ය වන්නේ ය.

රාජ්‍යයෙහි සැඩොල් කොලු මෙන් සද්ධර්මයෙහි නිරාස වන්නේ ය.

දුකට හිමිව සිටින බැවින් තෙමේම සුඛිතයෙක් යයි සිතන්නේ නමුදු දුක්ඛිත ම වන්නේ ය.

**අග්ගික්ඛන්ධොපම** සූත්‍රය වදාරණ භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ට මහා ගිනිකඳක් පෙන්වා මෙසේ වදාළ සේක.

"මහණෙනි, අපිරිසුදු, සැක කටයුතු, හැසුරුම් වලින් යුත්, පිළිසන් කර්මාන්ත ඇති, අශ්‍රමණ ව ශ්‍රමණ යයි ප්‍රතිඥා කරන, අබ්‍රහ්මචාරී ව, බ්‍රහමචාරී යයි ප්‍රතිඥා කරන, ඇතුළ කුණු වූ, කෙලෙස් වලින් තෙත් වූ, හටගත් කෙලෙස් කසට ඇති, දුශ්ශීලයෙකු ඒ මහා ගිනිකඳ වැළඳ ගෙන හිඳීම හෝ නිදීම හෝ සොඳය. එයින් ඔහුට වන්නේ මරණය හෝ මරණ සමාන දුකෙකි. එයින් හෙතෙම අපායට නො යන්නේ ය. මහණෙනි, දුස්සීල ව, මෘදු මොළොක් අත් පා ඇති ක්‍ෂත්‍රියාදී කන්‍යාවක් වැළඳ ගෙන හිඳිනේ නම්, නිදියේ නම් එය ඔහුට අහිත පිණිස, දුක් පිණිස වන්නේ ය. එයින් හෙතෙම මරණින් මතු අපායට යන්නේ ය.

"මහණෙනි, සිවි, සම්, මස්, නහර ඇට සිඳ, ඇටමිදුලු දක්වා හැපී සිටිනසේ දැඩි වූ වල්රැහැණෙකින් ජඞ්ඝා දෙක වෙළා ඇදීම සොඳය, එයින් ඔහුට වන්නේ මරණය හෝ මරණය හා සමාන දුකෙක. එයින් හෙතෙම අපායට නො යන්නේ ය. මහණෙනි, දුශ්ශීල ව, හිඳ, ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, ගහපති මහා සාලයන්ගේ වැඳුම් ඉවසීම අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. එයින් හෙතෙම අපායට යන්නේ ය.

"තියුණු අඩයටියෙන් ලැමද පැහැරීම හොඳය. එයින් ඔහුට වන්නේ මරණය හෝ මරණ සමාන දුකෙකි. ඔහු එයින් අපායට නො යන්නේ ය. දුස්සීල ව ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, ගහපති මහාසාලයන්ගේ ඇදිලි ඉවසීම දුක් පිණිස වන්නේ ය. එයින් හෙතෙම අපායට යන්නේ ය.

"ගිනිගෙන දිලිසෙන යකඩ පටියකින් ඇඟ වෙළාලීම සොඳය, දුස්සීල ව, ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, ගහපති මහාසාලයන් විසින් දෙන ලද සිවුරු දැරීම දුක් පිණිස වන්නේ ය. එයින් අපායට ද යන්නේ ය.

"ගිනිගෙන දිලිසෙන යකඩ අඬුවකින් මුඛය විවෘත කොට, තොල්, මුව, දිව, උගුර, පපු, දවා අතුණු, අතුණු බහන් බැහැර යන සේ ඇවිළගත් ලොහෝ ගුලි මුඛයෙහි දමාලීම සොඳය. දුස්සීලව හිඳ ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, ගහපති මහාසාලයන් ශ්‍රද්ධාවෙන් දෙන පිණ්ඩපාතය වැළඳීම දුක් වන්නේ ය. අපායට ද යවන්නේ ය.

"හිස හෝ කඳ හෝ අල්වා ගෙන ගිනිගෙන දිලිසෙන ඇඳෙක හෝ පුටුවෙක හොවාලීම හෝ හිඳුවීම හෝ සොඳ ය. දුස්සීල ව, ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, ගහපති මහාසාලයන් ශ්‍රද්ධායෙන් දෙන ලද ඇඳ, පුටු පරිහරණය කිරීම දුක් පිණිස වන්නේ ය. අපායට ද යවන්නේ ය.

"පා උඩුකොට, හිස යටිකොට අල්වා ගෙන ගිනිගෙන දිලිසෙන ලෝහ කුම්භියෙක පෙණ නගමින් වරින්වර

උඩ යට සරස යන සේ හෙළාලීම් සොඳ ය, දුස්සීල ව, ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති මහාසාලයන් ශ්‍රද්ධායෙන් කරවන ලද විහාරයක විසීම දුක් පිණිස වන්නේ ය. අපායට ද යවන්නේ ය.

"මහණෙනි, තොප විසින් අපි යම් කෙනෙකුන්ගෙන් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර වළඳමු ද, ඔවුන්ගේ ඒ උපකාරය අප විසින් මහත්ඵල මහානිසංස කළ යුතු ය. අපගේ මහණකම ද වඳ නොකොට සඵල කරගත යුතු යයි හික්මිය යුතු. මහණෙනි, ආත්මාර්ථය හෝ පරාර්ථය හෝ උභයාර්ථය හෝ බලන්නහු විසින් අප්‍රමාදයෙන් සම්පාදනය කරගත යුතු ය."

මේ ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළ කල්හි සැටක් පමණ භික්‍ෂූන්ගේ මුඛයෙන් හුණු ලේ නැංගේ ය. සැටක් පමණ භික්‍ෂූහු, "ස්වාමීනි, දුස්කරය, අති දුස්කරය" යයි සිවුරු හැර ගිහි වූහ. සැටක් පමණ භික්‍ෂූහු රහත් වූහ.

## සීල සම්පත්තියෙහි ආනිසංස

යමෙකුගේ සීලය නිර්මල වන්නේ ද, ඔහුගේ පා සිවුරු දැරීම ප්‍රසාදජනක වන්නේ ය. ප්‍රව්‍රජ්‍යාව ද ඵලවත් වේ.

හිරු කරා අන්ධකාරය නො එළඹෙන්නාක් මෙන් පිරිසුදු සිල් ඇති භික්‍ෂුවගේ හෘදය කරා අත්තානුවාදාදී භය නොඑළඹෙන්නේ ය.

අහසෙහි චන්ද්‍රයා ප්‍රභාසම්පත්තියෙන් බබලන්නාක් මෙන් තපොවෙනෙහි සිල්වත් භික්‍ෂු තෙම සීලසම්පත්තියෙන් බබලන්නේ ය.

සිල්වත් භික්‍ෂුවගේ කායගන්ධය ද දෙවියන්ට ප්‍රිය වන්නේ ය. ශීලගන්ධය ගැන කියනුම කිම.

තගර මල්ලිකාදී සියලු ගන්ධ ජාතීන්ගේ සුවඳ අභිභවනය කොට සීල සුගන්ධය සියලු දිසාවන්හි නොපැකිල හමන්නේ ය.

සිල්වතුන් කෙරෙහි කළ සවල්ප ක්‍රියා ද මහත්ඵල වන්නේ ය. එ හෙයින් සිල්වන්තයා පරලොව දුක්ඛයන් ගේ මූල ද කණන්නේ ය.

මනුෂ්‍යයන් අතර ඇතිතාක් සැප ද, දෙවියන් අතර ඇතිතාක් සැප ද කැමැති වෙතොත් සීලවන්තයාට දුර්ලභ නො වේ.

අත්‍යන්ත ශාන්ත වූ යම් නිර්වාණ සම්පත්තියක් වේද සීලවන්තයාගේ සිත ඒ නිවන් සැප කරාම දිවන්නේ ය.

නුවණ ඇති තැනැත්තේ සියල් සැපතට මුල්වූ සීලයෙහි මෙසේ අනේකාකාර විධවූ ආනිසංස ප්‍රකාශ කරන්නේ ය.

මෙසේ සීලවිපත්තියෙහි ආදීනව හා සීලසම්පත්තියෙහි ආනිසංස ද දැන සීලය පිරිසුදු කරගැනීම පිණිස උත්සාහ කටයුතු.

උපසම්පන්න භික්ෂූන්ගේ අපරියන්ත පාරිශුද්ධි සීල වශයෙන් විස්තර දක්වන ලද නමුත් අනුපසම්පන්නයන් විසින් ද ගිහියන් විසින් ද තම තමන් විසින් රකිනු ලබන යම් සීලයෙක් වේද එහි ශික්ෂාපද බිඳ නොගෙන, කිළිටි කර නොගෙන, නැවත නැවත සමාදන්ව දැහැමෙන් සෙමෙන් දිවි පැවැත්වීමෙන් දෙලෝ අභිවෘද්ධිය සාදා ගත යුතු. මෙය පළමුවන සීල විශුද්ධිය නම්.

## 2. චිත්ත විශුද්ධිය

උපචාර සමාධි සහිත වූ අෂ්ටසමාපත්තිහු චිත්ත විශුද්ධි නම් වේ. එහි විස්තර යට සමාධි භාවනා ශීර්ෂයෙන් දක්වන ලද පරිදි දත යුතු.

# 3. දිට්ඨි විසුද්ධිය

නාම-රූප ධර්මයන්ගේ යථාවදර්ශනය හෙවත් ඇති සැටි දැකීම **දිට්ඨි විසුද්ධි** නම් වේ.

**දිට්ඨි විසුද්ධිය** ලබන පුද්ගලයෝ දෙදෙනෙකි. එනම්:-

1. **සමථයානිකයා** - **අරූප මුඛයෙන්** විදර්ශනාවට බැසගනී.

2. **ශුද්ධ විදර්ශනායානිකයා** - **රූප මුඛයෙන්** විදර්ශනාවට බැසගනී.

උපචාරධ්‍යාන සහිත වූ අෂ්ට සමාපත්තියෙහි පිහිටා විදර්ශනා වඩනු කැමැති **සමථයානික** යෝගාවචර තෙම පළමු කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය හැර සෙසු රූපාවචර-අරූපාවචර ධ්‍යානයන් අතුරෙන් යම් කිසි ධ්‍යානයකට සමවැද, එයින් නැගී, ඒ ධ්‍යානයෙහි අන්තර්ගත විතර්කාදී ඒ ඒ ධ්‍යානාඞ්ග හා ඒ හා සම්ප්‍රයුක්ත වූ ඵස්සාදී ධර්මයන් ද, ඔවුන්ගේ **ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන** වශයෙන් පිරිසිඳ දත යුතු. මෙසේ පිරිසිඳ දැන, ඒ සියලුම ධ්‍යානාඞ්ග හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද අරමුණට අභිමුඛව නැමෙන **නාම** යයි ව්‍යවස්ථා කට යුතු.

ඉක්බිති, යම්සේ පුරුෂයෙක් ඇතුළු ගෙයි සර්පයෙකු දැක ලුහුබැඳයන්නේ සර්පයාගේ වාසස්ථානය දක්නේ වේ ද, එ පරිද්දෙන් ම මේ යෝගාවචර තෙම ඒ නාමය නුවණින් පරීක්ෂා කරනුයේ, කුමක් ඇසුරු කොට පවත්නේ දැයි නැවත නැවත සොයනුයේ, එයට නිශ්‍රයස්ථාන වූ හෙවත් වස්තු වූ **හෘදය රූපය** දකී. ඉක්බිති ඒ හෘදය රූපයට නිශ්‍රය වූ **සතර මහා භූතයන්** ද, ඒ සතර මහා භූතයන් නිශ්‍රයකොට ගෙන පවත්නා **සෙසු උපාදාය රූපයන්** ද, රූප්පනය වන හෙයින් **රූපය** යයි ව්‍යවස්ථා කට යුතු.

මෙසේ අරමුණට නැමෙන **ලක්ෂණය** ඇති හෙයින් **නාමය** යයි ද, විකාරයට පැමිණීම හෙවත් රූපපන **ලක්ෂණය** ඇති හෙයින් **රූපය** යයි සැකෙවින් නාම-රූප යන් ව්‍යවස්ථා කරන්නේ ය.

# චතු ධාතු වශයෙන් පරිග්‍රහ කිරීම

1. රූප ධර්මයන් ව්‍යවස්ථා කරන ශුද්ධ විදර්ශනායානිකයා හෝ සමථයානිකයා හෝ **චතු ධාතු ව්‍යවස්ථානයෙහි** දක්වන ලද පරිදි සම්බන්ධ **ලක්ෂණය** පඨවිධාතුය යනාදි වශයෙන් ඒ ඒ ධාතු පරිග්‍රහ මුඛයන් අතුරෙන් එක්තරා මුඛයකින් සංක්ෂෙප වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ පඨවි, ආපො, තෙජො, වායො යන සතර ධාතූන් පරිග්‍රහ කෙරේ.

මෙසේ පරිග්‍රහ කොට සතර ධාතූන් ප්‍රකට වූ කල්හි පළමු කොට **කර්මයෙන් හටගත් කෙශයෙහි**, පඨවි, ආපො, තෙජො, වායෝ යන ධාතු සතර ද, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, කාය ප්‍රසාදය යයි **කාය දසක** වශයෙන් රූප දසයක් ද, එසේම **කර්මජ** වූ, භාවරූපය සහිත වූ **භාව දසක** වශයෙන් රූප දසයක් ද, **ආහාර සමුට්ඨාන වූ ශුද්ධාෂ්ටකය, ඍතු සමුට්ඨාන වූ ශුද්ධාෂ්ටකය, චිත්ත සමුට්ඨාන වූ ශුද්ධාෂ්ටකය** දැයි, **කර්ම, චිත්ත, ඍතු, ආහාර** සමුට්ඨානසත්ගේ වශයෙන් සූසාළිස් රූපයෙක් වෙයි. මෙසේ **කෙශාදි සූවිසි කොට්ඨාසයන්හි එකක්** පාසා චතුසමුට්ඨානික රූප සූසාළිස බැගින් සූවිසි කොටසෙහි ම **රූප එක් දහස් සපනසක්** (1056) වේ යයි දතී.

එසේම, **සෙද, අස්සු, ඛෙළො, සිඞ්ඝාණිකා** යන සතරකොටස්හි **ඍතුසමුට්ඨාන ශුද්ධාෂ්ටකය, චිත්ත සමුට්ඨාන ශුද්ධාෂ්ටකය** යයි **එක එක** කොටසෙහි රූප සොළොස (16) බැගින් **ඒ සතර** කොටසෙක්හි **ඍතු චිත්ත සමුට්ඨාන රූප සූසැටක්** (64) වේ යයි දතී.

එසේම, **උදරියං, කරීසං, පුබ්බං,** මුත්තං යන සතර කොටස්හි **උතුසමුට්ඨාන ශුද්ධාෂ්ටකය** බැගින් **දෙතිස් රූපයෙක්** (32) වෙයි

මෙසේ දෙතිස් කොට්ඨාසයන්හි රූපයෝ එක්දහස් එක්සිය පණස් දෙදෙනෙක් (1,152) වෙති. (1056 + 65 + 32 = 1152).

මේ දෙතිස් කොටස්හි රූපයන් ප්‍රකට වූ කල්හි, **තෙජෝ කොටස් සතර ද, වායු කොටස් සය ද** යන දස කොටස්හි ද රූප පරිග්‍රහය කෙරේ.

**තේජෝ** කොටස් සතර අතුරෙන් **අසිත, පීත, ඛායිත, සායිත,** අහර පැසවන කර්මජ තේජෝ ධාතු කොටසෙහි **ජීවිතින්ද්‍රිය සහිත වූ ඕජාටඨමක රූප** යයි **රූප නවයක්** (9) වෙයි.

සෙසු, **තවන, දිරවන,** දවන තෙජෝ කොටස් තුනෙහි **ජීවිත නවක කලාපයක්** හා **චිත්තජ, ඍතුජ, ආහාරජ** වශයෙන් ඕජාටඨමක කලාප තුන තුන බැගින් (9 + 24 = 33) තෙතිස් රූපයන්ගේ වශයෙන් **රූප අනූ නවයක්** වෙති. (33 × 3 = 99).

වායෝ ධාතු කොටස් සය අතුරෙන් චිත්තජ ආශ්වාස ප්‍රශ්වාස කොටසෙහි ශබ්ද නවක කලාපයෙක් වෙයි. **රූප නවයකි** (9).

සෙසු **උද්ධඞ්ගම වාත, අධොගම වාත, කුච්ඡිසය වාත, කොට්ඨාසය වාත, අඞ්ගමඞ්ගානුසාරි වාත** යන වායු කොටස් පසෙහි ද **ජීවිත නවක කලාපයක්** හා **චිත්තජ, ඍතුජ, ආහාරජ** වශයෙන් ඕජාටඨමක කලාප තුන තුන බැගින් (9 + 24) තෙතිස් රූපයන්ගේ වශයෙන් රූප එක්සිය සැටපසෙක් වෙති (33 × 5 = 165).

මෙසේ **තෙජෝ කොටස් සතරෙහි** සහ **වායෝ කොටස් සයෙහි ද** යන දස කොටස්හි රූපයෝ (9 + 99 + 9 + 165 = 282) **දෙසිය අසූදෙකක්** වෙති.

සතර ධාතු කොට්ඨාසයන්ගේ වශයෙන් පඨවි කොටස් (20) ය, ආපො කොටස් (12) ය, තෙජෝ කොටස් (4) ය, වායො කොටස් (6) ය යයි දෙසාළිස් (42) කොටස්හි මේ භූත රූප සතරත්, උපාදාය රූප සූවිස්සත් ප්‍රකට වූ කල්හි, යෝගාවචර තෙම **වස්තුමාර වශයෙන්** රූප පරිග්‍රහ කරන්නේ ය. ඒ **ෂඩ්වස්තූහු** නම්, **චක්ෂු, සොත, ඝාණ, ජිව්හා, කාය, හදයවත්‍ථු** යන වස්තූහු ය. **පඤ්චද්වාර** නම් **චක්ෂු, සොත, ඝාණ, ජිව්හා, කාය** යන ද්වාරයෝ ය. මොවුන්ගේ වශයෙන් **චක්ෂු දසකය, සොත දසකය, ඝාණ දසකය, ජිව්හා දසකය, කාය දසකය, හදයවත්‍ථු දසක** යයි දසක සයක් හෙවත් **රූප සැටක්** (60) වෙතියි ප්‍රකට වේ.

ඒ යෝගාවචර තෙම, මෙසේ ප්‍රකට වූ සියලු ම රූපයෝ රුප්පන ලක්ෂණයෙන් එකක් කොට ගෙන **රූපය** යයි නුවණින් දකී. ඉක්බිති හෙතෙම ද්වාර වශයෙන් **අරූප ධර්ම** ද පරිග්‍රහ කරන්නේ ය.

**දෙපස් විඤ්ඤාණයෝ ය, මනොධාතුත්‍රිකය,** සෙසු **අටසැටක් මනොවිඤ්ඤාණ ධාතුය** යනාදි වශයෙන් **එක් අසූවක් ලෞකික සිත්** ඔහුට ප්‍රකට වේ. ඒ සිත්හි සහජාත වූ **ඵස්සය, වේදනාය, සංඥාය, චේතනාය, ඒකග්ගතාය, ජීවිතින්ද්‍රියය, මනසිකාරය** යන සබ්බ චිත්ත සාධාරණ චෛතසික සත ද එසේ ම ප්‍රකට වෙති. මේ අරූපී ධර්මයන්හි අරමුණ කරා නැමෙන ලක්ෂණය ඇති හෙයින් **නාමය** යි දකී.

මෙසේ මේ යෝගාවචර තෙම චතු ධාතු ව්‍යවස්ථාන කිරීම් වශයෙන් නාම-රූප ධර්මයන් විනිශ්චය කරන්නේ ය.

## 2. අටලොස් ධාතු වශයෙන් පරිග්‍රහ කිරීම

මේ ශාසනයෙහි ඇතැම් මහණ කෙනෙක්, මේ ආත්ම භාවයෙහි **චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු**, ඇතැයි ආවර්ජනා කොට, ලෝකයා විසින්, සුදු, කලු, මණ්ඩලයෙන් විසිතුරු වූ දිග-පුළුල් ඇස්වලෙහි නහර හුයින් බඳනා ලද මස්පිඩුව **චක්ෂුස** යයි හඳුනා ද, එය නොගෙන යට රූප නිර්දේශයෙහි දක්වන ලද පරිදි උපාදාය රූපයන්ට ඇතුළත් වූ **චක්ඛු ප්‍රසාද රූපය, චක්ඛු ධාතුව** යයි ව්‍යවස්ථා කෙරේ.

එයට නිශ්‍රය වූ **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර මහා භූතයෝ ද, එහි පිරිවර වූ **වණ්ණ, ගන්ධ, රස, ඕජා** යන සතර රූපයෝ ද අනුපාලක ජීවිතින්ද්‍රිය රූපය දැයි මේ **සහජාත රූප නවය** ද, එහි ම පිහිටි කාය දසකය ද, භාව දසකය ද යනාදී වශයෙන් **විසි කර්මජ රූපයෙන්** ද ආහාර, ඍතු, චිත්ත යන ත්‍රිවිධ සමුට්ඨාන වශයෙන් ඕජට්ඨමක තුන බැගින් **සූවිසි අනුපාදින්නක** රූප දැයි මෙසේ චක්ෂු ප්‍රසාද රූපය හැර සෙසු තෙපනස් රූපයෝ (9 + 20 + 24 = 53) **චක්ඛු ධාතුව** නො වේ යයි ද ව්‍යවස්ථා කෙරේ.

සෝත ධාතු ආදීයෙහි මේ ක්‍රමයෙන් සෝත ප්‍රසාද රූපය **සෝත ධාතු** යයි ද එයට නිශ්‍රය වූ අවශෙෂ තෙපනස් රූපයෝ සෝත ධාතු නොවේ යයි ද, ඝාණ ප්‍රසාද රූපය, **ඝාණ ධාතුව** යයි ද එයට නිශ්‍රය වූ අවශෙෂ තෙපනස් රූපයෝ ඝාන ධාතු නොවේ යයි ද, ජිහ්වා රූපය **ජිව්හා ධාතුව** යයි ද එයට නිශ්‍රය වූ අවශෙෂ තෙපනස් රූපයෝ ජිව්හා ධාතු නොවේ යයි ද, කාය ප්‍රසාද රූපය, **කාය ධාතු** යයි ද, එයට නිශ්‍රය වූ සහජාත රූප නවය භාවදසකය, ආහාරාදී ත්‍රිසමුට්ඨාන ඕජාට්ඨමක රූප වශයෙන් සූවිසි රූප දැයි (9 + 10 + 24 = 43) තෙසාළිස් රූපයෝ කාය ධාතු නොවෙති යි ද ව්‍යවස්ථා කෙරේ.

මෙසේ පඤ්චප්‍රසාදයන් හා පඤ්ච ගොචර රූප වූ **රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, ඓාට්ඨබ්බ ධාතු** යයි ද **දස ධාතු** කෙනෙක් වෙති. සෙසු සූක්ෂ්ම රූපයෝ **ධම්ම ධාතු** නම්.

**"චක්ඛුං නිස්සාය රූපං ආරබ්භ පවත්තං චිත්තං චක්ඛු විඤ්ඤාණ ධාතු නාම"** යනුවෙන් චක්ෂු ප්‍රසාදය නිසා රූපය අරමුණු කොට පැවැති සිත **චක්ඛු විඤ්ඤාණ ධාතු** නම් වේ. මෙසේ ද්විපඤ්ච විඤ්ඤාණයෝ **පඤ්ච විඤ්ඤාණ ධාතුහු** වෙති.

**මනොධාතුත්‍රය** හෙවත් පඤ්චද්වාරාවර්ජනය සහ සම්පටිච්ඡනද්වය එකම **මනොධාතු නම්.**

සෙසු අටසැටක් (68) මනොවිඤ්ඤාණ ධාතු චිත්තයෝ **මනොවිඤ්ඤාණ ධාතු** නම්.

මෙසේ සියලුම එක්අසූ (81) ලෞකික චිත්තයෝ **සත්ත විඤ්ඤාණ ධාතු** නම් වෙත්.

මේ එක් අසූ චිත්තයන්හි සම්ප්‍රයුක්ත **ඵස්සාදි** චෛතසික ධර්මයෝ **ධම්ම ධාතු** නම් වෙත්.

මෙසේ චක්ෂුරාදි පස හා රූපාදි පස යන සම්පූර්ණ රූප දසය ද ධම්ම ධාතුවට අයත් ධර්මයන් අතුරෙන් සොළොස් සූක්ෂ්ම රූප ද ගෙන අඩ එකොළොස් (10½) **ධාතුහු රූප** යයි ව්‍යවස්ථා කෙරේ.

පඤ්ච විඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතු යන ධාතු සත (7) හා ධම්ම ධාතුවට අයත් ධර්මයන් අතුරෙන් දෙපනස් චෛතසික හා නිර්වාණය යයි **අඩඅටකම (7½ ක්)** නාම ධාතුහු **නාම ධර්මයො** යයි ව්‍යවස්ථා කෙරේ.

මෙසේ අඩක් අඩු එකොළොසක් (10½) **රූප ධාතු** හා අඩක් අඩු අටක් (7½) **නාම ධාතු** දැයි, අටළොස් (18) ධාතුහු වශයෙන් **නාම රූප** විනිශ්චය කෙරේ.

## 3. ද්වාදසායතන වශයෙන් පරිග්‍රහ කිරීම

යට කී පරිදි චක්ෂු ධාතුව නිශ්‍රය කොට ඇති තෙපනස් ධර්මයන් හැර **චක්ෂු ප්‍රසාද** මාත්‍රයම **චක්ඛායතන** නම් වේ. මෙසේ **සෝතප්‍රසාදය, සෝතායතනය** යයි ද, **ඝාණප්‍රසාදය, ඝාණායතන** යයි ද, **ජිව්හාප්‍රසාදය, ජිව්හායතනය** යයි ද, **කාය ප්‍රසාදය, කායායතනය** යයි ද, ඔවුන්ට විෂය වූ **රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ** යන පස **රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන** යයි ද, මෙසේ ආයතන දසයක් ද, ලෞකික වූ සප්ත විඥානධාතුහු **මනායතන** යයි ද, ඒ සිත් හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද සෙසු රූපයන් ද එක්කොට ගෙන **ධම්මායතන** යයි ද, මෙසේ දොළොස් ආයතන කෙනෙක් වෙති. එයින් **චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ** යන දස ආයතනයන් හා ධම්මායතනයට අයත් සූක්ෂම රූපයෝ දැයි අඩ එකොළොස් ($10\frac{1}{2}$) ආයතන කෙනෙක් **රූප** යයි ද **මනායතනයත් ධම්මායතනයට** ඇතුළත් සම්ප්‍රයුක්ත ධර්මත් යන අඩක් සහිත වූ එක් ($1\frac{1}{2}$) **නාම** යයි ද, මෙසේ දොළොස් ආයතනයන්ගේ වශයෙන් **නාම-රූප** ධර්ම විනිශ්චය කෙරේ.

## 4. ස්කන්ධ වශයෙන් පරිග්‍රහ කිරීම

මේ ශාසනයෙහි භික්ෂු තෙම මේ ශරීරය පිළිබඳ වූ **කර්ම, චිත්ත, ඍතු, ආහාර**, යන සතර ප්‍රත්‍යයෙන් හටගත් **පඨවි, ආපෝ, තේජෝ, වායෝ**, යන ධාතු සතරය. ඒ ධාතු නිශ්‍රය කොට ඇති **වණ්ණ, ගන්ධ, රස, ඕජා** සතරය. **චක්ෂු ප්‍රසාද, සෝත ප්‍රසාද, ඝාණ ප්‍රසාද, ජිව්හා ප්‍රසාද, කාය ප්‍රසාද** යන ප්‍රසාද පසය. **හදය වත්ථු රූපය, භාව රූපය, ජීවිතින්ද්‍රිය රූපය**, චිත්ත, ඍතු දෙකින් නිපන් **ශබ්දය** දැයි මේ සතළොස් (17) රූපයෝ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බැලීමට සුදුසු වූවාහු, කර්මාදි සතර ප්‍රත්‍යයෙන් නිපන්නාහු, රූපපන සවභාවයෙන් යුක්ත හෙයින් **රූප-රූප** නම් වෙති.

**කාය විඤ්ඤත්තිය, වාග් විඤ්ඤත්තිය, ආකාශ ධාතුය, රූපයාගේ ලහුතා, මුදුතා, කම්මඤ්ඤතාය, උපචය, සන්තති, ජරතා, අනිච්චතාය** යන මේ රූප දසය, අනිත්‍යාදි වශයෙන් බැලීමට සුදුසු නො වන හෙයින් ද, රූපයන්ගේ ආකාර, විකාර හා අතර පිරිසිඳීම් මාත්‍රය වූ හෙයින් ද **නිෂ්පන්න රූපයෝ** ද නො වෙති, රූප්පන ලක්ෂණයෙන් යුක්ත නොවූ හෙයින් ද **රූප-රූපයෝ** ද නොවෙති. එහෙත් රූපයන්ගේ ආකාර විකාර හා රූපාන්තර පරිච්ඡේද මාත්‍ර හෙයින් **රූපය** යයි ගණනට යෙති. මෙසේ මේ සත්විසි (27) රූපය **රූපස්කන්ධ** යයි ව්‍යවස්ථා කෙරේ.

එක් අසූවක් ලෞකික සිත් හා සම්ප්‍රයුක්ත වේදනාව **වේදනාස්කන්ධ** යයි ව්‍යවස්ථා කෙරේ.

එක් අසූවක් ලෞකික සිත් හා සම්ප්‍රයුක්ත සංඥාව **සංඥාස්කන්ධය** යයි ව්‍යවස්ථා කෙරේ.

එක් අසූවක් ලෞකික සිත් හා සම්ප්‍රයුක්ත සෙසු ඵස්සාදි සංස්කාරයෝ **සංස්කාරස්කන්ධය** යයි ව්‍යවස්ථා කෙරේ.

එක් අසූවක් ලෞකික සිත් **විඤ්ඤාණ ස්කන්ධය** යයි ව්‍යවස්ථා කෙරේ.

මෙසේ රූපස්කන්ධය **රූපය** යයි ද සතර **අරූප ස්කන්ධයෝ නාම** යයි ද **පඤ්ච ස්කන්ධ** මුඛයෙන් **නාම-රූප** ව්‍යවස්ථා කෙරේ.

## 5. සංක්ෂේප වශයෙන් නාම රූප පරිග්‍රහ කිරීම

රූප්පන ලක්ෂණයෙන් යුත් සියලු **පඨවි, ආපො, තෙජො, වායො** යන **සතරමහා භූතරූප** ද, ඒ භූත රූප ඇසුරු කොට පවත්නා සෙසු **සූවිසි (24) උපාදා රූප** ද යන මේ ආත්මභාවයෙහි ලැබෙන සියලු ම රූප සමූහය **රූප** යයි ද, **මනායතන** සහ ධර්මායතනයෙහි **එක**

දේශයක් වූ චෛතසික දෙපනස (52) හා විඥානය ද, නාම යයි ද ඉගෙන මේ නාමය ද, මේ රූපය ද, නාම - රූප යයි සැකෙවින් නාම-රූප ව්‍යවස්ථා කෙරේ.

ඉදින්, එසේ ඒ ඒ මුඛයෙන් රූප පරිග්‍රහ කොට, අරූප පරිග්‍රහ කරන ඒ යොගීහට, ඉතා සියුම් හෙයින් අරූපය මනාව නොවැටහේ ද, එහෙයින් ම වීර්‍ය්‍යය අත් නොහැර රූපය ම නැවත නැවත මෙනෙහි කළ යුතු. නුවණින් විමසිය යුතු. පිරිසිඳ දත යුතු. විනිශ්චය කළ යුතු.

යම් යම් පරිද්දෙකින් ඔහට රූපය මනාකොට, නිරවුල් ව පිරිසුදු ව වැටහේ නම් ඒ ඒ පරිද්දෙන් ම ඒ රූපය අරමුණු කොට පවත්නා නාම ධර්මයෝ ද ප්‍රකට වෙත්.

අපිරිසුදු කැඩපතකින් මුහුණ බලන්නාහට මුහුණ නො පෙනෙන්නේ නම්, එය ඉවත නො දමා, කැඩපත නැවත නැවත පිරිසුදු කොට මුහුණ බලන කල, ඒ කැඩපත පිරිසුදු හෙයින් මුහුණ හෙවත් මුඛ නිමිත්ත තෙමේ ම ප්‍රකට වේ.

තලතෙල් ලබා ගැනීම පිණිස තලපිටි බඳුනක දමා දිය ඉස වරක් දෙකක් මිරිකීමෙන් තෙල් නො ලැබුණු පමණින් එය ඉවත නො දමා, නැවත, නැවත ද උණුදිය ඉස මඩින කල ඔහුට තලතෙල් ලැබේ.

ජලය පිරිසුදු කරනු කැමැති පුද්ගල තෙම ඉඟිනි ඇට ගෙන කළය තුල අත බහා වරක් දෙකක් ගැටූ පමණින් ජලය පිරිසුදු නො වේ යයි කියා ඉඟිනි ඇට ඉවත නො දමා නැවත නැවත ගැටෙන කල තුනී මඩ යටට බැස ජලය මනාව පැහැදීමෙන් ඔහුට පිරිසුදු ජලය ලැබේ.

එ පරිද්දෙන් යෝගාවචරයා විසින් ද භාවනාව අත් නොහැර, වීර්‍ය්‍යය අඩු නො කොට රූපය ම නැවත නැවත සම්මර්ශනය කට යුතු, මෙනෙහි කට යුතු, පරිග්‍රහ කට යුතු. විනිශ්චය කට යුතු.

මෙසේ රූපය යම් පරිද්දෙකින් මනා ව, ප්‍රසන්න ව, නිරවුල් ව, පිරිසුදු ව වැටහේ නම් එ පරිද්දෙන් ම මඩ මතුයෙහි ජලය පිරිසුදු වන්නාසේ, ඒ අරූප ධර්ම සම්මර්ශනය කරන්නා වූ ඥානයට ප්‍රතිපක්‍ෂ වූ කෙලශයෝ යටට බසිත්, සිත ප්‍රසන්න වේ. ඒ රූප ධර්මයන් අරමුණු කොට ඇති අරූප ධර්මයෝ තුමූ ම ප්‍රකට වෙත්.

පිරිසුදු කොට රූප පරිග්‍රහය කළ යෝගාවචරයාහට **අරූප ධර්මයන්** තුන් ආකාරයෙකින් වැටහෙත්. එනම්:-

1. **ස්පර්ශ වශයෙන්**
2. **වෙදනා වශයෙන්**
3. **විඥාන වශයෙන්**

**1. පඨවි ධාතුව** - කර්කශ බව **ලක්‍ෂණ** කොට ඇත්තේ ය. යනාදි වශයෙන් ධාතූන් පරිග්‍රහ කරන්නාවූ යෝගවචරයාහට ඇතැම් විට **ස්පර්ශය** පළමු කොට අරමුණු වේ. ඒ ස්පර්ශ සම්ප්‍රයුක්ත වේදනාව, **වෙදනා ස්කන්ධය** ය, සංඥාව **සංඥාස්කන්ධය** ය, ස්පර්ශය ඇතුළු වූ චෙතනාදී චෛතසික සමූහය **සංස්කාරස්කන්ධය** ය, සිත **විඥානස්කන්ධය** යයි වැටහේ.

එසේම කෙශයෙහි කර්කශ බව **පඨවි ධාතුය,** ලොම යෙහි කර්කශ බව ද **පඨවි ධාතුය** යනාදි වශයෙන් සියලු කොටස්හි ම කර්කශ බව පඨවි ධාතු යයි ගෙන එම අරමුණෙහි පළමුව පතිතවූයේ **ස්පර්ශය ය.** ඒ හා යෙදුන වෙදනාව, **වෙදනාස්කන්ධය** ය, සංඥාව **සංඥාස්කන්ධය** ය, ස්පර්ශය ඇතුළු චෙතනා දී චෛතසික සමූහය **සංස්කාර ස්කන්ධය** ය, සිත **විඥානස්කන්ධය** ය යනාදී වශයෙන් අරූප ධර්මයන් **ස්පර්ශ වශයෙන්** වැටහෙත්.

2. **අනෙක් යෝගාවචරයෙකුහට** පඨවි ධාතුව **කර්කශ** බව **ලක්‍ෂණ** කොට ඇත්තේ ය. ඒ පඨවි ධාතු නම් වූ

අරමුණෙහි රස අනුභව කරන වේදනාව, **වේදනාස්කන්ධය** ය. ඒ හා යෙදෙන **සංඥාව, සංඥාස්කන්ධය** ය, ඒ හා යෙදෙන ස්පර්ශය හා චේතනාදී චෛතසිකයෝ **සංස්කාරස්කන්ධය** ය, සිත **විඥානස්කන්ධය** යයි වැටහේ.

එසේම කෙශාදී කොට්ඨාසයන්හි පඨවි ධාතුව කර්කශ බව ලක්ෂණ කොට ඇත්තේ ය. ඒ අරමුණු කොට ඇති, රසානුභවණය ලක්ෂණ කොට ඇති වේදනාව **වේදනා ස්කන්ධය** ය, සංඥාව **සංඥාස්කන්ධය** ය, ස්පර්ශය හා චේතනාදී සම්ප්‍රයුක්ත ධර්මයෝ **සංස්කාරස්කන්ධය** ය, **සිත විඥානස්කන්ධය** ය යයි වැටහේ. මෙසේ **වේදනා වශයෙන්** අරූප ධර්මයන් වැටහෙත්.

3. අනෙක් යෝගාවචරයෙකුහට පඨවි ධාතුව කර්කශ බව ලක්ෂණ කොට ඇත්තේ ය. ඒ අරමුණු දැනගන්නාවූ විඥානය, **විඥානස්කන්ධය** ය, ඒ හා සම්ප්‍රයුක්ත වේදනාව **වේදනාස්කන්ධය** ය, සංඥාව, **සංඥාස්කන්ධය** ය, ස්පර්ශය සහිත වූ, චේතනාදී චෛතසික ධර්මයෝ **සංස්කාරස්කන්ධය** යයි වැටහෙත්. මෙසේ **විඥාන වශයෙන්** අරූප ධර්මයෝ වැටහෙත්.

මේ ක්‍රමයෙන් ම, කර්මයෙන් හටගන්නා කෙසෙහි පඨවි ධාතුව කර්කශ ලක්ෂණය ය යනාදී වශයෙන් සියලු ම දෙසාලිස් ධාතු කොටස්හි සතර සතර ධාතු වශයෙන් සෙසු චතුධාතු ආදී රූප පරිග්‍රහ මුඛයන්හි සියලු නය භෙදය අනුව ගොස් අර්ථ යොදා ගත යුතු.

මෙසේ මනා කොට, පිරිසුදු කොට පවත් වන ලද රූප පරිග්‍රහ ඇත්තා වූ යෝගාවචරයාහට ම නාම ධර්මයන් **ස්පර්ශ, වේදනා, විඥාන** යන තුන් ආකාරයෙන් ප්‍රකට වන හෙයින් ඒ එවැනි සුපරිශුද්ධ රූප පරිග්‍රහ ඇත්තහු විසින් ම **නාම ධර්මයන්,** පරිග්‍රහ කිරීම පිණිස යෝග කට යුතු. එසේ නැත්තකු විසින් යෝග නො කට යුතු.

මෙ පරිද්දෙන් යෝගාවචර තෙම, සතර නාමස්කන්ධයෝ **නාම** යයි ද, ඔවුන්ට අරමුණු වූ සතර මහා භූත හා සූවිසි උපාදාය රූපයෝ ද **රූප** යයි ද මෙසේ **නාම-රූප** ධර්ම ව්‍යවස්ථා කෙරේ.

මෙසේ **අටළොස් ධාතුය, දොළොස් ආයතනය, පඤ්චස්කන්ධය** යනාදී වශයෙන් සියලු ත්‍රෛභූමික ධර්මයන් කඩුවකින් සුමුගුවක් විවෘත කරන්නහු මෙන් ද, යමක තල්කඳක් දෙබෑ කොට පළන්නකු මෙන් ද, **නාමය** ද, **රූපය** ද දෙපරිද්දෙකින් විනිශ්චය කෙරේ. **නාම රූප** මාත්‍රයක් මුත් අන්‍ය වූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැතැයි නිෂ්ඨාවට පැමිණේ. යෝගාවචර තෙම ඇති සැටියෙන් නාම-රූප ධර්මයන් නියම කොට දැන සත්ත්වය ය, පුද්ගලය ය යන මුළාව දුරු කරනු පිණිස, නුමුළා බැව්හි සිත පිහිටුවීම පිණිස, අන්‍යවූ බොහෝ සූත්‍ර දේශානුසාරයෙන් ද "මේ ධර්ම ස්වභාවය, නාම-රූප මාත්‍රයක් ම වේ. සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත්තේය"යි දැන විනිශ්චය කෙරේ.

"රථය සෑදීමට උවමනා උපකරණ රැස් කොට සාදා ගත් කල්හි **රථය** යයි වචනයෙන් එය හඳුනාගනු ලැබේ ද, එ පරිද්දෙන් රූපාදී ස්කන්ධයන් ඇති කල්හි **සත්ත්වයෙක** යන ව්‍යවහාරය පවතී".

"ලී දඬු ද, වැල් ද, මැටි ද, තණ ද නිසා අහසින් පිරිවරන ලද්දේ ගෙය යයි ව්‍යවහාර වන්නාසේ ඇට, නහර, මස්, සම නිසා අහස පිරිවරන ලද්දේ ශරීරය යි ව්‍යවහාරයට යේ."

"දුකම උපදී, දුකම පවතී, දුකම වැනසෙති, දුකින් පිට අන් කිසිවක් නූපදී. දුකින් පිට අන් කිසිවක් නො නැසේ."

මෙසේ නොයෙක් ආකාරයෙන් විමසා, පඤ්චුපාදාන ස්කන්ධයන් ඇති කල්හි සත්ත්වය ය, පුග්ගලය යන ව්‍යවහාර මාත්‍රය වේ. පරමාර්ථ වශයෙන් රූපාදී එක එක ධර්මයක්

වෙත් වෙත් වශයෙන් පරීක්‍ෂා කරන කල්හි "මම වෙමි" යන **අස්මිමානය** ද, **මම** ය යන **ආත්මවාදය** ද ගැනීමට වස්තු වූ කිසි සත්ත්වයෙක් නැත. හුදෙක් පරමාර්ථ වශයෙන් **නාම - රූප** මාත්‍රයක් ම ඇත්තේ ය යි මෙසේ නුවණින් බලන්නාහුගේ දැකීම, ඇති සැටි දැකීම නම් වූ **යථාභූත දර්ශනය** නම් වේ.

යමෙක් සත්ත්වයෙක් ඇතැයි ගනී නම්, හෙතෙම ඒ සත්ත්වයාගේ **විනාශය** හෝ භවයෙන් භවයට යන්නේ යයි යන **අවිනාශය** හෝ අනුදන්නේ ය. ඉදින් අවිනාශය අනුදන්නේ නම් ශාසවත දෘෂ්ටියෙහි වැටේ. විනාශය අනුදන්නේ නම් උච්ඡේද දෘෂ්ටියෙහි වැටේ.

තවද, භාග්‍යවතුන් වහන්සේ වදාරණ සේක්:-

"මහණෙනි, ශාසවත - උච්ඡේද යන දෘෂ්ටි දෙකින් වැඩුණු දිව්‍ය, මනුෂ්‍යයන් අතුරෙන් ඇතැම් කෙනෙක් ශාසවත වශයෙන් භවයෙහි ඇලෙති. සමහරෙක් උච්ඡේද වශයෙන් අතිධාවනය කෙරෙත්. ඇති තතු පිරිසිඳ දන්නා නුවණැස් ඇත්තෝ පරමාර්ථ සත්‍යය දකී.

"මහණෙනි, ඇතැම් දෙව් - මිනිස් කෙනෙක් භවයෙහි ඇළුනාහු භවයෙහි සතුටු වූවාහු වෙති. ඔවුනට භවය නැති කිරීම පිණිස ධර්ම දේශනා කරන කල්හි සිත එහි නො පිවිසේ, නො පැහැදේ, නො පිහිටයි, නිශ්චයට නො පැමිණේ. මහණෙනි, මෙසේ ඇතැම් දෙව් - මිනිස්සු භවයෙහි ඇලෙති.

"මහණෙනි, ඇතැම් දෙව් - මිනිස් කෙනෙක් භවයෙන් පීඩිත වන්නාහු හරිවට පැමිණියාහු, පිළිකුලට පැමිණියාහු, විභව සඞ්ඛ්‍යාත උච්ඡේදය කැමැති වෙයි. යම් හෙයකින් මේ ආත්මය මරණින් මතු උච්ඡේද වේ ද, විනාශ වේ ද, මරණින් මතු නොවේ ද, මේ විභවය, ශාන්තය, ප්‍රණීතය, ඇති සවභාව යැයි මෙසේ උච්ඡේදය පිළිගනී. මහණෙනි, මෙසේ ඇතැම් කෙනෙක් උච්ඡේද වශයෙන් අතිධාවනය කෙරෙති.

"මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ පඤ්චස්කන්ධය, පඤ්චස්කන්ධය වශයෙන් දකී. පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධය සේ දැක, භූත සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, නිරොධය පිණිස පිළිපන්නේ වේ. මහණෙනි, මෙසේ ඇස් ඇත්තෝ දකිති. යම්සේ දැරූ යන්ත්‍රය ශූන්‍ය වූයේ, නිර්ජීව වූයේ, උත්සාහ නැත්තේ වේද, එතකුදු වුවත් දැවය, රැහැන් ය, යන මේ දෙය එකතුවීමෙන් යන්නේ වේද, සිටින්නේ වේද, උත්සාහ ඇත්තක්හු මෙන් වැටහේ ද, එසේ මේ නාම රූප දෙක ද සිස්වූයේ ජීවයක් නැත්තේ, උත්සාහ නැත්තේ, වේ. එතකුදු වුවත් ඔවුනොවුන් එකී භාවයෙන් යන්නේ ද, සිටින්නේ ද වේ. උත්සාහ සහිත වූ ව්‍යාපාර සහිත වූවක් මෙන් වැටහෙන්නේ ද වේ."

තවද, බට මිටි දෙකක් එකිනෙක නිසා පවත්නා කල එකක පැවැත්මට එකක් වහල් වේ. එකක් වැටෙන කල දෙකම වැටේ. එසේම පඤ්චවොකාර භවයෙහි නාම – රූප දෙක ඔවුනොවුන් නිසා පවතී. එකක් එකකට උපස්ථම්භක වේ. මරණ වශයෙන් එකක් වැටෙන කල අනික ද වැටේ.

තවද, දඹුවෙන් පහළ බෙරය නිසා ශබ්දය පවත්නා කල බෙරය හා ශබ්දය අමිශ්‍රය. බෙරය ශබ්දයෙන් ශූන්‍යය. ශබ්දය ද බෙරයෙන් ශූන්‍යය.

එපරිද්දෙන් ම වස්තු ය, ද්වාරය, ආලම්බනය යන රූපයන් නිසා නාම ධර්මයන් පවත්නා කල රූපය අනිකෙක. නාමය ද අනිකෙක්ම ය. **නාම – රූප** දෙක ඔවුනොවුන් හා අමිශ්‍රය. **නාමය** රූපයෙන් ශූන්‍යය. රූපය ද නාමයෙන් ශූන්‍යය. එහෙත් රූපය නිසා නාමය පවතී.

**නාම රූප** – දෙකින් **නාමය** තෙද නැත්තේ ය. ස්වකීය තේජසින් පැවතිය නොහේ. නොකයි, නොබොයි,

නොබෙණේ, ඉරියව් නොපවත්වයි. **රූපය** ද තෙද නැත්තේ ය. සවකීය තේජසින් පැවතිය නොහේ ඒ රූපයට කනු කැමැති බවක්, බොනු කැමැති බවෙක්, බණනු කැමැති බවෙක්, ඉරියව් පවත්වනු කැමැති බවෙක් නැත. නාමය නිසා රූපය පවතී. රූපය නිසා නාමය පවතී. නාමයට කනු කැමැති බවක් ද, බොනු කැමැති බවක් ද, බණනු කැමැති බවක් ද, ඉරියව් පවත්වනු කැමැති බවක් ද ඇති වූ කල්හි රූපය කයි, බොයි, බෙණෙයි, ඉරියව් පවත්වයි.

ජාත්‍යන්ධයෙක් ද, පිළෙක් ද ගමනක් යනු කැමැත්තාහු, ජාත්‍යන්ධයා පිළාට කියනුයේ, "යහළුව, මට පයින් යා හැකිය, නමුත් මාර්ගයෙහි සමවිසම තැන් බැලීමට ඇස් නැත." පිළාද, "යහළුව, මම ඇසින් බැලිය හැක්කෙමි. එහෙත් යාම් – ඊම් කිරීමට පා නැතැයි අන්ධයා කීය. එවිට ජාත්‍යන්ධයා පිළාව තම උරහිස නංවා ගත්තේය. පිළාද අන්ධයාගේ උරහිස නැග මෙසේ යව, මෙසේ හැරෙව දකුණට යව, දකුණට හැරෙව යනාදී වශයෙන් කියයි. මෙහි ජාත්‍යන්ධයා ද තෙද නැත්තේය. දුබලය, තමාගේ තේජසින් හෝ බලයෙන් ද යා නොහැකිය. පිළාද තෙද නැත්තේය, දුබලය, තමාගේ තේජසින් හෝ බලයෙන් ද යා නොහැකිය, එහෙත් ඔව්හු දෙදෙන, ඔවුනොවුන් නිසා ගමන කෙරෙත්.

එමෙන් ම **නාමය** ද තෙද නැත්තේ ය. තමා තෙදින් නූපදී. ඒ ඒ ක්‍රියාවන්හි නො පවතී. **රූපය** ද තෙද නැත්තේ ය. තමා තෙදින් නූපදී තමා අයත් ඒ ඒ ක්‍රියාවන්හි නො පවතී. **එහෙත්** නාම – රූප ඔවුනොවුන් නිසා උපදනේ ද, පවත්නේ ද වේ.

මෙසේ නා නා නයින් **නාම – රූප** විනිශ්චය කරන යෝගාවචරයාගේ **සත්ත්ව සංඥාව** මැඩ, නුමුළා බැව්හි සිටී.

නාම – රූපයන්ගේ ඇති තතු දැනීම හෙවත් යථා දර්ශනය **දිට්ඨි විසුද්ධි** නම් වේ. මේ දිට්ඨිවිසුද්ධියට ම **නාම**

**රූප ව්‍යවස්ථානය** යයි ද **සංස්කාර පරිච්ඡේදය** යයි ද කියනු ලැබේ. මෙසේ විදර්ශනා භාවනා කරන යෝගාවචර තෙම **සීලවිසුද්ධි** වශයෙන් සිල් පිරිසුදු කොට ගෙන, උපචාර අර්පණාදී වශයෙන් **චිත්තවිසුද්ධිය** ලබා නාම රූප යන්ගේ ඇති සැටි දැකීමෙන් **දිට්ඨිවිසුද්ධි** වශයෙන් ද පිරිසුදු වෙයි.

## 4. කඞ්ඛාවිතරණ විසුද්ධිය

නාම-රූප ධර්මයන්ගේ ප්‍රත්‍යය පිරිසිඳීමෙන් තුන් කල්හි පැවැති සැක දුරු කොට සිටි **ඤාණය කඞ්ඛාවිතරණ විසුද්ධි** නම් වේ.

දක්ෂ වෛද්‍යවරයෙක් රෝගයක් දැක එහි නිදානය නොහොත් ඒ රෝගයට හේතුව සොයන්නාසේ ද, වීපියක වැටීහුන් ළදරුවෙකු දැක අනුකම්පා ඇති එක් පුරුෂයෙක් මේ කවරෙකුගේ දරුවෙක් දැයි ඔහුගේ මව්පියන් සොයන්නා සේද, මේ **කඞ්ඛාවිතරණ විසුද්ධිය** ලබාගනු කැමැති මහණ තෙම නාම - රූප ධර්මයන්ගේ හේතු ප්‍රත්‍යය සෙවීමෙහි නියුක්ත වෙයි.

ඒ යෝගාවචර තෙම මෙසේ සලකයි:-

1. මේ නාම - රූප ධර්මයෝ සියලු තන්හි, සියලු කල්හි, සියල්ලනට සමව නො පැමිණෙන හෙයින් අහේතුක නොවෙති.

2. නාම - රූප දෙකින් මත්තෙහි ඊශ්වරාදී මැවුම් කාරයෙකු නැති හෙයින් ඊශ්වරාදී හේතුවකින් ද හට-ගත්තේ ද නොවේ.

එහෙයින් ඒකාන්තයෙන් ම, මේ නාම - රූප දෙදෙනාට හේතු ප්‍රත්‍යය ඇති විය යුතු යයි සලකා ඒ හේතු ප්‍රත්‍යය කවරේදැයි පරීක්ෂා කරයි.

පළමු කොට **රූපකායයට** හේතු ප්‍රත්‍යය මෙසේ සොයයි.

මේ කය උපදනා කල්හි උපුල්, පියුම්, හෙළ පියුම්, හෙල්මැලි ආදීන්ගේ අභ්‍යන්තරයෙහි නූපදී. මුතුමැණික් ආකාරයක හෝ නූපදී. නො පැසුණු අහර ඇති **ආමාශය** ද පැසුණු ආහාර ඇති **පක්වාශය** ද යන මොවුන් අතරෙහි වූ උදර පටලයට පිටුපා පිටිකටුව පෙරටු කොට, අතුණු, අතුණුබහන් පිරිවරා, තෙමේත් දුගඳව, පිළිකුල්ව, අතිශයින් දුක් සහිත වූ ස්ථානයෙහි කුණු මස්, කුණු කුණප, කුණු කොමු, ගම්දොර, ගවරවළ, අසූචි වළය යනාදී තැනෙක පණුවකු මෙන් උපදී.

එසේ උපදනා ඔහුට **අවිද්‍යාව, තෘෂ්ණාය, උපාදානය, කර්මය** යන මොව්හු උපදවනා හෙයින් **හේතු** නම් වෙති. **ආහාරය** උපස්ථම්භක භාවයෙන් උපකාර වන හෙයින් **ප්‍රත්‍යය** වේ. මෙසේ මේ ධර්ම පස හේතු ප්‍රත්‍යයෝ වෙති. ඒ හේතු ප්‍රත්‍යයන් අතුරෙන් **අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන** යන තුන ළදරුවෙකුට මවක් මෙන් මේ කයට **උපනිශ්‍රය** වේ. **කර්මය** පුතාට පියා මෙන් **ජනක** වශයෙන් හේතු වේ. **ආහාරය,** ළදරුවාට කිරිමව මෙන් ධරා සිටින හෙයින් **සන්ධාරක** වශයෙන් උපකාර වේ.

මෙසේ රූපකායයට ප්‍රත්‍යය පරිග්‍රහ කොට ඉක්බිති නාමකායයට ප්‍රත්‍යය පරිග්‍රහ කරන්නේ **"චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"** යනාදී වශයෙන් චක්ෂු ප්‍රසාදය ද රූපාරම්මණය ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. සොත ප්‍රසාදය ද, ශබ්දාරම්මණය ද නිසා සොත විඤ්ඤාණය උපදී. මේ ක්‍රමයෙන් සියලු නාම ධර්මයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ.

මෙසේ ප්‍රත්‍යය වශයෙන් නාම රූපයන්ගේ පැවැත්ම දැක, මේ **නාම-රූප ධර්මයෝ** දැන් පවත්නාක් මෙන් ම අතීතයෙහි ද හේතු ප්‍රත්‍යය නිසා පැවැත්තේ ය. අනාගතයෙහි ද හේතු ප්‍රත්‍යය නිසා පවත්නේ යයි දකී.

මෙසේ බලන්නා වූ ඒ යෝගාවචරයාගේ **පූර්වාන්ත** සඞ්ඛ්‍යාත **අතීත ස්කන්ධ පඤ්චකය** අරභයා (1) මම

අතීත කාලයෙහි සිටියෙම් ද, (2) නොසිටියෙම් ද, (3) කවරෙක්ව සිටියෙම් ද, (4) කෙබන්දෙක්ව සිටියෙම් ද, (5) කවරෙක්ව සිට කවරෙක් වූයෙම් ද මෙසේ පස් ආකාර වූ අතීතය පිළිබඳ විචිකිච්ඡාව ප්‍රහීණ වේ.

එසේම අපරාන්ත සඞ්ඛ්‍යාත අනාගතාධ්වය අරභයා- (1) අනාගත කාලයෙහි මම වන්නෙම් ද, (2) නො වන්නෙම් ද, (3) කවරෙක් වන්නෙම් ද, (4) කෙබන්දෙක් වන්නෙම් ද, (5) කවරෙක්ව කවරෙක් වන්නෙම් දැයි පස් ආකාර වූ අනාගතය පිළිබඳ විචිකිච්ඡාව ප්‍රහීන වේ.

වර්තමාන සකන්ධ පඤ්චකය අරභයා: (1) මම වෙම් ද, (2) නොවෙම් ද, (3) කවරෙක් වෙම් ද, (4) කෙසේ වෙම් ද, (5) මේ සත්ත්ව තෙම කොයි සිට මෙහි ආවේ ද, (6) නැවත කොහි යන්නෙහි දැයි මෙසේ වර්තමානය පිළිබඳව සය ආකාර වූ විචිකිච්ඡාව දැයි මෙසේ කාලත්‍රය පිළිබඳ සොළොස් ආකාර විචිකිච්ඡා ප්‍රහීණ වේ.

අනෙක් යෝගාවචර කෙනෙක්, නාමකාය පිළිබඳ වූ සාධාරණ, අසාධාරණ වශයෙන් දෙයාකාර වූ ප්‍රත්‍යය බලයි. රූපකාය පිළිබඳ කර්මාදි වශයෙන් චතුර්විධ ප්‍රත්‍යය බලයි.

නාමකාය පිළිබඳ වූ සාධාරණ, අසාධාරණ ප්‍රත්‍යයන් අතුරෙන්, චක්ෂුරාදි ෂඩ්ද්වාරයන් හා රූපාදි ෂඩාරම්මණ ය ද නාමයට සාධාරණ ප්‍රත්‍යය වෙති. කුසලාකුසල විපාක ක්‍රියා භෙදයෙන් සර්වප්‍රකාර වූ නාමය, චක්ෂුරාදි ද්වාරයෙන් රූපාදි සාරම්මණෙහි පවත්නා හෙයිනි.

**මනසිකාරාදිය නාමයාගේ අසාධාරණ ප්‍රත්‍යයෝය.**

**යොනිසොමනසිකාර, සද්ධර්මශ්‍රවණාදිය** කුසලයටම අසාධාරණ ප්‍රත්‍යයෝ ය.

**අයොනිසොමනසිකාර, අසද්ධර්මශ්‍රවණාදිය** අකුසලයටම අසාධාරණ ප්‍රත්‍යයෝ ය.

**කර්ම, අවිද්‍යා, ගති, කාලාදිය** විපාකයට අසාධාරණ ප්‍රත්‍යයෝ ය.

**භවාඞ්ගාදිය** ක්‍රියා චිත්තයට අසාධාරණ පත්‍යයෝ ය.

**රූපයට, කර්මය, චිත්තය, ඍතුය, ආහාරය** යන ප්‍රත්‍යයෝ සතර දෙනෙක් වෙති.

එයින් **අතීත වූ කර්මයම,** කර්මසමුට්ඨාන රූපයට ප්‍රත්‍යය වේ.

**චිත්තය,** චිත්තසමුට්ඨාන රූපයට උත්පාදක්ෂණයෙහි ම ප්‍රත්‍යය වේ.

**ඍතු, ආහාර** දෙක, ඍතුජ, ආහාරජ රූපයනට ස්ථිතික්ෂණයෙහිදී ප්‍රත්‍යය වෙත්.

මෙසේ මේ යෝගාවචර තෙම **නාම-රූප ධර්මයන්** පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහ කොට, නාම-රූපයන්ගේ පැවැත්ම බලා; මේ නාම-රූපයෝ වර්තමානයෙහි පවත්නාසේ අතීතයෙහි ද ප්‍රත්‍යය වශයෙන් පැවැත්තේ ය. අනාගතයෙහි ද ප්‍රත්‍යය වශයෙන් පවත්නේ යයි නුවණින් බලයි. මෙසේ බලන ඒ යෝගීහට **තුන් කල්හි ම විචිකිච්ඡාව** යට දැක් වූ පරිද්දෙන් ප්‍රහීණ වේ.

අනෙක් යෝගාවචර කෙනෙක්, **නාම-රූප සඞ්ඛ්‍යාත සංස්කාරයන්ගේ ජරාවට පැමිණීම ද, ජරාවට පැමිණියවුන්ගේ භඞ්ගය** ද දැක. මේ සංස්කාරයන්ගේ **ජරා මරණය උත්පත්තිය** ඇති කල්හි වේ. **ජාතිය කර්ම** භවය ඇති කල්හි වේ. **භවය** උපාදානය ඇති කල්හි වේ. **උපාදානය** තෘෂ්ණාව ඇති කල්හි වේ. **තෘෂ්ණාව** වේදනාව ඇති කල්හි වේ. **වෙදනාව** ස්පර්ශය ඇති කල්හි වේ. **ස්පර්ශය** ෂඩායතනය ඇති කල්හි වේ **ෂඩායතනය** නාම-රූප ඇති කල්හි වේ. **නාම-රූප** විඥානය ඇති කල්හි වේ. **විඥානය** සංස්කාර ඇති කල්හි වේ. **සංස්කාර** අවිද්‍යාව ඇති කල්හි වේ. මෙසේ **ප්‍රතිලොම පටිච්චසමුප්පාද**

වශයෙන් නාම-රූපයන්ගේ ප්‍රත්‍යය නිශ්චය කෙරේ. එකල්හි ඔහුගේ තුන් කල්හි විචිකිච්ඡාව යට දක්වන ලද පරිදි ප්‍රහීණ වේ.

අනෙක් යෝගාවචර කෙනෙක්. **අවිද්‍යා** ප්‍රත්‍යයෙන් **සංස්කාර** වේය යනාදී ක්‍රමයෙන් අනුලෝම වශයෙන් පටිච්චසමුප්පාද ධර්මයන් මෙනෙහි කොට නාම-රූපයන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහ මකාට තුන් කල්හි පැවති විචිකිච්ඡාව ප්‍රහීණ කෙරේ.

අනෙක් යෝගාවචර කෙනෙක්, පූර්ව කර්ම භවයෙහි **මෝහය, අවිද්‍යාය,** කුසලාකුසල රැස් කිරීම **සංස්කාර** ය, පඤ්චකාමයෙහි ඇලීම් සඞ්ඛ්‍යාත නිකන්තිය **තෘෂ්ණාය, දැ**ඩිව ගැනීම **උපාදානය ය,** අභිසංස්කරණ චේතනාව **කර්ම භවය ය,** මෙසේ පූර්ව කර්ම භවයෙහි මේ පඤ්චවිධ ධර්මයෝ වර්තමාන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති.

වර්තමාන ප්‍රතිසන්ධිය **විඥානය ය,** මව්කුසට වැදගැන්ම **නාම-රූපය,** ප්‍රසාදයෝ **ආයතනය ය,** අරමුණ ස්පර්ශ කිරීම **ස්පර්ශය,** අරමුණ රසවිඳීම **වේදනාය,** මේ පඤ්ච ධර්මයෝ වර්තමාන උත්පත්ති භවයෙහි පූර්වයෙහි කළ කර්මයාගේ ප්‍රත්‍යයෙන් පවතී.

මේ භවයෙහි චක්ෂුරාදි ආයතනයන් මිහිකිරීමට ගිය හෙයින් මෝහය **අවිද්‍යා** නම්. කුසලාකුසල රැස් කිරීම **සංස්කාර** නම්. පඤ්චකාමයෙහි ඇලීම් සඞ්ඛ්‍යාත නිකන්තිය **තෘෂ්ණාය** දැඩිව ගැනීම **උපාදානය ය.** චේතනාව **කර්ම-භවය ය.** මේ පඤ්ච ධර්මයෝ මේ කර්මභවයෙහි මතු ප්‍රතිසන්ධි භවයට ප්‍රත්‍යය වෙති.

මෙසේ **කම්මවට්ට, විපාකවට්ට** වශයෙන් නාම-රූපයන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ.

**කම්මවට්ටය** විපාක දෙන කාල වශයෙන් චතුර්-විධ වේ:-

1. **දිට්ඨධම්මවෙදනීය ය,**
2. **උපපජ්ජවෙදනීය ය,**
3. **අපරාපරියවෙදනීය ය,**
4. **අහොසිකර්මය ය,**

එක් ජවන චිත්ත වීථියෙක ජවන් සිත් සත අතුරෙන් කුසල් වූ හෝ අකුසල් වූ හෝ **ප්‍රථම ජවන චෙතනාව**, **දිට්ඨධම්මවෙදනීය** කර්මය වේ. ඒ කර්මය මේ අත්බැව්හිම විපාක දේ. එසේ විපාකයට නො පැමිණියේ **අහොසි කර්ම** නම්.

කුසලාකුසල වශයෙන් අර්ථ සිඬිය කරන සත්වන ජවන චෙතනාව **උපපජ්ජවෙදනීය කර්ම** නම්. ඒ කර්මයෙන් ප්‍රතිසන්ධි විපාකය අනතුරු හෙවත් දෙවන අත්බැව්හි දෙන්නේ ය. එසේ විපාකය නුදුනහොත් **අහොසි කර්ම** වේ.

කුසලාකුසල වූ ඉතිරි ජවන් සිත් පසෙහි එනම් දෙවන, තුන්වන, සතරවන, පස්වන, සවන ජවන චේතනාවෝ **අපරාපරියවෙදනීය කර්ම** නම් වෙත්. ඒ කර්ම අනාගතයෙහි අවකාශ ලද යම් තැනක විපාක දේ. සසර පැවැත්ම ඇතිතාක් කල් එය **අහෝසි කර්ම** බවට නො පැමිණෙත්.

**කම්මවට්ටය** – විපාක දෙන ක්‍රම වශයෙන් ද චතුර්-විධ වේ.

1. **යඟගරුක කර්ම,**
2. **යබ්බහුල කර්ම,**
3. **යදාසන්න කර්ම,**
4. **කටත්තා කර්ම** යනුයි.

අකුසල පක්ෂයෙහි මාතෘඝාතකාදී ආනන්තරිය කර්මයක් හෝ කුසල පක්ෂයෙහි ප්‍රථම ධ්‍යානාදී මහද්ගත කර්මයෙක් හෝ වේ නම් එය **ගරු කර්ම** නම්. ඒ ගරුකර්ම ප්‍රථම කොට විපාක දේ.

යම් කර්මයක් බහුල කොට කරණ ලද්දේ නම් එය **යබ්බහුල කර්ම** නම් වේ.

මරණාසන්න කාලයෙහි කළ කර්මය **ආසන්න කර්ම** නමි. මරණාසන්නයෙහි සිහිකළ කර්මය හෝ **යදාසන්න කර්ම** නමි.

මෙයින් අන්‍ය වූ, නැවත නැවත ලබන ලද ආසේවන ඇති කර්මය **කටත්තා කර්ම** නමි. පෙරකී කර්මයන් නැති කල මේ කර්මය විපාක දේ.

**කම්මචතුක්කය,** කෘත්‍ය වශයෙන් ද චතුර්විධ වේ.

1. **ජනක කර්මය,**
2. **උපස්ථම්භක කර්මය,**
3. **උපපීඩක කර්මය,**
4. **උපඝාතක කර්මය** යනුයි.

කුසල්වූ හෝ අකුසල්වූ හෝ **ජනක කර්මය** ප්‍රතිසන්ධි-යෙහි ද ප්‍රවෘත්තියෙහි ද රූප අරූප විපාක උපදවයි.

**උපස්ථම්භක කර්මයට** පමණක් විපාක ඉපදවිය නො හැකි වේ. අන්‍ය කර්මයකින් පටිසන්ධිය දුන් පසු සුවදුක් විපාකයනට රුකුල් දීම් වශයෙන් උපස්ථම්භක වේ.

**උපපීඩක කර්මය** ද අන්‍ය කර්මයකින් උපන් විපාකය වැළැක්වීම් වශයෙන් පෙළයි

**උපඝාතක කර්මය** ද කුසල් හෝ අකුසල් හෝ වේ. අනික් දුර්වල කර්මය නසා තමා විපාකයට අවකාශ කෙරේ. මෙසේ කර්මයෙන් අවකාශ කල කල්හි එහි විපාක උපදනේ වේ.

මේ දෙලොස් වැදෑරුම් කර්මයන්ගේ කර්ම භෙදය හා විපාක භෙදය ද බුදුවරයන්ගේ කර්ම විපාක ඥානයට ම තත්වූ පරිද්දෙන් ප්‍රකට වේ. ශ්‍රාවකයන් හා ද අසාධාරණ වේ. නමුත් විදර්ශනා වඩන යෝගාවචරයා විසින් ද කර්මාන්තරය ද විපාකාන්තරය ද එක දෙශමාත්‍රයකින් වත් දත යුතු.

යෝගාවචර තෙම මෙසේ සලකා කම්මවට්ට විපාක-වට්ටයන්ගේ වශයෙන් නාම-රූපයන්ගේ ප්‍රත්‍යය බලා, දැන් පවත්නාසේ අතීතයෙහි ද කම්මවට්ට විපාකවට්ට පැවැත්තේ ය. අනාගතයෙහි ද කම්මවට්ට විපාකවට්ට වශයෙන් පවත්තේ යයි මෙසේ-

**කර්මය ද-කර්මවිපාකය ද,**

**කම්මවට්ටය ද-විපාකවට්ටය ද,**

**කර්මප්‍රවෘත්තිය ද-විපාකප්‍රවෘත්තිය ද,**

**කර්මසන්තතිය ද-විපාක සන්තතිය ද,**

**ක්‍රියා ද-ක්‍රියා ඵල ද,**

නුවණින් දක්නා ඒ යෝගීහට පූර්වාන්තාදිය නිසා යට කියන ලද පරිදි තුන් කල් පිළිබඳ වූ සොළොස් වැදෑරුම් විචිකිච්ඡාව ප්‍රහීණ වේ. සියලුම භව, යෝනි, ගති, විඤ්ඤාණස්ථිති, සත්ත්වාවාසයන්හි හේතුඵල සම්බන්ධ වශයෙන් පවත්තේ නාම-රූප මාත්‍රය මැයි වැටහේ. හෙතෙම හේතුවෙන් මත්තෙහි කාරණයක් නොදක්තේ, විපාක පැවැත්මෙන් මත්තෙහි විපාක විඳින්නෙකු නොදකී. කාරණය ඇති කල්හි කාරක යයි ද, විපාක ප්‍රවෘත්තිය ඇති කල්හි ඵල විඳින්නේ යයි ද ව්‍යවහාර මාත්‍රයකින් පණ්ඩිතයන් ව්‍යවහාර කෙරෙති යි මනා නුවණින් මොනවට දකී.

එහෙයින් කියන ලදී-

**"කම්මස්ස කාරකො නත්ථි-විපාකස්සච වෙදකො**
**සුද්ධධම්මා පවත්තන්ති-එවෙතං සම්මදස්සනං."**

බීජයෙන් වෘක්ෂය ය, වෘක්ෂයෙන් නැවත බීජය ය යි මෙසේ වෘක්ෂ-බීජ සන්තතිය අනාදිමත් කාලික වශයෙන් පවත්නා හෙයින් පූර්වකොටිය හෙවත් මූල නො පෙනෙන්-නාසේ කර්ම ප්‍රත්‍යයෙන් විපාකය, විපාක ප්‍රත්‍යයෙන්

නැවත කර්මය ය යි කර්මවිපාක සන්තතිය අනාදිමත් කාලික හෙයින් පූර්වකොටිය හෙවත් මුල නො පෙනේ.

මෙසේ කම්මවට්ටයන්ගේ වශයෙන් නාම-රූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කොට අතීතාදී කාලත්‍රයෙහි විචිකිච්ඡාව ප්‍රහීණ කළ ඒ යෝගාවචරයාහට සියලු අතීතානාගත පච්චුප්පන්න ධර්මයෝ චුති ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රකට වෙති. අනුපදධර්ම වශයෙන් නොවේ. ඒ යෝගීහුගේ ඒ ප්‍රඥාව නාම-රූප පරිග්‍රහ කිරීම හා නාම-රූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කිරීම දැයි මෙසේ ක්‍රමයෙන් පරිච්ඡේද වශයෙන් දත් හෙයින් **ඤාත පරිඥා** නම් වේ.

නවද, හෙතෙම මෙසේ ද දනී.

අතීත භවයෙහි කර්ම ප්‍රත්‍යයෙන් උපන් ස්කන්ධයෝ ඒ භවයෙහිම නිරුද්ධ වූහ.

අතීත කර්ම ප්‍රත්‍යයෙන්, මේ වර්තමාන භවයෙහි අනික් ස්කන්ධ පහළ වූහ.

ඒ අතීත භවයෙන් මේ භවයට ආ එකද ධර්මයකුදු නැත්තේ ය.

මේ භවයෙහි ද කර්ම ප්‍රත්‍යයෙන් නිපන් ස්කන්ධයෝ මේ භවයෙහිම නිරුද්ධ වන්නාහ.

පුනර්භවයෙහි අනික් ස්කන්ධ පහළවන්නාහ.

මේ භවයෙන් පුනර්භවයට එකද ධර්මයෙක් නොයන්නේ ය.

එහෙයින් ධර්මයන්ගේ භවාන්තර හෙවත් භවයන් අතර සංක්‍රමණයෙක් නම් නැත්තේ ය.

ගුරු මුඛයෙන් හදාරණ ලද මන්ත්‍රාදිය අතවැසියාගේ මුඛයට නොපිවිසේ. එහෙත් ඒ නො පිවිසීමෙන් අතවැස්සාගේ මුඛයෙහි හැදෑරීම නො පවත්තේ ද නොවේ. පවත්තේම ය.

මුහුණෙහි වූ අලඞ්කාර විධානය කැටපත් තලාදියෙහි මුඛප්‍රතිබිම්බයට නො පැමිණේ. ඒ නො පැමිණීමෙන් කැටපත් ආදියෙහි අලඞ්කාර විධානය නො පෙනෙන්නේ නොවේ. පැනේමැයි.

එක් පහන් වැටියක පහන් සිළුව අනික් පහන් වැටියකට සංක්‍රමණය නොවේ. එහෙත් ඒ හේතුවෙන් ඒ පහන් වැටියෙහි පහන් සිළුව නොදැල්වෙන්නේ නොවේ. දැල්වේ මැයි.

මෙසේ අතීත භවයෙන් මේ භවයට ද, මේ භවයෙන් පුනර්භවයට ද, කිසිදු ධර්මයක් සංක්‍රමණය නොවේ. එහෙත් අතීත භවයෙහි සක්‍න්‍ධ, ආයතන, ධාතු ප්‍රත්‍යය-යෙන් මේ භවයෙහි ද, මේ භවයෙහි සක්‍න්‍ධ, ආයතන, ධාතු ප්‍රත්‍යයයෙන් පුනර්භවයෙහි ද සක්‍න්‍ධ, ආයතන, ධාතු නූපදින්නාහු නොවෙති. උපදින්නාහු ම ය යි දනී.

මෙසේ චුති ප්‍රතිසන්‍ධි වශයෙන් දක්නා ලද සියලු ධර්ම ඇති ඔහට හැම ආකාරයෙන් ම නාම-රූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහ ඥානය ස්ථිර බවට පැමිණ සොළොස් වැදෑරුම් විචිකිච්ඡා ද ප්‍රහීණ වේ.

තවද **බුද්ධ, ධම්ම, සඞ්ඝ, සික්‍ඛා, පුබ්බන්‍ත, අපරන්‍ත, පුබ්බන්‍තාපරන්‍ත, පටිච්චසමුප්පාද ධම්ම** යන අටතැන්හි සැකය ද, දෙසැට මිථ්‍යාදෘෂ්ටිහු ද විෂ්කම්භණය වෙති.

මෙසේ නොයෙක් අයුරින් නාම-රූපයනට ප්‍රත්‍යය පරිග්‍රහයෙන් තුන් කල්හි විචිකිච්ඡාව ඉක්ම සිටි ඥානය **කඞ්ඛාවිතරණ විසුද්ධි** නමි. එයට ම **යථාභූත ඥානය** යයි ද **සම්‍යක් දර්‍ශන** යයි ද කියනු ලැබේ.

තවද නො පිරිහුණු කඞ්ඛාවිතරණ විසුද්ධිය ඇති, විදර්ශනා වඩන යෝගාවචර තෙම ලෞකික සීල, සමාධි, ප්‍රඥා සම්පත්තියෙන් යුක්ත හෙයින් මත්තෙහි මාර්ග ඵලාධිගමය නො කෙළේ ද, සුගතිපරායණ ම වෙයි.

එහෙයින් **නියත ගතික** යයි කියන ලදී. එහෙයින් ම **චූළසොතාපන්න** නමුදු වේ. සොතාපන්න පුද්ගලයාද අපාය, දුර්ගති, විනිපාත ක්ෂය කළ හෙයිනි.

කඞ්ඛාවිතරණ විසුද්ධිය ලැබීමෙන් හෙතෙම **ලබ්ධ-ප්‍රතිෂ්ඨා** වේ. හේතු ප්‍රත්‍යය සහිත නාම-රූප දැකීමෙන්, මඩන ලද දිට්ඨිකණ්ටක ඇත්තේ, **අහේතුක-විසම හේතු** වාදයන් මැඩපියන ලද්දේ, තමතමා ප්‍රත්‍යයෙන් ම ධර්ම ප්‍රවෘත්තිය දැන, ශාසනයෙහි පිහිටු වන ලද ශ්‍රද්ධා ඇති හෙයින් ද **ලබ්ධ ප්‍රතිෂ්ඨා** නම් වේ.

**නාම-රූප වවත්ථානයෙන්, දුක්ඛසත්‍යය** ය ද **ධම්මට්ඨිති ඤාණයෙන් සමුදය සත්‍යය** ද, එයම මෑත භාගයෙහි අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කිරීමෙන් ක්‍රමයෙන් **මාර්ග සත්‍යය** ය ද විශිෂ්ට ඤාණයෙන් දැන, නාම-රූප ප්‍රවෘත්තියෙහි දුක්ඛ භාවය දැන, අප්‍රවෘත්තිය වූ **නිරෝධයෙහි** හෙවත් **නිර්වාණයෙහි** ඒකාන්ත නැමුණු අදහස් ඇති බැවින් ලෞකික ඥානයෙන් ම **චතුරාර්ය සත්‍යයන්** අධිගත හෙයින් අපායොත්පත්තියට අභව්‍යවූයේ සොතාපත්ති භූමියට භව්‍ය උත්පත්ති ඇත්තේ වන්නේ යයි ද **නියතගතික** යයි ද **චූළසොතාපන්න** යයි ද එහෙයින්ම කියන ලදී.

## 5. මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිය

මේ මාර්ගය ය, මේ මාර්ගය නො වේ යයි මෙසේ මාර්ගය ද අමාර්ගය ද දැන සිටි ඤාණය **මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි** නම් වේ. මෙහි ඕභාසාදී දස උපක්ලේශයන් ගෙන් මිදුණු මේ විදර්ශනා ප්‍රඥාව ආර්ය මාර්ගයට පූර්වභාග වූ **මාර්ග** යයි ද මේ ඕභාසාදී උපක්ලේශ ආර්ය මාර්ගය යයි ගැනීම **අමාර්ගය** යයි ද දත යුතු.

**"යස්මා තීරණ පරිඤ්ඤාය වත්තමානාය මග්ගාමග්ග ඤාණං උප්පජ්ජති. තීරණ පරිඤ්ඤා ච ඤාත පරිඤ්ඤා**

**ඤාණනතරං, තස්මාපි තං මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිං සම්පාදෙතු කාමෙන කලාපසම්මසනෙ තාව යොගො කාතබ්බො,"** යනාදී වශයෙන් **තීරණපරිඥාව** ඇති කල්හි **මග්ගාමග්ග ඤාණය** උපදී. තීරණ පරිඥාව ද ඥාතපරිඥාවට අනතුරුව වේ. එ හෙයින් ඒ මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය සම්පාදනය කරණු කැමැති යෝගියා විසින් **කලාප සම්මර්ශනයෙහි** පිළිවෙලින් යොග වැඩිය යුතු යයි වදාරණ ලදී.

**ලෞකික පරිඥාවෝ** තිදෙනෙකි, එනම් **ඥාත පරිඥා, තීරණ පරිඥා, පහාණ පරිඥා** ය

**1. ඥාත පරිඥා – රූපය** රූපපනය හෙවත් බිඳීම **ලක්ෂණ** කොට ඇත්තේ ය. **වෙදනාව** අරමුණු රස විඳීම **ලක්ෂණය** කොට ඇත්තේ ය යනාදී වශයෙන් ඒ ඒ **ස්කන්ධ, ආයතන, ධාතු** ආදීන් ඒ ඒවාට අයත් ස්වභාව හෙවත් ලක්ෂණයන් පිළිබඳව සැලකීම් වශයෙන් පැවැති ප්‍රඥාව **ඥාත පරිඥා** නම් වේ. **නාම – රූප පරිග්‍රහය දක්වා පැවැති ප්‍රඥාව ඥාත පරිඥාවට භූමි** වේ.

**2. තීරණ පරිඥා** – රූපය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යන වශයෙන් ඒ රූපාදී ධර්මයන්ගේ ම **අනිත්‍යය, දුක්ඛය, අනාත්මය** යන සාමාන්‍ය හෙවත් සියල්ලට සාධාරණ ලක්ෂණයට නගා පැවැති ස්වභාවය වූ ලක්ෂණත්‍රය අරමුණු කොට ඇති විදර්ශනා ප්‍රඥාව, **තීරණ පරිඥා** නම් වේ. **චක්ඛු දසකාදී කලාප සම්මර්ශනයෙහි පටන් උදයව්‍යානු දර්ශනය තෙක් තීරණ පරිඥාවට භූමි** වේ.

**3. ප්‍රහාණ පරිඥා** – ඒ ත්‍රෛභූමික ධර්මයන් කෙරෙහි ම නිත්‍ය සංඥාදිය දුරු කිරීම් වශයෙන් පැවති ලක්ෂණය නො හැරම ස්කන්ධයන් අරමුණු කරන **ලක්ෂණාලම්බනික විදර්ශනා ප්‍රඥාව ප්‍රහාණ පරිඥා** නම් වේ. **භඞ්ගානු දර්ශනයේ පටන් උදයව්‍යානු දර්ශනය තෙක් ප්‍රහාණ පරිඥාවට භූමි** වේ.

ඒ භඞ්ගානු පස්සනාවේ පටන් **අනිත්‍යාදී** වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන්නේ නිත්‍යය, ශාස්වතය යයි පැවැති **මිථ්‍යා සංඥාව** දුරු කෙරේ.

**දුක්ඛ වශයෙන්** සම්මර්ශනය කරන්නේ **සුඛ සංඥාව** දුරු කෙරේ.

**අනාත්ම වශයෙන්** සම්මර්ශනය කරන්නේ **ආත්ම සංඥාව** දුරු කෙරේ.

එසේ අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කිරීමෙන් සංස්කාර යන් කෙරෙහි කලකිරුණේ **නන්දි** යයි කියන ලද **සප්‍රීතික තෘෂ්ණාව** දුරු කෙරේ.

සංස්කාරයන් කෙරෙහි නො ඇලීම් වශයෙන් සම්මර්ශනය කරන්නේ **රාගය** දුරු කෙරේ.

නිරොධානුපස්සනාවෙන් බලන්නේ සංස්කාරයන්ගේ **සමුදය** නම් වූ **තෘෂ්ණාව** දුරු කෙරේ.

පටිනිස්සග්ගානුපස්සනාවෙන් බලන්නේ **ග්‍රාහය** දුරු කෙරේ.

මෙසේ මේ ත්‍රිවිධ පරිඥාවන්ගේ වශයෙන් සංස්කාරයන් පිරිසිඳීම ද, ප්‍රත්‍යය පරිග්‍රහය ද සිඬ කරන හෙයින් යෝගාවචරයාහට **ඥාත පරිඥාවම** අධිගත වේ. **තීරණ** පරිඥා හා **ප්‍රහාණ** පරිඥා ද අවබෝධ කළ යුතු වේ.

**කලාප සම්මර්ශනය** – අතීත, අනාගත, පච්චුප්පන්න ධර්මයන් එකට සංග්‍රහ කොට අනිත්‍යාදී වශයෙන් විනිශ්චය කිරිමේ ප්‍රඥාව අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය හෙවත් **තීරණය කිරීමේ ඥාණය** නම් වේ.

**අතීත, අනාගත, පච්චුප්පන්න** වූ හෝ **අධ්‍යාත්ම** වූ හෝ, **බාහිර** වූ හෝ, **ඖලාරික** වූ හෝ, **සූක්ෂ්ම** වූ හෝ, **හීන** වූ හෝ, **ප්‍රණීත** වූ හෝ, **දුර** වූ හෝ, **සන්තිකෙ** වූ හෝ

යම් කිසි රූපයක් වේ නම් ඒ එකොළොස් වැදෑරුම් සියලු රූපය අනිත්‍ය වශයෙන් ව්‍යවස්ථා කෙරේ. එය එක් සම්මර්ශනයකි.

එම රූප ධර්මයන් ම දුක්ඛ වශයෙන් ව්‍යවස්ථා කිරීම එක් සම්මර්ශනයෙකි.

එම රූප ධර්මයන් ම අනාත්ම වශයෙන් ව්‍යවස්ථා කිරීම එක් සම්මර්ශනයෙකි.

එසේම වේදනාව අනිත්‍ය වශයෙන් ද, දුක්ඛ වශයෙන් ද, අනාත්ම වශයෙන් ද, ව්‍යවස්ථා කෙරේ.

එසේම සංඥා, සංස්කාර, විඥානයන් ද, අනිත්‍ය වශයෙන් ද, දුක්ඛ වශයෙන් ද, අනාත්ම වශයෙන් ද, සම්මර්ශනය කෙරේ.

මෙසේ පඤ්චස්කන්ධය, තිලකුණු වශයෙන් සම්මර්ශනය කොට ඉක්බිති චක්ඛුද්වාරාදි ෂඩ්ද්වාරය, රූපාදි ෂඩාලම්බනය චක්ඛුවිඥානාදි ෂඩ් විඥානය, චක්ඛුසම්ඵස්සාදි ෂඩ් ස්පර්ශය ද, චක්ඛුසම්ඵස්සජා වේදනාදි ෂඩ් වේදනා ද, රූප සංඥාදි ෂඩ් සංඥාවෝ ද, රූප සංචේතනාදි ෂඩ් චේතනාවෝ ද, රූපතණ්හාදි ෂඩ් තණ්හාවෝ ද, රූප විතර්කාදි ෂඩ් විතර්කයෝ ද, රූප විචාරාදි ෂඩ් විචාරයෝ ද, එසේම ෂඩ් ධාතුය, දස කසිණය, දෙතිස් කොටස ය, දොළොස් ආයතනය, අටළොස් ධාතුය, දෙවිසි ඉන්ද්‍රිය ය, ත්‍රි ධාතුය, නව භවය, සතර ධ්‍යානය, සතර අප්‍රමාණ්‍යයෝය, සතර සමාපත්තිහුය, දොළොස් පටිච්චසමුප්පාදාඞ්ගයෝ ය යනාදි ධර්මයන් අතීතානාගත පච්චුප්පන්නාදි වශයෙන් ගෙන අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කෙරේ. ඒ ධර්මයන් දුක්ඛ වශයෙන් ද, අනාත්ම වශයෙන් ද සම්මර්ශනය කෙරේ.

තවද අතීත, අනාගත, පච්චුප්පන්න වූ රූපය ක්ෂය වන අර්ථයෙන් අනිත්‍යය, භය වන අර්ථයෙන් දුක්ඛය ය,

**අසාර අර්ථයෙන් අනාත්මය** යයි සංක්ෂෙප කොට ව්‍යවස්ථා කෙරේ. **එසේම** වෙදනාදී ධර්මයන් ද චාරාරම්මණ විඥානාදී වූ පටිච්චසමුප්පාදඞ්ගයන් අවසන් කොට ඇති සියලුම ධර්මයන් ද **ක්ෂය** වන **අර්ථයෙන් අනිත්‍යය,** භයට කාරණය වන අර්ථයෙන් **දුඃඛය, අසාරාර්ථයෙන් අනාත්මය** යි සංක්ෂෙප කොට ව්‍යවස්ථා කෙරේ.

එ පරිද්දෙන් ම අතීතානාගත පච්චුප්පන්නාදි ප්‍රභෙද ගත එකී රූපාදී සියළුම ධර්ම **අනිත්‍යය, ප්‍රත්‍යයන් විසින් සකස් කරණ ලද්දාහු** ය. **ප්‍රත්‍යයෙන් හටගත්තාහු** ය. **ක්ෂය ස්වභාවය** ඇත්තාහු ය. **විරාග ස්වභාව** ඇත්තාහු ය. **නිරොධ ස්වභාවය** ඇත්තාහුය යනාදී වශයෙන් සංක්ෂෙප යෙන් සම්මර්ශනය කෙරේ.

**ජාති ප්‍රත්‍යයෙන් ජරා-මරණ** වේ. **ජාතිය** නැති කල්හි **ජරා-මරණ** නොවේ යයි සංක්ෂෙප කොට සම්මර්ශනය කෙරේ. භව **ප්‍රත්‍යයෙන් ජාතිය** වේ. **කර්ම** භවය නැති කල්හි **ජාතිය** නොවේ. **උපාදාන ප්‍රත්‍යයෙන්** භවය වේ. **උපාදානය** නැති කල්හි භවය නොවේ. **තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය** වේ. **තණ්හාව** නැති කල්හි **උපාදානය** නොවේ. **වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව** වේ. වෙදනාව නැති කල්හි තෘෂ්ණාව නොවේ. **ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව** වේ. **ස්පර්ශය** නැති කල්හි **වෙදනාව** නොවේ. **ආයතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය** වේ. **ආයතන** නැති කල්හි **ස්පර්ශය** නොවේ. **නාම-රූප ප්‍රත්‍යයෙන් ආයතන** වේ. **නාම-රූප** නැති කල්හි **ආයතන** නොවේ. **විඥාන ප්‍රත්‍යයෙන් නාම-රූප** වේ. **විඥානය** නැති කල්හි **නාම-රූප** නොවේ. **සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය** වේ. **සංස්කාර** නැති කල්හි **විඥානය** නොවේ. **අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර** වේ. **අවිද්‍යාව** නැති කල්හි **සංස්කාරයෝ** නොවෙත්. මෙසේ ද සංක්ෂෙප කොට සම්මර්ශනය කෙරේ.

අනාගත කාලයෙහි ද **අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර** වේ. **අවිද්‍යාව නැති කල්හි සංස්කාර** නොවේ. මේ ආදි ක්‍රමයෙන් සංක්ෂප කොට ව්‍යවස්ථා කෙරේ.

මෙසේ අතීත, අනාගත, පච්චුප්පන්න ධර්මයන්ගේ දැනීම සංක්‍ෂෙප කොට ව්‍යවස්ථා කිරීම **සම්මර්‍ශනයෙහි ඥානය** නම් වේ.

යට දක්වන ලද ධර්මයන් අතුරෙන් **ෂට් ධාතූහු** නම්, **පඨවි, ආපො, තෙජො, වායො, ආකාශ, විඤ්ඤාණ** යන ධාතු සය ය.

**ත්‍රි ධාතූහු** නම්, **කාම ධාතු, රූප ධාතු, අරූප ධාතු** ය.

**නව භවය නම්:-** කාම භවය, රූප භවය, අරූප භවය, සඤ්ඤී භවය, අසඤ්ඤී භවය, නෙවසඤ්ඤානාසඤ්ඤී භවය, එකවොකාර භවය, චතුවොකාර භවය, පඤ්චවොකාර භව ය.

මෙතෙක් සම්මර්ශනය කළ යුතු ධර්ම, මේ පිළිවෙළින් දේශනා කර වදාළේ ආදිකාර්මිකයාගේ විදර්ශනා මනසිකාර පහසුව සඳහා ය.

පළමු කොට **පඤ්චස්කන්ධය** අතීතාදි වශයෙන් ගෙන සම්මර්ශනය කොට **ඉක්බිති** ඒ පඤ්චස්කන්ධයන්ම ද්වාරා-ලම්බනයන් හා ද්වාරයන්හි පැවැති ධර්ම වශයෙන් විභාගය ලබන හෙයින් එයට අනතුරුව **ද්වාරාදි** වශයෙන් **ෂට්කයක්** දක්වන ලදී. ත්‍රිවිධ **ලක්‍ෂණයන්** අතුරෙන් අනාත්ම **ලක්‍ෂණය** දුක්ඛ විභාගය කරන හෙයින් ඒ විභාගය පිණිස **ෂට් ධාතූහු** දක්වන ලදී. **ඉක්බිති** ශාසනයෙන් පිටත් තීර්ථකයන්ගේ ආත්මාභිනිවේශය ධ්‍යානයන් නිසා වන හෙයින් එයට අනතුරුව **දස කසිණය** දක්වන ලදී. අනතුරුව දුක්ඛානුපස්සනාවට පරිවාර වශයෙන් පිළිකුල් ආකාර වශයෙන් **දෙතිස් කොට්ඨාස** දක්වන ලදී. පළමුවෙන් ස්කන්ධ වශයෙන් සංක්‍ෂෙපයෙන් ගත් ධර්ම සංක්‍ෂෙප-විස්තර නොවුවද ක්‍රමයෙන් මෙතෙහි කළ යුතු බව දක්වනු පිණිස **දොළොස් ආයතන** ද, **අටළොස් ධාතු** ද ගන්නා ලදහ. මේ **ධාතු ආයතන** යන ධර්මයන් ශූන්‍ය බව ය, නිරුත්සාහ බව ය, වීර්‍ය රහිත බව ය, යන

මොවුන් ඇති කල්හි ධර්ම ස්වභාවයෙන් අධිපති වශයෙන් පැවැත්ම දැක්වීමෙන් **අනාත්ම ලක්ෂණය** විභාගවනු පිණිස **දෙවිසි ඉන්ද්‍රියයන්** දක්වන ලදී. මෙසේ නොයෙක් භෙද භින්න ධර්ම, භූමිත්‍රයට ඇතුළත් බැවින් ත්‍රිවිධ වේ යයි දක්වනු පිණිස **ධාතුත්‍රය** දක්වන ලදී. මෙසේ නිමිති දක්වා පැවැත්ම දක්වනු පිණිස **කාමාදී නව භවය** දක්වන ලදී. මෙකීතාක් අභිධෙය්‍ය විෂයෙහි පැවැති මනසිකාර කෞශල්‍යයන් යුක්තවූවහු විසින් සියුම් වූ මහද්ගත විෂයෙහි මනසිකාර පැවැත් විය යුතු බැව් දක්වනු පිණිස **ධ්‍යාන, අප්‍රමාණ්‍ය, ආරූප්‍යයෝ** දක්වන ලදහ. මෙකීතාක් ධර්ම **ප්‍රත්‍යය, ප්‍රත්‍යසමුත්පන්න** විභාගයෙන් බෙද මෙනෙහි කටයුතු බැව් දක්වනු පිණිස **දොළොස් පච්චසමුප්පාදඞ්ගයෝ** දක්වන ලදහ.

සම්මශීනයට එළඹෙන ධර්මයන් අතුරෙන් යෝගීහට යම් යම් ධර්මයක් ප්‍රකට වේ නම්, සුවසේ පරිග්‍රහ කටහැකි වේ නම්, ඒ ධර්මයන් විෂයෙහි ඒ යෝගියා විසින් සම්මශීනය ආරම්භ කටයුතු. පසුව නොවැටහෙන ධර්ම ද උපායෙන් වටහා ගෙන නිරවශේෂයෙන් සම්මශීනය කටයුතු.

රූප සම්මශීනය කරන්නහු විසින් යම් රූපයෙක් අතීත වේද, ඉපිද නිරුද්ධ වී ද, ඒ රූපය අතීතයෙහිම ක්‍ෂය වූයේය. මේ භවයට නොපැමිණියේ ය. එ හෙයින් **අනිත්‍යය**. මතු අනතුරු භවයෙහි යම් රූපයෙක් උපදීද, එයද එහිම ක්‍ෂයට පැමිණේ. එයින් තුන්වන භවයට නො පැමිණේ. එ හෙයින් ක්‍ෂය වන අර්ථයෙන් **අනිත්‍යය**. ප්‍රත්‍යුත්පන්න වූ යම් රූපයෙක් වේ නම් එයද මේ භවයෙහිම ක්‍ෂයවේ. මෙයින් දෙවන භවයට නො පැමිණේ. එ හෙයින් **අනිත්‍යය**. ස්වසන්තානගත අධ්‍යාත්ම රූපයෙක් වේද, එය ද අධ්‍යාත්මයෙහිම ක්‍ෂය වේ. බහිද්ධා රූපබවට නො පැමිණේ. එ හෙයින් **අනිත්‍යය**. යම් බාහිර රූපයෙක් වේ නම් එය ද බැහැර දීම ක්‍ෂය වේ. අධ්‍යාත්ම රූප බවට නො පැමිණේ. එ හෙයින් **අනිත්‍යය**. මෙසේම ඖදාරික

රූප ද, සියුම් රූප ද, හීන රූප ද, ප්‍රණීත රූප ද, දුරවූ රූප ද, සන්තික වූ රූප ද යන සියලුම රූපයන් එහිම ක්ෂය වේ. එ බැවින් **ක්ෂයාර්ථයෙන් අනිත්‍යය.** මෙසේ මේ අතීතාදී එකොළොස් අවකාශසථ රූපය ම **ක්ෂය වන අර්ථයෙන් අනිත්‍යය** යයි සම්මර්ශනය කටයුතු.

එසේම ඒ සියලු රූපය ම **භයාර්ථයෙන් දුක්** වේ යයි සම්මර්ශනය කෙරේ. අප්‍රහීණ කෙලෙස් ඇත්තහුට "මම විනාශවෙමි මා සතු දෙය විනාශ වේය" යි සිතන විට භය උපදී.

යමක් දුක් වේ නම් එය **අසාර අර්ථයෙන් අනාත්ම** වේ. ආත්ම යයි ද, තමහට වසඟ වූවෙක් ඇතැයි ද, කාරකයෙක් ඇතැයි ද, විඳින්නෙක් ඇතැයි ද තමහට වසඟ වන සුළු යයිද මෙසේ සලකන ලද ආත්ම සාරයක් ඇතැයි කල්පනා කරනු ලැබේ. එය ද, එකාන්තයෙන් ම අනිත්‍යය, දුක්ඛය ය, එ හෙයින් ම එයට තමා පිළිබඳ වූ ද අනිත්‍ය භාවය හෝ උත්පාද ව්‍යය දෙකින් පෙළීම හෝ වැළැක්මට හෝ නො හැකි වේ. එ හෙයින් ඔහුගේ කාරකාදී භාවයෙක් නම් නැත්තේම ය.

තව ද, යෝගාවචර තෙම පඤ්චස්කන්ධය අනිත්‍යාදි වශයෙන් **සතළිස් ආකාරයකින්** සම්මර්ශනය කෙරේ:-

1. **අනිත්‍ය වශයෙන්** - යෝගාවචර තෙම එකී එකී ස්කන්ධය අනිත්‍ය බව අන්ත කොට ඇති හෙයින්, පූර්ව අපර කෝටි ඇති හෙයින් ද **අනිත්‍ය වශයෙන්** සම්මර්ශනය කෙරේ.

2. **දුක්ඛ වශයෙන්** - උත්පාද - ව්‍යය දෙකින් ක්ෂණයක් ක්ෂණයක් පාසා පෙළෙන බැවින් ත්‍රිවිධ දුක්ඛයට හා සංසාර දුක්ඛයට වස්තු හෙයින් **දුක්ඛ වශයෙන්** සම්මර්ශනය කෙරේ.

3. **රෝග වශයෙන්** - සුදුසු ප්‍රත්‍යයෙන් යැපිය යුතු බැවින් ද සියලු රෝගයනට මූල බැවින් ද **රෝග වශයෙන්** සම්මර්ශනය කෙරේ.

4. **ගණ්ඩ වශයෙන්** – ත්‍රිවිධ දුක්ඛතා සඞ්ඛ්‍යාත රුජාවෙන් යුක්ත හෙයින් ද, කෙලෙස් නමැති අසුචි වහනය වන හෙයින් ද, උත්පාදය, ජරාය, භඞ්ගය යන මෙයින් ද, ඉදීම්ම ය, පැසවීම ය, බිඳීම ය යන මෙයින් ද යුක්ත හෙයින් **ගඩක් වශයෙන්** සම්මර්ශනය කෙරේ.

5. **සල්ල වශයෙන්** – පීඩා උපදවන හෙයින් ද, ඇතුළත විදින හෙයින් ද, ආර්‍ය මාර්ගයෙන් මුත් අන් මගෙකින් බැහැර කළ නොහැකි හෙයින් ද **ශූල වශයෙන්** සම්මර්ශනය කෙරේ.

6. **අඝ වශයෙන්** – හැරගිය යුතු හෙයින් ද, අවැඩ එළවන හෙයින් ද, අඝ වස්තුවන හෙයින් ද, පාප හෙවත් **අඝ වශයෙන්** සම්මර්ශනය කෙරේ.

7. **ආබාධ වශයෙන්** – අනුන් වසඟ බැව් කරන හෙයින් ද, ආබාධයට පිහිට හෙයින් ද, **ආබාධ වශයෙන්** සම්මර්ශනය කෙරේ.

8. **පර වශයෙන්** – වශයෙහි නො පවත්නා හෙයින් ද, නො දිරව, නොමියවයි මෙසේ කළ විධානයෙහි නොපිහිටන හෙයින් ද, **පර වශයෙන්** සම්මර්ශනය කෙරේ.

9. **පලෝක වශයෙන්** – ව්‍යාධි, ජරා, මරණයන්ගෙන් බිඳෙන හෙයින් **පලෝක වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

10. **ඊති වශයෙන්** – නොයෙක් ව්‍යසන පමුණුවන හෙයින් **ඊති වශයෙන්** සම්මර්ශනය කෙරේ.

11. **උපද්දව වශයෙන්** – නො දන්නා ලද්ද වූ ම මහත් අනර්ථ පමුණුවන හෙයින් ද, සියලු උපද්‍රවයනට වස්තු හෙයින් ද **උපද්දව වශයෙන්** සම්මර්ශනය කෙරේ.

12. **භය වශයෙන්** – සියලු භයට ආකර හෙයින් ද, දුක් සංසිඳුවීම වූ නිවනට ප්‍රතිපක්ෂ හෙයින් ද **භය වශයෙන්** සම්මර්ශනය කෙරේ.

13. **උපසග්ග වශයෙන්** - නොයෙක් අනර්ථ උපද්‍ර-බද්‍දනා ලද හෙයින් ද, දෝෂයන් විසින් අරමුණු වශයෙන් සැරිය යුතු හෙයින් ද, රාග - ද්වේෂාදීන් අනෙක ද්වේෂයන් ඇලී තිබෙන හෙයින් රාගාදීන් හා ඇලීම් අර්ථයෙන් ද, ඉවසනු නොහැකි හෙයින් ද, **උපසග්ග වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

14. **චල වශයෙන්** - ව්‍යාධි, ජරා, මරණයන්ගෙන් ද, ලාභාදී අෂ්ටලෝක ධර්මයෙන් ද චලනය වන හෙයින් **චල වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

15. **පභඞ්ගු වශයෙන්** - උපක්‍රමයෙන් ද, ස්වභාව යෙන් ද භඞ්ගයට පැමිණෙන සුළු හෙයින් ද **පභඞ්ගු වශයෙන්** සම්මර්ශනය කෙරේ.

16. **අධ්‍රුව වශයෙන්** - සියලු අවස්ථාවෙහි (වෘක්ෂ ඵලයන් මෙන්) හෙනසුළු බැවින් ද, ස්ථිර බවක් නැති හෙයින් ද **අධ්‍රුව වශයෙන්** සම්මර්ශනය කෙරේ.

17. **අතාන වශයෙන්** - ජරා - මරණාදි දුකින් හා අපායාදී දුකින් ආරක්ෂා කළ නො හැකි බැවින් ද, ක්ෂෙම බව නොලැබිය හැකි හෙයින් ද **අතාන වශයෙන්** සම්මර්ශනය කෙරේ.

18. **අලෙන වශයෙන්**-ආරක්ෂා ස්ථාන සොයන්නවුන්ට දුක්ඛාදීන් ආරක්ෂා වීමට ස්ථාන නො වන හෙයින් ද ඇලුනවුනට ද ආරක්ෂා ස්ථාන නො වන හෙයින් ද **අලෙන වශයෙන්** සම්මර්ශනය කෙරේ.

19. **අසරණ වශයෙන්** - පැමිණි ජාත්‍යාදී භය නැසීමෙන් නිශ්‍රිතයනට පිහිට වීමට අසමර්ථ හෙයින් **අසරණ වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

20. **රිත්ත වශයෙන්** - අඥාන ලෝකයා විසින් ඇතැයි සලකන ලද ධ්‍රුව, සුබ, ආත්ම භාවයෙන් ශූන්‍ය හෙයින් **රිත්ත වශයෙන්** සම්මර්ශනය කෙරේ.

21. **තුච්ඡ වශයෙන්** - රිත්ත හෙයින් ම අල්ප බැවින් ද ලාමක බැවින් ද, **තුච්ඡ වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

22. **සුඤ්ඤ වශයෙන්** - ස්වාමිය, නිවාසිය, කාරකය, වේදකය, අධිෂ්ඨායිකය, යන ආත්ම භාවයෙන් හිස් බැවින් **සුඤ්ඤ වශයෙන්** සම්මර්ශනය කෙරේ.

23. **අනත්ත වශයෙන්** - තමා ද, ස්වාමිකාදි ස්වභාව යෙන් වියුක්ත හෙයින් **අනාත්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

24. **ආදීනව වශයෙන්** - භවයෙහි පැවැත්ම දුක් හෙයින් ද, දුක්ඛය ආදීනව හෙයින් ද, නොහොත් නිතර බැගෑ බැවින් පවත්නා හෙයින්ද **ආදීනව වශයෙන්** සම්මර්ශනය කෙරේ.

25. **විපරිනාම ධම්ම වශයෙන්** - ජරා - මරණ දෙකින් පෙළෙන හෙයින් **විපරිණාම ධර්‍ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

26. **අසාර වශයෙන්** - දුර්වල හෙයින් ද, එලයක් මෙන් පහසුවෙන් බිඳිය හැකි හෙයින් ද, **අසාර වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

27. **අඝ මූලක වශයෙන්** - පවට මුල් වන හෙයින් **අඝමූලක වශයෙන්** සම්මර්ශනය කෙරේ.

28. **වධක වශයෙන්** - මිත්‍රයකු වැනි සතුරකු මෙන් විශ්වාසයෙහි තබා සිටින්නවුන් නසන හෙයින් **වධක වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

29. **විභව වශයෙන්** - නිත්‍ය, සුභ, සුඛ, ආත්ම සඞ්ඛ්‍යාත වැඩීම් නැති හෙයින් **විභව වශයෙන්** සම්මර්ශනය කෙරේ.

30. **සාසව වශයෙන්** - ආශ්‍රවනයට හේතු බැවින් **සාසව වශයෙන්** සම්මර්ශනය කෙරේ.

31. **සඞ්ඛත වශයෙන්** - ප්‍රත්‍යයෙන් නිපදවන ලද හෙයින් **සඞ්ඛත වශයෙන්** ද සම්මර්ශනය කෙරේ

32. **මාරාමිස වශයෙන්** - මෘත්‍යුමාර ක්ලේශ මාරයනට ගොදුරු වන හෙයින් **මාරාමිස වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

33. **ජාති ධම්ම වශයෙන්** - ජාතිය ස්වභාව කොට ඇති හෙයින් **ජාති ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

34. **ජරා ධම්ම වශයෙන්** - ජරාව ස්වභාව කොට ඇති හෙයින් **ජරා ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

35. **ව්‍යාධි ධම්ම වශයෙන්** - ව්‍යාධිය ස්වභාව කොට ඇති හෙයින් **ව්‍යාධි ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

36. **මරණ ධම්ම වශයෙන්** - මරණය ස්වභාව කොට ඇති හෙයින් **මරණ ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

37. **සොක ධම්ම වශයෙන්** - සොකය ස්වභාව කොට ඇති හෙයින් **සොක ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

38. **පරිදෙව ධම්ම වශයෙන්** - පරිදෙවය ස්වභාව කොට ඇති හෙයින් **පරිදෙව ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

39. **උපායාස ධම්ම වශයෙන්** - උපායාසය ස්වභාව කොට ඇති හෙයින් **උපායාස ධම්ම වශයෙන්** සම්මර්ශනය කෙරේ.

40. **සංකිලෙස ධම්ම වශයෙන්** - තෘෂ්ණා, දෘෂ්ටි දුශ්චරිත සංක්ලේශයනට විෂය වන හෙයින් **සංකිලෙස ධම්ම වශයෙන්** ද සම්මර්ශනය කෙරේ.

මෙකී සතළිස් විදර්ශනාවෝ අනිත්‍යාදී අනුපස්සනා තුනෙහි අන්තර්ගත වෙත්. ඒ මෙසේ යි.

**අනිත්‍ය, පලෝක, චල, පභඞ්ගු, අද්ධුව, විපරිණාම ධම්ම, අසාරක, විභව, සඞ්ඛත, මරණ ධම්ම** වශයෙන් එකී එකී ස්කන්ධයෙහි දසය දසය බැගින් පඤ්චස්කන්ධයෙහි පනස් **අනිත්‍යානුපස්සනාවෝ** වෙති.

**පර, රිත්ත, තුච්ඡ, සුඤ්ඤ, අනත්ත** වශයෙන් එකී එකී ස්කන්ධයෙහි පසක් පසක් බැගින් **අනාත්මානුපස්සනා** පස්විස්සෙක් වෙයි.

සෙසු පස්විස්සෙහි (25) එකී එකී ස්කන්ධයෙහි පස්විස්සක් බැගින් පඤ්චස්කන්ධයෙහි **දුක්ඛානුපස්සනාවෝ** එක්සිය පස්විස්සෙක් (125) වෙයි.

මෙසේ අනිත්‍යාදී තුන් අනුපස්සනාවන්හි ඇතුළත් වූ දෙසියයක් (200) භෙද ඇති සම්මර්ශනයෙන් පඤ්චස්කන්ධය සම්මර්ශනය කරන්නා වූ යෝගීහට **නය විදර්ශනා** සඞ්ඛ්‍යාත **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** යන ත්‍රිලක්ෂණ සම්මර්ශනය ස්ථිර වේ.

ඒ යෝගාවචරයාහට මෙසේ සම්මර්ශනය කොට, විදර්ශනාව සිඬ නොවී නම් මතු දැක්වෙන නවාකාරයෙන් ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු කටයුතු.

**ඒ නව ආකාරය** නම්:-

1. උපන් උපන් සංස්කාරයන්ගේ ක්ෂයම දකී,
2. ඒ ක්ෂය දැකීම සක්කච්ච ක්‍රියායෙන් හෙවත් ආදර කිරීමෙන් සපයයි.
3. සාතච්ච ක්‍රියායෙන් හෙවත් සතත ක්‍රියායෙන් සපයයි.
4. ආවාසාදී සප්පාය ක්‍රියායෙන් සපයයි,
5. සමාධිහුගේ නිමිත්ත ගැනීමෙන් ද,
6. සප්ත බොධ්‍යාඞ්ගයන් අනුව පැවැත්මෙන් ද,

7. කායයෙහි හා ජීවිතයෙහි නිරපෙක්ෂ බව එලවී- මෙන් ද,

8. එහිද නෛෂ්ක්‍රම්‍යයෙන් මැඩ,

9. භාවනාවන්ගේ අතර කඩ නොකර සපයයි.

මෙසේ නව ආකාරයෙන් ඉන්ද්‍රියයන් තියුණු කොට සප්ත අසප්පායයන් දුරු කොට, සප්ත සප්පායයන් සේවනය කරමින්, කලෙක රූප ද, කලෙක අරූප ද සම්මර්ශනය කටයුතු.

රූපය සම්මර්ශනය කරන්නහු විසින් රූපයාගේ උත්පත්තිය බැලිය යුතු. මේ රූපය කර්මාදී සතර ප්‍රත්‍යයෙන් නිපදේ.

කාමාවචරාදී භූමි වශයෙන් ද, අණ්ඩජාදී යෝනි වශයෙන් ද භින්න වූ සියලු සත්ත්වයන්ට උපදනා රූප පළමු කොට කර්මයෙන් උපදී.

ප්‍රතිසන්ධික්ෂණයෙහි ගර්භසෙය්‍යක සත්ත්වයන්ට, ජීවිතින්ද්‍රිය, අවිනිර්භාග රූපය, හෘදයවස්තු රූපය යන වස්තු දසකය ද,

ජීවිතින්ද්‍රිය ය, අවිනිර්භාග රූපය-කායප්‍රසාදය යන කාය දසකය ද,

ජීවිතින්ද්‍රිය, අවිනිර්භාග රූපය, භාව රූපය යන භාව දසකය දැයි,

මෙසේ ත්‍රිසන්තති වශයෙන් වස්තු දසක, කාය දසක, භාව දසකයන්ගේ වශයෙන් රූප තිසක් උපදී. ඒ රූප තිසම ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයේදීම උපදී. එසේම ස්ථිති ක්ෂණයෙහි ද, භඞ්ගක්ෂණයෙහි ද උපදී.

ඒ නාම-රූප දෙකින් රූපය සතළොස් චිත්තක්ෂණ- යකට ආයු ඇති හෙයින් දන්ධව නිරොධ වෙයි.

**චිත්තය** වහා නිරුඬ වෙයි. චිත්තයාගේ උත්පාදක්ෂණයත්, ස්ථිති **ක්ෂණයත්**, භඞ්ග **ක්ෂණයත්** යන තුනම එක සමානය. රූපයාගේ උත්පාද, භඞ්ග **ක්ෂණ** දෙක සමානව සැහැල්ලු වෙයි. රූපයාගේ ස්ථිති **ක්ෂණය** සොළොස් චිත්ත **ක්ෂණයක්** පවත්නා හෙයින් මහත් වේ.

ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව උපදනා **ප්‍රථම භවාඞ්ග චිත්තය,** ප්‍රතිසන්ධි චිත්තය හා **ඒකක්ෂණිකව** උපදනා හදයවත්‍ථු රූපය වූ පුරෙජාත හදයවත්‍ථු රූපය වස්තු කොට උපදී. **එයට** අනතුරුව **උපදනා** භවාඞ්ග සිත ප්‍රථම භවාඞ්ග චිත්තය හා **ඒකක්ෂණිකව** උපන් පුරෙජාත හදයවත්‍ථු රූපය වස්තු කොට ගෙන උපදී. මෙසේ මේ ක්‍රමයෙන් ආයු ඇතිතාක් චිත්ත ප්‍රවෘත්තිය පවතී. මරණාසන්න අවස්ථාවෙහිදී චුති චිත්තයට සොළොස් චිත්තක්ෂණයට පෙර උපන් හදය වත්‍ථු රූපය ඇසුරු කොට චුති චිත්තයෙන් අවසන් වන ඉතිරි සොළොස් චිත්තයෝ පවතිත්.

**ඕපපාතික සත්ත්වයනට** වනාහි **චක්‍ඛු දසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක, කාය දසක,** භාව **දසක,** වත්‍ථු **දසක** යන්ගේ වශයෙන් සත්තතිශීර්ෂ වශයෙන්, රූප සැත්තෑවෙක් උත්පත්තික්ෂණයේදී පහළ වෙත්.

**අසඤ්ඤසත්ත** පටිසන්ධියෙහි චිත්ත ප්‍රවෘත්තියෙක් නැත. එහි කර්මජ රූප වශයෙන් ඇත්තේ ජීවිත නවකය පමණය.

1. මෙසේ **කර්මජ රූපයන්ගේ ඉපදීම** බලන්නාවූ යෝගාවචර තෙම **කර්මය** නම් කුසලාකුසල චේතනාව යයි දනී. **කර්ම සමුත්ථානය** නම් විපාක වශයෙන් ලැබෙන වේදනාදි ස්කන්ධ හා චක්‍ඛු දසකාදි සමසැත්තෑ රූපය ද, ජීවිත නවක යයි ද දනී. **කර්ම ප්‍රත්‍යය** නම් කුසලාකුසල කර්මයෙන් උපස්ථම්භක ලද එම විපාක ස්කන්ධය හා **කර්මජ**

රූප බව යයි දනී. **කර්ම ප්‍රත්‍ය චිත්ත සමුත්ථාන** නම් විපාක චිත්තයෙන් උපන් රූප බව දනී. **කර්ම ප්‍රත්‍ය ආහාර සමුත්ථාන** නම් කර්ම සමුත්ථාන රූපයන්හි පවත්නා ඕජාව අනික් ඕජාටඨමක රූපයක් උපදවන බව යයි දනී ඒ කර්ම සමුත්ථාන වූ ද, ආහාර සමුත්ථාන වූ ද ඕජාව අනෙක් ඕජාටඨමක රූපයක් උපදවයි. මෙසේ සමාන සන්තති වශයෙන් රූප කලාප සතරක් හෝ පහක් උපදවයි. **කර්ම ප්‍රත්‍යය ඍතු සමුත්ථාන** නම් කර්මජ තෙජෝ ධාතුව ස්ථිති අවස්ථාවට පැමිණියේ ඍතු සමුත්ථාන ඕජාටඨමක රූප කලාපය උපදවන බව ද, ඒ ඍතු සමුත්ථානයෙහි ද තෙජෝ ධාතුව අනික් ඕජාටඨමක රූපයක් දැයි මෙසේ සමාන සන්තති වශයෙන් රූප කලාප සතරක් පහක් උපදවන බව ද දනී. **කර්මජ තේජෝ ධාතුව** නම් ආහාරාදිය දිරවන උෂ්ණය යයි ද දනී.

2. කර්මයෙන් උපදවනු ලබන රූප මෙසේ දැන ඉක්බිති චිත්තය නිසා හටගන්නා රූපයන්ගේ උත්පත්තිය බැලීම පිණිස උත්සාහ කරන්නේ ය.

**චිත්තය** නම් එකුන් අනූ (89) චිත්තයෝ ය. ඔවුන් අතුරෙන් **කාමාවචර කුසල් අට ය. අකුසල් දොළොස ය. මහා ක්‍රියා අට ය, මනොද්වාරාවජ්ජන ය, හසිතොත්පාද ය, පඤ්චමධ්‍යාන කුසල ක්‍රියා දෙකය** යන දෙතිස් චිත්තයෝ **රූප** ද, **ගමනාදී ඉරියව්** ද, **කායවාග් විඥප්ති** ද උපදවති.

**රූපාවචර කුසල් හා ක්‍රියා සිත් දසය, අරූපාවචර කුසල ක්‍රියා අට ය, ලොකොත්තර සිත් අට ය** යන සවිසි (26) චිත්තයෝ **රූප** ද, **ඉරියව්** ද උපදවති.

**කාමාවචර** මහා **විපාක අටය, සන්තීරණ දෙකය, රූපාවචර විපාක පසය, සම්පටිච්ඡන දෙකය, පඤ්ච ද්වාරාවජ්ජනය, සොම්නස්සසන්තීරණය** යන එකුන්විසි (19) සිත් **රූප** පමණක් උපදවති.

**දෙපස් විඤ්ඤාණයෝය, ප්‍රතිසන්ධි චිත්තය, රහතුන්ගේ චුති චිත්තය, අරූප විපාක සතරය** යන සිත් සොළොස රූප ද, ඉරියව් ද විඥප්ති ද නූපදවති.

චිත්තයාගේ උත්පාදක්ෂණය අනන්තර ප්‍රත්‍යය ලැබීමෙන් බලවත් වන හෙයින්, රූප උපදවන සිත් ඒ චිත්තයාගේ උත්පාදක්ෂණයේදීම රූප උපදවයි. ස්ථිතික්ෂණය හා භඞ්ගක්ෂණය ද දුර්වල හෙයින් රූප ඉපදවීමට ශක්තියක් නැත.

ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි උපන් රූපය ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු සොළොස් වන චිත්තය සමග නිරුද්ධ වේ. ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි උපන් රූපය සතළොස් වන චිත්තයාගේ ස්ථිතික්ෂණයට පැමිණ නිරුද්ධ වේ. සසර පැවැත්ම හෝ චිත්ත සන්තතියෙහි පැවැත්ම හෝ ඇති තාක් කල් මේ ක්‍රමයම බව දත යුතු.

**චිත්තජ රූප නම් ශබ්ද නවකය, කාය-වාග් විඥප්ති දෙකය, පරිච්ඡේද රූපය, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා** නම් වූ **විකාර රූපය උපචය රූපය** හා **සන්තති රූපය** දැයි සතළොස් රූපයෝ ය.

**චිත්ත ප්‍රත්‍යය කොට ඇති රූප** නම් පසුව උපන් චිත්ත-චෛතසික ධර්මයන්ගෙන් පශ්චාජ්ජාත ප්‍රත්‍යය වශයෙන් උපකාර ලබන **චතුසමුට්ඨානික රූප** යයි.

**චිත්ත ප්‍රත්‍යය ආහාර සමුට්ඨාන රූප** නම් චිත්ත සමුට්ඨාන රූපයන්හි ස්ථිතියට පැමිණි ඕජාව අතික් ඕජාටඨමක රූප උපදවයි. මෙසේ දෙතුන් ප්‍රවෘත්තියක් ගලපයි.

**චිත්ත ප්‍රත්‍යය උතුසමුට්ඨාන** නම් සිතින් උපන් තේජෝ රූපය ස්ථිතියට පැමිණියේ අතික් ඕජාටඨමක රූපයක් උපදවයි. මෙසේ දෙතුන් ප්‍රවෘත්තියක් උපදවයි.

3. මෙසේ කම්මසමුට්ඨාන චිත්තසමුට්ඨානාදි රූපයන්ගේ උත්පාදය බලා ඉක්බිති **ආහාරජ රූපයන්ගේ** ඉපැද්ම ද බලන්නේ ය.

මෙහි **ආහාර** නම් **කබලීකාරාහාරය** යි.

**ආහාර සමුට්ඨාන** නම්:- උපාදින්නක වූ කර්මජ රූප ප්‍රත්‍යය ලැබ, ඒ කර්මජ රූපයෙහි පිහිටා ස්ථිති ප්‍රාප්ත ඕජාව විසින් උපදවන ලද **ඕජට්ඨමක රූපය ද, ආකාශ ධාතුව ද, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා රූප ද, උපචය, සන්තති රූප** දැයි තුදුස් රූපයෝ ය.

**ආහාර පච්චය** නම් කබලීකාරාහාරයෙන් ප්‍රත්‍යය ලබන **චතුසමුට්ඨානික රූපයෝ** ය.

**ආහාර පච්චය ආහාර සමුට්ඨාන** නම්:- සමුට්ඨාන ආහාර රූප **වීෂයෙහි** ස්ථිතිප්‍රාප්ත වූ ඕජාව අනික් ඕජාට්ඨමක රූපයක් උපදවයි. මෙසේ දස දොළොස් වරෙක ප්‍රවෘත්තිය ගළපයි. එක් දවසක් වැළඳූ ආහාරය සත් දවසක් මුළුල්ලෙහි මේ ශරීරයට උපස්ථම්භක වේ. මව බුදින ලද ආහාරය දරුවාගේ සිරුරෙහි පැතිර රූප උපදවයි. සිරුරෙහි ගැල් වූ ආහාර ද රූප උපදවයි.

කර්මයෙන් උපන්, උපාදින්නක ආහාරය ද ස්ථිතිප්‍රාප්ත වූයේ රූප උපදවයි. ඒ උපාදින්නක ආහාරයෙහි ඕජාව ද අනික් රූපයක් උපදවයි. මෙසේ සතර පස් ප්‍රවෘත්තියක් ගළපයි.

**ආහාර පච්චය උතුසමුට්ඨාන** නම්:- ආහාර ප්‍රත්‍යයෙන් නිපන් තෙජෝ ධාතුව ස්ථිතිප්‍රාප්ත වූයේ උතුසමුට්ඨාන වූ ඕජාට්ඨමක රූපය උපදවයි. එසේ දස දොළොස් වාරයක ප්‍රවෘත්තිය ගළපයි.

4. **කර්මජ, චිත්තජ, ආහාරජ** රූපයන්ගේ උත්පාදය මෙසේ දැන **ඍතුජ** රූපයන්ගේ උත්පාදය බැලීමට ද උත්සාහ දරන්නේ ය.

මෙහි **සෘතු** නම්:- **කම්මාදී චතුසමුට්ඨානික තෙජෝ ධාතුව** ය. ශීතොෂ්ණ වශයෙන් දෙයාකාරයෙන් දක්වනු ලබන්නේ එකම තෙජෝ ධාතුහුගේ අඩු බව හෝ වැඩි බව ය. සපශී වූවහුගේ ශරීර උෂ්ණයට වඩා අඩුවූයේ **ශීතය** යයි ද, එයට වැඩි වූයේ **උෂ්ණ** යයි ද දත යුතු.

**උතුසමුට්ඨාන** නම්:- චතුසමුට්ඨාන වූ සෘතුව උපාදින්නක ප්‍රත්‍යය ලැබ සථිතිප්‍රාප්ත වූයේ ශරීරයෙහි රූප උපදවයි. **උතුසමුට්ඨාන රූපය, සද්ද නවකය, ආකාශ ධාතු, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා රූපය, උපචය** හා **සන්තති රූප** යන පසළොස් වැදෑරුම් රූප උපදවයි.

**සෘතු ප්‍රත්‍යය** නම්:- තෙජෝ ධාතුව කර්මාදි චතුසමුට්ඨානික රූපයන්ගේ පැවැත්මට ද, විනාශයට ද ප්‍රත්‍යය වේ.

**උතුපච්චය උතුසමුට්ඨාන** නම්:- සෘතුවෙන් හටගත් තෙජො ධාතුව සථිතිප්‍රාප්තවූවා අතික් **ඕජාෂ්ටමක රූපයක්** දූයි මෙසේ දීර්ඝ කාලයක් අනුපාදින්න පක්ෂයෙහි සිට ද උතුසමුට්ඨානය පවතී.

**උතුපච්චය ආහාර සමුට්ඨාන** නම්:- සෘතුජ තෙජෝ ධාතුව සථිතිප්‍රාප්ත කල්හි එහි ඕජාව අන්‍ය වූ ඕජාෂ්ටමක රූපයක් උපදවයි. එහි ඕජාව ද අන්‍ය ඕජාෂ්ටමක රූප ද මෙසේ දස දොළොස් වාරයක ප්‍රවෘත්තිය ගළපයි.

## අරූප සම්මශීනය

මෙසේ චතුසමුට්ඨානික රූපයන්ගේ උත්පත්තිය දැක ඉක්බිතිව අරූප ධර්මයන්ගේ ද උත්පත්තිය දකිනු කැමැති වේ. එයද එක් අසූ ලෞකික චිත්තයන්ගේ වශයෙන් බලන්නේ ය.

මෙහි **නාම** නම්:- පූර්ව භවයෙහි රැස් කරණ ලද කුසල-අකුසල කර්ම වශයෙන් නිපන් **මහා විපාක අටය.**

**මහග්ගත විපාක නවය** ය, **උපෙක්ඛාසහගත සන්තීරණ දෙක** ය යන එකුන් විසි (19) විපාක සිත් ය. ප්‍රතිසන්ධි-යෙහි ඒ ඒ භව වශයෙන් උපදී.

ඒ එකුන් විසි චිත්තය ම, ප්‍රතිසන්ධි චිත්තයට අනතුරු චිත්තයෙහි පටන් භවාඞ්ග වශයෙන් ද, ආයු කෙළවර චුති වශයෙන් ද උපදී.

ඔවුන් අතුරෙන් කාමාවචර විපාක චිත්තය, චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි **අතිමහන්තාලම්බනයෙහි ද,** මනොද්වාරයෙහි විභූතාලම්බනයෙහි ද, මහාවිපාක අටය, සන්තීරණ තුන ය යන එකොළොස් චිත්තයන්ගෙන් එකක් **තදාලම්බන** වශයෙන් ද පවතී.

ප්‍රවෘත්ති කාලයෙහි චක්ෂු ප්‍රසාදයට රූපාලම්බන හමුවීමෙන් ද, ආලෝකය ඇසුරු කොට ගෙන පැවැති මනසිකාරය හේතු කොට ගෙන ද **චක්ඛු විඤ්ඤාණ සිත සම්ප්‍රයුක්ත ධර්මයන් සමග** උපදී.

උපදනා රූපයත්, නිරුද්ධ වන රූපයත් කිසිවකට ප්‍රත්‍යය නොවේ. ස්ථිතිප්‍රාප්ත චක්ෂු ප්‍රසාද රූපයෙහි ස්ථිතිප්‍රාප්තවූම රූපාලම්බනය ගැටේ. ඒ ගැටුණු කල **භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡෙද** වශයෙන් භවාඞ්ග චිත්තය දෙවරක් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව එම අරමුණෙහිම **ක්‍රියා මනොධාතු** නම් වූ **පඤ්චද්වාරාවජ්ජන සිත** ඒ රූපාලම්බනයෙහිම ආවජ්ජන කෘත්‍ය සිද්ධ කරමින් උපදී. එයට අනතුරුව එම රූපය ම අරමුණු කරමින් කුසල විපාක වූ හෝ අකුසල විපාක වූ හෝ **චක්ඛු විඤ්ඤාණ චිත්තය ද,** එයට අනතුරුව ඒ රූපය පිළිගනිමින් **විපාක මනොධාතු** නම් වූ **සම්පටිච්ඡන** චිත්තය උපදී. එයට අනතුරුව ඒ රූපය ම මනාකොට තීරණය කරමින් **විපාක අහේතුක මනොවිඤ්ඤාණ ධාතුව** නම් වූ **සන්තීරණ චිත්තය** ද, අනතුරුව එම රූපාලම්බනය ම විනිශ්චය කරමින් **උපෙක්ඛාසහගත ක්‍රියා අහේතුක**

**මනොවිඤ්ඤාණ ධාතුව** නම් වූ **උපෙක්ඛාසහගත මනොද්වාරාවජ්ජන සිත** ද උපදී. එයට අනතුරුව කාමාවචර කුසල, අකුසල ක්‍රියා චිත්තයන් අතුරෙන් එක් සිතක් මූර්ඡාකාල, මරණාසන්න කාලයන්හි පස්වරක් හෝ ප්‍රකෘති කාලයෙහි සත්වරක් හෝ ජවන වශයෙන් ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව කාමාවචර සත්ත්ව-යනට යටකී එකොළොස් තදාරම්මණ චිත්තයන් අතුරෙන් ජවනයට සුදුසු සේ යම්කිසි චිත්තයක් තදාරම්මණ වශයෙන් උපදී. සෙසු ශ්‍රොතද්වාරාදී සිව්ද්වාරයන්හි ද මේ ක්‍රමයම වේ.

මනොද්වාරයෙහි රූපා-රූප මහග්ගත චිත්ත ද උපදී.

මෙසේ ෂඩ්ද්වාරයන්හි චිත්ත ප්‍රවෘත්තිය දත් යුතු. අරූප ධර්මයන් ගේ ඉපදීම බලන්නාවූ යෝගාවචර තෙම කලෙක අරූප සම්මර්ශනය කෙරේ. කලෙක රූප ද, කලෙක අරූප ද නුවණින් විමසා ත්‍රිලක්ෂණයට නගා උදය-ව්‍යය ඤාණානු ක්‍රමයෙන් පිළිපැද ප්‍රඥා භාවනාව සම්පාදනය කෙරේ.

අනෙක් යෝගාවචර කෙනෙක් **රූප සප්තක අරූප සප්තක** වශයෙන් ත්‍රිලක්ෂණයට නගා සංස්කාර ධර්මයන් සම්මර්ශනය කෙරේ.

## රූප සප්තකය

> **"ආදාන නික්ඛෙපනතො-වයොවුඩ්ඪත්ථ ගාමිතො**
> **ආහාරතො ච උතුතො-කම්මතොචාපි චිත්තතො**
> **ධම්මතාරූපතො සත්ත-විත්ථාරෙන විපස්සති ති."**

යනාදී වශයෙන් දක්වන ලද හෙයින් යෝගාවචර තෙම—

1. **ආදානනික්ඛෙප** වශයෙන් ද,
2. **වයොවුඩ්ඪත්ථගමන** වශයෙන් ද,
3. **ආහාරමය රූප** වශයෙන් ද,

4. **ඍතුජ රූප** වශයෙන් ද,

5. **කර්මජ රූප** වශයෙන් ද,

6. **චිත්තසමුට්ඨාන** වශයෙන් ද,

7. **ධම්මතා රූප** වශයෙන් ද,

යන මේ ක්‍රමයෙන් තිලකුණට නගා සංස්කාර ධර්මයන් සම්මර්ශනය කෙරේ.

1. **ආදානනික්ඛෙප වශයෙන්** – මෙහි **ආදාන** නම් ප්‍රතිසන්ධියයි. **නික්ඛෙප** නම් චුතියයි. මේ යෝගාවචර තෙම **ප්‍රතිසන්ධිය** හා **චුතිය** අතර පැවැති සියලු **රූප ධර්මයෝ** උත්පාද, නිරුද්ධ වශයෙන් පවත්නා හෙයින් ද, විපරිණාම හෙවත් ජරා – මරණ දෙකින් පෙරළෙන හෙයින් ද, තාවකාලික හෙයින් ද, නිත්‍ය ස්වභාවයෙන් නො පවත්නා හෙයින් ද, **අනිත්‍යයහ**.

උපන් සංස්කාරයෝ ස්ථිතියට පැමිණෙන හෙයින් ද, ස්ථිතියෙහි පැවැති සංස්කාර ජරායෙන් පීඩිත වන හෙයින් ද, ජරාවට පැමිණි සංස්කාර ඒකාන්තයෙන් බිඳෙන හෙයින් ද, මෙසේ නිතර නිතර පෙළෙන හෙයින් ද, ඉවසීමට දුෂ්කර හෙයින් ද, සසර දුකට පිහිටවන හෙයින් ද, සැපයට ප්‍රතිපක්ෂ හෙයින් ද **දුක්ඛයහ**.

"උපන් සංස්කාර ස්ථිතියට නො පැමිණෙත්වා, ස්ථිතියට පැමිණියාහු නො දිරත්වා, දිරුවාහු නො බිඳෙත්වා." මෙසේ මේ ස්ථිති, ජරා, භෙද යන අවස්ථා තුන කිසිවකුගේ වශයෙහි නො පවත්නා හෙයින් ද, ශූන්‍යහ. එසේ ශූන්‍ය හෙයින් ද, වශයෙහි නො පවත්නා හෙයින් ද, ස්වාමිවූවක් නැති හෙයින් ද, වශයෙහි පවත්නකු නැති හෙයින් ද, ආත්මයට ප්‍රතිපක්ෂ හෙයින් ද **අනාත්මයහ**.

මෙසේ **ආදාන නික්ඛෙප** වශයෙන් ප්‍රතිසන්ධිය හා චුතිය අතර පැවති රූපයෙහි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණයන් සම්මර්ශනය කරන්නේ ය.

2. **වයොවුඩ්ඪත්ථගමන වශයෙන්** – මෙහිදී යෝගී තෙම වයස් වශයෙන් වැඩුණු රූපයාගේ අස්තඞ්ගමය බැලීම් වශයෙන් ත්‍රිලක්ෂණයට නගයි. පළමු කොට අවුරුදු සියය තුනකට බෙදා, ප්‍රථම වයස ය, මධ්‍යම වයස ය, පශ්චිම වයස යයි පිරිසිඳියි. මුල තෙතිස් වස ප්‍රථම වයස ය. මැද සූතිස් වස මධ්‍යම වයස ය. අග තෙතිස් වස පශ්චිම වයස ය. මෙසේ තුන් වයසින් පිරිසිඳ, ප්‍රථම වයසෙහි පැවති රූපය මධ්‍යම වයසට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එහෙයින් ඒ රූපය අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් ඒ දුකය. යමක් දුක් නම් ඒ අනාත්ම යයි විදර්ශනා වඩයි.

මධ්‍යම වයස්හි පැවැති රූපය ද, පශ්චිම වයසට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එ හෙයින් එය ද අනිත්‍යය. දුක්ය, අනාත්ම යයි විදර්ශනා කෙරේ.

පශ්චිම වයස්හි පැවැති රූපය ද මරණයෙන් මත්තෙහි යාමට සමර්ථයෙකු නැති හෙයින් එය ද අනිත්‍යය, දුක්ය, අනාත්මය යි ත්‍රිලක්ෂණයට නගයි. මෙසේ තුන් වයසින් **වයොවුඩ්ඪත්ථ ගමන** වශයෙන් ත්‍රිලක්ෂණයට නගයි.

ඉක්බිති හෙතෙම සියයක් වූ වයස දස කොටසකට බෙදා විදර්ශනා කරන්නේ ය. ඒ මෙසේයි –

**"මන්දා, ඛිඩ්ඩාච වණ්ණාච – බලං, පඤ්ඤාච, හායනා, පබ්භාරාච පවඞ්කාච – මොමූහ, සයනා දස."**

1. මුල් දස හවුරුද්ද **මන්ද දසකයයි**. එකල හෙතෙම මන්ද, චපල, කුඩා ළදරුවෙක් වේ. මේ දසකයෙහි පැවැති රූපය දෙවන දසකයට නො පැමිණ එහි ම නිරුද්ධ වේ.

2. දෙවන දසකය නම් **ක්‍රීඩා දසකයයි**. මෙහිදී හෙතෙම බොහෝ සේ ක්‍රීඩායෙහි ඇලෙයි. මේ දෙවන දසකයෙහි පැවැති රූපයෝ තුන්වන දසකයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙත්.

3. තුන්වන දසකය නම් **වර්ණ දසකයයි.** මේ කාලයෙහි ඔහුගේ ශරීර වර්ණය ප්‍රසන්නව වර්ණවත් බවට පැමිණේ. මෙ කල්හි පැවැති රූපයෝ ද පස්වන දසකයට නො පැමිණ නිරුද්ධ වෙත්.

4. සතරවන දසකය නම් **බල දසකයයි.** ශරීරය ශක්ති සම්පන්නව වැඩී පවතින කාලයයි. මෙ කල්හි පැවැති රූපයෝ ද පස්වන දසකයට නො පැමිණ නිරුද්ධ වෙත්.

5. පස්වන දසකය නම් **ප්‍රඥා දසකයයි.** මේ කාලයෙහි ඔහුගේ නුවණ සපිරව පිහිටයි. ඒ කාලයෙහි පැවැති රූපයෝ සවන දසකයට නො පැමිණ නිරුද්ධ වෙත්.

6. සවන දසකය නම් **හායන හෙවත් පිරිහෙන දසකයයි.** වර්ණ, බල, නුවණාදිය ක්‍රමයෙන් පිරිහෙන්නට පටන්ගනී. මෙ කල්හි පැවැති රූපයෝ සත්වන දසකයට නො පැමිණ නිරුද්ධ වෙති.

7. සත්වන දසකය නම් **පබ්භාර දසකයයි.** සිරුර ඉදිරියට නැමීමට පටන් ගනියි. මෙහිදී උපන් රූපයෝ ද එහි දීම නිරුද්ධ වෙත්. අටවන දසකයට නො පැමිණෙත්.

8. අටවන දසකය නම් **ප්‍රවඞ්ක දසකයයි.** සිරුර නගුල් කොනක් මෙන් ඉදිරියට නැමෙයි. මෙහිදී ඇතිවන රූප එහිදීම නිරුද්ධ වෙත්. නවවන දසකයට නො පැමිණෙත්.

9. නවවන දසකය නම් **මෝමූහ දසකයයි.** සිහිනුවණ පිරිහී මූළාවට පත්වන කාලයයි. මෙහිදී හටගන්නා රූපයෝ දසවන දසකයට නො පැමිණ නිරුද්ධ වෙත්.

10. දසවන අවසාන දසකය නම් **ශයන දසකයයි.** අධික දුර්වලත්වය නිසා බොහෝ සේ සයනගත වන කාලයයි. මේ කාලයේදී පැවැති රූපයෝ දෙවන භවයට නොගොස් ඒ දසකයෙහිම නිරුද්ධ වෙත්. එ බැවින් මේ සියලුම කල්හි පැවැති රූපයෝ අනිත්‍යයහ. දුක්ඛයහ, අනාත්ම යයි තිලකුණට නගයි.

මෙසේ දසක වශයෙන් ගෙන **වයෝවුඩ්ඪ ගමන වශයෙන්** විදර්ශනාවට නගයි.

මෙසේ ක්‍රමයෙන් අවුරුදු සියයක් වන ජීවිත කාලය පස් අවුරුද්ද වශයෙන් විසි කොටසකට ද,

සතර අවුරුද්ද බැගින් පස්විසි කොටසකට ද,

තුන් අවුරුද්ද බැගින් තෙතිස් කොටසකට ද,

දෑවුරුද්ද බැගින් පනස් කොටසකට ද,

එක් අවුරුද්ද බැගින් කොටස් සියයකට ද,

එක් අවුරුද්ද තුන් කොටසට බෙදා **වස්සාන ඍතුවය, හේමන්ත ඍතුවය, ගිම්හාන ඍතුව** යයි ඍතුව වශයෙන් ද,

එක් අවුරුද්ද සය කොටසකට බෙදා, **වස්සාන ඍතුවය, සරද ඍතුවය, හේමන්ත ඍතුවය, සිසිර ඍතුවය, වසන්ත ඍතුවය, ගිම්හාන ඍතුවය** යන ඍතු සයක් වශයෙන් ද,

එක් මසක් දෙකකට බෙදා **කාල පක්ෂය, සුක්ල පක්ෂය** යයි දෙපක්ෂයක් වශයෙන් ද,

එක් දිනක් රෑ දවල් වශයෙන් දෙකොටසකට ද,

එක් දිනක් සයකොටසකට බෙදා **පූර්වාහ්නය, මධ්‍යාහ්නය, සායන්හය, පෙරයම, මැදියම, පසුයම** වශයෙන් ද ගෙන ඒ ඒ අවස්ථාවන්හි පැවති රූපයෝ අනෙක් අවස්ථාවකට නො පැමිණ එහි ම නිරුඬ වෙත්. එ හෙයින් අනිත්‍යය, දුකය, අනාත්මය යයි ත්‍රිලක්ෂණයට නගයි.

තවද, **ඉරියව් ආදීන්ගේ වශයෙන්** වයෝවුඩ්ඪගමන මෙනෙහි කරයි. **ඉදිරියට යාමය, පෙරළා ඒමය, ඉදිරි බැලීමය, ඔබ්මොබ බැලීමය, අත් පා හැකිලීමය, දිග හැරීමය** යන මොවුන්ගේ වශයෙන් ද සලකයි. ඉදිරියට

යාමෙහි පැවැති රූපය පෙරළා ඊමට නො පැමිණ එහි ම නිරුඬ විය. මේ ආදී වශයෙන් ඒ ඒ ඉරියව්වෙහි පැවැති රූප අන් ඉරියව්වකට නො පැමිණ එහි ම නිරුඬ විය. එ හෙයින් අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි තිලකුණට නගයි.

තවද, එක් පියවරක් **උඬරණ** හෙවත් පය භූමියෙන් නැගීමය, **අතිහරණ,** හෙවත් ඉදිරියට යැවීමය, **වීතිහරණ** හෙවත් කණුකටු සර්පාදීන් ගෙන් කිසිවක් දැක, පය ඔබ්මොබ යැවීමය, **වොස්සජන,** හෙවත් පය යටට හෙළීමය, **සන්නික්ඛෙපන** හෙවත් පොළොවෙහි පය තැබීමය, **සන්නිරුම්භන** හෙවත් පය ඉදිරීමය යනාදී වශයෙන් ගෙන උඬරණ අවස්ථායෙහි පැවැති රූපයෝ අතිහරණ අවස්ථාවට නො පැමිණ එහිදී ම නිරුඬවිය. මේ ක්‍රමයෙන් සැම ඉරියව්වක් පාසාම උපදනා රූපයෝ අන් ඉරියව්වකට නො පැමිණ නිරුඬ වෙතියි මෙනෙහිකරත්. එ හෙයින් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනාවට නගයි.

**මෙකී උඬරණයෙහි, පඨවි, ආපෝ** ධාතු හීන ය. **තෙජෝ, වායෝ** ධාතු බලවත් ය. **අතිහරණ, වීතිහරණ** දෙක්හි ද එසේ ම ය. **වොස්සජනයෙහි දී තෙජෝ, වායෝ** ධාතු හීන ය. **පඨවි, ආපෝ** දෙක බලවත් ය. **සන්නික්ඛෙපනයෙහි ද, සන්නිරුම්භයෙහි ද** එසේ ම ය.

යෝගාවචර තෙමේ මෙසේ නා නා අයුරින් වයො-වුඩත්ථගාමි රූපයෙහි තිලකුණු නගා සම්මර්ශනය කරන්නේ ය.

**3. ආහාරමය රූප වශයෙන්** – මේ ආහාරමය රූපය **ක්‍ෂුධා සුභික්‍ෂ කාල** වශයෙන් ප්‍රකට වේ.

ක්‍ෂුධා කාලයෙහි උපන් රූපය ම්ලානික වේ. කලානත වේ. දැගිය කණුවක් මෙන් ද අඟුරු පැසෙක සැඟවුණු කවුඩකු මෙන් ද දුර්වර්ණ වෙයි. නපුරුව සිටී. සුභික්‍ෂ කල හෙවත් ආහාරයෙන් පිරුණු කල උපන්

රූපය තෘප්ත වෙයි. ප්‍රණීත වෙයි. මෘදු වෙයි. සිනිඳු වෙයි. මනා පහස් ඇති වෙයි. ඒ යෝගි තෙම එය පරිග්‍රහ කොට ක්‍ෂුධා කල්හි පැවැති රූප සුභික්‍ෂ කලට නො පැමිණ ඒ ක්‍ෂුධා කල්හි ම නිරුද්ධ වෙත්. සුභික්‍ෂ කල්හි පැවැති රූප ක්‍ෂුධා කලට නො පැමිණ එහිම නිරුද්ධ වෙත්. එ හෙයින් ඒ රූප අනිත්‍ය ය, දුක්ඛය, අනාත්මය යයි තිලකුණට නගයි.

4. **සෘතුජ රූප වශයෙන්** – මේ සෘතුජ රූපය ශීත උෂ්ණ වශයෙන් ප්‍රකට වේ. උෂ්ණ කාලයෙහි පවත්නා රූපය මලානික වේ. කලානත වේ. දුර්වර්ණ වේ. ශීත කාලයෙහි පවත්නා රූපය තෘප්ත වේ. ප්‍රණීත වේ. මෘදු වේ. සුවපහස් ඇත්තේ වේ. සිනිඳු වේ. උෂ්ණ කාලයෙහි පැවැති රූපය ශීත කාලයට නො පැමිණ එහිම නිරුද්ධ වේ. ශීත කාලයෙහි පැවැති රූපය උෂ්ණ කාලයට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එ හෙයින් එය අනිත්‍ය ය, දුක්ඛය, අනාත්ම යයි මෙසේ තිලකුණට නගයි.

5. **කර්මජ රූප වශයෙන්** – කර්මජ රූප ආයතන සංඛ්‍යාත ද්වාර වශයෙන් ද ප්‍රකට වේ. චක්‍ෂුර්ද්වාරයෙහි **චක්‍ෂු දසක, කාය දසක,** භාව **දසක** යයි, **කර්මජ රූප තිසක්** වේ. ඔවුනට උපස්ථම්භක **සෘතු, චිත්ත, ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටක** තුන තුන වශයෙන් සූවිසි රූපයක් දැයි සූපනසක් (54) රූප වෙති. **ශ්‍රොත, ඝ්‍රාණ ජිව්හා** ද්වාරයන්හි ද එසේම සූපනස බැගින් වෙති. **කායද්වාරයෙහි කාය භාව** දසක වශයෙන් ද රූප විස්සක් වෙයි. සෘතු, චිත්ත, ආහාර සමුට්ඨාන වශයෙන් ශුද්ධාෂ්ටක තුන තුන බැගින් සූවිසි රූපයක් දැයි සූසාළිස් (44) රූප වෙති. මනොද්වාරයෙහි **හදය වත්ථු දසකය, කාය දසකය, භාව දසකය** යන මොවුන්ගේ වශයෙන් ද **සෘතු, චිත්ත ආහාර** සමුට්ඨාන වශයෙන් ද සූපනසෙක් (54) වේ.

යෝගී තෙම මේ සියලු රූප පරිග්‍රහ කොට චක්‍ෂුර්ද්වාරයෙහි පැවැති රූපය ශ්‍රොතද්වාරයට නො පැමිණ එහි ම

නිරුද්ධ වේ. මෙසේ ඒ ඒ වාරයන්හි පැවැති රූප අන් වාරයකට නො පැමිණ එහි ම නිරුද්ධ වෙත්. එ හෙයින් එය අනිත්‍ය ය, දුක්ඛය, අනාත්ම යයි මෙසේ තිලකුණට නගයි.

6. **චිත්ත සමුට්ඨාන වශයෙන්** – මේ රූප සෝමනස්ස දෝමනස්ස කාලයෙහි පැවැතීම් වශයෙන් ප්‍රකට වේ.

සොම්නස් කල උපන් රූපය සිනිඳු වේ. මෘදු වේ. ප්‍රණීත වේ. සුඛස්පර්ශ ඇත්තේ වේ. දොම්නස් කල උපන් රූපය මලානික වේ. කලානත වේ. දුර්වර්ණ වේ.

සොම්නස් කල පැවැති රූපය දොම්නස් කලට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. දොම්නස් කල පැවැති රූපය සොම්නස් කලට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එහෙයින් අනිත්‍ය ය, දුක්ඛය, අනාත්මය යයි තිලකුණට නගයි.

7. **ධම්මතා රූප වශයෙන්** – **ධම්මතා රූපය** නම් බාහිර වූ අනින්ද්‍රිය බද්ධ වූ යකඩ, ලෝහ, සුදු ඊයම්, කළු ඊයම්, රන්, රිදී, මුතු, මැණික්, වෙරළු, සක්, කළුගල්, පබළු, රතුකැට, මැසිරිගල්, පොළොව්, පහණ ගල්, තණ, රුක්, ලිය ආදී ප්‍රභෙද ඇති හටගන්නා කප හෙවත් විවට්ට කල්පය පටන්ගෙන උපදනා රූපයයි. එය මේ යෝගීහට **අශෝක අඞ්කුර** වශයෙන් ප්‍රකට වේ යයි කියන ලදී.

අශෝක අඞ්කුර රූපය ආදියෙහි තුනී රත්පැහැය ය, දෙතුන් දිනක් ගිය කල මඳක් රත් වේ. අනතුරුව තරුණ පත් බඳු වර්ණ වේ. අනතුරුව මේරූ පත් බඳු පැහැ වේ. එතැන් පටන් වර්ණාදී වශයෙන් සමාන සවභාවය ඇති රූපය හේතු-ඵල පරම්පරා නො සිඳ පවත්තේ අවුරුද්දකින් පමණ පඬුවන්ව නටුවෙන් ගැලවී බිම හෙයි. ඒ යෝගී තෙම ඒ රූපය පරිග්‍රහ කොට තුනී රතු කල පැවැති රූපය තද රතු කාලයට නො පැමිණ නිරුද්ධ වේ.

මේ ක්‍රමයෙන් එක් අවස්ථාවෙක පැවැති රූපය අනෙක් අවස්ථාවකට නො පැමිණ නිරුද්ධ වේ. එ හෙයින් එය අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි තිලකුණට නගා සියලු ම ධම්මතා රූප සම්මර්ශනය කෙරේ.

මෙසේ රූප සප්තක වශයෙන් පළමු කොට තිලකුණට නගා සංස්කාරයන් සම්මර්ශනය කෙරේ.

## අරූප සප්තකය

**“කලාපතො, යමකතො - ඛණතො, පටිපාටිතො
දිට්ඨිඋග්ඝාටතො මාන - සමුග්ඝාටනතො පි ච
නික්කන්ති පරියාදානා - සත්තාරූප විපස්සනා.”**

යනාදී වශයෙන් දක්වන ලද හෙයින් යෝගාවචර තෙම—

**1. කලාප වශයෙන් ද, 2. යමක වශයෙන් ද, 3. ක්ෂණික වශයෙන් ද, 4. පටිපාටි වශයෙන් ද, 5. දිට්ඨිඋග්ඝාටන වශයෙන් ද, 6. මාන සමුග්ඝාටන වශයෙන් ද, 7. නික්කන්ති පරියාදාන වශයෙන් දැයි** සත් පරිද්දෙකින් විදර්ශනා කරන්නේ ය.

**1. කලාප වශයෙන් සම්මර්ශනය** - යෝගාවචර භික්ෂු තෙම මේ කෙශය අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි සම්මර්ශනය කිරීමේ දී ඒ සිත හා සම්ප්‍රයුක්ත **ඵස්ස, වෙදනා, සංඥා, චෙතනා** හා **චිත්තය** ද යන **ඵස්ස පඤ්චක ධර්මයට අරූප කලාප** යයි කියනු ලැබේ. මේ ඵස්ස පඤ්චමක ධර්මයෝ අනික් කලාපයකට නො පැමිණ කොටස් කොටස් ව විනාශව යෙති. එ හෙයින් අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි සම්මර්ශනය කෙරේ.

තවද, යට කියන ලද රූප සප්තකයෙහි වූ ආදාන නික්ඛෙපාදී රූප වෙන් වෙන් වශයෙන් ගෙන අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි සම්මර්ශනය කොට ඒ ත්‍රිලක්ෂණයට නැංවූ චිත්තය ද අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි අන් සිතකින් සම්මර්ශනය කරන කල්හි එය **කලාප සම්මර්ශනය** නම් වේ.

**2. යමක වශයෙන් සම්මර්ශනය** – ආදානනික්ඛෙපාදී රූපයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සම්මර්ශනය කොට ඒ සම්මර්ශනය කළ චිත්තය ද අන් සිතකින් අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි සම්මර්ශනය කිරීමෙන් රූපා රූප යුගල වශයෙන් විදර්ශනා වැඩීම ද, **යමක වශයෙන් සම්මර්ශනය කිරීම** නම් වේ.

**3. ක්‍ෂණික වශයෙන් සම්මර්ශනය** – ආදානනික්ඛෙපාදී රූපයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සම්මර්ශනය කොට ඒ විදර්ශනා කළ පළමු වන සිත ද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සම්මර්ශනය කොට, ඒ සිත ද අනිත්‍යාදී වශයෙන් අන් සිතකින් සම්මර්ශනය කොට මෙසේ දෙවන තුන්වන, සතරවන සිත දැයි සිත් සතරක් සම්මර්ශනය කිරීම **ක්‍ෂණික වශයෙන් සම්මර්ශනය කිරීම** නම් වේ.

**4. පටිපාටි වශයෙන් සම්මර්ශනය** – ආදානනික්ඛෙපාදී රූපයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි විදර්ශනා කොට ඒ විදර්ශනා චිත්තය දෙවන සිතකින් විදර්ශනා කොට මෙසේ පිළිවෙළින් දසවන චිත්තය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි එකොළොස් වන සිතින් සම්මර්ශනය කෙරේ. මෙසේ දසවන චිත්තය තෙක් විදර්ශනා වැඩීමෙන් රූප කර්මස්ථානය ද, අරූප කර්මස්ථානය ද ප්‍රගුණ වේ. මෙසේ සම්මර්ශනය කිරීම පටිපාටි වශයෙන් සම්මර්ශනය කිරීම නම් වේ. මෙසේ විදර්ශනා පිළිවෙළින් මුළු දවසම සම්මර්ශනය කිරීම ද යුතු ම ය.

**5. දිට්ඨි උග්ඝාටන වශයෙන් ද,**

**6. මාන උග්ඝාටන වශයෙන් ද,**

**7. නිකන්ති පරියාදාන වශයෙන් දැයි** යන මේ තුනෙහි වෙන් වෙන් වූ සම්මර්ශනයක් නැත.

රූප සප්තකයෙහි රූප ද, අරූප සප්තකයෙහි අරූපය ද විදර්ශනා වඩා ඒ නාම – රූපයන්ගෙන් මත්තෙහි අනෙක් සත්ත්වයෙකු නො දක්තේ ය. එසේ සත්ත්වයෙකු නුදුටු

තැන් පටන් සත්ත්ව සංඥව උගුළු වන ලද්දේ වේ. සත්ත්ව සංඥව බැහැර කල සිතින් සංස්කාරයන් පරිග්‍රහ කරන්නාහට **දිට්ඨිය** නූපදී. දිට්ඨිය නූපදනා කල **දිට්ඨිය උගුළු වන ලද්දී** වේ.

දිට්ඨිය උද්ඝාටිත සිතින් සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට **මානය** නූපදී. මානය නූපදනා කල **මානය සමුද්ඝාටිත** නම් වේ.

මානය සමුද්ඝාටිත සිතින් සංස්කාරයන් පරිග්‍රහ කරන්නාහට **තෘෂ්ණාව** නූපදී. තෘෂ්ණාව නූපදනා කල්හි නිකන්තිය හෙවත් **සියුම් තෘෂ්ණාව** ප්‍රහීණ වෙයි.

තවද, "මම විදර්ශනා කරමි. විදර්ශනාව මාගේය" යි මෙසේ සත්කායදිට්ඨියෙන් ගන්නවුන්ගේ **ආත්ම දිට්ඨිය** නො සිඳේ. සංස්කාරයෝම, සංස්කාරයන් විදර්ශනා කෙරෙති, අනිත්‍යාදී වශයෙන් විනිශ්චය කෙරෙති. පරිග්‍රහ කෙරෙති, පිරිසිඳිති යයි ගන්නහුට වනාහි **දිට්ඨිය උග්ඝාටනය** වේ.

"මම මනාව විදර්ශනා කරමි. මගේ විදර්ශනාව මැනවැ"යි ගන්නහුගේ **මානය** නො නැසේ. සංස්කාරයෝ සංස්කාරයන් විදර්ශනා කෙරෙති. සම්මර්ශනය කෙරෙති, විනිශ්චය කෙරෙති, පරිග්‍රහ කෙරෙති, පිරිසිඳිති යයි ගන්නහුගේ **මානය සමුද්ඝාටනය** වේ.

"මට විදර්ශනා කල හැකිය" යි විදර්ශනාව ආශ්වාදනය කරන යෝගීහුගේ නිකන්ති නම් වූ සියුම් තෘෂ්ණාව ක්‍ෂය නොවේ. සංස්කාරයෝ ම සංස්කාරයන් විදර්ශනා කෙරෙති, සම්මර්ශනය කෙරෙති, විනිශ්චය කෙරෙති, පරිග්‍රහ කෙරෙති, පිරිසිඳිතියි ගන්නහුගේ **සියුම් තෘෂ්ණාව ක්‍ෂය** වේ.

මෙසේ සංස්කාරයන් **අනාත්ම** වශයෙන් දක්නහුගේ **ආත්ම දිට්ඨිය සමුද්ඝාටනය** වේ. **අනිත්‍ය වශයෙන්** දක්නහුගේ **මානය සමුද්ඝාටනය** වේ. **දුක් වශයෙන්** දක්නහුගේ **නිකන්තිය දුරු** වේ.

මේ නයින් රූපා - රූප කර්මස්ථානය පුහුණු වූ යෝගී තෙම අටළොස් මහා විදර්ශනායෙන් මෙහි දී පළමු කොට එක දෙශයක් ප්‍රතිවෙධ කිරීමෙන් එයට ප්‍රතිපක්‍ෂ වූ ධර්ම විෂ්කම්භනය කෙරේ.

**අටළොස් මහා විදර්ශනාවෝ නම්:—**

1. **අනිච්චානුපස්සනාව** – නිත්‍ය සංඥව දුරු කෙරේ.
2. **දුක්ඛානුපස්සනාව** – සුඛ සංඥව දුරු කෙරේ.
3. **අනත්තානුපස්සනාව** – ආත්ම සංඥව දුරු කෙරේ.
4. **නිබ්බිදානුපස්සනාව** – නන්දිය නම් වූ සප්‍රිතික තෘෂ්ණාව දුරු කෙරේ.
5. **විරාගානුපස්සනාව** – රාගය දුරු කෙරේ.
6. **නිරෝධානුපස්සනාව** – සමුදය දුරු කෙරේ.
7. **පටිනිස්සග්ගානුපස්සනාව** – ආදානය නම් වූ භව තෘෂ්ණාව දුරු කෙරේ.
8. **ඛයානුපස්සනාව** – ඝන සංඥව නම් වූ සන්තති, සමූහ, කෘත්‍ය, ආරම්මණ වශයෙන් එකත්වයෙන් ගැනීම දුරු කෙරේ.
9. **වයානුපස්සනාව** – සංස්කාරයන්ගේ රැස් කිරීම දුරු කෙරේ.
10. **විපරිනාමානුපස්සනාව** – ධ්‍රුව සංඥව නම් වූ ස්ථිර වශයෙන් ගැනීම දුරු කෙරේ.
11. **අනිමිත්තානුපස්සනාව** – නිත්‍ය නිමිත්ත දුරු කෙරේ.
12. **අප්පණිහිතානුපස්සනාව** – ප්‍රණිධිය නම් වූ සුඛ වශයෙන් ගැනීම දුරු කෙරේ.
13. **සුඤ්ඤතානුපස්සනාව** – ආත්ම වශයෙන් අභිනිවෙශය දුරු කෙරේ.

14. **අධිපඤ්ඤා ධම්මානුපස්සනාව** - තෘෂ්ණා, දිට්ඨි වශයෙන් දැඩිව ගැනීම දුරු කෙරේ.

15. **යථාභූත ඤාණ දර්ශනය** - සම්මෝහාභිනිවේශය දුරු කෙරේ.

16. **ආදීනවානුපස්සනාව** - ආලය වශයෙන් දැඩිව ගැනීම දුරු කෙරේ.

17. **පටිසඞ්ඛානුපස්සනාව** - අප්පටිසඞ්ඛාය නම් වූ අවිද්‍යාව දුරු කෙරේ.

18. **විවට්ටානුපස්සනාව** - කාමසංයොගාදි කෙලෙශ ප්‍රවෘත්තිය දුරු කෙරේ.

මේ අටළොස් මහා විදර්ශනාවන් අතුරෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන **ලක්ෂණත්‍රය** වශයෙන් සංස්කාරයන් දක්නා ලද හෙයින් යෝගාවචර තෙම අනිත්‍ය, දුක්ඛ, අනාත්මානු දර්ශනය ප්‍රතිවේධ කරන ලද්දේ වෙයි.

**අනිච්චානුපස්සනාව** හා **අනිමිත්තානු පස්සනාව** ද සමානාර්ථ ඇත්තේ වේ.

**දුක්ඛානුපස්සනාව** හා **අප්පණිහිතානුපස්සනාව** ද සමානාර්ථ ඇත්තේ වේ.

**අනත්තානුපස්සනාව** හා **සුඤ්ඤතානුපස්සනාව** ද සමානාර්ථ ඇත්තේ වේ.

එහෙයින් **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** යන **ත්‍රිවිධ අනුපස්සනාවන්** සම්බන්ධ වූ කල්හි **අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත** යන ත්‍රිවිධ අනුපස්සනාවෝ ද ප්‍රතිවේධ කරන ලද්දේ වේ.

එසේ ම **අධිපඤ්ඤා ධම්මානුපස්සනාව** සියලු විදර්ශනාවන්හි ඇති හෙයින් එය ද ප්‍රතිවේධ කරන ලද්දේ වේ.

**යථාභූත ඤාණ දර්ශනය කඞ්ඛාවිතරණ විශුද්ධියෙහිම** සංග්‍රහ කරන ලදී.

සෙසු **නිබ්බිදානුපස්සනාදී** දස විදර්ශනාවන් අතුරෙන් කිසිවක් එක දේශ මාත්‍රයෙන් ප්‍රතිවෙධ කරන ලද්දේ වෙයි, කිසිවක් ප්‍රතිවේධ නො කරන ලද්දේ ද වෙයි.

තවද, **අනිච්චානුපස්සනාව** සිඞ කල්හි, **නිරෝධානුපස්සනා, භයානුපස්සනා, විපරිණාමානුපස්සනා** යන ත්‍රිවිධ අනුපස්සනාවෝ ද එකදේශ වශයෙන් සිඞවෙති.

**දුක්ඛානුපස්සනාව** සිඞ කල්හි **නිබ්බිදානුපස්සනාව** හා **ආදීනවානුපස්සනාව** ද එක දේශ වශයෙන් සිඞවේ.

**අනත්තානුපස්සනාව** සිඞ කල්හි ඉතිරි අනුපස්සනාවෝ ද සිඞවූවාහු වෙත්.

මෙසේ රූපා-රූප **කර්මස්ථාන** ප්‍රගුණ කළ යෝගාවචර තෙම මතු භඞ්ගානුපස්සනාව පටන් **ප්‍රහාණ පරිඥා** වශයෙන් සියලු ආකාරයෙන් පැමිණිය යුතු අටළොස් මහා විදර්ශනාව පළමුව **මෙහි ම එක දෙශයක්** ප්‍රතිවෙධ කරමින් එයට ප්‍රතිපක්ෂ ධර්ම ද පහ කරන්නේ ය.

යෝගාවචර තෙම මෙසේ අනිච්චානුපස්සනාදියට ප්‍රතිපක්ෂ නිච්චසංඥාදිය පහ කිරීමෙන් විසුඞ ඥනය ඇතිව නොයෙක් ආකාරයෙන් කෙලෙසන සංස්කාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමෙන් සම්මසන ඥනයාගේ පරතෙරට ගොස් **නය විදර්ශනා** සඞ්ඛ්‍යාත **කලාප සම්මර්ශන ඥනයට** අනතුරුව "**ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ගේ විපරිණාමානුපස්සනාවෙහි** පැවැති ප්‍රඥව **උදයව්‍යානු දර්ශනයෙහි ඥනය**" යයි කියන ලද හෙයින් ඒ **උදයව්‍යානු දර්ශනයට** පැමිණීම පිණිස යෝග කිරීමට උත්සාහ කරන්නේ ය.

යෝගාවචර තෙම සංක්ෂෙප වශයෙන් මෙසේ මෙනෙහි කරන්නේ ය. **උපන් රූපය පච්චුප්පන්නය.**

ඒ රූපයාගේ හටගැනීම් ලක්ෂණය **උදය** ය. පෙළීම් සඞ්ඛ්‍යාත විපරිණාම **ලක්ෂණය ව්‍යය** ය. අනුපස්සනාව **ඤාණය** ය.

මෙසේම උපන් **සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණයෝ, පච්චුප්පන්නය,** නිබ්බත්ති ලක්ෂණය උදය ය, විපරිණාම **ලක්ෂණය ව්‍යය** ය, අනුපස්සනාව **ඤාණය** ය.

හටගත් **ද්වාදසායතනයෝ පච්චුප්පන්නය, නිබ්බත්ති ලක්ෂණය උදය** ය, විපරිණාම **ලක්ෂණය ව්‍යය** ය, අනුපස්සනාව **ඤාණය** ය.

මෙසේ ම **අටළොස් ධාතු, දෙවිසි ඉන්ද්‍රියයෝ පච්චුප්පන්නය.** නිබ්බත්ති ලක්ෂණය උදය ය, විපරිණාම **ලක්ෂණය ව්‍යය ය,** අනුපස්සනාව **ඤාණය** ය.

ජාත වූ භවය **පච්චුප්පන්නය,** ඒ භවයා ගේ හටගැනීම් **ලක්ෂණය උදය** ය, විපරිණාම **ලක්ෂණය** ව්‍යය ය, අනුපස්සනාව **ඤාණය** ය.

නැවත ද, යෝගාවචර තෙම මෙසේ මෙනෙහි කරන්නේ ය. මේ නාම-රූප, උත්පත්තියෙන් පෙර, නූපන් නාම-රූපයන් ගේ රැසෙක් හෝ පිඬුවූවෙක් හෝ නැත්තේ ය. උපදින්නා වූ නාම-රූපයන් ගේ රැසෙකින් හෝ පිඩකින් හෝ ඊමක් නැත්තේ ය. නිරුද්ධ වන්නාවූ නාම-රූපයන්ගේ ද දිසානුදිසාවන්ට යාමෙක් හෝ නැත්තේ ය. නිරුද්ධ වූ නාම-රූපයන්ගේ ද එක් තැනෙක රැස්වීමෙක් ද, පිඬු වශයෙන් හෝ නිධාන වශයෙන් හෝ පිහිටා සිටීමෙක් ද නැත්තේ ය.

වීණාව වයන කල්හි උපදනා ශබ්දය උපදින්නට පෙර රැස්වීමෙක් නැත්තේ ය. උපදනේ ද පිණ්ඩයකින් ආයේ නොවේ. නිරුද්ධ වන්නේ ද දිශානුදිසාවන්ට ගමනෙක් නැත්තේ ය. නිරුද්ධ වූයේ ද තැනෙක රැස්ව නො සිටී. එහෙත්, වීණාව ද, වාදක උපකරණ ද, ඒ පුරුෂයාගේ එයට සුදුසු ව්‍යායාමය ද නිසා පෙර නො වූ ශබ්දය හට ගනී. හටගෙන නස්නේ ය.

එ පරිද්දෙන් ම සියලු රූපා-රූප ධර්මයෝ පෙර නොවූවෝ ඇති වෙත්. ඇතිව විනාශ වෙත් යයි මෙසේ සංක්‍ෂෙපයෙන් උදය-ව්‍යය මෙනෙහි කොට නැවත මේ උදය-ව්‍යය ඥානයම පඤ්චස්කන්‍ධ වශයෙන් බෙදා **"අවිජ්ජා සමුදයා රූප සමුදයො, තණ්හා සමුදයා රූප සමුදයො, කම්ම සමුදයා රූප සමුදයො, ආහාර සමුදයා රූප සමුදයො"** යනාදී වශයෙන් **අවිද්‍යාවගේ** උත්පත්තියෙන් රූප ඉපදීම වේ **තෘෂ්ණාවගේ** ඉපදීමෙන් රූප ඉපදීම වේ. **කර්ම සමුදයෙන්** රූප සමුදය වේ. **ආහාර සමුදයෙන්** රූප සමුදය වේ යයි මෙසේ ප්‍රත්‍යයන්ගේ සමුදයාර්ථයෙන් රූප-ස්කන්‍ධයාගේ **උදය** බලයි. එහි නිබ්බත්ති ලක්‍ෂණය හෙවත් රූප කලින් නොතිබී අළුතෙන් ම උපදනා බැව් බලන්නේ ද, රූපස්කන්‍ධයාගේ සමුදය බලයි. මෙහි **අවිද්‍යා, තෘෂ්ණා, කර්ම** යන ප්‍රත්‍යයෝ අතීත භවයෙහි දී පැවති හේතුහු ය. **ආහාරය** මේ භවයට අයිතිය. හුදෙක් ආහාරය පමණක් නොව **ඍතු චිත්ත සමුට්ඨාන** ද ගත යුතු වේ. එ හෙයින් චතුසමුට්ඨානික රූපයාගේ ප්‍රත්‍යය වශයෙන් **උදය** ය දක්වන ලද්දේ වෙයි.

ප්‍රත්‍යය නැති කල්හි රූපයාගේ අභාවය වන හෙයින් අග්‍රීත් මාර්ග ඥනයෙන් අවිද්‍යාවගේ අනුත්පාද නිරොධයෙන් අනාගත රූප නිරොධය වේ. එසේම තෘෂ්ණා නිරොධ-යෙන් ද කර්ම නිරොධයෙන් ද, කබලිකාරාහාර නිරොධ-යෙන් ද, අනාගත රූප නිරොධය වේ. මෙසේ ප්‍රත්‍ය නිරොධාර්ථයෙන් රූපස්කන්‍ධයාගේ **ව්‍යය** ය බලයි.

**විපරිණාම ලක්‍ෂණය** බැලීමෙන් ද රූපයාගේ ව්‍යය බලයි. රූපස්කන්‍ධයාගේ ව්‍යය බලන යෝගී තෙම මේ **අවිද්‍යා, තණ්හා, කර්ම ආහාර නිරොධයෙන් ද, විපරිණාම ලක්‍ෂණයෙන්** දැයි මේ පස් ආකාරයෙන් බලයි.

එසේම **"අවිද්‍යා සමුදයෙන් ද, තෘෂ්ණා සමුදයෙන් ද, කර්ම සමුදයෙන් ද, ස්පර්ශ සමුදයෙන් ද වේදනා සමුදය** වේ යයි ප්‍රත්‍යය සමුදයාර්ථයෙන් **වෙදනාස්කන්‍ධයාගේ**

සමුදය බලයි. නිබ්බත්ති ලක්ෂණය බලන්නේ ද වේදනාවගේ උදය බලයි. මෙසේ වේදනාස්කන්ධයාගේ උදය බලන්නේ මේ පස් ලක්ෂණ බලයි.

අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, ස්පර්‍ශ නිරොධයෙන් වේදනා නිරොධය වේ යයි මෙසේ ප්‍රත්‍යය නිරොධයෙන් වේදනා ස්කන්ධයාගේ ව්‍යය දකී. විපරිණාම ලක්ෂණය ද බලන්නේ වේදනාස්කන්ධයාගේ ව්‍යය බලයි. මෙසේ වේදනාස්කන්ධයාගේ ව්‍යය බලන යෝගී තෙම මේ පස් ලකුණු බලයි.

එසේම "අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, ස්පර්‍ශ සමුදයෙන් සංඥා සමුදය වන්නේ යයි, සංඥාවගේ නිබ්බත්ති ලක්ෂණය ද බලන්නේ ය. අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, ස්පර්‍ශ නිරොධයෙන් සංඥා නිරොධය වන්නේ යයි සංඥාවගේ නිරොධය ද විපරිණාම ලක්ෂණය ද බලන්නේ ය.

එසේම "අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, ස්පර්‍ශ සමුදයෙන් සංස්කාර සමුදය ය වන්නේ ය. සංස්කාරයන්ගේ නිබ්බත්ති ලක්ෂණය ද, අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, ස්පර්‍ශ නිරොධයෙන් සංස්කාර නිරොධය වන්නේ යයි සංස්කාර නිරොධ ලක්ෂණය ද, විපරිණාම ලක්ෂණය ද බලන්නේ ය."

එසේම "අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, නාම-රූප සමුදයයෙන් විඥාන සමුදය ය වන්නේ යයි විඥානයාගේ සමුදය ය ද, නිබ්බත්ති ලක්ෂණය ද බලන්නේ ය. අවිද්‍යා, තෘෂ්ණා, කර්‍ම, නාම රූප නිරොධයෙන් විඥාන නිරොධය වන්නේය යි විඥානයාගේ නිරොධය ද, විපරිණාම ලක්ෂණය ද බලන්නේ ය.

මෙසේ එක් එක් ස්කන්ධයෙහි උදය-ව්‍යය වශයෙන් දසය දසය බැගින් සමපනස් ආකාරයෙන් උදය-ව්‍යය දක්වන ලද බව දත යුතු.

උත්පත්තික්ෂණයෙහි ම නිබ්බත්ති ලක්ෂණය ද, භඞ්ගක්ෂණයෙහි ම විපරිණාම ලක්ෂණය ද වන හෙයින්

මෙසේ **ප්‍රත්‍යය** වශයෙන් ද, **ක්ෂණ** වශයෙන් ද, දෙපරිද්දෙකින් උදය-ව්‍යය බලන්නා වූ ඒ යෝගීහට ප්‍රත්‍යය වශයෙන් උදය දැකීමෙන් **සමුදය සත්‍යය** ප්‍රකට වේ. සකන්ධාදීන් උපද වන අවිද්‍යාදී ප්‍රත්‍යය අවබෝධ වන හෙයිනි.

ජාති දුක්ඛය අවබෝධ වන හෙයින් **ක්ෂණ** වශයෙන් උදය දර්ශනයෙන් **දුක්ඛ සත්‍යය** ප්‍රකට වේ.

ප්‍රත්‍යය ධර්මයන්ගේ අනුප්පාද නිරෝධයෙන් ප්‍රත්‍යයෙන් උපදින ධර්මයන්ගේ අනුප්පාද නිරෝධය අවබෝධ වන හෙයින්, ප්‍රත්‍යය වශයෙන් ව්‍යය දර්ශනයෙන් **නිරෝධ සත්‍යය** ප්‍රකට වේ.

මරණ දුක අවබෝධ වන හෙයින් **ක්ෂණ** වශයෙන් ව්‍යය දර්ශනයෙන් **දුක්ඛ සත්‍යය** ප්‍රකට වේ.

මෙසේ උත්පත්ති වශයෙන් හා ක්ෂණ වශයෙන් උදයව්‍යය දැකීම වූ මේ **ලෞකික සම්මාදිට්ඨිය, මාර්ගයයි, මාර්ගසත්‍යය** ද ප්‍රකට වේ. ප්‍රදීපය තමාද ප්‍රකාශ කරන්නාසේ ආර්ය මාර්ගය සම්මොහවිඝාතයෙන් නොහොත් මොහොන්ධකාරය නසමින් තමා ද ප්‍රකට වේ. තවද, ඒ යෝගීහට **ප්‍රත්‍යය** වශයෙන් උදය දර්ශනයෙන් **අනුලොම පටිච්ච සමුප්පාදය** ප්‍රකට වේ. **ක්ෂණ** වශයෙන් උදය-ව්‍යය දර්ශනයෙන් සංස්කාර ලක්ෂණය අවබෝධ වන හෙයින් **ප්‍රත්‍යසමුප්පන්න ධර්ම** ප්‍රකට වේ.

හේතු-ඵල සම්බන්ධයෙන් සන්තානය නො සිඳ පවත්නා බව අවබෝධ වන හෙයින් **උච්ඡේද දිට්ඨිය** දුරු වේ. උත්පාද, ඨිති, භඞ්ග වශයෙන් අලුත් නාම-රූප ධර්මයන් ඉපදීම අවබෝධ වන හෙයින් **ශාශ්වත දිට්ඨිය** දුරු වේ. නාම-රූප ධර්මයන්ගේ තමා වශයෙහි නො පවත්නා බව අවබෝධ වන හෙයින් **ආත්ම දිට්ඨිය** දුරු වේ. ප්‍රත්‍යයට අනුරූප වශයෙන් ඵලයාගේ උත්පාදය අවබෝධ වන හෙයින් **අකිරිය දිට්ඨිය** දුරු වේ. සංස්කාර ධර්මයන්ගේ

උත්සාහ රහිත බව හා ප්‍රත්‍යය පිළිබඳ පැවැතුම් ඇති බව අවබෝධ වන හෙයින් **අනාත්ම ලක්ෂණය** ප්‍රකට වේ. ඇති ව නැති වන බව අවබෝධ වන හෙයින් හා පූර්වාන්ත අපරාන්ත විවේකය අවබෝධ වන හෙයින් **අනිත්‍ය ලක්ෂණය** ප්‍රකට වේ. උදය-ව්‍යය දෙකින් නැවත නැවත පෙළෙන බව අවබෝධ වන හෙයින් **දුක්ඛ ලක්ෂණය** ප්‍රකට වේ. උදය-ව්‍යය දෙකින් පිරිසිඳින ලද බව අවබෝධ වන හෙයින් **ස්වභාව ලක්ෂණය** ද ප්‍රකට වේ. උදය ක්ෂණයෙහි ව්‍යයයාගේ ද, ව්‍යය ක්ෂණයෙහි උදයයාගේ ද අභාවය අවබෝධ වන හෙයින් පඨවි-ඵස්සාදි ස්වභාව ලක්ෂණයෙහි **සඞ්ඛත ලක්ෂණයාගේ** ද, **තාවකාලික** බව ද ප්‍රකට වේ.

මෙසේ ප්‍රකට වූ ඒ යෝගාවචරයාහට "පෙර නූපන්-නාවූම ධර්මයෝ උපදිති. උපන් නාම-රූප ධර්මයෝ නිරුඬ වෙත්" යි යනාදී වශයෙන් නිත්‍යයෙන් ම අළුත්වූවන්ව ම සංස්කාරයෝ වැටහෙති. එය ද, නිත්‍යය නවක ධර්ම නොව හිරු උදාවන කල්හි තණ අග පිණි බිඳු මෙන් ද, දිය බුබුලක් මෙන් ද, දඬුයෙන් දියෙහි ඇඳි ඉරක් මෙන් ද, හිඳි අග වැටුණු අබැටක් මෙන් ද, විදුලිය ගැසීමක් මෙන් ද, ස්වල්ප කලක් සිටින්නන්ව ද ඉන්ද්‍රජාල, මරීචි, ස්වප්න අලාත චක්‍ර, ගන්ධර්ව නගර, ඵේණ, කදලි ආදියක් මෙන් ද අසාර වේ යයි ද වැටහෙති.

මෙපමණකින් මේ යෝගාවචරයා විසින්, "ව්‍යය ධර්ම වූයේ ම උපදී. උපන් නාම-රූප ධර්ම සමූහය විනාශයට පැමිණේ" යයි මේ ආකාරයෙන් සමපණස් ලක්ෂණ ප්‍රතිවෙධ කොට පැවැති **උදය-ව්‍යයානුපස්සනා** නම් වූ පළමු වන **තරුණ විදර්ශනා ඥානය** ලබන ලද්දේ වේ. එ බැවින් ඒ යෝගීහට **ආරබ්ධ විදර්ශකයා** යයි කියනු ලැබේ.

කලාප සම්මර්ශනාදී වශයෙන් පැවැති සම්මර්ශන ඥානය නිෂ්පර්යායයෙන් විදර්ශනා නම නො ලබයි. උදය-ව්‍යයානු දර්ශනාදී වශයෙන් පැවැති ඥානයම **විදර්ශනා ඥාන** නම ලබයි.

## දස විදර්ශනෝපක්ලේශයෝ

තරුණ විදර්ශනාවෙන් පටන් ගත් විදර්ශනා ඇති ඒ යෝගාවචරයා හටම **දස විදර්ශනෝපක්ලේශයෝ** උපදිත්. ඒ විදර්ශනෝපක්ලේශයෝ මාර්ග-ඵල ප්‍රතිවේධ කළ ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ද, සීල විපත්ති ආදීන් විප්‍රතිපන්න පුද්ගලයාට ද නූපදිති. සම්‍යක් ප්‍රතිපත්ති ඇති, විදර්ශනා ඇති, විදර්ශනා භාවනාවෙහි යෙදුණු **ආරබ්ධ විදර්ශක** වූ කුලපුත්‍රයා හටම උපදිත්.

**"ඔභාසො, පීති, පස්සද්ධි – අධිමොක්ඛො ච පග්ගහො**
**සුඛං ඤාන මුපට්ඨාන – මුපෙක්ඛා ච නිකන්ති ච."**

**දස විදර්ශනෝපක්ලේශයෝ** නම්:-

| | | | |
|---|---|---|---|
| 1. | **ඕභාසය,** | 6. | **අධිමොක්ෂය,** |
| 2. | **ඥානය,** | 7. | **වීර්‍ය්‍යය,** |
| 3. | **ප්‍රීතිය,** | 8. | **සමාධිය,** |
| 4. | **පස්සද්ධිය,** | 9. | **උපෙක්ෂාය,** |
| 5. | **සුඛය,** | 10. | **නිකන්තිය,** |

**1. ඕභාසය**– නම් විදර්ශනා චිත්තයෙන් උපදනා එක්තරා ශරීරාලොකයකි. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට ම මෙය උපදී. ඒ ආලෝකය උපන් කල්හි ඇතැම් යෝගාවචරයෙක් "පෙර මට මෙබඳු ආලෝකයෙක් නූපන්නේ ය. ඒකාන්තයෙන් ම මාර්ගයට පැමිණියෙමි, ඵලයට පැමිණියෙමි යි අමාර්ගයම මාර්ගය යයි ද, ඵලය නො වූවම ඵලය යයි ද ගනී. එසේ ගන්නාහුගේ විදර්ශනා භාවනාව අමාර්ගයට වැටුණේ වෙයි. ඒ හේතුකොට ගෙන වූ වික්ෂෙපය, **උද්ධච්චය** නම් වේ. ඒ උද්ධච්චයෙන් මඩනා ලද සිත් ඇති යෝගී තෙම අනිත්‍ය වශයෙන් වැටහීම තතුසේ නො දනී. හෙතෙම තමාගේ මූල කමටහන හෙවත් විදර්ශනාව හැර ආලෝකය ම ආස්වාදනය කෙරෙමින් හිඳී.

ඒ ආලෝකය, ඇතැම් භික්ෂුවක්හට, තමා හුන් පයඍීඞකය පමණ තැන එළිය කෙරෙමින් උපදී. ඇතැම් භික්ෂුවක්හට ඇතුළු ගැබ පමණ ද, ඇතැමෙකුට ගැබින් පිටත ද, කිසිවෙකුට සියලු විහාරය ද, කිසිවෙකුට ගව්වක්, අඩයොදුනක්, යොදුනක්, දෙයොදුනක්, තුන්යොදුනක් පමණ ද, කිසිවෙකුට පොළොවෙහි පටන් අකනිටා බඹලොව දක්වා ද ඒකාලෝක කෙරෙමින් උපදී. භාග්‍යවතුන් වහන්සේට දසදහසක් සක්වළ ආලෝක කරමින් උපදී.

පෙර සිතුල්පහු වෙහෙර දෙබිති ගෙයක් තුළ තෙරහු දෙනමක් හුන්හ. එක් කරුවල පොහෝ දිනෙක වැසිවලා කුලින් වැසුණු, ගනඳුර ඇති මධ්‍යම රාත්‍රියෙහි භාවනායෙහි යෙදී සිටි මේ දෙනම අතුරෙන් එක් නමක් ''සවාමීනි, මට දූන් දාගැබ් මලුයෙහි සිංහාසනයෙහි පස්වණක් මල් පැනේ යයි'' කීය. එවිට අනික් භික්ෂූන් වහන්සේ ''ඇවැත්නි, එය පුදුමයක් නොවේ, මට දූන් මහමුහුදෙහි යොදුනක් තැන මස් කැස්බන් බොහෝ පෙනෙතැ'' යි කීහ. **මේ විදර්ශනොපක්ලේශය බොහෝ සේ සමථවිදර්ශනාලාභීන්හටම වේ.**

තවද, මේ ආලෝකය ඇති වූ කල්හි, සමාපත්ති බලයෙන් විෂ්කම්භනය කරන ලද කෙලෙසුන්ගේ නො හැසිරීමෙන් ''මම රහත්වීමි'' යි වරදවා සිත් උපදවයි.

තලඟුරු වෙහෙර **ධම්මදින්න** නම් සිව්පිළිසිඹියා පත් මහරහතන් වහන්සේ නමක්, බොහෝ භික්ෂුසංඝයාහට අවවාද අනුසාසනා කරමින් සිටි කල්හි එක් දවසක් දිවාසථානයෙහි වැඩහිඳ උන්වහන්සේගේ ආචාය්‍ර්‍යවූ උස්වැලි වැසි **මහානාග** සථවිරයන් වහන්සේගේ මහණ කම මුදුන් පැමිණියේ ද නැද්ද යි ආවර්ජනා කරනසේක් උන්වහන්සේ පෘථග්ජන බව දැක, ''මා නොගිය කල පුහුදුන් ව ම කළුරිය කිරීම වන්නේ'' යයි දැන සෘධියෙන් වැඩ දිවාසථානයෙහි වැඩහුන් තෙරුන් සමීපයෙහි බැස, වැඳ වත් පිළිවෙත් කොට එකත්පසෙක වැඩහුන් සේක.

මහතෙරණුවෝ ද, 'ඇවැත්නි, නො කල්හි ආයේ කිම්දැ'' යි විචාළ කල, ''ස්වාමීනි, ප්‍රශ්න ඇසීමට ආයෙමි'' යි කීහ. 'ඇවැත්නි, විචාරව, දත්තෙම් කියමි'' යි කීහ. තෙරුන් වහන්සේ ද විචාළ ප්‍රශ්න නොපැකිල විසඳූ සේක. එකල ධම්මදින්න තෙරණුවෝ කියනුයේ, ''ස්වාමීනි, ඔබවහන්සේගේ ඤාණය ඉතා තියුණු ය. කවර දා මේ ධර්මය අවබෝධ කළ සේක් දැ යි විචාළ කල, ''ඇවැත්නි, මෙයින් සැට වසකට පෙර'' යයි කීහ. ''ස්වාමින්වහන්සේ සමාධියට සමවදනා සේක් දැ'' යි විචාළ කල, ''අපට එය බරක් නොවේ'' යයි කීහ. ''ස්වාමීනි, එසේ නම් එක් ඇතෙකු මවනු මැනවැ'' යි කීහ. තෙරුන්වහන්සේ ද සුදු ඇතෙකු මැවීය. ''ස්වාමීනි, දැන් මේ ඇතා කන්තිශ්වල කොට තබා නඟුට දික් කොට ගෙන සොඬ මුවෙහි බහා බිහිසුණු ලෙස කුඤ්චනාද කරමින් ඔබ අභිමුඛයට එන ලෙසක් කළ මැනවැයි කීහ. තෙරුන්වහන්සේ ද එසේ කොට වේගයෙන් තමා වෙත එන ඒ ඇතාගේ බිහිසුණු අයුරු දැක නැගිට පැනයන්නට සැරසුණු සේක. රහත් තෙරුන්වහන්සේ උන්වහන්සේගේ සිවුරුකොණ අල්වා ගෙන, ''ස්වාමීනි, රහතුන්ට තැතිගැනීමක් වේ දැ'' යි ඇසූ සේක. උන්වහන්සේ එකල තමා පෘථග්ජන බව දැන, ''ඇවැත් ධම්මදින්නයෙනි, මට පිහිට වෙවයි කියා පාමුල උක්කුටිකයෙන් හුන් සේක. ''ස්වාමීනි, නුඹවහන්සේට පිහිටවීම සඳහාම ආමි'යි, අනිකක් නො සිතනු මැනවැ යි කියා කමටහනක් වදාළ සේක. තෙරුන්වහන්සේ කමටහන් ගෙන සක්මනට නැගී තුන්වන පියවරෙහි අග්‍ර ඵලය වූ අර්හත්වයට පැමිණි සේක. මේ තෙරුන්වහන්සේ වෙෂ චරිතයෙකු බැවින් ආලෝකයෙහි කම්පාවූයේ යයි කියන ලදී.

**2. ඤාණය.** අනිත්‍යය වශයෙන් මෙනෙහි කරන යෝගීහට **විදර්ශනා ඤාණය** උපදී. නාම-රූප ධර්මයන් ප්‍රමාණ කරන, විචාරණය කරන ඒ යෝගීහට හරන ලද වජ්‍රායුධය මෙන් නො පැකිලෙන වේග ඇති තියුණු වූ ඉතා විශද වූ විදර්ශනා ඤාණය උපදී.

**3. ප්‍රීතිය** නම් විදර්ශනා ප්‍රීතිය යි, ආරබ්ධ විදර්ශකයා හට **ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඔක්කන්තික ප්‍රීතිය, උබ්බෙග ප්‍රීතිය, ඵරණ ප්‍රීතිය** යන පස්වැදෑරුම් ප්‍රීතිය මුළු ශරීරය පුරමින් උපදී.

**4. පස්සද්ධිය** නම් විදර්ශනා පස්සද්ධි යයි. රාත්‍රි ස්ථාන–යෙහි හෝ දිවාස්ථානයෙහි හෝ හුන්නාවූ ඒ යෝගීහට කාය චිත්ත දෙක්හි පීඩාවක් හෝ, බර බවක් හෝ, කර්කශ බවක් හෝ, අකර්මණ්‍ය බවක් හෝ, ගිලන් බවක් හෝ, වඞ්ක බවක් හෝ නොවේ. උද්ධච්චය සංසිඳීමෙන් කාය චිත්තයෝ සංසිඳුනාහු වෙති. ථිනමිද්ධය දුරුවීමෙන් සැහැල්ලු වෙති. දිට්ඨි මාන සංසිඳීමෙන් මෘදු වෙති. සෙසු නීවරණ සංසිඳීමෙන් කම්මඤ්ඤ වෙති. අශ්‍රද්ධාදිය සංසිඳීමෙන් නො ගිලන් වෙති. මායා සාඨෙය්‍ය සංසිඳීමෙන් ඍජු වෙති. මෙසේ ඒ යෝගීහට මනුෂ්‍යත්වය ඉක්ම සිටි අමානුෂ රතිය හෙවත් ඇලීම සිද්ධකරන්නා වූ ලහුතාදීන් හා යුක්තවූ **පස්සද්ධිය** උපදී.

**5. සුඛය** නම් විදර්ශනා සුඛය යි. විදර්ශනා වඩන ඒ යෝගීහට මුළු සිරුර තෙමමින් ඉතා ප්‍රණීත වූ කිසි කලෙක නොවූ විරූ සුඛයෙක් උපදී.

**6. අධිමොක්ෂය** නම් විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත බලවත් ශ්‍රද්ධාවයි. විදර්ශනාව වඩන්ම චිත්ත චෛතසික ධර්මයන් අතිශය ප්‍රසන්න භාවයට පමුණුවන ඉතා බලවත් ශ්‍රද්ධාව උපදී.

**7. ප්‍රග්‍රහ** හෙවත් **වීර්‍ය්‍යය** – විදර්ශනා චිත්තය හා සම්ප්‍රයුක්ත වූ ලිහිල් නොවූ, ඉතා දැඩි ද නොවූ, මනා කොට ගන්නා ලද වීර්‍ය්‍ය උපදී.

**8. උපට්ඨානය** හෙවත් **ස්මෘතිය** – විදර්ශනා චිත්තය හා සම්ප්‍රයුක්ත වූ මනාව එළඹ සිටි, මනාව පිහිටුවන ලද ඉන්ද්‍රජාලයක් බඳු වූ ද, නිශ්චල පර්වත රාජයකු බඳුවූ ද සතිය උපදී.

**9. උපෙක්ෂාව නම් විදර්ශනොපෙක්ෂාව හා ආවර්ජ-නොපෙක්ෂාවයි.** සියලු නාම-රූප ධර්මයන් උදය-ව්‍යය වශයෙන් මනාව පරීක්ෂා කිරීමෙන් ඒ පිළිබඳ මධ්‍යස්ථ භාවයෙන් පැවැති විදර්ශනා උපෙක්ෂාව ද බලවත්ව උපදී. **තත්‍රමජ්ඣත්තතා උපෙක්ෂා** යයි ද මෙයට ම නමෙකි. මනොවාරාවර්ජන චිත්තය හා සම්ප්‍රයුක්ත වූ චේතනාව ආවර්ජනයෙහි මධ්‍යස්ථතාව පැවැත් මෙන් ආවර්ජන උපෙක්ෂාව ද වේ.

**10. නිකන්තිය** නම් විදර්ශනා චිත්තය පිළිබඳ වූ සියුම් තෘෂ්ණාවයි. මෙසේ ඕභාසාදීන්ගෙන් යුක්තවූ විදර්ශනාවෙහි ආලය කරමින්, සියුම්වූ, ශාන්තාකාර වූ නිකන්තිය උපදී.

මේ ඕභාසය, විදර්ශනාවට අලඞ්කාරයක් වන්නාක් මෙන් ම, ඒ ප්‍රඥාදීන් අතුරෙන් එකක් උපන් කල්හි ඒ යෝගීහට, "මට මෙයින් පෙර මෙබඳු ඤාණයෙක් නූපන්නේ ය. මෙබඳු ප්‍රීතියෙක් පස්සද්ධියෙක්, සුඛයෙක්, අධිමොක්ෂයෙක්, ප්‍රග්‍රහයෙක්, උපට්ඨානයෙක්, උපෙක්ෂා වෙක්, නිකන්තියෙක් නූපන්නේ ය. ඒකාන්තයෙන් ම මම මාර්ගයට පැමිණියෙමි, ඵලයට පැමිණියෙමි" යි අමාර්ගම මාර්ගය යයි ද, ඵලය නොවූව ඵලය යයි ද ගනී.

අමාර්ගය මාර්ගය යයි ද, අඵලය ඵලය යයි ද ගන්නා ඒ යෝගීහුගේ විදර්ශනා චිත්ත වීථිය ඉක්ම ගියේ නම් වේ. එකල්හි හෙතෙම තමාගේ ඒ විදර්ශනා කර්මස්ථානය අත්හැර ඕභාසාදියෙහි සියුම් ඇල්ම වූ නිකන්තියම ආස්වාදනය කරමින් හිඳී.

මේ දස උපක්ලේශයන් අතුරෙන් ඕභාසාදිය **උපක්ලේශ වස්තු වන හෙයින් උපක්ලේශය** යි කියන ලද නමුත් අකුසල් නිසා නොවන බව දත යුතු. නිකන්තිය උපක්ලේශ ද, උපක්ලේශ වස්තු ද වේ. මෙසේ වස්තු වශයෙන් උපක්ලේශ දසයක් වේ. එයම **තෘෂ්ණා, දිට්ඨි, මාන** වශයෙන් ගැනීමෙන් සමතිසක් වේ.

මට ආලෝකයක් උපනැයි ගන්නාහට **සක්කායදිට්ඨි** වශයෙන් ගැනීම වේ. මනා ආලෝකයක් උපනැයි ගන්නා-හට **මාන** වශයෙන් ගැනීම වේ. ආලෝකය ආස්වාදනය කිරීම් වශයෙන් **තෘෂ්ණාව** උපදී. මෙසේ ආලෝකයෙහි **දිට්ඨි, මාන, තණ්හා** වශයෙන් ගැනීම් තුනෙකි. සෙසු උපක්ලේශ ධර්මයන් කෙරෙහි ද මේ ක්‍රමයම වේ.

අදක්ෂ, අව්‍යක්ත යෝගී තෙම මේ ඕභාසාදී නිමිත්තෙන් කම්පා වේ. වික්ෂිප්ත වේ. ඒ එකක් එකක් පාසාම **"එතං මම එසො හමස්මි, එසො මෙ අත්තා"** මේ මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය යයි ද **තෘෂ්ණා, මාන, දිට්ඨි** වශයෙන් බලයි.

දක්ෂ, පණ්ඩිත, ව්‍යක්ත, බුද්ධිමත් යෝගී තෙම ඕභාසාදිය උපන් කල මට ආලෝකයෙක් උපන. එය ද අනිත්‍යය, සඞ්ඛතය, පටිච්චසමුප්පන්නය, ක්ෂය වන සුලුය, ව්‍යය වන සුලුය, නැසෙන සුලුය, නිරුඬ වන සුලුය යි මෙසේ පරීක්ෂා කෙරේ.

තවද, ඒ ආලෝකය තමා වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්මය ය** ඇතිව නැති වන හෙයින් **අනිත්‍යය.** උදය-ව්‍යය දෙකින් පෙළෙන හෙයින් **දුක්ඛය.** අනිකුදු උපක්ලේශයන් ද මෙසේ පරීක්ෂා කොට ඒ ඕභාසාදිය **මාගේ නොවේ** යයි ද, මම **නොවෙමි** යයි ද, **මාගේ ආත්මය නොවේ** යයි ද බලයි. මෙසේ බලන්නාවූ හෙතෙම ඕභාසාදියෙහි කම්පා නොවේ. තැති නොගනී. හෙතෙම ඒ සමතිස් වැදෑරුම් උපක්ලේශ ධර්ම, මාර්ගය නොවේ යයි ද, ඒ උපක්ලේශයෙන් මිදුණු, විදර්ශනා මාර්ගයට පිළිපන් විදර්ශනා ඥානයම **මාර්ග** යයි ද ව්‍යවස්ථා කෙරේ. මෙසේ මේ මගය, මේ නොමග යයි **මාර්ගය** ද, **අමාර්ගය** ද දැන සිටි නුවණ **මග්ගාමග්ග ඤාණදස්සන** විසුඬි යයි කියනු ලැබේ.

**මග්ගාමග්ග ඤාණදස්සන විසුඬියෙහි** සිටි යෝගාවචර තෙම **සත්‍යය තුනක්** ව්‍යවස්ථා කරණ ලද්දේ වේ.

**දිට්ඨි විශුද්ධියෙහි** නාම–රූප ව්‍යවස්ථාපනය කිරීමෙන් පළමු කොට **දුක්ඛ සත්‍යය** ව්‍යවස්ථා කෙළේ වේ.

**කඞ්ඛාවිතරණ විශුද්ධියෙහි** ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් **සමුදය සත්‍යය** ව්‍යවස්ථා කෙළේ වේ.

මේ **මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධියෙහි** මනාව මාර්ගය ව්‍යවස්ථා කිරීමෙන් **මාර්ග සත්‍යය** ව්‍යවස්ථා **කෙළේ** වේ.

මේ ත්‍රිවිධ සත්‍යය ව්‍යවස්ථානය **ලෞකික ඥාන** වශයෙන් බව දත යුතු.

## 6. ප්‍රතිපදා ඤාණදස්සන විසුද්ධිය

උදය ව්‍යය ඥානයාගේ පටන් සඞ්ඛාරොපෙක්ෂා ඥානය තෙක් පැවැති අෂ්ටවිධ ඥානයාගේ වශයෙන් ශිඛාප්‍රාප්තවූ විදර්ශනා ඥානය හා නවවැනිවූ සච්චානුලොමක ඥානය ද යන මේ **නවමහා විදර්ශනා ඥානය, ප්‍රතිපදා ඥානදස්සන විසුද්ධි** නම් වේ.

ඕභාසාදී දසවිධ විදර්ශනොපකෙලශයන්ගෙන් මිදුණාවූ විදර්ශනා චිත්ත වීථියට බැසගත් හෙයින් **විදර්ශනා** නම් වූ මේ **ඥානයෝ** නවදෙනා නම්:—

1. **උදයව්‍යානු දර්ශනා ඥානය,**
2. **භඞ්ගානු දර්ශනා ඥානය,**
3. **භයතුපට්ඨාන ඥානය,**
4. **ආදීනවානුදර්ශනා ඥානය,**
5. **නිබ්බිදානු දර්ශනා ඥානය,**
6. **මුඤ්චිතුකම්‍යතා ඥානය,**
7. **පටිසඞ්ඛානු දර්ශන ඥානය,**
8. **සඞ්ඛාරොපෙක්ෂා ඥානය,**
9. **සත්‍යානුලොමක ඥානය හෙවත් අනුලොම ඥානය.**

උදයව්‍යය දැනීම් අර්ථයෙන් හා ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීම් අර්ථයෙන් ද **ඥාන දර්ශන** නම් වේ. එයම ප්‍රතිපක්ෂ ධර්මයන්ගෙන් විශුද්ධ වූ හෙයින් **ඥාන දර්ශන විශුද්ධි** නම් වේ. එයම ආර්යමාර්ගයට පිළිපැදීම් වශයෙන් **ප්‍රතිපදා ඥාන දස්සන** විසුද්ධි නම් වේ.

**1. උදයව්‍යානු දර්ශනා ඥානය**:– යටකී දස උපක්ලේශයන්ගෙන් කිලිටිවූ උදයව්‍යය ඥානය යථා සවභාවයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණය සලකා ගැනීමට අසමර්ථය. ඒ උපක්ලේශයන්ගෙන් මිදුණු ඥානයෙන්ම ත්‍රිලක්ෂණ බැලීමට සමර්ථ වේ.

උදය ව්‍යය මෙනෙහි නො කිරීමෙන්, සන්තතියෙන් වැසුණු හෙයින් **අනිත්‍ය ලක්ෂණය** නො වැටහේ. උදය ව්‍යය මෙනෙහි කොට සන්තතිය ඉගිලවීමෙන් **අනිත්‍ය ලක්ෂණය** යථා සවභාවයෙන් වැටහේ.

සංස්කාරයන් නිතර පීඩා කරන බව මෙනෙහි නො කිරීමෙන් සතර ඉරියව්වෙන් වැසුණු හෙයින් **දුක්ඛ ලක්ෂණය** නො වැටහේ. සංස්කාරයන් නිතර පෙළෙන බව මෙනෙහි කොට ඉරියව්වෙන් වැසුණු බව ඉගිලවූ කල **දුක්ඛ ලක්ෂණය** යථා සවභාවයෙන් වැටහේ.

නා නා ධාතූන් වෙන් කොට මෙනෙහි නො කිරීමෙන්, ඝනයෙන් වැසුණු හෙයින් **අනාත්ම ලක්ෂණය** නො වැටහේ, පඨවි ආදී නා නා ධාතූන් වෙන් වෙන් කොට ඝනය බිඳීම කල කල්හි **අනාත්ම ලක්ෂණය** යථා සවභාවයෙන් වැටහේ. ඔවුනොවුන් හා සම්බන්ධව පවත්නා රූපා රූප ධර්මයන් එකක් වශයෙන් ගැනීම වූ **සමූහඝනය ද**, ඒ ඒ ධර්මයනට ප්‍රතිනියත කෘත්‍ය භේදයෙන් එකත්වයෙන් ගැනීම වූ **කෘත්‍ය ඝනය** ද, ඒ ඒ ආලම්බණ සහිත ධර්මයන් ආලම්බණ භේදයෙන් එකත්වයෙන් ගැනීම වූ **ආලම්බන ඝනය** දැයි යන ත්‍රිවිධ ඝනයම වෙන් වෙන්ව ධාතු ආදී වශයෙන් වැටහෙන කල්හි අතින් පිරිමදින ලද පෙන

පිඩක්සේ විනාශයට යෙතියි ප්‍රත්‍ය ලාභයෙන් පවත්නා ශූන්‍ය ධර්ම මාත්‍රයෙකැයි තතුසේ **අනාත්ම ලක්‍ෂණය** අතිශයින් ප්‍රකට වේ.

තවද, **අනිත්‍යය** නම් සකන්ධ පඤ්චකය යි, විනාශය අනත්‍යාත්‍රිකත්වය යන සවභාවය ඇති හෙයිනි. ඇතිව නැති වන හෙයින් ද **අනිත්‍යය** නම් වේ.

**උත්පාද, ව්‍යය, අන්‍යථාත්වය** යන මෙය **අනිත්‍ය ලක්‍ෂණය** නම් වේ. ඉපිද නැතිවීම යයි කියන ලද ආකාර විකාරය ද අනිත්‍යය ලක්‍ෂණ යයි.

**"යදනිච්චං තං දුක්ඛං"** යමක් අනිත්‍ය නම් ඒ දුක යයි වදාළ හෙයින් පඤ්චසකන්ධයම නිතර පෙළන හෙයින් **දුක්** නම් වේ.

නිතර පෙළෙන ආකාරය **දුක්ඛ ලක්‍ෂණය** නම් වේ.

**"යං දුක්ඛං තදනත්තා"** යමක් දුක නම් එය අනා**ත්ම** යයි වදාළ හෙයින් ඒ සකන්ධ පඤ්චකයම වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්ම** නම්.

වශයෙහි නො පවත්නා ආකාරය **අනාත්ම ලක්‍ෂණ** යයි.

මෙසේ මේ යෝගාවචර තෙම මෙකී **ලක්‍ෂණය** හා ඒ ලක්‍ෂණයෙන් යුත් පඤ්චසකන්ධය ද යන මේ සියල්ලම උපක්ලේශයන්ගෙන් මිදුණු, වීථියට පිළිපන් විදර්ශනා සඞ්ඛ්‍යාත උදය ව්‍යයානුදර්ශන ඥානයෙන් යථා සවභාවයෙන් සලකා, නැවත නැවත අනිත්‍ය, දුක්ඛ, අනා**ත්ම** යයි රූපාරූප ධර්මයන් නිශ්චය කරන, තීරණය කරන කල්හි ඔහුගේ විදර්ශනා ඥානය තියුණු වී සංසකාරයේ සැහැල්ලුව වැටහෙති.

**2. භඞ්ගානුදර්ශන ඥානය** – උදයව්‍යයානුදර්ශන ඥානය තියුණුව පවත්නා කල්හි, සංසකාරයන් සැහැල්ලුව

වැටහෙන කල්හි ඉපදීමට හෝ සවිතියට හෝ පැවැත්මට හෝ සංස්කාර නිමිත්තට හෝ නො පැමිණේ. **ක්ෂය** ව්‍යය භේද සඞ්ඛ්‍යාත නිරෝධයෙහි සිහිය මනාව පිහිටයි. සංස්කාරයන් මෙසේ ඉපිද, මෙසේ නිරුද්ධ වෙතියි දක්නා වූ යෝගීහට පෙර කී සේ උදය හැර ව්‍යය ම මෙනෙහි කරන කල්හි **භඞ්ගානු දර්ශනාය** නම් වූ විදර්ශනා ඥනය උපදී.

රූප, වෙදනාදී වූ යම් අරමුණක් **ක්ෂය,** ව්‍යය වශයෙන් දැන ඒ ආලම්බනය ක්ෂය ව්‍යය වශයෙන් බැලීමෙන් උපන් ඤාණයාගේ ද යම් භඞ්ගයක් වේ නම් අන්‍ය සිතකින් ඒ භඞ්ගය බැලීමෙන් උපන් ප්‍රඥව **භඞ්ගානු දර්ශනා ඥන** නම් වේ. දක්නා ලද අරමුණ ද, ඒ අනුපස්සනා වශයෙන් දක්නා ලද ඤාණය ද යන දෙකම **ක්ෂය** ව්‍යය වශයෙන් බැලීම යයි දත යුතු. මෙහි භඞ්ගය බලන්නේ ද, අනිච්චානු පස්සනාදී නොයෙක් ආකාරයෙන් නැවත නැවත බලයි. ඒ මෙසේයි. **භඞ්ගය** නම් අනිත්‍යය පිළිබඳ අන්තිම කෙළවරය. එ හෙයින් ඒ භඞ්ගය අනුව බලන යෝගී තෙමේ සියලු සංස්කාරයන්ම **අනිත්‍ය** වශයෙන් බලන්නේ **නිත්‍ය සංඥව** දුරු කෙරේ. එසේම සියලු සංස්කාරයන් **දුක්** වශයෙන් බලයි. සැප වශයෙන් නො බලයි. දුක් වශයෙන් බලන්නේ **සුඛ සංඥව** දුරු කෙරේ. එසේම සියලු සංස්කාරයන් **අනාත්ම** වශයෙන් බලයි. **ආත්ම** වශයෙන් නො බලයි. අනාත්ම වශයෙන් බලන්නේ **ආත්ම සංඥව** දුරු කෙරේ. යමක් **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** නම් එය **තෘෂ්ණා, දිට්ඨි** ආදී වශයෙන් අභිනන්දනය නොකට යුතු. යමක් **අභිනන්දනය** නොකටයුතු නම් එහි **නො ඇලිය** යුතු. එ හෙයින් **භඞ්ගානුපස්සනා** අනුසාරයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි දක්නා ලද සංස්කාර සමූහයෙහිම කලකිරේ. කලකිරුණේ සතුටු නොවේ, නො ඇලේ, නො රැඳේ. එ හෙයින් කලකිරීමෙන් සතුට දුරු කෙරේ, නො ඇලුණේ ලෞකික ඥනයෙන්ම රාගය දුරු කෙරේ. රාගය නිරුද්ධ කරනුයේ සමුදය

නො කෙරේ. සමුදය දුරු කෙරේ, තෘෂ්ණාව නූපදවයි, මෙසේ පිළිපන් ඒ යෝගාවචර තෙම සංස්කාරයන් දුරු කෙරේ, නොගනී.

මේ අනිත්‍යාදී අනුපස්සනාව තදඞ්ග වශයෙන් ස්කන්ධාදී අභිසංස්කාරයන් සමග කෙලෙසුන් පහකරන හෙයින් **පරිච්චාගපටිනිස්සග්ගය** යයි ද සංස්කාර ධර්මයන්ගේ දොස් දැකීමෙන් ද සංස්කාර ධර්මයට විපරිත වූ නිර්වාණයෙහි නිම්න භාවයෙන් පක්ඛන්දනය වන හෙයින් ද **පක්ඛන්දන පටිනිස්සග්ග** යයි ද කියනු ලැබේ.

විදර්ශනාවට ප්‍රවෘත්ති ස්ථාන හෙයින් **වස්තු** නම් වූ රූපාදී ආලම්බනයාගේ භඞ්ගය දැක නැවත ඒ භඞ්ගය දක්නා ලද සිතෙහි ද භඞ්ගය දැකීම් වශයෙන් පළමු වස්තුවෙන් අන්‍ය වස්තුවකට සංක්‍රමණය වීමෙන්, ව්‍යයෙහි විදර්ශනා ප්‍රඥව මනාව පිහිටීමෙන් ඒ ආලම්බනයාගේ භඞ්ගය දැක නැවත ඒ භඞ්ගය අරමුණු කරන චිත්තයාගේ ද භඞ්ගය දැකීම පිණිස ආවර්ජනා කිරීමෙහි සමත් බව **පටිසඞ්ඛාවිපස්සනා නම් වේ.**

ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා ලද අරමුණු අනුව යාමෙන්, වර්තමාන ස්කන්ධ පඤ්චකය බිඳෙන්නා සේ අතීතයෙහි ද, අනාගතයෙහි ද සංස්කාර බිඳේ යයි ද, දිට්ඨ, අදිට්ඨ දෙදෙනාගේ ක්ෂණ භඞ්ගය හිරු නැගි කල තණ අග පිණිබිඳු සේ විනාශ වන සුළු බව ද ඒකාකාරයෙන් ව්‍යවස්ථා කොට ඒ භඞ්ග සඞ්ඛ්‍යාත නිරෝධයෙහිම අධිමුක්ත බව, ගරු කොට ඇති බව, එයට නැමුණු බව, අවනත බව, අභිමුඛ බව දැකීම ව්‍යය **ලක්ෂණ විපස්සනා** හෙවත් **විපරිනාම ලක්ෂණ භඞ්ගානුදර්ශන විදර්ශනා** නම් වේ.

භඞ්ගානුදර්ශන වශයෙන් රූපාදී අරමුණු දැන ඒ ආලම්බනයාගේ භඞ්ගය දැක, ඒ භඞ්ගය අරමුණු කළ චිත්තයාගේ ද භඞ්ගය දැක, මෙසේ භඞ්ගය අනුව බලන

ඒ යෝගීහට සංස්කාරයෝම බිඳෙති, සංස්කාරයන්ගේ භෙදයම මරණයය අන්‍ය වූ කිසි ආත්මයක් නැත්තේ යයි **ශූන්‍ය වශයෙන් වැටහීම** වේ.

මෙසේ **ආලම්බන පටිසඞ්ඛා විපස්සනා ප්‍රඥාව** ද, **භඞ්ගානුපස්සනාව** ද, **ශූන්‍ය යයි වැටහීම** දැයි මේ තුන් ආකාර විදර්ශනාව **අධිපඤ්ඤා විපස්සනා** නම් වේ.

එ හෙයින් මෙසේ වූ විදර්ශනා ඥාන ඇති යෝගාවචර තෙම ශාස්වත දිට්ඨි ආදී නා නා ප්‍රකාර දෘෂ්ටීන්හි කම්පා නොවේ. මෙසේ කම්පා නො වන ඒ යෝගී තෙම, නිරුද්ධ නුවූයේම නිරුද්ධ වේ. නො බිඳුනේම බිඳේ යයි පැවැති මනස්කාර ඇත්තේ බිඳෙන දුර්ල භාජනයක් මෙන් ද, විසිරෙන සියුම් දූලි රැසක් මෙන් ද, බදින තල මෙන් ද, සියලු සංස්කාරයන්ගේ උප්පාද, ඨිති, පවත්ති, නිමිත්ත හැර භෙදයම දකී.

ඇස් ඇති පුරුෂයෙක් පොකුණු තෙරෙක හෝ ගං තෙරෙක හෝ සිට මහත් පොද ඇති වැස්සක් වස්නා කල දිය පිට මහත්, මහත් බුබුළු නැගි නැගී, වහ වහා බිඳෙන්නවුත් දක්නා සේ, ඒ යෝගී තෙමේ සියලු සංස්කාරයෝ බිඳෙත් බිඳෙත් යයි දකී, දිය බුබුළක්, මිරිඟු දියක් දක්නා සේ ලෝකය බලන යෝගී තෙම අර්හත්වයට පැමිණෙන හෙයින් මරහු නොදකී. මෙසේ බලන ඒ යෝගීහුගේ, **අට අනුසසකින් පිරිවරාගත් භඞ්ගානුපස්සනා ඥාණය** බලවත් බවට පැමිණේ.

**ඒ අනුසස් අට** නම්:-

1. **භවදිට්ඨි ප්‍රහාණය** හෙවත් ශාස්වත දෘෂ්ටිය දුරු කිරීම.
2. **ජීවිතනිකන්ති පරිත්‍යාගය** හෙවත් ජීවිත ආශාව දුරු කිරීමය.
3. **සදායුත්තපයුත්තතාවය** හෙවත් සතත භාවනායෙහි යුක්ත ප්‍රයුක්තතාවය.

4. **විසුද්ධාජීවතා** හෙවත් පිරිසුදු ආජීවතාය.

5. **උස්සුක්කප්පහාන** හෙවත් කෘත්‍යාකෘත්‍යයෙහි ව්‍යාවෘත නො වීමය.

6. **විගතභයතා** හෙවත් කිසිවකට භය නැති බවය.

7. **ඛන්තිසොරච්ච ප්‍රතිලාභය** හෙවත් ක්‍ෂාන්ති සුරතභාව ලාභය.

8. **අරතිරතිසහනතා** හෙවත් අධිකුසල ධර්මයෙහි අරතිය හා කාමගුණරතිය සහනතාය.

මේ උතුම් අනුසස් අට දැක, ඒ භඞ්ගය බලන සුළු යෝගී තෙම නිවණට පැමිණෙනු පිණිස ගිනිගත් වස්ත්‍ර, ශීර්ෂ ඇතියකු සේ සංස්කාරයන්ගේ භඞ්ගය සම්මර්ශනය කෙරේ.

**3. භයතුපට්ඨාන ඥානය** – සියලු සංස්කාරයන්ගේ ක්‍ෂය, ව්‍යය භෙද සඞ්ඛ්‍යාත නිරෝධය අරමුණු කොට පැවැති භඞ්ගානුපස්සනාව ආසේවනය කරන, වඩන, නැවත නැවත වඩන ඒ යෝගාවචරයාහට සියලු භව, යොනි, ගති, විඤ්ඤාණස්ථිති, සත්ත්වාවාසයන්හි බිඳෙන සංස්කාරයෝ, සුවසේ ජීවත්වනු කැමැති බියසුළු පුරුෂයෙකුහට සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්, යක්, රකුස්, සැඩගොන්, සැඩබලු, මදකිපුණු ඇත්, ඝෝර සර්ප, හෙණ, සොහොන්, යුදබිම්, දිළිසෙන අඟුරු වළ ආදිය දක්නා කලෙක මෙන් මහා භයක්ව වැටහේ.

අතීත සංස්කාරයෝ නිරුද්ධවූහ. වර්තමාන සංස්කාරයෝ නිරුද්ධවෙත්. අනාගතයෙහි උපදින සංස්කාරයෝ ද මෙසේ ම මතු නිරුද්ධ වන්නාහයි බලන්නා වූ යෝගාවචරයාහට **භයතුපට්ඨාන** නම් වූ **ඥාණය** උපදී.

මෙය අවබෝධ කර ගැනීම පිණිස උපමාවෙක් දක්වනු ලැබේ. එක් ස්ත්‍රියකගේ පුත්‍රයින් තිදෙනෙක් අපරාධ කොට, රජුට අසුවී, හිස් සිඳ දැමීමට නියෝග

ලැබ වර්‍ධස්ථානයට පමුණුවන කල්හි ඕතෝමෝ ද පුතුන් සමග වධස්ථානයට පැමිණියා ය. දෙටුපුතුගේ හිස සිඳ මද්දුම පුතුගේ හිස සිඳීමට සූදානම් වූ කල්හි ඕතොමෝ “වැඩිමලාගේ හිස සින්දේය, මද්දුමයාගේ හිස ද සිඳියි.” කියා මේ තෙමේද අනික් දෙදෙනා මෙනැයි සිතා බාලයා කෙරෙහි ආලය හැරියා ය.

මේ උපමායෙහි ඒ ස්ත්‍රිය දෙටු පුතුගේ සිඳි හිස දැකීම මෙන් යෝගීහුගේ ඉකුත් සංස්කාරයන්ගේ නිරොධය දැකීම ද මද්දුමයාගේ හිස සිඳිනු මෙන් වර්තමාන සංස්කාර නිරොධය දැකීම ද, මේද මොවුන් වැනි යයි බාලයා කෙරෙහි ආලය හැරීම මෙන් අනාගතයෙහි ද උපදනා සංස්කාරයෝ බිඳෙත් යයි අනාගත ධර්මයන්ගේ නිරොධය දැකීම ද දත යුතු.

මෙසේ බලන්නාවූ ඒ යෝගීහට මෙතැන **භයතුපට්ඨාන ඤාණය** උපදී.

මිය යන දරුවන් ඇති එක් ස්ත්‍රියක් දරුවන් දස දෙනකු වැදුවාය. එයින් නව දෙනෙක් මළහ. එකෙක් දූන් මරණාසන්නව අතෙහි සිටී. අනෙකෙක් කුසෙහි ද සිටී. ඕතොමෝ දරුවන් නව දෙනෙකුන් මළ කල, දසවැන්නා ද මියයන්නහු දැක, කුසහොත් දරුවා මළවුන් හා සම යයි ඔහු කෙරෙහි ආලය හැරියා ය.

ඒ උපමායෙහි ද, ඒ ස්ත්‍රියගේ දරුවන් නව දෙනෙකුන්ගේ මරණය සිහි කිරීම මෙන් ඒ යෝගීහුගේ අතීත සංස්කාර පිළිබඳ නිරොධය සිහි කිරීම ද, අතදරුවා මිය යනු දැකීම මෙන් වර්තමාන සංස්කාර නිරොධය දැකීම ද, කුස හොත් දරුවා කෙරෙහි ආලය හැරීම මෙන් අනාගත සංස්කාර නිරොධය දැකීම ද දත යුතුයි. මෙසේ බලන්නාවූ ඒ යෝගීහට එකෙණෙහිම **භයතුපට්ඨාන ඤාණය** උපදී.

මේ **භයතුපට්ඨාන ඤාණය** වනාහි “ඉකුත් සංස්කාරයෝ නිරුද්ධයහ. වර්තමාන සංස්කාරයෝ නිරුද්ධ වෙත්. අනාගත

**සංස්කාරයෝ නිරුඩ වත්නාහ'' යි තීරණ මාත්‍රයක් පමණමුත් බිය වන ආකාරයෙන් උපදනා නුවණක් නොවන** බව දතයුතු.

ඇස් ඇති පුරුෂයෙක් නුවර දොර අඟුරු වළවල් තුනක් දැක බිය නොවෙයි. මෙහි යම් යම් කෙනෙක් වැටෙත් නම් ඔහු හැම දෙනම බොහෝ දුක් විඳිතියි තීරණ මාත්‍රයෙක්ම ඕහට වේ. භයතුපට්ඨාන ඤාණය ද එ පරිද්දෙන් ම සංස්කාර නිරොධයෙහි තීරණ මාත්‍රයෙක්මය.

**අනිත්‍ය** වශයෙන් මෙනෙහි කරන්නාහට සංස්කාර යන්ගේ භඞ්ගය පෙනෙන හෙයින් ඒ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ සංස්කාර නිමිත්ත භය වශයෙන් වැටහේ. **දුක්** වශයෙන් මෙනෙහි කරන්නාහට රූපා රූප භවයන්ගේ ප්‍රවෘත්තිය නිතර පෙළෙන හෙයින් භය වශයෙන් වැටහේ. **අනාත්ම** වශයෙන් මෙනෙහි කරන්නාහට සංස්කාර නිමිත්ත ද භව ප්‍රවෘත්තිය ද ශූන්‍ය ගමක් මෙන් ද, මිරිඟු දියක් මෙන් ද, ගන්ධර්ව නගරයක් මෙන් ද රික්තය, තුච්ඡය, ශූන්‍යය, අස්වාමිකය, අපරිනායක යයි පෙනෙන හෙයින් නිමිත්ත ප්‍රවෘත්ති දෙකම භය වශයෙන් වැටහේ.

මෙසේ අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් සංස්කාර යන්ගේ භඞ්ගය දක්නා යෝගාවචරයාහට **භයතුපට්ඨාන ඤාණය** උපදී.

**4. ආදීනවානුදර්ශනාඤාණය** – ඒ භයතුපට්ඨාන ඤාණය සේවනය කරන්නා වූ, වඩන්නාවූ, බහුල කොට වඩන්නා වූ ඒ යෝගාවචරයාහට සියලුම භව, යොනි, ගති, විඤ්ඤාණස්ථිති, සත්ත්වාවාසයන්හි සංස්කාරයන් ගෙන් වන්නාවූ අනර්ථයන්ගෙන් ආරක්ෂාවක් හෝ උවදුරු වළක්වාලීමට සැඟවෙන තැනෙක් හෝ, යායුතු තැනෙක් හෝ පිළිසරණ හෙවත් රක්ෂා කරන තැනක් හෝ නැතැයි

වැටහේ. එ හෙයින් එකී තැන්හිවූ එක සංස්කාරයෙක්හිදු ප්‍රාර්ථනාවෙක් හෝ පරාමාසයක් හෙවත් දෘෂ්ටි වශයෙන් දැඩිව ගැනීමක් හෝ නොවේ. ඒ **ත්‍රිවිධ** භවයම සාලගුරින් පිරි අඟුරු වළවල් මෙන් ද, **සතර මහා භූත,** කට්ඨමුඛ, පූතිමුඛ, අග්ගිමුඛ, සත්ථමුඛ නම් වූ ආශිර්විෂයන් සතර දෙනෙකුන් මෙන් ද, **පඤ්චස්කන්ධයෝ,** ඔසවාගත් කඩු ඇති වධකයන් පස් දෙනෙකු මෙන් ද, **චක්ෂුරාදී අධ්‍යාත්මික ආයතන සය,** ආත්ම-ආත්මීය භාවයෙන් ශූන්‍ය හෙයින් ශූන්‍ය ග්‍රාමයක් මෙන් ද, **බාහිරායතන සය** ගම් පහරන සොරුන් මෙන් ද, **සප්තවිඥානස්ථිතහු ද, නවසත්ත්වාවාසයෝ** ද රාගාදී එකොළොස් ගින්නෙන් ඇවිල ගත්තවුන් මෙන් ද, දිළිසෙන්නවුන් මෙන් ද, ගිනිසිළු ඇත්තවුන් මෙන් ද, **සියලු සංස්කාරයෝ** ගඩ මෙන් ද, රෝග මෙන් ද, හුල් මෙන් ද, අඝයන් මෙන් ද, ආබාධයන් මෙන් ද වූවාහු ආස්වාද රහිතයන්ව, නිරසයන්ව, මහත් ආදීනව රැසක්ව වැටහෙති.

යම්සේ පුරුෂයෙක් චණ්ඩ මෘගාදීන් ඇති වනගහණාදීන්ට පැමිණ බියපත්ව, කලකිරුණේ, හටගත් ලොමුඩැහැගැනීම් ඇතිව හාත්පසින් ආදීනව දක්නාසේ මේ යෝගාවචර තෙමේ ද, **භඞ්ගානුපස්සනා ඥාණයාගේ** වශයෙන් සියලු සංස්කාරයන් භය වශයෙන් එළඹ සිටි කල්හි හාත්පසින් ආස්වාද රහිත වූ නීරස වූ ආදීනවයම දකී. මෙසේ බලන්නාවූ ඒ යෝගාවචරයාහට **ආදීනවානුපස්සනා** ඥාණය උපන්නේ වේ.

1. ඉපදීම භයෙක, සංස්කාර ප්‍රවෘත්තිය භයෙක, සංස්කාර නිමිත්ත භයෙක, ආයූහන සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධියට හේතුවූ කර්මය භයෙක, ප්‍රතිසන්ධිය භයෙක, නිරයාදී පස්ගතිය භයෙක, නිපැත්ම භයෙක, උපප්‍රාප්තිය භයෙක, ජාතිය භයෙක, ජරාව භයෙක, ව්‍යාධිය භයෙක, මරණය භයෙක, සොකය භයෙක, පරිදෙවය භයෙක, උපායාසය භයෙකැයි භයතුපට්ඨානයෙහි ප්‍රඥව ආදීනවයෙහි ඥාන නම් වේ.

2. අනුත්පාදය, අප්‍රවෘත්තිය, අනුපායාසය, ක්ෂේම යයි **ශාන්තිපද සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි** ඥානය වේ.

3. උත්පාදය භයය, අනුත්පාදය ක්ෂේම යයි **ශාන්ති-පදයෙහි ඥානය** වේ.

4. උත්පාදය, ප්‍රවෘත්තිය, උපායාසය දුක් යයි භයතුපට්ඨානයෙහි ප්‍රඥව **ආදීනවයෙහි ඥානය** වේ.

5. අනුත්පාදය, අප්‍රවෘත්තිය, අනුපායාසය සුඛ යයි **ශාන්තිපදයෙහි ඥානය** වේ.

6. උත්පාදය දුක්ය, අනුත්පාදය සුඛ යයි **ශාන්ති-පදයෙහි ඥාණය** වේ.

7. උත්පාදය, සංස්කාර ප්‍රවෘත්තිය, උපායාසය සාමිස යයි භයතුපට්ඨානයෙහි ප්‍රඥව **ආදීනවයෙහි ඥානය** වේ.

8. අනුත්පාදය, අප්‍රවෘත්තිය, අනුපායාසය නිරාමිස යයි **ශාන්තිපදයෙහි ඥානය** වේ.

9. උත්පාදය සාමිසය, අනුත්පාදය නිරාමිස යයි **ශාන්තිපදයෙහි ඥානය** වේ.

10. උත්පාදය, ප්‍රවෘත්තිය, උපායාසය සංස්කාරයහයි භයතුපට්ඨානයෙහි ප්‍රඥව **ආදීනවයෙහි ඥානය** වේ.

11. අනුත්පාදය, අප්‍රවෘත්තිය, අනුපායාසය නිර්වාණය යයි **ශාන්තිපදයෙහි ඥානය** වේ.

12. උත්පාදය සංස්කාරයහ, අනුත්පාදය නිර්වාණයහ, ප්‍රවෘත්තිය සංස්කාරයහ, අප්‍රවෘත්තිය නිර්වාණයහ, උපායාසය සංස්කාරයහ, අනුපායාසය නිර්වාණය යි **ශාන්තිපදයෙහි ඥානය** වේ.

**ඉපදීමය, පැවැත්මය, නිමිත්තය, ආයූහනය, ප්‍රතිසන්ධිය දුක් වශයෙන් දැකීම ආදීනවයෙහි ඥාණය යි.**

**අනුත්පාදය, අප්‍රවෘත්තිය, අනිමිත්තය, අනායූහනය, අප්‍රතිසන්ධිය** සැප යයි දැකීම **නිර්වාණ සඞ්ඛ්‍යාත ශාන්ති-පදයෙහි ඥාණය** වේ.

මෙසේ උත්පාදාදී ධර්මයෝ භය වශයෙන් මැනවින් වටහාගත් යෝගාවචරයාගේ සිත ඒ භය ආදියට ප්‍රතිපක්ෂ වූ නිර්වාණයට නැමේ.

**5. නිබ්බිදානුදර්ශන ඥානය** – ත්‍රෛභූමික වූ සියලු සංස්කාරයන් ආදීනව වශයෙන් දක්නා යෝගාවචර තෙම සියලු භව, යොනි, ගති, විඥානස්ථිති, සත්ත්වාවාසයන්හි වූ, බිඳෙන සුලු සියලුම සංස්කාරයන්හි කලකිරෙයි. උකටලී වෙයි, නො ඇලෙයි, චිත්‍රකූට පර්වත පාදයෙහි ඇලුණු ස්වර්ණ හංසරාජයා අපවිත්‍රවූ සැඩොල් ගම්දොර ගවර වලෙහි නො ඇලෙන්නාක් මෙනි. ඔව්හු සිංහ ප්‍රපාතාදී සප්ත මහාවිල්හිම ඇලේ. එ පරිද්දෙන් ම මේ යෝගී තෙම මනාකොට දක්නා ලද ආදීනව ඇති ත්‍රෛභූමික සංස්කාර-යන්හි නො ඇලේ. භාවනායෙහි ඇලුණු හෙයින් භාවනාභිරතියෙන් යුක්තවූයේ **සප්තානුදර්ශනයෙහි** ඇලේ. මෙසේ සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි කලකිරීම් වශයෙන් පැවැති ඥානය **නිබ්බිදානුපස්සනා ඤාණ** නම් වේ.

**6. මුඤ්චිතු කම්‍යතා ඤාණය** – යට කී නිබ්බිදානු-පස්සනා ඤාණයෙන් කලකිරුණු, උකටලී වූ නො ඇලුණු යෝගාවචරයාගේ සිත සියලු භව, යොනි, ගති, විඥානස්ථිති, සත්ත්වාවාසයන්හි සියලු සංස්කාරයන් අතුරෙන් එකද සංස්කාරයෙක්හිවත් නො ඇලේ. නො ලැගේ, නො බැඳේ. සියලු සංස්කාරයන් ගෙන් මිදෙනු කැමැත්තෙත්, නික්මෙනු කැමැත්තේ වේ.

දැල ඇතුළට වන් මත්ස්‍යයකු මෙන් ද, සර්පමුඛගත මැඩියකු මෙන් ද, මැදිරියක ලූ වලිකුකුළකු මෙන් ද, දැඩි මලපුඩුවකට අසුවූ මුවකු මෙන් ද, අහිකුණ්ඨිකයෙකු අතට පත් නයකු සේ ද, මහමඩෙහි ගැලුණු ඇතකු සේ ද,

ගරුඩ මුව ගත නාගයකු සේ ද, රාහු මුඛගත චන්ද්‍රයා සේ ද, සතුරන් පිරිවරණ ලද පුරුෂයකු සේ ද, ඒ යෝගීහුගේ සිත ද සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැත්තේ, නික්මෙනු කැමැත්තේ වේ. මෙසේ සියලු සංස්කාරයෙහි නො ඇලුණු, එයින් මිදෙනු කැමැති ඒ යෝගීහට **මුඤ්චිතුකම්‍යතා ඥාණය** උපදී.

**7. පටිසඞ්ඛානුපස්සනා ඥානය** – මෙසේ මුඤ්චිතුකම්‍යතා ඥානය උපදවාගත් යෝගාවචර තෙම සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු පිණිස නැවත ඒ සංස්කාරයන්ම **පටිසඞ්ඛානුපස්සනා ඥාණයෙන්** ත්‍රිලක්ෂණයට නගා පරිග්‍රහ කෙරේ.

සියලු සංස්කාරයන් අනිත්‍ය හෙයින් ද, තාවකාලික හෙයින් ද, උදය ව්‍යය දෙකින් පිරිසිඳිනා ලද හෙයින් ද, විනාශ වන හෙයින් ද, බිඳෙන හෙයින් ද, අස්ථිර හෙයින් ද, විපරිණාම ධර්ම හෙයින් ද, අසාරක හෙයින් ද, විභව හෙයින් ද, සඞ්ඛත හෙයින් ද, මරණ ධර්ම හෙයින් ද යනාදී කාරණයෙන් ඒ යෝගී තෙම සංස්කාරයන් **අනිත්‍ය** යයි දකී.

නිතර පෙළෙන හෙයින් ද, දුකින් ඉවසන හෙයින් ද, දුකට වස්තු හෙයින් ද, රොග හෙයින් ද, ගණ්ඩ හෙයින් ද, දුක් හෙයින් ද, ආබාධ හෙයින් ද, ඊති හෙවත් කිරිහැර හෙයින් ද, උපද්‍රව හෙයින් ද, භය හෙයින් ද, උපසග්ග හෙයින් ද, රක්ෂා ස්ථාන නැති හෙයින් ද, නිලීන ස්ථාන නැති හෙයින් ද, අසරණ හෙයින් ද, ආදීනව හෙයින් ද, දුකට මුල් හෙයින් ද, වධක හෙයින් ද, ආශ්‍රව සහිත හෙයින් ද, මාරාමිෂ හෙයින් ද, ජාති ස්වභාව ඇති හෙයින් ද, ජරා ස්වභාව ඇති හෙයින් ද, ව්‍යාධි ස්වභාව ඇති හෙයින් ද, ශොක ස්වභාව ඇති හෙයින් ද, පරිදෙව ස්වභාව ඇති හෙයින් ද, උපායාස ස්වභාව ඇති හෙයින් ද, සංක්ලෙශ ස්වභාව හෙයින් දැයි මේ ආදී කාරණයෙන් **දුක්ඛ** යයි දකී.

අමනොඥ හෙයින් ද, දුර්ගන්ධ හෙයින් ද, පිළිකුල් කටයුතු හෙයින් ද, අමඞ්ගලාගී හෙයින් ද, විරූප හෙයින් දැයි මේ ආදී කාරණයෙන් දුක්ඛ ලක්ෂණයට පරිවාර වූ **අශුභයහයි** දකී.

පර වශයෙන් ද, පරිත්ත හෙයින් ද, තුච්ඡ හෙයින් ද, ශූන්‍ය හෙයින් ද, අස්වාමික හෙයින් ද, අනීශ්වර හෙයින් ද, තමා වශයෙහි නො පවත්නා හෙයින් දැයි මේ ආදී කාරණයෙන් **අනාත්ම වශයෙන්** දකී.

සංස්කාරයන් ගෙන් මිදීම සඳහා උපාය සම්පාදනය කරණු පිණිස යෝගාවචර තෙම මෙසේ සංස්කාරයන් පරිග්‍රහ කෙරේ. එයට එක් උපමාවක් දක්වා ඇත.

එක්තරා පුරුෂයෙක් මසුන් ඇල්ලීම පිණිස මස් කරප්පයක් ගෙන ජලයෙහි අටවා ඒ කරක් මුවින් අත දමා දියතුළ වූ සර්පයෙකු ගෙලෙන් අල්වාගෙන මසෙක් ගත්තා ලද්දැයි සතුටුව් මා විසින් මහා මත්ස්‍යයෙක් ලද්දැයි ඔසවා බලනුයේ සෝවැති තුන දැක සර්පයා හැඳින බියපත්ව, ආදීනව දැක ගැනීමෙන් කළකිරී ඉන් මිදෙනු කැමැතිව එයට උපාය යොදනුයේ නගුට අග සිට අත වෙළුම හැර බාහුව ඔසවා, හිසවට දෙතුන් වරක් කරකවා, උඟ දුබල කොට, දුෂ්ට සර්පයා යවයි දුරට දමා ගසා වහා වැ මියරට නැගී, "පින්වත, මහා සර්පමුඛයෙන් මිදුනෙමි" යි කියා ආ මග බලමින් සිටියේ ය.

මේ උපමායෙහි ඒ පුරුෂයා මත්ස්‍යයෙකැයි සර්පයා ගෙන සතුටු වූ කාලය මෙන් මේ යෝගීහුගේ ආදියෙහිම ආත්මය ලැබ සතුටු වූ කාලය ද,

ඔහු කරක් මුවින් සර්ප හිස පිටතට ගෙන සෝවැති තුන දැකීම මෙන් මොහු ඝන විනිර්භොග කොට සංස්කාරයන්ගේ තිලකුණු දැකීම ද,

ඔහු බියවූ කාලය මෙන් මොහුගේ භයතුපට්ඨාන ඤාණය ද,

අනතුරුව ආදීනව දැකීම මෙන් **ආදීනවානුපස්සනා ඤාණය** ද,

සජීයාගෙන් මිදෙනු කැමැත්ත මෙන් **මුඤ්චිතුකම්‍යතා ඤාණය** ද,

මිදීමට උපාය සෙවීම මෙන් **පටිසඞ්ඛානුපස්සනා ඤාණයෙන්** සංස්කාරයන් තිලකුණට නැගීම ද,

ඒ පුරුෂයා සජීයා හිස වටා සිසාරා දුබල කොට පෙරළා දෂට කිරීමට අසමර්ථ කොට මොනවට මිදුණා සේ මේ යෝගීතෙම තිලකුණට නගා සංස්කාරයන් බමවා දුබල කොට නැවත නිත්‍ය, සුඛ, සුභ, ආත්ම ආකාරයෙන් එළඹ සිටීමට අසමර්ථ බවට පමුණුවා මනාමිදුමෙන් මිදේ.

මෙතෙකින් ඒ යෝගීහට **පටිසඞ්ඛා ඤාණය** උපන්නේ වේ.

**8. සඞ්ඛාරොපෙක්ෂා ඤාණය** – **පටිසඞ්ඛානුපස්සනා ඤාණය** උපදවා ගත් යෝගාවචර තෙම සියලු සංස්කාරයෝ ශූන්‍යහයි පිළිගෙන, නැවත මේ සංස්කාර ධර්ම සමූහය ආත්මයෙන් හා ආත්මය පිළිබඳ ධර්මයකින් ද ශූන්‍යහයි මෙසේ **දෙකොණක් ඇති ශූන්‍යත්වය** පරිග්‍රහ කෙරේ.

මෙසේ ආත්මයක් නො ලැබෙන හෙයින් ම ප්‍රත්‍යක්ෂ වශයෙන් ද, අනුමාන වශයෙන් ද, ආත්මයක් නො දැක, තමතමාගේ උපකරණ වශයෙන් සුවදුක් එළවන භාවයෙන් සිටි අන් කිසිවකු හෝ නොදැක නැවත හෙතෙම (1) "මම කිසිතැනෙක්හි ආත්මය නොදකිමි. (2) තමාගේ ආත්මය අන් කිසිවකුට පළිබොධ භාවයෙහි එළවිය යුත්තක් නො දකී. (3) මම ශබ්දය හැර අන්‍යයාගේ ආත්මය ද කිසි තැනක නො දක්නේ ය. (4) අන්‍යයාගේ ආත්මය මාගේ කිසි තැනෙක පළිබොධ භාවයෙහි ඇතැයි නො දකී" යි මෙසේ **චතුෂ්කොටික සුඤ්ඤතාවය** පරිග්‍රහ කෙරේ.

නැවත ද හෙතෙම **සයාකාරයකින් ශුන්‍යතාවය** පරිග්‍රහ කෙරේ. ඒ මෙසේ යි:— **චක්ෂුෂය** (1) **ආත්මයෙන්** හෝ, (2) ආත්මය පිළිබඳ දූයින් හෝ, (3) නිත්‍යයෙන් හෝ, (4) ධ්‍රැව හෙවත් ස්ථිරත්වයෙන් හෝ, (5) ශාස්වතයෙන් හෝ, (6) අවිපරිණාම ධර්මයෙන් හෝ ශුන්‍යය වේ. මෙසේ චක්ඛු සොතාදීහු ද, රූපශබ්දාදීහු ද, චක්ඛු විඤ්ඤාණාදීහු ද, චක්ඛු සම්ඵස්සාදීහු ද යනාදී ක්‍රමයෙන් ජරා මරණ ධර්ම තෙක් මේ සයාකාරයෙන් ශුන්‍යතාවය පරිග්‍රහ කෙරේ.

නැවත ද යෝගාවචර තෙම **අටආකාරයකින් ශුන්‍යතාවය** පරිග්‍රහ කෙරේ. ඒ මෙසේයි:— **රූපය** (1) නිත්‍ය සාරසාරයෙන් හෝ, (2) ධ්‍රැව සාරසාරයෙන් හෝ, (3) සුඛ සාරසාරයෙන් හෝ, (4) ආත්ම සාරසාරයෙන් හෝ, (5) නිත්‍යයෙන් හෝ, (6) ධ්‍රැවයෙන් හෝ, (7) ශාස්වතයෙන් හෝ, (8) අවිපරිණාම ධර්මයෙන් හෝ **අසාරය, නිස්සාරය, සාරාපගතය, වෙදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන,** යනාදී වශයෙන් **ජරා මරණතෙක්** සියලුම ධර්ම සමූහය **අසාරය, නිස්සාරය, සාරාපගතය** යයි අටාකාරයකින් පරිග්‍රහ කෙරේ.

බටය, එරඬුය, දිඹුල්ය, හෙළුවරාය, එරබදුය, පෙණපිඩය, දිය බුබුළුය, මිරිඟු දියය, කෙසෙල් කඳය, මායාය, යන මේ දූය යම්සේ අසාර වෙද්ද, නිස්සාර වෙද් ද, සාරාපගත වෙද්ද එසේම යටකී ධර්මයෝ එකී අටාකාරයකින් ශුන්‍යතාවය පරිග්‍රහ කෙරේ

නැවත ද ඒ යෝගී තෙම **දසාකාරයකින්** ශුන්‍යතාවය පරිග්‍රහ කෙරේ. ඒ මෙසේ යි. (1) **රික්ත** වශයෙන් ද, (2) **තුච්ඡ** වශයෙන් ද, (3) **ශුන්‍ය** වශයෙන් ද, (4) **අනාත්ම** වශයෙන් ද, (5) **අනීශ්වර** වශයෙන් ද, (6) **අකාම කාරී** වශයෙන් ද, (7) **අලබ්භනීය** වශයෙන් ද, (8) **අවසවත්තක** වශයෙන් ද, (9) **පර** වශයෙන් ද, (10) **විවික්ත** වශයෙන් ද යන මේ දසාකාරයෙන් ශුන්‍යතාවය බලයි. මෙසේ වෙදනා දී සෙසු ධර්මයන් ද මේ දසආකාරයෙන් ශුන්‍යතාවය පරිග්‍රහ කෙරේ.

නැවත ද යෝගාවචර තෙම **දෙලොස් ආකාරයකින් ශූන්‍යතාවය** පරිග්‍රහ කරන්නේ ය. ඒ මෙසේ යි. **රූපය:** (1) **සත්ත්වයෙක්** නොවේ, (2) **ජීවයෙක්** නොවේ, (3) **නරයෙක්** නොවේ, (4) **මානවකයෙක්** නොවේ, (5) **ස්ත්‍රියක්** නොවේ, (6) **පුරුෂයෙක්** නොවේ, (7) **ආත්මයක්** නොවේ, (8) **ආත්මය පිළිබඳ දෙයක්** නොවේ, (9) **මම** නොවෙමි, (10) **මාගේ** නොවේ, (11) **අනෙකෙකුගේ** නොවේ, (12) **කිසිවෙකුගේ** නොවේ. **වේදනාදී** ධර්ම ද මෙසේ ම ය. මේ දෙලොස් ආකාරයෙන් සියලුම ධර්මයන්ගේ ශූන්‍යතාවය පරිග්‍රහ කෙරේ.

නැවත ද යෝගාවචර තෙම **තීරණ පරිඥා** වශයෙන් **දෙසාළිස් ආකාරයකින්** ශූන්‍යත්වය පරිග්‍රහ කෙරේ. ඒ මෙසේ යි:—

**රූපය :**

1. අනිත්‍යය
2. දුක්ඛය
3. රෝගය
4. ගණ්ඩය
5. සල්ලය
6. අඝය
7. ආබාධය
8. පරය
9. පලෝකය
10. ඊතිය
11. උපද්දවය
12. භයය
13. උපස්සග්ගය
14. චලය
15. පභඞ්ගුය
16. අද්ධුවය
17. අතාණය
18. අලෙනය
19. අසරණය
20. අසරණීභූතය
21. රිත්තය
22. තුච්ඡය
23. තුච්ඡය
24. අනත්තය
25. අනස්සාදය
26. ආදීනවය
27. විපරිණාමධම්මය
28. අසාරය
29. අඝමූලය
30. වධකය

31. විභවය
32. සාසවය
33. සංඛතය
34. මාරාමිසය
35. ජාතිධම්මය
36. ජරාධම්මය
37. ව්‍යාධිධම්මය
38. මරණධම්මය
39. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස ධම්මය
40. සමුදය ය
41. අත්ථඞ්ගමය
42. නිස්සරණය

යනාදී වශයෙන් වෙදනාදී සියලුම ධර්මයන් දෙසාළිස් ආකාරයකින් ශූන්‍යතා වශයෙන් පරිග්‍රහ කෙරේ.

රූප, වෙදනා, සංඥ, සඞ්ඛාර, විඤ්ඤාණාදීහු අනිත්‍යාදි වූ මේ දෙසාළිස් ආකාරයෙන් ශූන්‍යතා වශයෙන් බලන්නේ ලෝකය බලන්නේ වේ.

මෙසේ සියලු සංස්කාරයන් ශූන්‍ය වශයෙන් දැක, තිලකුණට නඟා සංස්කාරයන් පරිග්‍රහ කරන්නේ, සම්මර්ශනය කරන්නේ සංස්කාරයන්ගේ විනාශය නිසා භය ද, සංස්කාරයන්ගේ සම්පත්තිය නිසා ඇති වන ප්‍රීතිය ද, හැර, සංස්කාරයන් කෙරෙහි උදාසීන වෙයි. මැදහත් වෙයි. මම වෙමියි කියා හෝ මාගේ යයි කියා හෝ අත්හළ භාර්‍ය්‍යාවක් ඇති පුරුෂයකු මෙන් මිථ්‍යාදෘෂ්ටි වශයෙන් නොගනී.

සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැති යෝගීතෙම පටිසඞ්ඛානුපස්සනා ඥණයෙන් සංස්කාරයන් සම්මර්ශනය කොට, මම ය, මාගේ යයි ගත යුත්තක් නොදැක භය ද, ප්‍රීතිය ද හැර සියලු සංස්කාරයන්හි උදාසීනව, මැදහත් වෙයි. මෙසේ දන්නා, මෙසේ දක්නා ඒ යෝගීහුගේ සිත ත්‍රිවිධ භවයෙහි ද, සතර යෝනියෙහි ද, පඤ්චගතියෙහි ද, සප්තවිඥන ස්ථිතියෙහි ද, නව සත්ත්වාවාසයෙහි ද හැකිලෙයි. පැකිලෙයි. වැතිරෙයි. නොපැතිරෙයි. මැදහත් බව හෝ පිළිකුල් බව හෝ පිහිටයි.

මදක් නැමුණු පියුම් පතෙක දිය බිඳුහු හැකිලෙද් ද, පැකිලෙද් ද, වැතිරෙත් ද, නොපැතිරෙද් ද, ගින්නෙහි බහාලූ කුකුළු පිහාටුවෙක් හෝ නහර වැලක් හෝ හැකිලේ ද, පැකිලේ ද, වැතිරේ ද, නොපැතිරේ ද, එපරිද්දෙන් ම ඒ යෝගාවචරයාගේ සිත ද තුන් භවයෙහි හෝ සතර යෝනියෙහි හෝ පඤ්චගතියෙහි හෝ සප්තවිඤ්ඤාණස්ථිතියෙහි හෝ නව සත්ත්වාවාසයන්හි හෝ මැදහත් බව හෝ පිළිකුල් බව හෝ පිහිටයි. මෙසේ ඒ යෝගීහට **සඞ්ඛාරුපෙක්ඛාඤාණය** උපන්නේ වේ.

මේ **සඞ්ඛාරුපෙක්ඛා ඤාණය** සාන්තිපද සඞ්ඛ්‍යාත **නිර්වාණය** ශාන්ත වශයෙන් දකී. සියලු සංස්කාර ප්‍රවෘත්තිය හැර නිවණට ම වදී. ඉදින් ඒ ඤාණය **නිර්වාණය** ශාන්ත වශයෙන් නොදකී නම් නැවත නැවත සංස්කාරයන් ම අරමුණු කොට පවතී. සමුද්‍රිකයන්ගේ **දිසාකාකයා** මෙනැයි කියන ලදී.

මහ මුහුද තරණය කරන වෙළෙඳ ජනයා නැව් නගින කල්හි දිසා කාකයකු ගෙන යති. යම් හෙයකින් වාත වේගයෙන් පහරණ ලද නැව විදේශයකට පැමිණ තෙරක් නොපෙනේ නම් එකල ඔව්හු දිසා කාකයා අත්හරිත්. එවිට උඹ කුඹගසින් අහසට නැඟී සියලු සතර දිග ද, සතර අනුදිග ද අනුව ගොස් තෙරක් පෙනේ නම් එයට අභිමුඛව යෙයි. එසේ තෙරක් නොදකී නම් නැවත නැවත අවුත් කුඹගසෙහි ම ලැගෙයි.

එ පරිද්දෙන් ම **සඞ්ඛාරොපෙක්ඛා ඥානය,** ශාන්ත පදය වූ **නිර්වාණය** ශාන්ත වශයෙන් දකී නම් සියලු සංස්කාර ප්‍රවෘත්තිය හැර **නිවණට** ම වදී. එසේ නිවණ නොදකී නම් නැවත නැවත සංස්කාරයන් අරමුණු කොට පවතී. ඒ විදර්ශනා ඥානය, කුළු අග පොළනු ලබන පිටි මෙන් ද, පොළා ඇට හරන ලද කපු පුළුනක් මෙන් ද, නානා ප්‍රකාරයෙන් සංස්කාරයන් පරිග්‍රහ කොට භය ද, නන්දිය ද, හැර සංස්කාර පරිග්‍රහයෙහි මැදහත්ව ත්‍රිවිධානුදර්ශනා

වශයෙන් සිටී. මෙසේ පැවැති ඒ **සඞ්ඛාරොපෙක්ඛා ඥානය,** ත්‍රිවිධඅනුපස්සනා වශයෙන් පවත්නා හෙයින් **ශ්‍රද්ධා, සමාධි, ප්‍රඥා** යන ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ අධිපති වශයෙන් **ත්‍රිවිධ විමොක්ෂ මුඛ භාවයට පැමිණ සද්ධානුසාරී** ආදී වූ **සප්තාය්‍ය පුද්ගල භාවය** පිණිස ප්‍රත්‍යය වේ.

**ත්‍රිවිධ විමොක්ෂ මුඛ නම්:-**

1. **අනිමිත්ත විමොක්ෂ මුඛය,**
2. **අප්පණිහිත විමොක්ෂ මුඛය,**
3. **ශූන්‍යතා විමොක්ෂ මුඛය,**

**1. අනිච්චානුපස්සනාව** බහුල වූවාහුට **ශ්‍රද්ධෙන්ද්‍රිය** බලවත් වේ. හෙතෙම සසර දුකින් එතරවනු පිණිස සංස්කාරයන් උදය ව්‍යය වශයෙන් පරිච්ඡේද කොට බලයි. උදය-යෙන් පූර්වයෙහි සංස්කාර නැතැයි පිරිසිඳ, ඒ සංස්කාරයන්ගේ ගතිය සොයනුයේ ව්‍යයයෙන් මත්තට නොයෙන බවත්, මෙහි ම අතුරුදන් වන බවත් දකී. මෙසේ **අනිත්‍යය** වශයෙන් මෙනෙහි කොට **ක්ෂය** වශයෙන් සංස්කාරයන් මනාව වැටහෙන හෙයින් ද, සර්ව සංස්කාර නිමිති නැති හෙයින් අනිමිත්ත වූ අසඞ්ඛත ධාතුවෙහි අධිචිත්තයාගේ අනුප්‍රවේශය වන හෙයින් ද **අනිමිත්ත විමොක්ෂ** නම් වේ. මෙසේ අනිත්‍යානු දර්ශනයෙන් අනිමිත්ත වශයෙන් සංස්කාරයන් පරිග්‍රහ කොට විදර්ශනා වඩන යෝගීහුගේ අනිමිත්තාකාරයෙන් නිර්වාණය අරමුණු කොට පැවැති **ආය්‍ය මාර්ගය** ද **අනිමිත්තවිමොක්ෂ** නමුදු වේ. සසර දුකින් නික්මයාම පිණිස උපකාර වන හෙයින් **අනිමිත්තවිමොක්ෂ මුඛ** නම් වේ.

**4. දුක්ඛානුපස්සනාව** බහුලවූවහුට **සමාධින්ද්‍රිය** බලවත් වේ. හෙතෙම සියලු සංස්කාරයන් කෙරෙහි චිත්ත සමුත්තෙජනය පිණිස, නොහොත් සංස්කාර ස්වභාවය සැලකීමෙන් සංවේගයට පැමිණි චිත්තය සම්‍යක් ප්‍රතිපත්තියෙහි තියුණු කරන පිණිස ද රාග ප්‍රණිධීන්ගේ

අභාවයෙන් අප්‍රණිහිත ධාතුවෙහි චිත්තයාගේ අනුප්‍රවේශය වන හෙයින් ද **අප්පණිහිතවිමොක්ඛය** නම් වේ, අප්‍රණි-හිතාකාරයෙන් **නිර්වාණය** අරමුණු කොට පැවැති **ආර්‍ය්‍ය මාර්ගය, අප්පණිහිතවිමොක්ඛ** නමුදු වේ. සසර දුකින් නික්ම යාම පිණිස උපකාර වන හෙයින් **අප්පණිහිත විමොක්ඛ මුඛ** නම් වේ.

**3. අනත්තානුපස්සනාව** බහුලවූවහුට **ප්‍රඥෙන්ද්‍රිය** ය බලවත් වේ. හෙතෙම සියලු සංස්කාර ධර්ම **අනාත්ම** වශයෙන් බලන්නේ, **ආත්මසූන්‍යතා** වශයෙන් ශූන්‍යතා ධාතුවෙහි චිත්තයාගේ අනුප්‍රවේශය වන හෙයින් **සුඤ්ඤත විමොක්ඛය** නම් වේ. මෙසේ ශූන්‍යතාකාරයෙන් **නිර්වාණය** අරමුණු කොට පැවැති **ආර්‍ය්‍ය මාර්ගය සුඤ්ඤත විමොක්ඛ** නමුදු වේ. සංස්කාර දුකින් නික්ම යාම පිණිස උපකාර වන හෙයින් **සුඤ්ඤතවිමොක්ඛ මුඛ** නම් වේ.

මෙ කී **ත්‍රිවිධ විමොක්ඛ මුඛ** වශයෙන් ප්‍රත්‍යය ලැබීමෙන් ඇතිවන **සප්තාර්‍ය්‍ය පුද්ගලයෝ** නම්:-

1. **සද්ධානුසාරිය,**
2. **සද්ධාවිමුත්තය,**
3. **කායසක්ඛිය,**
4. **උභතොභාගවිමුත්තය,**
5. **ධම්මානුසාරිය,**
6. **දිට්ඨිප්පත්තය,**
7. **පඤ්ඤාවිමුත්තය** යන ආර්‍ය්‍ය පුද්ගලයෝ සත්දෙන ය.

**1. සද්ධානුසාරී ආර්‍ය්‍ය පුද්ගලයා**- අනිත්‍ය වශයෙන් සංස්කාරයන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය ය තියුණු කර ගෙන ඒ අනුව විදසුන් වඩා සෝවාන් මාර්ග ඥානය **ලබන** පුද්ගලයා ඒ සෝවාන් මාර්ගක්ෂණයේදී **සද්ධානුසාරී** නම් වේ.

**2. සද්ධා විමුත්ත ආර්‍ය්‍ය පුද්ගලයා**- හේතු-ඵල විශ්වාස කරමින් කෙලෙසුන් කෙරෙන් මිදුණු සෙසු සත් මාර්ගඵලලාභී පුද්ගලයෝ **සද්ධාවිමුත්ත ආර්‍ය්‍ය පුද්ගලයෝ** නම් වෙති.

**3. කායසක්ඛි ආර්‍ය පුද්ගලයා**- සංස්කාරයන් දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය බහුලව, සමාධින්ද්‍රිය තියුණු කොට ගෙන ඒ අනුව විදසුන් වඩා මාර්ගය ලබා ගත් ආර්‍ය පුද්ගල තෙම හැම තැනම **කායසක්ඛි** නම් වේ. මෙතෙම අරූපධ්‍යාන පළමුව සපර්ශ කොට පසුව නිරෝධය හෙවත් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන පුද්ගලයා ය.

**4. උභතෝභාග විමුත්ත ආර්‍ය පුද්ගලයා** - අරූප ධ්‍යානයට පැමිණ අර්හත් ඵලය ලබන පුද්ගලයා **උභතෝභාග විමුත්ත** පුද්ගලයා නම් වේ. හෙතෙම අරූප ධ්‍යානයෙන් ද ආර්‍ය මාර්ගයෙන් දැයි දෙකොටසින් මුක්ත වූ පුද්ගලයා යි. රූප කාය, නාම කාය වශයෙන් හෝ විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් හෝ උභයභාගයෙන් හෝ උභය වාරයෙක හෝ මිදුණේ උභතෝභාග විමුත්ත යයි ද කියනු ලැබේ.

**5. ධම්මානුසාරි ආර්‍ය පුද්ගලයා**- සංස්කාරයන් අනාත්ම වශයෙන් මෙනෙහි කොට දැනීම බහුල කොට ඇත්තේ, ප්‍රඥෙන්ද්‍රිය තියුණු කොට ගෙන ඒ අනුව සෝවාන් මාර්ග ඥානය ලබන පුද්ගලයා සෝවාන් මාර්ගක්ෂණයේදී **ධම්මානුසාරි අර්‍ය පුද්ගල** නම් වේ.

**6. දිට්ඨිප්පත්ත ආර්‍ය පුද්ගලයා**- සෝවාන් මාර්ගයට අනතුරුව සොවාන් ඵලයෙහි සිට අර්හත් මාර්ගය තෙක් පැමිණි ආර්‍ය පුද්ගලයෝ **දිට්ඨිප්පත්ත පුද්ගලයෝ** නම් වෙත්. සංස්කාරයෝ දුක්ඛයහ, නිරෝධය සුඛයහයි **දක්නා** ලද්දේ, ප්‍රකට කොට දක්නා ලද්දේ, සපර්ශ කරන ලද්දේ **දිට්ඨිප්පත්ත** නම් වේ.

**7. පඤ්ඤා විමුත්ත ආර්‍ය පුද්ගලයා**- අනිත්‍යාදි වශයෙන් ප්‍රකාරයෙන් දැන කෙලෙසුන් කෙරෙන් මිදුණු අර්හත් ඵලයෙහි පිහිටි පුද්ගල තෙම **පඤ්ඤාවිමුත්ත ආර්‍ය පුද්ගල** නම් වේ.

මෙසේ මාර්ගයට පූර්වයෙහි **නිබ්බිදානුපස්සනා ඥානයෙන්** සංස්කාරයන් කෙරෙහි කලකිරුණු පුද්ගලයා, ඡන්දරාගාදීන් ප්‍රහානය කිරීමෙන් සසරින් මිදෙනු කැමැතිව මුඤ්චිතු

**සම්මසන ඥානය** උපදවා ගෙන සසරින් මිදීමට උපාය කරනු පිණිස නැවත සංස්කාරයන් තිලකුණට නගා **පටිසඞ්ඛානුපස්සනා ඥානය** ලබා අවසානයෙහි අපෙක්‍ෂාව හැරීම් වශයෙන් මස්තකප්‍රාප්ත වීමෙන් මැදහත් භාවයෙහි පිහිටි **සඞ්ඛාරුපෙක්‍ෂා ඥානය** උපදවා ගන්නේ ය.

මේ **සඞ්ඛාරුපෙක්ඛා ඥානලාභී** පුද්ගල තෙම විදර්ශනාව මස්තකප්‍රාප්ත කළ බැවින් එයට **සිඛාප්පත්ත විපස්සනා** යයි ද වුට්ඨාන සඞ්ඛ්‍යාත මාර්ගයට යන හෙයින් **වුට්ඨාන ගාමිනී** යයි ද කියනු ලැබේ. මේ ඥානය සිඛාවට ක්‍ෂාත්‍ය වශයෙන් ද, ප්‍රවෘත්ති වශයෙන් ද, ලෞකික ඥානයන්ගේ මස්තකයට, උත්තම බවට පැමිණි හෙයින් **සිඛාප්‍රාප්ත** නම් වේ. පිටත විදර්ශනාවට අරමුණු වූ අභිනිවෙශ කළ පඤ්චස්කන්ධ සඞ්ඛාත වස්තුවෙන් ද, අධ්‍යාත්ම සන්තානයෙහි පවත්නා මිත්‍යාදෘෂ්ටි ආදියෙන් හා ඒ අනුව පවත්නා කෙලශයන් කෙරෙන් ද නැගී සිටින හෙයින් ද වුට්ඨාන නම් වූ මාර්ගයට යන හෙයින් ද **වුඨාන ගාමිනී** නම් වේ.

මේ අභිනිවේශය ද වුට්ඨානය ද ප්‍රකට කරනු ලබන්නේ මෙසේ යි:-

1 අධ්‍යාත්මයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී,

2. අධ්‍යාත්මයෙහි පිවිස බාහිරයෙන් නැගී සිටී,

3. බාහිරයෙන් පිවිස බාහිරයෙන් නැගී සිටී,

4. බාහිරයෙන් පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී,

5. රූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටී,

6. රූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටී,

7. අරූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටී,

8. අරූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටී,

9. එකප්‍රහාරයෙන් පඤ්චස්කන්ධයෙන් නැගී සිටී,

10. අනිත්‍ය වශයෙන් පිවිස අනිත්‍ය වශයෙන් නැගී සිටී,

11. අනිත්‍ය වශයෙන් පිවිස දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද නැගී සිටී.

12. දුක් වශයෙන් පිවිස දුක් වශයෙන් ද, අනිත්‍ය වශයෙන් ද, අනාත්ම වශයෙන් ද නැගී සිටී,

13. අනාත්ම වශයෙන් පිවිස අනාත්ම වශයෙන් ද, අනිත්‍ය වශයෙන් ද, දුක් වශයෙන් ද නැගී සිටී.

මේ ශාසනයෙහි එක් යෝගාවචර කෙනෙක් පළමු කොට අධ්‍යාත්ම සංස්කාරයන් විෂයෙහි පිවිස හෙවත් අධ්‍යාත්ම සංස්කාරයන් අරමුණු කිරීමෙන් විදර්ශනාව ආරම්භ කොට අධ්‍යාත්ම සංස්කාරයන් මනා කොට බලයි. අධ්‍යාත්ම සංස්කාර දර්ශනයෙන් පමණක් මාර්ග ව්‍යුත්ථානය නොවන හෙයින් බාහිර සංස්කාරයන් ද බැලිය යුතු වේ. එ හෙයින් පරසන්තානගත ස්කන්ධයන් ද, අනුපාදින්න නොහොත් අනින්ද්‍රිය බද්ධ සංස්කාරයන් ද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බලයි. මෙසේ හෙතෙම කලෙක අධ්‍යාත්ම සංස්කාරයන් සම්මර්ශනය කෙරේ. කලෙක බාහිර සන්තානගත සංස්කාරයන් සම්මර්ශනය කෙරේ. යෝගී තෙම මෙසේ සම්මර්ශනය කරන කල්හි, අධ්‍යාත්ම සංස්කාරයන් සම්මර්ශනය කිරීමේදී, විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් අධ්‍යාත්මයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී නම් වේ. බාහිර ධර්මයන් සම්මසනය කළ විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් අධ්‍යාත්මයෙහි පිවිස බාහිරයෙන් නැගී සිටී නම් වේ. මෙ පරිද්දෙන් ම පළමු කොට බාහිර සංස්කාරයන්හි පිවිස විදර්ශනා ආරම්භ කොට බාහිර අධ්‍යාත්ම දෙකන්හිම සංස්කාරයන් සම්මර්ශනය කොට, එයින් බාහිර ධර්මයන් සම්මසනය කළ විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම්, බාහිරයෙහි පිවිස බාහිරයෙන් නැගී සිටී නම් වේ. අධ්‍යාත්ම සංස්කාරයන් සම්මසනය කළ විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම්, බාහිරයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී නම් වේ.

ඇතැම් යෝගාවචර කෙනෙක් පළමු කොට රූපයෙහි පිවිසෙයි, හෙවත් රූපය අරමුණු කොට විදර්ශනා ආරම්භ කරයි. හෙතෙම භූත රූප ද, උපාදා රූප ද රැසක් කොට දකී. රූප දර්ශනයෙන් පමණක් මාර්ගව්‍යුත්ථානය නොවන හෙයින් අරූපය ද දැකිය යුතු වේ. එ හෙයින් ඒ රූපය අරමුණු කොට උපන් **වේදනා, සංඥා, සංස්කාර, විඥාන** යන මෙය අරූප යයි අරූප සම්මර්ශනය කෙරේ. හෙතෙම මෙසේ කලෙක රූපය සම්මර්ශනය කෙරේ, කලෙක අරූපය සම්මර්ශනය කෙරේ. මෙසේ සම්මර්ශනය කරන ඒ යෝගී හට රූපය සම්මසන කාලයෙහි විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් **රූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටි** නම් වේ. අරූප සම්මසනය කළ විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් **රූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටි** නම් වේ. ඉදින් හෙතෙම පළමු කොට අරූපයෙහි පිවිස අරූප රූප දෙකත්හිම විදර්ශනා වශයෙන් සම්මසනය කළ, අරූප සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම්, **අරූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටි** නම් වේ. රූපය සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් **අරූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටි** නම් වේ.

ඇතැම් යෝගී කෙනෙක් **"යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං"** යයි උදය වන සුළුවූයේ ව්‍යය වන සුලුය යි මෙසේ අභිනිවේශ කොට විදර්ශනා වඩන කල්හි මාර්ගව්‍යුත්ථාන කාලයෙහි **එක ප්‍රහාරයෙන්ම පඤ්චස්කන්ධයෙන් නැගී සිටි** නම් වේ.

තවද, එක් යෝගාවචර කෙනෙක් පළමු කොට අනිත්‍ය වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කෙරේ. අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කළ පමණින්ම මාර්ගව්‍යුත්ථානය නොවන හෙයින් දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද, සම්මර්ශනය කළ යුතු වේ. එ හෙයින් හෙතෙම දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද සංස්කාරයන් සම්මර්ශනය කෙරේ. එසේ පිළිපැද අනිත්‍ය වශයෙන් සම්මර්ශනය

කරන කල මාර්ගව්‍යුත්ථානය වේ නම් නොහොත් විදර්ශනාව මාර්ග හා ගැලපේ නම් **අනිත්‍ය වශයෙන් පිවිස අනිත්‍ය වශයෙන් නැගී සිටි** නම් වේ. දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද සම්මර්ශනය කරන කල මාර්ගව්‍යුත්ථානය වේ නම් **අනිත්‍ය වශයෙන් පිවිස දුක් වශයෙන් ද, අනාත්ම වශයෙන් ද නැගී සිටි** නම් වේ.

මෙ පරිද්දෙන් ම පළමු කොට **දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ පිවිස දුක් වශයෙන් ද, අනිත්‍ය වශයෙන් ද, අනාත්ම වශයෙන් ද නැගී සිටි** නම් වේ.

මේ යෝගීන් අතුරෙන් ඇතැම් කෙනෙක් පළමු කොට අනිත්‍ය වශයෙන් අභිනිවේශය කෙරේ. ඇතැම් කෙනෙක් කෙනෙක් දුක්ඛ වශයෙන් අභිනිවේශය කෙරේ. ඇතැම් කෙනෙක් අනාත්ම වශයෙන් අභිනිවේශය කෙරේ. මොවුන් අතුරෙන් යමෙක් ව්‍යුත්ථාන කාලයෙහි අනිත්‍ය වශයෙන් ව්‍යුත්ථානය වේ නම්, ඒ තුන්දෙනම **අධිමොක්ඛ** බහුලයෝ වෙති. **ශ්‍රද්ධෙන්ද්‍රිය** ය පිළිලබත්. **අනිමිත්ත විමොක්ෂයෙන්** මිදෙත්. සෝවාන් මාර්ගක්ෂණයෙහි දී **සද්ධානුසාරීහු** වෙති. සෙසු සත් තන්හි **ශ්‍රද්ධා විමුක්තයෝ** වෙති.

යමෙක් ව්‍යුත්ථාන කාලයෙහි දුක්ඛ වශයෙන් ව්‍යුත්ථානය වේ නම්, ඒ තුන්දෙනම **පස්සද්ධි** බහුලයෝ වෙති. **සමාධින්ද්‍රිය** පිළිලබති. **අප්පණිහිත විමොක්ෂයෙන්** මිදෙති. සියලු තන්හිම **කායසක්ඛිහු** වෙති.

අරූපධ්‍යානය මෙහිදී යමෙකුට පාදක වේ නම් හෙතෙම අග්‍ර ඵලයෙහිදී **උභතොභාග විමුක්ත** වේ.

යමෙක් ව්‍යුත්ථාන කාලයෙහි අනාත්ම වශයෙන් ව්‍යුත්ථානය වේ නම් ඒ තුන්දෙනම **ප්‍රඥා** බහුලයෝ වෙති. **ප්‍රඥෙන්ද්‍රිය** පිළිලබති. **ශූන්‍යතා විමොක්ෂයෙන්** මිදෙත්. සෝවාන් මාර්ගක්ෂණයෙහි දී **ධම්මානුසාරීහු** වෙති. සෝවාන් ඵලය සිට අග්‍ර මාර්ගය තෙක් **දිට්ඨිප්පත්තයෝ** වෙති. අග්‍ර ඵල යෙහි **ප්‍රඥා විමුක්තයෝ** වෙති.

මේ **සඞ්ඛාරුපෙක්ඛා ඥානය**, මත්තෙහි ආර්ය **මාර්ගයාගේ ද, බොධ්‍යාඞ්ග, මාර්ගාඞ්ග, ධ්‍යානාඞ්ග ප්‍රතිපදා, විමොක්ෂ** යන මොවුන්ගේ ද විශේෂය නියම කෙරේ.

**1. ධ්‍යානලාභී නොවූ ශුෂ්කවිදර්ශකයාහට උපන් මාර්ගය ද,**

**2. සමාපත්තිලාභී යෝගියාහට ධ්‍යාන පාදක නොකොට උපන් මාර්ගය ද,**

**3. ප්‍රථම ධ්‍යානය පාදක කොට ඒ පාදක ධ්‍යානයෙන් අන්‍ය වූ ප්‍රකීර්ණක සංස්කාරයන් සම්මර්ශනය කොට උපදවන ලද මාර්ගය ද ප්‍රථම ධ්‍යානිකයෝ ම** වෙති.

මේ තුන් ප්‍රකාර මාර්ගයෙහි ම **සප්ත බොධ්‍යාඞ්ගයෝ ද, අෂ්ට මාර්ගාඞ්ගයෝ ද, පඤ්ච ධ්‍යානාඞ්ගයෝ ද** වෙති.

ආර්ය මාර්ගයන්ගේ **පූර්වභාග විදර්ශනාව, සොමනස්ස සහගතව** ද, **උපෙක්ඛා සහගතව** ද වේ. වුට්ඨාන කාලයෙහි හෙවත් මාර්ගාසන්න කාලයෙහි සඞ්ඛාරුපෙක්ඛා භාවයට පැමිණ **සොමනස්ස සහගත** වේ.

**පඤ්චකනය** වශයෙන් **ද්විතීය ධ්‍යානය** පාදක කොට මාර්ගය උපදවන කල්හි විතර්කය හැර **ධ්‍යානාඞ්ග සතරක්** වේ. **තෘතීය ධ්‍යානය** පාදක කොට මාර්ගය උපදනා කල්හි විතර්ක විචාරයන් හැර **ධ්‍යානාඞ්ග තුනෙක්** වේ. **චතුර්ථ ධ්‍යානය** පාදක කොට මාර්ගය උපදවන කල්හි විතර්ක, විචාර, පීති හැර **ධ්‍යානාඞ්ග දෙකෙක්ම** වේ. මෙකී සියලු තන්හිම විතර්ක නැති හෙයින් සම්මා සඞ්කප්පය හැර **මාර්ගාඞ්ග සතක්ම** වෙත්. **චතුර්ථ ධ්‍යානයෙන්** උපදවන කල්හි ප්‍රීති සම්බොධ්‍යාඞ්ගය හැර **බොධ්‍යාඞ්ග සයෙක්** වේ. මේ විශේෂය **පාදකධ්‍යාන නියමයෙන්** ද, **විපස්සනා නියමයෙන්** ද වේ මෙයින් පූර්වභාග විපස්සනාව සොමනස්ස සහගතව ද, උපෙක්ඛා සහගතව ද වේ. වුට්ඨානගාමිනී ප්‍රඥාව සොමනස්ස සහගත ම වේ.

**පඤ්චමධ්‍යානය** පාදක කොට උපදවන මාර්ගයෙහි, උපෙක්ඛා, එකග්ගතා වශයෙන් **ධ්‍යානාඞ්ගයෝ දෙදෙනෙක්** වෙත්. එහි **බොධ්‍යාඞ්ගයෝ** ප්‍රීතිය හැර **සදෙනෙකි. මාර්ගාඞ්ගයෝ** සම්මාසඞ්කප්පය හැර **සත්දෙනෙකි.** මේ විශේෂය ද පාදක ධ්‍යාන නියමය හා විදර්ශනා නියමය ද යන උභය නියමයන්ගේ වශයෙන් වේ. මෙහිදී ද පූර්වභාග විපස්සනාව සොමනස්ස සහගතව හෝ උපෙක්ඛා සහගතව හෝ වෙයි. ව්‍යුත්ථානගාමිනී විදර්ශනාව **උපෙක්ඛා සහගත** ම වේ.

අරූප ධ්‍යානයන් පාදක කොට උපදවන ලද මාර්ග යෙහි ද මේ ක්‍රමයම වේ.

මේ **සඞ්ඛාරුපෙක්ඛාව** මූල පටන් කෙලෙස් විෂ්කම්භනය කරණුයේ දුකින්, උත්සාහයෙන් විෂ්කම්භනය කිරීමට හැකි වී නම් ඒ ප්‍රතිපදාව දුක් සහිත වූ හෙයින් **දුක්ඛාපටිපදා** නම් වේ. විපර්‍ය්‍යාසයෙන් **සුඛාප්‍රතිපදා** නමුදු වේ. කෙලශයන් විෂ්කම්භනය කොට මාර්ගය පහළවීම සෙමෙන් කෙරෙන කල්හි **දන්ධාභිඤ්ඤා** නම් වේ. විපර්‍ය්‍යාසයෙන් **ඛිප්පාභිඤ්ඤා** ද වේ. මෙසේ මේ **සඞ්ඛාරු පෙක්ඛාව** ආගමනීය ස්ථානයෙහි සිට තම තමන්ගේ මාර්ගයට නම් නියම කෙරේ. එහෙයින් මාර්ගය නම් සතරක් ලබයි. එනම් **දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා,** කියා යි.

මේ ප්‍රතිපදාව ඇතැම් භික්ෂුවක්හට වෙන් වෙන් වශයෙන් ද වේ. කිසි භික්ෂුවක්හට සතර මාර්ගයෙහි එකම ප්‍රතිපදාවෙක් ම වෙයි. බුදුරදුන්ට වූ කලී සතර මාර්ගයම **සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** විය. දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන්ට ද එසේ ම විය. මහමුගලන් තෙරණුවන්ට වනාහි සෝවාන් මාර්ගය **සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** විය. මතු තුන **දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා** විය.

මෙසේ සඞ්ඛාරුපෙක්ෂා ඥානය **ප්‍රතිපදා විශේෂය** නියම කෙරේ. **විමොක්ෂ විශේෂය** නියම කෙරෙන පිළිවෙල යට දක්වන ලදී.

තවද, මේ මාර්ගය කරුණු පසෙකින් ද නම් ලබයි.

1. **ස්වරස වශයෙන්** – මේ සඞ්ඛාරුපෙක්ඛා ඥානය, සංස්කාරයන් **අනිත්‍ය** වශයෙන් සම්මර්ශනය කොට නැගේ නම් ඒ මාර්ගය **අනිමිත්ත විමොක්ෂ** නම් වේ **දුක්** වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කොට නැගේ නම් ඒ මාර්ගය **අප්පණිහිත විමොක්ෂ** නම් වේ. **අනාත්ම** වශයෙන් සම්මර්ශනය කොට නැගේ නම් ඒ මාර්ගය **සුඤ්ඤත විමොක්ෂ** නම් වේ. මෙය ස්වරස වශයෙන් නම් ලැබීම වේ

2. **ප්‍රත්‍යනීක වශයෙන්** – මේ මාර්ගය **අනිත්‍යානු දර්ශනයෙන්** සංස්කාරයන්ගේ ඝන විනිර්භෝග කොට **නිත්‍ය නිමිත්තය, ධ්‍රුව නිමිත්තය, ශාශ්වත නිමිත්තය** යන මොවුන් දුරු කෙරෙමින් ආ හෙයින් **අනිමිත්ත** නම්. **දුක්ඛානු දර්ශනයෙන්** සුඛ සංඥාව හැර ප්‍රණිධිය හෙවත් ප්‍රාර්ථනාව වියළවමින් ආ හෙයින් **අප්පණිහිත** නම්. **අනත්තානු-පස්සනාවෙන් ආත්මය** ය, **සත්ත්වය** ය, **පුද්ගලය** යන සංඥා හැර සංස්කාර ශූන්‍යත්වයෙන් දක්නා ලද හෙයින් **සුඤ්ඤත** යයි මෙසේ ප්‍රත්‍යනීක වශයෙන් සිඩ නාම වෙති.

3. **ස්වගුණ වශයෙන්** – රාගාදීන්ගෙන් සූන්‍ය හෙයින් **සුඤ්ඤත** නම්. රූප නිමිති ආදීන්ගේ ද, රාග නිමිති ආදීන් ගේ ද අභාවයෙන් **අනිමිත්ත** නම්. රාග ප්‍රාර්ථනා ආදීන්ගේ අභාවයෙන් **අප්පණිහිත** යයි ද මේ මාර්ගයට **ස්වගුණ** වශයෙන් සිඩ නම් වෙති.

4. **ආලම්බන වශයෙන්** – මේ මාර්ගය ශූන්‍ය වශයෙන් නිර්වාණය අරමුණු කරන හෙයින් **සුඤ්ඤත** ය. අනිමිත්ත වශයෙන් නිර්වාණය අරමුණු කරන හෙයින් **අනිමිත්ත** ය. අප්‍රණිහිත වශයෙන් නිර්වාණය අරමුණු කරන හෙයින් **අප්පණිහිත** ය. මෙසේ මාර්ගයට ආලම්බන වශයෙන් මේ නාමයෝ වෙති.

5. **ආගමනය වශයෙන් – විපස්සනාගමනය, මග්ගාගමනය** කියා ආගමන ද්විධ වේ. **එයින් මාර්ගයෙහි විදර්ශනාගමනය වේ. ඵලයෙහි මාර්ගාගමනය ලැබේ.**

## 9. සත්‍යානුලෝම ඥානය

**සඞ්ඛාරුපෙක්ඛා ඥාණය** ආසේවනය කරන්නාවූ ද, වඩන්නාවූ ද, බහුලීකෘත කරන්නාවූ ද යෝගාවචරයාහට **අධිමොක්ඛ** සඞ්ඛ්‍යාත වූ **ශ්‍රද්ධාව** බලවත්ව උපදී. ප්‍රතිපක්ෂ කෙලෙසුන් මැඩීමට සමත් **වීර්‍ය්‍යය** මනා කොට උපදී. ආලම්බනාභිමුඛ භාවයෙන් **සතිය** මනාව එළඹ සිටියේ වේ. පස්සද්ධි සුඛාදීන්ගේ බලවත් වීමෙන් සිත **සමාහිත** වේ. අතිශයෙන් තීක්ෂණ වූ **සඞ්ඛාරොපෙක්ඛා ඥාණය** උපදී. ඒ යෝගීහට මාර්‍ගය දැන් දැන් උපදී යයි කිව යුතු බවට පැමිණි කල්හි සඞ්ඛාරොපෙක්ෂා ඥාණය ත්‍රෛභූමික සංස්කාරයන්හි එල්බ **අනිත්‍ය** යයි හෝ, **දුක්ඛ** යයි හෝ, **අනාත්ම** යයි හෝ සම්මර්‍ශනය කොට භවාඞ්ගයට බසී. අනතුරුව සඞ්ඛාරොපෙක්ෂා ඥාණය අනිත්‍යාදී වශයෙන් අරමුණු කළාක් මෙන් ම සංස්කාරයන් **අනිත්‍ය** යයි හෝ **දුක්ඛ** යයි හෝ, **අනාත්ම** යයි හෝ සම්මර්‍ශනය කොට අරමුණු කරමින් මනොද්වාරාවජ්ජන චිත්තය උපදී. එයට අනතුරුව එය ම අරමුණු කරමින් **පරිකර්‍ම** නම් වූ පළමු වන ජවන් සිත උපදී. අනතුරුව එම සංස්කාරයන් ම අරමුණු කරමින් **උපචාර** නම් වූ දෙවන ජවන් සිත උපදී. එයට අනතුරුව එසේම සංස්කාරයන් අරමුණු කරමින් **අනුලොම** නම් වූ තුන් වන ජවන් සිත උපදී. මේ සිත් තුන වෙන් වෙන් වූ නමින් හැඳින්වනු ලබන්නේ වී නමුත් ඒ ත්‍රිවිධ ජවන චිත්තයන්ට **ආසෙවන** යයි ද, **පරිකර්‍ම** යයි ද, **උපචාර** යයි ද, **අනුලොම** යයි ද කිය යුතු වේ.

මේ **අනුලොම** බව පූර්‍වභාග, පශ්චිම භාග යන දෙතන්හිම වූ ධර්‍මයන් පිළිබඳව වේ. ජවන චිත්තය පූර්‍ව වූ උදය-ව්‍යයාදී අට වැදෑරුම් විදර්‍ශනා ඥානයන්ට **ලක්ෂණ** ත්‍රය සම්මර්‍ශනය කිරීම වූ **තථ කෘත්‍යය** වන බැවින් **අනුලොම** වේ. මත්තෙහි ද සත්තිස් බොධිපාක්ෂික ධර්‍ම යන්ට **තථ කෘත්‍යය** සිඞ කරන හෙයින් **අනුලොම** වේ.

**අනුලෝම** ඥානය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සංස්කාරයන් අරමුණු කොට පවත්නා හෙයින්, **උදය-ව්‍යය** ඥාණය ද, උදය-ව්‍යයවත් සංස්කාරයන්ගේම **උදය ව්‍යය** දිටී යයි ද, **භඞ්ගානුපස්සනා** ඥාණය, ඒකාන්තයෙන් භඞ්ගය ඇති ධර්මයන්ගේ **භඞ්ගය** දිටී යයි ද, ඒකාන්තයෙන් භය සහිත වූ යෙහිම **භයතුපට්ඨාන** ඥාණයට සංස්කාරයන් භය සහිතව වැටහිණැයි ද, **ආදීනවානුපස්සනා** ඥාණය ආදීනව සහිත වූ යෙහිම **ආදීවන** දිටී යයි ද, **නිබ්බිදා** ඥාණය නිර්වේද කටයුත්තෙහිම කළකිරුණේ යයි ද, **මුඤ්චිතුකම්‍යතා** ඥාණය, මිදිය යුත්තෙහිම මිදෙනු කැමැතිවී යයි ද, **පටිසඞ්ඛානුපස්සනා** ඥාණය, අනිත්‍යාදී වශයෙන් පටිසඞ්ඛා හෙවත් නුවණින් සැලකීම කරණ ලදැයි ද, **සඞ්ඛාරුපෙක්ඛා** ඥාණයෙන් උපෙක්ෂා කටයුත්තෙහිම උපෙක්ෂිත යයි ද, **අර්ථ** වශයෙන් කියන්නාක් මෙන් මේ අටවැදෑරුම් ඥාණයන්ගේ තථ කෘත්‍ය ඇති හෙයින් මතු මාර්ගයෙහි ද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට ඒ සම්‍යක් ප්‍රතිපත්තියෙන් පැමිණිය යුතු බැවින් ද **අනුලෝම** වෙයි

මේ **අනුලෝම** ඥාණය සංස්කාරාලම්බනික වූ **වුට්ඨාන-ගාමිණී** විදර්ශනාවගේ කෙළවර වේ.

**මේ වුට්ඨානගාමිනී විදර්ශනාවට, අතම්මයතාය** යයි ද, **නිබ්බිදා** යයි ද, **ධම්මට්ඨිති ඥාණය** යයි ද, **සඤ්ඤග්ගය** යයිද, **පාරිශුද්ධිපධානියඞ්ගය** යයි වදරන ලද බව දත යුතු.

## 7. ඥානදර්ශන විශුද්ධිය

යටකී **අනුලෝම** ඥාණයට අනතුරුව **ගෝත්‍රභූ** ඥාණය වේ. ඒ **ගෝත්‍රභූ** ඥාණය මාර්ගය ආවර්ජනා කරන ස්ථානයෙහි වූ හෙයින් **ප්‍රතිපදා ඥාන දස්සන විසුද්ධිය** නොවේ. එසේම **ඥාන දර්ශන විසුද්ධිය** ද නොවේ. **ක්‍රියා මනොධාතුව** විඤ්ඤාණ ධාතුන්ට විෂය **දක්වන්නාක්** මෙන් ගෝත්‍රභූ සිත මාර්ගයට ආවර්ජනා ස්ථානය ගන්නේ ය. එහෙත් වුට්ඨානගාමිනී විදර්ශනාවගේ අවසානය වූ විදර්ශනා

ශ්‍රොතයෙහි පතිත වූ හෙයින් විදර්ශනා සඞ්ඛ්‍යාවට යේ. **ගෝත්‍රභූ චිත්තයට** අනතුරුව **සෝවාන් මාර්ග චිත්තය** වේ.

**සෝවාන් මාර්ගය, සකෘදාගාමි මාර්ගය, අනාගාමි මාර්ගය, අර්හත් මාර්ගය** යන මේ සතර මාර්ගයෙහි ඥානය **ඥානදස්සන විශුද්ධිය** නම් වේ.

**සෝවාන් මාර්ග ඥානය** සම්පාදනය කරනු කැමැති යෝගාවචරයා විසින් අනුලෝම ඥානය උපදවා ගැනීමෙන් ම මාර්ගය පිණිස වැඩිය යුතු විදර්ශනාවන් අවසන් කොට වඩන ලද හෙයින් ඒ සඳහා කළමනා අන් කිසිවක් නැති බවට පැමිණේ.

හෙතෙම **පරිකර්ම, උපචාර අනුලෝම** යන ත්‍රිවිධ අනුලෝම ඥානයෙන් තමතමන්ගේ ශක්ති පමණින් මහත් මහත්, සත්‍යය වසා සිටි මොහාන්ධකාරය දුරු කළ කල්හි, සියලු සංස්කාර ගතයෙහි සිත නොදුවයි. එසේම සංස්කාර ධර්මයන්හි සිත නොසිටී, නො ඇලේ, නො රැඳේ, නො ලැගේ, නො බැඳේ. නෙළුම් පතෙහි වත් දිය බිඳක් මෙන් හැකිලේ, පැකිලේ, පෙරළේ. සියලු සංස්කාරාලම්බනයෝ ද, සියලු විපාක ප්‍රවෘත්ති ආලම්බනයෝ ද පළිබොධ වශයෙන් වැටහෙත්. සියලු නිමිත්තාරම්මණයන් හා පවත්තාරම්මණයන් ද පළිබොධ වශයෙන් වැටහුණු කල්හි, අනුලෝම ඥාණයාගේ ආසේවනය ලත් හෙයින් අනුලෝම චිත්තයට අනතුරුව සංස්කාර නිමිති නැති හෙයින් **අනිමිත්ත වූ,** සංස්කාර ප්‍රවෘත්ති නැති, සංස්කාරයෙන් වියුක්ත වූ, සංස්කාර විරෝධ වූ, නිරොධ වූ **නිර්වාණය** අරමුණු කරමින් පෘථග්ජන ගෝත්‍රය ද, පෘථග්ජන සඞ්ඛ්‍යාව ද, පෘථග්ජන භූමිය ද ඉක්මවන්නාවූ ආර්‍ය්‍ය ගෝත්‍රයට, ආර්‍ය්‍ය සඞ්ඛ්‍යාවට, ආර්‍ය්‍ය භූමියට පමුණුවන්නා වූ, නිර්වාණාලම්බනයෙහි පළමු ආවර්ජනය වූ, පළමු ආභොගය වූ, පළමු සමන්නාහාරය වූ මාර්ගයට **අනන්තර, සමනන්තර, ආසේවන, උපනිස්සය, නත්‍ථි, විගත** යන සයාකාර ප්‍රත්‍යය භාවය සිඩ කරමින්, විදර්ශනාවගේ මස්තකය වූ පෙරළා නො එන **ගෝත්‍රභූ චිත්තය** හෙවත් **ගෝත්‍රභූ ඥානය** එක් වරක් උපදී.

උත්පාදය, ප්‍රවෘත්තිය, දුක්ඛ ආයාසය, බාහිර සංස්කාර නිමිති මඩිනුයි **ගෝත්‍රභූ** නම්. එසේම අනුප්පාදවූ ද, සංස්කාර ප්‍රවෘත්තිය නැත්තාවූ ද, උපායාස නැත්තාවූ ද, සංස්කාර නිරෝධය වූ නිර්වාණයට වදිනුයි **ගෝත්‍රභූ** නම් වේ.

මෙසේ **පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ, මාර්ග, ඵල** චිත්තයෝ එකම ජවන වීථියෙහි උපදනා චිත්තයෝ ය.

මහ ඇළකින් පැන එතර පිහිටනු කැමැති එක්තරා පුරුෂයෙක් වහා දුවගෙනවිත් ඇළ මෙතෙර සිට වෘක්ෂ ශාඛායෙහි බැඳි එල්බෙන රැහැනක් හෝ යෂ්ටියක් හෝ ගෙන උඩින් පැන පරතීරයට නැමුණු බරවූ කය ඇතිව පරතීරයේ මතු භාගයට පැමිණ ඒ රැහැන හෝ යෂ්ටිය හෝ හැර වෙවුලමින් පරතෙර පතිතව සෙමෙන් පිහිටයි.

එ පරිද්දෙන් ම යෝගාවචර තෙමේ ද, භව, යෝනි, ගති, විඥානස්ථිති, සත්ත්වාවාසයන්ගේ පරතෙර වූ නිවණෙහි පිහිටනු කැමැත්තේ, උදය-ව්‍යයානු දර්ශනාදී වේගයෙන් දුව විත් ආත්මභාව නමැති වෘක්ෂ ශාඛායෙහි එල්වන ලද රූප නැමති රැහැන හෝ වෙදනාදීන් අතුරෙන් එක් වේදනාදී නැමැති දණ්ඩක් හෝ, අනිත්‍ය යයි හෝ දුක්ඛ යයි හෝ අනාත්ම යයි හෝ අනුලෝම ආවර්ජනයෙන් ගෙන ඒ නො හැරම ප්‍රථම අනුලෝම චිත්තයෙන් උඩ නැඟී, දෙවන අනුලෝම චිත්තයෙන් පරතීරයට නැමුණු, බරවූ සිත් ඇතිව, තුන්වන අනුලෝම චිත්තයෙන් පරතීරයේ මතු භාගයට පැමිණියාක් මෙන් දැන් පැමිණිය යුතු නිවණට ආසන්නව ඒ තුන් වන අනුලෝම චිත්ත නිරෝධයෙන් ඒ සංස්කාරාලම්බනය හැර ගෝත්‍රභූ සිතින් විසංඛාර වූ, පරතීරය වූ නිර්වාණයෙහි පතිත වේ. එක් වරක්ම ලද අරමුණෙහි ආසේවන නො ලද බැවින් වෙව්ලන ඒ පුරුෂයා මෙන් පළමු කොට මනාව පිහිටියේ නොවේ, ඉක්බිති මාර්ග ඥානයෙන් මනාව පිහිටන්නේ වේ.

**අනුලෝම** ඥානය සත්‍යය වසා සිටින කෙලශාන්ධ-කාරයන් දුරු කිරීමට සමත් වේ. නමුත් නිවණ අරමුණු

කිරීමට සමත් නොවේ. ගෝත්‍රභූ ඥාණය නිවණ අරමුණු කිරීමට සමත් වේ. නමුත් සත්‍යය මුවහ කරණ කෙලශාන්ධකාරය දුරු කරන්නට සමත් නොවේ.

ඇස් ඇති පුරුෂයෙක් චන්ද්‍රයා බලා නක්‍ෂත්‍ර යෝගයක් දැන ගැනීම පිණිස රාත්‍රි කාලයෙහි නික්ම ගොස් අහස බැලූ කල වලායෙන් වැසුණු හෙයින් සඳ නො දුටුයේ ය. ඒ වේලෙහි එක් වාතයක් නැග ඝන ඝන වලාපටලයන් පහ කෙළේ ය. නැවත ද වාතයක් නැගී මධ්‍යම වලාපටලයන් පහ කෙළේ ය. නැවත ද අනෙක් වාතයෙක් නැගී සියුම් වලාහකයන් ද පහ කෙළේ ය. ඉක්බිති ඒ පුරුෂයා පහවූ වලා ඇති අහසෙහි සඳ දැක නක්‍ෂත්‍රයෝගය දැන ගත්තේ ය.

එහි තුන් වලාහකයන් මෙන් සත්‍යය මුවහ කරන ඝනවූ ද, මධ්‍යමවූ ද, සියුම්වූ ද කෙලශාන්ධකාරය දත යුතු. තුන් වාතයන් මෙන් තුන් අනුලෝම සිත් දත යුතු. ඇස් ඇති පුරුෂයා මෙන් ගෝත්‍රභූ ඥාණය ද, සඳ මෙන් නිවණ ද, එකි එකී වාතයෙන් පිළිවෙලින් වලාහකයන් පහ කිරීම මෙන් එකි එකී අනුලොම චිත්තයාගේ සත්‍යය වසා සිටි කෙලශාන්ධකාරය දුරු කිරීම දත යුතු. වලා පහවූ අහසෙහි ඒ පුරුෂයාගේ පිරිසුදු සඳ දැකීම මෙන් සත්‍යය වසා සිටි මොහාන්ධකාරය නැසුණු කල ගෝත්‍රභූ ඥාණයාගේ නිර්‍වාණ දශීනය ද දත යුතු.

මේ ගෝත්‍රභූ චිත්තය ආවර්ජනා නුවූයේම ආවර්ජනා ස්ථානයෙහි සිට මෙසේ උපදුවයි මාර්ගයට සංඥා දෙන්නක්හු මෙන් නිරුඩ වේ. අනතුරුව උපදනා මාර්ගය ද ඒ ගෝත්‍රභූ චිත්තයා විසින් දුන් සංඥාව නො හැරම අතුරක් නැති ප්‍රබන්ධ වශයෙන් ඒ ගෝත්‍රභූ ඥානය ලුහු බඳිනු ලබන්නේ පෙර නොවිඳු විරු නොපැලූ විරු ලොභස්කන්ධය ද, වෙෂස්කන්ධය ද, මොහස්කන්ධය ද විදිමින් පළමින් උපදනේ වේ.

එක් දුනුවායෙක් අට ඉස්බක් පමණ දුර සිට පුවරු සියයක් තබවා වස්ත්‍රයෙකින් මුහුණ වසා බැඳ හියක්

සවිකොට චක්‍රයන්ත්‍රයෙහි සිටියේ ය. අනෙක් පුරුෂයෙක් චක්‍රයන්ත්‍රය කරකවා යම් වෙලාවක දුනුවායාට පුවරු සියය අභිමුඛ වේ නම් එකල ඒ චක්‍රයෙහි දණ්ඩෙකින් සලකුණු දෙයි. දුනුවායා දඬුවෙන් කළ සලකුණු නොහැර හීය විද පුවරු සියයම විද දමයි.

එහි දඬු සලකුණ මෙන් ගෝත්‍රභූ ඥානය ද, දුනුවායා මෙන් මාර්ග ඥානය ද, දුනුවායාගේ, දුනු දඬුවෙන් කළ සංඥව නොහැර, පුවරු සියය විදීම මෙන්, මාර්ග ඥානයට ගෝත්‍රභූ ඥානයෙන් දෙන ලද සංඥව නොහැර නිවන් අරමුණු කොට පෙර නොවිදි, පෙර නොපැලූ ලොභ, ද්වෙෂ, මොහස්කන්ධයන් පැලීම ද දත යුතු.

මෙසේ උපදනා මාර්ග සිත, ලොභ, ද්වෙෂ, මොහස්කන්ධයන් පමණක් නොව, අනවරාග්‍ර සංසාරවට්ට දුක්ඛ සමුදය වියළවයි. සියලු අපායද්වාරයන් වසා දමයි. සප්තාර්‍ය ධනයට අභිමුඛ කෙරෙයි. අෂ්ටාඞ්ගික වූ මිථ්‍යා මාර්ගය දුරු කරයි. සියලු කෙලෙස් සතුරු බිය සංසිඳුවයි. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ඖරස පුත්‍ර භාවයට පමුණුවයි. අනෙක් නොයෙක් සියගණන් ආනිසංසයන්ගේ ප්‍රතිලාභය පිණිස ද පවතී. මෙසේ අනෙකානිසංස දායක වූ සෝවාන් මාර්ගය හා සම්ප්‍රයුක්ත ඥානය **සොතාපත්තිමග්ග ඤාණ** නම් වේ. මේ **පළමු වන ආර්‍ය පුද්ගලයා** ය.

**සොවාන් මාර්ග සිතට** අනතුරුව එම මාර්ගඥනයාගේ විපාකය වූ සොවාන් ඵල සිත් දෙකක් හෝ තුනක් උපදිත්. මෙයට **අකාලික ඵලය** යයි ද **ආනන්තරික සමාධිය** යයි ද කියනු ලැබේ.

මාර්ග-ඵල චිත්තයන් උපදනා මනොද්වාරික චිත්තවීථියෙහි ජවන් සිත් සතක්ම විය යුතු. එය අර්පණා චිත්තවීථියක් බැවින් එහි සතරවැනිව හෝ පස්වැනිව අර්පණාව විය යුතු. ඉන් ඔබ්බෙහි භවාඞ්ගයට ආසන්න හෙයින් අර්පණා චිත්තය නූපදී. මේ නියමය අනුව **මන්දප්‍රාඥ පුද්ගලයාහට** පිළිවෙලින් මනොද්වාරාවජ්ජනයට අනතුරුව පළමු ජවනය වශයෙන්

**පරිකර්ම චිත්තය** ද, දෙවන ජවනය, **උපචාර චිත්ත** යද, තුන්වන ජවනය **අනුලෝම චිත්තය** ද, සතර වන ජවනය **ගෝත්‍රභූ චිත්තය** ද වේ. පස්වනුව උපදනා ජවනක්‍ෂණය අර්පණා ප්‍රාප්තවූ **මාර්ග චිත්තය** යි, ඉතිරිවූ සවන, සත්වන ජවනක්‍ෂණයෝ **ඵල සිත් දෙකින්** සම්පූර්ණ වෙති. **තීක්‍ෂණප්‍රඥ පුද්ගලයාට වනාහි පරිකර්මයක්** නූපදනා හෙයින් පළමු ජවනක්‍ෂණය **උපචාර** වශයෙන් ද, දෙවන ජවනක්‍ෂණය **අනුලෝම** වශයෙන් ද, තුන්වන ජවනක්‍ෂණය **ගෝත්‍රභූ** වශයෙන් ද, සතරවන ජවනක්‍ෂණය **මාර්ග චිත්තය** වශයෙන් ද, පස්වන, සවන, සත්වන ජවනක්‍ෂණයෝ ඵල සිත් තුනකින් ද යුක්ත වන බව දත යුතු. මාර්ග සිතට අනතුරුව ඵල සිත් දෙකක් හෝ තුනක් උපදින බව කියන ලද්දේ එ හෙයිනි.

මේ සෝවාන් ඵලසථ පුද්ගලයාහට **දෙවන ආයර්‍ය පුද්ගලයා** යයි කියනු ලැබේ.

සොවාන් ඵලසථ දෙවන ආයර්‍ය පුද්ගලයා දෙව් සැප, සක්විති සැප ආදිය ලැබීමෙන් ඉතා ප්‍රමාදවූයේවී නමුත් සත්වරක් දෙවියන් අතර ද, මනුෂ්‍යයන් අතර ද ඉපිද දුක් කෙළවර කිරීමට සමත් වේ.

සෝවාන් ඵල චිත්තයන් ඉපිද නිරුද්ධ වූ පසු ඒ ආයර්‍ය පුද්ගලයාගේ සිත භවාංගයට බසී. ඉක්බිති භවාංගය සිඳී තමා උපදවා ගත් **සෝවාන් මාර්ගය** ප්‍රත්‍යවෙක්‍ෂා කරනු පිණිස මනොද්වාරාවර්ජන චිත්තය ඉපිද නිරුද්ධවූ පසු පිළිවෙලින් මාර්ගය ප්‍රත්‍යවේක්‍ෂා කරන කාමාවචර ජවන් සිත් සතක් උපදී. එයින් "මම මේ මාර්ගයෙන් ඒකාන්තයෙන්ම නිර්වාණට පැමිණියෙමි" යි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරේ.

මාර්ග ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන්ට අනතුරුව නැවත භවාංගය වේ. ඉක්බිති "මා විසින් මේ අනුසස් ලබන ලදැ යි" **සොතාපත්ති ඵලය** ප්‍රත්‍යවෙක්‍ෂා කරමින් පෙරසේම ප්‍රත්‍යවෙක්‍ෂා ජවන් සතකින් යුත් චිත්ත වීථියක් උපදී. එයට අනතුරුව සිත භවාංගයට බසී.

මෙසේ ඵලය ප්‍රත්‍යවේක්‍ෂා කොට අනතුරුව "මාගේ මේ මේ කෙලෙස් පහවී" යයි **පහවූ කෙලෙස්** ප්‍රත්‍යවෙක්‍ෂා කරනු සඳහා නැවත පෙරසේ චිත්ත වීථියක් උපදී. එයට අනතුරුව භවාඞ්ගය වේ.

එයට ඉක්බිතිව "මාගේ මෙනම් කෙලෙස් ඉතිරිවී" යයි **ඉතිරි කෙලෙස්** ප්‍රත්‍යවෙක්‍ෂා කරනු සඳහා නැවත ද චිත්ත වීථියක් ඉපිද අනතුරුව භවාඞ්ගයට බසී.

අවසානව "මා විසින් මේ ධර්මය අරමුණු කරමින් ප්‍රතිවෙධ කරන ලද්දැ"යි අමෘත වූ **නිර්වාණය ප්‍රත්‍යවෙක්‍ෂා කරනු** සඳහා චිත්ත වීථියක් ඉපිද භවාඞ්ගයට බසී.

මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂණයන් පස් දෙනෙක්ම ඇති වන්නේ උත්කෘෂ්ට පරිච්ඡෙද වශයෙනි. සමහර ශෛක්‍ෂ පුද්ගලයන් හට **ප්‍රහීණ කෙලෙස්** හා **ඉතිරි කෙලෙස්** ප්‍රත්‍යවෙක්‍ෂණ-**යක්** නොවෙයි. මේ ක්‍රමයෙන් සෝවාන්, සකෘදගාමි ආයර්‍යපුද්ගලයන්හට උත්කෘෂ්ට වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂණයෝ පස් දෙන බැගින් ප්‍රත්‍යවෙක්‍ෂණ පසළොසක් වෙති. අර්හත් වූ ආර්‍ය පුද්ගලයාහට වනාහි ඉතිරි කෙලෙස් නැති හෙයින් ප්‍රත්‍යවෙක්‍ෂණයෝ සතර දෙනෙක් ම වෙති. එහෙයින් **එකුන්විසි ප්‍රත්‍යවෙක්‍ෂා කෙනෙක්** ඇති බව වදාරණ ලදී.

සසරින් එතර වනු කැමැති යෝගාවචර තෙමේ, මෙසේ සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් සම්මර්ශනය කොට සීල විසුද්ධි, චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කඞ්ඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි, සඞ්ඛ්‍යාත පඤ්ච විසුද්ධීන්ගේ වශයෙන් විසුද්ධි බවට පැමිණ, ප්‍රතිපදා ඤාණදස්සන විසුද්ධිය පිණිස උදයව්‍යයාදි නවමහා විදර්ශනා ඥාන උපදවා ගෙන පරිකර්ම, උපචාර, අනුලෝම ගෝත්‍රභූ පිළිවෙළින් ගොස් මාර්ගයන් ඵලයන් උපදවා ගෙන ආර්‍ය භාවයට පැමිණෙන්නේ ය.

**මේ පිළිවෙළෙහි දක්වන ලද වුට්ඨානගාමිනී විදර්ශනා යෙහි, භයතූපට්ඨාන ඤාණයෙහි පටන් ඵල ඤාණය දක්වා සියලු ඤාණ කෘත්‍යයන් ප්‍රකට කිරීම පිණිස උපමා දක්වනු ලැබේ.**

එක් වවුලියක් ශාඛා පසක් ඇති මී රුකෙක වසා, "මෙහි මලක් හෝ ඵලයක් හෝ ලබමි"යි සිතා එහි එක් ශාඛාවක් පරමර්ශනය කොට එහි ගත යුතු කිසි මලක් හෝ ඵලයක් හෝ නො දැක, පිළිවෙළින් දෙවන, තුන්වන, සතරවන, පස්වන ශාඛාවන් ද පරාමර්ශනය කොට, ඉන් එකෙකවත් මලක් හෝ ඵලයක් නො දැක, ඒකාන්තයෙන් මේ රුක ඵලනැත්තෙකැයි එහි ගතමනා කිසිවක් නැතැයි නිගමනය කොට එහි ආලය හැර ඍජුවූ ශාඛාවට නැග හිස ඔසවා උඩ බලා අහසෙහි පියාඹා අනික් ඵල ඇති රුකෙක වැසුවා ය.

මේ උපමාවෙහි යෝගී තෙම වවුලිය මෙන් ද, පඤ්ච උපාදානස්කන්ධය ශාඛා පසක් ඇති මී රුක මෙන් ද, වවුලිය මී රුකෙහි වැසීමමෙන් යෝගීහුගේ පඤ්චස්කන්ධයෙහි අභිනිවෙශය ද, ඇයගේ එක එක ශාඛාව පරාමර්ශනය මෙන් යෝගියාගේ රූපස්කන්ධය සම්මර්ශනය කොට ගතමනා කිසිවක් නො දැක සෙසු ස්කන්ධයන් සම්මර්ශනය කිරීම ද, ඇය ඒ රුක නිෂ්ඵල යයි රුකෙහි ආලය හැරීම මෙන් පඤ්චස්කන්ධයෙහි අනිත්‍යාදී ලක්ෂණ දැකීම් වශයෙන් කලකිරුණු යෝගීහුගේ මුඤ්චිතුකාමතා, පටිසඞ්ඛානු පස්සනා, සඞ්ඛාරුපෙක්ඛා යන ත්‍රිවිධ ඤාණ ද, ඇය ඍජු ශාඛාවෙන් මත්තෙහි නැගීම මෙන් යෝගීහුගේ අනුලොම ඤාණය ද, හිස නගා උඩ බැලීම මෙන් ගෝත්‍රභූ ඤාණය ද, ආකාශයෙහි ඉහළ නැගීම මෙන් මාර්ගඤාණය ද, අන් ඵලරුකෙක වැසීම මෙන් ඵලඤාණය ද දත යුතු.

යට පටිසඞ්ඛානු පස්සනාඤාණයෙහිදී දක්වන ලද සර්පයාගේ උපමායෙහි ද, සර්පයා හැරීම මෙන් ගෝත්‍රභූ ඤාණය ද, සර්පයා මුදා හැර ආ මග බලන්නාක් මෙන් මාර්ග ඤාණය ද, එයින් මිදී අභයස්ථානයෙහි සිටීම මෙන් ඵල ඤාණය ද දත යුතු.

තවද, ගෘහිමියෙක් රාත්‍රි ආහාර නිමවා යහනට නැගී නිදිගත් කල ගෙය ගිනිගත් හෙයින් ඔහු පිබිදී ගිනි දැක

බියවී මේ ගින්නෙන් නොදැවී නික්ම යේ නම් මැනැවැයි සිතා වටපිට බලන්නේ මගක් දැක එයින් නික්ම වේගයෙන් නිර්භය ස්ථානයකට ගොස් සිටියේ ය.

මේ උපමායෙහි ගෙහිමියා අහර ගෙන යහනට නැගී නිදීම සේ බාල පෘථග්ජනයා පඤ්චස්කන්ධයෙහි "මම ය, මාගේ" යයි මමායනය ද, පිබිද ගිනි දැක බියපත් කල මෙන් සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිළිපැද තිලකුණු දැක ඇති වූ **භයතුපට්ඨාන ඤාණය** ද, නික්මෙන මග සෙවීම මෙන් **මුඤ්චිතුකම්‍යතා ඤාණය** ද, මග දැකීම මෙන් **අනුලෝම ඤාණය** ද, නික්මයාම මෙන් **ගෝත්‍රභූ ඤාණය** ද, වේගයෙන් යාම මෙන් **මාර්ග ඤාණය** ද. අභයස්ථානයෙහි සිටීම මෙන් **ඵල ඤාණය** ද දත යුතු.

තවද, එක් ගොවියකු රෑ නිදාගත් කල ගාල බිඳගෙන ගවයෝ පලාගියහ. ඔහු අලුයම එහි ගොස් බැලූ කල ඔවුන් පැනගිය බව දැන පියවර අනුව ගොස් රජුගේ ගොනුන් දැක "මේ මාගේ ගෙරීහු" යයි සිතා ගවයන් ගෙන යන්නාවූ හෙතෙම අළුයම්හි මේ මාගේ ගෙරිහු නොවෙති, රජහුගේ ගෙරිහු යයි හැඳින මේ සොරෙකැයි මා රාජ පුරුෂයන් දැක අල්ලා පෙළන්නට පෙර පලායෙමැයි බියව ගවයන් හැර වේගයෙන් පලාගොස් බිය නැති තැනෙක සිටියේ ය.

මේ උපමායෙහි මාගේ ගෙරිහු යයි රජුහුගේ ගොනුන් ගැනීම මෙන් බාල පෘථග්ජනයන්ගේ **"මම ය, මාගේ"** යයි ගැනීම ද, අලුයම්හි රජුගේ ගෙරිහු යයි හැඳිනීම මෙන් යෝගී හුගේ තිලකුණු වශයෙන් **අනිත්‍යය, දුක්ඛය, අනාත්ම** යයි ස්කන්ධයන් හැඳිනීම ද, බිය වූ කාලය මෙන් **භයතුපට්ඨාන ඤාණය** ද ගොනුන් හැර පලායනු කැමැත්ත මෙන් **මුඤ්චිතු කම්‍යතා ඤාණය** ද, ගොනුන් අත්හැරීම මෙන් **ගෝත්‍රභූ ඤාණය** ද, පලායාම මෙන් **මාර්ග ඤාණය** ද, පලා ගොස් අභයස්ථානයෙහි සිටීම මෙන් **ඵල ඤාණය** ද දත යුතු.

තවද, එක් පුරුෂයෙක් යකින්නක් හා සමග සහවාසය කෙළේ ය. ඕතොමෝ රාත්‍රි කාලයෙහි "මෙතෙම

නිදිවත්තේ'' යයි සිතා අමුසොහොනට ගොස් මිනීමස් කයි. හෙතෙම ඈ නොදැක, ඈ කොහි දැයි ලුහුබැඳ මිනී මස් කනු බව දැක, ඇය මිනිස් නොවන බව දැන, මාද කන්නට පෙර පැන යම් යි භය වී වේගයෙන් පලාගොස් අභය ස්ථානයක සිටියේ ය.

ඒ උපමාවෙහි මිනිසාගේ, යකින්න හා සහවාසය මෙන් ස්කන්ධයන් ''මම ය, මාගේ'' යයි ගැනීම ද, සොහොනෙහි මිනීමස් කනු දැක ''මෝ යකින්නකැ''යි ගැනීම මෙන් ස්කන්ධයන්ගේ තිලකුණු දැක අනිත්‍යාදි ලක්‍ෂණ දැකීම ද, බියපත් වූ කල මෙන් **භයතුපට්ඨානඥාණය** ද, පලායනු කැමැත්ත මෙන් **මුඤ්චිතු කාම්‍යතා ඥාණය** ද, සොහොන හැරීම මෙන් **ගෝත්‍රභූ ඥාණය** ද, වේගයෙන් පලායාම මෙන් **මාර්ග ඥානය** ද, අභය ස්ථානයෙහි සිටීම මෙන් **ඵල ඥාණය** ද දත යුතු.

තවද, දරු සෙනහය ඇති එක් ස්ත්‍රියක් පහයෙක මතු මහලෙහි සිටියේ ඇතුළු වීථියෙහි දරුහඬක් අසා ''මා පුතු කිසිවෙක් පෙලාදැ''යි වේගයෙන් ගොස් තමාගේ පුත්‍රයා යයි හැඟීමෙන් අන් පුතකු ගත්තා ය. ඕ තොමෝ මේ පර පුතෙකැයි හැඳින හෙයින් ඔබමොබ බලන්නී මෝ දරු සොරෙකැයි කිසිවකු කියන්නට පෙර දරුවා එහි බස්වා පෙරලා වේගයෙන් පහයට නැඟී හුන්නේ ය.

මේ උපමායෙහි තමාගේ පුත්‍රයා යයි සඤ්ඤායෙන් පර පුතු ගැනීම මෙන් මම ය, මාගේ යයි පඤ්චස්කන්ධය ගැනීම ද, මේ පර පුතු යයි හැඳිනීම මෙන් තිලකුණු වශයෙන් මම නොවෙමි, මාගේ නොවේ යයි හැඳිනීම ද, බියවීම මෙන් **භයතුපට්ඨාන ඥාණය** ද, පැනයාමට ඔබ මොබ බැලීම මෙන් **මුඤ්චිතු කාම්‍යතා ඥාණය** ද, එහි ම දරුවා බැස්වීම මෙන් **අනුලෝම ඥාණය** ද, බස්වා ඇතුළු වීථියෙහි සිටි කාලය මෙන් **ගෝත්‍රභූ ඥානය** ද, පහයට නැගීම මෙන් **මාර්ග ඥානය** ද, නැග හිඳීම මෙන් **ඵල ඥාණය** ද දත යුතු.

තවද, බඩගින්නෙන් මඩනා ලද, සාගිනි ඇති පුරුෂයෙකු මිහිරි වූ රස බොජුනක් කැමැති වන්නා සේ මේ යෝගාවචර තෙම සංසාර වෘත්තිය නමැති බඩසයින් පෙළුණේ අමාරස වූ **කායගතා සති** නම් වූ බොජුන ප්‍රාර්ථනා කරයි.

පිපාසිත පුරුෂයෙකු වියළි හෙල මුව ඇතිව නොයෙක් ද්‍රව්‍යයෙන් යුත් පානයක් පතන්නා සේ මේ යෝගී තෙම සංසාර වෘත්ත සඞ්ඛ්‍යාත පිපාසයෙන් පෙළුණේ **ආර්ය අෂ්ටාඞ්ගික මාර්ග** නමැති පානය පතන්නේය.

සීතලින් පෙළුණු පුරුෂයකු උණුසුම පතන්නා සේ සංසාර වෘත්තයෙහි තෘෂ්ණා, සෙනහ ශීතයෙන් පෙළුණේ කෙලෙස් තවන **මාර්ග සඞ්ඛ්‍යාත** වූ උෂ්ණය පතයි.

උෂ්ණයෙන් පහරන ලද පුරුෂයකු සිහිල පතන්නා සේ සංසාර වෘත්තියෙහි රාගාදී එකොළොස් ගින්නෙන් තැවුණු යෝගී තෙම එකොළොස් ගිනි සංසිඳුවන නිවන පතයි.

අන්ධකාරයෙන් මඩනා ලද පුරුෂයකු එළියක් පතන්නා සේ අවිද්‍යාන්ධකාරයෙන් වෙළා වට කරන ලද යෝගී තෙම ඥානාලෝකය ගෙන දෙන මාර්ග භාවනාව පතයි.

විෂ කැවුණු පුරුෂයකු විෂ නසන බෙහෙතක් පතන්නා සේ කෙලෙශයෙන් වළඳනා ලද මේ යෝගී තෙම කෙලෙස් විෂ මඩනා අමෘතය ඖෂධයක් වූ **නිවන** පතයි.

**සෝවාන් ඵලයට පැමිණි දෙවන ආර්ය පුද්ගල තෙම,** යට කියන ලද පරිද්දෙන් මාර්ගය ද, ඵලය ද, ප්‍රහීණ කෙලෙස් ද, අවශෙෂ කෙලෙස් හා නිවණ ද ප්‍රත්‍යවෙක්ෂා කොට එම ආසනයෙහිම හිඳ හෝ අන් කලෙක හෝ කාමරාග, ව්‍යාපාද තුනී කිරීමෙන් දෙවන ශ්‍රාමණ්‍ය ඵලය වූ **සකෘදාගාමි** මාර්ග ඵල ප්‍රතිලාභය පිණිස යෝග කෙරේ. හෙතෙම **ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියන්** ද, **ශ්‍රද්ධාදී පඤ්ච බලයන්** ද, **සති ආදී සප්තබොධ්‍යඞ්ගයන්** ද, රැස් කොට රූප, වෙදනා, සංඥා, සඞ්ඛාර, **විඥාන** යන භේද ඇති සංස්කාර අමූහය **අනිත්‍යය, දුක්ඛය, අනාත්මය** යයි නුවණින් සම්මර්ශනය

කොට, උදය-ව්‍යයානු දර්ශනයෙහි පටන් විදර්ශනා වීථියට බසී. මෙසේ පිළිපන් ඒ පුද්ගලයා හට පෙර උදයව්‍යය ඤාණාදිය උපන්නාසේ යටකී නයින්ම සංස්කාරොපෙක්ෂාවගේ අවසාන යෙහි අනුලොම වොදාන ඤාණයන් උපන් කල වොදාන ඤාණයට අනතුරු ව සකෘදාගාමි මාර්ගය උපදී. ඒ සකෘදාගාමි මාර්ග සම්ප්‍රයුක්ත ඥානය **සකෘදාගාමි මාර්ග ඥාන** නම් වේ. මෙ තෙමේ **තුන්වන ආර්ය පුද්ගලයා** නම් වේ.

සකෘදාගාමි මාර්ගයට අනතුරුව යට කීසේ සකෘදාගාමි ඵල සිත් තුනක් හෝ දෙයක් උපදී. සකෘදාගාමි ඵලයට පැමිණි මේ පුද්ගලයා **සතරවනආර්යපුද්ගලයා** නම් වේ. හෙතෙමේ එක් වරක් මේ ලෝකයට පැමිණ දුක් කෙළවර කිරීමට සමර්ථවූයේ වේ.

ඇතැම් සකෘදාගාමි ඵලසථ ආර්යයෝ මෙහිදීම රහත්ව පිරිනිවන් පාන්නාහ.

ඇතැම් කෙනෙක් මෙහිදී සකෘදාගාමීව, දෙව්ලොවදී පිරිනිවන් පාත්තේ ය.

ඇතැම් කෙනෙක් දෙව් ලොවදී සකෘදාගාමීව දෙව් ලොවදීම පිරිනිවන් පාත්තේ ය.

ඇතැම් කෙනෙක් දෙව් ලොවදී සකෘදාගාමිව මෙලොවට පැමිණ පිරිනිවන් පාත්තේ ය.

තවත් කෙනෙක් මෙහිදී සකෘදාගාමීව දෙව් ලොව ඉපිද ආයු ඇතිතාක් එහි වැස නැවත මිනිස් ලොවට විත් පිරිනිවන් පාත්තේ ය.

සකෘදාගාමි ඵල සිතට අනතුරුව, මාර්ගය, ඵලය, නැසුණු කෙලෙස් ය. අවශෙෂ කෙලෙස් ය, නිර්වාණය යන මේ ප්‍රත්‍යවෙක්ෂා කරන චිත්ත වීථි උපදී.

**ඒ සකෘදාගාමි ඵලසථ ආර්ය පුද්ගල තෙම** එම ආසනයෙහි ම හිඳ හෝ එයට පසුව හෝ කාමරාග, ව්‍යාපාදයන් නිරවශෙෂප්‍රහාණයෙන් තුන්වන ආර්ය භූමිය වූ **අනාගාමි මාර්ගයට** පැමිණීම පිණිස විදර්ශනා කරන්නේය.

හෙතෙම **ඉන්ද්‍රිය, බල, බොධ්‍යඞ්ග ධර්මයන් එකග්ගතාවයෙන් එක් රැස්** කොට, සියලු සංස්කාරයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි විදර්ශනා ඥානයෙන් සම්මර්ශනය කොට විදර්ශනා වීථියට බසී. මෙසේ පිළිපන් ඒ යෝගීනට පෙර කී සේ ම **සඞ්ඛාරුපෙක්ඛා ඤාණයාගේ** අවශානයෙහි **අනුලෝම වෝදන** සිත් උපන් කල්හි **අනාගාමි මාර්ගය** උපදී. මේ මාර්ගය හා සම්ප්‍රයුක්ත ඥානය **අනාගාමි මග්ග ඤාණ** නම් වේ. මෙනම් **පස්වන ආර්යපුද්ගලයා** ය.

අනාගාමි මගීඤාණයට අනතුරුව යට කී පරිදි **අනාගාමි ඵල සිත්** දෙකක් හෝ තුනක් **උපදී. අනාගාමි ඵලසථ පුද්ගල තෙම සවනා ආර්ය පුද්ගලයා** නම් වේ.

**අනාගාමි ආර්ය පුද්ගල** තෙමේ මරණින් මතු බඹලොව වැස එහි ම රහත්ව පිරිනිවන්පාන්නේය. නැවත කාම භවයට නොඑන හෙයින් **අනාගාමි** යයි කියනු ලැබේ. එයට අනතුරුව පෙර කී සේ ප්‍රත්‍යවෙක්ෂා චිත්ත වීථි උපදී.

ඒ අනාගාමි ආර්ය ශ්‍රාවක තෙමේ එම ආසනයෙහි හිඳ හෝ පසුකලෙක හෝ **රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා** යන පඤ්ච උද්ධම්භාගීය සංයෝජනයන්ගේ නිරවශෙෂ ප්‍රහාණයෙන් සතර වන අර්හත් භූමියට පැමිණීම පිණිස නැවත විදර්ශනා වඩන්නේ ය. හෙතෙම **ඉන්ද්‍රිය, බල, බොධ්‍යඞ්ගයන්** එකග්ගතායෙන් එක්රැස් කොට සංස්කාරයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි විදර්ශනා ඥානයෙන් සම්මර්ශනය කෙරේ. මෙසේ පිළිපන් ඒ යෝගීහට යට කී සේ **සඞ්ඛාරොපෙක්ෂා ඥානයාගේ** අවසානයෙහි **අනුලොම, වොදන** ඤාණයන් උපන් කල වොදන සිතට අනතුරුව **අර්හත් මාර්ගය** උපදී. ඒ මාර්ගය හා සම්ප්‍රයුක්ත ඥානය **අර්හත්තමග්ග ඤාණ** නම් වේ. මේ **සත්වන ආර්ය පුද්ගලයා** ය.

**අර්හත් මාර්ග ඤාණයට** අනතුරුව පෙර කී සේ ඵල සිත් දෙකක් හෝ තුනක් උපදී. මෙතෙකින් හෙතෙමේ

**අටවන ආර්‍ය්‍ය පුද්ගලයා** නම් වේ. මෙසින් මේ ආර්‍ය්‍ය පුද්ගල තෙම **මහා ක්‍ෂීණාසව** වූ අන්තිම දේහය දරණ, බහා තබන ලද ස්කන්‍ධාදී බර ඇති, **සවකීය** අර්‍ථයට පැමිණි, **ක්‍ෂය** කළ භව සංයෝජන ඇති, ස්කන්‍ධාදීන්ගේ ස්කන්‍ධාදී අර්‍ථයන් **මොනවට** දැන විමුක්ත වූ, **දෙවියන්** සහිත ලෝකයාගේ අග්‍රදක්‍ෂිණාවට සුදුසු වූ මහරහත් බවට පැමිණි **අටවන ආර්‍ය්‍ය පුද්ගලයා** වන්නේය.

මෙසේ **සෝතාපත්ති මග්ගය, සකෘදාගාමි මග්ගය, අනාගාමි මග්ගය, අරහත්ත මග්ගය** යන මේ චතුර්විධ මාර්ගයෙහි **ඤාණය, ඤාණදස්සන විසුද්ධි** නම් වේ.

## ඤාණදස්සන විසුද්ධියේ ආනුභාවය

**1. පරිපූර්ණ බොධිපාක්‍ෂික භාවය,**

**සතර සතිපට්ඨානයෝ ය,**

**සතර සම්‍යක් ප්‍රධානයෝ ය,**

**සතර ඉද්ධිපාදයෝ ය,**

**පඤ්ච ඉන්ද්‍රිය ය,**

**පඤ්ච බලය ය,**

**සප්ත බොධ්‍යාඞ්ගය ය,**

**අෂ්ට ආර්‍ය්‍ය මාර්ගාඞ්ගය ය.**

යන මේ සත්තිස් (37) ධර්මයෝ නිර්‍වාණාවබොධය කරවන හෙයින්, **බොධි** නම් වූ ආර්‍ය්‍ය මාර්ගයාගේ **පක්‍ෂයෙහි** වූ හෙයින් උපකාරක භාවයෙහි සිටි හෙයින් **බොධිපාක්‍ෂික** නම් වේ.

### සතර සතිපට්ඨාන

කායාදී ඒ ඒ ආරම්මණයන්හි අනුව පිවිස, අනුව ගොස්, එළඹ සිටින හෙයින් **පට්ඨාන** නමි. **සතියම** පට්ඨානවූයේ **සතිපට්ඨාන** නමි.

මේ **සතිපට්ඨානය, කාය, වේදනා, චිත්ත, ධම්ම** යන මේ සතර ධර්මයන්හි පිළිවෙලින් **අශුභය, දුඃඛය, අනිත්‍යය, අනාත්මය** ය යන මේ ආකාරයන් ගැනීම් වශයෙන් ද, **ශුභය, සුඛය, නිත්‍යය, ආත්මය** ය යන මේ සංඥාවන්ගේ ප්‍රහාණ කෘත්‍යය සිඩ කිරීම් වශයෙන් ද පවත්නා හෙයින් **සතර සතිපට්ඨානයෝ** නම් වෙත්. මෙහි කායාදී සතරෙහි අශුභාදී ආකාර වශයෙන් ගැනීම **පූර්වභාග සතිපට්ඨාන** වශයෙන් ද, ඒ සතරෙහි වූ ශුභාදී සතර සංඥාවන්ගේ ප්‍රහාණ කෘත්‍ය සාධනය **මාර්ග සතිපට්ඨාන** වශයෙන් ද දත යුතු.

**සතර සම්‍යක් ප්‍රධානයෝ** – චිත්ත චෛතසික ධර්මයන් මනාව වීර්‍ය්‍ය කරවන හෙයින් ද, කෙලෙශයන්ගෙන් වන විරූපභාවය පහ කොට සොභන වූයේම හිතසුව නිපදවීම් වශයෙන් උත්තම භාවය එළවන බැවින් ද **සම්‍යක් ප්‍රධාන** නම් වේ.

මේ **සම්‍යක්ප්‍රධාන** නම් වූ **වීර්‍ය්‍යය,** උපන් අකුසලයන්ගේ **ප්‍රහාණ කෘත්‍යය ද,** නූපන් අකුසලයන්ගේ **අනුත්පාද කෘත්‍යය ද,** නූපන් කුසලයන්ගේ **උත්පාද කෘත්‍යය ද,** උපන් කුසලයන්ගේ **ස්ථිති කෘත්‍යය ද** සිඩ කරන හෙයින් සතරවැදෑරුම් වේ.

**සතර ඍද්ධිපාදයෝ** – **ඡන්ද, චිත්ත, විරිය, වීමංස** යන ධර්මයෝ තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට පූර්වාඞ්ගමාර්ථයෙන් හෝ ඵල වූ ඒ ඍද්ධියට පූර්වභාග කරන අර්ථයෙන් හෝ ඍද්ධිහුගේ පාදවේ නුයි **ඍද්ධිපාද** නම් වේ. **ඡන්ද ඉද්ධිපාද, චිත්ත ඍද්ධිපාද, විරිය ඍද්ධිපාද, වීමංසා ඉද්ධිපාද** යන සතර ධර්මයෝ ලොකොත්තරම වෙති. ඡන්දාදී සතර අධිපතීන්ගේ වශයෙන් සමාධිය චිත්තයාගේ එකග්‍රතාවය ලබා නම් එය ඡන්ද සමාධි ආදී සමාධීහු වෙති. ඒ හා සම්ප්‍රයුක්ත ඵස්සාදී ධර්මයෝ ද **ලෞකික ඍද්ධිපාද** වෙති.

**පඤ්ච ඉන්ද්‍රියයෝ** – **ශ්‍රද්ධා, විරිය, සති, සමාධි ප්‍රඥා** යන පඤ්ච ධර්මයෝ ප්‍රතිපක්‍ෂ ධර්මයන් මැඩ පියන හෙයින් ඒ මැඩීම් අර්ථයෙන් **ඉන්ද්‍රිය** නම් වෙති.

**ශ්‍රද්ධාව** – එයට ප්‍රතිපක්ෂ වූ අකුසල ධර්මයවූ ද, අවස්තුක ප්‍රසාද ප්‍රතිරූපක වූ මිථ්‍යාදෘෂ්ටිය යන අශ්‍රද්ධාව නසයි.

**විරිය** – ථින මිද්ධ සම්ප්‍රයුක්ත කුසිත බව මැඩලයි.

**සතිය** – ස්මෘති විප්‍රවාසය වූ ප්‍රමාදය දුරු කරයි.

**සමාධිය** – නන් අරමුණෙහි සිත විසුරු වන වික්ෂෙපය නසයි

**ප්‍රඥාව** – අරමුණෙහි මූළා බව නම් වූ සම්මොහය නසයි.

**පඤ්චබල ධර්ම** – අශ්‍රද්ධාදී ප්‍රතිපක්ෂ ධර්මයන් විසින් මැඩපිය නොහෙන අර්ථයෙන් **ශ්‍රද්ධා, විරිය, සති, සමාධි,** ප්‍රඥා යන ධර්ම පස **බල ධර්මයෝ යි.**

**සප්ත බොධ්‍යාඞ්ග** – චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබොධ කරන සත්ත්වයාහට අඞ්ගභාවයෙන් **සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි උපෙක්ඛා** යන සප්ත ධර්මයෝ **බොජ්ඣඞ්ග** නම් වෙත්.

යම් පුද්ගලයෙකු ලොකොත්තර මාර්ගක්ෂණයෙහි උපදනා මේ සති ආදී ධර්ම සමූදය කරණකොට කෙලශ සන්තාන නිද්‍රාවෙන් නැගෙන හෙයින් ද, චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රතිවේධ කරන හෙයින් ද, නිර්වාණය හෝ අවබොධ කරන හෙයින් ද, මාර්ගඥනයට **බොධි** යයි කියනු ලැබේ. ඒ **බොධියට** අඞ්ග වන හෙයින් සති ආදිය **බොජ්ඣඞ්ග** නම් වෙත්.

**අෂ්ට ආර්‍ය්‍ය මාර්ගාඞ්ග** – සසරින් නික්මවන, ගෙන යන අර්ථයෙන් සම්මාදිට්ඨි ආදී ධර්ම අටදෙන **මාර්ගාඞ්ග** නම් වෙත්.

මේ සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ මාර්ගයට පූර්වභාගයෙහි නානා චිත්තක්ෂණයන්හි පවතිත්. ලෞකික විදර්ශනාව පවත්නා කල්හි **ආනාපානසති, ඊර්යාපථ, චතු-සම්පජඤ්ඤ, පටිකකූලමනසිකාර පර්ව** හා **නවසිවථික පර්ව** වශයෙන් තුදුස් පරිද්දෙකින් පරිග්‍රහ කරන්නහුට **කායානුපස්සනා සතිපට්ඨානය** ද,

නවප්‍රකාරයකින් **වේදනා** පරිග්‍රහ කරන්නහුට **වේදනානුපස්සනා සතිපට්ඨානය ද,**

සොළොස් ආකාරයෙන් **සරාග, සදෝස, සමෝහ, සංඛිත්ත, මහග්ගත, සමාහිත, සඋත්තර, විමුත්ත** යන සප්‍රතිපක්ෂ පදයන්ගේ සොළොස් ආකාරයෙන් සිත පරිග්‍රහ කරන්නාහුට **චිත්තානුපස්සනා සතිපට්ඨානය ද,**

**නීවරණ, උපාදානස්කන්ධ, ආයතන, බොජ්ඣඞ්ග, සච්ච** යන පස්වැදෑරුම් පසි වශයෙන් ධර්මයන් පරිග්‍රහ කරන්නහුට **ධම්මානුපස්සනා සතිපට්ඨානය ද** ලැබේ.

මේ ආත්මභාවයෙහි තමා සතන්හි නූපන්, පරහට උපන් අකුසලය දැක, යම් යම් පරිද්දෙකින් පිළිපන් ඔහුට මේ වධබන්ධනාදිය උපන්නේ නම් මම එසේ නොපිළිපදිමි යි, මෙසේ ඇති කල්හි ඒ අකුසලය මට නූපදිනුයි ඒ අකුසල් නූපදීමට වෑයම් කරන කල්හි **පළමුවන සම්‍යක් පධානය ද,**

තමා සතන්හි උපන් අකුසලයක් දැක ඒ අකුසල ප්‍රහාණය පිණිස වෑයම් කරන්නහුට **දෙවන සම්‍යක් ප්‍රධානය ද,**

මේ අත්බැව්හි නූපන් විරූ ධ්‍යාන විදර්ශනාදියක් ඉපද-වීමට වෑයම් කරන්නහුට **තුන්වන සම්‍යක් ප්‍රධානය ද,**

තමා සතන්හි උපන් ධ්‍යානාදියක් නො පිරිහෙනසේ නැවත නැවත උපදවන්නහුට **සතර වන සම්‍යක් ප්‍රධානය ද වේ.**

**ඡන්දය** ප්‍රධාන කොට කුසලය උපදවන කල **ඡන්දිද්ධිපාදය** වේ. **චිත්තය** ප්‍රධාන කොට කුසලය උපදවන කල **චිත්තිද්ධිපාදය** වේ. **වීරිය** ප්‍රධාන කොට කුසලය උපදවන කල **වීරියිද්ධිපාදය** වේ. **ප්‍රඥාව** ප්‍රධාන කොට කුසලය උපදවන කල **වීමංසා ඍද්ධිපාදය** වේ.

මෙසේ අතිකුදු බෝධිපාක්ෂික ධර්මයෝ ඒ ඒ අවස්ථාවන්හි ලැබෙන බව සැලකිය යුතු.

**සතර මාර්ග චිත්තයන්ගේ උත්පත්ති කාලයෙහි මේ බෝධිපාක්ෂික ධර්මයෝ එක සිතෙහි ම ලැබෙති.**

මේ සියලු බොධිපාක්ෂික ධර්ම, වස්තු ධර්ම වශයෙන් තුදුසෙක් වේ. එනම්:—

| | |
|---|---|
| **1. සති** | **8. පීති** |
| **2. විරිය** | **9. පස්සද්ධි** |
| **3. ඡන්ද** | **10. උපෙක්ඛා** |
| **4. චිත්ත** | **11. විතක්ක** |
| **5. පඤ්ඤා** | **12. සම්මාවාචා** |
| **6. සද්ධා** | **13. සම්මාකම්මන්ත** |
| **7. සමාධි** | **14. සම්මාආජීව.** |

මෙහිත්—

**ඡන්ද, චිත්ත** යන දෙදෙන **ඉද්ධිපාද** වශයෙන් ද,

**පීති, පස්සද්ධි, උපෙක්ඛා** යන තිදෙන **බොජ්ඣඞ්ග** වශයෙන් ද,

**සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා-ආජීව** යන සතරදෙන **මාර්ගාඞ්ග** වශයෙන් දැයි නව ධර්මකෙනෙක් එක් එක් වැදෑරුම් වේ.

**ශ්‍රද්ධාව – ඉන්ද්‍රිය, බල** වශයෙන් දෙවැදෑරුම් වේ.

**සමාධිය – සමාධින්ද්‍රිය, සමාධිබල, සමාධිසම්බො-ජ්ඣඞ්ග, සම්මා සමාධි** වශයෙන් සිව්වැදෑරුම් වේ.

**ප්‍රඥාව – ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග,** (ධම්මවිචය) **සම්මාදිට්ඨි,** (මාර්ගාඞ්ග) **වීමංසිද්ධිපාද** වශයෙන් පස් වැදෑරුම් වේ.

**සතිය** – සතර සතිපට්ඨාන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග, ඉද්ධිපාද වශයෙන් ද නව වැදෑරුම් වේ.

**ප්‍රථමධ්‍යානික මාර්ගයෙහි** මේ වස්තු ධර්ම තුදුසම ලැබෙති.

**ද්විතීයධ්‍යානික මාර්ගයෙහි** සඞ්කප්පය හැර තෙලෙසකි.

**චතුර්ථ පඤ්චක ධ්‍යානික මාර්ගයන්හි** ප්‍රීතිය ද නැති හෙයින් වස්තු දෙළොසෙකි.

**2. වුට්ඨානයෙන් ද, බලයෙන් ද යුක්ත බව, වුට්ඨාන බල සමායෝගය** වේ.

**වුට්ඨානය** නම් **නිමිත්තයෙන්** හා **ප්‍රවෘත්තයෙන්** නැගීම ය.

**බලසමායොගය** නම් **සමථ විදර්ශනා බලයෙන්** සම්ප්‍රයුක්ත බව ය.

**වුට්ඨානය** හා **බලසමායෝගය** – **වුට්ඨාන බලසමායෝග** නම්.

ලෞකික විදර්ශනාව සංස්කාර නිමිත්ත අරමුණු කොට ඇති හෙයින් නිමිත්තෙන් නොනැගිට්ටියි. සංස්කාර නිමිත්ත හැර **නිවන්** අරමුණු කිරීමෙදී නිමිත්තයෙන් නැගීම වේ.

ප්‍රවෘත්ති කාරණා වූ සමුදය සමුච්ඡේද නොකරන හෙයින් නොසිඳින හෙයින් විපාක ප්‍රවෘත්තියෙන් නොනැගේ. හේතු නිරොධයෙන් ආයති විපාක ප්‍රවෘත්තිය මතු නූපදනා ස්වභාවයට පැමිණවීම ප්‍රවෘත්තයෙන් හෙවත් පැවැතීමෙන් නැගීම නම් වේ.

**ලෞකික අෂ්ටසමාපත්තීන්** භාවනා කාලයෙහි සමාධි භාවනා වශයෙන් **සමථ බලය** අධික වේ.

**අනිච්චානුපස්සනාදිය** භාවනා කරන කාලයෙහි **විදර්ශනා බලය** අධික වේ.

**ආයඝී මාගීක්ෂණයේදී** ඒ සමථ විදශීනා ධර්මයෝ දෙදෙන සමව, අන්‍යොන්‍යයන් වැළඳගන්නවුන් මෙන් පවතිත්. එ බැවින් මේ සතර මාගීක්ෂණයෙහිම **සමථ-විදශීනා බල සමායෝගය** වේ

**3. ඒ ඒ මාගීයෙන් ප්‍රහාණය කටයුතු සංයෝජනාදිය ප්‍රහීණ කිරීම.**

මේ චතුර්විධ මාගීයන් අතුරෙන් යම් මාගීඥනයකින් ප්‍රහාණය කළ යුතු යම් සංක්ලෙශ ධර්මයක් වේ නම් එය ද ප්‍රහාණයවීම එක් ආනුභාවයකි. ඒ සංක්ලෙශයෝ නම්—

1. **සංයෝජන** - මෙලෝ, පරලෝ ස්කන්ධයන් ද, ඵලය හා කර්මය ද, දුක හා සත්ත්වයන් ද එකට බැඳ තබන හෙයින් **සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා** යන දස දෙන සංයෝජන නම් වෙත්. මෙයින් **සක්කායදිට්ඨි** ආදී මුල් ධර්ම පස කාම භවයෙහි සත්ත්වයන් බැඳ තබන හෙයින් **ඕරම්භාගිය සංයෝජන** නම් වෙත්. රූපරාගාදී ඉතිරි පස රූපාරූප භවයන්හි සත්ත්වයන් බැඳ තබන හෙයින් **උද්ධම්භාගිය සංයෝජන** නම් වෙත්.

2. **ක්ලේශ** – තමාම කිලිටි වන හෙයින් ද සම්ප්‍රයුක්ත ධර්ම කිලිටි කරන හෙයින් ද **ලෝභ, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප** යන දස ධර්මයෝ **ක්ලේශ ධර්ම** නම් වෙත්.

3. **මිච්ඡත්ත** – වරදවා විපරීත අදහසින් පවත්නා හෙයින් ද, මිථ්‍යාභාවයෙන් යුක්ත වන හෙයින් ද, **මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්ප, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්ත, මිච්ඡාආජීව, මිච්ඡාවායාම, මිච්ඡාසති, මිච්ඡාසමාධි** යන ධර්මයෝ අටදෙන **අෂ්ටමිච්ඡත්ත** නම් වෙත්. **මිච්ඡාවිමුත්ති, මිච්ඡාඤාණ** යන දෙකත් සමග මිච්ඡත්තයෝ දස-දෙනෙකි.

4. **ලෝක ධර්ම** – සත්ත්වයන්ගේ පැවැත්ම ඇති කල අනුපරම ධර්ම වශයෙන් පවත්නා **ලාභ, අලාභ, අයස, යසස, නින්දා, පසංසා, සුඛ, දුක්ඛ** යන ධර්ම අටදෙන **අෂ්ටලෝක ධර්ම** නම් වෙත්.

5. **මච්ඡරිය** – අනුන් හා සාධාරණ බව නොඉවසන කාරයෙන් පවත්නා **ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, ධම්ම මච්ඡරිය, වණ්ණ මච්ඡරිය,** යන ධර්ම පස **මච්ඡරිය** ධර්ම නම් වෙත්.

6. **විපල්ලාස** – **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම,** අශුභ වස්තූන්හි **නිත්‍ය, සුඛ, ආත්ම, සුභ,** වශයෙන් පැවති **සංඥා, චිත්ත, දිට්ඨි** යන ධර්මයෝ තිදෙන **විපල්ලාස ධර්ම** නම් වෙත්.

7. **ග්‍රන්ථ** – නාම, රූප කායයන් භවයෙන් භවයෙහි ගැටගසන **අභිජ්ඣා, ව්‍යාපාද, සීලබ්බතපරාමාස, ඉදං සච්චාභිනිවෙස** යන ධර්ම සතර **කායග්‍රන්ථයෝ** නම් වෙත්.

8. **අගති** – **ඡන්ද, දෝස, මෝහ,** භය යන සතර ධර්මයන්හි යෙදී නොකටයුතු කිරීම හා කටයුතු නොකිරීම. **අගති** නම් වේ. ආර්‍ය්‍යයන් විසින් නොයා යුතු මඟ වන හෙයින් ද **අගති** නම් වේ.

9. **ආශ්‍රව** – ආරම්මණ වශයෙන් ගෝත්‍රභූ සිත දක්වා ද භවාග්‍රය දක්වා ද, වහනය වන හෙයින් හෝ සංවරණය නො කල චක්‍ෂුරාදී ද්වාරයෙන් කල සිදුරු වලින් ජලය මෙන් වහනය වන හෙයින් නිතර වැගිරීම් අර්ථයෙන් හෝ සසර දුක වහනය වන හෙයින් හෝ **කාමරාග,** භවරාග**, මිච්ඡාදිට්ඨි, අවිද්‍යා** යන සතර ධර්මයෝ **ආශ්‍රව** නම් වෙත්.

10. **ඕඝ** – භව සයුරට ඇද හෙලන අර්ථයෙන් හා එතර වීමට දුෂ්කර අර්ථයෙන් **කාම, භව, දිට්ඨි, අවිද්‍යා** යන සතර ධර්මයෝ **ඕඝ** නම් වෙත්.

11. **යෝග** – ආලම්බන වියෝගයට හා දුක්ඛ වියෝග-යට ද අවකාශ නොදෙන හෙයින් **කාම, භව, දිට්ඨි, අවිද්‍යා** යන සතර ධර්මයෝ **යෝග** නමුදු වෙති.

12. **නීවරණ** - සගමොක් මග ද, කුසල චිත්තය ද විශේෂයෙන් ධ්‍යාන චිත්තය වැළකීම් වශයෙන් ආවරණය කරණ හෙයින් ද, වැසීම කරන හෙයින් ද, කුසලාදීන් පිරිසිඳ දක්ක නොදී පැවැත්ම වන හෙයින් ද, **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා** නම් වූ ධර්ම පස **නීවරණ ධර්ම** නම් වෙත්.

13. **පරාමාස** - කායාදී ඒ ඒ ධර්මයාගේ අශුභාදී ස්වභාවය ඉක්ම ශුභාදී වශයෙන් නැති ස්වභාවයෙන් දැඩි කොට ගැනීම් ආකාරයෙන් පවත්නා මිථ්‍යාදෘෂ්ටිය **පරාමාස** නම් වේ.

14. **උපාදාන** - **කාම, දිට්ඨි, ශීලව්‍රත, ආත්මවාදාදී** වශයෙන් දැඩිව ගන්නා අර්ථයෙන් **කාමූපාදාන, දිට්ඨූපාදාන, සීලබ්බතූපාදාන, අත්තවාදූපාදාන** යන සතර ධර්මයෝ **උපාදාන** නම් වෙත්.

15. **අනුසය** - බලවත්ව උපන් බැවින් ද, නැවැත කාමරාගාදීන්ගේ උත්පත්තියට හේතුභාවයෙන් අනුව ශයනය කරන හෙයින් **කාමරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා** යන ධර්ම සත **අනුසය** ධර්ම නම් වෙති.

16. **මල** - තෙල් අඳුන් කලලයක් මෙන් තමනුත් කිලුටු බැවින් ද අනුනුත් අශුචි කරන හෙයින් ද, **ලෝභ ද්වේෂ, මෝහ** යන තුන **මල** නම් වෙත්.

17. **අකුශල කර්මපථ** - අකුසල කර්මභාවයෙන් ද, දුගතියට මාර්ගභාවයෙන් ද, **ප්‍රාණාතිපාත, අදින්නාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප,** අභිධ්‍යා, ව්‍යාපාද, **මිථ්‍යාදෘෂ්ටි** යන දසය **අකුසල කර්මපථ** නම් වෙත්.

18. අකුසල චිත්තෝත්පාද - **ලෝභමූලික** අකුසල් සිත් අටය, **ද්වේෂමූලික** දෙකය, **මෝහමූලික** දෙකය යන දොළොස **අකුසල චිත්තෝත්පාද** නම් වෙත්.

## සතර මාර්ග ඥානයාගේ කෙලෙස ප්‍රහාණය

| කෙලෙස ධර්ම | සෝවාන් මාර්ග ඥානයෙන් | සකෘදාගාමි මාර්ග ඥානයෙන් | අනාගාමි මාර්ග ඥානයෙන් | අර්හත් මාර්ග ඥානයෙන් |
|---|---|---|---|---|
| සංයෝජන | සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, අපායට පමුණුවන කාම රාග, පටිඝ | ඖදාරික කාමරාග හා පටිඝ | කාමරාග, පටිඝ | රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා |
| කෙලෙස | දිට්ඨි, විචිකිච්ඡා | | ද්වේෂය | ලොභ, මොහ, මාන, ථීන, අහි-රික, අනොත්තප්ප, උද්ධච්ච |
| මිච්ඡත්ත | දිට්ඨි, මුසාවාද, මිච්ඡාකම්මන්ත, මිච්ඡාආජීව | | මිච්ඡාසංකප්ප පිසුණාවාචා ඵරුසාවාචා | සම්ඵප්පලාප, මිච්ඡාවායාම, මිච්ඡාසති, මිච්ඡා-සමාධි, මිච්ඡා-විමුත්ති, මිච්ඡාඤාණ |
| ලොක ධර්ම | | | අලාභ, අයස, නින්දා, දුක්ඛ | ලාභ, යසස, පසංසා, සුඛ |

| ක්ලේශ ධර්ම | සෝවාන් මාර්ග ඥානයෙන් | සකෘදාගාමි මාර්ග ඥානයෙන් | අනාගාමි මාර්ග ඥානයෙන් | අර්හත් මාර්ග ඥානයෙන් |
|---|---|---|---|---|
| මච්ඡරිය | මච්ඡරිය | | | |
| විපල්ලාස | අනිත්‍යයෙහි නිත්‍යය අනාත්මයෙහි ආත්මය යයි ගන්නා සංඥා, චිත්ත, දිට්ඨි, විපල්ලාස, දුක්ඛයෙහි සුඛය, අශුභයෙහි ශුභයයි ගන්නා දිට්ඨි විපල්ලාස | | අශුභයෙහි ශුභයයි ගන්නා සංඥා, චිත්ත, විපල්ලාස | දුක්ඛයෙහි සුඛයයි ගන්නා සංඥා, චිත්ත, විපල්ලාස |
| ග්‍රන්ථ | සීලබ්බතපරාමාස ඉදංසච්චාභිනිවේශ කායග්‍රන්ථ | | ව්‍යාපාද කාය ග්‍රන්ථ | අභිධ්‍යා කාය ග්‍රන්ථ |
| අගති | සතර අගතීහු | | | |
| ආශ්‍රව | දිට්ඨාසව | | කාමාසව | භවාසව, අවිද්‍යාසව |
| ඕඝ | දිට්ඨෝඝ | | කාමෝඝ | භවෝඝ, අවිජ්ජෝඝ |
| යෝග | දිට්ඨියෝග | | කාමයෝග | භවයෝග, අවිජ්ජායෝග |

| කෙලෙස ධර්ම | සෝවාන් මාර්ග ඥානයෙන් | සකෘදාගාමි මාර්ග ඥානයෙන් | අනාගාමි මාර්ග ඥානයෙන් | අර්හත් මාර්ග ඥානයෙන් |
|---|---|---|---|---|
| නීවරණ | විචිකිච්ඡා, ඖද්ධත්‍ය කුක්කුච්ච | | කාමච්ඡන්ද, ව්‍යාපාද, කුක්කුච්ච | ථිනමිද්ධ, උද්ධච්ච |
| පරාමාස | පරාමාස (මිථ්‍යාදිට්ඨි) | | | |
| උපාදාන | දිට්ඨි, සීලබ්බත පරාමාස අත්තවාද | | | කාමූපාදාන |
| අනුසය | දිට්ඨි, විචිකිච්ඡා | | කාමරාග, පටිඝ | මාන, භව, අවිද්‍යා |
| මල | | | දෝස | ලෝභ, මෝහ |
| අකුසල කර්මපථ | ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, මිථ්‍යාදිට්ඨි | | පිසුණාවාචා, පරුෂාවාචා, ව්‍යාපාද | සම්ඵප්පලාප, අභිජ්ඣා |
| අකුසල චිත්තෝත්පාද | දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත | ඖද්ධත්‍යපටිඝ සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද | පටිඝ සම්ප්‍රයුක්ත සිත් 2 | දිට්ඨි විප්‍රයුක්ත සිත් සතර හා උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත |

සතර මාර්ග ඥානයෙන් ප්‍රහාණය කරනු ලබන කෙලශයෝ අතීත කෙලෙස් නො වෙති. ඔව්හු අතීතයෙහි ම නිරුද්ධ වූහ. අනාගත කෙලෙස් නූපන් හෙයින් අනාගත කෙලෙස් ද නො වෙති. කෙලෙස් ඇති කල මාර්ග භාවනාවක් නො වන හෙයින් ප්‍රත්‍යුත්පන්න කෙලෙස් ද ප්‍රහාණය නො වෙත්.

මෙතාක් ගෙඩි හට නොගත් තරුණ ගසක් යම් පුරුෂයෙක් මුලින් සිඳී නම් ඒ ගසෙහි හට නොගත් ඵල නූපන්නාහු ම නූපදිති. හට නොගත්තාහු ම හට නො ගනිති. පහළ නොවූවෝ්ම පහළ නො වෙත්. මෙසේ ඵල හට නොගත් ගසක් මුලින් සිඳි කල මතු ඉපදීමට, සුදුසු වූ, සිඳීමෙන් ම නූපන්, ඵල නැසුණවුන් වන්නාක් මෙන් මාර්ග භාවනාව නො කළ කල ඉපදීමට සුදුසු කෙලෙස්, මාර්ග භාවනාවෙන් නුපදින හෙයින් ප්‍රහීණ වූයේ වේ කෙලෙස් ඉපදීමට උත්පත්තියම හේතුව ද වේ. ප්‍රත්‍ය ද වේ. ඒ උත්පත්තියෙහි ආදීනව දැක අනුත්පාදයෙහි හෙවත් නිර්වාණයෙහි සිත පිවිසේ. එසේ නිවණෙහි සිත පිවිසි හෙයින් ඉපදීම හේතුකොට වන්නා වූ කෙලෙස් නූපදනවුන්ම නූපදනා හෙයින් ප්‍රහීණ නම් වේ. පහළ නොවූවෝ්ම පහළ නොවෙති. මෙසේ හේතුනිරොධයෙන් ඵලය වූ දුක්ඛනිරෝධය වේ.

කෙලෙස් ඉපදීමට හා පැවැත්මට භූමියක් ඇති විය යුතු. ඒ භූමිය නම් විදර්ශනා ප්‍රඥාවට අරමුණු වන උපාදාන ස්කන්ධ පඤ්චක යයි. එ හෙයින් කෙලෙස් ඉපදීමට හේතු වූ පඤ්චුපාදානස්කන්ධ සංඛ්‍යාත භූමිය ලැබූ කල්හි උපදනා කෙලශයෝ භූමිලබ්ධොත්පන්නයෝ ය. එය වර්තමානාදී උත්පන්නයනට ප්‍රතිපක්ෂය.

උත්පන්නයෝ සතර දෙනෙකි. එනම්:-

1. වර්තමාන උත්පන්න ය,
2. භුත්වාපගත උත්පන්න ය,
3. අවකාශකෘත උත්පන්න ය,
4. භූමිලබ්ධ උත්පන්න ය,

**1. වර්තමාන උත්පන්නයෝ** – උත්පාද, ජරා, භඞ්ගයෙන් යුක්ත වූ නාම-රූපයෝ **වර්තමාන උත්පන්න ධර්මයෝ** ය.

**2. භූත්වාපගත උත්පන්නය** – අරමුණු රස අනුභව කොට නිරුද්ධ වූ අනුභූත්වාපගත නම් වූ කුසල් අකුසල් ද, උත්පාදාදී ක්‍ෂණත්‍රයට පැමිණ නිරුද්ධ වූ කුසලාකුසලයෙන් පිටත් සෙසු සඞ්ඛත ධර්මයෝ ද **භූත්වාපගතෝත්පන්නයෝ** නම් වෙත්.

**3. අවකාශ කෘත උත්පන්නය** – විපාකදීමට අවකාශ කිරීම් වශයෙන් උපද වන ලද අතීත කර්මය ද, එයින් උපදනට සිටි අනාගත විපාක ද **අවකාශ කෘත උත්පන්න** නම් වෙත්.

**4. භූමිලබ්ධ උත්පන්නය** – ඒ ඒ දිව්‍ය මනුෂ්‍යාදී ආත්මභාව සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධය නම් වූ භූමියෙහි නො නසන ලද අකුසලය, නැතැයි නොකිය හැකි හෙයින් **භූමිලබ්ධෝත්පන්න** නම් වෙත්. එනම් ප්‍රහීණ නොකළ කෙලශයෝ ය. ඒ ස්කන්ධ විෂයෙහි අප්‍රහීණාර්ථයෙන් අනුශයිත කෙලෙස්හු ද වෙති. ඒ පුද්ගලයාගේ ඒ ස්කන්ධයෝ ඒ කෙලශයන්ට වස්තු වෙති. අනුන් සන්තක වූ ස්කන්ධයෝ වස්තු නොවෙති.

සෝවාන් ආදී ආර්‍ය්‍ය පුද්ගලයන් අතුරෙහි යම් යම් ආර්‍ය්‍ය පුද්ගලයෙකුගේ ස්කන්ධ විෂයෙහි ඒ ඒ වට්ටමූල අනුශය කෙලශ සමූහය ඒ ඒ මගින් ප්‍රහීණවූයේ නම් ඒ ඒ ආර්‍ය්‍ය පුද්ගලයෝ ඒ ඒ ස්කන්ධ ප්‍රහීණ වූ ඒ ඒ වට්ටමූල කෙලශයනට වස්තු නොවන හෙයින් භූමිය යන ව්‍යවහාරය නො ලබයි.

පෘථග්ජනයන්ගේ වට්ටමූල කෙලෙස් ප්‍රහීණ නොකළ බැවින් ඔවුන් විසින් කරනු ලබන චේතනා චෛතසික භෙද ඇති යම් කිසි කර්මයක් කුසල් හෝ අකුසල් වේ. මෙසේ අප්‍රහීණ අනුශය කෙලෙස් ඇති හෙයින් ඒ පෘථග්ජනයන් හට කර්ම – කෙලශ ප්‍රත්‍යයෙන් සංසාර වෘත්තිය පවතී. ඒ වට්ටමූලය ඔවුන් පිළිබඳ වූ ස්කන්ධ පඤ්චකයෙහිම පවතී.

තවද, මේ **උත්පන්නය,**

1. **සමුදාචාරය,**
2. **ආරම්මණාධිගෘහිතය,**
3. **අවික්ඛම්භිතය,**
4. **අසමූහතය** යි ද චතුර්විධ වේ.

මේ සතර වැදෑරුම් උත්පන්නයන් අතුරෙන් වර්තමාන උත්පන්නය **සමුදාචාර උත්පන්නය** නමි.

චක්ෂුරාදියට අරමුණු හමුවූ කල්හි, පූර්වභාගයෙහි පැවැති ජවනවාර නූපදනා කෙලෙස්, අරමුණ දැඩි කොට ගත් කල්හි පසුව නියමයෙන් ම උපදනා හෙයින් **ආරම්මණාධිගෘහිත උත්පන්නය** නම් වේ.

කැලණිගම පිඬු පිණිස හැසුරුණු **මහාතිස්ස** තෙරණුවෝ දවල් කාලයෙහි විසභාග රූපයන් දැක රාත්‍රි කාලයෙහි, එම අරමුණෙහි බලවත් ව උපන් කෙලෙස් විෂ්කම්භණය කොට රහත්වූහ.

සමථ - විපස්සනාවන් අතුරෙන් එකෙකින්වත් විෂ්කම්භණය නොකළ කෙලෙස් චිත්ත සන්තතියට නොනැගි නමුත් කෙලශොත්පත්තිය වළක්වන හේතුවක් නැති හෙයින් **අවික්ඛම්භිතුප්පන්න** නම් වේ.

සමථ විපස්සනා වශයෙන් විෂ්කම්භණය කළ කෙලෙස් ද, ආර්ය මාර්ගයෙන් නො නැසූ හෙයින් ද, උත්පත්ති ස්වභාවය නො ඉක්ම වූ හෙයින් ද, **අසමූහතුප්පන්න** නම් වේ. අහසින් යන අෂ්ට සමාපත්තිලාභී තෙරුන්ට මල් පිපි රුක් ඇති උයනෙක මල් නෙලමින් මිහිරි හඬින් ගායනා කරන මාගමකගේ ගීත ශබ්දය ඇසීමෙන් උපන් කෙලෙස් මෙනි.

මේ සතර වැදෑරුම් උත්පන්නයන් අතුරෙන් **ආරම්මණාධිගෘහිතුප්පන්නය, අවික්ඛම්භිතුප්පන්නය, අසමූහතුප්පන්නය** යන ත්‍රිවිධ උත්පන්නයෝම, **භූමිලබ්ධොත්පන්න** යෙන්ම එකට සංග්‍රහ වෙති. **වර්තමානය, භූතාපගතය, අවකාශ කෘතය, සමුදාචාරය** යයි කියන ලද සතර

වැදෑරුම් උත්පන්නයෝ මාර්ගවධ්‍ය නොවන හෙයින් සතර මාර්ග ඥානයෙන් පහ කළ යුතු නො වේ. **භූමිලබ්ධය, ආරම්මණාධිගහිතය, අවික්ඛම්භිතය, අසමූහතය** යි කියන ලද චතුර්විධ උත්පන්නයාගේ උත්පන්න භාවය විනාශ කරමින් ඒ ඒ ලෞකික - ලොකොත්තර ඥාන උපදින හෙයින් සියල්ල ම පහ කළ යුතු වේ.

මාර්ගාවබොධකාලයෙහි නොහොත් චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරන කාලයෙහි ඒ සතර මාර්ග ඥානයන් අතුරෙන් එක් එක් මාර්ග ඥානයකින් **පරිඥා, ප්‍රහාණ, සච්ඡිකිරිය, භාවනා** යන සතර සතර කෘත්‍යයන් එකවර සිද්ධ කරනු ලැබේ.

පහන ඉදිරිපසු නොවී එකවර වැටිය දැවීමය, අඳුරු දුරු කිරීමය, ආලෝකය පැතිරවීමය, තෙල් ක්‍ෂය කිරීමය යන සතර කෘත්‍යයන් සිද්ධ කරන්නාක් මෙන් **මාර්ග ඥානය** ද පෙරපසු නොවී එක ක්‍ෂණයෙහි ම **දුඃඛ පිරිසිඳ දැනීමය, සමුදය පහ කිරීමය, මාර්ගය වැඩීමය, නිර්වාණ සාක්‍ෂාත් කිරීමය** යන සතර කෘත්‍යයන් සිදු කෙරේ.

**දුක් දක්නා** මහණ තෙම දුක්ඛසමුදය ද, දුක්ඛ නිරොධය ද, දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාව ද දක්නේය. මේ ක්‍රමයෙන් සමුදය දක්නා පුද්ගලයා ද, නිරොධය දක්නා පුද්ගලයා ද, මාර්ගය දක්නා පුද්ගලයා ද චතුරාර්ය සත්‍යයන්ම දකී.

මාර්ග ඥානයාගේ චතුර්විධ කෘත්‍යයන් අතුරෙන් **පරිඥාව ත්‍රිවිධ වේ.** එනම්:- **ඤාත පරිඥා, තීරණ පරිඥා, පහාණ පරිඥා** යනු යි. **අභිඤ්ඤෙය්‍ය** වූ හෙවත් දතයුතු දැය දැනගැනීමේ ඤාණය **ඤාත පරිඥා** නම්. ඤාත පරිඥාවගේ ප්‍රත්‍යය සහිත නාම - රූපයන් දැනීම තීරණාර්ථයෙන් **තීරණ පරිඥා** නම්. අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥාව **ප්‍රහාණ** කෙරේ යනාදී වශයෙන් බැහැර කරන ලද කෙලශ ධර්මයන් පිළිබඳ දැනීම **ප්‍රහාණ පරිඥා** නම් වේ.

**එසේම ප්‍රහාණය** ද ත්‍රිවිධ වේ. එනම්: **විෂ්කම්භණ ප්‍රහාණය, තදඞ්ග ප්‍රහාණය, සමුච්ඡෙද ප්‍රහාණය** යනු යි.

ලෞකික සමාධියෙන් නීවරණාදි විරුද්ධ ධර්මයන් විෂ්කම්භණය වීම **විෂ්කම්භණ ප්‍රහාණ** නමි. විෂ්කම්භණය නම් ඔබාලීමයි. **නීවරණයෝ** ධ්‍යානයට පූර්වභාගයෙහි ද, පසුභාගයෙහි ද වහා සිත නො මඩනාහු වෙති.

විදර්ශනාවට අවයව වූ ඒ ඒ ඤාණයෙන් කෙලශයන්ගේ ප්‍රහීණ කිරීම **තදඞ්ග ප්‍රහාණය** යි. මේ තදඞ්ග ප්‍රහාණය සීල විසුද්ධි ආදීන්ගේ වශයෙන් සිදුවේ.

**නාම – රූප පරිච්ඡේදයෙන්** පළමුකොට **සත්කාය දිට්ඨිය** ප්‍රහීණ වේ.

**ප්‍රත්‍යය පරිග්‍රහයෙන්** අහේතුක දෘෂ්ටි, විෂම හේතු දෘෂ්ටීන්ගේ ද, සොළොස් වැදෑරුම් **කඞ්ඛා මලයන්ගේ ද** ප්‍රහාණය වේ.

**කලාප සම්මර්ශනයෙන්** මම ය, මාගේ යයි සමූහ වශයෙන් ගැනීම ද ප්‍රහීණ වේ.

**මාර්ග අමාර්ග ව්‍යවස්ථානයෙන්** අමාර්ගයෙහි මාර්ග යන සංඥාව ද ප්‍රහීණ වේ.

**උදය දර්ශනයෙන් උච්ඡේද දෘෂ්ටිය** ප්‍රහීණ වේ.

**ව්‍යය දර්ශනයෙන් ශාශ්වත දෘෂ්ටිය** ප්‍රහීණ වේ.

**භයතුපට්ඨාන ඤාණයෙන්** භය සහිත පඤ්චස්කන්ධයෙහි අභය සංඥාව දුරු වේ.

**ආදීනවානු දර්ශනයෙන්** පඤ්චස්කන්ධයෙහි ආස්වාද වශයෙන් පැවති සංඥාව ප්‍රහීණ වේ.

**නිබ්බිදානුපස්සනාවෙන්,** ව්‍යාපාරයෙහි ඇලීම් සංඥාව ප්‍රහීණ වේ.

**මුඤ්චිතුකම්‍යතා ඤාණයෙන්** නොමිදෙනු කැමැති බව ප්‍රහීණ වේ.

**පටිසඞ්ඛාන ඤාණයෙන්** එයට ප්‍රතිපක්ෂ වූ මෝහයාගේ ප්‍රහාණය වේ.

**සඞ්ඛාරුපෙක්ඛා ඤාණයෙන්** අනුපෙක්ෂණයෙක් වන නිත්‍යග්‍රාහයාගේ ප්‍රහාණය වේ

**අනුලෝම ඤාණයෙන්** මාර්ගසත්‍යාධිගමයට විලෝම වූ නිත්‍යාදී ග්‍රාහයාගේ ප්‍රහාණය වේ.

තවද, **අනිච්චානුපස්සනාදී** අටළොස් විදර්ශනාවන්ගෙන් නිත්‍ය සංඥාදීන්ගේ ප්‍රහාණය වේ.

මේ සියල්ලම **තදඞ්ග ප්‍රහාණ** වශයෙන් සිඬ වේ.

**ආර්‍ය මාර්ග ඤාණයෙන්** සංයෝජනාදී ධර්මයන් නැවත නොපවත්නාසේ ප්‍රහීණවීම **සමුච්ඡේද ප්‍රහාණය** නම් වේ. අභිසමය කාලයෙහි නොහොත් **ඤාණ දර්ශන** විසුඬියෙන් සමුච්ඡේද ප්‍රහාණය වේ.

එ හෙයින් ඒ යෝගීහට පූර්වභාගයෙහි **තදඞ්ග විෂ්-කම්භණ ප්‍රහාණයෝ** ද, මාර්ගාවධියෙහි වන **සමුච්ඡේද ප්‍රහාණයට** උපකාර වේ. එ හෙයින් මේ ප්‍රහාණත්‍රයම මාර්ග ඥානයාගේම කෘත්‍යය යයි දත යුතු.

**සාක්ෂාත් කිරීම** ද, **ලෞකික සාක්ෂාත් කිරීමය, ලෝකොත්තර සාක්ෂාත් කිරීම** යයි විධ වේ. ලොකොත්තර **සාක්ෂාත් කරණය** ත්‍රිවිධ වේ.

ප්‍රථම ධ්‍යානය ලැබුවෙමි, වසඟ කෙළෙමි, එය මා විසින් සාක්ෂාත් කරන ලදැයි යනාදී වශයෙන් ප්‍රථම ධ්‍යානාදිය සපර්ශ කිරීම **ලෞකික සාක්ෂාත් කිරීම** නම් වේ. මෙහි **සපර්ශ කිරීම** නම් අධිගම කොට, මෙය මා විසින් අධිගත යයි ප්‍රත්‍යක්ෂයෙන් අරමුණු කිරීම් සඞ්ඛ්‍යාත ඥාණයෙන් සපර්ශ කිරීමයි. එකබු, රූපාදී වූ සියලුම සාක්ෂාත් කළ යුතු ධර්ම සපර්ශ කිරීම් වශයෙන් සාක්ෂාත් කිරීම **ලෞකික සාක්ෂාත් කිරීම** නම් වේ.

ප්‍රථම වූ සෝවාන් මාර්ගක්ෂණයෙහි නිවන් අවබෝධ කිරීම **දර්ශන සාක්ෂාත් කෘත්‍යය** වේ. සෙසු සකෘදගාමි ආදී මාර්ගක්ෂණයන්හි නිවන් අවබෝධ කිරීම **භාවනා සාක්ෂාත් කෘත්‍යය** වේ.

භාවනාං ද, **ලෞකික භාවනාය, ලොකොත්තර භාවනාං** යයි විධ වේ.

**ලෞකික සීල, සමාධි, ප්‍රඥාවන්ගේ** ඉපදවීම ද, **ඒ සීල, සමාධි, ප්‍රඥාවන්ගෙන්** තමා සතන්හි පුරුදුවීම් වශයෙන් පැවති සන්තාන වාසනාව ද, **ලෞකික භාවනා** ය. යම් පමණෙකින් ලෞකික වූ **සීල භාවනාං, චිත්ත භාවනාං, ප්‍රඥා** භාවනාංවෝ උපදන ලද්දාහු ද, **එයින්** ම සන්තානය ද **පරිභාවිතය.**

**ලෝකොත්තර** වූ **සීල, සමාධි, ප්‍රඥාවන්ගේ** ඉපද-වීම ද, ඒ සීලාදීන්ගෙන් පැවති සන්තාන වාසනාව ද **ලෝකොත්තර** භාවනාය. මෙහි ඥාණදස්සන විසුද්ධියෙහි වූ ලෝකොත්තර භාවනාව කියන ලදී. **ලොකොත්තර** වූ **සීලය** නම් **සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යයි. **ලොකොත්තර සමාධිය** නම් **සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි** යයි.

## ප්‍රඥා භාවනායෙහි අනුසස්

ප්‍රඥා භාවනාවගේ නොයෙක් සියදහස් ආනිසංසයන් අතුරෙන් ප්‍රධාන වශයෙන් අනුසස් සතරෙක් වේ. එනම්:–

1. **සක්කායදිට්ඨි** ආදී නොයෙක් කෙලෙස් නැසීම ය,
2. **ආයර්‍ය ඵල රස** අනුභව කිරීම ය,
3. **නිරොධ සමාපත්තියට** සමවැදීමට සමත් බවය,
4. **ආහුණෙය්‍ය** භාවාදී සිද්ධිය ය.

1. පූර්වභාගයෙහිදී නාම – රූප පරිච්ඡේදයෙහි පටන් **සක්කායදිට්ඨි** ආදීන්ගේ වශයෙන් නානා විධ කෙලශ-යන්ගේ දුරු කිරීම **ලෞකික ප්‍රඥා භාවනායෙහි ආනිසංසය** වේ.

ආයර්‍ය මාර්‍ගක්ෂණයෙහි **සංයෝජනාදි** නානාවිධ කෙලශයන්ගේ නැසීම **ලොකොත්තර ප්‍රඥා භාවනායෙහි ආනිසංසය** වේ.

**2. ශ්‍රාමණ්‍ය ඵලය නම් වූ ආර්‍ය මාර්ග ඵලයෙහි රසානුභවය** නවත් ආනිසංසයකි. එය දෙවැදෑරුම් වේ.

(1) **මාර්ග චිත්ත වීථියෙහි වූ ඵලය**

(2) **ඵල සමාපත්තියෙන් ප්‍රවෘත්ති කාලයෙහි ඵලරසානුභවය.**

මාර්ගය උපදනා චිත්තවීථියෙහි මාර්ග චිත්තයට අනතුරුව ඵල සිත් දෙකක් හෝ තුනක් අකාලික විපාක වශයෙන් ද, ආනන්තරික සමාධිය වශයෙන් ද උපදනා සැටියට දක්වන ලදී.

**ඵල සමාපත්තිය** – ආර්‍ය ඵලයාගේ නිරොධයෙහි අපීණාව පිහිටීම **ඵල සමාපත්ති** නමි. සියලුම ආර්‍යයෝ තම තමන්ගේ ඵල සමවතට සමවදිති. මතු සකෘදගාමි ආදී ආර්‍යයෝ යට සෝවාන් ඵලාදියට සමනොවදිත්. යට සොවාන් ඵලාදියෙහි පිහිටියාහු මතු සකෘදගාමි ඵලාදියට සම නො වදිත්.

රජකු රාජ්‍යසුඛය අනුභව කරන්නාසේ, දෙවියන් දිව්‍යසුඛය අනුභව කරන්නාසේ, ආර්‍යයෝ ද ඉහාත්මයෙහි කෙලෙස් විඩා සංසිඳුවා සුවසේ වසනු පිණිස කාලය පිරිසිඳ කැමති කැමති කෙණෙහි **ඵල සමවතට** සමවදිත්.

**ඵල සමාපත්තියට** සමවැදීම දෙයාකාරයකින් සිදුවේ. එනම්:–

(1) **නිවණින් අන්‍ය වූ අරමුණක් මෙනෙහි නො කිරීම ය.**

(2) **නිවණ මෙනෙහි කිරීම ය.**

ඵල සමවතට සමවදනා කැමැති ආර්‍ය ශ්‍රාවකයා විසින් රහසිගතව, නත් අරමුණෙන් වැළකී, උදයව්‍යයාදී වශයෙන් සංස්කාරයන් විදර්ශනාවට නැගිය යුතු. පැවති අනුපූර්ව විදර්ශනා ඇති ඒ යෝගිහුගේ, සංස්කාරයන් අරමුණු කොට ඇති වෝදන සිතට අනතුරුව ඵල සමාපත්ති වශයෙන් නිවන් අරමුණු කොට සිත පිහිටයි. ඒ පුද්ගලයාහට **ප්‍රථම ධ්‍යානික මාර්ගය** අධිගතවී නම් **ප්‍රථමධ්‍යානික ඵලයම**

උපදී. චිතියාදී ධ්‍යානයන් අතුරෙන් යම් කිසි ධ්‍යානයක් අධිගතවී නම් ඒ චිතිය ධ්‍යානිකාදී වූ ඵලයම උපදී. මෙසේ ඵල සමාපත්තිය සිදු වේ.

මේ **ඵල සමාපත්තිය** හෙවත් **අනිමිත්ත චෙතොවිමුත්තිය** නො සිඳ පැවැත්මට ප්‍රත්‍යයෝ තිදෙනෙක් වෙති. එනම්:-

(1) සංස්කාර නිමිති මෙනෙහි නො කිරීම ය,

(2) අනිමිත්ත ධාතුව (නිවණ) මෙනෙහි කිරීම ය,

(3) කාලය පිරිසිඳීම ය.

සමවතට සමවැදීමට ප්‍රථම අසුවල් කාලයෙහි සමවතින් නැගී සිටිමි යි පිරිසිඳියි. ඒ පිරිසිඳි කාලයෙහි සමවතෙහි සිටීම වේ.

ඵල සමවතින් නැගිටීමට ද කරුණු දෙකක් වෙති. එනම්:-

(1) සංස්කාර නිමිති මෙනෙහි කිරීම ය,

(2) අනිමිත්ත ධාතුව මෙනෙහි නො කිරීම ය.

මාර්ග වීථියෙහි **ඵල චිත්තයට** මාර්ග සිත අනන්තර ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව ඵල චිත්තය පසුව පසුව වූ ඵල චිත්තයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. ඵල සමාපත්තියෙහි පළමු ඵල චිත්තයට අනුලොම ඥානය සඞ්ඛ්‍යාත චොදනය අනන්තර ප්‍රත්‍යය වේ.

රහතන් වහන්සේගේ අනුලොම ඥානය ඵල සමවතට අනන්තර ප්‍රත්‍යය වේ.

**3. නිරොධ සමාපත්තියට** සමවැදීම ද ප්‍රඥා භාවනාවගේ තවත් ආනිසංසයෙක් වේ. මේ පිළිබඳ විස්තරය යට දක්වන ලදී.

**4. ආහුණෙය්‍ය භාවාදී සිද්ධිය** ද ලොකොත්තර ප්‍රඥාවේ එක් ආනිසංසයකි.

ලොකොත්තර ප්‍රඥාව වැඩූ හෙයින් භාවිතප්‍රාඥ වූ පුද්ගලතෙමේ දෙවියන් සහිත ලොකයාට **ආහුණෙය්‍ය** වේ හෙවත් දුරින් ගෙනැවිත් දෙන දානයට සුදුසු වේ. එසේ ම ආගන්තුක දානයට සුදුසු වන හෙයින් **පාහුණෙය්‍ය** ද වේ. පරලොව සඳහා දෙන දානයට සුදුසු හෙයින් **දක්ඛිණෙය්‍ය** නමුදු වේ. සියලු ලොකයා විසින් දෙහොත් මුදුනෙහි තබා කරණ **අඤ්ජලිකර්‍මයට** ද සුදුසු වේ. සියලු ලෝකයාගේ අනුත්තර පින් කෙතක් ද වේ.

මෙසේ සතර මග නුවණින් ආර්‍යභාවයට පැමිණි පුද්ගලයන් අතුරෙන් **සෝවාන් පුද්ගලයෝ** තිදෙනෙක් වෙති. එනම්: **එකබීජි, කොලංකොල, සත්තක්ඛත්තුපරම** යන තිදෙනා ය.

තියුණු වූ විදසුන් වඩා තියුණු වූ ශ්‍රද්ධාදී ඉඳුරන් ඇතිව සෝවාන් මාර්‍ග ඥානය උපදවා එකම ප්‍රතිසන්ධියක් ලැබ සසර දුක් කෙළවර කරන්නේ **එකබීජි** නම් වේ.

මධ්‍යම වූ විදර්‍ශනාවෙන් හා මධ්‍යම වූ ශ්‍රද්ධාදී ඉඳුරන් ඇතිව කුල දෙක තුනක හෝ සය දක්වා පිළිසිඳීම් වශයෙන් සසර සැරිසරා දුක් කෙළවර කරන්නේ **කොලංකොල** නම් වේ.

මඳ වූ විදර්‍ශනාවෙන් සෝවාන් බවට පැමිණ ශ්‍රද්ධාදී මෘදු වූ ඉඳුරන් ඇත්තේ ම දෙව්මිනිස් ලෝ වශයෙන් සත් සුගති භවයෙක ප්‍රතිසන්ධි වශයෙන් සසර ඇවිද දුක් කෙළවර කරන්නේ **සත්තක්ඛත්තුපරම** නම් වේ.

**සකෘදාගාමි පුද්ගලයෝ** පස්දෙනෙකි.

1. සකෘදාගාමි ඵලය ලබා මෙහි ම පිරිනිවන්පාන පුද්ගලයා ය.
2. මෙහි සකෘදාගාමිව දෙව්ලොව ඉපිද එහි පිරිනිවන්පාන පුද්ගලයා ය.
3. දෙව්ලොවදී සකෘදාගාමීව එහිදීම පිරිනිවන්පාන පුද්ගලයා ය.

4. දෙව්ලොවදී සකෘදාගාමීව මෙහි ඉපිද පිරිනිවන්පාන පුද්ගලයා ය.

5. මෙහිදී සකෘදාගාමීව, දෙව්ලොව ඉපිද එහි ආයු ඇතිතාක් සිට නැවත මෙහි ඉපිද පිරිනිවන්පාන පුද්ගලයා ය.

**අනාගාමි පුද්ගලයෝ** ද පස්දෙනෙකි.

1. **අන්තරා පරිනිබ්බායී අනාගාමි** – අවිහාදීන් අතුරෙන් සම් කිසි සුද්ධාවාසයක ඉපිද එහි ආයු ප්‍රමාණයෙන් මධ්‍යයට නො පැමිණ පිරිනිවන්පාන අනාගාමි පුද්ගලයා ය.
2. **උපහච්ච පරිනිබ්බායී අනාගාමි** – එහි ආයු මධ්‍යය පසු කොට පිරිනිවන්පාන අනාගාමි පුද්ගලයා ය.
3. **අසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමි** – නිරුත්සාහයෙන් අර්හත් මාර්ගය උපදවා පිරිනිවන්පාන අනාගාමි පුද්ගලයා ය.
4. **සසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමි** – උත්සාහයෙන් අර්හත් මාර්ගය උපදවන අනාගාමි පුද්ගලයා ය.
5. **උද්ධංසොත අකණිට්ඨගාමි අනාගාමි** – උපන් සුද්ධාවාස භූමියෙන් ක්‍රමයෙන් මතු මතු ලොකයට යමින් අකණිට්ඨාව තෙක් ගොස් පිරිනිවන්පාන පුද්ගලයා ය.

මේ අනාගාමි පුද්ගලයන් පස්දෙනා අතුරෙන් **අන්තරා පරිනිබ්බායී** පුද්ගලයෝ **තිදෙනෙක්** වෙති. එනම්: (1) අවිහයෙහි උපන් කෙණෙහිම රහත්ව පිරිනිවන් පාන එක් පුද්ගලයෙක්, (2) ආයු මධ්‍යයට නො පැමිණ පිරිනිවන්පාන එක් පුද්ගලයෙක, (3) ආයු මධ්‍යයෙහි පිරිනිවන්පාන එක් පුද්ගලයෙක.

**උපහච්ච පරිනිබ්බායී** එක් පුද්ගලයෙකි.

**උද්ධංසොත අකණිට්ඨගාමි** එක් පුද්ගලයෙකැයි පුද්ගලයෝ පස්දෙනෙක. මේ පස්දෙන ද **අසංඛාර**

**පරිනිබ්බායී, සසංඛාර පරිනිබ්බායී** වශයෙන් **දසදෙනෙක** මෙසේ **අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී** යන සතර සුද්ධාවාසයන්ගේ වශයෙන් සතළිස් (40) දෙනෙක.

**අකණිට්ඨයෙහි,** උද්ධංසොත අකණිට්ඨගාමි පුද්ගලයා හැර සතර දෙනෙක. ඒ සතර දෙනා ද **අසංඛාර, සසංඛාර** භෙදයෙන් අටදෙනෙක. මෙසේ අනාගාමිහු සතළිස් අටදෙනෙක් වෙත්.

සතර වන අර්හත් මාර්ග ප්‍රඥාවෙහිදී කිසිවෙක් **සද්ධාවිමුක්ත** වෙයි, කිසිවෙක් **ප්‍රඥාවිමුක්ත** වෙයි, කිසිවෙක් **උභතොභාග විමුක්ත** වෙයි, කිසිවෙක් **ත්‍රිවිද්‍යාප්‍රාප්ත** වෙයි, කිසිවෙක් **ෂඩභිඥාප්‍රාප්ත** වෙයි, කිසිවෙක් **සිව්පිළිසිඹියාපත් මහා ක්ෂීණාශ්‍රව** වෙයි.

මෙසේ නුවණ ඇති පුද්ගල තෙමේ සසර දුකින් මිදෙනු පිණිස සමථ විපස්සනා වශයෙන් භාවනා කොට සප්ත විසුද්ධීන්ගේ වශයෙන් සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මග සතර ඵලයන්ට පැමිණ දුක් කෙළවර කොට දෙවියන් සහිත ලොකයා අතර අග්‍රදක්ෂිණෙය්‍ය භාවයට පැමිණ සසර දුකින් මිදී නිවණට පැමිණ වදාරණ සේක.

ත්‍රිපිටකධර අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන්වහන්සේ විසින් සම්පාදිත **අභිධර්මාර්ථ සංග්‍රහ** නම් වූ අභිධර්ම ග්‍රන්ථයට අනුව යමින් එහි ඇතුළත් ධර්මයන් පිළිබඳ විස්තර විවරණයක් වශයෙන් කාණ්ඩ සතරකින් යුක්තකොට ධර්මාවබොධය පිණිස සැදැහැයෙන් කළ **අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම් වූ ග්‍රන්ථය මෙතෙකින් සමාප්තයි.

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡文：ABHIDHARMARTHA PRADIPIKA Vol. IV,
阿毗達摩 第四冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan
1,500 copies; October 2015
SR044 - 13515